

සීමාසහිත රත්නාකර යන්ත්‍රාලය මගින් මුද්‍රණය කරවා
ප්‍ර කා ශි ත යි.

මිල රු. 10-00 යි.

80/10 A

පූජාවලිය

සිතියම් සහිතයි.

මයූරපාද පරිවෙණාධිපති

බුද්ධ පුත්‍ර හිමියන් විසින්

ර චි ත යි.

විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය්‍ය

පණ්ඩිත වේරගොඩ අමරමෝලි

නාහිමියන් විසින්

සං ශෝ ධි ත යි.

රත්නාකර පොත් වෙළඳ හල

ම ගි න්

සීමාසහිත රත්නාකර මුද්‍රණාලයෙහි

මුද්‍රාපිතයි.

2497

1953

සංඥාපනය.

මේ පූජාවලි නම් ග්‍රන්ථය වනාහි සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයන් වහන්සේට මූලප්‍රණිධියෙහි පටන්ද බුද්ධත්වයෙන් එක්දහස් අටසිය නව වසක් මුළුල්ලෙහිද සතරමර සකල ලෝකයා විසින් අතිශය උත්කෘෂ්ටවද් භාවයෙන් යෙදී සිදු කරණ ලද ආමිෂ ප්‍රතිපත්ති පූජාවන් පිළිබඳ 'ආවලිය' මෙහි සඳහීය වශයෙන් දක්වෙන හෙයින් 'පූජාවලී' නම් විශේෂ නාමයකින් යුක්ත වූයේ 'අර්හත් ගුණ වර්ණනා' නම් අපර නාමධෙයයක් ද ඇති වූවකි.

“අප මහ රජහට බෝධිසත්ව පාරමිතායෙන් යෙදුනා වූ බණක් වදාළ මැනව” යි කරණ ලද දෙවප්‍රතිරාජ මහ ඇමති තුමන්ගේ අරාධනාව පිළිගත් 'මයූරපාද පරිවෙණාධිපති බුද්ධ පුත්‍ර ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙය 'ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො', යනාදි නවගුණ පාඨයට ඇතුළත් 'අරහං' යන පදය ගෙණ එය සුකෝමල හෙළු බසින් වර්ණනා කිරීම් මුඛයෙන් රචනා කළහ.

යථොක්ත බුද්ධපුත්‍ර ස්වාමීන්ද්‍රයන් වහන්සේ වනාහි මහ පැරකුම්බා රජතුමන් විසින් කරවන ලද පොළොන්නරු ජේතවන මහා විහාරයෙහි අධිපතිව වැඩ සිටියාවූ ත්‍රිපිටක ධර්මයෙහිද තදන්‍ය ශාස්ත්‍රවිෂයෙහිද පරතෙර පැමිණියා වූ ටීකාචාර්ය්‍ය ශාරිපුත්‍ර සඞ්ඝරාජයන් වහන්සේගේ ශිෂ්‍ය වූ ගණවැසි වංශාභිජාත මහතෙත් පාමූල සුමඞ්ගල මාහිමියන්ගේ සොහොයුරුවූ, එසේ ම උන්වහන්සේ වෙතින් ම ධර්ම ශාස්ත්‍රය හදාළා වූ ධර්මශාස්ත්‍රයෙහි හා තදන්‍ය ශාස්ත්‍රයන්හි පටුතර බුද්ධිමත් වූ බහුශ්‍රැත මහා ස්ථවිරයන් වහන්සේ නමකි. බුදු බැව් පතා ගුණ දහම් පිරීමෙහි නියුක්ත උතුමෙකි. සාමාන්‍ය ලෝක වර්ගයාගේ හිත සැප පිණිස මුන්වහන්සේ විසින් ම යෝගාර්ණවය, ප්‍රයෝග රත්නාවලිය යන වෛද්‍යක ග්‍රන්ථයෝද රචිතයහ.

මයූරපාද පිරිවෙණ

අනුරාධ පුරයෙහි බුද්ධදාස රජතුමන් විසින් කරවනලද මොරතර පිරිවෙණ නම් විහාරය ගැණ මහාවංසයෙහි සඳහන් වේ. එහෙත් මෙහි සඳහන් වන මයූරපාද පිරිවෙණ එය ම යයි නිශ්චයට නො යා හැකිය. මේ ග්‍රන්ථය නිපදවන කාලයෙහි අනුරාපුරයෙහි පැවති විහාරායතනාදිය සාකල්‍යයෙන් ම වන බිහි වී ගොස්ය. එසේ ම භික්‍ෂු පරපුරද සිඳී බිඳී ගොස් ය. පුරා විද්‍යාධිකාරි උතුමන්ගේ ද අදහස් පරිදි මෙහි සඳහන් මයූරපාද පිරිවෙණ කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල

නම් පෙදෙසෙහි පිහිටි වාතගිරි යන අපරනාමයකින් ප්‍රසිද්ධ වාගිරිගල පිහිටියෙකැයි නිශ්චයට යා යුතුව තිබේ. දැනට කැලෑ රොදින් ගහන වූ මෙහි වනාහි ගල්ලෙන් පොකුණු ආදි නටබුන්ව ගිය දේ දකින්ට ලැබේ

පෙර මේ ස්ථානය සිංහල මහා බලකොටුව වශයෙන් ද රක්ෂිත ධනස්ථානය වශයෙන්ද ඇතැම් සිංහල රජවරුන්ට අතිශයින් පිහිට විය. පසුව ආරණ්‍යායතනයක් බවට පරිවර්තිත වූයේ පූජාවලි නම් ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ නිෂ්පාදක බුද්ධ පුත්‍ර මහා ස්වාමීන්ද්‍රයන් මහත්සේගේ ජය භූමිය ද විය.

ක්‍රි: ව: 1250 දී ලක් රජයට පැමිණ පන්තිස් වසක් කාලය රාජ්‍යයවිචාළාවූ කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත විතීය පරාක්‍රමබාහු රජතුමන්ගේ තිස්වන හවුරුදුයෙහි පූජාවලි ග්‍රන්ථය නිමවාලිය යි එහි සඳහන් වේ.

ii පැරකුම්බා රජතුමා

තුන් වැනි විජයබාහු මහ රජතුමන්ගේ පුත් වූ ii පැරකුම්බා රජතුමා දඹදෙණි පුරය රාජධානිය කොට ගෙණ ලඞ්කාරාජ්‍ය පද ප්‍රාප්ත විය. මේ රජතුමාගෙන් ශාස්ත්‍රයටද ආගමටද සිදු වූ සේවය අනල්ප ය. දඹදෙණි කාලයෙහි නිෂ්පාදිත ග්‍රන්ථයන්ගෙන් මෙකලද ශාස්ත්‍රය උද්දීපනව පවතී. විසුද්ධි මාර්ග සන්නය මේ රජතුමන්ගේම කෘතියකි. එතුමාගේ ශාස්ත්‍රාගම විෂයෙහි පැවති ඥානය මේ එකම ග්‍රන්ථයෙන් ප්‍රකාශිතය.

දඹදෙණිය, කුරුණෑගල, කැලණිය, අත්තනගල්ල. වාගිරිගල, බෙන්තොට, තොටගමුව, වැලිගම, දෙවුන්දර ආදි ස්ථානයන්හි පිරිවෙන් විහාර පිහිටුවා මේ රජතුමා ආගමික වර්ධනයද කරවාලීය.

පෙර යා නො හැකිව තිබූ විෂමස්ථානයන්හි මාර්ග ඉදි කරවා ඒදඬු පාලම් සාදවා, තැන් තැන්වල උයන් වතු නිපදවා, වැව් අමුණු බඳවා මහාජන සේවයද මැනවින් ඉටු කෙළේය.

දෙව ප්‍රතිරාජ මහ ඇමතිතුමා

දුනුකේවතු පරපුරෙන් පැවත ආවා වූ දෙව ප්‍රතිරාජ මහ ඇමතිතුමා විතීය පරාක්‍රමබාහු රජතුමන්ගේ ආගමික කෘත්‍ය සංවිධානයෙහි ශ්‍රේෂ්ඨස්ථානය ඉසිලීය. හේ යුද්ධයෙහිද ඉතා දක්ෂයෙකි. චන්ද්‍රභානු හා කළ යුදෙහි දී ඒ බැව් මැනවින් ප්‍රකට විය. අනොමදස්සි මාහිමියන් කළ සිදත් සඟරා වෙහි මෙසේ ප්‍රතිරාජ මහ ඇමති තුමාගේ ගුණ වර්ණය දක් වේ.

"සඳවන සිදු කිය කුඹුයොන නම සත — රා
කිවී සෙවෙත තොාද වැලිනී යලතො ගො — රා
අරුණු කිහෙති වී කෙරලත් ලැබ හුරි — රා
පැවිවනෙදෙස යුද පතිරජ දිය ඉසු — රා"

යනුවෙනි

එසේම එතුමාගේ තත්ත්වය එහි මෙසේද සඳහන් වේ.

"දකණලක සියල්-බුජමහවුරෙති රක්නා,
දෙදෙව් රදලගම් විමතග-පතිරජ දෙව් සැරදෙනේ."
යනුයි

පූජාවලියෙහිදඃ-

"..............මාගේ ඒ අදහස් දැන ලෝවැඩෙහි බැදෙන ඇමතියෙක් කවරේදෝහෝයි සිතා එකතාලිකේර ඵලයක් බුදුබැව් පතාරොපණය කොට තුන් ඇස්සෙන් තුන් පැල යක් නංවා ගත්, දිළිඳුන් දුන අඹුදරුවන් පවා දන් දුන් බුදුවෙම්වයි පතන තුණු රුවනෙහි පහන් දෙව ප්‍රතිරාජ නම් ඇමතියා කැඳවා.............." යනාදි වශයෙන් සඳහන් වේ.

ii පැරකුම්බා රජතුමන් සිංහලු ආගමික කාර්‍ය්‍ය සාධක ශාසනා මාත්‍ය ධුරයට මේ දෙව ප්‍රතිරාජ මහ ඇමති තුමන් පත් කළ බැව්ද එහි සඳහන්වේ. අනතිමේ දී බුද්ධ පුත්‍ර ස්වාමි න්‍ද්‍රයන් වහන්සේ පූජා වලිය රචනා කොට නිමවා රජතුමන්ට පිළිගැන්නීම ද මේ ඇමති තුමන් ලවා ම කරවූහ.

පූජාවලි ග්‍රන්ථය වනාහි සද්ධර්මරත්නාවලි, සද්ධර්මාලඞ්කාර, සද්ධර්මරත්නාකරාදිය වැනි අනුවාදක ග්‍රන්ථයක් නොවෙයි. 'අරහං' යනාදි පදය විස්තර කරමින් ත්‍රිපිටක ධර්මයෙන් ග්‍රන්ථ කතන්දය හෙතු උදාහරණ පෙන්වමින් ආගම ශාස්ත්‍රය විෂයෙහි ස්වකීය පටුතර භාවය විදහා දක්වමින් සැපයුනු ග්‍රන්ථයක් වෙයි.

පූජාවලිය කල්පනාවෙන් යුක්තව කියවන්නා හට එකවිට ම අවබොධ වන්නේ කර්තෘන් වහන්සේගේ ධර්මය විෂයෙහි පැවති පෘථුල භාවයයි. චින්තාමාණික්‍යයක්, භද්‍රඝටයක් වැනිවූ පූජාවලි ග්‍රන්ථය පාඨකයාගේ අභිරුචිය පුන පුනා ඇතිකරයි. මුහුණ වරක් හාස්‍ය යෙන්ද, වරක් කඳුළු වලින්ද යුක්ත කරයි.

මට සිලුටු බසින් රචිත මේ ග්‍රන්ථය ශාස්ත්‍රය අතින් ද ඉමහත් අභිවෘද්ධියක් සිදු කරයි. මෙ ග්‍රන්ථය ලත් රජතුමා දෙවන රාජ්‍ය ලාභයක් මෙන් කල්පනා කෙළේය. සිංහලු රාජ කෘත්‍යයක් තවත්වා

මසක් මුළුල්ලෙහිම ක්‍ෂණ ක්‍රීඩාවෙහි යෙදුනේය. සිය බිසොවුන් ලවා මඟුලැතුව නංවා මහත් පෙළහරින් නගරය ප්‍රදක්ෂිණා කරවිය.

ප්‍රමාණය මෙහි ප්‍රමාණය පරිච්ඡේද සූතිසකින් පරිමිතය. ග්‍රන්ථ වශයෙන් සුවිසි දහසකි. බණවර වශයෙන් සයානුවකි. අක්ෂර වශයෙන් සත්ලක්ෂ අට සැට දහසක් වෙති.

1. **පරිච්ඡේදය:**- මහා සඞ්ග්‍රහ පූජා සූතිසකින්ද,
2. **පරිච්ඡේදය:**- අට ලක්ෂ අසූ දහස් එක්සාළිසක් අභිනීහාර මඟුල් පූජාවන් ගෙන්ද,
3. **පරිච්ඡේදය:**- පස් පණස් ලක්ෂ විසි දහසක් සාමාන්‍ය විවරණ පූජාවන් ගෙන්ද,
4. **පරිච්ඡේදය:**- බොධි සම්භාර තෙළෙස් පූජාවකින්ද.
5. **පරිච්ඡේදය:**- සුසාළිසක් ජාති භෙද මහා පූජාවන්ගෙන්ද,
6. **පරිච්ඡේදය:**- සුවිස්සක් මහා ජාතිභෙද පූජාවන්ගෙන්ද,
7. **පරිච්ඡේදය:**- දෙ ලක්ෂ සතළිස් දහසක් සාධූකාර පූජාවන් ගෙන්ද,
8. **පරිච්ඡේදය:**- දෙතිසක් මහා පූර්ව නිමිති පූජාවෙන්ද,
9. **පරිච්ඡේදය:**- දෙලක්ෂ සතළිස් දහස් දෙතිසක් ප්‍රසව මඞ්ගල පූජාවන්ගෙන්ද
10. **පරිච්ඡේදය:**- පන් ලක්ෂ දෙළොස් දහසක් මහාබිනික්මන් පූජාවන් ගෙන්ද,
11. **පරිච්ඡේදය:**- සාර ලක්ෂ විසිදහස් තෙසාළිසක් බොධිමණ්ඩල පූජාවන්ගෙන්ද,
12. **පරිච්ඡේදය:**- දෙලක්ෂ සතළිස් දහසක් බ්‍රහ්මාරාධනා පූජාවන්ගෙන්ද,
13. **පරිච්ඡේදය:**- දෙලක්ෂ සතළිස් දහස් දෙතිසක් දම්සක් පැවතුම් පූජාවන්ගෙන්ද,
14. **පරිච්ඡේදය:**- දෙලක්ෂ පණස් දහස් තුන්සිය සූසාළිසක් වෙළුවනාරාම පූජාවන් ගෙන්ද,
15. **පරිච්ඡේදය:**- සාරලක්ෂ විසිදහස් එකක් නිග්‍රොධාරාම පූජාවන්ගෙන්ද,
16. **පරිච්ඡේදය:**- සඞ්ඛ්‍යාපථාතික්‍රාන්ත මහා පූජාවන්ගෙන්ද,
17. **පරිච්ඡේදය:**- දෙසිය සැත්තෑවක් ජේතවනාරාම පූජාවන් ගෙන්ද,
18. **පරිච්ඡේදය:**- එක්සිය විස්සක් පූර්වාරාම පූජාවන්ගෙන්ද,

19 පරිච්ඡේදය:- අප්‍රමාණ ප්‍රතිපත්ති පූජාවෙන්ද,

20. පරිච්ඡේදය:- අසදෘශ දාන පූජාවෙන්ද,

21. පරිච්ඡේදය:- සත් දහස් පන්සිය තිසක් ගංගාරොහණ පූජාවන්ගෙන්ද,

22. පරිච්ඡේදය:- අසූ දහසක් දිව්‍යරාජ පූජාවෙන්ද

23 පරිච්ඡේදය.- දෙලක්‍ෂ සතළිස් දහස් එක්සිය තෙයාසූවක් යමක ප්‍රාතිහාර්‍ය්‍ය පූජාවෙන්ද,

24. පරිච්ඡේදය:- දෙකෙළ සොළොස් ලක්‍ෂයක් පාණ්ඩුකම්බලාසන පූජාවන්ගෙන්ද,

25. පරිච්ඡේදය:- දෙලක්‍ෂ සැත්තෑ දහස් පන්තිසක් දෙවොරොහණ පූජාවන්ගෙන්ද,

26. පරිච්ඡේදය:- අප්‍රමාණ භික්‍ෂුණී ප්‍රතිපත්ති පූජාවෙන්ද,

27 පරිච්ඡේදය:- මහා ප්‍රජාපතිඅද්භූත මහා පූජාවෙන්ද,

28 පරිච්ඡේදය:- ජීවකාරාම පූජාවෙන්ද,

29. පරිච්ඡේදය:- දෙවදත්තාවතාර සම මෙත් පූජාවෙන්ද,

30. පරිච්ඡේදය:- අජාසත් දමනාදි පූජාවෙන්ද,

31. පරිච්ඡේදය:- යශොධරා ප්‍රාතිහාර්‍ය්‍ය ප්‍රතිපත්ති පූජාවෙන්ද,

32. පරිච්ඡේදය:- තුදුස් ලක්‍ෂ සත් පණස් දහස් නවසිය සයානුවක් ධර්මාශොක පූජාවන්ගෙන්ද,

33. පරිච්ඡේදය:- සුවහස් ගණන් මිහිඳු මාහිමි ප්‍රතිපත්ති පූජාවෙන්ද,

34. පරිච්ඡේදය:- එක් තෙපණසක් රජුන්ගේ උද්දෙසික පූජාවන්ගෙන් ද යුක්තවේ.

කොළඹ වේල්ල වීදියේ රත්නාකර පොත් වෙළඳ හල හිමි ජී. පී. බී. ගේබ්‍රියෙල් මහතාගේ නියමය පරිදි ඒ මහතාගේ පුත්‍ර ජී. පී. බී. සේනාරත්න මහතා පූජාවලි ග්‍රන්ථය සංශොධනය කර දෙන ලෙස අපට ආරාධනා කෙළේය.

අපේ සංස්කරණය විද්‍යොදය පිරිවෙණේ අධ්‍යාපනය පිළිබඳ කාර්‍ය්‍යයන්හි නිරත වුවත් මේ කාර්‍ය්‍යයෙහිද යෙදුනෙමු. එසේම ඇතැම් සංස්කරණයන්හි මුල් ග්‍රන්ථ නත්‍තව්‍ය පසෙක දමා තිබුනු බවක් පෙණුනු හෙයින් මුල් පොත යම්තම්න්

වත් ආරක්ෂාවන පරිදි අපේ සංස්කරණය සකස් වී ඇත. ඇතැම් තන්හි ප්‍රමාදයෙන් වූ දොෂ ස්ථානද තිබිය හැකිය. දෙමසක පමණ කාලයක් තුළ දී මේ පොත මුද්‍රණවාරයෙන් බිහි කරවන්ට ඒ මහ තුන්ගේ අදහස වූ හෙයින් සුහුසුලුව මෙහි සංශොධන කාය්‍ර්‍යය නිම කෙළෙමු.

රත්නාකර මුද්‍රණාලයායත්ත කාය්‍ර්‍ය මණ්ඩලයෙහි මහතුන්ටද, එසේම ශොධ්‍ය පත්‍ර කියවීමේදී අපට අතිශයින් උපකාර වූ බද්දෙගම ආනන්ද පොඩි උන්නාන්සේටද අපේ සතුතිය හිමි විය යුතු ය.

පණ්ඩිත වෙරගොඩ අමරමොලි
නායක ස්ථවිර.

2497
——
1953
10, 7 දින,

විද්‍යොදය පිරිවෙණේ දී ය.

අනුක්‍රමණිකා

1. පූජාසංග්‍රහ කථා	**පිට**
නවපද විභාගය	1
සද්ධර්මය අද්භූත බව	5
බුදුගුණ අචින්ත්‍යය බව	7
සැදැකිත් රජු දහම් අසා ලක්රජය පිදීම	8
පූජාවලිය ආරම්භයට හේතුව	12
ආමිස ප්‍රතිපත්ති පූජා විස්තරය	13
2. අභිනීහාර මඟුල් පූජා කථා	17
අටමහා ලෝවැඩ	17
සුමේධ තාපස කථාව	19
ප්‍රථම විවරණය ලැබීම	24
3. විවරණ මඟුල් පූජා කථා	27
4. බෝධි සම්භාර පූජා කථා	45
දෙවප්‍රතිරාජ මහ ඇමතිතුමන්ගේ ආරාධනය	45
පාරමිතාවන් පිළිබඳ තොරතුරු	46
5. ප්‍රථම ජාතිභෙද පූජා කථා	61
එම ජාතිවලදී බුදුන් පිදූ පරිදි	62
6. ද්විතීය ජාතිභෙද පූජා කථා	83
කට්ඨහාරි ජාතකාදියෙදී කළ පූජා	83
අටවැදෑරුම් තපස්කම්	86
අකීර්ති ආදි ජාතකවලදී කළ පූජා	88
7. සාධුනාද පූජා කථා	102
පස්මහා කෝලාහල	102
පඤ්චමහා විලෝකනය	106
මහා සම්මත වංශය	109
8 ප්‍රතිසන්ධි පූජා කථා	125
බෝසතුන් මහාමායා දේවීන් කුස පිළිසිඳගැනීම	125
මහාමායා දේවිය දුටු සිහින	126
දෙතිස් නිමිති	127

9 ප්‍රසව මඞ්ගල පූජා කථා 131

බෝසතුන් පිළිසිඳ ගැණීම 131
මවුපියන් දක්නා අදහස 132
බෝසතුන් බිහිවීම 133
දිව්‍ය බ්‍රහ්මාදීන් පිළිගෙණ පූජා කිරීම 133

10. මහාභිනිෂ්ක්‍රමණ පූජා කථා 136

කුමරු කිඹුල්වත් පුරයට වැඩමවාගෙණ යාම 136
සමග උපන් වස්තූන් 137
කාලදේවල තාපසයන් පැමිණීම 137
මගුල් ලකුණු 139
දෙතිස් මහා පුරුෂ ලක්ෂණ 141
අසූ අනු ලකුණු 142
කාලදේවල තාපසයන් සිනාවීම හා හැඬීම 143
නාලක කුමරුගේ පැවිද්ද 144
බුදුවන බැව් නිශ්චය කිරීම 145
කිරි මවුන් තේරීම 146
ආනාපාන සතිය වැඩීම 148
රකවල් තබා ප්‍රාසාද කරවා දීම 149
රාජ්‍යය පාවාදීම 150
අෂ්ටාදශ මහා ශිල්ප සුසැට කලා හා ධනුශ්ශිල්ප 151
සතර පෙර නිමිති දැකීම 152
අන්තිම ගිහි ඇඳුමෙන් සැරසීම 153
රහල් කුමරු ඉපදීම 155
කිසාගෝතමී නිබ්බුතපද කීම 155
මහණවන්ට පිටත්ව යාම 156
වසවත්මරුගේ පැමිණීම 159
දෙව් බඹුන්ගේ පූජා 160

11. බෝධිමණ්ඩල පූජා කථා 162

බෝසතුන් මහණවීම 162
අනුපිය නම් අඹවනයෙහි විසීම 165
රජගහනුවර පිඬු හැසිරීම 166
දුෂ්කර ක්‍රියා කිරීම 170
පංච මහා ස්වප්නය 173
කිරිපිඬු පිළිගැන්වීම 175

කුසතණ පිළිගැන්වීම	178
මරුන් පැරදවීම	179
මහී ගර්ජන නම් පූජාව	189
12. සාධුනාද පූජා කථා	191
අනිමිසලෝචන පූජාව	192
සද්ධම් නමැති රත්න සමමගීතය	193
මාරදුහිතෘන්ගේ පැමිණීම	196
මුචලින්ද රාජායතන මූලයන්හි වැඩ සිටීම	204
සක්දෙව්දු අමා අරළු පිළිගැන්වීම	205
වෙළඳ දෙබෑයන් මී පිඬු පිළිගැන්වීම	205
කේශ ධාතු කරඬුව ගිරිහඬු වෙහෙර තැන්පත් කිරීම	206
දහම් දෙසීමෙහි මන්දෝත්සාහී වීම	206
මහබඹුගේ ආරාධනය	207
13. ඉසිපතනාරාම පූජා කථා	208
ඉසිපතනයට වැඩමවීම	208
උපක ආජීවකයන් හමුවීම	209
පස්වග මහණුන් හමුවීම	214
ධම්සක් පැවැත් වීම	217
14. වේළුවනාරාම පූජා කථා	221
පස්වග මහණුන්ගේ මාර්ගඵලාධිගමය	221
යස කුලපුත්‍රාදීන්ගේ පැවිද්ද	222
තෙරුවන් උපන් බැව් පතළ කිරීම	224
භද්දවග්ගිය කුමරුන්ගේ පැවිද්ද	225
තුන්බෑ ජටිල දමනය	226
බිම්සර රජු කරා වැඩමවීම	234
රුජා නම් රජ දූව	236
සක්දෙව්රජුගේ පැමිණීම	244
කලන්දකනිවාපය	246
වේළුවනය පිළිගැන්වීම	247
ඥාති ප්‍රේතයන්ගේ පැමිණීම	248
අගසවු දෙනම හමුවීම	250
15. නිග්‍රෝධාරාම පූජා කථා	260
සුදොවුන් රජු දූතයන් යැවීම	260
කාළුදායි තෙරුන්ගේ මගවැණුම	262
කිඹුල්වතට නික්මීම	263
නිග්‍රෝධාරාම පූජාව	265

ඤාතීන්ගේ මාන මර්දනය කිරීම 266
බුද්ධ වංශ දෙශනාව 272
අනාගත වංශ දෙශනා 276

16 ශික්‍ෂාවතාදී අද්භූත පූජා කථා 289

කිඹුල්වත් පුර පිඬු පිණිස හැසිරීම 289
සවණක් රැස් විහිදීම 291
යශොධරා දෙවිය පුතුට බුදුන් හැඳින්වීම 297
සුදොවුන් රජුගේ නොමනාපය 298
යශොධරාවන් පෙරද පක්‍ෂපාතව ආ බව 300
බුදුහු යශොධරාවන්ගේ ගෙට වැඩමවීම 302
ඒ ඒ ජාතකවලදී පක්‍ෂපාත බැව් දෙසීම 304
නන්ද කුමරුගේ පැවිද්ද 314
රහල් කුමරු 317
ඔහුගේ පැවිදිවීම ගැණ ශෝකයට පත් සුදොවුන් රජුට දහම් දෙසීම 327

17. ජේතවනාරාම පූජා කථා 331

අනේපිඬු සිටුතුමා බුදු රදුන් දකින්ට යාම 331
ජේත රජකුමරුගේ උයන මිලදී ගැණීම 337
ජේතවන මහා විහාරය පිදීම 339
එහිදී බුදුරදුන් දහම් දෙසීම 342

18. පූර්වාරාම පූජා කථා 344

සත් හැවිරිදි විශාඛාවන් 344
ධනංජය සිටානන් 345
පඤ්ච කල්‍යාණය 346
විශාඛාවන් සරණ යිවිස ගැණීම 350
මේලපලඳනාව 353
විශාඛාවන් පිළිබඳ නඩු විසඳීම 359
මිගාර සිටානන්ට දහම් දෙසීම 362
විශාඛාවන් ලත් අටවරය 365
පූර්වාරාමය 367

19. ප්‍රතිපත්ති පූජා කථා 370

රාහු අසුරිඳු 370
අනුරුද්ධ කුමාරයා 372
අනුරුද්ධාදීන්ගේ පැවිදිවීම 382
සුමන සාමණේරයන් හා රජු දමනය කිරීම 384

20 අසදෘශ මහාදාන පූජා කථා	393
ආනන්ද ස්ථවිරයන් වහන්සේ උපස්ථායක තනතුර භාරගැනීම	393
ආනන්ද තෙරුන් පිළිබඳ ජාතක දේශනා	395
ආනන්ද බෝධි පූජා කථා	400
බන්ධුල මල්ලිකාවෝ	404
කොසොල් රජුගේ බන්ධු සම්බන්ධය	411
කෝසල මල්ලිකාවෝ	414
උත්පලගන්ධ සිටාණන් කළ ප්‍රතිපත්ති පූජා	418
ආනන්ද මහ තෙරුන් ලද සාටක පූජා	421
ස්ත්‍රීන් ගැබ් ගැනීම	423
අසදෘශ මහාදානය	426
අංගුලිමාල තෙරුන්ගේ පූර්වකුශලය	432
21. ගංගාරෝහණ පූජා කථා	434
ලිච්ඡවීන්ගේ උත්පත්ති කථා	434
විශාලා මහ නුවර උපන් ත්‍රිවිධ භය සංසිඳ වීම	437
දිව්‍ය නාගාදීන් කළ ගංගාරෝහණ පූජාව	444
පූර්වකුශලය දේශනා කිරීම	446
22. දිව්‍යරාජ පූජා කථා	453
පෝ දවස්හි දිව්‍ය සභාවට දෙවියන් රැස්වීමෙහි විභාග	459
සූරිය වච්චසාව	460
වස්වසා පවරණ දා	461
සක්දෙව්රජ බුදුන් කරා පැමිණීම	467
23. යමක ප්‍රාතිහාර්ය පූජා කථා	478
ෂට් ශාස්තෘන්ගේ උත්පත්ති කථා	478
නිගණ්ඨනාථ පුත්‍රයා පාත්‍රය ගන්ට නැත්කිරීම	482
පිණ්ඩොල භාරද්වාජ තෙරුන් පෙළහර පෑම	484
ගණ්ඩබබ අඹ ගස	493
තීර්ථකයන්ගේ පෙළහර	496
පූරණ කාශ්‍යපයන්ගේ මරණය	498
පෙළහර පාන්ට අවසර ඉල්ලීම	500
බුදුහු යමා මහ පෙළහර දක්වීම	504
24 පාණ්ඩුකම්බලාසන පූජා කථා	508
දෙව්ලෝ බුදුහු විජම්බණ දෙසන්ට වැඩම වීම	508
චුළු අනාථ පිණ්ඩික සිටුහුගේ උපස්ථානය	512
දානානිශංස කථා	516
විජම් බණ දෙසීම	519

සැරියුත් තෙරුන්ට විජම් බණ කියාදීම 523
මාතෘ දිව්‍යපුත්‍රයා සෝවාන්වීම 524
මවු උවටැන් පිළිබඳ ජාතක දෙශනා 525

25. දේවෝරෝහණ පූජා කථා 529

මුගලන් මහ තෙරුන් තව්තිසා දෙව්ලොවට වැඩමවීම 529
බුදුන් දෙව්ලොවින් සකස් පුර දොරට බැසීම 533
පෙර බුදුවරුන් පා වැදි පරිදි 536
බුදුබැව් පැතුවන්ට එය සිදුවන පරිදි 538

26 ප්‍රතිපත්ති පූජා කථා 542

මහා ප්‍රජාපතී ගෝතමී චරිතය 542
ශාක්‍ය කෝලිය දෙනුවර වාසීන්ගේ දිය දබරය 544
භික්ෂුණී ශාසනය 548
මෙහෙණින්නන්ගේ සතුති පූජා 558

27. අදහන පූජා කථා 563

මහා ප්‍රජාපතී ගොතමීන් පෙළහර පෑම 563
ගොතමීන්ට පිරිනිවන්ට අවසර දීම 584
මහා ප්‍රජාපතීන්ගේ පරිනිර්වාණය හා ආදාහනය 586

28. ජීවකාරාම පූජා කථා 588

ජීවක කථාව 588
ජීවකයන්ගේ වෛද්‍යය නිමවීම 592
ජීවකයන්ගේ පළමු වෙදකම 593
දෙවන වෙදකම 595
තුන්වන වෙදකම 597
සිවුවන වෙදකම 599
චණ්ඩපජ්ජෝත රජුට කළ පිළියම 600
සෝණ සිටාණෝ 606
උතුරුකුරු දිවයින විස්තර කථාව 610
සීවෙය්‍ය සාටක පූජාව 614
ගැහැවි චීවරය පිළිගැණීමට නියම කිරීම 614
අඹවනය බුදුන්ට පිදීම 616

29. සමමෙන් නොයෙක් ජාතිභේද පූජා කථා 617

දෙව්දතුන් වයිර බැඳීම 617
දෙව්දත් සසර දී බෝසතුන්ට වයිර කිරීම 621
සසරදී දෙව්දතුන් මහපොළොව ගිලී පරිදි 630
අජාසත් කුමරු 634

දෙව්දතුන් දම්සෙනෙවිවුරය ඉල්ලීම 637
අජාසත් කුමරු පියරජු මැරවීම 638
දෙව්දත්තෙර දුනුවායන් යෙදීම 642
දෙව්දත් බුදුන්ට ගලක් පෙරළීම 644
..ාලාගිරි ඇතු මෙහෙයවීම 646
..ව්දත් ඉල්ලූ පස් මහ වරය 653
..ඝ භෙද කර්මය කිරීම 658
දෙව්දත්හුගේ පොළොව ගැලීම 660
මහපොළොව ගැලීගිය පස්දෙනා 662

30. ජීවිතාදි පූජා කථා 663

අජාසත් රජු බුදුන් දකින්ට යාම 663
අෂට නිෂෙධ දෙශනන් 670
අජාසත් රජු පැන විචාරීම 671
විජිතසේන නම් පසේ බුදුන් 674

31. ප්‍රාතිහාර්‍ය්‍යාදි ප්‍රතිපත්ති පූජා කථා 675

යශෝධරා දෙවිය 675
යශෝධරා දෙවියගේ පැවිද්ද 679
යශොධරා මෙහෙණි 681
පෙළහර පෑම 690
පූජී පක්ෂපාත වූ ජාතක දෙශනා 696
සප්තවිධ භාර්‍ය්‍යාවෝ 700
යශොධරාවන් සූවිසි බුදුවරයන්ගෙන් ලත් විවරණ කථා 706
පිරිනිවණට අවසර දීම 715
පිරිනිවන් පෑම 717

32 උද්දෙසික පූජා කථා 718

බුද්ධකාරක ධර්‍ම 718
බුදුරදුන් විසූ සතලිස් පස් වස 719
බුද්ධ පරිනිර්වාණය 720
කසුප් තෙරුන්ගේ පා වැඳුම 722
අජාසත් රජුට බුදුන් පිරිනිවි බැව් දන්වීම 725
ධාතු බෙදීම 727
දස ථූප 727
ත්‍රිවිධ පරිනිර්වාණ 728
ප්‍රථම සඞ්ගායනා 738
..තීය සඞ්ගායනා 739
..තීය සඞ්ගායනා 740

33 සම්‍යක් ප්‍රතිපත්ති පූජා කථා 746

කකුසන්ධාදි තුන් බුදුවරුන් ලක්දිව් වැඩමවීම	746
ගෞතම බුදුන්ගේ ප්‍රථම ලඞ්කාගමන	750
,, ද්විතීය ලඞ්කාගමන	753
,, තෘතීය ලඞ්කාගමන	754
අනුරාධපුර උත්පත්තිය	756
ප්‍රත්‍යන්ත දේශයන්හි බුදු සසුන් පිහිටුවීම	759
ලක්දිව බුදුසසුන පිහිටුවීම	762

34 උද්දේසික පූජා 768

සිංහල රාජාවලියෙහි එක්සිය තෙපණස් රජහු	777
දෙවන පැතිස් රජු පටන් මහා වංශයේ රජුන් කළ පූජා	770
චූල වංශයේ රජුන් කළ පූජා	777
විජයබා රජහු	785
ii පැරකුම්බා රජහු	787
පුත් කුමාරවරුන්ට රාජ්‍යය භාර දීම	797
බෝසත් විජයබා රජුගේ පින්කම්	800
චන්ද්‍රභානු හා දෙවන යුද්ධය	802
පූජාවලිය පිළිගැන්වීම හා පෙළහර කිරීම	806

මෛරගේ සුමඞ්ගල මහා ස්ථවිර
මිහිඳු ආරණ්‍යය
අනුරාධපුර.
A 10

පූජාවලිය

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

පළමු වන පරිච්ඡේදය.

1. පූජා සංග්‍රහ කථා.

ඉති'පි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති.

සො භගවා බුද්ධො- ඒ භාග්‍යවත් වූ බුදුරජාණන්වහන්සේ; ඉති පි අරහං- මුළුලෝ වැසියන් විසින් කරණලද ආමිස පූජා-ප්‍රතිපත්ති පූජාවට සුදුසු හෙයින් ද, තමන් රහසත් පව් නො කරණ හෙයින් ද, කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින්ද, කෙලෙස් නමැති සතුරන් නැසූ හෙයින් ද, අවිජ්ජා-සංඛාර නමැති නාභි ඇති, ජරා මරණ නමැති නිම්වලලු ඇති, ආශ්‍රය සමුදය නමැති අකුරෙන් විද, තුන් ලෝ නමැති රියෙහි යොදන ලද, සංසාර නමැති චක්‍රයාගේ කුශලාකුශලකර්ම නමැති අර බෝමැඩදී ම සීල නමැති පොළොවෙහි, වීර්‍ය්‍ය නමැති පයින් සිට ශ්‍රද්ධා නමැති හස්තයෙන් ගත්, කර්මක්ෂයකරඥාන නමැති එරසු වෙන් පලා, සුණුවිසුණුකොට මූලොච්ඡෙදන කළ හෙයින් ද යි යන මේ ආදී අර්ථයෙනු දු අර්හත් නම් වනසේක.

එසේ හෙයින් කියනලදී:

> ආරකත්තා හතත්තා ච-කිලෙසාරීන සො මුනි
> හතසංසාර චක්කාරො-පච්චයාදීනචාරහො
> න රහො කරොති පාපානි-අරහං තෙන පවුච්චති'ති.

සො භගවා බුද්ධො- ඒ භාග්‍යවත් වූ බුදුරජාණන්වහන්සේ, ඉතිපි සම්මා සම්බුද්ධො:- සංස්කාරධර්මයන් සක්සා දත් හෙයිනු දු, විකාර ධර්මයන් විශෙෂයෙන් දත්හෙයිනු දු, ලක්ෂණ ධර්මයන් සංලක්ෂණය කොට දත් හෙයිනු දු, නිර්වාණ ධර්මයන් සර්වප්‍රකාරයෙන්

දත් හෙයිනු ද, ප්‍රඥප්ති ධර්මයන් ප්‍රත්‍යක්‍ෂකොට දත් හෙයිනු ද, ආය්‍යීසත්‍යයන් විශෙෂයෙන් දත් හෙයිනු ද, මෙසේ සියලු දතමනා ධර්මයන් නිමවා දත් හෙයිනු ද, භාවිත කළමනා ධර්මයන් විශෙෂයෙන් භාවිතකළ හෙයිනු ද, දුරුකළමනා ධර්මයන් දුරින් ම දුරු කළ හෙයිනු ද, සියලු සත්ත්වයන්ට ද කරතලාමලක ක්‍රමයෙන් අව බොධකරවූ හෙයින් ද යි යනාදි නානාවිධ වූ අර්ථයෙන් **සම්මා සම්බුද්ධ** නම් වනසේක.

වදාළේ මැනෝ:

> අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං-භාවෙතබ්බඤ්ච භාවිතං,
> පහාතබ්බං පහීණමෙම-තස්මා බුද්ධොස්මි බ්‍රාහමණ යි.

සො භගවා බුද්ධො- ඒ භාග්‍යවත් වූ බුදුරජානන්වහන්සේ; **ඉතිපි විජ්ජාචරණසම්පන්නො**:- පෙර විසූ කඳ පිළිවෙළ දැන්ම, දිව ඇස, ආශ්‍රවයන් නැසීම ය යි යන මේ ත්‍රිවිද්‍යායෙන් යෙදුනු හෙයින් ද, විදර්ශනා ය, මනොමය ඍද්ධි ය, ඍද්ධිප්‍රභෙද ය, දිව්‍ය ශ්‍රොත්‍ර ය, පරසිත් දැන්ම ය, පූර්වේනිවාස ය, දිව්‍යචක්‍ෂුෂ ය, ආශ්‍රවක්‍ෂ ය ය යන මේ අෂට විද්‍යායෙන් යෙදුනු හෙයින් ද; ප්‍රාතිමොක්‍ෂ සංවරශීල ය, ඉන්ද්‍රිය සංවරශීල ය, භොජනයෙහි මාත්‍රඥතා ය, නිදි වර්ජිත කිරීම ය, ශ්‍රද්ධා ය, හ්‍රී ය, ඔත්තප්ප ය, බහුශ්‍රැතත්ත්ව ය, වීය්‍යී ය, සමෘති ය, ප්‍රඥ ය, සතර රූපාවචර ධ්‍යාන ය යන මේ පසළොස් චරණ ධර්මයෙන් යෙදුනු හෙයින් ද යි යන මේ ආදි අර්ථයෙනු ද **විජ්ජාචරණ සම්පන්න** නම් වන සේක.

සො භගවා බුද්ධො- ඒ භාග්‍යවත් වූ බුදුරජානන්වහන්සේ, **ඉතිපි සුගතො**- සුන්දර වූ ගමන් ඇති හෙයිනු ද, සුන්දර වූ ශරීර ඇති හෙයිනු ද, සුන්දර වූ දෙශනා විලාස ඇති හෙයිනු ද, සුන්දර වූ නිවන් භූමියට සුන්දර ව ගියහෙයින් ද යි යන මේ ආදි අර්ථයෙනු ද **සුගත** නම් වනසේක.

සො භගවා බුද්ධො- ඒ භාග්‍යවත් වූ බුදුරජානන්වහන්සේ, **ඉතිපි ලොකවිදූ**- සත්ත්වලොක ය, අවකාශලොකය, සංස්කාර ලොක ය, කාමලොක ය, රූපලොක ය, අරූපලොක ය, සහශ්‍රී ලොක ය, දශසහශ්‍රීලොක ය, කොටි ශතසහශ්‍රී ලොක ය යනාදි ලොකයන් නිමවා දත් හෙයින් ද යි යන මේ ආදී අර්ථයෙනු ද **ලොකවිදූ** නම් වනසේක.

සො භගවා බුද්ධො- ඒ භාග්‍යවත් වූ බුදුරජානන්වහන්සේ; ඉතිʼපි අනුත්තරො- ශීලයෙන් ද, සමාධියෙන් ද, ප්‍රඥාදියෙන් [1] ද, විමුක්තියෙන් ද, විමුක්තිඥානයෙන් ද, මුළුලොව තමන්ට වඩා අතික් උතුම් කෙණෙකු නැති හෙයින් ද යි යන මේ ආදී අර්ථයෙනු දූ අනුත්තර නම් වනසේක.

සො භගවා බුද්ධො- ඒ භාග්‍යවත් වූ බුදුරජානන්වහන්සේ; ඉතිʼපි පුරිසදම්මසාරථි- බකබ්‍රහම, ආලවක, අංගුලිමාල, ශක්‍ර, සභිය, සුචිරෝම, ඛරරෝම, සච්චක, නන්‍දොපනන්‍දාදී දම්‍ය පුරුෂයන් දමා සරණසීලයෙහි පිහිටුවා වැඩ දී හික්මවනලද හෙයින් ද යි යන මේ ආදී අර්ථයෙනු දූ පුරිසදම්මසාරථි නම් වනසේක.

සො භගවා බුද්ධො- ඒ භාග්‍යවත් වූ බුදුරජානන්වහන්සේ; ඉතිʼපි දෙවමනුස්සානං සත්ථා- දෙවියන්ට ද, මනුෂ්‍යයන්ට ද, මෙලොවින් ද, පරලොවින් ද, අනුශාසනාකොට සංසාරදුගීයෙන් ගොඩනගා නිර්වාණක්ෂෙමභූමියට පමුණුවන හෙයින් ද යි යන මේ ආදී අර්ථයෙනු දූ ශාස්තෘ නම් වනසේක.

සො භගවා බුද්ධො- ඒ භාග්‍යවත් වූ බුදුරජානන්වහන්සේ; ඉතිʼපි භගවා- දාන ශීලාදී සමතිස්සත් පාරමිතාවෙන් ජනිත වූ භාග්‍ය ඇති හෙයින් ද; රාගාදී කෙලෙසුන් භග්නකළ හෙයින් ද යි යන මේ ආදී අර්ථයෙනු දූ භගවත් නම් වනසේක.

මෙහි 'භගවත්' යනු දෙකක් හා "බුද්ධ' යනු දෙකක් හා අතික් සත්පදය හා එකොළොස්පදය අරහාදි ගුණ නවයකට බෙදුනු හෙයින් පළමුවන භගවත් යන්න හා අන්තයෙහි කී බුද්ධ යන්න ගෙණ 'සො භගවා බුද්ධො' යි කියා බිඳ නවපදයෙහි අර්ථ කථනය කළහ යි දතයුතු.

එහි නවපදවිභාගය දක්වූ පූර්වාර්ථ කථාචාරීන් විසින් මෙසේ කියනලදී

අරහං අරහොʼති නාමෙන-අරහො පාපං න කාරයෙ,
අරහත්ත ඵලං පත්තො-අරහං නාම තෙ නමො.

සම්මාසම්බුද්ධ ඤාණෙන-සම්මාසම්බුද්ධ දෙසනා,
සම්මාසම්බුද්ධ ලොකස්මිං-සම්මාසම්බුද්ධ තෙ නමො.

විජ්ජාචරණ සම්පන්නො-තස්ස විජ්ජා පකාසිතා,
අතීතානාගතුප්පන්නා-විජ්ජාචරණ තෙ නමො.

---

1 සමිති ප්‍රඥායෙන් ද

සුගතො සුගතනතානං-සුගතො සුන්‍දරමපි ච,
නිබ්බානං සුගතිං යනති-සුගතො නාම තෙ නමො.

ලොකවිදූති නාමෙන-අතීතානාගතෙ විදූ,
සඞ්ඛාර සතතමොකාසෙ-ලොකවිදූ නාම තෙ නමො.

අනුතතරෙ ඤාණ සීලෙන-යො ලොකසස අනුතතරො,
අනුතතරෙ පූජ ලොකසමිං-තං නමසසාමි අනුතතරෙ.

සාරථි සාරථි දෙවා-යො ලොකසස සුසාරථි,
සාරථි පූජ ලොකසමිං-තං නමසසාමි සාරථි.

දෙව යකඛ මනුසසානං-ලොකෙ අගග ඵලං දදං,
දදනතං දමයනතානං-පුරිසා ජඤ්ඤ තෙ නමො.

භගවා භගවා යුතෙතා-භගග කිලෙසවාහනො,
භගග.සංසාර මුතතාරෙ-භගවා නම තෙ නමො'යි.

සදෙව්ලොව එකැඟිල්ලෙන් පෑවා සේ, නවමහ බඹලොව නම් මේ ය යි කියා ඉඟි ලා පෑවා සේ, නවඅරහාදී බුදුගුණයෙහි මේ සංක්‍ෂෙපාර්ථ නම. විස්තර වශයෙන් වණත්, එක්සක්වළෙක මිනිසුන් මහමුහුද පැන් ඉස නිමවාලි ය නො හැක්කැ සේ, එක් රජපිරිසක් මහපොළොවෙහි පස් ඇද නිමවාලිය නො හැක්කා සේ, එක් දිවයිනෙක මිනිසුන් මහමෙර ඔසවාලි ය නො හැක්කා සේ, එක් නෙලිතුඩකින් හිමවුගල සොලවාලිය නො හැක්කා සේ, එක් සියොතක්හුගේ පතින් අහස්කුස වසාලි ය නො හැක්කා සේ, එක් සතකු ඇඟිල්ලෙන් ගුවන්කුස මැන නිමවාලි ය නො හැක්කා සේ, එක් රළෙක කුහුඹුවන් ඇත් බඳෙක මස් බිඳකා නිමවාලි ය නො හැක්කා සේ, එක් ගමෙක මිනිසුන් මහගඟ පැන් උකා බී නිමවාලි ය නො හැක්කා සේ, එක් රළෙක ගිරවුන් සුවහස් කිරි ඇති කෙතක කරල් සිඳ නිමවාලි ය නො හැක්කා සේ, එක් සතකු ඇසින් බුදුන් රූ බලා නිමවාලි ය නො හැක්කා සේ, එක් සක්විතිරජපිරිසක් මහමුහුද රුවන් උකා නිමවාලි ය නො හැක්කා සේ, එක්සක්වළෙක මිනිසුන් බුදුන්ගේ සතරමහ නිධාන යෙහි රුවන් උකා නිමවාලි ය නො හැක්කා සේ, මහා මේරුව එක්සිදුහතුකරඬුවකින් සඟවාලි ය නො හැක්කා සේ, මිහිමඬල නිය අස්සේ සඟවාලි ය නො හැක්කා සේ, එක් සත්වයෙකුගේ මුඛයෙන් නබා බුද්ධෝත්පාදයෙක උපන් තුන්ලෙව්හි හැම නිය වතුසු දු බුදුගුණ වණ ත් නිමවාලි ය නො හැක්කේම ය.

කියේ මැනෝ:

සක්කා වෙ තහමඞ්ගුලෙන මිනිතුං සින්ධූදකං බිඤ්ඤුනො,
මෙරුං සාසපභාජනෙ නිදහිතුං භූමිං තබගණනතරෙ.
කාමෙපතුං ධරණීධරං හිමධරං ආනච්චතුලංසුනා,
නො වෙ නාථගුණොදධිමපතරිතුං කෙනා'පි ලොකත්තයෙ.

එසේ හෙයින් සද්ධර්ම සමුද්‍රය සේ අද්භූත වූ ධර්මයන් ඇති යේ ය, කපක් මුළුල්ලෙහි වර්ණනා කොටත් නිමවාලිය නො හැක්කා වූ විස්මය කර වූ ගුණයන් ඇති යේ ය. බඹලොව සේ අචින්ත්‍යය වූ චින්තාවන් ඇති යේ ය රජුන්ගේ රාජ්‍ය පුදවා ගන්නා තරම් අසාධාරණ වූ උපමා ඇති යේ ය. බුදුනු දු අතින් පවා ආදර ලබන තරම් උතුම් වූ මහිම ඇති යේ ය. එහි විභාග වෙන වෙන ම මෙසේ දතයුතු. ඒ සමුද්‍රය තෙම අද්භූත වූ ධර්මයන් අටදෙනෙකුන් විරාජමාන ව දිව්‍ය අසුර නාගයන්ට ක්‍රීඩාමණ්ඩල යැ වි ය. මාගේ බුදුන්ගේ ගුණ මුහුද ද අද්භූත වූ ධර්මයන් අටදෙනෙකුගෙන් විරාජමාන ව ප්‍රඥාවන්ත වූ විශුද්ධරාජයන්ට ක්‍රීඩාමණ්ඩලය වූ මගුල් ගෙයක් සේ වි ය

ඒ කෙසේද? යත්;

ඒ සමුද්‍ර ය කෙළවර පටන්ගෙණ අඟලෙක, වියතෙක, රියනෙක, යටෙක, ඉස්බෙක, ගව්වෙක, යොදනෙක: සියක් යොදනෙක, දහසක් සෙදනෙකැ යි යනාදි වශයෙන් ක්‍රම ක්‍රමයෙන් ගැඹුරු ගැඹුරු ව සුවාසූදහසක් යොදුන් අතිගම්භීර ව කිසිවක් හට අවිෂය ව සිටියේ ය. මාගේ බුදුන්ගේ සද්ධර්ම සාගරය ද ත්‍රිවිධ වූ ශික්ෂා ය, සප්තානුසමෘති ය, අෂ්ටායර්යමාර්ගී ය, ත්‍රයොදශ ධූතගුණ ය, අෂ්ටාදශ විදර්ශනා ය, සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ ය, අටතිස් අරමුණු ය, සමසතළිස් කර්මස්ථාන ය, දෙසිය පණස් මහාශික්ෂා ය යනාදි වශයෙන් ක්‍රම ක්‍රමයෙන් ගැඹුරු ව සුවාසූදහසක් ධර්මස්කන්ධ සංඛ්‍යාවෙකින් අතිගම්භීර ව සුගත් මෙර පැහැර සොභාවමින් සිට ගත මේ **පළමුවන අද්භූත ධර්මය** ය.

තව ද ඒ මහාසමුද්‍රය සුවහස් ගණන් මහරළ දිව වෙලාන්තය ඉක්ම අඟලකුත් යා නො හෙයි. එසේ ම මාගේ බුදුන්ගේ

සද්ධර්ම සාගරයෙහි ශ්‍රාවකගණ නමැති මහරළ පඞ්ක්තීහු, ඔබගේ ශික්ෂාපද නමැති වෙලාන්ත ය ඉක්ම ජීවිතාන්ත ය දක්වා ත් යා නො හෙත්නාහ. මේ දෙවන අද්භුතධර්ම ය ය.

තව ද ඒ මහාසමුද්‍රයෙහි හස්ති, අශ්ව, අහි කුණපාදී කුණප යෙක් වේව යි, කාෂ්ඨ ශෛවාලාදී කසලෙක් වේව යි, මැද රඳුලිය නො දී වේලාන්තයට පහකොට ඇමද ම පිරිසිදු ව තිබෙන්නේ ය. මාගේ බුදුන්ගේ සද්ධර්මසාගරයෙහි ද ශ්‍රාවකගණ නමැති මහරළ පඞ්ක්තීහු කෙලෙස් නමැති කුණපයන් හා පාපපුද්ගල නමැති දණ්ඩශෛවාලයන් ගිහිවෙලාන්තයට පහ කොට ඇමද ම පරිශුද්ධ කරන්නාහු ම ය. මේ තුන්වන අද්භුත ධර්මය ය.

තව ද ඒ මහාසමුද්‍රයට ගඞ්ගා යමුනාදී නානාවිධ නාමයෙන් ප්‍රසිද්ධ වූ නො එක් ගඞ්ගාසමූහයෝ වැද තමතමන්ගේ පූර්වනාම යන් හැර සමුද්‍රනාමයට පැමිණෙන්නාහ. මාගේ බුදුන්ගේ සද්ධර්ම සාගරයට ද ක්ෂත්‍රිය බ්‍රාහමණාදී ප්‍රසිද්ධ වූ චාතුර්වර්ණයෝ ද, අව ශෙෂ වූ චණ්ඩාල පුක්කුසාදී ලාමක වූ නානාකුලජාතීහු ද පැමිණ තමතමන්ගේ පූර්වයෙහි වූ වෙන වෙන ජාති ගොත්‍ර හැර බුද්ධ පුත්‍ර නාමයට පැමිණ උතුම් වන්නාහ. මේ සතර වන අද්භූත වූ ධර්මය ය.

තව ද ඒ මහාසමුද්‍රය කපක් මුලුල්লෙහි වස්නා සත මහා වර්ෂාවෙනු ත් උතුරු වාලි ය නො හැක්ක. වර්ෂශතසහස්‍රයක් වැසි නො වස්නේ වී නමුත් අඟලක් පමණකු ත් අඩු නො වේ ම ය. මාගේ බුදුන්ගේ සද්ධර්මසාගරයෙහි ද අසඞ්ඛ්‍යගණන් මණ්ඩලවල බොහෝ සත්වයන් අමාමහනිවන් දක්වනු ත් පූරණත්වයෙකු ත් නො පැණෙයි. කෙනෙක් සත්වයෝ නො වන ත් ඌනත්වයෙකු ත් නො පැණෙයි. නොහොත් බුද්ධොත්පාදයෙක උපන් කෙනෙක් නියවනනු ත් ඔබගේ ගුණයෙන් සද්ධර්මවර්ෂා කළ ත්, ගුණ මුහුද උතුරුවාලි ය නො හැක්ක, නා නා ලබ්ධිගතුවන් කෙනෙක් උත්සාහ කළ ත්, ඒ ගුණ මුහුද අඩුකොට ලිය නො හැක්ක. එසේ හෙයින් මේ පස්වන අද්භූත ධර්ම ය ය

තව ද ඒ මහාසමුද්‍ර ය සකල කාලයෙහි ම අනික් රසයක් නැති ව එකවිධ වූ ලවණරසයෙන් ම විරාජමාන ය. එහෙයින් ම මාගේ බුදුන්ගේ සද්ධර්මසාගරය ද සර්වාකාරයෙන් අනික් රසයක් නැති ව අමාමහනිවන් රසයෙන් ම හොබනේ ය. ප්‍රේමණීය වී ය. මේ සවන අද්භූත ධර්ම ය ය.

තව ද ඒ මහාසමුද්‍රය මුක්තාමාණික්‍යාදී නානාවිධ වූ රත්න යෙන් සශ්‍රීක වි ය. මාගේ බුදුන්ගේ සද්ධර්මසාගර ය ද සතර සම්‍යක් ප්‍රධාන ය, සතර ඍද්ධිපාද ය, පඤ්චෙන්ද්‍රි ය ය, පඤ්චවිධ වූ බල ය, ෂඩ්අභිඥ ය, සප්ත බොධ්‍යඞ්ග ය, සප්ත ආයර්‍ධන යා අෂ්ටායර්‍ය මාර්ග ය, නවලොකොත්තර ධර්ම ය යනාදී නානාවිධ වූ ධර්මරත්නයෙන් සම්පූර්ණ ව සශ්‍රීක වි ය. ප්‍රේමණීය වි ය. එසේ හෙයින් මේ **සක්වන අද්භුත ධර්ම ය** ය.

තව ද ඒ මහාසමුද්‍රයෙහි තිමිය, තිමිඞ්ගලය, තිමිරපිඞ්ගලය, අජ්ඣාරොහණය, ආනන්දය යනාදී සියලු සියදහස්ගණන් යොදුන් දිග ඇති මහාමත්ස්‍යරාජයන්ගේ විජෘම්භණයෙන් ඉතා හොබ නේ ය. මාගේ බුදුන්ගේ සද්ධර්ම සාගර ය ද ශාරිපුත්‍ර, මෞද්ගල්‍යා යන, ආනන්ද රාහුලාදී මහාශ්‍රාවක රාජයන්ගේ පැලඹීමෙන් ඉතා ම හොබනේ ය. එසේ හෙයින් මේ **අටවැනි වූ අද්භුත ධර්මය** ය.

මෙසේ අද්භූත ධර්මයන් දක්‍ අභිප්‍රසන්න වූ ශ්‍රාවකගණ නමැති දිව්‍යරාජයෝ මාගේ බුදුන්ගේ සද්ධර්මසාගරයට වැද, සිල් නමැති නැව් නැඟී, කර්මස්ථාන නමැති රිටි හා පලුපත් ගෙණ, ශික්‍ෂාපද නමැති තරු ලකුණු බල බලා, ඉන්ද්‍රි ය නමැති රුවල් නගා, නිලකුණු නමැති ගොතින් බැඳ රඳව රඳවා, කරුණා නමැති දිග ඉස ඉස, ප්‍රඥ නමැති හසනයෙන් ධ්‍යාන නමැති ක්‍රීඩා කෙළි කෙළ කෙළ, නිවන් නමැති මහසුව විඳිනාහු ය. මේ ආදී කාරණයෙන් සද්ධර්මය සමුද්‍ර ය බඳු වූ අද්භූත ධර්මයන් ඇති යේ ය යි දතයුතු.

තව ද ඒ සමුද්‍රය නිමවා බැස බලා පී ම සෑද්ධිමතුන්ට විෂය ම ය. මාගේ බුදුන්ගේ සද්ධර්මසාගර ය වනාහි සෑද්ධිමතුන්ට ත් අවිෂ ය මැ යි

කාරණා කිම? යත්;

මේ ලෝකයෙහි ලොවුතුරා බුදුන්ට වඩා සෑද්ධිමත් කෙනෙක් නැත්තාහ. එසේ වූ බුදුකෙනෙකුන් බුදුවූ දවස් පටන් අනිකෙක තො ගෙදී තමන්ගේ ආයුෂ්කල්ප ය මුළුල්ලෙහි එක් බුදුකෙනෙ කුන්ගේ ගුණ මුහුද වැද හලලා ගුණවර්ණනා කරන්හු නම් කප ගෙවේ ම ය. බුදුගුණ නො ගෙවේ මැ යි; මේ මේ කාරණයෙනු දු බුදුගුණ නිමවා වර්ණනකට සෑද්ධිඥන ලදුවන්ට ත් අවිෂය ම යයි දතයුතු.

වදාලේ මැනෝ :-

බුද්ධොපි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං,
කප්පම්පි චෙ අඤ්ඤමභාසමානො;
ඛීයෙථ කප්පො චිර දීඝමන්තරෙ,
වණ්ණො න ඛීයෙථ තථාගතස්ස.

තව ද එක්කලෙක තෙවලා බුදුවදන් දන්නා මහතෙර දෙදෙනෙක් එක් මගෙක යෙති. එයින් පසු ව වඩනා මහා ස්ථවිරයෝ පෙරටුව වඩනා මහතෙරුන්ට තමන් මහනුවණැති බැවි හඟවා කියන්නාහු "ස්වාමීනි ! බුදුගුණ ඉතා බෙහෙව. විස්තර වශයෙන් පොත් සංග්‍රහකරත් හොත් බඹලොව දක්වා පොත් ගොඩවේ දෝ හොයි සිතමි" කිහ. එබස් අසා පෙරටුව වඩනා මහතෙරහු තමන් උන්ට වඩා සියුම් වූ නුවණ ඇතිහෙයින් සිනා පහළ කොට "ඇවැත්නි ! එසේ බුදුගුණ ලඝුකොට කිවූනා බුදුගුණ බොහෝ වුව. බඹලොව උස්තෙනෙක් දෑ" යි වදාළහ. එවේලෙහි පස්සෙහි වඩනා මහතෙරහු බුදුගුණ ලඝුකොට කියවූ නැයි කී බසට භය ඇතිව "ස්වාමීනි ! බුදුන් කෙරෙහි අනාදරයක් නිසා කීයෙම් නොවෙමි. මාගේ නුවණ පමණින් බුදුගුණ දක්විමි. මට ක්‍ෂමාකළමැනවැ"යි කියා මහතෙරුන් ක්‍ෂමා කර වූහ. මෙසේ බුදුගුණ බඹලොව සේ අචින්ත්‍යය ය. බුද්ධධර්මයෝ ද අචින්ත්‍යයහ. මෙසේ ම අචින්ත්‍යය අප්‍රමෙය්‍ය වූ බුදුන් කෙරෙහි ද, ධර්මය කෙරෙහි ද, පහන්වූවානට විපාකයෝ ද අචින්ත්‍යය අප්‍රමෙය්‍ය වූහ යන මේ ආදී කාරණයෙනු දු බුදුගුණ බඹලොව සේ අති උස් වූ චින්තා වක් ඇති සේ ය යි දතයුතු.

වදාලේ මැනෝ:-

එවං අචින්තියා බුද්ධා-බුද්ධධම්මා අචින්තියා,
අචින්තියෙසු පසන්නානං-විපාකො හොති අචින්තියො'ති.

තව ද එක්කලෙක තෙවලා බුදුවදන්හි ඉතා දක්‍ෂ වූ කාළබුද්ධ රක්ඛිත නම් මහාක්‍ෂීණාශ්‍රව ශ්‍රාවක කෙණෙක් අනුරාධපුරනුවර කළුතිඹිරිය මුල වැඩහිඳ, බොහෝ දිව්‍ය මනුෂ්‍යයන්ට කාලකාරාම නම් සූත්‍රයෙකින් රාත්‍රි බණ වදරති. එ දවස් ශ්‍රීලංකාධිපතිවූ සැදුතිස්ස නම් පින්වත් රජෙක් කිසියම් කටයුත්තක එතැන් පත් ව මහතෙරුන් බණ කියන්නා දැක පිරිස් කෙළවර නො පෙණී සිට දූන් බණ සමහර කෙරෙති. දූන් බණ සමහර කෙරෙති බණ සමහරකළ විටෙක මුත් මෙ තැනින් නො යෙමි යි සිතා තුන්යම්

රාත්‍රිය මුලුල්ලෙහි සිටි පිය නො සොල්වා සිට බණ අසා අරුණෝද් ගමන වේලෙහි මහතෙරුන් පන්සිල් දී බණ සමහර කළ කල අනතුයෙහි සිටි රජ්ජුරුවෝ ද පන්සිල් ගෙණ මහත්කොට සාධුකාර දී තමන් එතැන සිටි බැවි හඟවා මහතෙරුන්ට පෙණුනාහ. එ කල මහතෙරහු රජ්ජුරුවන් දැක මහරජ කවර විටක අවුදැ? යි විචාළහ. රජ්ජුරුවෝත් ස්වාමීනි! නුඹවහන්සේ යම් වේලෙක ධර්‍මදෙශනාවට පටන්ගතුයේ වී නම් එ වේලෙහි ම මෙ තැනට ආයෙම් වේ දූයි කීහ. එ වේලෙහි මහතෙරහු විස්මය පත් ව මහරජ! තෙපි ඉතා ම රාජ සුකුමාලය, තුන්යම් රෑ කොසේ නම් සිට කෙසේ සිත එකඟ ව බණ අසාගතුදැ? යි විචාළහ. රජ්ජුරුවෝ ස්වාමීනි ! මේ එක් රාත්‍රියක් තබා නුඹවහන්සේ හා මාගේ හා ආයුෂ්කල්පය මුළුල්ලෙහි ද එසේ වූ බණක් වදරණුයේ වී නම් මෙසේ ම සිට බණ අසම් ම ය. මාගේ ලඹකාවීපය මුළුල් ලෙහි කැවිටි දඹුඅඟක් ඔබාලන තරම් බිමෙකු දූ හිමි නො වන තරම් වෙම්ව යි නුඹ වදාළ බණින් පදයකු ත් පිල්ලකු ත් නො පිරිහෙලා සිත හෙලා ඇසිම්ම ය යි ශපථ කළහ.

එ වේලෙහි මහතෙරහු සාධු ! සාධු ! මහරජ යි රජ්ජුරුවන්ට තුන්යලක් සාධුකාර දුන්හ. සිසාරා සිටි මහපිරිස ද සාධුකාර දී පැන නැංගාහ. දෙවියෝ ද මහරජහට සාධුකාර දුන්හ. ඉක්බිත් තෙන් රජ්ජුරුවෝ ද තම ද මහතෙරුන් වැඳ සිට "ස්වාමීනි ! මෙසේ වූ දහම්නයක් මෙතෙක් දවස් නො ඇසූවිරිමි. බුදුන් දහම් මෙසේ බොහෝදෙයක් බව ත් නො දන්නෙමි. මෙසේ වූ ධර්‍මයක් නිමවා නුඹ කෙසේ ඉගෙණගත්තෙහි ද?' යි විචාළාහ. එ වේලෙහි මහ තෙරහු "මහරජ ! කුමක් කියව් ද? අප බුදුහු තුන්පිටකයෙහි වදාළ පන්සිය පණස් ජාතකදෙශනාවෝ ය, දෙසියඥවානුවක් වස්තුකථා දෙශනාවෝ ය, සතළිස්දහස් පන්සිය පන්සැත්තැවක් පමණ සූත්‍රදෙශනාවෝ ය යි යනාදීන් ඉතා ගහන වන්නාහ. එයින් එක් සූත්‍රයක්හුගේ කිසියම් නයෙක් වේ ද, (ඒ) මා කීයේ, බුදුන් දහම් ඉතා බොහෝ දෙයෙක් වේ දැ'' යි වදාළසේක එ බසට රජ්ජුරුවෝ නැවත මහතෙරුන් වැඳ "එසේ ස්වාමීනි යි! නුඹ වදාළ බණට ත් වඩා තවත් බණ බොහෝදැ"යි කීහ. "බෙහෙව මහරජ!" යි වදාළසේක. "නුඹ වදාළ බණ මද නියාවට ත්, නො වදාළ බණ බොහෝ නියාවට ත් මට උපමා කියා හඟවා වදාළ මැනවැ" යි කීහ.

එ වේලෙහි මහතෙරහු ධර්‍ම ය බොහෝ නියාව නො එක් උපමායෙන් රජ්ජුරුවන්ට හඟවන්නාහු "මහරජ ! සිදුහත්

කරඹුවකින් උකා ගත් සමුද්‍ර ජලය ස්වල්ප වන්නා සේ, අවශෙෂ වූ සමුද්‍රජලය අප්‍රමාණ වන්නා සේ මා විසින් කිවා වූ ධර්මය ස්වල්පයෙක් ම ය. නො කිවා වූ ධර්මය අප්‍රමාණ මැයි. තව ද මහරජ! ලිහිණියක ආකාශයෙහි පියාසර කරණකල ඇගේ පක්ෂයෙන් වැසී ගිය ආකාශය ස්වල්ප වන්නා සේ නො වැසුනා වූ ආකාශය අප්‍රමාණ වන්නා සේ මා විසින් කිවා වූ ධර්මය ස්වල්ප ය. නො කිවාවූ ධර්මය අප්‍රමාණ මැයි. තව ද මහරජ! මහපොළොවින් උපචිකාවක්හුගේ මුඛයෙන් ඬැහැගත් පස්බින්දු ස්වල්ප වන්නා සේ, සෙසු මහපොළොවෙහි පස් අප්‍රමාණ වන්නා සේ, මා මේ සූත්‍රයෙන් නොපට කිවාවූ ධර්මය ස්වල්ප ම ය. නො කිවා වූ ධර්මය අප්‍රමාණ මැයි. තව ද මහරජ! පිපීලිකා මුඛයෙන් ඇත්බඳෙකින් ඬැහැගත්තා වූ මාංසබින්දුව ස්වල්ප වන්නා සේ, අවශෙෂ වූ හස්තිමාංසය අප්‍රමාණ වන්නා සේ, මාගේ මුඛයෙන් කිවා වූ ධර්මය ස්වල්පයෙක් ම ය, නො කිවා වූ ධර්මය අනල්ප වන්නේ ය. තව ද මහරජ! චාතුර්ද්වීපික මහාමෙඝයක් සත්දවසක් ධාරානිපාතයෙන් වස්නා කල කෙතෙක එක් ලියද්දෙක්හි වටුවා වූ වර්‍ෂාව ස්වල්ප වන්නා සේ, සතර මහ දිවයින වසින්නා වූ අවශෙෂ වර්‍ෂාව අප්‍රමාණ වන්නා සේ, මා විසින් කීවාවූ ධර්මය ස්වල්පයෙක් ම ය. මාගේ බුදුන්ගේ මා නො කීවාවූ ධර්මය අප්‍රමාණ මැ යි. තව ද මහරජ! මහගංවතුරකට හිදිකටු මලක් පොවාලූ කල්හි ඒ හිදිකටු මල ගස්සෙහි යන දිය ස්වල්ප වන්නා සේ, උභයභාගයෙන් දිවන මහවතුරු අප්‍රමාණ වන්නා සේ මා දෙසූ ධර්මය ස්වල්ප ය. නො දෙසූ ධර්මය අප්‍රමාණ මැ යි. තව ද මහරජ! දහසක් කිරිය මහ ගැල් කෙත්හි එක් තරලක් කඩා මැඩි ධාන්‍යයෙන් ස්වල්ප වන්නා සේ, අවශෙෂ වූ ධාන්‍යයන් අනල්ප වන්නා සේ, මා කී ධර්මය ස්වල්පයෙක් ම ය. නො කිවාවූ ධර්මය අප්‍රමාණ ය." යනාදීන් නොයෙක් උපමායෙන් රජ්ජුරුවන්ට බුදුන් දහම් බොහෝ පරිදි හැඟවූසේක.

එ වේලෙහි මහතෙරුන්ගේ වාග්ලීලාවෙහි හා ධර්මගම්භීරත්වයෙන් අති ප්‍රසන්නවූ රජ්ජුරුවෝ උපමායෙන් උපමාවෙහි මහතෙරුන්ට නමස්කාරයෙන් වඳින්නාහු පස්වණක් ප්‍රීතීන් පිණමින් සියලඟ ලොමු දැහැ ගන්වමින් අමෘතාභිෂෙකයක් ලදුවා සේ සද්ධර්මාමෘත සන්තොෂයෙන් මත්වූවාහු "ස්වාමීනි, නුඹ අද වදාළ මේ උපමාවට සක්විති රජ වී නම් සත්රුවන් පුදම් ම ය. මුළු දඹදිවට අගරජ වීම් නම් එ දඹදිව පුදම් ම ය. දෙව්රජ වීම් නම් දිව්‍ය රාජ්‍යය ත් පුදම් ම ය. එසේ හෙයින් නුඹ වදාළ උපමාවට තරම්

පූජා වස්තු දූන් මාගේ නැත. එසේ ද වුවත් මාගේ ශක්ති පමණ දුගී පඬුරකින් නුඹට පූජාවක් කෙරෙමි" යි කියා මේ සියක් යොදුන් ලංකාද්වීපය හා සියලු තමන්ගේ දළපුඩු සේසත් ආදි වූ රාජ සම්පත්තිය මහතෙරුන්ට පූජා කළහ. එ වේලෙහි මහතෙරුන් වහන්සේ, "මහරජ ! තොපගේ රාජ්‍යයෙන් අපට කම් නැත. අපට අපගේ දහම් රාජ්‍ය ය පමණ, අප සතු රාජ්‍යය දුක්පත්තුන්ට පීඩා නො කොට, නො ඔදු අය නො ගෙණ, තුණුරුවන් රක්ෂාකොට දූහැමෙන් රජ ය කරව" යි රාජ්‍යය රජ්ජුරුවන්ට ම පාවාදී, රජ්ජුරුවන් රාජධර්මයෙහි පිහිටුවා සමු දී ගවා වදාළසේක. මේ ආදී කාරණයෙනු දු ධර්මය රජුන්ගේ රාජ්‍ය පුදවා ගන්නා තරම් අතිගම්භීර වූ උපමා ඇතියේ ය යි දතයුතු.

තව ද එක්කලෙක අප බුදුන් මල්, තන්‍දමහතෙරහු මහපිරිස් පිරිවරා ධර්මාසන නැඟී හිඳ රාත්‍රි බණ වදාරති. එදා බුදුහු නන්‍දයා අද රාත්‍රි බණක් කිය යි. මාගේ ධර්මයෙහි බොහෝදෙනා ආදර කාරණ පරිද්දෙන් අද මම ද බණ අසමි යි සිතා සුගන්ධ ගන්ධකුටි යෙන් බාහ්‍ය ව ගඳකිළි නිස වත්තෙහි වැඩ සිට වලාගැබෙකින් මුවහ වූ පුන්සඳක් සේ සියලු පිරිසට නො පෙණී ම තුන්යම් රැ සිටි පිය නො සොල්වා සිට බණ අසා මහතෙරුන් අලුයම බණ සම හරක් ළ කල බුදුහු සරත් වලාගැබකින් පෙණුනු හිරුමඬලක් සේ මහපිරිසට පෙණී ශ්‍රී මුඛයෙන් නිකුත් සුවඳින් බණ පිරිස සුවඳ පිඩක් සේ කරමින් "සාධු ! සාධු !! නන්‍දය, මාගේ අදහස් නො, වරදවා ම බණ කියෙහි ය" යි සතුති කළසේක. එ වේලෙහි මහ පිරිස් බුදුන් දැක ඉපිල පැන නැංගාහ. එ වේලෙහි මහතෙරුන් වහන්සේ ආසනයෙන් පැන නැගී ගොස් බුදුන් වැඳ සිට "ස්වාමීනි! නුඹවහන්සේ රාජසුකුමාල ව, බුද්ධසුඛුමාල ව, තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි කෙසේ තම් සිට බණ අසා වදාළ සේක් දැ?" යි දැන්වූ සේක. එ වේලෙහි බුදුහු "නන්‍ද ය, එක් දවසක් මා හිම සිට බණ ඇසූයේ කවර විස්මයෙක් ද? ඉදින් තාගේ, මාගේ ආයුෂ්කල්ප ය මුළුල්ලෙහි ත් සම්හර නො කොට බණ කියන්නේ වී නම් මෙසේ සිට ම අසන්නෙම් වේ දැ යි වදාළසේක. එ වේලෙහි බොහෝ ශ්‍රාවකයන් වහන්සේ බුදුන්ට සාධුකාර දී වදාළසේක. එතැන් පටන් බොහෝ සත්වයෝ ද ධර්මයෙහි මහත් වූ ආදර කළහ.

එහින් කිහ:-

"සුද්ධාභිධම්ම රසඤාත මනොමපඤකු
සක්කච්ච සොත පතහඤ පුටා පිබන්තු,
ධම්මිස්සරොපි භගවා සකලම්පි රත්තිං
ගෙහාජිරම්හි ඨිතකො'ව සුණිත්‍ථ ධම්මං" යි.

මේ ආදි කාරණයෙන් සද්ධර්මය සියලු සතුන් විසින් ආදර කට යුතු. සත්කාරයට භාජන වූ හෙයිනු ත්, දහම් අතිගම්භීර දෙයක් ම වන්නැයි දතයුතු. මෙසේ මාගේ බුදුන්ගේ සද්ධර්මය නම්: අනොපමෙය වූ, අද්භූත වූ, අචින්ත්‍ය වූ, අසදෘශ වූ, අති ගම්භීර වූ, දුරවගාහ්‍ය වූ, ශාන්ත තර නිපුණ වූ, කර්ණරසායන වූ, ලෝකාභිනීය වූ, ප්‍රෙමණීය ධර්මයක් හෙයින් මේ නව අරහාදී බුදුගුණ වෙන වෙන වර්ණා නිමවන්නට මාසේ වූ එක් නුවණකින් සෙද්නාවූ සත්වයෙක් හට බැරි ම ය. එසේ ද වුව ත්:-මෙතැන වනාහි ශ්‍රී ලඞ්කාධිපති වූ අප ශ්‍රී සඞ්ඝබොධි පරාක්‍රමබාහු නම් නරපතිහු කාලෙක මහත්වූ රාජ ඍද්ධීන් මහත්වූ උත්සවයෙන් දන්තධාතු පූජාවක් කොට, මහත් වූ බුද්ධාලම්බන ප්‍රීතීන් පිණ පිණා සිටි කල්හි ඔහුගේ ම බුද්ධත්වාභිලාෂී වූ දෙවප්‍රතිරාජ නම් අගමැතියානන් විසින් එ දවස් රජ්ජුරුවන් කරා ගොස් රජහු පූර්වයෙහි තුණුරුවන්ට කළා වූ නොයෙක් පූජා සත්කාර සඳහන් කොට "හිමි කුඹ මැකී ගොණ වනන වූ මෙසේ මෙසේ මහපින් රැස්කරණ මහපින්වත් රජ්ජුරු බුදුබැව් පැතීමෙහි උපෙක්‍ෂාවන්නු නො සෙදෙසි. බුදුවන්නට වහා ප්‍රාර්ථනා කළ මැනැව" යි කී කල්හි එ බසට රජපා බුදුන්ගේ චරියාපදන සිහිකොට, 'කුමක් කියව් ද? මඞ්ගල නම් බුදුන් බෝසත් කල දත් දුන් දරු දෙදෙනා ඛරදල නම් යකෙක් දෙක පොළයෙන් ලේ වගුරුව වගුරුවා මහිනුණු කිළිලක් සේ මුරු මුරුගා කිඳ කන කල ඒ බෝසතානෝ ද දරුදුක් ඉවසා බුදුබැව්හි ම පෙම් බැන්දෑල.

තවද වෙසතුරු මහබෝසතානෝ ජූජක නම් බමුණාට ජාලිය කුමාරයා-කෘෂ්ණජිනා නම් දරු දෙදෙනා දන් දී ඔහු දරුවන් බැඳගෙණ මර මරා ගෙණයන වේලෙහි දෙදරුවන් පිටින් වැගිරෙණ ලේ හා, ඇසින් වැගිරෙණ කඳුලුධාරා දක ළය වාවා ගෙණ බුදුබැව් පත පතා උන්නාහු ල. ඉතා දුෂ්කරය, ඉතා භාරය; බෝසත්වරු එසේ එසේ ම යාචකයන්ට ප්‍රිය දරුවන් බැඳ දුන් වැල් පමණක් රැස්කරතොත් මහමෙර පරයා සිටි ල. සෙසු පාරමිතා වන්නු ත් එසේ ම ල ඇස්, මස්, ලේ දන්දීමෙහි ද, භාර්‍ය්‍යාවන් දන් දීමෙහි ද, සරු නැත්තෙමි. ඒ මට ඉතාම පිළිවන. පුත්‍රදානය කළ ඉතා බැරි ම ය. මම මාගේ ප්‍රිය පුත්‍රයන් පස් දෙනාට පස් මහරටක් හා පස් මහ පිරිසක් දී ඒ ඒ තන්හි වස්වනුයෙමි. ශ්‍රී සම්පත් විඳුනාවූ ඔවුන් කිසියම් කලෙක පවා නොදක, පෙම් රඳවා ගත නොහෙනුයෙමි කෙසේ දරු දන්දී ගතහෙම් ද? එසේ හෙයින් මා බුදුබැව් නො පතන්නෙමි" යයි කීවා වූ පුත්‍රස්නෙහ වචන එම දෙවප්‍රතිරාජ නම් අගමැතියානන් අතින් අසා ඔවුන් විසින් ම

නොයෙක් වාරයෙහි "අප රජහට බොධිසත්ව පාරමිතාගෙන් යෙදුණාවූ බණක් වදාළමැනවැ" යි ආරාධිත ව රජු කෙරෙහි උපන් මහ කුළුණු ඇති ව:-

" ගිහීනං'මුපකරොන්තානං-නිච්චමාමිසදානතො,
කරොථ ධම්මදානෙන-තෙසං පච්චුපකාරකං."

යනු බුදුන් විසින් වදාළ හෙයිනු දු; ලෝක ශාසනෝපකාර යෙහි නියුක්ත වූ අප රජහු බොහෝ ධම්මකථා අසා කෘතඥවනත ව වසතු දු, අපි දු බොධිසත්වයන්ට සසරදුක් මදනියාව ත්, සුව බොහෝ තියාව ත්, අවශෙෂ වූ සත්වයන්ට සසර සුව මදනියාව ත්, දුක් බොහෝ තියාව ත්, බොධිසත්වවරයන්ට වඩා ආත්මප්‍රෙම සුතප්‍රෙම ඇත්තවුන් නැතිනියාව ත් සියලු ප්‍රාර්ථනාවෙන් බුදුවෙම්වා යි පහන්නාවූ ප්‍රාර්ථනාවට වඩා උතුම් වූ ප්‍රාර්ථනාවක් නැති තියාව ත්. බොධිසත්වවරයන් සසර පාරමිතා සුවයෙන් සුවපිඳ ම බුදුවන නියාව ත්, කිසියම් ධර්‍ම ව්‍යාඛ්‍යාන කථාවකින් රජහට බොධිසත්ව පාරමිතාවෙහි විභාග හඟවන පිණිස හා සිංහල භාෂාව දන්නා සත්පුරුෂ ජනයන්ගේ බොහෝ කාල් ශ්‍රද්ධාබුද්ධි ජනන ය කරවා ත්‍රිවිධවූ සම්පත් සෑදෙන පිණිස හා නවවන බුද්ධොත්පාදක්ෂණ සම්පත්ති ලද්ද වූ මේ මාගේ ද අභිමත වූ ප්‍රාර්ථනා ව සාදගන්නා පිණිස හා, නවඅරහාදී බුදුගුණයෙහි පළමු වන 'අරහං' යන අකුරු තුණෙන් කිවා වූ අර්හත් ගුණය ගෙණ පූජාවලි නම් ධර්‍ම ව්‍යාඛ්‍යාන කථාවෙකින් අප මහා ගෞතම බුදුන්ගේ ගුණෙක දෙශයක් වර්‍ණනා කරම්හ. සත්පුරුෂයන් විසින් සාවදන ව ඇසියයුතු.

ආරකත්තා හතත්තා ච-කිලෙසාරීන සො මුනි
හත සංසාර චක්කාරො-පච්චයාදීන වාරහො,
න රහො කරොති පාපානි-අරහං තෙන පවුච්චති' යි

යන මේ ගයින් දක් වූ පස්මහා අර්‍ථය වෙන වෙන වර්‍ණනා කරත්:-මෙසේ ම පස්මහ පොතකින් මිස එක් පොතකින් උගහට වන බැවින් " අහී පූජාය " යන ධාතුහු කෙරෙන් සිද්ධ පූජාර්‍ථය පමණක් ගෙණ මේ පූජාවලියෙහි වර්‍ණනා කරම්හ.

අප බුදුහු සතරාමර ලොකයා විසින් කරණ ලද නොයෙක් පූජාවට අග්‍රදක්ෂිණෙය වන බැවින් අර්හත් නම් වනසේක. එහි ආමිස පූජා ය, ප්‍රතිපත්ති පූජා ය යි බුදුන් ලබන පූජා දෙකක් වන්නාහ. ඔවුන් අතුරෙන් ආමිස පූජා නම් ශ්‍රද්ධා මූලික වෙයි.

ප්‍රතිපත්ති පූජා නම් ගුණ මූලික වෙයි. එහි ප්‍රතිපත්ති පූජාවෝ උතුම් වූ පූජා වෙති. යම් පුද්ගල කෙනෙක් ප්‍රතිවෙධ මූලික ව වෙසෙත් නම් ඔහු ද බුදුන් පුදන්නාහු නම් වෙති. යමෙක් ප්‍රතිපත්ති මූලික ව වෙසෙත් නම් ඔහු ද බුදුන් පුදන්නාහු නම් වෙති. යමෙක් පර්‍ය්‍යාප්ති මූලික ව වෙසෙත් නම් ඔහු ද බුදුන් පුදන්නාහු නම් වෙති. ඔවුන් තුන්දෙනා විසින් ම කළමනාවූ ඒකාන්ත පූජාවෝ සත්දෙනෙක් වන්නාහ.

ඔහු කවරහ? යත්;

බුදුන් ගුණ ගෙණ ශාසනගත ව වසන යම් භික්ෂුකෙනෙක් කොහෙලොමින් බඳ සිරියක් යට සයනය කරන්නක්හු මෙන්, හැම වේලෙහි පාපයෙහි භය ඇති ව වෙසෙද්ද, යම් භික්ෂුකෙනෙක් දුෂ්ප්‍රතිපත්තියෙන් කෙලෙසුම් නැති ව, අනවතප්ත ජලය සේ නිර්මලව, අනින්දිත ව, ශීලය රක්‍ෂා කෙරෙද්ද; යම් භික්ෂුකෙනෙක් පිනිදියෙන් සන්තුෂ්ට ව්‍යාඝ්‍ර රාජභාසයන් සේ ත්‍රිවිධ වූ සන්තොෂ යෙන් යෙදී වෙසෙද් ද, යම් භික්ෂු කෙනෙක් පාංශු ප්‍රච්ඡන්නවූ ජාතිරංග මාණික්‍ය රත්නයක් සේ ගණසඞ්ගණිකායෙන් දුරුව විවේකාභිරාම ව වෙසෙද් ද, යම් භික්ෂුකෙනෙක් ඇත්ගොදුරු වටු ගොදුරෙහි සම වූ වීර්‍ය්‍ය ඇති සිංහරාජයන් සේ ලද දෙයකින් යැපී අල්පෙච්ඡ ව වාසය කෙරෙද් ද, යම් භික්ෂුකෙනෙක් නිධාන රක්‍ෂා කරන්නා වූ දිව්‍ය නාග රාජයන් සේ සද්ධර්ම නමැති නිධානය තම තමන් ලෙන් දරා වාසය කෙරෙද් ද, යම් භික්ෂුකෙනෙක් ප්‍රිය පුත්‍රයන්ට ප්‍රේමයෙන් අවවාද කරණ මවුපියන් සේ තම තමන් උගත්තාවූ ධර්මයෙන් තුමූ ම තමන්ට ද අනුන්ට ද අවවාද කොට ස්වසන්තාන පරසන්තාන දමනයෙන් යෙදී වෙසෙත් ද, මෙසේ සප්තප්‍රකාර භික්ෂූන් විසින් කරණලද ප්‍රතිපත්ති පූජාවෝ ම අසාධාරණ පූජාවෝ නම් වෙති.

වදාලේ මැනෝ:—

"යෙ වජ්ජභීරූ පරිසුද්ධ සීලා
සන්තොසසාරුප්ප විවෙකරාමා
අප්පිච්ඡතා ධම්මධරානුයොගී
තෙ ලොකනාථං අභිපූජයන්ති"

තව ද ඔවුන් සත්දෙනා අතුරෙන් යම් අනුයොගී ආචාර්‍ය පුද්ගල කෙනෙක් පළමු ව තුමූ තමන් සද්ධර්මයෙහි හික්මවාගත නොහී අනුන් සද්ධර්මයෙන් හික්මවා ඇවිදිනාහු නම්, එසේ වූ ආචාර්‍ය්‍යවරයන්ගේ සද්ධර්මානුශාසනා සත්‍යයෝ ආදරයෙන් නොපිළි

ගන්නාහු ය. ඒ සද්ධර්ම ය ආදරයෙන් නො පිළිගැන්ම හෙතු කොට ගෙණ සත්‍වයන්ට මහත්වූ ඵලදායක නො වන්නේය යම් ආචාර්‍ය්‍ය පුද්ගල කෙනෙක් පළමුව තුමූ තමන් සද්ධර්මයෙහි හික්මව, තමන් පිහිටියාවූ සද්ධර්මයෙහි අනුන් පිහිටුවා හික්මවා ඇවිදිනාහු නම් එසේ වූ ආචාර්‍ය්‍යවරයන්ගේ සද්ධර්මානුශාසනාව සත්‍වයෝ ඉතා මහත්වූ ආදරයෙන් ම පිළිගන්නාහු ය. ඒ සද්ධර්මය ආදරයෙන් ම පිළිගැන් ම හේතුකොටගෙණ සත්‍වයන්ට මහත්ඵල මහානිසංස වෙයි. මේ කාරණයෙන් යමෙක් තුමූ පළමුව සද්ධර්මයෙහි පිහිටා අනුන් සද්ධර්මයෙහි පිහිටුවන්නාහු නම් ඔවුන් කරණ ප්‍රතිපත්ති පූජාව ඉතා දූ උතුම් පූජායයි දතයුතු.

විදුලේ මැනෝ—

"අත්තානමේව පඨමං-පතිරූපෙ නිවේසයෙ,
අථඤ්ඤමනුසාසෙය්‍ය-න කිලිසෙය්‍ය පණ්ඩිතො"

තව ද ඒ ත්‍රිවිධ වූ සප්තප්‍රකාරකොට දක්වූ ප්‍රතිපත්ති පූජා වෝ ම ධුතගුණ වශයෙන් තෙළෙස්දෙනෙක් වන්නාහ. විදර්ශනා වශයෙන් අටළොස්දෙනෙක් වන්නාහ ආරම්මණ වශයෙන් අටතිස්දෙනෙක් වන්නාහ. කර්මස්ථාන වශයෙන් සතළිස් දෙනෙක් වන්නාහ. ආර්‍ය්‍ය පුද්ගල වශයෙන් අෂ්ටොත්තර ශත ප්‍රමාණයහ. ශික්ෂාපද වශයෙන් දෙසිය පණස්දෙනෙක් පමණ වන්නාහ. පර්‍ය්‍යාප්ති වශයෙන් සුවාසූදහසක් පමණ වන්නාහ. ශීල වශයෙන් කොටිගණන් වන්නාහ. නය වශයෙන් අසඞ්ඛ්‍යගණන් වන්නාහ මේ ප්‍රතිපත්ති පූජා හ යි දතයුතු.

අවශෙෂ වූ සත්‍වයන් ප්‍රත්‍යය දානයෙන් කරණ ලද සත්කාරයෝ ආමිසපූජා නම් වෙත්. අප බුදුන් ලද ආමිස පූජාවෝ වනාහි දීපඞ්කර ප්‍රණිධියෙහි දී ලද පළමුවන අභිනීහාර මගුල් පූජා ය, හැම බුදුන් ගෙන් නොවරදවා ලද විවරණ මගුල් පූජා ය, පාරමිතා බෙලෙන් ලද බොධිසම්භාර පූජා ය, සංසාරගත ව ලද පළමුවන ජාතිභෙද පූජා ය, එසේ ම ලද දෙවන වූ මහා ජාතිභෙද පූජා ය, පඤ්චමහා විලොකනාවසානයෙහි දී ලද සාධුනාද පූජා ය, පශ්චිමභවයෙහි දී ලද ප්‍රතිසන්ධිකාල පූජා ය, ලුම්බිනී වනොද්‍යානයෙහි දී ලද ප්‍රසවමඞ්ගල පූජා ය, පැවිදි වූ දා ලද මහාභිනික්මන් පූජා ය, බුදු වූ දා ලද බොධි මණ්ඩල පූජා ය, සද්ධර්මාරාධනයෙහි දී මහා බ්‍රහ්මයා ගෙන් ලද ආයාචන පූජා ය, පළමුවන දම්සක් පැවතුම් සූත්‍ර දෙශනාවෙහි දී ලද ඉසිපතනාරාම පූජා ය, රජගහනුවර දී බිම්සර රජහුගෙන් ලද වෙළුවනාරාම

පූජා ය, කිඹුල්වත් නුවර බන්ධුසමාගමයෙහි දී ලද නිග්‍රොධාරාම පූජා ය, එනුවර දී ලද භික්‍ෂාටනාදී අද්භූත මහා පූජා ය, සැවැත් නුවර දී අනේපිඬු මහාසිටාණන්ගෙන් ලද ජේතවනාරාම පූජා ය, විශාඛා උපාසිකාවන් ගෙන් ලද පූර්වාරාම පූජා ය, එම වෙහෙර දී සුමන සාමණේරාදී හෙරණ මහණුන්ගෙන් ලද භික්‍ෂු ප්‍රතිපත්ති පූජා ය, එම නුවර දී කොසොල් මහරජහුගෙන් ලද අසදෘශ මහාදාන පූජා ය, විශාලාමහනුවර දී ලිච්ඡවි රජුන්ගෙන් ලද ගඞ්ගාරොහණ පූජා ය, ඉන්ද්‍රශාල ගුහාවෙහි දී සක්දෙව්රජුගෙන් ලද දිව්‍යරාජ්‍ය පූජා ය, සැවැත් නුවර ගණ්ඩම්බ නම් වෘක්‍ෂමූලයෙහි දී ලද යමකප්‍රාතිහාර්‍ය්‍ය පූජා ය, තව්තිසා භවනයෙහි දී අභිධර්ම දෙශනාවෙහි සක්දෙව් රජහුගෙන් ලද පාණ්ඩුකම්බල ශෛලාසන පූජා ය, සංකස්පුරදොර දී ලද දෙවොරොහණ පූජා ය, භික්‍ෂුණී ශාසන ප්‍රතිෂ්ඨාවෙහි දී මහා ප්‍රජාපතීන්ගෙන් ලද භික්‍ෂුණී ප්‍රතිපත්ති පූජා ය, මහා ප්‍රජාපතීන්දී පන්සියයක් මෙහෙණින්ගේ ආදහනයෙහි දී ලද අනූනවූ ශ්‍රාවකගණ පූජා ය, ජීවකයන්ගෙන් ලද ජීවකාරාම පූජා ය, දෙව්දත්හු නිසා ලද සමමෛත් පූජා ය, අජාසත් රජහුගෙන් ලද ජීවිතාදි පූජා ය, යශොධරා මහාස්ථවිරීන් ගෙන් ලද ප්‍රතිපත්ති පූජා ය, ධර්මාශොකාදී දඹදිව රජුන්ගෙන් ලද උද්දෙසික පූජා ය, මිහිඳුමාහිමියන් ආදී මහා ස්ථවිරයන් ශ්‍රී ලඞ්කාවීපයෙහි සසුන් පිහිටුවා කළ උත්තම ප්‍රතිපත්ති පූජා ය, මෙම ලඞ්කාවීපයෙහි වූ චූලවංශ-මහාවංශයෙහි මහපින්වත් රජුන් විසින් භොග පමණින් කළ අසඞ්ඛ්‍යගණන් උද්දෙසික පූජා හ යි

මෙ තැන්හි ම විසින් දක්වන ලද මෙසේ මෙසේ වූ නොයෙක් පූජා ලත් හෙයිනු ත් නො දක්වන ලද අප්‍රමාණ පූජා ලත් හෙයිනු ත් එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත් මාගේ බුදුහු අර්හත් නම් වනසේක.

එසේ හෙයින් කියන ලදී:—

"පූජාවිසෙසං සහපච්චයෙහි,
යස්මා අයං අරහති ලොකනාථො;
අත්‍ථානු'රූපං අරහන්ති ලොකෙ,
තස්මා ජිනො අරහති නාම මෙතං" යි.

මෙතෙකින් අවමහ ලෝ වැඩ පිණිස කරණ ලද අර්හත් ගුණ වර්ණනා සංඛ්‍යාත මේ පූජාවලියෙහි අප බුදුන් ලද පූජා සංග්‍රහ කථා නම් වූ පළමුවන පරිච්ඡේදය නිමි.

නන්ද මහතෙරුන් දම් දෙසද්දී බුදුරජුන්ද අසා සිටීම.   11 පිට බලන්න   (1-2)

දෙවන පරිච්ඡේදය

මෙහි අප බුදුන් දීපඞ්කර ප්‍රණිධියෙහි දී ලද පළමුවන අභිනීහාර මඟුල් පූජා නම් කවරහ? යත්;

මාගධිභාෂාවෙන් සංක්ෂෙපයෙන් සැඟවී තිබූ සද්ධර්මය ස්වභාෂාවෙන් අර්ථකථා ව්‍යාඛ්‍යාන ඉපදවීමෙහි ලෝවැඩ අමෙක් වන්නේ ය. ඒ කෙසේ ද? යත්; ධර්මයන් අටදෙනෙකුගෙන් අලඞ්කාරවූ ලෝකය සේ අෂ්ටාඞ්ගශීලයෙන් අලඞ්කෘත වූ පෞෂධය සේ අෂ්ටාඞ්ගමාර්ගයෙන් අලංකෘතවූ නිර්වාණය සේ අෂ්ටගරු ධර්මයෙන් අලඞ්කෘත වූ ශ්‍රාවිකාවන් සේ අෂ්ටමහා දිශාන්තරයෙකින් අලඞ්කෘත වූ චක්‍රවාටය සේ අෂ්ටාඞ්ග ලක්ෂණයෙන් අලඞ්කෘත වූ දූතයන් සේ අෂ්ට ප්‍රකාර වූ රසයකින් අලඞ්කෘත වූ පානීය වර්ගයන් සේ අෂ්ටප්‍රකාරවරයෙකින් අලඞ්කෘත වූ බුද්ධොපස්ථානයන් සේ ස්වභාෂා ලිඛිත වූ ධර්ම ව්‍යාඛ්‍යාන කථාවෝ ද අෂ්ටමහලෝවැඩ කරන්නාහු ය යි දතයුතු යි.

කෙසේ වූ ලෝවැඩ අමෙක් ද? යත්;

නො එක් රාජ්‍ය ක්‍රියාවෙහි යෙදී ශ්‍රී සම්පත්තීන් මත් ව අවකාශයක් නො ලබන්නාවූ රජදරුවන්ට බුදුන්ගේ මහමුහුද සේ අතිගම්භීර වූ, ආකාශය සේ අප්‍රමාණ වූ ධර්මය දැන බුදුන්ගේ මහිම දැන් ම උගනව වන බැවින් ලද ලද අවකාශයෙහි රහොගත ව හිඳ මෙසේ මෙසේ වූ ස්වභාෂා ලිඛිත බුදුගුණ කථා ගෙන්වා තමින් තමන් අතුරේ බලා බුදුන්ගේ ආගමයෙහි ඒ ඒ තන්හි එන විසිතුරු ධර්මකථා හා සූක්ෂම නය හා සිතට නගා නුවණ වඩා ලොකශාසන රක්ෂාවෙහි අප්‍රමාද ව ආත්මාර්ථ-පරාර්ථ සැදීමෙන් රජුන්ට වන්නාවූ වැඩ පළමු වන ලෝවැඩ ය යි කියමි.

තව ද රාජමහෙෂිකාදී ශ්‍රීවනිතාවූවන් ගෙන් දොර නොහඳුනන තරම් උතතම ස්ත්‍රීන් ඒ ඒ තන්හි සිත් සේ ඇවිද බණ අස අසා ද මහබෝ වැඳ පින් රැස්කොට නුවණ වඩා මෙලොව පරලොව දැන ගැන්ම ඉතා උගනට වනහෙයිනුත් නුවණැතියන් හා සිතූ සිතූ විට ධර්මාන්විත කථාකොට දැනුම් එවා ගැන්ම බැරිවන හෙයිනුත් එසේ වූ කුල ස්ත්‍රීන් අක්ෂර මාත්‍රාවක් දැන මෙබඳු බුදුගුණ කථා ලිඛිත පුස්තකයන් ගෙන්වා තමින් තමන් අතුරෙහි ම සිත් සේ බලා බුදුගුණ දැන නුවණ වඩාගෙණ දනාදිවූ පින්කම් කිරීමෙන් එසේ එසේ වූ ස්ත්‍රී ලෝකයාට වන්නා වූ මෙසේ මෙසේ වූ නිරාකුලාභිවෘද්ධිය ම දෙවන ලෝවැඩ යයි කියමි.

තව ද යුවරජ මහඇමතියන් ආදී ශ්‍රීමත් වූ ප්‍රධානයන් හැම වේලෙහි ම රජදරුවන්ගේ නොඑක් කාර්‍යයෙහි ව්‍යාපෘතවන බැවින් බුදුන් සද්ධර්‍මය සකසා දැන්ම ඔවුන්ට ද බරෙක් ම ය. එසේ හෙයින් කල්‍යාණ පෘථග්ජන වූ ඒ ශ්‍රීමත්හු දු ලද ලද අවකාශයෙක්හි මෙසේ මෙසේ වූ නොයෙක් බුදුගුණ කථා සිත් සේ බලා රාජනීති, ලෝකනීති, ධර්‍මනීති, ලෝකව්‍යවහාර, ධර්‍මව්‍යවහාර, දේශව්‍යවහාර, මෙලෝ - පරලෝ විශේෂයෙන් දැන රජුන්ට ද ලොවට ද වැඩ ම දී අමාගීයෙහි නොගොස් ආත්මාර්ථ-පරාර්ථ සාදා තමන් ලද යැපත පරලෝ නිධාන කෙරෙමින් වැඩ සාදා ගැන්ම තුන්වන ලෝවැඩ යයි කියමි.

තව ද ශාසනාරක්‍ෂාවෙහි අප්‍රමාද වූ මහාස්ථවිරවරයන් ගරුවූ ස්ථානාන්තර ලදින් වසන හෙයිනු ත්, ශාසනයට ගරු වූ ස්ථානාන්තර ලද හෙයිනු ත්, ඔවුන් කෙරෙහි මහත් වූ ආදර බහුමාන කළමනා හෙයිනු ත්, නොයෙක් නය දැන දහම සිත තබා හිඳිනා ධර්‍මකථිකයෝ ඔවුන්ට බණ කියමින් උපෙක්‍ෂා වන්නාහ. එහෙයින් එම මිහ පොළොව සේ නුවණැති මහාස්ථවිරයන්ට ද බණ ඇසීම සුලභ නො වෙයි. ඔවුනු ද ලද ලද අවකාශයෙහි මෙබඳු වූ ධර්‍ම ව්‍යාඛ්‍යාන කථා ගෙන්වා සිත් සේ බලා තම තමන් දත් ආගමයෙහි ඒ ඒ තන්හි එන විසිතුරු වූ ධර්‍මකථා හා අසාධාරණ වූ ඔපම්මකථා හා පූජීතපිටකයන්ගේ ව්‍යවහාර වාක්‍යප්‍රබන්ධ අසා ඒ මහාස්ථවිරයන්ගේ ද ප්‍රඥාචක්‍ෂුයන් නිර්මලවනු යේ සතරවන වූ ලෝවැඩ ය යි කියමි.

තව ද අති ශ්‍රද්ධාවෙන් සසුන් මැද මහණ ව අක්‍ෂරාභ්‍යාසය කොට ගත නොගී-විදර්‍ශනාවෙහි යෙදී ශීලවිසුද්ධියෙන් යෙදී වසන්නා වූ බොහෝ ශ්‍රද්ධා චරිත ධර්‍මලෝභී සබ්‍රහ්මචාරීන් මෙසේ මෙසේ වූ අර්ථ කථාවන් සිත් සේ බලා ධර්‍මවිභාගය, ශීලවිභාගය, දැන ප්‍රඥා වඩා ප්‍රතිපත්ති ප්‍රතිවේධයට ආදර උපදවා ශ්‍රද්ධා නමැති ප්‍රදීපයන් බබුලුවා ගැන් ම පස්වන ලෝවැඩ ය යි කියමි.

තව ද නො එක් සූත්‍රාන්තයන් ඉගෙණ බණ කියමින් දක්‍ෂ වූ මහ පඬිවරයන් පූජීතපිටකයන්ගේ වාක්‍යප්‍රබන්ධ බලා නොයෙක් අර්ථ ව්‍යාඛ්‍යාන ඉපදවීමට මුඛ දැන, පූජීතපිටකයන් කෙරෙහි අති ප්‍රසන්න ව රන් මල්හි සුවඳ කවන්නා සේ ප්‍රඥාභිවෘද්ධිය කොට ගෙණ තම තමන්ගේ වාක්පථ නමැති ගඞ්ගාවන් නිර්මල කරණුයේ සවන ලෝවැඩ ය යී කියමි.

තව ද කල්‍යාණ පෘථග්ජන වූ අක්‍ෂරාභ්‍යාස ය ඇති සත් පුරුෂයන් සාවද්‍යවූ කර්මාන්තයන් හැර නිරවද්‍ය වූ ධර්මයෙන් ආත්මාර්ථ-පරාර්ථ සාද ගණුම්හ යි සිතා නිරවද්‍ය ජීවිකාවෙන් ඒ ඒ තන්හි ධර්ම දැක ය දී ලෝවැඩ කරණු යේ සත්වන ලෝවැඩ ය යි කියමි.

තව ද නො එක් ප්‍රත්‍යන්තවල සත්පුරුෂ දර්ශනයක් නො ලබන්නාවූ ශ්‍රද්ධාවන්ත වූ ස්ත්‍රී පුරුෂයන්ට බණ අසා මෙලෝ පරලෝ දුන් ම ඉතා දුර්ලභ වන බැවින් ඔවුනු දු මේ බඳු වූ බුදු ගුණ කථා ලිඛිත පුස්තකයන් සොයාගෙණ අක්‍ෂරාභ්‍යාසය ඇතිය වුන් ලවා කියවා අසා ස්වභාෂාගෙන් නිර්ව්‍යාකූල වූ බුදුගුණ දැන මෙලෝ පරලෝ දෙකින් ගැලවෙතු යේ අටවන ලෝවැඩ ය යි කියමි.

මේ ආදිකාරණයෙන් ස්වභාෂා ලිඛිත වූ අර්ථකථාවන් ඉපදවීමෙහි මෙසේ අටමැදෑරුම් වූ ලෝවැඩෙක් ඇතියේ ම ය. එසේ හෙයින් මෙහි මා විසින් කියන ලද පළමුවන අභිනීහාර මඟුල් පූජා කථාව ද සත් පුරුෂයන් විසින් සාවධාන ව ඇසිය යුතු.

අපගේ මේ මහාභද්‍රකල්පයට සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයෙකින් යට සාරමණ්ඩ නම් කල්පයෙක් වි ය. එ කප තණ්හඞ්කරය, මෙධඞ්කරය, සරණඞ්කරය, දීපඞ්කරය යි බුද්ධදිවාකරයෝ සතරදෙනෙක් පහළ වූහ. එයින් පසු ව බුදු වූ තුන්ලොවට ඛෙමඞ්කර වූ, මොහඳුරට දිවාකර වූ, මුළු සත්නට ශාන්තිකර වූ, පින්වත්නට ශිවඞ්කර වූ, මරසෙනගට භයඞ්කර වූ, "දීපඞ්කර" නම් සර්වඥරාජයානෝ:- හස්ති ශබ්දය, අශ්ව ශබ්දය, රථ ශබ්දය, වීණා ශබ්දය, මෘදඞ්ග ශබ්දය, සඞ්ඛ ශබ්දය, සම්ම ශබ්දය, තාල ශබ්දය, බාද්‍ය ශබ්දය, භොජ්‍ය ශබ්දය, යන දශ විධ වූ ශබ්ද ඝොෂාවෙන් පිරුණාවූ "රම්මවතී" නම් පුරයෙහි ස්වාමිය, ඇමතිය, රටය, ක්‍ෂෙම ස්ථානය, කොෂය, බලසෙනගය, සුහෘදය, යන සප්තාඞ්ගයෙන් සම්පූර්ණ ව රාජ්‍යශ්‍රී විඳින්නාවූ "සුදෙව" නම් රජුහුගේ කුලය, ගුණය, රූප ය යන මේ ගුණත්‍රයෙන් උතුම් වූ "සුමෙධා" නම් අගබිසවුන් කුස හැම බුදුන්ගේ ප්‍රතිසන්ධික්‍රමයෙන් පලක් බැඳ නාභිමණ්ඩලය බලා දැවාන කරඹු වෙක වඩාලූ රන්පිළිමයක් සේ සියලු සතුන්ට පෙණි පෙණී දවස දවස මෑතියන්ගේ පෙම් වඩ වඩා දසමසක් වාසයකොට දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්ම සේනාව මධ්‍යයෙහි මේඝමුඛයෙකින් නිකුත් පුන්සඳ සේ සුද්ධාවාසයෙහි වසන අරහන්ත බ්‍රහ්මරාජයා පෑ රන් දලට බිහි ව එතැන් පටන් පෙරඬමය සඳ සේ වැඩී, දෙවගනන්

බඳු වරගතන් තුන්ලක්ෂයක් පිරිවරා දසදහසක් හවුරුදු රාජ්‍යශ්‍රී පුරා රත්පියුමක් මෙන් මුවපියුමක් ඇති "පියුම්" නම් බිසවුන් තමන් හා එක්වැනි වූ "උසභක්ඛන්ධ" නම් පුත්රුවන වැදූ දා සුව සූදහසක් ඇතුන් හා සමග මගුල් ඇත් යහන් නැගී උයන් කෙළියට වැඩ මගුල්සල්වට මැඩ හිඳ මගුල්කඩුවෙන් මුහුලස කපා, අහසට දමා, බ්‍රහ්මයා පිළිගත්වූ කල්පොත්පතතියෙහි දී තමන් තමාම මැවී තුබූ, අටපිරිකර පිළිගෙණ, සියක් ලක්ෂයක් ඇමතියන් හා සමග එම දා ම පැවිජි ව දසමසක් දුෂ්කරක්‍රියා පුරා හැම බුදුන් බුදුවන්නාවූ වෙසගමැදි පොහෝදා නුවරෙක ජනයන් දෙවපූජා වකට පිස, නමන් දුන පිළිගත්වූ මී කිරිපිඬු සහ පිරිවරින් වළඳා එම දා සවස කෙපණස් රියන් තණ පලහක් නැගී, සියක් රියන් කඳ ඇති, සියක්රියන් ශාඛා ඇති, දෙසියයක් රියන් උස ඇති, තුන්සියයක් රියන් ශාඛාමණ්ඩල ඇති මුල පටන් අග දක්වා මලින් ගැවසී සිටියා වූ, පුළිලසිරි බොධිඥට පිට දී මැඩ හිඳ, බුදු වීය නො දෙමි" යි දිවූ වනවත් මරසෙනග යිල සෝජතින් හයගන්වා බිඳ පලවා සව්සෝ ගෙවා බුදු ව.

සඳුන් නමැති මහා නිඛානයෙහි දිලිසෙන අග මිණිරුවන් සහලක් බඳු වූ "සුමඞ්ගලය" "තිසසය" යන අග සවු දෙදෙනා සමග මිත සවුවන් පිරිවරා ගුණා ගතවූ "සාගත" නම් මිහ තෙර කෙණෙකුන් අතින් අත් පා මෙහෙ විඳ මැතියන්ගේ නියෝග යෙන් තමන් කරා දසාඳ සොයා ආ දා මහණ කරවා ගත්තාවූ තමන්වහන්සේගේ "උසභක්ඛන්ධ" නම් වූ පුත් මිහතෙරුන් ආදීවූ සාරලක්ෂයක් ක්ෂීණාශ්‍රව ශ්‍රාවක දරුගණයා පිරිවරා හැමබුදුන්ගේ චාරිත්‍ර වූ සම්ත්‍රිංශත් පාරමිතා බුද්ධකාරකධර්මයෙන් යෙදී, නාරද කුල වසන නාරද නම් යක්ෂරාජයා ආදී වූ බොහෝ දතුන් දමා අමා, මහ නිවන් ලා, රන්මෙරක් වැනිවූ අසූරියන් බුද්ධකායකින් ලක්ෂයක් හවුරුද්දව ආයුඃශ්‍රී ඇතිව මුළුලොවට නැගු පහනක් සේ, මුළු ලොවට ලූ තිලකයක් සේ, මුළුලොවට මැවූ මුදුන් මල්කඩක් සේ, මුළුලොවට අඹා ලූ අමාපිඩක් සේ, දහම් වහරේ වස්වා සියලු සතුන් අමාමහනිවන් පුරයෙහි පුරවත සේක. එකල මාගේ ශ්‍රීමහා බොධිසත්ත්වයෝ පෙර බුදුන් කෙරෙන් ලබනලද මනෝප්‍රණිධි ඇති ව හසම ප්‍රවජ්‍යනා ජාතවේදයක් සේ සංසාරගත ව වසන දා අමරවතී නම් නුවර බමුණු මහසල් කුලයෙහි ඉපිද "සුමෙධ" නම් පණ්ඩිත ව ප්‍රඥාබලයෙන් නිවන් ඇසැයි දන නිර්මාණ ය සොයා සැපත් හැර වල්ගොස් දහම් පව්වෙහි සක්දෙව්රජහු මවා දුන් පන්සල් හා තවුස් පිරිකර දක මහණවනු කැමති ව හිත තුබූ සළුව බලා එහි නව ආදීනවයක් දක්ක. කෙසේ වූ නව ආදී නවයෙක් දැ? යත්;

මේ සළුව ඉතා මාහැඟි බව තපසට එක් පලිරෝධයෙක, අනුන් නිසාම උපදවාගැන්ම එක් පලිරෝධයෙක, වහා කිලිටිවීම එක් පලිරෝධයෙක, මාළු වී ම එක් පලිරෝධයෙක, සිතුවිට නො ලැබීම එක් පලිරෝධයෙක, තපසට අනඹග වී ම එක් පලිරෝධයෙක, සතුරන්ට සාධාරණ වී ම එක් පලිරෝධයෙක, ඇඳීමෙන් මද වඩනා බව එක් පලිරෝධයෙක, ලෝබ වඩනා බව එක් පලිරෝධයෙකැයි; මෙසේ නව ආදීනවයක් දක, ඒ සාටක ය හැර වාකචීරය බලා, එහි දොළොස් මහවිපාකයක් දක්ක.

කෙසේ වූ විපාකයක් ද? යත්;–මේ මාහැඟි නොවීම එක් ගුණයෙක, අනුන්ගෙන් උපදවා ගන්නා දෙයක් නො වීම එක් ගුණයෙක. සවහස්තයෙන් ම උපදවා ගත හැක්කේ එක් ගුණයෙක. වහා කොකෙලෙසෙන්නේ එක් ගුණයෙක. සොරුන් මීට ලොභ නොකරන්නේ එක් ගුණයෙක, ගිය ගිය තෙන සුලභ ව ලැබෙන්නේ එක් ගුණයෙක, තපසට ඉතා සරු බව එක් ගුණයෙක, අනුභව කරන්නාහට කෙලශයක් උත්සන්න නො වීම එක් ගුණයෙක, ඉතා අල්පෙච්ඡ බව එක් ගුණයෙක, අනුභවයට ලඝුවීම එක් ගුණයෙක, අනුන්ගෙන් නො ඉල්වා ලැබීම එක් ගුණයෙක, තම කල ලොභසිත් නො ඉපදීම එක් ගුණයෙක, මෙසේ වූ දොළොස් මහාවිපාකයෙකින් යුක්ත වූ වාකචීරය මට මැනවැයි ඒ සිවුර ධරා ගෙණ එ පන්සල්ගෙය බලා ඒ ගෙයි වාසයෙහි අටමහා පලිරෝධයක් දක්ක. කෙසේ වූ පලිරෝධ ද? යත්;

මේ ගෙය බොහෝ දරුසම්භාරයෙන් උපදවාගැන්ම පළමුවන පලිරෝධ ය. දවස්පතා සුන්බුන් තැන්පත්කිරීම දෙවන පලිරෝධ ය, ගෙහි වසන්නවුන් මහල්ලන් දුටුකල නො වේලෙහි ත් වාසස්ථාන දීම තුන්වන පලිරෝධ ය, නැවත දෙදෙනකු එක් ගෙයි වාසය කිරීම සතරවන පලිරෝධ ය, ශීත උෂ්ණ පීඩා නැතිව ගෙයි වාසය කිරීමෙන් ශරීරය සුඛුමාලවීම පස්වන පලිරෝධ ය, කාමවිතර්කාදියට නිලියන ස්ථානය වීම සවන පලිරෝධ ය, මේ මාගේ වාස යයි ලොභ සිත් ඉපදවීම සත්වන පලිරෝධ ය, මකුණන් උකුණන් සූනන් සිකනළුන් ආදී සතුන් හා එක ස්ථානයෙහි විසීම අටවන පලිරෝධ ය යි මෙසේ පන්සල් වාසයෙහි අටමහා පලිරෝධයක් දක ඒ පර්ණශාලාව ත් හැර පියා ඡායාසම්පන්න රුකක් මුල කට ගොස් මේ රුක්මුල නිත්‍යවාස ය කෙරෙමි නම් දසමහා ආනුසංසයෙක් ඇතැයි දක්ක.

කෙසේවූ ඵාසු ද? යත්;

අල්පව්‍යසනයෙන් සොයාගැන්ම පළමුවන විශෙෂ ගුණ ය, ගිය ගිය තෙන රුක්මුල් සිත් සේ ලැබීම දෙවන වූ විශෙෂ ගුණ ය, පුරාණ පත්‍රාදීන්ගේ විකාර දැක අනිත් ලකුණු ඉපදවීම තුන්වන වූ විශෙෂ ගුණ ය, ලොභ සිත් නො හටගැන් ම සතරවන වූ විශෙෂ ගුණ ය, කාම විතර්කාදීන්ට අස්ථාන වීම පස්වන වූ විශෙෂ ගුණය, අනුන් විසින් නො දෙවා ලැබීම සවන වූ විශෙෂ ගුණ ය, දෙවියන් හා එක්තෙන විසීම සත්වන වූ විශෙෂ ගුණය, සිඝාරා පරික්ෂෙප ඇත මැනවැ යි උත්සාහ නො කිරීම අටවන වූ විශෙෂ ගුණය, වාසයට සුව වීම නව වන වූ විශෙෂ ගුණය, ගිය ගිය තෙන සුලභ හෙයින් නැවත අව මැනවැ යි රුක්මූල අපෙක්ෂා නැතිවීම දසවන වූ විශෙෂ ගුණ ය යී මෙසේ වූ දසමහා විශෙෂ ගුණයක් දැක, නො යෙක් රුක්මුල්හි හිඳ එක් වේලෙක භාවනා කොට එක් වේලෙක දිග සැළරියනක් හා පුළුල යෙලරියනක් වූ, දෙකෙළවර ආසන දෙකක් හා ආලම්බන ඵලකයෙන් යුක්ත වූ, හිම ඉන්ද්‍රනීලමාණික්‍ය මය වූ, පස්නීවරණ දොෂයෙන් දුරු වූ, ශක්‍රයා මැවූ ඒ සක්මණෙහි සක්මන්කොට, සත් දවසක් ඇතුලත පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවාගෙණ එතැන් පටන් ගුණධර්ම පුරන්නාවූ බොධිසත්වයෝ අභිඥ ගුණ අටක් විඳින්නාහු.

කෙසේ වූ සුව අටෙක් ද? යත්;

වස්තුකාම ක්ලෙශකාම නමැති ගිහිබන්ධනයෙන් ගැලවීම පළමුවන සුවවිඳීම ය, නිරවද්‍ය වූ පිඬුසිගා වැළඳීම දෙවන සුවවිඳීම ය, උපන් පසය ම වැළඳීම තුන්වන වූ සුවවිඳීම ය, දඬමුඩ ඉස්රන් මස්රන් එළවා ඇවිදිනා රාජපුරුෂයන්ගෙන් පීඩා නොවිඳීම සතරවන සුවවිඳීම ය, කෙත්වත් ගවමහිෂාදි ගෘහොපකරණයෙහි කල්පනා නො කිරීම පස්වන සුවවිඳීම ය, සොරුන් කෙරෙහි සැක නොකිරීම සවන සුවවිඳීම ය, රජ යුවරජ මහ ඇමතියන් දුටු කල භය නැති ව හුනස්නෙන් නො නැගී හිඳීම සත්වන සුවවිඳීම ය, ගිය යම් දෙසෙක භය නැති ව සිත් සේ ඇවිදීම අටවන සුව විඳීම ය යි, මෙසේ පැවිදිවූවන් ලබන්නාවූ අටමහසුවයක් විඳ නෙසජ්ජික ය පුරා පවත්නාඵලක නම්වූ සත්වන වූ උග්‍රතපස් කොට වාසයකරණ කල එක් දවසක් ආකාශයෙන් වඩනා වූ ඒ මාගේ සුමෙධතාපස නම් බෝධිසත්වයෝ, එදා සුදෙවුන් වෙසෙහර සිව රම්‍යවතී නම් නුවරට ඒ දීපඞ්කර නම් බුදුරජානන් වඩනා මාර්ගය සරහන්නාවූ මිනිසුන් දැක විචාරා බුදුන් වඩනා මග ය යි අසා

ආකාශයෙන් බැස මට ද එක් අවකාශයක් දෙව යි ඉල්වා තමන්ගේ සෘද්ධි දැක, දුදුළු වූ කඳුරක් ජනයන් දීලූ කල, ඒ කඳුර බලා සිතන් නාවූ බොධිසත්ත්වයෝ ශක්‍රයාගේ සියයක් යොදුන් පරසතු ගස සලා, මල් ගෙණවුත් මේ වල පුරාලම් නම් ඒ මාගේ ඇඟින් ලොමය කට ත් ආයාශයෙක් නැත. තව ද දසදහසක් යොදුන් අසුර භවනයට දිව අසුරයන්ගේ පලුලු ගසින් මල් ගෙණවුත්, මෙතන තනාලම් නම් ඒ මව දුන් පැයකින් පිළිවන., තව ද, සාගරයෙහි දිය දෙබෙදකොට රුවන් වැලි උකාගෙණවුත් සුමෙරුවුන් වෙහෙර සිට රඹගම් නුවර දක්වා රුවන් මැල්ලෙන් තනාලම් නම් මාගේ අපුරුසසකක් කලින් නිමවන සෘද්ධි ම ය, මාගේ මේ අඳුන් දිවිසම ශීඝ්‍රකොට මවාලා ඇඳ සැදූ බෙරයක් සේ ම තනාලම් නම් ඇසිල්ලෙකින් පිළිවන. ආනුභාවයෙන් කරන්නාවූ සත්කාර හැර මාගේ ශරීරයෙන් ඩා සොල්වා බුදුන්ට අද කායවෛයාවතක් කෙරෙමි යි සිතා ලා උදැල්ලක් හා කුඩයක් ගෙණ, උස්තැන් කපා වලතැන් පුරා, සතුටු සතුටුව මග තනන ද ය.

ඒ තනා නොනිමන තුරු සාරලක්ෂයක් රහතන් පිරිවරා සවණක් රැසින් දිලිහි දිලිහී රුවන්මෙරක් සේ අවුදින් වැඩසිටි බුදුන් දැක, පස්වණක් ප්‍රීතීන් පිණා, අද ආශ්‍රවක්ෂීවත් වූ බුදුන්ට ආශ්‍රවක්ෂීවත් වූ මාගේ ප්‍රිය ජීවිතය පූජාකෙරෙමි යි සිතා මිතු ලෝවැඩ පත පතා එ කලල් වසා, අඳුන් දිවිසම අතුට බුදුන් දිසාමට සිරස ලා මිතු මා බුදුවිත දවස් වසවත් මරහු මැදගේ සොඳුර! නෝ මට දෙස් කියා! යි මීකත වැලඳ සිඹ සනහන්නකු සේ, මිකොලෙහි ඔබින් බැස හෙව බුදුහු අද මා හෙයක් කොට වඩින්වා, මම ද මතු ලොවිතුරා බුදු ව මේ අප බුදුන් සේ ම සියලු සතුන් සංසාරසාගරයෙන් ගලවමි යි ප්‍රාර්ථනා කළ ද ය. එ කල බුදුහු දිවි දී වැදහොත් බෝසතුන් දැක මේ මිනුෂ්‍යයෙක, ඉනු ත් පුරුෂයෙක, හෙතුසම්පත් ඇතියේ ය, බුදුන් දිට තපස්වී ය, ධ්‍යානලාභී ය, අධිකාරත්වයෙන් යෙදින, බුදුබැව් පතා හොත්තේ ය. එසේ හෙයින් පලමුවන අභිනීහාරයට සුදුසු වූ මේ ධර්මයෝ අට දෙන ම දුන් මොහු කෙරේ ම විද්‍යමාන ය හ. මේ වීර පුරුෂයා කවර කලෙක බුදුවේ දෝ (හෝ) යි එ කප බලා, දෙවන කප බලා, සියක් කප් බලා, දහසක් කප් බලා, ලක්ෂයක් කප් බලා, කෝටියක් කප් බලා, අසංඛ්‍යයක් කප් බලා, මෙසේ ක්‍රමයෙන් බලන්නා වූ බුදුහු සාරාසංඛ්‍ය කල්පලක්ෂයකින් මතු ගෞතම නම් බුදුවේ යයි දැක, පස්සෙහි වඩනා සාරලක්ෂයක් රහතුන් බලා තමන් වහන්සේගේ මූඛ නමැති පද්මයෙන් සුවඳ විහිදුවා:

"පස්සථ ඉමං තාපසං
ජටිලං උග්ගතාපනං,
අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ
අයං බුද්ධො භවිස්සති" යි.

යනාදීන් වදාරා මහණෙනි! මේ මට දිවිපුදනොක් පුරුෂයා සාරාසඞ්ඛ්‍ය කල්පලක්‍ෂයකින් මතු ගෞතම නම් බුදු වෙයි. කිඹුල් වත් නම් පුරයෙක උපදී ශුද්ධෝදන නම් රාජෝත්තමයෙක් පිය වෙයි මහාමායා නම් දේවියක් මව් වෙයි. සතළිස් දහසක් පුරසත්‍රීන් පිරිවරා එකුන්තිස් හවුරුද්දක් රජසිරි විඳ, යශෝධරා නම් අග මෙහෙසී බිසවන, රාහුල නම් තමා හා එක්මැති පුතකු වැදූදා අශ්වයානයෙකින් මහබිනික්මන් කෙරෙයි. අනෝමා නම් ගං තෙර දී මුහුලස කපා අහසට දමා මහබඹුන් දුන් සිවුරු ධරා සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කෙරෙයි, සුජාතා නම් සිටුදුවක් දුන් කිරිපිඬු වළඳා එම ද සවස කුදුස්පිණන් විදුරඹුන් හැගී ඇසතු ගසක් පිටලා හිඳ මරසෙන් බිඳ බුදු ව එකෙණෙහි මා සේ ම අනන්තාපරිමාණ සක්වළ සවණක් රැස් විහිදුව යි. එකල මොවුන්ට කොලිත-උපතිස්ස නම් අගසව්වෝ දෙදෙනෙක් වෙති. ආනන්ද නම් මහතෙර කෙනෙක් අත් පා මෙහෙකරෙති. ඛෙමාය-උප්පලවණ්ණා යයි අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වෙති, අටළොස් රියන් උස ඇති බුද්ධ කායකින් පන්සාලිස් හවුරුද්දක් බුදු ව මා සේ ම දහම්රස පොවා, සියලු සතුන් අමාමහ නිවන් පමුණුවයි, මහණෙනි! මේ පුරුෂයා සවල්පා වූ සතෙක් නො වෙයි, මතු බුදු වන්නා වූ බුදු බිජුවටෙකැ යි සතුටු කොට වදාරා විවරණ පතුල් දුන්සේක.

එතෙපුල් ඇසූ දෙවිමිනිසුන් දුන් සාධුකාර ශබ්දය බඹලෝ ගසා පැවැත්ත; ඉක්බිත්තෙන් බුදුහු බෝසතුන්ගේ මතු මරුන්ට නො දක්වන්නා වූ පිට නො මඩිමි යි ආදරයෙන් පස නොගා තුන් යලක් පැදකුණුකොට, සමන්මල් අටමිටකින් අටපූජාවක්කොට, වැඩිසේක. පස්සෙහි වඩනා සාරලක්‍ෂයක් රහතුන්වහන්සේ ද, සාරලක්‍ෂයක් මල්මිටින් පුදා වැඩිසේක. එදා බුදුන්ට පූජාවට, රැස්වූ දසදහසක් සක්වළ සතළිස් දහසක් වරම්රජදරුවෝ සතළිස් දහසක් දිවමල් මිටින් පූජාකොට ගියහ. තව ද දසදහසක් ශක්‍රයෝ ද දසදහසක් සුයාමයෝ ද, දසදහසක් සන්තුෂිතයෝ ද, දසදහසක් සුනිර්මිතයෝ ද, දසදහසක් පරනිර්මිතයෝ ද, දස දහසක් සක්වළ අරූතල-අසංඥ තල සොළසත් හැර එක්ලක්‍ෂ පණස්දහසක් බ්‍රහ්ම ලෝකවල බ්‍රහ්මරාජයෝ ද, යන මේ සියළු දිව්‍යබ්‍රහ්මයෝ ම එකි එකී දිවමල් මිටින් බෝසතුන්ට පුදා ගියහ.

මෙසේ බුදුන් රහතන් මිනිසුන් දෙවියන් බඹුන් තමන් පුද ගියකල මහබෝසතාණෝ ඒ මල් පිරා නැගි දිවමල් රැස් පිට වැඩ හිඳ බුද්ධකාරක ධර්‍මයන් පරීක්‍ෂාකොට ක්‍රමක්‍රමයෙන් සමත්‍රිංශත් පාරමිතාවන් දුටුසේක. එකෙණෙහි "හිමි! තුඹ බුදුවන ද මම දෙස් කියමි' යි මිකත අත්පොලසන් දුන්නා සේ, දසදහසක් සක්වළ මහපොළව එකාඈහැර ගුගුරා පී ය. ඒ කෙණෙහි ඒ මහ නාදය අසා දසදහසක් සක්වළ වසන්නා වූ නාගයෝ ය, ගරුඩයෝ ය, ගන්ධර්‍වයෝ ය, යක්‍ෂයෝ ය, රාක්‍ෂසයෝ ය, සිද්ධයෝ ය, විද්‍යාධරයෝ ය, දිව්‍යයෝ ය, බ්‍රහ්මයෝ ය යනාදී මහත් වූ සේනාව එතැනට දිව අවුදින් බෝසතුන් පිරිවරා, තව ද අප්‍රමාණ වූ පූජා කරන්නාහු, ඔල්වරසන් දහස, අත්පොළසන් දහස, අසුරුසන් දහස, පිළිසන් දහස, වැඳුම් දහස, සාධුකාර දහස යනාදීන් බඹලොව දක්වා එකතින් නාද පැවැත්වූහ.

ඒ කෙසේ දැ යත්;

"ඉදින් මෙ බුදුන් කල සසරින් ගැලවීගත, නොහැකුවෝ නම්: හිමි තුඹගේ බුද්ධරාජ්‍යයෙහි දී අප සසරින් ගැලවුවමැනවැ"යි කියා කියා වැඳ වැඳ සමහර ලොවෙක දෙවියෝ දිවමල්කඳු පුද යෙති. තව ද සමහර ලොවෙක දෙවියෝ, හිමි! සුමෙධපණ්ඩිතයෙණි! පෙර තුඹසේ ම බොධිසත්ව වරයන් පළමුවන විවරණ ලදින් පාරමිතාවන් ආවර්ජනා කළ කලැ, ලොව යම් ආශ්චර්‍යයෙක් පෙණිනි ද, ඒ ආශ්චර්‍යවරයෝ දූන් තුඹටත් පහළ වූ හ. එසේ හෙයින් ඒකාන්තයෙන් තුඹ මතු බුදුවන දැම ය, අප ද මතු සසරින් ගැලවුම මැනව"යි දිවසුවඳින් පුද යෙති.

තව ද-සමහර ලොවෙක දෙවියෝ "ස්වාමීනි! සුමෙධ පණ්ඩිතයෙනි! දූන් මෙ ඇසිල්ලෙහි ශීත පීඩාවෙන් දුක්ගන්නා වූ එක ද සත්වයෙක් නැත, උෂ්ණ පීඩාවෙන් දුක්ගන්නා වූ එක ද සත්වයෙක් නැත, දසදහසක් සක්වළ ම ඉතා නිශ්ශබ්ද වී ය. සියලු සතුන්ට ම වියවුල් නැති වී ය ප්‍රචණ්ඩ වූ පවන් නැති වී ය, ගං හෝ කඳුරැලි දිය සිටි දිය සේ රඳා ගියේ ය. මේ මේ කාරණයෙන් තුඹ මතු බුදුවන දැ ම ය. අප ද එදා සසරින් ගැලවුව මැනව"යි දිව්‍ය හෙරිනාදයෙන් පූජාකොට යෙති.

තව ද- සමහර ලොවෙක දෙවියෝ අවුත් "ස්වාමීනි! බුද්ධාංකුරයාණෙනි! අද තොපගේ මේ ආවර්ජනාවෙහි දසදහසක් සක්වළ මුළුල්ලෙහි දියෙහි ගොබෙහි කුසුමයෙන් පිරීගියේ ය,

1. නොහෙමෝ.

නොයෙක් තුරුලිය එලහාරයෙන් පිරීගියේ ය. බෙර සක් - මිහිඟු ආදි තූර්‍ය්‍යයෝ තුමූ ම නාද පවත්වති, ආකාශයෙන් මල්වැසි වැස පී ය, සමුද්‍රවල මහරළ සන්සිඳී ගියේ ය, මහපොළොව ගුගුරා පී ය, මේ මේ කාරණයෙන් මතු නුඹ බුදුවන බව ඒකාන්‍තා ම ය. අප ද සසරින් ගැලවුව මැනවැ"යි කිය කියා දිව්‍ය විණාගායනාවෙන් පූජා කොට යෙති.

තව ද-සමහර ලොවෙක දෙවියෝ අවුත් "ස්වාමීනි! වීරපුරුෂ යාණෙනි! දැන් හැම නරකවල ගිනි නිවී ගිය, හිරුමඩල ප්‍රභාවත්ව ගිය, දහමල් තරු පෙණී ගිය, පොළොව පළා දියකඳු පැන නැංගේ ය, චන්‍ද්‍රදිව්‍යපුත්‍රයා වෛශාඛ යෝගයෙහි යෙදී ගිය, මේ මේ කාරණයෙන් මතු නුඹ බුදුවන දෑ ම ය, අපට ද මතු නිවන්රස දුනමැනව"යි දිව්‍ය නෘත්‍යයෙන් පූජා කොට යෙති.

තව ද – සමහර ලොවෙක දෙවියෝ "ස්වාමිනි සුමෙධ නම් උත්තමයාණෙනි! අද තොපගේ මේ ආවජ්ජනාවෙහි දසදහසක් සක්වළ සියලු ප්‍රාණීහු ම තම තමන් වසන බිලාදියෙන් පිටත් ව ගියහ. සියලු තිරිසනුන්ගේ භය සංසිඳී ගිය, සියලු සතුරෝ ම ඔවුනොවුන් කෙරෙහි සන්තොෂ ය, සියලු සතුන් ගේ ම රෝග පීඩාවෝ සංසිඳී ගියහ, සියලු සතුන්ගේ සා පිපාසා නිවී ගියහ, මේ මේ කාරණයෙන් නුඹ මතු බුදු ව දම්සක් දෙසන දෑ ම ය, අපට ද මතු ධර්මදෙශනා කළමැනවැ"යි කිය කියා දිව්‍ය ගීතිකාදියෙන් පුදා යෙති.

තව ද- සමහර ලොවෙක දෙවියෝ "ස්වාමීනි! මතු බුදුවන හිමියාණෙනි! දැන් මේ ඇසිල්ලෙහි රාගාදි කෙලෙස් සන්සිඳී ගියහ, ආකාශයෙහි රජස් නැති ව ගියහ. ලොව හැම දුර්භික්ෂයෝ ම නැති ව ගියහ. සුගන්ධ ගන්ධයෙන් හැම ලොව පිරී ගියේ ය; හැම දෙවියෝ මිනිසුන්ට පෙණෙති. මනුෂ්‍යයෝ දෙවියන්ට පෙණෙති. හැම නරක ම පෙණී ගියහ. මුළුලොව ම ආවරණ නැති ව ගියහ මේ මේ කාරණයෙන් නුඹ මතු බුදු ව නිවන්පුරයෙහි දොරහරණ දෑ ම ය, අප ද එපුරෙහි ලුව මැනවැ" යි කිය කියා දිව්‍ය ධ්වජමාලවෙන් පුදා යෙති.

තව ද-සමහර ලොවෙක දෙවියෝ දිව අවුදින් "ස්වාමීනි! සුමෙධ නම් මහතාණෙනි! දැන් මේ මුළුලොව උපදනා සත්ත්වයකුත් නැත, මියන්නාවූ සත්වයෙකුත් නැත. ලොව අවිශ්වාසවත් තාපසයෙකුත් නැත. මුළුලොව පැහැදී ගිය. මුළුලොව නිවී ගිය. හැම

සිත් පිරී ගිය, මේ මේ කාරණයෙන් ඒකාන්තයෙන් තුඹ මතු බුදුව සද්ධර්ම දේශනාවෙන් සතුන් සන්තුෂ්ටකරණ දෑ ම ය. අපට ද එ දා දහම් දෙසුව මැනවැ"යි කිය කියා දිව මල් දම් දමා දිව සුවඳ ඉස ඉස ගායනා පතුරුව පතුරුවා, පූජා කොට හැම දෙවියෝ ගියහ.

මෙසේ මාගේ ශ්‍රීමහාබෝධිසත්ත්වයෝ තමන් පළමුවන විවරණ පතුල් ලත් දා ම බුදුන්ගෙන් පූජා අවෙක, රහතුන්ගෙන් සාර ලක්ෂයක් පූජා ය, වරම් රජුන්ගෙන් සතළිස් දහසක් පූජා ය, සක් දෙව් රජුන්ගෙන් දසදහසක් පූජා ය, සුයාම රජුන්ගෙන් දසදහසක් පූජා ය, සන්තුෂිත රජුන්ගෙන් දසදහසක් පූජා ය, සුනිර්මිත රජුන්ගෙන් දසදහසක් පූජා ය, පිරිනිර්මිත රජුන්ගෙන් දසදහසක් පූජා ය, තව ද-දසදහසක් සක්වළ අරූතල-අසඥතලයන් හැර සියළු බ්‍රහ්මරාජයන්ගෙන් එක්ලක්ෂ පණස්දහසක් පූජා ය, පසුව පාරමිතාවන් ආවර්ජනා කළ වේලෙහි මහීගර්ජනාවෙහි හඬ අසා දිවූ දසදහසක් සක්වළ මුළුල්ලෙහි දිව්‍ය බ්‍රහ්මයන් විසින් කරණලද දෙලක්ෂ සතළිස් දහසක් මහාපූජා ය, දෙතිස් මහාපූර්නිමිත්ත පූජා ය; මහීගර්ජනා නම් පූජා ය යි මෙසේ පළමුවන අභිනීහාර මඟුල් පූජාවෙහි ම අවලක්ෂ අසූදහස් එක්සාළිස් මහා පූජාවක් ලත් හෙයිනුත්, සඞ්ඛ්‍යා පථයට අවිෂය වූ පූජාවන් අප්‍රමාණකොට ලත් හෙයිනු ත් එසේ වූ පූජාවිදීම්ට සුදුසුහෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වනයේක.

එසේ හෙයින් කියනලදී.

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං'ති

මෙතෙකින් අව මහලෝ වැඩ පිණිස කරණලද අර්හත් ගුණ වර්ණනා සඞ්ඛ්‍යාත මේ පූජාවලියෙහි අපබුදුන් අෂ්ටාඞ්ගධර්මයෙන් ලද

අභිනීහාරමඟුල් පූජාකථා නම් වූ දෙවන පරිච්ඡේදය නිමි.

තුන්වන පරිච්ඡේදය.

තව ද අප බුදුන් හැම බුදුන්ගෙන් නො වරදවා සාමාන්‍ය ධර්ම යෙන් ලද විවරණ මඟුල් පූජා නම් කවරහ? යත්;

ඒ දිවකුරු බුදුන් පටන් බුද්ධ ශූන්‍ය වූ අසඞ්ඛ්‍ය කප් ගිය කල සාරතම් කාපෙත කොණ්ඩඤ්ඤ නම බුදුරජානෝ, රම්‍යවතී නම් නුවර සුනන්ද නම් රජහුගේ සුජාතා නම් බිසවුන් කුසින් දසදහ

සක් සක්වළ දෙව් බඹ පිරිස් මැද සරත් වලාහකයෙකින් නික්මුණු පුන්සඳ මඬලක් සේ බිහිව මැඩි තුන් ලක්‍ෂයක් පුරඟනන් පිරිවරා, දසදහසක් හවුරුදු රජසිරි විඳ රුචි නම් අගබිසවුන් විජිතසේන නම් පුත් රුවන වැදූ දා රථයානින් වැඩ දසකෙළක් ඇමතියන් හා සමග පැවිදිව, දසමසක් දුෂ්කරක්‍රියා පුරා යශොධරා නම් සිටුදුව් දුන් මීකිරිපිඬු වළඳා, අටපණස්රියන් විදුරස්නේ සල්සිරිබෝ පිට දී වැඩ හිඳ බුදුසිරි ලදින් සසුන් නමැති ගුවනෙහි හිරු සඳු සේ ප්‍රසිද්ධවූ භද්‍රය-සුභද්‍රය යන අගසව්වන් දෙදෙනා හා සමග කෙළ ලක්‍ෂයක් මහසව්වන් පිරිවරා ශීලාදීයෙන් සමෘද්ධ වූ අනුරුද්ධ නම් මහතෙර කෙනෙකුන් අතින් අග්පා මෙහෙ විඳ, අට අසූරියන් බුදුබදෙකින් හවුරුදු ලක්‍ෂයක් ආසිරි ලදින් වැඩහිඳ මුළුලොව එක් තිවන් පිඩක් සේ කරණසේක. එ කල අප බෝසතාණෝ විජිතාවි නම් චක්‍රවර්ති රජ ව, වෙහෙරක් කරවා කෙළලක්‍ෂයක් රහතුන් සමග බුදුන්ට තුන් මසක් අසදෘශ මහදන් දී ඒ යශොමඞ්ගල නම් බුදුන් අතින් ද විවරණ ශ්‍රී ලදින් සක්විති රජය හැර මහණව, එ දවස් දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ දෙවන වූ විවරණ මඟුල් පූජාව ලත් සේක.

තව ද-එසින් බුදුන් නැති ව ම අසංඛ්‍යයක් ශූන්‍යකල්ප ගිය. සාරමණ්ඩ නම් කල්පෙක මඞ්ගලය, සුමනය, රේවතය, සොභිතය යන බුදුවරුන් සතරදෙනෙක් පහළ වූ හ. ඉන් මඞ්ගල නම් බුදුහු උත්තරා නම් නුවර උත්තර නම් රජහුගේ උත්තරා නම් බිසවුන් කුස පිළිසිඳ, එතැන් පටන් දරුගැබ් සොභාවෙන් අසුරිනන් ගෙයි අඳුරු දුරුකොට දසමසක් වැස, දෙව්බඹ පිරිස් මැද ළහිරුමඬලක්සේබිහිව ක්‍රමයෙන් වැඩී, දෙවඟනන් වැනි වරඟනන් තිස්දහසක් පිරිවරා නවදහසක් හවුරුදු රජසිරි වළඳා යසවතී නම් දේවින් සීලව නම් පුත්රුවන වැදූ දා වර තුරඟ යානාවෙකින් වැඩ තිස්කෙළක් සෙනඟ හා සමග එක දා මහණව අටමසක් දුෂ්කර ක්‍රියා පුරා උත්තරා නම් සිටුදුව දුන් පිවිතුරු කිරිපිඬු වළඳා සවස අටපණස්රියන් විදුරසුන් අරා නාසිරිබෝ පිට දී වැඩ හිඳ සව් කෙලෙසුන් නසා බුදුව තමන්වහන්සේ පෙර බොධිසත්ව සමයෙහි දන් දුන් දරු දෙදෙනා හුණකිලිල් සේ මූරු මූරුයා කකා, දෙක පොළොයෙන් නිකුත් රුධිර ධාරාවන් වගුරුම වගුරුවා කට දල්වා පැලූ කරදල නම් ඒ දරුණු යකු දැක ද, සිත නො කලඹා කළ පැතුම් බලයෙන් හා, තව ද-සිටුපුතක් ව සීහලග තෙල්කඹ සිසාරා පහන් දල්වා තුන්යම් රැ එක් බුදුකෙනෙකුන්ගේ ධාතු සෑයක් වටා දිවි දී පුදකළ පහන් බෙලෙන් නොසු බුදුන් වඩා සිය

ලඟින් නික්මුත් රැස්කඳින් දසදහසක් සක්වළ දිවාරාත්‍රියෙහි බබුළුවා හිරුසඳු රැස් මලක්වා සසුන් නමැති ආකාශයෙහි ගුරු සිකුරු තරු වැනි වූ සුදෙව ය, ධම්මසේන ය යන අගසවු දෙදෙනා සමග කෙළ ලක්‍ෂයක් මහරහතුන් පිරිවරා, අචාලිත වූ පාලිත නම් මහතෙර කෙණෙකුන් අතින් අත් පා මෙහෙ විඳ අටාසූරියන් බුදුබෙදකින් අනූදහසක් හවුරුදු බුදුසිරි වළඳා මුළු ලොව බබුළුවා නිවන්රස දෙන සේක. එ කල අප මහබෝධිසත්ත්වයෝ සුරුචි නම් බමුණු ව කෙළ ලක්‍ෂයක් රහතුන් සමග බුදුන් පවරා ගෙණවුත් සක්දෙව් රජහු මවා දුන් අටසාළිස් ගවු සත් රුවන් මණ්ඩපයක වඩා හිඳුවා පැන් නො වැකූ කිරිබතින් අසදෘශ මහදන් සත්දවසක් දී පසුවද බුදුන්ට අනගි පිරිකරක් හා, කෙළලක්‍ෂයක් රහතුන්ට කෙළලක්‍ෂයක් අට පිරිකර දෙනුමෝ පෙළග හුන් තමාට පස්සෙහි පිරිකර සතරන් දහසක් අගනා කොට දී ඒ මඟුලේ මඟුල් නම් බුදුන් අතින් ද විවරණ ශ්‍රී ලදින් එකෙණෙහි දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ තුන්වන වූ විවරණ මඟුල් පූජාව ලත් සේක.

නව ද–එ ම කප දෙවන අනතර කල්පයෙහි, සුමන නම් බුදුහු මෙඛලං නම් නුවර සුදත්ත නම් රජහුගේ සිරිමා නම් අගබිසවුන් කුස පිළිසිඳ දසමසක් වැස තුන්ලෝ තිලකානක් සේ බිහි ව ක්‍රමයෙන් වැඩී පුරහනන් වැනි පුරඟනන් තෙසැට දහසක් පිරිවරා නවදහසක් හවුරුදු රජසිරි විඳ වටංසකා නම් බිසවුන් නිරූපම වූ අනුපම නම් පුත්රුවන වැදූ ද මඟුලැත්යානින් මහබිනික්මන කොට එක ද තිස් කෙළක් දෙනා හා සමග මහණ ව දසමසක් දුෂ්කරක්‍රියා කොට අනුපම නම් සිටුදුව දුන් නිරුදක වූ කිරිපිඬු වළඳා, තිස්රියන් විදුරසුන් අරා, නාසිරිබෝ මුල දී වැඩහිඳ, පස් මරුන් බිඳ, බුදුව සසුන් නමැති කල්පද්‍රැමයෙහි ජාත ශාඛා පුන්මයක් වැනි සරණය, භාවිතත්තය යන අගසවු දෙදෙනා සමග කෙළලක්‍ෂයක් මහසව්වන් පිරිවරා පිදේනී වූ උදේනි නම් ඉහතෙර කෙණෙකුන් අතින් අත්පා මෙහෙ විඳ අනූරියන් බුදුබෙදකින් අනූදහසක් හවුරුදු ආසිරි වළඳා ලෝවැඩ කරණ සේක. එ කල අප මහාබෝධිසත්ත්වයෝ අතුල නම් දිව්‍යනාගරාජයන් ව නේ පුවහස් දිව නසින් පිරිවරා අවුදින් බුදුන් හා සමග කෙළලක්‍ෂයක් මහරහතන් පිරිවරා දිමඩිත් වළඳවා, කෙළලක්‍ෂයක් දිවසළු පුදා, දිව්‍ය පූජායෙන් සුමනකොට, ඒ සුමන නම් බුදුන් අතින් විවරණ ශ්‍රී ලදින්, එ ද දසදහසක් සක්වළ දෙව්බඹුන් කළ මේ සතරවන විවරණ මඟුල් පූජාව ලත් සේක.

තව ද-එම කප තුන්වන අනතර කල්පයෙහි රේවත නම් බුදු රජාණෝ සුධඤ්ඤවතී නුවර විපුල නම් රජහුගේ විපුලා නම් අග බිසවුන් කුසින් චිත්‍රකූට පර්වතයෙන් බස්නා සවර්ණහංසරාජයකු සේ බිහි ව පෙර‘ඹමිස සඳ සේ වැඩී සුරලියක් වැනි වරලියන් තෙතිස් දහසක් පිරිවරා, දසදහසක් හවුරුදු රජය කොට සුනන්දා නම් දේවීන් තමන් හා එක් වැනි වූ වරුණ නම් පුත්රුවන වැදූ දා රථ යානාවකින් නික් ම කෙළක් පිරිස් සමග එක් දා මහණ ව, සත් මසක් පධන් සැරිසරා සාධුදේවිය දුන් කිරිබත් වළඳා, තෙපණස් රියන් විදුරසුන් අරා නාගශ්‍රී බෝධියට පිට දී වැඩහිඳ, කෙලෙසුන් නසා බුදු ව සසුන් නමැති ගුවනෙහි නැඟූ ජය කෙතු යුග්මයක් වැනි වරුණය, බ්‍රහ්මදේවය යන අගසව්වන් දෙදෙනා සමග කෝටියක් පමණ මහසව්වන් පිරිවරා ගුණ විහව් සම්භව නම් මහ තෙරකෙණකුන් අතින් නිති මෙහෙ ගෙණ අසූවියක් බුදුබලෙහින් දිලියෙමින් ව්‍යාම ප්‍රභාමණ්ඩලයකින් සතර ගව්වක් තැන් දීමා රැ බබුලුවා සැටදහසක් හවුරුදු ආයිරි වළඳමින් සවුගතුන් සිවන් පුර පුරා වැඩවසන සේක. එ කල මාගේ ශ්‍රීමහාබෝධිසත්ත්වයාණෝ අතිදේව නම් බ්‍රාහ්මණ ව සිවු වේදය ගෙවා දැන මහා පණ්ඩිත ව ඒ බුදුන් කරා ගොස් දෙතිස් ලකුණු දුටු සතුටින් දහසක් වටිනා උතුරු සළුවෙන් පුදා බුදුන් බල බලා සිටි පිය නොසොල්වා සිට, විසිතුරු සිලෝ දහසක් බැඳ බුදු ගුණ කියා; ඒ රේවත නම් බුදුන් අතින් ද විවරණ ශ්‍රී ලදින් එ තැන රැස්වූ දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ පස්වන වූ විවරණ මඟුල් පූජාව ලත් සේක.

තව ද-එම් කප සතරවන අනතර කල්පයෙහි ශෝභිත නම් බුදු රජාණෝ සුධර්මා නම් නුවර සුධර්ම නම් රජ්ජුහුගේ සුධර්මා නම් බිසවුන් කුස පිළිසිඳ දසමස් අනාමෙන් මහ මේ ගැබෙකින් නිකුත් පුන්සඳ මඬලක් සේ බිහි ව කුමාරශ්‍රීන් වැඩී දෙවඟනන් වැනි වරඟනන් සැත්තෑදහසක් පිරිවරා දසදහසක් හවුරුදු රජසිරි විඳ මබිලා නම් බිසවුන් සිංහ නම් පුත්රුවන වැදූ දා තමන් රජසිරි විඳිමින් රන් පායෙහිදී ම පැවිදි ව එම දා ම චතුර්ධ්‍යාන උපදවා සත් දවසක් එ ම ගෙහි පධන් සැරිසරා වෙසඟ මැදි පොහෙදා ඒ මබිලා නම් අග බිසවුන් පිස දුන් මී කිරිබත් වළඳා, මහබිනික්මන් කෙරෙමි යි සිතුකෙණෙහි කුසල් බෙලෙන් එම රන්පාය පොළොවින් අහසට නැඟී සිවුරඟ සෙනග සමග පුන්සඳ මඬලක් සේ ගොස් බෝමැඩ වටා ෑබෝගෙයක් සේ පිහිටි කල්හි අඳහස් දක් වරඟනන් පායෙන් බැස සිවුරඟ සෙන් හා උන් සමග නුවර ගිය කල්හි රජසිරි උන් සිංහාසනාරූඪ ම නාගබෝධිය පිට ලා වැඩ හිඳ

කෙලෙසුන් නසා බුදු ව සසුන් නමැති මහාසරසියෙහි පැනනැඟි පද්ම ගුල්මයක් මැනි වූ අසමය, සුනෙත්‍රය යන අගසව්වන් දෙදෙනා සමග තිස්කෙළක් පමණ මහරහතන් පිරිවරා ගුණානන්ද වූ ආනන්ද නම් මහාසථවිරකෙණෙකුත් අතින් උපසථාන ලදින්, අටපණස් රියන් බුදුබඳෙකින් අනූ දහසක් හවුරුදු ආසිරි විළඳ බුදුසිරි විඳිසේක. එ කල අප මහාබෝසතාණෝ සුජාත නම් බමුණු ව බුදුන් දූත බණ අසා සතුටු ව බුදුපාමොක් සඟපිරිසට තුන්මසක් දන් දී ඒ සොභිත නම් බුදුන් අතින් ද විවරණශ්‍රී ලදින් එ කෙණෙහි දසදහසක් සක්වළ දෙව්බඹුන් කළ මේ සවන විවරණ පූජාව ලත් සේක.

එ තැන් පටන් බුද්ධශූන්‍යව අසඞ්ඛ්‍යයක් කප් ගියකල වර නම් කල්පයෙක් වී ය. එහි-අනොමදස්සි ය, පදුම ය, නාරද ය යන මුනි උතුමෝ තුන්දෙනෙක් උපන්න. එයින් අනොමදස්සි නම් බුදු රජාණෝ සඳවත් නම් නුවර සඳවත් නම් රජහුගේ යසොධරා නම් දේවීන් කුස පිළිසිඳගත් තැන් පටන් මැනියන් ඇඟින් නික්මුත් ප්‍රභාවෙන් අසුරියන් ගෙයි පහන් නොනංවා දූරග මිණිරුවණක් සේ වැස දසමස් ඇවෑමෙන් බාලාකීමණ්ඩලය සේ, බිහිව ක්‍රමයෙන් වැඩී දිව්‍යස්ත්‍රීන් බඳු පුරස්ත්‍රීන් දසදහසක් පිරිවරා දස දහසක් හවුරුදු රජ සිරි විඳ සිරිමා නම් අගබිසවුන් උපවාන නම් පුත්රුවන වැදූ දා රන්සිව්ගෙයකින් වැඩ තිස්කෙළක් අගමැතියන් හා සමග පැවිදි ව දසමසක් වීර්‍ය්‍යකොට අනූපමා නම් සිටුදුව දුන් කිරිපිඩු වළඳා අටතිස් රියන් විදුරසුන් අරා මහකුඹුක් සිරිබෝ පිට ලා වැඩහිඳ මරසෙන් බිඳ බුදුව සසුන් නමැති මහරත්පව්වෙහි ජාත රන්කුළු සගලක් වැනි වූ නිසභය, අනොමය යන අගසවු දෙදෙනා සමග තිස් කෙළක් මහරහතුන් පිරිවරා සරණ වූ වරුණ නම් මහතෙර කෙණෙකුත් අතින් අත් පා මෙහෙ විඳ අටපණස් රියන් බුදුබඳෙකින් ලක්‍ෂයක් හවුරුදු ආසිරි වළඳා එකල; සරද තාපස සිරිවඩ්ඪන නම් දූත් අපගේ සැරියුත් මුගලන් යන දෙදෙනාවහන්සේට අගසවු ප්‍රාර්ථනා ද දී බොහෝ සතුන් නිවන් පුරයෙහි පුරා වැඩවසන සේක. එ කල අප මහබෝසතාණෝ මහෙසාක්‍ය යක්‍ෂරාජන්ව උපද නෝ සුවහස් යක්සෙන් පිරිවරා අවුදින් සත්රුවන් මණ්ඩපයක් මවා බුදුපාමොක් මහසඟනට සත් දවසක් දිව්‍යා:හාර දන් දී ඒ අනොමදස්සි නම් බුදුන් අතින් ද අනොම වූ විවරණ ශ්‍රී ලදින් එ සඳ දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ සත්වන විවරණ මඟුල් පූජාව ලත් සේක.

තව ද-එම කප දෙවන අනතරකල්පයෙහි පදුම නම් සර්වඥ දරුවාණෝ චම්පා නම් නුවර අසම නම් රජුගේ අසමා නම් බිසවුන් කුස පිළිසිඳ දසමස් පුරා දඹදිව්තෙලෙහි පිහුම්වැහි වස්වා, දෙව් බඹ කැලන් මැද බිහි ව දෙව්කුමරකු සේ වැඩී කෙළිස් දහසක් වරඟනන් පිරිවරා දසදහසක් හවුරුදු රජ කොට උත්තරා නම් බිසවුන් රම්‍ය නම් පුත්කුමරුවා ලත් දා රථානාකාවකින් වැඩ සියක් ලක්‍ෂයක් ඇමැතියන් හා සමග එක ද මහණ ව අවමසක් දුෂ්කරක්‍රියා පුරා ධනාවතී නම් සිටු දුව දුන් මී කිරි පිඩු වළඳා සවස බෝමැඩව වැඩ අවතිස් රියනක් විදුරසුන් අරා සෝණසිරිබෝ පිට දී වැඩ හිඳ සව් කෙලෙසුන් නසා බුදු ව සසුන් නමැති මහරත් පියුමෙහි ජාත රත්පෙති සඟලක් වැනි සාලය, උපසාලය යන අගසවු දෙදෙනා සමග කෙළක පමණ මහරහතුන් පිරිවරා සරණ වූ වරුණ නම් ස්ථවිර කෙනෙකුන් විසින් කරණ ලද අත් පා මෙහෙ ඇති ව අටපණස් රියන් බුදු බඳෙකින් සවුරුදු ලක්‍ෂයක් වැඩහිඳ දහම් වැසි වස්වන සේක. එ කල මාගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝ සිංහරාජන් ව ඉපද සත්දමසක් ධ්‍යාන සුවයෙන් වන මැද වැඩහුන් බුදුන් දැක තුන් යලක් පැදකුණුකොට, තුන් යලක් ප්‍රීතීන් සිංහනාද පවත්වා මඤු නමත් අසිම්සලෝවන පූජා වට කරණ සරඹයක් සේ ගොදුරු නොකා නොසැලී ඇස නොමිරු සත්දවසක් බුදුන් බලා දිවි පුද සිටි දා ය. බුදුහු ධ්‍යාන සුවයෙන් නැඟී බුදුකුරුදම් විසී කළ ඒ සීරජු දැක සිතත්නා හා සමග වැඩ සිතාරා සිට ගත් ශ්‍රාවකගණයා මැද, "මහණෙනි! මේ සිංහරාජයන් මට දිවි පුද හුන් කුසලින් මතු ගෞතම නම් බුදු ව මා සේ ම ලෝ වැඩ කෙරෙ.යි වදාළසේක. මෙසේ ඒ පදුම නම් බුදුන් අතින් ද විවරණ ශ්‍රී ලදින් එකෙණෙහි දසදහසක් සක්වල දෙව් බඹුන් කළ මේ අටවන විවරණ පූජාව ලත්සේක.

තව ද- එම කප තුන්වන අනතරකල්පයෙහි, නාරද නම් බුදුරජාණෝ සුධඤ්ඤවතී නම් නුවර සුදෙව් නම් රජහුගේ අනුපමා නම් අගබිසවුන් කුස පිළිසිඳ දඹදිව දෙර දෙර කප්රුක් නංවා බඹලොවින් බස්නා බඹකුමරෙකු සේ බිහි ව කුමරසිරින් වැඩී පුරඟනන් එක්ලක්‍ෂ විසිදහසක් පිරිවරා නවදහසක් හවුරුදු රජසිරි වළඳා විජිතසේනා නම් අගබිසවුන් නඳුත්තර නම් පුත්රුවන වැදූ දා, සිවුරඟසෙන් සමග සිරිපතුල් යාතින් මඟුල් උයන් වැඩ මඟුල්සලවට වැඩ හිඳ, ලක්‍ෂයක් ඇමැතියන් හා සමග පැවිදි ව එම උයන සත්දවසක් පධන් සැරිසරා අගබිසවුන් පිසදුන් මීකිරිබත් වළඳා එම උයනෙහිදී ම අවපණස්රියන් විදුරසුන් අරා මහාසෝණ

නම් සිරිබෝකඳ පිට දී සව්නේ ගෙවා දැන බුදු ව සසුන් නමැති ගුවනෙහි දෙව්දුනු දෙකක් වැනි වූ, භද්‍රසාල ය, සුනේත්‍ර ය යි යන අගසවු දෙදෙනා සමග ලක්‍ෂයක් පමණ මහරහතන් පිරිවරා ශිෂ්ටවූ වාශිෂ්ඨ නම් මහතෙර කෙණෙකුන් අතින් නිති මෙහෙ ලදින් අව අසූරියක් බුදුබඳින් දිලිසෙන බ්‍යාමප්‍රභාමණ්ඩලයෙන් යොදනක් තැන් දසදිග බබුළුවා අනූදහසක් හවුරුදු ආසිරි වළඳා ද්‍රෝණමුඛ නම් නාගරාජයා ආදී වූ බොහෝ සතුන් දමා නිවන් පුර පුරා වසන සේක. එ කල අප මහබෝසතාණෝ උග්‍ර වූ තපස් ඇති ව ධ්‍යානලාභී ව මෙතෙහි වසන දෑ අසූකෙලක් රහතන් හා අනාගාමී උපාසක දසදහසක් සමග පන්සලට වැඩ බුදුන් දැක පැහැද බුදු පාමොක් සංඝපිරිසට විසිතුරු කොට පන්සල් මවා සතපා රූ බණ අසා ළිඳගෙ උතුරුකුරුදිව වැඩ දිව බත් ගෙණවුත් වළඳවා, මෙසේ සත්දවස සනපා පසුවදා අනගි රත්සඳුන්හරක් බුදුන් පෙරට පුදා ඒ නාරද නම් බුදුන් අතින් ද චීවරණ ශ්‍රී ලදින් එකෙණෙහි දසදහස සක් සක්වළ දෙව් බඹුන් කළ මේ නවවන චිවරණ මඟුල් පූජාව ලත්සේක.

නව ද–මෝහාන්ධකාරයෙන් ලොව ඒකාන්ධකාර ව අසංඛ්‍යයක් කප් බුද්ධ ශූන්‍ය ව ගිය කල අපගේ මේ භද්‍රකල්පයට ලක්‍ෂයක් වන සාර නම් කල්පයෙහි සාරවූ ගුණ ඇති, පියුමතුරා නම් බුදු රජාණෝ හංසවතී නම් නුවර ආනන්ද නම් රජහුගේ සුජාතා නම් අගබිසවුන් කුස පිළිසිඳ ලොව පියුම් මැසි වස්වා මහාබ්‍රහ්මයා අත රන්දලට බ්‍රහ්මකුමාරයකු සේ බිහි ව ක්‍රමයෙන් වැඩී ලක්‍ෂයක් නාටක ස්ත්‍රීන් පිරිවරා දසදහසක් හවුරුදු දසරජදම් පුරා වාසුදත්තා නම් අගබිසවුන් අනුතතර වූ උත්තර නම් පුත් රුවන වැදූ ද මහබිනික්මන් කෙරෙමි යි සිතූ කෙණෙහි පින් බෙලෙන් අහසට පැන නැංගාවූ රන් මාළිගාවෙන් සිවුරඟසෙනග සමග වැඩ බෝමැඩ කරා බැස නැවත එම මාලිගාවට ගොස් සිය නුවර පිහිවා ගිය කල ස්ත්‍රීන් හැර හැම සෙන් සමග මහණ ව සත් දවසක් ප්‍රධන් සැරිසරා වෙසගමැදි පොහෝදා රුචිනන්ද නම් සිටුදුව දුන් මී කිරිබත් වළඳා, අටකිස්රියන් විදුරසුන් අරා, සළල සිරිබෝ පිට දී වැඩ හිඳ කෙලෙසුන් නසා බුදු ව උදන පවත්වා සත්දවසක් බුද්ධාසනයෙහි වැඩහිඳ සත් වෙනි දා දක්ෂිණ ශ්‍රීපාද ය පොළොවට දිගුකොට වදාළසේක. එ කෙණෙහි අනූරියන් දිග මහ පෙති ඇති, තිස්රියන් දිග කෙසුරු ඇති, දොළොස් රියන් කෙමි ඇති, මහපියුමක් පොළොව පලා පැනනැගී, ශ්‍රී පාද ය

පිළිගත. වාම ශ්‍රීපාදය ඔසවා වදාළසේක. එසේ ම මහපියුමෙක් පැන නැගී ඒ ශ්‍රීපාදයද පිළිගත. මෙසේ බුදුහු දෙළොස්රියන් පියුම් කෙමියෙහි එකොළොස්රියන් ශ්‍රීපාද ය තබ තබා වඩනාසේක්, නැගූ නැගූ පත්ලෙහි පියුම් අනානඹාත වෙ යි. දිගුකල කල පත්ලෙහි පියුම් පෙණෙයි. මෙසේ ඒ පියුම්වල නවනිඹක් පමණ රොන් අහසට පැන නැගී අටපණස්රියන් බුද්ධකාය රත් පතීතයෙක ලාක්ෂාරස ඉස්නා සේ තවරමින් බසී යි. ඉක්බිත්තෙන් බුදුන්ගේ ශ්‍රී ශරීරයෙන් බුදුරැස් කඳෙක් දිම අවට දෙලොස් යොදුනෙහි පැතිර දිවා රාත්‍රියෙහි වෙනසක් නො දක්වා සිටගත. මෙසේ ඒ බුදුන් මවුකුසින් බිහිවූ වේලෙහි ද බුදු වූ වේලෙහි ද දස දහසක් සක්වළ පියුම වැසී වැසපී ය. දිවි පමණින් ම නැගූ නැගූ පත්ලෙහි පියුම් නැගෙ යි. එසේ හෙයින් ඒ බුදුහු පියුමතුරා නම් සේක. ඒ පියුමතුරා නම් ස්වාමිදරුවෝ සසුන් කාමැති සතත ප්‍රාසාදයෙහි මැවුනු රුවන් මැණි සඟලක් මැනිවූ දෙවල ය සුජාත ය යන අගසව්වන් දෙදෙනා සමග සැත්තෑ ලක්ෂයක් මහරහතන් පිරිවරා සුමන වූ සුමන නම් මහතෙර කෙණෙකුන් අතින් අත්පා මෙහෙ වීද දෙලොස් යොදනක පැතිරෙණ බ්‍යාමප්‍රභාමණ්ඩල ඇති ව අටපණස් රියන් බුදුබඳෙකින් ලක්ෂයක් හවුරුදු ආසිරි වළඳා අප බුදුන්ගේ අසුමහසව්වන්ට ද විවරණ දී, දෙශනාරශ්මීන් විනෙය කුමුදුවන පුබුදු වන සේක. එ කල්හි අප මහ බෝසතාණෝ කෝටි ගණන් ධන ඇති ජටිල නම් මහරැටි ව බුදුපාමොක් මහසඟනට හා සිවුරු පිරිකර දී ඒ පියුමතුරා නම් බුදුන් අතින් ද සිතු උතුරුවා විවරණ ලදින් එකෙණෙහි දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ දසවන විවරණ මඟුල් පූජාව ලත්සේක.

මෙසේ සිටි ලක්ෂයක් කපින් සැත්තෑ දහසක් කප් බුද්ධ ශූන්‍ය ව ගිය කල මෙයට තිස්දහසක්වන සාරමණ්ඩ නම් කල්පයෙහි සුමෙධ ය - සුජාත ය යන සර්වඥවරයෝ දෙදෙනෙක් උපන්හ. ඉන් සුමේධ නම් බුදුරජාණෝ සුදර්ශන නම් නුවර සුදත්ත නම් රජුහුගේ සුදත්තා නම් අගබිසවුන් කුසින් මෙසඹුබයෙන් නික්මුනාවූ සඳ මඬලක් සේ බිහිව ක්‍රමයෙන් වැඩී දෙවඟනන් බඳු වරඟනන් අට සාළිස් දහසක් පිරිවරා නවදහසක් හවුරුදු රජසිරි විඳ සුමනා නම් බිසවුන් පුනර්බසුමිත්‍ර නම් පුත්රුවන වැදූ දා ඇත්යානෙකින් වැඩ කෙළ සියයක් පුරුෂයන් හා සමග මහණ ව අටමසක් දුෂ්කර ක්‍රියා පුරා නකුලා නම් සිටුදුව දුන් කිරිපිඩු වළඳා විසිරියන් තණ

පලඟ පිට ණීප සිරිබෝ පිට දී සිවුරග ලූවා වැඩහිඳ මුළුලොව සඳ බුදු ම සසුන් නැමැති මහසරසියෙහි පැන නැගී දූරගම්ණිරුවන් සහලක් වැනි වූ සරණ ය, සම්බතාම ය යන අගසව් දෙදෙනා සමග කෙළ සියයක් පමණ මහරහතන් පිරිවරා සාගරය සේ ගුණ ඇති වූ සාගර නම් මහතෙරකෙණෙකුන් අතින් අත් පා මෙහෙ විඳ සිහලඟ රසින් යොදනක් තැන් දම් රැ බබුළුවා අටාසූරියන් උස බුද්ධ කායෙකින් අනූදහසක් හවුරුදු ආසිරි වළඳා වැඩහිඳ, තමන් වහන්සේම සිපී පඩිනයක් සා හිසක් මවා, හිරුමිඩල සා ඇස් මවා ගල්ගුහාවක් ගේ කට දල්වා, කම් ගි දිවු කුම්භකණ්ණ නම් යක්ෂයා ආදීවූ බොහෝ සත්වයන් අමාමහනිවන් පමුණුවා වසනසේක. එ කල අප මහබෝසතානෝ උත්තර නම් මානවක ව අසූ කෙළක් ධනය එක ද විසඳා බුදුපාමොක් මහසඟනට මහදන් දී එම්'දා පැවිදි ව ඒ සුමෙධ නම් බුදුන් අතින් ද, සුමේධ වූ විවරණශ්‍රී ලදින් එකොළොණහි දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ එකොළොස් වන විවරණ මඟුල් පූජාව ලත් සේක.

තව ද-එම කප දෙවන අනතර කල්පයෙහි සුජාත නම් බුදු රජාණෝ-සුමඞගල නම් නුවර උග්ගත නම් රජහුගේ ප්‍රභාවතී නම් බිසවුන් කුස පිළිසිඳ දසමස් පුරා මිණිගුහායෙකින් නික්මුත් කෙසර සිංහරාජයකු සේ බිහි ව ක්‍රමයෙන් මැඩී තෙවිසිදහසක් පුරඟනන් පිරිවරා නවදහසක් හවුරුදු රාජ්‍යශ්‍රී විඳ ශ්‍රීනන්දා නම් දේවීන් උපසේන නම් පුත්රුවන වැදූදා වර තුරඟයානින් මහ හිනික්මන්කොට එක්දා සියක් ලක්ෂයක් ඇමතියන් හා සමග මහණ ව නවමසක් දුෂ්කරක්‍රියා පුරා ශ්‍රීනන්දා නම් සිටුදුව දුන් කිරිපිඩු වළඳා දෙනිස්රියන් තණපලඟ පිට හුනගසක් පිට ලා වැඩ හිඳ මරසෙන් බිඳ බුදු ව සසුන් නමැති ගුවනෙහි නැගූ ධවජමාලා වක් වැනි වූ, සුදශීනය, සුදෙව ය යන අග්‍රශ්‍රාවක දෙදෙනා සමග සියක් ලක්ෂයක් මහරහතන් පිරිවරා, ගුණයෙන් විසාරද වූ නාරද නම් මහතෙර කෙණෙක් අතින් අත් පා මෙහෙ විඳ පණස්රියන් බුදුබඳෙකින් අනූදහසක් හවුරුදු ආසිරි වළඳා මුළුලොව නිවන් පුර පුරා වැඩවසන සේක. එකල අප මහබෝසතානෝ චක්‍රවර්ති රජ ව බුදුන් දුටු සතුටින් සක්විති රජ ය. පුදා මහණ ව ඒ සුජාත නම් බුදුන් අතින් විවරණ ශ්‍රී ලදින් එකොණෙහි දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ දොළොස්වන විවරණ මඟුල් පූජාව ලත්සේක.

තුබූ තිස්දහසක් කපින් විසිනවදහස් අටසිය දෙයාසූකපක් බුද්ධ ශූන්‍ය ව ගියකල මෙයට එක්සිය අටළොස්වන වර පැම

කල්පයෙහි පියදස්සී ය, අත්ථදස්සී ය, ධම්මදස්සී ය යන බුද්ධෝත්පාද තුනෙක් වී ය. එහින් පියදස්සී නම් ස්වාමිදරුවාණෝ සුධඤ්ඤවතී නම් නුවර සුදත්ත නම් රජුහුගේ චන්ද්‍රවතී නම් බිසවුන් කුස පිළිසිඳ දසමස් පුරා දෙව් බඹ නැලන් මැද මුදුන් මල්කඩක් සේ බිහි වැ ක්‍රමයෙන් වැඩි දෙතිස් දහසක් රන්ලියන් වැනි මරලියන් පිරිවරා නවදහසක් හවුරුදු රජසිරි පුරා විමලා නම් අගබිසවුන් කඤ්චනවෙල නම් පුත්රුවන වැදූ දා අශ්වයානයෙන් නික් ම, සියක් ලක්ෂයක් හා සමඟ මහණ ව සමසක් වීර්‍යකොට වසභා නම් බැමිණිය දුන් මී කිරිපිඩු වළඳා තෙපණස්රියන් මිණිපලඟ පිට පුවඟුසිරිබෝ පිට ලා වැඩ හිඳ සව්නේ ගෙවා බුදු ව බුදුසසුන් නමැති රන්කෙතෙහි ගත් රත්කරල් සගලක් මැති වූ පාලිත ය සබ්බදස්සී ය යන අග්‍ර ශ්‍රාවක දෙදෙනා සමග සියක් ලක්ෂයක් මහරහතන් පිරිවරා සොභිත වූ ගුණ ඇති සොභිත නම් වූ මහතෙරකෙණෙකුන් අතින් අත් පා මෙහෙ විඳ අසූරියන් බුදුබඳකින් අනූදහසක් හවුරුදු ආසිරි වළඳා වැඩහිඳ අලව් යකු සේ දැඩි වූ සුදර්ශන නම් යක්ෂරාජයා ද, සොණ නම් දෙව්දත්තයා මෙහෙසු ද්‍රෝණමුඛ නම් හස්තිරාජයා ආදී වූ බොහෝ සතුන් ද දමා නිවන්සෙත් දී වැඩවසන සේක. එ කල මාගේ ශ්‍රීමත් බෝධි සත්වයාණෝ කාශ්‍යප නම් බ්‍රාහ්මණ මාණවක ව ත්‍රිවේද ය දැන සධනී ව වසන්නාහු බුදුන් දැක සතුටු ව කෙළලක්ෂයක් ධන විය දන් කොට සඞ්ඝාරාමයක් කරවා දන් දී ඒ පියදස්සී නම් බුදුන් අතින් ද විවරණ ශ්‍රී ලදින් එතෙණෙහි දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ තෙලෙස්වන විවරණ මඟුල් පූජාව ලත් සේක.

තව ද-එම කප දෙවන අනන්තරකල්පයෙහි අත්ථදස්සී නම් බුදු රජාණෝ සොභන නම් නුවර සාගර නම් නරපතිහුගේ සුදසුන් නම් අගබිසවුන් කුස පිළිසිඳ, දසමස් පුරා දෙව් බඹ පිරිස් මැද ගුවනින් බස්නා සත්රුවනක් සේ බිහි ව ක්‍රමයෙන් වැඩි පුරස්ත්‍රීන් තිස්දහසක් පිරවරා; දසදහසක් හවුරුදු රජකෙළි කෙළ විශාඛා නම් අගබිසවුන් සෙල නම් පුත්රුවන වැදූ දා අශ්වයානයෙන් රජ ය හැර ගොසින් එක් ද නවකෙළක් සෙන් සමග මහණ ව අවමසක් වීර්‍යකොට සුවිනබරා නම් නාගකන්‍යාව දුන් මධුපායාසය වළඳා සවස තෙපණස්රියන් විදුරසුන් නැගී සපු සිරිබෝ පිට ලා වැඩහිඳ බුදුසිරි ලදින් සසුන් නමැති මහාජම්බුවෘක්ෂ මූලයෙහි පැන නැගි සුවර්ණාංකුර පුශ්මයක් බඳු වූ ශාන්ත ය, උපශාන්ත ය

යන අගසවු දෙදෙනා සමග නවකෙළක් පමණ මහරහතන් පිරිවරා ගුණගණ විභව අභය නම් මහතෙරකෙණෙකුන් අතින් අත්පා මෙහෙවිඳ අසූරියන් උස බුද්ධකායෙකින් යොදනක් තැන් දව රැ සව ණක් රසින් බබුළුවා හවුරුදු ලක්ෂයක් ආයු සිරිවළඳා තුන්ලොව තගා ලූ ඒකප්‍රදීපයක් සේ දිළියෙන සේක. එ කල මාගේ ශ්‍රීමහාබෝධි සත්වයාණෝ සුසීම නම් බ්‍රාහ්මණ මහාසාර ව සියලු සැපත් හැර වල් ගොස් පැවිදි ව ධ්‍යාන සුවයෙන් වසන ද, බුදුන් කරාගොස් බණ අසා සතුටු ව එකෙණෙහි ශක්‍රභවනයට නැගී මතැතෙකු දුටු කොබෝලිල අත්තක් සේ සියක් යොදුන් පරසතුරුකා සලා පරසතු මල් ගෙණවුත් සියලු පම්දට පෙණී "සාධු! මම ද මෙසේ ම බුදු ව දම් දෙසම්වා" යි අඩගා මුළුසක්වළට අස්නා මහවැස්සක්-සේ මල් වැසි වස්වා මහත් වූ මල් මඬුවක් මවා පරසතුමල් කුඩයක් බුදුන් සිරසට පුදා එ ද, ඒ අත්ථදස්සී නම් බුදුන් අතින් විවරණ ශ්‍රී ලදින් එකෙණෙහි සතුටු ව දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ තුදුස්වන විවරණ මඟුල් පූජාව ලත් සේක.

තම ද-එම කප තුන්වන අනතරකල්පයෙහි ධම්මදස්සී නම් බුදුරජාණෝ සරණ නම් කුමර සරණ නම් නරෙන්ද්‍රයාගේ සුනන්දා නම් අගබිසවුන් කුස මිණිරුවනක් සේ වැස වලාකඩෙකින් නිකුත් පුන් සඳමඩලක් සේ බිහි ව ක්‍රමයෙන් වැඩී එක්ලක්ෂ විසිදහසක් වර යුවතීන් පිරිවරා අටදහසක් හවුරුදු රජදම් පුරා විචිකොළි නම් බිසව, පුණ්‍යවර්ධන නම් පුත්රුවන වැදූ ද, මැදයම් රැ නාටක ස්ත්‍රීන්ගේ වික්‍රියා දුක වල් යෙමි යි සිතූ කෙණෙහි පින්බෙලෙන් මැඩහුන් රත්පහය පොළොවින් නැගී දෙවන හිරුමඩලක් සේ ගොස් බෝමැඩ කරා බව කල මහබඹහු දුන් අටපිරිකර දරා රත් පායෙන් බැස සිරිතල පුරස්ත්‍රීන් හා පිරිවර අඟනන් අඬගව්වක් තැන් ගොස් හුන් කල එම රත්පාය නැවත නැගී බෝගෙයක් සේ බෝ මැඩ කරා ගොස් පිහිටි කල, කෙළලක්ෂයක් ඇමතියන් සමඟ මහණ ව සත්දවසක් සැරිසරා එම අගබිසවුන් පිස දුන් මී කිරිබත් වළඳා තෙපණස් රියන් මහ්‍රාසනාරූඪ ව රත්කරව් සිරිබෝ පිටලා වැඩහිඳ තුන්ලෝතිලක ව කෙලෙසුන් ගෙවා බුදු ව තමන්වහන්සේගේ ශ්‍රීපාද නමැති පද්මයෙහි වසන භෘඞ්ගරාජ යුග්මයක් වැනි වූ පදුම ය, ඵුස්සදෙව ය යන අගසව් දෙදෙනා සමඟ කෙළලක්ෂයක් මහරහතන් පිරිවරා සුන්දරවූ නෙත්‍ර ඇති සුනෙත්‍ර නම් මහතෙර කෙණෙකුන් අතින් අත් පා මෙහෙ විඳ අසූරියන් උස බුද්ධකායෙකින් ලක්ෂයක් හවුරුදු ආයු සිරි වළඳා මුළුලෝ දුකින් මුදා වැඩ

වසන සේක. එකල අප මහබෝසතාණෝ ශක්‍රදේවේන්ද්‍රව ඉපැද දෙදෙව්ලොව දෙවියන් පිරිවරා අවුත් දිව සුමඳ මලින් පුදා ඒ ධම්මදස්සී නම් බුදුන් අතින් විවරණ ශ්‍රී ලදින් එකෙණෙහි දස දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ පසළොස්වන විවරණ මඟුල් පූජාව ලත්සේක.

තුබූ එක්සිය අටළොස්වන කපින් ශූන්‍ය කල්පයන් සුවිසි දෙනෙකු ගිය කල, මෙයට සිවු අනූවන සාර නම් කල්පයෙහි සිද්ධාර්ථ නම් බුදුරජාණකෙනෙක් වෙභාතික නම් නුවර උදෙන නම් රජහුගේ සුඵස්සා නම් දෙවින් කුසින් සිතුමිණිරුවනක් සේ බිහි ව ක්‍රමයෙන් වැඩී, අටසාළිස් දහසක් වරඟනන් පිරිවරා දස දහසක් හවුරුදු රජය කොට සොමනස්සා නම් අගබිසවුන් නිරූපම වූ අනුපම නම් පුත්රුවන වැදූ දා රන්සිවිගෙන් මහ භිනික්මන් කොට කෙළ ලක්ෂයක් සෙන් සමග මහණ ව දසමසක් දුෂ්කරින් දවස් යවා සුනෙත්‍රා නම් බැමිණිය දුන් මී පායාස ය වළඳා, සමස සතළිස්රියන් විදුරසුන් අරා කිණිහිරි සිරිබෝ මුල ලා වැඹහිඳ සව් කෙලෙසුන් නසා බුදු ව, සඳුන් නම් වැණි රුවන් ආකර යෙහි ජාතමිණිරුවන් සඟලක් වැනි වූ සම්බල ය, සුමිත්ත ය යන අගසව් දෙදෙනා සමග නව කෙළ ලක්ෂයක් රහතන් පිරිවරා නියත වූ රේවත නම් මහතෙරකෙනෙකුන් අතින් අත් පා මෙහෙ විඳ සැටරියන් උස බුද්ධකායෙකින් ලක්ෂයක් හවුරුදු ආයුසිරි වළඳා ලොකාර්ථ සාදන සේක. එකල මාගේ ශ්‍රීමහාබොධිසත්වයානෝ මඞ්ගල නම් තාපස ව බුදුන් දුටු සතුටින් සෘද්ධියෙන් ගොස් සාර සියයක් ගවු උස ඇති මහ දඹගස සලා මහ දිය කල සා දඹ ගෙණ වුත් නව කෙළ ලක්ෂයක් රහතන් හා සමග ඒ සිද්ධාර්ථ නම් බුදුන් වළඳවා සිද්ධාර්ථ වූ විවරණ ශ්‍රී ලදින් එකෙණෙහි දසදහසක් සක්වළ දෙව්බඹුන් කළ මේ සොළොස්වන විවරණ මඟුල් පූජාව ලත්සේක.

තුබූ තෙසානූ කපින් අතුරෙහි එක් කපක් බුද්ධශූන්‍ය ව ගිය කල මෙයට දෙයානූවන මණ්ඩ නම් කල්පයෙහි තිස්ස ය, ඵුස්ස ය යන සර්වඥවරයෝ දෙදෙනෙක් උපන්නාහු ය. එයින් තිස්ස නම් බුදුරජාණන් වහන්සේ, ඛේමා නම් නුවර ජනසන්ධ නම් රජහුගේ පදුමා නම් අගබිසවුන් කුස පිළිසිඳ දසමස් පුරා සඳරැස් කලඹක් සේ බිහි ව ක්‍රමයෙන් වැඩී, තෙතිස් දහසක් පුරඟනන් පිරිවරා සත්දහසක් හවුරුදු රජසිරි පුරා, සුභද්‍රා නම් අගබිසවුන් ලොකානන්ද වූ ආනන්ද නම් පුත්රුවන වැදූ දා, අශ්වයානාවක නැගී මහ

භිනික්මන්කොට සියක් ලක්ෂයක් හා සමග එක් දා මහණ ව අට මසක් කල් යවා වීරා නම් සිටුදුව දුන් මී කිරිබත් වළඳා අටසාළිස් රියන් විදුරසුන් නැගී පියා ගසක්මුල වැඩහිඳ කෙලෙසුන් නසා පියා බුදු ව සසුන් නමැති කල්පද්‍රැමයෙහි ජාත ශාඛායුග්මයක් වැනි වූ බ්‍රහ්මදේවය, උදය ය යි යන අගසවු දෙදෙනා සමග සියක් ලක්ෂයක් මහරහතුන් පිරිවරා අනගි වූ ගුණ ඇති සමග නම් මහ තෙරකෙනෙකුන් අතින් අත් පා මෙහෙ විඳ සැවරියන් ශ්‍රී ශරීර යෙකින් ලක්ෂයක් හවුරුදු ආසිරි වළඳා මොහඳුරු දුරුකරණ සේක. එ කල මාගේ ශ්‍රීමහාබෝධිසත්ත්වයෝ සුජාත නම් තවුස් ව බුදුන් දක බණ අසා සතුටු ව ශක්‍ර පුරයට ගොස් දිව උයන් වැස යොදුනක් සා රත්කරඬුවෙකින් දිවමල් පුරා ගෙණවුත් බුදුන් පෙරව පුදා විසිතුරු මහ පියුමක් ද බුදුන් සිරසව මල්කුඩයක් සේ පුදා එදා ඒ තිස්ස නම් බුදුන් අතින් ද බුදුවන්නව නියයේ ය යි විවරණශ්‍රී ලදින් එ සඳ දසදහසක් සක්වළ දෙවිබඹුන් කළ මේ සතළොස්වක විවරණ මඟුල් පූජාව ලත් සේක.

තව ද-එම කප දෙවන අනන්තරකල්පයෙහි ඵුස්ස නම් බුදු රජාණෝ-කාසි නම් නුවර ජයසේන නම් රජහුගේ සිරිමා නම් අග බිසවුන් කුස පිළිසිඳ දසමස් පුරා දිව්‍යපුරයෙන් බස්නා දිව්‍යකුමරකු සේ බිහිව ක්‍රමයෙන් වැඩි තිස්දහසක් පුරඟනන් පිරිවරා දසදහසක් හවුරුදු රජසිරි විඳ කිසාගෝතමී නම් බිසවුන් නිරූපම වූ අනූපම නම් පුත්‍රුවන වැදූ ද මගුලැතුනාගෙන් වැඩ එක් ද ලක්ෂයක් ඇමතියන් හා සමග මහණව සමසක් දුෂ්කරක්‍රියා පුරා සිරිවඩ්ඪන නම් සිටුදුව දුන් මී කිරිපිඩු වළඳා අවතිස් රියන් විදුරසුන් නැගී මහ ඇඹුලගසක් පිට දී වැඩහිඳ පස්මරුන් බිඳ බුදු ව සසුන් නමැති කනක ප්‍රාසාදයෙහි ජාත සිංහපඤ්ජරයුග්මයක් බඳු වූ සුරක්ෂිතය, ධම්මසේන ය යන අගසවු දෙදෙනා සමග කෙළක් පමණ මහසව්වන් පිරිවරා අභිය වූ සභිය නම් මහතෙරකෙනෙකුන් අතින් අත් පා මෙහෙ විඳ අටපණස්රියන් බුදුබඳක් දරා අනූදහසක් හවුරුදු බුදුසිරි විඳ දෙශනා රශ්මියෙන් විනෙයජන නමැති පද්මයන් ප්‍රබෝධකර වැඩවසන සේක. එ කල අපගේ ශ්‍රීමහාබෝධිසත්ත්වයෝ විජිතාවී නම් රජ ව, බුදුන්ට මහදන් දී රජය හැර මහණ ව තුන් පිටක ය ධරා ධර්මකථික ව ප්‍රතිපත්ති පූජායෙන් පූජාකොට ඵුස්ස නම් බුදුන් අතින් ද විවරණ ශ්‍රී ලදින් එ දා දසදහසක් සක්වළ දෙවිබඹුන් කළ මේ අටළොස්වන විවරණ මල්ගුපූජාව ලත් සේක.

මීට එකානූවන සාර නම් කල්පයෙහි මහාවිපස්සී නම් බුදුහු බන්ධුමතී නම් නුවර බන්ධුමතී නම් රජහුගේ බන්ධුමතී නම් අග බිසවුන් කුස පිළිසිඳ දසමස් පුරා දෙව් බඹ කැලන් මැද සරත් වලාකඩෙකින් නික්මුත් පුන්සඳ සේ බිහි ව ක්‍රමයෙන් වැඩී එක් ලක්‍ෂ විසි දහසක් පුරඟනන් පිරිවරා අටදහසක් හවුරුදු ගිහිගෙයි වැස සුතනු නම් දෙවින් සමවත්ඛන්ද නම් පුතණුවන් වැදූ දා රථ යානයෙන් මහබිනික්මන්කොට සුවාසූදහසක් ඇමතියන් හා සමග එකද මහණ ව අටමසක් දුෂ්කරක්‍රියාකොට සුදසුන් නම් සිටුදුව දුන් මධුපායාසය වළඳා වෙසග මැදි පෝහෝදා සවස කෙපණස්රියන් විදුරසුන් නැගී එවිගස පණස්රියන් කඳ ඇති ව, පණස්රියන් ශාඛා ඇති ව, සියක් රියන් උස ඇති ව, මුලපටන් අගදක්වා මලින් සැදී පැතනැගි, පලු සිරිබෝ පිටලා වැඩහිඳ කෙලෙසුන් නසා බුදුව බුද්ධ ශාසන නැමැති දිව්‍යපුරයෙහි ජාත රශ්මාලිගා දෙකක් වැනි වූ ඛණ්ඩය, තිසස ය යන අගසව් දෙදෙනා සමග සුවාසූදහසක් මහ සව්වන් පිරිවරා නිසෙසාන වූ අශෝක නම් මහතෙරයෙණකුන් අතින් අත් පා මෙහෙ විඳ අවුව අට විසිගවුවක් කැස් බුදුරැස් කඳින් බබුලුවා අසූරියන් බුද්ධකායකින් අසූදහසක් හවුරුදු වැඩ හිඳ ලෝවැඩකරණසේක. එ කල අපගේ ශ්‍රීමහාබෝධිසත්වයෝ අතුල නම් දිව්‍යනාගරාජ ව කෙළ ගණන් දිවනයින් පිරිවරා බුදුන් දැක සතුටු ව සඳමඬලක් සා සත්රුවන් මණ්ඩපයක් මවා ලා බුදු පාමොක් සඟපිරිස සතපා සත්දවසක් දිව්‍යදාන ය දී මිණිරැසින් දිලියෙන්නාවූ අනගි මිණිපළඟක් පුදා ඒ මහාවිපස්සී නම් බුදුන් අතින් ද, බුද්ධප්‍රාර්ථනා ලදින් එකෙණෙහි දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ දසනවවන විවරණ මඟුල් පූජාව ලත් සේක.

එ තැන් පටන් බුද්ධාලෝකයක් නැති ව ලොව මොහාන්ධකාරව ශූන්‍ය කල්පයන් පණස්දෙනකුන් ගියකල මෙ යට එක් තිස්වන මණ්ඩ නම් කප සිඛිය, වෙස්සභූ ය යන බුද්ධදිවාකරයෝ දෙදෙනෙක් පහළ වූහ. ඉන් සිඛී නම් බුදුරජානෝ අරුණවතී නම් නුවර අරුණවතී නම් රජහුගේ ප්‍රභාවතී නම් බිසවුන් කුස පිළිසිඳ චිත්‍රකූට පර්වතයෙන් බස්නා ජවනහංසරාජයකු සේ බිහි ව ක්‍රමයෙන් වැඩී සූවිසිදහසක් පුරඟනන් පිරිවරා සත්දහසක් හවුරුදු රජකෙළි කෙළ සබ්බකාම නම් බිසවුන් සිරිවිපුල අතුල නම් පුත් රුවන වැදූ දා ඇත්කඳ අරා වැඩ සැත්තෑදහසක් ඇමතියන් හා සමග මහණ ව අටමසක් දුෂ්කරක්‍රියා පුරා ප්‍රියදර්ශන නම් සිටුදුව දුන් මී කිරි බත වළඳා සූවිසි රියන් විදුරසුන් අරා එකෙණෙහි

සියක්රියන් උසැති පැහැනැගි ඇටඹ සිරිබෝ පිට දී වැඩ හිඳ, නිවන් දහම පසක් කොට බුදුව බුද්ධශාසන ශ්‍රී නගරයෙහි ජාත ජයනෙතු ගුල්මයක් බඳු වූ අභිභූ ය, සම්භව ය යන අගසවු දෙදෙනා සමග සැත්තෑදහසක් පමණ මහසවුවන් පිරිවරා තමන් කෙරෙහි පෙම් කර වූ ඛෙමඞ්කර නම් මහතෙරකෙණෙකුන් අතින් අත් පා මෙහෙ විඳ සිගලග රැසින් දෙළොස්ගව්වක් අවට දම රැ බබුළුවා සැත්තෑ රියන් උස බුදුබඳකින්, සැත්තෑ දහසක් හවුරුදු ආසිරි වළඳා, ලෝකාර්ථ සාදන සේක. එ කල අපගේ ශ්‍රීමහාබෝධිසත්වයෝ අරින්දම නම් රජ ව බුදුන් සඟුන් පවරා සත්දවසක් මහදන් දී අනඝී වූ ගළ දී මගුලැතු සරහා පුදා, ඔහු බරට කප්පියභාණ්ඩ ද පුදා ඒ සිඛී නම් බුදුන් අතින් ද විවරණශ්‍රී ලදින් එ කෙණෙහි දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ විසිවන විවරණ මඟුල් පූජාව ලත් සේක.

තව ද-එම කප දෙවන අනන්තරකල්පයෙහි, වෙස්සභූ නම් බුදු රජාණෝ-අනුපම නම් නුවර සුප්පවත්ත[1] නම් රජහුගේ සීලවතී නම් අගබිසවුන් කුස පිළිසිඳ දසමස්පුරා දෙව්බඹකැලන් මැද බ්‍රහමයාගේ සුවර්ණජාලයට බිහි ව ක්‍රමයෙන් වැඩී රජලියන් තිස්දහසක් පිරිවරා දසදහසක් හවුරුදු රජසිරි විඳ සුමිත්‍රා[2] නම් දෙවින් සුප්‍රබුද්ධ නම් පුත්රුවන වැදූ දා, රන්සිවිගෙන් උයන් වැඩ, සැත්තෑ දහසක් පුරුෂයන් සමග එක්දා මහණ ව සමසක් දුෂ්කරක්‍රියා පුරා වෙසඟ පුණුපොහෝදා සිරිවඩ්ඪන නම් නාගාඛ්‍යනාව දුන් මී කිරිබත් වළඳා සමසතළිස්රියන් විදුරසුන් නැගී එකෙණෙහි සියක්රියන්ව පැහැනැගි සුපිපි සල්සිරිබෝ පිට දී වැඩහිඳ කෙලෙසුන් නසා බුදු ව සසුන් නැමැති ගන්ධමාදනයෙහි ජාත චන්දන පාදප ගුල්මයක් වැනි වූ සොණ ය, උත්තර ය යන අගසවු දෙදෙනා සමග සැත්තෑදහසක් මහසව්වන් පිරිවරා ගුණගණ ශාන්තවූ උපශාන්ත නම් මහතෙරකෙණෙකුන් අතින් අත් පා මෙහෙ විඳ සැටරියන් උස බුද්ධ කායෙකින් සැටදහසක් හවුරුදු වැඩහිඳ දහම්වැසි වස්වා සසර ගිම් නිවන සේක. එ කල අප මහා බෝධිසත්වයෝ සුදසුන් නම් මහ රජ ව බුදුපාමොක් සඟපිරිස් පවරා මහදන් හා සිවුරු දී, බුදුන්ට අනඝී ගඳකිළියක් කර වා අවට විහාර දහසක් කර වා පිළිගන්වා සියලු රජසැපත් පුදා සසුන් වැද මහණ ව තෙළෙස් ධුතගුණ සමාදන් ව අපිස් ගුණ පුරා

1. සුප්පවතිත.　2. සුමිත්‍රා.

අසාධාරණ වූ ප්‍රතිපත්ති පූජාවෙන් ඒ වෙස්සභූ නම් බුදුන් අතින් ද විවරණශ්‍රී ලදින් එකෙණෙහි දසදහසක් සක්වළ දෙව් බඹුන් කළ මේ එක්විසිවන විවරණ මඟුල් පූජාව ලත් සේක.

එ තැන් පටන් බුද්ධාලෝක විරහිත ව ලොව මොහාන්ධකාර යෙන් එකාන්ධකාර ව කප් තිසක් ගියකල අපගේ මේ මහාභද්‍ර කල්පයෙහි කකුසඳ ය, කෝණාගමන ය, කාශ්‍යප ය, ගෞතම ය යන සතර දෙනෙකුන් වහන්සේ බුදුවූ සේක. අනාගතයෙහි මෛත්‍රෙය නම් බුදුහු ත් උපදනා සේක. මෙසේ පස් බුදුකෙණෙකුන්ගෙන් උතුම් වූ හෙයින් මේ කප මහාභද්‍ර නම් වි ය.

ඉන් කකුසඳ නම් බුදුරජාතන් වහන්සේ- එ කල බ්‍රාහ්මණ වංශය උතුම් හෙයින් මේඛලා නම් නුවර අග්ගිදත්ත නම් පුරෝහිත බ්‍රාහ්මණයාතන්ගේ විශාඛා නම් බැමිණි දේවින් කුස පිළිසිඳ දසමස් පුරා දියකඳෙකින් නිකුත් මිණිකඳක් සේ බිහි ව ක්‍රමයෙන් වැඩි දෙවඟනන් බඳු වරඟනන් සියදහසක් පිරිවරා සාරදහසක් හවුරුදු ගිහිගෙයි වැස රුචි[1] නම් අග බැමිණිය විසිතුරුවූ උතුරු නම්[2] පුත්රුවන වැදූ ද, රථයානයෙන් මහ බිනික්මන් කොට සතළිස් දහසක් බමුණන් හා සමඟ එක්ද, මහණ ව අටමසක් දුෂ්කරක්‍රියා පුරා වෙසඟමැදි පොහෝද, වජ්‍රවතී නම් බැමිණිය දුන් මීකිරිබත් වළඳා සුතිස්සරියන් විදුරසුන් අරා එකෙණෙහි පැනනැගී සුපිපි සියක්රියන් මඟුල් මාරා තුරක් පිට දී,[3] පස්මරුන් බිඳ බුදුව සසුන් නැමැති අනවතප්තයෙහි දිළිසෙන රන්කුළුසඟළක් වැනි වූ විධුර ය, සඤ්ජීව ය යන අගසවු දෙදෙන සමග සතළිස් දහසක් පමණ මහ සව්වන් පිරිවරා සුද්ධාවූ බුද්ධි ඇති බුද්ධිජ නම් මහතෙර කෙනෙකුන් අතින් අත් පා මෙහෙ විඳ, සතළිස් රියන් උස බුද්ධ ශරීරයෙන් නිකුත් ව්‍යාමප්‍රභා මණ්ඩලයෙන් අවට සතළිස්ගව්වක් තැන් දූල්වූ රුවන් ඇඟෑයක් සේ බබුලුවා සතළිස්දහසක් හවුරුදු ආසිරි වළඳා නාරදෙව නම් යක්ෂයා ආදී වූ බොහෝ සතුන් දමා අමාමහනිවන් පුරයෙහි පුරණසේක. එ කල අප මහබෝසතාණෝ ඛෙම නම් නරපති ව බුදුන් හා සතළිස් දහසක් සඟපිරිස් පවරා මහදන් දී පා සිවුරු සතළිස් දහසක් හා අඳුන් ආදී වූ බෙහෙත් බඩු හා නවුස් පිරිකර දී බුදු සසුන් වැද මහණ ව ඒ කකුසඳ නම් බුදුන් අතින් ද විවරණශ්‍රී ලදින් එකෙණෙහි දසදහසක් සක්වළ දෙව්බඹුන් කළ මේ දෙවිසිවන විවරණ මඟුල් පූජාව ලත් සේක.

---

1. රොචිනී. 2. කුමරුන්. 3. පිටලා.

තව ද-මේම කප දෙවන අනතරකල්පයෙහි-කොණාගමන නම් බුදුරජානන් වහන්සේ සොභාවතී නම් නුවර යඤ්ඤදත්ත නම් බ්‍රාහමණයානන්ගේ උත්තරා නම් අගබැමිණිය කුස පිළිසිඳ දස මස් පුරා වැස දෙව්බඹ කැලන් මැද සඳමඬලින් නිකුත් සඳ කුමරු වකු සේ බිහි ව ක්‍රමයෙන් වැඩී සොළොස්දහසක් පුරඟනන් පිරිවරා තුන්දහසක් හවුරුදු ගිහිගෙහි වැස රුචිගාත්‍රා නම් බැමිණිය සාර්ථවාහ නම් පුත්රුවන වැදූ ද ඇත් යානක් නැගී මහබිනික්මන් කොට තිස්දහසක් පුරුෂයන් හා සමග මහණ ව සමසක් වීර්‍ය්‍ය කොට අග්ගිසේන නම් බැමිණිය දුන් මීකිරිබත් වළඳා විසිරියන් විදුරසුන් අරා දිඹුල්සිරිබෝ පිට ලා වැඩහිඳ මරසෙන් බිඳ බුදු ව සසුන් කැමැති දිව්‍යභවනයට ලූ සොපාන සඟළක් වැනි වූ භිය්‍යස ය,[1] උත්තර ය යන අගසවුදෙදෙනා සමග තිස්දහසක් මහ සව්වන් පිරිවරා සොත්ථිජ නම් මහතෙරකෙණකුන් අතින් අත් පා මෙහෙවිඳ තිස් දහසක් හවුරුදු වැඩහිඳ දහම් වැසි වස්වන සේක. එ කල අප මහ බෝධිසත්වයෝ පර්වත නම් නරෙන්ද්‍ර ව ඒ බුදුන් සඟුන් පවරා වස් තුන් මස මහදන් දී සළු පිරිකර හා අනගි රුවින් පිරිවැසි සඟළක් පුදා ඒ කොණාගමන නම් බුදුන් අතින් ද විවරණ ශ්‍රී ලදින් එතෙකෙණහි දසදහසක් සක්වළ දෙව්බඹුන් කළ මේ තෙවිසිවන විවරණ මඟුල් පූජාව ලත් සේක.

තව ද-එම කප තුන්වන අනතර කල්පයෙහි කාශ්‍යප නම් බුදුහු බරණැස බ්‍රහ්මදත්ත නම් අගබමුණානන්ගේ ධනවතී නම් අග මෙහෙසුන් කුස පිළිසිඳ පිළිමිණියැගැබ රන්පිළිමයක් සේ වැස දස මස් පුරා කිරිමුහුදින් නිකුත් පුන්සඳක් සේ බිහි ව ක්‍රමයෙන් වැඩී අටසාළිස් දහසක් වරඟනන් පිරිවරා දෙදහසක් හවුරුදු ගිහිගෙහිවැස සුනන්දා නම් අගබැමිණිය විජිතසේන නම් පුත් රුවන වැදූ ද සිත හා සමග ආකාශයට පැන නැගී සත්රුවනක් සේ නික්මුනු රන්පායෙන් වැඩ එම රන්පාය බෝධිය වටා බෝගෙයක් සේ බට කල පහයෙන් බැස බ්‍රහ්මයා දුන් අටපිරිකර ගෙණ සත්‍රින් පායෙන් බැස දෙගව්වක් තැන් ගොස් හුන් කල කැටි ව ආ සියක් ලක්ෂයක් ඇමතියන් හා සමග එක්විට මහණ ව සත්දවසක් පදන් සැරිසරා සුනන්දා නම් බැමිණිය දුන් මී කිරිපිඩු වළඳා පසළොස් රියන් විදුරසුන් අරා නුග සිරිබෝ පිට ලා වැඩහිඳ මුළුලොව සඳ බුදු ව සසුන් කැමැති ගුවනෙහි දිලියෙන නතක ප්‍රාසාදයුග්මයක් වැනි වූ තිස්ස ය, භාරමාජ ය යන අගසවුදෙදෙනා සමග විසි

1. භියස්ස.

දහසක් පමණ මහසව්වන් පිරිවරා බුද්ධමිත්‍රවූ[1] සළුමිත්‍ර නම් මහ තෙර කෙනෙකුන් අතින් අත් පා මෙහෙ විඳ විසිරියන් බුද්ධ කායෙකින් විසිදහසක් හවුරුදු මැඩසිඳ නරදෙව නම් යක්‍ෂයා ආදීවූ බොහෝ සතුන් දමා අමාමහනිවන් දෙසන සේක. එ කල අපගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝ ජෝතිපාල නම් බමුණු ව බුදුන් කරා ගොස් සැපත් හැර මහණ ව තුන්පිටක ය ගෙවා දූත විචිත්‍රවූ ප්‍රතිපත්තියෙන් පූජා කොට ඒ කාශ්‍යප නම් බුදුන් අතින් ද විවරණශ්‍රී ලදින් එකෙණෙහි දසදහසක් සක්වළ දෙව්බඹුන් කළ මේ සුවිසිවන විවරණ මඟුල් පූජාව ලත් සේක.

මෙසේ මාගේ බුදුහු නමත් සසර පළමුවන විවරණ ලදින් පාරමිතාභූමියෙහි ඇවිදිනා සමයෙහි හැම බුදුන් කො මරදවා දූත දූතාදී පරිත්‍යාගකොට බුදුබව පතා විවරණ ලදින් ඒ ආශ්චර්‍යයෙහි සතුටුව දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයන් රැස් ව එකී එකී වාරයෙහි දෙලක්‍ෂ සතළිස්දහසක් පූජා බැගින් මෙසේ පස් පණස්[2] ලක්‍ෂ විසිදහසක් විවරණ මඟුල් පූජා ලත් හෙයිනුත් නවද මේ සුවිසි විවරණ පූජාව කොට සාමින්වහන්සේ අතින් බණ අසා අපි අපි නිවන් දකුම්හ යි ප්‍රාර්ථනා කළාවූ සුවිසි අසංඛ්‍යයක් සතුන් සුවිසි දවසෙක වැඩ හිඳ වදාළා වූ ධර්මයෙන් අමාමහනිවන් දක්වා ඔවුන් විසින් කරණ ලද සුවිසි අසංඛ්‍යක් ප්‍රතිපත්ති පූජා ලත් හෙයිනුත් එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වන සේක.

එසේ හෙයින් කියනා ලදී.

“පූජා විසෙසං සහ පච්චයෙහි
යසමා අයං අරහති ලොක නාථො,
අත්ථානු රූපං අරහන්ති ලොකෙ
තසමා ජිනො අරහති නාම'මෙතං” යි.

මෙතෙකින් අවම්හ ලෝවැඩ පිණිස කරණ ලද අර්හත් ගුණවර්ණනා සඞ්ඛ්‍යාත මේ පූජාවලියෙහි අප බුදුන් සාමාන්‍ය ධර්මයෙන් ලද

විවරණ මඟුල් පූජාකථා නම් වූ
තුන්වන පරිච්ඡේදය නිමි.

---

1. සව්මිත්‍ර,-ධර්මමිත්‍ර. 2. දසදහසක්.

සිව්වන පරිච්ඡේදය

අප බුදුහු පාරමිතා බලයෙන් සුව විඳ ලද බෝධිසම්භාර පූජාකථා නම් කවරහ? යත්;

අප බුදුහු පමා බුදු ව [1]දහම් දෙසමි යි සම්තිස් පෙරුම් පුරා ලොවුතුරා බුදු වූ සේක. සහම්පතී මහාබ්‍රහ්මයාගේ ආරාධනායෙන් ම දහම් දෙසූ සේක. ඇවැත් අනඳමහතෙරුන්වහන්සේ වැනි ධර්මභාණ්ඩාගාරිකයෝ පමා මහසුප් ස්ථවිරයන් හා පන් සියයක් [2]මහරහතුන්ගේ ආරාධනයෙන් ම ධර්මසංගායනා කළහ. යස නම් මහා ස්ථවිරයන් වැනියෝ පමා කාලාශෝක නම් වූ මහ රජහුගේ ආරාධනායෙන් ම දෙවන ධර්මසංගායනාව කළහ. බ්‍රහ්ම ලොකාගත මොග්ගලීපුත්තතිස්ස මහාස්ථවිරයන් වැනියෝ පමා ධර්මාශෝක රජහුගේ ආරාධනායෙන්ම තෘතීය සංගායනා-ධර්මසංගණිකාදීන් ධර්මසංග්‍රහ කළහ. විසුද්ධවූ බුද්ධීන් ප්‍රසිද්ධවූ බුද්ධදත්ත නම් මහාඅර්ථකථාචාරීන් වැනියෝ පමා වනවිනිස, බුද්ධවංශ, අභිධර්මාර්ථ සංග්‍රහ අර්ථකථා සංඛ්‍යාත වූ ධර්මකථා උපදවන්නාහු සුමති නම් මහතෙරකෙණෙකුන් හා කණ්හදාස නම් අමාත්‍යයාගේ ආරාධනායෙන් ම කළහ. ප්‍රබුද්ධ බුද්ධීන් ප්‍රසිද්ධවූ බුද්ධඝෝෂාචාරීන් වැනි විශුද්ධඥාන ලදුවෝ පමා සමන්තපාසාදිකා, අර්ථසාලිනී, සම්මොහවිනෝදනී, සුත්තන්ත, සුමඞ්ගලවිලාසිනී, ප්‍රපඤ්චසූදනී, සාරාර්ථප්‍රකාශිනී, මනෝරථපූරණී, සද්ධර්මජෝතිකා යනාදී නොයෙක් අර්ථකථාවන් උපදවන්නාහු-ශ්‍රීනිවාස නම් රජහු හා මහානිගම නම අමාත්‍යයානන්ගේ ආරාධනායෙන් ම කළහ. වජ්‍රඥාන ඇතිහෙයින් විදුරු නම් ලද සැරියුත් මාහිමියන් වැනි එකශ්‍රැති බුද්ධපුත්‍රයෝ පමා සාරාර්ථදීපනී නම්වූ විනයටීකාර්ථකථාව ලක්‍ෂයක් ග්‍රන්ථසංඛ්‍යාවෙකින් යුක්තවූ ධර්මසංග්‍රහ කථා උපදවන්නාහු මහළුපරාක්‍රමබාහු නම් නරපතිහුගේ ආරාධනායෙන් ම කළහ.

මේ ආදි පූර්වාචාර්යවරයන්ගේ සද්ධර්මානුශාසනාව ආයාචන මූලිකව ම වූ හෙයින් මෙතැන්හි වනාහි ශ්‍රී ලඞ්කාද්වීපයෙහි වානගිරි පර්වතයෙහි වැස සද්ධර්මාභරයෙහි වැරපමණින් පිනා සාරය දූත, සුගතොවාද නමැති ජීවිත රක්‍ෂා කිරීමෙහි ඉතා අප්‍රමාද ව බොහෝ සතුන් බෝධිසත්ව පාරමිතාවෙහි වීර්ය වඩවා බණකීමෙහි අග පැමිණ, තමන් කරා පැමිණි බොහෝ සත්පුරුෂයන් බුදුබැව්හි ප්‍රාර්ථනාකරවූ මයූරපාද පරිවෙණාධිපතිවූ බුද්ධපුත්‍රයන් විසින්-

1. දම්, 2. මහරහතුන්වහන්සේ.

ද්විතීය පරාක්‍රමබාහු නම් නරපතිහට ම අනුශාසනා පිණිස ද, සිංහල භාෂාව දන්නා සත්පුරුෂයන්ට ලෝ වැඩ පිණිස ද, එම රජහුගේ අග්‍රාමාත්‍ය වූ බුද්ධාභිලාෂී වූ දේවප්‍රතිරාජ නම් ශ්‍රද්ධා පුරුෂයානන්ගේ ආරාධනයෙන් ඔහුගේ ම නමින් කළ ආරාමයෙහි දී උපදවනලද මේ පූජාවලි නම් වූ ධර්මව්‍යාඛ්‍යාන කථාවෙහි ඇසූ ඇසූවන් බුදුබැව්හි ලොභ කරවා පියන තරම් වූ මේ සතරමන බොධිසම්භාර පූජා කථාව ද සත්පුරුෂයන් විසින් සාවධාන ව ඇසිය යුතු.

ඒ මාගේ ස්වාමිදරුවෝ යටකී ක්‍රමයෙන් පළමුව නමත් ඒ දිව කුරුබුදුන් දුටුදා ම චතුෂ්පදික ගාථාවක් අසා අමාමහකිවන් පැමිණ එතෙකෙණෙහි ම පැවිදි ව සාරලක්ෂයක් රහතන් හා සමග සඞ්ඝනවක ව වඩනා මහපින් ඇති ව ද සංසාරයෙහි ගොඩ නො දන්නා අපමණ සතුන් දුක උපන් මහාකාරුණ්‍යාවෙන් අමාපාත්‍රයක් ගෙණ අනුන්ට නොදී විශිෂ්ටපුරුෂයකු උදකලාව හිඳ කන්නා සේ, මම අද අමාමහ නිවන් එකලාව නො වළඳමි, බොහෝ සතුන් හා සමග වළඳමි යි සිතා හස්තගත වූ සක්විතිරජයක් හරණා සේ සම්ප්‍රාප්ත වූ නිවන් රජය හැර පියා සත්වයන් පිණිස නමන් වහන්සේ විඳිනා සංසාර ව්‍යසනය නිවන් සුවයක් සේ සිතා සංසාර සාගරයට වැද-එතැන් පටන් සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි පාරමිතා සාගරයට වැද අලලන්නා වූ ඒ මාගේ ස්වාමිදරුවානන් වහන්සේ නොයෙක් ජාතිශතසහස්‍රයෙහි නොයෙක් සතුන් දිළිඳු වෙසින් අවුත් සිට කුස අල්වා පෑ "මහා බුද්ධාංකුරය! ඉතා බඩදල යම්හ. අපගේ සාදුක් නිවව"යි බැගෑ තෙපුල් කී කල්හි "සාධු! මතු බුදුව මුළුලොව දුකින් මුදමි' යි පත පතා සසජාතකාදියෙහි දන් දුන් ඇඟ මස් කියම් නම්, දෙලක්ෂ සතළිස්දහසක් යොදුන් ඝන කඩ බොල් මහපොළොවෙහි පස් මද ම ය, මස් බොහෝ ම ය, නව ද ජාතිකොටියෙහි යක්ෂරාක්ෂසාදීන් දිළිඳු වෙස් මවා අවුත් සිට ස්වාමීනි! පිපාසිතයම්හ, මතු තෙපි බුදුව දහම්වැසි වස්වා සසර ගිම් නිවා නම් දූනු දූ තොප ඇඟලේ පොවා අපගේ පවස්ගිම් නිවව, නරලේ බොනු කැමැත්තම්හ යි යාචඤා කළ කල ඔවුන් මුහුණ සතුටින් බලා සිනලන පටනෙව සිරුර ගස්වා දරුකිරිදෙන මවකසේ ඒ දිළිඳුන්ට දුන් ලේ කියම් නම්, සතරමහාසාගරයෙහි දිය මද මය, ලෙහෙ බොහෝ ම ය, නව ද නොයෙක් වාරයෙහි අන්ධයන් අවුත් සිට භවත! අපි ජාත්‍යන්ධයම්හ. ලෝකාලෝකයක් නොම දුටුම්හ. මතු තෙපි බුදු ඇස් ලදින් මොහඳුරු දුරුකරා නම් අපගේ ද අඳුරු දුරු කරව යි කියා ඇස් ඉල්වූ කල තමා වැඩූ දරුවන්ගේ ආපදාවන්හි

කම්පිත වන මවක සේ ඒ අන්ධයන්ගේ දුක් ඉවසාගත නොහී සිටි ජාතකාදියෙහි උපුටා දුන් ඇස් කියම් නම් ආකාශයෙහි තරු මද ම ය. බුදුඇස් පතා දුන් ඇස් බොහෝ ම ය, තව ද, අසංඛ්‍ය ගණන් ජාතියෙහි ඒ ඒ සත්‍වයන් අවුත් සිට "භවත! මතු බුදු ව මුළුලොවට ඊශ්‍වර වෙහි නම් අද තාගේ තෙලෙ ඉස අපට දත් දී පියව"යි කීඤ්ඤ වූ බස් කී වේලෙහි අනඤ්ඤ ව ඔවුන් මුහුණ බලා සුරතල් කියන ප්‍රියපුත්‍රයන් සේ සිතා එකෙණෙහි ම මඟුල් කඩුව ගෙණ බුදුවෙම්මැයි පත පතා කපා දීපු මිණිඔටුනුපලන් රජහිස් ගොඩ කියම් නම් එක් ලක්‍ෂ අටසැටදහසක් යොදුන් උස මෙරගල් මිටි ම ය, ඉස්ගොඩ උස් ම ය. තව ද අපමණ ජාති යෙහි දී දිළිඳුන් අවුත් සිට "භවත! එකලාවම්හ. අපිත් මෙහෙ කොට ගත නො හෙම්හ, තෙපි මතු ලොවුතුරා බුදු ව මුළුලොව තොප දරූ කරා නම්, දැන් තොපගේ තෙලෙ දරුවන් අපට ගැතිකොට දෙව"යි කියා යාචඤා කළ කල දෙබසක් නො කියා වෙස්සන්තර ජාතකාදියෙහි ප්‍රිය දරුවන් බැඳ දුන් වැල්ගොඩ කියම් නම් මෙරගල් මිටි ම ය, වැල්ගොඩ උස් ම ය. තව ද ජාති කොටියෙහි යාචකයන් අවුත් සිට "හිමි! තෙපි මතු බුදුවන ද මිහිකත ලවා දෙස් කියවා නම්, බුදු සිරිකත පතා නම් කරුණා මෛත්‍රී නමැති කාන්තාවන් දෙදෙනා හව වල්ලභ වෙ නම්, දැන් තොපගේ සිරිකත වන් තෙලෙ රජකත අපට දෙව" යි ඉල්වූ කල දෙබසක් නො කියා තමන්ගේ ප්‍රිය කාන්තාවන් බුදුබව පත පතා බැඳ දීපු වැල්ගොඩ කියම් නම් එම මෙරගල් මිටි ම ය. වැල්ගොඩ උස්ම ය.

මෙසේ මාගේ ස්වාමිදරුවානන් පිරූ පාරමිතා අපමණ ම ය. ප්‍රමාණ වස්තු ගෙණ උපමා කරන්නෙම් නම්, දිය පොළොවට ගැඹුරු අතික් පැන්මලක් නැති හෙයිනු ත්, පස්පොළොවට බොල් අතික් පස් ගොඩක් නැති හෙයිනු ත්, තරුමට බොහෝ අතික් ගනන වස්තුවක් නැති හෙයිනු ත්, මෙරගලට උස් අතික් පර්‍වතයක් නැති හෙයිනු ත්, මේ වස්තු සතර බුදුන්ගේ පාරමිතාවට උපමා කළ බවක් මුත් පාරමිතාවෝ වනාහි උපමා නැත්තාහ. ඒ විශෙෂයෙන් දත ද මෙරගල හා සමුද්‍රය හා පොළොව හා ආකාශ යෙහි තරු හා බුදුන්ගේ පාරමිතාවට මා උපමා කළ පරිදි යෙළ සියයක් යොදුන් ගරුඩරාජයා මහත් නියාව කියම් සි වටුවක්හට මහතැයි කීවා වැන්න. ගරුඩරාජයා වටුවාට මහතැ යි කියන්නෝ සැබෑම යි කියා ගරුඩරාජයාගේ මහත සගවා ලිය තුහුහුයේ මැයි

එසේ හෙයින් මම ද බුදුන්ගේ පාරමිතාවන් සංක්ෂෙපයෙන් හඟවාකිමි. ඒ පාරමිතාවන් බොහෝ ලෙස මේ විතරකින් අසන්නවුන්ට තව හඟවාලිය නුහුනුයේ මැයි.

එහි විස්තර කෙසේ ද? යත්;

යම් සේ සඛකෙනෙක් දිමයින් නොදනත් කුමණෑස්ලා[1] සත තරඟන නමැති පහන නහා, දහම් නමැති ඇස දල්වා, විශෙෂ යෙන් බැලූ නම් දනුත් මාගේ බුදුන්ගේ ඒ පාරමිතාමෝ හස්තා මලකයක් සේ විශෙෂයෙන් පොණත්නාහු මැ යි.

ඒ මෙසේයි—

කල්පයක් නම් බොහෝ කාලයෙක, යොදනක් උස හොටුවෙක අබ පුරාලා හවුරුදු ලක්ෂයක් ගියකල අබ ඇටයක් බැගින් හරි නොත් කලකින් අබ ගෙවී යේල, කල්පය අවුරුදු නො ගෙවේ මැ යි, තව ද යොදනක් උස ගල්මුඩුනෙකින් දහසක් හවුරුද්දෙන් නැගී යන්නාවූ සිඬයකුගේ දිවසළු[2] කොණ ගැහැවීමෙක් ඒ පර්වතය, කලෙකින් ගෙවී උදැමක් සා ව යේ නමුත් කල්පය හවුරුදු නො ගෙවේ මැ යි. මෙසේ වූ කල්පයක් නම බොහෝ වූ කාලයෙක, මාගේ බුදුහු එසේ වූ කපින් සාරාසංඛ්‍යකල්පලක්ෂයක් කල් පාරමිතාවන් පිරූසේක. තව ද අසංඛ්‍යයක් නමු දු ලුහුඹු බවක් මින තෙමේ ඉතා දිග ය.

ඒ මෙසේයි—

දස දසයෙක් නම් සියයෙක, දස සියයෙක් නම් දහසෙක, සියක් දහසෙක් නම් ලක්ෂයෙක, සියක් ලක්ෂයෙක් නම් කෝටියෙක, කෝටිකෝටියෙක් නම් ප්‍රකෝටියෙක, ප්‍රකෝටිකෝටියෙක් නම් කෝටිප්‍රකෝටියෙක, කෝටිප්‍රකෝටි කෝටියෙක් නම් නහුතයෙක, නහුත කෝටියෙක් නම් නින්නහුතයෙක, නින්නහුත කෝටියෙක් නම් හුත නහුතයෙක, හුත නහුත කෝටියෙක් නම් ඛම්භයෙක, ඛම්භ කෝටියෙක් නම් විස්කම්භයෙක, විස්කම්භ කෝටියෙක් නම් අහහයෙක, අහහ කෝටියෙක් නම් අබබයෙක, අබබ කෝටියෙක් නම් අටටයෙක, අටට කෝටියෙක් නම් සෝගන්ධිකයෙක, සෝගන්ධික කෝටියෙක් නම් උප්පලයෙක, උප්පල කෝටියෙක් නම් කුමුදයෙක, කුමුද කෝටියෙක් නම් පුණ්ඩරීකයෙක, පුණ්ඩරීක කෝටියෙක් නම් පදුමයෙක, පදුම කෝටියෙක් නම් කථානයෙක, කථාන කෝටියෙක් නම් මහා කථානයෙක, මහා කථාන කෝටියෙක් නම් අසංඛ්‍යයක් නමි.

1. විශෙෂ ගණිත ඥාන, 2. කොණ.

තව ද මේ ගණන කල්පයා කී හෙයින් බොහෝ දෙයෙකැයි සිතන බව මුත් අසඞ්ඛ්‍යයෙක් නම් බොහෝ හියාව ගණන් විශෙෂ ය නොදක්නාහට විශෙෂයෙන් නො දනේ ම ය. මේ මිනිස්ලොව අසඞ්ඛ්‍යයට ලත් තබන වස්තුවක් කිසිතෙනකත් නැත සතර මහා සාගරයෙහි දිය අසඞ්ඛ්‍යක උලක්කුවට ත් මද ම ය. මහපොළොව පස් පුවක් කඩ සා කොට කඩ කඩ කරතොත් අසඞ්ඛ්‍යයක් කැටියට මද ම ය. ආකාශයෙහි පෙණෙන තරු අසඞ්ඛ්‍යයට මද ම ය. මෙර ගල අබ ඇට සා බිඳු කර කොත් අසඞ්ඛ්‍යයක් බිඳුවට මද ම ය. එසේ හෙයින් අසඞ්ඛ්‍යයට පුඩුවක් දක්නා ගණනෙක් කිසිතැනෙකත් නැත් ම ය. සාගරයෙහි ගැඹුර ඇති හෙයින් ද, ප්‍රමාණ ඇති හෙයින් ද, සක රියන් පමණ අවකාශයෙහි පැන් සතරමුණක් ගන්නා හෙයින් ද, සාගරයෙහි දිය අසඞ්ඛ්‍යයක් උලක්කුවට මද ය යි යනු ගණින බුඞිමතුන්ට විෂයම ය. පොළොව ද ප්‍රමාණවත් හෙයින් ද, සතාරියක් වල පස් දසපැලක් ගන්නා හෙයින් මහ පොළොවෙහි පසුන් ගණිත ඥාණයට විෂය ම ය. තව ද රියනක් සා තැන අබ දමූණෙක් ගන්නා හෙයිනු ත් කුළුදුලෙක් නම් අබ ඇට ලක්ෂයක් පමණ හෙයිනු ත් මෙරගල ද ප්‍රමාණවත් හෙයිනු ත් මේ කයින් මෙරගල අබ ඇට සා කර තුත් ඥාණයට විෂ ය ම ය. අසඞ්ඛ්‍යය විෂයෙහි ඉතා බෙහෙව, මේ කාරණයෙන් අසඞ්ඛ්‍ය යෙක් නම් බොහෝ සඞ්ඛ්‍යාවෙකැ යි දතයුතු.

මේ මාගේ ස්වාමිදරු වූ බුදු රජානෝ මෙසේ බොහෝ සතර අසඞ්ඛ්‍යයක් හා කප්ලක්ෂයක් කල් සසර ඇවිද පාරමිතා පිරූසේක. මේ දැකුරෙහි එක් කපෙකට එක් වාරයෙක, එක් ලේ උලක්කුවක් ම ඉදින් දන් දුන් සේක් වී නමුත් සතර අසඞ්ඛ්‍යයක් හා ලක්ෂයක් ලේ උලක්කු ය. එසේ දුන් ලේ සුග මෙසේ වූ සාගර දසයෙක දියට ත් බෙහෙව. තව ද මාගේ ස්වාමිදරුවානෝ කපෙකට එක පුවකක් සා මස්කැටියක් බැගින් ම ඉදින් දන්දුන් සේක් වී නමුත් සතර අසඞ්ඛ්‍යයක් හා ලක්ෂයක් පමණ මස්කැටි වෙයි. එසේ දුන් මස් සුග ම නුවණැසින් බැලූකල මෙසේ වූ පොළෝ දසයෙක පසට ත් බෙහෙව තව ද මාගේ බුදුහු කපකට එකවාරයෙක. එක් ඇසක් බැගින් උදුරා දන් දුන් සේක් වී නමුත් ඒ සතර අසඞ්ඛ්‍ය යක් හා ලක්ෂයක් ඇස් ය. එසේ දුන් ඇස් ම මෙසේ වූ චක්‍ෂුඃපථ ආකාශ දසයෙක තරුවට ත් බෙහෙව. තව ද මාගේ බුදුහු කපෙ කට එක් වාරයෙක, එක් ඉසක් බැගින් කපා දන් දුන් සේක් වී නමුත් ඒ අසඞ්ඛ්‍යයක් හා ලක්ෂයක් ඉස, ඒ ඉස්ගණන ම ඉදින් ගොඩකරතොත් මෙසේ වූ මෙරගල් දසයකට ත් උස් ම ය.

1. කඩ සා කොට කඩ කඩ සා කොට කරත්.

තව ද මාගේ ස්වාමිදරුවාණෝ කපකට එකවාරයෙක ම අඹු දරුවන් බැඳ දුන්සේක් වී නමුත් සතර අසඞ්ඛ්‍යයක් හා ලක්‍ෂයක් ඒ වැල්ගණන ම සිතාපි කල මෙසේ වූ මෙරගල් දසයකට ත් උස් ම ය. එසේ හෙයින් මාගේ ස්වාමිදරුවාණෝ කපකට එක් ලේ උලක් කුවක් බැගින් ම දන් දුන්සේක් ද, කපකට එක් පුවකක් සා මස් කැටියක් බැගින් ම දන් දුන් සේක් ද, කපකට එක් ඇසක් බැගින් ම දන් දුන්සේක් ද, කපකට එක් ඉසක් බැගින් ම දන් දුන්සේක් ද, කපකට එක්වාරයෙක ම අඹු දරුවන් බැඳ දන් දුන්සේක් ද, එසේ නැත කපකට අපමණ වාරයෙක අපමණ කොට දන් දුන්සේක් ම ය. මේ මේ කාරණයෙන් සමුද්‍රය හා පොළොව හා තරු හා මෙර ගල් හා මහා වස්තුමෙක් නො වෙයි. මාගේ බුදුන්ගේ පාරමිතාවෝ කලී නුවණැතින් දක්නාහට ඉතා මහත් වන්නාහු මැයි. මාගේ බුදුන් දන් දුන් ලේ හා මස් හා ඇස් හා කපා දුන් ඉස් හා පතා දුන් අඹුදරුවන් බැඳි වැල්ගොඩ හා හැම රැස්කොට නුවණැසින් විශෙෂයෙන් බැළුවහොත් බඹලොව උස් කැකොකැයි නො සිතමි. මාගේ බුදුන්ගේ පාරමිතා ගොඩ ම උසැ යි සිතමි. මේ පාරමිතාවන්ගේ ගරුභාවයෙහි කථා ඇසූ කල ඥානවන්තයෝ කාරණ ගිවිස පාරමිතා ගරුත්වයෙහි පැහැද බුදුවීමෙහි වීර්‍ය්‍යවත් වෙති. හීන වූ වීර්‍ය්‍ය ඇති මන්‍දබුද්ධීන්ගේ සිත් කිහිරිදණ්ඩක් සැසි හුල ගලපිට හෙළූ කල ඒම තබා මොට වන්නා සේ බුදුවීමෙහි වීර්‍ය්‍ය පසුබස්සී, කෙසේ ද? සත් මුහුදදිය පරයා ඇඟ ලේ දුන මනාල, පොළොව පස් පරයා ඇඟ මස් දුන මනාල, මෙර පරයා සිය ඉස් දුන මනාල, තරු පරයා සිය ඇස් දුන මනාල, එම මෙර පරයා ප්‍රියවූ අඹු දරුවන් බැඳ දුන් වැල්ගොඩ සිටී ල සි. මෙතෙක් කල් දම් අසා බුදුවීම නම් බැරි දෙයෙකැ යි භීරුක වෙති. දුන් ඒ සමුද්‍රයෙහි දිය මිඳ ල, පොළොව් පස් මිද ල, අහස තරු මිද ල, මෙරගල් උස් නොවෙ ල, පාරමිතාවෝ බොහෝ ල, මස් ගොඩ ලේ ගොඩ ඉස් ගොඩ ඇස් ගොඩ වැල්ගොඩ ඉතා උස් ල, බඹලොව පරයා සිටී ල, එතෙක් ලේ මස් ඇස් ඉස් අඹු දරුවන් අපි දන් දිය නොහේ ම ය, එසේ හෙයින් ඒ බුදුවීම නම් අපට බැරි ය යි හීන විර්‍ය්‍ය වෙති, එයින් ඒ සත්ත්වයාගේ අඥාන භාව ය මැ යි.

කාරණා කිම? යත්;

එසේ සිතූ සත්ත්වයා තම තමා සසර ඇවිදිත සෙසුකල් හැර බුදුන් පෙරුම් පිරූ මේ දතුරෙහි ම තමා ත් අනුන්ට දුන් ලේ, බුදුන් දන් දුන් ලෙයට බොහෝ ම ය, තමා දීපු ඇඟ මස් ගොඩ බුදුන් දන් දුන් ඇඟ මසට බොහෝ ම ය, බුදුන් දන් දුන් ඉස්

ගොඩව ඒ සත්‍වයා තම්හා දීපු ඉස් ගොඩ බොහෝ ම ය, බුදුන් දන් දුන් ඇසට ඒ සත්‍වයා දුන් ඇස් බොහෝ ම ය. බුදුන් දන් දුන් අඹු දරුවන්ට වඩා ඒ සත්‍වයා තමා දුන් අඹු දරුවන් බොහෝ ම ය, ඒ කෙසේ දිනී ද? පාරමිතා පිරී ද? යත් එසේ නැති; මාගේ ස්වාමිදරුවාණෙනි සාධු බුදුවෙම්ව යි පත පතා ඇස් ඉස් මස් ලේ අඹුදරුවන් දන් දුන්සේක. ඒ සත්‍වයා අනුන්ට අන්‍යායෙන් ඇස් ඉස් මස් ලේ අඹුදරුවන් බොහෝකොට දිනී.

කෙසේ දිනී ද? යත්;

මාගේ බුදුන් සාධු! සාධු!! බුදුවෙම්වා යි පත පතා ඇඟ ලේ දන්දෙන [1]අතුරෙහි, නිකම් සසර ඇවිදිනාවූ ඒ සත්‍වයා ජාති ජාති වල දී යක්‍ෂ රාක්‍ෂසාදීහු ඔහු අල්වාගෙණ හූරා බීපු ලේ ද, තව ද ඔහු ගේ ම ජාති ජාතියෙහිදී ම ගණ්ඩ පිළිකාදීන් හැරපී ලේ ද, තව ද සැත් [2]සිරා ආදීන් [3]හැරපී ලේ ද, නුවණැසින් බැලූකල ඔහු අන්‍යායෙන් මෙසේ දීපු ලේ බොහෝ ම ය, මාගේ බුදුන් දුන් ලේ මඳ ම ය, මෙසේ වූ අන්‍යායෙන් බොහෝ ලේ දී සසර ඇවිදිනා සත්වයා සාධු! බුදු වෙම්වා යි සිත් පහදවා මඳ ලෙයකුත් දන් දී බුදුවෙමැයි නොසිතීම ඒ සත්වයාගේ අඥානභාව ය ම ය. තව ද බුදුන්ගේ පාරමිතා කාලයෙහි ම සසර ඇවිදිනා එක් සත්වයෙකු ඒ ඒ ජාතියෙහි දී යක්‍ෂයන් රාක්‍ෂසයන් සිංහයන් දිවියන් වලසුන් කිඹුළුන් විසින් ඔහු අල්වාගෙණ සල්ව සල්වා කාපු මස් ද, එසේ ම ජාති ජාතියෙහි නොයෙක් වරදෙහි අල්වාගෙණ වධකයන් ඔහු ඇඟින් කපා ඔහුට ම කවාපු මස් ද, නුවණැසින් බැලුවහොත් බුදුන් දුන් ඇඟමස් මඳ ම ය, මෙසේ ඔහු අන්‍යායෙන් දුන් ඇඟ මස් බොහෝ මැ යි. මෙසේ සසර අන්‍යායෙන් බොහෝ කොට ඇඟ මස් දී ඇවිදිනා සත්‍වයා මඳ ඇඟ මසක් දන් දී සසර ඇවිද බුදු වෙම්මැ යි නො සිතීම ඔහුගේ ම අඥානභාවය මැ යි, තව ද එක් සත්වයකු නො එක් ජාති ජාතියෙහි, ඒ ඒ වරදෙහි අල්වාගෙණ ඔහු හඩ ව හඩ වා කපා හුල ඇනපු ඉස් ද, නො යෙක් යාගයෙහි අකුසල් බෙලෙන් බිලි පුද දුන් ඉස් ද, යුඩාදියෙහි දී ඛඩ්ගප්‍රහාරයෙන් කැපුන් ලද ඉස් ද, රැස් වී නම් මාගේ බුදුන් දුන් ඉස් ගොඩ මඳ ම ය, මෙසේ ඔහු අන්‍යායෙන් දුන් ඉස් ගොඩ බොහෝ ය, සසර අන්‍යායෙන් මෙසේ බොහෝ ඉස් කප කපා දී ඇවිදිනා ඒ සත්වයා බුදුවන්ට දෙන ඉස් බොහෝ ය යි සිතීම ඔහුගේ ම නුවණ නැති බව ය, තව ද මේ සසර ජාති ජාතියෙහිදී ම එක් සත්වයෙකු අල්වාගෙණ ඔහු හඩ ව හඩ වා උදුරාපු ඇස් නුවණැසින් රැස්කොට

1 දුතුරෙහි, 2 සිරු, 3 හැරපු.

බැලුව හොත් බුදුන් දන් දුන් ඇස්ම ද ම ය. මෙසේ ඔහු අන්‍යයන් දුන් ඇස් බොහෝ ය. මෙසේ අන්‍යයන් බොහෝ ඇස් දී සසර ඇවිදිනා සත්වයා මද ව ඇස් දෙන්නාවූ බුදු බැව්හි උපෙක්‍ෂාවීම ඔහුගේම නුනුවණෙහි මුල්බැස්ම ය, තව ද මේ අක්මුල් නැති සසර එක් සත්වයෙකුගේ අඹුදරුවන් ජාති ජාතියෙහි දී ඔහු හඬ හඬා සිටිය දී සතුරන් අල්වා බැඳගෙණ ගිය වැල්ගොඩ බැලූ කල මාගේ බුදුහු අඹු දරුවන් බැඳ දුන් වැල්ගොඩ මිටි ම ය. ඔහු සතුරන්ට අඹුදරුවන් බැඳ දුන් වැල්ගොඩ ලප් ම ය, මෙසේ සසර-සිණක් නොකොට තමාගේ අඹු දරුවන් සතුරන්ට බොහෝකොට දී ඇවිදිනා සත්වයා අඹු දරුවන් දන් දීය නොහෙම් යි බුදුවීමෙහි උපෙක්‍ෂා වීම ඔහුගේ ම නුනුවණෙහි මුල් බැස්ම ය, මේ ධර්මකථා වෙහි දී ත් සමහරු විශයීවාත් ම බුදුවීමෙහි ලොභ ය නොකෙරති. තව ද සමහර කෙනෙක් කපෙක් නම් බොහෝ කාලෙක් ද, අසඞ්ඛ්‍යයක් නමුත් බොහෝ සඞ්ඛ්‍යාවෙත්ල. බුදුවීමට [illegible] මගයෙන් සාරාසඞ්ඛ්‍ය කප්ලක්‍ෂයක් පෙරුම් පිරුවමනාලු. ඒ ගෙවාගන්නේ කවර කලෙක ද? පෙරුම් පුරන්නේ කවර කලෙක ද? බුදුවන්නේ කවර කලෙක ද? යි දීර්ඝ කාල මගයෙන් කර්සිත සිත විශයී වෙති. ඒ සිතිවිල්ල ත් සත්වයාගේ නුනුවණ මැයි.

ගේ මෙසේ යි.

බුදුහු අසුරු සණක් කලින් අසඞ්ඛ්‍ය ගණන් කප්වල ජාති දැන පියන සේක. එසේ සූක්‍ෂම වූ ඥාණගති ඇති බුදුහු එක් සත්වයෙකුගේ ජාති කෙලවර පරිජීර්ණ ය වනතෙක් බලා ත් දැනපීම නොහෙන සේක් ම ය, තව ද එම සත්වයා අක් මුල් නැති සසර සුව දුකින් යෙදී පෙර සසර ඇවිදි කල් බලන සේක් වී නම් බුදුකෙනෙකුන්ගේ ආයු ගෙවී යෙයි. සසර ඔහු ඇවිදිනා කාලයෙහි මුලෙක් නො පැණෙයි, මෙසේ අසුරුසණක් කල්හි අසඞ්ඛ්‍ය ගණන් කප්වල ජාති දැන පියන බුදුන් තමන්ගේ ජීවිතාන්තය දක්වා බලා ත් නිමවාගත නොහැකි ජාති ජාති සසර පෙර ඇවිද දුක්ගත් සත්වයා අසුරු සණෙකින් බුදුන් දක්නා සාරාසඞ්ඛ්‍ය කප්ලක්‍ෂයක් [2]බොහෝ කලෙකැ'[1]යි සිතා බොධිසත්ව පාරමිතාවෙහි හීන විශයී ව උපෙක්‍ෂා වීම වැසි බා පිහිළී වන්නා සේ සත්වයාගේ නුනුවණෙහි මුල්බැස්ම මැයි, තව ද සංසාරයෙහි ඒ බුදුහු අෂ්ටලෝක ධර්මයෙහි යෙදී ඇවිදිනාසේක් වී ද, ඔබ ත් අන්‍යයන් ඇස් ඉස් මස් ලේ අඹු දරුවන් දන් දුන් සේක් ම වේ ද, බුදුවෙමි යි පතා දුන්සේක් ම වේ ද; එසේ වන්නාවූ බුදුන් දුන් ඇස් ඉස් මස් ලේ අඹුදරුවෝ බොහෝ වෙත්

---

1 සේ, එසේ මැයි. 2 කල් බොහෝ යයි.

දුසී යමෙක් ඉතින් සිතන්නාහු වූ නමුත් ඒ සිතිවිල්ල ත් සත්වයාගේ අඥානභාවය මැ යි. මාගේ බුදුහු පාරමිතා භූමියේ දී අන්‍යායෙන් ඉසකුත් ඇස කුත් මස කුත් ලෙය කුත් අඹුදරු කෙණෙකුත් තමන් වහන්සේ නො තමැති ව එක් කලෙක ත් නු දුන් සේක් ම ය. එහි කාරණ මණිචෝර ජාතක, සංඛපාල ජාතක, වානරින්ද ජාතක, කුම්සීල ජාතක, පඤ්චායුධ ජාතක, නිග්‍රෝධ මෘග ජාතක, කර්කමක ජාතක, තුඩිල ජාතක, සුචිලෝම ජාතක, පුන්නක ජාතකාදීයෙහි සහයින් බලා දතයුතු.

කිම් ද සම්භාර සත්වයෙකුණෙක් බුදුහු ඉතා තද සේක, තමා අතින් තමා හිස් කපා පිය හැකි ද? තමා ඇඟ මස් තමා කපා දීපිය හැකි ද? තමා ඇඟ ලේ තමා දී පි ය හැකි ද? තමා ඇස් තමා උදුරා දී පි ය හැකි ද? තමාගේ ප්‍රිය වූ අඹු දරුවන් අනුන්ට හඩ ව හඩා මා හැකිතාම බැඳ දී පි ය හැකි ද? බෝධිසත්ව වූ කල ඉතා සඳවුම් මැනමැ යි එසේ අපට බැරි ය යි සිතන්නාහු වී නම්, එයින් ඒ සත්වයාගේ නුනුවණ මැයි, මේ මුළුලොව මාගේ බුදුන්ට වඩා ඉසට ලොභී ඇති කෙණෙකු ත් නැත, ඇසට ලොභී කෙණෙකු ත් නැත, ඇඟ මසට ලොභී කෙණෙකු ත් නැත,! බුදුන්ට වඩා ඇඟ ලෙයට ප්‍රිය කෙණෙකු ත් නැත, බෝධිසත්වවරයන්ට වඩා [1]අඹු දරුමත් කෙරෙහි දයාපර කෙණෙකු ත් අතික් කිසි කෙණෙකු ත් නැත් ම ය.

කාරණා කිම? යත්;

සෙසු සත්වයෝ මේ වස්තු පසට ලොභ කරන්නාහු !තමන් අස්ථිර බැව් නො දැන මෝහයෙන් ප්‍රේම කෙරෙති. බෝධිසත්ව වරයෝ විදුරු සේ නුවණැත්තෙන් නුවණින් ම ප්‍රේම කෙරෙති.

කෙසේ ද? යත්;

මේ සසර නම් අවුල් හුවැටියක් සේ අක් මුල් නැත; ගුල නම් ලීහිණියන්ගේ කසල්ලක් සේ අවුල; පිදුරු කැරැල්ලක් සේ පිළිවෙළක් නැත්තේ ම ය; වගුන් ඇති වනයක් සේ භයඞ්කර ය, කිඹුළුන් ඇති ගඟක් සේ ශඞ්කා පර ය; සොරුන් ඇති මගක් සේ ලඟ වී ය නො හැක්ක; කයින් ඔත් තුඹසක් සේ සැක කර ය; මෙසේ සසර ඇපිද මතු බුදු ව මා සසරින් ගැලවෙනතෙක් මාගේ මේ ඉස ද; මාගේ මේ ඇස ද; මාගේ මේ ඇඟ මස් ද; මාගේ මේ ඇඟ ලේ ද; මාගේ මේ ප්‍රිය වූ අඹුදරුවන් ද අනික් සත්වයන්හට අන්‍යායෙන් නොදෙමි, තුණුරුවන් වැඳි අතින් අන්‍ය සත්වයකු නො වඳිනා සේක් සාධු! බුදුවෙම් යි පත පතා එක්වාරයෙක දීපු

1. අඹුදරුමත්

ඉසෙහි පිණින් මිතු අන්‍යායෙන් අනුන් කපාගත නොහැක්කැ යි ඉසෙහි කල ප්‍රේමයෙන් මී ඉස් දන් දුන් සේක. මෙසේ ම දන් දුන් ඇසව් ජාති සහස්‍රයෙක රෝග ත් නැත. උදුරාගන්නා සත්වයකුත් නැතැයි ඇසෙහි කල ප්‍රේමයෙන් ම ඇස් දන් දුන්සේක. තව ද ඇඟ මස් ත් ප්‍රේමයෙන් ම දුන්සේක. ලේ ත් එසේ ම අනුන්ට අන්‍යායෙන් නො දෙමි යි සිතා මී ප්‍රේමයෙන් ම දුන් සේක, මාගේ ප්‍රිය වූ අඹුදරුවන් එක්වාරයෙක මා සිත් පහදවා දන් දුනිම් නම් අසඞ්ඛ්‍ය ගණන් ජාතිවල මා නො නමැති කරවා බැඳගෙණ ගොස් මෙහෙ ගනගෙත එකද සත්ව කෙණෙක් නැත, එසේ කල උන්ට සුව වෙයි, ශාන්ති වෙයි, නිර්භය වෙයි සිතා ප්‍රේමයෙන්ම අඹුදරු වනු ත් දන් දුන්සේක; එසේ හෙයින් ම මේ මුළුලොව ම බොධි සම්භාරයන්ට වඩා ආත්ම ප්‍රේම ඇත්තෝ නැත, ලොව ඔවුන්ට වඩා අඹු දරුවන් කෙරෙහි ත් ප්‍රේම ඇති කෙණෙකුත් නැත්මැ යි, තවද සසර බුදුන් දන් දුන් ඇස් ඉස් මස් ආදිය මඳසියාවට ත්; සසර ඇවිදිනා සත්වයා අන්‍යායෙන් දුන් ඇස් ඉස් මස් ලේ අඹුදරු වන් බොහෝ නියාවටත් කාරණ කිම්? යත් දැන් මේ කාලයෙහි අසවල් පුරුෂයා බුදු වෙමියි පතා ඉස්දී පී ය, ඇස් දී පී ය, මස් දී පීය, ලෙහෙ දී පී ය, අඹුදරුවන් දී පී යයි ඇසීමෙක් දුර්ලභය. දීර්ඝකාල වශයෙන් රාශිභූත අවස්ථාවෙයි බොහෝ බව මුත් මේ ඉතා අමාරු ය.

එ දුන් අසවල් යුද්ධයෙහි දහස් ගණන් හිස් කපාපුහ. අසවල්හු ඇඟ මස් කිඹුල්ලු කෑහූ ය. අසවල්හු ඇඟ ලේ යක්ෂ රාක්ෂසයෝ බීපූ ය. අසවල්හු හඬව හඬවා ඇස් උදුරා පූ ය. අසමල්හුගේ අඹු දරුවන් සතුරෝ බැඳගෙණ ගියෝ ය යි කියා ඇසෙන දූත් බොහෝ ම ය. දක්නා දූ ත් බොහෝ ම ය. අන්‍යායෙන් දෙන දේ දූන් බොහෝවූ වා සේ ම සසර ඇවිදිනා සත්වයා අන්‍යායෙන් දුන් ඉස් ඇස් මස් ලේ අඹුදරුවෝ බොහෝ මි ය යි දතයුතු. දූන් මිද වූවා සේ ම පින් නිසා දුන් ඉස් ඇස් මස් ලේ අඹුදරුවෝ බොහෝ නොමෙත් ම ය යි දතයුතු. තව ද මේ ලොකයෙහි සමහර සත්ව කෙණෙක් බුදු වන්නේ බොහෝ දුක් ගෙණ ය; සසර බුදුන් ගත් දුක් බොහෝ ය යි හීරුක වෙත්. එයි ත් අඥනභාව ය මය මාගේ බුදුහු සසර පාරමිතාභූමියෙහි පෙරුම් බලයෙන් දුකක් නො ගත් සේක. සසර සුවයෙන් ම හුන්සේක. සියලු සතුන්ට ත් සුව ම දුන්සේය, තමන් වහන්සේ ත් කෙළමර නිවන්සුව ම ලත් සේක. එසේ හෙයින් මම වනාහි මාගේ බුදුන් සසර පාරමිතා සුවෙන් සුවව්දම් බුදුවුහ යි කියමි. අධිකවූ වීර්‍ය මුත් බොධිසම්භාරයන්ට සසර අධික වූ දුක් නැත්තේ මැයි.

කාරණ කිම? යත්;

කෘතාධිකාර වූ බෝධිසත්ත්වයන් සසර ලබන පූජා සුව කෙලෙසෙක් ඇත, සෙසු සත්ත්වයන්ට ඒ සුව විඳීම කෙලෙස නැත, බෝධිසත්ත්වයන්ගේ පාරමිතා බලයෙන් ලබන පූජා සුව කෙලෙස නම් කවරහ? යත්;

සංජීව ය, කාලසූත්‍ර ය, සඞ්ඝාත ය, රෞරව ය, මහාරෞරව ය, තාප ය, ප්‍රතාප ය, අවීචි ය, යන අටමහනරකයෙක් ඇත; ඒ අට ම දසදහසක් යොදුන් දිග හා පුළුල හා උස ඇත්තේ ය; නවයොදුන් බොල, යකබල ය. ගිනිරසින් සියක් යොදුනෙහි සිටියවුන් ඇස් පිපිරෙයි; කලෙක පුරාලූ තුඹසුණු සේ අතුරු නැති ව පැසෙන නාවූ පව්කළ සත්ත්වයෝ බොහෝ හ; ඔවුන්ගේ ආයු කෙතෙක් ද? යත්; මෙ මිනිස් ලොවින් පණස් අවුරුද්දෙක් නම් චාතුර්මහාරාජික දිව්‍යලෝකයට එකදවසෙක; එසේවූ තිස් දවස් මස් කොට දොළොස් මස් අවුරුදු කොට, එහි උපන් දෙවියන්ට පන්සියයක් අවුරුද්දට ආයු ය. ඒ දෙවියන්ගේ පරමායු වූ පන්සියයක් අවුරුදු නම් පළමු වන නරකයෙන් එක් දවසෙක. ඒ නියා දවසින් තිස් දවස් මස් කොට, දොළොස්මස් අවුරුදු කොට, පන්සියයක් අවුරුද්දට ආයු ය,

මේ ආදි වූ දිව්‍ය ආයුක්‍රමයෙන් ගෙණ මනුෂ්‍ය ගණනායෙන් අට අට ගුණකරණයෙන් වඩ වඩා පරීක්ෂාකළ කල ඒ පළමුවන සංජීව නරකයෙහි හුණුවාවූ සත්ත්වයෝ මනුෂ්‍ය ගණනායෙන් එක ලක්ෂ දෙසැට දහසක් කෙළ වර්ෂ කාලයක් දුක් ගණිති. දෙවන නරකයෙහි හුනු සත්ත්වකෙණෙක් දොළොස් ලක්ෂ සයානූදහසක් කෝටි වර්ෂ කාලයක් දුක් ගණිති, තුන්වන නරකයෙහි හුනු කෙණෙක් එක් කෝටි තුන්ලක්ෂ අට හැටදහස් කෝටි වර්ෂ කාලයක් දුක් ගණිති. සතරවන නරකයෙහි වැටී ගිය සත්ත්වකෙණෙක් අශ්වකෝටි විසිනව ලක්ෂ සුසාළිස් දහස් කෝටි ප්‍රමාණ වර්ෂ කාලයක් දුක්ගණිති. පස්වන නරකයෙහි හුනු කෙණෙක් සුසැටකෝටි පන්තිස් ලක්ෂ දෙපණස් කෝටි ප්‍රමාණ වර්ෂ කාලයක් දුක්ගණිති, සවන නරකයෙහි හුනු වාහු පන් සිය තිස් කෝටි සුවාසූ ලක්ෂ සොළොස්දහස් කෝටි ප්‍රමාණ වර්ෂ කාලයක් දුක් ගණිති. සත්වන නරකයෙහි හුනුවාහු අඞ්තල්පයක් දුක් ගණිති. පඤ්චානන්තරිය කම් ආදිවූ පව්කොට අටවන නරකයෙහි හුනු කෙණෙක් කල්පයක් කල් දුක් ගණිති. මෙසේ බොහෝ ආයු ඇති ඝෝර වූ අවමහ නරකයට බෝධිසත්ත්වයෝ නො වදනාහු ය. "බුදුවීම් නම් දුකැ"යි යන සත්ත්වයෝ මේ නරකවල දුග්ගෙණ ඇවිදිනාහු ය, මෙ බුද්ධාංකුරයන්ගේ පළමුවන සුව විඳීම ය.

තව ද තුන්සක්වළක් එක් වූ තෙන ලෝකාන්තරික නම් නරක යෙක් ඇති. එහි උඩින් හිරු සඳු ආලෝකයකු ත් නැත, යට අති සිසිල්වූ ක්‍ෂාරෝදකය වේ. එහි උපදනා ප්‍රේතයන් උස තුන්ගවු ය, ඉතා මහත් වූ නිය ය, [1]පරඬලාපත් සේ ශරීර ය, ඉස්මුදුනෙහි පිහිටි හිදිකටුමල සා මුඛය ය, කපක් කල් දුක් ගන්නා ආයුෂ ය, මේ නරක ය නම් අළුහා මෙලෝ පරලෝ නැතැ යි මිථ්‍යාදෘෂ්ටි ගත් තා වූ සත්‍වයන්ට ම නියත ව තිබී ආ නරකයෙක. මේ නරකයෙහි වැටී කපක් කල් දුක් නො ගත්තාවූ එක ද ස්ත්‍රීපුරුෂ කෙනෙකුත් නැති. මාගේ බුදුහු පාරමිතාබලයෙන් ම එක් කලෙක ත් එහි නො වන්සේක. එසේ හෙයින් මේ ලෝකාන්තරික නම් නරක යට නො වැදීම බුද්ධාංකුරයන්ගේ දෙවනු සුව විදීම ය.

තව ද මේ ලෝකයෙහි නිජ්ඣාමතණ්හා නම් මහාප්‍රේතයෝනි යෙක් ඇත; ඔහු ගසක ගත් ගිනි සේ දිලිසෙන ශරීර ඇත්තාහ. අසුරුසණකු ත් නො රඳා ඒ ඒ තන්හි ඇවි ද සපකුදු බත් නො ලදින්, පැන් නො ලදින් අඬ අඬා ඇවිදිනාහ එහි ඉපද දුක් නො ගත්තාවූ එක ද සත්‍වකෙනෙක් නැත. මාගේ බුදුහු පාරමිතා භූමියෙහි එක් කලෙක ත් ඒ ප්‍රේතයෝනියෙහි නූපන්සේක. එසේ හෙයින් බුද්ධාංකුරයන්ගේ මේ තුන්වන සුව විදීම ය.

තව ද මේ ලෝකයෙහි ඛුප්පිපාස නම් වූ ප්‍රේතයෝනිය කු දු ඇත. ඔහු තලයොදුන් පමණ ඉස් ඇත්තාහ, විසිගවු දිග දිව් ඇත්තාහ; ඉතා උස් වූ ශරීර ඇත්තාහ; කේ ලොම් සා බඳ ඇත්තාහ; බුද්ධාන්තරයක් දක්වා බත් නො ලබන්නාහ; පැන් නො ලබන්නාහ; පැන් බොමිහ යි සාගරයට මන්කල දිය සිදීගියා සේ පෙණී යෙයි. ඉදින් සැඩිවතත කෙනෙක් පඤ්චමහාගඞ්ගාවෙහි දිය ඉන් එක් ප්‍රේතයෙකුගේ මුඛයෙහි එක්විට වත් කෙරෙත් නුමුත් රසදිව නො නෙමෙත තෙක් කසින් නැගී ගින්නෙන් දැ හසම ව යෙයි. ඒ ප්‍රේතයොනියෙහි ඉපද දුක් නො ගත්තා වූ එක ද සත්‍ව කෙනෙක් නැත; පාරමිතාබලයෙන් මාගේ බුදුහු එක්කලෙ ක ත් මේ ප්‍රේතයොනියෙහි දුක් නො ගත් සේක. එසේ හෙයින් බුද්ධාංකුරයන්ගේ මේ සතරවන සුව විදීම ය

තව ද ගිනිගෙණ දිලියෙන අංගුඩ ගෙණ ඔවුනොවුන් පැහැර මරා දුක්ගන්නා කාලකඤ්ජක නම් ප්‍රේත අසුරයොනිය කු දු ඇත. එහි ඉපිද දුක් නො ගත්තාවූ එක ද සත්‍වකෙනෙක් නැත. පාරමිතා බලයෙන් මාගේ බුදුහු එක්කලෙකත් එහි නූපන්සේක. එසේ හෙයින් බුද්ධාංකුරයන්ගේ මේ පස්වන සුව විදීම ය.

---

[1]පරණලා පත්

තව ද සකල සත්ත්වයෝ ම උකුණු ව ඉකිකුණු ව මකුණු ව කුරා ව කුහුඹු ව සිකි ව පැණි ව පණු ව ගැඩවිල් ව ගොම පණු ව මඩපණු ව මැසි ව මදුරු ව යනාදී වූ ක්‍ෂුද්‍රප්‍රාණී ව උපදනාහ. සසර මාගේ බුදුහු වඩුකුරුල්ලන්ට කුඩා වූ ක්‍ෂුද්‍ර ප්‍රාණී ව නූපන් සේක. තව ද දර පිඹුරු ආදි වූ ලාමක ප්‍රාණීන් ව ත් නූපන් සේක. එ හෙයින් මේ බුද්ධාංකුරයන්ගේ සවන සුව විඳීම ය.

තව ද සංසාරගත වූ සත්ත්වයෝ ජාතියෙන් අන්ධ ව ඉපද බොහෝ දුක් විඳිති, සමහරු ජාතියෙන් ගොළු ව ඉපද දුක් ගනිති; සමහරු ජාතියෙන් ම බිහිරි ව ඉපද කර්ණරසායන නො ලබති; සමහරු ජාතියෙන් ම කොර පිළු ව ඉපද වනුගා ඇවිද නීගා විඳිති. සමහරු ජාතියෙන් ම සෙවතකුෂට ආදී පාප රෝග ඇති ව උපදිති; මාගේ බුදුහු එක් කලෙක ත් මෙසේ වූ පඤ්චේන්ද්‍රිය වෛකල්‍යයෙන් ඉපද දුක් නො ගත් සේක. එසේ හෙයින් බුද්ධාංකුරයන්ගේ මේ සත්වන සුව විඳීම ය.

තව ද මේ සසර සමහර පුරුෂයෝ පරදාරාදී වූ අකුසල් බෙලෙන් ගෑණුම් ඉපිද පියා සිය දහස් ගණන් වාරයෙහි නරක දුක් වැනි වූ ස්ත්‍රී කර්මයෙන් දුක් විඳිති, මාගේ බුදුහු එක් කලෙක ත් ස්ත්‍රී ව නූපන් සේක. එසේ හෙයින් බුද්ධාංකුරයන්ගේ මේ අට වන සුව විඳීම ය.

තව ද සමහර සත්ත්වයෝ පරදාරාදී වූ අකුසල් බෙලෙන් නපුංසක ය-ඔපක්කමික ය-උභතොබ්‍යඤ්ජනක ය යි යනාදී පණ්ඩක ව සිය දහස් ගණන් ආත්මභාවයෙහි ඉපද ගෙයක් නැති ව, දෙරක් නැති ව, අඹු කෙණෙකුත් නැති ව, දරු කෙණෙකු ත් නැති ව, ගැහැණි ත් නොව-පිරිමි ත් නොව බොහෝ දුක් ගන්නාහ, මාගේ බුදුහු එක් කලෙක ත් එසේ වූ හීනාත්මභාවයෙක නූපන් සේක. එසේ හෙයින් බුද්ධාංකුරයන්ගේ මේ නවවන සුව විඳීම ය.

තව ද මේ ලෝකයෙහි සමහරු මාතෘඝාතක ය, පිතෘඝාතක ය, අර්හන්තඝාතක ය, ලෝහිතුප්පාදක ය, සඞ්ඝ භේදක ය යි යන පඤ්චානන්තරිය කර්මයන් කොට කපක් මුළුල්ලෙහි නරක දුක් ගනිති. මාගේ බුදුහු එක් කලෙක ත් එසේ ආනන්තරිය කර්මයන් නො කළ සේක. එසේ හෙයින් මේ බුද්ධාංකුරයන්ගේ දස වන සුව විඳීම ය.

---

1 ගොඩි   2 ධර්මයෙන්

තව ද සමහර සත්ත්වයෝ අරූතල අසංඥතලයෙහි ඉපද, ඒ ඒ කල උපන් බුදුන්ගේ ශ්‍රී නො ලබන්නාහ, මාගේ බුදුහු වනාහි එක් කාලයක ත් අරූතල අසඥතලයෙහි නො උපන්සේක. එසේ හෙයින් බුද්ධාංකුරයන්ගේ මේ එකොළොස් වන සුව විඳීම ය

තව ද බුද්ධාංකුරයන් සසර බුදුන් දුට ත් මාර්ගඵල නොහන් නා හෙයින් අනාගාමින් උපදනා සුද්ධාවාස බ්‍රහ්මලෝකයෙහි ත් ඉපැදීමක් නැත, රජකුලයෙහි ඇත්තවුන් ගොවිකුලයෙහි ඇත්ත වුන්ගේ වාසයට නො වදනා සේ තමන්ට සේවක වූ සුද්ධාවාස බ්‍රහ්ම ලෝකයෙහි බඹුන් හා එක් ව නො ඉපදීම බුද්ධාංකුරයන් ගේ මේ දොළොස් වන සුව විඳීම ය.

තව ද සමහර සත්ත්වයෝ අකුසල් බෙලෙන් මෙලෝ පරලෝ නැතැ යි ගන්නා නියත මිථ්‍යාදෘෂ්ටි කුලයෙහි ඉපද සත්පුරුෂ මාර්ගයන් පාතවුන් නැත්තෙන්, මෙලෝ පරලෝ නැතැ යි දෘෂ්ටි ගෙණ කාලාන්ධකාරයෙක ගමන්[1] ගත්තවුන් සේ අකුසලමාර්ගයෙහි හොස් අපාගත වෙති. මාගේ බුදුහු දීපඞ්කර පාදමූලයෙහි දී විවරණයෙහි ලද පටන් ගෙණ මේ සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂාන්තරයෙහි එක් ජාතියෙක ත් එසේ වූ නියත මිථ්‍යාදෘෂ්ටි කුලයෙක නූපන් සේක. එසේ හෙයින් බුද්ධාංකුරයන්ගේ මේ තෙළෙස් වන සුව විඳීම ය.

මෙසේ මාගේ බුදුහු මේ නරකාදි තේරශ අභව්‍යස්ථානයෙහි නූපන් හෙයිනු ත් එහි දුක් නො ගත් හෙයිනු ත් සසර අන්‍යාය යෙන් ඇස් ඉස් මස් ලේ අඹු දරුවන් කිසි කෙණෙකුන්ට ත් නො කමැති කරවා නුදුන් හෙයිනු ත් කිසියම් හෙතෙක චුල්ලනන්දිය ජාතකාදියෙහි සේ පීඩාවක් ජීවිතහරණයක් වූ තෙනෙක් ඇති නමුත්, ඒ සියල්ල ද පාරමිතා කොට්ඨාසයෙක අන්තර්ගත වූ හෙයි නු ත් ඒ සියල්ල ම පරිත්‍යාගයෙන් සිත පහදවා ත්‍රිවිධ වූ සන්තොෂ නො වරදවා ම නොමද කොට දන් දුන් හෙයිනු ත් දුන් දනෙහි නිසෙසාකී වූ හෙයිනු ත් සසර ත් මෙසේ සුඛයෙන් ම හුන්සේක බුදු ව සියලු සතුන්ට ත් සුව ම දුන්සේක.

තව ද දීපඞ්කර ප්‍රණිධියෙහි දී විවරණ ලත්දා ම කරුණා මෛත්‍රී නමැති අඞ්ගනාවන් දෙදෙනා තමන් වහන්සේගේ සිත් නමැති ගෘහයෙහි වස්වා ගෙණ දවසෙක ත් ඔවුන් දෙදෙනා අත් නොහළ සේක. එ දවස් ම මෙ තෙමේ බොහෝ දවස් අත් නො

1 ගත්තවුන්සේ

හැර ආවා වූ මා දුන් අත්වූනා පියා කරුණා මෛත්‍රී දෙ අඹුවන් කෙරෙහි අභිනවයෙන් පෙම් කෙරෙයි කියා සපත්නිරොෂයෙන් දිලිහී ඔහු වසන ආසන්නයෙහි දු නො වෙසෙම් යි දුරුව ගියා සේ වස්තුතෘෂ්ණා නමැති පාපී වූ ස්ත්‍රිය එක් කලෙකත් ඔබ කරා නො පැමිණී හෙයිනු ත් ඔබ ඇට ස්නෙහයක් නො කළ හෙයිනුත් අසාධාරණ සුවයෙන් ම හුන්සේක.

එයින් කීහ :

දෙහීති වත්‍ථුමසුකං හදිතොත්ථි කෙහි
නාලං කථෙතුම්හ නත්‍ථි න දෙම් චාති,
චිත්තෙන මහාකරුණාය පහමාවකාසා
දූරඤ්ජගාම විය තස්සහි වත්‍ථු තණ්හා"යි,

තවද අවශෙෂවූ සත්වයෝ දුඃඛ සහගත චිත්තයාගෙන් මහත් වූ දුක් විඳිනාහුම ය, මාගේ බුදුහු වනාහි දුක්ඛයට ම දුක් දුන් බවක් මිස ඔහුගෙන් [1]පීඩාවක් නොවුන්සේක. කෙසේ නො වූන් සේක්ද? ලොකයෙහි සතුරන් ඇති සතුන් ගෙයක් දොරක් නැති ව ඔබිනොබ වල කොල ඇවිදිමින් සිඳිනා කල තමහට ඔවුන් විසින් පීඩාවක් කොට ලිය නො හැක්කා සේ මාගේ බුදුහු සසර නො එක් ජාතිවල ඉස් දෙන කල ඇස් දෙන කල මස් දෙන කල ඉතා මහත් වූ දුක්ඛ වේදනා නමැති සතුරා තමන් වහන්සේ කරා පැමිණ මහත් වූ දුක්ඛ වේදනාවන් උපදවන්නට පටන් ගත් කල්හි දානයෙන් පැන නැංගා වූ මහත් වූ ප්‍රීති නමැති ඔබගේ මහා යොධයා ඔහු ලුහුබැඳ දුර ස්ථානයෙහි ලයි නැවත ඔහු ආ කල්හි නැවත නැවත ද දුරු කෙරෙයි. මෙසේ මේ සාරාසඞ්ඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි තමන් වහන්සේ කම් සේ නැති ව ඔබ මොබ යාමෙන් ඊමෙන් දුක් ගන්නා වූ දුක්ඛයා ඔබට දුක්ඛයක් දී ලිය නීහුනු යේ ම ය යි දතයුතු.

එයින් කීහ :

ආනීයතෙ නීසින සත්‍ථ නිපාතනෙන
නික්කඩ්ඪතෙව මුහුදාන භවාය රත්‍යා,
එවං පුනප්පුන ගතා ගත වේගබින්න
දුක්ඛං න තස්ස හදයං වත පීළයිත්‍ථ, යි.

මේ ආදි කාරණයෙන් මාගේ බුදුහු සුවවිඳ ම බුදුවූවාහු නම් වන සේක; තව ද සංවතී ය, සංවත්තීස්ථායී ය, විවතී ය, විවත්තීස්ථායී ය යි මහා කල්පයා ගේ සතර භාගයෙන් සියලු සත්වයෝ පලමුව ම

1. පීඩාව නොකළ සේක.

කී තුන් භාගයෙහි අපරාපර්‍ය්‍යවෙද්‍යකර්‍මයාගේ බලයෙන් ඒකාන්ත සුව විඳිනාහ, චිරතීස්ථායී නම් වූ අටයෙන් සිටිනා අසංඛ්‍ය කල්ප වන බැවින් දුක්ඛ කොට්ඨාසය ම බොහෝකොට විඳිනාහ. එසේ හෙයින් සංසාරගත සත්වයාට මහා කල්පයාගේ අටවන භාගයෙන් සත් භාගයෙක් ඒකාන්ත සුව විඳීම වෙයි. සුරු වූ එක් භාගයෙක ඒකාන්ත දුක් විඳීම වෙයි. බොධිසත්වවරයෝ ඒ අටභාගයෙහි ම කල්පයාගෙන් ඒකාන්ත සුව විඳිනාහු ය. මෙසේ වූ සුව විඳීම ද අවශෙෂ වූ සත්වයන්ට නැතැ යි දතයුතු. තව ද තුන් තොටක් ඇති මහත් වූ ගඟෙක බෑස දිය කපා ඉඟිකරන්නා වූ පුරුෂයෙක් මත්තෙහි තොටින් නැගෙමි යි විශේෂකොට ප්‍රඥාධිකයාගේ වී නම් එම තොටින් හෝ නැගෙයි. එ තොට ශ්‍රද්ධාධිකයාගේ වී නම් දෙවන තොටින් හෝ නැගෙයි. එ තොට ත් ශ්‍රද්ධාධිකයාගේ වී නම් තුන් වැනි තොටින් නැගේ ම ය. මුහුදු බත් ගොඩවී මෑ යි. එසේ හෙයින් ම බුදු වෙම්ව යි ප්‍රාර්ථනා කළාවූ සත්වයෝ ද ප්‍රඥාධික වූ විශේෂ ඇත් තාහු ලොව්තුරා බුදුබව සාදා ගණිති, ශ්‍රද්ධාධික වූ විශේෂ ඇත්තාහු පසේ බුදුබව සාදා ගණිති. සාමාන්‍ය වූ විශේෂ ඇත්තාහු ශ්‍රාවක බොධිය සාදගණිත් ම ය. සංසාර සාගරයට බත් කොමෙක් මෑ යි.

එසේ හෙයින් මේ ලොකයෙහි සියලු ප්‍රාර්ථනාවෙන් ම බුදුවෙම්ව යි කරන්නා වූ ප්‍රාර්ථනාව නම්, සියලු ප්‍රාර්ථනා ම එහි අනතර්ගත වන බැවින් බුදුපීමෙහි විශේෂ ඇත්තාහට ද නැත්තාහට ද උතුම්වූ ප්‍රාර්ථනාවෙක් ම ය එසේ හෙයින් බුදුබැව් ප්‍රාර්ථනා කරන්නා වූ සත්වයෝ සිතු යම් ශාඛාවකට පැන සිත්සේ පල්ලව එලානුභව කළ හැකි හෙයින් රුක් මුදුන් අත්තට නැගෙන ශාඛා මෘගරාජ යන් වැනියාහ. තව ද ඔහු එක් බන්ධනයෙන් සර්‍වාඞ්ග බන්ධනය කළා නම් වන හෙයින් ග්‍රීවාබන්ධනය සාදන්නාවූ ඥෘෂමල්ලවයන් වැනියහ. තව ද සිතු සිතු කාලයෙක ඉච්ඡානුරූප වූ සම්පත්ති දෘෂක හෙයින් චින්තාමාණික්‍ය රත්නයට ම අත දිගුකරන්නන් වැනියහ. තව ද බුදුවෙම්වා යි පතනුවෝ ඉච්ඡානුරූප වස්ත්‍රාභරණයන් දෙන හෙයින් කල්පද්‍රුමයට නැගෙන්නවුන් වැනියහ. තව ද ඉච්ඡානුරූප වූ දියෙහි ගොඩෙහි නන් සුවඳ මල් පැලඳීම පිලුවන් සේ දන මංජුසක නම් දිව්‍ය වෘක්ෂයට නැගෙන්නාවූ දිව්‍ය පුත්‍රයන් වැනියහ. තව ද එක් ශරීරයෙන් තමන් කැමති කැමති වර්ණයකින් සුව විඳින්නාවූ අනන්ත වර්ණ දිව්‍යරාජයන්ගේ සම්පත් ප්‍රාර්ථනා කරන්නවුන් වැනියහ. තව ද කැමති කැමති සම්පත් එක් මුඛයකින් දෙන හෙයින් සුරභිධෙනු මුඛයට දෙහොත් දිගු

කරණ ධෛර්‍ය්‍යයින් මැනියහ. මේ ආදී නොයෙක් කාරණයෙන් සත්පුරුෂවූ ජනයන් විසින් බුද්ධ ප්‍රාර්ථනාව උත්තම ප්‍රාර්ථනාවෙකැ යි දැන, බුදු බැව් පතා තුන්තරා බොධියෙන් එක්තරා බොධියක් සාදා සංසාර සාගරයෙන් ගොඩනැංග යුතු.

මෙසේ මාගේ ස්වාමිදරුවෝ සසර ඇවිදිනාසේක් තමන්වහන්සේගේ පාරමිතා බලයෙන් ම මෙසේ වූ බොධිසම්භාර පූජාවන් තෙළෙස් දෙනෙකු ලත් හෙයිනුත්, එසේ වූ පූජාවිදීමට සුදුසු හෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වනසේක.

"පූජං විසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං" යි.

මෙසේ [illegible] ලෝවැඩ පිණිස කරණලද අර්හත් ගුණවර්ණනා සම්බන්ධ වූ මේ පූජාවලියෙහි අප බුදුන් පාරමිතා බෙලෙන් ලද බොධිසම්භාර පූජාකථා නම් වූ සතරවන පරිච්ඡේදය නිමි.

පස්වන පරිච්ඡේදය

තව ද අප බුදුන් සංසාරගත ව ලද පළමුවන ජාතිභේද පූජාකථා නම් කවරහ? යත්;

ස්වාමිදරුවන්ගේ සද්ධර්ම සාගරයට වැද නොයෙක් අද්භූත ධර්මයන් බලා ඇවිදිනා වූ මයූරපාදපරිවෙණාධිපති සුගතෙතා රසයන් විසින් ඔබ සංසාරයෙහිදී සූවිසි වාරයෙක සූවිසි බුදුකෙනෙකුන් නො වරදවා දැක, සූවිසි මහා සන්තානයෙකින් යෙදී, සූවිසි මහා දානයක් දී, සූවිසි මහා ප්‍රාර්ථනාවක් කොට, සූවිසි බුදු මුඛයකින් සූවිසි මහා විවරණ ලදින්, සූවිසි දිව්‍ය පූජාවක් ලදින්, සූවිසිමණ්ඩලයක දෙවියන් ලවා සාධුකාර දෙවා, තමන්ගේ බුදුසිරි දකුම්හ යි තුඩ තුඩ ප්‍රාර්ථනා කරවාපු මහාවීරපුරුෂ මහිමයක් හා තව ද තමන් ලොවුතුරා බුදුවූ දවස් පැළ සක්මළ පවන් බෝමැඩ දක්වා පුළුල සූවිසි යොදනෙක්හි හිටි ගැවසී දිවූ මරසෙනඟක් බිඳ පලවාපු නිර්භීතභාවයක් හා, තව ද යමාමහ පෙළහර කරණ දවස් සූවිසි යොදුන් අයම් විතර තන්හි හිටි ගැවසී සිටි මහ පිරිසක් ලවා තුඩ තුඩ බුදුවෙම්ව යි ප්‍රාර්ථනා කරවාපු ප්‍රාතිහාර්‍ය මහිමයක් හා,

තව ද සූවිසි දවසෙක සූවිසි තැනක වැඩහිඳ, සූවිසි දෙශනාමක් කොට, සූවිසි අසංඛ්‍යයක් ප්‍රාණීන් සෝවාන් කෙරෙමින්, සූවිසි අසංඛ්‍යයක් ප්‍රාණීන් සැදෑගැමි කෙරෙමින්, සූවිසි අසංඛ්‍යයක් ප්‍රාණීන් අනාගැමි කෙරෙමින් සූවිසි අසංඛ්‍යයක් ප්‍රාණීන් අමාමහ නිවන් දක්වමින් සබසානාති කෙරෙමින් ලෝමැඩකලාවූ මහාබුද්ධ මහිමයක් හා තව ද සොණනන්ද ජාතකයෙහි සොණ නම් මහ තවුස් ව වදාළ බණින් සූවිසි අක්ෂෞහිණී ඒ සා මහසෙනඟක් මොහොතක් කලකින් පන්සිල් ගන්වාපු චිත්‍ර කථික වාක්ලීලාවක් හා තව ද දිව්‍යඥනයට ද අවිෂය වූ අභිධර්මයට බැස සූවිසි උපාදනරූපයන් හා සූවිසි ප්‍රත්‍යයන් ද යථාදීවූ ධර්මයන් වෙන වෙන දක්වූ බුද්ධඥනයක් හා තව ද බුදු වූ දවස් පටන් දවස දවස සූවිසි කෙළ ලක්ෂයක් බැගින් එලසමවතින් හා සූවිසි කෙළලක්ෂයක් මහා කරුණා සමාපත්ති සුව විඳි වූ අප්‍රමාද භාවයක් හා තව ද සූවිසි බුදුන්ගේ මහිම වෙන වෙන දක්වාපු තුන් කල් දන්නා [1]ත්‍රිවිද්‍ය මහිමයක් හා, මෙසේ අද්භූත වූ සූවිසි මහා ධර්ම කෙණකුන් දුන ඔබ කෙරෙහි උපන් මහාසන්තෝෂයෙන් උදාර වූ ශ්‍රද්ධාවෙන් අධික වූ, බුද්ධ ප්‍රේමයෙන් දහම් මී බී කුල්මත් වූවාහු සූවිසි දහසක් ග්‍රන්ථ සංඛ්‍යාවෙකින් පූජාවලී නම් වූ ධර්මව්‍යාඛ්‍යාන කථාවකින් බුදුන්ට සතුති පූජාවක් කරන්නාහු, මේ ජාතිභෙද පූජා පරිච්ඡෙදයට ප්‍රාරම්භ කරම්හ. සත්පුරුෂයන් විසින් සාවධානව ඇසිය යුතු.

මාගේ බුදුහු තමන් [2]ලෙහෙන ව උපන් ජාති ය, වවුලු ව, උපන් ජාති ය, කුරුළු ව උපන් ජාති ය, ගිරා ව උපන් ජාති ය, කෙවිලි ව උපන් ජාති ය, කැර ව උපන් ජාති ය, පරෙවි ව උපන් ජාති ය, කපුටු ව[3] උපන් ජාති ය, දියකා ව උපන් ජාති ය, උකුසු ව උපන් ජාති ය, ලිහිණි ව උපන් ජාති ය, කොක් ව උපන් ජාති ය, කකුළු ව උපන් ජාති ය, කිඳුරු ව උපන් ජාති ය, ගුරුළු ව උපන් ජාති ය, හංස ව උපන් ජාති ය, මොනර ව උපන් ජාති ය, මණ්ඩූක ව උපන් ජාති ය, සුනඛ ව උපන් ජාති ය, ජම්බුක ව උපන් ජාති ය, මූෂික ව උපන් ජාති ය, ගෝධ ව උපන් ජාති ය, සා ව උපන් ජාති ය, මත්ස්‍ය ව උපන් ජාති ය, නාග ව උපන් ජාති ය, වඳුරු ව උපන් ජාති ය, හූරු ව උපන් ජාති ය, මුව ව උපන් ජාති ය, මී ගොන් ව උපන් ජාති ය, හෙලගොන් ව උපන් ජාති ය, අස් ව උපන් ජාති ය, ඇත් ව උපන් ජාති ය, සිංහ ව උපන් ජාති ය, චණ්ඩාල ව උපන් ජාති ය, නාටක ව උපන් ජාති ය, සොරදෙටු ව උපන් ජාති ය, සවර්ණකාර ව උපන් ජාති ය, කුම්භකාරව උපන්

1. ත්‍රිවික්‍රමයක්, 2. ලේන ව, 3. කුකුළු ව

ජාති ය, වෛද්‍යවංශයී ම උපන් ජාති ය, සිටු ව උපන් ජාති ය, වෙළඳ ව උපන් ජාති ය, බමුණු ව උපන් ජාති ය, පුරෝහිත ව උපන් ජාති ය, ඇමැති ව උපන් ජාති ය, පණ්ඩිත ව උපන් ජාති ය, රජ ව උපන් ජාති ය, තාපස බව පිරූ ජාති ය, වෘක්‍ෂ දෙවතා ව උපන් ජාති ය, ශක්‍රදේවේන්ද්‍ර ව උපන් ජාති ය, බ්‍රහ්ම රජ ව උපන් ජාතිය යි යන මේ පන්සිය පණස් ජාතකයෙහි පෙණෙන සම්පූර්ණ ජාතිභෙදාදීන් අතුරෙන් එකි එකී ජාතිභෙදයෙක්හි ම නො එක් නො එක් වාරයෙහි ඉපැද පාරමිතා පූරා සසර ඇවිදුනා වූ මාගේ සවාමි දරු වූ බොධිසත්වයෝ.

සුවර්ණමයූර ජාතකයෙහි පෙර බොහෝ කලක් රක්‍ෂා කළා වූ ශීලපාරමිතාවගේ ආනුභාවයෙන් කසුන් පිඩක් බඳු වූ ශරීර ලදින් හිමාලය වෙනෙහි සතර වනු වූ දණ්ඩකී හිරඤ්ඤ නම් පර්වතයෙහි බ්‍රහ්මචර්‍ය්‍යායෙන් වාසය කරණ සේක්: අරුණෝද්ගමන වේලායෙහි උදය පර්වතයෙන් නැඟෙන සූර්‍ය්‍ය දෙවතාවා බලා "උදෙතයං" යන ගාථාව බැඳෙගෙණ හිරුට පළමු ව නමස්කාර කොට ලා "යෙ බ්‍රාහ්මණා" යන ගයින් අතීතයෙහි උපන් නො එක් බුදුන්ට නමස්කාර කොට පැන නැඟී ගොස් ගොචර ග්‍රහණයෙන් දහවල් සුව සේ දවස් යවා සවස අස්තපර්වතයට යන හිරු බල බලා හිඳ "අපෙතයං" යනාදීන් එම පිරිත බැණ රාත්‍රියෙහි දවස් යවා, මෙසේ වසන කල මේ පිරිතෙහි ආනුභාවයෙන් දීර්ඝ කාලයක් මුළුල්ලෙහි බෝසතුන්ට භයෙක් වේව යි, සාරද්‍යයෙක් වේව යි, ලොමොද්ගමයෙක් වේව යි, එක දවසකුත් නො වූයේ ම ය. මෙසේ වසන කල බරණැස වැදි පුත්‍රයෙක් වෙනෙහි ඇවිදිනේ දවසෙක ඒ පර්වත ය මුදුනෙහි උදයගිරියෙහි දිලියෙන හිරුරැස් කලඹක් සේ රන් රසින් දිලියෙන පිල්කලඹ විහිද විහිදු නටන බෝසතුන්ගේ රූප ශ්‍රී දැක ගමට අවුත් කලෙකින් මියෙනුයේ "අසුවල් පර්වතයෙහි රන්වන් මයූර රාජයෙක් වෙසෙ යි. ඒ බව දැන හිඳුව" යි තම්පුතුට කී ය.

එ සමයෙහි බරණැස් රජුගේ ඛෙමා නම් බිසොවක් රන්වන් මොනරකු අතින් සිහිනෙන් බණ අසා "රන්වන් මොනරකු අතින් බණ අසන දොළක් මට උපන. ඒ දොළ පසිඳ දෙව" යි රජ්ජුරුවන්ට නො එක් වාරයෙහි යාච්ඤා කළා යි. රජ්ජුරුවෝ රන්වන් මයූරයෝ ලෝකයෙහි ඇතැයි වේදයෙන් අසා බරණැස වැදි සෙනග රැස්කරවා "රන්වන් මොනරකු දුටුවෝ කවුරු දැ" යි විචාරා සියලු වැදි සෙනග "අපි නුදුටුම්හ, අපි නුදුටුම්හ" යි කී කල යව කී

වැදි පුත්‍රයා අතින් ‘අසුමල් පර්වතයෙහි රන්වන් මයුරයෙක් ඇතැ” යි අසා සතුටු ව ප්‍රසාද දී “ඒ මයුරයා නො මරා බඳා ගෙණ තෝ ම ගෙණෙව” යි එම වැදි පුත්‍රයා යවූ හ.

එ කල ඒ වැදිපිත් “ඔහු ගෙණෙමි, දේවයෙනි” යි මහසි කියා හිමාලය වනයට ගොස් බොධිසත්ත්වයන් දුටු පර්වතය සිසාරා ඒ ඒ තන්හි මල ලයි; පිරිතෙහි ආනුභාවයෙන් මල පිට ඇක්මුනත් බෝසතානන් පය නො බැඳේ ම ය. අද බඳා ගණිමියි, හෙට බඳගණිමි යි උත්සාහ කරණුයේ සත්හවුරුද්දක් මුළුල්ලෙහි දුක්ගෙණ බඳගත නොහී රජු දක්නට භය ඇති ව ඒ වෙනෙහි ම මළේ ය. කිසාවු ද දෙල නො ලදින් එ ම ශොකයෙන් ම මළහ. රජ්ජුරුවෝ ද “ඒ රන්වන් මොනරු නිසා ම බිසොවුන් නො ලදිමි”යි බෝසතුන් කෙරෙහි වෛර බැඳ තමන් දිවිහිමියෙහු උත්සාහ කොට බඳා ගෙන්වා ගත නොහී “අසුමල් පර්වතයෙහි රන්වන් මයුරයෙක් වෙසෙසි; ඔහු මරා මස් කෑවෝ අජරාමර වෙති”යි රන්පත දැහිගුලෙන් ලියා භාණ්ඩාරයෙහි ලවා තුමූ ද පරලොව ගියහ. පසු පසු ව ඇති වූ සත් පරම්පරාවෙක රජ දරුවෝ ද රන්පත අකුරු බලා “ඒ මොනරු මරවා මස් කා අජරාමර වම්හ”යි වැද්දන් යවා නො ලදින් තුමූ තුමූ ද පරලෝ ගිය හ. ගිය ගිය වැද්දෝ ද වෙනෙහි ම මළහ.

පසුව සත්වනු ව උපන් රජ්ජුරුවෝ මෙ පුවත් අසා මායමෙහි දක්ෂ වූ වැද්දකු ගෙන්වා ඔහට බොහෝ සැපත් දී පෙර සේ ම යවූ හ. ඒ වැදි වනයට ගොස් බෝසතුන් දුටු නො බැඳෙන කාරණ පරීක්ෂා කරණුයේ, උදය සවස හිර බල බලා හිඳ මන්ත්‍රය පිරුවාණා දුටු “මේ මන්ත්‍රානුභාවයෙන් වන නො බැඳීමතැ” යි දුටු “මේ මයුරයා එකලාව ම වෙසෙ යි; එසේ හෙයින් පරිශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍යාව ඇති එනෙක; මොහු කාමයෙන් මත් කරවා පියා මන්ත්‍රය පිරුවා ගත නො දී බ්‍රහ්මචර්‍ය්‍යාව කෝප්‍ය කරවා ගෙන්වා බඳා ගණිමි” යි සිතා දව සෙක අරුණු නො නැගෙන තෙක් එක් තෙනෙක මල අටවාලා එ තැන සෙබඩක බැඳ සිටුවා තෙමේ නො පෙණී සිට “රාවයක් කළ” යි සංඥා කොට ලී ය. සෙබඩ ඒ වේලෙහි බෝසතුන් පර්වත මුදුනෙහි දිලියෙන්නවුන් දුටු කාමරාවකයෙන් හැඬුව. එ නෙණෙහි ඇගේ රාවකය කණ ගී ම හා සමග මාගේ එ වැනි වූ බුද්ධාංකුරයාණෝ පවා සත්සියයක් හවුරුදු මුළුල්ලෙහි රක්ෂා කළා වූ බ්‍රහ්මචර්‍ය්‍යාව කෝප්‍ය කොට කාමොන්මාද ව සිහි එලවා



බෝසත් වඳුරා ස්වකීය වඳුරු රැළ ගනිත් එතර කරලීම.

73 පිට බලන්න. (4-5)

ගත නො හී එ දවස් මන්ත්‍රය නො පිරුවා ම දිව සෙබඩ සමීපයෙහි වැටී ඉල මලව පා දී, කාම මලට සිත් දී, එක විට මී මල දෙකින් හසු ව සිටි සේක.

එ කෙණෙහි වැදිපිත් බෝසතුන් අල්වා නො මරාම, ගෙණ ගොස් රජ්ජුරුවන් අතට දින. රජ්ජුරුවෝ ද බෝසතුන්ගේ රන් රසින් දිලියෙන රූපශ්‍රී බලා පැහැද මහත් වූ ප්‍රෙම බැද රන්මල් සේසතින් දිලියෙන සිංහාසනය පිට වඩා හිඳුවාලූහ. එ වේලෙහි බොධිසත්වයෝ සිංහාසනයෙහි වැඩහිඳ රජ්ජුරුවන් මුහුණ බලා "දේවයෙනි! කුමක් නිසා මේ සා උත්සාහයක් කොට මා ගෙන් වූ දෑ? යි විචාළ දෑ ය. රජ්ජුරුවෝ: "තොප ඇඟ මස් කැවත් අජරාමර වෙති" යි අසා මම ද අජරාමර වෙමි' යි මස් කනු සඳහා ගෙන්වීමි" යි කීහ. බෝධි සත්වයෝ ද, "දේවයෙනි! පෙර රන්වන් මොනරුන්ගේ මස් කෑ කෙනෙක් රජහු අජරාමර වූහ' යි ඇසූ දෑ? යි විචාළ දෑ ය. රජ්ජුරුවෝ "තොප මිනා අනික් රන්වන් මයුරයකු ලෝකයෙහි නැති වුව, එසේ හෙයින් පෙර අජරාමර වූ රජෙක් නැතැ" යි කීහ. බෝසතාණෝ: "එසේ නැති කල, දේවයනි! තොපගේ බස් පූර්වාපර විරොධ ය; මා විනා අනික් රන්වන් මයූරයකුත් නැති කල, එ බඳු වූ මසක් කෑවනුත් නැති කල, පෙර අජරාමර වූ වනු ත් නැති කල, දැන් මාගේ මස් කෑමෙන් අජරාමර වෙති යි කෙසේ දතු දෑ? යි විචාළ දෑ ය. රජ්ජුරුවෝ: "තොප රන්වන් හෙයින් තොප ඇඟ මස් කෑවත් අජරාමර වෙති යි ඇසීමි" යි කීහ. බෝධිසත්වයෝ: "මා මරා ඇඟ මස් කවු ද, නො මරා ඇඟ මස් කවු දෑ?" යි විචාළ දෑ ය. රජ්ජුරුවෝ: "ඇඟ මස් කන්නේ නම් මරා වේ දෑ" යි කීහ.

තොපගේ බස් තවත් පූර්වාපර විරොධ ම ය. දේවයෙනි! තෙපි ම දැන් මා මරා පියා නම් මා මියන කල මා ඇඟ මස් කෑවත් නො මියන්නේ කෙසේ දෑ යි විචාරා: "මේ ලෝකයෙහි එකාන්ත වස්තුවෙකුත් ඇද්ද? අජරාමරයෙක් ඇද්ද? මහත් වූ ආනුභාව ඇති දිව්‍ය බ්‍රහ්මරාජයෝ පවා පෙණපිඩක් සේ ඇති ව නැති වන්නාහු ම ය. මුළු සක්වළබබුළුවන චන්ද්‍ර-සූර්‍ය්‍ය දිව්‍යපුත්‍රයෝ පවා දවසෙක කඩෙුතිමින් නො වටනාවත් ම අනන්තඞාන වෙත් ම ය" යි යනාදීන් අනිත් ලකුණෙන් රජහු ගිවිස්වා බුදුවෙණකුත් සේ බණ වදාළ දෑ ය. එ වේලෙහි රජ්ජුරුවෝ කාරණා ගිවිස "තොප රන්වන් වූ කාරණ කිම් දෑ? යි විචාළහ. බොධිසත්වයෝ ඒ ජාතියෙහි ජාතිස්මරණඥාන ඇතිහෙයින්: "දේවයෙනි! පෙර මම මේ ම නුවර සත්රුවන් සක්විතිරජ ව වැස මුළු සක්වළ ආකාශයෙන් ඇවිද සක්විති රාජ්‍යය කොට බොහෝ දෙනා පඤ්චශීලය රක්‍ෂා

කරවා මම ද බොහෝ කලක් පඤ්චශීලය රක්‍ෂා කොට ඉන් මිය තවුතිසා භවනයෙහි ඉපැද එහි බොහෝ කලක් දිව්‍යසම්පත් විඳ ඉන් මිය අපරාපර්‍යායවේද්‍ය වූ කිසියම් අකුශලයෙකින් අහේතුක තිරශ්චීන ව උපන්මි. පෙර රක්‍ෂා කළ පඤ්ච ශීලයෙහි ආනුභාව යෙන් රන්වන් ව ලා රූපශ්‍රී ලදිමි" යි වදාරා, රජහු නො ගිවිස්නා හෙයින් මඟුල් පොකුණෙහි කිඩා කොට තුබූ සත්රුවන් රජගම දක්වා ගිවිස්වූසේක.

එ වේලෙහි ඒ දේශනාවෙහි පහන් වූ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සාධුකාර දී බරණැස් රාජ්‍යයෙන් පූජා කළහ. බෝසතානන් වහන්සේ ද රජහුගේ රාජ්‍යපූජාව ඉවසා කීප දවසක් වැස රජ්ජුරුවන් හා සියලු රාජ්‍යවාසීන් පන්සිල් ගන්වා අනුශාසනා කොට ආකාශයට පැන නැඟී නකත් තරුවක් සේ දිලිහි දිලිහී එම දණ්ඩ කිඹිරකණ්ඩ නම් පර්වතයට ම ගොස් බොහෝ කලක් සුවසෙන් වාසය කළසේක. මෙසේ අහේතුක ව ඉපැද පවා රජ්ජුරුවන්ගේ රාජ්‍ය පුදවා ගන්නා තරම් මහත් වූ පින්බල ඇති හෙයිනුත් මාගේ බුදුහු අභීත් නම් වන සේක.

2. තව ද කණ්ඩින ජාතකයෙහි තමන් වහන්සේ වෘක්‍ෂ දේවතා ව ඉපැද:

ධිරත්ථු කණ්ඩිනං සල්ලං–පුරිසං ගාළ්හවේධිනං,
ධිරත්ථු තං ජනපදං–යත්ථ'ත්ථී පරිණායිකා,
තෙ වාපි ධික්කිතා සත්තා–යෙ ඉත්ථීනං වසං ගතා–යි,

යන මේ ගාථාවෙන් ත්‍රිවිධ වූ ගර්හිත වස්තු නම් මේ යයි බණ වදාළ දා බොහෝ වන දෙවියන් විසින් කරණලද දිබ්බගන්ධ කුසුමා දීන් පූජා ලත්සේක.

3. තව ද කුක්කුර ජාතකයෙහි සුනඛ රාජන් ව ඉපැද ඥාත්‍යර්ථ චර්‍ය්‍යා පූර්ණය කළ සමයෙහි බොහෝ නැයන්ට රජකුලෙන් උපන් භය දැක ඒ රජ්ජුරුවන් කරා ගොස් රජපිරිස විස්මය පත් කරවා, රජහු පහදවා, රජහුගේ සිංහාසන නැඟී වැඩහිඳ සුනඛෝවාද නම් දේශනාවක් කොට සියලු සතුන් පන්සිල් ගන්වා රජහුගේ දළපුඩු සේසතින් පූජා ලදින් එ දවස් දෙසූ බණින් දමුනාවූ සත්ත්වයන් දසදහසක් හවුරුදු මුළුල්ලෙහි කරණලද අප්‍රමාණ වූ ප්‍රතිපත්ති පූජා ලත්සේක.

4. තව ද නන්දිවිශාල ජාතකයෙහි අජානීය වෘෂභ රාජත්ව ඉපැද ගැල්සියයක් එකවිට ඇද මසු දහසකින් පූජා ලත්සේක.

5. තව ද කණ්හ ජාතකයෙහි එසේ ම වෘෂභ රාජත්ව ඉපැද දුගී මෑණියන් පන්සියයක් ගැල් ගොඩ නංවා ඒ පෙළහැරෙහි ද කහාපණ සහස්‍රයෙකින් පූජා ලත්සේක.

6. තව ද වටු ව ඉපැද පවා මහ වල් දවාගෙණ තමන් වහන්සේ කරා දිවෙන ලැව්ගිනි දැක:

සන්ති පක්ඛා අපතනා-සන්ති පාදා අවඤ්චනා,
මාතා පිතා ච නික්ඛන්තා-ජාතවේද පටික්කම-යි.

යන මේ ගයින් සත්‍යක්‍රියා කොට සියාරා සොළොස් කිරියක් මානයෙහි ගිනි මැද්ද නො දී එ වේලෙහි රක්‍ෂා වූ විමන් ඇති ඒ වෙනෙහි දෙවියන් විසින් සන්තුෂ්ට ව කරණලද සාධුකාද සහස්‍රයෙන් පූජා ලත්සේක. එ දවස් නැවැති ගිනි කල්පාන්තය දක්වා එ තැනට මැද්ද නො දී පාරමිතාබල පෑ. බොහෝ දෙනා විසින් කරණලද සතුති පූජා ලත්සේක.

7. තව ද: බක ජාතකයෙහි වෘක්‍ෂදේවතාව ඉපැද භකීටක යක්හු විසින් ග්‍රීවාච්ඡේදයට පැමිණි බලාකයක්හු බලා:

නාච්චන්ත නිකතිප්පඤ්ඤො-නිකත්‍යා සුඛමෙධති,
ආරාධෙති නිකතිප්පඤ්ඤො-බකො කක්කටකාමිව-යි.

යන මේ ගාථාවෙන් බණ කියා කෛරාටික ඥානයෙහි ආදීනව දක්වූ දා ද වන දෙවියන් විසින් කරණලද සාධුකාද සහස්‍රයෙන් හා දිව්‍යගන්ධ පුෂ්පාදීන් අප්‍රමාණයකොට පූජා ලත්සේක.

8. තව ද: වේදබ්භ ජාතකයෙහි වේදබ්භ නම් මන්ත්‍රානුභාවයෙන් සත් රුවන් වැසි වස්වා ඒ සම්පත්තිය නිසා මරණ ප්‍රාප්ත වූ දස දහසක් පුරුෂයන් දැක උපන් සංවේගයෙන්:

අනුපායෙන යො අත්ථං-ඉච්ඡති සො විහඤ්ඤති,
චෙතා හනිංසු වෙදබ්භං-සබ්බෙ තෙ ව්‍යසනමජ්ඣගුං-ති.

යන මේ ගාථාවෙන් නුවණ නැති ව ධන ලෝභය කිරීමෙහි ආදීනව දක්වා බණ කී වේලෙහි ද මනුෂ්‍ය ව ඉපැද පවා වනදෙවියන් ලවා සාධුකාර දෙවා මහත් වූ සතුති පූජා ලත්සේක.

9. තව ද: මහාශීලව ජාතකයෙහි ශීලව නම් රජ ව දශ රාජ ධර්මයෙන් රාජ්‍යය කොට ක්‍ෂාන්ති පාරමිතාවෙහි අග පැමිණි සමයෙහි නිරපරාධ වූ තමන් වහන්සේගේ රාජ්‍යය උදුරා ගෙණ අමුසොහොනෙහි කට පමණ වළ බිඳුවා එහි ඉස් තලුවා වධ කරුවූ රජහට සම වූ මෛත්‍රී පතුරුවා ඒ ගුණයෙහි පහන් දෙවියන් විසින් දෙන ලද සවකීය රාජ්‍යසම්පත්තියෙන් පූජා ලත්සේක.

10. තව ද: ඛණ්ඩවනකාඛණ්ඩ ජාතකයෙහි දරිද්‍ර වූ කුලයෙක ඉපැද පමා පාරමිතාබලෙන් දෙවියන් විසින් දෙනලද චතුහස්තායාම වූ ඌරු ප්‍රමාණ සත රන් කඳෙකින් පූජා ලත්සේක.

11. තව ද: සොධම්ම ජාතකයෙහි වානරේන්ද්‍ර ව ඉපැද ඇත් සමාන බලපරාක්‍රම ඇති ව වෙනෙහි ඇවිදුයා කල රකුසු විල දුත කාරණා කාරණා දන්නා වූ නුවණින් රකුසු විල බව දැන දියෙහි නො ගැවී එ තෙර මෙ තෙර පැන පැන කැමැති පමණ මල් කඩා විල්තෙර හොබකල වේලෙහි ඒ වික්‍රමයෙහි පැහැද දිය පළා පැන නැගී බද්ධාඤ්ජලි ව සිටි උදක රාක්‍ෂසයා විසින්:

යස්ස එතෙ තයො ධම්මා-වානරින්ද යථා තව,
දක්ඛියං සූරියං පඤ්ඤා-දිට්ඨං සො අභිභොතාති-සි

යන මේ ගයින් කරණලද සතුති පූජා හා, වන දෙවියන් විසින් කරණලද සාධුකාර පූජා හා අසූදහසක් වඳුරන් විසින් කරණලද රාජ්‍ය පූජා ලත්සේක.

12. තව ද: සීලවනාග ජාතකයෙහි ඇත්රජ ව ඉපැද අසූ දහසක් ඇතුන් හා හස්තිරාජ්‍ය ය හැර එකලාව වනමැද වැස තපස් කොට තමන් කරා අවුදින් දළ ඉල්වූ දිළිඳක්හට "මුරයෙන් මුරයෙහි දුඃඛිතයෙමි" යි ආ ආ සේ ම මහත් වූ කරුණා ඇති ව තුන් වාරයෙක්හි ම දළ කප කපා දී දානපාරමිතාවෙහි මුදුන් පැමිණ වන දෙවියන් ලවා සාධුකාර දෙවා මහත් වූ පූජා ලත්සේක.

13. තව ද: සච්චං කිර ජාතකයෙහි ගඞ්ගාවක් සමීපයෙහි පන්සලෙක සීලරක්‍ෂණයෙන් වාසය කරන්නාහු දියෙන් යන දුෂ්ට වූ රාජ කුමාරයකු හා සපයෙක, ගිරවෙක, මූෂිකයෙකැයි යන මොවුන් සතරදෙනා ගොඩනගා මෛත්‍රී කොට පසු ව රාජ කුමාරයා රාජ්‍යයට පැමිණ තමන් වහන්සේට වධ යොදා උල අන්නා සේ නියොග කළ කල්හි:

සච්චං කිරෙවමාහංසු-නරා එකච්චියා ඉධ,
කට්ඨං විප්ලාවිතං සෙය්‍යො-නත්වෙවෙකච්චියො නරො-ති.

යන මේ ගාථාව කියා එහි අපි දත් රජ යුවරජ මහ ඇමැතියන් විසින් දුෂ්ට රජහු මරා තමන් ඔටුනු පලඳවා කරණලද අභිෂෙක මඞ්ගලයෙන් පූජා ලත්සේක. ජීවිතදානය ලත් නාගරාජයා සතළිස් කෙළක් ධනයෙන් පූජා කෙළේ ය. මූෂිකයා තිස් කෙළක් ධනයෙන් පූජා කෙළේය. ගිරවා නම් ශකටි පමණ සුගන්ධශාලි භොජනයෙන් පූජා කෙළේය.

14. තව ද අම්බ ජාතකයෙහි පන්සියයක් අතවැසියන් හා සමග වෙසෙහි තපස් කොට මෛත්‍රී බලයෙන් තිරිසනුන් පවා පහදවා සියලු හිමාල ය වෙසෙහි සිවුපාවුන් හා පක්ෂීන් හා තමන් තමන්ගේ බලානුරූප වූ පරිද්දෙන් දවස් පතා ගෙණෙනලද දෙසිය පණස් ගැල් පමණ ඇති ඵලා ඵල දානයෙන් බොහෝ කලක් උපස්ථාන ලත්සේක.

15 තව ද කාක ජාතකයෙහි අසූ දහසක් කපුටුවන්ට රජ ව "බොහෝ කපුටුවන් මරා තෙල් ගන්නේ ය" යි බරණැස් රජහුගෙන් නියෝග වූ සමයෙහි තැනන්ට උපන් භය දුක ආකාශ යෙන් ගොස් රජපිරිස් බල බලා සිටියදී, කිසි භයක් නැති ව සිංහාසන මස්තකයෙහි වැඩ හිද "දේවයෙනි! මක්නිසා කපුටුවන් මරවු දැ" යි විචාර තෙල් නිසා යයි කී කල "දේවයෙනි! කපුටුවන් ඇග තෙල් නැතැ" යි කී කල්හි තෙල් නැතිවන්නට කාරණා කිම් දැයි විචාළ කල:

නිච්චං උබ්බිග්ගහදයා- සබ්බලොක විහිංසකා
තස්මා තෙසං වසා නත්ථි-කාකානාසමාක ඤාතිනං-ති.

යන මේ ගාථාවෙන් බණ කියා මේ මේ කාරණයෙන් කපුටුවන් ඇග තෙල් නැති නියා ය යි ගිවිස්වා රජපිරිස් සන්තොෂ කරවූ සේක. ප්‍රසන්න වූ රජ්ජුරුවෝ බෝසතුන්ට සියලු රාජ්‍ය ය පුදා අපාද විපැදදි සියලු සතුන්ට ද අභයදාන පූජා කොට එ තැන් පටන් අමුණක් සහලින් දවස් පතා කාකපිණ්ඩ නම් දානපරත්‍යාගයක් කොට දිවි හිමියෙන් පඤ්චශීල ය රක්ෂා කොට මහත් වූ බහුමාන පූජා කළහ.

16. තව ද: [1]ගඟගර ජාතකයෙහි මිණිවෙළඳ කුලයෙහි ඉපැද සොළොස් හැවිරිදි ව අනන්තර මාර්ගයෙහි ශාලාවකට පැමිණි දා ඒ ශාලාවෙහි වැස යමකු කිවිසපු කල ජීව පටිජීවකයන් තබා

1. ගගග ජාතකයෙහි.

අජීව අපටිජීවකයන් සල්ව සල්වා කා බොහෝ පවු රැස් කරන් නා වූ කකීශ වූ කෂායාව නො එක් ප්‍රකාරයෙන් බණ කියා ඔහු දමා ඔහු විසින් දිවිහිමියෙන් කරණලද අත් පා මෙහෙ පූජා හා එ බැවි. දත් බඹදත් රජහු එම දවස් දෙකලද සේනාධිපති ධුරයෙන් පූජා ලත් සේක.

17. තව ද අලීනචිත්ත ජාතකයෙහි බරණැස බ්‍රහ්මදත්ත රජහට පුත්‍ර ව අලීනචිත්ත නම් කුමාර ව මවුකුසින් බිහි වූ දා ම උපත් පිණිස් ඒ සා මහත් සතුරු සෙනඟක් සාධා උපන් දවස් ම ජයමඟුල් පූජාය අභිෂෙක මඟුල් පූජා යයි මෙසා පූජා දෙකක් ලත්සේක.

18. තව ද: තිරීට වච්ඡ ජාතකයෙහි තිරීට වච්ඡ නම් තාපස ව බරණැස් රජහු දිවි පමණින් කරණලද චතුර්විධ ප්‍රත්‍යය දානයෙන් පූජ ලත්සේක.

19. තව ද: චුල්ල කාලිඞ්ග ජාතකයෙහි සැපත් හැර වල් ගොස් තපස් කොට ශීලානුභාවයෙන් ශක්‍රදෙවෙන්ද්‍රයා ගෙන්වා ප්‍රසන්න වූ ඒ සක්දෙවු රජහු විසින් දවස් පතා කරණලද සප්පාය වූ අත් පා මෙහෙ පූජා ලත්සේක.

20. තව ද: ඒකරාජ ජාතකයෙහි බරණැස් රජ ව දශ රාජ ධර්මයෙන් රාජ්‍යය කොට මෛත්‍රී පාරමිතා නමැති මහ ලිය මල් ගන්වාපු සමයෙහි තමන් වහන්සේගේ මෛත්‍රීබල දත් දබ්බසේන රජහු අවුදින් රාජ්‍යය උදුරා ගෙණ, නිරපරාධ වූ තමන් දෙ කකුල බැඳ අධඃශීර්ෂ කොට [1]උත්තර.මමාරාමබරයෙහි බැඳ එල්ලාපු දා ඒ වධ කැර වූ රජු හා සියලු සතුන්ට ම සම මෙත් භාවනා කොට ධ්‍යාන උපදවා බැඳුම් සිඳුවා ආකාශයෙහි පලක් බැඳ වැඩහිඳ ඒ පෙලහර දුටු සතුරු වූ රජු හා, මිතුරු වූ ඇමැතියන් හා වතුරු ගේ කරණලද අතුරු නැති සාධුකාර පූජා ය, ඔල්වරසන් පූජා ය, අසුරුසන් පූජාය, පිළිසන් පූජාය, ලොමොද්ගමන පූජා ය, දොහොත් මුදුන් දී කරණලද නමස්කාර පූජා ය, ස්වකීය රාජ්‍ය ප්‍රතිලාභයෙන් කරණලද පූජා ය, අභිෂෙක මඟුල් පූජා යයි යනාදි වූ අප්‍රමාණ පූජා ලත්සේක.

21. තව ද: දද්දර ජාතකයෙහි හිමාලය වෙනෙහි දද්දර නම් පර්වත ප්‍රාන්තයෙහි දද්දර නම් නාගභවනයෙහි දද්දර නම් නාග රාජයාව පුත්‍ර ව මහා දද්දර නම් නාගකුමාර ව තමන් මලනුවන්

1. උත්තරාම්බරයෙහි.

චුල්ලදද්දරයන් හා සමග පිය රජහු අතින් උදහස් අසා දඬුවම් නිසා ගොස් බරණැස් නුවර මිනීකුණු හා මලමූත්‍ර වහනය කරන්නාවූ උක්කාර භූමියෙහි තුන් අවුරුද්දක් වැස ඒ නිහතමානභාවයෙහි ප්‍රසන්න වූ පිය රජහු විසින් කරණලද දිව්‍යනාගරාජ්‍යයෙන් පූජා ලත්සේක.

22. තව ද: සීලවීමංස ජාතකයෙහි සත් හැවිරිදි බ්‍රාහ්මණ කුමාරව පන්සියයක් අතවැස්සන් හා සමග දිසාපාමොක් ආචාරීන් කෙරෙහි ශිල්ප උගන්නා කල දවසෙක ආචාරි "මෙසින් ගුණවත් එකක්හට ම දුව සරණ දෙමි" යි සිතා අතවැස්සන් තනි තනි ව කැඳවා "සකපි මාගේ දියණියන් කැමැත්තා නම් තොප තොපගේ නෑයන් සාරා ගොස් කෑමත් නො පෙණී පලඳනාවක් ගෙණෙව" යි කී කල පන්සියයක් අතවැස්සෝ තමන් තමන් කුලයව ගොස් පන්සියයක් පලඳනා සොරා ගෙණවුත් ආචාරීන්ට පාවා දුන්හ. පසු ව බොධිසත්වයන් කැඳවා "මාගේ දියණියන් ප්‍රාර්ථනා කොට සෙසු අතවැස්සෝ සොරකම් කොට ගෙණෙති, පුත තෙපිත් යමක් සොරා නො ගෙණෙවු දෑ" යි විචාළහ. එ වේලෙහි බොධිසත්වයෝ "ආචාරීනි වහන්ස! අනුන් නො දක්වා සොරකම් කළ නො හැක්ක මිනිසුන් නුදුටුව ත් දෙවියෝ දකිති. දිවැස් ඇතියෝ දකිති. එසේ හෙයින් මේ ලොකයෙහි රහසෙක් නම් නැතැ" යි කියන්නාහු:

නත්ථි ලොකෙ රහො නාම-පාපකම්මං පකුබ්බතො,
පස්සන්ති වන භූතානි-තං බාලො මඤ්ඤතී රහො-සි.

යනාදීන් බණ කී දැ ය. එ වේලෙහි ඒ ගුණයෙහි ප්‍රසන්න වූ දිසාපාමොක් ආචාරීන් කුලධනය සහිත වූ දියණියන් සරණ පාවා දී විවාහ මඞ්ගලයෙන් පූජා කළහ.

23. තව ද: මංස ජාතකයෙහි සිටුපුත්‍ර ව ඉපැද සිඟලු සතුන්ව ප්‍රිය තෙපුල් කීම ම උතුම් නියාවට දෘෂ්ටාන්ත දක්වා වදාළ සමයෙහි කාරණා කාරණ නො දන්නා රෞද්‍ර වූ මැදි පුත්‍රයා ලවා:

යස්ස ගාමෙ සඛා නත්ථි-යථාරඤ්ඤං තථෙව තං,
සබ්බස්ස සදිසී වාචා-සබ්බං සමම දදාමි තෙ-සි.

යන ගයින් ස්තුති කරවා සහළුව යි කී බසට ප්‍රිය වූ ඒ වැද්දහු විසින් දෙනලද ඒ සා මහත් මාංස සකටයකින් පූජා ලත්සේක.

24. තව ද: විසය්හ ජාතකයෙහි විසය්හ නම් ධන සිටු ව දාන පාරමිතාවගේ බලයෙන් සක්දෙව්රජහු පහදවා ඔහු විසින් "දවස දවස දෙලොස් ලක්ෂයක් ධන පරිත්‍යාගයෙන් දිව්හිමියෙන් දානප්‍රවාහ කරව" යි මවා දෙනලද දිව්‍යධන සමූහයකින් පූජා ලත්සේක.

25. තව ද: උරග ජාතකයෙහි සෑෂි බ්‍රාහ්මණ ව උපන් කා වූ මාගේ බොධිසත්ත්වයෝ අනිත් ලකුණු දෙශනාවෙන් ශක්‍ර දෙවේන්ද්‍රයා පහදවා එදවස් ද ඔහු විසින් ම, ගේ පුරා මවා දෙන ලද දිව්‍ය ධන සමූහයකින් පූජා ලත්සේක.

26. තව ද: සත ජාතකයෙහි සත නම් රජ ව බරණැස දශ රාජ ධර්මයන් පෑරුම් පුරන්නා වූ බොධිසත්ත්වයෝ තමන් ප්‍රාණයක් නො නසති යි අසා සැමැත් කුවර මංත නම් රජහු අවුදින් අවබත වූ තමන්ගේ රාජ්‍යය උදුරා ගෙණ තමන් භාරපය මසා, සිරගෙයි ලවා, සිසාරා ගෙයාධයන් රකමිල සිටුවා, මහා ව්‍යසන ප්‍රාප්ත කල ද රාජ්‍යය උදුරාගත් රජහු කෙරෙහි ද, සියලු සතුන් කෙරෙහි ද; සම ව කලා වූ මෛත්‍රී භාවනා බලයෙන් ධ්‍යාන උපදවා එ කෙණෙහි යදම් පුපුරවා පලය පලා ආකාශයට පැන නැගී පලක් බැඳ වැඩ උන්සේක එ කෙණෙහි සතුරු රජ බෝසතුන්ගේ මෛත්‍රී පිරුණා වූ ශ්‍රී මුඛය හා පෙරහැර දුන ගයගෙණ වෙවුලා සවකීය රාජ්‍යයෙන් ම පූජා කොට ගියේ ය.

27 තව ද: නන්දිමිග ජාතකයෙහි නන්දිය නම් මුවරජ ව මාතු පිතුපට්ඨාන ධර්මය පූර්ණය කරන්නා වූ මේ මාගේ බොධිසත්ත්ව යෝ බරණැස් රජහු තමන් ඇතුළු වූ දහස් ගණන් මුවන් උයනට ගෙන්වා ගෙණ බලා "රජමුවා මා අනින් ම මිදිම" යි කියා උරපුරා තමින් භාරා ශරය ඇදගත් වේලෙහි මරණ භය නැති ව පාරමිතාවන් ආවර්ජනා කොට "අද මාගේ ඇඟමස් දානමුඛයට ම වෙව යි; රජහට පවු නො වේව යි; ඔම ද දුන් මස්රස දුන්නා සේ ම ඔතු සියලු සතුන්ට දහම් රස දෙම්ව" යි සිත සිතා වැඩ සිටිසේක. බෝසතුන්ගේ මෛත්‍රී ආනුභාවයෙන් රජහු හයා ගත් ශරය අතිනුත් නො හැරේ ම ය. රජ ද සිතියම ඇඳපු රුවක් සේ නිශ්චල ව සිටියේ ම ය බොධිසත්ත්වයෝ 'සිට[1] වෙහෙසි පි ය; මහරජ! ශරය අතහැරපියව' යි කී ද ය.

රජ්ජුරුවෝ: මහනානෙනි! ජොප වැනි පින්වත් මුවරජක්හු මරාපියන්ට මා අත නො නැගෙ" යි කියා ධනුව හා ශරය බිම හෙළා නමස්කාර කොට සිට "ස්වාමිනි! නොපට අභය දානය පූජා

1. මෙහෙසිපියා

කෙරෙමි; වල්යම" යි කීහ. එ වේලෙහි බෝධිසත්ත්වයෝ: "දේවයන්! මාගේ ජීවිතය පමණක් ගලවාගෙණ වලව් යාම මා වැනියන්ට සුදුසු නො වෙයි; මා කෙරෙහි ප්‍රේම ඇතිනා නම් මාගේ සෙසු නෑයන්ට ත් අභයදානය දෙව" යි කී සේක. එ වේලෙහි රජ්ජුරුවෝ බෝසතුන් කෙරෙහි උපන් සන්තොෂයෙන් 'තුඹ වහන්සේගේ නෑයන් තබා අද පටන් මාගේ ජීවිතාන්තය දක්වා මාගේ අණසක පවත්නා වූ මානයෙහි යම් ම තෙනක සියලු තිරිසනුන්ට ද අභයදානය දීනිමි, අද පටන් මම ද ප්‍රාණයක් නො නසමි" යි ප්‍රතිඥා කළහ. එ වේලෙහි බෝධිසත්ත්වයෝ රජහු පන්සිල් ගන්වා:-

දානං සීලං පරිච්චාගං-අජ්ජවං මද්දවං තපං,
අක්කොධං අවිහිංසා ච ඛන්ති ච අවිරොධනං
ඉච්චෙත කුසලෙ ධම්මෙ-ඨිතෙ පස්සාමි අත්තනි,
තතො තෙ ජායතෙ පීති-සොමනස්සඤ්චනප්පකං-යි.

යනාදීන් රජහු දශ රාජධර්මය උගන්වා සියලු සතුන් විසින් කරණලද නමස්කාර සාධුනාද පූජා සහස්‍රයන් ලදින් වන ප්‍රවිෂ්ට වූසේක. මෙසේ තිරිසන් ව ඉපැද පවා රජුන්ට බණ වදාරා සියලු සතුන්ගේ අභයදාන පූජා ලබන පින්බල ඇති හෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වන සේක.

28. නව ද: මහාකපි ජාතකයෙහි කපිරාජ ව උපන්නා වූ මාගේ බෝධිසත්ත්වයෝ අසූ දහසක් වඳුරන් පිරිවරා ගංගාවක් සමීප යෙහිවූ මහ මී අඹ ගසෙක වාසය කරණ සේක. එ කල බරණැස් රජ්ජුරුවෝ ගඞ්ගා ජලයෙන් ගිය අඹ-ඵලයක් දැක අඹ රසැහි තෘෂ්ණා බැඳ නැව් නැගී ගංගාව ඔස්සේ ගොසින් සවස මී අඹ ගස දැක ගස සිසාරා දහස් ගණන් දුනුවායන් සිටුවා තුමූ අඹ ගසමුල යහන් අතුරුවා ලැගුම් ගෙණ "උදැසනක් සේ වඳුරන් හැම මරව" යි නියොග කළහ. එ දවස් බෝධිසත්ත්වයෝ මේ භය දැක: 'මා මැනි වීරපුරුෂයක්හුගේ නෑයන් නස්නා සේ නො යෙදෙයි; අද ඥාත්‍යව වශීභාවෙහි මුදුන් පැමිණෙමි" යි සිතා අසූදහසක් වඳුරන් "භය නො කරව" යි අශ්වසාලා අඹ අත්තෙන් ධනුඃශත ප්‍රමාණවූ පලල් ගඟ එතෙර හිත්තිනව පැන පියා පිනූ සලකුණෙන් ගඟ පලල දැනගෙණ වැලක් කඩා ඉඟ බැඳගත. වැල්පිල තිසා මදක් ලුහුඬු වන නියාව අහේතුක ඥාන නෙතින් සිතා ගත නො හී නැවත මාතවජ්ජාන වලාපිඩක් සේ අඹගසට පැන වැල්පිල මදක් ලුහුඬු ව

ගිය හෙයින් දැතින් අඹ අත්ත අල්වා ගෙණ පසුබඳ මැල්පිලට දීලා තමන් වහන්සේ මතු සංසාර නමැති සාගරයට සේතුවක නියාවට සරඹයක් කරන්නා සේ පසු බඳ සේතුවක් කොට පෑලා අසූ දහසක් වඳුරන් කැඳවා "නෑයෙනි! වැල මදක් ලුහුඹු ව ගියේ ය; දෙවනු ව එ තෙර පැන මැලක් දික් කොට ගණිම් නම් එ තෙකට පහන් වෙයි; පහන් වී නම් තොප හැම දෙනාගේ ජීවිත නැත. තොප හැම දෙනාට මාගේ ජීවිතය දන් දිනිමි. මා ගැණ නො සිතා මා සෙයක් කොට ගොස් තොප තොපගේ ජීවිත රක්ෂා කොට ගණුව" යි නියොග කල දැ ය.

එ වේලෙහි අසූදහසක් වඳුරෝ බෝසතුන් පිට සෙමින් සෙමින් එලි එලී අත්වැලට නැගී හැම ගැලවී ගියහ. දෙව්දත් ඒ ජාතියෙහි වඳුරු ව ඉපැද පෙර නසම් යි කල පැතුම් බලයෙන් මොහු කවර දවසෙක නසා පියම් දෝ හෝ යි අවසරයක් බල බලා හුන්නේ එ වක සේවක ව වසතුගේ හැම වඳුරන් පලා ගත තුරු මුදුන් අත්තෙහි ඇලී හිඳ අනතුරෙහි බෝසතුන් පිටට පැන දෙපසිනු මැඩ වසට බිඳගෙණ දිව පි ය. බොධිසත්ත්වයෝ ඒ සා මහත් දුඃඛයක් ඉවසා ගෙණ ක්‍රොධයක් නො කොට දෙවනු ව පැනපිය නො හැකි හෙයින් අඹ අත්ත අතින් අල්වා ගෙණ පහන් කල දැ ය.

අලුයම් රාත්‍රියෙහි ගස උඩ බලා එක වඳුරකුත් ගස උඩ නැති නියාව ත්, එ තෙරින් මෙ තෙර අත්වැල තුබූ නියාව ත්, හිඟ බැඳි වැල හා සමඟ අඹ අත්ත දැතින් ගෙණ බෝසතුන් වැද හොත් නියාව ත් රජ්ජුරුවෝ දැක ඉතා මහත් විස්මය ව යොධයන් ගස උඩට නංවා බෝසතුන් සෙමෙන් සෙමෙන් බාවා හිඟ බැඳි වැල මුදා වසට බුන් සේ දැක, ඉතා මහත් වූ කම්පා ඇති ව ගීග දිය කඩලා ශතපාක සහස්‍රපාක තෙල් ගල්වා තෙලි සමකින් යහනෙහි සතපා දෙහොත් මුදුන් දී සිට "ස්වාමීනි! තෙපි කෙසේ වූ වීරපුරුෂයාන කෙණෙක් ද, මේ කෙබඳු වූ පෙරහරෙක් ද; තිරිසනුන් තබා මනුෂ්‍යයන් කෙරෙහි ත් තමන් දිවි දී අනුන් දිවි රක්නා කෙණෙක් නැත. නුඹ වහන්සේ මේ කෙලේ කිමෙක් දැ"යි විචාලහ. එ වේලෙහි බෝසතානෝ මරණ වේදනාව ඉවස ඉවසා මහරජ්ජුරුවන් හා සමඟ කථා කරණ සේක්:

රාජා'හං ඉස්සරො තෙසං-යූථස්ස පරිහාරකො,
තෙසං සොකපරෙතානං-භීතානං තෙ අරින්දම-යි.

යනාදීන් බණ කියා තමන් වහන්සේ රජ නියාව ත්, තමා දිවිදී ත් ආශ්‍රිතයන් රක්‍ෂා කිරීම රාජධර්ම නියාවත් යනාදීන් රජ්ජුරුවන්ට බණ කිය කියා ම නිරුද්ධ වූසේක. එ වේලෙහි බෝසතුන්ගේ ගුණයෙහි පහන්වූ රජ්ජුරුවෝ මහත්වූ ශොකයෙන් වැලප බෝසතුන් රන් දෙණකට වඩා දරුශත ප්‍රමාණ දරසෑයක් බඳවා, නොයෙක් රජ පෙළහරින් ආදහනය සරහා නොඑක් ඇමතියන් හා සමග තුමූ කසා පිළි හැඳ පෙරව සිසාරා දඹුවැට පහන් ගන්වා තුන්යම රාත්‍රිය මුළුල්ලෙහි සිට බෝසතුන් මහත් වූ පූජාවෙන් දවා, තුන්වන දා ආදහන පූජා කොට එ තෙන චෛත්‍යයක් බඳවා ගඳ මල් දුමින් පුදා සතරවන දා බෝසතුන්ගේ සිස කපාලය රන් කරඬුවකින් ගෙණ බරණැස් නුවර ගෙණ ගොස් සත් දවසක් මුළුල්ලෙහි දන්තධාතුව ලද ශක්‍රදෙවෙන්ද්‍රයා සේ මහත් වූ පූජා කොට බරණැස් නුවර මැද සීසකපාල නම මහසෑයක් බඳවා එහි වඩා, දිවි පමණින් මහත් වූ පූජා කළහ.

පසු ව උපන් නොයෙක් රජදරුවෝ ද මෙපවත් ශ්‍රැත පරම්පරාවෙන් අසා පැහැද කමින් තමන්ගේ ධන පමණින් දීර්ඝකාලයක් ඔබ උද්දෙසා ම පූජා කළහ. මෙසේ මාගේ ස්වාමිදරුවානන් තිරිසන් ව ඉපැද පවා ශරීර ධාතුවට පූජා ලත් කල දූන් ලොව්තුරා බුදු ව මුළුලෝ නිවන් රසයෙන් තෙත් කොට ඉතා මහත් වූ බුද්ධශ්‍රී දක්වා තමන් වහන්සේගේ පා පිසපු කිලේස පවා මහ බඹුන්ට මුදුන්මල්කඩ කොටපු සම්යෙහි පිරිනිවන් පෑ තැන ධාතු ගෙණ දූන් දෙවියන් බඹුන් මිනිසුන් තම තමන්ගේ ධන පමණින් පුදන නියාව කවර ආශ්චර්ය්‍යයෙකැයි කියම් ද, මේ මේ කාරණයෙනු දු මාගේ ස්වාමිදරුවානෝ අර්හත් නම් වන සේක.

29. තව ද: මහා සුව ජාතකයෙහි ගිරා රජ ව ඉපැද, දිඹුල් ගසෙක වාසය කොට පවතනා ඵලක නම් වූ තපස් කොට, ඒ දිඹුල් ගස ම ගොදුරුගම් කොට සිතා යථාලාභ සන්තොෂයෙන් වාසය කොට පසු ව දිඹුල්ගස මිය දිරා සුණු වැගිරෙණ අවස්ථාවෙහි ද, අනික් තැනකට නො ගොසින් මළ ගස සුණු අනුභව කොට මතු කරණ දුෂ්කර ක්‍රියාවට අභ්‍යාස කරන්නාක් සේ කෘතොපකාරයෙහි යෙදී බොහෝ දවසක් වාසය කරණ සේක. ඒ ගුණයෙහි පහන් ශක්‍ර දෙවෙන්ද්‍රයා ඒ ගස ජීවමාන කොට මීවා ඉදුම ඵලයෙන් පූජා කොට ගියේ ය.

30. තව ද: චුල්ල සුව ජාතකයෙහි ද එයේ ම මාංසය කොට ශක්‍රයා විසින් මවා දෙනලද ඵල සහිත වූ උදුම්බරා වෘක්ෂයෙකින් ම පූජා ලත් සේක.

තව ද: කුද්දල සමාගමයෙහි ද, හත්ථිපාල සමාගමයෙහි ද, අයෝඝර සමාගමයෙහි ද, ජෝතිපාල සමාගමයෙහි ද, මූගපක්ඛ සමාගමයෙහි ද යන මේ පස්වූ සමාගමයෙහි තමන් වහන්සේගේ දේශනා බලයෙන් සියලු සතුන් දමා රාජ්‍යය සිය් කරමින් මහ පිරිස් ගෙණ තාපසව වල ගොස් සක්දෙවු රජහු විසින් මවා දෙනලද දොළොස් යොදුන් තිස් යොදුන් පමණ කොත දිව්‍යමය වූ පන්සැල් හා දිව්‍යමය වූ රාත්‍රිස්ථාන දිවාස්ථාන චංක්‍රමණ හා දිව්‍යමය වූ මණ්ඩප පැන් පොකුණු හා දිව්‍යමය වූ තවුස් පිරිකර සහිත වූ ඒ සා මහත් වූ සෙනාසන දානයෙකින් පූජා ලත් සේක.

31. තව ද: සුප්පාරක ජාතකයෙහි සුප්පාරක නම් පණ්ඩිත ව නැව් නැගී ගොස් වලභාමුඛ සමුද්‍රයට පැමිණ නැව නස්නට පටන් ගත් වේලෙහි කළා වූ සත්‍යක්‍රියා බලයෙන් ආපස්සේ දිවූ නැව් ඇසිල්ලෙකින් පටුන් වැද ගෙසින් අට ඉස්බක් තැන් දිව තමන් වහන්සේගේ දොර මිදුලෙහි සිටගත් වේලෙහි එ දවස් දිවි ලදින් සන්තොෂ වූ සත් සියයක් වෙළඳුන් එකවිට දෙනොත් මුදුනෙහි තබා ගෙණ කළා වූ සත් සියයක් සාධුනාද පූජා ලත් සේක.

32. තව ද: මහා කණ්හ ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර ව ඉපැද ලොකාර්ථ චර්‍ය්‍යාව කළා වූ මාගේ බොධිසත්වයෝ කාශ්‍යප සර්‍වඥයන් වහන්සේගේ ශාසනය විසි දහසක් හවුරුදු පැවත නස්නට පවත්ගත් අවධියෙහි බොහෝ සතුන් අපා ගත වන සේ දුක උපන් මහා කරුණාවෙන් මිනිස්ලෝ වැඩ ශුනක වෙෂයෙන් තුන්ලෝ වෙවුල්වා සියලු සතුන් භය ගන්වා "මෙ තැන් පටන් බුදුන් කී පිළිවෙත් වරදවා පාපයක් කළ කෙනෙක් ඇත්නම් මේ ශුනකයා ලවා කවා මරවමි"යි බොහෝ දෙනා භයගන්වා අවවාද දී සියලු සතුන් දහම් ගන්වා වැඩිසේක එ තැන් පටන් මනුෂ්‍යයෝ බෝසතුන් කෙරෙහි භය ඇති ම ගුණ රක්ෂා කරන්නාහු නටුවා වූ ශාසනයෙහි දහසක් හවුරුදු මුළුල්ලෙහි සසුන් පවත්වා ප්‍රතිපත්ති පූජා කළහ.

33. තව ද: කාලිඞ්ග බොධි ජාතකයෙහි තමන් වහන්සේ බුදු වන්නාවූ බොධිමණ්ඩලය පමණක් දුට ප්‍රසන්න වූ කාලිඞ්ග

චක්‍රවර්ති රජහු විසින් එ තෙනට බොහෝ උපචාර කරවා දවස් පතා කරණලද සැටදහස් සුවඳමල් සඞ්ඛ්‍යාවෙන් අපමණ වූ පූජා ලත්සේක.

34. තව ද: රුරුමිග ජාතකයෙහි රුරු නම් මුවරජ වූ මේ මාගේ බොධිසත්ත්වයෝ බරණැස් රජහුගේ සිංහාසනය නැගී වැඩහිඳ, එ දවස් දෙසූ ධර්මදෙශනා බලයෙන් රජහු ලවා සියලු රාජ්‍යය පුදවා ගෙණ, සියලු සතුන්ට ද අභය දානය ඉල්වා ගෙණ, මහත් වූ වික්‍රමයෙන් නොඑක් පූජා ලත් සේක.

35. තව ද: සරභ මිග ජාතකයෙහි සරභ නම් මුවරජ ව තමන් වහන්සේ මරමි සී ලුහුබඳවා පසු පස්සේ දිවන බරණැස් රජහු සැට රියන් ගැඹුරු නරාවළෙක්හි දිය බී මියයන්නා දැක ඔහු කෙරෙහි උපන් මහා කරුණා ඇති ව "දැන් මේ වළ හුනු රජහු නො නගා ගියෙම් නම් මතු සසර වළ හුනුවන් කෙසේ ගොඩ නගම් දැ" යි සිතා ආ පස්සෙහි එ තෙනට අවුත් ඒ වළ හුනු රජහු ගොඩ නගා දිවි ගැලවූ සේක. ඒ කාරණයෙහි පහන් බරණැස් රජ්ජුරුවෝ ද බෝසතුන්ට තමන්ගේ රාජ්‍යය පුදා, සියලු සතුන්ගේ ජීවිතදානය පුදා, දිවිපමණින් පඤ්චශීලය රක්ෂා කොට බෝසතුන් නමට ම ප්‍රතිපත්ති පූජා කළහ.

36. තව ද: සිවි ජාතකයෙහි සිවි නම් මහ රජ ව ඇස් ඉල්වා ආ අන්ධ බ්‍රාහ්මණයාට ඇස් දන් දී අඞ්ග පරිත්‍යාගයෙහි මුදුන් පැමිණ නැවත එ ම ජාතියෙහි ම පාරමිතා නමැති සෑශිහු විසින් මවා දෙනලද සියක් යොදුන් දක්නා දිවැස් සඟලෙකින් පූජා ලත්සේක.

37. තව ද: රොහණ මිග ජාතකයෙහි රොහණ මුව රජ ව මාගේ බොධිසත්ත්වයන් කසුන් කඳක් බඳු වූ රූපලීලා ඇති සමයෙහි තමන් වහන්සේගේ ඇඟින් රන්වන් වූ ලොම් මිටක් පමණ ලැබ ගත්තා වූ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කෙශධාතු ලද සක්දෙව් රජහු සේ ඉතා සන්තුෂ්ට වූවාහු රන්සුමුගකට වඩා දීර්ඝ කාලයක් භෝග පමණින් පූජා කළහ.

38. තව ද: ඡද්දන්ත ජාතකයෙහි ඡද්දන්ත නම් මහා හස්ති රාජන් ව රිදී පර්වතයක් සේ දිලියෙන එක්සිය විසි රියන් ශරීරයෙකින් හා සවණක් රස් විහිදුවන තිස් රියන් දළ සඟලෙකින් හා, ශ්‍රීමත් වූ සමයෙහි දළ සොයා ගිය වැද්දහුට දළ දෙක කපා දන් දී දාන පරමාර්ථ පාරමිතාවෙහි මුදුන් පැමිණ එම වේලෙහි ම කාලක්‍රියා

කොට එ දවස් අට දහසක් ඇතුන් විසින් හා පන්සියයක් පසේ බුදුන් විසින් හා තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි සිහාරා සිට කරණලද මහත් වූ ආදෘනන පූජා ලත් සේක.

39.+ තව ද: කුශ ජාතකයෙහි කුස නම් රජ ව ප්‍රභාවතීන් නිසා ගොස් නුවර පිරිවරා ගත් ඒ සා මහත් සත් සෙනගක් දුටු "අහං කුසො" යි කී එක බසින් මිහිකාද ය අසා පැරදී පලා ගිය මිර සෙනග සේ ඒ මහීපාල කාද ය අසා සත් සෙනග ම පැරද පලා ගිය වේලෙහි, ඒ වික්‍රමයෙහි ප්‍රසන්න වූ සක්‍රදෙවෙන්ද්‍රා විසින් ග්‍රීවාභරණ කොට පලඳවනලද අෂ්ටම්ඛන වූ දිව්‍යමය මාණික්‍ය රත්නයෙකින් පූජා ලත් සේක.

40. තව ද: මහා ජනක ජාතකයෙහි මහා ජනක නම් රාජකුමාරව වීර්‍ය්‍යපාරමිතාවෙහි මුදුන් පැමිණියා වූ මේ මාගේ බෝධිසත්වයෝ රජය සතුරන් ගත් හෙයින් "පළමු ව ධන උපදවා, දෙවනු ව පිරිස් සිවුවා, තුන් වනු ව යුද්ධ කොට සතර වනු ව රාජ්‍යය ගණිමි" යි සිතා නැව් නැඟී ගොස් මුහුදු මැද නැව නට කල, තව ද වීර්‍ය්‍යයෙහි පසු නො බැස ඉන්ද්‍රනීල භූමියෙක කසුන් කදක් පෙරලෙන්නා සේ සත් දවසක් මුහුදු පීනා තමන්ගේ වීර්‍ය්‍යබල දුටු මණිමෙඛලා නම් දෙව්දුව එ කෙණෙහි ම දිව අවුදින් තමන් වඩා උරමඬලෙහි සතපා දිමපසස් පතුරුවා විඩා සන්සිඳුවා ප්‍රිය පුත්‍රයකු සේ නිදිගන්වා එ ම දවස් ගෙණ ගොස් සවකීය රාජ්‍යයෙහි පිහිටුවා මෙසේ ඈ විසින් කරණලද ජීවිත දාන පූජා ය, රාජ්‍ය ප්‍රතිලාභ පූජා ය යි මහත් වූ සත්කාර පූජා ලත් සේක.

41. තව ද: මහා සුතසෝම ජාතකයෙහි මේ මාගේ බෝසතාණන් වහන්සේ කුරුරට ඉඳිපත් නුවර ධනඤ්ජය කොරව්‍ය රජහට පුත්‍ර ව සුතසෝම නම් රාජකුමාර ව, එක්සියයක් රාජකුමාරයන් හා සමග තක්සලා නුවර දිසාපාමොක් ආචාර්‍ය්‍යයන් කෙරෙහි ශිල්ප හදාරා නුවණින් අග පැමිණ එක්සියයක් රජ කුමරුන්ට අනුශාසනා කොට ඔවුන් තමන්ගේ රාජධානිවලට යවා සවකීය රාජ්‍යය ප්‍රතිලාභ කරවා තමින් වහන්සේ ද සවකීය රාජ්‍යයෙහි රාජ්‍යශ්‍රී විඳ, එක්සියයක් රජුන් පඤ්චශීල රක්‍ෂණයෙන් හික්මවා ලොව බුද්ධොත්පාද කාලයක් සේ කරණසේක. එ කල ඔවුන් අතුරෙන් බ්‍රහ්මදත්ත කුමර බරණැස් රජ ය කරණුයේ සොර සොරා මිනී මරවා මිනීමස් කයි. මෙසේ කලක් ගිය කල කාල නම් සෙනාධිපති මෙ පවත් දුන රජ්ජුරුවන් කරා අවුදින්

"දේවයිනි! ස්වකීය මාංසානුභවය නම් තමාට ම විනාශයට කාරණ වන්නේ ය; පෙර ආනන්ද ය, තිමිනන්ද ය, අජ්ඣාරෝහණ යයි යන පන්සියයක් යොදුන් දිග මස් රජුන් තුන්දෙනා හා තිමිංගල ය, තිමිර පිංගල ය යි යන දහසක් යොදුන් දිග මස් රජුන් දෙදෙනා හා මේ පස්දෙනා අතුරෙන් ආනන්ද නම් මත්ස්‍යරාජයා විනාශයට පැමිණියේ ස්වකීය මාංසානුභාවය නිසා ම ය. පෙර මම නුවර සවසති නම් බ්‍රාහ්මණ කුලයෙහි උපන් සොවච මානවකයා කුලයෙන් නටුවේ ද ජාතියට නො තරම් වූ සුරාපානයෙහි තෘෂ්ණාව බැඳ ම ය. තව ද ධෘතරාෂ්ට්‍ර කුලයෙහි හංසයන් විනාශයට පැමිණියේ ස්වකීය මාංසභවය නිසා ම ය" යි යනාදීන් රජහට අවවාද කියා ගිවිස්වා ගත නොහී අරක්කැමියා හා මගුල් කඩුව හා මස් පිසන සැළියක් පාමාදී ඔහු රාජ්‍යයෙන් නෙරියහ.

එ කල රාජ්‍යය හැර වල්වැද දුවුදුටුවන් මරා මිනීමස් කා ඇවිද දවසෙක මිනීමස් නො ලදින් අරක්කැමියා මරා මස් කා එතැන් පටන් එකලා නුග ගසක් මුල වාසය කොට "පොරිසාද නම් මිනිස් යකෙක් මිනී මරා මස් කන්නේ ය" යි මුළු දඹදිව ප්‍රසිද්ධ ව දවසෙක පය උලක් ඇනගෙණ බොහෝ වෙදනා ඉවසාගත නොහී නුගරුක දෙවියා කරා ගොස් "ස්වාමීනි! රුක්දෙවිඳාණෙනි! දවස් ගණනක් ඇතුළත පයට වහලක් ලදිම් නම් දඹදිව එක්සියයක් රජුන් හො මරා මෙතැනට ගෙණවුත් උන්ගේ ගල ලෙහෙයෙන් තොපගේ කඳ සෝදා ලම්; අතුණුබහැතින් තොපගේ විමන සිසාරා පන් බැද ලම්; ඔවුන්ගේ පඤ්චමධුර මාංසයෙන් තොපට බිලි දෙම්" යි ද, එගසමුල වැදහෙව නිරාහාර හෙයින් සියලඟ වියලෙත්, වණය නොමේම සුව වූ කල්හි දේවතානුභාවයෙනැයි රුක්දෙවියා කෙරෙහි පැහැද "මට මේ සා මැඩක් කළ රුක්දෙවියා තන්ට යදී බිලියෙන් පූජා කෙරෙම්" යි සිතා "කෙසේ දඹදිව රජුන් ගෙණෙම් දෝ හෝ දඹදිව මහතැ" යි සිත සිතා සිටියේ ය.

එ කෙණෙහි ලැවු ගින්නට සෙණ ගින්නක් හැමුවා සේ, නිෂ්කාරණ වූ යක්ෂයෙක් ඔහට පෙණී එක දවසින් සියක් යොදුනුත් දිව විඩා නො වන මිතැ 'ආනුත් සොඬ ගෙණ බිම අපුලා පියන ශබ්ද ඇසුවවුන් දුස් පියවි මුහුණින් වැටීගෙන ජවබල තේජස් ඇති දිව්‍ය මන්ත්‍රයක් උගන්වාලා යහළු! තා සිතූ සිත නො පමා ව" යි කියා අන්තර්ධාන විය.

එ කෙණෙහි ඔහු සතුටු ව කඩුපත ගෙන ඉස සිසාරා පවන් වේගයෙන් වෙන වෙන රාජධානී දිව "මම ය පොරිසාදයා ය" යි

බැණනැඟි බසින් සිවුරඟ සෙන් වෙවුල්වා මහ පිරිස් මැදින් දිව සෙණක්ගැසුවාසේ මහපිරිස කුමක් බව නොදැන බලබලා සිටියදීම සිංහාසනවල උන් රජුන් දෙකකුල ගෙණ බිම හෙළා සකුන් ගත් කුකුළන් සේ, සල්ව සල්වා එල්වා පිටි දැමැද මතුරුමා ඉස් විළුඹින් පැහැර පැහැර දිව අවුදින්, රජුන්ගේ අතුල්විද අවුනා ගස අතු අත්තේ එල්වා මෙසේ සත් දවසක් ඇතුළත සුතසෝම රජ්ජුරුවන් හැර මුළු දඹදිව රජුන් ගස එල්වා යාගයට පමන් ගත් කල්හි නුග ගස දෙවතාවා රජදරුවන්ට උපන්නාවූ ඉතා මහත් පීඩා දැක මහත් වූ කරුණා ඇතිව ද නොමෙ ඔවුන් දිවි ගලවා ගත නොහී මෙ පවත් ක්‍රමයෙන් සක්දෙව් රජහට කියා ඔහුගෙන් උපදෙස් ලදින් නැවත නුගගස කරා අවුදින් පොරිසාදයාට පෙණී "තෝ එ දවස් එක්සියයක් රජුන්ගෙන් බිලියම් දෙමි සි යදල දැන් සුතසෝම රජ්ජුරුවන් හැර බිලියම් දෙයි ද; ඔහු හැර බිලියම් නො ගණිම්" යි කියා අනතර්ධාන වි. එ බසට පෝරිසාදයා රුක් දෙවියා දුටු සතුටින් මත් ව, 'එසේ වී නම් ඇසිල්ලෙකින් දිව ඔහු ගෙණවුත් හිමි තුඹට බිලියම් දෙමි; මට නො කිපෙව" යි යැදලා ඇසිල්ලෙකින් ඉදිපත් නුවරට දිව "සුතසෝම රජහට රකවල් දැඩි ය; ඇතුළු නුවර දී අල්වා ගත නො හැක්ක; උයන දී අල්වා ගණිම්" යි සිතා මඟුල් උයනෙහි මඟුල් පොකුණෙව මැද නෙළුම් පතින් මුවා ව සිටියේ ය.

අලුයම් රාත්‍රියෙහි බෝසතානන් වහන්සේ සූසැට ආභරණයෙන් සැරැහී මඟුලැතු සරහා සිවුරඟසෙන් සමගින් මඟුල් උයනට වන්සේක. එ කෙණෙහි "පොරිසාදයා ඉදින් අප රජහු ද ගෙණ ගියා නම් දඹදිව සිස්වන්නේය" යි අමාත්‍යයෝ උයන සිසාරා එකී එකී අතින් දෙළොස් දෙළොස් ගවු මානයෙහි ඇත් පවුරු ය, අස් පවුරු ය, රථ පවුරු ය, බල පවුරු යයි සිවුරඟ සෙන් සිටුවා තලමිටක් අහසට දැමූ කල ඇටකුත් බිම හිය නො හැක්සා සේ එක ඝනාකාරයෙකින් වැසුවා සේ සිසාරා සිටගත්හ.

ඉක්බිත්තෙන් බෝසතාණෝ මඟුල් පොකුණට බැස දිය කෙළ නහා ගොඩනැගී ඇඟ දිය විසලමින් සිටි දැ ය. එ කෙණෙහි පොරිසාදයා "රජ ආභරණ පලන් නම් පසු ව බර මහත; දැන් ම අල්වා ගණිමි" යි සිතා "මම පොරිසාදයා ය" යි හඬක් ගසා දියරකුස්සකු සේ පැන නැගී වේලෙහි දෙළොස් ගවු මානයෙහි ගැවසී සිටි මහ සෙනගට ඇසී සෙණහඬක සේ වෙවුලා,

ඇතරුවෝ ඇතුන් පිටින් හුනහ; අසරුවෝ අසුන් පිටින් හුනහ, රථරුවෝ රථ පිටින් හුනහ; බඹු යොධයන් අත තුබූ ආයුධ වැගිර ගිය; මහැත්හු දිය සලා බෙරිසලා වෙවුල වෙවුලා මහ හඬින් ගුගුරා නැංගාහ; අශ්වයෝ මරණ හෙෂාරව දුන්හ. යෝධයෝ මුණින් හුනහ. මේ සා මහත් තෙජස් පෙර ජාතියෙහි දන් දුන් එක ම ගිති කබලක් නිසා ලදූයේ ය.

එසේ හෙයින් නුවණැත්තාවූ සත්පුරුෂයන් විසින් කුසල් කම් සවල්ප දෙයකැ යි නො සිතිය යුතු ය. විපාක දෙන අවස්ථා වෙහි සවල්ප නො වන්නේ මැයි කීයේ මැනෝ:

කුසලං කාමමනනබබං බුද්දකනාති කදාචිපි,
අනනතඵලදං හොති-නිබබානමපි දදාතිති-සි.

ඉක්බිත්තෙන් පොරිසාදයා බෝසතුන් කරා දිව "මතු නමා අගුල් මල් මිස කෙර ව ඔබ අතින් බණ අසා අමාමිහ තිමත් දුටු දෑ නමා සිත් සේ මැඳ පෙරළී යන තමහට මුදුන්මල්කඩ කරණ ශ්‍රීපාද යට දුන් අනාදර නො කෙරෙමි" යි පය නො ගන්නා සේ, කසු රජුන් සේ බෝසතුන් දෙ කකුල නො ගෙණ තෙල් කළයක් ඔසවන්නා සේ බෝසතුන් වඩා කරපිට හිඳුවා ගෙණ අවලොස් රියන් මහපවුර සිංහ පොවුම්කු සේ පැන ඇත්කුඹින් ඇත්කුඹුව, අස්පිටින් අස්පිටට, රථහිසින් රථහිසට පැන පැන දොළොස් ගවුමක් තැන් පය බිම නො ගා දිව, සිංහයක්හට හසු වූ ඇත් පෙ විච්කු සේ බෝසතානන් ගැරගෙණ පලා ගියේ ය. එ වේලෙහි බොධිසත්ත්වයෝ මරණ භයක් නැති ව ඔහු කරපිට හිඳ ම මගදී නොඑක් කථා කොට ඔහු සපථයන් ගිවිස්වා ගැලවී නැවත නුවරට අවුදින් සතාරගහ ගාථාවෙහි බණ අසා සහසසාරණ වූ පූජා කොට රාජ්‍යයට අනුශාසනා කොට දෙවන දෑ උදෑසන එකලාව ම පොරිසාදයාගේ නුග ගස කරා ගිය දෑ ය.

එ වේලෙහි පොරිසාදයා තැන තැන ගිනි අඟුරු මැල බැඳ සිය ගණන් උල් සැස "එක්සියයක් රජුන් මරා දුන් දුන් බිලියම් දෙමි" යි සිත සිතා බෝසතුන් එනතුරු මග බල බලා සිටියේ ය. එ වේලෙහි බෝධිසත්ත්වයෝ පොරිසාදයාගේ බිලියම් මඩුල්ල හා මලාගිය සපු මල් දම සේ කෙදිරි ගගා ගස අතු අත්තෙහි එල්ලෙන රජුන් දුක උපන් මහා කරුණා ඇති ව පොරිසාදයා හා සමග නොයෙක් විසිතුරු කථා කොට:

පඤ්ච පඤ්ච නඛා භක්ඛා-ඛත්තියෙන පජානතා,
අභක්ඛං රාජ භක්ඛෙසි-තසමා අධම්මිකො තුවං-ති.

යනාදීන් නොඑක් ප්‍රකාරයෙන් බණ වදුරා ඔහු නරකයෙන් නැඟී ගන්වා දමා, දිවිහිමියෙන් ප්‍රාණයක් නො නසනා සේ හික්මවා වදාළසේක.

ඉක්බිත්තෙන් ඒ දෙශනාවෙහි ප්‍රසන්න වූ මනුෂ්‍ය භක්ෂක යක්ෂාකාර වූ ඒ පොරිසාදයා පළමු බෝසතුන්ගේ ජීවිත ය පූජා කෙළේ ය. එක්සියක් රජුන්ගේ ජීවිත ද පූජා කෙළේ ය. දිවිහිමියෙන් පඤ්චශීලය රක්ෂා කොට සම්‍යක් ප්‍රතිපත්තීන් පූජා කෙළේ ය. ඒ සා මරණ භයින් ගැළවුනා වූ එක්සියක් රජ දරුවෝ ද තමන් තමන්ගේ රාජ්‍යශ්‍රීයට පැමිණ දිවි පමණින් ධන පමණින් පූජා කළහ.

මෙසේ මාගේ ස්වාමිදරුවන් බුදු නොව පාරමිතා භූමියෙහි සංසාරගත ව ඇවිදුනා කල පවා පොරිසාදයා වැනි මනුෂ්‍ය යක්ෂයන් දමා මෙසේ මෙසේ වූ පූජා ලත් කල දුත් ලොවුතුරා බුදු ව ආළවක නම් යක්ෂයාගේ විමනට වැඩ නොයෙක් පෙළහරින් ඔහු දමා එ ද ඔහුව බිලියම්ට ගෙණා අළවු රජකුමරුවා හා බත් තවු වෙන් පූජා ලත් නියාව මට කවර ආශ්චර්යයක් ව වැටෙනෙන හෙයින් මාගේ බුදුහු අර්හත් නම් වන සේක් යි කියම් ද, එසේ ද වුවත් මේ මේ කාරණයෙනුදු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලදී:

පූජාවිසෙසං සහ පච්චයෙහි
යසමා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තසමා ජිනො අරහති නාමමෙතං- ති.

මේ පූජාවලියෙහි අප බුදුන් සංසාර ගත ව ලද
පළමුවනජාතිභෙද පූජා කථා නම්වූ
පස් වන පරිච්ඡෙදය නිමි.

සවන පරිච්ඡේදය

තව ද: අප බුදුන් ලද ද්විතීය ජාතිභේද පූජා නම් කවරේ? යත්;

42. මෙසේ සංසාර ගත ව ඇවිදිනාවූ මේ මාගේ බෝධිසත්තයෝ කට්ඨහාරි ජාතකයෙහි බරණැස් රජුව දූ ව දිළිඳු වූ ස්ත්‍රියක කුසින් ඉපැද කට්ඨහාරි නම් කුමාර ව තමන් වහන්සේ කිළිඳි කල වඩා ගෙණ ගොස් ඇමැතිගණයා පිරිවරා හුන් රජු පෙරව ව සිට "මහරජ! තොපට දා මේ තොප පුතනුවන් පාවා ගෙණ වඩා ගන්ව; මාගේ ගෙය නැත; දෙර නැත; හෙන්නා හිඳිනා තැන් නැත; මම ද අනුන් හිමියෙමි; තොප පුතනුවෝ තම බොමි යි හඬති" යි ඒ මැනියන් රත්රුවක් වන් පුතනුවන් පා පා මෙ තෙපුල් කි කල පිරිස්මැද හුන් රජ ලජ්ජාවෙන් කරබා "කෙල්ල! තෝ කුමක් කිය යි ද මපුතෙක් නො වේ" යි කිහ එබසට මැනීයෝ කිපී "තා පුතෙක් නො වේ නම් අද බිම හී යේවා; තා පුතෙක් වී නම් අහස් කුස ම රඳා හිඳීව" යි කියා බෝසතුන් දෙ කකුල ගෙණ සපුමල් දමක් සේ අහසට දමූව. මෙ කප බුදු වන පිණැ'ති මාගේ ඒ බෝසත් පැටවා තෝ එ කෙණෙහි ආකාශයෙහි පලග් බැඳ හිඳ මතු ශුද්ධෝදන රජ වන පින් ඇති ඒ පියරජහු මුහුණ ප්‍රේමයෙන් බලා කුරවික නාදයක් සේ ප්‍රිය වූ නාදයෙන්:

පුත්තෝත්‍යාහං මහාරාජ-තං මං පෝස ජනාධිප,
අඤ්ඤෙපි දේවෝ පෝසෙති-කිඤ්ච දේවෝ සකං පජං-යි

යන මේ ගයින් රජහු පෙම් වඩා බුද්ධ ලීලායෙන් බණ කී දා ය. එ කෙණෙහි සතුටු වූ දහසක් ඇමැතියන් දෙදහසක් අත් නගා වැද වැද තමන් තමන් අතට බස්නට ආරාධනා කළ කල පිය රජහු පා අතට ම බැස ඇක ය පිට හිඳ පෙම් වැඩූ සේක. සතුටු වූ රජ එ ම විට ම දොළොස් යොදුන් බරණැස් නුවර හා රජ සැපත පූජා කෙළේය.

43 තව ද: සුසිම ජාතකයෙහි හස්තිවේද දන්නා පුරෝහිත බ්‍රාහ්මණකුලෙහි ඉපැද තමන් පියානන් අයාමෙහි හස්තිමඞ්ගල කාලයෙහි දී අපවත් වන ධනශෝකයෙන් වලප්නා මැනියන් දුක උපන් ලජ්ජාවෙන් සත් හැවිරිදි වයස එක්සිය විසි යොදුන් මග ගෙවා එ ම දා ම තක්සලා නුවරට වැද දිසාපාමොක් ආචාර්‍ය්‍යයන්

දුටු ගුරුපූජා කොට එක දා රාත්‍රියෙහි ම ලක්‍ෂයක් ග්‍රන්ථයෙන් පිරුණා වූ හස්තිශිල්ප ය නිමවා ධරාගෙන ආචාර්‍ය්‍යයන්ට ත් ගැට තැන් සැක හැර උගන්වාලා දෙවන දා නැවත බරණැස් නුවර අවුත් වැද මැතියන් අස්වසාලා තුන්වන දවස "මම ඇත් මගුල් කෙරෙමි" යි රජු පිරිවරා සිටගත් දහස් ගණන් බමුණුගණා මැද ඇත්මුලක් මැදව වන් කෙශරසිංහ පැටවකු සේ කිසි කෙනකුන් කෙරෙහි ත් භය නැති ව "මේ දඹදිව් තෙලෙහි මා මිනා හස්තිශිල් ප ය නිමවා දන්නා අන් කවර සෙනෙක් ඇද්ද" යි ගර්ජනා කොට හැම බමුණන් පරදවා රජු බල බලා සිටියදී දක්‍ෂ ව ඒ හස්තිමඞ්ගල ය කළසේක. එ කෙණෙහි සතුටු වූ ඒ සුසිම නම් රජු හා අග මැතියෝ නවකෙළක් පමණ මහත් ධන රාශියෙකින් බෝසතුන්ට පූජා කළහ.

44. තව ද: සම්භව ජාතකයෙහි බරණැස බ්‍රහ්මදත්ත නම් නරපතිහුගේ විධුර නම් පණ්ඩිතයන්ට පුත්‍ර ව සත්හැවිරිදි සම්භව නම් කුමාර කල වැලි කෙළනා වූ මාගේ ඒ බුද්ධාංකුරයාණෝ කෝරව්‍ය නම් රජහුගේ [1]සුචිර නම් පුරොහිත බ්‍රාහ්මණයා අවුත් සිව ධර්මාංග නම් පැනය විචාළ ද බුද්ධලීලායෙන් ප්‍රශ්න ව්‍යාකරණ ය කොට එ කෙණෙහි සතුටුවූ රජ යුවරජ මහ ඇමතියන් විසින් දමනලද සියක් ලක්‍ෂයක් ධනරාශියෙකින් පූජා ලත් සේක.

45. තව ද: දෙව ධම් ජාතකයෙහි බරණැස බ්‍රහ්මදත්ත රජහුගේ අගබිසොවුන් කුසින් බිහිව අහිංසක නම් රාජපුත්‍ර වූ මාගේ බොධිසත්ත්වයෝ චන්ද්‍ර සූර්‍ය්‍ය නම් වූ මල් කුමරුවන් දෙන්නා හා සමඟ තපසට වලට යන දා කම්යි අල්වා ගත් උදක රාක්‍ෂසයාට දෙව ධම් නම් වූ ධර්මදෙශනාව කොට ඔහු සන්තොෂ කරමා තුන්බෑ රජුන්ගේ ජීවිත පූජා ද, ඔහු විසින් ම ඔවා දෙනලද පන්සැල් පූජා ද නිත්‍යයෙන් කරණලද අත්පා මෙහෙ පූජා දූයි එක ජාතියෙහි ම තුන් පූජාවක් ලත්සේක.

46. තව ද: න්‍යග්‍රොධමෘග ජාතකයෙහි මෘගරාජන් වූ බෝසතාණෝ වදන මුවදෙනකගේ මරණ භය දැක උපන් මහා කරුණා වෙන් [2]"තී මැරේයයි (නොසිත) මාගේ ජීවිතය දෙමි" යි ඇ අස්වසා දං ගෙඩියෙහි හිස තබා ජීවිතදානය දී ඔත්සේක. ඒ ආශ්චර්‍ය්‍ය අසා අවුත් දැක සතුටු වූ බ්‍රහ්මදත්ත රජහට බුදුතුඩෙකින් බණකියන්නා සේ මුවතුඩින් දශරාජධර්මයන් බණවදාළසේක

1. සුචිරත්ත, සුචිරථ 2. නි මාරෙයයි, නී මාරද්‍යෙමි,

ඒ සද්ධර්ම ප්‍රීතියෙන් මත් වූ රජ බෝසතුන්ගේ ජීවිතය ද පූජා කෙළේ ය. සියලු අපාද විපාද චතුෂ්පද දී සතුන්ගේ ජීවිත පූජා ද කෙළේ ය.

47. තව ද: පඤ්චායුධ ජාතකයෙහි බ්‍රහ්මදත්ත රජහට පුත් ව දුනු මුගුරු කඩු හීරි අඩයටි යන පඤ්චායුධ නිමවා දත් හෙයින් පඤ්චායුධ නම් කුමාර ව සොළොස් හැවිරිද්දෙහි තක්සලා නුවරට ගොස් සූසැට කලා ශිල්පයන් ද නිමවා නැවත බරණැස් නුවර වඩනා වූ මාගේ බොධිසත්ත්වයෝ සුවිලොම නම් යක්ෂයාට අසු ව වීර්‍ය්‍යපාරමිතාවෙන් ඔහු ජය ගෙණ, ප්‍රඥා පාරමිතාවෙන් බණ කියා ඔහු සන්තානය කැරවූ ද ය. ප්‍රසන්න වූ ඒ චණ්ඩ යක්ෂයා පවා මාගේ බොධිසත්ත්වයන්ගේ ජීවිතය පූජා කෙළේය.

48. තව ද: වානරින්ද ජාතකයෙහි කපි රාජන් වූ මාගේ බෝධිසත්ත්වයෝ තමන් කම්හි තිී කය දල්වා සැඟවී ගලතල වැද හොත් දෙව්දත් කිඹුලා දැක දෘතපාරමිතාවෙන් ඔහු වඤ්චා කොට ඒ කිඹුලාගේ ම කටට පැනපියා ඔහට අසු නො ව අභිවත්සථානගත වූ ද ය. ඒ වික්‍රම ය දැක සතුටු වූ කිඹුලා:

යස්සෙතෙ චතුරො ධම්මා-වානරින්ද යථා තව,
සච්චං ධම්මො ධිති චාගො-දිට්ඨං සො අතිවත්තති-ති.

යන මේ ගාථාව අඩගා කියා බෝසතුන්ට සතුති පූජා කෙළේය.

49. තව ද: මච්ඡ ජාතකයෙහි මස් රජ ව උපන්නා වූ මාගේ බොධිසත්ත්වයෝ සමීකාලයෙහි දිය සිඳී කම්බලයෙන් මියයන්නා වූ බොහෝ නෑයන් දැක ඉඳුනිල් මිණි සකලක් සේ ඉතා ප්‍රසන්න වූ තමන්දෑගේ ඇස්දෙක දල්වා ආකාශය බලා:

අභිත්ථනය පජ්ජුන්න-නිධිං කාකස්ස නාසය,
කාකං සොකාය රන්ධෙහි-[1]මඤ්ච සොකා පමොචය-ති.

යන මේ විසිතුරු ගයින් සත්‍යක්‍රියා කළසේක. ඒ සත්‍යක්‍රියාවෙහි සතුටු වූ වස්සවලාහක දිව්‍යපුත්‍රයා සහ මහා වර්ෂාවක් වස්වා පූජා කෙළේ ය.

50. තව ද: ගුත්තිල ජාතකයෙහි ගුත්තිල ගාන්ධර්ව නම් වූ මාගේ බොධිසත්ත්වයෝ මනුෂ්‍යාත්මයෙහි සිට ම ශක්‍රදේවේන්ද්‍රයා

1. මච්ඡ.

ගේ විජයොත් නම් දිව්‍යරථයෙන් ශක්‍රභවනයට ගොස් දෙ කෙළ පණස් ලක්‍ෂයක් දිව්‍යාඞ්ගනාවන් මධ්‍යයෙහි වීණා ගායනා කොට දිව්‍යයන් සන්තොෂ කැරවූ දැ ය. ඒ ආශ්චර්‍ය්‍යයෙහි ප්‍රසන්න වූ සක්දෙව් රජ සත් දවසක් මුළුල්ලෙහි තමාගේ ශක්‍රසම්පත්දී පූජා කෙළේ ය.

51. තව ද: කණ්හ ජාතකයෙහි අසූ කෝළක් පමණ ධන ඇති බ්‍රාහ්මණ මහාසාර සැපත් හැර මල් ගොස් අටවිධ වූ තපස් අතුරෙන් දන්තලුය්‍යක නම් වූ සවන තාපස් කොට තමුඩ ගසක් මුල සිද වාසය කරණ දැ ය.

අට විධවූ තපස් නම් කවර? යත්: සපුත්තදාරකාය, උඤ්ඡාචාරිකය, සම්පත්තකාලකය, අනග්ගිපක්කිකය, අසම්මුට්ඨිකය, දන්තලුය්‍යකය, පවත්තඵලකය, වණ්ටමුත්තකය යයි යන මේ අට තපස් නම.

එහි විභාග මෙසේයි: සමහර කෙනෙක් අඹු දරුවන් කෙරෙහි ලොභ ය ඇති ව ඔවුන් හැරපිය නොහී අඹුදරුවන් හා සමග ඉසිවෙස් ගෙණ කෘෂි වණික් ආදී නිරවද්‍ය කර්මාන්තයෙන් දිවි යවන්නාහු ය. ඔහු සපුත්තදාරකා නම් වෙති.

සමහර කෙනෙක් වලට නො ගොසින් නුවර දොර පන්සැල් කරවා ගෙණ එහි රජ බමුණු වෙළඳ සිටු දරුවන් අකුරු කරවා රන් රිදී මසු කහවණු නො පිළිගෙණ උඳු මුං තලතෙල් සහල් ආදී කප්පිය භාණ්ඩයන් රැස් කොට වාසය කෙරෙති. ඔහු උඤ්ඡාචාරිකයෝ නම් වෙති. ඒ තපස පළමුවන තපසට වඩා උග්‍ර ය.

සමහර කෙනෙක් කිසි පළිබොධයක් නැති ව ඉසිවෙස් ගෙණ වේලාවට ගම් වැද භික්‍ෂාචාරය කොට ලද දෙයෙකින් යැපී තපස් කෙරෙති. ඔහු සම්පත්තකාලකා නම් වෙති. ඔවුන්ගේ තපස දෙ වන තපසට වඩා උග්‍ර ය.

සමහර කෙනෙක් ගිනි නොවන් වන මූල් ඵලාඵල ශාකාදීන් අනුභව කොට තපස් කෙරෙති. ඔහු අනග්ගිපක්කිකයෝ නම් වෙති. ඔවුන්ගේ තපස තුන් වන තපසට වඩා උග්‍ර ය.

සමහර වීර පුරුෂ කෙනෙක් මිටි වාණක් හෝ තෙහු හැතක් හෝ අතින් ගෙණ වෙනෙහි ඇවිද දුටු යම් ගසෙකින් පොතු මූල් ආදිය තලා ගෙණ අනුභව කොට පෙහෙවස් ඉටා ගෙණ සතර බ්‍රහ්මවිහාර භාවනාවන් කොට වාසය කෙරෙති. ඔහු අසම්මුට්ඨිකයෝ නම් වෙති. ඔවුන්ගේ තපස සතර වන තපසට වඩා උග්‍ර ය.

සමහර වීරපුරුෂ කෙනෙක් ඒ මිරි වාණාදිය ත් නො ගෙණ දුවූ යම් ගසෙකින් පෙතු [1]මල් එල ජාති ආදිය දතින් උරා ගෙණ අනුභව කොට දවසින් දවස උපෙක්ෂාංගය වඩා බ්‍රහමවිහාර භාවනා කෙරෙති. ඔහු දන්තාලූයිකා නම් වෙති. ඔවුන්ගේ තපස් පස් වන තපසට වඩා උග්‍ර ය.

සමහර කෙනෙක් එක් විලක් හෝ එක් වන ලැහැබක් හෝ ගොදුරුගම් කොට සිතා හිඳගෙණ අනික් තැනකට නො ගොසින් ඒ විලෙහි ම නෙළුඹල හොළුඹුදුලි ඔළු ආදී ය හෝ එ ම වෙනෙහි මල් සමයෙහි මල්, එල සමයෙහි එල, කොළ සමයෙහි කොළ අනුභව කෙරෙති. ගමක් වසයෙන් සෙසු සමයෙහි ගැටපුඹුලු ආදිය අනුභව කොරෙති. ගොදුරු නිසා අනික් කිසි තැනකට ත් නො ගොස් නිත්‍ය ශීලය රක්‍ෂා කොට බ්‍රහමචර්‍ය්‍යාව රක්‍ෂා කෙරෙති. ඔහු පවත්තඵලභොජකයෝ නම් වෙති. ඔවුන්ගේ තපස සවන තපසට වඩා උග්‍ර ය.

සමහර වීරපුරුෂ කෙනෙක් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදී ම ගෙණ වල් ගොස් එක රුකක් මුල හිඳගෙණ මල් එල කොළ නටුගෙන් ගිලිහී සමීපයෙහි වැගිර ගිය කල අත පොවන මානයෙහි තුබූ දෙය ඇරගෙණ අනුභව කෙරෙති. සවයංසතයෙන් හිඳගෙණ අනුභව නො කෙරෙති. ඔහු වණ්ටමුත්තකයෝ නම් වෙති. ඔවුන් ගේ තපස සත්වන තපසට වඩා උග්‍ර ය.

මොහු අටදෙන ම පඤ්චශීලය රක්‍ෂා කොට පඤ්චාභිඥා අෂ්ට සමාපත්තිලාභී වෙත් ම ය. ගුණයෙන් වනාහි ක්‍රමක්‍රමයෙන් ම උත්තමයන යි දතයුතු.

මේ අට තපසින් එ කල දන්තාලූයිකා නම් වූ සවන තපස කොට ශීල බලෙන් ශක්‍රදේවේන්ද්‍රයාගේ: දිග සැට යොදුන් පුළුල පණස් යොදුන්, බොල පසළොස් යොදුන්, බඳුවද පෙත්තක් හා සමාන පැහැ ඇති, ඔහු උන් කල නාභිමණ්ඩලය දක්වා ගැලී යන්නාවූ, නැගී කල හෙරි තලයක් සේ නැනී යන්නාවූ, හුණු කැමැති කල හුණුව පවත්නාවූ, සිහිල් කැමැති කල සිහිල් ව පවත්නා වූ, පාණ්ඩුකම්බල නම් ශෛලාසන ය ශීල තෙජසින් හුණු කරවා ඒ ශක්‍රයා ගෙන්වා විශෙෂ වූ ප්‍රශ්න ව්‍යාකරණයෙන් ඔහට ධර්‍ම දෙශනා කළ සේක. ඒ දෙශනාවෙහි සන්තොෂ වූ සක් දෙව් රජ ඒ වැඩහුන් ගස සහ මල්පල්ලෙන් මව, ඩ්‍රැවඵලයෙන් පූජා කොට ගියහ.

---

1. මුල්.

52. තව ද: අකිර්ති ජාතකයෙහි අසූ කෙළක් සැපත් හැර බරණැස් නුවරින් පිටත් ව ක්‍රමයෙන් කාර දිවයින් වැඩ එ කල එකලා ව කරගසක්මුල වැඩහිඳ කරපලා මලඳා පවනතාළුලක නම් වූ සත්වන උග්‍ර තපස කොට ඔහු වැඩඋන් තැනට ගෙන්වා ඔහු ම විචාරණලද පැන ය කියා බුද්ධලීලායෙන් ධම් දෙශනා කළ දා ය. එ දා ද සන්තොෂ වූ සක්දෙව්රජ අසාධාරණ වූ වර අටෙකින් පූජා කොට ගියහ.

53. තව ද: සඛ ජාතකයෙහි සඛ නම් බ්‍රාහ්මණ ව දන් දෙනු සඳහා ධන සොයමින් මුහුදු නැගී ගොස් මුහුදු මැදදී නැව් නැසීගිය කල සත් දවසක් මුළුල්ලෙහි නිරාහාර ව මහත් වූ වීය්‍ර්‍යයෙන් තෙරක් දකිම් යි මුහුදු පිහිනන්නා වූ මාගේ බොධි සත්වයෝ සම්පූර්ණ වූ චන්ද්‍රයා දූත 'මියෙහෙස් පොහොදාධන [1]ගිලය' යනා මරදවා අවහසිල් සමාදන් ව ශීලබලයෙන් මණිමෙඛලා නම් දෙවුදුව ගෙන්වා ප්‍රිය කථාවෙන් අෑ සන්තොෂ කැරවූ සේක. එ දා සතුටු වූ ඒ මණිමෙඛලා නම් දෙවුදුව දිග අටසියක් රියන්, පුළුල සාරසියක් රියන්, ගැඹුර සියක් රියන් පමණ ඇති, ඉන්ද්‍රනීල මාණික්‍යමය වූ කුඹ ඇති, සක් රුමින්මය වූ කඹ ඇති, රිදීමය වූ රුවල් ඇති, සහරන්මය වූ රිටි හා පළු පත් ඇති, සත්රුවන් නැවක් හා එහි පිරූ සත්රුවන් සමූහයකින් පූජා කොට බෝසතුන් මෝලිනී නම් නුවර පිහිටුවා ගියාය. කියේමැනෝ:-

සා තත්‍ථ චිත්තා සුමනා [2]පණීතා-නාවං සුචිත්තං අභිනිම්මිණිත්වා
ආදාය සඛං පුරිසෙන සද්ධිං-උපානයි නගරං සාධු රම්මං-යි.

54. තව ද: ඛදිරඞ්ගාර ජාතකයෙහි ධනසිටු ව උපන්නා වූ මාගේ බොධිසත්වයෝ පිඬු සිඟා වැඩ සිටි පසේ බුදුන් දුට පස් වණක් ප්‍රීතීන් පිණා ලක්ෂයක් අගනා බත් තලියක් ගෙණ ගොස් පසේ බුදුන් ඉදිරියෙහි සිටි දා ය. -එ කෙණෙහි වසවත් මර බෝසතුන්ගේ දානාන්තරාය හා පසේ බුදුන්ගේ ජීවිතාන්තරාය කෙරෙමියි අතුරෙහි නරක ගිනි වළක් මවා ලී ය. ඒ ගිනිවළ දුටා:

නාහං පතාමි නිරයං-උද්ධපාදො අවංසිරො,
නානරියං කරිස්සාමි-හන්ද පිණ්ඩං පටිග්ගහ-යි.

යන මේ ගාථාව කියා ඒ ගිනිමැදට පිනූ දා ය එ කෙණෙහි ඒ ගිනි අන්තර්ධාන ව පොළොව පළා මහ ගැල් සකස් සා පියුමෙක් පැනනැගී බෝසතුන්ගේ ශ්‍රීපාදය පිළිගෙණ සුවඳ මුවරද ගඳින් පූජා කෙළේය.

1. කොවරවම්යි. 2. පණීතා.

55. තව ද: සස ජාතකයෙහි සස රජව ව පෙහෙවස් රක්‍ෂා කරන්නාවූ මාගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝ තමන්ගේ ශ්‍රද්ධා බල බලමි සි සිතා දිළිඳු වෙසක් මවා බඩසා ය සී අවුත් සිටි ශක්‍ර බ්‍රාහ්මණයා දැක සන්තෝෂ උපදවා "අද මාගේ ඇඟ මස් පලහා කවා තාගේ සාදුස් සිමමි සි, ගිනි ගෙණෑ" යි කී කල ඒ ශක්‍රයා මවා පෑලූ නරක ගින්නක් සේ භයංකර වූ ගිනිරස් දැක තුන් විටක් ඇඟ කිලි පොළා ගිනි ගොඩ මැදට පැන ගිනි පළා පැනනැගි පියුම්ගැබ රාජහංස ලීලායෙන් වැඩහිඳ 'බමුණ! තාගේ ගිනි ඉතා සිහිල් වනැ" යි ඔහට ආශ්චර්‍ය්‍යයී නෙපුල් කී දැ ය. එ කෙණෙහි ප්‍රසන්න වූ සක්දෙව්රජ බෝසතුන් වඩාගෙණ මුදුනෙන් පුදා "හිමි! මම බමුණෙක් නො වෙමි; දෙ දෙව්ලොවට අධිපති වූ සක්දෙවුරජ නම් මම් ම යෑ" යි කියා සතුති පූජා කොට, පර්වතයක් පලා යුස ගෙණ එකුන් පණස් යොදුන් සඳමඩලෙහි බෝසතුන්ගේ සස රූප ය හැඳ කල්පාන්ත පූජා කොට ගියේ ය.

56. තව ද: තුණ්ඩිල සූකර ජාතකයෙහි සූකර රාජව වූ මාගේ බොධිසත්ත්වයෝ 'සමත් මරා ඇඟ මස් කම්හ' යි පොලු මුගුරු ගෙණ මවා සිටගත් රා සොඬුන් දෙතිස්දෙනා[1] මැද තුණ්ඩිලොවාදය කරණ වේලෙහි ඒ ආශ්චර්ය්‍යය ඇසූ රජ යුවරජ මහ ඇමතියන් අවුත් පිරිවරාගත් කල දොළොස් යොදුන් බරණැස දෙර දෙර කියන බණක් සේ බුද්ධලීලාවෙන් වැඩහිඳ:

ධම්මො රහදො අකද්දමො පාපං සෙදමලන්ති වුච්චති,
සීලං ච වණ්ණං විලෙපනං තස්ස ගන්ධො න කදාචි ඡිජ්ජති-යි

යනාදීන් බණ කියා එ කෙණෙහි බරණැස් රජුගෙන් මුළු දඹදිව රාජ්‍යය පුදවාගෙණ මහත් වූ සත්කාර ලත්සේක. එ දා දෙසූ ධර්මයෙන් හික්මුනා වූ සත්ත්වයෝ සැටදහසක් හවුරුදු මුළුල්ලෙහි බෝසතුන්ට ප්‍රතිපත්ති පූජා කළාහු ය.

57. තව ද: තෙසකුණ ජාතකයෙහි ජම්බුක නම් ගිරා පණ්ඩිත ව බ්‍රහ්මදත්ත රජහුගේ සිංහාසන මස්තකයෙහි වැඩහිඳ පඤ්චබල ප්‍රශ්නය එ රජු විචාළ වේලෙහි:

බලං පඤ්චවිධං ලොකෙ පුරිසස්මිං මහග්ගතෙ
තත්ථ බාහුබලං නාම චරිමං වුච්චතෙ බලං.

1 තිස්දෙනා-ඇතැම්.

භොගබලං ච දීඝායු දුතියං වුච්චතෙ බලං,
අමච්චබලං ච දීඝායු තතියං වුච්චතෙ බලං;
පඤ්ඤාබලෙනු'පත්ථද්ධා අත්ථං වින්දති පණ්ඩිතො'ති

යනාදීන් පඤ්ඤාබල ප්‍රශංසාය හා දශරාජ ධර්මයන් ජම්ප්‍රකොවාද නම් ධර්මදේශනාවක් ගිරාතුඩින් කළ දා ය. ඒ දෙශනාවෙහි සන්තොෂ වූ රජු හා අමාත්‍යයෝ සෙනාධිපති ධුරය දී අප්‍රමාණ වූ ධනයෙන් පූජා කළහ.

58. තව ද: සාලිකෙදාර ජාතකයෙහි ගිරා රජ ව ජීර්ණ වූ මවු පියන්ට මෙහෙ කරන්නා වූ මාගේ බොධිසත්ත්වයෝ තමන් බඳ ගෙන්මා ගත් සාලින්දිය නම් බ්‍රාහ්මණයාගේ ඇතැයේ සැතයක් නැති ම වැඩහිඳ:

මාතා පිතා ච මෙ වුද්ධා ජිණ්ණකා ගතයොබ්බනා,
තෙසං තුණ්ඩෙන ආදාය මුඤ්චෙව පුබ්බෙ කතං ඉණං'ති.

යනාදීන් බණ කියා ඔහු ද සන්තොෂ කළ දා ය. එ දා ඒ සාලින්දිය බ්‍රාහ්මණයා පැසුනු පිටින් කිජු වව අවකිරිය හැල් කෙතක් පූජා කෙළේ ය.

59 තව ද: සුතනු ජාතකයෙහි සුතනු නම් කුමාර ව දිළිඳු වූ කුලයෙක උපැද වැන්දඹු වූ මෑනියන්ට මෙහෙ කොට පින් පුරන්නා වූ මාගේ බොධිසත්ත්වයෝ දුක්පත් මෑනියන්ට මසු දහසක් දෙවා බත් තලියක් ගෙණ යක්ෂයකුට බිලියම්ව ගොස් බණ කියා ඔහු දමාගෙණ ඇලවකයා සේ ම ඉතා තද වූ ඒ යක්ෂයා අතින් ගැලවී අභයදානය පූජා ලත්සේක ඒ ආශ්චර්ය්‍යය දුටු රජ යුවරජ මහ ඇමැතියෝ එ දා අප්‍රමාණ වූ ධන සමූහයෙකින් පූජා කළහ.

60. තව ද: අසදිස ජාතකයෙහි අසදිස නම් රාජකුමාර ව ධනුවේදය නිමවා දුන වෙස් වළා නුවරින් ගොස් පසල් රජෙකුට සේවක ව දවස දහසක් වැටුප් ලදින් වැස අඹකැන විද ධනුශිල්ප පානා ද පළමු ව විදි ශරයෙන් නටුව හාගයක් කපා දෙසාළිස් දහසක් යොදුන් නැගී දෙව්ලොව වන් කල, දෙවනුව විදි ශරයෙන් ඒ ශර පුඞ්ඛ ය පැහැර බිම හෙන ශරයෙන් අඹකැන තුබූ නටු භාගය ත් සිඳුවා දකුණතින් ශරය හා වමතින් අඹ කැන ගෙණ සිට රජ පිරිස විස්මය පත් කළ දා ය. එතෙණෙහි කුල්මත් වූ රජ යුවරජ මහ ඇමතියෝ කෙළ පමණ ධන රාශියෙකින් පූජා කළහ.

61. තව ද: මාතුපොසක ජාතකයෙහි ඇත් රජව උපන්නා වූ මාගේ බෝධිසත්ත්වයෝ අන්ධ වූ මෑණියන්ට අත් පා මෙහෙ කරණ ලෙහෙයෙන්ම හස්තිරාජ්‍යය හැරපියා චණ්ඩෝරණ නම් පර්වතයට ගොස් මෑණියන්ට අත් පා මෙහෙ කරණ දා ය. එකල ඒ ආශ්චර්යය දුටු බ්‍රහ්මදත්ත රජු හා දඹදිව වැසියන් හා බෝසතුන්ට දිවි පමණින් මැවුප තබා දී ඔබ ඇවෑමෙහි එ තැන බෝසතුන් වැනි හස්ති රූපයක් කරවා හස්තිමහ නම් වූ පූජාවක් දීර්ඝ කාලයක් මුළුල්ලෙහි දවස් පතා කළාහු ය.

62. තවද චුල්ලහංස ජාතකයෙහි ශ්වේතහංස රාජව උපන්නා වූ මාගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝ බ්‍රහ්මදත්ත නම් රජහුගේ සිංහාසන නැගී මැඩහිඳ හංසතුඩින් විසිතුරු වූ බණ කියා ලොව විස්මය පත් කරවූසේක. එ දවස් සද්ධර්ම ප්‍රීතීන් මත් වූ රජ දළපුඩු සේසත හා සමග බරණැස් රාජ්‍යයෙන් පූජා කෙළේ ය.

63. තවද: විධුර ජාතකයෙහි විධුර නම් මහා පණ්ඩිත වූ මාගේ බෝධිසත්ත්වයන් මහත්සේ චතුෂ්පොසථ නම් පැනය කියා ශක්‍ර ගරුඩ නාග මනුෂ්‍ය යයි යන රජදරුවන් සතරදෙනාගේ ශීල විවාදය දුරු කළ සේක. ඒ බණ අසා ශක්‍රදෙවෙන්ද්‍රයා ප්‍රසන්න වූ දෙලොස් යොදුන් දිව සළුවක් පූජා කෙළේ ය. වෛනතෙය්‍ය නම් ගරුඩරාජයා රන් මාලාවකින් පූජා කෙළ් ය. වරුණ නම් දිව්‍ය නාග රාජයා කණ්ඨාමාණික්‍යයෙන් පූජා කෙළේ ය. ධනඤ්ජය කෞරව්‍ය රජ හස්තිරාජයකු හා ගවයන් දහසක් හා අසුන් යෙදූ රථ දහසක් හා ගම්වර සොළසකින් හා පූජා කෙළේ ය.

තව ද: එම ජාතකයෙහි තමන් මරා හදවත ගණිමි යි සැට යොදුන් කාලාගිරි පර්වතයට පැන නැගී පූර්ණක නම් යක්ෂ සේනාධිපතියාට සාධුතර ධර්මදෙශනාවෙන් බණ වදාළ සේක. එ දා ප්‍රසන්න වූ ඒ පූර්ණක නම් යක්ෂයා බෝසතුන්ගේ ජීවිතය හා අනර්ඝ වූ චින්තාමාණික්‍ය රත්නයකින් පූජා කෙළේ ය.

64. තව දා මහා උම්මග්ග ජාතකයෙහි වෛදෙහ රජ්ජුහුගේ මිථිලා නුවරට පූර්වදිග්භාගයෙහි යව මැදුම්ගම 'සිරිවඩ්ඪන'[1] නම් ගෘහපතිහුගේ සුමනා නම් සිටුදුව කුස පිළිසිඳ දසමස් පුර ශක්‍රදෙවෙන්ද්‍රයා දෙහලද දිවසඳුන් ගැටයක් මිටින් ගෙණ මවුකුසින් බිහි ව උපන් කෙණෙහි ම "අම්මි! මහෞෂධයකැ"යි මෑණියන් හා සමග ප්‍රිය කථා කොට ඒ ආශ්චර්යය දැක මහෞෂධ කුමාර යයි නමින්

1 සිරිවඩ්ඪ

ප්‍රසිද්ධ වූ මාගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝ දහසක් සිටුකුමරුවන් හා
සමග තරුමැද සඳ සේ වැඩී දඹදිව්තෙලෙහි පැන දන්නවුන්ට අග්‍ර
ව විශ්වකර්ම නිර්මිතයක් සේ විචිත්‍ර වූ චිත්‍රකර්මාන්තයෙන් හෙබියා
වූ ක්‍රීඩාශාලාවක් හා සියක් පැන් තොටින් හා දහසක් වංකින් විසි
තුරු වූ පැන් පොකුණක් හා නඳුන් උයන සේ උයනක්කුදු කරවා
සත් හැවිරිදි ව කුමාර ක්‍රීඩාවෙන් වැස දඹදිව බුද්ධොත්පාද කාල
යක් සේ ප්‍රශ්න ව්‍යාකරණයෙන් බබුළුවා මෙසේ වර්ණනා කළ.

ලිහිණිය ගෙණ යන මස් කැටිය උඩ නො බලා හිමි ගෙළුවා ගත්
පැනය. ගොන් ගෙන බැඳගෙණ යන සොරු අසු කොට දී ලූ
පැනය. ගැට හූ පලඳනාව සඟවා ගත් සොර අසු කොට දුන්
පැනය හූවැටිය හිමියන් හිමි කොට ලූ පැනය. යකින්න
තමා දරුවෝ යයි අල්වා ගෙණ ගොස් කම්හි සිතූ ද එ කුමරු රැක
දී ලූ පැනය. කාළගොළයා හා දික්පිටියා හා දික්තල හා තුන්
දෙනාගේ සත්‍රිවාදය සිඳ දී ලූ පැනය. ශක්‍රයා කළ රථවාදය
සිඳ දී ලූ පැනය. කිහිරි හරෙහි අග මුල තෝරා ලූ පැනය.
ස්ත්‍රියගේ හා පුරුෂයාගේ හිනි ඉස් තෝරා ලූ පැනය නයී හා
සැපින්නගේ වෙනස දක්වා ලූ පැනය. කුකුළකු එවන්නේ යයි
වෘෂභ වසුවාවෙන් කියායැ වූ පැනය. අෂ්ටවඞ්ක මාණික්‍යයෙහි
හූ ලාලූ පැනය. මඞ්ගල වෘෂභයා දරුවන් වදවන්නේ යයි කියා
එවූ පැනය. අෂ්ටාඞ්ගයෙන් යුක්ත වූ පැසිබත් පිස එවන්නේ
යයි කී පැනය පස් පියුමෙන් පිරි පොකුණක් එවන්නේ යයි
කී පැනය. විසිතුරු උයනක් එවන්නේ යයි කී පැනය. වැලි
යොතින් ඇඹරූ කඹයක් එවන්නේ යයි කිවා එවූ පැනය යන
මේ සතළොස් පැනය සත් හැවිරිදි අවස්ථාවෙහි බුදුකෙනකුන් සේ
කියා මුළු දඹදිව ප්‍රසිද්ධ ව ගද්‍රභ නම් පැන රජ්ජු දුටු ද කියා එ තැන්
පටන් සිටුපුත්‍ර භාවය හැර රාජපුත්‍ර ව රජ්ජුගේ හෙයි වැඩී තල්හස
තුබු මිණිරුවන නුවණින් පෑ ලූ ද සතුටු වූ ඒ වෙදෙහ රජහු
විසින් දෙනලද දහසක් මුතුමැල් හා ලක්‍ෂයක් වටනා මුතු හරකින්
මේ උම්මග්ග ජාතකයෙහි පළමු වන පූජාව ලත්සේ ය.

තව ද කකණ්ටක නම් පැනය කී දු එ නුවරට නිම්න සතර
ශෘංගමෙහි අයින් දෙවන පූජාව ලත්සේක.

තවද: සිරිකාලකණ්ණි නම් ප්‍රශ්න ව්‍යාකරණය කළ දු
ලක්‍ෂයක් ධනයෙන් තුන් වන පූජාව ලත්සේක.

මිත්‍රකම් කළ එළුවා හා බල්ලාගේ ප්‍රශ්නයෙන් ජය ගත් ද අසූන් යෙදූ රථ දහසක් හා ලක්ෂයක් නිමවන ගම්වරයකින් සතර වන පූජාව ලත්සේක.

බුදුකෙණෙකුන් සේ සිරිමඬ නම් ප්‍රශ්නය කියා සේනකයා දිනූ ද සත්‍යාලඞ්කාරයෙන් හෙබි හස්තිරාජයකු හා ගවයන් දහසක් හා අසූන් යෙදූ රථ දහසක් හා සමෘද්ධ වූ ගම්වර සොළොසකින් හා පස්වන පූජාව ලත්සේක.

ජන්නපඤ් නම් පැනයෙන් අමරාඞ්ගනා නම් වූ අඞ්ගනාවක ලදින් ඛජ්ජෝපණක නම් පැනය කියා භූරි නම් පැනයෙන් ධම්දෙශනා කළ ද රජහුගේ දළපුඩු සේසත අරක් ගත් දේවතා දුව විසින් සතුටු ව පුදනලද දිව රත් කරඬු සතරකින් දිව මල් පුවඳ සතර කරඬුවක් සතර වාරයෙක පාදමූලයෙහි පුදවා ඇලවා සාධුකාර දෙවා මෙම ජාතකයෙහි ම සවන පූජාව ලත්සේක.

තව ද. එ ම ද ම ප්‍රසන්න වූ ඒ වෛදෙහ රජුන් විසින් දෙනලද සේනාධිපති ධුරයෙන් සත්වන පූජාව ලත්සේක.

තව ද: පඤ්චපණ්ඩිත ප්‍රශ්නයෙහි දී සේනකාදී පණ්ඩිතවරුන් ජයගෙණ එ තැන් පටන් රජුහට අනුශාසනා කොට එක මන්ත්‍රීධුරයෙන් වාසය කරණ කල බරණැස උත්තරපඤ්චාල නම් නුවර චූලනී බ්‍රහ්මදත්තරජු හා කේවට්ට නම් පුරෝහිත බ්‍රාහ්මණයා හා චතුෂ්ෂෂ්ඨී නම් මන්ත්‍රණයක් කොට එක්සියයක් රාජධානීන් සෑද, එක්සියයක් රජුන් ගෙණ එක්සියයක් සිටුන් ගෙණ එක් සියයක් අගබමුණන් ගෙණ එක්ලක්ෂ දෙසැට දහසක් මතැතුන් හා එක්කෙළ දෙසැට ලක්ෂයක් රථ හා එක්සිය දෙසැට කෙළක් අස් සෙනග හා සොළොස් දහස් දෙසිය කෙළක් බළ සෙනග හා, එකුන් සතළිස් දහසක් මහා යොධයන් හා අටළොස් අක්ෂෞහිණී පමණ මහසෙනග ගෙණ, තමන් හුන් සත් යොදුන් මිසුලු නුවර තුන් වළල්ලකින් වටලා ගත් කල මාගේ ශ්‍රීමහා බෝධිසත්ත්වයානෝ ඇත්මූලක් මැදට වන් සිංහපොව්වකු සේ තමන් ඇඟ ලෝමයෙකුත් භයක් නැති ව සතුන් දැක මරණ භයින් වෙවුලන වෛදෙහ රජු කරා ගොස් සිට:

පාදෙ දෙව පසාරෙහි භුඤ්ජ කාමේ රමස්සු ච,
හිත්වා පංචාලියං සෙනං බ්‍රහ්මදත්තො පලායති-සී.

යත මේ අභීත වූ ගාථා නාදයෙන් ඒ රජහු අශ්වශාලා, තමන්ගේ දහසක් පමණ යෝධයන් හැරගෙණ වික්‍රම කරණ ජේක් සාරමසක් මුළුල්ලෙහි නුවර සිසාරා හිඳගෙණ බ්‍රහ්මදත්ත නම් රජු හා කෙවට්ට නම් පුරෝහිතයා හා කරණලද මාරයාගේ යුද්ධය සේ අප්‍රමාණ වූ යුද්ධයෙහි තමන්ගේ නුවණ බලයෙන් ජය ගෙණ එක් දවසෙක ධර්මයුද්ධයෙන් ජයගණිමි යි තමන් කරා අවුත් සිටි කෙවට්ට නම් බ්‍රාහ්මණයා මැණික් මාගමිකින් වඤ්චා කොට තමන් පාදමූලයට හිස නම්මා "ඔ හෝ නො වදුම්! ආචාරිණී" යි සෙනඟව ඇසෙන සේ කියා කියා වැඳුම් වළකනා ආකාරයෙන් [1]රත්මල්දමක් ගලතලයක ළෙලන්නා සේ ඔහු තළල බිම ළලා ලේ මුහුණු කොට එ දවස් ඒ ධර්මයුද්ධයෙහි ජය ගෙණ ඒ සා මහත් සෙනඟක් මිනියක් නො මරා; සතකු ඇඟින් ලේ බින්දුවකුත් නො සොල්වා කැටක් ගසා ලුහුබඳවන කපුටු සෙනඟක් සේ තමන් ගේ නුවණ නමැති කැට ගසා හැම ලුහුබඳමා ජය ගෙණ එක් සියක් රාජධානියෙහි රජසෙන් හැරපියා ගිය අප්‍රමාණ වූ මහත් ධන රාශීන් ලදින් එ දවස් ද මේ අව වන පූජාව ලත්සේක.

තව ද: විවාහ මන්ත්‍රණයෙන් ජය ගණුම්හ යි කෙවට්ටයා තළ චතුෂ්කර්ණී නම් මන්ත්‍රණය, ෂට්කර්ණී මන්ත්‍රණය, කොට අසා ඒ මන්ත්‍රණයත් ජයගණිම් යි අටලොස් වර්ගයෙක කුලපිරිස් ගෙණ මඟුලට පළමු බ්‍රහ්මදත්තරජු කරා යෙම් යි මිථුලු නුවරින් ගොස් සෝපාන කර්මාන්තයෙන් ගිය දූ ම රජු වඤ්චා කොට එමදා ම මන්ත්‍රණබෙලෙන් තවකෙළක් ධන උපදවා උපකාරී නම් නුවරක් කරමා තුන්සියයක් යෝධයන් ලවා රජදුව ගෙණෙන සුළු උමඟ ගව්වක් තැන් බිඳුවා සත්සියයක් යෝධයන් ලවා තම රජහු ගලවන මහ උමඟ දෙගව්වක් තැන් බිඳුවා, විසිතුරු වූ සිතියම් කරවා අටලොස් රියන් මහදොර අසූවක් හා සුළුදොර සූසැවක් හා, එක්සියයක් ශ්‍රීයහන් ගබඩා හා ඉර සඳ සදෙව්ලෝ ආදි වූ අප්‍රමාණ කර්මාන්ත කිසිවක්හට ත් නො කියා නිමවා වෛදෙහ රජු ගෙන්වා, එ දා මඟුල් පසාරයෙන් අටලොස් අක්ෂෞහිණී සෙනඟ ගෙණ එක්සියයක් රජුන් සමඟ චූලනී බ්‍රහ්මදත්ත රජහු උපකාරි නුවර පිරිවරා අවුත් සිටගෙණ "කෙලෙ වෛදේහයා ලා ගොවියාපිත් මහෞෂධයා ගණු ව, මර ව, නො යා දෙව"යි යනාදීන් කර්කශ වූ බස් කිය කියා සිටගත් වේලෙහි ද මාගේ බොධිසත්වයෝ තුන් සියයක් යෝධයන් සුළු උමඟින් යවා පඤ්චාලචණ්ඩි නම්

---

1 රත්මදමලක්, රත්ල මදනක්.

රජදුව හා අගමෙහෙසින්වූ නන්‍දා දේවීන් හා පඤ්චාලචණ්ඩ නම් රජ කුමරුවා හා කලහා දේවීන් හා ඇතුළු වූ සතර දෙනා සොරා ගෙන් වා ගෙණ තමන්ගේ වෙදෙහ රජහට පඤ්චාලචණ්ඩීන් ඒ සන්තක ම පාවා දී රාහුමුඛයට හසු වූ සඳදෙව් පුතු ගැලවූවා සේ, බ්‍රහ්මදත්ත රජුට හසු ව ගියා වූ වෙදෙහරජු හා සමග ඇමැතියන් එ ම දා මහ උමඟින් මිහුලු කුමර යවා පාත් වූ කල බ්‍රහ්මදත්ත රජු පිය කථා වෙත් සත්හිඳුවා උමංපානා මායමින් එක්සියයක් රජුන් හා සමගින් උමගින් ගනුකොට එ දා තමන්ගේ නුවණ බලපරාක්‍රම දක්වා, ඒ බ්‍රහ්මදත්ත රජු ද ප්‍රසන්නකරවා, ලක්ෂ වටිනා ගම්වර අසූවක් හා කෙල්ලන් සාරසියයක් ඇතුළු වූ අප්‍රමාණ ධනයෙන් නව වන පූජාව ලත්සේක.

පසු ව වෛදේහ රජු සවගීසථ වූ කල එ ම බ්‍රහ්මදත්ත රජු කරු ණොස් දියරකුසු නම් පැනයෙහි දී ප්‍රසන්න වූ රජහු විසින් දෙනලද දඹදිවට අග්‍ර වූ සෙනෙවිරත් ධුරයෙන් දසවන පූජාව ලත්සේක.

65 තව ද: බුදු වන්ට තුන් වන ජාති වූ මහා වෙස්සන්තර ජාතකයෙහි ජයතුරා නම් නුවර සඳමහ රජුගේ [1]පුසතී නම් අග බිසෝවුන් කුස පිළිසිඳ දසමස් පුරා වෛශ්‍යයන්ගේ වීථි අන්තර යෙහි දී පියුම් ගබින් බස්නා රන් බඹරකු සේ බිහි ව උපන් කෙණෙහි ම ඉඳුනිල්මිණි වන් ඇස් සුං දෙක දක්වා මෑණියන් මුණ බලා මෑණියනි! මා දන්දෙන වතක් දෙව"යි මිහුරු බස් කියා රත්'තුල් සුං දිගු කොට මෑණියන් විසින් දෙනලද දහසින් බඳ පියලි ගෙණ එකෙණෙහි ම කිරිමවුන්ට දන් දී, එ තැන් පටන් වෙස්සන්තර නම් වූ මාගේ ශ්‍රී මහා බොධිසත්වයෝ සැටදහසක් ඇමැති දරුවන් පිරිවරා පෙරඹමස සඳ සේ වැඩී තව වාරයෙක තව ලක්ෂයක් අගනා පලඳනා ගලවා, කිරිමවුන්ට ම දන් දී, අට හැවිරිදි කල පලක් බැඳ වැඩහිඳ සරස වූ සිතින්:

හදයං දදෙය්‍යං චක්ඛුමපි-මංසමපි රුධිරමපි ච,
දදෙය්‍යං කායං සාවයිත්වාන-යදි කොචි යාචකො මම' යි.

යනාදීන් "යම්කු ඉල්වූ යම් වස්තුවක් දන් දෙමි ම ය" යි සිතූ වේලෙහි මෙරගල හා හිමාලය පජිත නමැති මුදුන් මල්කඩින්

---

1. පුසාවතී, 2. සර වූ.

සැරසී මහී නමැති කාන්තාව ගර්ජනා නමැති භේරිනාද පවත්වා සන්තොසින් නටා කරණ ලද මේ වෙස්සන්තර ජාතකයෙහි මහී ගජිතා නම් වූ පළමු වන පූජාව ලත් සේක.

තව ද සොළොස් හැවිරිදි වයස මද්‍රී නම් අගබිසෝ රුමත හා සමඟ රාජ්‍යශ්‍රී ලදින් ජාලිය-ක්‍රිෂ්ණජිනා නම් දරු දෙදෙනා ලැබ දශරාජ ධර්මයෙන් රාජ්‍යය කොට සදන්හල් කරවා දවස දවස සලක්ෂයක් ධනයෙන් දන් දී වසන කල කලිඟුරටින් ආ බමුණන් අටදෙනා ඇතු ඉල්ලූ කල අනඝි වස්තු සතරක් හා සුවිසි ලක්ෂයක් රන් සැදුම් ලදින් රිදී පර්වතයක් සේ දිලියෙන පාණ්ඩව නම් හස්ති රාජයා ඒ බමුණන් අත පැන් එව දන් දී එකෙණෙහි ද මහ පොළොව ගුගුරුවා මහී කාන්තාව විසින් කරණලද මහීගජිතා නම් වූ දෙවන පූජාව ලත් සේක.

තව ද: ඇතු දුන්න යි කිපී නුවරුන් නුවරින් නෙරනා සමයෙහි තපසට වලට යෙමි යි සත්තසතක නම් වූ මහා දානය දී එ කෙණෙහි ද පොළොව ගුගුරුවා මහීගජිතා නම් තුන් වන පූජාව ලත් සේක.

තව ද: මද්‍රීදේවීන් හා දරුදෙදෙනා හා සමඟ එක මඟ නික්ම අටළොස් ගැලක් ධන මඟදී ම යාචකයන්ට දන් දී රථයානින් නුවරින් පිටත් ව නැවත රජගෙය දිසාව බලා:

ඉඞ්ඝ මද්දි නිසාමෙහි-රම්මරූපංච දිස්සති
පාසාදෙ සිවිසෙට්ඨස්ස-පෙත්තිකං භවනං මම- යි.

යන මේ ගය කියා මද්‍රීදේවීන් හා කථා කරණ වේලෙහි ස්වාමි දරුවකුගේ ආපදායෙක මූර්ඡා අඩන බිරියක සේ මහ හඬින් ගුගුරා මිහිකත කරණලද මහීගර්ජනා නම් මේ සතර වන පූජාව ලත් සේක.

තව ද: මෙසේ නුවරින් නික්ම පස්සෙහි දිවූ බමුණන් සතර දෙනාට මඟුලසුන් සතරදෙනා දන් දී පසු ව ආ බමුණා දුන මඟුල්රථය දන් දී දෙ දරුවන්ගේ දුක් දූත ඇකයෙන් වඩාගෙණ ඔවුනොවුන් හා සමඟ ප්‍රිය කථාවෙන් සන්සිඳී යන මද්‍රී දේවීන් හා වෙස්සන්තර නම් ඒ බෝසතාණනෝ ජයතුරා නුවර පටන් විසි ගව් වක් අහස් සුවර්ණගිරිතල නම් පර්වතයට නැගී එ තැන් පටන් විසි ගව්වක් ගොස් කොන්තිමාරා නම් ගඞ්ගාවෙන් එ තෙරෙ ව

ප්‍රියා බිසව ව්‍යාඝ්‍රයා දැක බියපත් වීම.

120 පිට බලන්න. (6-7)

තව ද විසි ගව්වක් ගොස් ආරඤ්ජරගිරි නම් පර්වතයට පැමිණ තවද විසි ගව්වක් ගොස් දුනුම්ටි නම් බමුණු ගමට වැද, එයින් සතළිස් ගව්වක් ගෙවා සැ රව් ගොස් මෙසේ දෙවියන්ගේ ආනුභාවයෙන් එක්සිය විසි ගවු මඟ ගෙවා එම ද සවස ලැග්මට මාතුල නම් නුවරට වැද, එහි රජුන් කළ රාජ්‍යපූජාව නො ඉවසා එ ද රාත්‍රිය එහි යවා,

දෙවන ද එ නුවර සැට දහසක් සෑ රජුන් පිරිවරා සැට ගව්වක් තැන් ගොස් වන දෙරකඩ දූත මල් දුටු සතුටින් රජපිරිස් අවසර දී එව්, අඹුදරුවන් හා සමග මහ වනයට නැඟී ගිය ද රාත්‍රියෙහි ගන්ධමාදන නම් පර්වතකූටයෙහි ලැග හිරු උදයෙහි නික්ම උතුරු දිග බලා ගොස් විපුල නම් පර්වතයට වැද එහි ඉශාන කොණින් ගොස් කෙතුමිනී නම් ගඟට බැස නහා පැන් බී අඹුදරුවන්ගේ ගමින් විඩා නිමා වල්වැද්දකු දුන් වී හා මුවමස් මේ තිමවා ඔහට මුහුල දුන් රන්ඉද්ද ප්‍රසාදයට දී, එයින් ගොස් ස්වාතු පර්වතය මුදුනෙහි පිහිටි නුගගස එල හා මධුර වූ රස ඇති නුග පරඬලා අනුභව කොට තුරුමූල සැතපී, එයින් ගොස් නාලිකා නම් පර්වතයට වැද, තව ද උත්තරාපථයෙන් ම ගොස් මිදෙල්ල නම් විලක් දැක එයින් ගොස් සිවුරැස් පොකුණට වැඩ එ තෙනට ඉශාන කොණ, එක් පියවර සමහන් මඟින් ගොස් ශක්‍රයා මවා තුබූ පන්සැල් හා තවුස් පිරිකර දැක "ශක්‍රයා මා ආ බව් දත් වනැ" යි සන්තොෂ උපදවා විශෙෂ වූ තවුස්වෙස් ගෙණ අඹුදරුවන් ද තවුස්වෙස් ගන්වා වන මුල් වන ඵලාහාරයෙන් ජීවත් ව සපුත්තදාරක නම් වූ පළමු වන තපසින් ඒ වංකගිරි පර්වතයෙහි සත්මසක් වාසය කොට මෛත්‍රී බෙලෙන් ඒ වෙනෙහි සියලු සතුන් ද ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී කරවා දවස් යවන සේක.

එ කල කලිඟු රට දුනුම්ටි නම් බමුණුගම් පුජක නම් බමුණෙක් අමිත්තතාපතා නම් බැමිණියන්ගේ නියොගයෙන් දරු දන් ඉල්වා යනුයේ වනදෙරකඩ රතවල සැ රජුන් විසින් සිටුවන ලද මැදිපුත්‍රයාගේ බල්ලන් දැක ගසකට නැඟී වැද්දවු අවුත් හය ගන්වා "දූන් දූන් නා මිද හෙළමි, කොයි යෙයි දැ? බමුණෑ" යි කී කල "වෙස්සන්තර රජ්ජුරුවන් කරා සඳමන රජ්ජුරුවන් ගෙන් දූත මෙහෙවර යෙමි" යි බොරා කියා ගැළවී ඒ වැද්දා කී සලකුණෙන් ගොස් සුළුවනය ගෙවා අච්චුත නම් තාපසයන්ගේ පන්සැලට වැද "වෙස්සන්තරයන්ට බාල කල ශිල්ප දිනිමි, උන් බලන්ට යෙමි" යි බොරු කීමෙන් අච්චුත තාපසයන් පහදවා ගෙණ එ ද

ය. ඒ පන්සැල ළඟ දෙවන දා උදැසන "හිමි! මම මඟ කියමි" යි කී කල තාපසයෝ දකුණත ඔසවා කියන්නාහු "බමුණ! තෙල පෙණෙන්නේ ගඳමදන් පව්ව ය; තා එගල් පාමිටින් ගිය කල දුම් ය, අසු ය, බුබුළු ය, මූරුත ය, කිහිරි ය, සල කොහොඹ ය, වල් දමුණු ය, මාලුවා ලිය ය, අඹ ය, ගිවුළු ය, කොස ය, දඹ ය, බුළු ය, අරළු ය, ඇඹුලු ය, ඇසතු ය, රත්වන් තිඹිරි ය, නුග ය, කෙළ කිඳි ඇසතු ය, මීගස ය, දිඹුල ය, වල්පලු ය, කිරිපලු ය, හෙල ගෙඳ ය, මිදි ය, ඉඳි ය, තල ය, පොලය යනාදි මේ කී රුක්හු පලින් ගෙණ සිටිනාහ. එයින් මිහිරි වූ පකාපැකින් කකා ඒ වෙසතුරු රජහු මි තකා තා ගිය කල, තව ද සුළු කෙළිඳ ය, මහ කෙළිඳ ය, උපුල් කොළ ය, තුම්රලා ය, පළලු ය, කීණ දෙඹ ය, මහ දෙඹ ය, කොබ ලීල ය, එරහැන්ද ය, හෝමි ගස ය, කොහොම් ගස ය, කළුවැල ය, බදුළු ය, අවරි ගස ය ලතාවැලි ය, සුළු කුඹුක ය, මහ කුඹුක ය, පියා ගස ය, ඇලව ය, බක්මී ය, කොහොඹ ය, දෙල්දුම් ය යනාදි මෙ කී රුක්හු මල් පිපී බමරුන් විසින් ගැවසිගෙණ සිටිනාහ.

එයින් සුවඳ මල් බිඳ බිඳ සිහිල් සෙවන සැතපී සැතපී, මිහිරි දිය කඳුරු වලින් පැන් බී බී, බමුණ! තා ගිය කල සිවුරැස් පොකුණ දක්නෙහි ය. ඒ පොකුණෙහි දුවාන සේ සුදු වූ කැලබෑඳ ඇම්දූනා මස්කැලන් විසින් ගැවසී ගත්තේ ය. මහවිල නම් ය; කුදුහැල, හුරු හැල, බිම් මගළුහැල යන තුන් ජාතියෙහි හැල් ය, උපුල, හෙළ පියුම්, හෙළඹුල, හෙල්මැලි ය, බිල ය, දියකුර ය යනාදි දියෙහි නැංගම්නා ගසිනුත් ගැවසී ගත්තේ ය. තව ද: බමුණ! ඒ විල දිය කෙළවර නානා රුක්හු මල්පිපී බමරුන් විසින් ගැවසීගෙන සිටිනාහ. ඔහු කිනම්හ යත්:—කොළොම්, පඹලු, කොබලීල, අගුණු, වැල් කිණිහිරි, කලුසු, ඇසතු, කරඳ, එරබදු, නා, ඇට්මර, මහරි, හෙළ කොබලීල, පියුම්ගස්, මහනමුඩ, සිහින් නමුඩ, රත්නික, හෙළනික, මහනික, සුළුනික, කළුනික, පියාගස, පගුරු, මුහුලු, සල්මල්, මූරුගා, දුනුකේ, වැටකේ, කරාකේ, කිණිහිරි, කනේරු, කුඹුක්, පතුක්, කසකැල, ඇත්දෙමට, රුක්අත්තන, කදුරු, ඔහඹු, දුනුවලා, තිට්ග, කිරමසු, වරණ, අසු සිවල්, හීන්සලු, හෙළවසු, වැසි කලු මරණ යනාදි මෙ කී රුක්හු මල් පිපී බමරුන් විසින් ගැවසී ගෙණ පිදූ මලසුන් මෙන් පෙණෙති. තව ද: බමුණ ඒ විලට නුදුරු තෙන දියෙහි හොබෙහි පිපෙන්නා වූ තිසියම් මල් ජාතියකින් ගැවසී ගත් මිදෙල්ල නම් විලෙකුදු ඇත එ විල්හි දිය කෙළ වර ද බොහෝ ම හවගත්තා වූ දමුණු ය, සිහින්මුන ය, සිහින් මෑ ය, කවු සෙවෙල ය, ගෝසී සදුන ය, හිගුරු ය, රත්කරවු ය, සුළු

අත්ගෙන්ද ය, මහ අත්ගෙන්ද ය, හුරු කලත්ද ය, තල් කලත්ද ය, දුනුකේ ය, මැටකේ ය, ගිරිකොළමල ය, ඉන්දීවර ය, නිල්මල දීය මෙරළිය ය, මූඩුමුරු කැප්පෙට්ටි ය, කණේරු ය, කළුනලා ය, හෝ නලා ය, සුවඳ නලා ය, තුන් ජාතියෙහි කැකිරි ය, කැළුනු ය, තල් උස ඉඳි ය, මිටි තෙත ඕට මිටපුරා කා බිඳ කෑ හැකි එරහැන්ද ය, ගැමිසි සමි ච සිටි ගිරි මැඩි ය: කෑලිය ය, මීගෙන්ද ය, හෝපලු ය, තිවිති ය, ලබු ය, කොමඩු ය, ගිගිණි ය, දෙ කටු කරඹු ය, නිත්මල නාලිය ය, බුලත් මැල ය, කිරමුසු ය, කිරිවැල ය; වාගස ය, වැකොඳ ය, සීනිද්ද ය, බෝලිද්ද ය, දූසමන් ය, ගස්සමන් ය, යොහොඹු ය, වංබටු ය, ගඳහැඹුල ය, රත්සඳුන ය, විල්පලා ය, යනාදි මෙකී රුක්හු ද මල්පිපී බමරුන් විසින් ගැවසී ගෙණ සිටිනාහ.

තව ද: බමුණ! එබඳුවිල් තෙර ඉසාන කණ එක් පියවර සවහන් මගින් නා ගිය කල මිල් සුවඳ ය, රොත් සුවඳ ය, එල සුවඳ ය, කොළ සුවඳ ය, කඳ සුවඳ ය, මද සුවඳ ය, ගැට සුවඳ ය, මැලි සුවඳ ය, පොතු සුවඳ ය, මූල් සුවඳ ය යි යන දශවිධ වූ සුවඳින් ගැවසී ගත් කිමැසි මී, මැල්මී, තලිස් පතුරු, පුවඟු, කළු නීරිය, වංමුතු ය, ඕපලු ය, ලොත්සුඹුළු ය, සුවඳගඳ ඇති රත්වන් සඳුන, තුවරලා, වුංගහොල්, කවුපියුම්ගස්, නාරිගෙන්ද, උපුල්, කළුවැල්, දූහැලිය ගඳ, රූහැණීය ගඳ, දෙකසා, රත්සිරියෙල්, හිරිවේරි ය, ගුගුල්, ලමිහ, සොරම්ඩුලු, කපුරු, කිරිපලු යනාදි මේ කී සුවඳ රුක්හු බෙහෙව.

තව ද: බමුණ! ඒ වෙනෙහි සිවුපා සතුන් හා ලිහිණියෝ බෙහෙව; ඔහු කිනම්හ යත්:-සිංහයෝ ය, ව්‍යාඝ්‍රයෝ ය, වෙළඹුමුව පක්ෂි ය, ඇත්තු ය, එළුමුවෝ ය, පසද මුවෝ ය, රොහිත මුවෝ ය, සරබ මුවෝ ය, විසිතුරු මුවෝ ය, කෙහෙල් මුවෝ ය, දිමන මුවෝ ය, පතන මුවෝ ය, කැනහි මුවෝ ය, තොක්නහ මුවෝ ය, ගිජු ඇසෝ ය, පිනාබලල්ලු ය, රුක්නහවුවෝ ය, සෙමරු ය, මහදළ ගිරාතුඩුවෝ ය, වඳුරෝ ය, මහාකාළ වඳුරෝ ය, ගෝණෝ ය, අගබෙරලියෝ ය, වලස්සු ය, දඹගෝණු ය, කගවෙසණුවෝ ය, හූරෝ ය, මූගටියෝ ය, ලෙහෙනෝ ය, කලවැද්දෝ ය, වල්මීවු ය, බල්ලෝ ය, සුළු හුන පුපුළුවෝ ය, මහ හුන පුපුළුවෝ ය, ගොසී ය, මහ ගජකුඹුවෝ ය, කකරංග යන ලිහිණියෝ ය, දිවියෝ ය, සහවු ය, සුළු සිලිබිල්ලෝ ය, මහ සිලිබිල්ලෝ ය, බාසුරුසිංහයෝය, අටපාකෙවිල්ලෝ ය, රත්වත් මොනරු ය, හෙළපා අස්සු ය, සුමර

ලිහිණියෝ ය, වලිකුකුළෝ ය, කණකොක්කු ය, හෙල කොක්කු ය, බකුස්සෝ ය, කිරළු ය, කොස්වාලිහිණියෝ ය, දියකාවෝ ය, දිය වඩුලෝ ය, රත්කොරළුවෝ ය, ජීවං ජීවකයෝ ය, අගහැලි ලිහිණියෝ ය, පුරවි කෙවිල්ලෝ ය, ගුරුළු ය, බක මුහුණෝ ය, ඇට කුකුළෝ ය, කළු ලිහිණියෝ ය, කුකුළු ලිහිණියෝ ය, ගෝ ලිහිණියෝ ය, මහ වෙල්ලු ය, කෙවිල්ලෝ ය, කළු උකුස්සෝ ය, කබරුස්සෝ ය, පියවි හංසයෝ ය, ජවන හංසයෝ ය, දකුඩුවෝ ය, පරවියෝ ය, හැල්බොසියෝ ය, සක්වා ලිහිණියෝ ය යනාදි මෙකී සතුන් සතුටු ව බල බලා, බමුණා ගිය කල්හි සක්දෙවුරජහු විසින් මවා දෙන ලද දෙව්ලොවින් බව භාගයක් සේ රම්‍ය වූ වෙස්සන්තර රජ්ජුරුවන් වසන ලද ඒ අසපුවෙහි ශ්‍රී දක්නෙහිය'යි මෙසේ අච්චුතතාපසයන් කියන ලද්දා වූ මාර්ගසංඥාවෙන් මග නො වරදවා ගොස් මද්‍රි දේවීන් වනමුල් වනඵලාඵල සොයා වලට ගිය කල්හි මග බලා වැඩහුන් බෝසතුන් දැක පෙරට ම සිට:

"එථාචාරී මහා පුරෝ-සබ්බකාලං න බීයති,
එවං තං යාචිතාගඤ්ජං-පුත්තෙ මෙ දෙහි යාචිතො-යි

යනාදීන් ස්තුති කොට ඒ ජූජක නම් බමුණා දරුවන් ඉල්වූ වේලෙහි මසුරු සිතක් නො සිතා ප්‍රිය දරුවන් දෙදෙනා ලඟට කැඳවා ජාලිය කුමාරයන් දකුණත හා ක්‍රිෂ්ණජිනාවන් වමත හා අතින් අල්වා ගෙණ කමණ්ඩලායෙන් බමුණා අත පැන් වත්කොට ප්‍රිය වූ බුදුබව පතා දිළිඳු වූ ඒ බමුණාට දරුවන් දන් දුන් වේලෙහි ඒ ආශ්චර්යය දැක දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝනකඩ බොල් මහ පොළොව ගුගුරුවා මහී කාන්තාව කළ මහී ගජිතා නම් වූ පූජාව හා මහමෙර හා සත්කුලපර්වතන් නළුවන් සේ නමා නටා කළා වූ නෘත්‍ය පූජා හා, සදෙව්ලෝ දෙවියන් කළා වූ සාධුකාර පූජා හා, මහාබ්‍රහ්මයන් විසින් කරණලද අත්පොළසන් පූජා හා මෙසේ පස් වන මාරයෙහි අනන්ත වූ පූජා ලත් සේක

තව ද ඒ බමුණා දරුවන් දන් ගෙණ ගිය දෙවන දා උදෑසන ශක්‍රයා බමුණු වෙසක් මවාගෙණ අවුත් සිට "භවත! නිවහල්ලෙමි; හැල් කා විඩාව ගියෙමි. තෙපි බුදුසිරි කත පතා නම්, මේ මද්‍රි දේවීන් දූන් මට දන් දෙව" යි ස්තුති කොට ඉල්වූ වේලෙහි මාගේ ස්වාමිදරුවෝ "ඉය්යේ දරුදෙදෙනා දන් දුන්නෙම් වේ ද, අද මද්‍රි දේවි ය දිනිම නම් මම එකලා ව මේ වෙනෙහි අසරණයෙමි" යි

නො සිතා දනෙහි පසුබැස්මක් නැති ම ඒ බමුණා සන්තොෂයෙන් මුණ බලා මද්‍රිදේවීන් අත අල්වා ඒ බමුණා අත තබාපු වේලෙහි මහීකාන්තාව හා ශක්‍රාදී දෙවියන් විසින් කරණලද මහීගජ්ජිතාදි සවන වාරයෙහි පූජා ලත් සේක

තව ද බමුණා ගෙණ ගිය දරුවන් දූත ගලවා දෙලොස් අක්ෂෞහිණී මහ සෙනග ගෙණ මුණුබුරන් හා සමග වඞ්කගිරි පර්වතයෙහි බෝසතුන්ගේ පන්සැලට පිළිරජහු ගිය කල ඔවුනොවුන් දුටු සතුටින් සඳමහ රජ්ජුරුවෝ ය, පුසැ'ති නම් බිසොවු ය, මද්‍රීදේවි ය, වෙස්සන්තර රජ්ජුරුවෝ ය, ජාලිය කුමාරයෝ ය, ක්‍රිෂ්ණජිනාවෝ ය යි යන මේ රජ සදෙනා ඔවුනොවුන් පිට සිහත් වූ ශොකාගෙන් හඬා හී මූසපත් වූ වේලෙහි මුළු පොළොව ගුගුරුවා මීකන කරණලද සත්වනු වූ මහීගජ්ජිනා නම්වූ පූජාව ලත් සේක.

තව ද එම වේලෙහි සක්දෙව්රජහු විසින් කරණලද අටවන වූ පුෂ්කර වර්ෂා නම් වූ පූජාව ම ලත්සේක.

තව ද පිය රජහුගේ ආරාධනාවෙන් එම ද ඉසිවෙස් හැර රජවෙස් ගෙණ සත් දවසක් වනතෙළි කෙළ මහ පෙරහරින් සිය නුවරට වැඩ රජගෙට වන් ද දෙවියන් විසින් වස්වනලද නව වනු වූ සත්රුවන් වර්ෂාවකින් පූජා ලත්සේක.

මෙසේ මාගේ බුදුහු දහස්ගණන් ජාතිභෙදවල ඇවිද පාරමිතා බෙලෙන් නොඑක් පූජා ලදින් මේ එක ම වෙස්සන්තර ජාතියෙහි මහීගජ්ජිතා නම් වූ පූජා සතක, පුෂ්කර වර්ෂා නම් වූ පූජා වෙක, රුවන් වර්ෂා නම් වූ පූජාවෙකැයි නව මහා පූජාවක් ලත් හෙයිනු ත් මෙසේ වූ පූජා විදීමට සුදුසු හෙයිනු ත් මාගේ බුදුහු අර්හත් නම් වන සේක එසේ හෙයින් කියන ලදුයේ මැයි:

පූජා විසෙසං සහ පච්චයෙහි
යස්මා අරහං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං-ති.

මේ පූජාවලියෙහි අප බුදුන් සංසාර ගත ව ලද
ද්විතීය ජාතිභෙද පූජා කථා නම් වූ
සවන පරිච්ඡේදය නිමි.

සවන පරිච්ඡෙදය

තව ද: අප බුදුන් පසඳුව මහා විලොකනාවකාශයෙහි දී ලද සාධුනාද පූජා නම් කවරි? යත්;

මෙසේ මාගේ ස්වාමිදරු වූ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝ ධන පරිත්‍යාග ය, පුත්‍ර පරිත්‍යාග ය, භාර්‍ය්‍යා පරිත්‍යාග ය, අඞ්ග පරිත්‍යාග ය, ජීවිත පරිත්‍යාග ය යන පසඳුව මහා පරිත්‍යාගයෙහි කොටිප්‍රාප්ත ව ලොකාර්ථචර්‍ය්‍යා ය, ඥාත්‍යර්ථ චර්‍ය්‍යා ය, බුද්ධි චර්‍ය්‍යා ය යන ත්‍රිවිධ වූ චර්‍ය්‍යායෙහි කෙළ පැමිණ, දාන ය, ශීල ය, නෙෂ්ක්‍රම්‍ය ය, ප්‍රඥා ය, වීර්‍ය්‍ය ය, ක්ෂාන්ති ය, සත්‍ය ය, අධිෂ්ඨාන ය, මෛත්‍රී ය, උපෙක්ෂා ය යන දශවිධ වූ පාරමිතාවන් හා, දශවිධ වූ උප පාරමිතාවන් හා, දශවිධ වූ පරමාර්ථ පාරමිතාවන් හා, යන මේ සමත්‍රිංශත් පාරමිතා නමැති සාගරයෙන් ගොඩ නැඟී විශ්වන්තරාත්ම භාවයෙන් චුත ව සියලු බුදුන්ට දෙවන ආත්මභාවයෙහි විසිපුර වූ තුසීපුරයට නැඟී, තුන්ගවු උස දිව්‍යශරීර ඇති ව, ගවු උස මිණි වොටුනු ඇති ව, සැට ගැලක් පිරූ දිව්‍යාභරණයන් ධරා, යොදුනාලක් සුවඳ විලෙවුන් ගෙණ, අහස් ගඟ සේ මුතුහරක් ධරා, අප්‍රමාණ වූ දිව්‍යශොභාවෙන් ශොභාවත් ව, කෙළගණන් දිව්‍යස්ත්‍රීන් පිරිවරා, මුළු ලොවට නැගූ ජය කේතුවක් සේ, තුන්ලෝ නමැති වොටුන්නෙහි සිළුමිණිරුවනක් සේ, තුන්ලෝ තිලකයක් සේ, නේ සුවහස් දිව්‍යරාජයන්ගේ කිරුළු කුළු මිණී රසින් තමන්ගේ ශ්‍රීපාදයන් බබුළුවා, සද්ධර්මදෙශනාවෙන් දිව්‍යබ්‍රහ්මයන් ප්‍රීති කරවා, සත් පණස් කෙළ සැට ලක්ෂයක් හවුරුදු ආයුෂ ශ්‍රී විඳ සන්තුෂිත නම් දිව්‍යරාජ ව ඒ තුසී පුරයෙහි වැඩ වසන සේක.

ලොකයෙහි: කල්ප කොලාහල ය, චක්‍රවර්ති කොලාහල ය, බුද්ධ කොලාහල ය, මඞ්ගල කොලාහල ය, මොනෙය්‍ය කොලාහල ය යි පස් කොලාහලයෙක් ඇත. ඒ කෙසේ ද? යත්;

කල්ප කොලාහල නම් කවරි? යත්;

සිත්තෙන් හෝ දිනෙන් හෝ සුලඟින් හෝ කල්ප විනාශයට පූර්වභාගයෙහි ලක්ෂයක් හවුරුදු තිබිය දී ලොවට ඉෂ්ට වූ කාමාවචර දේවතා කෙනෙක් රතක් හැඳ රතක් එකාංශ කොට ලා එක් කෙණෙහ පත් තබා, ඉසකේ විදා පිට හෙළා, කඳුළු වැගිරෙණ ඇස් ඇති ව මෙසේ අවමඟුල් වූ වෙසක් ගෙණ කෙළ ලක්ෂයක් සක්වළ ඇවිද "පින්වත් වූ සත්ත්වයෙනි! හවුරුදු ලක්ෂයක් ගිය කල කප නස්සී, කෙළ ලක්ෂයක් සක්වළගල් නස්සී, කෙළ

ලක්ෂයක් මහ පොළෝ නස්සී, කෙළලක්ෂයක් මෙරගල් නස්සී, කෙළ ලක්ෂයක් හිමවු කුළු නස්සී, සත් කෙළ ලක්ෂයක් කුලපව්වෝ නස්සී, ස කෙළ ලක්ෂයක් දෙව්ලෝ නස්සී, සද කෙළ ලක්ෂයක් හිර සඳ නස්සී, සමහර බඹලෝ පමා නස්සී. ඒ කල්පාන්ත විනාශයෙන් ගැලමෙනු කැමැත්තෝ නම් මවුන්ට මෙහෙ කරව, පියන්ට කීකරු වව; කුලදෙටුවන් පුදව. පස් පව් නො කරව. පන්සිල් රකුව" යනාදීන් ඔවා තෙපුලෙන් අනුශාසනා කොට ඇවිදිති.

එ කල කෙළලක්ෂයක් සක්වළ වසන හැම සත්වයෝ ම ලක්ෂයක් හවුරුද්දෙන් කප නසී ල යි භීතිමත් ව "අහො දුක්ඛං, අහො දුක්ඛං" යනාදීන් මහත් වූ කොලහල කෙරෙති. මේ කොලාහලය කෙළ ලක්ෂයක් සක්වළ මුළුල්ලෙහි බඹලොව ගසා පැතිර සිටී. මේ කල්ප කොලාහල නම.

චක්‍රවර්ති කොලාහල නම් කවරි? යත්;

චක්‍රවර්ති රජකු උපදනාට පූර්වභාගයෙහි හවුරුදු සියයක් තිබියදී කාමාවචර දේවතා කෙනෙක් රත්වත් වූ සළුවක් හැඳ, රත්වත් වූ සළුවක් එකාංශ කොට ලා, රත්වත් වූ සුවඳ විලෙවුන් ගෙණ රත්වත් පලඳනා හා මිණි වොටුනු ධරා මෙසේ රජමගුල් වෙසක් ගෙණ චක්‍රවර්තීන් උපදනා මේ මගුල් සක්වළ ම සතර මහා වීථිය වටා ඇවිද "පින්වත් වූ ජනයෙනි, සියක් අවුරුදු ගිය කල සක්විති රජෙක් මේ සක්වළ උපදිදී; ඔහු උපන් කල රා පිය නො හැක්ක; බොරු කිය නො හැක්ක; සොරකම් කල නො හැක්ක; සතුන් මැරිය නො හැක්ක; පරදාරයෙහි අනාචාර කල නො හැක්ක; යමෙක් කමා රහසත් මේ පස් පවින් පවක් කෙළේ නම් ඔවුන් ඉස් පැලී යෙයි; මතු තොප පස් පව් නො කිරීමට දන් පවත් අභ්‍යාස කරව, පන්සිල් රකුව" යනාදීන් ඔවා තෙපුල් කිය කියා මුළු සක්වළ වටා ඇවිදිති.

එ කල මේ මුළු සක්වළ වැසියෝ "සියක් හවුරුදු ගිය කල සක්විති රජෙක් උපදී ල; සක් රුවනෙක් නැගේ ල, චින්තාමාණික්‍ය රත්න ය ද ආකාශයෙන් ඒ රජහුගේ දොරට තෙමේ ම ඒ ල; උපොසථ කුලයෙන් ආකාශචාරී වූ මඞගල හස්තිරාජයෙක් ඒ ල; වලාහක කුලයෙන් අස් රුවනකුත් ඒ ල; උතුරුකුරු දිවයිනින් අගබිසෝරුවනක් දෙවියෝ ගෙණ දෙත් ල; දහසක් පුතුන් හා සමග ඒ රජ පුත්‍රරුවනකුත් ලැබේ ල; ඒ පුත්‍රයා සතිස් යොදුනක හැවසී සිටි රජහුගේ මහා සේනාවෙහි හැම දෙනා රුචි

රුචි වූ බාද්‍ය භෝජ්‍යාදි හැමදෙනා කැමැති කැමැති වස්ත්‍ර හා ආභරණයන් දී මහ පිරිස සන්තොෂ කළා ල; යොදුනක් තැන නිධාන දක්නා දිවස් ඇති සිටු රුවනෙකුත් උපදී ල; ඒ සක්විති රජ හිරු සඳු සේ වූ ගමින් ඇත්තේ ල; සතර මහා සෘද්ධි ආදී වූ මහ පින් ඇත්තේ ල" යි මේ මුළු සක්වළ වැසියෝ සාධුකාර නාද පවත්වා මහත් වූ කොලාහල කෙරෙති. මේ චක්‍රවර්ති කොලාහල නම.

බුද්ධ කෝලාහල නම් කවරේ? යත්;

බුදු කෙනකුන් උපදනාම දහසක් හවුරුදු තිබියදී ශුද්ධාවාසවූ දේවතා කෙනෙක් සුදු පිළියක් හැඳ සුදු පිළියක් එකාංශ කොට ලා සුදුමල් පැලඳ සුදු විලෙවුන් ගෙණ ශුභ මඟුල් මෙසක් ගෙණ "පින්වත් වූ සත්ත්වයෙනි! මෙ තැන් පටන් දහසක් හවුරුදු ගියා කල ලෝවුතුරා බුදුකෙනෙක් ලොව ඉපැද දහම්වැසි වස්වා සසර ගිම් නිවා නිවන් පුරයෙහි දොර හරිති. ඒ බුදුන්ගේ බුදුරූ හා බුදු සිරි දක්නා සත්පුරුෂ කෙනෙක් පඤ්චානන්තරිය කර්මයන් නො කරව; මවුපියන්ට ආක්‍රොශ පරිභව නො කරව; නියත මිථ්‍යා දෘෂ්ටි නො ගණුව; පඤ්චශීල ය රක්‍ෂා කරව; අට මහ නරකයෙහි උපදනා පව් නො කරව; අරූතල අසංඥ තලයෙහි උපදනා ව්‍රතයන් නො ගණුව; මෙ කී තැන උපන්නාහු බුදුන් නො දකිති. පන්සිල් පුරව; අටසිල් පුරව; දසපින්කිරිය වත් පුරම; ත්‍රිවිධ වූ සුචරිත ධර්මයන් පුරව; ඒ බුදුන් දක්නා සේ පතව"යි යනාදීන් කණ මී ඕනා සේ ප්‍රිය වූ තෙපුල් කියා කියා දස දහසක් සක්වළ වටා ඇවිදිති.

එ කල දසදහසක් සක්වළ මනුෂ්‍යයෝ ද, දෙවියෝ ද, බඹහු ද, ඒ තෙපුල් අසා "දහසක් හවුරුද්දෙන් බුද්ධදිවාකරයෙක් නැගේ ල; ලොව මොහාන්ධකාර දුරු වේ ල; බොහෝ කලක් එළි ව තුබූ අපා ය මාර්ගයෙහි [1]අකුල් හේ ල; බුද්ධාන්තර කාලයක් මුළුල්ලෙහි වල් ව පියා තුබූ නිවන් මාර්ග ය එකහෙළි වේ ල" යි කිය කියා සන්තොෂ වූවාහු අත්පොළ සන් දී, ඔල්වර සන් දී, අසුරුසන් දී සාධුනාද පවත්වා ඒ මාගේ සවාමිදරුවානන් දහසක් හවුරුද්දෙන් උපදිති යි යන බස් අසා දස දහසක් සක්වළ පාතාලය පටන් බ්‍රහ්මාණ්ඩය ගසා එකඝොෂ කොට බුද්ධකොලාහල නම් වූ මහා පූජාවක් කෙරෙති. එසේ හෙයින් අහීත් නම් වන සේක. මේ බුද්ධ කෝලාහල නම.

1. අකුල්හෙලා.

මඞ්ගල කොලාහල නම කවරේ? යත්;

බුදුන් මඞ්ගල සූත්‍රය දෙශනා කරන්නාව පූර්ව භාගයෙහි දෙලොස් හවුරුද්දක් තිබියදී එසේ ම කාමාවචර දෙව් කෙනෙක් ශුභ මිඟුල් වෙසක් ගෙණ මනුෂ්‍යපථයෙහි ඇවිද "පින්වත්නි! මෙයින් දෙලොස් හවුරුද්දක් ගිය කල බුදුන් මිඟුල් වදරති; එකල අසඞ්ඛ්‍යයක් ප්‍රාණීහු අමාමහ නිවන් දකිති; තෙපි තෙපි ද මඟුල් අසා නිවන් දැක සසරින් ගැලවෙව" යි ප්‍රිය තෙපුල් කියති. එකල සත්ත්වයෝ "දෙලොස් හවුරුද්දක් ගිය කල මිඟුල් අසා සසරින් ගැලවෙම්හ"යි සාධුනාදයෙන් කොලාහල කෙරෙති. මේ මඞ්ගල කොලාහල නම.

මොනෙය්‍ය කොලාහල නම කවරේ? යත්;

එසේ ම කාමාවචර දෙව් කෙනෙක් මනුෂ්‍යපථයෙහි ඇවිද "පින්වත්නි! මෙයින් සත් හවුරුද්දක් ගිය කල එක්තරා එක් මහණ කෙනෙක් බුදුන් කරා එක තැනට පැමිණ මොනෙය්‍ය පිළිවෙත් නම් වූ බුද්ධාකාරක ධර්මයන් විචාරති. එකල බුදුහු මොනෙය්‍ය පිළිවෙතින් ධර්මදෙශනා කොට අසඞ්ඛ්‍යයක් ප්‍රාණීන් සසරින් ගලවති. තෙපි තෙපි ද එදා සසරින් ගැලවෙව"යි ඔවා තෙපුල් කියති. එකල සත්ත්වයෝ සාධුනාදයෙන් කොලාහල කෙරෙති. මේ මොනෙය්‍ය කොලාහල නම.

මේ පස් කොලාහලයන් අතුරෙන් බුද්ධ කොලාහලය පහළ වූ කල දස දහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයෝ "බුදු වන්නා වූ වීරපුරුෂයානෝ කවරෙක් දෝ හෝ"යි සොයන්නාහු පාරමිතා සාගරයෙන් [1]නැඟී තුසී පුරෙහි ආයුඃශ්‍රී වළඳා සද්ධර්මශ්‍රීන් වැස පංච මහා පූර්ව නිමිත්තයන් පහළ වූ ලොකනාථයාවන් ඒ මාගේ බොධිසත්ත්වයන් දැක දස දහසක් සක්වළ දස දහසක් ශක්‍රයෝ ද, දස දහසක් සුයාමයෝ ද, දස දහසක් සන්තුෂිත දිව්‍යයෝ ද, දස දහසක් සුනිර්මිත නම් දිව්‍යරාජයෝ ද, දස දහසක් පරනිර්මිත නම් දිව්‍යරජයෝ ද, දස දහසක් සහම්පති මහා බ්‍රහ්මයෝ ද, තොප හැම බ්‍රහ්මරජයෝ ද යි යනාදි මෙ කී දිව්‍යරාජයෝ තමන් තමන්ගේ දිව්‍ය පර්ෂද් හා සමග මේ මඟුල් සක්වළ තුසී පුරයෙහි රුස්ව මාගේ සවාමිදරු වූ සන්තුෂිත නම් වූ බුද්ධාංකුරයානන් වටා දොහොත් මුදුන් දී සිටඃ

කාලොයං තෙ මහාවීර උප්පජ්ජ මාතුකුච්ඡියං
සදෙවකං තාරයන්තො බුජ්ඣස්සු අමතං පදං–යි.

---

1. ගැළවී

යන මේ ගය කියා ''ස්වාමීනි, බුද්ධාංකුරයානෙනි! සමතිස් පෑරුම් පුරා සාරාසංඛ්‍යය කප ලක්‍ෂයක් මුළුල්ලෙහි සංසාරයෙහි ඇවිද පින් රැස් කළා වූ තොප විසින් ශක්‍ර සම්පත්, මාර සම්පත්, බ්‍රහ්ම සම්පත්, චක්‍රවර්ති සම්පත් ප්‍රත්‍යෙක බොධි සම්පත්, ශ්‍රාවක බොධි සම්පත්, එක කාලෙකත් ප්‍රාර්ථනා නො කරණලද; ඉස්, ඇස්, මස්, ලේ, අඹුදරුවන් දන් දුන් තුඹ විසින් බුදුබව ම ප්‍රාර්ථනා කරණලද; එසේ හෙයින් දැන් තුඹගේ පාරමිතාවෝ කුළුගත්හ පස් බුදු කෙනෙකුන්ගෙන් උතුම් වන මේ මහා භද්‍ර කල්පයෙහි කකුසඳය, කොණාගමන ය, කාශ්‍යප ය යි තුන් බුද්ධාන්තරයක් ශොසින් දූන් මේ තුඹ බුදු වන්නා වූ කාලය ය, බුදුන්ගේ චාරිත්‍ර වූ මවුකුසෙක පිළිසඳ දෙවිමිනිසුන් සසරින් ගොඩ නඟා ලොවුතුරා බුදු ව නිවන්පුර පුරව''යි මෙසේ ඒ දස දහසක් සක්වළ දෙවියෝ ආරාධනා කළහ. එ කල මාගේ බොධිසත්ත්වයෝ දෙව්බඹුන්ගේ ආරාධනා නො පිළිගෙණ ම කාලය, ද්වීපය, දෙශය, කුලය, ජනෙතතිය, ආයුෂය, යන මේ පංච මහා විලොකනයන් කළසේක.

පංච මහා විලොකන නම් කවරහ? යත්;

යම් කාලයෙක මනුෂ්‍යයන්ගේ ආයු ලක්‍ෂයක් හවුරුද්දට බොහෝ වී නම් එ කල ජරා මරණ මඳ හෙයිනු ත්, රොගාන්තරාය, බොහෝ නො වන හෙයිනු ත්, මනුෂ්‍යයන්ට දුක් මඳ වෙයි. දුක් උදෙසා ම සෑදහෑ උපදනා හෙයිනු ත්, දුක් මඳ වීමෙන් කුසල් සිත් මඳ වෙයි. තිලකුණු සලකුණු කරවා ගිවිය්මා ලිය නො හැක්ක. ඒ තිලකුණෙහි පිහිටුවා ලිය නො හැක් කෙනෙන් සත්ත්වයාට මාර්ගඵල දී ලිය නො හැක්ක මේ කාරණයෙන් ලක්‍ෂයක් හවුරුද්දට වඩනා ආයු කාලයෙහි බුදුන් නූපදනා හෙයින් ඒ බුදුවන්නට කාල නම් නො වෙයි.

තව ද යම් කාලයෙහි මිනිස් ලොව ආයු සියක් හවුරුද්දට මඳ වී නම් ඒ ශීත ආයු කාලයෙහි අකුශලයෝ බෙහෙව, කුසල ධර්මයෝ මඳ වෙති. ශීතායුකාලයෙහි උපන් සත්ත්වයෝ කුසල් කරමින සි වරදවා අකුසල් කෙරෙති. කුසල් සිත සිතා අමායෙහි [1]සිරිගි ඕනාවුන් සේ අකුසල් සිතති කුසල් අන අසා අකුසල් අසති. ඔවා නෙපුල් නොගිව්සති බණ කථා අසන කල දියෙහි ඇඳලූ රෙඛාව පසු පස්සේ මැකී යන්නා සේ ඇසූ ඇසූ බණ සිතින් මැකීගෙණ යෙති. මෙසේ සත්ත්වයන්ගේ සිත් විකල හෙයින් මාර්ග

1. රිශි.

එල දී ලිය නො හැක්ක. මේ මේ කාරණයෙන් සියක් හවුරුද්දට හීනායු කාලය ද බුදුන් ඉපැදීමට කල් නො වෙයි බලන්නා වූ බොධිසත්ත්වයෝ එ කල මිනිස්ලොව එක්සිය විසි හවුරුද්දට ආයු දැක බුදුන් උපදනා කාලය මේ යයි දුටුසේක. මේ පළමු වන කල් බැලුම නම.

දීප විලොකන නම් කවරී? යත්;

මේ මඟුල් සක්වළ සත් දහසක් යොදුන් අපරගොයාන ද්වීපය හා පන්සියයක් කොදෙව් දැක, අට දහසක් යොදුන් උත්තරකුරු ද්වීපය හා පන්සියයක් කොදෙව් දැක, සත් දහසක් යොදුන් පූර්ව විදෙහ දිවයින හා පන්සියයක් ක්ෂුද්‍රද්වීප දැක, දස දහසක් යොදුන් ජම්බුද්වීපය හා පන්සියයක් ක්ෂුද්‍රද්වීප දැක, මෙසේ සතර මහා ද්වීප හා දෙ දහසක් කොදෙව් දැක "මා බුදු වන ජාතියෙහි උත්පත්ති යට සෑවර ද්වීපයෙක් උතුම් දෝ හෝ" යි පරීක්ෂා කොට අනන්ත පරිශුද්ධ වූ බුදුන්ගේ උත්පත්තිස්ථාන වූ ඒ ජම්බුද්වීපයෙහි උපදිමි" යි දුටුසේක. මේ දෙ වන ද්වීප විලොකන නම

දෙස විලොකන නම කවරී? යත්;

තව ද: ඒ ජම්බුද්වීපය නම් දස දහසක් යොදුන එයින් තුන් දහසක් යොදුන් තැන් හිමාලය පර්වතය වී ය. තව ද සාර දහසක් යොදුන් තැන් සාගරයෙන් ගිලීන. තුන්තුන් දහසක් යොදුන් තැන් දඹදිව නම. මේ දඹදිව නම් සයානූකෙළක් පවුන් ගමින් හා, නවානූලක්ෂයක් ද්‍රෝණ මුඛයෙන් හා සපණසක් රුවන් ආකරයෙන් හා සමෘද්ධ වී ය. තව ද උත්තම කාලයෙහි එක්ලක්ෂ නවානූදහසක් පමණ රාජධානි ඇතියේ ය. මධ්‍යම කාලයෙහි සුවාසූදහසක් හෝ තෙසැටදහසක් ශ්‍රී නගරයෙන් හොබනේ ය. පශ්චිම කාලයෙහි එක්සියයක් පමණ රාජධානි ඇති ව මෙසේ සෑදී එක මඟුල්ගෙයක් සේ ශොභාව ජය ශ්‍රී මහා බොධිමණ්ඩලය නම් දඹදිවට නාභිමණ්ඩලයක් සේ මැද පිහිටියේ ය. එසේ වූ බොධිමණ්ඩලයට පූර්ව දිග්භාගයෙහි සසියයක් ගවු ගිය තැන කජංගල නම් නියම් ගමෙක් ඇත. එ ගමට නැගෙණහිර ඉතා මහත් වූ ශාලද්‍රැමයෙක් ඇත. තව ද ඒ බොධිමණ්ඩලයට අග්නි දිග්භාගයෙහි සලලවතී නම් ගඞ්ගාවෙක් ඇත. තව ද බොධිමණ්ඩලයට දක්ෂිණ දිග්භාගයෙහි පන්සියයක් ගවු ගිය තැන සෙඛතකර්ණිකා නම් නියම් ගමෙක් ඇත. තව ද ඒ බොධිමණ්ඩලයට පශ්චිම දිග්භාගයෙහි ස සියයක් ගවු ගිය

කල ථූන නම් මහ බමුණුගමෙක් ඇත. තව ද ඒ බොධි මණ්ඩල යට උත්තරදිග්භාගයෙහි පන්සියයක් ගවු ගිය කල උශීරධ්වජ නම් පර්වතයෙක් ඇත. නැගෙණහිර කී සල්ගස පටන් බටහිර, කී බමුණු ගමට එක්දහස් දෙසීයයක් ගවු ය. දකුණුදිග කී සෙවත කර්ණිකාව පටන් උතුරුදිග කී පර්වතයට දහසක් පමණ ගවු ය. මෙසේ අඟමින් තුන්සියයක් යොදුන් හා විතරින් දෙසිය පණසක් යොදුන් හා වටින් නව සියයක් යොදුන් තැන මධ්‍ය මණ්ඩල නම.

තව ද මේ බොධිමණ්ඩලයට පූර්ව දිග්භාගයෙහි හස්තිපුරය, මාතඞ්ගය, සෞවීරය, සෞරාෂ්ට්‍රය, පුණ්ඩරීකය, සාලිඛණ්ඩය, සුප්පාරකය යි යන රුවන් ආකර උපන්නා වූ උතුම් වූ මේ මහ නුවර සත පිහිටියේ ය. තව ද මේ බොධිමණ්ඩලයට අග්නි දිග්භාගයෙහි සැවැත් නුවරය, ජයතුරා නුවරය, සාගල නුවරය, කුසාවතී නුවරය, රජගහා නුවරය, මිහුලු නුවරය යන මේ මහ නුවර සය සලලවතී නම් ගඞ්ගාව දිගාවෙහි පිහිටියේ ය. තව ද මේ බොධිමණ්ඩලයට දක්ෂිණ දිග්භාගයෙහි අශ්වපුරය කුල සවුවාය, අයොධ්‍යා පුරය, ඉඳිපත් නුවරය, කුරුරටය, බරණැසය, කිඹුල්වතය යන මේ මහ නුවර සත පිහිටියේය. තවද මේ බොධිමණ්ඩලයට පශ්චිම දිග්භාගයෙහි සිංහපුරය, අරිෂ්ට පුරය, විශාලා මහා නුවරය, කොසඹෑ නුවරය, පැලලුප් නුවරය කණී ගෞඩය, දද්දරපුරය යන මේ උතුම් වූ සත් නුවර ථූන නම් බමුණුගම දිගාවෙහි පිහිටියේ ය. තව ද මේ බොධිමණ්ඩලයට උතුරැ දිග්භාගයෙහි උත්තර පඤ්චාල නුවරය, රොජය, වස්සානය, තක්සලා නුවරය, කුසිනාරා නුවරය, තාම්‍රපර්ණී නුවරය, ගෞඩ දෙශය, ගන්ධාර දෙශය යි යන මේ අට මහ නුවර පිහිටියේ ය. මේ පන්තිස් මහ නුවර මධ්‍යමණ්ඩලයට, ඇතුළත් මය මේ මහ නුවර නම් චක්‍රවර්ති රජුන් හා මහ ධන සිටුවරුන් හා මහෙශාඛ්‍ය දෙවියන් හා අසූ මහ සව්වන් හා පසේබුදුන් හා ලොවුතුරා බුදුන් හා මෙ කී උත්තමයන්ගේ ම උත්පත්තිස්ථානයෙක.

මෙයින් පිටත් බංගාලය, අරමණය, වගුරටය, කොඩකණය, කම්බුදෙශය, සින්ධුය, සිහලය, නෙපාලය, ගුර්ජය, සිංගුරය, දෙළුවරය, චෙගගුය, කණ්ණාටය, ලාටය, පරලාවය, තිමිරදෙශය, කාකය, යවනය, තුරගය, අඳුය, මිදුය, කාම්බොජය, පුලොපාලය, කුරුකය, ජත්තිශය, කර්ණාරය, ...ඛය, වල්ලූරය.

මලයුරය, පංඩුරය, චීනය, මහා චීනය, කාශ්මීරය, යොනකය, බබ්බරය, ශබරය, වඞ්ගරය, චීරය, කලිඞ්ගය, පූරණය, චෝළය, පාණ්ඩ්‍යය යනාදි මේ සියලු දේශ මධ්‍යමණ්ඩලයෙන් පිටත් වූ ප්‍රත්‍යන්ත දේශ නම්. මේ දෙශවල බුද්ධාදීහු නූපදනාහුය.

එසේ හෙයින් බුදුන් උපදනා වූ මේ මධ්‍යමණ්ඩලය නම් අනන්තාපරිමාන්ත වූ සක්වළ වලට ද, මෙම සක්වළ තො සියන ලද සෙසු දිවයින්වලට ද, දෙව්ලොව ද, බඹලොවට ද, වඩා මෙම මධ්‍යමණ්ඩලය ම උතුම්.

එසේ හෙයින් මාගේ ශ්‍රී මහා බොධිසත්වයෝ "උතුම් වූ මේ මධ්‍යදේශයෙහි ම උපදිමි"යි දුටුසේක. මේ තුන් වන දෙස විලොකන නම.

කුල විලොකන නම් කවරීයත්;

හැම සම්‍යක්සම්බුද්ධවරයෝ ම ගොවි කුලෙහි හෝ වෙළඳ කුලෙහි නූපදනාහුය. බ්‍රාහ්මණකුලෙහි හෝ රජකුලෙහි උපදනාහු ය. යම් කාලෙක රජදරුවෝ බමුණන්ට වඳිත් නම් එ කල බුදුහු බමුණු කුලෙහි උපදනාහු ය. යම් කාලෙක බමුණෝ රජ දරුවන්ට වඳිත් නම් එ කල බුදුහු රජකුලෙහි උපදනාහු ය. එසේ හෙයින් "බමුණු කුල ය උතුම් දෝ හෝ රජකුල ය උතුම් දෝ හො" යි මිනිස් ලොව බලා"දැන් රජ කුලය උතුමැ"යි දැක මේ සමයෙහි දඹදිව් තෙලෙහි තෙසැට දහසක් රාජධානිවල තෙසැට දහසක් රජුන් අතුරෙන් කවර නම් රජෙක් බුදුවෙතෙණ කුත්ට පිතෘසථානයෙහි සිටිම්"යි කරණලද ප්‍රාර්ථනා ඇති ව කප් ලක්‍ෂයක් පැරුම් පුරා සිටියේ දෝ හෝ"යි බලන්නා වූ මාගේ බොධිසත්වයෝ කපිලවස්තු නම් පුරයෙහි ශාක්‍යවංශ නමැති ප්‍රාසාදයෙහි හැඟු ජයකෙතුවක් වැනි වූ උභයකුල පරිශුද්ධ ශුද්ධොදන නම් නරපතිහු දුටුසේක.

එ රජ කෙසේ උභයකුල පරිශුද්ධ වී දැ?යත්; එහි පිළිවෙල කථාව මෙසේ දතයුතු.

ප්‍රථම අනන්‍යකල්පයෙහි සූර්‍ය්‍ය පුත්‍ර මහාසම්මත නම් ඖපපාතික රජෙක් වී ය. ඒ රජ මහාජනයාගේ සම්මතයෙන් පලමු වන අභිෂෙකයට පැමිණි හෙයින් මහාසම්මත නම් වී ය. ඒ රජ තෙම හිරුරැස් කලඹක් බඳු වූ සියලඟ ආලෝක ඇතියේ ය. ආකාශයෙහි පලක් බැඳ වැඩහිඳ සියලු ජනයන්ට අනුශාසනා කරණ මහත් වූ සෘද්ධි ඇතියේය. විද්‍යාධරයෝ සතර දෙනෙක් කඩු ගෙණ රජුට සතර දිග රකවල් ගෙණ සිටිනාහ. ඔහු සියලඟින් නික්මුත්

දිවසඳුන් සුවඳ හාත්පසින් සතර ගව්මක් තැන් පැතිර සිටියේ ය. ඔහු බැණ නැගී බස හා සමග මූඛයෙන් නික්මුත් මහනෙල් මල් සුවඳ යොදනක් තැන් දිවෙ යි. මෙසේ වූ සතර මහා සෘද්ධීන් රාජ්‍යය කරන්නා වූ ඒ රජ ජරා විළිපිළියක් නැති ව රෝගාදි ව්‍යසනයකුත් නැති ව පුත්‍රදාරාදි ශෝකයකුත් නැති ව අසංඛ්‍යයක් හවුරුදු මුළු දඹදිව රාජ්‍යය කෙළේ ය. එ සමය නම් සියලු සතුන්ට ම අසංඛ්‍යායු සමය ය. එ කල අකුශල ධර්මයෝ නමා ම නැත. එසේ හෙයින් කුශල ධර්මයන්ගේ නිෂ්ඵලබක භාවයෙන් සත්ත්වයෝ උපන් කල් නො දනිති. මියන කල් නො දනිති. ජරා විළිපිළි නැත. අජරාමරයන් මැනියන. දෙව්ලොම දෙවියන්ට පවා ආයු මඳ ය යි අපහාස කරන්නාහ. එසේ හෙයින් එ කල මිනිස්ලොව දෙව්ලොවට ත් වඩා ආයු සම්පත්තීන් මහනේය. එ සමයෙහි සිවුපාවෝ, සිංහයන් රජ කළහ. පක්ෂීහු හංසයන් රජ කළහ. දියෙහි මීන්හු, ආනන්ද නම් මත්ස්‍යයා රජ කළහ. යටත් වසයෙන් කුරුකුහුඹුවෝ දක්වා තමත් තමන්ට රජුන් ඇති කළහ. එහි විභාග ඒ ඒ ජාතක සූත්‍රාදී පූර්වකථාවලින් බලා දතයුතු.

පසු ව ඒ මහාසම්මත රජහුගේ පුත් රෝජ නම් රජ ද, එසේම අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍යය කෙළේය. ඔහු පුත් වරරෝජ නම් රජ ද, අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍යය කෙළේ ය. ඔහු පුත් කල්‍යාණ නම් රජ ද, අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍යය කෙළේ ය. ඔහු පුත් වරකල්‍යාණ නම් රජ ද, අසංඛ්‍යයක් හවුරුදුම රාජ්‍යය කෙළේ ය. ඔහු පුත් උපෝසථ නම් රජ ද, අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍යය කෙළේ ය ඔහු පුත් මහාමාන්ධාතු නම් චක්‍රවර්ති රජ මහත් වූ ආඥා තෙජස් ඇති වි ය. ඔහු වම්අත හකුළුවා දකුණතින් අත් පොළසන් දී ආකාශ ය බලා “දෙවියනි! මට මිනිස්ලොව සම්පත් නො කැමැත්තේ ය. මාගේ ආඥාවක් ඇත්නම් මට දිව්‍ය සම්පත් දෙව’යි හඬගා කී කල සියලු දෙවියෝ සුළං ගත් මහ වනයක් සේ වෙවුලා වෙන වෙන සත් රුවන් වැසි වස්වා මව සතිස් යොදනක් මානයෙහි දණ පමණ කටි පමණ රුවන් ගොඩවල් පුරන්නාහුය. ඒ රජ මෙසේ මිනිස්ලොව බොහෝ සුව විඳ එම ආත්මභාවයෙන් දෙව්ලොව නැගී සතිස් ශක්‍ර කෙණකුන්ගේ ආයු පමණින් එක්සිය විසිනවකෙළ සැවලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් විඳ නැවත එ ම ආත්මභාවයෙන් මිනිස්ලොවට බැස ඒ ඇතුළු අසංඛ්‍යයක් හවුරු ම රාජ්‍ය ය කෙළේ ය.

ඔහු පිත් වරමන්ධාතු නම් රජ ද, අසඞ්ඛ්‍යයක් හවුරුදු ම රාජ්‍යය කෙළේ ය. ඒ රජහු ඇමැතියන්ට කැමැති ව ප්‍රසාද දෙමිසී පාද සඤ්ඤිය කළ කල කැමැති කැමැති සම්පත් පතින් වැහිරෙයි. ඔහු පිත් වර නම් රජ ද, අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍යය කෙළේ ය. ඔහු පිත් උපවර නම් රජ ද අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍යය කෙළේ ය. ඔහු පිත් චේතිය නම් රජ ද, අසංඛ්‍යයක් අවුරුදු ම රාජ්‍යය කෙළේ ය. එ රජ පෙර කමා හා කැපි ව එක ගුරුන් කෙරෙහි ශිල්ප උගත් කෝරකළම්බක නම් බමුණාණන්ට අග්‍ර පුරෝහිත ස්ථානාන්තර දෙමිසී ඔවුන් බෑ කපිල නම් පුරෝහිතයන් බොරුවක් කියා බෑල කොට කෝරකළම්බකයන් මහලු කොට ස්ථානාන්තර දෙමි සී නුවර සැලකළ කල ඒ ඇසූ රාජ්‍යවාසීන් "බොරු නම් සුදු දේ හෝ, කළු දේ හෝ, රත් දේ හෝ, නිල් දේ හෝ, අද ඒ බලම්හ"යි රැස්වූ කල්හි කපිල නම් මහාසෘෂීන් වළක්වා වළක්වා නො මැලක ලොවට බොරු උපදවා එ කෙණෙහි ම මහ පොළොව ගැල ජිඤ්ඤයෙන් දුගතියට ගියේ ය.
වදාළේ මැනෝ:

ස රාජා [1]ඉසිනා සත්තො-අන්තලික්ඛෙ චරො පුරෙ,
පාවෙක්ඛි පඨවිං චෙච්චො-හීනත්තො පත්තපරියායං-යි.

බොරු ඉපැදූ වූ රජ ද නම. ඔහු විසූ නුවර ද නම. ඔහුගේ පුත්‍රයෝ පස් දෙනෙක් වූහ. ඔහු කපිල නම් සෘෂීන්ගේ අනුශාසනා වූ පරිද්දෙන් එක්කෙණෙක් බරණැසට පූර්විභාගයෙහි හස්ති පුර ය කරවා විසූහ. එක්කෙණෙක් දක්ෂිණ දිග්භාගයෙහි අශ්ව පුර ය කරවා විසූ හ. එක්කෙණෙක් පශ්චිම දිග්භාගයෙහි සිංහ පුර ය කරවා විසූහ. එක්කෙණෙක් පශ්චිමෝත්තර දිග්භාගයෙහි දද්දර පුරය කරවා විසූහ. එක්කෙණෙක් උත්තර දිග්භාගයෙහි පඤ්චාල නුවර කරවා විසූ හ. එහි විභාග චේතිය ජාතකය බලා දතයුතු.

එ කල පළමු ව සියලු දුශ්චරිතයන් මෙසේ මුසාවාදය ලොව පහළවී යයි දතයුතු. එතැන් පටන් දෙවියෝ රජුන්ට අරක් ගෙණ නො සිටිනාහ. එ කල ඇමැතියෝ උත්පත්ති දෙවියන් නො ලදින්, සංවෘති දෙවියන් අරක් ගන්වම්හ යි මල් රජකුමරුවන් සතර දෙනකු කඩුදී අරක් ගෙණ සිටුවා මුවලයන් අභිෂේක කළහ. ඔවුන් සතර දෙනාගේ දරුමුනුබුරෝ සුවහස් ගණන් ඇතිව මහා ගණී ව මැස උපනුපන් රජුන්ට ආත්මාරක්ෂාවෙහි නියුක්ත ව දූත් දක්වා ගණවාසි රජහ යි පැවැත්තැ යි දතයුතු.

1. ඉසිනා, ඉසිනො

ඒ චේතිය රජු මහලු පිත් මුචල නම් පිය රජහු පොළොව ගිලූ හයින් රාජ ධර්මයන් නො වරදවා අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍යය කෙළේ ය ඔහු පිත් මුචලින්ද නම් රජ ද අසංඛ්‍යයක් හවුරුදු රාජ්‍යය කෙළේ ය. ඔහු පිත් සගර නම් රජ ද අසංඛ්‍යයක් හවුරුදු රාජ්‍යය කෙළේ ය. ඔහුගේ සැටදහසක් පමණ පුත්‍රයෝ මූළු දඹදිව වෙන වෙන ම සැටදහසක් රාජධානි උපදවා වෙන වෙන ම චක්‍රවර්ති ප්‍රතිරූපයෙන් රාජ්‍යය කොට මහාසම්මත වංශ නමැති මහලියෙහි මල් පිපී වැනී ගියා සේ රාජවංශය අසංඛ්‍යය ගණන් වගී කළහ. ඔවුන්ගේ වෙන වෙන් වගී පරම්පරායෙහි දරුමුනුබුරු රජහු කාලයක් ගිය කල ඔවුනොවුන්ගේ වගී විභාග නො දත වෙන වෙන රාජවංශ ව්‍යවහාර කළහ. මූලින් වූ කලී සියලු රජහු ම මහාසම්මත වංශයෝ යයි දතයුතු,

ඒ සැටදහසක් රජුන් අතුරෙන් සාගර නම් මහලු පිත් අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍යය කෙළේ ය. ඔහු පිත් භරත නම් රජ ද අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍යය කෙළේ ය. ඔහු පිත් භගීරථ නම් රජ ද අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍ය ය කෙළේ ය. ඔහු පිත් රුචි නම් රජ ද අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍ය ය කෙළේ ය. ඔහු පිත් සුරුචි නම් රජ ද අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍ය ය කෙළේ ය. ඔහු පිත් ප්‍රතාප නම් රජ ද අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍ය ය කෙළේ ය. ඒ රජ තමා බිසොව තමා දක්ක දී සත්මැසි ධම්පල් නම් පුත් කුමරහු වඩාගෙණ උස උන්හ සී කිපී කුමරහට අසිමාලක නම් වධ කරවා ලොවට ප්‍රාණඝාත ඉපැද වී ය. එ කෙණෙහි ඔහු ද මිහ පොළොව ගැල අවීචි මහනරකයෙහි හෙළී ය එ කල ප්‍රාණඝාත ය ලොකයෙහි පහළවී යයි දතයුතු.

උපන් උපන් අකුශල ධර්මයන් නැවත නැවත අනතතීත වන හෙයින් නැමත නැමත රජුන් ධර්මයෙන් ම වසන හෙයින් රජුන්ගේ ආයු වූ කලී අඩු නො වේ ම ය. ක්‍රමක්‍රමයෙන් රජහු වර්ණයෙන් අඩු වූවාහු ය යි දතයුතු.

ඒ මහා ප්‍රතාප නම් රජහු පිත් පනාද නම් රජ ද, අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍යය කෙළේ ය. ඔහු පිත් මහාපනාද නම් රජ ද සක්දෙව් රජහුගේ නියෝගයෙන් අවුත් මිනිස්ලොව ඉපැද සත්රුවන්මය පායක සදහසක් තළුමින් සා සමග අසංඛ්‍යයක් හවුරුදු ම රාජ්‍ය ය කෙළේ ය. වදුළේ මැනෝ.

මහාමායා දේවිය දුටු සිහිනය. 126 පිට බලන්න (7_8)

පනාදො නාම සො රාජා-යස්සයූපො සුවණ්ණයො,
තිරියං සොළස උබ්බෙධො-උච්චමාහු සහස්සධා.

සහස්සකණ්ඩො සතභෙණ්ඩු-ධජාලු හරිතා යුතො,
අනච්චුං තත්ථ ගන්ධබ්බා-ඡ සහස්සානි සත්තධා-ති.

ඒ මහා පනාද නම් රජහු පිත් සුදර්ශන නම් රජ ද, අසංඛෙය්‍යයක් හවුරුදු ම රාජ්‍ය ය කෙළේ ය. ඔහු පිත් මහා සුදර්ශන නම් චක්‍රවර්ති රජ ද, සත්රුවන්මය වූ දෙළොස් යොදුන් මහ නුවර කදී අසංඛෙය්‍යයක් හවුරුදු ම රාජ්‍ය ය කෙළේ ය. ඔහු පිත් නෙරු නම් රජ ද අසංඛෙය්‍යයක් හවුරුදු ම රාජ්‍ය ය කෙළේ ය. ඔහු පිත් මහානෙරු නම් රජ ද අසංඛෙය්‍යයක් හවුරුදු ම රාජ්‍ය ය කෙළේ ය. ඔහු පිත් අච්චිමන්ත නම් රජ ද අසංඛෙය්‍යයක් හවුරුදු ම රාජ්‍ය ය කෙළේ ය.

මෙසේ මහාසම්මතය, රොජය, වර රොජය, කල්‍යාණය, වර කල්‍යාණ ය, උපොසථය, මන්ධාතු ය, වර මන්ධාතු ය, චර ය, උප චර ය, චෙතිය ය, මුචල ය, මුචලින්ද ය, සගරය, සාගරය, භරතය, භගීරථ ය, රුචිය, සුරුචිය. ප්‍රතාපය, මහා ප්‍රතාපය, පනාදය මහාපනාදය, සුදර්ශනය, මහාසුදර්ශනය, නෙරුය, මහානෙරුය, අච්චිමන්තයයි අසංඛෙය්‍යයක් අසංඛෙය්‍යයක් හවුරුදු ම රාජ්‍ය ය කළා වූ මේ රජහු අවිසි දෙන ම කුසාවතී නුවරය, රජගහා නුවරය, මියුලු නුවරය යි මේ උතුම් තුන් නුවර ම රාජ්‍යය කළහ. කීයේ මැනෝ:

අසංඛියායුකා එතෙ-අට්ඨවීසති ඛත්තියා
කුසාවතිං රාජගහං-මිථිලඤ්චාපි ආවසුං-ති.

එ තැන් පටන් රජහු වර්ණයෙන් ද ආයුෂයෙන් ද අඩුවූහ යි දත යුතු.

කෙළවර කී අච්චිමන්ත රජහුගේ දරුමුනුබුරෝ අසංඛෙය්‍යායු නො ලදින් කෙළගණින් හවුරුදු ආයු වළඳ ලක්ෂයක් රජහු ම පරම්පරාවෙන් රාජ්‍යය කළහ. ඔවුන් කෙළවර සගර නම් රජහු පිත් මඛාදෙව නම් රජෙක් වී ය. ඒ රජ දෙ ලක්ෂ දෙ පණස් දහසක් හවුරුදු ආයු වළඳ මියුලු නුවර හිඳ රාජ්‍යය කරණ කල පළමුවන නරකෙස ඕනව පහළ වී ය. එ රජ නරකෙස දුක අතින් ලකුණු උපදවා නරකෙස පෑ කපුවාට ගම්වර දී, තමා ගේ මඛාදෙව නම් පුතුට රාජ්‍යය දී, මහණ ව මඛාදෙව නම් උයනදී සුවාසූදහසක් හවුරුදු තපස් කොට බ්‍රහ්මලොකයෙහි උපන, වදාළේ මැනෝ:

උත්තමංගරුහා මය්හං-ඉමෙ ජාතා වයොහරා,
පාතුභූතා දෙවදූතා-පබ්බජ්ජා සමයො මම-යි.

එ රජහු පටන් මහාසම්මතවංශ නම් පෙරළී මඛාදෙව වංශ නම් වි ය. ඒ වංශයෙහි දරුමුනුබුරු පරම්පරාවෙහි සුවාසූදහසක් මඛාදෙවරජහු ම පළමු වන නරකෙස දැක පෙර රජුන් කළ සිරිත් නො වරදවා ම රාජ්‍යය හැර ගොස් තපස් කොට බ්‍රහ්ම ලොකයෙහි උපන්හ. තුන් ලක්ෂ සතිස් දහසක් හවුරුදු බැගින් ආයු ත් වැළඳූහ. පසු ව රජහු ජරා විළි පිළි බොහෝ සේ දැක් මෙන් තපසට නො ගියහ. එසේ හෙයින් ඒ මඛාදෙව වංශ නම් පෙරළී කෙළවර කාලාර ජනක රජහු පිත් අශොක නම් රජෙක් වි ය. ඔහු පිත් ප්‍රථම ඔක්කාක නම් රජෙක් වි ය. එ තැන් පටන් මඛා දෙව වංශ නම් පෙරළී ඔක්කාක වංශ නම් වි ය. ඒ වංශයෙහි කුස රජය, දිලීපය, රඝුය, අජය, දශරථය, රාමය, යනාදී ලක්ෂයක් ඔක්කාක රජදරුවෝ ම පණස් දහසක් හවුරුදු ය, සමහරු සතළිස් දහසක් හවුරුදුය, සමහරු තිස් දහසක් හවුරුදුය, සමහරු විසි දහසක්, සමහරු සොළොස් දහසක්, පසළොස් දහසක්, දස දහසක්, පන් දහසක් යනාදි වශයෙන් බැස බැස ආයු වැළඳූහ. දශරථ ජාතකයෙහි වදාළේ මැනෝ:

දසවස්ස සහස්සානි-සට්ඨිංවස්සසතානි ච,
කම්බුගීවො මහාබාහු-රාමො රජ්ජමකාරයි-යි

තව ද ඒ ලක්ෂයක් රජුන්ගෙන් කෙළවර විතීය ඔක්කාක නම් රජෙක් වි ය. ඔහුගේ පරම්පරාවෙහි උදය, භද්ද ය, ධනඤ්ජ ය, කෝරව්‍ය ය, වෛදෙහ ය, සඤ්ජ ය ය, වෙස්සන්තර ය, ජාලිය ය, සිංහ වාහන ය, යනාදි වූ ලක්ෂයක් රජහු රාජ්‍ය ය කරන්නාහු දස දහසක් හවුරුදු පටන් මැත කනිෂ්ඨ වූ ආයු වළඳා රාජ්‍ය ය කළහ. ඒ වංශයම කෙළවර සුජාත නම් රජහු පිත් අම්බට්ඨ නම් වූ තෘතීය ඔක්කාක නම් රජෙක් වි ය. එ රජහුගේ හස්තා ය, චිත්‍රා ය; ජන්තු ය, ජාලිනී ය, විශාඛා යයි යන පන්සිය පුරස්ත්‍රීන්ට නායක වූ අගමෙහෙසුන් බිසෝවරු පස් දෙනෙක් වූහ. උන් පස්දෙනා කෙරෙන් හස්තා නම් බිසොවු උල්කාමුඛ ය, කලණ්ඩුක ය, හස්තිනීක ය, සිරිනිපුර ය, යන පුතුන් සතරදෙනකු හා ප්‍රියා ය, සුප්‍රියා ය, නන්දා ය, විජිතා ය, විජිතසෙනා යයි දූන් පස් දෙනෙකු හා සමග රජු හා එක්වැනි වූ දරුවන් නවදෙනකු වදා මෙසේ ඒ හස්තා නම් බිසොවු කලෙකින් පරලොව ගියහ. එ කල රජ අනික් යෞවන ස්ත්‍රියක අගමෙහෙසින් කෙළේ ය.

එ බිසෝද රජුට ජනතු නම් පුතකු වදා. එ කුමර උපන් පස් දවසින් නාවා මලින් සරහා මල්දමක් සේ කුමරු දෑතින් ගෙණ "හිමි! තොප පුතු රූසිරි බලව"යි රජු අතට වඩාලූය. රජ තමා ගිය යොවුන් කල ලත් පුත්‍රයා හෙයින් මහත් වූ ප්‍රේමයෙන් පුතු සිඹ සනහා පෙම්වතුරු රඳවාගත නොහෙනුයේ බිසොවුන් මූණ බලා "මම මැනී පුත්රුවනක් වදා දුන් තිව සිත්කලු වූ වරයක් දෙමි; දුන් ම හැරගණැ"යි කීය. එ කෙණෙහි බිසෝ සතුටු ව "මා කැමැති විටෙක ඉල්වා ගත්මි"යි එ විට නො ගෙණ පසු ව පුතු මැඩුනු කල්හි "හිමි මට අන් වරයෙකින් කම් නැත, තොප මට කුදුන් රුවනෙක් නැත; මපුතුට රජය දෙව"යි කීව. එ බසට රජ කිපී "කෙල්ල, චණ්ඩාල දුව! කප්රුක් සේ මපුතුන් සතර දෙනකු දිලියෙමින් සිටිනදී තී පුතුට රජය ඉල්වයි ද මපුතුන් මරණු කැමැතියෙහි ද"යි බැණ නුයේ සිරියහන් ගෙට වන.

නැව ද: මෙසින් කීප දවසක් ගිය කල රජු හා සමඟ ප්‍රියකථා කරණ වේලෙහි "රජදරුවන් නම් බොරු කිය නො හැක්ක, පෙර බොරු කී රජකු පොළොව ගිලී යයි නො ඇසූ විරූ ද, තොප වැනි ධර්මිෂ්ඨ වූ රජුන් බොරුබස් කියනු ඉතා නො යෙදෙයි. කැමැති වරයක් දෙමි යි පළමු කියාලා දුන් මා කැමැති ව ඉල්වූ වරය නො දෙති"යි රජහට නොඑක් වර නිතර බැණ රජය ඉල්ව යි. එ තෙල බොරු කිව යි යන බසට පිළිකුළ් කරණුයේ තමාගේ මාලු පුතුන් සතර බෑයන් ගෙන්වා "දරුවෙනි! තොපගේ මේ ජනතු නම් මල් කුමරුවාට නො සලකා රජය දිනිම්. මා ඇති සමයේ ඒ ජනතුවාම රජය කෙරෙයි. මා නැති කල තොපගේ රජය තොපට ම දිනිමි. ස්ත්‍රී නම් මායම් දතිනි. තෙපි මේ නුවර නො රඳා මාගේ වල්විදුනාව හා තලල්පව හා මගුල් කඩුව හා රන් මරවැඩි හා දළපුඩු යේසන හා මේ පසඳුව කකුධ භාණ්ඩයන් පමණක් තිබියදී තොප කැමැති කැමැති සෙනඟ හා කැමැති කැමැති පමණ රුවන් ගෙණ මෙසින් ගොස් අතික් තෙනෙක වසව"යි කියා පුතුන් සතරදෙනා සිඹ සනහා වැලප රජු සමූ දින.

එ කල ඒ රජකුමරුවෝ සතරදෙන පියරජහු වැඳ සමූ ගෙණ කැමැති කැමැති පමණ රුවන් ගෙණ, කැමැති කැමැති පිරිස් ගෙණ නුවරින් නික්මුනාහ. රජහුගේ දූ පස්දෙන ද එ පවත් අස "අප මල් කුමරුවන් රටින් යන කල අපි කවුරුන් බලා රඳමෝ ද"යි තමන් තමන් කැමැති පිරිවර හා සැපත් ගෙණ නික්මුනාහ.

එ කල මුළු නුවර අසුරයන් වත් ශක්‍රපුර ය සේ ඇලිලී ගි ය. අපගේ රජහුගේ දරුවෝ රටින් යෙත් ල. මිතු අවුදින් රජය ගණිත් ල. උන් හා කැටිව දූන් අපි නො ගියමෝ නම් මිතු රාජවල්ලභ විය නො හැක්කැ යි සුවහස් ගණන් මහ ඇමැතියෝ නික්මුනාහ. බ්‍රාහ්මණ සාරයන් හා ධන සිටුවරු සියගණන් නික්මුනාහ. මහ වෙළෙඳනා වරුන් හා මාලේකාවරුන් දහස් ගණන් නික්මුනාහ. පළමු වන දවසට සතර ගව්වක් තැන් පිරී සිට ගත්හ. දෙවන දවසට අට ගව්වක් තැන් ගලා ගත්හ. තුන් වන දවසට දොළොස් ගව්වක් තැන් අවකාශ නැති ව පිරී සිට ගත්තා වූ මහ පිරිස් වි ය.

ඉක්බිත්තෙන් රජකුමරුවෝ මේ සා මහත් පිරිස් හා සමග නුවරින් නික්ම බරණැසට අග්නි දිග්භාගයෙහි යොදුන් ගණනක් ගොස් ඔවුනොවුන් හා සමග කථා කරන්නාහු: "අපගේ බල සෙනග මහත, මේ දඹදිව්හි කැමැති රජයක් උදුරාගෙණ එහි රජ කරමෝ නම් ඉතා බැරි නො වෙයි. අනික් රජකු අනුභව කළ රාජ්‍යයෙක් නම් අපට ඉසවත් භොජනයක් සේ පිළිකුල. අපගේ ඔක්කාක වංශයට සුදුසු නො වෙයි. අනුන් සතු දෙය උදුරා ගැන්මත් රාජධර්මයෙක් නො වෙයි. මිනිසුන් නැති මහා වන මධ්‍යයෙක නුවරක් කරවා වැවු අමුණු බඳවා කෙත්වත් තනවා ධර්මිෂ්ඨවූ සෙමි වාසය කරමහ" යි මෙසේ වූ මන්ත්‍රණය කොට එක් බිමෙක මහ සෙනග රඳවා ඇමැතියන් හා සමඟ නුවරකට සුදුසු බිමක් බලන්නාහු ය.

එ කල මාගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝ කපිල නම් තාපස ව එක් විලකට නුදුරු තැන බොහෝ ශාඛද්‍රැමයෙන් යුක්ත වූ වන මධ්‍යයෙක පන්සලක් කරවා ඝෝර වූ [2]තපස් කොට වාසය කරණ දූ ය. වල ඇවිදුනා රාජකුමාරයෝ බොධිසත්ත්වයන් දැක වැඳ එකත්පස් ව සිටියාහු ය. එ කල බෝසතාණෝ මොහු ඔක්කාක රජ දරුවෝ යයි හැඳින ගෙණ "දරුවෙනි! මේ කොයේ වූ අසරණ ගමනෙක් දැ; කුමක් සොයා වල ඇවිදු දැ" යි විචාළ දැ ය. රජ කුමරුවෝ තමන් රටින් ආ පවතු ත් නුවරක් කරවාගන්ට සුදුසු බිමක් බලන පරිදි ත් බෝසතුන්ට කීහ.

ඒ ජාතියෙහි බොධිසත්ත්වයෝ භූමිවිජය නම් ශිල්පයක් දන ආකාශයෙන් අසූ රියනෙක හා පොළොවෙන් අසූ රියනෙක හා ලක්ෂණ දන්නා දූ ය. ඒ වෙනෙහි එක් බිමෙක තෘණලතාවෝ දක්ෂිණාවර්ත ව නැමී සිටිනාහු ය. [3]කැණහිලුන්ට බා දිවන්නා වූ

---

1 බිම්, 2 තපස් කරණ දූය, කැණහිලන්,

සාවුන් හා මීවින්නෝ එ බිමට අවුත් වැද පෙරළී නැමී තැණහිලුන්, ලුහුබඳවා ගණිති. නයින් දුක දිවන්නා වූ මීයන් හා මැඩියෝ එ තැනට වැද භය නැති ව ගොන් පෙරළී නයින් ලුහුබඳවා ගණිති. දිවියන් දුක දිවන මුවපොල්ලෝ එ තැනට වැද පෙරලා දිවියන් ලුහුබඳවා ගණිති. බොධිසත්ත්වයෝ මේ කාරණ දුක "මෙ ජයභූමි යෙක. චක්‍රවර්ති රජුන් හෝ ලොවුතුරා බුදුන් හෝ උපදනා බිමෙක. මතු අපමක් නුවුව මැනවැ" යි සිතා එ බිම පන්සලක් කොට වාසය කරණසේක. එ දා ඒ රජකුමරුවන් කී බස් අසා "දරුවෙනි! නුවරක් කැමැතියා නම් මාගේ මේ පන්සල් භූමිය ගණුව. මෙ බිම මහත චණ්ඩාලයෙක් වී නමුත් චක්‍රවර්ති පිරිසක් පරදවා පියහ ඈඳ ඇත්තේ ය. මතු මේ භූමියෙහි උපදනා වූ පුරුෂයෙක් මුළු ලෝ වැසියන් විසින් සත්කාර ලබයි" කියා භූමිය වර්ණනා කොට පන්සල්බිම දීලා 'තොප මට කරණ උපකාර නම් මෙ නුවර නිමි කල මාගේ කපිල නම් තබව" යි කී දූ ය.

ඉක්බිත්තෙන් රජකුමරුවෝ එ තැනට නුදුරු තෙන පන්සලක් නිමවා බෝසතුන්ට පිළිගන්වා ඒ මහවනය මුල්සිඳුවා ඒ පන්සල් බිම මහත් වූ මාලිගාවක් කරවා පවුරු පදනම් දොරටු වීථි අවලු ආදියෙන් එ නුවර නිමවා කපිලවස්තු නමැයි තාපසයන් නමින් නුවරට නම් තබා ඔවුනොවුන් හා සමඟ කථා කරන්නාහු: "අපි ඉදින් කියා යවුමෝ නම් මෙ දඹදිව් තෙලෙහි අපට සරණක් නො එවන රජෙක් නැත. එසේ ජාතිසම්භේදයෙක් වී නම් අපගේ ඔක්කාක වංශයට කිලිටු ය. අපගේ නඟුන් පාමා දෙන්ට සුදුසු අතික් රජෙකුත් නැත. ඥාතිසම්භේදයට වඩා ජාතිසම්භේදයක් නො වීම ම උත්තම ය" යි හැමදෙනාව වැඩිමාලු වූ ප්‍රියා නම් බුහුතැනියන් මව් තනතුරෙහි තබා සතර බෑයෝ තමන් තමන්ට කුඩා නඟුන් අගමෙහෙසියන් කොට රක්‍ෂා කළහ. ඒ බිසෝවරු සතරදෙන ම දූන් අට අට දෙනා හා පුතුන් අට අට දෙනා හා බැගින් සුසැටක් දරුවන් වැදූහ. එ කල පිය මහරජ්ජුරුවෝ මේ පවත් අසා "ම දරුවෝ රටින් ගොසිනුත් ජාතිසම්භේදයක් නො කළාහුයැ" යි සාධුනාද පවත්වා "සක්‍යා වත භො රාජ කුමාරා; පරම සක්‍යා වත භො රාජ කුමාරා" යි ප්‍රීතීන් තුන් යලක් උද්දාන ගායනා කළහ.

අම්බට්ඨ නම් ඔක්කාක රජු කළා වූ ප්‍රීති උද්දාන ය හෙතුකොට ගෙණ එ තැන් පටන් ඔක්කාක වංශය නම් පෙරළී අම්බට්ඨ ශාක්‍ය වංශ යයි මෙ නමින් ප්‍රසිද්ධ වි ය.

මෙසේ ඒ ශාක්‍යවංශයෙහි රජුන් එම කිඹුල්වත් නුවර දෙලක්‍ෂ නෙවිසි දහස් සත්සිය එකුන් සැත්තෑවක් රාජපරම්පරා ගිය කල කෙළවර බුදුකෙණකුන්ට මුතුන් මක පිත් ඇති ජයසෙන නම් රජහු පිත් සිංහහනු නම් රජෙක් වී ය. ඔහුගේ කසයින් නම් අගමෙහෙසුන් බිසොවුන් වැදූ දරුවෝ ශුද්ධෝදන ය, අමිතෝදන ය, ධෝතෝදන ය, සුක්කෝදන ය, සපිතෝදන ය යි පුතුන් පස්දෙනෙකු හා අමිතාවෝ ය, පාර්ලි ය යි යන දූන් දෙදෙනකු හා මෙසේ දරුවෝ සත් දෙනෙක් වූ හ. එයින් ශුද්ධෝදන නම් කුමරු වැඩි පියරජහු අගාමෙන් කපිලවස්තු පුරයෙහි දශරාජ ධර්මයෙන් රාජ්‍ය ය කෙරෙයි.

එ කල මාගේ බොධිසත්ත්වයෝ තුසිපුරයෙහි වැඩහිඳ දෙවියන් කළ ආරාධනාවෙන් මිනිස්ලොව බලා මහාසම්මත රජහු පටන් ශුද්ධෝදන රජහු දක්වා ක්‍රමයෙන් රාජ්‍යය කළා වූ සත්ලක්‍ෂ සත් දහස් සත්සිය සතානූවක් මහාසම්මත වංශයෙහි වූ හිරු ගොත් රජුන් දැක "මේ රාජවංශ ය මාගේ උත්පත්තියට උතුම් වෙයි. කාරණ කිම? යත්:- මේ රාජවංශයෙහි පාරමිතා පුරා සංසාරයෙහි ඇවිදුනා වූ මම ම පළමුවන මහාසම්මත නම් රජ ව [1] උපන්මි; මහාමන්ධාතු නම් චක්‍රවර්ති රජ ව උපන්මි; මහා සුදර්ශන නම් චක්‍රවර්ති රජ ව උපන්මි; මඛාදෙව නම් රජ ව උපන්මි; නිමි රජ ව උපන්මි; කුස රජ ව උපන්මි; රාම නම් රජ ව උපන්මි; උදය භද්‍ර නම් රජ ව උපන්මි; මහිංසක නම් රජ ව උපන්මි; කටඨාරි නම් රජ ව උපන්මි; මහාසීලව නම් රජ ව උපන්මි; චූල ජනක නම් රජ ව උපන්මි; මහා ජනක නම් රජ ව උපන්මි; චුල්ලපදුම නම් රජ ව උපන්මි; මහාපදුම නම් රජ ව උපන්මි; චුල්ලසුතසෝම නම් රජ ව උපන්මි; මහා සුතසෝම නම් රජ ව උපන්මි; පඤ්චායුධ නම් රජ ව උපන්මි; ධර්ම නම් රජ ව උපන්මි; සතභාතුක නම් රජ ව උපන්මි; සහස්සභාතුක නම් රජ ව උපන්මි; ධර්මිෂ්ඨ නම් රජ ව උපන්මි; භාගිනෙය්‍ය නම් රජ ව උපන්මි; රාජෝවාද නම් රජ ව උපන්මි; අලීනචිත්ත නම් රජ ව උපන්මි; වෙදේහ නම් රජ ව උපන්මි; අසදෘශ නම් රජ ව උපන්මි; සකක දත්තිය නම් රජ ව උපන්මි;

තව ද ගන්ධාර නම් රජ ව උපන්මි; මහාගන්ධාර නම් රජ ව උපන්මි; ආදාසමුඛ නම් රජ ව උපන්මි; සුධාභෝජන නම් රජ ව උපන්මි; අනිත්ථිගන්ධ නම් රජ ව උපන්මි; තව ද කුරුධර්ම නම් රජ ව උපන්මි; සත නම් රජ ව උපන්මි; ධර්මපාල නම් රජ ව

1. උපනිමි.

උපන්මි; දීඝායු නම් රජ ව උපන්මි; මහාදීඝායු නම් රජ ව උපන්මි; තව ද සුසීම නම් රජ ව උපන්මි; කුම්මාසපිණ්ඩ නම් රජ ව උපන්මි; පරන්තප නම් රජ ව උපන්මි; උදය නම් රජ ව උපන්මි; භරත නම් රජ ව උපන්මි; තව ද සාධීන නම් රජ ව උපන්මි; සිවි නම් රජ ව උපන්මි; මහාසිවි නම් රජ ව උපන්මි; සෝමනස්ස නම් රජ ව උපන්මි; අයෝඝර නම් රජ ව උපන්මි; තව ද අලීනසත්තු නම් රජ ව උපන්මි; අරින්දම නම් රජ ව උපන්මි; නේමිය නම් රජ ව උපන්මි; චන්ද්‍ර නම් රජ ව උපන්මි; එකුන්විසි වාරයක් බරණැස් රජ ව උපන්මි; කෙළවර මහා වෙස්සන්තර නම් රජ ව ඉපැද සත්වාරයක් මහපොළොව ගුගුරුවා, මහදන් වතුරු කොට පෑරුම් කුළු ගෙණ අවුත් මේ තුසිත පුරයෙහි සන්තුෂිත නම් දිව්‍යරාජන් ව උපන්මි. මේ මේ කාරණයෙන් මාගෙන් ම අලඞ්කෘත වූ, මාගෙන් ම ශ්‍රීමත් වූ, මාගේ ම මේ මහා සම්මත වංශයෙහි කෙළවර උපන්නා වූ යම කි උභය කුල පරිශුද්ධ ශුද්ධොදන නම් රජතෙම බුදුකෙණකුන්ට පිතෘස්ථානයෙහි සිටිම් යි පින්කොට කප් ලක්ෂයක් පිරූ පාරමිතා ඇත්තේ ය යි බලා සනිටුහන් කළ සේක. මේ සතර වන කුල විලෝකන නම.

තව ද: බුදුකෙණකුන් වදන මවක නම් කප් ලක්ෂයක් පැරුම් පුරා කරණ ලද ප්‍රාර්ථනා ඇත මැනව. උභය කුල පරිශුද්ධ වුව මැනව. උපන් තැන් පටන් පන්පව් නො කළ මැනව. එක රජක් හට ම පතිව්‍රතා ධර්මයන් රක්‍ෂා කළ මැනව. මේ ආදී ගුණ ගණාඪ්‍යයෙන් පිරුණා වූ මට මවු වන්ට සුදුසු වූ උත්තම ස්ත්‍රීයක් කවරක් දෝ හෝ යි මිනිස් ලෝව බලා පරීක්‍ෂා කරන්නා වූ මාගේ බොධිසත්ත්වයෝ කොලිය නම් නුවර මහා සුප්‍රබුද්ධ නම් අනුශාක්‍ය රජුට දූ ව, එ ම සුද්ධොදන නම් රාජොත්තමයාට අගමෙහෙසින් වූ මහාමායා නම් දේවී බුදුකෙණකුන් වදම් යි ප්‍රාර්ථනා කොට අව. ඕ තොමෝ මට දුන් මවු වන්නීය යි දුටුසේක.

ඒ මහාමායා දේවීන් උභය කුල පරිශුද්ධ වූ පිළිදි කෙසේ ද? යත්;:- සව සි මහාසම්මතය. මඛාදේව ය, ඔක්කාක ය, යන තුන් පරම්පරාව ගෙණ ශාක්‍යවංශයට උත්පත්තිස්ථාන වූ කපිල නම් පුරයෙහි තුන්වන ඔක්කාක රජුගේ දරු වූ සිවුබෑ රජුන් තමුන් රක්‍ෂා කොට ජාතිසම්භෙදයක් නො කොට රජය කරණ කල හැමදෙනාටම බූත් වූ ප්‍රියා නම් කිසෙයාවුන්ට ශෙවතකුෂ්ඨ නම් රොගයක් ඇති ව සකල ශරීරය සුදු ව කොබලීල මල්පෙත්තක් සේ වී ය. එ කල මල් රජ දරුවෝ ඔවුනොවුන් හා සමග මන්ත්‍ර

ණය කරන්නාහු "මොවුන්ට ඇතිවූයේ පාපරෝගයෙක. මේ රෝගය නම් කැපිව කෑවත් කරා යෙයි දුටුවත් කරාත් යෙයි එක ගෙයි වසනුවත් කරා ත් යෙ යි. මතු අප ඇමදෙනාට ත් මේ රෝගය බෙදී යෙ යි" කියා තමන් තමන් කෙරේ භය ඇති ව දවසක් උයන් කෙළියට යම්හ යි කියා බූනෑනියන් රථයකට නංවා කඩතුරාවකින් වසා ගඟ ඔස්සේ ගොසින් එක් වන මධ්‍යයෙක මහත් කොට වළක් බිඳුවා, වළ යට ශාකක් අතුරුවා, දිය දර ලුණු ඇඹුල් වළන් සාල් ගිතෙල් ආදි ය වළ යට පටවා, බූනෑනියන් ඒ ශාකෙන් ලවා, වළ මතුයෙහි පුවරු අතුරුවා පස්මේ කරවා කඳුළු මුසු මුහුණින් ගියහ. එ කල දේවී වළ යට දී ම පිසනා ජීවිත ය රකි යි. මෙසේ වසන කල දඹදිව රාම නම් රජකුට ද ඒ කුෂ්ඨරෝගය ඇති වි ය. බිසෝවරු ද නාටකස්ත්‍රීහු ද ඔහු ලඟට පිළිකුල් ඇති ව නො එදිකී. ඒ රජ මහත් වූ ලජ්ජා ඇති ව තිලකුණු මෙනෙහි කොට පුත් කුමරුවාට රජය දී තෙමේ "වළ ගෙව එ කලාව හිමයෙමි" සි සිතා ඒ වලට වැද ඒ ඒ තැන්හි ඇවිදුනේ ක්ෂුධාව ඉවසා ගත නොහී දුටු යම් ම ගසෙක පොතු ය, මුල් ය, මල් ය, කොළ ය, ඵල ය යනාදීන් අනුභව කෙළේ ය. එ කල ඒ ඖෂධ බලයෙන් කුෂ්ඨ රෝගය සන්හිඳී රජුගේ සර්වාංගය ම රන් කඳක් සේ වි ය.

ඉක්බිත්තෙන් ඒ රජ වාසයට සුදුසු තැනක් බලනුයේ එක් තෙනෙක මහ සිදුරු ඇති කොළොම් ගසක් දැක මෙහි යට වෙසෙන්නන්ට වගුන්ගෙන් භය නැතැයි සිතා ඉණික් ලාගෙණ ගස උඩට සොළොස් රියනක් නැගී කවුළුදෙරක් කපාගෙණ එ තැන උඩ මැස්සක් බැඳ ගිනි කබලක් තබාගෙණ ඒ ගස්බිලයේ වාසය කොට නො එක් සතුන් කෑ තැනින් මස් ගෙණවුත් පලහා කා ජීවත් ව රාත්‍රියෙහි සිංහ ව්‍යාඝ්‍රාදීන්ගේ නාද ද, සෙසු සතුන්ගේ රාවු පිළිරාවු ද අස අසා වාසය කෙරෙයි. එ කල එක් දවසක් පාන්දර ව්‍යාඝ්‍රයෙක් ගොදුරු සොයා ඇවිදුනේ එ බිසොවුන් වසන වළ මුදුනට පැමිණ මනුෂ්‍යගන්ධයෙකැ යි ආඝ්‍රාණය කොට ඉදපයින් පස් පීරා පුවරු ඔසවා ඒ බිසොවුන් දැක භයඞ්කාර[1] කොට නාද කෙළේ ය. එ සඳ බිසොවු උඩ බලා ව්‍යාඝ්‍රයා දැක භයින් වෙවුලා බැගෑපත් ව මහත් කොට හඬක් ගැසූව. මනුෂ්‍ය ශබ්දයෙහි, සියලු සතුන් ම භය ගන්නා සෙයින් ව්‍යාඝ්‍රයා බා දිව ගියේ. ඉරු නැගිකල ඒ රාම රජ්ජුරුවෝ සිතන්නාහු "අසුවල් දිග ව්‍යාඝ්‍රයෙක් හැඬි ය. ස්ත්‍රියක ත් හැඬූ හඬෙක. කාරණ කිම්දෝ හෝ" සි ගසින් බැස ගොසින් බලන්නාහු ව්‍යාඝ්‍රයා ඔසවාපු පෝරු දැක වළයට

1. පෙංසම් නම්, 1. පාත්වර

බලා බිසෝවුන් දැක තෙපි කවුරු දැ යි විචාළේ ය. බිසෝවු මම ගැහැණියෙකිමි යි කීහ. තෙපි ගැහැණියක් වූ නම් මම පිරිමියෙක්මි ගොඩ නැගෙව යි කීහ. එ බසට බිසෝවු “ඔක්කාක රජ්ජුරුවන්ගේ මහලු දූ වූ ප්‍රියාවෝ නම් මම ය. ජීවිතයට හානි වේ නමුත් රාජ වංශයට කිලුටක් නො කෙරෙමි” යි කිවු ය.

එ බසට රජ කියනුයේ “බරණැස රාම රජ නම් මම ය. වැසිදිය හා ගංදිය හා සම වූවා මැන්න. වහා ගොඩ නැගෙව” යි කී ය. බිසෝවු කියන්නාහු “ස්වාමීනි! මිනිසුන් බැලිය නො හැක්කා වූ ශ්වේතකුෂ්ඨ රෝගයෙක් මා ශරීරයෙහි ඇත. එසේ හෙයින් ගොඩ නො නැගෙමි” යි කීහ. එ බසට රජ කියනුයේ “මම ද එ බඳු වූ පාප රෝගයක් ඇති ව රජය හැර වල ඇවිද ඖෂධ බලයෙන් දුන් සන්සිඳුවා ගතිමි. එම බෙහෙදින් තොපගේ රෝගයත් කලකින් සපාපියමි. වහා ගොඩ නැගෙව යි කියා හිණක් බැඳ වලට බා බිසෝවුන් ගොඩ නගාගෙණ තමන්ගේ වාසස්ථානයෙහි ම ගෙණ ගොස් ටාලා කමන් ඇඟට කළ බෙහෙත් බිසෝවුන්ට කොට කීප දවසකින් කුෂ්ඨ රෝගය සන්සිඳුවා පී ය. බිසෝවුන්ගේ ද සියලඟ කිණිහිරි මල් පෙත්තක් සේ ඉතා රන්වන් වී ය. එ කල දෙදෙන ප්‍රියවාසයෙන් ලෝකාස්වාදය කළාහු ය. ප්‍රථම වාසයෙහි ම දරුගබක් පිළිසිඳ දස මසක් ගිය කල රන්රුදෙකක් සේ පුත්රුදෙකක් එකවිට ම වැදූහ. මෙසේ ම හවුරුදු පතා සම වූ පුතුන් දෙදෙකා බැගින් සොලොස් හවුරුද්දක් ඇතුළත පුතුන් දෙතිසක් වැදූහ. එ කල රාමරජ්ජුරුවෝ දරුවන් මඩා නො එක් ශිල්ප ඉගැන්වූහ.

මෙසේ වසන කල ඒ රාමරජ්ජුරුවන්ගේ බරණැස වසන දනවුවැසි පුරුෂයෙක් දඹසෝයා වෙනෙහි ඇවිදුනේ රජහු දැක ඇඳින වැඳ සිට “ස්වාමීනි! මා හඳුනා දැ” යි විචාළේ ය. රජහු “තා මම නො හඳුනෙමි” යි කී කල “නුඹගේ රාජ්‍යයෙහි අසුවල් ගම අසුවලා නම් මම යැ” යි කී ය. එ කල පුතනුවන්ගේ පවත් හා තමන්ගේ රාජ්‍යයෙහි ප්‍රවෘත්ති ඒ පුරුෂයා අතින් විචාරමින් සිටිය දී පුත්තු දෙතිස ම අවුත් පියරජහු පිරිවරා සිටගත්හ. ඒ පුරුෂයා විස්මය පත් ව රජකුමරුවන් බලා “මූ කාගේ දරුවෝ දැ” යි විචාළේ ය. රාම රජ්ජුරුවෝ මදරුවෝ යැ යි කීහ. මෙතෙක් දරුසිරි ඇති ව හිමි නුඹ වල වසනු නො යෙදෙයි, රජයට වැඩිය මැනවැ යි කී ය. එබස් අසා “රජු රජය මට නො කැමැත්තේ යැ” යි කී කල ඒ පුරුෂයා එ කෙණෙහි අවසර ඉල්වා ගෙණ බරණැස් නුවරට දිව පියරජු දුටු පවත් පුත් රජහට කී ය. පුත් රජ එ පවත් අසා

සිවුරඟසෙන් ගෙණ පිය රජහු වසන මහ වනයට වැද පියාතන් දුන වැද රජයට මා හා නැරීව වැඩිය මැනවැ යි ආරාධනා කොට පියරජහු නො ගිවිස්නෙන් තමාගේ යොධයන් ලවා ඒ මහවනය මුල්සිඳුවා නුවරක් කරවා පවුරු ආදීන් සුරක්ෂිත කොට පියරජහු විසූ කොලොම් ගස මුලින් උදුරවා එ බිම මහ ප්‍රාසාදයක් කරවා වැවු අමුණු බඳවා, සරක් බත් බිජුවට සි මැස්සන් ලවා, අපමණ රුවන්දී, පියරජහු ඒ නුවර පිහිටුවා, තැන තැන නුවර වටා රකවල් ලවා, බරණැස් නුවර ම ගියේ ය.

නුවර, කොලොම් වෘක්ෂය පිහිටි තැන කළ හෙයින් කොලිය නුවර නම් විය. ව්‍යාඝ්‍රයා විසින් දක්නා ලද බිසොවුන්ගේ පරම පරාගත නුවර හෙයින් ද ව්‍යාඝ්‍රපථයෙහි ජාත හෙයින් ද, ව්‍යාඝ්‍ර පුර ය යි කියාත් කියනු ලැබෙයි. දෙවුදැ නුවර නමුත් විය. කොලොම් ගසදී උපන් රජදරුවන්ගේ වංශය හෙයින් ඒ රාජවංශය කොලිය වංශ නම් වි ය.

මෙසේ එ නුවර වසන කල ඒ ප්‍රියා නම් බිසොවු පුතුන් දෙතිස් බෑයන් කැඳවා: "දරුවෙනි! කපිලපුරයෙහි රජකරණ සිවුබෑ රජහු මාගේ මල්බෑයෝ ය. ඒ කාරණයෙන් තොප මයිලෝ ය. උන් සතරදෙනාගේ දූ දෙතිස් දෙනෙක් ඇත. උඉ තොපගේ බැඳුවු ය. තෙපි හැම සුරූ වූ නම් තොප බැඳුවුන් රක්‍ෂාකර වසි කීවුය. රජ කුමරුවෝ මැනියන් කී බස් අසා මයිලන් කරා පඬුරු දී අපට සරණක් එවන්නේ යැයි වෙන වෙන ම දූතයන් යවති. මයිලෝ එ බස් අසා "ඒ කොල්ලන්ගේ පියවංශය අනිකෙක, උපන්නේ කොලොම්ගස් බිලයෙක දී ය. කුමක නැකම් ද උන්ලා"යයි කුලසම්බන්ධයෙන් බැණ දූත් පාමා නොදෙති. රජකුමරුවෝ බැඳුවුන්ට හොර පත් යවා හොර පඬුරු දෙවා පෙම් වඩාගෙණ අසුවල් දා අසුවල් වේලෙහි අසුවල් තෙන අසුවල් ගංතොටට ගොසින් සිටි මි යි, එ තැනට එන්නේ ය යී අවධි කොට[2] යවාලති. රජකුමරියෝ එ දවස් ගඟදිය කෙළිනට යම්හයි පිය රජුන්ට කියා අවසර ගෙණ තමන් තමන් පිරිවර ගෙණ හසනසාර වූ රුවන් හා පලඳනා ගෙණ ගංතොටට යෙති. රජකුමරුවෝ පෙර මන්ත්‍රණය කළ කළ බැඳුවුන් අත් අල්වාගෙණ "මම ය බරණැස් රජුව ද කොලොම් සිදුරෙන් උපන් කෝලිනා"[1] ය යි වෙන වෙන තමන් තමන් නම් හඬ ගා කියා "දිවි කැමැති කෙණකුන් අප අඹා නො එන්නේ ය" යි වාසි කියා කෝලිය නුවර යෙති.

1. කෝලිය, 2. ගවති.

මයිල් රජහු එ පවත් අසා සිතා පහළ කොට "අප බෑනෝ සූර යහ. නිර්භීත යහ. තමන් බැඳවුන් තුමූ ම හැරගෙණ ගියහ. ඉන් අපට ජාති සම්භේදයෙක් නැතැ" යි සතුටුව පසුපස්සෙහි පිරිස් නො යවා දායාද සම්පත් දී යවති. මෙසේ දෙතිස් බෑයෝ දෙතිස් බැඳකුමරියන් බලයෙන් ගෙණ ගොස් රක්‍ෂා කළහ. එ තැන් පටන් කපිලවස්තු පුර ය හා කෝලි ය නුවර හා දෙනුවර රජදරුවන්ගේ ආවාහ විවාහ සම්බන්ධ ය නො කැඩී පැවැත්ත.

මෙසේ දෙතිස් බෑයෝ දෙතිස් පායක් නංවා, දෙතිස් පවුරු, දෙතිස් දොරමු දෙතිස් උයන්, දෙතිස් පොකුණු, හිමවා කෝලිය නුවර සමෘද්ධ කොට වාසය කරන්නාහු එකි එකී දෙන දෙතිස් දෙතිස් ම දරුවන් වැදූහ. එ තැන් පටන් කෝලිය වංශයෙහි නො එක් දහස් ගණන් රාජපරම්පරා ගිය කල කෙළවර බුදුකෙණෙකුන්ට මුතුන් මහ පිය ඇති දෙවුදහ රජහු පිත් අනුශාක්‍ය නම් නරේන්ද්‍රයෙක් වි ය. සිංහ හනු රජහු නං මහා යශෝධරා දේවී ඒ අනුශාක්‍ය රජහට අගමෙහෙසින් ව සුප්‍රබුද්ධ ය, දණ්ඩපාණී ය යි යන රජකුමරුවන් දෙදෙනා හා මහා මායා දේවි ය, මහා ප්‍රජාපතී යයි යන දූන් දෙදෙනා හා දරුවන් සතරදෙනකු වැදූව. ඔවුන් අතුරෙන් මහාමායා ප්‍රජාපතී නම් ඒ දූ දෙදෙන ම දෙවඟනන් බඳු වූ රූ ඇතියහ. උපන් සිඟිත් රා බොත්තවුනු ත් නො දකිති. කෙළි පිණිස ත් බොරු නො කියති. අනුන් සතු වස්තුවක් ලොභයෙන් නො බලති. ලේඩිත්තකගෙ ත් ප්‍රාණයක් නො නසති. අපව තරම් සවාමි පුරුෂයකු දක්නා තුරු පර පුරුෂයකු නො දකුම්හ යි කියති. එ කල කකාන් දන්නා බමුණෝ මේ කුමරියන් දෙදෙනාගේ උතුම් වූ ස්ත්‍රී ලක්‍ෂණ දැක "මේ කුමරියෝ දෙදෙන මතු පුතුන් දෙදෙනකු ලබති. එකෙක් චක්‍රවර්ති රජ වෙයි. එකෙක් බුදු වෙයි" කීහ.

එ බස් අසා දඹදිව නෙ සැට දහසක් රාජධානියෙහි රජුන් ගෙන් මෙන මෙන එවන රුවතින් අතුරු නො වී ය. ශුද්ධෝදන රජ්ජුරුවෝ එ පවත් අසා "බෑ රජ දූන් දෙදෙනා ම අනික් රජෙක්හට නො හරිම්" යි මඟුල් කොට දෙ බිහින්නන් ගෙණ ගොස් අගමෙහෙසින් කළහ. එ කල මහාමායා නම් ඒ බිසොවු අඛණ්ඩ කොට පඤ්චශීල ය රක්‍ෂා කෙරෙති. රජහට පතිව්‍රතා ධර්ම ය රක්‍ෂා කෙරෙති. උතුම් වූ ආචාර ගුණයෙන් යුක්තයහ. පෙර මහා විපස්සී නම් බුදුන් සමයෙහි අනඝ වූ රත් සඳුනක් සුණු කොට බුදුන්ට පුද "මම ද නුඹ සේ ම බුදුකෙණෙකුන්ට මවු වෙමව" යි කරණ ලද ප්‍රාර්ථනා ඇත්තී ය.

එ කල මාගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයන් වහන්සේ ඒ තුෂිත පුරයෙහි දී දස දහසක් සක්වළ දෙවියන් කළ ආරාධනායෙන් සිවිය දී ම මිනිස්ලොව බලා මේ මහා මායා දේවී නම් වූ ශුද්ධෝදන රජ්ජුරුවන් අගමෙහෙසින් කළා වූ උත්තමාඞ්ගනාවන් දැක "මි මට මවු වන්ට පින් ඇත්තී ය ඇගේ පරිශුද්ධ වූ කුසයෙහි ප්‍රතිසන්ධි ය කෙරෙමි" යි බලා සිතිවුහන් කළසේක.

තව ද බුදුන් උපන් කුස සැම් ධාතුකරඬුවක් සෙයින් අනික් සත්ත්වකෙනෙකුන්ට වාසස්ථාන නො වෙයි. මලමූත්‍රයෝ අවගත නො හැක්ක. කෙලෙස් මල ද නූපදනෝ ය. බුදුන් මව්කුස පිළිසිඳි ද පටන් ඒ ආත්මභාවයෙහි මෑතියන්ගේ මෛථුන සංවාසයෙක් නො ම ඇත මැනව. මේ මේ කාරණයෙන් බුදුකෙනෙකුන් වැදූ මෑනියෙකෙනෙකුන් ඔබ උපන් සත් දවසින් මිය දෙව්ලොව ගිය මැනව එසේ හෙයින් ඒ මහාමායා දේවින්ගේ ආයු කෙතෙක් කල් ඇද්දෝ යි පරීක්ෂා කොට තුන්සිය සත් දවසකට ආයු දැක මව්කුස පිළිසිඳිනා කාලය මේ යයි දුටුසේක. මේ පස් වන මාතෘ විලොකන නම්.

මෙසේ මාගේ බෝධිසත්ත්වයෝ මහ බැලුම් පසක් හා මහ ශබ්දයෙන් උපන් සූක්ෂ්ම බැලුම් ලක්ෂණයන් බලා "මිනිස්ලොව ඉපැද මා බුදු වීමට එකාන්ත කාල යැ" යි දැන එ තැනට රැස් ව ආරාධනා කළ දසදහසක් සක්වල දිව්‍යබ්‍රහ්මසෙනාවට "බුදු වන්ට මනුෂ්‍යලෝකයට යෙමි" යි ප්‍රතිඥා දී "තෙපි හැම තොප තොපගේ දෙව්ලෝ යව" යි සමු දුන්සේක.

එ කල දිව්‍යබ්‍රහ්මරාජයෝ "සාධු සාධු බුද්ධාන්තරයක් මුළුල්ලෙහි මොහාන්ධකාරයෙන් එකාන්ධකාර ව තුබූ තීවන් පුරයෙහි මේ වීරපුරුෂයා අඳුලු නැති කෙරෙයි. දෙශනා රශ්මීන් එකාලොක කෙරෙයි" කියා බුදුන් බුදුවූ දා සේම බුදු වෙමි යි කීබස් අසා සතුටු වූ දශ දහසක් සක්වල මුළුල්ලෙහි දිව්‍යබ්‍රහ්මරාජයෝ දෙහොත් මුදුන් දී දෙලක්ෂ සතළිස් දහසක් සාධුකාර පූජා කොට ගියහ.

මෙසේ බුදු නොව බුදු වෙමි යි දුන් ප්‍රතිඥාවෙන් දිව්‍යබ්‍රහ්මයන් සන්තෝෂ කරවා බොහෝ වූ සාධුකාර පූජා ලත් හෙයිනු ත්, මෙසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත් සමන්ත භද්‍ර වූ; පරදුඃඛ දුඃඛිත වූ, කරුණානිධාන වූ, ලොක දිවාකර වූ, ත්‍රෛලොක්‍ය චූඩාමාණික්‍ය වූ, මාගේ බුදුහු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියනලදුයේ මැයි;

පූජා විසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං-ති.

මේ පූජාවලියෙහි
අප බුදුන් පස්වූ මහා විලොකනාවසානයෙහි දී ලද
සාධුනාද පූජා කථා නම් වූ
සත් වන පරිච්ඡෙදය නිමි

අට වන පරිච්ඡෙදය

තව ද; අප බුදුන් ලද ප්‍රතිසන්ධි පූජා නම් කවරහ? යත්;

මෙසේ අප මහා බොධිසත්ත්වයෝ ආරාධනා කළ දිව්‍යබ්‍රහම යන්ට අවසර දී යවා හුනස්නෙන් නැගී ඒ තුෂිත පුරයෙහි දෙවියන් පිරිවරා ඒ පුරයෙහි ම නඳුන් උයන් වැඩිසේක. ඒ කෙණෙහි සියලු දෙවතාවන් චුත වන කාලයෙහි ම පෙණෙන්නා වූ පස්වූ මහා පූර්විනිත්ත පෙණීන. ජේ කෙසේ ද? යත්;

ඒ බෝසතුන්ගේ සත් පණස් කෙළ සැටලක්‍ෂයක් හවුරුදු සැඳි දා හැඳිවත, නො කෙලෙසී තුබූ සළුව, ඒ දවස් කෙලෙසී ගියේ ය. ඒ කෙක් කල් මුළුල්ලෙහි නො මලා තුබූ පැලඳි මල් පර ව ගියේ ය කිරිරස් කලබක් වන් ශරීරප්‍රභා ව නිෂ්ප්‍රභ ව ගියේ ය. දිව්‍ය වූ මාළිගාවෙහි වාසයට රිසි නැති විය. තුන් ගවු උස දිව්‍ය ශරීරයෙන් පිනි ගත් රුකක් සේ ඩා සෙල් විය. තුසීපුර දෙවියෝ බෝසතුන්ගේ චුත වන මේ පස්වූ කාරණ දැක "ඉතො චුතො සුගතිං ගච්ඡ මාරිස, ඉතො චුතො සුගතිං ගච්ඡ මාරිස" යනාදීන් පිරිවරා සිට මගුල් තෙපුල් කීහ. ඒ කෙණෙහි බෝසතාණෝ ද පවනින් පැහැර තිවූ පානක් සේ ඒ තුසිපුරයෙන් අනතර්ධාන ව ඒ දා ඇසළ මස මැදිපොහෝ ලද උතුරුසළ නකතින් අලුයම් රාත්‍රියෙහි ඒ මහාමායා දේවීන් කුස පිළිසිඳ වදාළසේක. එහි විස්තර මෙසේ දතයුතු.

ඒ කපිලවස්තු නම් නුවර ඇසළ කෙළි නම් වූ මහත් වූ උත්සව කෙළියෙක් පළමු සත්මෙනිදා පවත් වී ය. සියලු ජනයෝ ඉස් සෝධා නාඟමින් සුවඳමල් පලඳිමින් සුවඳ ඇඟ ගල්වමින් කෑමෙන් පීමෙන් නැටීමෙන් ගී කීමෙන් කෙළියෙන් සිනායෙන් දවස් යවා ශක්‍රපුරය සේ එ නුවර සරහමින් සත් දවසක් උත්සව කෙළි කෙළිති. එ කල ශුද්ධෝදන රජ්ජුරුවෝ සොළොස් කළයක් සුවඳ පැනින් නහා ලක්‍ෂයක් අගනා සළුවක් හැඳ සුසැටක් ආභරණයෙන් සැරසී ශක්‍රදෙවේන්ද්‍ර ලීලායෙන් සිංහාසන නැගී හිඳ ඇමැති ගණයා පිරිවරා සැණකෙළි සිරි වීඳිති.

එ කල මහාමායා දේවී දිව්‍ය සත්‍රියක සේ සැරසී පන්සියයක් සත්‍රීන් පිරිවරා මඟුල් පොකුණු වැද ජලක්‍රීඩා කොට නඳුන් පොකුණු වන් නන්දනවනයේ ක්‍රීඩා කොට ලක්‍ෂයක් අගනා කසී සළුවක් හැඳ සුපිපි සපුමල් රුකක් සේ රන් පලඳනාමෙන් සැරසී රජගෙට ගොස් රන්වන් පායෙහි මතුමාලට නැගී තමන්ගේ ශ්‍රීයාන් ගබඩායෙහි සරහා මල්පිරූ යහනක් මතුයෙහි එ දා රෑ නිද්‍රාවට පටන්ගත්හ.

එ දවස් රෑ මායේ බුදුන්ගේ ප්‍රතිසන්ධි වේලායෙහි මහාමායා දේවී මේ බඳු ස්වප්නයක් දුටහ. ඒ කල වරම් රජදරුවෝ සතර දෙන තුන්ගවු උස දිව්‍යශරීරයෙන් රන් ගොහා විහිදුව විහිදුවා දේවීන් ඔත් යහන් ගබඩාවට වැද සපුමල්දමක් සේ දේවීන් වඩා ගෙණ පන්සියයක් යොදුන් හිමාලය පර්වතය මුදුනෙහි පසේ බුදුන් සිවුරු වළඳනා සැටයොදුන් සිරියෙල් ගල්තලාවෙහි කොළවර පිහිටි සත්යොදුන් සල්රුක මුල යොදනක් උස මල් ගොබ පිට වඩා ලූ නම. එ සඳ වරම්රජුන්ගේ අඹුවෝ සතරදෙන සපිරිවරින් අවුත් බිසෝවුන් ඔසවාගෙණ පණස් යොදුන් අනවතප්තවිල දෙව්දූන් දිය කෙළිනා පැන්තොට දී මිනිස්ගඳ හැර දේවීන් නාවා දිවසළු හඳවා දිවපලඳනාමෙන් සරහා දෙසියයක් ගවු උස රිදීමය වූ කෙලාසකූට පර්වත මුදුනෙහි පිහිටි රන්පායට ගෙණ ගොස් දිවයහනක් පණවා පශ්චිම දිග්භාගයට සිරස ලා දක්‍ෂිණ දිග්භාගයෙන් ජම්බුද්වීපයට ඇතුළත් කොට සතපා දේවීන් පිරිවරා සිටියෝ නම.

ඒ පර්වතයට නුදුරු තෙත් සහ රන්මය වූ දෙසියයක් ගවු උස චිත්‍රකූටපර්වතය මුදුනෙහි සිට ඇළි ඇත්පැටවෙක් රිදී දමක් වන් සොඬින් සුදු පියුමක් ගෙණ ඒ පර්වතයෙන් බැස බිසෝවුන් බල බලා ඔත්දී ම ඒ රිදී පර්වතයට නැගී රන් පායට වැද බිසෝවුන් සැතපුනු දිව යහන වඩා තුන් යළක් ඇවිද දක්‍ෂිණභාගයෙන් බිසෝවුන් කුසට වැද ගියේ නම.

එ කෙණෙහි බිසෝවු පිබිද නැගී සයන පිට උන්හ. දේවීන් බඩ විදුරු පුරා ලූ භාජනයක් සේ බර විය. බිසෝවු නො නිදම පාන් වූ කල ගොස් රජහට දැන්වූහ. රජ වේදයෙහි නිපුණ බ්‍රාහ්මණයන් සූසැටදෙනකු ගෙන්වා චතුමධුරයෙන් පැන් නො වකා පිසූ කිරිබත් ලක්‍ෂ වටිනා රන්තලි සූසැටක් පුරා ලක්‍ෂ වටිනා රන්තලි සූසැටකින් වසා ඒ බමුණන් පෙරට තබා කිරිබත් කවා රන්තලි සමගින් බමුණන්ට දන් දී අත් සෝදවා කපුරුය, තකුල්ය, නාරඟය, ලමිඟය, හිඟුරුය, යන මේ පස් පලවතින් බුලත් දී බමුණන් සතුටු කරවා බිසෝවුන් දුටු ස්වප්නය කියා විචාළහ.

ඒ බමුණෝ ස්වප්නය පරීක්‍ෂා කොට කියන්නාහු 'දේවයෙනි! දේවීන් දුටුයේ දරු සිහිනයෙක. සුදු ඇත්පැටවෙක් නම් බුදු වන පුත් පැටවෙකැ'' යි යන අර්ථ ය. ශුද්ධ පද්මයෙක් නම් බුද්ධ පද්මයෙකැ යි යන අර්ථ ය. එසේ හෙයින් ප්‍රඥා නමැති හස්තයෙන් වෛනෙය ජන නමැති පද්මයන් බොරා දේශනා නමැති රශ්මීන් ප්‍රබුද්ධ කරන්නා වූ බුද්ධපුත්‍රයෙක් ම ය. මේ කාරණයෙන් දේවීන් කුස, හිමි! තුඹ බුදු හෝ වන චක්‍රවර්ති හෝ වන පුතෙක් උපන. ඒකාන්තයෙන් ඒ විපදයන්ට උත්තම තුන්ලෝ වැසියන් විසින් පූජා ලැබෙන පුතෙක් ම ය. දරුගබ් මඟුල් කරව''යි බමුණෝ රජු සන්තොෂ කරවා සමු ගෙණ ගියහ. මෙසේ මාගේ ශ්‍රී මහා බොධිසත්වයන් මවුකුස පිළිසිඳගත් ඇසිල්ලෙහි ම පාරමිතා බලෙන් ජනිත වූ උන්වහන්සේගේ ම පුණ්‍යප්‍රභාවයෙන් ලොවට අද්භූත වූ ආශ්චර්‍ය්‍ය පූජා දෙතිසෙක් පහළ වී ය. ඒ දෙතිස් පූජා නම් කවරහ? යත්;

එ දා මහී නමැති කාන්තාව දීපඞ්කර පාදමූලයෙහි පටන් තම, බඳු වූ අචල ගුණයන් සාරාසංඛ්‍යය කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි පුරා ආ හෙයින් "මා සේ ම අචල වූ ගුණ ඇති සේකැ'' සන්තුෂ්ටව දසදහසක් සක්වළ දසදහසක් මහ පොළෝ නමැති භෙරීන් නාද පවත්වා මහීගර්ජනා නම් වූ පළමු වන ප්‍රතිසන්ධි පූජාව කළ දා ය. තව ද සුවහස් පහන් දැල් වූ එක මඟුල් ගෙයක් සේ දසදහසක් සක්වළ මුළුල්ලෙහි පැවැත්තා වූ මහත් වූ ආලෝකය මාගේ බුදුන් ලද දෙවන ප්‍රතිසන්ධි පූජා නම. තව ද ජාතියෙන් අන්ධ වූ මිනිසුන් උපන් තැන් පටන් නුදුටු විරූ දෑ අනෙකප්‍රකාර වර්ණ දැක මේ කෙසේ වූ ආශ්චර්‍ය්‍යයෙක් දැයි අහෝ සාධු අහෝ සාධු'' යි

කිය කියා ලෝකාලෝක දක්‍ව කළා වූ සන්තොෂය මාගේ බුදුන් ලද තුන් වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද දස දහසක් සක්වළ මුළුල්ලෙහි උපන්නා වූ ජාති ගොළුවන් කුරවීක නාද පරදවා එ කෙණෙහි ලීලොපෙත කොට ගී කීම මාගේ බුදුන් ලද සතර වන ප්‍රතිසන්ධි පූජා නම.

තව ද උපන් තැන් පටන් ජාතියෙන් බිහිරන් බෙර හඬ සක් හඬ පමණකුත් නො අසා එ කෙණෙහි ගොළුවන් කියන ගීතිකා ශබ්දයෙන් පිබිද ඒ ගායනා අස අසා සාධුකාර දීම මාගේ බුදුන් ලද පස් වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද උපන් දා පටන් පසින් නො ගිය විරූ වතුගා නිගා විද ඇවිදුනා පිළුන් දෙපය සොල්වා යොදුන් ගණන් දිවමියා හළුවන් සේ නව නටා අප්පොළසන් දී දී අහෝ සාධු, අහෝ සාධු, යි හඬගානා ශබ්ද ඝොෂාව මාගේ බුදුන් ලද සවන ප්‍රතිසන්ධි පූජා නම. තව ද කුරු කුදු ම උපන් සත්ත්වයන් විශෙෂ වූ ගාත්‍ර ලදින් ඉතා උස්තෙන තුඹු පතාපැතින් බිඳ තකා තලු ගසා රස විඳ ඔල්වරසන් දී දී සාධුකාර දීම මාගේ බුදුන් ලද සත්වන ප්‍රතිසන්ධි පූජා නම.

තව ද ඒ ඒ තන්හි බන්ධනාගාරයන්හි වසන හස්ති අශ්ව මියූර ශාරිකාදීන් හා අනුසරාදීයෙහි [1]හැකිළි බඳ සත්ත්වයන් තමන් තමන්ගේ බැඳුම් සිඳී ස්වකීය වූ ස්ථානයට පැමිණ සන්තොෂයෙන් කරන්නා වූ රුචි පිළිරුචි දහස් ගණන් මාගේ බුදුන් ලද අටවන ප්‍රතිසන්ධි පූජා නම. තව ද දස දහසක් සක්වල තෙළෙස් ලක්ෂ සැටදහසක් නරකවල ගිනි නිවී හිමපිඩක් සේ සිහිල් ව කපක් මුළුල්ලෙහි ගින්නෙන් දන නිරිසතුන්ගේ ගිනිගත් ශරීර දියකඳු සේ සිහිල් ව ගිය වේලෙහි ඔවුනොවුන් දක මේ කෙසේ වූ විස්මයෙක් දැ? හොල, මේ නරක දුකින් අද මිදී ගියම්හ යී කිය කියා දසදහසක් සක්වළ මුළුල්ලෙහි නරකවල සත්ත්වයන් කිවා වූ සාධුකාර ශබ්ද ඝොෂාව මාගේ බුදුන් ලද නව වන ප්‍රතිසන්ධි පූජා නම.

තව ද: කපක් මුළුල්ලෙහි බත් නො ලද්දා වූ ප්‍රෙතයන්ගේ සා පිපාසා නිවී බත් ලදින් පැන් ලදින් 'අහෝ සුඛං අහෝ සුඛං' කී වා වූ ශබ්ද ඝොෂාව මාගේ බුදුන් ලද දස වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද උපන් තැන් පටන් මරණයෙහි සයින් ඇවිදුනා වූ තිරිසන් අපායෙහි සත්ත්වයන් ඔවුනොවුන් කෙරෙහි භය නැති ව සිත් සේ ඇවිදීම මාගේ බුදුන් ලද එකොළොස්වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද දසදහසක් සක්වළ සියලු සතුන්ගේ උපන්දා උපන් අසාධ්‍ය වූ රොග සන්හි දී 'අහෝ සුඛං අහෝ සුඛං' යන සන්තොෂ

1. ඇකිළි,

වචනයන් කීම මාගේ බුදුන් ලද දොළොස් වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද සියලු සත්ත්වයන් ම ඔවුනොවුන්ට අප්‍රිය වචනයක් නොකියා ප්‍රිය වචන ම කීම මාගේ බුදුන් ලද තෙළෙස් වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද එ දා අශ්වරාජයන් එ කෙණෙහි ම මධුර නාදයෙන් හේෂාරව කිරීම මාගේ බුදුන් ලද තුදුස් වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද එ දා දස කුලයි ඇතුන් සන්තොෂයෙන් කුඤ්චනාද කිරීම මාගේ බුදුන් ලද පසළොස් වන ප්‍රතිසන්ධි පූජා නම.

තව ද එ දා සිංහරාජයන් නොඑක් ගල් මුදුනට නැගී “සත්ත්වයෙනි! බුදුහු මවුකුස පිළිසිඳි සේක” යි ලොවට හඬ ගාන්නා සේ කරනලද මහත් වූ සිංහගර්ජනාව මාගේ බුදුන් ලද සොළොස් වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද එ දා මහිෂ ගවර සෙමරාදි සියලු සිවුපාවත් තමන් තමන්ගේ නාදයෙන් ඝොෂා කිරීම මාගේ බුදුන් ලද සතළොස් වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද එ දා දසදහසක් සක්වළ දෙව්මිනිසුන් පලඳනාලද කනක කටකාදි ආභරණයන් සැලී ප්‍රාණ ඇතියන් සේ රමනය කිරීම මාගේ බුදුන් ලද අටළොස් වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද එ දා දශවිධ වූ දිගන්තරයෙහි ප්‍රභාසක ධජයන් විහිද බුදු රැස්කඳ සේ දිවීම මාගේ බුදුන් ලද එකුන් විසි වන ප්‍රතිසන්ධි පූජා නම.

තව ද එ දා මාතවලාහක දිව්‍යපුත්‍රයන් සැඩ පවන් දුරුකොට මන සුවදින් යෙදුනා වූ මඳ මඳ පවන් පැවැත්වීම මාගේ බුදුන් ලද විසි වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද එ දා වස්ස වලාහක දිව්‍ය පුත්‍රයන් අකාල මේඝ නගා දසදහසක් සක්වළ එ කෙණෙහි වැසි වස්වා පීම මාගේ බුදුන් ලද එක්විසි වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද මහපොළොව පලා නැඹ තල්කඳ සා ජලධාරාවන් රිදී කඳන් සේ නැගී ඒ ඒ දිග්හි දිවීම මාගේ බුදුන් ලද දෙවිසි වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද එ දා සියලු පක්ෂීන් ම එ වේලෙහි ආකාශයෙන් නො ගොස් තුරු අග නො හිඳ මිහිමඬලට බැස තමන් තමන්ගේ ධවනියෙන් මධුරනාද කිරීම මාගේ බුදුන් ලද තෙවිසි වන ප්‍රතිසන්ධි පූජා නම.

තව ද එ දා දසදහසක් සක්වළ නේ සුවහස් ගඞ්ගාවන් සපිගං බලා සන ගමන් හැර බුදුහු උපන් හ යි සතුටු ව බලා සිටිනා සේ නො ගොසින් රඳාපීම මාගේ බුදුන් ලද සූවිසි වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද එ දා දසදහසක් සක්වළ මූළල්ලෙහි සතළිස් දහසක් සමුද්‍රයන්ගේ මහ රළ සන්හිඳී ලුණුදිය අනතඩිත ව මධුර ජලයෙන් පිරී ප්‍රසන්න ව නිවී සැනහී තිබීම මාගේ බුදුන් ලද පස්විසි වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද එ දා සතළිස් දහසක් සාගර

යෙහි පස් පියුම් පිපී විසිතුරු මලසුන් සේ වීම මාගේ බුදුන් ලද සවිසි වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද එ දා දියෙහි ගොඩෙහි පිපෙන හැම මල් සමූහයන් එ කෙණෙහි ප්‍රබුද්ධ ව දසදිග සුවඳ පතුරුවා රොන් සළා දීම මාගේ බුදුන් ලද සත්විසි වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද දසදහසක් සක්වල මුළුල්ලෙහි ගල්මල ද මුල් වල ද මූල පටන් අග දක්වා මලින් වැසී යාම මාගේ බුදුන් ලද අටවිසි වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද දසදහසක් සක්වල පොළොව්වල ද, දසදහසක් සක්වළ පජීත මූදුයෙහි ද, බිම් පලා ගල් පලා සත්බුඹු දඬු පියුම් පැන නැඟී ඒ ඒ තැන සිටීම මාගේ බුදුන් ලද විසිනව වන ප්‍රතිසන්ධි පූජා නම.

තව ද සියලු ආකාශය මුළුල්ලෙහි පියුමෙන් අතුරු නැතු ව උඩු බලා නවූ තිබී යටි බලා නෙමි තිබී මල් වියනක් සේ මැවී යාම මාගේ බුදුන් ලද තිස් වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද දස දහසක් සක්වල මුළුල්ලෙහි එ කෙණෙහි මල්වැසි වැස පියා මුළුලොව එක මලස්නක් සේ, එක මල් වවක් සේ, වීම මාගේ බුදුන් ලද එක්තිස් වන ප්‍රතිසන්ධි පූජා නම. තව ද එ දා මිතු අර්හත් ධවජයට පූජී නිමිත්ත පාතා සේ එදා නැගූ ධවජමාලා යෙන්, බඹලෝ වසා ගැන්ම මාගේ බුදුන් ලද දෙතිස් වන ප්‍රතිසන්ධි පූජා නම.

මෙසේ බුදුහු තමන් බුදු වන ජාතියෙහි මවු කුස පිළිසඳගත් කුසල් පමණකින් මෙසේ ලොවට ඉතා අද්භූත වූ, ඉතා ආශ්චර්ය වූ, ඉතා විස්මය වූ, ප්‍රතිසන්ධි පූජාවන් දෙතිස් දෙනකු එක විගසම ලත් හෙයිනු ත්, මෙසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, ශාක්‍යකුල සිංහ වූ, ශාක්‍යකුල නායක වූ, ශාක්‍යකුල කෙතු වූ, ශාක්‍යකුල ප්‍රසාදනීය වූ, ශාක්‍යකුල ලොචන වූ, ශාක්‍යකුල චින්තාමාණික්‍ය වූ, ශාක්‍යකුල භද්‍රඝට වූ, ශාක්‍යකුල කල්පද්‍රැම වූ, ශාක්‍යකුල තිලක වූ, ශාක්‍යකුල ප්‍රදීප වූ, මාගේ ස්වාමිදරු වූ, බුදුරජාණෝ මේ මේ කාරණයෙනුදු අහීත් නම් වන සේක. එසේ හෙයින් කියන ලදුයේ මැයි:–

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං—ති.

මේ පූජාවලියෙහි අප බුදුන් පශ්චිමාත්මභාවයෙහි ලද
ප්‍රතිසන්ධි පූජා කථා නම් වූ

අට වන පරිච්ඡේදය නිමි.

නව වන පරිච්ඡේදය

නව ද: අප බුදුන් ලුම්බිනී වනෝද්‍යානයෙහි දී ලද ප්‍රසව මඞ්ගල පූජා නම් කවරී? යත්;

මෙසේ මාගේ ශ්‍රී මහා බොධිසත්ත්වයන් තුසීපුරෙන් වැඩ මවු කුස පිළිසිඳගත් වේලෙහි ම මෑනියන් වහන්සේට ද දරුගබ්බටද උපද්‍රව වලකනු සඳහා වරම් රජදරුවෝ සතරදෙන මඟුල් කඩු ගත් අත් ඇති ව ශ්‍රීයහන් ගබ්බාවට සතර දිග රැකවල් ගත්හ. ඔහු සතරදෙන මතු කො වෙති. නව ද දසදහසක් සක්වල ම සතළිස් දහසක් වරම් රජහුම ඒ ශ්‍රීයහන් ගබ්දොරය, රත්පාය සිංහාරාය, කුමර සිංහාරාය, දඹදිව සිංහාරාය, සක්වලගබ සිංහාරාය යි බෝසතුන්ට අරක්ගෙණ සිටියාහු ම ය. එ තැන් පටන් ගෙණ බෝසතානන් වහන්සේට ද මෑනියන් වහන්සේට ද පෙර ගිල නුන්ට කළා වූ ඔංශධ සත්කාර බලයෙන් ජාත වූ කුශලානුභාව යෙන් ද, ඒ දෙවියන්ගේ අානුභාවයෙන් ද, රොගාදීන් කිසි පීඩා වෙක් නොවී ය දඹදිව සියලු රජුන්ගෙන් එවන අපමණ වූ රුව තින් අතුරු නො වී ය.

මෑනියන් වහන්සේගේ නාභිමණ්ඩලයට මුහුණ ලා පලක් බැඳ ධර්මාසනයක උන් ධර්මකථිකයෙකු සේ, මිණිකරඬුයෙක වඩාලූ කනක රූපයක් සේ, බලන්නවුන්ට පෙණී පෙණී වැඩ හිඳිනාසේක. අදුම මෙ තෙක් තැන් වැඩිසේක. අදව මේ තෙක් මහත් වූ සේනෑ යි ප්‍රේමයෙන් බල බලා හිඳිනා ඒ මෑනියන් වහන්සේ "මදරුවෝ කුස වසන්නාහු මෙසේ ප්‍රීති වඩති. කුසින් බිහි වූ කල කෙසේ රූපශ්‍රී ඇතියෝ දෝ හෝ" ප්‍රීතින් පිණ පිණා පිරුණු තෙල් පාත්‍රයක් ධරන්නා සේ ගබට කිසි පීඩාවක් නො, කොට ඉතා උෂ්ණ භෝජනය, ඉතා ශීත භෝජනය, තිත්ත භෝජනය, කටුක භොජනය, ලුණාදියෙහි රස නො දන දස මස මූළල්ලෙහි ම පුතනුවන්ට නොහැටුම් වෙති යි කුස පුරා බත් නොකා, මුහුණින් වැද නො හෙව, වම් ඇලයෙන් නො සැතපී, දක්ෂිණභාගයෙන් ම සැතපී, දරුගබ සැලී නැගෙති යි සක්මන් මාත්‍රාවකුත් නො කොට දස මස මූළල්ලෙහි ඉතා අප්‍රමාද ව ගබ පිරිමෑසූහ.

තවද ඒ මාගේ [1]බෝධිසත්ත්වයන් වහන්සේ මතු සියලු සතුන්ගේ රාග කෙලෙසුන් දුරුකිරීමට දෙස් පාන්නා සේ මවුකුසව වැඩිද පටන් මෑනියන් වහන්සේගේ පුරුෂයන් කෙරෙහි රාග චේතනාවෙක් එ තුන්සිය දෑ ම නො හටගත. මෙසේ මාගේ බෝසතානෝ දසමසක් මවුකුස වැස සියලු බුදුන්ගේ ම උත්පත්ති කාලය වූ වෙසක මැදි පොහෝ දා සඳු විශාඛා නම් යෝගයෙහි සිටිය දී මෑනියන් වහන්සේට [2]දෙව්දහ නම් වූ කෝලිය නුවර ගොස් මවුපියන් දක්නා දොලෙක් වි ය. එ කල ශුද්ධෝදන රජ්ජුරුවෝ ඒ දොල අසා කිඹුල්වත් නුවර පටන් දෙව්දහ නුවර දක්වා මග සම කරවා කෙසෙල් තොරණ බඳවා දෙපස පුන්කලස හා විසිතුරුවූ ධවජ බඳවා පිළි තොරණින් සරා විලඳ පුන්සාල් අබ සමන්කැකුළු හීතණ යන ලද පස්මල් විසුරුවා මග සදා දේවීන් රන්සිවිගෙයක නංවා මගුල්වෙස් ගත් දහසක් ඇමැතියන් ලවා ඒ සිවිගෙය ගන්වා සිවුරඟසෙන් සමඟ රජපෙළහපින් මහත් වූ ආරක්ෂා දී යවූහ.

මෙසේ වූ මහා මඞ්ගලයෙන් මහා ශ්‍රීසෞභාග්‍යයෙන් මහ පෙළහරින් මහා උත්සවයෙන් යන්නා වූ ඒ මායා දේවීන් නම් වූ ඒ බුද්ධ මාතාවෝ සොළොස් කළයක් සුවඳ පැනින් නහා ලක්ෂයක් වටනා සළුවක් හැඳ, පාද පාදාංගුලි පාදකටක පස්රූ පස් පෙර හර එක්වැපී පාමුදු රන්මරවැඩි පාඩගම් [3]මිණිකොස් වැළ, සිරි වළලු දෙපට විද්‍යා අඟුල් දසරූ බාහුදණ්ඩ බුහුවැල ගලමුතුමාලා මැණික් මාලා දෑකන් පසෙවිකන් දසඅඟාතිලක මිණිදම්, නීලමාත්‍රා මුතුඔටුනු ආදි වූ සත්‍රී අලඞ්කාරයෙන් දෙවඟනක මෙන් සැරසී දහස් ගණන් සත්‍රීගණයා පිරිවරා ඒ මගුල් සිවිගෙය ගන්වා ගෙණ ගොස් දෙනුවර රජදරුවන් සමඟ උයන්කෙළි කෙළනා අතුරෙහි ලුම්බිනී නම් සල් උයනට පැමිණියෝ ය. එ සඳ ඒ උද්‍යානයෙහි පුන්නාග නාග තුවරක උද්දාලක මධුගන්ධික අශෝක කරවීර කර්ණිකාර තගර කේතක තිලක චම්පක විශාල ශාල සලල තමාලාදි නන් කුසුමයෝ ඒ උතුමාගේ උත්පත්තිශ්‍රී බලම්හ යි නික්මුනාවුන් සේ මුල් පලා කඳ පලා අතු පලා පිටත් ව ප්‍රබුද්ධ ව මුල පටන් අග දක්වා තුරූ වසා අතුරු නොදී සිටගත්හ. මල් රොන් ගන්නා බමරුන්ගේ නාදයෙන් හා තව්පුරා කෙසරුගෙණ ඔවුනොවුන් පරයා තුරූ අග හිඳ ලිය ගී නගන සියොතුන්ගේ නාදයෙන් හා එක නිත්‍යානාද ව ඉතා රම්‍ය විය.

1. බෝසතානන්, 2. දෙ වදූහා, 3. හිණ කොස්වැල.

කියන ලද්දේ මැයි:

විභූසිතා බාලජනාති චාලිනී
විභූසිතංගී වනිතෙව මාලිනී;
සදා ජනානං නයනාලි මාලිනී
[1]විලුම්පිනී චාතිවිරොචි ලුම්බිනී-යි.

තව ද තමා කරා එන ප්‍රිය වූ බිසෝවක පෙර මගට සතුටු පඬුරු යවන්නා වූ රජකු සේ එ කල ඒ ලුම්බිනී උද්‍යාන නම් රජ ද බිසෝවුන් උයන කරා සමීප වූ වේලෙහි පෙර මගට සුවඳ මඳපවන් නමැති සතුටු පඬුරු යැවී ය. එකල ඒ බිසවු සුවඳ මඳ පවන් ලදින් උයන දිසාව බලා උද්‍යාන ශ්‍රී දක උයන්කෙළි කෙළනු කැමැතිවූහ. ඒ අදහස් දත් ඇමැතියෝ එ පවත් රජහට සැලකර යැවූහ. එ පවත් රජ අසා උයන ද සරසව යි කියා බිසෝවුන් සිත් සේ උයන්කෙළි කෙළනා ලෙස අවසර දින.

බිසෝවු දහස් ගණන් ස්ත්‍රීන් පිරිවරා ඇමති සමඟින් උයනට වැද චිත්‍රලතා වනයට මෙන් විචිත්‍ර වූ චිත්‍රාඞ්ගනාවකසේ නන් තුරු කුසුම් බල බලා උයන් කෙළි මතින් මඟුල් සලවට කරා ගොස් මුල පටන් අග දක්වා මලින් සැදී තුබූ මංගල ශාල වෘක්ෂරාජයා දක ප්‍රීතිමත් ව විශාල වූ ශාල ශාඛාවක් අතින් ගනැපි ව රන් ලියක් මෙන් අත දිගු කළහ. එ කෙණෙහි ප්‍රේමකාන්තාවක දක අත දිගු කළා වූ කාමපුරුෂයකු සේ ඒ බිසෝවුන් දුටුවා වූ ශාලද්‍රුමරාජයා තමාගේ ශාඛා නමැති හස්තය නමා පැලීය. බිසෝවු ඒ ශාල ශාඛාව අතින් ගෙණ සිටියහ. එ කෙණෙහි කර්මජවාත චලනය වී ය. එ පවත් දත් ඇමතියෝ සිසාරා කඩතුරා ඇද රකවල් ගෙණ සිටියාහු ය. එ කෙණෙහි ඒ උතුමාගේ ප්‍රසව මංගල කාලයයි දසදහසක් සක්වළ දෙවියෝ රැස් ව පිරිවරා සිට ගත්හ. එ කල මෑනියන් වහන්සේ ඒ ශාලශාඛාව අල්වා ගෙණ සිටියදී ම බ්‍රහ්ම ලොකයෙන් බස්නා බ්‍රහ්මකුමාරයකු සේ, දිව්‍යලොකයෙන් බස්නා දිව්‍යකුමාරයකු සේ, ධර්මාසනයකින් බස්නා මහ තෙරකෙණකුන් සේ මවුකුසින් බිහි වූ සේක.

එ කෙණෙහි ශුද්ධාවාසයෙහි වසන අරහන්ත බ්‍රහ්මරාජයෝ මංගල සම්මත වූ රන්දැලක් දැතින් ගෙණ පෑ බෝසතුන් පිළිගෙණ රූපශ්‍රී බලා සතුටු ව "දේවීනි! තොප කුසින් මුළුලොවට මුදුන් මල්කඩක් වැනි වූ මහෙශාක්‍ය වූ පුතෙක් උපන. ඉතා සන්තොෂ වෙව" යි කියා මඟුල් තෙපුල් කී ය. අවශෙෂ වූ සත්ත්වයෝ මවුකුසින් පිටත් වන්නාහු ලේ මුසු වූ ශරීර ඇති ව ප්‍රතික්කූල වූ ශරීර ඇති ව පිටත් වෙති. ඔවුන්ට මහත් වේදනා දක්වා කර්මජවාතයෙන් මිරිකී ඉස යටත් ව ලා පෙරළී

1. විලුම්බිනී

කෙසිවියකින් අදනා ඇත් පොච්චන් සේ මවුන් මතු දරුවන් වැදීමට ලොභ නැති කරවා ප්‍රසූත වන්නාහු ය. එසේ හෙයින් මාගේ ස්වාමි දරුවාණෝ තමන්ට ද කිසි පීඩාවක් නැති ව මෑණියන් වහන්සේ නො දන්නා සේ, ධර්මකරකයක පුරා ලූ දියත්තක් යෙහෙන් පිටත් ව යන්නා සේ, අතුල් පතුල් දිගු කොට මවුකුසෙහි කිසි කුණුපයකුත් නුමුසු ව ඉතා පරිශුද්ධ ව, ඉතා විශාරද ව, ඉතා ප්‍රේමකර ව, කසීසළුවකින් වසා තුබූ ජාතිරඞ්ග මාණික්‍යරත්නයක් සේ දිලියෙමින් මවුකුසින් නික්මුනුසේක. මෙසේ පරිශුද්ධ වූ ශරීර ඇති ද බෝසතාණන් වහන්සේට ද, මවු දේවීන් වහන්සේට ද උපචාර සඳහා ආකාශයෙන් ජලස්කන්ධයෝ දෙදෙනෙක් පිරීකඳන් සේ දිව අවුත් දෙදෙනා ම පිරිසිදු කොට නාවා අන්තර්ධාන ව ගියාහු ය.

එ කල බෝසතාණන් වහන්සේ [1]රන් දූලට බිහි ව පිළිගෙණ සිටි බ්‍රහ්මරාජයා අතින් වරම් රජදරුවෝ සතරදෙනා අභිමඞ්ගල සම්මත වූ සිනුම් පහස් ඇති අඳුන් දිවිසමින් පිළිගත්හ. ඔවුන් අතින් මඟුල් මහ ඇමැතියෝ දිව්‍යදුකුල චුම්බටකයෙන් පිළිගත්හ. ඒ ඇමැතියන් අතින් බසිමින් පොළොව පලා සිරිපතුල්සුං දිගු කළසේක. එ කෙණෙහි පොළොව පලා මහ පියුමෙක් පැනනැගී සිරිපතුල් පිළිගත. එ කෙණෙහි පියුම්ගබ රාජහංස ලීලායෙන් වැඩසිට පැදුම් දිසාව බැලූසේක. එ දෙස දසදහසක් සක්වළ ම එකාඞ්ගන ව පෙණී ගි ය. එදෙස දෙවියන් හා මනුෂ්‍යයෝ සුවඳින් මලින් පුදා දෙහොත් මුදුන් දී "ස්වාමීනි! මහා පුරුෂයාණෙනි! මෙ දෙස නුඹ හා සම කෙණෙකුත් නැත. නුඹට වඩා කෙණෙකුත් නැත නුඹ ම උතුරුද්ද ය"යි කිය කියා වැන්දාහු ය. නැවත දකුණු දිග බැලූසේක. එ දෙසත් ලොව එකාඞ්ගන වී ය. දෙවිමිනිස්සු වැඳුම් දී "හිමි! නුඹට වඩා උත්තර කෙණෙක් නැතැ"යි ආශීර්වාද කළ හ. ඉක්පසු පශ්චිම දිග බැලූසේක. එදිග දිව්‍යමනුෂ්‍යයෝ හැම සාධුනාද පවත්වා මලින් ගඳින් පුදා "හිමි! නුඹට වඩා උත්තර කෙනෙක් මේ දිගත් නැතැ"යි කියා සතුති ඝොෂා කළහ. ඉක්බිති උතුරුදිග බලා එ දිග දෙවිමිනිසුන් වැඳුම් දුන් කල මෙසේ සතර මහදිගය, සතර අනුදිගය, පොළොවය, අහසය, යන මේ දස දිග් බලා තමන් හා සම කෙණෙකුත් නො දැක "මට උතුරු ව සිටි එක ද සත්ත්වයෙකුත් නැත. එසේ හෙයින් මම ම උතුරු වෙමි"යි නැඟූ නැඟූ පත්ලෙහි පියුම් නංව නංවා සත් පියවරක් උතුරු දිගට වැඩ සප්ත පදනතයෙහි සිට:

---

1. රන්දැලින්

"අග්ගොහමස්මි ලොකස්ස-ජෙට්ඨොහමස්මි ලොකස්ස,
සෙට්ඨොහමස්මි ලොකස්ස-අයමන්තිමා ජාති
නත්ථි දානි පුනබ්භවො"යි.

යනාදීන් අභීත වූ සිංහනාදයෙන් ගර්ජනා කළසේක. එ දවස් මාගේ ස්වාමිදරුවන් මවුකුසින් බිහිවූද සත් පියවරක් ඔසවා ගොස් කළා වූ මේ අභීත නාදය දසදහසක් සක්වළ මුළුල්ලෙහි බඹලොව ගසා පැවැත්ත එ කෙණෙහි දස දහසක් සක්වළ දසදහසක් සහම්පතී මහා බ්‍රහ්මයෝ තුන්ගවු සා සේසත් ගෙණ බෝසතුන් සිරසමට ධරා පූජා කළහ. තවද දස දහසක් ශක්‍රයෝ එක්සිය විසිරියන් දිග ඇති සාරමස් දෙපෝයක් නො නැසී පවත්නා නාද ඇති දස දහසක් දකුණුසක් තුඹ තබා පිඹ පූජා කළහ. තව ද දස දහසක් සුයාම රජහු තුන්ගවු දිග චාමර සලා පූජා කළහ. තව ද දස දහසක් සන්තුෂිත දිව්‍යෙන්ද්‍රයෝ තුන්ගවු සා ම දසදහසක් මිණි තල් වැට සලා පූජා කළහ. තව ද දස දහසක් පඤ්චසිඛ දිව්‍යපුත්‍රයෝ තුන්ගවු දිග මිණි වීණා ගායනාවෙන් පූජා කළහ. තව ද සුනිර්මිත පරනිර්මිතාදි සෙසු දිව්‍යරාජයෝ රන් කරඬු, රුවන්කරඬු, රන්මරවැඩි, රුවන්මරවැඩි, මිණිඔටුනු, තලල්පට, මඟුල්කඩු, දිවමල් කඳු, දිවසුවඳ කඳු, දිවසඳුන් සුණු ආදි සියගණන් මඟුල් සත්කාර ගෙණ සීට අපමණ වූ පූජා කළහ, තව ද මවුකුස පිළිසඳගත් වේලෙහි සෙයින් ම එ දා මවුකුසින් බිහි වූ වේලෙහි ද ලොවට අද්භූත වූ පූර්වනිමිති පූජා දෙතිස ද වී ය.

මෙසේ තමන් බුදු වන ජාතියෙහි මව්කුසින් බිහි වූ ඇසිල්ලෙහි ම දස දහසක් සක්වළ මුළුල්ලෙහි ම සැටදහසක් කාමාවචර දිව්‍යලොකවල අනූ දහසක් දිව්‍යරාජයන් කළ පූජා හා, තව ද දස දහසක් සක්වළ මුළුල්ලෙහි ම අරූතල අසංඥතලයන් හැර එක්ලක්ෂ පණස් දහසක් රූපාවචර බ්‍රහ්මලොකවල බ්‍රහ්මරාජයන් කළ පූජා හා, අද්භූත පූජාවන් දෙ තිස් දෙනා හා, දෙලක්ෂ සතළිස් දහස් දෙතිස් මහා පූජාවක් මෙසේ ලත් හෙයිනු ත්, මෙසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, ත්‍රිභුවන තිලක වූ ත්‍රිභුවනාධිපති වූ ත්‍රිභුවනේශ්වර වූ, ත්‍රිභුවන නායක වූ, ත්‍රිභුවන කල්පද්‍රැම වූ ත්‍රිභුවන චූඩාමණි වූ, ත්‍රිභුවන චින්තාමාණික්‍ය වූ, ත්‍රිභුවන ප්‍රදීප වූ, ත්‍රිභුවනාලොක වූ, මාගේ බුදුහු අභීත් නම් වන සේක. එසේ හෙයින් කියන ලද්දේ මැයි:

පූජාවිසෙසං සහපච්චයෙහි
යසමා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං"ති ලොකෙ
තසමා ජිනො අරහති නාමමෙතං–යි.

මේ පූජාවලියෙහි අප බුදුන් ලුම්බිනීවනොද්‍යානයෙහි දී ලද ප්‍රසව මඞ්ගල පූජා කථා නම් වූ

නව වන පරිච්ඡේදය නිමි.

දස වන පරිච්ඡේදය

තව ද: අප බුදුන් පැවිදි වන දා ලද මහබිනික්මන් පූජා නම් කවරහ? යත්;

මෙසේ මාගේ ස්වාමිදරුවාණන් ලුම්බිනී වනොද්‍යානයෙහි දී මුළු ලොවට මුදුන් මල්කඩක් සේ, මුළු ලොවට අමා කඬක් සේ, මුළු ලොවට රුවන්කඩක් සේ, මවුකුසින් බිහිව මෙසේ මුරු බඹ කැලන් කළ පූජා ලත් කල ශාක්‍ය-කෝලිය දෙනුවර එක්ලක්ෂ සැටදහසක් රජදරුවෝ මහත් වූ පෙළහර කොට බෝසතුන් කිඹුල්වත් පුරයට ම වඩාගෙණ ගියහ.

තව ද; වෙස්සන්තර ජාතියෙහි මද්‍රිදේවී බෝසතුන් හා සමගම සම වූ ආයුඃශ්‍රීන් රාජ්‍යශ්‍රී විඳ එයින් සැව බෝසතුන් හා සමග ම තුසීපුරයෙහි ඉපැද සත් පණස්කෙළ සැටලක්ෂයක් හවුරුදු මුළුල්ලෙහි බෝසතුන්ට ම අගමෙහෙසුන් ව වැස, දෙව්බඹුන්ගේ ආරාධනා ඉවසා බෝසතුන් අවුත් මේ ශුද්ධෝදන රජහට දා ව මෙ මහා මායා දේවීන් කුස පිළිසඳ ගත් වේලෙහි ම ඒ අගමෙහෙසින් වූ දිව්‍යාඞ්ගනාවෝ ද තුසීපුරෙන් සැව අවුත් දෙව්දහ නම් වූ කෝලිය නුවර මහාමායා දේවීන් බෑ සුප්‍රබුද්ධ රජහට දා ව සුද්ධෝදන රජ්ජුරුවන් නං වූ අමිතා නම් බිසොවුන් කුස පිළිසඳ බෝසතුන් මවුකුසින් බිහි වූ එම වෙසඟ මැදි පොහෝ දා විසා නකතින් තුමූ ද බිහි ව යශෝධරා නම් ලද. එ දා ශුද්ධෝදන රජ්ජුරුවෝ "මපුතනුවෝ මහපින් ඇතියහ. අද උන් හා එක නකත උපන් රජ දුවක් කවරක් දෝ හෝ" යි තෙසැට දහසක් රාජධානි පරීක්ෂා කරවා තමන් නැඟනියන් එ දා දුවක ලදහ යි අසා "ම ජ්‍යේෂ්ඨ මපුත නුවන්ට මතු අගමෙහෙසුන් වේ"යි කියා එ දවස් ම පුතනුවන් නමින් කිරිමවුන් ලවා සියලු මගුල් ම එක දා කරණ සේ නියෝග කළහ.

මෙසේ යශෝධරා දේවිය, කණ්ථක නම් අශ්වරාජයා ය, ඡන්න නම් අමාත්‍යයා ය, ආනන්ද මහ තෙරුන් වහන්සේ ය, කාළුදායී නම් අමාත්‍යයානෝ ය, සතර මහා නිධානය, ශ්‍රී මහා බොධීන්වහන්සේ ය, යන මේ වස්තු සත එක දා ම උපන. ඒ සතරමහානිධාන යෙන් ශංඛ නම් නිධානය වටින් ගව්වක් තැන. එල නම් නිධාන ය වටින් දෙගව්වක් තැන. උත්පල නම නිධාන ය වටින් තුන් ගව්වක් තැන. පුණ්ඩරීක නම් නිධානය වටින් සතර ගව්වක් තැන. ගැඹුරෙන් දෙලක්‍ෂ සතළිස් දහසක් යොදුන් මහපොළොව හා සම වූ ගැඹුර ඇත්තේ ය එසින් එක නිධානයෙක පිඹානය හැරපියා ඔබගේ විධානයෙන් මුළු ලෝ වැසියෝ කැමැති කැමැති පමණ සත්රුවන් උකාගෙණ යෙත් නමුත් ගත් තැන් පිරේ ම ය. අගලක් තැණුත් අඩු නොවේ ම ය. නො එක් ජාතියෙහි දිළිඳුන් ගේ සිත් පුරා හැනෑ යි නො කියා දුන් සතතසතතාදී දානපාර මිතාවන්ගේ ආනුභාවයෙන් ම සතර මහා නිධානය ලද සේ යැයි දතයුතු.

තව ද ඒ ශුද්ධොදන රජ්ජුරුවන්ගේ පියානන් සිංහහනු නම් රජ්ජුරුවන්ගේ අග්‍රපුරොහිත වූ කාළදෙවල නම් අමාත්‍යයානෝ ශුද්ධොදන රජ්ජුරුවන් බාල කල ශිල්ප උගන්වා පසු ව පියරජ හුගේ අභාවෙන් ශුද්ධොදන රජ්ජුරුවන් රාජ ශ්‍රී විඳිනා කල තමන් දුන රජ්ජුරුවන් ආදර දක්වන හෙයින් ගිහිගෙයි නො රඳම් යි තපස් කොරම් යි අවසර ඉල්වා "එසේ වී නම් මපියානන් වහන්සේත් නැත. ගුරු වූ නුඹවහන්සේ ත් දුරකව ගියහොත් මට රක්‍ෂාව නැත මාගේ මේ උයනේ ම වැඩහිඳ තපස් කොට නිතර ම මාගේ ගෙට ම වැඩ වළඳා වදාළ මැනවැ"යි රජ්ජුරුවන් කී කල එසේ ම කෙරෙම් යි රජ්ජුරුවන්ට ප්‍රතිඥ දීලා ගොස් තපස් වෙස් ගෙණ එම උයන වාසය කොට භාවනා කරන්නාහු නොබෝ දවසකින් රූපවිරාගය කොට අභිඥ ලදින් අතීතයෙන් සතළිස් කපක් හා අනාගතයෙන් සතළිස් කපක් හා අසූ කපක් දක්නා නුවණ ඇති ව රජ ගෙයිදී වළඳා වදුරා රාත්‍රිභාගයෙහි එම උයනේ වැස දිවාවිහාර සඳහා සමහර දවසෙක නාගභවනයට ගොස් නයින්ගේ දිව්‍යොද්‍යානවල ධ්‍යානසුවයෙන් හිඳිති. සමහර දවසෙක ගරුඬ භවනයෙහි ගොස් හිඳිති. සමහර දවසෙක අසුර භවන යෙහි ගොස් හිඳිති. සමහර දවසෙක උතුරුකුරු දිවයින් ආදි

යෙහි ගොස් සිදිති. සමහර දමසෙක ශක්‍රයාගේ නන්දනොද්‍යානයෙහි ගොස් හිඳිති. ලෝකයෙහි බුදුන්ගේ ප්‍රසිද්ධ උත්පත්ති ආදි වූ දෙතිස් පූර්වනිමිති පෙනෙන්නා වූ මහාමඞ්ගල්‍ය කාලයෙහි ලොව යම් සෘෂිකෙනෙකුත් ධ්‍යානසුවයෙන් ඉඳීම මාගේ බුදුන්ගේ ම එක් අද්භූත වූ ධර්මයක් ම හෙයින් එ දවස් කාලදෙවල නම් තාපසයෝ ද රජගෙයි දී වළඳලා දිවාවිහාර සඳහා ශක්‍රභවනයට නැඟී ශක්‍රයාගේ නන්දනොද්‍යානයෙහි දිව්‍ය ප්‍රාසාදයෙක දිව්‍යාසනයක් මතුයෙහි ධ්‍යාන සුවයෙන් උන්හ.

එ දා මෙසේ බුදුන්ගේ උත්පත්ති ශ්‍රී දුටුවා වූ දේවතාවෝ "කිඹුල්වත් නුවර ශුද්ධෝදන රජහුගේ පුත්‍රරුවනෙක් උපනී. ඒ උත්තමයා බෝමැඩ අරා බුදු ව ධම්සක් පතුරුම යි. ඔහුගේ බුද්ධ ශ්‍රී බලමිනැ"යි කිය කියා තව්තිසා දිව්‍ය ලොකයෙහි දෙවියෝ අත්බැල් බැඳ නට නටා ගී කිය කියා නඳුන් උයන් ආදියෙහි ඇවිද මහත් වූ උත්සවයෙන් නෙසියාඹම් කෙළනාහු ය. එ වේලෙහි ඒ කාල දෙවල නම් තාපසයෝ ධ්‍යානයෙන් නැගී දෙවියන්ගේ මේ උත්සව කෙළි දැක "මේ වැනි උත්සව කෙළියක් අතික් කාලෙක නුදුටු විරීම. කිමෙක් ද? දෙවියෙනි! තොපගේ මේ ශක්‍රදෙවේන්ද්‍රයා අතික් ශක්‍රයකුගේ සම්පත් ලැබපී ද, තව ද, අඩු ආක්තෙක්‍රක් දෙවහනත් ලැබපී ද, කිමෙක් ද? අද ඉතා කුල්මත්නැ"යි විචාළහ. දෙවියෝ කියන්නාහු "ශුද්ධෝදන රජහුගේ පුතෙක් උපන. එ කුමර පන්තිස් හවුරුද්දකින් ලොව්තුරා බුදු වෙයි. ඒ කාල ය අපගේ දිව්‍ය ගණනායෙන් එක්විසි පැයෙක; එසේහෙයින් ඔහුගේ බුදුසිරි ඇසිල්ලකින් දකිනා හෙයින් සතුටු වම්හ"යි කීහ.

කාලදේවලයෝ දෙවියන්ගේ බස් අසා තුඹු ද ආශ්චර්යවත් ව ඇසිල්ලකින් දෙව්ලොවින් බැස රජුගේ ගෙට ගොස් පණවන ලද ආසනයෙහි පලක් බැඳ උන්හ. ඉක්බිත්තෙන් ශුද්ධෝදන රජ්ජුරුවෝ අවුත් තාපසයන් වැඳ සිටියහ. එ කල තාපසයෝ "මහරජ! තොපගේ දේවීන් පුතකු ලදහ යි ඇසීම්. එ කුමරුන් දුන් ම දකිනා කැමැත්තෙමි"යි කීහ. රජ්ජුරුවෝ එ බස් අසා ගෙට දිවගෙණගොස් පුතනුවන් නාවා මලින් ගඳින් සරහා ලක්ෂයක් අගනා පලසකින් වසා ගෙණවුත් "පුතණ්ඩ! මේ ස්වාමීන් වැඳ පින් පුරා ගන්නැ"යි කිය කියා තාපසයන් කරා බෝසතුන් පෑළූහ.

එ කල මාගේ ස්වාමිදරුවාණන් බුදු වන ජාතියෙහි කිසි කෙණෙකුත් නො වඳනා හෙයිනු ත්, වැඳුම් ගත් කෙණෙකුන් ඉස් මුදුන් සත් කඩක් ව පැලෙන හෙයිනු ත්, බෝසතුන්ගේ තෙජසින් හුනස්නෙන් හිඳගත නොහී තාපසයෝ නිමට බැස පීහ. එ කෙණෙහි බෝසතාණන්ගේ සිරිපතුල් සුං දෙක පෙරළි නැගී තාපසයන් ජටා මෙහි පෙණී මේඝකූටයෙන් පැන නැගි විදුලිය සුං දෙකක් සේ විරාජමාන විය. ඒ ආශ්චර්ය්‍ය දුටු පිය මහ රජ්ජුරුවෝ ප්‍රෙමධරා ගත නො හෙන්නාවූ තුමූද පුතනුවන්ගේ ඒ සිරිපතුල් සුං දෙක තමන් නලළ තබාගෙණ වැන්දහ. එ කල කාළදේවලයෝ "මේ කෙසේ වූ විස්මය පුරුෂයෙක් දෝ හෝ, අද ශක්‍රබ්‍රහ්මයෝ වූ නමුත් මා දැක නො මැඳ සිටි ය නො හෙති. හිරු සඳු දෙදෙන මා නො කැමැණි කරවා ආකාශයෙන් ගමන් යා නො හෙති. මේ රජ කුමරුවා එසේ වූ මා අඟින් වැඳුම් ගත. වැළි එකාන්තයෙන් මේ බුදු වේ දෝ හෝ බුදු ලකුණු මෝහට ඇද් දෝ හෝ" යි මිණි කැටපත් සුං දෙකක් බලන්නා සේ සිරිපතුල් සුං දෙක තමන් දෑතින් අල්වා ගෙණ මඟුල් ලකුණු බලන්නාහු පළමු කොට විසිතුරු වූ මලස්නක් සේ දෙපතුල් පුරා තුබූ අටතුරා සියක් මඟුල් ලකුණු දුටහ.

දෙපතුල් මැද පිහිටි සක්ලකුණු දෙක දුටහ. එකී එකී චක්‍රය සිසාරා සිටි දෙ දහසක් දැවි දැක, දැවි වටා සිටි රෙඛා දැක, අතර තුරෙහි ජිද්‍රුම්බ ලක්ෂණ දැක, එහි පෙළ මල් රැසක් සේ තුබූ සිරිවස දෙකය, ස්වස්තික දෙකය, නඳවට දෙකය, සෝවැති දෙකය, අවතංස දෙකය, වඩමං දෙකය, භද්‍රපීඨ දෙකය, ප්‍රාසාද දෙකය, මඟුල් තොරණ දෙකය, සේසත් දෙකය, මඟුල් කඩු දෙකය, තාල වෘන්ත දෙකය, පිල් කලප් දෙකය, චාමර දෙකය, නලල්පට දෙකය, මිණිරුවන් දෙකය, සුමනදම් දෙකය, නීලෝත්පල දෙකය, රක්තෝත්පල දෙකය, ශ්වෙතෝත්පල දෙකය, රත්පියුම් දෙකය, නෙළපියුම් දෙකය, පුන්කලස් දෙකය, පූර්ණපාත්‍ර දෙකය, කිරි මුහුදු දෙකය, හිල්මුහුදු දෙකය, ප්‍රවාල සාගර දෙකය, ස්වර්ණ සාගර දෙකය, සක්වළ ගල් දෙකය, හිමාලය ගල් දෙකය, මෙර ගල් දෙකය, හිර විමන් දෙකය, සඳ විමන් දෙකය, පූර්වවිදෙහ දිවයින් දෙකය, පශ්චිම දිවයින් දෙකය, උතුරුකුරු දිවයින් දෙකය, ජම්බුද්වීප දෙකය, සප්තරත්න දෙකය, සපිරිවරින් සිටිත චක්‍රවර්ති දෙදෙනාය, දක්ෂිණාවර්ත ශංඛ දෙකය, ස්වර්ණ මත්ස්‍ය යුගල

දෙකය, චක්‍රායුධ දෙකය, සප්ත මහා ගංගාවෝ දෙදෙනාය, සප්ත මහා සීදන්තසාගර දෙකය, යුගන්ධර පර්වත දෙකය, ඊෂධර පර්වත දෙකය, කරවීක පර්වත දෙකය, සුදර්ශන පර්වත දෙකය, නෙමින්ධර පර්වත දෙකය, විනතක පර්වත දෙකය, අශ්වකර්ණ පර්වත දෙකය, අනවතප්ත විල් දෙකය, ඡද්දන්ත විල් දෙකය, කර්ණ මුණ්ඩ විල් දෙකය, රථකාර විල් දෙකය, සිංහප්‍රපාත විල් දෙකය, මන්දාකිණී විල් දෙකය, කුණාල විල් දෙකය, ගරුඬ රාජයෝ දෙදෙනාය, සුංසුමාරයෝ දෙදෙනාය, මගුල් ධවජ දෙකය, පතාකා දෙකය, ස්වර්ණ පර්වත දෙකය, ස්වර්ණ සිවිකා දෙකය, වල් විදුනා දෙකය, කෛලාස කූට දෙකය, සිංහරාජයෝ දෙදෙනාය, ව්‍යාඝ්‍ර රාජයෝ දෙදෙනාය, වලාහක අශ්වරාජයෝ දෙදෙනාය, උපෝසථ හස්තිරාජයෝ දෙදෙනාය, වාසුකී නම් නාගරාජයෝ දෙදෙනාය, හංසරාජයෝ දෙදෙනාය: වෘෂභරාජයෝ දෙදෙනාය, ඓරාවණ නම් හස්තිරාජයෝ දෙදෙනාය, ස්වර්ණ මකර රාජයෝ දෙදෙනාය, ස්වර්ණ නෞකාවෝ දෙදෙනය, සුරභිධේනුවෝ දෙදෙනාය, කිම්පුරුෂයෝ දෙදෙනාය, කින්නරාඞ්ගනාවෝ දෙදෙනාය, සඳකිඳුරෝ දෙදෙනාය, පුරවිකෙවිල්ලෝ දෙදෙනාය, මයූර රාජයෝ දෙදෙනාය, ක්‍රෞඤ්ච රාජයෝ දෙදෙනාය, චක්‍රවාකරාජයෝ දෙදෙනාය, ජීවංජීවකයෝ දෙදෙනාය,

චාතුර්මහාරාජික දෙව්ලෝ දෙකය, තව්තිසා දෙව්ලෝ දෙකය, යාම දෙව්ලෝ දෙකය, තුෂිත දෙව්ලෝ දෙකය, නිර්මාණරතී දෙව්ලෝ දෙකය, පරනිර්මිත වශවර්ති දෙව්ලෝ දෙකය, රූපාවචර වූ බ්‍රහ්මපාරිෂද්‍ය නම් බඹලෝ දෙකය: බ්‍රහ්ම පුරෝහිත නම් බඹලෝ දෙකය, මහාබ්‍රහ්ම නම් බඹලෝ දෙකය, පරිත්තාභ නම් බඹලෝ දෙකය, අප්‍රමාණාභ නම් බඹලෝ දෙකය, ආභස්වර නම් බඹලෝ දෙකය, පරිත්තසුභ නම් බඹලෝ දෙකය, අප්‍රමාණ සුභ නම් බඹලෝ දෙකය, ශුභකීර්ණ නම් බඹලෝ දෙකය, වෛහප්ඵල නම් බඹලෝ දෙකය, අසංඥසත්ත නම් බඹලෝ දෙකය, අවිහ නම් බඹලෝ දෙකය, අතප්ප නම් බඹලෝ දෙකය, සුදස්ස නම් බඹලෝ දෙකය, සුදස්සී නම් බඹලෝ දෙකය, අකනිෂ්ඨක නම් බඹලෝ දෙකයයි යන මේ දෙසිය සොළොස් මගුල් ලකුණු ඒ බෝසතාණන්ගේ සිරිපතුල් සුං දෙකින් බලං දුන එකාන්තයෙන් මේ උතුමා බුදු වේමයයි දැන තමා ද පාදනාය,

පටන් කෙසාන්තය දක්වා බලනුයේ ද තිස් මහා පුරුෂ ලක්ෂණයන් දිට

කෙසේ වූ ලක්ෂණයන් දිටී ද? යත්:-

රන් මිරිවැඩි දෙකක් සේ තැනී තිබෙන පතුල් ඇති පළමුවන ලක්ෂණය ය, ඒ පතුල් මැද පිහිටි චක්‍රලක්ෂණය ය, රත්පලස් හූවටක් සේ වට ව සිනිඳු ව දිගු ව තිබෙන්නා වූ විළුම් ඇති ලක්ෂණය ය, ක්‍රමයෙන් සිහින් ව දිගු ව තිබෙන්නාවූ ඇඟිලි ඇති ලක්ෂණය ය, ගිතෙල ගලාලූ පුලුන් සේ ඉතා මොළොක් ව සිනිඳු ව තිබෙන්නාවූ අතුල් පතුල් ඇති ලක්ෂණය ය, ජාල කවුළුවක් සේ ලක්ෂණයෙන් පිරුණාවූ හස්තපාදයන් ඇති ලක්ෂණය ය, පාද ගුල්ඵයන් යටි පතුල් පෙණෙන්නා සේ උස් ව තිබෙන්නා වූ ලක්ෂණය ය, එණි මෘගයන් බඳු වූ වට ව පිරී තිබෙන්නා වූ ජංඝා ඇති ලක්ෂණය ය, නො නැමී සිට අතුල් දෙකින් දෙදන මඩල පිරිමදනා වූ දීඝ හස්ත ඇති ලක්ෂණය ය, පුරුෂ ව්‍යඤ්ජනය පියුම් කෙමියක් රෝන්සලායෙන් සැඟවී තිබෙන්නා සේ කොශෝහිත වස්ත්‍රයෙන් සැඟවී තිබෙන්නා වූ ලක්ෂණය ය, දිවිදළින් ඔප් නැඟූ කනක රූපයක් සේ ඉතා සියුම් වූ ඡවිවර්ණී ඇති ලක්ෂණය ය, පියුම් පතෙහි දිය නො ඇලෙන්නා සේ රජෝජල්ලිකාවන් ඇඟ නො රඳන්නා වූ ලක්ෂණය, එකි එකී ලොම කූපයෙහි එකී ලොමයක් ම ඇති ලක්ෂණය ය, සියලු ලොමයන් අඳුන් වන් ව දක්ෂිණාවර්ති ව කැමී මුදුන් බලා සිටින්නා වූ ලක්ෂණය ය, සතර දිගට නො නැමී බ්‍රහ්මයා සේ ඍජු ව තිබෙන්නා වූ ගාත්‍ර ඇති ලක්ෂණය ය, දෙඅතුල් දෙපතුල් දෙඅංසකූට පිටිකර යන මේ සප්තස්ථානය පිරී උස්ව තිබෙන්නා වූ ලක්ෂණය ය, සිංහයකුට බඳු වූ ඌර්ධ්වකාය ඇති ලක්ෂණය ය, පිට රන්පෝරුවක් සේ තැනී තිබෙන්නා වූ අන්තරාංසයන් ඇති ලක්ෂණය ය, නිග්‍රෝධ වෘක්ෂයක් සේ උස හා සම වූ ව්‍යාමය–ව්‍යාමය හා සම වූ උසය යන සම පරිමණ්ඩල වූ ලක්ෂණය, රන්බෙරක් සේ සම ව වට වූ ග්‍රීවා ඇති ලක්ෂණය ය, සත්දහසක් රස නහරයන් නැඟී රස දිවට එක් ව උඩුබලා සිට රස ග්‍රාස ය කරන්නා වූ ලක්ෂණය ය, සිංහයකු සේ වට ව සිටිනා වූ හනුභාග ඇති ලක්ෂණය ය,

සමසතළිස් දන්තධාතූන් ඇති වන ලක්ෂණය ය, ගා සෙදූ සක් පත් වටක් සේ සම ව සිටිනා දන්තධාතූන් ඇති වන ලක්ෂණය, එක පෙළ හිඳුවාලූ විදුරු පෙළක් සේ නො සිදුරු ව තිබෙන්නා වූ දන්තයන් ඇතිවන ලක්ෂණය ය, නකත් තරු පෙළක් සේ සුදුරස් විහිදුනා

අනාකායන් ඇති වන ලක්ෂණය ය, දෙකන් සිදුරු තලල්තල තැනැ ඔබල පිරිමදනා වූ දිගු වූ ජිව්හා ධාතු ඇති ලක්ෂණය ය, කුරවීක නාදයක් සේ ඉතා මධුර වූ අෂ්ටාඞ්ග සමුපෙත බ්‍රහ්මනාද ඇති ලක්ෂණය ය, නිලුපුල් දෙකක් සේ නිල්රස් විහිදුනා වූ ඇස් ඇති ලක්ෂණය ය, එම ද වැදූ රකු වස්සකුගේ අක්ෂි මණ්ඩලය සේ පරිමණ්ඩල ව ජ්‍යොතිමත් ව තිබෙන්නා වූ ඇස් ඇති ලක්ෂණය ය, රන්ගල් මුදුනෙක නැගී දිලියෙන පුන්සඳ හුණක් සේ තලල් මැදින් නැගී දක්ෂිණාවර්ත ව නැමී උඩු බලා තිබෙන්නා වූ ඌර්ණරෝම ධාතුව ඇති ලක්ෂණය ය, දෙකන්සිළු පමන් තලල්තල රන්පටෙකින් වැසුවා සේ තිබෙන්නා වූ උණ්හිස සීස ලක්ෂණය ය, යන මෙසේ වූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් වෙන වෙන ම බලා ඒකාන්තයෙන් මේ උතුමා බුදු වේ ම ය යි දැන ඉතා සතුටු ව නැවත විශෙෂයෙන් බලන්නා වූ ඒ කාලදෙවලයෝ මේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් අනුව පවත්නා වූ ව්‍යඤ්ජන ලක්ෂණයන් අසූව ද දුටහ.

කෙසේ වූ ලක්ෂණ ද? යත්:-

චිතතංගුලි ය, අනුපුබ්බංගුලී ය, වට්ටංගුලි ය, තම්බ නඛ ය, තුඞ්ග නඛ ය, සිනිද්ධ නඛ ය, නිග්ගුළ්හ ගොප්ඵක ය, සමපාද ය, ගජ සමානක්කම ය, සීහසමානක්කම ය, හංස සමානක්කම ය, උසභ සමානක්කම ය, දක්ෂිණාවර්ත වූ ගාත්‍ර ය, සමන්තතො චාරු ජානු මණ්ඩල ය, පරිපූර්ණ වූ පුරුෂ ව්‍යඤ්ජන ය, අච්ඡිද්‍ර වූ නාභි ය, ගම්භීර වූ නාභි ය, දක්ෂිණාවර්ත වූ නාභි ය, හෙමගජ කරාකාර වූ ඌරුබාහු ය, සුවිභක්ත වූ ගාත්‍ර ය, අනුපූර්ව වූ ගාත්‍රය, මට සිලුටු වූ ගාත්‍ර ය, අනුස්සන්න වූ ගාත්‍ර ය, අලීන වූ ගාත්‍ර ය, තිලකාදි රහිත වූ ගාත්‍ර ය, අනුපූර්වයෙන් රුචිර වූ ගාත්‍ර ය, ඉතා පරිශුද්ධ වූ ගාත්‍ර ය, කොටි ශත සහස්‍ර හස්ති බල ධාරණ වූ ගාත්‍ර ය, උත්තුඞ්ග වූ නාස ය, සුරක්ත වූ විජමාංස ය, ශුද්ධ වූ දන්ත ය, සනිග්ධ වූ දන්ත ය, පරිශුද්ධ වූ ඉන්ද්‍රිය ය, වෘත්ත වූ දන්ත ය, රක්ත වූ ඔෂ්ඨ ය, ආයත වූ වක්ත්‍ර ය, ගම්භීර වූ පාණිතල ලේඛය, ආයත වූ ලේඛ ය, ඍජු වූ ලේඛ ය, රුචිර වූ සණ්ඨාන ලේඛ ය, පරිමණ්ඩල වූ ශරීරප්‍රභාව ය, සම්පූර්ණ වූ කපොල ය, දිගුපුළුල් වූ නෙත්‍ර ය, පඤ්චප්‍රසාද වූ නෙත්‍ර ය, ආකුඤ්චිතාග්‍ර වූ පබුම ය, මෘදුවූ තුනු වූ රක්ත ජිහ්වා ය, ආයත රුචිර වූ කර්ණ ය, ගණ්ඨින් විරහිත වූ ශීර්ෂ ය, නිග්ගුළ්හ වූ ශීර්ෂ ය, ඡත්‍රසන්නිභ වූ ශීර්ෂ ය, ආයත

පෘථුල වූ ලලාට ය, සුසණ්ඨාන වූ භ්‍රෑයුග්ම ය, සණ්හ වූ භ්‍රෑ යුග්ම ය, අනුලෝම වූ භ්‍රෑයුග්ම ය, මහන්ත වූ භ්‍රෑයුග්ම ය, ආයත වූ භ්‍රෑයුග්ම ය,

සුකුමාල වූ ගාත්‍ර ය, සෞම්‍ය වූ ගාත්‍ර ය, ඉතා උජ්වලිත වූ ගාත්‍ර ය, ඉතා සිලුටු වූ ගාත්‍ර ය, ඉතා කෝමල වූ ගාත්‍ර ය, ඉතා සිනිඳු වූ ගාත්‍ර ය, සුවඳ විහිදුනා වූ ගාත්‍ර ය, සම වූ ලෝම ය, කෝමල වූ ලෝම ය, දක්ෂිණාවර්ත වූ ලෝම ය, අති නීල වූ ලෝම ය, අති සනිග්ධ වූ ලෝම ය, අති සුඛුම වූ අස්සාස පස්සාස ධාරණ ය, සුගන්ධ වූ මුඛ ය, සුගන්ධ වූ මූර්ධන ය, සුනීල වූ කෙශ ය, දක්ෂිණාවර්ත වූ කෙශ ය, සුසංස්ථාන වූ කෙශ ය, සිනිඳු වූ කෙශ ය, සිලුටු වූ කෙශ ය, අලුලිත වූ කෙශ ය, සම වූ කෙශ ය, කොමල වූ කෙශ ය, සිරෝධාතු වෙත් වඩුරියනක් නැගී හැම වේලෙහි ම ජ්‍යොතිමත් ම තිබෙන්නා වූ කෙතුමාලා නම් රශ්මිකදම්බ යසි යන මෙසේ වූ අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණයන් ද යි මෙසේ තුන්සිය අටවිස්සක් මඟුල් ලකුණු දුක එකාන්තයෙන් ම මේ උතුමා මේ ජාතියෙහි ම බුදු ව ධර්මයක් දෙසා ම ය යි කියා උපන් ලකුණු තමන්ගේ වේදයෙන් දුක නුපන්නා වූ දනතාදි ලක්ෂණයන් තමන්ගේ දිවසින් දුක, කුල්මත් ව තමන් තපස්වී නියාව ද එ තැන ගිහිගෙය නියාව දුසි ප්‍රීතින් සිහි එලවා ගත නොහී පිරුණු පැන්කලයක් මුහුණින් නැමූ කල බක බකයේ පැන් වැගිරෙන්නා සේ කක කකයේ සි දමා පීහ.

ඉක්බිත්තෙන් "මේ උත්තම පුරුෂයාගේ බුද්ධ ශ්‍රී දක්ක හෙම් දෝ හෝ නො හෙම් දෝ හෝ" යි දිවසින් බලා අතුරෙහි තමන් මිය බුදුන් සියයක් දහසක් ලක්ෂයක් ඉපැදත් සසරින් මුදාගත නො හැකි අරූපලයෙහි උපදනා සේ දුක "ඉතා මහත්ත වූ හානි යෙක මට වූයේ" යි ශොක කරන්නාහු බුන් කලයෙකින් පැන් වැගිරෙන්නා සේ කඳුළු ධාරාවන් වගුරුවා හැඬූහ. අමාත්‍යයෝ මේ සිනාව හා ඇඬීමෙන් තාපසයන් කලාවූ කාරණ දෙක ම දුක 'කිමෙක් දෝ හෝ මේ බෝසතාණන්ට අතුරෙහි වන අනතුරක් දුක අඬද් දෝ හෝ' යි සැක වූ සිත් ඇතියාහු "කිමෙක, හිමි! තෙපි දුන් ම මහත් කොට සිනුව, සිනා කෙළවර වලපිතව පටන්ගතුව. කාරණ කිමෙක් දෝ හෝ' යි විචාළහ. තාපසයෝ කියන්නාහු 'මේ කුමරුවා මතු බුදු වන සේ දුක සන්තොෂයෙන් සිපිමි. ඔහුගේ බුද්ධ ශ්‍රී මා නො දක්නා සේ දුක මම ම මා කෙරෙහි කළ

කම්පාවෙන් ශෝක ගෙණ හැඬීම්. මේ කුමරුවාට වන අනතුරෙක් නැතැ" යි රජ්ජුරුවන් හා අමාත්‍යයන් සතුටු කරවා රජගෙන් නික්ම සිතන්නාහු "මම මේ කුමරුවාගේ බුඩ ශ්‍රී දක්නා නොහෙමි: මාගේ නෑයන්ගෙන් බුදු සිරි දක්නට පොහොසත් කෙණෙක් ඇද්ද නො හෝ"යි සිතා පරීක්‍ෂා කරන්නාහු තමන්ගේ නාලක නම් බෑනා කෙණෙකුන් ඇති සේ දැන එ කෙණෙහි එම නුවර වසන තමන් නැගනියන්ගේ ගෙට ගොස් පැණවූ අස්නේ හිඳ "නඟ! තොප පුතු වහා ගෙණෙව"යි කියා බෑනනුවන් කැඳවා කියන්නාහු "ශුද්ධෝදන රජ්ජුරුවන්ගේ අද උපන් පුතනුවෝ පන්තිස් හවුරුද්දක් ගියකල ලොවුතුරා බුදුවෙති. මුළුලෝ දුකින් මුදති. ආයු මඳහෙයින් මම ඔවුන්ගේ බුඩ ශ්‍රී දක්නා නො හෙමි. තෝ මට මෑරුවේ දූන් ම ගිහිගෙන් ගොස් ඔවුන් සමින් පැවිදි ව ඔවුන් බුදු වූ කල බුදුසිරි බලා සසරින් ගැලවී ගණැ" යි කියා බෑනාට අනුශාසනා කොට ගියාහු ය.

ඒ නාලක නම් බෑනනුවෝ ද පෙර තමන් පියුමුතුරා නම් බුදුන් සමයෙහි ඒ බුදුන් සස්නෙහි නාලක නම් මෝනෙය්‍ය පිළිවෙත් පුරන්නා වූ භික්‍ෂු කෙණෙකුන් අග්‍ර වූ සේ දැක "මම ද මතු බුදුකෙණෙකුන්ගේ ශාසනයෙක නාලක නම් පිළිවෙත් පුරන්න වුන් කෙරෙහි අග්‍ර වෙම්ව" යි එ කල දනාදී වූ පින් කොට කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි පුරණලද්දවූ ප්‍රාර්ථනා ඇති කෘතාධිකාර පුරුෂයා හෙයින් මී මයිල් තාපසයන්ගේ බස් අසා සතාසූ කෙළක් ධන ඇති කුලෙහි බ්‍රාහ්මණ සාර සැපත් හැරපියා "එකාන්තයෙන් මාගේ මයිල් තාපසයෝ මට වැඩක් කැමතියාහ" යි සතුටු ව වීපි යව යවා කසා පිළී හා මැටිපාත්‍රයක් ගෙන්වා ගෙණ ඉසකේ කපා කාෂාය වස්ත්‍ර ධාරා බෝසතුන් දසාවට ඇඳිලි බැඳ සිට පසඟ පිහිටුවා වැද "මතු බුදු වන උතුමානෙනි! තොප උදෙසා මහණවිමි"යි කියා පාත්‍ර ය පසියේ බහා කර ලාගෙණ හිමාලය වනයට ගොස් මහණදම් පුරා පසු ව මාගේ බුදුන් බුදුව බරණැසදී ධම්සක් දෙසූ සත් වන ද අවුදින් බුදුන් දැක නාලක නම් පිළිවෙත් ඉගෙණ සත් මසක් රැක්‍ෂ වූ ඒ පිළිවෙත් පුරා හිමාල ය වනයට ගොස් ගරු වූ භාවනා කොට එ කෙණෙහි රහත්,ව රන්පවීනයක් මුදුනෙහි වැඩ සිට සිටිපිය නො සොල්වා නිරුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවියහ:

මෙසේ මාගේ බුදුහු තමන් මවුකුසින් උපන්දා ම කාලදේවල නම් සෘෂින්ගෙන් ලබනලද්දා වූ නමස්කාර පූජා ය, ඒ සනෙනාම

යෙහි පිය මහ රජ්ජුරුවන්ගෙන් ලබනලද්ද වූ නමස්කාර පූජාය. එම දා ම තමන් තමට මහණ වූ කාලක නම් මහ තෙරුන්ගෙන් ලද සම්‍යක් ප්‍රතිපත්ති පූජාය යන මේ තුන් පූජාවක් ලත් හෙයින් මෙසේ වූ පූජා විඳිමව ශුද්ධ හෙයිනුත් අශීන් නම් වන සේක.

තව ද: මෙසේ මාගේ බෝධිසත්වයන් උපන් පස් දවසින් නම් තබන මඟුල් කරණ දා සුවඳ දියෙන් නාවා මලින් සරහා රජ ගෙය රත් සඳුන්, කපුරු, කොකුම්, තුවරලා යන සිවුද්ද ගඳින් පිරිබඩ ගෙණ ලද පස්මල් විසුරුවා හිඳිනා අසුන් පණවා චතුර්වේද යෙහි නිපුණ වූ බ්‍රාහ්මණයන් අටතුරාසියක් ගෙන්වා පැන් නො වකා පිසූ කිරිබත් රන් තලිවලින් කවා තලි සමඟින් දී, පස් පලවතින් බුලත් දී, සත්කාර කොට "ම දරුවන්ගේ ලක්ෂණ බලා කියව"යි නියොග කළහ.

ඔවුන් අතුරෙහි හැමදෙනාට ශිල්ප දුන් රාම ය, ධජ ය, ලක්ෂණ ය, [1]ජාතිමන්ත්‍රි ය, කොණ්ඩඤ්ඤ ය, භොජ ය, සුයාම ය, [2]සුදත්ත ය, යන මේ ආචාර්‍ය්‍ය බමුණන් අටදෙනා අතුරෙන් වැඩිමාලු සත්දෙන බෝසතුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ හා අසූ අනුව්‍යංජන ලක්ෂණයන් දැක "මේ කුමර ගිහිගෙයි වෙසේ නම් චක්‍රවර්ත්ති රජ ව, සතර මහා සෘද්ධි ඇති ව, සතර මහා ද්වීපයෙහි ආකාශයෙන් ඇවිද අනුශාසනා කෙරෙයි. මහණ වී නම් ලොවුතුරා බුදුව දිව්‍යබ්‍රහ්මයන් අතින් වැඳුම් ගන්නා පින් ඇත්තේ ය යි ව්‍යාකරණ දෙකක් කියා සත්දෙන ම දෙ ඇඟිලි ඔසවා පෑහ. ඔවුන් සත්දෙනාට බාල සුදත්ත කොණ්ඩඤ්ඤ නම් බමුණු ආචාර්‍ය්‍ය තෙමේ උර්ණ ලොම ධාතුව සුදු සේ දැක චක්‍රවර්ත්ති වී නම් මේ ලොම ය රන්තිලකයක් සේ තිබෙයි. බුදු වන්නාහට මකුල් තිලකයක් සේ තිබෙයි. එකාන්තයෙන් මේ කුමර බුදු වේ ම ය"යි කියා එකැඟිල්ලක් ඔසවා පෑහ.

එ දා ඒ මඟුල් පිණිස රැස් වූ බ්‍රාහ්මණයෝ මේ කුමර මතු ලොවට ද සිද්ධාර්ථ කෙරෙයි. තමාට ද සිද්ධාර්ථ කෙරෙයි කියා සිද්ධාර්ථ කුමාර යයි නම් තබා ගියහ. ගොසින් ඒ බමුණෝ අටදෙන නම් තමන්ගේ ගෙයිදී පුතුන් කැඳවා කියන්නාහු, "දරුවෙනි! ශුද්ධොදන රජ්ජුරුවන් පුතනුවෝ සිද්ධාර්ථ කුමාරයෝ පන්තිස්

1 මන්තීය. 2 සුදත්ත කොණ්ඩඤ්ඤය.

හවුරුද්දක් ගියකල බෝමැඩ හරා බුදු වෙති. අපි ඉතා මහල්ලම්හ. තෙපි උන්ගේ සසුන් මැද මහණ ව සසරින් ගැලුවෙව" යි අවවාද කිහ. ඔවුන් අතුරෙන් මහලු සත්දෙන නොබෝ කලෙකින් පර ලොව ගියහ. ලදරු සුදතන කොණ්ඩඤ්ඤ මානවකයෝ ඉතා නිරෝගීහ. නිරෝගී හෙයින් එ කල ගිහිගෙය හැරපියා තවුස්වෙස් ගෙණ දඹදිව ඇවිදිනාහු උරුවෙලා නම් දනව්වෙහි ඉසිපතන් ගොස් මේ භූමිභාගය තපස්වීන්ට රම්‍ය යයි එ තැන සිත් අලවා 'සිද්ධාර්ථ කුමාරයන් වහන්සේ මහභිනික්මන් කරණ කල් දක්වා මෙ තැන වෙසෙම්" යි වාසය කොට බෝසතුන් මහභිනික්මන් කළ බව අසා පසු ව මහලු බමුණන් සත්දෙනාගේ දරුවන් කරා ගොස් "ඉදින් තොපගේ පිය බමුණෝ දූත් ඇත්තාහු වූ නම් බෝසතුන් හා සමඟ මහණ වෙති. ඉදින් තෙපි හැම කැමැත්තාහු වූ නම් මා හා සමඟ එව" යි කියා හැමදෙනා ම නො ගිවිස්නා හෙයින් භද්දිය ය, වප්ප ය, මහානාම ය, අස්සජි ය, යන සතරදෙනා ගිවිස්වා ගෙණ මහණ කරවා ගෙණ ගොස් මෙසේ පස්දෙනා වහන්සේ උරුවෙලා නම් දනව්වෙහි විසූ සේක. පස්වග මහණුන්ගේ උත්පත්ති කථාව මෙසේ දත යුතු.

එ ද බොධිසත්ත්වයන්ට නම් තබන මගුලට රැස් වූ අසූදහසක් කුලෙහි නෑයෝ "මේ සිද්ධාර්ථ කුමාරයෝ මතු ඉදින් චක්‍රවර්තති වූ නම් ක්ෂත්‍රිය සේනාව ම පිරිවරා ඇවිදිති. ඉදින් බුදු වූ නම් ක්ෂත්‍රිය භික්ෂූන් ම පිරිවරා ඇවිදිති. මේ දෙ කාරණයෙන් ම අප දරුවන්ට මතු වැඩ වෙයි" සිතා අසූදහසක් ශාක්‍ය කුමරුවන් බෝසතුන් හා සමඟ වඩනා සේ එ ද ම රජගෙයි ලා ගියහ.

ඉක්බිත්තෙන් ශුද්ධොදන රජ්ජුරුවෝ "මපුතනුවන්ට කිරි මවුන් ගෙණෙව" යි ශාක්‍ය-කොළිය දෙ නුවරින් රජදූත් ගෙන්වා කිරිමවුන් තෝරන්නාහු ඉතා උස් වූ ගෑණුන් ඔර හිඳ කිරිබොන දරුවන් කර ඔසවා කිරිබොන හෙයින් ග්‍රීවා දික් වෙයි. ඉතා මිට්වූ ස්ත්‍රීන් ඇකයේ හිඳ කිරි බොන දරුවන් කර තමා බොන හෙයින් බද කර වෙයි. ඉතා සථූල වූ ස්ත්‍රීන් ඇකයෙන් වඩනා දරුවන් බකල වූ පා වෙයි. ඉතා දූජීල වූ ස්ත්‍රීන් වඩනා දරුවන් කලවේ සිහින් වෙයි. ඉතා එලලි වූ ස්ත්‍රීන්ගේ තනයේ කිරි හුණු වන හෙයින් හුණු කිරි පූ දරුවන් ඇඟ [1]ලවුණ ඇතිවෙයි. ඉතා කැළී වූ ස්ත්‍රීන්ගේ තනයේ කිරි සිහිල් වන හෙයින් ඇල් කිරි පූ දරුවන් ඇඟ මස් පිපිසලු වෙයි කියා මේ වරද සයින් දුරු ව උසු ත් නො

1 ලුණු.

වත, ශිටි ත් නො වත, සවුල ත් නො වත, දුජීල ත් නො වත, එළ ලි ත් නො වත, ¹කැලි ත් නො වත, ස්ත්‍රීන් ම තෝරා සියගණන් කිරිමවුන් ලූහ.

මෙසේ තරු පිරිවර සඳ සේ වැඩි මාගේ ඒ බෝසතාණන් පස්මැසි වූ කල ඒ ශුද්ධෝදන රජ්ජුරුවන්ගේ මහ පෙළහරින් යුක්තවූ වප් මඟුලෙක් විය. එ දා ඒ මුළුනුවර දෙව්නුවරක් සේ සරහා ඒ රජ ශක්‍රදේවේන්ද්‍ර ලීලායෙන් සැරහී දිව්‍යසේනාවක් බඳු වී මහ සෙනග පිරිවරා පායෙන් නික්මෙනුයේ පුත්‍රනුවන් රත්සිවු ගෙයකින් වඩා ගෙණ එ කෙත්වත් කෙත්‍රවර ඝන වූ ඡායා හා අභිනව වූ පත්‍රයෙන් ගැවසී ගත් මහ දඹගසක් මුල සුදුවැල්ලෙන් නවරා, යහන් සලසා, පුත්‍රනුවන් ඒ යහනට වඩා, රන් තරු රිදී තරුවෙන් විසිතුරු වූ වියන් බඳවා, වටතිර අද්දා, රැකවල් ලවා, තුමූ ද ඇමැති දහස් පිරිවරා කෙත්වතට වැද වප් මඟුල් කෙරෙති. එ දා ඒ වප් මඟුලෙහි ගෑමිදෙන ම සුදු පිළි හැඳ, සුවඳ මලින් සැරහී, කෙත්වත පුරා සිට ගත්හ. ඒ වප් මඟුලෙහි දහසක් පමණ නඟුල් එකවිට ම යොදන ලද. එයින් අමතුරාසියක් නඟුල් රිදී පතින් වසා ගොණුන්ගේ අංවල රිදී කුප්පි බහා කර සුදුමල් කඳු බැඳ යොදා සිටුවනලද. රජ්ජුරුවන් අතට වඩනා නඟුල සතරන් පතින් වසා ඔබගල මාඟගරාජයන්ගේ අංවල රන්කුප්පි බහා කර රන්වන් මලින් සරහා පිට රන්සැදින් වසා යොදා සිටුවන ලද.

ඉක්බිත්තෙන් රජ්ජුරුවන් වමතින් රන්නඟුල ගෙණ, දකුණතින් රන්කැවිට ගෙණ, සිටගත් කල අමතුරාසියක් මඟුල් ඇමැතියෝ මඟුල්වෙස් ගෙණ, රිදී නඟුල් රිදී කැවිටි ගෙණ, සිටගණිති. පරිවාර ජනයෝ මඟුල් මේස් ගෙණ දහසක් ගොන්ගේ යොදා සිටගණිති. රජ්ජුරුවෝ දකුණතින් රන්කැවිට ගෙණ නැගෙණහිරින් බස්නාහිරට එක හිවටක් ලා ලති. එ දා ඒ මඟුලෙහි රජ්ජුරුවන්ගේ මඟුල් මහ ඇමැතියෝ තුන් තුන් හිවිට ලා ලති. සෙසු දහසක් පුරුෂයෝ දහසක් ගොන්ගේ ගෙණ ඔවුනොවුන් පරයා දක්ෂව වප්මඟුල් කෙරෙති. එදා ඒ උත්සවයෙහි රජ්ජුරුවන්ගේ රන් ධජ ය, රිදී ධජ ය, ²රන් පැන ය, රිදී පැන ය, රන් කලශ ය, රිදී කලශ ය, රන් කොතලා ය, රිදී කොතලා ය; රන් කරඬු ය, රිදී කරඬු ය, රන් කැටපත ය, රිදී කැටපත ය, රන් තල්වැට ය, රිදී තල්වැට ය, යනාදි වූ රජ පෙළහරින් ඒ කෙත තරුකැල

1 කැළලිත්, 2 රන් පාතය,

යෙන් ගැවසී ගත් ආකාශය සේ දිලියෙයි. එ දා ඒ හැම කිරිමවුන් බෝසතාණන් පිරිවරා උත්නාහු තිරයෙන් පිටත් ව රජ්ජුරුවන්ගේ මේ පෙළහර බලති.

එ කල මාගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝ ඇතුළෙහි කිසි කෙණකුනු ත් නැති සේ දැක, යහනින් නැඟී, පලක් බැඳ මැඩහිඳ, ආනාපාන සමෘති භාවනා කොට ප්‍රථමධ්‍යාන උපදවා, ධ්‍යාන සුවයෙන් උන්සේක. එවේලෙහි කිරිමවුන් ඇතුළුව මැද පලක් බැඳ හුන් බෝසතාණන් දැක ඒ දඹගස ඡායාව ද පෙරමරු බස්නාහිරව නො ගොසින්, පස්වරු නැගෙණහිරට නො ගොසින්, හැම වේලෙහි පිල්කුඩයක් සේ බෝසතුන් වසා ගෙණ සිටිනා ආශ්චර්‍ය්‍යය දැක එ කෙණෙහි රජ්ජුරුවන් කරා දිව දීව ගොස් 'හිමි! තොපගේ මේ මඟුල් තබා තොප පුතනුවන් සිද්ධාර්ථකුමාරයන් ගේ මඟුලක් වහා බලව"යි කිහ.

රජ්ජුරුවෝ එ බස් අසා වප්මඟුල් හැර දිව දීව අවුත් දඹගස ඡායා කිසි අතෙක නො ගොස් සිටිනා පරිදි ගස සිහාරා ඇවිද බලා විස්මය පත්ව ඇතුළුව වැද ධර්මාසනයෙහ වැඩ හුන් මහ තෙර කෙණකුන් සේ, දිවි දළින් ඔප්නැගූ රන්පිළිමයක් සේ, පතුල්පුං පිට පතුල්පුං තබාගෙණ අතුල්පුං පිට අතුල්පුං තබා ගෙණ දසදිග් නො බලා, ඇසිපිය නො මරා, නො සැලී, සරබාගෙණ ප්‍රථමධ්‍යාන සුවයෙන් වැඩහුන් පස් මැසි වූ පුතනුවන් වහන්සේගේ පෙළහර බලා රජ්ජුරුවෝ පුතනුවන්ට ජීවිතය පුදපියන්නා සේ මහ මෙර සේ, පැනනැගි ප්‍රේමස්කන්ධය ධරාගත නො හෙන්නාහු සන්තොෂ බාෂ්පයන් පවත්වා "පුතනුවනි! මෙ කෙසේ වූ විස්මයෙක් ද, දූන් ම නුඹ බුදු ව ගියෙ ද, නුඹ මැතිවෝ මහාමායාදේවි අද ඇත්නම්, මේ පෙළහර දුටුවූ නම්, නුඹට තමන්ගේ ජීවිතය පුද නො පියද් ද. මා එකලා වූ පියක්හම මෙසේ වූ සුරතල් කුමක් නිසා පානේ ද" යනාදීන් කිය කියා පුතනුවන්ගේ සිරි පතුල්පුං දෙක තමන් හිස්මුදුනෙහි තබා වැඳ, සත සතා මෙසේ දෙවන වාරයෙහි පිය මහ රජ්ජුරුවෝ මාගේ ම සවාමිදරු වූ, මාගේ ම ගුරු වූ, මාගේ ම මිත්‍ර වූ, මාගේ ම දෙවි වූ, මාගේ ම බඹ වූ, මාගේ ම ලොක සවාමීයානන්ට නමස්කාර පූජා කළහ.

මෙසේ මාගේ බුදුරජාණෝ තමන් පස්මැසි අවස්ථාවෙහි ද ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා පිය මහ රජ්ජුරුවන් අතින් නමස්කාර පූජා

ලත් හෙයිනු ත්, මෙසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනුත් අභින් නම් වන සේක..

ඉක්බිත්තෙන් මෙසේ මාගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝ ප්‍රථම මාස චන්ද්‍රයා සේ රූපශ්‍රීන් විරාජමාන ව වැඩී සත් හැවිරිදි ව ශක්‍ර දෙවේන්ද්‍රයාගේ නියෝගයෙන් විශ්වකර්ම දිව්‍යපුත්‍රයා මවා දුන් ශීතල ජල සම්පූර්ණ වූ පස්පියුමෙන් සැදී සිටි රුවන්මය වූ මගුල් පොකුණෙහි ජල ක්‍රීඩා කොට ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි වූදු ය.

ඉක්බිත්තෙන් ශුද්ධෝදන රජ්ජුරුවෝ බමුණන් ගෙන්වා "කෙසේ වූ පූර්වනිමිත්තක් දැක මපුතනුවෝ තපසට වලව යෙද් දැ"යි විචාළහ. බ්‍රාහ්මණයෝ කියන්නාහු "ආදි වාරයෙහි ජරා රූපයක් දකිති. දෙ වන වාරයෙහි ගිලන් රූවක් දකිති. තුන් වන වාරයෙහි මල රූවක් දකිති. සතර වන වාරයෙහි මහණ රුවක් දැක රජය හැර ගොස් තුමූ ද මහණ වෙති"යි කීහ. රජ්ජු රුවෝ එ බස් අසා "එසේ වී නම් මපුතනුවන් බුදුවීමෙන් නම් නැත. බුදු වන දා වසවර්ති නම් මාරයෙක් යක්සෙන් ගෙණ දිව ඒ ල. මුළු තුන්ලොව ම ඒ යක්ෂයා දැක නො බා සිටිනා එක ද සත්ත්වයෙක් නැත් ල. මපුතණුවන්ට එ දා ඔහුගෙන් උපද්‍රවයෙක් වී නම් නපුර. චක්‍රවර්ති වූ නම් මේ මුළු සක්වළට නායක ව සතර මහ දිවයිනා ආඥාශායෙන් ඇවිදිති. මපුතනුවන්ගේ චක්‍ර වර්ති සම්පත් දක්නා කැමැත්තෙම් මෙ තැන් පටන් නර ඇති එකකු ත් මපුතනුවන් දක්නා නො දෙව. ව්‍යාධිගත එකකු ත් ලංවිය නො දෙව. මල රුවකු ත් දක්න නො දෙව. මහණ රුව කු ත් දක්න නො දෙව"යි නියෝග කොට නුවරට සතර දිග ගවු හමුවේ රකවල් ලවා පුතනුවන් කාමබන්ධනයෙන් බඳිමි යි සිතා හිමත් – ගිමන් – වසන් යන තුන් ඍතුවට සුදුසු වූ තුන් පායක් කරවා දුන්හ. එයින් එක් පායෙක් නව මහල. එක් පායෙක් සත් මහල. එක් පායෙක් පස් මහල. තුන් පාය ම උස හා මහත එක සමය. ඒ ඒ ඍතුවට සුදුසු මන යේ මාල් හෙද වී ය.

ඉක්බිත්තෙන් පිය මහරජ්ජුරුවෝ යශෝධරා දේවීන් පුත නුවන්ට අගමෙහෙසින් කරණු කැමැති ව උන්ගේ පියානන් සුප්‍ර බුද්ධ රජ්ජුරුවන්ට කියා යැවූහ. සුප්‍රබුද්ධ රජ්ජුරුවෝ කියන්නාහු

"තමන් පුතනුවෝ සිද්ධාර්ථ කුමාරයෝ නො බෝ කලෙකින් මහණවනු සඳහා රජ ය හැර යෙත් ල. එ දවස් මාගේ දියනියෝ වැන්දඹු වෙති. මහණ නො වන රජක්හට පාවා දෙමි"යි කියා යවූහ. බොධිසත්ත්වයෝ එ පවත් අසා "මහණත් වෙමි ම ය. යශොධරාවන් මට පාවා නුදුනහොත් රජ්‍ය ය මට නො කැමැත්තේ යැ"යි කියති. යශෝධරා දේවී ද "සිද්ධාර්ථ කුමාරයෝ සෙව මහණ වෙත් නමුත් සරණෙක රැකෙම් නම් උන් කෙරේ ම රැකෙම් ම යැ" කියති. ශුද්ධෝදන රජ්ජුරුවෝ මේ දෙදෙනාගේ පවත් අසා නමින් ශාක්‍යකුලයට අධිපති හෙයිනු ත්, නැගනියන් වැදූ දියනියන් හෙයිනු ත්, හිමිනම් බැණ ගිවිස්සා මහ පෙළහරින් මඟුල් කොට යශෝධරා දේවීන් ගෙන්වා රුවන් ගොඩක් පිට සිටුවා බොධිසත්ත්වයන්ට අගමෙහෙසුන් කොට පාවා දී ත්‍රිශඞ්ඛයෙන් ම දෙදෙනා මුදුනෙහි අභිෂෙක ජලය වක් කොට දෙදෙනා එක වීට වොටුනු පලඳවා සියලු රජ්‍ය ය ම පාවා දුන්හ.

තව ද රජ්ජුරුවෝ "එකෙකි කුලෙන් එකෙකි කුමරියක් මපුතනුවන්ට අන්තඃපුර කොට සරහා එවන්නේ යැ" යි සියලු ශාක්‍ය - කොළිය නෑයන්ට කියා යැවූහ. ශාක්‍යයෝ එ තෙපුල් අසා "ඒ සිද්ධාර්ථකුමාරයෝ ඉතා සිවුමැලියෝ ය, ඉතා ළදරුවෝ ය, තව දක්වා ත් එක ද ශිල්පයකු ත් නුගත්හ. මතු සංග්‍රාමයෙක් වී නම් කෙසේ ජය ගණිද්ද? අපගේ දරුවන් කෙසේ ඔහු පොෂ්‍ය ය කෙරෙද්ද,? නිශ්ශිල්පී නැනැත්තන්ට අප දරුවන් නො දෙමිහ" යි කියා යවූහ.

මාගේ බොධිසත්ත්වයෝ නෑයන් කී පවත් අසා "මාගේ බල පරාක්‍රම හැම නෑයන්ට ම පවිම් යි සිතා "මාගේ ශිල්ප දක්නා කෙණෙක් සත් දවසකින් මා කරා රැස් වන්නේ යැ"යි මුළු නුවර බෙර ලවා සත්වන දා රජාඞ්ගනයෙහි මහ මඬුවක් කරවා මහසෙනඟ පිරිවරා හිඳගෙණ ඒ එක්ලක්‍ෂ හැටදහසක් නෑයන් මධ්‍යයෙහි දහසක් යොධයන් නගාලන බාලන මහත් වූ දුන්නක් ගෙන්වා යටි පිලාව වම් පය මාපටැඟිල්ලෙහි තියා පිට නබා උන්පාලින් නො සෙල්වී රොද්දක් නගන්නා සේ ඒ දුන්න නගා දුනුදිය අත් පොලාපු දැය. ඒ ශබ්ද ඝොෂාව දසදහසක් යොදුන් දඹදිව දෙර දෙර ගැසූ සෙණහඬක් සේ පැතිර ගිය. සියලු සතුන් ඇස් පිහී ගිය. හැම සිත් ඉපිල ගිය. මුළුදඹදිව් වැසියෝ "කොල! මේ කිමෙක් ද? මේ කෙසේ වූ ආශ්චර්‍ය්‍යයෙක් ද? වර්‍ෂාවක් නැති ව මහ සෙණක් ගසාපීයැ"යි කියමින් වෙවුලා ගියහ. ශිල්ප බලමිහ යි

ආ තැනැත්තෝ මේ ආශ්චර්ය්‍ය දැක "අප සිදුහත් කුමර මනුෂ්‍යයෙකැයි නො සිතව. දිව්‍යයෙක්ම යැ" යි කියා සතුටුව සාධුකාර සහස්‍ර යන් පැවැත්වූහ. එ වේලෙහි බෝසතාණෝ "තව ද නො එක් ශිල්පයන් ගුරු කෙණෙකුන් අතින් නො ඉගෙණ ශාස්ත්‍රයක් බලා නො දැක, නොඑක් නොඑක් ප්‍රකාරයෙන්ම තමන් දන්නා පරිදි තැනැත්තට අද පාමි" යි කියා ශිල්ප දන්නා ආචාර්ය්‍යවරුන් ගෙන්වා ඔවුන් හැම දක්කාදී: ශ්‍රැතිය, වේදය, ව්‍යාකරණය, ඡන්දොලක්ෂණය, ශබ්දාර්ථය, නක්ෂත්‍රය, ශික්ෂාය, මොක්ෂඥානය, සිරිතය, ධනුශ්ශිල්පය, හස්ති ශිල්පය, කාමතන්ත්‍රය, සාමුද්‍රිකාය, පරකථාය, නිඝණ්ටුය, නීතිය, තර්කය, වෛද්‍යය යන මේ අෂ්ටාදශ ශිල්ප දක්වා.

තව ද තමන් විශේෂයෙන්ම ශිල්ප පරිදි හඟවන්නාහු: අක්ෂරය, ලිඛිතය, ගණිතය, ගාන්ධර්වය, තර්කය, ව්‍යාකරණය, ඡන්දස්ය, නිඝණ්ටුය, අලංකාරය, ශාලිහෝත්‍රය, මන්ත්‍රය, තන්ත්‍රය, යන්ත්‍රය, ඈක්ෂෝදය, ජ්‍යොතිර්ඥානය, ඉතිහාසය, පුරාණය, අග්නිස්තම්භනය, ජලස්තම්භනය, කෞමාරය, කූප ශාස්ත්‍රය, සූප ශාස්ත්‍රය, කාමශාස්ත්‍රය, ශස්ත්‍ර වින්‍යාසය, ශස්ත්‍ර කර්මය, අශ්වාරොහණය, ගජාරොහණය, අංකුශ්මාරණය, මාරණය, මොහනය, ස්තම්භනය, උච්චාටනය, ත්‍රොවනය, දූර ගමනය, දූරදර්ශනය, හෙරිත්‍රොටනය, පත්‍රච්ඡේදනය, චිත්‍රකර්මය, මාලාබන්ධය, ගන්ධයුක්තිය, ද්‍යූතය, හරනය, ස්ත්‍රී ලක්ෂණය, පුරුෂලක්ෂණය, නපුංසක ලක්ෂණය, පරචිත්ත ඥානය, කනක පරීක්ෂාය, රෛතක පරීක්ෂාය, වාතුජීදය, ධාතුවාදය, බීජ වාදය, කන්‍යාවාදය, ආකර්ෂණය, ආකාශ ගමනය, ශීඝ්‍ර කර්මය, කාෂ්ඨ කර්මය, හෙම කර්මය, රත්න පරීක්ෂාය, කණ්ඨාභරණය ශ්‍රැයාණය, අදෘශ්‍යකරණය, පරකාය, ප්‍රවේශනය, වේණුවීණා වාද්‍යය, විෂහරණය, යන මේ සූසැට කලා ශිල්පයන්ද විශේෂයෙන් දක්වා.

තව ද සරභඞ්ග ජාතකයෙහි බ්‍රහ්මදත්තරජහට ධනුශ්ශිල්ප දක්වූ පරිද්දෙන්ම: ශර පවුරුය, ශර තොරණය, ශර පොකුණුය, ශර ප්‍රාසාදය, ශර රැනය, අක්ෂණ වෙධිය, ශබ්ද වෙධිය, වාල වෙධිය, ශර වෙධිය, ගොඩ විදුමනය, දියෙහි විදුමනය, ආකාශ විදුමනය, දූර වි.මනය, ආසන්න විදුමනය, යපව විදුමනය, තඹපව විදුමනය පිදුරු කිසි විදුමනය, මැලි කිසි විදුමනය, මීකං විදුමනය, උදළු තැටිලි විදුමනය, දිඹුල් පෝරු පියා පෝරු විදුමනය, යනා දිවු නොඑක් ධනුශ්ශිල්ප දක්වා මහත්වූ බල පරාක්‍රම පැමුළු ලෝ

විස්මය පත් කළදැය. මේ වික්‍රම දැක සන්තෝෂවූ නෑයෝ තමන් තමන් දූන් සරහා සතළිස් දහසක් ශාක්‍ය කුමරියන් අන්තඃපුර කොට පවා දුන්හ.

මෙසේ මාගේ බොධිසත්ත්වයෝ යශොධරා දේවීන් ප්‍රධානවූ මේ සතළිස් දහසක් නාටකස්ත්‍රීන් පිරිවරා මාණික්‍ය ශොභාවෙන් දිලියෙන්නාවූ කනක ප්‍රාසාද බඳුවූ, පියරජහු කරවා දුන් තුන් ප්‍රාසාදයෙහි සුරඟනන් බඳු වරඟනන්ගේ මඬනය ලැසි බැල්මෙන් පිණා පිණා මහත්වූ රාජ්‍යශ්‍රී සම්පත් විඳිනා කල ඒ බෝසතාණෝ එක් දවසෙක උයන් කෙළි කෙළනා කැමැතිව රථාචාර්යයා කැඳවා මගුල් රථය සරහා ලවයි කීදැය. රථාචාර්යයා 'යහපතැ' යි ගිම්හ උතුම්වූ රථයක් රථාලඞ්කාරයෙන් සරහා නෙළුම්පත පැහැ ඇති මඞ්ගල අශ්වරාජයන් සතරදෙනකු යොදලා බෝසතුන්ම දැන්වීය. බෝසතාණෝ දිව්‍යරථයක් මැනිවූ ඒ රථයට පැනනැගී මහ පෙළ හරින් උයනට නික්මුනු සේක. එ කෙණෙහි දේවතාවෝ 'සිද්ධාර්ථ කුමාරයන් බුදුවන කල් ආසන්නය, නපසට කාරණා දක්වම්හ'' යි එක් දිව්‍යපුත්‍රයකු ජරා වෙසක් ගන්වා කඩ දත් ඇතිව. කර ඉස් ඇති වක ගසාගෙණ දණ්ඩක් අතින් ගෙණ වෙව්ල වෙව්ලා සිටි යාසේ දක්වාලූහ. ඒ ජරාරූපය බෝසතුන් හා රථාචාර්යයාට පෙණෙයි. සෙස්සවුන්ට නො පෙණෙයි. බෝසතාණෝ "සබඳ රථාචාර්යය! මේ කෙසේවූ රූපයෙක් දැ?" විචාළදැය. සවාමිනි! මහළු මිනිසෙකැයි කීය. මොහු මේ උපන් සැටිම දැයි විචාළදැය. "නැත, සවාමිනි! පෙර අප සේම ලදරුය. දැන් දිරා ගියේ යැ" යි කීය. තවත් මෙසේවූ සත්හු ලොව ඇද්දැ? යි විචාළ දැය, සවාමීනි! ඉතා සුලභ යැයි කීය. මටත් මේ ජරා රූපය ඇද්දැ? යි විචාළ දැය. සියලු සතුන්ටම ඇතැයි දෙවියන්ගේ ආනුභාවයෙන් කීය.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ "මේ මනුෂ්‍යාත්මය නම් මෙසේ අනිත්‍ය දෙයක් වනැයි මේ ජීවිතයට නින්දා වේව" යි කියා අනිත් ලකුණු උපදවා මෙසේවු ජරා ඇති මට ක්‍රීඩාවෙන් කම් නැතැයි සසර කලකිරි නැවත ප්‍රාසාදයටම වන් දැය. ශුද්ධොදන රජ්ජුරුවෝ "කුමක් කීසා මපුතනුවෝ උයනට නො ගොස් නැවත අවුදැ" යි විචාරා ජරා රූපයක් දැක කලකිරී ආසේතැයි අසා "එ බඳු රුවක් දැක මහණ වෙතියි පෙරම ඇසීමි. කොල! මා නො නසව! වහා නළු වන්දි මපුතනුවන් ක්‍රීඩාවෙක් සතුටු

කරවා මහණ වීමෙහි ලොභය නැති සේ කරව" නියොග කොට තව ද කුමර සතර දිගින් දෙගවු දෙගව්වේ රැකවල් ලැවූ හ.

තව ද සාරමසක් ගිය කල පෙර සේ ම උයන් කෙළියට යනදූ දෙවියන් මවා පෑ කුෂ්ඨරෝගයෙන් පිරිගිය ශරීර ඇති, මහ සැළ සේ උදර ඇති, [1]මන්ඩු හා සිපදූ ඇති, ව්‍යාධිගත වූ රූපයක් දැක පෙර සේ ම රථාචාර්‍ය්‍යයා අතින් විචාරා එදා ද සසර කලකිරී නැවත මාළිගාවට ම වැඩියේ ය. එ පවත් රජ්ජුරුවෝ අසා මහත් වූ ශොක කොට කුමර සිහාරා තුන් තුන් ගව්වේ රැකවල් ලැවූහ.

නැවත ද සාරමසක් ගිය කල උයන් කෙළියට යත දී එදා ද දෙවියන් මවා පෑ, කට දල්වා ගෙණ ඉදිම, නිල්ව ගිය ශරීර ඇතිව, නව දොරින් නික්මෙන පණුකැලන් විසින් ආකුල වූ මෘතරූපයක් දැක, එ දවස් ද පෙර සේ ම කලකිරී උයන්කෙළියට යන ගමන් හැර ප්‍රාසාදයට ම නැඟි ඈ ය. එ දවස් ද රජ්ජුරුවෝ විචාරා දෙම්නස් ව තව ද කුමර සිහාරා සතර සතර ගව්වේ රැකවල් ලැවූ හ.

මෙසේ තව ද සාරමසක් ගිය කල ඇසළ මැදි පොහෝ දින සම්ප්‍රාප්ත විය. බොහෝ ආයු ඇති බොධිසත්ත්වයෝ මේ නිමිත්ත දක්නාහු සියක් සියක් අවුරුද්දෙන් දකිති. ආයු මඳ කාලයෙහි උපන් බොධිසත්ත්වවරයෝ සාරමසින් සාරමසකට දකිති. මේ කාරණයෙන් අප මහා බොධිසත්ත්වයන් ද සාරමසක් ගිය කල මෙ තුන් කාරණය දුටු සමයෙහි සතර වන ගමනෙහි මෙසේ ඇසළ මැදි පොහෝදිනය සම්ප්‍රාප්ත වි ය. එ දා උයන් කෙළියට යනදූ දෙවියන් මවා පෑ සකස් කොට හැඳ පෙරව වියදඬු පමණින් දුර නො බලා උපශාන්ත වූ ගුණයෙන් සැදී සිටියා වූ මහණවෙස දැක "යහළු මේ උපශාන්ත වූ වෙශයකින් හොබනාහු කවුරු දූ"යි විචාරා දෙවියන්ගේ ආනුභාවයෙන් "ස්වාමීනි තපස් මෙවෙසෙකැ"යි කී කල "මේ උපශාන්ත වූ වෙසෙක. එකාන්තයෙන් මේ වෙස ගන්නාහට සසරින් ගැළවීමෙක් වේමයැ"යි මහණ වෙසෙහි සතුටු ව එදා උයන් කෙළියට ගියසේක.

ඒ උයනෙහි දිවාභාගයෙහි නඳුන් උයන් වන් ශක්‍රයා සේ උද්‍යානක්‍රීඩා කොට, මඟුල් පොකුණට බැස ජල ක්‍රීඩා කොට, හිරු බැසනගත වේලෙහි මඟුල් සලවට වැඩහිඳ සර්වාභරණයෙන් සැරසෙමි යි සිතූසේක. ඒ අදහස් දන්නා වූ ඇමැතියෝ ලක්‍ෂවටනා සළු හා සුසැව ආභරණයන් ගෙණහැර සිහාරා සිටගත්හ. ඒ කෙසේ වූ ආභරණ දැ? යත්:

1. වන්ඩිබ.

පාදාංගුලී, පාදජාලා, පාදාභරණ, පාදශාඛලා, පාදසිරි, ජංඝාපත්‍ර, වශ්‍රලු, කෙයූරාභරණ, ඌරුජාලා, කිණි සැද, මකරපට, උදර බන්ධන, හස්තාංගුලි, හස්ත මුද්‍රිකා, කෙසපේට්ටු, අඞ්ගදාභරණ, ගලමුතුමාලා එකාවැල, අවුල්හර, සද්දම්, මුතු දම්, රන් දම්, රිදී දම්, සිද්දතුදම්, පබළු දම්, කර්ණාභරණ, කර්ණාවතංස, කර්ණ කුණ්ඩල, ලලාටපට, චොටුණු ශතාදීමේ සූක්ෂම ආභරණයන් හා මල් සුවඳ විලෙවුන් ගෙණ පිරිවරා සිට ගත්හ.

එ කෙණෙහි මාගේ ස්වාමිදරුවන් පශ්චිමභවයෙහි ලබන අලඞ්කාරය හෙයින් ශක්‍රදෙවේන්ද්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු වී ය. සක්දෙව්රජ පරීක්ෂා කරණුයේ බෝසතාණන් මහණ වන ද පශ්චිමාලඞ්කාරයැ යි දැන විශ්වකර්ම දිව්‍යපුත්‍රයා කැඳවා "යහළු විශ්වකර්ම දිව්‍යපුත්‍රය! සිද්ධාර්ථ කුමාරයෝ අද මධ්‍යම රාත්‍රියෙහි මහාභිනිෂ්ක්‍රමණය කොට සෙට අලුයම මහණ වෙති. මේ උන්ගේ පශ්චිම වූ මහණ පූජාලඞ්කාර ය. තෝ ගොස් ඒ මහාපුරුෂයා දිව්‍යාභරණයෙන් සරහාලව" යි නියොග කෙළේ ය. එ කල විශ්වකර්මයා දිව්‍යානුභාවයෙන් ඇසිල්ලකින් අවුදින් මඟුල් කපු වෙසක් ගෙණ කපුවා අත තුබූ වෙළුම් සළුව ගෙණ බෝසතාණන් සිරස වෙළී ය. එ වේලෙහි බෝසතාණන් ඔහුගේ අත දිව පහස් දැන "මේ මනුෂ්‍යයෙක් නො වෙයි. එකාන්තයෙන් මේ දෙවතාවෙක් ම යැ"යි දත්සේක. ඒ විශ්වකර්ම දිව්‍යපුත්‍රයා එ ද සරනතුයේ අකුලාලූ කල තලමල් තුඹ මල් හා ඇති විදපි කල සහොදුන් දෙළොස් යොදුන් හා ඇති දිමසළු දහසක් පටින් සිරස වෙළා මිණි චොටුනු පලඳවා දිව්‍යාභරණයෙන් අලඞ්කෘත කෙළේ ය. මෙසේ බෝසතුන් මහණ වන ද ඒ විශ්වකර්ම දිව්‍යපුත්‍රයා එද කළා වූ අලඞ්කාර පරම්පරාම දූත් දක්වා සසුන් වැද මහණ වන්නවුන්ට ව්‍යවහාර වී යැ යි දතයුතු.

ඉක්බිත්තෙන් මෙසේ සැරහුම් ලදින් මැඬහුන් කල ආතත විතතාදි වූ පඤ්චාංගික තූර්‍ය්‍ය නාදයන් පවත්වා මහත් වූ උත්සව වී ය. බ්‍රාහ්මණයෝ ජය නන්දාදි මඞ්ගල සතුතියට පටන් ගත්හ. එ කෙණෙහි පාණ්ඩුකම්බල ශෛලාසනයෙන් පැනනැගි ශක්‍ර දෙවේන්ද්‍රයා සේ බෝසතාණෝ මඟුල් සල වටින් පැනනැගී රථාලඞ්කාරයෙන් හෙබියා වූ මඟුල් රථයට පැනනැගි සිටගත්සේක. එ කෙණෙහි යශෝධරා නම් අගබිසෝ රුවන් කුඹින් රාහුල නම් පුත්රුවන පහළ විය.

එ කල ශුද්ධොදන රජ්ජුරුවෝ "දෙහෙලනියන් පුතකු වැදූය යි අසා "එතෙකින් මපුතනුවන් දරුමලින් බැඳ ගම්තරද්දමා ගණිම්යි මහණ විය නො දෙමි යි මට වූයේ අනුබලයෙකැ" යි ඉතා සතුටු ව "ම පුතනුවන්ට සතුටු හසුන් කියව" යි අමාත්‍යයන් මඟුල් වෙස් ගන්වා බෝසතුන් කරා යවුවාහු ය. එ වේලෙහි අමාත්‍යයෝ දිව දිව ගොස් "හිමි! තොප සා එක්වැනි වූ පුතනු කෙණෙක් උපන්න" යි බෝසතුන්ට දැන්වූහ. බෝසතාණෝ එ බස් අසා "රාහුලයෙක් උපන, ඒ මට ගිහිබන්ධන යැ" යි කීසේක. ශුද්ධොදන රජ්ජුරුවෝ මපුතනුවෝ කුමක් කිවු දේ හෝ යි විචාරා "රාහුලො ජාතො" යි කීසේකැයි අසා මෙ තැන් පටන් මාගේ මුනුබුරණෝ රාහුලයෝ යයි නම දුන්හ.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ "මිනිස්ලොව උපන්නාහට දරුකෙණකුන් ලැබීම නම් ඉතා දුලභවය. ඉනුත් පුතකු ලැබීම නම් ඊටත් වඩා උලභවය. දැන් ම මහණ වන්නට නො ගොස් රජ ගෙට ගොසින් මි පුතුන් දැකපියා රාත්‍රිභාගයෙහි මහාභිනික්මන් කෙරෙමි" යි සිතා මහත් වූ ශ්‍රීහස්තයෙන් නුවරව වැද ශක්‍ර දෙවෙන්ද්‍ර ලීලායෙන් රජගෙට නික්මුනුදැය. එ වේලෙහි කිසා ගොතමි නම් බැද්ද බිසොවක් බෝසතුන් වීථියෙහි වඩනා ලීලා හා ඓශ්වර්ය්‍යය දැක ඉතා කුල්මත් ව ඇතුළු ගෙහි ගින්ද නොහී මතු මාලේ සිංහපඤ්ජරයෙහි දෙර හැර බෝසතුන්ගේ රූපලීලා දැක නිල්වලා ගබකින් චන්ද්‍රබිම්බයක් පැමැ සේ සිංහපඤ්ජර මුඛයෙන් නමා ගේ මූබය බෝසතුන්ගේ අභිමුඛයට දක්මාලා:

නිබ්බුතා නූන සා මාතා-නිබ්බුතො නූන සො පිතා,
නිබ්බුතා නූන සා නාරී-යස්සායං ඊදිසො පතී'යි

යන මේ ගය කියා "සිද්ධාර්ථ නම් [1] පුරුෂයාණනි! අද තොප මෑනීයන්ගේ ද සිත නිවී ගිය. තොපගේ මේ ශ්‍රී දුටු පියාණන්ගේ ද සිත නිවී ගිය. යම් ස්ත්‍රියක් තොපගේ ශරීර පහස් ලද්දද නම් ඇගේ ද සිත නිවී ගියේ යැ" යි කිව. බෝසතාණෝ "නිවී ගියේය, නිවී ගියේ යැ" යි යන බිසොවුන් කී තෙපුල් අසා "මම ත් නිවන් සොයමි. මම යි ත් නිවී ගිනැ යි යන සේ කිය යි. මට මෝ ප්‍රිය බස් කියයි. අද ම මා ගිහිගෙය හැර ගොස් මහණ වුව මැනවැ" යි සතුටු ව "මට ප්‍රියතෙපුල් කී වියව ප්‍රිය වස්තුවකින් පූජා කෙරෙමි" යි ලක්‍ෂයක් වටනා මුතුහර ගලවා ඒ කිසා ගෝතමීන්ට යවුද්දා ය. කිසාගෝතමී මුතුහර දැක "සිද්ධාර්ථ

1 රූ, ශ්‍රූරාතෙනි,

කුමාරයෝ මා කෙරෙහි ප්‍රේමයෙන් කර තුබූ මුතුහර එවාපූ ය. එකාන්තයෙන් මා කෙරෙහි ප්‍රතිබද්ධ වූ සිත් ඇත්තාහු ය. යශෝධරා දේවින් සේ ම මාත් අග්‍රමෙහෙසුන් කෙරෙති" යි සිතූහ.

ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයෝ මහත් වූ ශ්‍රී සෞභාග්‍යයෙන් ප්‍රාසාදයට නැඟී ශ්‍රී යහනෙහි සැතපුනුසේක. එ කෙණෙහි රජගෙය සුවඳතෙල් වැට පහනින් එකාලෝක කළහ. සර්වාලඞ්කාරයෙන් සැරහුනා වූ නෘත්‍ය ගීත වාද්‍යයෙහි දක්ෂ වූ දෙව ගනන් බඳු රූ ඇති සතළිස් දහසක් නාටක ස්ත්‍රීහු පිරිවරා ගත්හ. එයින් සමහරු නටති. සමහරු ගී කියති. සමහරු වංගි පිඹිති. සමහරු වීණා ගාති. සමහරු අත්තල එලති. සමහරු වස්කුලල් පිඹිති. සමහරු නෘත්‍යාඞ්ග දක්වති සමහරු ලීලා දක්වති. සමහරු වයති. යනාදීන් ක්‍රීඩාමට පටන්ගත්හ. බෝසතාණෝ කෙලෙසුන් කෙරෙහි විරක්ත වූ සිතින් ඒ ක්‍රීඩායෙහි සිත් නො ලා අතික් ඇලයෙන් සැමී නිද්‍රාවට පටන්ගත්හ. ඒ ස්ත්‍රීහු බෝසතුන් නිදන සේ දැක "නිකම් නටා වෙහෙසෙනු කිම් දෑ" යි තූර්‍ය භාණ්ඩයන් බිම තබා එ ම බෙරෙහි හිස තබා සිටි සිටි තෙන මැද හෙව නිදන්නාහු ය. ප්‍රදීපාලෝකයෙන් එකාලෝකම ය. බෝසතාණෝ යහනින් නැඟී වැඩහිඳ ස්ත්‍රීන්ගේ නොයෙක් විකාර දුටුදෑ ය. සමහරු කුණු කෙළ ධාරා වගුරුවති. සමහරු දත් කති සමහරු නලු ගසති. සමහරු නත් දොඩති. සමහරු අපගත වස්ත්‍රව කෝපීන ස්ථාන දක්වති. බෝධිසත්ත්වයෝ මොවුන්ගේ විප්‍රකාර දැක කාමයෙහි අතිශයින් ලොභ නැති ව "මේ ස්ත්‍රීහු පෙරයම් වේලෙහි දිව්‍යාඞ්ගනාවන් සේ සිටියාහු ය. දැන් මෘත රූප වැනි යාහු යැ" යි සසර කලකිරී එ තැන නොයෙක් කුණපයෙන් පිරුණා වූ අමුසොහොනක් සේ මැටහිත. තුන් භවය ම ගිනි ගත් ගෙවල් සේ සිතිත.

මේ සසර හුනු සත්ත්වයාට ඉතා උපද්‍රවයෙක් වී ය. ඉතා පරිහානි වී යැ"යි උදාන පවත්වා අතිශයින් ම මහණ වීමෙහි සිත නැමී "දැන් ම මා නික්මුන මැනවැ"යි සිතා යහනින් නැඟීලා පද සලකුණු නො දී ම සෙමින් සෙමෙන් රන් බාව කරා ගොස් මේ තැන කවරෙක් දැයි විචාළදෑ ය. එදා රෑ සිණිසබඩායෙහි එළි පත හිස තබා ගෙණ වැදහොත්තා වූ ඡන්න නම් අමාත්‍යයා "ස්වාමීනි! මම ඡන්නය" කීය. "යාළු ඡන්නය! දැන් ම මම

මහභිනික්මන් කරණු කැමැත්තෙමි. කිසි කෙණෙකුන්ට ත් නො හඟවා මඟුලසු සරහා වහා ගෙණෙව" යි කීදු ය. ඒ "මැනව ස්වාමිනි" යි කියා අශ්වාලඞ්කාර ගෙණ දහස් ගණන් අසුන් සිටිනා අශ්වශාලාවට ගොස් සුවඳ වැට පහනින් දිලිහි දිලිහි සමන් මල් වියනක් යට බුමුතුරුණු පිට අස්රජ සිරින් සිටියා වූ කන්ථක නම් අශ්වරාජයා දුටු මේ අසු සරහමි යි සිතාලා ඒ අශ්වයා සරහාලී ය. ඒ අශ්වරාජයා තමා සරහන වේලෙහි ම සිතනුයේ "මේ සැරහුම ඉතා දැඩි ය [illegible] ද උයන් කෙළි ආදියට මාගේ ස්වාමීහු වඩින කල [illegible] යෙදීමෙක් නො වෙයි. අද රාත්‍රියෙහි සොරා ම යොදනී. මාගේ ස්වාමිදරුවාණෝ දූක් ම මහභිනික්මන් කෙරෙත් වනැ යි. බොහෝ කලක් මා පුරා ඇවා වූ මාගේ ප්‍රාර්ථනාව ද අද කුළු ගන්නා වනැ" යි ඉතා සන්තුෂ්ට වූයේ මහත් කොට හේෂාරව කෙළේ ය. ඒ ශබ්දය මුළු නුවර පැතිර ගි ය. දේවතාවෝ ඒ ශබ්දය සඟවා කිසි කෙණෙකුන් කණ ගී ය නුදුන්හ.

එ කල බෝධිසත්ත්වයෝ අමාත්‍යයා අශ්වශාලාවට යවාලා "පුතනුවන් දුටු පියා යෙමි" යි සිතා යශෝධරා දේවීන් වසන ශ්‍රී යහන් ගබඩාවට ගොස් දොර හරපි දූ ය. එ වේලෙහි ගර්භාන්තරයෙහි සුවඳ වැට පහන් සතර දිග දිලියෙ යි. යශෝධරා දේවී අමුණක් සමන් මලින් කැනූ යහන් මතුයෙහි හෙව නෑරිලතාවෙන් නික්මුත් රුවන් දළුවක් සේ පුතනුවන් බඩ දීගෙණ ලෙහි අත තබා ලා නිදන්නාහු ය. බෝසතාණෝ එ වේලෙහි රත්බාව අතින් අල්වා ගෙණ දකුණු පය එළිපත මත්තෙහි තබා සිට ගර්භාන්තරය බලා පුතනුවන්ගේ රූ හා දේවීන්ගේ ශොභා දුටු "දරුවන් වඩා ගෙණ සිඹ සනහා පියමි" යි සිතාලා "දේවීන් අත පහ කොට පියා දරුවන් ඇල්ලීම් නම් යශොධරා දෙවි පිබිදු යෙති. උන් හා සමඟ කථායෙක් වී නම් මා කාමබන්ධනයෙන් බැඳ මහභිනික්මන් කොට ගත නොදී ගමනාන්තරාය කෙරෙති" යි සිතා "මතු බුදු ව ඈ දු ම දරුවන් දුටු පියමි සිතා "දැන් මේ එක දරුකෙණකුන් කෙරෙහි කළා වූ ප්‍රේමයෙන් මහණ නො වීම් නම් මතු මුළු ලෝ වැසියන් හැම නො වරදවා කෙසේ දරු කොට ගණීම් ද, සංසාර සාගරයෙහි ගොඩ නො දක්නා අප්‍රමාණ වූ සත්ත්වයෝ කාවුරුන් මුහුණ බලා ගැලුවෙද්ද?" යනාදීන් සියලු සතුන් කෙරෙහි උපන් මහා කරුණා ඇති ව, පුතනුවන් කරා දිවූ ප්‍රේම නමැති මහවතුර තමන් වහන්සේගේ සාරාසඞ්ඛ්‍යය කප් ලක්ෂයක් මුලුල්ලෙහි නො කඩ කොට තිබුවා වූ ධෛර්‍ය පාරමිතා නමැති මහ

ඕයරින් රඳවා මහමෙරක් ඔසවන පුරුෂයකු මහත් වූ උත්සාහයෙන් ඔසවන්නා සේ, එළිපත තුබූ පය මහත් වූ වීර්‍ය්‍යයෙන් නගාගෙණ ප්‍රාසාදයෙන් බැස අශ්වයා කරා ගොස් පිට අත ගසා ඕහට මෙසේ කීසේක. "යහළු කන්ථක ය! අද එක රෑ තෝ මා ගළවව. මම තා ගේ සහායයෙන් ගොස් බුදු ව තා ඇතුළු ව බොහෝ දිව්‍ය මනුෂ්‍යයන් සසරින් ගළවමි"යි කියාලා ඒ අශ්වරාජයා පිටව පැන නැඟිද්ද ය.

ඒ අශ්වරාජයාගේ ග්‍රීව ය පටන් වාලධි ය දක්වා අටළොස් රියන් දිග ඇත්තේ ය. දිගට සුදුසු වූ උස ඇත්තේ ය. ඉතා සුදුය. පිරිසුදු වූ සකක් වැන්නේ ය. මහත් වූ බල හා ජව ඇත්තේ ය. ඉදින් හේෂාරවයක් කෙරේ නම් ඛුරපහර දේ නම් හැම නුවර වෙවුල්වාපි ය යි එසේ හෙයින් කිසි අරගලයක් නො වන සේ නැගු නැගු ඛුරපහරින් ඛුරපහරට දෙවියෝ අතුල්තල දුන්හ. බෝසතානෝ ඒ අශ්වරාජයා පිට හිඳ ඡන්න නම් අමාත්‍යයාලවා අසු වාලධි ය ගන්වා එ දා රෑ වූ පසළොස් පැය ගිය වේලෙහි මහ වාසල්දොරට පැමිණිදෑය. එ කල ශුද්ධෝදන රජ්ජුරුවෝ පුතනුවන් නො වේලෙන සොරා පලා යෙතියි දහසක් යොධයන් වසාලන දහසක් යොධයන් හසාලන, [1]බිලිගලන දොර දෙකක් ලැවූහ. දහස් ගණන් යොධයෝ රැකවල් ගෙණ නිදන්නාහුය.

මාගේ බෝධිසත්ත්වයෝ ඉතා බලසම්පන්නසේක. දශබලධාරී දශ නාරායණ බලයෙන් ඡද්දන්ත හස්තින් දසදෙනෙක් හට බල ඇතිසේක. උපෝසථ කුලයෙන් සියක් ඇතුන්ට බල ඇතිසේක. හෙම කුලයෙන් දහසක් ඇතුන්ට බල ඇතිසේක. මඞ්ගල කුලයෙන් දසදහසක් ඇතුන්ට බල ඇතිසේක. ගඞ්ග කුලයෙන් ලක්‍ෂයක් ඇතුන්ට බල ඇතිසේක. පිඞ්ගල කුලයෙන් දසලක්‍ෂයක් ඇතුන්ට බල ඇතිසේක. තම්බ කුලයෙන් කෙළක් ඇතුන්ට බල ඇතිසේක.. පණ්ඩර කුලයෙන් දසකෙළක් ඇතුන්ට බල ඇතිසේක. ගන්ධහස්ති කුලයෙන් කෙළසියයක් ඇතුන්ට බල ඇතිසේක. කාලාවක කුලයෙන් කෙළ දහසක් ඇතුන්ට බල ඇතිසේක. මධ්‍යම පුරුෂ ගණනායෙන් දසකෙළදහසක් පුරුෂයන්ට බල ඇතිසේක. මෙසේ එකොළොස් දහස් එකසිය එකොළොස් කෙළ එකොළොස් ලක්‍ෂ එකොළොස් දහස් එක්සිය දස මහා බල ධාරී සේක.

ඉදින් දොර නො හැරේ නමුත් "ඡන්නයා අසු වල්ගය අල්වා ගන දී අසු දෙකලනේ බඳගෙණ අටළොස් රියන් මහ පවුර

1. බිගලි,

ගරුඬ රාජයකු සේ පැන දමාපියමි" යි සිතූසේක. අමාත්‍යයා සිතන්නේ "ඉදින් දොර නො හැරේ නම් මාගේ ස්වාමිදරුවන් දකුණු දසරුවෙහි හිඳුවාගෙණ අශ්වරාජයා සහක් යේවම අත්ලෙහි තබාගෙණ කිසි අරගලයක් නො කොට පවුර පැනපියා මම ම ගෙණ යෙමි" යි සිතීය. කන්ථක නම් අශ්වරාජයා සිතන්නේ 'ඉදින් දොර නො හැරේ නම් අමාත්‍යයා වල්ගය ගතදීම, මාගේ ස්වාමියා පිට මැඬඉස්දදීම, මේ ප්‍රාකාරය සිංහයකු සේ පැන පියා අද ගෙණ යෙමි" සිතීය. ඉදින් දොර නො හැරුණේ වී නම් මේ තුන්දෙනාම තමන් තමන් සිතූ සිතූ සේම පැන පලා යන බල ඇත්තාහ. එ කෙණෙහි වාසල අරක්ගත් දෙවියෝ "මතු අපට නිවන් දොර හැරදී ලුව මැනවැ" යි සතුටු පඬුරු දුන්නාසේ වාසල් දොර හැරපීහ.

එ කෙණෙහි වශවර්තිමාරයා 'සිදුහත් කුමර අද මේ දොරින් පිටත් වී නම් ගොසින් ඒකාන්තයෙන් බුදු වෙයි. බුදු වී නම් එ දවස් මාගේ නරකමලු ගිනි නිවයි. හැම නරක හිස් කෙරෙයි. හැම සතුන්ම දෙව්ලෝ පුරයි. මට බොහෝ හානි කෙරෙයි. මායමක් කියා ඔහු අද යා නො දෙමි' යි සිතාලා දිව දිව අවුත් නුවර දොර ආකාශයෙහි සිට:

"මා නික්ඛම මහාවීර-ඉතො තෙ සත්තමෙ දිනෙ,
දිබ්බන්තු චක්කරතනං-අද්ධා පාතු භවිස්සති" යි.

යන මේ ගාථාව කියා "නො යව, සිද්ධාර්ථ කුමාරයෙනි! සත් දවසක් ගිය කල තොපට චක්‍රවර්තිරුවන පහළ වෙයි. සතර මහාද්වීපය හා දෙදහසක් කොදෙව්වලින් පිරුණා වූ මේ සක්වළ ගබ මුළුල්ලෙහි ම ඒකාධිපත්‍යයෙන් චක්‍රවර්ති රාජ්‍යය කරව. යහළු නො යව නො යව" යි කී ය. බොධිසත්ත්වයෝ මාරයා දැක "තෝ කවරෙක්දැ" යි විචාළ දූ ය. මර දෙව්පුත් කියනුයේ "මම එසේ මෙසේ එකෙකිම් නො වෙමි. සවන පරනිර්මිත වශවර්තති දිව්‍ය ලොකයෙහි මාර දිව්‍යපුත්‍රයා නම් මම ය. මා කීවා කරව" යි කී ය. බෝසතාණෝ එ බස් අසා "තා සේ වූ මාරයෝ සියයෙක් දහසෙක් ලක්ෂයෙකුත් අද මා රඳවා ගත නො හෙති" යි කියාලා:-

මාර ජානාමිහං තිට්ඨ මය්හං චක්කස්ස සම්භවං,
අනත්ථි කොහං රජ්ජෙන තිට්ඨ ත්වං මාර මා ඉධ යි.

ගනාදීන් ගජ්ජනා කොට "දසදහසක් සක්වළ ගුගුරුවා ලොවුතුරා බුදුව ධම්සක් පවත්වම්හි මට තාගේ සක්රුවනින් කම් නැත. තෝ මෙතැන නො රඳා පලා යා" යි කීසේක. ඒ වසවත් මර එ බස් අසා ආකාශයෙහි සිට බෝසතුන්ට දත් කකා "මතු තා බුදු වන ලෙස් බලම්හි මෙතැන් පටන් ගෙණ කාම විතර්කයක් හෝ, ව්‍යාපාද විතර්කයක් හෝ, විහිංසා විතර්කයක් හෝ, සිතූ විටෙක නට නිබඩ දනිම්"යි කියා ඡායාවක්සේ ලඟ සිටගෙණ ඒ සාවුරුද්ද මුළුල්ලෙහිත් අවකාශයක් බලා නො දුටු, බුදු වන දා මහත්වූ යක්සෙනාව හැරගෙණ දිව පැරද ගොසිනුත්, බුදුවූ හවුරුද්දක් මුළුල්ලෙහි ත්, බුදුන් සමීපයෙන් දුරු නො ව මෙසේ සත් හවුරුද්දක් බුදුන් හා සමඟ ඇවිද්දේමය.

ඉක්බිත්තෙන් අනන්‍ය සාධාරණානතාව වූ සුරගණම්ණි රත්නාලඞකෘත විශුද්ධ බුද්ධාංකුර මාගේ ශ්‍රී මහාබෝධිසත්ත්වයෝ සත් දවසකින් ලැබෙනා චක්‍රවර්ති රාජ්‍යය අලුගම් දූවූ කෙළපිඩක් සේ සරු නො කොට හැරපියා මහත් සත්කාරයෙන් නුවරින් පිටත් වූසේක. මෙසේ ඇසළවස මැදි පොහෝද උතුරුසළ නකතින් එදා මධ්‍යම රාත්‍රියෙහි මහභිනික්මන් කොට නික්මිලා නුවර බලාපියනු කැමැති වූසේක. එකෙණෙහි මහ පොළොව කුඹල් සකක් සේ පෙරළී බෝසතාණන්ට නුවර දක්වාලි ය. ඒ ස්ථානය කන්ථක නිවත්තන නම් චෛත්‍යක් මතු වත්නේ ය යි සලකුණු දීලා වඩනාලද මාගී මුඛව මී අශ්වරාජයා විසිදූවා ගමන් ගත්සේක.

එ කෙණෙහි ඉතා මහත් වූ සත්කාරයෙන් මහත් වූ ශ්‍රී සෞභාග්‍යයෙන් දසදහසක් සක්වළ සැටදහසක් කාමාවචර දිව්‍ය ලොකවල දෙවියෝ "අපගේ ස්වාමියා මහභිනික්මන් කෙරෙයි. ඔහට අද රෑ අඳුරු දුරු කොට මහභිනික්මන් පූජා කරම්හ" යි රැස් ව පෙරට ව සැටදහසක් දෙවියෝ සැටදහසක් පමණ මිණි දඹුවැට පහන් ගෙණ සිටියහ. දකුණැලයෙන් සැටදහසක් පහන් ගෙණ සිටියහ. වම්ඇලයෙන් ද සැටදහසක් පහන් ගෙණ සිටියහ. පිටිපස්සෙන් ද සැටදහසක් පහන් ගෙණ සිටියහ. සෙසු දෙවියෝ සක්වළගබ වසා උරවපින් උරවට ගසා මිණිදඹුවැට පහන් ගෙණ සිටියහ එ දා රෑ මාගේ ස්වාමිදරුවාණන්ට දෙවියන් පිදූ පහන් පූජාවෙන් මේ සා සක්වළගබ මුළුල්ලෙහි කුරු කුහුඹුවන් සා සත්තුන් ඔවුනොවුන්ට පෙණෙත්නාහුම ය. අඳුරෙන් වැසෙන්නා වූ අල්ලක් සා අවකාශයෙකුත් කිසිතැනෙකත්[1] නැත්

1. නො පෙණෙයි.

මය. මෙසේ සක්වලගබ ඒකාලෝක වූ වේලෙහි සෙසු දෙවියෝ ද, නාගයෝ ද, ගරුඩයෝ ද, ගන්ධර්වයෝ ද, දිවමලින් දිවගඳින් දිව සුණ්ණෙන් දිවදුමින් පූජා කෙරෙති. දෙවියන් දමන පරසතු මලින් හා, මඳාරා මලින් හා අසුරයන් දමන පලොල් මලින් හා නාගින් දමන කඩුපුල් මලින් හා, ආකාශයෙහි අතුරු නැති ව ඝන මහා වර්ෂාවක් සේ මල්ධාරාවෙන් වතුරු වී ය.

තව ද, පඤ්චාංගික තුර්‍ය්‍ය ගෙණ දිව අා ගන්ධර්ව දෙවියෝ ඉදිරියේ අටසැට දහසක් තුර්‍ය්‍යනාදයන් පැවැත්වූහ. දකුණෙන් පස අටසැටදහසක් තුර්‍ය්‍ය නාද පවත්වා පූජා කෙරෙති. වමත් පස අටසැටදහසක් දිව්‍යභෙරිනාද පවත්වා පූජා කෙරෙති. පිටිපස් සෙන් අටසැටදහසක් භෙරිනාද පූජා කෙරෙති. අවශෙෂ වූ ගන්ධර්ව යෝ සිටිනා අනික් අවකාශයක් නැතිහෙයින් සක්වලගබ මුවවිට සිසාරා සිටගත්හ. ඒ දිව්‍යභෙරි ඝොෂාව සමුද්‍ර මධ්‍යයෙහි මහා මෙඝ නාදයක් සේ, යුගන්ධර පර්වතයෙහි වැදගත්තා රළ හඬ සේ, පොළොව පටන්ගෙණ අකනිට්ඨා බඹලොව දක්වා පූජා ඝොෂාවෙන් එක නින්නාද වී ය. මෙසේ දසදහසක් සක්වල දෙවියන් කරණ මහත් වූ පූජා විඳිනා වූ මාගේ බෝධිසත්ත්වයන් වහන්සේ එ දා රෑ තිබූ පසළොස් පැය දතුරෙහි තුන් රාජ්‍යයක් ගෙවා තිස් යොදනක් ගොස් අනොමා නම් ගංතෙරට අලුයම් වේලෙහි පැමිණිසේක. ඒ අශ්වරාජයාගේ දුව එතෙක්ම දුසි යතොහොත්, ඉදින් දිගුව නම් සතිස් ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් සක්වලගබ සිසාරා බමරක් නැවූවා සේ ඇසිල්ලකින් දිවපියා දහවල් බතට වාසයට එන තරම් දුව ඇත්තේය. එදා දිව්‍ය බ්‍රහ්ම අසුර නාග සුපර්ණ ගන්ධර්වාදීන් දමනලද සුවඳින් මලින් මහ අතුරු නැත්තෙන් මල් වැසි පිහිරා දුවනුයේ ලස්ව තිස් යොදනක් ගියේ ය හී දතයුතු.

මෙසේ මාගේ ඒ සොම්දරුමෝ නමින් බුදු වෙම් යි නික්මුනු පමණකින් දසදහසක් සක්වල දිව්‍යබ්‍රහ්මාදීන් කරණලද සංඛ්‍යා පථයට විෂයවූ ප්‍රදීප තුර්‍ය්‍යාදිවූ, පස්ලක්ෂ දෙළොස් දහසක් මහා පූජා ලත් හෙයිනුත් අවශෙෂවූ අසඞ්ඛ්‍ය ගණන් පූජා එ ම දා ම ලත් හෙයිනු ත් මෙයට වූ පූජා විඳිමට සුදුසු හෙයිනු ත් කරුණා නිධාන වූ කරුණා නර වූ කරුණා ප්‍රවාහ වූ, කරුණා ගඞ්ගා වූ කරුණා ගෘහ වූ කරුණා සථාන වූ කරුණා සමුද්‍ර වූ කරුණා,

පූජ්‍ය වූ කරුණා ස්වාමි වූ, කරුණා නාථ වූ මාගේ සර්වඥරාජයාණෝ මේ මේ කාරණයෙනුදු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලදි.

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං'ති.

මේ පූජාවලියෙහි අප බුදුන් පැවිදි වනදා ලද

මහබිනික්මන් පූජා කථා නම් වූ

දස වන පරිච්ඡේදය නිමි.

එකොළොස් වන පරිච්ඡේදය

තව ද: අප බුදුන් බුදු වන දා ලද බොධිමණ්ඩල පූජා නම් කවරහ? යත්;

මෙසේ මාගේ බොධිසත්ත්වයෝ ඒ දා රෑ නුවරින් නික්ම මහත්වූ පූජා ලදින් වැඩ එ ගංතෙර අසු රඳවාලා "මේ කිනම් ගඟෙක් දැ"යි අමාත්‍යයා අතින් විචාළ දෑ ය. අමාත්‍යයා "ස්වාමීනි! මේ ගඟ අනොමා නමැ" යි කී ය. 'මාගේ පැවිද්ද ත් අනෝම් යයි අලාමික යැ" යි ගඟ නම් අසා සතුටු ව අශ්වයාව ගඟ පැනයි විළඹෙන් සත් කළඳැ ය. අශ්වරාජයා වාලධිය ගත් ඡන්න නම් අමාත්‍යයා සා සමග අටසියයක් රියන් පළල ඇති ගඟ පැන රිදී පටක් වන් වැලිතලායෙහි රිදී පිඩක්සේ සිටියේය බොධිසත්ත්වයෝ අසුපිටින් බැස මුතුරැසක් වන් ඒ වැලිතලායෙහි සිට ඡන්න නම් අමාත්‍යයා ලඟට කැඳවාලා: "යහළු ඡන්නය තෝ මා පලන් ආභරණ හා මේ අශ්වයාත් නුවරට ගෙණ යව. මම මහණ වෙමි"යි කීදෑ ය. ඇමැති ස්වාමීනි මම ද මහණ වෙමි යි කී ය. බෝසතාණෝ කියන්නාහු: තට දැන් පැවිදි නො ලැබෙයි. තා මහණ වූවෝතින් මේ ආභරණත් නස්සී. අශ්වයා ත් එකලා වෙ යි. මපියාණන් හා යශොධරා දේවින් හා මා පැවිදි වූ ලෙස් නො දනිති. එසේහෙයින් දැනව තෝ යා. පසුව තා මහණ කරවා ගණිමි" යි තුන්විටක් කියා වැළකූදෑ ය.

මේ ඡන්න නම් අමාත්‍යයා තම් "බුදුකෙණකුන් සාම්බන්ධත යෙන් ගැලවීමෙකි අනුබල වෙමි" යි කප් ලක්ෂයක් කරණ ලද ප්‍රාර්ථනා ඇතියේ ය. කෙසු කප් තබා මෙම කප මාගේ බුදුන් සවර්ණමෘග ජාතකයෙහි රන්වන් මුවරජ ව ඉපැද මල බැඳී ගිය දා දූත ප්‍රේම උපදවා ඒ මලින් ද ගලවා හැර සිත් සේ වල ඇවිදුනාවන් කෙළේ ය. තව ද: මෙම ඡන්න නම් අමාත්‍යයා මාගේ බුදුන් රොහන්ත නම් මෘගජාතකයෙහි රොහන්ත නම් මුවරජ ව ඉපැද මල බැඳී ගිය දා දූත ප්‍රේම උපදවා ඒ මලින් ද ගලවා හැර සිත් සේ වල ඇවිදුනාවන් කෙළේ ය. තව ද: මෙම ඡන්න නම් අමාත්‍යයා සාලිකෙදර ජාතකයෙහි මාගේ බුදුන් ගිරා රජ ව උපන් සමයෙහි හැල්කෙත දී බැඳී ගිය දා දූත ප්‍රේම උපදවා ඒ මලින් ද ගලවා පීඩාවක් නො කොට සාලිඥය නම් බමුණා අතට හැර මහත් වූ උපකාර කැරවිය. තව ද: මෙම ඡන්න නම් අමාත්‍යයා සුවණ්ණමයූර ජාතකයෙහි රන්වන් මොනර ව දණ්ඩකහිරඤ්ඤ නම් පර්වතයෙහි වාසය කොට සසියයක් හවුරුදු ගිය කල මලෙහි බැඳී ගිය දා දූත ප්‍රේම උපදවා කිසි පීඩාවක් නොකොට ඒ මලින් ද ගලවා හැර සිත් සේ ඇවිදුනාවන් කෙළේ ය. තව ද: මෙම ඡන්න නම් අමාත්‍යයා චුල්ලහංස ජාතකයෙහි මාගේ බුදුන් ශ්වෙත හංස රාජ ව උපන් සමයෙහි මලෙහි බැඳුනු දා පීඩාවක් නො කොට ඒ මලින් ද ගලවා ලී ය. තව ද: මෙම ඡන්න නම් අමාත්‍යයා මහාහංස ජාතකයෙහි මාගේ බුදුන් හංසරාජන් ව ඉපැද මලෙහි බැඳී ගියදා ඒ මලින් ද ගලවා හළ.

මෙසේ සසර ජාති සහස්‍රයෙහි නොයෙක් බන්ධනයෙන් බුදුන් ගලවා උපකාරී ව අවුදින් දූත් මේ බුදු වන ජාතියෙහි සාම්බන්ධත යෙන් අනුබල ව ගලවා සිත් සේ ධ්‍යාන භූමියෙහි ඇවිදුනාවන් කෙළේය. මෙසේ මෙසේ උහු උපකාරී ව ආ හෙයින් බෝසතානෝ ඔහු අස්වසා "තා පසු ව මහණ කරවා ගණිමි"යි කියා සන්හිඳුවාලා පලඳනා හා අශ්වයා ඔහට පාවා දී මෙසේ සිතූසේක. "මේ මාගේ හිසකෙස් මැටි ය තපසට සරුප් නො වෙයි. කෙසේ හරිම් දෝ හෝ"යි සිතා බෝධිසත්ත්වයන් හිස අල්වා කෙස් කැපීමට අතික් සුදුසු කෙණකුන් නැති හෙයිනු ත් සිය අතින් ම කෙස්මැටි ය කැපී ම හැම බුදුන්ගේ සිරිත් හෙයිනු ත් කොපුවෙහි තිබූ මඟුල් කඩු ව වලාකඩකින් හළ විදුලිය පතක් සේ හළා, දකුණතින් කඩුමිට ගෙණ, වමතින් කෙස්මැටි ය ගෙණ, තිලුපුල් තලබක් සේ

කපා හළ කල සිටි කෙස් දෑඟුල් පමණ ව දක්ෂිණාවර්ත ව නැමී සිරස හා සම ව හැලී ගිය. දැළි රැවුළු ද එසේ ම වී ය. නැවත ජීවිතාන්තය දක්වා කෙස් බැව මැනවැ යි නැති ව එසේ ම පැවැත්ත.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ අඳුන් රැසක් සේ කෙස් වැටිය අතින් ගෙණ "ඉදින් එකාන්තයෙන් මම බුදුවෙම් නම් මේ කෙස්වැටිය ආකාශයෙහි රඳාවයි. බුදු නො වෙම් නම් බිම වැටේවා'යි අධිෂ්ඨාන කොට අහසට දැමූදැ ය. එ කෙස්වැටිය සතර ගව්වක් අහසට පැන නැඟී කාලහංස රාජයකු සේ ලීලොපෙත ව සිටියේ ය. එ කෙණෙහි ශක්‍රදෙවේන්ද්‍රයා දිවැසින් බලා දැක සතර ගව්වක් උස ඇති රුවන් කරඬුවකින් ඒ කෙශ ධාතු පිළිගෙණ තමාගේ ශක්‍ර භවනයට ගෙණ ගොස් සිළුමිණිසෑ නම් දාගබක් මවා දෙදෙව් ලෝවැසියන් ගෙණ දූත දක්මා පූජා කෙරෙයි. එසේ හෙයින් කියන ලදී:

ඡෙත්වාන මොළිං වරගන්ධ වාසිතං
වෙහායසං උක්ඛිපි අග්ග පුග්ගලො,[1]
සහස්ස නෙත්තො සිරසා පටිග්ගහී
සුවණ්ණචඞ්ගොටවරෙන වාසවො–යි.

මෙසේ මාගේ බුදුන් කපා හළ කෙස්වැටිය පමණක් පවා ශක්‍රදෙවේන්ද්‍රයා තමා මුදුනෙන් පිළිගෙණ ශක්ති පමණින් පූජා කළ හෙයිනු ත්, එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනුත්, මාගේ බුදුහු අර්හත් නම් වන සේක.

ඉක්බිත්තෙන් කෙස්වැටිය මෙසේ කපා බොධිසත්ත්වයෝ "මේ මා හින තුබූ කසී සළුව තපසට සුදුසු නො වේ"යි සිතූදැ ය. එ කෙණෙහි කාශ්‍යප බුදුන් සමයෙහි බෝසතුන්ට යහළු වූ ශුද්ධාවාස බ්‍රහ්මලොකයෙහි වසන ඝටීකාර නම් මහාබ්‍රහ්ම රජ්ජුරුවෝ බුද්ධාන්තරයක් මුළුල්ලෙහි නො නැසී පැවැත්තා වූ මිත්‍රධර්මයෙන් සෙදුනාහු "අද මාගේ යහළුතුමෝ මහණ වෙති යි සිතූ හ. උන්ට මහණ පිරිකර ගෙණ යෙමි"යි සිතා කාලප්‍රාප්තපත්තියෙහි දී පියුම් පෙත්තෙහි මැවී තුබූ සතර වන අටපිරිකර ගෙණවුත් ශ්‍රී හස්තයෙහි තබාලූහ. එ කෙණෙහි බොධිසත්ත්වයෝ බ්‍රහ්මයා දුන් සිවුරු පෙරව, උතුම්වූ තවුස් වෙස් ගෙණ ඉන තුබූ සාටක යුග්මය අතින් ගෙණ පෙර සේ ම ඉටා ආකාශයට දැමූදැ ය. එ ද සතර ගව්වක්

1. සඞ්ඝපුඞ්ගවො.

ආකාශයට පැන නැගී ගෙවන හංසරාජ යුග්මයක් සේ ලීලා පෙන ව සිටි කල මහාබ්‍රහ්මයා දෙව්ලොස් යොදුන් රුවන් කරඬුව කින් ඒ සළු ද, පිළිගෙණ බඹලෝ ගෙණ ගොස් සළුමිණිසෑ, වඩා දූන් දක්වා මහත් වූ පූජා කෙරෙයි. මෙසේ තමන් වහන්සේ මහණ වන ද ඇඳි සළුම දක්වා මහා බ්‍රහ්මයාට මුදුන් මල්කඩ වූ හෙයිනු ත්, ඔහු නමා ගත්ති පමණින් පූජා කල හෙයිනුත් එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනුත්, මාගේ බුදුහු අර්හත් නම් වනසේක.

මෙසේ මහණ වූ ඉක්බිත්තෙන් බෝසතාණෝ ඡන්නයා නම් අමාත්‍යයා ලඟට කැඳවා "යහළු! තෝ ශොක නො කොට මාගේ කිමෙන් ගොස් මිපියාණන් වහන්සේට හා මෑණියන් වහන්සේට හා යශොධරා දේවින්ට හා මා සිදූක් පරිදිත් ඉසෙක් කාපා මහණ වූ පරිදිත්, දෙවසුව ලොවුතුරා බුදුව මුත් තමන් දක්නට නො එන පරිදි ත්, මා කෙරෙහි ශොක නො කරන්ට ත් මිපියාණන් වහන්සේ මපුතු රහල් කුමරුවා බලා මා කෙරෙහි ශොක නො කරණ මෙ ප රිද්දෙන් කියයි සමු දුන්සේක. ඡන්නයා බොධිසත්වයන් වැඳ ප්‍රදක්ෂිණා කොට ලා හඬ හඬා නික්මිත. කන්ථක නම් අශ්වයා බෝසතුන් මහණ වූ පරිදි ත්, ඡන්නයා හා සමග කරණ කථාවත් දූන "නැවත මාගේ ස්වාමිහු දක්මෙක් මට නැතැ" යි සිතා ශොක කරණුයේ චක්ෂුඃපථය ඉක්මෙත් ඉක්මෙත් ශොකාග්නින් ලය පැළී මිය රිදී කඳක් වැනි අත්කඳ බිම හෙලා එ කෙණෙහිම තවුතිසා භවනයෙහි කන්ථක නම් දිව්‍ය පුත්‍ර ව තුන් ගවු උස දිව්‍ය ශරීර ඇතිව දිව්‍ය පිළිදිත් සැදී දෙලොස් යොදුන් දිව්‍ය ප්‍රාසාදයෙක පෙණී ගිය. ඒ ඡන්නා නම් අමාත්‍යයාට ආදි එක ශොකයෙක. අසුමළ පසු දෙවන ශොකයන් පෙළෙන්නේ හඬා ගෙණ වැලප වැලප නුවරට ගොස් මේ පවත් සැලකෙළේ ය.

ඉක්බිත්තෙන් මහණවලා මාගේ ස්වාමිදරුවෝ අමාත්‍යයා ගිය පසු නුවරින් ආ කෙණෙක් මා දූන පියති යි එ තැනින් නික්ම වැඩ එම ගංබඩ] අනුපියා නම් අඹවනයට වැදලා ඒ වනෙහි පැවිදි සුවෙන් සත් දවසක් නිරාහාරයෙන් වැඩහිඳ අටවන දා එ තැනට තිස් යොදුන් මග ගෙවා රජගහා නුවරට ගොස් පූර්වාරයෙන් වැද ගෙපිළිවෙළින් සිඟන්නට පටන්ගත් සේක.

එ නුවර පළමු සත් දවසෙක පටන් ඇසළ කෙළි නම් වූ නකත් කෙළියෙක් විය, මනුෂ්‍යයෝ තමන් තමන්ගේ කර්මාන්ත හැර නුවරම වැද උත්සව කෙළි කෙළනාහු ය. එ දා ඒ මනුෂ්‍යයෝ බෝසතුන්ගේ රූපදර්ශනී ය නිසා නාලාගිරිහු මත් එ ම රජගහා නුවර යේ, අසුරයන් මත් ශක්‍රපුර ය යේ, කැලලී අවලොස් කෙළක් මනුෂ්‍යයෝ දිව අවුදින් බෝසතුන් වට කොට ගත්හ. එ වේලෙහි බෝසතාණෝ ගෙයක් පත්වා ගෙසකට කො ගොස්, වියදඬු පමණ තින් වඩා දුර නො බලා, සත්හුත් ගමිනින් පිඩු සිඟනසේක. එ දා රැස්වූ මිනිසුන් අතුරෙන් සමහර කෙනෙක් කොල මේ රාහුට භයින් මිනිස්ලොවට දිව වෙස් වලා ඇවිදිනේ පූර්ණ චන්ද්‍රයා යයි යෙති. සමහර කෙනෙක් කොල, කුමක් කියවු ද ඒ පූර්ණ චන්ද්‍රයා මනුෂ්‍ය ලෝකයෙහි කවර කාලක ඇවිදි විරි ද? ඒ සකලඞ්ක ය. මේ අකලඞ්ක ය. එසේ හෙයින් මේ පූර්ණ චන්ද්‍රයා නොවේ යි. අප ගේ රජුගේ හා නුවර වැසියන්ගේ ක්‍රීඩා විභූතිය අසා කෙළනා නිසා වෙස් වළා ආයේ මේ කාම දෙවයා දෝ"යි යෙති.

සමහර කෙනෙක් එ බසට සිනාසී "කොල, කොපි නන්දෙ බවු ද, ඒ අනඞ්ගයා නම් ඊශ්වරයා විසින් දග්ධපියක ලද අඞ්ගාඞ්ග ඇත්තේ ය. මේ පුරුෂයා ඉතා සම්පූර්ණ වූ ගාත්‍ර ඇත්තේ ය. එසේ හෙයින් මේ කාම දේවයා නො වෙයි. තමාගේ දිව්‍ය පුරය දේ හෝයි යන සංඥවෙන් ඇවිදිනේ ශක්‍ර දෙවේන්ද්‍රයා දෝ" යි යෙති. සමහරු එ බසට සිනා පහළ කොට "තොප කියන බස් පූර්වාපර විරොධ ය. ඒ තොපගේ ශක්‍රයාගේ දහසක් ඇස් කොයි ද, ඓරාවණ නම් හස්ති රාජයා කොයි ද, එසේ හෙයින් මේ ශක්‍රදෙවේන්ද්‍රයෙක් නො වේ ම ය. මෙ නුවර බ්‍රාහ්මණ තපස්වීවරුන් වේද වෙදාඞ්ගයෙහි ප්‍රමාද ය යි වැඩ පිණිස ආයේ මේ මහා බ්‍රහ්මයා දෝ" යි යෙති. ඔවුන් ඇමට නිඳු කොට සමහර කෙනෙක් "මේ සදෙකුත් නො වේ යි. කාමදෙවයෙකුත් නො වේ යි. බ්‍රහ්මයෙකුත් නො වේ යි. එකාන්තයෙන් ම මේ ලෝකයට ඉෂ්ටකාමී වූ තපස්වියෙක් ම ය" යි කීහ.

එ කල රජ පුරුෂයෝ රජු කරා දිව ගොස් "ස්වාමීනි දෙවියකු බව ත් නො දනුම්හ. බ්‍රහ්මයකු බව ත් නො දනුම්හ. යක්ෂයකු බව ත් නො දනුම්හ. නාගයකු බව ත් නො දනුම්හ. ගරුඬයකු බව ත් නො දනුම්හ. අපගේ මේ නුවර දෙරින් දෙර පිඩු සිඟ යි. ඉතා ආශ්චර්‍ය පුරුෂයෙකැ" යි කීහ. එ පවත් රජ අසා සිංහ

පඤ්ජරයෙහි දොර හැර පිටින බලනුයේ, බෝසතුන්ගේ රූපශ්‍රී දැක ඉතා ආශ්චර්‍ය්‍ය වූයේ "කොල, වහා යව. ඉදින් අමනුෂ්‍යයෙක් වී නම් නුවරින් පිටත් වලා අන්තර්ධාන වෙයි. ඉදින් දෙවියෙක් වී නම් ආකාශයෙන් නැඟී යෙයි. දිව්‍යනාගයෙක් වී නම් පොළොව කිමිද යෙයි. ඉදින් මිනිස් තවුසෙක් වී නම් ලද ආහාරයක් සැප කොටගෙන හිඳ වළඳයි. දුටු පවත් මට කියව" යි නියොග කෙළේ ය.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ තමන්ගේ රූප ශොභාවෙන් සියලු සතුන්ගේ නුවන් කමන් කරා නගමින් යුගමාත්‍ර දර්ශී ව යැපෙන පමණක් සෑඳි බත් ලදින් වන් වාඤලින් ම නුවරින් පිටත් වලා පාණ්ඩව නම් පර්වත සෙවනෙක පූර්ව දිග් බලා වැඩහිඳ වළඳන්නට පටන් ගත්තේ ය. උපන් දා පටන් එසේ වූ බැඟෑපත් ආහාරයක් ඇසිනුත් නුදුටුවිරූ හෙයිනුත්, සුවඳ ඇල්සාලේ අග්‍ර භොජන ය ම අනුභව කොට වැඩි හෙයිනුත්, ඒ බත මුඛයට පැලූ වේලෙහි බඩවැල් මුඛයට නැගෙන ආකාර ව පිළිකුල් වී ය. එ වේලෙහි මාගේ සවාමිදරුවෝ සිතා මදුරණයේක් 'එසේ ද සිද්ධාර්ථ ය! තෝ පෙර සුවඳ කමා නුබූ හැල්සාලේ අග්‍ර භොජනය ම අනුභව කොට [1]බත් කන කුලෙහි උපැද රජ සුව විඳිනා සමයෙහි කවර දවසෙක සිවුරක් පෙරව ඇගින් බාඳිය වගුර වගුරා දොර දොර පිඬු සිඟා පාංශුකූල වූ ආහාරයක් එකලා ව වැඩහිඳ අනුභව කෙරෙම් දෝ හෝ, කවර දවසෙක ලැබෙම් දෝ හෝයි සිතා ඇවිද්දෙහි ය.

දැන් තෝ ඒ පාංශුකූල වූ ආහාර ය ලදින් පිළිකුල් සිතයි ද, සුභොජන ය ම වළඳා බුදු වනොත් කැමැත්තෙහි ද, තා සේ වූ අලජ්ජියෙක් නවත් ඇද්ද, තාගේ ශරීරයට සුව කැමැත්තෙහි වී නම් මුළු ලෝ වැසියන්ට කෙසේ නම් නිවන් සුව දී ලයි ද, තෝ ලජ්ජා ඇතියෙහි වී නම් මේ වේලෙහි පටන් බුදු වන දවස් දක්වා ලද යම් භොජනයක් අමා කොට සිතාලා ලද දෙයකින් යැපී ඉන්ද්‍රිය සංවර ශීලය අඛණ්ඩ කොට රක්‍ෂා කරව" යි මෙසේ තමන් වහන්සේ ම තමන් වහන්සේට ගුරුව ඉන්ද්‍රිය සංවර ශීලය ඉවා ගෙණ "එම්බල සිද්ධාර්ථ කුමාරය! තාගේ මේ ශරීරය ඝන රතින් නිමවා ඔප් නඟන ලදුයේ හො වෙයි. දෙකෙළ පණස් ලක්‍ෂයක් ඉසකේසෙන, නවානූදහසක් ලෝමයෙන, විසි නිය පොත්තෙන, දෙතිස් දතින, මස් වසා සිරි සහිත, නවසියයක් මස් පිඬින, නවසියයක් නහරවැලෙන, තුන්සියයක් ඇටසැකිල්ලෙන, පුරා තිබෙන ඇටමිදුළෙන, වකුගඩුයෙන, හදමසින, අක්මායෙන, දලබුයෙන,

1. එකකුලෙහි.

බඩදිවින, පපුකැතින, දෙතිස් රියන් බඩ මැලෙන, දෙතිස් රියන් අතුනු බහනින, උදරයෙන, අසර මලයෙන, ඉස්මුලින, ලය පුරා තිබෙන පිතින, උගුරු පිරුණු සෙමින, පූයයෙන, පැතිර සිටිනා ලෙහෙයෙන, සෝදියෙන, මේදස් තෙලින, ඇස් පුරණ කඳුලෙන, විරි පවත්නා තෙලින, මුව පුරණ කෙළින, නාසා පුරණ සොටුයෙන සඳමිදුලෙන, විත් පලා පිරුණු වළින් දියෙනැ යි යන මේ දෙතිස් පිළිකුල් කුණප කොටඨාසයෙන් ම පිරුණේ ය.

තව ද මේ පවිත්‍ර වූ ආහාර ය තාගේ ශරීර නමැති ගෘහයෙහි, මුඛ නමැති වතට බහා දත් නමැති මොහොලින් කොටා, දිව නමැති කුල්ලෙන් පොළා, කෙළ නමැති දියෙන් ගරා, උදර නමැති සැළියේ ලා පඨවි නමැති උදුනට නගා, ආපො නමැති දියවර ගෙණ තෙජො නමැති ගිනි උපදවා, වායො නමැති පත් සලා, මෙසේ මිහ කුස ගින්නෙන් දිවා රාත්‍රියක් තැම්බවා හැමපැය ගිය කල දිය වටන් මල වටන් උභතො මාර්ගයෙන් ඉතිරි පිළිකුල් බවට පැමිණේ යි. තාගේ මේ ශරීර කුණප ය බලසේ මේ ආහාරය ම ඉතා පිරිසුදු ය. ඉතා පවිත්‍රය. ඉතා උතුමැ"යි සිතක් සිතත් බෝසතුන්ට ඒ ආහාරය ම සුභොජන වී ය. එඹල සිද්ධාර්ථ කුමාර ය! තාගේ මේ ශරීරය ද එක් ධාතුයෙක. මේ ආහාරය ද එක් ධාතුයෙක. මේ ආහාරය ද එක් ධාතුයෙක. එහෙයින් ධාතු සමූහයෙක් ධාතු සමූහයක් වළඳ යි" යනාදීන් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කොට පිළිකුල් නැතිව ම ඒ ආහාරය ම වැළඳූසේක.

ඉක්බිති රාජපුරුෂයෝ බත් වළඳන්නා දැක ගොස් රජහට සැලකළහ. රජ්ජුරුවෝ දූතයන් කී බස් අසා වහා නුවරින් නික්ම බෝසතුන් කරා ගොස්, වැඩහුන් ලීලා දැක පැහැද නම් සලකුණු විචාරා බෝසතුන් ඇඳින, "කිමෙක, යහළු සිද්ධාර්ථ කුමාරයෙනි! තොපගේ වංශයෙහි සිගා කෑ එක ද රජෙක්හු නැත. මහත් වූ රාජ්‍ය ශ්‍රී ම විඳිති. තොපගේ රජකුලයට පරිභව නො කරවා යහළු, මාගේ මේ රජගහානුවර නම් අසූ දහසක් නියම් ගමින් හා අටලොස් කෙළක් මනුෂ්‍යයන් විසින් හා, ගැවසී ගත්තේ ය. තුන් සියයක් යොදුන් අඟු මගධ දෙරටින් නිමක අයින් අතුරු නැත්තේය. ඉසිගිලි, වේභාර, වේපුල්ල, පාණ්ඩව, ගිජ්ඣකූට යන පඤ්ච මහා පර්වතයන්ගෙන් පරික්ෂිප්තය. පූර්වයෙහි චක්‍රවර්ති රජුන්ගේ ම වාසස්ථාන ය. අමිත භොගී වූ පඤ්ච මහා ධන සිටුවරුන්ගෙන් ශොභමාන ය. යහළු මේ නුවර මා හා එක් ව රජ ය කරව" යි කියා සියලු තමාගේ රජ ඉසුරු දින. බෝධිසත්ත්වයෝ

"සත් දවසකින් ලැබෙන චක්‍රවර්ති රාජ්‍යය හැරපියා අවුදින් දුක් නොප හා සමග අධිරාජ්‍යය ගතිම් නම් ඒ චින්තාමාණික්‍ය රත්නය හැරපියා විදුරුගල් ගත්තා වැන්න. රජ සැපතින් මට කම් නැත. සම්‍යක්සම්බෝධිය පතා මහණ වීමි" යි කීසේක රජ්ජුරුවෝ නො එක් ප්‍රකාරයෙන් රජයට යාච්ඤා කොට නො ගිවිස්නා හෙයින් "එසේ වී නම් නුඹ වහන්සේ යම් දවසෙක බුදු වූසේක් වී නම් පළමු ව මාගේ නුවරට වැඩ මිනිසුන්ට දෙසන පළමු වන ධර්මදේශනාව මට ම දෙසූ ව මැනවැ"යි ප්‍රතිඥා ගෙණ අවසර ලදින් නැවත ඒ බිම්සර රජ්ජුරුවෝ තමන්ගේ රජගහා නුවරට ම වන්හ. එසේ හෙයින් කියන ලදී:-

අථ රාජගහං වර රාජගහං
[1] නර රාජවරෙ නගරන්තු ගතෙ,
ගිරිරාජවරො මුනිරාජවරො
මිගරාජගතො සුගතොපි ගතො-යි

ඉක්බිත්තෙන් බෝසතාණන් වහන්සේ "බුදු ව පළමු වන ධර්මදේශනාව මහරජ තොපට ම දෙසනා කෙරෙමි" යි රජහට ප්‍රතිඥා දීලා මිණි ගුහාවෙන් නික්මුත් සිංහරාජයකු සේ ඒ පාණ්ඩව නම් පර්වත ගුහාවෙන් නික්මී, අනුක්‍රමයෙන් දනවු සැරිසරා ඇවිදිනාසේක් ආලාරය උද්දකය යි යන තාපසවරුන් දෙදෙනා කරා ගොස් කිප දවසක් එහි වාසය කොට අෂ්ටසමාපත්තීන් උපදවා ගෙණ "මේ ධ්‍යාන මාත්‍රයකින් බුදු ව ලෝවැඩ කළ නො හැක්කැ" යි එයි ලොභ නො කොට ඒ තපස්වින්ගේ සමීපයෙහි නිවන් නැතැ යි හැර එ තැනින් වැඩ සියලු දිව්‍ය මනුෂ්‍යයන්ට තමන් වහන්සේගේ වීර්‍ය්‍යබල දක්වා මහත් වූ දුෂ්කර ක්‍රියා කෙරෙමි යි සිතා උරුවෙලා නම් දනවුවට වැඩ ඒ රමණීය වූ වැලිතලාව දැක මේ තපසට රම්‍ය ස්ථානයෙකැ යි පැහැද එ තැන වාසයට පටන්ගත් සේක. ඒ උරුවෙලායෙහි වැලිතලාව නම් කෙසේ වී ද? යත්;

පෙර ධ්‍යානලාභී දසදහසක් තාපසවරුන් බොහෝ කලක් විසූ පන්සල ය. එ කල ඔහු ඇම දෙනා ම අප ඇමදෙනා අතුරෙන් යම් යම් කෙනෙක් කාම තමන් රහසත් කාමවිතර්කාදි පාපයක් සිතූ නම් හිරු උදයේ ගොස් මේ ගඩනාවේ කට පමණක් දියට බැස ගංපල්ලෙන් වැලි ගෙණවුත් මේ මුලු මධ්‍යයෙහි ලලා ආරෝපනය කළ මැනව. ඔහට මේ දඩුවම් නමැ' යි කතිකා කළහ එකල ඒ තාපසවරු අකුශල විතර්කයක් සිතූ කල උපන් කල

1. නරරාජවරෙ නගරන්තු ගතෙ,

එම ක්‍රමයෙන් වැලි ගොටුවක් ලා ඇවෑත් දෙසැත්තෑන දීඝී කාලය කින් සෝදුන් පමණ වැලිතලාවෙක් විය. පසු ව තාපසවරුන්ගේ අයාමෙහි උපන් රජදරුවෝ මේ පෙර උතුමන් විසූ තැන ය යි සිල්වතුන් ඇදී වැලි ය යි සිතාරා පවුරු බඳවා උපචාර කළහ. මෙසේ ඒ උරුවෙලා නම් වැලිතලාවට රම්‍ය ය යි දැක දුෂ්කර ක්‍රියාවෙන් එහි වාසයට පටන් ගත්සේක

ඉක්බිත්තෙන් අඤ්ඤාකොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාමය, අස්සජි යි යන පෙර කී පඤ්චවග්ගියෙහි භික්ෂූහු ගම් නියම් ගම් රාජධානීයෙහි සැරිසරා ඇවිදිනාහු ඒ උරුවෙලාවට වැද බෝසතුන් දුටහ. එතැන් පටන් එක්ව වාසය කොට සාවුරුද්දක් මුළුල්ලෙහි ස්වාමිදරුවන් දුෂ්කර ක්‍රියා පූර්ණ කල "මේ සිද්ධාර්ථ කුමාරයෝ අද බුදු වෙති. සෙට බුදු වෙති" යි මලු ඇමද නහන බොන පැන් දී වත් පිළිවෙත් කොට දුක් ගෙණ සමීප යෙහි වාසය කළාහු ය. බෝසතාණෝ "මේ ශරීරයට ආසුවක් කොට බුදු විය නොහැක්කැ යි ඉතා මහත් වූ දුක් දී දුෂ්කර ක්‍රියායෙන් මුදුන් පැමිණෙමි" යි දවසෙක තල ඇටක් සා භොජනය කිනුත් යපී දවස් යවන සේක. හැම පරිද්දෙන් ම ආහාර වර්ජිත කොට මිරිස් කනක් ලද්දෑත්, තිබ්බටු කනක් ලද්දෑත්' දවස් යවන සේක. සමහර දවසෙක බත් හුලකින් වුවත් දවස් යවනසේක. සමහර දවසෙක සුන් බතුත් වනසේක. දෙවතාවෝ ආහාර වර්ජිතයෙන් නො නසින්ව යි සිතා මුඛයෙන් අනුභව නො කරණ හෙයින් තවානුද්දහනක් ලොමකූපයෙන් දිව්‍ය ඕජස් බහා ජීවිතය රක්‍ෂා කෙරෙති.

ඉක්බිත්තෙන් මෙසේ ආහාර වර්ජිත කිරීමෙන් දුබල වත් වත් රන් කඳක් වන් ශරීරය කාලවර්ණ ව ගියේ. දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෝ ද ශරීරයෙහි ම සැඟ වී ගියහ. එක් දවසක් තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි මෙසේ නිරාහාරයෙන් සක්මන් කොට භාවනා කරන්නාහු දසකෙළ දහසක් පුරුෂයන්ට බල ඇති මාගේ ස්වාමීදරුවෝ ආහාර වර්ජිතයෙන් පස්කඳ ධරාගත නොහී සක්මන් කෙළවර ගසකින් හුනු පුරාණ පත්‍රයක් සේ බිම වැටී විසංඥ වූසේක. එ වේලෙහි සමහර දෙවතාවෝ "අහෝ, ඛෙදය, ලොවට හානි වී ය. මහණ භවත් ගෞතමයෝ බුදු වෙමි යි උත්සාහ කොට බුදු විය නො හී බලව, දැන් මියගියාහු ය" යි සියාරා සිට හඬති. සමහර දෙවතාකෙණෙක් "තව නො මළාහු ය. ඇසිල්ලකින් උපදිති. බුදු නොව ඔහට අන්තරායෙක් නැතැ" යි කියති.

ඉක්බිත්තෙන් එක් දෙවතා දුවක් බෝසතුන් විසංඥ ව බිම හුනු විට ම කිඹුල්වතට දිව ශුද්ධොදන රජ්ජුරුවන්ගේ ශ්‍රී යහන් ගබඩාවෙහි ආකාශයෙහි සිට ආලෝක පතුරුවා රජ්ජුරුවන්

පුබුදුවා "කිමෙක් ද? ශුද්ධෝදන රජ්ජුරුවෙනි," තොප පුතනුවෝ සිද්ධාර්ථ කුමාරයෝ දැන් පරලොව ගියාහුය" යි කීවුය. එ බස් අසා රජ්ජුරුවෝ "මපුතනුවෝ බුදු ව මළාහු ද, නුබුදු ව මළාහු දැ"යි විචාළහ. "බුදු විය නො හී දුෂ්කර ක්‍රියා භූමියෙහි මළාහු ය"යි කීව. එ බස් අසා රජ්ජුරුවෝ "මම තී කී බස් නො ගිවිසිමි මා පුතනුවන් ලොවුතුරා බුදු නො වී මිය යාමෙක් නම් අහසට පොළොව යේ දුරැ"යි කියා නො ගිවිස්සාහ.

මෙසේ කර ම රජ්ජුරුවන් නොගිවිස්නට කාරණ කිම යත්:- එදා කාලදේවල නම් තාපසයන්ගේ ජටාන්තරයෙහි ශ්‍රී පාදය පෙණී ගිය ප්‍රාතිහාර්‍ය්‍යය, දඹගස මුලදී දුටු ප්‍රාතිහාර්‍ය්‍ය ය යන මේ දෙකාරණයෙන් ප්‍රත්‍යක්ෂ ව රජ්ජුරුවෝ නො අදහා "තී සේ වූ දෙවතා දූන් සියයක් දහසක් කිවත් මම නො ගිවිසිම ම ය. මපුතනුවෝ බුදු ව බණ දෙසා මුත් නො මියෙත් මැ යැ" යි ප්‍රතික්ෂෙප කළාහු ය. ඉක්බිත්තෙන් දෙවතා දූ නැවත ගොස් බෝසතුන් පැහැනැගී සිටියවුන් දැක සතුටු සතුටුව නැවත දිව ගොස් "රජ්ජුරුවෙනි! තොප පුතනුවෝ නො මළාහු ය. ශොක නො කරව" යි කිව. මෙසේ ම දෙවතාවෝ නො එක් වාරයෙහි අවුදින් බෝසතුන් මළහ යි යෙති. නො එක් වර ම රජ්ජුරුවෝ නො ගිවිසිත් ම ය. ඉක්බිත්තෙන් මාගේ බොධිසත්වයන් කරන්නා වූ වීර්‍ය්‍යය අහස හා පොළොව ගැට ලන්නා සේ, මහ මුහුද පැන් ඉස්නා සේ, මහමෙර සොලවන්නා සේ, ඉතා උගහට වි ය.

මෙසේ දුක් ගෙණ බුදුවිය නොහී "මේ බුදු ව යා හැකි මඟෙක් නො වෙයි. දුක් හැරපියා ආහාර පර්‍ය්‍යෙෂණය කොට කායබල උපදවායෙණ වීර්‍ය්‍ය කොට බුදු වෙමි"යි සිතා නානා ස්ථානයෙහි ඇවිද භික්ෂාවතනය කොට මධුර වූ ආහාරය අනුභව කරන්නට පටන්ගත් සේක. නැවත ශරීර ය රන්කඳක් සේ ම සැහැවී ගිය දෙතිස් අසූ ලකුණු පහළ වී ය. එ කල පස්වග මහණු "මේ සිද්ධාර්ථ කුමාරයෝ සාවුරුද්දක් දුෂ්කර ක්‍රියා පුරා බුදුවිය නුහුනු වෝ ය. දැන් නානා ස්ථානයෙහි පිඬු සිඟා මධුර වූ ආහාර ය අනුභව කොට කවර කලෙක නම් බුදු වෙද්දැ යි, ඉස් සෝධා නහනු කැමැති ව පිනිබිඳු එක්කරන්නා සේ මෝහට දුක් ගෙණ කවර දෑ වැඩක් විඳිමෝද්දැ" යි කමින් තමන්ගේ පා සිවුරු ගෙණ අවලොස් යොදුන් මඟ ගෙවා ගොස් බරණැස ඉසිපතනයට වැද වාසය කෙරෙති

එ සමයෙහි එම උරුවෙලා නම් දනව්වෙහි සේනානි නම් නියම් ගම සේනානි නම් සිටකුගේ සුජාතා නම් දූවක් වැඩිවිය පැමිණ අජපාල නම් න්‍යග්‍රොධ වෘක්‍ෂය කරා ගොස් "මේ වෘක්‍ෂයෙහි දෙවතාවකෙනෙහි, මම මතු සම්වූ ජාති හා ධන රුව ඇති සිටකු කෙරේ සරණ රැකි කුළුඳුලෙහි පුතෙකු ලදිම් නම් එ තැන් පටන් හවුරුදු පතා ලක්‍ෂයක් අගනා කිරිබතකින් තොපට පූජා කෙරෙමි"යි යාදිනි කත්‍රා ය. පසු ව බිසෝතොමෝ බරණැස සිටානන් කෙරේ වැස කුළුඳුලෙහි යස නම් පුතකු ලදින් හවුරුදු පතා ඒ නුගගස දෙවතාවාට බිලියම් දෙ යි. එ කල මාගේ බුදුන් දුෂ්කර ක්‍රියා පුරා සාවුරුද්දක් ගිය කල බුදු වන වෙසක මැදි පොහෝද දෙවපූජා කෙරෙමි යි ඒ සුජාතාවෝ පළමුව දහසක් දෙනුන් වැල්මී වනෙහි කවා උන්ගෙන් දහසක් කිරි බදුත් දෙව, ඒ කිරි කකාරු පන්සියයක් දෙනුන් පොවා, ඒ දෙනුන්ගේ කිරි දෙව කකාරු දෙසිය පණස් දෙනකු පොවා, ඔවුන්ගේ කිරි දෙව කකාරු එකසිය පස්විසි දෙනකු පොවා, උන්ගේ කිරි දෙව කකාරු සූසැට දෙනකු පොවා උන්ගේ කිරි දෙව කකාරු දෙතිස් දෙනකු පොවා, උන්ගේ කිරි දෙව කකාරු සොළොස් දෙනකු පොවා, උන්ගේ කිරි දෙව කකාරු මගුල් දෙනුන් අටදෙනෙකු පොවා, මෙසේ ඒ දහසක් දෙනුන්ගෙන් දෙවි කිරි අට පරම්පරාවකින් බොල් ව මියුරු වූ කල එ දා උදෑසන ඒ දෙනුන් අටදෙනාගේ කිරි දොවනු සඳහා වස්සන් මුදලූ කල වස්සෝ බුරුලුවල තොලු නො ලා සිටිති. එ විගස [1]භාජනයන් පැලූ වේලෙහි ක්‍ෂීරධාරාවෝ ඒ ධාරා ව තුමූ ම වැගිරී බඳුන් පුරා ඉතිර සිටගත්හ

ඒ ආශ්චර්‍ය්‍ය දුටු සුජාතාවෝ තමන් ස්වහස්තයෙන් ම කිරි ගෙණ නවමු මහ සැළෙක බහාලා අගුරු දෙවුදුරු කපුරු කළුවැල් සඳුන් යනාදි සුවඳ දරින් කිරිබත පැස වන්ට පටන්ගත්හ. එ බත පැසෙත් පැසෙත් මහත් බුබුළු නැගී දක්‍ෂිණාවෘතව ව සැළ වටා දිවෙයි. එක බින්දුවෙකු ත් පිටත නො යෙයි. ඒ උදුනෙන් පාන් ශිඛාවෙක දුම් පමණකු ත් නො නැගෙයි. එ වේලෙහි වරම් රජදරුවෝ සතර දෙන අවුත් උදුන සතරදිග රකවල් ගත්හ. ශක්‍රදෙවෙන්ද්‍රයා අවුත් ද දෑ බව පෙණෙනහලි උදෑ ගිනි දල්වා අරක් කැමි කම් කෙරෙයි. මහාබ්‍රහ්මයා උඩුත් මුදුනට සේසත් ගෙණ සිටගත. දසදහසක් සක්වළ දෙවියෝ දස දහසක් මනුෂ්‍ය ලොකවල ද සැට දහසක් දිව්‍ය ලොකවල ද ඇති යම් ම රසයක් තමන් තමන්ගේ ආනුභාවයෙන් දඹුවල්බැ මීයක් පෙළා මධුරස ගන්නවුන් සේ හැම රස ම ගෙණ ඒ බඳනේ බහාලූහ. සුජාතාවෝ

1 තවුම.

ඒ ආශ්චර්යය දැක සාමින්ගේ පූර්ණා නම් දාසිය කැඳවා "බුහුනැතියෙනි, මේ තෙක් කල් මේ බත් පිසන කල මෙසේ වූ ප්‍රාතිහාර්යයක් නුදුටු විරිමි. අපගේ වෘක්ෂ දේවතාවා අද ඉතා ම මා කෙරෙහි පැහැද ගියේ වන. තෙපි පළමු ව දිව ඒ දේවාලය සසසා පිස පියව" යි කීය. ඒ පූර්ණා නම් දාසී අජපාල නම් ඒ නුග ගස කරා ගියා ය. මාගේ බෝසතාණෝ ඒ දා රෑ පස්ව මහා ස්වප්නයක් දුටහ. ඒ කෙසේ දැ? යත්:-- පශ්චිම භවික වූ මහා බෝධිසත්ත්වවරයන් බුදුවන දවස් චාතුර්දශී දින රාත්‍රියෙහි දක්නා ස්වප්නයෝ පස් දෙනෙක. එසේ හෙයින් ම මහා ස්වප්න යයි ව්‍යවහාර වී ය. ඒ දවස් රෑ "සෙට මැදි පොහෝ දින ය. වෛශාඛ යෝගය ත් යෙදින, මාගේ උත්පත්ති මහා මඞ්ගල වූ දින ය. දුෂ්කර ක්‍රියායෙන් දුන් හවුරුදු සංඛ්‍යා දු සම්පූර්ණ වි ය. එසේ හෙයින් සෙට මැදි පොහෝ දිනයෙහි ලොවුතුරා බුදු ව මහා බුද්ධ මඞ්ගලය නු දු ලදිම් නම් යෙහෙක" යි සිතා වැදහෙව නිද්‍රාවට පවන් ගත් සේක.

එකල එක් වේලෙහි දක්නා සේක් මේ සා මහ පොළොව ශ්‍රී යහනක් කොට, හිමාලය පර්වතය [1]මහගුවක් කොට, සතර මහා සාගරයෙහි සතර ගාත්‍රය ගලා, ඇඟිලි අගින් සක්වළ ගල පිරිමදිමින්, උඩු බලා වැද හොත් සේක් නම. ඒ කෙළෙහි බඹලෝ දක්වා සියලු දෙවියන් හා විමාන හා විශේෂයෙන් පෙනෙන්නේ නම. ඒ කෙළෙහි පිබිද ස්වප්නයෙහි අර්ථ පරීක්ෂා කොට" ඒකාන්තයෙන් මේ මා සිතූ දෙය සිඬමන්නා වූ මගුල් ස්වප්නයෙක් ම ය. සම්‍යක් සම්බෝධි ය නමැති මහ පොළොව මට ශ්‍රී යහන් වන. බුද්ධඥානය ම මට කන්වයිනක් ව ආධාර වන වන. චක්‍රවාළය මුළුල්ලෙහි ම මාගේ ධර්මචක්‍රයෙන් ම සම්පූර්ණ වන. තුන් ලෙවුහි මම ද උත්තානී ව සියලු සතුන් දු උන්මුඛ කර වම්. තුන් ලොව ඒකාඞ්ගන ව පෙනීගියා සේ ම අනන්තාපර්යන්ත වූ ලෝකධාතු විශේෂයෙන් දක්නා තරම් අසාධාරණ වූ දිවැසු ත් ලබන වන්මි. තුන්ලොව ඒකාලෝක ව ගියා සේම මා සිත ද අනාවරණ ඥානයෙන් ඒකා ලෝක වන. ඒකාන්තයෙන් ම මම සෙට බුදුවෙම් ම යැ" යි පළමු වන ස්වප්නයෙන් ම දක්සේක.

තම ද එක් වේලෙහි සුරකත වූ හිතණ ගසෙක් තමන් වහන්සේගේ නාභිමණ්ඩලයෙන් පැනනැගී තඹුලිසක් සා ව සියක් යොදුන් ව, දහසක් යොදුන් ම වැඩි වැඩී සඳෙව්ලොව ගෙවා ගොස් සොළොස් බඹලොව ගෙවා ගොස්, පත් සෙවෙනි පෙළක් සේ මුළු සක්වළ වසාගෙණ ඉඳුනිල් මිණි සතක් සේ සිටිගත් නම.

---

1 ඕවුලාවන්

එවේලෙහිදු පිබිද ඉතා විස්මය පත් ව "මෙයි දු අනික් කාරණා යෙක් නො වෙයි. බුදු මඟුලට ම කාරණ වූ ස්වප්නයෙක් ම ය. තණ නම් ත්‍රාණාව ය. ත්‍රාණාව නම් මාගේ බුදු වන ත්‍රාණාව ම ය. තිතණ වෘක්ෂය නම් ශාන්ති වෘක්ෂ ය ය. තුන්ලොව පුරාගත් හෙයින් තුන්ලෝ ශාන්තියෙන් පිරුණ මැනව. ඒ ශාන්ති වෘක්ෂ ය ද මාගේ ම නාභියෙන් නැගි හෙයින් ඒ ශාන්ති ය ද ලොවට මා විසින් ම වුව මැනව. අමා මහ නිවන් ශාන්තියෙන් මුළුලොව පුරණවන්නී" යි සිතා දෙවන ස්වප්නයෙහිදු අදිය දුටුසේක.

නව ද එක් වේලෙක එක්තරා එක් පණුමෝ ජාතියෙක් ඉතා ධවලයෝ නම්. කළු වූ ඉස් ඇත්තෝ නම. මෙසේ වූ ලක්‍ෂ සුවහස් ගණන් පණුවෝ ඒ ඒ දිගින් අවුත් නමින් වහන්සේ සිසාරා අතුරු නොදී ගලාගෙණ දෙපත්ලෙහි පමණ් දෙ දනමඬල දක්වා පැනනැංගෝ නම්. එ වේලෙහි දු පිබිද අති ප්‍රීති උපදවා 'අති නීල වූ කෙස්මැලි ඇති, ශුඩ වූ වස්ත්‍ර ඇති, බොහෝ වූ චේතිය ජනයෝ මා කරා රැස් ව මාගේ පාද මූලයෙහි පිරෙණු වන්න. බොහෝ දෙන මා සරණ ගන්නා වන් හ'' යි තුන් වන ස්වප්නයෙහිදු අර්ථය දැන සෙව බුදු වෙමි ම ය යි සනිටුහන් කළ සේක.

නව ද එක් වේලෙක අනෙක වර්‍ණ වූ පැහැ ඇති, ඉතා මනොහර වූ රූ ඇති, ලිහිණියෝ සතර දෙනෙක් සතර දිගින් දිව අවුත් බෝසතුන් පාදමූලයෙහි හිඳ ඇසිල්ලකින් තමන්ගේ පළමු වර්‍ණ හැර ඉතා සර්‍වාඞ්ග ධවල ව ගොස් එක වර්‍ණ ව ගියෝ නම්. එවේලෙහි දු පිබිද ප්‍රීති එළවා "ලිහිණියෝ සතර දෙන නම් රජ-බමුණු-වෙළඳ-ගොවි යයි යන චාතුර්‍වර්‍ණයන. ඔවුන් නන් පැහැ ඇති වූයේ නම් නානා වර්‍ණ-නානා ජාති-නානාච්ඡන්ද-නානාදෘෂ්ටි ඇති නිසාවම් කාරණ ය. ඔවුන් මා කරා පැමිණීම නම් ඒ චාතුර්‍වර්‍ණයන් මාගේ පාද මූලයට රැස් වන්නව කාරණ ය. ඒ ලිහිණිනන් තමන් තමන්ගේ වර්‍ණ හැර මා කරා පැමිණ ඉතා ශ්වෙත වර්‍ණ ව ගියේ නම් ඒ චාතුර්‍වර්‍ණයන් මා කරා පැමිණ තම තමන්ගේ නානා ජාති ගොත්‍ර හැර මාගේ සසුන් මැද මහණ ව ශාක්‍යපුත්‍රයෝ ය යි එක වර්‍ණ ලදින් අමා මහ නිවන් දැක පරිශුඬ වූ ශරීර ලැබීමට කාරණ ය'' යි මෙසේ සතර වන ස්වප්නයෙහි දු අර්ථ දැන සෙව බුදු වෙමි ම ය යි සනිටුහන් කළ සේක.

නව ද එක් වේලෙක යෝජන ප්‍රමාණ වූ අමෙධ්‍ය පර්‍වතයක් මුදුනට පැනනැගී ඔබමොබ සක්මින් නොව ඇවිදිනා සේක් වී නම්. එ කල්හි කිසි අමෙධ්‍යයෙකුත් ඔබගේ ශ්‍රීපාදයේ නො වැකේ නම. එ වේලෙහි දු පිබිද ඉතා විස්මය ව මෙහි දු අර්ථ කිමෙක් දෝ

හෝ යි පරීක්ෂා කොට "මෙසි දු මා බුදු වන්නා වූ ස්වප්නයෙක් ම ය. බුදුහු නම් මුළු ලෝ වාසීන් කරණ ලද අප්‍රමාණ වූ ප්‍රත්‍ය ය දන යෙහි අග්‍ර වන්නාහ. මේ සා මිහත් වූ ප්‍රත්‍යය දන ය ලද ත් එහි කිසි ඇල්මකු ත් නො කරන්නාහ. එසේ හෙයින් මෙසි දු මට ද මාගේ ශ්‍රාවකයන්ට ද මතු චතුර්විධ ප්‍රත්‍ය ය දන ය බොහෝ කොට ලැබීමට කාරණ ය. එසේ හෙයින් අමේධ්‍යයෙක් මා පය නො ඇලුනා සේ ම, මතු මා ද මාගේ ශ්‍රාවකයන් ද ලාභ සත්කාර යෙහි ලොභ නො කොට නො ඇලීමට කාරණය ය"යි පස්වන ස්වප්නයෙහි දු අර්ථය දැන අලුයම් වේලෙහි පැන නැගී මේ ආදි කාරණයෙන් අද බුදු වෙමි ම ය යි අධිෂ්ඨාන කොට එ දා උදය දූව්වූ සා මුඛ ශෝධන ය කොට, පාත්‍ර සිවුරු ගෙණ, එක වාරී වූ ගඳැත් පොවුමකු සේ, බරණැස සෙනානී නම් නියම් ගමට වැඩ, අජපාල නම් බ්‍රාහ්මණයා එ තැන දී කළා වූ යාග ය ගෙණ අජපාල නම් නුග යයි ප්‍රසිද්ධ වූ ඒ මහ නුග ගස මුල පූර්ව දිග් බලා වැඩහුන්සේක.

එ වේලෙහි ඔබ ඇඟින් නැගෙන ප්‍රභාවෙන් නුග ගස සිඟලු පත්‍රයෝ රන් කැටපත් සේ බබළා පැන නැගෙති. මේසේ බාලාර්ක මණ්ඩලය සේ වැඩහුන් බෝසතානන්ගේ ශරීර ප්‍රභාව ඒ පූර්ණා නම් දාසි ය දැක ඉතා විස්මය පත් ව "අද අපගේ වෘක්ෂ දෙවතාවන් මහත්සේ විමානයෙන් බැස පියා ස්වහස්තයෙන් ම බත් පිළිගන්නීම් යි සමානයක් නැති ව ම වැඩහුන් සේක"යි සතුටු වූ සිත් ඇති ව ආපස්සේ දිවගෙණ ගොස් "නගඬ! සුජාතාව, තීගේ දේවතාවා අද ශරීරයෙන් ම ගසමුල වැඩිහුන්නේ ය. තව ද තිට අභිවෘද්ධියක් කෙරෙයි. වහා ගොසින් කිරිබත් පුදව"යි කිව. සුජාතාවෝ ඈ කී බස් අසා ඉතා සතුටින් පියා "මෙ බඳු වූ සතුටු අසුන් මට කී තෝපි අද පටන් මාගේ මහලු දූ ය"යි කියා දූ තනතුරෙහි තබා දූවකට දෙන තනතුරු හා දැයාද හා ආභරණ සැපත් දුන්හ. හැම බුදුන් බුදු වන දා ලක්ෂයක් වටනා රන් තලි යෙන් ම කිරිබත් පිළිගැන් ම එකාන්ත ධර්මයක් ම හෙයින් එ දා සුජාතාවෝ ද බුදුන්ගේ පිණිස් "රන්තලියකින් අද කිරිබත් පුදමි"යි සිතාලා ලක්ෂයක් වටනා රන් තලියක් ගෙන්වාගෙණ සකස් කොට මැද පියා බත්සැළ ඔසවාගෙණ රන්තලිය මුදුනෙහි මුණින්තමාලූහ. එ කෙණෙහි එක බත් හුලකු ත් පැළී පල්ලෙහි නො ගැවී නෙළුම් පතක බැඳුලූ දියත්තක් සේ තලියෙහි වැගිර

අඟලක් සා තැනුත් අඩු නො ව තලිය පුරා සම ව සිටගත. ඉක්බිත්තෙන් ඒ බත් තලිය ලක්‍ෂයක් වටනා අනික් රන් තලියකින් වසාගෙණ ඒ මත්තෙහි සුදු වස්තකින් වසා, තොමෝ ද ඉස් සෝධා නහා දෙවඟනක සේ සර්වාභරණයෙන් සැරහී බත් තලිය ඉස් මුදුනෙහි තබාගෙණ බෙර සක් තිඹිලි ධජ පතාකාදි මහත් වූ පූජා පෙළහරින් නුග ගස කරා ගොස් බෝසතුන් දුක ඉතා සන්තොෂ වූ සිත් ඇත්තී, රුක් දෙවියා ය සි යන සිතින් දුටු තැන පටන් ආදරයෙන් නැමි නැමී ගොස් මුදුනෙහි තුබූ තලිය බාගෙණ පිධානය හැරපියා පෙරට තබාලා ස්වර්ණභිංකාරයෙන් සුවඳ පැන් ගෙණ සමීප ව සිටියා ය.

මහා බ්‍රහ්මයා දුන් මැටි පාත්‍රය මේ සාවුරුද්ද මුළුල්ලෙහි ප්‍රයොජනවත් ව දුතියක භාජනයක් බුදුන් නො පිළිගන්නා හෙයින් එ කෙණෙහි අන්තර්ධාන වි ය. බෝසතාණෝ සමීපයෙහි තුබූ මැටි පාත්‍රය නො දුක දක්ෂිණොදකය ඉවසූසේක. එ කෙණෙහි සුජාතා නමි ආයාසයෙන් පිසූ පායාස ය රන්තලියෙන් ම බුදුන් අතට පිළිගන්වාලුව බෝසතාණන්වහන්සේ තලිය මාහැඟි සේ දුක සුජාතාවන් මුහුණ බැලූසේක. සුජාතාවෝ අභිප්‍රාව දැන "ස්වාමීනි! තෙල බත් තලිය හා සමග ම නුඹවහන්සේට දිනිමි. සිත් සේ පිළිගෙණ වැඩ කැමැති තෙනක දී වැළඳුව මැනවැ"යි ආරාධනා කොට පසග පිහිටුවා වැඳලා "යම් සේ නුඹවහන්සේ නිසා මාගේ අභිප්‍රාය සිද්ධ වී ද, එසේම නුඹවහන්සේගේ අභිප්‍රාවද සිද්ධ වේවා"යි කියාලා ගියා ය. මේ සුජාතාවෝ නම් පියුමතුරා බුදුන් සමයෙහි බුදු කෙණකුන් බුදු වන දා කිරිපිඬු දන් දෙමි යි ප්‍රාර්ථනා කොට එ කල දානාදි පින් කොට කප් ලක්‍ෂයක් නරකාදි දුක් නො දුක සසර ඇවිද, අප බුදුන් සමයෙහි බරණැස සිටුදූ ව ඉපැද ඒ ප්‍රාර්ථනා බලයෙන් මේ කිරිපිඬු දානය බෝසතුන්ට දී, උපන් සන්තොෂයෙන් ලක්‍ෂයක් අගනා රන් තලිය පුරාණ පත්‍රයක් කොට ත් නො සිතා තමන්ගේ ගෙට ම ගියා හ

ඉක්බිත්තෙන් බෝසතාණන් වහන්සේ හුනස්නෙන් පැන නැඟී නුග ගස පැදකුණු කොට ලා බත් තලිය අත්ලේ තබාගෙණ නෙරංජරා නම් ගංතෙරට ගොස් නොයෙක් දහස් ගණන් බුදුන් බුදු වන දා බැස නහනා සුප්‍රතිෂ්ඨිත නම් තොටට බැස ගංතෙර බත් තලිය තබාලා, ගඟට බැස පැන් සනහා, නොයෙක් ලක්‍ෂ ගණන් සර්වඥවරයන් හඳනා පොරෝනා අර්හත්ධවජය බරු



වසවත් මරු ප්‍රමුඛ දසබිම්බරක් මරසෙනග පරදවා බුද්ධත්වය ලැබීම. 198 පිට බලන්න (11-12)

ගෙණ අනන්තාපරියන්ත වූ බුදුන් වැඩහිඳ වැළඳූ ස්ථානයෙහි පූර්විදිග් බලා වැඩහිඳ 'අද බුදු වීම් නම් එකුන් පණස් දවසකට මේ ම බල යෑ"යි එක්කෑටි නල් පක් සා එකුන් පණස් පිඩක් 'එකුන් පණස් දවසකට යෑ"යි ඉටාගෙණ ඒ මධුර වූ කිරිබත නිරවශෙෂ කොට ම වැළඳූසේක. බත් වළඳා ඉක්බිත්තෙන් "මේ රන් තලියෙන් මට කම් නැත. බුදු වීමට කාරණයක් පරීක්ෂා කෙරෙමි"යි ඒ තලිය අත්ලෙහි තබාගෙණ ගංතොට සිට "එකාන්තයෙන් අද බුදු වෙම් නම් මේ රන් තලිය උඩුගං බලා යේව යි ඉදින් බුදුවිය නොහෙම් නම් යටිගං බලා යේව යි අධිෂ්ඨාන කොට තලිය ගඟට දමාපීසේක. එ කෙණෙහි දිය කපාගෙණ නැවක් දිවූවා සේ ගං මැදට දිව, නැවත උඩුගං බලා අසනූ දිවූවා සේ අසූ රියනක් තැන් දිව, එක් සළාවක ගැලී කාල නම් දිව්‍ය නාගරාජයාගේ භවනයට වැද කකුසඳ, කොණාගමන, කාශ්‍යප යයි යන තුන් බුදුන් බුදු වසඳ වළඳා හළ රන් තලි තුණ කරා පැමිණ එහි ගැසී රාවක් පවත්වා තුන් තලිය යටට වැදලා නැනී තුබූයේ ය.

ඉක්බිත්තෙන් කාල නම් නා රජ්ජුරුවෝ තලිය හුණු හඬ අසා තමන් කපක් මුළුල්ලෙහි හිඳිනා ආයු ඇති හෙයින් ආදි තුන් තලියන් හුණු හඬ ඇසූ හෙයින් මේ තලියෙත් හඬ අසා "කොල, ඉන් පෙරවිදාත් එක් බුදුකෙණෙක් බුදු වූ ය. පෙරවිදාත් එක් බුදු කෙණෙක් බුදු වූ ය. ඊයේත් එක් බුදු කෙණෙක් බුදු වූය. අදත් එක් බුදුකෙණෙක් බුදු වෙති. කොල බුදු මඟුලට යම්හ"යි නා නළු වන් රැස් කොට පූජා සරහා සිවගත. බුද්ධාන්තරයෙක් නම් දහ සක් හවුරුද්දෙක් සත අඟලක් වඩනා පොළොව සත් ගව්වක් උස වැඩී ගිය කල මෙසේවූ දීර්ඝ කාලය ඔහුගේ ආයු බොහෝ හෙයින් ඊයේ පෙරවිද සේ සිතීන.

ඉක්බිත්තෙන් බෝසතානන්වහන්සේ තලිය දිය පිට හැර පියා එ ගඟ සමීපයෙහි සුපිපි සල් වනයකට වැඩ, සල් ගසක් මුල වැඩහිඳ පඤ්ච අභිඥා අෂ්ට සමාපත්ති උපදවාගෙණ දිවාභාගය එ තැන යවා සවස් වේලෙහි සියලු වන කුසුමයන් නටුයෙන් ගිලිහී හෙන කාලයෙහි සියලු දේවතාවන් විසින් සරහා, බෝමැඩ දක්වා මිලිත් තනතලද පුළුල අට සියක් රියන්, හෙරි තලයක් සේ තැනූ මාර්ගයට පැමිණ අභීත කෙශර සිංහරාජයකු සේ, එකචාරී ගන්ධ හස්තිරාජයකු සේ, බෝධිමණ්ඩලයට අභිමුඛව නික්මුනුසේක.

එ කෙණෙහි ඒ කාල නම් නාගරාජයා සැට දහසක් නා නළුවන් ගෙණ සතුති ගී කිය කියා නට නටා පෙරටුව නික්මින. තෙසු නාග යක්ෂ ගරුඩ ගන්ධර්වාදි දෙවියෝ දිව මල් දිව සුවඳින් පුදමින් යෙති. ඔහු මොහු නො වෙති. දසදහසක් සක්වල දෙවියන් කරණ පූජාවෙන් සුවඳින් මලින් සාධුකාරයෙන් සම්පූර්ණව මෙසේ මාගේ ස්වාමිදරුවන් වඩනා වේලෙහි [1]ශාන්ති නම් බමුණෙක් තණ කදක් ගෙණ බුදුන් පෙරමගට එනුයේ ස්වාමිදරුවන්ගේ අදහස් දැන මෙයින් ප්‍රයෝජනයෙක් ඇති වනැ යි සිතා එයින් තණ අට මිටක් ගෙණ ශ්‍රී හස්තාග්‍රට පිළිගන්වාලි ය. ඒ තණ අට මිට ගෙණ බොහෝ මරුන්ගේ මාන නමැති මඩ වියලන්නා වූ බෝමැඩ කරා මහා බ්‍රහ්මයා දූ කුඩ ය යටින් වැඩ, සිරිමාබෝ කඳට දකුණු දිශැ උතුරු දිග බලා වැඩසිටිසේක. එ කෙණෙහි දකුණු සක්වල පාතාල යෙහි හැලී උතුරු සක්වල බඹලොව ගැසී පැන නැංගාසේ වැටහින එයින් පශ්චිම දිග්භාගයෙහි පූර්ව පූර්ව දිග් බලා වැඩසිටිසේක. පැළ සක්වල ගැලී පූර්ව සක්වල එසවී ගියා සේ වැටහින. උත්තර දිශා භාගයට ගොස් නැවත දකුණු දිග් බලා වැඩසිටිසේක. උතුරු සක්වල ගැලී දකුණු සක්වල එසවී උඩ අජටාකාශයෙහි ගැසී ගියා සේ වැටහින "මේ තුන් දිසාවම අචල භූමියෙක් නො වේ"යි හැර නැගෙණහිර දිසාවෙහි වජ්‍රාසන භූමියෙහි පශ්චිම දිග් බලා වැඩ සිටිසේක. ඒ ස්ථානය අචල ස්ථානය හෙයින් නොසැලී සිටීය.

මේ කාරණයෙන්ම "මෙ තැන නො එක් බුදුන්ම මාර විජය කොට කෙලෙස් පඳුරු කපා හරණ උත්තම ස්ථානයෙක්ම යැ"යි සිතාලා තණ අට මිට අගින් අල්වාගෙණ සලාලූසේක. තිඵක නමැති හස්ති සෙනාව මුදුනට දමාලූ අංකුශයක් සේ ඒ කුසතණ පොළොවට දමාලීම හා සමගම ස්වාමිදරුවන්ගේ පාරමිතානු භාව යෙන්, මහ පොළොව පලාගෙණ තුදුස් රියන් වජ්‍රාසනයක් පැන නැගී හැම කුසතණ චිත්‍ර කර්මාන්තයක් සේ මුල් සැඟවී අග්පිටත ව සෙමෙති පෙලක් සේ ශොභාවත්ව සිටගත. එ කෙණෙහි මාගේ ස්වාමිදරුවෝ වජ්‍රාසනය දැක එකාන්තයෙන් අද බුදු වෙමි ම ය යි කුල්මත් ව. ඒ විදූරස්තව පැනනැගී බෝසඳට පිටලා නැගෙණහිර බලාගෙණ "මේ මාගේ ශරීරයෙහි ඇට සම් මස් නහර ලේ වීයලී සුණුවිසුණු වේ නමුත් සාරාසංඛ්‍යය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි වියදී කොට මා ලැබගත්තා වූ මේ වජ්‍රාසනය හැරපියා බුදු නො ව

1. සොත්ථිය

නැඟී නො සිටිමි මයැ"යි චතුරඞ්ග සමන්විාගත වීර්‍යාධිෂ්ඨාන කොට ගෙණ රත්ගල් මුදුනක් දුටු සිංහ පොව්වකු සේ වැඩහුන් සේක.

එ කෙණෙහි දසදහසක් සක්වල ශක්‍රබ්‍රහ්මාදි දෙවියෝ "උතුමා අද බුදු වෙ යි. ඔහුගේ බුදුමඟුලුව යම්හ"යි කියා අවුදින් රුස් ව බෝමැඩ පටන් සක්වලු වටා සිව්ගෙණ නොඑක් පූජාවට පටන් ගත්හ. එ කෙණෙහි වශවර්ති මාරයා දූත බා සැඟවුනා සේ පලඹු කොට හිරු අසත පර්වතයෙන් සැඟවී ගියෙ. පුන් සඳ සවාමිදරුවන් අභිමුඛයට පුදලු රිදී කැටපතක් සේ උදයගිරි පර්වතයෙක් බබලා පැනනැංග. එ කෙණෙහි වශවර්තිමාරයා 'සිද්ධාර්ථ කුමාරයා මහණ වන්නට යන දැක් ගිා නො යවයි කියව කියවා පලා ගියෙ. ගිය සාවු රැද්දෙ ත් මට අවකාශයක් නො පැයෙයෙ. දැන් බුදු වෙමි යි වජ්‍රාසන නැඟී හිඳගත. දැන් ඇසිල්ලක් පමා විම් නම් බුදු ව මට බොහෝ පරිභානි කෙරෙයි, අද ඔහු බුදු විය නො දෙමි"යි සිතා තමාගේ මර සෙනඟ රැස් කොට මෙ පවත් කියාලා තමාගේ වශවර්තිඝොෂාව නම් වූ මහ බෙරහස්වා ලියෙ. ඒ හෙරිඝොෂාව බ්‍රහ්මාණ්ඩය ගසා ඇසී ගියෙ. හැම දිව්‍ය බ්‍රහ්මයෝ වෙවුලා ගිහ. හැම දෙවියන් ඇස් පිහී ගිය සියලු සතුන් සිත් ඉපිල ගිය. එ වේලෙහි මාගේ සවාමිදරුවෝ ඒ හෙරිඝොෂාව අසා තමන්වහන්සේගේ බුදු මඟුලට ගැසූ ජිඹිලි බෙරක් සේ කොට සිතා "වශවර්ති මාරයා මා කරා එත වනැ"යි සිතා "අද මාගේ වික්‍රම මුළු ලෝ වැසියෝ දක්නා වන්න"යි සිතා උපන් සන්තොෂයෙන් නිශ්චලව වැඩහුන් සේක.

ඉක්බිත්තෙන් ඒ භේරිඝොෂාව අසා ඔහුගේ මාර සෙනඟාව "අපගේ මර දෙව්පිත් අද මහා සංග්‍රාමයක් කරණ වනැ"යි නන් අවිගෙණ දිව අවුදින් ඔහු පිරිවරා සිටගත්හ. එකල වශවර්ති මාරයා දෙළ සියයක් යොදුන් ගිරිමෙඛලා නම් ඇත්රජකු පැන නැඟී සිද්ධාර්ථ කුමාරයාට අද එක අංගුධයක් ගණීම් දූයි සිතා ලා පන්සියයක් හිස් මවාලා ගිනිවට සේ දහසක් රතැ'ස් මවා, දෙත පෙලයෙන් නික්ම තිබෙන භයඞ්කර වූ දහසක් දල මවා, දහසක් අත් මවාගෙණ චක්‍ර තෝමර හෙණ්ඩිවාල අසි කණය කම්පනාදි වෙන වෙන දහසක් ආයුධ ගෙණ, දසදහසක් නබසැත් හා සමඟ රතැස් බමා පිරිතොල් කකා "මට හිමි සෙනගෙක් ඇත් නම් මාගේ සතුරා සාධා දෙව"යි කිස කියා නික්මිත එ කෙණෙහි

ඔහුගේ වශවර්ති සේනාව ද ඉගිලී ගියහ. කෙමෙ තමාගේ මහ සෙනග බලා "මා යන බව මුත් සිද්ධාර්ථකුමාරයා ජය ගෙණලිය නො හැක්ක. මහත් වූ මානම් දනිති. මහත් වූ තේජස් ඇතියේය. ඉදිරියෙන් ගියෙම් නම් දුර දී ම දැක නො සැලී ම හින්දී. දසදික් නො බලම් යි අධිෂ්ඨාන කොට හිඳගන. පිටිපසින් ගියකල මාගේ මාර ඝොෂාව අසා පිටිපස බලා තමා කර හොල්වා තමාගේ චතුරඞ්ග අධිෂ්ඨානය බිඳපියවයි. ඒ අවකාශයෙහිදී ඔහු පිටිපසින් ගොස් අල්වා ගණිම්"යි පශ්චිම චක්‍රවාඩ මුවවිටට බැස මර සෙනග මෙහෙයා නික්මින. එ කෙණෙහි ඔහුගේ යක්ෂ සේනාව [1]ඉදිරි පිටින් අටසාලිස් ගව්වෙක දිවෙති. දකුණැලයෙන් අටසාලිස් ගව්වෙක දිවෙති. වමැලයෙන් අටසාළිස් ගව්වෙක දිවෙති. ආකාශයෙහි බොලින් සතිස් ගව්වෙක හිවී ගැවසී දිවෙති පිටිපසින් සක්වල ගල පටන් මාර සේනාව මුහුද රළ පෙළක් සේ දිවෙත්මය.

ඒ මර සෙනගගේ ඝොෂාව ඉදිරියෙන් සාරසියයක් ගව්වෙහි පොළොව පෙරළෙන හඬ සේ ඇසෙයි. මේ සා මරසෙනගෙහි දෙදෙනෙක් එක් වෙසක් නො ගත්තාන. දෙදෙනෙක් එක්වැනි ආයුධයක් නො ගත්තාහ. සමහරු අශ් වෙස් මවා දිවෙති. සමහරු ඇත් වෙස් ගෙණ දිවෙති. සමහරු සිංහවෙස් ගෙණ දිවෙති. සමහරු මහිෂ වෙස් මවා දිවෙති සමහරු වෘෂභ වෙස් මවා දිවෙති. සමහරු සුනඛ වෙස් ගෙණ දිවෙති. සමහරු ගුරුළු වෙස් මවා දිවෙති. සමහරු කපුටු වෙස් මවා දිවෙති. සමහරු ලිහිණි වෙස් මවා දිවෙති. සමහරු කා වෙස් මවා දිවෙති. සමහරු පොළොං වෙස් මවා දිවෙති සමහරු පිඹුරු වෙස් මවා දිවෙති. සමහරු රාක්ෂස වෙස් මවා දිවෙති. සමහරු යක්ෂබඩ ගසා දිවෙති. සමහරු පජීත ගසා දිවෙති. සමහරු සපාපුඛ ගෙණ දිවෙති. සමහරු මහ රුක් උපුරා ඉස සිසාරා දිවෙති. සමහරු හිතිවට ගස ගසා දිවෙති මෙසේ නොයෙක් වෙස් ගෙණ දිවූ නොනිනී පිරිස සක්වළ ගල පටන් අතුරු නො දී බෝමැඩ සිසාරා සිවගත්හ. එ කෙණෙහි මර සෙනඟ බෝමැඩ කරා එත් එත් මාර ඝොෂාව ඇසෙන් ඇසෙන් පිරිවරා සිටී. දසදහසක් සක්වල දෙවියන් අතුරෙන් එක දෙවියෙකු ත් සිටි පිය නුහුනුයේය. කාළ නම් නා රජ්ජුරුවෝ සැට දහසක් නා කළුවන් ගෙණ දහස් ගණන් සතුති ගී කිය කියා නවමින් සිටියාහු. එ කෙණෙහි පොළොව කිම්දගෙණ තමන්ගේ පන්සියයක් යොදුන් මාඤ්ජරික නම්

1. නොත්හි.

නාග භවනයට බැඳ දෑතින් මුණ වසාගෙණ "අහෝ! සිද්ධාර්ථකුමාරයන්ගේ රූසිරි අද නවැ"යි කියකියා යහන් මතුයෙහි මුහුණින් වැටී ඔත්තාහු ය.

ඉක්බිත්තෙන් දසදහසක් සක්වළ සෙසු ශක්‍රයෝ තමන් තමන් අත තුබූ දස දහසක් ජය සක් අතින් දමා පියා තමන් තමන් සිටි සිටි දිගින්ම දිවපින. අපගේ මේ මගුල් සක්වළ පූජම්පති නම් ශක්‍රයෝ තමන් මේ මගුල් සක්වළ උපන් හෙයිනු ත් මහ පින් බල ඇති හෙයිනු ත්, මහා ඓශ්වර්‍ය ඇති හෙයිනු ත් තමන්ගේ ජයසක බිම හෙළා නො පියා පිට වතුරුවාගෙණ දිවන්නාහු තමන්ගේ ශක්‍රපුරය බලා නො ගොස් සක්වළ ගල මුදුනට නැගී තර නගා බෝමැඩ දිසාව බල බලා සිටියහ. මෙසේ ම දස දහසක් සක්වළ සුයාම සන්තුසිතාදී දෙවියෝ තමන් තමන් අත තුබූ තල් වැට චාමරාදී පූජා භාණ්ඩයන් දම දමා සිටි සිටි දිගින් පැලන. දස දහසක් සක්වළ සහම්පතී මහා බ්‍රහ්මයෝ දස දහසක් සේසත් සඳමඬුලු සේ සක්වළ මුවවිටියෙහි තබ තබා දිවපූන. එතෙක් දෙවියන් අතුරෙන් එක දෙවතාවෙකු ත් සිටපිය නුහුනු යේ ම ය. මාගේ සවාමිදරුවෝ ඒ දෙවියන් ඇම පැල තල ඇත් සෙනඟක් දුටු සිංහපොව්වකු සේ ලෝමයකට ත් භය නැති ව මහ මෙර සේ නො සෙල්වීම වැඩහුන් සේක් ම ය.

එසේ හෙයින් කියනලදී.

විගච්ඡමානං ගරුළෝව දිස්වා
දිස්වා මිගානං පරමෝ'ව සීහො,
මහායසො මාරබලස්ස දිස්වා
විසාරදො වීතභයො නිසීදි යි.

එ වේලෙහි උතුරු දිගින් දිව වන් මාරසෙනග දුටු 'මෙ තෙක් සත්වයෝ එකලා වූ මට ම යුද්ධයට ආවෑහු ය. මෙ තැන මාගේ මවු පිය කෙනෙක් වේව යි, මල්බෑ කෙනෙක් වේව යි, අනික් කිසි කෙනෙක් වේව යි නැත. එ බැවින් මෙ සාරාසංඛ්‍යය කප් ලක්ෂයක් මුළුල්ලෙහි අත් නො හැර ආවා වූ මාගේ සත්‍ය පාරමිතාව ම මෑනියෝ නම. ගැඹුරු වූ මාගේ ප්‍රඥා පාරමිතාව ම පියාණෝ නම. මා දත්තා වූ ධර්ම ය ම අනුබල වූ මල්බෑයෝ නම. මාගේ මෛත්‍රී පාරමිතාව ම කල්‍යාණමිත්‍රයා නම. මාගේ අචල වූ ශ්‍රද්ධා තොමෝ ම ප්‍රිය වූ කාන්තා නම්, මාගේ ක්ෂාන්ති පාරමිතාව ම අනුබල වූ පුත්‍රයා නම. මේ මාගේ නෑයන් සඳෙනාට මා මෙ තුවක් කල් මුළුල්ලෙහි එක දවසකු ත් එක පැයකු ත් කිසි ම හානියක්

නො කොට රක්ෂා කෙළෙම් මි ය. එසේ හෙයින් මාගේ මේ තැන ජීවිතය සමාන නෑයෝ ඇත. තව ද මේ තුවක් කල් මුළුල්ලෙහි මා අත් නො හැර විසූවා වූ මා විසින් රක්ෂාකරණ ලද්දා වූ මාගේ සමත්‍රිංශත් පාරමිතා නමැති මහා යෝධයෝ තිස් දෙන අද මා රක්ෂා කෙරෙත් මි ය. එසේ හෙයින් බල යොධයනු ත් මම ඇත් තෙමි. තව ද මාගේ සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ මාගේ මහා මන්ත්‍රී නම.

තව ද මාගේ තව දහස් අසූකෙළ පණස් ලක්ෂ ශතීන් මහා සංවරශීල සමූහයෝ ම මහ බල සේනාග නම. එසේ හෙයින් මාගේ ශීල බල සේනාව අද මේ තැන මා අත්හැර නො යෙත් ම ය. තව ද මාගේ ගම්භීර වූ ගුණ සමූහය ම ගැඹුරු වූ මහ අගල නම. මාගේ ප්‍රසන්න වූ මෛත්‍රී සමූහය ම එහි පුරා තිබූ දිය සමූහයා නම. එසේ හෙයින් මාගේ මේ මහ අගල මා හැරා අද සතුරන් වැද්ද නො දෙත් ම ය. තව ද මාගේ පාරමිතා නමැති හුළින් බැඳ තනන ලද තෙජො මහ පවුර බ්‍රහ්මාණ්ඩය ගසා උස්ව සිටියේ ම ය එසේ හෙයින් ඒ ප්‍රාකාරය පැන මරු සතුරා වැද්ද නොහේ ම ය. මේ මාගේ විශෙෂයෙන් රක්ෂාකරණ ලද චතුපාරිශුද්ධි සීලයෝ සතර දෙන ම සතර මහ වාසල් නම. මේ මාගේ ඉන්ද්‍රිය සංවර ශීලය ම පක්ෂපාත වූ වාරපාලයා නම. එසේ හෙයින් ඒ මාගේ වාරපාලයා අද සතුරන්ට වාසල් නො හැර මා රක්ෂා කෙරේ මි ය මාගේ මේ වජ්‍රාසනය ම නසනි වාහන නම මාගේ මේ ජයශ්‍රී මහා බොධිය ම සතුරන් පරදවන ජය ස්ථාන නම එසේ හෙයින් මා නිසා උපන් මොහු දෙදෙන ත් අද මා හැර නොයෙත් ම ය." යි යනාදීන් මෙසේ මාගේ ස්වාමිදරුවෝ තමන් වහන්සේගේ පාරමිතා නමැති සේම වූ මහ නුවර මවා ශීල නමැති සෙනඟින් කඳවුරු බැඳ සුදර්ශන මහ නුවර මහ පිරිස් පිරිවරා හුන් සුදර්ශන නම් චක්‍රවර්ති රජහු සේ මාගේ ඒ ධර්ම චක්‍රවර්ත්තීන් වහන්සේ ත් නිර්භීත ව වැඩහුන් සේක් ම ය.

මෙසේ වැඩහුන් කල ඒ වශවර්ත්තිමාරයා පිටිපසින් බෙර්මැඩ කරා දිව අවුදින් බුදුන්ගේ තෙජසින් ලංවිය නොහී "මහ පවනක් මෙමෙහෙයා පවන් පහරින් කසා පරසක්වළ හෙළම්" යි සිතා ලො ප්‍රමාණ වූ පවනක් මෙහෙයා ලී ය. දිවන මහ සුළං යොදුන් දෙ යොදුන් පමණ ගල්කුළු උපුරාගෙණ මහරුක් බිඳගෙණ කල්පාන්ත වාතයක් සේ දිව අවුදින් මාගේ ස්වාමිදරුවානන්ගේ

මෛත්‍රී පුණ්‍ය ප්‍රභාවයෙන් බෝධිද්‍රැමයෙන් පත්‍ර ශාඛාවකුත් සොලවා ලිය නොහී, සිවුරු කණක් ලොමයකුත් කම්පිත නොකොට ගත නොහී, සිසිරි වූ සුවඳ මඳ පවනක් සේ ශරීරයට සුව පහස් දී පූජා කොට ගියේ ය.

ඉක්බිත්තෙන් වසවත් මර දිව අවුදින් 'සිද්ධාර්ථ කුමාරයා පුලං පහරින් ගොස් කවර සක්වළෙක වැටී ගියේ දෝ හෝ" යි බලනුයේ ස්වාමි දරුවන්ගේ උදයගිරි පර්වතයෙන් පැනනැගි ලහිරු මඬලක් සේ දිලියෙන ශරීරය දැක නැවත දණ්ඩක් ගැසූ නයකු සේ කිපී "ඝන වර්ෂාවක් වස්වා සැඩ වතුරෙන් මොහු පලවා මුහුදු බත් කොට මරම්"යි සිතාලා කල්පාන්ත වර්ෂාවක් සේ මහත් වූ මෙඝයක් මවා ලී ය. එකෙණෙහි ඔහුගේ දිව්‍යානුභාවයෙන් ශතපටල සහස්‍ර පටල කහාලා දස දිගින් මෙඝ නාද පතුරුවා සිය ගණන් අකුණු සෙණ විදුලිය ගස ගසා, තල් කඳ පොල් කඳ සා ජලධාරාවෝ මහපොළොව සාරාගෙණ දිවත්නාහු ඒ මහ සැඩවතුරු නොයෙක් තුරු දහස් ගලාගෙණ බෝමැඩ කරා වැද මාගේ ස්වාමිදරුවානන්ගේ සිවුරු කණක් පමණක් තෙමා ලිය නොහී උන්වහන්සේගේ විඩා නිමා බුදු මඟුලට පොකුරු වැසි පූජා කොට ගියේ ය.

ඉක්බිත්තෙන් "ශ්‍රමණ භවත් ගෞතමයෝ අද බුදු වන්නට රිසි පැලූ දෝ හෝ සැඩ වතුරෙන් ගොස් කවර මුහුදෙක වැටී ගියේ දෝහෝ" යි බලනුයේ මාගේ ස්වාමි දරුවානන්ගේ අභ්‍ර ය, මහික ය, ධූම ය, රජස ය, රාහු යයි යන පඤ්චවාපක්ලෙශයෙන් විරහිත වූ පූර්ණ චන්ද්‍රයා සේ දිලියෙන්නාවූ ශ්‍රී මුඛය දැක ප්‍රහාර ලත් මතැතකු සේ කිපී "මොහු අද මිරිකා සුණු විසුණු කෙරෙම්" මහත් වූ පර්වත වර්ෂාවක් වස්වා ලී ය. එකෙණෙහි යොදුන් දෙ යොදුන් සා ගිනි ගෙණ දිලියෙන ලක්ෂ ගණන් පර්වත ආකාශයෙන් බෝමැඩ කරා දිව අවුත් මාගේ ස්වාමිදරුවන්ගේ ශීල තෙජසින් ඒ පර්වතයෝ පෙරළී සුවඳ මල් වට ව බුදුන් වවා පෙළ මල් පූජ වක් සේ සිවගත එකල වසවත් මර "කිමෙක් දෝ හෝ, ගොයුම් මහණ සුණු විසුණු ව ගියේ දෝ හෝ බෝමැඩ හිඳිනට රිසි පැලූ දෝ හෝ" යි බලනුයේ මාගේ ස්වාමිදරුවන්ගේ රන් කැවපතක් සේ දිලියෙන ශ්‍රී මුඛය දැක

තව ද නියපිට ගල් ගැසූ මතැතකු සේ කිපී "මොහුගේ රන් වන් වූ ශරීර හා තෙල කන් නාසා ලියා හරවම්" යි අවි

වැස්සක් වස්වා ලී ය. එ කෙණෙහි ඒක ධාරාය, විධාරාය, කඩු කොන්ත ශර තෝමරාදී ඒ සූක්ෂ්ම වූ ආයුධ වර්ෂාවෝ ආකාශයෙන් බැස මාගේ බුදුන්ගේ සූක්ෂ්මවූ ප්‍රඥා පාරමිතා බලයෙන් ඒ තන් තන් පෑ ඇති ආයුධයෝ ද පෙරළී පෙළ මල් පූජාවක් මෙන් සිට ගත්හ. ඉක්බිත්තෙන් 'මහණ භවත් ගෞතමයෝ අපි පහරින් කැපී ගියෙ දෝ හෝ" යි බලනුයේ මාගේ ස්වාමිදරුවන්ගේ රන් පියුමක් සේ බබලන මුව පියුම් දැක ගිනිකම පිදුරු දමුවා සේ කිපී "අද මොහු දවා හළු කෙරෙමි" යි අඟුරු වැස්සක් ඔවා ලී ය ඒ සගලඟුරු ධාරාවෝ දිව මාගේ ස්වාමිදරුවන්ගේ පාරමිතා තේජසින් පෙරළී පද්මරාග මාණික්‍ය පූජාවක් සේ ශ්‍රීපාද මූලයෙහි වගුළහ. ඉක්බිත්තෙන් ඒ මර දෙවිපුත් "සිදුහත් කුමර ගින්නෙන් දා මළේ දෝ හෝ, වජ්‍රාසනයට ලොභ පැලෑ ගියේ දෝ හෝ" යි සතුටු ව බලනුයේ අඳුරු බිඳ පජිස මුදුනෙහි සහ රන් කඳක් සේ දිලියෙන මාගේ ස්වාමිදරුවන්ගේ ශ්‍රී ශරීරය දැක ගිනි දුටු ලුණු සේ තට තටා දත් කහා කිපී ගිනිගෙණ දිලියෙන අළු වැස්සක් බුදුන් මුදුනෙහි වස්වා ලී ය. ඒ අළු වර්ෂාව අනන්ත ව මාගේ ස්වාමිදරුවන්ගේ බුදු මඟුලට සඳුන් සුණු පූජාවක් සේ විය.

තව ද "ගොසුම් මහණ හුණු අළුයෙන් මෙළේ දෝ හෝ" යි බලනුයේ මාගේ ස්වාමිදරුවන් සඳුන් රූකක් සේ සිහිල් වූ ශ්‍රී ශරීරයෙන් වැඩහුන්නවුන් දැක තව ද අප්‍රසාද ව තෙල් දුටු ගිනි සේ කිපී වැලි වර්ෂාවක් වස්වා ලී ය. ගිනිගෙණ දිලියෙන්නා වූ සියුම් වූ ඒ වැලි සමූහයෝ බුදුන් කරා පැමිණ බුදු මඟුලට පිදූ දිමුතු මුතු තලාවක් සේ පූජා කොට සිට ගත් හ. තව ද බලනුයේ සුපුෂ්පිත වූ ශාලද්‍රැමයක් සේ ශෝභාවත් ම වැඩහුන් බුදුන් දැක පුළුං දුටු ගිනිකඳක් සේ කිපී තව ද ගිනිගෙණ දිලියෙන කලල් වැස්සක් වස්වා ලී ය. ඒ වර්ෂාව මාගේ බුදුන් කරා පැමිණ බුදු මඟුලට ගෙණා ගඳ කලල් සමූහයක් සේ පූජා වෙමින් සිටගත. තව ද "කිමෙක් දෝ හෝ" යි බලනුයේ දෑරඟ මිණි රුවනක් සේ දිලියෙන බුදුන් දැක චතුරංගයෙන් යෙදුනා වූ ඝන අඳුරක් ඔවා ලී ය. තව ද ඔහු මෑ වූ ඒ ඝනාන්ධකාරය බුදුන් කරා පැමිණ හිරු දුටු අඳුරක් සේ අනන්ත ම ආලෝකයෙන් පූජා කෙළේ ය. "කිමෙක් දෝ හෝ ගොසුම් මහණ අන්ධකාරයෙන් මූර්ච්ඡා වී දෝ හෝ නවත් විදූරස්තේ ම උන්නේ දෝ හෝ" යි බලනුයේ පර ව සඩූයෙන් ගිලිහුනු කනක තාල ඵලයක් සේ මාගේ ස්වාමිදරුවන්

යේ මෛත්‍රීන් පිරුණා වූ ශ්‍රී මුඛ ය දැක තව ද සිංහයකු දුටු ඇත් පොච්චකු සේ බුදුන්ට කිපී කිපී මෙසේ වාත යුධ ය, වර්ෂා යුධ ය, පර්වත යුධ ය, ආයුධ යුධ ය, අඞ්ගාර යුධ ය, භස්ම යුධ ය, වාලුකා යුධ ය, කලල් යුධ ය, අන්ධකාර යුධ ය යි යන නව මහා යුධයකින් මාගේ ස්වාමිදරුවන්ට කිසි හිංසාවක් කළ නුහුනුයේ තමා කළ කළ යුධ ය ම උන්වහන්සේට පූජා වන සේ දැක බුදුන්ට ලංවිය නොහී දුරු ම සිටිනා කමාගේ මර සෙනග බලා කිපී "කොල! හැම සිටුනා. හෙල සිද්ධාර්ථයා මහා ගණුව, අනුව, සිදුව, බිඳුව, විදුව, බඳුව, ගෙණම, සුණු විසුණු කරව, බුදු වීමට රිසි පලවව, ඔහු නො නා දෙමි"යි කිය කියා තමාගේ ගිරිමෙඛලා නම් ඇතු මෙහෙය මෙහෙයා චක්‍රායුධ ය ඔසවාගෙණ ස්වාමිදරුවන්ගේ අභිමුඛයට අවුත් සිට සිකාරා බුදු බඳට චක්‍රායුධය දමා ලී ය.

ඒ චක්‍රායුධ ය ඉදින් දමාලුව හොත් එක් ලක්‍ෂ අට සැට දහස් යොදුන් මහමෙර හුණ කිළිලක් සේ පොළු ගසා දෙකඩ කොට පියා හිඟ පළා යේ ම ය. මුහුදට හැසුව හොත් මුහුද දිය වියළා සිඳ කෙරේ ම ය. අහසට දමුව හොත් දෙලොව් හවුරුද් දක් වැසි නැති කෙරේ ම ය. මෙසේ ආනුභා සමපන්න ඒ චක්‍රායුධ ය මාගේ ස්වාමිදරුවන්ගේ බඳට ගැසුවා ලංවිය නොහී ආකාශයට දමූ අහස්පතක් සේ, වෙවුල වෙවුලා පැන නැගී ඔබගේ මහත් වූ පුණ්‍යානුභාවයෙන් මල් වියනක් පිදූවා සේ, සිරසට පූජා කෙරෙමින් දිලිහී දිලිහී සිටගත. ඒ චක්‍රායුධ ය මරනු දමත් නා දුටු මර සෙනග "කොල! එතෙකින් සිද්ධාර්ථ කුමාරයා බලනු කිමෙක් ද. එතෙකින් නව ම ය. අපගේ මාර දිව්‍ය පුත්‍රයා තමාගේ ආත්ම රක්‍ෂාවට තුබූ ඇති දෑ පටන් කිසි තැනකට නො හෙළ චක්‍රායුධ ය සිකාරා දමින් නහු ය. එතෙකින් බලනු කිම් දැ"යි මහත් වූ පර්වත සිකාරා එකපැහැර දමාලීය. ඒ ලක්‍ෂ ගණන් පර්වතයෝ බුදුන් කරා පැමිණ සුමිද මල්වට සේ පූජාවෙමින් සිට ගත්හ. එ කෙණෙහි සෙසු දෙවතාවෝ සක්වළගල වටා නැගවී නැගවී සිට කර ඔසවා බල බලා "අද සිද්ධාර්ථ කුමාරයන්ගේ රූපශ්‍රී ගියා. වසවත් මර චක්‍රායුධ ය දැමී ය"යි කිය කියා හයගෙණ සිටිති.

එ කෙණෙහි වසවත් මර චක්‍රායුධයෙනු ත් බුදුන් සොලවා ලිය නොහී ඉදිරියෙහි සිට කප් ගින්නක් සේ කොපාග්නීන් දිලිහී දිලිහී පිටිතොල් දත් කකා රතැස් බම බමා දහසක්

අතින් ගත් දුහසක් අවි බුදුන් අභිමුඛයෙහි අමෝරා "දුන් දුන් තා මෙද කකුල ගෙණ පර සක්වළ ගසමි. මාගේ කෙල වජ්‍රාසන යෙන් වහා නැඟී සිටැ යව" යි කී ය.

එසඳ සජීඥවරයන් බුදු වන දෑ මාරයෝ මෙසේ ම දිව පර සක්වළ මුවවිට සිට හෝ යොදුන් සිය ගණනක සිට හෝ ඒ ඒ බුදුන්ගේ පුණ්‍ය ප්‍රභාවයෙන් දිලියෙන ශ්‍රී මුඛය දුටු බුඩ තෙජසින් වෙවුලා පැරද පලා යන්නාහු ම ය. මාගේ ස්වාමිදරුවෝ වෙස්සන්තර ජාතියෙහි ජාලිය කුමාර — කෘෂ්ණජිනා නම් දරු දෙදෙනා ජූජක බමුණාට දන් දී ඔහු දරුවන් මර මරා පිටින් ලේ වගුර වගුරා බැඳගෙණ යන වේලෙහි කෘෂ්ණජිනා නම් දියනියෝ තමන්ගේ රත් පියුමක් වන් මුඛය පියාහන් අභිමුඛ යට දක්වාලා:

යං තං කණ්හා ජිනාමෙව — අයං මං නාත බ්‍රාහ්මණො,
ලට්ඨියා පතිකොටෙති — ඝරෙ ජාතංව දාසියං — යි.

යන මේ ගය කිය කියා ඇඬූවාහු ය. එ වේලෙහි මාගේ ස්වාමිදරුවාණන් වහන්සේ දියනියන් කෙරෙහි උපන් මහා කරුණා වෙන් මහත් වූ ශොක කොට "දරු දීම් තබා බුදු වීම් තබා ලෝ වැඩ තබා දිවගෙණ ගොස් බමුණා හු වැටියක් සේ බැඳ පෙරළා පියා මාගේ දරුවන් හැරගෙණ එම් දෝ හෝ" යි හිත විගසී ව විතර්කයක් සිතූ සේක ඒ අඩු ව හෙතු කොට ගෙණ අවුදින් ඒ වසවත් මර බෝමැඩට වැද 'කෙල හස්තෙන් බැසපිය" යි භයඞ්කර වූ බස් කී ය. එසේ ද වුව ත් මාගේ ස්වාමිදරුවාණෝ නිර්භීත ව වැඩ හිඳ සිනාවක් පහළ කොට තමන්වහන්සේගේ මුඛ නමැති පද්ම ය විවෘත කොට කුරවීක නාදයක් සේ ලීලාපෙත වූ ශබ්ද යෙන් වදාරණ සේක් "පාපී වූ වශවර්ති මාර ය! මේ වජ්‍රාසන ය නිසා සාරාසංඛ්‍යෙය කප් ලක්ෂයක් මුළුල්ලෙහි පාරමිතා පුරා මහ පොළොව පරයා ඇඟ මස් ලියා දිනිමි. මුහුදු පරයා ලේ දිනිමි. මෙර පරයා ඉස් දිනිමි. තරු පරයා ඇස් දිනිමි. මේ වජ්‍රාසන ය ම පත පතා ජීවිත ය සමාන වූ අඹු දරුවන් බැඳ දුන් වැල් ගොඩ ම මෙසේ වූ මෙරගල් දුහසකට ත් උස් ම ය. සම්තිස් පැරුම් පිරීමි. රාජ්‍යය දන් දිනිමි. මඟුලැතුන් දන් දිනිමි. සත සතු මහ දන් දිනිමි. එසේ හෙයින් මේ වජ්‍රාසන ය මට ම හිමි ය. එක කලෙක ත් පෝතක් සා මස් කැටියකු ත් දන් නො දී, ඇඟින් ලේ බින්දුවකු ත් දන් නො දී, ඇසකු ත් දන් නො දී, ඉසකු ත් දන්

නො දී, අඹු දරු කෙණෙකුනුත් දන් නො දී, පාරමිතාවකු ත් නුපුරා, මේ අස්න තව කෙසේ හිමි වී ද, මට කෙසේ නොහිමි වී ද, තාගේ කල තාගේ වශවර්ති භවනයෙහි නො නැගී මාගේ මේ බෝමැඩ පැන නැංගෙනැ'' යි වදාළ සේක. එ බසට වසවත් මර කිපී කිපී මම් තට වඩා පැරුම් පිරීමි, ඉස් ඇස් මස් ලේ අඹු දරුවන් තට වඩා මම දිනිමි. එසේ හෙයින් මේ වජ්‍රාසනය මට ම නැංග. තො දෙඩා වහා පැන නැඟෙව'' යි කී ය. එ කල මාගේ ස්වාමි දරුවෝ "පාපි වූ වශවර්ති මාරය, මම ත් "පැරුම් පිරීමි" යි තොපි ත් "පැරුම් පිරීමි" යි කියහි. තට දෙස්සු කවුරු'' යි වදාළසේක. එ කෙණෙහි වශවර්ති මාරයා මර සෙනඟට දහසක් අත් දිගු කොට "මාගේ මර සෙනඟ දෙසැ'' යි කීය. එ කෙණෙහි යක්ෂ සෙනාව "අපි දෙසැ'' යි "අපි දෙසැ'' යි අත් නඟා කියන ශබ්ද ඝොෂාව පොළොව පැළෙන අඩක් සේ, සමුද්‍ර ඝොෂාවක් සේ, බඹලොව ගසා සිටගත.

ඉක්බිත්තෙන් වශවත් මර කියනුයේ "සිද්ධාර්ථ කුමාරයෙනි, මා පැරුම් පිරූ නියාවට මේ සා මර සෙනඟක් ලවා දෙස් කියවාලීමි. තොප පැරුම් පිරූ නියාවට එක දෙසක් කියවා බලගැ'' යි කී ය. එ බසට ස්වාමිදරුවෝ "තෝ පණ ඇති නො මැදහතුන් ලවා දෙස් කියවූයෙහි ය. මම සිත් පෙවත් නැති මැදහත් කෙණෙකුන් ලවා දෙස් කියවාලමි'' යි කියාලා රත් වලා ගැබෙකින් නිකුත් විදුලියක් සේ රත් සිවුරු ගබින් රත්වන් වූ දක්ෂිණ ශ්‍රී හස්තය දිගු කොට ලා මහීකාන්තාවට "මීනක! දීපඞ්කර පාද මූලයෙහිදී විවරණ ලදින් මා සමතිස් පැරුම් සිහි කළ වේලෙහි දස දහසක් මහීකාන්තාවන් හා සමග ගුගුරා තෝ සාධුකාර දුන්නෙහි වේ ද'' යි වදාරා "සෙසු ජාති හැර එක වෙසසන්තර ජාතියෙහි මා අව හැවිරිදි කල දානයක් ආවර්ජන කළ දා ය, ඇළී ඇතු දන් දුන් දා ය, සත සතු මහ දන් දුන් දා ය, නුවරින් වංකගිරි පර්වතයට නික්මුනු දා ය, දරුවන් දන් දුන් දා ය, මද්‍රි දෙවීන් දන් දුන් දා ය, පොකුරු වැසි වට දා ය, යන මේ සත් වාරයෙහි තෝ මහ හඬින් ගුගුරා ගර්ජනා කොළෙහි වේ ද, දැන් මේ වශවත් මරහුගේ බොරු දෙස් අස අසා මහීකාන්තාව බැණ නො නැගේ'' යි කියාලා ඒ ශ්‍රී හස්තය පොළොවට දිගු කොට ලූ සේක. එ කෙණෙහි මහීකාන්තා සත ඝොෂා, සහස්‍ර ඝොෂා යයි එකවිට පවත්නා සක්වළක් සා ලෝ බෙරක් ගෙණ මෙර ගලක් සා ලෝ දණ්ඩකින් ගසුවා සේ දස

දහසක් සක්වළ දස දහසක් මහ පොළෝ හා සමග මහ හඬින් ගුගුරා පැන නැගී ය. එ කෙණෙහි ම මහාපොළොව පැළී එක් සිය සතිස් තරකවල කිනි කඳු බුරා පැන නැංග. එ කෙණෙහි සියලු මර සෙනග පොළොව මහ හඬින් වෙවුල්වා මහ සුළඟින් දිවතා පරඬලාපත් සේ දෙ දෙනෙක් එක මග නො ගොස් ශිරාභරණ ග්‍රීවාභරණ උතුරු සළු වගුරුවා ගෙණ හැම ආයුධ සලාගෙණ දුණින් මුහුණු වසාගෙණ මරු නො බලා වෙවුල වෙවුලා පලා ගියහ. ඉක්බිත්තෙන් ඒ ගිරිමෙඛලා නම් ගෙල සියයක් ගොදුත් මතැත් දෙ දත බිම ඔබා මරණ භයින් වෙවුලා පිට හුන් මරු සලා හෙලා සොඬ හකුලා කට ලාගෙණ වාලධිය අවුඩු හස්සෙන් සඟවා ගෙණ මහ හඬින් ගුගුර ගුගුරා මරු නො බලා පැන පලා ගියහ. වසවත් මාර ඇතු පිටින් බිම හී දුසස් අවි සලා "සිද්ධාර්ථ කුමාරයෙනි! තොප බල ඇති බව දනිම් ම ය. තොප තෙද ඇති බව දනිම් ම ය. තොප පින් ඇති බව දනිම් ම ය. තොප සම්තිස් පැරුම් පිරූ බව දනිම් ම ය. තොපගේ විරක්තභාව මුළු ලොවට හඟවම් යි තොපගේ බල දක්වන්නට ඇයිමි. ක්ෂමා කරව. ක්ෂමා කරව" යි තුන් යලක් කියා තමාගේ වශවර්ත්ති දිව්‍යලෝකයට දිව ලජ්ජාවෙන් තමාගේ සෙනඟ මුහුණ බැලිය නො හෙනුයේ සඟ තෙනි මුණින් සුසුම් ලලා වැද හොත්තේ ය.

එ කෙණෙහි සක්වළගල වටා නො ගොසින් සිටි මේ සක්වළ දිව්‍ය සේනාව පැරද දිවන්නා වූ වසවත් මරු හා සෙනඟ දැක "වසවත් මරු පැරද ගියේ ය. අපගේ සිද්ධාර්ථ කුමාරයෝ ජය ගෙණපූ යැ"යි මේ සක්වළ නාගී පරසක්වළ නාගින්ට කියා ගියහ. මේ සක්වළ ගරුඬයෝ පරසක්වළ ගරුඬයන්ට කියා ගියහ. මේ සක්වළ දෙවියෝ පරසක්වළ දෙවියන්ට කියා යවූහ. මේ සක්වළ බ්‍රහ්මයෝ පරසක්වළ බ්‍රහ්මයන්ට කියා යවූහ. එ බස් අසා දස දහසක් සක්වළ ශක්‍ර බ්‍රහ්ම නාග සුපර්ණ ගරුඬ ගන්ධර්වාදි දෙවියෝ දිවමල් සුවඳ ආදීන් ගෙණවුත් සවාමිදරුවන් වටා සිව දෙසොත් මුදුන් දී ජය පූජා කළහ. කියනලදුයේ මැයි.

ජයො හි බුද්ධස්ස සිරීමතො අයං
මාරස්ස ච පාපිමතො පරාජයො,
උග්ඝොසයුං බොධිමණ්ඩෙ පමොදිතා
ජයං තදා දෙවගණා මහෙසිනො යි.

මෙසේ මාගේ බුදුහු එද රැ හිරු අස්තයට නො යත පූරු මර සෙනඟ බිඳපියා බෝමැඬ අරා මැඩසිද දසපෑ ගිය එලෙසි

අනන්තාපරියන්ත වූ ලෝකධාතුයෙහි සතුන්ගේ පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ ලදින්, විසිපෑ ගිය වේලෙහි අසංඛ්‍යය ගණන් සක්වළ පර්‍යන්තයෙහි ත් තුබූ වස්තුවක් කරතලාමලක යක් සේ පෙනෙන්නා වූ දිවැස් ලදින්, තුබූ දස පැයෙහි ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි ප්‍රඥාව බහාලූයේක. එ වේලෙහි මාගේ ස්වාමිදරුවන් අනුලෝම ප්‍රතිලෝමයෙන් ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි ධර්මයන් සම්මර්ශනය කරත් කරත් දස දහසක් සක්වළ මහපොළෝ දෙලොස් දෙලොස් වාරය බැගින් මෙසේ එක් ලක්ෂ විසි දහසක් වාරයෙහි ගර්ජනා පතුරුවා සාධුකාර දෙන්නා සේ මහීගර්ජනා නම් වූ පූජාවක් කෙළේ ය.

මෙසේ දසදහසක් සක්වළ එක පැහැර ගර්ජනා කරවා අනුක්‍රමයෙන් සෝවාන් මාර්ගයට පැමිණ, සෝවාන් ඵලයට පැමිණ, සකෘදාගාමි මාර්ගයට පැමිණ, සකෘදාගාමි ඵලයට පැමිණ, අනාගාමි මාර්ගයට පැමිණ, අනාගාමි ඵලයට පැමිණ, අර්හත් මාර්ගයට පැමිණ, අර්හත් ඵලයට පැමිණ, ඉක්බිත්තෙන් මෙසේ අරුණු නැගෙන වේලෙහි සවාසනා කෙලෙසුන් නසා ලොවුතුරා බුදු ව, අනන්තාපර්‍යන්ත වූ සක්වළ බුදුන් නො දක්නා සත්ත්වයන් දුක උපන් මහා කරුණාවෙන් පෙර බුදුන් කල චාරිත්‍ර නො වරදවා සවණක් බුදු රස් ඒ ඒ දිග විහිදුවා හළ සේක. ඒ බුදු රස් සමූහයෝ එක තෙනෙක අසුරු සණක් නො රඳා සක්වළ ගලින් සක්වළ ගල ගැසී නිල් වලාපවල සේ, රන් වලාපවල සේ, කිණිහිරි සපු මල් කැන් සේ, සුදු පිළී හඳනා සේ, මඳව දම් වලලු සේ, පබසර කඳන් සේ, අද දක්වා දිව දිව සත්ත්වයන්ගේ ප්‍රේම එබ වඩා මනොඥ ව දිවන්නාහු ම ය. ඒ බුදු රස් දුටු දුටු සත්ත්වයෝ විශේෂ වූ වර්ණයක් බලවති එහි සිත් අලවා ඒ කුසල මූලයෙන් ම මේ මගුල් සක්වළ ඉපැද බුදුන් දැක සසරින් ගැලවෙන්නාහු ම ය.

මෙසේ මාගේ ස්වාමිදරුවන් ලොවුතුරා බුදු වූ වේලෙහි දස දහසක් සක්වළ මගුල් ගෙයක් සේ සැරහී ගිය එ දා දිවූ දෙවියන් පූර්ව සක්වළ මෝර්විට සිට නැගූ ධවජයේ කකුල් පැළ සක්වළ මෝර්විට ගැසෙ යි. පැළ සක්වළ මෝර්විට සිට නැගූ ධවජයේ කකුල් පූර්ව සක්වළ මෝර්විට ගැසෙ යි. උතුරු සක්වළ මුදුනෙහි සිට නැගූ ධවජයේ කකුල් දකුණු සක්වළ මුදුනෙහි ගැසෙයි. දකුණු සක්වළ මුදුනෙහි සිට නැගූ ධවජයෙහි කකුල් උතුරු සක්වළ මුදුනෙහි ගැසෙ යි. පොළෝ තෙලෙහි සිට නැගූ ධ්වජ බඹලෝ ගස සිට

ගත. බඹලෝ බැඳි ධවජයෙහි සකුල් පොළෝ කෙළෙහි ගැසෙයි. දසදහසක් සක්වළ මුළුල්ලෙහි මියපොළෝ ගුගුරු පී ය. සියලු ලෝ එකාලෝක ව ගි ය. ජාත්‍යන්ධයෝ ඇස් ලද්දාහු ය. ගොළුවෝ කටහඬ ලද්දාහු ය. බධිරයෝ කර්ණරසායන ලද්දාහු ය. පිළුනු ගමන් ලද්දාහු ය. කුරු කුදුහු ආරෝහ පරිනාහ ලද්දාහු ය. හැම බැඳුම් සිඳී ගිය. නරක ගිනි නිවී ගි ය. ප්‍රේතයන්ගේ සා දුක් නිවි ගි ය. තිරිසනුන්ගේ භය සන්හිඳී ගි ය. අසාධ්‍යවූ ව්‍යාධි සන්හිඳී ගි ය ප්‍රිය වචනයෙන් ලෙම සැදී ගි ය. අශ්වයෝ හේෂාරව කළහ. ඇත්හු කුඤ්චනාද කළහ. සිංහයෝ සිංහනාද කළහ. සියලු තිරශ්චීනයෝ මධුර නාද ම කළාහු ය. සියලු ආභරණයෝ රාව කළාහු ය. දස දිග ප්‍රභාස්කන්ධයෝ දිවයන්නාහු ය. සුවඳ මඳ පවන් හැමී ගි ය. අකාලයෙහි වර්ෂා වි ය. මහපොළොව පළා දිය කඳු පැන නැංග. සියලු පක්ෂීහු ආකාශයෙන් ගමන් නැති ව පොළොවට ම බටුවාහු ය. ගංගෝවල යන දිය නැවති ගි ය. මහ මුහුද ලුණුදිය නැති ව ගි ය. මුහුද පස්පියුමෙන් සැදී පිරී ගි ය දියෙහි ගොඩෙහි සියලු මල් පිපී ගි ය. නන් තුරු ලිය මල් භාරයෙන් ගැවසී ගත. බිම් පලා ගල් පලා දඬු පියුම් පෙණී ගි ය. ආකාශය මල් වියනින් වැසී ගි ය. මුළු ලොව මල්වැසි ධාරා වැසී ගි ය. මුළුලොව ධවජ මාලාවෙන් පිරී ගි ය. යන මේ දෙතිස් පූර්ව නිමිත්ත නම් වූ ආශ්චර්‍ය්‍ය පූජාවෝ ද පහළවූහ. එ දා දෙවියන් කරණ පූජා හා මාගේ සවාමිදරුවන් ඒ ආශ්චර්‍ය්‍ය හා බුදු මඟුල් වෙන වෙන වර්ණනා කෙරෙම් නම් මාගේ එක මුඛයක් තබා සියක් දහසක් ලක්ෂයක් මුඛයෙනු ත් කියා නිමවනු බැරි ම ය.

මෙසේ මාගේ සවාමිදරුවෝ ලොවුතුරු බුදුව සියලු ධර්මස්කන්ධයන් මෙනෙහි කොට මීයෙන් පිරී ගිය භාජනයක් යට අවකාශ නැත්තෙන් ඉතිර වැගිරෙන්නා සේ දහම් අමායෙන් පිරුණා වූ ශරීර භාජනයෙන් සද්ධර්මාමෘත ය උතුරවා සුවාසූදහසක් ධර්මස්කන්ධයන්ට පළමු වනු වූ:-

අනෙකජාති සංසාරං-සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො-දුක්ඛා ජාති පුනප්පුනං.
ගහකාරක දිට්ඨොසි-පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා-ගහකූටං විසංඛිතං,
විසංඛාර ගතං චිත්තං-තණ්හානං ඛයමජ්ඣගා-ති.

උදාන වශයෙන් මේ මඟුල ගාථාවන් දෙශනා කර වදාළසේක.

ප්‍රථමයේ මාගේ ස්වාමිදරු වූ බුදුරජාණන් වහන්සේ බෝමැඩ අරා බුදු වූ වේලෙහි කාල නම් දිව්‍ය නාගරජයා නා ළුවන් හා සමග කළා වූ සැටදහසක් දිව්‍ය නාගාදි පූජා ය, මාරයුද්ධයෙහි දී ලද ජයතවසසාදි එකොළොස් මහා යුද්ධ පූජා ය, බුදු වන වේලෙහි මිහිකාන්තාවන් කළ එක්ලක්ෂ විසිදහසක් පූජා ය, දෙ තිස් මහා පූර්ව නිමිත්ත කම වූ ආශ්චර්ය පූජා ය, නව ද දසදහසක් සක්වළ වරම් ශක්‍ර සුයාම සන්තුෂිත සුනිර්මිත පරනිර්මිත කාමාවචර දිව්‍ය රාජයන් කළ අනූදහසක් පූජා ය, නව ද දස දහසක් සක්වළ රූපාවචර බ්‍රහ්මරාජයන් කළ එක් ලක්ෂ පණස් දහසක් බ්‍රහ්ම පූජා ය, යන මේ ශාරලක්ෂ විසිදහස් තෙසාලිස් මහා පූජාවක් ලත් හෙයිනු ත්, අවශෙෂ වූ අසංඛ්‍යෙය පූජා ලත් හෙයිනු ත්, මෙසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, ස්වයම්භූ වූ, දශබල ධාරී වූ, සර්ව ශාසනඥ වූ, සර්වඥ වූ, ද්විපදෝත්තම වූ, මුනීන්ද්‍ර වූ, භාග්‍යවත් වූ, ලෝකනාථ වූ, විනායක වූ, සුගතේන්ද්‍ර වූ, මාගේ ස්වාමිදරු වූ, මාගේ චින්තා මාණික්‍ය වූ, මාගේ ම කල්පද්‍රැම වූ, මාගේ ම නිධාන වූ, මාගේ ස්වාමිදරුවෝ මේ මේ කාරණයෙනු දු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලද්දේ මැයි:

පූජාවිශෙෂං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො;
අත්ථානුරූපං අරහං ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං, යි.

මේ පූජාවලියෙහි අප බුදුන් බුදු වන දා ලද
බෝධිමණ්ඩල පූජා කථා නම් වූ
එකොළොස් වන පරිච්ඡේදය නිමි.

දොළොස් වන පරිච්ඡේදය

නව ද අප බුදුන් ධර්මාරාධනාවෙහි මහාබ්‍රහ්මයාගෙන් ලද සාධුනාද පූජා නම් කවරහ? යත්;

මෙසේ දීපඞ්කර පාද මූලයෙහි පටන් අනුක්‍රමයෙන් වැඩ බෝ මැඩ මැඩහිඳ මරසෙන් බිඳ බුදුවැ උදන් පවත්වා, එම වජ්‍රාසනයෙහි මෑ ලෝවැඩ වඩා වැඩහුන්නා වූ මාගේ ස්වාමිදරුවෝ

මෙසේ සිතා වදාළසේක. සාරාසඞ්ඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි ඉස් දී මස් දී ඇස් දී ලේ දී අඹුදරුවන් දී බොහෝ දුක්‍ඛ සම්භාරයෙන් බොධිසම්භාර පුරා මේ වජ්‍රාසනය හා ශ්‍රී මහාබොධිය ලදිමි, මේ පර්‍ය්‍යඞ්කය නම් මාගේ ජය පර්‍ය්‍යඞ්කය ය, මේ බොධිය නම් මාගේ ජය මහාබොධිය ය, මරහු මවාලූ කල්පාන්තවාතයක් සේ පවිත ඔසුවා දිවන ඒසා මහත් සැඩ පවනෙහි පත්‍රාඞ්කුරයකුත් සැලී නොහැංගේ ම ය. මෙම ආසනයෙහි මෙම බෝකඳ පිටලා වැඩහිඳ කෙලෙසුන් හෙවා බුදුව මුළුලෝ මුදුන් පත්විමි. මේ මේ කාරණයෙන් මේ විදූරත්න මට මහා වැඩ වැඩූ ය, ඒ හැර නො නැගෙමිසී සිතා; කෙළ ලක්‍ෂ ගණන් සමවත් සමවැද සත්දවසක් මුළුල්ලෙහි ම නොසැලී වැඩහිඳ එම වජ්‍රාසනයෙහි ම දවස් යැවූසේක. එසේ වැඩහිඳිනාකල සමහර දෙවියෝ සිතන්නාහු සිද්ධාර්ථ කුමාරයෝ වජ්‍රාසනය හැර නව දක්වා නො නැගෙති. තව බුදු නුවූවාහු වන. තම බුද්ධකාර්‍ය්‍ය නො නිමියේ වනැ යි විතර්ක සිතුවහු ය.

ඉක්බිත්තෙන් ස්වාමිදරුවෝ මෙසේ පළමුවන සතියෙහි වජ්‍රාසනයෙහි ඵලසමාපත්තීන් වැඩහිඳ දෙවියන්ගේ සැක දුරු කෙරෙමි යි දෙවන සතියෙහි වජ්‍රාසනයෙන් ආකාශයට පැන නැගී මොහොතක් කල් යමාමහ පෙළහර දක්වා දෙවියන්ගේ සැක දුරු කොට ශ්‍රී මහා බොධියට ඉසාන කොණට ආකාශයෙන් බැස 'මට උපකාරී වූ මේ වජ්‍රාසනයට හා ශ්‍රී මහාබොධියට ප්‍රිය වස්තුවක් පුදමි'යි සිතා ඇසිපිය නො සොල්වා අනිමිස ලොචනයෙන් බෝකඳ බලා සිට ඉන්ද්‍රනීල මාණික්‍ය සහශ්‍රක් පුදන්නා සේ ස්වාමින්වහන්සේගේ පස්පැයෙන් දිලියෙන ඇස් සඟළින් අනිමිස ලොචන නම් පූජාවක් කොට සද් දවසක් ධ්‍යාන සුවයෙන් වැඩ සිටිසේක. ඒ වැඩ සිටි තැන දුන් අනිමිස ලොචන නම් චෛත්‍යයක් වි ය.

මෙසේ වැඩසිටි තැනට හා වජ්‍රාසනයට හා අතුරෙහි පූර්ව සක්වළැ මුඛපාටයෙහි පටන් පශ්චිම සක්වළ මුඛපාටය දක්වා දෙවියෝ රුවන් සක්මනක් මැවූහ. මාගේ ස්වාමිදරුවෝ මෙසේ දෙවන සතියෙහි අනිමිසලොචන පූජාවෙන් දවස් යවා තුන්වන සතියෙහි දෙවියන් මැවූ ඒ රුවන් සක්මනැ සක්මන් කළසේක. ඒ ස්ථානය දුන් රත්නචංක්‍රමණ චෛත්‍ය ය නම් වි ය.

ඉක්බිත්තෙන් දෙවියෝ ඒ ශ්‍රී මහා බොධියට වායව්‍ය කොණෙහි රුවන් ගෙයක් බුදුන්ට මැවූහ. එකල ස්වාමිදරුවෝ තුන්වන සතියෙහි රුවන් සක්මනැ මෙසේ දවස් යවා සතරවන සතියෙහි දෙවියන් මැවූ රුවන් ගෙට සක්මනින් බැස පලක් බැඳ වැඩ

හිඳ රජයක් ලද්දාවූ සක්විති රජකු නොයෙක් රුවනින් පිරූ භාණ්ඩාගාරවල දොර හරවා සිත්සේ වෙන වෙන නන් විසිතුරු රුවන් බලා අගයගෙනා ලේඛම් බලා සතුටුවන්නා සේ, මාගේ ඒ සද්ධර්ම චක්‍රවර්තීන් වහන්සේ ද බුද්ධරාජ්‍යය ලදින් සද්ධර්ම නමැති රත්න සමූහයන් සද්දවසක් මුළුල්ලෙහි විශේෂයෙන් වෙන වෙන බලා වදාළ සේක.

කෙසේ බැලූ සේක් දැ? යත්:-

මම බුද්ධරාජ්‍ය ය ලදින් පන්සාළිස් හවුරුද්දක් හිඳ බුද්ධ ශ්‍රී විඳිමි යි මාගේ ශාසනයෙහි ශාරිපුත්‍ර ස්ථවිර ප්‍රධාන අසීති මහා ශ්‍රාවකාදි කෝටිගණන් භික්ෂුගණයා චන්ද්‍ර සූර්‍ය්‍ය දිව්‍ය පුත්‍රයන් සේ ශෝභාවත් ව සසුන් බබුළුවති යි මාගේ මේ ශාසන ය මෙයින් මතු පන්දහසක් හවුරුදු පමිති. මාගේ භික්ෂූත්ව අනුශාසනා පිණිස විනය ය පිටක ය දේශනා කෙරෙමි යි විනෙයජනයන් නිසා සූත්‍ර පිටක ය දේශනා කෙරෙමියි මාගේ ප්‍රඥාවගේ සාර ය දක්වා දිව්‍ය බ්‍රහ්මයන්ට විජම්පිටක ය දේශනා කෙරෙමි යි මෙසේ සංක්ෂෙපයෙන් තුන්පිටක ය කල්පනාකොට බලා වෙන වෙන පරීක්ෂාකරන්නාවූ මාගේ ස්වාමිදරුවෝ: තවද: විනය පිටකයෙහි පරිජි නම මේ ය. පචිති ය නම් මේ ය. මහාවග විනය නම් මේ ය. සුළුවග විනය නම් මේ ය. පරිවාර නම් මේ ය. ඊට සමන්තපාසාදිකා නම් වූ විනය අටුවා නම් මේ ය. සාරාර්ථ දීපනී නම් වූ විනය ටීකා වසයෙන් නවඅනූදහස් දෙසිය පණස් ග්‍රන්ථසඛ්‍යාවෙකැ යි බලා දක්නා.

තව ද දෙවැනිව සූත්‍රපිටකයට වැද එහි පඤ්චමහාසඟියක් දුන, පළමු වන දික්සඟියෙහි ශීලස්කන්ධවර්ග ය නම් මේ ය. මහා වර්ගය නම් මේ ය. පාළිවර්ග ය නම් මේ යි තුන්වර්ගයක් දක්නා. තව ද දෙවන මධ්‍යම සඟියෙහි මූලපණ්ණාස නම් මේ ය. මජ්ඣිම පණ්ණාස නම් මේ ය. උපරි පණ්ණාස නම් මේ ය යි තුන් පණ්ණාසයක් දක්නා තව ද තුන් වන සංයුක්සඟියෙහි [1]සගාථ වර්ග ය නම් මේ ය නිදාන වර්ගය නම් මේ ය. ස්කන්ධ වර්ග ය නම් මේ ය. සළායතන වර්ග ය නම් මේ ය. මහා වර්ග ය නම් මේ ය යි පඤ්චමහා වර්ගයක් දක්නා. තව ද සතරවනවූ අංගුත්තර සඟියෙහි එක-තික නිකනිපාත නම් මේ ය. චතුක්ක නිපාත නම් මේ ය. ඡ-සත්තක නිපාත නම් මේ ය. අට්ඨ-නවක නිපාත නම් මේ ය. දශෙකාදස නිපාත නම් මේ ය යි ෂට්ප්‍රකාරයක් දක්නා. තව ද

1 ශතවර්ගය

පච්චන කුද්දු ගොත් නම් සඟියෙහි චූලනිද්දේශ නම් මේ ය. මහානිද්දේශ නම් මේ ය. ප්‍රතිසම්භිදා නම් මේ ය. මහාවශීය නම් මේ ය. ජාතකපාළි නම් මේ ය. නෙත්පවුරුණු නම් මේ ය යි ෂට්ප්‍රකාරයක් දක්ක. තව ද සුමඞ්ගල විලාසිනී නම්වූ සූත්‍ර අටුවා මේ ය. ප්‍රපඤ්චසූදනී නම්වූ සූත්‍ර අටුවා මේ ය. සාරාර්ථප්‍රකාශනී නම් වූ සූත්‍ර අටුවා මේ ය. මනොරථ පූරණී නම් වූ සූත්‍ර අටුවා මේ ය. සද්ධර්ම ජොතිකා නම් වූ සූත්‍ර අටුවා මේ ය. ප්‍රතිසම්භිදා නම් වූ සූත්‍ර අටුවා මේ ය. පරමාර්ථ ජොතිකා නම් වූ සූත්‍ර අටුවා මේ ය. උදාන නම් වූ සූත්‍ර අටුවා මේ ය. විමානවස්තු නම් වූ සූත්‍ර අටුවා මේ ය. ප්‍රෙතවස්තු නම් වූ සූත්‍ර අටුවා මේ ය. ථෙරගාථා නම් වූ සූත්‍ර අටුවා මේ ය. ථෙරිගාථා නම් වූ සූත්‍ර අටුවා මේ ය. චර්‍ය්‍යාපිටක නම් වූ සූත්‍ර අටුවා මේ ය. බුද්ධ වංශ නම් වූ සූත්‍ර අටුවා මේ ය. ධම්පියා නම් වූ සූත්‍ර අටුවා මේ ය. පන්සියපණස් ජාතක නම් වූ සූත්‍ර අටුවා මේ ය විශුද්ධිමාර්ගී නම් වූ සූත්‍ර අටුවා මේ ය. නෙත් පවුරුණු නම් වූ සූත්‍ර අටුවා මේ ය යි මෙසේ සූත්‍ර පිටකයට මැද මෙන මෙන බලා නමින් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් වදාරණ පාළි හා අටුවා සථා සාරලක්ෂ එකොළොස් දහස් පන්සියයක් ග්‍රන්ථයෙන් සම්පූර්ණවී ය යි මෙ සේ සූත්‍ර පිටක ය දක්ක.

තව ද අභිධම්පිටකයට වැද ධම්සඟුණු නම් වූ විජම් පාළි මේ ය. විභඞ්ග නම්වූ විජම් පාළි මේ ය ධාතුකථා නම් වූ විජම් පාළි මේ ය. පුද්ගලප්‍රඥප්ති නම් වූ විජම් පාළි මේ ය. කථාවස්තු නම් වූ විජම් පාළි මේ ය. යමක නම් වූ විජම්පාළි මේ ය. පට්ඨාන නම් වූ විජම් පාළි මේ ය අර්ථසාලිනී නම් වූ විජම් අටුවා මේ ය. සම්මොහවිනොදනී නම්වූ විජම් අටුවා මේ ය. පඤ්චක නම්වූ විජම් අටුවා මේ ය යි මෙසේ විජම් පිටකයෙහි ශ්‍රීමුඛ පාළි හා අටුවා සථා එක්ලක්ෂ විසිදහස් දෙසිය පණස් ග්‍රන්ථ සඞ්ඛ්‍යාවෙකැ යි දක්ක.

මෙසේ තුන්පිටක ය මුලපටන් අගදක්වා යැ. අගපටන් මුල දක්වා යැ. දෙකෙළවර පටන් මැද දක්වා යැ. මැද පටන් දෙකෙළවර දක්වා ය යි මෙසේ අනුලොම ප්‍රතිලොමාදී වශයෙන් සකස පරීක්ෂා කොට බලා වදාරා. තව ද ඒ මාගේ ධර්මසංඛ්‍යාව විශෙෂයෙන් බලත් නම්: රසවශයෙන් එකෙක් වෙයි. පිටක වශයෙන් තුනෙක් වෙ යි. නිකාය වශයෙන් පසෙක් වෙ යි. අඞ්ග වශයෙන් නවයෙක් වෙ යි. ස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් පමණ වෙ යි. ශ්‍රී මුඛ පාළි වශයෙන් මාම කරන්නාවූ දෙශනාමෝ දෙලක්ෂ පන් සැත්තෑදහස් දෙසිය පණසක් පමණ ග්‍රන්ථ සඞ්ඛ්‍යාමෝ වෙති. මතු ශ්‍රී ලඞ්කා

විෂයෙහි දී කප් ලක්‍ෂයක් පැරුම් පුරා ආ බුද්ධඝොෂ නම් ආචාර්‍ය්‍ය ස්ථවිරයන් විසින් මාගේ අභිප්‍රාය දැන ලියනලද අට්ඨවා කථා වස යෙන් තුන්ලක්‍ෂ එක් හැට දහස් සත්සිය පණස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවෝ පමණ වෙති. ඒ මාගේ ආගම් කථාවෝ හැමදෙන ම ග්‍රන්ථසඞ්ඛ්‍යා වෙන් සලක්‍ෂ සත්තිස් දහසක් පමණ වෙති. භාණවාර සඞ්ඛ්‍යා වෙන් පස්විසි ලක්‍ෂ අටසාළිස් දහසක් බණවර වෙති. අක්‍ෂර ගණ නාවෙන් දෙකොළ තුන්ලක්‍ෂ සුවාසූ දහසක් අක්‍ෂරයෙන් පිරුණේ ය. නය වසයෙන් අසඞ්ඛ්‍ය ගණන් නාය ය. ඒ මාගේ සියලු ධර්ම සමූහයෝ මැ අවිනාශටමැ පන්දහසක් අවුරුදු පවත්නාහු ය යි මෙසේ මාගේ ස්වාමිදරුවෝ "අනෙකජාති සංසාරං" කියා පළමු බසවාගත් ශබ්දයෙහි පටන් ගෙණ කොළවර යමහල වැදහෙවැ "අප්පමාදෙන සම්පාදෙථ" යි යන මේ ශබ්දය අන්තකොට ඇති සියලු ධර්ම සමූහයන් ඒ දෙවියන් මැවූ රුවන් ගෙයි වැඩහිඳ ඒ සතරවන සති ය මුළුල්ලෙහි මෙනෙහි කොට නිමවා වදළසේක. ඒ සද්ධර්ම රත්න ය වැඩහිඳ සමමගින ය කළාවූ ස්ථාන ය දුන් රත්නඝරචෛත්‍ය නම් වී ය.

මෙසේ මාගේ ස්වාමිදරුවෝ සද්ධර්ම සමමශීනයෙන් සතර වන සතිය යවා පස්වන සතියෙහි අජපාල නම් නිග්‍රොධ මූලයට වැඩැ පූර්වදිග් බලා වැඩහිඳ විමුක්ති සුව විඳ දවස් යවන සේක.

එසමයෙහි මාරදිව්‍යපුත්‍රයා පැරද ගොස් ගහන් මතුයෙහි මුහුණින් හෙව බොහෝ දෙවියන් තමාට කරණ නින්දා ඉවසාගත නොහී තමාගේ ඒ දිව්‍යභවනයෙන් සැඟවී ගොස් දඹදිව මාවතක් මැද මගී වෙසක් ගෙණ දෙපා දිගුකොට ලා එක් අතක් නිකටට දීලා කරබා හිඳ සිතනුයේ "සිද්ධාර්ථ කුමාරයා මා නො කැමැති කරවා ම මහාභිනිෂ්ක්‍රමන් කොළේ ය. සාවුරුද්දක් මුළුල්ලෙහි මට අවකාශයක් නොපැයේ ය. දැන් මට මේ සා පරිභවයක් කොට බුදුව ගියේ ය ඉතිකින් මාගේ විෂය ය ඉක්ම ගිය මාගේ ඒ සතුරාව සතර සතියෙක් ඉක්ම ගියේ ය. ඒ සතුරා නොබෝ දවසකින් බොහෝ බණ කියා සියලු සතුන් නිවන් පුරයෙහි ඇදලා පියයි. බොහෝ කලක් අඩුවක් නැති ව තුබූ මාගේ නරකවල් අවකාශ කරව යි. මිතු තබා තමා මවුකුස උපන් වේලෙහි ද, බිහිවූ වේලෙහි ද, මහාභිනිෂ්ක්‍රමන් කළ වේලෙහි ද, බුදුවූ වේලෙහි ද, මාගේ නරකවල ඇවිලෙන ගිනිකඳ නිවා හැල් කරවා මා මුහුණ දූලිගා පිය. ඒ සතුරා තොපේ පිටු දකිමි දෝ හෝ" සිත සිතා ශෝක කරණුයේ සොළොස් කාරණයක් සිත සිතා සොළොස් හිරක් මග අවුරා ඇඟිල්ලෙන් ඇන්දේ ය.

කෙසේ දැයත්;

මම සිද්ධාර්ථයාට දාන පාරමිතාවෙනු ත් අඩුවෙම් මැ යි, ශීල පාරමිතාවෙනු ත් අඩුවෙම් මැයි, නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවෙනු ත් අඩුවෙම් මැයි, ප්‍රඥාපාරමිතාවෙනු ත් අඩුවෙම් මැයි, වීර්‍ය්‍ය පාරමිතාවෙනු ත් අඩුවෙම් මැයි, ක්‍ෂාන්ති පාරමිතාවෙනු ත් අඩුවෙම් මැයි, සත්‍ය පාරමිතාවෙනු ත් අඩුවෙම් මැයි, අධිෂ්ඨාන පාරමිතාවෙනු ත් අඩුවෙම් මැයි, මෛත්‍රී පාරමිතාවෙනු ත් අඩුවෙම් මැයි, උපෙක්‍ෂා පාරමිතාවෙනු ත් අඩුවෙම් මැයි, තව ද ඉන්ද්‍රිය පාරවරඥානයෙනු ත් අඩුවෙම් මැයි, ආශ්‍රවක්‍ෂය කරඥානයෙනු ත් අඩුවෙම් මැයි, මහා කරුණා සමාපත්තිඥානයෙනු ත් අඩුවෙම් මැයි, යමක ප්‍රාතිහාර්‍ය්‍යඥානයෙනු ත් අඩුවෙම් මැයි, අනාවරණඥානයෙනු ත් අඩුවෙම් මැයි, සර්‍වඥතාඥානයෙනු ත් අඩුවෙම් මැ ය යි මෙ සොළොස් කාරණයෙන් ඒ සිද්ධාර්ථයා මට ශත ගුණයෙන් සහස්‍ර ගුණයෙන් වඩනේ මැයි, ශතසහස්‍ර ගුණයෙන් මම ඔහට අඩුවෙම් මැය යි මහ අවුරා මෙසේ සොළොස් හිරක් ඇඳ ඒ බල බලා සුසුම් ලලා කර බාගෙණ හුන්නේ ය.

එ කල ඒ මාරයාගේ තණ්හා ය, රති ය, රාගා ය යි යන දූන් තුන්දෙන පියාතන්ගේ දිව්‍ය ප්‍රාසාදයට වැද, යහනේ වැදහොත් පියාතන් නො දක අපගේ පියාතන් වහන්සේ කොයි ගියසේක් දෝහෝ යි දිවසින් බලා මාවත් මැදෙක බිම ඇඟිලි ගගා සුසුම් ලලා හුන්නවුන් දක අසුරුසනාක් කලින් එනනාව දිව 'පියාතන් වහන්ස! මේ කොසේවූ දුක්පත් කාමෙක්ද? නුඹ සුසුම් ලන්නේ කුමන ශොකයකින් දැ' යි විචාළහ. එසමත්මර කියනුයේ "දරුවෙනි! තෙපි නො දනු ද, මහණ භවත් ගෞතමයා දසදහසක් සක්වල දෙවියන් බලා සිටියදී මා පිරු ලුහුබඳවා මා මුහුණ දූලි ගාපී ය. දූන් මාගේ සතුරා බුදුව ගියේ ය. මට වූ ලජ්ජා නො දනු ද, මාගේ ආත්මාරක්‍ෂාවට තුබූ චක්‍රායුධය දක්වා දරුවෙනි! උදුරා ගත්තෙමේ වේද"යි කී ය. එ බසට දූ තුන්දෙන කියන්නාහු: 'සවාමිනි! අපට නො කියා ඒ සා පිරිසක් ගෙණ ගොස් කුමට වඩාවූ සේක් ද? අපට කිවහොත් එක බල පිරිසකුත් නැති ව අපි තුන් දෙන ගොස් ඔහු කාම සමැති මලින් බඳගෙණ මුවපොල්ලකු සේ පැලම්හ. දූනු දූ ශෙක සො ගෙණ නුඹවහන්සේ දිව්‍යශ්‍රීන් ම හුන මැන ව. ඇසිල්ලකින් ගොස් අප ඔහු නුඹ පාපිටට ගෙණන ලෙස් බලා වැටහුන මැනමැ"යි කීහ' එ කල මරදෙව් පින් කියනු යේ "දරුවෙනි! කුමන බස් කීවු දැ, සිද්ධාර්ථ කුමාරයා ඉතා

මහත් වූ ආනුභව හා ඕජස් වූ තේජස් ඇතියේ ය. ඔහු හා විසිනු ත් ජය ගත නො හැක්ක. සොලවාලිය හැකි සතෙක් නො වෙයි, මහා ධෛර්‍ය සම්පන්න පුරුෂයෙකැ"යි කී ය.

එ බසට දූන් කියන්නාහු "ස්වාමීනි අපගේ වසවර්ති දිව්‍යලෝකයට වඩා කාමභූමියක් නැතිබැව් නො දන්නා සේක් ද, ජීවිතයක් ඇති පුරුෂයෙක් ඉදිරියෙහි ඇසිල්ලෙක පෙණීගියමෝ් නම් ඔහු කාමයෙන් පොළඹා ගැන්මෙහි අපට වඩා දක්ෂ වූ කාමාවචරනාමෝ් කාමලෝකයෙහි නැත් ම ය"යි මෙසේ පියානන් ඉදිරියෙහි සිට වහසිබැණ පියා පියානන් දෙව්ලොවට යවාලා තුමූ එතැනින් අනතඹාකව දික්සාළ අතක් වක් නො කරණතුරු ඇසිල්ලෙක බුදුන් වැඩහුන් අජපාල මූලයට ආසන්නව පොපෙණී සිට තුන් දෙන ඔවුනොවුන් හා මන්ත්‍රණ බණන්නාහු: "නගිනි, පුරුෂයන්ගේ සිත් නම් නොයෙක් ආකාරය, සමහර කෙනෙක් බාල ස්ත්‍රීන් කැමැති වෙති. සමහර කෙනෙක් යෞවන ස්ත්‍රීන් කැමැති වෙති. සමහර කෙනෙක් මධ්‍යම ස්ත්‍රීන් කැමැති වෙති. සමහර කෙනෙක් වෘද්ධ ස්ත්‍රීන් කැමැති වෙති. ඒහෙයින් කුමාරයාගේ අදහස් නො වරදවා බලා ගන්නම්හ"යි මන්ත්‍රණ කොට ලා.

දොළොස් හැවිරිදි කුඩා කෙලිරූ සියයෙක, සොළොස් හැවිරිදි පළමුවන යෞවනයෙහි සිටි ස්ත්‍රී රූ සියයෙක, එක දරුවන් ලද ස්ත්‍රී රූ සියයෙක, දෙදරුවන් ලද උත්තම ස්ත්‍රී රූ සියයෙක, එක දෙ තර දුවූ ස්ත්‍රී රූ සියයෙක, විලිකුත් කෙස් ඇති මැහැලි රූ සියයෙකැ යි මෙසේ සසියයක් වෙස් මවාගෙණ සිද්ධාර්ථයා අප පියානන් මුහුණ ගැ දැලි අඳ පිස හරිමෝ් ම ය. ඔහුගේ සිල් බිඳුමෝ් ම ය"යි කිය කියා, නන්විසිතුරු මලින් සරහන ලද නිල් වරලසින් හා, කන් නමැති මටු ගුහාවට ගමන්ගත් නීල භෘඞ්ග යුග්මයක්සේ ඉඳුනිල්වන් දිගු පුළුල් වූ ඇසින් හා, ගන නිල් වරල් නමැති මහ මේ කුළින් පැනනැගී දෙව්දුනුවන් දිලියෙන බැම සඟලින් හා, දුටුදුටුවන් දෙපා මසන රන් හැකිලි යේ යක් පතින් දිලියෙන කණින් හා, කෙම්මැල වන් තඹුරු තොලින් හා, කොඳකැකුළුවන් දත්පෙළින් දිවන සුදුරැසින් සඳරැස් පරදවමින් මුව පිනුම් බල බලා කර ඔසවා සිටිනාවූ රන්වන් හංස පැටවුන් සේ ලීලෝපේත ව සිටිනා පිරුණු තන සඟලින් හා, නැඹ පිනුමට මුවරද ලොලින් බස්නා භෘඞ්ගාවලින් සේ දුටුදුටුවන් සිත් උමතු කරවන නිල් මයාරෙදින් හා, රන් නැඹිලි කඳවන් අසුරෙන් ගන්

නා සිඟු විලසින් හා, කාම පුරුෂයන් මනදොළ විශාරද කරවන්නා වූ රන්වන්වූ පුළුලුකුලෙන් හා; පුරුෂයන්ගේ ෙදඩයසි ඔබනා තිරිකි කද සේ රත්කෙහෙල් කඳව නිකාදුන් මට සිලුටුවූ කලවා සඟලෙන් හා, තිවන්පුරට වදනවුන් බඳු හෙණ්ඩුක මල සේ කර පුරා හෙළනලද මුතුහර පැලද "කාම පුරුෂයෙනි! පිණෑසි එකෙක් වල නොගොස් අපකරා එව යි හඬගා කැඳවන්නා සේ රන්ලියවන් අනෙකි පිරූ මිණි වළලු රැවු දෙමින් සියලු සතුන් ඇසව ලූ ඉඳු ජලා බඳුවූ තත් පැනැයන් විසිතුරූ උතුරුසළු ලා, රතියට ආකර සේ, ලීලාවට සිය ගේ සේ, යොබබනයට මිඟුල් ගෙවල් සේ, මඳ මඳ සිනායෙන් පිරුණු මුව නමැති සඳ පෙළින් දිවන දසනග රසින් සල්ලාල නමැති කොමුදයන් සතුටු කරමින්, මෙසේවූ දුටුවන් ඇසුවන් සිතුවන් සිත් සොලවා පියක සමීයයන් වෙස් මවා ගෙණ ඔවුනොවුන්ගේ රූසිරි බල බලා 'කිහිපි, අද අපට එක පුරුෂයෙක් නම් සරු කිම්දැ'යි මනසි කිය කියා ඒ මාගේ ස්වාමි දරුවන්ගේ අභිමුඛයට අහසින් වගුළ සුපුම්ල්දම් පෙළක් සේ, රත්ලිය සමූහයක් සේ, විදුලිය සමූහයක් සේ, දෙවුදුනු සමූහයක් සේ, බුද්ධපූජාවට දමාලූ සසියක් රන්පිළුම් සේ, සසියක් සඳ මඩුලු සේ, සසියක් රන් කැටපත් සේ, දෙදෙනෙක් එකතැටියක නො සැරහී, දෙදෙනෙක් එක්වන් සළු නො හැඳ, මෙසේ වෙන වෙන නොයෙක් ස්ත්‍රී ලීලාවෙන් බුදුන් පෙරටව, සිටගෙණ මෙසේ කියති.

"යසළ සිද්ධාර්ථ නම් කුමාරයෙනි! තෙපි වසනනයා බඳු කාන්ති ඇති කෙනෙකු ව, පන්තිස් හැව්රිදි හෙයින් නව යෞවනයෙහි පිහිටි ය ව, රන්වන්වූ ශරීර ඇති කෙනෙකු ව, සියලු ස්ත්‍රීන්ගේ ප්‍රෙම නොපකරා ගයා ගන්නා කෙනෙකු ව, රසයෙන් සම්පූර්ණ කෙනෙකු ව, ස්නෙහයෙන් ආර්ද්‍රකෙනෙකු ව, එසේ වූ තෙපි රන්පවුලකින් රන්වන් වූ තෙද කය වසාගෙණ කාමිස්ත්‍රීන්ගේ ශොක නමැති ලැවු වනයෙහි ගිනිලන්නා සේ එකලාව, මේ නුගගස මුල කරබාගෙණ, හිඳුව, ස්වාමීනි! නො වලා කියව, නොප අඹුවෝ ඇද්ද නැද්ද? නොහොත් නොප හා බබරකොට ගියෝද,? නොහොත් උත්තම සජ්‍රානක කල්දම්‍ය නො එන හෙයින් ඇ බල බලා හිඳු ද? අහෝ සිද්ධාර්ථ කුමාරයෙනි! මේ අපට නොහගවා කියවයි විචාළහ. එකල මාගේ, ස්වාමිදරුවාණෝ වෙස්සන්තර ජාතකයෙහි කෘෂ්ණජිනා නම් දියනියන් කියන ලද බොලඳ පුරතල් තෙපුල් කොට සිනා මුවෙන් නො බැණ, හුදු කරුණා

මෙත් අඹාලූ රුවක් සේ, හුදු මුදිතාවෙන් මවාලූ රුවක්සේ, හුදු උපෙක්ෂාවෙන් මවාලූ රුවක් සේ නො සෙල්වී මහපොළොව සේ වැඩවුන්සේක් මැයි.

ඉක්බිත්තෙන් මැහැලි වෙස්ගත් තණ්හා නම් දේවතාදූ “මේ පුරුෂයා එසේ මෙසේ සොලවාලිය නො හැක්ක. අප හැම දෙනා තමාගේ නුවණින් කොළමරිනු ත් නො බල යි. පුරුෂයෝ නම් තමන් රූ වර්ණනා කළ කල මද නැගී ඇතුන් සේ උමතු වෙති. මොහුගේ රූපය ඉදිරියෙහි සිව වර්ණනා කරා නමා ගණිමි’යි සිතා ‘ස්වාමීනි සිද්ධාර්ථ කුමාරයෙනි! තොපගේ සිද්ධාර්ථ නම් තම සියලු ස්ත්‍රීන්ගේ කාමාර්ථයන් සිද්ධකාරණ හෙයින්ම ලද්ද යි සිතමි. තොපගේ මේ රශ්මිවත්වූ ශරීරය ලෝකවාසීහු කරුණා මෛත්‍රීන් සම්පූර්ණවී ය යි කියති. මම මහාගි පඤ්චකාමයෙන් පිරුණාය යි සිතමි. තොපගේ කෙළෙ රන්කඳක් වන් පස්කඳ රන්මුහුදින් පැන නැගි සුවර්ණාංකුරයක් වැන්නැ යි නො කියමි. කාම ස්ත්‍රීන් තොපගේ තුනුවිලට බැස කෙළනා පස් මහ නොවෙතැ”යි කියමි. තව ද තොපගේ රන්මෙරක් බඳුවූ බුහුතායෙහි දිලියෙන ඉඳුනිල් වන් සිරස රශ්මුහුදින් පැන නැගි ඉඳුනිල් පර්වතයක්හුගේ ශ්‍රී විභූතියක් වැන්නැ යි නො කියමි. කාමස්ත්‍රීන් නමැති බකාබක නාවන්ට ගබ දෙන්නාවූ මහ මේ කුළක් දෝ හෝ යි කියා සිතමි.

තව ද තොපගේ කෙළෙ රන්තලාවක් වන් තලල් තල මැද දිලියෙන ඌර්ණාරෝම ය රන් බිතෙක්හි දුන් මකුල් තිලකයක් වැන්නැ යි කියා ත් නො කියමි. සුවර්ණ සාගරයෙන් පැන නැගි දක්ෂිණ ශංඛයක් වැන්නැ යි කියා ත් නො කියමි. නො හොත් එම රන් මුහුදින් පැනනැගී දරණලා හොත් හැලී නාග රාජයකු වැන්නැයි කියා ත් නො කියමි. නොහොත් තොපගේ රූ මුහුදින් පැන නැගි අමා දතියක් වැන්නැ යි කියා ත් නො කියමි. නොහොත් තොපගේ යශෝලතාවෙන් ප්‍රබෝධවූ සමල් කැනක් වැන්නැ යි කියා ත් නො කියමි. නොහොත් නාසිකා නමැති පුඩු ඇති, බැම නමැති ඉඳුනිල් තිල්වන් සතෙහි මුදුන් දුන් රිදී කොතක් වැන්නැ යි කියා ත් නො කියමි. නොහොත් තොපගේ මුඛ නමැති මහපිහුමෙව බැස මුව පුරා රොන් ගෙණ තලල් නමැති රන්පෙත්තෙහි සිඳ රැවු තගා මත් ව ගුවන් බලා හුන් ශ්වේත හංස පෝතකයකු වැන්නැ යි කියා ත් නො කියමි. ඒකාන්ත යෙන් කාම ස්ත්‍රීන් නමැති කෞමුදයන් ප්‍රබොධ කරන්නාවූ පූන්

යදක් මැන්නැයි කියාත් නො සිතමි. හොඳහොයි තොප කරා පැමිණි යෞවන ස්ත්‍රීන්ගේ කාම ධාහ නිර්වාණය පිණිස මවාලූ විදී හල් වැටෙක් දෝ හෝ යි කියාම සිතමි. තව ද තොපගේ තෙපල වෙන වෙන පත් වර්‍ණක් පැහැයෙන් දිලියෙන්නාවූ ඇස් සඟල මුව පද්මයට බව නීල භෘඞ්ගරාජ යුගලයක් වැන්නැයි කියා ද, නීලෝත්පල යුගලයක් මැන්නැයි කියා ද, ඉන්ද්‍රනීල යුගලයක් වැන්නැයි කියා ද නො කියමි. පඤ්චකාමයන්ගේ ජයගැන මට වෙන වෙන ම මවා ලූ පඤ්චවර්‍ණධ්වජයෙක් දෝ හෝ යි කියා ම සිතමි.

තව ද තොපගේ තෙපල උන්නතඹග වූ නාසිකාව මුව පියුම බලා කර යා උඩ් රත්මත් වූ හංස රාජයකු මැන්නැයි කියාත් නො කියමි. තොප කරා පැමිණි ප්‍රේම කාතරතා නැමැති කෙණෙරගනක් අනුන් කරා නො යාදී ගයා ගත් නාවූ සවර්‍ණාංකුශයෙක් දෝ හෝ යි කියා ම සිතමි. තව ද තොපගේ තෙපලෙ බිඹුපල සමාන වර්‍ණ වූ අධරයුග්මය මුව නමැති පද්මයෙහි හටගත්තා වූ රත් පියුම්පෙති සඟලක් වැන්නැයි කියාත් නො කියමි. තොපගේ රූප නමැති ක්‍රීඩා ශාලාවෙහි කාම ස්ත්‍රීන්ට නිව, තුබූ ප්‍රවාලමය වූ රා ඔඩම සඟලක් වැන්නැයි කියා ම සිතමි. තව ද තොපගේ තෙපල අධරයුග්මාභ්‍යන්තරයෙන් අඩ රූප දක්මන්නා වූ දන්ත පංක්තීහු මුඛ පද්මයෙහි කෙසර පංක්තියක් මැන්නැයි කියාත් නො කියමි. දුටු දුටු කාමිස්ත්‍රීන්ගේ කාමාඞ්ගයන් සිඳු නොරඹි යි සන්ධ්‍යාවල ගබින් පෙණෙන්නාවූ විතීය චන්ද්‍රයා දෝ හෝ යි කියා ම සිතමි. තව ද යහළ සිඩාඹ නම් රූසපුරාණෙනි, තොපගේ තෙපල රත්කුළු සඟලක් වන් උරමඬලේ පැනැර සිටිනා තනපව සඟල රත්ගල් මුදුනෙක නවන සවර්ණමයුර රාජ යුග්මයක් වැන්නැයි කියාත් නො කියමි. තොපකරා පැමිණි යෞවන ස්ත්‍රීන් අනුන් කරා නො යාදී දෙපා මයන රත්පමුදම් දෙනකැයි සිතමි. තොපගේ තෙපල රත්මන්වූ ග්‍රීවය රන් මිහිගක් වැන්නැයි නො කියමි. කාමාඞ්ගනාවන් උමතුකරමන ඖෂධ සපිනායෙක් ම ය යි සිතමි. තොපගේ තෙපල රත් සිවුරුගබින් නික්මුන් බාහු යුග්ම ය රත්වලා ගබින් නිකුත් විදුලිය දෙකක් වැන්නැයි නො කියමි. තොපගේ රූ නමැති අමාගඞ්ගාවට වැද කාමි ස්ත්‍රීන් සිත් සේ කෙළිනාවූ රන් පලු පත්සඟලක් වැන්නැයි සිතමි.

මෙසේ වූ රූපයකින් මේසා වන මැදෙක කාමිස්ත්‍රීන් නැති ව තොප වැනි කෙනකුන් උදකලාව වසනු ඉනා නො යෙදෙ යි. මේ ලෝකයෙහි ස්ත්‍රී නම් තොප වැනියන් පහස් ලත් ස්ත්‍රී ම ය.

එ බැවින් වරෝ හිමි, එකලාව මේ වෙනෙහි නො වසව, අද දක්වා පුරුෂයන්ගේ පහස් නො ලත් මාගේ මේ දොළොස් හැවිරිදි කුඹා නගුන් සිය ය හෝ රක්ෂාකරව. නොහොත් තව යෞවනයෙහි පිහිටි සොළොස් හැවිරිදි නගුන් සිය ය හෝ රක්ෂා කරව, නො හොත් එක් දරු වැදූ මේ රත්ලිය වැනි නගුන් සියය හෝ රක්ෂා කරව. දෙ දරු වැදූ මේ විදුලිය වැනි නගුන් සියය හෝ රක්ෂා කරව. පුරුෂයන් පොළඹා ගැන්මෙහි අප මුත් නැතැයි ධවජ නැගුවා සේ එක දෙ කර නැගි නගුන සිය ය හෝ රක්ෂා කරව. නොහොත් කපු පිසම්න් දී ගඳලගයෙන් පුරුෂයන් පොළඹා ගැන්මෙහි දක්ෂවූ අප මැහැල්ලන් සියය හෝ රක්ෂා කරව. හිමි! තොප සිත ඇත්තක් නො වළා කියව. අප මුත් මෙතන අනික් කිසි කෙනෙකුන් නැති බැවින් කිසි විළියක් නො කරව" යනාදීන් මෙයේ ලඳු බොලඳ වූ නොයෙක් විරහ තෙපුල් කීව. එ විගස හැම මාරස්ත්‍රී ඔවුනොවුන් පරදවා අපි මී ලෝභ කරවා ගණ්ණම්හ. අපි ම ලෝභ කරවා ගණ්ණම්හ යි සිත සිතා සමහරු නටති. සමහරු ගී කියති. සමහරු අත්තල ගෙළති. සමහරු අසුරු සන් දෙති. සමහරු වස්කුළල් පිහිති. සමහරු දිව වෙණ ගයති. සමහරු නරු තතති, සමහරු බමති, සමහරු පුසුඹු ලති, සමහරු අත්වැල් බැඳ බුදුන් සිඟාරා දිගෙවති, සමහරු ලීලා දක්වති, යනාදීන් නොයෙක් ප්‍රකාරයෙන් අකට විකට පෑ පොළඹවත්නාහු මාගේ ස්වාමිදරුවා නන්සේ කුමන් කෙළවරින් බැලුම් පමණකුත් නො ලද්දාහු ය.

මෙසේ බොහෝ උත්සාහ කොට අවකාශයක් නො ලදින් වෙහෙසන්නාහු "ස්වාමීනි සිද්ධාර්ථ කුමාරයෙනි, මේ ලොකයෙහි තොප මහා ශ්‍රද්ධාවන්ත ය යි කියති. කාම්බාහයන් තොප කරා ආ අප තොපගේ තුනුවිල ගලා සන්සිඳුවා තුලූ නම් අද අප දිවි තිබෙති යි නො සිතව. එසේ ත් ලොභී වූ නම් තොපගේ තෙපල ශ්‍රීපාද නමැති පියුම් දෙකින් අප අපගේ නළල් මැද තිලකාභරණ දෙව තව ද එසේ ත් ලෝභී වූ නම් ස්වාමි සශ්‍රීක වූ සුවඳ හඳින් පිරුණා වූ තොපගේ මූඛ නමැති කරඬුව හැර මධුර වචනයක් දන් දී අප අපගේ කන් පුරව. එසේ ත් ලෝභී වූ නම් තොපගේ නෙලෙ පස් වණක් පැහැයෙන් දිලියෙන බැලුම් පමණකින් ලෝවැඩ කරන්නාවූ ඇස් සගලින් අඹ බැලුම් දී ඒ ආස්වාද යෙන් තොප නිසා ම පැලෙන අප නම්කිළියන් නම්ගිනි නිවව. අද තොපගේ ශ්‍රද්ධාබල, බලම්හයි" යි නොයෙක් ලෙස යැච්ඤාකළ කල ද මාගේ ස්වාමි දරුවානන් ඒ දිව්‍ය ස්ත්‍රීන්ගේ හාවභාව ලීල

ජරාපත් වැඳිරියන් පානා වූ විකාර සේ, මෙස් බැඳ පානා විකාර සේ, සිනා අශුභ ලකුණු උපදවා මෛත්‍රීන් පිණ පිණා මහාමේර සේ නිශ්චල ව මැඩහුන්සේක් ම ය.

එ කල මාරස්ත්‍රීහු නමන් දිව්‍යාංගනාවක් හෙයින් මොහුගේ පූර්ව චරිතයෙන් මෝහව නින්දුකොට පොළඹා, ගණුම්හ යි සිතා කියන්නාහු: "සිද්ධාර්‍ථ කුමාරයෙනි! දුන් අපව තොප නදවන්නේ ඇයි ද, තොප පෙර කුසරජ ව උපන් කල ප්‍රභාවතීන් තොපහැර පලාගිය කල එදා තොප ඒ සා රාජ්‍යයක් හැරපියා උන් පසු පස් සෙහි එක ද සියයක් යොදුන් දිවූ දුමස් සඳහන් නැද්ද? තව ද සත්මසක් මුළුල්ලෙහි දර පැන් ඇද බත් මාලු පිස එම ස්ත්‍රිය නිසා අරක්කැමි කම් කොට තොප ගත් දුක් සඳහන් නැද්ද? තව ද වලන් කද කාර නබාගෙණ හිණි පාමුල හි මලාගෙ වෙස්ගෙණ ඇස පෙරළලා එදා තොප වැදහොත් ලෙස් මෙදා සඳහන් නැද්ද? තව ද තොප හුනු හඩ අසා ප්‍රභාවතීන් දිම්අවුදින් කර දිගුකොට මේ මලඳේ හෝ තොමල දේ හෝ යි සිතා කාසයට අත පෑ බලන වේලෙහි ඒ ස්ත්‍රිය දුක ප්‍රේම බරාගත තොායි කම්පුරා කෙළ ගෙණ ඇගේ මුව පියුමට දුමූ ලෙස් සඳහන් නැද්ද? තව ද එම ස්ත්‍රිය නිසා විශ්‍රීය කරණ තොප එදා කැසපට ගොහාගෙණ, කලල්මැද සිව බඳුන් සේදූ ලෙස් සඳහන් නැද්ද? පෙර සසර මෙසේ ගැණුන් කෙරෙහි ලොභ නැහැන්නන් දුන් අප වැනි ස්ත්‍රීන් කෙරෙහි මඳකුත් ලොභ නොකරණු තොප වරද නො වෙයි. අප කළාවූ අකුසල් බල ම ය.

තවද පෙර තොප රජ වූ ජාතියෙක පඤ්චකාමය මා මුත් අනින් සතකු අනුභව කළ නො හැක්කැ යි සිතා කාමයෙහි ගිජු ව කිලෙහි සිපි බල්ලන් දක්වා කඩුවෙන් පොලුගෙණ කාමොන්මතන ව එදා ඇවිදි ලෙස් මෙදා තොප සඳහන් නැද්ද? තවද එක් කලෙක චුල්ලපදුම ජාතකයෙහි ප්‍රිය වූ කා නතාවකා නිසා රජය හැර ගොස් ඇ පය බිම ගැ නොදෙමි යි කර හිඳුවාගෙණ දුරුමග ගෙවා යනද ඈ පැන් බොම් යි කී වේලෙහි පැන් නැත්තෙන් තොපගේ තෙලෙ පුළුල් උරමඬල පලා ලේදිය හොවා ඇ පිපාසා නිවා ඇවිදි ලෙස් මෙදා තොප සඳහන් නැද්ද? තවද තොප සුභලක්‍ෂණ ජාතකයෙහි සුභලක්‍ෂණා නමා බිසවුන් කර හිඳුවාගෙණ රාජවීථි මද්‍ය්‍යයෙහි වනමද්‍ය්‍යයෙක යන්නා සේ කාමයෙන් අඳ ම එදා තොප ගියහැටි මෙදා දුන් සඳහන් නැද්ද? තවද සංකපප ජාතකයෙහි තොප බරණැස් රජුගේ අග මෙහෙසුන් කිස වුන් දුක ලෝභකොට එකෙණෙහි ම පත් සිඳපූ පක්‍ෂියකු සේ

ආකාශයෙන් බිම හී එ බඳු වූ ධ්‍යානසුවය හැර උයනට ගොස් සද්ද මුළුල්ලෙහි කො තා කො බී එ සමයෙහි තොප කළ ස්ත්‍රී ශොකය මේ සමියෙහි දැන් සිහි මඳ ව ගියේ දැ? තව ද පෙර තොප තක්ක ජාතකයෙහි ගංබඩ පන්සලක් කොට ධ්‍යානසුවයෙන් වසන කල දියෙන් යන කාන්තාවක් දැක ඈ දියෙන් ගොඩ නගා ඈ කෙරේ කළ ලොභයෙන් ධ්‍යානසුවය හැර ගොස් ඈ හා සමඟින් වැස තොප [1]මොර මෙළෙඳුම් කොට එදා ජීවත් වූ සැටි මෙදා දැන් සඳහන් නැද්ද? තව ද පෙර තොප විනීල ජාතකයෙහි ස්වර්ණ හංසරාජ ව ඉපද පක්ෂීන් කෙරෙහි හීන වූ කපුටු ධෙනුවක හා සමග සංවාසය කොට විනීල නම් පුතකු ලදින් ඒ කපුටුවා හා කපුටුධෙනුව නිසා මහාවනු ව ඇවිද එදා ජීවත් ව තොප ගත් දුක් මෙදා දැන් සඳහන් නැද්ද?

තව ද පෙර තොප [2]උම්මදන්ති ජාතකයෙහි රජව නුවර පැද කුණු කොට යන දා උම්මදන්ති නම් ස්ත්‍රියක දැක ඈ කෙරෙහි කළ ලෝභයෙන් කාමෝන්මාද ව ඈ පස්සෙහි රජගෙට ගොස් නොයෙක් විලාපයෙන් ඈ මිත්තේ නොයෙක් ගී කියා එදා තොප ඇඹුලෙස් මෙදා දැන් සඳහන් නැද්ද? තව ද පෙර තොප වන මැදෙක ධ්‍යාන ලදින් වසනකල එක්දවසෙක රැ ස්ත්‍රියක වැදහොත් ගේකට ගොස් දොර හරවා ඈ දොර නොහරණ හෙයින් මුඩක් දී පලය ඔසවා බලල්ලාසෙන් ගෙට වදනා වේලෙහි පය ගැසී මුඛ ය ගැලවී පලහාරය තොප පිට හී ඔබාගත් කල එදා තොප ගත් දුක් මෙදා සඳහන් නැද්ද?. පෙර මෙසේ එකී එකී ස්ත්‍රියක් නිසා දුක් ගත්තාවූ තොප දැන් අප සසියක් ප්‍රිය කාන්තාවන් දැක තද වන්නේ කො යෙදෙයි. හිමි' අපට දැන් කාමාසවාද කරව"යි නොයෙක් ලෙස යාච්ඤාකළාහු ය.

එ වේලෙහි ස්වාමිදරුවෝ නිශ්චලව කරුණා පිඩක් සේ වැඩ හිඳ සිතා වදාරණසේක්; "මා රාගාදි කෙලෙසුන් නසා ලොවුතුරා බුදුව තුන්ලෝ මුදුන් වූ පරිදි මේ ස්ත්‍රීහු නො දන්නාහු ය. මොවුන්ට මා අරාගී අද්වෙෂී අමෝහී පරිදි හඟවාලම්"යි සිතාලා තමන් වහන්සේ මුඛ නමැති පද්මයෙන් සුවඳ ගඳ විහිදුවා අෂ්ටාඞ්ගසමුපෙත වූ මධුරනාදයෙන් වදාරණසේක් 'නගිනි, කුමක් කියා වෙහෙසෙව් දැ? තොපගේ කෙලෙ ස්ත්‍රී ලීලාව අජීතරාගී වූ, පුරුෂයන්ට ම සුදුසු බව මුත් මා සේ වීතරාගී වූ, වීතද්වේෂී වූ, වීත මෝහී වූ, නික්ලෙශී වූ, ශාන්ත වූ, දාන්ත වූ, අමාමහනිවන් දුටුවා නට සුදුසු සේ නොවෙයි" වදාරා:—

1 මෝරු, 2 උම්මාදන්ති.

යස්ස ජිතං නාවජීයති-ජිතමස්ස නො යාති කොචි ලොකෙ,
තං බුද්ධමනන්තගොචරං-අපදං කෙන පදෙන නෙස්සථ.

යස්ස ජාලිනී විසත්තිකා-තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවෙ,
තං බුද්ධමනන්තගොචරං-අපදං කෙන පදෙන නෙස්සථ.

යන මේ ගාථාවෙන් ස්වාමීන්වහන්සේ විතරාගී බැව් හඟවා බණ වදාළසේක. මාර ස්ත්‍රී ඒ බණ අසා අප තබා සදෙව්ලොව දෙවඟනෝ අවුදිනුත් මොහු කාමපාශයෙන් බඳගත නො හෙත් ම ය යි හැම කලකිරී බුදුන් වටාසිට තමන් සසියයක් දෙනාගේ එක් දහස් දෙසියයක් පමණ අත් බුදුන් දක්වා පොව පොවා "කොල සිද්ධාර්ථය! එකාන්තයෙන් තෝ මනුෂ්‍යයෙක් නො වේම ය. ලෙසි ගුණ රස නැති යක්ෂයෙක්හි දෝ? නොහොත් උන්මත්තක පුරුෂයෙක්හි දෝ? නොහොත් තාගේ රාව මතුපිට රත්පොත්තකින් වසා ඇතුලත ගලකින් නිමියේ දෝ? නොහොත් තාගේ සොල ශරීරය යකඩින් නිමවා රත්වන් කොළේ දෝ? එකාන්තයෙන් තාගේ තෙල පස්කඳ මුත් සිතෙක් එහි දුරින් දුරු ම ය. ඉදින් අපි අභිසාරාගීවූ යම් පිරිමියකු ඇසිල්ලකු ත් දුටුමෝ නම් ඔහු අප වසඟ කොට ගණුමෝ ම ය. තා සේ වූ රූක්ෂ සිත් ගුණ නැති, අග්‍රාම්‍ය පුරුෂයකු කාරා අප ආයේ ම නො යෙදෙයි. තා සේ වූ ගුණ නැතියන් කොයි ඉදින් තා කැමැත්තෝතිනු ත් කිඳිතෝ කවුරුද" යි නිඳා බැණ, "අපගේ පියාණන් වහන්සේ ඔහු කාවිසිදු ත් ජයගත නො හැක්කැ යි කීයම කියාවා අප ආයේ නො යෙදෙයි. අපට වූ පරිභව ඉතා මහත. යම්හ සැ ගිති" කියා එතැනින් අන්තර්ධාන ව පැරද පලා ගියහ.

මෙසේ මාගේ ස්වාමිදරුවෝ මාරස්ත්‍රීන් ජයගෙණ ඒ අජපාල නිග්‍රොධ මූලයෙහි පස්වන සතිය වැඩහිඳ සවන සතියෙහි මුචලින්ද නම් විලට වැඩ එ විල්තෙර මහමිදෙල්ල ගසක්මුල වැඩහුන් සේක. එදා පටන් බුදුන් හා සක්විති රජුන් ලොව උපන් කල සත් දවසක් වස්නා චාතුර්විපික මහාමෙඝ නම් මහාමෙඝයක් නගා සත් දවසක් ධාරා නිපාත වි ය. එ විල වසන මුචලින්ද නම් දිව්‍ය නාගරාජයෙක් විලින් නැගී දසදෙශ වසාසිටි මහත් වූ මැණිඅඳුරු දුන බුදුන්ගේ ශරීරයට වැසි සුළං සීත මැසි මදුරුවන් වලනා මේ සඳහා නාග මෛත්‍රාවෙතකින් පින් රැස්කෙරෙම්හ යි සිතාලා අවුදින් බුදුන් වටාලා සත් දරණ පටක් එව මහත් වූ පෙණගබින් මුදුන වසා බුදුන් පුදා සිටගත. එ කල මාගේ බුදුහු දුමාන කරඬුවෙකින් වසා ලූ ප්‍රතිබිම්බයක් සේ මුචලින්ද නම් නාගරාජයාගේ දරණගබ සවන සතියෙහි ධ්‍යාන

සුවයෙන් වැඩහිඳ, එ තැනින් පැනනැගී සත්වන සතියෙහි මහ කිරිපලු වනයකට වැඩ කිරිපලු ගසක්මුල ගල්තලක් පිට නිල් වලා ගබක් පිට දිලිසෙන පුන්සඳක් සේ දිලිහි දිලිහී ධ්‍යානසුවයෙන් වැඩහුන්සේක. මෙසේ මේ සත්වන සතියෙහි බුදුවූ එකුන් පණස් ද මුළුල්ලෙහි ආහාර කෘත්‍යයක් නැති ව නිවන්සුව වළඳ දවස් ගෙවූ කල බුදු වූ පණස්වන ද උදෑසන අරුණු නැගී වේලෙහි ශක්‍ර දේවේන්ද්‍රයා අමා අරළු සුණුකබක් ශ්‍රී හස්තයෙහි පිළිගන්වා ලි ය. ඒ දිව්‍ය වූ අරළු වැළඳූකල සිරුරු පිළිදගුම් වි ය. එකෙණෙහි මාගේ ස්වාමිදරුවෝ පන්සියයක් යොදුන් උස හිමාලයෙහි සම්පණස් යොදුන් අනවතප්ත විලට වැඩ අනන්තාපරිමිතවූ බුදුන්ට ම තිබෙන ව තුබූ හුගත් නම් තොළව බැස මුඛ ධෝවනය කොට එහි ශක්‍රයා පිළිගැන්වූ මෘදු වූ සිනිඳු වූ නාලිය දැහැටි වළඳා නැවත වැඩ එම කිරිපළුගස මුල වැඩහුන් සේක

එ කල බුදුකෙණකුන්ට අග්‍රභෝජනයක් දන්දෙමියි කප් ලක්ෂයක් පතා ආ තපස්සු - භල්ලුක නම් වෙළෙඳ දෙබෑ කෙනෙක් උතුරු දනව්වෙහි සිට පන්සියයක් ගැලින් බඩු පුරාගෙණ මධ්‍ය මණ්ඩලයට යන්නාහු ඒ කිරිපලු වනයට පැමිණියාහ. පෙර ඔවුන්ට නෑ දෙවතා දුවක් ඒ වෙනෙහි වසන්නී වෙළෙඳ දෙබෑයන් යන්නවුන් දැක උන් ලවා අද බුදුන්ට දන් දෙවා උන්ට වැඩක් කෙරෙමි යි සිතා උන් ගෙණයන පන්සියයක් ගැල් නාභිය දක්වා පොළෝ ගලා පුව, අඳනා ගොන් දණ බිම ඇන රඳාගියහ. එ වේලෙහි වෙළෙඳ දෙබෑයෝ භයපත් ව මේ වෙනෙහි දෙවිකෙණකුන් කළ දෙයෙකැ යි දන ගඳ දුම් මල් පහන් පුදා දෙවියන්ට ආරාධනා කළාහ. එ කල දේවතා දූ දෙව්පිරිස් පිරිවරා ආකාශයෙහි සිට ඔවුන්ට පෙණී හඬ හරවා 'මාගේ බුදුහු බුදුවූ ද පටන් එකුන් පණස් දවසක් මුළුල්ලෙහි තව දක්වා නිරාහාරයෙන් ම සත් සතියක් යවා දැන් මාගේ මේ වෙනෙහි පින්කොය් ව වැඩහුන්සේක. තොපට ත් මට ත් පින් පුරා පරලෝ වැඩ සිසා බුදුන්ට අග්‍රභෝජනය දෙවාලනු කැමැත්තෙමි.

මෙසේ බුදුන්ගේ ගුණ කියා බුදුන්ට දනක් දෙන සේ ඔවුන් සමාදන්කරවාගෙණ ඒ පන්සියයක් ගැල් ම හැරපූහ. එකෙණෙහි ඔහු දෙදෙන පැහැද මීපිඩු ගෙණගෙණ බුදුන් පෙරටුව සිට ආරාධනා කළාහ. මහ බ්‍රහමයා පිළිගැන්වූ පාත්‍රය කිරිපිඩු පිළිගත්විට ම අන්තර්ධාන ව ගියේය. කිරිපිඩු පිළිගැන්වූ තලිය නාගභවනයට ගියේ ය. එසේ හෙයින් 'බුදුහු නම් පාණි පාත්‍රයෙන් නො පිළි

ගණිති. තවර පාත්‍රයකින් පිළිගණිම් දෝහෝ"යි සිතා වදාළසේක. එකෙණෙහි මාගේ ස්වාමිදරුවානන් සතර ජාති ජාතියෙහි දන් දුන් චතුර්මධුර පූර්ණපාත්‍රයන්ගේ ආනුභාවයෙන් වරම රජදරුවෝ සතරදෙන ඉන්ද්‍රනීල මාණික්‍යමය වූ පාත්‍ර සතරක් ගෙණාහ. බුදුහු පූර්ව බුද්ධවරයන්ගේ චාරිත්‍ර බලා ඒ පාත්‍ර නො ඉවසා වදාළසේක. නැවත මුංවන් පැහැ ඇති ශෛල පාත්‍ර සතරක් ගෙණවුත් 'මාගේ පාත්‍රය ම ගත මැනව. මාගේ පාත්‍රය ම ගත මැනවැ'යි කියා බුදුන්ගේ ශ්‍රී හස්ත නැමැති පියුමට බන්නා නීලභාණ්ඩරාජයන් සතර දෙනකු සේ මිතු මත්තේ තබාපීහ. බුදුහු වරමුන් සතරදෙනාට ම අනුග්‍රහ සඳහා සතර ම එකපාත්‍රයක් වේව යි අධිෂ්ඨානකොට වදාළසේක. එකෙණෙහි සතර පාත්‍රය ම එක්ව ඇලි සතර මෝව්ව තෝරා රේඛා පෙණී එක පාත්‍රයෙක් වී ය. එ කල බුදුහු ඒ පාත්‍රයෙන් මීපිඬු පිළිගෙණ පළමුවන භෝජනය ය වළඳා ඒ වෙළඳ දෙබෑයන්ට අනුමෙවෙනි බණ වදාරා බුද්ධශරණ-ධර්මශරණ පිහිටුවා ඔවුන් බුදුසස්නෙහි වෙවාචික නම් උපාසක කළසේක.

ඒ වෙළෙඳ දෙබෑයෝ 'ස්වාමීනි! නිති අප වැඳපුදාගන්නා නියායෙන් වස්තුවක් දුනමැනවැ'යි කීහ. ස්වාමිදරුවෝ ශ්‍රී හස්තයෙන් සිරස පිරිමැද කෙශධාතු මිටක් ඔවුන්ට දුන් සේක. ඔහු රුවන් කරඬුවකින් ඒ කෙශ ධාතු පිළිගෙණ රථයෙහි තබා සිය නුවර ගෙණ, ගොස් පූජා කරන්නාහු කාලෙක ජලයාත්‍රාවෙහි ඇවිද ශ්‍රී ලඞ්කා මීපයට පැමිණ දර පැන් සොයා ගිරිහඬු බෑස දාකරඬුව ගලපිට තබා බත් පිස කා යන කල දාකරඬුව තුබූ පලින් සෝලවා ගත නො හී මේ උත්තම ස්ථානයෙක් වනැ යි දූත පාෂාණගොඩකින් වසා ගඳ දුම් මල් පුදා ගියාහ. පසුව එතෙන ගිරිහඬු නම් වෙහෙරෙක් වී ය. ඉක්බිත්තෙන් මාගේ ස්වාමිදරුවානෝ කිරිපලු ගසමුලින් නැගී අවමන යතියෙහි අජපාල නම් නුග ගසමුල වැඩහිඳ අනන්තා පරිමෙය වූ බුදුන්ගේ සිතිවිලි වූ ක්‍රමයෙන් "මාගේ දහම් ගැඹුරු ය, සත්තුන්ගේ නුවණ ලා ය, ක්ලේශයෝ ඉතා උත්සන්නයෝ ය, මා බුදු වූ බව මුත් දහම් දෙසීමට කල් නො වෙයි" ධර්මගම්භිරත්වයෙන් පසුබට සේක.

එ කෙණෙහි සහම්පතී මහාබ්‍රහ්මයා "නස්සති වත භො ලොකො විනස්සති වත භො ලොකො"යි කියා දසදහසක් සක්වළ දිව්‍ය-බ්‍රහ්මනාග-සුපර්ණ-ගරුඬ-ගන්ධර්ව-යක්ෂ-රාක්ෂස-උෂ්ණවලාහක-අභ්‍රවලාහක-සීතවලාහක-වාතවලාහක-වස්සවලාහක-

සිඬ-මිඳුබරාදී දිව්‍ය සේනා වෙවුල්වා මහහඬින් ගුගුරුවා දසදහසක් සක්වළ දෙවියන් රැස්කොට, එක්ලක්ෂ පණස් දහසක් බ්‍රහ්මරාජයන් පිරිවරා, දසදහසක් සක්වළ අනූදහසක් දිව්‍යරාජයන් හා සමග මේ මඟුල්සක්වළට රැස් ව බ්‍රහ්මරාජතෙම අවසාළිස් ගවු උසින්, සත්ගවු සමාර දිග පතුල් හා, දෙළොස් ගවු දිග රියන් හා, සඟවු දිග පියක් හා, අඩගවු තැන් වසා ලන ඇඟිලි ඇති ව, සොළොස් යොදුන් දිව සළු හැඳ, දෙළොස් යොදුන් සළු එකාංශ කොට, සැටළොස් ගවු මිණිඔටුනු පැලඳ, තමාගේ දසඇඟිල්ලෙන් දිවූ දස රස්කඳින් දසදහසක් සක්වළ හිරු දහස් සඳුදහස් නැංගා සේ ඒකාලෝක කෙරෙමින් ඒ දසදහසක් සක්වළ හැම දෙවියන් ඔහුන් ගෙණ මාගේ ස්වාමිදරු වූ, ධර්ම රාජ වූ, ධර්ම චක්‍රවර්ත්ති වූ, බුදුරජාණන් කරා ඒ අජපාල මූලයට දිව තමාගේ දෙළොස් ගවු උස දකුණු දණමඬල සමා උක්කුටිකයෙන් හිඳ තමාගේ සඟවු පමණ විශාරද වූ, දෙහොත් මුදුනෙහි තබාගෙණ: "ස්වාමීනි! බුදු කෙණකුන් ඉපදීම කප් අසංඛ්‍යයකිනුත් ඉතා දුර්ලභ වන්නේ ය. නුඹ වහන්සේ මේ සාරාසංඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි පාරමිතාවත් පුරා දුක් ගත්තේ ධර්මයක් පවත්වා සියලු සතුන් සංසාරසාගරයෙන් ගොඩනගමි යි සිතා වේ ද, එසේ වූ නුඹවහන්සේ දැන් සද්ධර්මචක්‍රවර්ත්ති ව ධර්මචක්‍රය නො පවත්වමි යි සිතූ යේ, නො යෙදෙයි. නුඹවහන්සේගේ දේශනා නමැති රශ්මීන් ප්‍රබුද්ධාකාර ව හිඳිනා විනෙයජන පද්මයෝ අසංඛ්‍යගණන, නුඹවහන්සේගේ ධර්මචක්‍රය ඉක්ම පවත්නේවී නම් මම මාගේ ආඥාචක්‍රයෙන් හික්මවා දෙමි"යි "දේසෙථ මුනින්ද ධම්මං, දේසෙථ භගවා ධම්මං" යනාදීන් කියා ධර්ම දේශනාවට ආරාධනා කෙළේ ය.

කීයේ මැතෝ:—

බ්‍රහ්මා ච ලොකාධිපතී සහම්පතී
කතඤ්ජලී අනධිවරං අයාචථ,
සන්තීධ සත්තා අප්පරජක්ඛජාතිකා
දෙසෙස්සු ධම්මං අනුකම්පිමං පජං යි.

එ කල මහාබ්‍රහ්මයාගේ ආරාධනාව අසා ධර්මදේශනා කෙරෙමි යි බුද්ධයාට ප්‍රතිඥා දුන් සේක. එ කෙණෙහි ඒ සහම්පතී මහාබ්‍රහ්මයා සන්තොෂවූයේ මුළු ලොවට ඇසෙන සේ තුන්යලක් සාධුකාර පූජා කෙළේ ය. ඔහුගේ ඒ ශබ්ද ඝොෂාව හා සමග ම දස දහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්ම රාජයෝ ද සන්තොෂවූවාහු

දෙහොත් මුදුන් දී දෙලක්‍ෂ සතළිස් දහසක් සාධුකාර පූජාකොට ගියහ.

මෙසේ තමන්වහන්සේ බුදුව ලා බණ දෙශනා කෙරෙමි යි ප්‍රතිඥා දුන් පමණෙකින් දස දහසක් සක්වල දිව්‍යබ්‍රහ්මයන් කළා වූ මෙසා මහත් වූ පූජා ලත් හෙයිනුත්, මෙයේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනුත්, මුළුලොවට ගුරු වූ, මුළුලොවට මවු වූ, මුළුලොවට පිය වූ, මුළුලොවට පිහිට වූ, මුළුලොවට ආධාර වූ, මුළුලොවට කල්‍යාණ මිත්‍ර වූ, මුළුලොවට එකබන්ධු වූ, මුළුලොවට තිලක වූ, මුළුලොවට රසාඤ්ජන වූ, මුළුලොවට අමා වූ, මුළුලොවට චින්තාමාණික්‍ය වූ, මුළුලොවට නිධාන වූ, මාගේ සව මිදරුවූ බුදුරජාණෝ මේ මේ කාරණයෙන් අහීන් නම් වන සේක.

එසේ හෙයින් කියන ලදී:—

> පූජාවිසෙසං සහ පච්චයෙහි
> යසමා අයං අරහති ලොකනාථො,
> අත්‍ථානුරූපං අරහන්ති ලොකෙ
> තසමා ජිනො අරහති නාමමෙතං ති.

මේ පූජාවලියෙහි අප බුදුන් සඹ්බොධිමාරාධනාමෙහි අජපාල නිග්‍රොධ මූලයෙහි දී මහාබ්‍රහ්මයාගෙන් ලද සාධුනාද පූජාකථා නම් වූ

දොළොස් වන පරිච්ඡෙදය නිමි.

තෙළෙස් වන පරිච්ඡෙදය.

තව ද අප බුදුන් ධම්සක් පැවතුන් සූත්‍ර දෙශනාවෙහි දී ලද ඉසිපතනාරාම පූජා නම් කවරහ? යත්;

මෙසේ මාගේ සවාමිදරුවෝ බුදුව අනුක්‍රමයෙන් සත්සති යවා අටවන සතියෙහි අජපාල මූලයෙහි දී බ්‍රහ්මයාගේ ආරාධනාව ඉවසා පළමුවන ධම්දෙශනාව කවුරුන්ට උදෙසා දෙසම් දෝ හෝ යි සිතා මදුරා ආලාර–උද්දක නම් තාපසවරුන් දෙදෙනා ඉතා නුවණ ඇති සේ දැක, ඔහු දැන් කොයි මෙසෙක් දෝ හෝ යි බලන සේක් ආලාරයන් එවකට සත්වන දා මිය, උද්දකයන් ඊයේ වන දා මිය, දෙදෙනා ම බුදුන් දසදහසක් ඉපද ක් ගලවාගන

නො හැකි අරූතල බ්‍රහ්මලෝකයෙහි උපන් සේ දැන, ඔවුන් කෙරේ උපන් මහා කරුණා ඇති ව, තව ද අඤ්ඤා කොණ්ඩඤ්ඤයන් ආදි වූ පස්වග මහණුන් සතවුරුද්දක් මුළුල්ලෙහි මට මෙහෙ කොට බොහෝ දුක් ගත්තාහු, ඔහු දැන් කොයි වෙසෙත් දෝ හෝ යි බලා මිදුරා බරණැස් නුවර නිසා ඉසිපතන විහාරයෙහි වෙසෙති යි දැන පළමුවන මාගේ ධර්මදේශනාව ඔවුන් පස්දෙනා ප්‍රධාන කොට දේශනා කෙරෙමි යි සිතා වදාරා අටවන සතිය ගිය කල ඒ අජපාල මූලයෙන් නැගී වැඩ බෝමැඩ සමීපයෙහි තුදු සතර දා විසූ කල බුදු වූ සෑම දවසක් පිරී මාගේ ස්වාමිදරුවන්ගේ ප්‍රඥ නමැති චන්ද්‍රයා සැමකලාවෙන් සම්පූර්ණ වූ චන්ද්‍රයා සේ ම සම්පූර්ණ වී ය. එකල අනන්තාපරියන්ත වූ බුදුන් ධම්සක් පතුරුවා බස් වසන ඇසල මස මැදි පොහෝදිනය සම්ප්‍රාප්ත ව ඒ චන්ද්‍රයා ද සම්පූර්ණ වී ය. එ දා බෝමැඩ සිට දෙසැත්තෑ ගව්වක් දුරුමග ගෙමා ඉසිපතන විහාරයට ඒකචාරී හස්තිපොව්වකු සේ, ඒකචාරී සිංහ පොව්වකු සේ ඒ මග වඩනා සේක.

එ කල උපක නම් අජීවකයෙක් සන්හුන් ගමනින් එකලා ව වඩනා මාගේ ස්වාමිදරුවන් දැක, සඳරස් දුටු කුමුදුවිලක් සේ ඉතා ප්‍රසන්න වූයේ බුදුන් මුහුණ බලා, සියලඟින් දිව්‍ය සවණක් රස් හා දෙතිස් අසූ ලකුණු හා, ශ්‍රී මුඛයෙන් දිවන සඳ කැලුම් වන් බුදුරස් කඳ හා, සඳමඬුල්ලක් ලූ වා සේ සිසාරා සිටිනා බ්‍යාම ප්‍රභාමඬුලු හා පුන්සඳක් සේ දිලියෙන ශ්‍රී මුඛ ය දැක, "ස්වාමීනි, තෙපි නිශ්චල වූ ගුණ මිහිකතගෙන් ලදු ද? සථිර වූ ගුණ සතරන්මෙරින් ගතු ද? ගැඹුරු වූ ගුණ මහමුහුදින් ගතු ද? තෙජෝ ගුණ හිරු මඬලින් ගතු ද? සෞම්‍ය ගුණ සඳමඬලින් ගතු ද? අමාපිඩක් වැනි කෙණෙකු ව, මහපින් පිඩක් වැනි කෙණෙකු ම, සත රන් කඳක් සේ සොඳ කෙණෙකු ව, ශක්‍රයා නම් තෙපි ද? බ්‍රහ්මයා නම් තෙපි ද? තොප දුටු වේලෙහි පටන් මාගේ සිත ඉතා අමා පිරූ බඳනක් සේ සන්තොෂයෙන් ඉතිර ඉතා ප්‍රසන්න ය. හිමි! තෙපි කවුරුදැ? යි විචාළේ ය.

එ කල ස්වාමිදරුවෝ තමන් කෙරෙහි එදා ඔහු කළ සන්තොෂයෙන් මතු බොහෝ වැඩ වන සේ දැන තමන් වහන්සේ ද මඳ මඳ සිනා පහළකොට ඔහු මුහුණ බලා, "ආජීවක ය, මම ශක්‍රයා ත් නො වෙමි. බ්‍රහ්මයා ත් නො වෙමි. සම්මා සම්බුද්ධයෙමි. සියලු සංස්කාර ධර්මයන් සකසා නිමවා දනිමි. දුරුකළමනා ධර්මයන් යට අජටාකාශයට උඩ අජටාකාශය සේ දුරින් දුරුකෙළෙමි. භාවිත කළමනා ධර්මයන් හැම අල්ලා අමාපිඩක් සේ හැරගතිමි.

සදෙව්ලෝ වැසියන් මට කුලගෑණි කෙළෙමි. මා පා පිසපු කිසී පවා බ්‍රහ්මයාව මුදුන්මල් කෙළෙමි. දේවාතිදේව වීමි. ශක්‍රාතිශක්‍ර වීමි. බ්‍රහ්මාතිබ්‍රහ්ම වීමි. වන්‍දනීයාභිවන්‍දනීය වීමි. පූජනීයාභිපූජනීය වීමි. සද්ධර්මවරචක්‍රවර්තී වීමි. දෙවිබඹුන් අතින් මෙහෙ ගෙණපීමි. පස්මරුන් ජයගෙණපීමි. එසේ ජයගෙණ සිටි හෙයින්, ආජීවක ය! මට අනන්තජිනයෝ ය යි යෙති"යි වදාළ සේක. එ වේලෙහි ආජීවකතෙම බුදුන් කෙරෙහි අතිප්‍රසන්න ව "යහළු අනන්ත ජිනයෙහි, එසේ වී නම් අද පටන් තෙපි මාගේ යහළුහ. මතු තොප කරා මා ආ දවසෙක තොප මෙසේ පොහොසත් බැවින් මා රක්‍ෂා කරව් දැ? යි විචාළේ ය. සර්වාඥදරුවෝ තමන් වහන්සේ තිසා මතු ඔහට වන වැඩක් දැක මඳ සිනා පහළ කොට, "යහපත, දරුව! පලා එව. එ දවස් තොප රක්‍ෂා කරම්හ"යි වදාරා ඉසිපතනාරාමයට වැඩි සේක.

ඕහු පසු ව බුදුන් කරා ආ පරිදි කෙසේ ද? යත්; එදවස් ඒ ආජීවකතෙම ඒ බරණැසින් ගොස් මහා ප්‍රත්‍යන්තයෙහි වූ වංගහාර නම් දනව්වකට පැමිණ එහි එක්තරා එක් වැදිගමක් මැද කිසිල්ලවු නගා හිනමසින් මත්තට පිළි හැඳ ආජීවක වෙසින් කරබාගෙණ සිටියේ ය. එ කල ඒ ගම් නෝසාඳ ජනයෝ ඔහු දුටු කොල මොහු කවුරු ද?යි ඒ ඒ දිගින් දිව අවුත් ඔහු සිසාරා විස්මය පත් ව සිට තෙපි කවුරු ද?යි විචාළහ. ආජීවක කියනුයේ, ගිහි මිනිසුන් සේ ලජ්ජා වසා පිළි නො හඳුම්හ. අපි තපස් රක්‍ෂා කරම්හ. ලජ්ජාවෙන් අඩියක් පාලනය කරණ හෙයින් අඩිපාල නම් රහතුම්හ යි කී ය. එ කල මනුෂ්‍යයෝ "මොහු මහා බලවත් කෙණෙක, ලජ්ජා පමණකු ත් නැත්තාහ. එසේ හෙයින් සෙසු පාපයෝ වූකලි මොහුගේ සන්තානයෙහි නැත්තාහු ම ය"යි කියා පැහැද රහතුන්ට වඳිම්සි කියා වඳිති පුදති සත්කාර කෙරෙති. එකල එ ගම වැදි මුදලි තෙම ඔහු කෙරේ පැහැද උපස්ථාන කෙරෙයි. ඒ දනව්වෙහි තල් ඇට සා මක්‍ෂිකා ජාතියෙක් බෙහෙව. ඔහු මිනිසුන් වෙතෙහි දී අසුකළ කල සියලඟ සිරුලා අදිනා සේ ලේ උරා බී පුවක්පත්කඩ සේ මිරා හෙළා පියති. එසේ හෙයින් ඒ දනව්වෙහි සත්ත්වයෝ ඒ මැස්සන් බොහෝවූ සමයෙහි මහ සැලවල් ගුහා සේ කරවා එහි වසන්නාහුය. එසේ හෙයින් ඕහට ද මේ වෙතෙහි මැස්සන්ගෙන් උපද්‍රවයක් නො වන සේ වලගෙයක් නංවා ඒ ගෙයි මහත්වූ සැලක් කරවා ඒ සැලෑ ඔහු ට පිඩානයකින් වසා දවසින් දවස දන් දෙති.

එ කල ඒ වැද්දහුගේ ජාවි නම් දුවක් ඇත. මෙ තෙමේ දවසෙක ඇ දක්ක ඇ කෙරේ කාමතෘෂ්ණා බැද නො කා නො බී කීප දවසක් නිරාහාරයෙන් හුන්නේ ය. එ කල ඒ වැදි තෙම බැහැරෙක ගොස් ගෙම අවුත් මාගේ රහතන් වහන්සේ කුමක් කොට හුන් සේක් දැ යි විචාරා අඹුවන් හා දුව 'ඔවුන් අපි තුන් සතර දවසක් නු දුටුම්හ. දෙරව ගිය නො ආමෝ ය'යි කී කල්හි ඒ වැදි පුත් කම්පිත වූ සිත් ඇති ව ඔහු කරා ගොස් වැද 'හිමි තුඹට කෙබඳුවූ ව්‍යාධියෙක් ද, මෙතෙක් දවස් සිඟා නො වැඩිය සේක් වන. වැහැර ගිය සේක් දැ'යි විචාළේ ය. එ වේලෙහි ආජීවක කියනුයේ "මට අතික් ව්‍යාධියෙක් නැත. බොහෝ දවසක් තපස් කොට විඩාව ගියෙමි. එක දවස තපස් කොටගත නො හෙමි. තොපගේ ජාවි නම් දුව මට පාවා දෙව් නම් තොප කෙරේ වෙසෙමි. එසේ නො කලා නම් මා රැකෙති යි නො සිතව"යි කී ය. එ වේලෙහි වැදි පිත් කියනුයේ: තපස්කිරීම් නම් පළිබෝධ නැතියේ ය. ගිහි ගෙයි විසීම් නම් බොහෝ සම්පත් උපදවා පළිබෝධයෙන් විසුව මැනව. එක් ශාස්ත්‍රයක් දැනමුත් ගෘහවාසය බැරිම ය. තුඹ දන්නා ශාස්ත්‍ර කිම්දැ"යි විචාළේ ය.

ආජීවක කියනුයේ: "මා දන්නා ශාස්ත්‍ර නැත. තොප පස්සෙ දල්කත් පත්කත් හැදගෙණ යෙමි. සතුන් මරාලූ කල මස්කත් ගෙණ යෙමි. මෙතෙක් ශාස්ත්‍ර මදදැ"යි කී ය. එවේලෙහි වැදිපුත් 'මේ මහා මුග්ධයෙක, ම දුව නො ලත් නම් මූ මියයත බවත් සබා ම ය, මූ මියයාමෙන් ප්‍රයෝජන නැත. මට මෙනෙ කෙරේ නම් එක් ප්‍රයෝජනයෙක් ම වේදැ'යි සිතා යහපතැ යි ගිවිස එ වේලෙහි තමාගේ උත්තරසාටක ය ඕනව දී පරිබ්‍රාජක වෙස් හැර වැදිවෙස් ගන්වා තමාගේ ගෙට ගෙණ ගොස් ජාවි නම් දුව සරණ දින. එ තැන් පටන් එතෙම එක් වේලෙක මහීලා සිත් ගන්මි යි දල්කත් පත්කත් මස්කත් අදී. එක් වේලෙක නැන්දා සිත් ගන්මි යි දරඹිළි පලාඹිළි ආදි ය ඇද දෙයි, එක් වේලෙක අඹුව සිත් ගන්මි යි වී සාල් පැර දී පැන්කත් ඇද දී නොයෙක් කර්මාන්ත කෙරෙයි. නොබෝ කලකින් මෙසේ දුක් ගැන්මෙන් තෙමේ ඉතා ම ජරා වී ය. ජාවි නම් අඹු ඕහට සඳක නම් පුතකු වදා එතැන් පටන් පුතු වඩාගෙණ නොමෝ ඔහු කෙරේ හිද මොහු අතින් ම සියලු කර්මාන්ත කරව යි. පුතු හඬවන කල මොහු ඇසිය දී 'මස්කත් අදිනා කත් පුමයගේ පුත නොහඬ'යි කිය කියා මෝහව බැණ බැණ පුතු නලව යි. එ කල ඒ තෙම ලජ්ජා ඇති ව: "තෙළි

තෝ මා නිරාශ්‍රය වූ එ කල්හි එතකු ය යි සිතයි ද? මම නිරාශ්‍රය එකෙක්ම නො වෙමි. අනන්ත ජිනයෝ ය යි යන මාගේ සෙහෙලත්තු කෙනෙක් ඉතා බලවත්හ. මෙසේ හෙයින් මට බෙණෙයි නම් මම ඔවුන් කරා පලා යෙමි" කී ය.

එ කල ජාවි ඔහුගේ බස් අසා "මෝහට මා කියන බස් ප්‍රිය නොවන මන, මොහු ජරාපත් මහල්ලා නිසා යෞවන පුරුෂයෝ මා කරා නො එළැඹෙති. මෝහට නොයෙක් සන්තාවුළු බස් කියා බැණ මොහු පලවා පියා සිත් සේ වෙසෙමි"යි සිතා එ තැන් පටන් දවසින් දවස පුතු නොමෝ ම හඩ ව හඩවා ලා පුතු නලවන ව්‍යාජ යෙන් "මස් වැද්දහුගේ පුත නොහඬ. සත් අදනා සුමයගේ පුත නො හඬ, මූඩාගේ පුත නොහඬ, කෙළකොල්ලගේ පුත නොහඬ" යනාදීන් කිය කියා මෝහට බැණ එතාමිතු ව ලජ්ජාකර වයි. එ කල එ තෙම ඇගේ නින්දාකිරීමෙන් ඉතා මහත් වූ ලජ්ජා ඇතිව අඹුව හා පුතු හැර ගිහිගෙයි කලකිරී හැදිමගිලන්ට ක් ෂො කියා ඒ දනව්ව හැර පෙර ගිය සලකුණෙන් බරණැස් වැද අනන්ත ජිනයෝ කොයි ද යි දුටු දුටුවන් අතින් විචාරයි. සමහරු එනම් කෙණෙකුන් අපි නුදුටුම්හයි කියති. සමහරු කෙසේ වූ කෙණෙක් ද යි විචාරති. ඔහු ඉතා සන්තොෂ කෙණෙක, උන් වැනි කෙණෙක් නැත. අසවල්හු වැනියෝ ය යි කිය නො හෙමි, ඔහු තුමූ ම තමන් වැනි කෙණෙක, අමා කඳක් වැනි කෙණෙක, කප්රුකක් වැනි කෙණෙක, සිතුමිණිරුවනක් වැනි කෙණෙක, ගහරන් පිඩක් වැනි කෙණෙක, සුපිපි පියුමක් වන් මුවපියුමක් ඇති කෙණෙක, විදුලිය වන් කන්වැල් සඟලක් ඇති කෙණෙක, නලළැ මිකුල් තිලකයක් වන් ඌණීරෝමයක් ඇති කෙණෙක, කන් සුවඳින් පිරුණාවූ ශ්‍රී මුඛයක් ඇති කෙණෙක, සඳවලාකඩක් වන් රත් සිවුරක් ඇති කෙණෙක, ඇත් ගමනක් වන් සන්හිඳි යන ලීලා සම්පන්න වූ ගමන් ඇති කෙණෙක, මිහිරි වූ කට හඬ ඇති කෙණෙක, දෙතිස් අසූලකුණු ඇති කෙණෙක, සියලඟින් නිකුත් සවණක් රැස් ඇති කෙණෙක, ඔහු හිරුට වඩිති, සඳුට වඩිති, දෙවියන්ට වඩිති, බඹුන්ට වඩිති, අනන්තජිනයෝ ය යි කියති, මෙම බරණැස දී එක් සමයෙක, අතර මගදී මග යන්නවුන් දිටිමි. ඔහු දැන් කොයි වෙසෙද් ද"යි විචාළේ ය.

එ කල නුවණැති සත්ත්වයෝ මොහු කියන සලකුණෙන් බුදුන් විචාරණ බව් දැන එ වකට බුදුන් දෙවුරම් වෙහෙර වැඩ වසන කල් හෙයින් කොසොල් රජුගේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර යොයි දැනගන්ව යි කීහ.

එ කල ස්වාමිදරුවෝ ඔහු තමන් වහන්සේ කරා එන කල් දැන මහණෙනි! අනන්තජිනයෝ කොයිදැයි විචාළ කෙනෙක් ඇත් නම් ඔහු මා කරා ගෙණෙවයි වදාළ සේක. එ සමයෙහි ඕතෙමේ දෙව්රම් වෙහෙර දොරටුවට ගොස් සිට අනන්තජිනයෝ නම් වූ මාගේ රූපත් යහළුවෝ කොයිදැ"යි කී ය. පෙර බුදුන් අතින් නියොග ලත් භික්ෂූන් වහන්සේ ඔහු ගෙණ ගොස් බුදුන් දැක්වූ සේක. හෙ තෙමේ බුදුන් දක සමීකාලයෙක අම්බා විලෙහි ගැලෙන්නවුන් සේ බුදුන් දුටු සිත් සේ මැද පෙරළී 'අනන්තජිනයෙනි, මා හඳුනාදැ'යි විචාළේ ය. එ වේලෙහි ස්වාමිදරුවෝ ඔහු කෙරෙහි උපන් මහත් කුළුණු ඇති ව 'එසේ ය උපකයෙනි, තොප හඳුනම්හ. එ දවස් බෝමැඩ ඉසිපතනයට යනුවමෝ අතරමඟ දී තොප දුටුවම්හ වේද, මෙතෙක් දවස් කොයි විසූදැ යි වදාළ සේක. හෙ තෙමේ තමා වංගහාර නම් දනව්වෙහි විසූ නියාව ත්, චාවි නම් කාන්තාවක් රක්ෂාකොට භද්දක නම් පුත්‍රයා ලත් නියාව ත්, ඈගේ අවඥාවෙන් ගෘහවාසයෙහි කලකිරී බුදුන් කරා දෙව්රම් වෙහෙරට තමා ආ නියාවත් බුදුන්ට දැන්වී ය. එයින් කීහ:-

චාවිකාය භද්දකං හිත්වා–අනන්තජින සන්තිකං
වංගහාර ජනපදා උපකො ජේතවනං ගතො.

ඉක්බිත්තෙන් උපක නම් ආජීවක "ස්වාමිනි, අනන්තජිනයෙනි, මා තොප කෙරේ මහණ කරවාගණුව"යි කීය. ස්වාමිදරුවෝ වදාරණ සේක් "තෝ ඉතා මහල්ලෙහි ය. මාගේ ශාසනයෙහි මහණ ධම් පුරනට වේදැ" යි වදාළ සේක. "මහණකොට පුරම්! ස්වාමීනි යි" කී ය. එ වේලෙහි බුදුහු ඔහු මහණකරවා උපසම්පදා සීලය දී ඔහුට තරම්වූ කම්මටහන් උගන්වා වදාළ සේක. එ කල විදර්ශනා වඩා නොබෝ දවසකින් අනාගාමී ව උපක නම් මහතෙර ව බුදුසසුන් හොබවා බුදුන්ට සම්‍යක් ප්‍රතිපත්තින් පූජාකොට ආයු කෙළවර ඉඩ දහසක් කපට ආයු ඇති අවිහ නම් සුද්ධාවාස බඹලොව දෙලොස් යොදුන් බ්‍රහ්මාත්ම භාවයකින් ඉපද, උපන් කෙණෙහි ම රහත් ව දස ඇඟිල්ලෙන් දිවූ දසරශ්මීන් දසදහසක් සක්වළ එළු කරණ තරම් මහත් වූ ආනුභාව ඇති ව දූන් දක්වා සුව විඳිනාහු ය. ඔහු මතු නො වෙසි. අපගේ මේ බුද්ධෝත්පාදයෙහි සද්දෙනෙක් මෙහි දී අනාගාමි ව ගොස් එම බඹලොව ඉපද උපන් කෙණෙහි ම රහත් ව දහසක් කප් බ්‍රහ්මසුව විඳිනාහු ය. වදාළේ මැනෙවි:—

අවිහං උපපන්නාසෙ-විමුත්තා සත්ත භික්ඛවො,
රාගදොස පරික්ඛීණා-තිණ්ණා ලොකෙ විසත්තිකං,

උපකො පලගණ්ඩො ච-පුක්කුසාති ච තෙ තයො,
භද්දියො ඛණ්ඩ දෙවො ච-බාහුදන්ති ච පිඞ්ගියො;
තෙ හිත්වා මානුසං දෙහං-දිබ්බං යොගං උපච්චගුං-ති.

මෙසේ ඕහට මතු වන වැඩ දැන අවලෝස් යොදුන් මඟ ගෙවා ශ්‍රීපාදයෙන් වැඩ එ දවස් ඔහු හා සමඟ මෙතෙක් කථාකොට මාගේ ස්වාමිදරුවෝ බරණැස ඉසිපතනාරාමයට එදා සවස වැඩි සේක.

එ කල පස්වග මහණහු දුරින් වඩනා බුදුන් දැක; "භවත් ගෞතමයෝ දුෂ්කර ක්‍රියා හැරපියා තමන් රජකුලෙන් මහණ වූ හෙයින් සුඛිතයන් විසින් දෙනලද මිහිරවූ ආහාරය අනුභවකොට ඡවි පහස් ලදින් දුන් ප්‍රභා සම්පන්නව රන්කඳක් සේ ව ගියාහුය. බඩ පුරා කන බත් හෙයින් මුඛ සන්තෝෂ ඇඟි ව යහපත් වූයේ නොයෙක් උත්සාහ කොට බුදු විය නො හී දුන් අප කරා එමින් සිටියහ. ඔහු රජ කුලෙහි උපන් බැවින් හිඳිනා අසුන් පමණක් දෙම්හ. හුනස්නෙන් නොනැඟෙම්හ, පෙර ගමන් නො කරම්හ. පෙර සේ ඔහු අපි නො වඳුම් හ"යි කතිකා කළහ.

එ කල මාගේ ස්වාමිදරුවෝ ඒ භික්ෂූන්ගේ අදහස් දැන එකොළොස් දහස් පන්සියක් මහා ගඞ්ගාවන් පසඳුව මහා ගඞ්ගාවට මෙහෙයා ලූවා සේ, අනන්තාපරියන්ත වූ සත්ත්වලොකයෙහි පැතිර සිටිනා මහා මෛත්‍රී නමැති ජලප්‍රවාහය ඒ පස්දෙනා කරා ම මෙහෙයාලූ සේක. එ වේලෙහි සැඩවතුරෙහි මල පරඬලාපත් තුඹු පලෙහි තිබිය නොහී ඉපිල පැනනැංගා සේ බුදුන් මෛත්‍රී කරත් කරත් තමන් කරා වඩුත් වඩුත් බුදුරස් පෙළින් පෙළ ගී තමන් කරා වදුත් වදුත් පස්දෙන ම හුනස්නෙහි හිඳ ගත නො හී සෙල් වී පැන නැංගාහ. ස්වාමිදරුවන් ලඟට වඩුත් වඩුත් බුඹ තෙජසින් සිට ගත නො හී පෙරමඟට ගොස්, තව ද සිටගත නො හී, බුදුන් මැද පෙරළී පාසිවුරු අතින්ගෙණ හිඳිනා අසුන් පණවා ආදරයෙන් ශ්‍රීපාදය මැද සෝධා ඇඟට පත්සලා පැන් පවස් විචාරා බුදුන් බුදුවූ බව නො දැන සාමීචි කථා කරන්නාහු "ආවුසො" වාදයෙන් සම සමයන් සේ කථා කෙරෙති. එ කල සවමිදරුවෝ මේ භික්ෂූහු මා බුදුවූ බව් නො දනිති. මා හා සම කෙනකුන් ලොකයෙහි නැති බව නො දනිති, මම ම මා බුදු වූ

බව මොවුන්ට හඟවමි' යි සිතා "මහණෙනි සව් සමයන් හා කථා කරන්නා සේ ලොවුතුරා බුදුන් හා කථා නො කරව. මරසෙන් බිඳහැරපීමි. වසවත් මර මන් බිඳපීමි. ගිරිමෙවුලා මතු'තු දත තිම අන්වාපීමි. එ කොළොස් මහා යුද්ධයෙහි ජයගතිමි. මරු දූවූ චක්‍රායුධය පාකිහි කොළෙමි. මහපොළව ගුගුරුවාපීමි. මහ මෙර සක්වළගල් කටවාපීමි. දෙව් බඹ කැලන් කළ පූජා විඳපීමි. මරගතන් සලවාපීමි. මහබඹුන් ලවා සාධුකාර දෙවාපීමි. මහණෙනි! සව්නන් ගෙවා බුදුව තුන්ලෝ මුදුන්පත්වීමි. තොප හැමදෙනාගේ සැක හැර අද ර් ධම්සක් දෙසුම් අසා බලව" යි වදාළසේක.

එබස් අසා සස්වග මහණහු බුද්ධතෙජසින් වෙවුලා කෙශර සිංහයක්හු දුටු ඇත්ඇමවුන් සේ දිම් දළු සෙ තො සොල්වා එකත්පස් ව උන්හ. එ වේලෙහි සවාමි දරුවාතන් වහන්සේ අනන්තා පරිශනන වූ බුදුන් ධමසක් දෙසත දෑ මැඩසිඳිනාවූ ධම්මහුම්යෙහි පැනනැගි බුබාසයාගෙක් විය. මහමුහුද රළ පෙළ මැඩ අඳුරු විදහා උදයපර්වතයට පැන නැංගාවූ සම පුණ් යොදුන් ඒ නිරු මඩල සේ බුද්ධාසනයට පැනනැගී සිංහලගිය් බුදුරස් කඳ හරින්ට පටන්ගත් සේක. දිවූ බුදුරැස් බඹලොව ගැසී සක්වළගලින් සක්වළ ගලට පැන පැන දිවත්නට පටන්ගත. එ කෙණෙහි තිශා නමැති කාන්තාව කරුපෙළ නමැති ගෙළ මුතුදම් පැලඳ, තිල්වලා නමැති කෙස්මැඩ තකා, දික් නමැති හසනයෙන් සඳරස් නමැති දිවසළු විදු හැඳ, බඹලෝ නමැති මිණිඔටුනු දරා, තුන්ලෝ නමැති ඇඟ සොල්වා, කොමඬ නමැති ඇස් දල්වා, හාඩගනාද නමැති ගායනා පතුරුවා, මාගේ සවාමිදරුවන් වහන්සේ පළමුවන මඟුල් බණ පූජාවට මෙන් ලීලොපෙත ව සැරහී සිටගත.

එ කෙණෙහි ම ඇව ම අලඞකාර වූ රුවන්තෝඩු දෙකක් තිබුවා සේ සම්පුණ් යොදුන් නිරුමඩල පශ්චිම චක්‍රවාට කණීය සරහා සිටගත. පූර්වචක්‍රවාට කණීයෙන් පැනනැගි එතුන් පුණ් යොදුන් සඳමඩල ප්‍රභා විහිදුවමින් සිටගත. එ කෙණෙහි මාගේ සවාමිදරුවන්ගේ ධම්දෙශනා කාලය සම්ප්‍රාප්ත වී ය. මෙරගල නවා පැනනැංග සත්කුළ පව්වෝ බුදුන් දසා වට මැඳුම් ගත්හ. සක්වළගල සක් වලල්ලක් සේ බමා ලී ය. මහමුහුද ඇඳ සඳුලු ඛෙරයක් සේ රළ සන්හිඳී පස්පියුමෙන් සැදී ගි ය. මහ පොළොව සෙලවී පැනනැංග, මේ ආදි වූ දෙතිස් මහා පූර්ව නිමිතන පූජාවෝ ද මඟුල් බණව පහළ වූහ.

එ කෙණෙහි දසදහසක් සක්වල දිව්‍යබ්‍රහ්මයෝ ‘අපගේ ස්වාමිදරුවෝ දහම් අමාවතුරෙකි අප නැම් ගලා සංසාරදුක් නමැති මහ ගිම් නිවති. ඔහුගේ දහම් අමාරස බොන්නට යම්හ' යි කියා දසදහසක් ලොව අසුරයන් වන් ශක්‍රපුරය සේ ඇලලු, දසදහසක් සක්වළ දිව්‍ය නාගයෝ කඩුපුල්මල් මිටි ගෙණ දිවූ ය. ගරුඩයෝ මහ පියුම් තුඩින් කඩාගෙණ දිවූ ය. ගන්ධර්වයෝ තූර්‍ය්‍යභාණ්ඩ ගෙණ දිවූ ය. අසුරයෝ පලොල්මල් ගෙණ දිවූ ය. දෙවියෝ පරසතුමල් ආදිවූ නන් විසිතුරු දිවමල්ගෙණ දිවූ ය. බ්‍රහ්මයෝ සේසත් ගෙණ දිවූ ය. දසදහසක් සක්වළ මුළුල්ලෙහි සඳගිරුදෙවියෝ දිවූ ය. පළමුව දිවූ පිරිස ගව්වක් සා තැන සැට සැත්තෑම බැගින් සිටියහ. දෙවනුව දෙවියන් එක් එක් අල්ලක් සා තැන අසූවක් අනූවක් බැගින් සිටියහ. තුන්වෙනුව දෙවියන් එක් එක් අහලක් සා තැන සියයක් දහසක් බැගින් සිටියහ. සතරවෙනුව දෙවියන් එක් එක් ඉදිකටු මලක් සා තැන සියයක් දහසක් බැගින් සිටියහ. පස්වනුව දෙවියන් එක් එක් ඉදිකටු අගක් සා තැන දහසක් බැගින් සිටියහ. සවනුව දෙවියන් එක් එක් එම සා තැන සුවහසක් සුවහසක් බැගින් සිටියහ. මෙසේ දස දහසක් සක්වළ මුළුල්ලෙහි සැටදහසක් කාමාවචර දිව්‍යලෝකවල දෙවියන් තමන් තමන්ගේ දෙව්ලෝ සිස්කොට ගහනව අවුත් හිවි ගැවසී සිටගත් වේලෙහි;

තව ද දසදහසක් සක්වළ අරූතල අසඤ්ඤ තලයන් හැර එක් ලක්ෂ පණස් දහසක් රූපාවචර බ්‍රහ්මලෝකවල එක බ්‍රහ්මයකු ත් නොරඳා දෙළොස් යොදුන් උස ඇති ඒ සා බ්‍රහ්මසේනාව තුන් යොදුන් ගවු සා සේසත් ගෙණ අවුත් සිටගත්හ. යහලක් පමණ ධාන්‍යයන් එක ලාහස්සෙක නො ගන්නා සේ මෙසා සක්වළ ගබ සතර රියන් ගබඩා සුගක් සේ අවකාශ මිඳ වී ය. එ කල දෙවියෝ සත්වනුව එක බ්‍රහ්මසේනා දක නව ද සියුම් වෙස් මවාගෙණ කෙස් ලොම් අගක් සා තැන සැට සැත්තෑ අසූ අනූ බැගින් සිට ගත්හ. මෙසේ සිටි දිව්‍ය-බ්‍රහ්ම සේනා සක්වළ ගල පරියන්ත ව අකනිට්ඨා බඹලොව දක්වා නළෙක පුරාලූ රන්සුණු සමූහයක් සේ අවකාශයක් නැති ව ම සිට ගත්හ. බඹලෝ සිට වට පැලක් සා ගලක් හෙළාපි කල සාරමස් දෙපෝයකින් අවුත් පොළොවට පැමිණෙයි. මෙසේ දුරු වූ අවකාශය මාගේ බුදුන්ගේ පළමුවන මිඟුල් බණෙහි පිරිස් ගහනයෙන් මෙසේ අස්ලෙමක් සා තැනු ත් අවකාශයක් නැති ව සිටගත්තා වූ බණපිරිස ම ය.

තව ද බුදුන් මැඩහුන් බුද්ධාසනයේ පටන් බ්‍රහ්මාණ්ඩය දක්වා බුදුන් සිරසින් පැනනැඟි බුදුරස් කඳට ම අවකාශ වි ය. විම නොක් වේව යි, දෙව් බඹ කෙනෙක් වේව යි බුදුරස් කඳෙහි නො ගැවෙන්නාහු ම ය ඉක්බිත්තෙන් ස්වාමිදරුවන් සිරසට පිදූ සඳම්බුලු සේ දස දහසක් මහාබ්‍රහ්මයෝ දස දහසක් සේසත් මතු මතුයෙහි කබා සිටි ගත්හ. දස දහසක් ශක්‍රයෝ බුදුන්ගේ යසරැස් උරා බොන්නවුන් සේ දස දහසක් ජයසක් තුඩ තබාගෙණ පිඹින්ට පටන්ගත්හ. දස දහසක් සුයාම දෙව්යෝ දස දහසක් චාමර සලති දස දහසක් සන්තුසිත දෙව්යෝ දස දහසක් මිණි තල් වැට සලති. සෙසු දෙව්යෝ රන් තොරණ මිණි තොරණ රන් ඇගෑ මිණි ඇගෑ රන් පියුම් රුවන් පියුම් රන් මල් රුවන් මල් රන් කරඬු රුවන් කරඬු රන් සුණු රුවන් සුණු මුතු සුණු රන් දම් රුවන් දම් මුතු දම් ආදිවූ පූජා භාණ්ඩ ගෙණ සිට පූජාකරන්ට පටන් ගත්හ. එ කල දෙවියන්ගේ පූජා කොලාහලයෙන් බ්‍රහ්මාණ්ඩ ය දක්වා ගැවසී ගත් මුහුදු ගිගුමක් සේ එකනින්නාද වි ය. දෙවියන්ගේ අරගලය සන්සිඳුවා ලන්ට සමත් අන් කිසි සත්ත්වයෙක් නැත් ම ය. බුදුන් වමා සිටි දස දහසක් ශක්‍රයෝ ඒ තමන් කල මහා ධුරයක් හෙයින් දස දහසක් දකුණු සක් පිඹ සක් පිට වතුරුවා ගෙණ විසි දහසක් අත් ඔසවා එකවිට අත්පොළසන් දී 'බ ! භෝ බණ පිරිස සන්සිඳෙව'යි කියා තුන්ලෝ වෙවුල්වා බැණ කැංගාහ එ වේලෙහි ඒ ශක්‍රඝෝෂාව අසා තුන්ලෝ පුරා සිටි දෙව් බඹ පිරිස් රළ නැති මුහුදක් සේ නිශ්ශබ්ද වූහ එ කෙණෙහි දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝනකඩ බොල් මිහ පොළොව සාධුකාර දින.

මාගේ ස්වාමිදරුවෝ ඒ මිහිකාන්දය හා සමග තමන් වහන්සේගේ පාරමිතා නමැති දියෙන් පිරුණාවූ, බුද්ධඥාන නමැති සූර්‍ය්‍යකාන්තියෙන් ප්‍රබෝධ වූ, සුරකත වූ ජිහ්වා ධාතු නමැති කෙමි ඇති දන්තධාතු නමැති කෙසුරු ඇති, සුරකත වූ ඔෂ්ඨධාතු නමැති පත්‍ර ඇති, සද්ධර්ම නමැති මධුබින්දු ඇති, ශ්‍රීමත් වූ මුඛපද්මය විවෘත කොට බැණනැඟි බසින් දිවූ සුවඳ ගඳින් සිංලූ බණ පිරිස සුවඳ පිඩක් සේ කෙරෙමින්; "ද්වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා යො චායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො යො චා'යං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො එතෙ තෙ භික්ඛවෙ උභො. අන්තෙ අනුපගම්ම

මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති" යනාදීන් ධම්සක් පැවතුම් සූත්‍ර දේශනාවට පටන්ගත්සේක.

එ කල පූර්ව චක්‍රවාඩයෙහි සිටි දෙවියෝ බුදුහු අප මුහුණ බලා බලා ම සිදු බණ දෙසති යි සිතති. දක්ෂිණ චක්‍රවාඩයෙහි සිටි දෙවියෝ බුදුහු දකුණුදිග් බලා ම වැඩහුන්සේකැ යි සිතති. පශ්චිම චක්‍රවාඩයෙහි සිටි දෙවියෝ බුදුහු පශ්චිම දිග් බලා ම වැඩහුන් සේකැ යි සිතති. උත්තර චක්‍රවාඩයෙහි සිටි දෙවියෝ බුදුහු උතුරු දිග් බලා ම වැඩහුන්සේකැ යි සිතති. දස දිග සිටි දෙවියෝ තමන් තමන් දිශාවට මුහුණ ලා වැඩහුන් සේකැ යි සිත සිතා පිණ පිණා ම බණ අසති. සදෙව්ලොව සිටි දෙවියෝ සාම තමන්ගේ දිව්‍යලෝකයෙහි දී ම බණ වදාරණසේකැ යි සිත සිතා ම සතුටු සතුටු ව ම අසන්නාහු ය. බ්‍රහ්මලොකවල සිට බණ අසන බ්‍රහ්මයෝ තමන් තමන්ගේ බඹලොව දී ම වදාරණ බණෙකැ යි සිත සිතා විඳ විඳ අසති. බුදුහු නම් සඳ සේ උපමා ඇති සේක. යම් සේ ගුවන් මුදුනෙහි දිලියෙන්නාවූ සඳ බැලු බැලූ සතුන්ගෙන් අභිමුඛ යට ම පෙණේ ද, ඉවත් ව නො පෙණේ ද, එසෙයින් ම මාගේ ස්වාමිදරුවෝ ත් තමන් වහන්සේ සියලු සතුන් කෙරෙහි සම ව පවත්නාවූ මහා කරුණා ඇති හෙයින් සියලු සතුන් අභිමුඛයට ම පෙණ පෙණී සියලු සතුන්ගේ සිත් තමන් වහන්සේ කරා ම ඇද ඇද සියලු සතුන්ගේ ඇස් තමන්වහන්සේගේ ඇඟ් හමුවට ඇද සියලු සතුන්ගේ ප්‍රෙම නමැති මහා ගඞ්ගාවන් තමන් වහන්සේගේ රූප නමැති මහ මුහුදට ඇද ප්‍රේම වඩ වඩා බණ වදාරණ සේක්ම ය.

තව ද අකනිට්ඨා බඹ ලොව සිට බණ අසන්නාවූ, දෙලොස් යොදුන් උස ඇති මහා බ්‍රහ්මයෝ දෙලොස් රියන් උසින් මිනිස් ලොව වැඩහිඳ බණ වදාරන්නාවූ මාගේ ස්වාමිදරුවූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛය පුන්සඳක් බලන්නවුන් සේ කර ඔසව ඔසවා බල බලා බණ අසන්නාහු ම ය. අනවලෝ මුදුන් ධාතුව සඳ මතුපිට නො දක්නවුන් සේ එක කෙණෙකුත් නො ම දක්නාහු ය. එ දා තබා ස්වාමිදරුවන් බුදුව වැඩහුන් පන්සාළිස් හවුරුද්ද මුළුල්ලෙහි ම කිසි දෙවියෙක් බ්‍රහ්මයෙක් මාරෙක් ඒ අනවලෝ මුදුන් ධාතුව නුදුටුයේ ම ය.

එ වේලෙහි පොළොම පටන් බඹලොව දක්වා ගැවසී සිටින මේ සා බණ පිරිසෙහි මේ සත්ත්වයා රාග චරිතය, මේ සත්ත්වයා ද්වෙෂ චරිතය, මේ සත්ත්වයා මෝහ චරිතය, මේ සත්ත්වයා ශ්‍රද්ධා චරිතය, මේ සත්ත්වයා බුද්ධි චරිතය, මේ සත්ත්වයා විතර්ක චරිතය, යනාදීන් එකි එකී සත්ත්වයකුගේ සිත් නොසැමක් නොසැවක් තියායෙන් වෙන වෙන ම චරිත බලා වදාරණ සේක්ම ය. තව ද මේ බ්‍රහ්මයා සිතුයේ මේ ය, මේ දිව්‍යයා සිතුයේ මේ ය, මේ අසුරයා සිතුයේ මේ ය, මේ ගන්ධර්වයා සිතුයේ මේ ය, මේ සිද්ධ විද්‍යාධරයා සිතුයේ මේ ය, මේ මේඝවලාහකයා සිතුයේ මේ ය, මේ නාග සුපර්ණයා සිතුයේ මේ ය, මේ ස්ත්‍රී මේ පුරුෂයා සිතුයේ මේ ය, මේ අපාද විපාදයා සිතුයේ මේ ය, මේ චතුෂ්පාදයා සිතුයේ මේ ය, මේ බහුප්පාදයා සිතුයේ මේ ය, යටත් වශයෙන් මේ පණු පැණියා සිතුයේ මේ ය, මේ කූරැකුහුඹුවා සිතුයේ මේ ය යි යනාදීන් සියලු සතුන්ගේ සිත් දැන බණ වදාරණ සේක් ම ය.

තව ද මාගේ ස්වාමිදරුවන් එක මාගධික ශබ්දයෙන් වදාරන් නාවූ බණ බ්‍රහ්මයෝ බ්‍රහ්ම භාෂාවෙන් කියති යි සිතති. දිව්‍යයෝ දිව්‍ය භාෂාවෙන් කියති යි සිතති. අසුරයෝ අසුර භාෂාවෙන් කියති යි සිතති, නාගයෝ නාග භාෂාවෙන් කියති යි සිතති. ගරුඩයෝ ගරුඩ භාෂාවෙන් කියති යි සිතති. මනුෂ්‍යයෝ වෙන වෙන තමන් තමන්ගේ නො එක් මනුෂ්‍යභාෂාවෙන් කියති යි සිතති. සිවුපාවෝ තමන් තමන්ගේ භාෂාවෙන් කියති යි සිතති, හංස මයුරාදි පක්ෂීහු තමන් තමන්ගේ භාෂාවෙන් කියති යි සිතති. යටත් වශයෙන් සියලු ක්ෂුද්‍ර ප්‍රාණීහු තමන් තමන්ගේ භාෂාවෙන් කියති යි සිතති කූරැකුහුඹු පිණි පැණි ආදි වූ සූක්ෂ්ම ප්‍රාණීහු තමන් තමන්ගේ භාෂාවෙන් කියති යි සිතා විඳ විඳ අසති. මෙසේ සියලු සතුන්ගේ භාෂානුකූල ව බණ වදාරණසේක්ම ය. මේ සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි ඉස් දී, මස් දී, ඇස් දී, ලේ දී, අඹු දරුවන් දී, රාජ්‍ය දී, උතුම් වූ ධන දී, කළ පාරමිතාවන්ගේ ආනුභාවයෙන් ජනිත වූ පින් සම්භාරයන් හෙයින් මාගේ ස්වාමිදරු වූ බුදුරජාණන් වහන්සේගේ මේ අසාධාරණ වූ බුද්ධානුභාවය හා බුද්ධඥාන හා බුද්ධවික්‍රම හා බුද්ධශ්‍රී අචින්ත්‍ය ම ය. අසදෘශ ම ය. ඔබ සේ වූ බුදුකෙණෙකුන්ම මුත් අනික් සත්ත්වයක් හට ඒ අවිෂම ය. අචින්ත්‍යම ය. නො දැනේ ම ය. නො සිතේ

ම ය. අසාධාරණම ය. ආශ්චර්ය්‍යම ය, විස්මයම ය, එව ද මේ ඇසූ සිතූ සියලු සතුන්ට ද මේ වික්‍රමය වාසනා වේව යි මෙසේ මාගේ ස්වාමිදරුවෝ සියලු සතුන් කැමැති කැමැති රස කවා පොවන එක් මෑණියන් සේ හැම දෙනා කැමැති කැමැති චරිතයෙහි බණ වදරා ඒ දවසක් පැවතුම් පළමුවන සූත්‍රදේශනාව මෙසේ සමහර කොට වදාළ සේක.

එ කෙණෙහි පස්දෙනා වහන්සේට වැඩිමහලු අඤ්ඤාකොණ්ඩඤ්ඤ නම් මහ තෙරුන් වහන්සේ කෙළ දහසක් පමණ කෙලෙසුන් නසා දහසක් නයින් සම්පූර්ණ වූ සෝවාන් මාර්ගයෙන් වැද අමා මහ නිවන් පුරය දුටුසේක. එදා අසඞ්ඛ්‍යයක් දෙවියෝ සෝවාන් මාර්ගයෙන් වැද අමාමහ නිවන් පුරය දැක සතුටු වූහ. තව ද අසඞ්ඛ්‍යයක් දෙවියෝ දෙවන වූ සෙදගැමි මාර්ගයෙන් වැද අමාමහ නිවන් පුරය දැක පිණා ගියහ. තව ද අසඞ්ඛ්‍යයක් දෙවියෝ තුන්වන වූ අනාගාමි මාර්ගයෙන් වැද අමාමහනිවන් දැක සතුටු වූහ. තව ද අටළොස් කෙළක් මහා බ්‍රහ්මයෝ සතරවනවූ රහත් මගින් වැද අමාමහනිවන් පුරය දැක සසර දුකින් මිදී ගියහ. මෙසේ එ දා මාගේ ස්වාමිදරුවෝ ඇසළ මැදිපොහෝදා පතළ සඳපානේ කළා වූ පළමු වන ධර්මදේශනාවෙහි තුන් අසංඛ්‍යයක් දෙවියන් හා අටළොස් කෙළක් බ්‍රහ්මයන් නිවන් දක්වා නිවන් කෙළවර බණ සමහර කොට තොප තොපගේ විමන් යව යි අවසර දුන්සේක. එ කල දිව්‍ය බ්‍රහ්මයෝ ස්වර්ණ රස ධාරාවෙන් අභිෂිකත ගාත්‍රා ඇතියවුන් සේයින් පිණ පිණා සාධුකාර පවත්වා බුදුන් වැද ප්‍රදක්ෂිණා කොට බුදුන්ට සතුති කොට තමන් තමන්ගේ භවනයට ගියාහුය.

මෙසේ බුදුහු තමන් වහන්සේ පළමුවන ධර්මදේශනාව කළ ද ප්‍රතිෂ්ඨිතන නම් වූ මහා පූජා දෙතිසක් හා, කාමාවචර දිව්‍ය රාජයන් කළ අනූ දහසක් පූජා හා, මහාබ්‍රහ්මයන් කළ එක්ලක්ෂ පණස් දහසක් පූජා හා, මෙසේ දෙලක්ෂ සතළිස් දහස් දෙකින් මහා පූජාවක් ලත් හෙයිනුත්, එසේ වූ පූජා පිදීමට සුදුසු හෙයිනුත්, සද්ධර්ම මහා චක්‍රවර්ති වූ, සද්ධර්ම මහා මේඝ වූ, සද්ධර්ම මහා ප්‍රවාහ වූ, සද්ධර්ම මහා ගඞ්ගා වූ, සද්ධර්ම මහා සමුද්‍ර වූ, සද්ධර්ම මහා චූඩාමණි වූ, සද්ධර්ම මහා කිරීට වූ, සද්ධර්ම මහා තිලක වූ, සද්ධර්ම මහා කේතු වූ, සද්ධර්ම මහා නිධාන වූ මාගේ ස්වාමිදරු වූ, ගෞතම ද

නීය වූ, ගෞතම ගොත්‍රයෙහි උපන් හෙයින් ගෞතම නම් වූ බුදු රජාණෝ මේ මේ කාරණයෙනුදු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලද්දේමැයි:

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොක නාථො,
අත්ථානු රූපං අරහන්ති ලොකෙ,
තස්මා ජිනො අරහති නාම මෙතං යි.

මේ පූජාවලියෙහි අප බුදුන් පළමු වන දම්සක් පැවතුන් සූත්‍ර දේශනායෙහි දී ලද ඉසිපතනාරාම පූජා කථා නම් වූ

දොළොස් වන පරිච්ඡේදය නිමි.

තුදුස්වන පරිච්ඡේදය

තව ද අප බුදුන් රජගහා නුවර දී ලද වෙළුවනාරාම පූජා නම් කවරහ? යත්;

මෙසේ මාගේ බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මයාගේ ආරාධනායෙන් ඇසළ මස මැදි පොහෝ ලද උත්‍රාසළ නකතින් දම්සක් පතුරුවා දෙව් බඹුන්ට සමු දී යවා, එදා රැ පස්තරුවෙන් පිරුණු සඳම්ඩලක් සේ පස්වග මහණුන් හා සමග එම ඉසිපතනයෙහි පළමු වන වස වැස, දෙවන දා උදෑසන සතරදෙනා වහන්සේ සිඟායාදී, භද්දිය නම් මහා තෙරුන් වහන්සේට බණ වදාරා සෝවාන් කොට, තුන්වන දා උදෑසන ඔබ ඇතුළු වූ සතරදෙනා වහන්සේ සිඟා යවා වප්ප නම් මහ තෙරුන් වහන්සේට බණ වදාරා සෝවාන් කොට, සතරවන දා උදෑසන ඔබ ඇතුළු වූ සතරදෙනා වහන්සේ සිඟා යවා මහානාම නම් මහ තෙරුන් වහන්සේට බණ වදාරා සෝවාන් කොට, පස්වන දා උදෑසන ඔබ ඇතුළු වූ සතරදෙනා වහන්සේ සිඟා යවා අස්සජි නම් මහ තෙරුන් වහන්සේට බණ වදාරා සෝවාන් කොට, සවන දා උදෑසන පස්දෙනා වහන්සේට අනිත් ලකුණු නම් සූත්‍ර දේශනාවක් කොට එකවිට ම රහත් කොට, එ තැන් පටන් පසළවූ මහා ශාඛායෙන් දිලියෙන්නා වූ කප්රුකක් සේ පස් මහ රහතන් හා සමග එම වෙහෙර වාසය කරණ සේක.

ඒ අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහතෙරුන් වහන්සේ කෙබඳු වූ පිණක් කොට මෙබඳු වූ බුදුකෙණකුන්ගේ සියලු මහ සව්වන්ට පළමු ව අග්‍ර වූ නිවන් දුටුයේක් දැ? යත්; පෙර මහා විපස්සී නම් බුදුන් සමයෙහි බන්ධුමතී නම් නුවර චූලකාල නම් සිටුව හැල් කුඹුරෙක බඩ තළවා පැන් නො වකා කිරිපිඩු පියවා බුදුපාමොක් මහසඟ පිරිස වළඳවා මෙසේ ම ඒ එක කෙතැ ගොයමින් නව වාරයක් අග්‍රභොජනය දී මතු බුදුකෙණකුන්ගේ සස්නෙහි මම පළමුවන අග්‍ර දෙසුම් අසා අග්‍ර වූ නිවන් රස ලද්දවුන් කෙරෙහි අග්‍රයෙමම යි ප්‍රාර්ථනාකොට ඒ පිණින් එකානූ කපක් මුළුල්ලෙහි අපායට නො ගොස් දිව්‍යලොකයෙහි හා මනුෂ්‍යලොකයෙහි සුව විඳ ඇවිද දැන් අප බුදුන් සමයෙහි පළමුවම අග දෙසුම් අසා, පළමුව ම අමාමහ නිවන් දුටුයේකැ යි දතයුතු.

මෙසේ බුදුන් එහි වසන කල සුජාතා නම් සිටු දුව වැදූ බරණැස යස නම් සිටු පුත්‍රයාණෝ තුන් සෘතුවට සුදුසු තුන්පායෙහි නළුවන් පිරිවරා උඩුමාලෙන් යටිමාලට නොබැස මහත්වූ ශ්‍රී විඳිනාහු, එක් දවසෙක නිඳා පිබිද නාටක ස්ත්‍රීන්ගේ විකාර දැක අතින් ලකුණු උපදවා සසර කලකිරී එ විගස ම යහනින් නැගී රුවන් මිරිවැඩි පයින් ගෙණ ගොස් පායෙන් බැස නුවරින් නික්ම ගොස් මැදියම් රෑ බුදුන් වසන ඉසිපතන වෙහෙර සමීපයෙන් යෙති. එ වේලෙහි මාගේ සවාමිදරුවෝ ඔහු යන්නවුන් දිවසින් දැක කතර ගොස් එන පුතකු පෙරමගට දිවන මවක සේ ඔහු පෙරමගට මහත් වූ කරුණාවෙන් වැඩ, අඳුරම මහත් වූ පානක් නගා පැවා සේ බුදුරස් කඳක් ඔහු කරා හැර මහ අලුකොට ලා 'මෙසේ මා කරා එයි යසැ'යි වදාළ සේක. ඒ සිටුපුත් බුදුන්ගේ ශබ්දය කණ හුනු වේලෙහි බුදුන් දිසාව බලා, තමාගේ රසින් දිලිහී පෙණෙන හිරු මඬලක් සේ බුදු රස් දිලියෙන බුදුන් දැක පිපාසිතයක්හු දුටු ආකාශ ගඞ්ගාව සේ, පෙණිගිය දුගියකු මහා නිධානයක් සේ, දුටු දිව්‍යයකු සුධා භොජනයක් සේ, දුටු ඇතකු මහපියුම් විලක් සේ, හිරුරස් දුටු මහා පද්මයක් සේ, සන්තොෂ ව පස්වණක් ප්‍රීතින් පිණා දෙනක කරා දිවන වසුපුත් පැටවකු සේ, බුදුන් කරා දිව පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව සිට බණ අසා එ කෙණෙහි ම සෝවාන් ව එහි භික්ෂුභාවයෙන් මහණ වූහ.

දෙවන ද උදෑසන ඒ සිටානන් පිය වූ බරණැස් සිටාණෝ පුතනුවන් මතුමාලේ නො දැක රෑ පලා ගියහ යි අසා මහත් වූ ශොකයෙන් හඬ හඬා පුතනුවන් පලාගිය මඟ දැක රන්මිරිවැඩි

සලකුණෙන් මග නො වරදවා ගොස් මහණව සිටි පුතනුවන් හා ලොවුතුරු බුදුන් දැක පුතනුවන් කෙරෙහි ශෝකයෙන් වලපනට පටන් ගත්හ.

එ වේලෙහි බුදුරජාණන් වහන්සේ ගිනි කඳෙක හැල්පැන් [1]තමන්නා සේ දෙශනා නමැති අමාදියෙන් සිටානන්ගේ ශෝක නමැති මහ ගිනි නිවා වදාළසේක. එ කෙණෙහි සිටානෝ සෝවාන් වූහ. ඒ බණ වදාරණ වේලෙහි පුතනුවන් වහන්සේ රහත් වූ සේක. ඉක්බිත්තෙන් සිටානන් ගිය කල්හි ඒ යශ නම් සාමීන්ගේ ගිහි යහළුවෝ සූපණස් දෙනෙක් යහළුවානන් මහණ වූ බව අසා 'අප යහළුවා අප කිමැක් කොරේයයි, ඔහු සිවුරු හරවාගෙණ කෙළි යව ගෙණ එම්හ'යි මාසි කියා සුදු පිළි ගෙණ ගොස් සත්හුන් ගුණෙන් සිටි තෙරුන් වහන්සේගේ උපසම ය හා බුදුන්ගේ රූසිරි දැක 'අප යහළුවා ගිහිගෙයි වසන කලට වඩා දැන් ඔහුගේ මහණ වෙශ ම ඉතා හොබනේ ම ය. සඳුව අනුවූ ගුරු තරුව සේ ඉතා හොබනේ ය. උතුම්කු කෙරේ මහණ වි ය. අප යහළුවා ලද සිරි අපට ත් වී නම් යෙහෙකැයි'යි සිත සිතා බුදුන් වැඳ එකත් පස් ව සිටියහ. බුදුහු ඔවුන්ගේ චරිත බලා බණ වදුරා අමා මග නිවන් දක්වා දක්ෂිණ ශ්‍රී හස්තය දිගුකොට "එථ භික්ඛවෙ" යනාදින් වදුරා ඍද්ධිමය වූ පාත්‍ර සිවුරු දී ඒ සූපණස් දෙනා මහණ කළසේක.

මේ යශාදි පස් පණස් යහළුවෝ ද පෙර කෙසේ වූ පිණක් කොට මෙසේ වූ බුදු උතුමාන කෙණකුන් දැක සසරින් ගොඩ නැංගාහු දැ? යත්; පෙර එක් කාලෙක මේ පස්පණස් දෙන දැන් සේ ම යහළුව ඇවිදිනාහු දූරි ඇති ගැහැණියක අනාථ ම මිය වන මෑදෙක වැදහොත්තිය දැක ඇ කෙරෙහි කරුණා උපදවා පින් නිසා දරසැයක් බැඳ ඇ දවන්නාහු මිනිය දන වේලෙහි ඇ ඇඟින් දදු නැගෙන බුබුලු දැක බුබුලු ගැසුනු වේලෙහි පොතු ගැලවුනු කුකුලලයක් සේ සජීඩාගය සුදුමන සේ දැක අනිත් ලකුණු උපදවා මේ සියලු සතුන්ගේ ම ධර්මයෙකැ යි තිලකුණු මෙනෙහි කළහ. මෙසේ ඒ ජාතියෙහි මිනිය දවාපු පිණින් දිව්‍ය මනුෂ්‍ය ලොකයෙහි සැරිසරා ඇවිද මේ බුදුන් සමයෙහි අපමණ කල් සුව සැපත් විඳ

1. තමන්නා සේ.

ඒ අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහතෙරුන් වහන්සේ කෙබඳු වූ පිණක් කොට මේබඳු වූ බුදුකෙණකුන්ගේ සියලු මහ සව්වන්ට පළමු ව අග්‍ර වූ නිවන් දුටුසේක් දැ? යත්; පෙර මහා විපස්සී නම් බුදුන් සමයෙහි බන්ධුමතී නම් නුවර චූලකාල නම් සිටුව හැල් කුඹුරෙක බඩ තලවා පැන් නො වත්‍ා කිරිපිඬු පිසවා බුදුපාමොක් මහසඟ පිරිස වළඳවා මේසේ ම ඒ එක කෙතැ ගොයමින් නව වාරයක් අග්‍රභොජනය දී මතු බුදුකෙණකුන්ගේ සස්නෙහි මම පළමුවන අග්‍ර දෙසුම් අසා අග්‍ර වූ නිවන් ඒක ලද්දවුන් කෙරෙහි අග්‍රමෙමව යි ප්‍රාර්ථනා කොට ඒ පිණින් එකනූකපක් මුළුල්ලෙහි අපායට නො ගොස් දිව්‍යලොකයෙහි හා මනුෂ්‍යලොකයෙහි සුව විඳ ඇවිද දැන් අප බුදුන් සමයෙහි පළමුව අග දෙසුම් අසා, පළමුව ම අමාමහ නිවන් දුටුසේකැ යි දතයුතු.

මෙසේ බුදුන් එහි වසන කල සුජාතා නම් සිටු දුව වැදූ බරණැස යස නම් සිටු පුත්‍රයාණෝ තුන් ඍතුවට සළ තුන්පායෙහි නළුවන් පිරිවරා උඩුමාලෙන් යටිමාලට නොබැස මහත්වූ ශ්‍රී විඳිනාහු, එක් දවසෙක නිඳා පිබිද නාටක ස්ත්‍රීන්ගේ විකාර දැක අතිත් ලකුණු උපදවා සසර කලකිරී එ මිගෙස ම යහනින් නැගී රුවන් මිරිවැඩි පයින් ගෙණ ගොස් පායෙන් බැස නුවරින් නික්ම ගොස් මැදයම රැ බුදුන් වසන ඉසිපතන වෙහෙර සමීපයෙන් යෙති. එ වේලෙහි මාගේ ස්වාමිදරුවෝ ඔහු යන්නවුන් දිවසින් දැක කතර ගොස් එන පුතකු පෙරමගට දිවක මවක සේ ඔහු පෙරමගට මහත් වූ කරුණාවෙන් වැඩ, අඳුරට මහත් වූ පානක් නගා පෑවා සේ බුදුරස් කඳක් ඔහු කරා හැර මහ අලුකොට ලා 'මෙසේ මා කරා එයි යසැ'යි වදාළ සේක. ඒ සිටුපුත් බුදුන්ගේ ශබ්දය කණ හුනු වේලෙහි බුදුන් දිසාව බලා, තමාගේ රසින් දිලිහී පෙණෙන හිරු මඬලක් සේ බුදු රැස් දිලියෙන බුදුන් දැක පිපාසිතයකුහු දුටු ආකාශ ගඞ්ගාව සේ, පෙණීගිය දුගියකු මහා නිධානයක් සේ, දුටු දිව්‍යයකු සුධා භොජනයක් සේ, දුටු ඇතකු මහපියුම් විලක් සේ, හිරුරැස් දුටු මහා පද්මයක් සේ, සතොෂව පස්වණක් ප්‍රීතින් පිණා දෙනත කරා දිවන වසුපුන් පැටවකු සේ, බුදුන් කරා දිව පසග පිහිටුවා වැඳ එකත්පස් ව සිට බණ අසා එ කෙණෙහි ම සෝවාන් ව එහි භික්ෂුභාවයෙන් මහණ වූහ.

දෙවන ද උදෑසන ඒ සිටාණන් පිය වූ බරණැස් සිටාණෝ පුතනුවන් මතුමාලේ නො දැක රැ පලා ගියහ යි අසා මහත් වූ ශොකයෙන් හඬ හඬා පුතනුවන් පලාගිය මඟ දැක රන්මිරිවැඩි

සලකුණෙක් මඟ නො වරදවා ගොස් මහණව සිටි පුතනුවන් හා ලොවුතුරා බුදුන් දුටු පුතනුවන් කෙරෙහි ශොකයෙන් වලපතව පටන් ගත්හ.

එ වේලෙහි බුදුරජාණන් වහන්සේ ගිනි කඳෙක හැල්පැන් [1]නමන්නා සේ දෙශනා නමැති අමාදියෙන් සිටාණන්ගේ ශොක නමැති මහා ගිනි නිවා වදාළසේක. එ කෙණෙහි සිටාණෝ සෝවාන් වූහ. ඒ බණ වදාරණ වේලෙහි පුතනුවන් වහන්සේ රහත් වූ සේක. ඉක්බිත්තෙන් සිටාණන් ගිය කල්හි ඒ යශ නම් සවාමීන්ගේ ගිහි යහළුවෝ සූපණස් දෙනෙක් යහළුවාණන් මහණ වූ බව අසා 'අප යහළුවා අප නිමයක් කොරේයයි, ඔහු සිවුරු හරවාගෙණ කෙළි යව ගෙණ එම්හ'යි මෑසි කියා සුදු පිළි ගෙණ ගොස් සන්හුන් ගුණෙන් සිටි තෙරුන් වහන්සේගේ උපසම ය හා බුදුන්ගේ රූසිරි දුටු 'අප යහළුවා ගිහිගෙයි වසන කලට වඩා දැන් ඔහුගේ මහණ වෙස ම ඉතා හොබනේ ම ය. සඳුට අනුවූ ගුරු තරුව සේ ඉතා හොබනේ ය. උතුමකු කෙරේ මහණ වි ය. අප යහළුවා ලද සිරි අපට ත් වී නම් යෙහෙකැයි'යි සිත සිතා බුදුන් වැඳ එකත් පස් ව සිටියහ. බුදුහු ඔවුන්ගේ චරිත බලා බණ වදාරා අමා මහ නිවන් දක්වා දක්ෂිණ ශ්‍රී හස්තය දිගුකොට "එථ භික්ඛවෙ" යනාදින් මධුරා ඍද්ධිමය වූ පාත්‍ර සිවුරු දී ඒ සූපණස් දෙනා මහණ කළසේක.

මේ යශාදී පස් පණස් යහළුවෝ ද පෙර කෙසේ වූ පිණෙක් කොට මෙසේ වූ බුදු උතුමාන කෙණකුන් දුටු සසරින් ගොඩ නැංගාහු දැ යත්; පෙර එක් කාලෙක මේ පස්පණස් දෙන දැන් සේ ම යහළුව ඇවිදිනාහු දුරි ඇති ගැබැණියක අනාථ ව මිය වන මෑදෙක වැදහොත්තිය දුටු ඈ කෙරෙහි කරුණා උපදවා පින් නිසා දරසැයක් බැඳ ඈ දවන්නාහු මිනිය දන වේලෙහි ඈ ඇඟින් දද නැගෙන බුබුලු දුටු බුබුලු ගැසුනු වේලෙහි පොතු ගැලවුනු කුකුලලයක් සේ සම්බාධය සුදුමන සේ දුටු අනිත් ලකුණු උපදවා මේ සියලු සතුන්ගේ ම ධම්යෙකැ යි තිලකුණු මෙනෙහි කළහ. මෙසේ ඒ ජාතියෙහි මිනිය දවාපු පිණින් දිව්‍ය මනුෂ්‍ය ලොකයෙහි සැරිසරා ඇවිද මේ බුදුන් සමයෙහි අපමණ කල් සුව සැපත් විඳ

1. හමනිනා සේ.

පස් පණස් සහළුවෝ එක්ව කළ පිණින් බරණැස ඉපද අප බුදුන් දැක සෘද්ධිමය වූ පාත්‍ර සිවුරු ලදින් මේ පස්පණස් දෙන ම අමාමහ නිවන් දැක සසරින් එතෙර වූහ යි දතයුතු. මෙසේ ලොකයෙහි බුදුන් හා සමග එක් සැටක් මහ රහතන් පහළ වූ කල ස්වාමි දරුවෝ වප්මස මැදි පොහෝ දා වස් පවරා සැට මහ රහතන් ලඟට කැඳවා ලා:

පරත්ථඤ්ච වත්තනතො අත්ථං-කාරානන්තා පථවිං ඉමං,
ඛ්‍යාහරන්තා මනුස්සානං-ධම්මං චරථ භික්ඛවෙ, යි.

යනාදීන් අවවාද දී "මහණෙනි, මේ ලොකයෙහි සත්ත්වයෝ බුදුරුවන් ලොව පහළ වූ බව නො දනිති. තොපි හැම දෙදෙනෙක් එක මඟ නො යව. සැටදෙන මෙන මෙන සැට මාර්ගයෙකින් ගොසින් ගිය ගිය දෙස දුටු දුටු සත්ත්වයන්ට මා උපන් පරිදි කියා ලොකාවබොධ කරව. 'සත්ත්වයෙනි, සම්බුදු නමැති මහ පියුමෙක් නැඟී සදහම් නමැති රොන්සළා දෙමින් සිටියේ ය. සම්බුදු නමැති ආකාශයෙහි සධම් නමැති ආකාශ ගඞ්ගාම ධාරානිපාතව වසිමින් සිටියේ ය. සම්බුදු නමැති මහානිධානයෙක් පෙණී දහම් නමැති නවරුවනින් දිලියෙමින් සිටියේ ය. සම්බුදු නමැති කප්රුකෙක් පැන නැඟී දහම් නමැති මහ සැපත් දෙමින් සිටියේ ය. සම්බුදු නමැති දිවාකරයෙක් පැන නැඟී මොහ නමැති අන්ධකාරයන් දුරු කරණ ය සොට සධම් නමැති මහ රස්කඳ විහිදුවමින් සිටියේ ය'යි යනාදීන් අවවාද දී සත්ත්වයන් බුද්ධ දර්ශනයෙහි ලොභ වඩව"යි වදාරා, සැටදෙනා වහන්සේ සැට මාර්ගයෙකින් යවා තමන් වහන්සේ එකලාව නික්මුනු අමා ගංගාවක් සේ උරුවෙලා නම් දනව්වට වඩනාසේක් අතුරු මඟ එක්තරා එක් රුකක් මුල සුවණක් රසින් දිලිහි දිලිහී ජම්බුනදීයෙහි ජාත සුවර්ණාඞ්කුරයක් සේ ලීලා සම්පන්න ව වැඩහුන් සේක.

එ කල කොසොල් රට රජකුමරුවෝ තිස්දෙනෙක් උතුම් වූ රූ හා උතුම් වූ ගුණ ඇති ව සම වූ සිත් ඇති හෙයින් භද්‍රවර්ගීයයි කියා මේ නමින් ප්‍රසිද්ධ ව කොසොල් රජහුගෙන් දූන් දෑව්වෙන සමඟ ව රජකරන්නාහු කප්පාසික නම් වනයක් ඉතා රම්‍ය ය යි අසා එහි කෙළිනට යන්නාහු එක්කෙණකුන්ට ප්‍රජාපතීන් නැති හෙයින් උන් තිසා වෙශ්‍යාවක ගෙණ ගියහ. රජ කුමරුවන් ක්‍රීඩ වෙන් ඇවිදිනා කල්හි ඕ ප්‍රමාදයක් දැක ඒ රාජකුමාරයන්ගේ

උරුවෙල් කසුප්හට පාත්‍රයෙහි හුන්. නාගයා පෙන්නීම.

227 පිට බලන්න. (14-15)

ආභරණ සහවාගෙණ වල්වැද ගියා ය. එ වේලෙහි ඔබමොබ බලා ආභරණ ත් වෙශ්‍යාව ත් නො දුක තිස්දෙන ම එක් ව ගෙණ ඈ ගිය පද සලකුණෙන් වල් සොයා ඇවිදිනාහු ඒ රුක්මුල සවණක් රසින් දිලිසෙන බුදුන් දුක වැඳ එකත්පස් ව හිට මෙසේ ඈ වෙශ්‍යාවක දුටු සේක් දැ යි විචාළහ. බුදුහු කුමක් නිසා ඈ සොය-වු දැ යි විචාළසේක. තමන් උයන්කෙළිනට ආ නිසාව ත් ඈ සෙරු සම්පත් ගෙණ ගිය නිසාව ත් බුදුන්ට දැන්වූහ. බුදුහු තමන් සෙවීම උතුම් ද, අනුන් සෙවීම උතුම් දැ යි විචාළසේක. ඔහු තමන් හෙතුසම්පත් ඇති හෙයින් බුදුන් වදාළ පැනයෙහි අර්ථ දැන අනුන් සෙවීමට වඩා තමන් සොයාගතහොතින් ඒ සෙවිල්ල ම උතුම් වේ දැ යි කීහ.

එ වේලෙහි ස්වාමිදරුවෝ එ බැවින් තෙපි තොප සොයනු කැමති කියා නම් හොඳ සේ ඉඳුව යි වදාරා ඔවුන් එකත්පස් ව උන් කල්හි අනුරූප වූ බණ වදාරා ඒ කුමාරවරුන් තිස්දෙනා ම සතර මග සතර ඵලයෙහි පිහිටුවා ඒහි භික්ෂුභාවයෙන් මහණකොට ඒ භික්ෂූන්ට ද අනුශාසනය කොට:

විහරථ විවිත්තෙසු-පබ්බතෙසු වනෙසු ච,
පකාසයන්තා සද්ධම්මං-ලොකස්ස සතතං මම-යි.

යනාදීන් අවවාද දී "මහණෙනි, තෙපි තිස්දෙන ද තිස්මාගී යෙක ගොසින් දුටු දුටූ සත්වයන්ට "සත්වයෙනි, ලොව බුදු රුවන් දමුරුවන් සඟුරුවන් පහළ වි ය. ඒ සර්වඥ නමැති මහා මෙඝ ය පැන තැගී සදහම් නමැති අමා වැසි වස්වා විනෙයජන නමැති මහ ඇල්කෙත සඵුවූකරවමින් සිටියේ ය. අපාය මාගීයෙහි අකුල් එළමින් සිටියේ ය. නිවන්මග එක එළිවමින් සිටියේ ය. යනාදීන් බුදු ගුණ කියා ලෝවැඩ කරව"යි වදාරා ඒ තිස්දෙනා වහන්සේ තිස් මාගීයෙක යවූ සේක. ඒ රජකුමරුවෝ තිස්දෙන කෙසේ වූ පිණක් කොට මෙසේ වූ බුදුකෙනකුන් දැක නිවන්රස වැළඳූ දැ? යත්; පෙර මාගේ බුදුන් තුණ්ඩිල නම් සූකර රාජ ව ඉපද බරණැස් රජුට බණ වදාරණ දා බෝසතුන් බඳ අල්වාගෙණ තා මරා ඇඟ මස් කමිය යි පොලු මිල ගෙණ සිසාරා සිටගත් රා සොඬුන් තිස්දෙන තුණ්ඩිලොවාද නම් වූ ඒ දෙශනාව දෙලොස් යොදනක් තැන් ඇසෙන සේ කරත් කරත් අත තුබූ පොලු මිල හෙළා සාධුකාර දී දී බණ අසා එදා ලත් අවවාදයෙන් සැටදහසක් හවුරුදු මුළුල්ලෙහි පන්සිල් රක්ෂාකොට එතැන් පටන් සදෙව්

ලොව සැරිසරා ඇවිද සුව විඳ එ කල උතුම් වූ රජකුලයෙහි ඉපද ඒ පන්සිල් රක්‍ෂාකළ පිණිසින් අසාධාරණ වූ රූ සිරි ලදින් මොහොතක් කල් පමණ බණ ඇසූ පිණිසින් අප බුදුන් දැක අමා මහ නිවන් දුටුහ යි දතයුතු.

මෙසේ ලොකයෙහි එකොනූවක් රහත් සඟුන් ඇතිවූකල මාගේ සවාමිදරුවෝ උරුවෙලා නම් දනව්වට වැඩිසේක. එහි නිල්තලා නම් ගං තෙර උරුවෙල කාශ්‍යප ය, නදී කාශ්‍යප ය, ගයා කාශ්‍යප ය, යන ජටිලයෝ තුන්බෑ කෙනෙක් රහතුම්හයි කියා මිථ්‍යාදෘෂ්ටි ගෙණ ලෝවැස්සන් වඤ්චාකොට පහදවා ලාභයෙහි යසසෙහි අග්‍ර ව වෙසෙති. එයින් උරුවෙල කාශ්‍යපයන්ගේ පන්සියයක් අතැවැසියෝ ය. නදී කාශ්‍යපයන්ගේ තුන්සියයක් අතැවැසියෝ ය. ගයා කාශ්‍යපයන්ගේ දෙසියයක් අතැවැසියෝ ය. මෙසේ මේ දහසක් දෙන ම මිථ්‍යාදෘෂ්ටි ගෙණ වෙසෙති. බුදුහු මොවුන් දහසක් දෙනා හෙතුසම්පත් ඇති සේ දැක 'අපායගත වූවත් නිවන් පුරයෙහි ලම්'යි උපන් මහා කරුණා ඇති ව එදා ඒ උරුවෙල කාශ්‍යපයන්ගේ පන්සලට වැඩ "කාශ්‍යපයෙනි! තොපගෙන් අවසර ලදුමෝ නම් තොපගේ මේ ගිනිහල් ගෙයි අද එක රෑ සැතපෙනු කැමැත්තම්හ"යි වදාළ සේක.

එ කල උරුවෙල කාශ්‍යපයෝ කියන්නාහු 'මහණ භවත් ගෞතමයෙනි! තපස් විවරයන්ට අවසර දීම අප සේ වූ තපස්විවරයන්ට සුදුසු ම ය. එසේ ද වී නමුත් ගිනිහල් ගෙයි විෂඝොරවූ නාග රාජයෙක් වෙසෙයි. ඒ අප රහත් හෙයින් අපට කිසිවකු ත් නො කෙරෙයි. නො රහත් වූ තොප වැනි සොඳ රුවක් ඇති මහණ කෙණකුන්ට උපද්‍රවයක් කෙළේ නම් අලාභ වේදෑ'යි! කීහ. බුදුහු එ බස නො ඇසූ කන් ව 'තොපගෙන් අවසර ලදුමෝ නම් මේ ගිනිහල් ගෙයි ම සැතපෙනු කැමැත්තම්හ'යි දෙවනුවත් වදාළසේක. තව ද උරුවෙල කාශ්‍යපයෝ 'භවත් ගෞතමයෙනි! ඒ ගිනිහල් ගෙයි ලැගීමෙන් අපට කිසිවක් නැත. ඒ නාගරාජයා ඉතා දරුණු වූ විෂ ඇත්තේ ම ය'යි කීහ. එ බසට සවාමිදරුවෝ තුන්වනු ව වදාරණ සේක්: 'නයින්ගේ දැඩිකම් නො කියා අද එක රැයට ගිනිහල් ගෙය අපට අවකාශ කරම්'යි වදාළසේක. බුදුන්ට තුන්වන වාරයෙහි උත්තරයක් කී සතකු ඉස සත් කඩක් ව පැළෙන හෙයින් කාශ්‍යපයෝ අනිකක් කියාගත නොහී නයාගේ දැඩිකම් ම කීහ. ඉක්බිත්තෙන් බුදුහු 'නයිගේ බල නො කියා තොපගේ

ගිනිහල්ගෙය අපට අවසර දෙව'යි වදාරා උන්ගෙන් අනුදන්වා ගෙණ නා විමනකට වදනා ගරුඬරාජයක්හු සේ නිර්භීත ව ඒ ගිනිගල්ගෙට වැද බුද්ධාසන පණවා පලක් බැඳ වැඩ උන්සේක.

ඉක්බිති නාගරාජතෙමේ ගිනිහල්ගෙහි වැඩ හුන් බුදුන් දැක 'ඇතැකු නොරා පැමිණි උන්මත්තකයකු සේ මාගේ භවනයට අවුදින් මා අභිමාන මැඩ තමාගේ ගෙයක සේ හිඳගත් මොහු තව මරක්දැ'යි කිපී බුදුන්නාරා විෂධූම් හරණට වන. ස්වාමිදරුවෝ 'මම ද එක ජෂ ධූමියක් හළිම් හැම එක නායකු තබා මුළු ලොව මකුළු හුයක් සේ දැවෙයි. එසේ ද වුව ත් මොහුගේ අභිමාන මැඩ දමූ ව මනා වේදැ'යි සිතාලා 'මාගේ ශරීරයෙන් නික්මුනාවූ දුමින් මුළුලොම නිසි සතකුව ත් මේ ගෙහි මසය මැසි මදුරු කුරු කුහුඹු ආදී සියලු සතුන්ට ත් උපද්‍රවයෙක් නො වේව'යි අධිෂ්ඨාන කොටලා පිදුරු කලම්බෙක ගිනි ලූ කලක් සේ ශ්‍රී ශරීරයෙන් දුම් කඳු හරණව පවත්ගත් සේක. ඒ දුම්කඳු නයිගේ විසදුම් ඔබා ඔහුගේ ඡවිමාංසාදියට හානියක් නො කොට පෙළන් නට පවත්ගත. ඉක්බිත්තෙන් නාග රාජයා මුඹු මහණහු ගින්නෙන් දවාපියම් යි සිතා බුදුන් නාරා ගිනිකඳ හරණට පවත්ගත. එ කල බුදුහු තේජෝ කසිණ සමාපත්තියට සමවැද ලා ඔහට වඩා ශතසහස්‍ර ගුණයෙන් ශ්‍රී ශරීරයෙන් ගිනිකඳු නඟන්නට පවත්ගත් සේක. එ වේලෙහි සියලු ගිනිහල් ගෙය ගිනිගෙණ දිලියෙන සේනක් සේ පෙණී සියලු ආශ්‍රමය ඒකාලෝක වි ය. ඒ ගිනි දුටු උරුවෙල කාශ්‍යපාදී ජටිලයෝ 'තෙලෙ නාගරාජයා හළ ගිනිකඳ ය. මහණ භවත් ගෞතමයන්ගේ රන්කඳක් වන් ශරීර ය අද දැ නස්සි. අප කියමන් නො ගත්ස. ඉතා ගත් නැගි කෙණෙකැ'යි කිය කියා සිටියහ.

මෙසේ ස්වාමිදරුවෝ තමන් වහන්සේගේ ගින්නෙන් නයි නික්මවා අභිමාන ශූන්‍යකොට ශ්‍රී හස්තය දිගුකොට, දළ මුත්හ-රක් හයා ගන්නා සේ සමින්. මල් දමක් හයා ගන්නා සේ, නාග රාජයා හයාගෙණ ඉඳුනිල් මිණි කරඬුවෙක රිදී සවඩියක් ලන්නා සේ, පාත්‍රාධාතු ව ඇතුළෙහි දරණ ලා විෂ නැති කොට කොවා ලා උදෑසන උරුවෙල කාශ්‍යපයන් කැඳවා ලා 'ජ්‍යේ තොප ආනුභාව කී නාගරාජයා වැදහොත් ලෙස බලව' යි දක්වා වදාළ සේක. එ කල නාගරාජයා බුදුන්ගේ ශ්‍රී මුඛ ය ප්‍රේමයෙන් බල බලා ඇකිළි ඇකිළී හොත්තේ ය. ඒ ප්‍රාතිහාර්‍යය දැක උරුවෙල කාශ්‍යපයෝ

"මේ මහණ භවත් ගෞතමයෝ අප සේ ස්වසන්තාන දමනය කොට රහත්වත සේ නො දන්නා බව මුත් කයින් දමන්නාවූ ආනුභාව ඇතියහ'යි කියා රහත්ගුණ නමින් තොරේ ම තබා දුවහ.

තව ද බුදුහු ඔහුගේ ලය මොළොක් නො වූ සේ දැක තව ද ප්‍රාතිහාර්‍ය්‍ය දක්වනු කැමැති ව ඔහුගේ ම පන්සල අතික් තැනකදු එසේ ම දමා පාත්‍රා ධාතුමෙහි ලා පැසේක. එ දවස ද ඒ ප්‍රාතිහාර්‍ය්‍යය දැක උරුවෙල කාශ්‍යපයෝ 'රහත් ගුණය මා කෙරෙහි ම පිහිටියේ ය. කයින් දමන්නාවූ සෑබ භවත් ගෞතමයන් කෙරෙහි පිහිටියේ යැ'යි කීය. තව ද එක් දවසෙක බුදුහු කාශ්‍යපයන්ගේ පන්සලට කුඩුරුවූ එක් තෙනෙක රාත්‍රියෙහි වැඩහුන්සේක. එකල වරම් රජදරුවෝ සතරදෙන තුන්ගවු උස දිව්‍ය ශරීරයෙන් දිළිහි දිළිහී අවුදින් බුදුන්ට සතරදිග රකාවල් ගෙණ සිට ගත්හ. බුදුහු පාන් ඇඟෑ සතරක් මැද දිලියෙන රන් දාගබක් සේ ශ්‍රීමත් ව බැබළිඳ ඔවුන්ට බණ වදාළසේක. ඉක්බිත්තෙන් පාන්වූ කල උරුවෙල කාශ්‍යප යෝ බුදුන් කරා අවුදින් 'මහණ භවත් ගෞතමයෙනි! වළඳන්නට අවමැනව. ඊයේ රෑ රන්වන් රැස් විහිදුම් විහිදුවා නමින් කරා අවුදින් සතර දිග සිට බණ ඇසුවෝ කවුරුදැ'යි විචාළහ. එ බසට බුදුහු කාශ්‍යපයෙනි, වරම් රජදරුවෝ සතර්දෙනා ය'යි වදාළසේක. ඒ ප්‍රාතිහාර්‍ය්‍යය දැක ද උරුවෙල කාශ්‍යපයෝ 'තොපගේ වරම් රජ දරුවෝ අප කරා නො එත් ම ය. අපගේ රහත්ගුණ තොප කරා නො එත් ම ය'යි කීහ.

තව ද එක් දවසෙක ශක්‍රයෝ දෙදෙව්ලොව දෙවියන් පිරිවරා අවුදින් බුදුන් වැඳ බණ අසා ගියහ. අතික් දවසෙක මහාබ්‍රහ්මයෝ අවුදින් බුදුන් දැක වැඳ බණ අසා ගියහ. එදා ද උරුවෙල කාශ්‍යපයෝ විචාරා දැන 'මහණ භවත් ගෞතමයෙනි! තොප ශක්‍ර බ්‍රහ්මයන් අතිකුත් වැඳුම් ගන්නා නැතැත්තන් අප සේ රහත් නො වන්නේ නො යෙදේ'යි කීහ. තව ද එක් දවසෙක අඟු මගධ දෙරට වාසීහු පූජාසත්කාර ගෙණ උරුවෙල කාශ්‍යපයන් කරා අවුත් වන්හ. උරුවෙල කාශ්‍යපයෝ එ දා සිතන්නාහු 'මහණ භවත් ගෞතමයෝ මහත් වූ ආනුභාව ඇතියහ. මනොහර වූ රූ ඇතියහ. මේ මනුෂ්‍යයන් මධ්‍යයෙහි ආනුභාවයක් දක්වාලූ නම් අප හැම තවුස් වෙස් ගත් වඳුරන්

කොටවත් නොකාකසි. ශමණ ගෞතමයෝ අද මෙතැනට නො අවු නම් යෙහෙකැ'යි සිතූය. ස්වාමිදරුවෝ ඔහු සිතූ සිත් දැන ඔහු දමා ගන්නා සේක් ඔහු කැමැති කැමැති දෙයක් ම කෙරෙමි යි සිතා එ දවස් උදසන උතුරුකුරු දිව් වැඩ අහර පිළිගෙණ අනවතප්ත නම් විලට මැඩ එහි දී වළඳා මෙසේ තුන් දවසකින් ඔහුගේ පූජාව නිමිකල නැවත ඒ පන්සලට ම වැඩිසේක. ඉක්බිත්තෙන් උරුවෙල කාශ්‍යපයෝ උදසන බුදුන් කරා ගොස් 'භවත් ගෞතමයෙනි! අද වළඳන්නට අම් මැනව. ඊයේ පෙරෙව්දා අඟු මගධ දෙරට වාසීහු අපට මහා පූජාවක් කොට මහා දානයක් දුන්නාහු ය. අපි එ කල තමන් සඳහන් කලම්හ ඊයේ පෙරෙව්දා කොයි ගිය නියා දැ යි කීහ. මාගේ බුදුරජානන් වහන්සේ එ බසට සිනා පහළ කොට උරුවෙල කාශ්‍යපයෙනි! සෙසු ලෝ වැස්සන්ට කියන විඩුවා මට නො කියව. මම තොප තබා සියලු සත්වලෝකයෙහි කුහුඹුවා පමණ් මහා බ්‍රහ්මයා දක්වා සියලු සතුන් සිතූ සිත් දනිමි. තොපගේ ම අදහස් දැනය මා නො ආයේ යි වදාළසේක. ඒ ප්‍රාතිහාර්ය දැක උරුවෙල කාශ්‍යපයෝ 'භවත් ගෞතමයෝ පර සිත් දන්නා බව මුත් අප සේ රහත් මග නො දනිති'යි කීහ.

තව ද එ සමයෙහි බුදුන්ට පාංශුකූල චීවරයෙක් උපන, ඒ කල බුදුහු මේ සිවුර කොයිදී සෝදම්දැ හෝ යි සිතා වදාළසේක. ඒ සිත හා සමග ශක්‍රදෙවේන්ද්‍රයා අවුදින්, තමුන් පොකුණ සේ මනොහරවූ පොකුණෙක් හා, විසිතුරු පියගැට පඩකති හා, සිවුර ගසන්නට සුදුසුවූ පාණෙක් හා, සිවුර වනාලන්ට මනොහර වූ ගල තලෙක් හා මවාලී ය. ඒ වෙනෙහි වන දෙවතාවා බුදුන් පොකුණට බස්නා කල එල්බගන්නා පරිද්දෙන් පොකුණුතෙර ගසෙක අත්තක් නමා පෑලී ය. බුදුහු ඒ පොකුණෙහි දී සිවුර සෝදා වදාළසේක. ඉක්බිත්තෙන් උදසන උරුවෙල කාශ්‍යපයෝ තමන්ගේ අසපුවෙහි ඉන්ද්‍ර ජාලයක් සේ මැවී තුබූ පොකුණ හා පාණ හා ගලතල හා ගසින් නැමී ගිය අත්ත දැක මහා ආශ්චර්‍ය්‍යවත් ව බුදුන් අතින් විචාරා ශක්‍රයා මැවූ බව අසා 'මහණ භවත් ගෞතමයන්ගේ අසාධාරණ වූ සෘද්ධි දවසින් දවස වඩ වඩා දකුම්හ. අප සේ රහත් ගුණයක් නුදුටු විරූමෝ ම ය'යි කීහ.

තව ද එක් දවසෙක උරුවෙල කාශ්‍යපයෝ බුදුන් වැඩහුන් තැනට ගොසින් 'භවත් ගෞතමයෙනි! වළඳන්නට අව මැනව'යි කීහ. බුදුහු 'අපි එම්හ, තෙපි යව'යි කියා කාශ්‍යපයන් පළවූකොට

යවා සරසනක් පමණ තෙන තුබූ භොජන ශාලාමව උත් තොයන තුරු තමන්වහන්සේ අනුරුසනකින් හිමාලය මහයට වැඩ දඹ දිවව සලකුණු වූ සියක් යොදුන් උස මහ දඹගසින් දඹපාත්‍රයක් ගෙණ උරුවෙල කාශ්‍යපයන්ට පළමුකොට ගොස් ශාලාවේ වැඩ හුන්සේක. එ කල කාශ්‍යපයෝ 'මහණ භවත් ගෞතමයෝ එද්දෙ හෝ නො එද්දෙ හෝ''යි සිත සිතා ශාලාමව ගොස් පළමුව ගොස් වැඩහුන් බුදුන් දැක ආශ්චර්යයීමත් ම 'භවත් ගෞතමයෙනි! මට පසුව අවුත් තවර ඇසිල්ලෙක පළමුව අවුත් මැඩහුන්හෝදැ'යි විචාළහ. එවිට බුදුහු වදාරණසේක් 'කාශ්‍යපයෙනි! තොප එවාලා අපි මහදඹ අසව ගොස් දඹ ගෙණ අවුදින් උතුමහ, තව ද මේ ආශ්චර්ය නො වෙයි. තොප මෙතනට එන අතුරෙහි සිතුමෝ නම් සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් මව ඇති සක්වල ගල වටා ලක්ෂ ගණන් වාරයෙහි සිසාරා ඇවිදමින් ම තෙනට එන්ට පොහොසතුම්හ'යි වදාළසේක. එ බසට උරුවෙල කාශ්‍යපයෝ අප සේ නිවන් මග දිමන සේ නොදන්නා බව මුත් තිකම් ගමන් යාමෙහි ඉතා දක්ෂයෝය'යි කීහ.

තව ද මෙසේ ම මොහු අද දමා ගණිම්'' යි සෙම දමා ගණිමියි සිත සිතා දවසෙක එම හිමාලයෙහි අභ්‍යන්තරයෙන් අඹ ගෙණ වුත් පැ සේක. එහි ම දිව්‍යවූ ඇඹුලගසින් ඇඹුල ගෙණවුත් පැ සේක, තව ද දවසෙක දිව්‍යවූ අරළු ගසින් අරළු ගෙණවුත් පැ සේක. දවසෙක තවුතිසා භවනයට වැඩ ශක්‍රයාගේ පරසතු ගසින් මදුරු මල් ගෙණ වුත් පැ සේක. ඒ ඒ ප්‍රාතිහාර්යයෙහි උරුවෙල කාශ්‍යපයෝ 'භවත් ගෞතමයෝ අපයේ රහත් ගුණ නැති බව මුත් ශීඝ්‍ර ගමන් දන්නා සෘද්ධි ඇත්තෝය'යි කීහ. තව ද එක් දවසෙක ගිනිදෙවියාට පූජාවක් කරමහ යි සිතාලා උරුවෙල කාශ්‍යපයන්ගේ පන්සියයක් ජටිලයෝ පන්සියයක් පොරෝ ගෙණ එක විට ම දර පළන්ට පටන් ගත්හ එදා බුදුහු 'මේ දර එකෙකු ත් නො පැළේව යි අධිෂ්ඨානකොට වදාළ සේක. ඒ අධිෂ්ඨානය හා සමග ම සමහරු එළා ලූ පොරෝ තුඹපත් සේ වක් ව ගියා. සමහෙරක් තිල ගැහුවා සේ දරදණ්ඩේ ම ඇලි ගිය. ඔසවා ගත් පොරෝ එළා ලිය නො හී සමහෙරක් සිතියම්කළ රූ සේ ම සිටියහ. එක දණ්ඩකුත් නො පැළෙයි. ජටාධරයෝ මේ මහණ භවත් ගෞතමයන් කළ අධිෂ්ඨානයෙක් උවමැනවැ' යි සිතූහ. එ කල බුදුහු කාශ්‍යපයන් මුහුණ බලා 'කිමෙක් ද කාශ්‍යපයෙනි, දර පැළුව මනාදැ යි වදාරා 'එසේය! භවත් ගෞතම-

යෙනි! දර පැළව මැනැ'යි කී කල දර පැලේවා යි අධිෂ්ඨාන කොට වදාළසේක. එකෙණෙහි ඔසවා ගත් පොරෝ නො එළන තෙක් පන්සියයක් දඬු තොමෝ ම පැළී ගියේ ය. ඒ ආශ්චර්යය දැක උරුවෙල කාශ්‍යපයෝ කියන්නාහු මහණ භවත් ගෞතමයෝ අප සේ කෙලෙස් පලා රහත්වන සේ නො දන්නා බව මුත් දර පලා ප්‍රාතිහාර්‍ය්‍ය පානා සේ ඉතා දක්‍ෂයෝම ය'යි කීහ.

තව ද එක් දවසෙක පන්සියයක් ජටිලයෝ යාගයට ගිනි දල් වන්නාහු, බුදුහු 'ගිනි නො දැල්වේවා' යි අධිෂ්ඨාන කොට වදාළසේක. එ කල දියෙහි ගැලූ පිදුරු කැරැල්ලෙක ගිනි නො ඇවිලෙන්නා සේ ගිනි නො දැල්වී ම ය. දුම් කඳු නැගේ ම ය. පන්සියයක් දෙනා ඇඳ බා මගුරුම් වගුරුවා පත් සලා ගිනී දල්වා ගත නො හී 'මේ භවත් ගෞතමයන්ගේ අධිෂ්ඨානයෙකැ' යි සිතූහ. එ කල බුදුහු 'කාශ්‍යපයෙනි ගිනි ඇවිලෙනු කැමැත්තෝ ද'' යි කියා විචාරා 'එසේය භවත් ගෞතමයෙනි! ඇවිලෙනු කැමැත්තෙමි' යි කී කල බුදුහු ගිනි ඇවිලේයි අධිෂ්ඨානකොට වදාළසේක. එ කෙණෙහි තෙල් කළ නමා ලූවා සේ ගිනි තෙමේ ම ඇවිල පැනනැංගේ. ඒ ප්‍රාතිහාර්‍ය්‍යය දැක කාශ්‍යපයෝ කියන්නාහු 'රහත්ගුණ අප කෙරේ ඇති සේ භවත් ගෞතමයන් කෙරෙහි ගිනි දල්වන් නාවූ ආනුභාව විශෙෂ ඇතැ'යි කීහ.

තව ද එම ද යාග කොට නිමිකල පන්සියයක් ජටිලයෝ ගිනි නිවන්නට පටන්ගත්හ බුදුහු 'ගිනි නො නිවේවා'යි අධිෂ්ඨානකොට වදාළසේක. ජටිලයන් ගඟින් පැන් කළ සල ත් සල ත් තෙල් කළ සලන්නා සේ, ගිනි බුර බුරා නැගේ ම ය. එ වේලෙහි ද බුදුහු 'කාශ්‍යපයෙනි! ගිනි නිවමෝ දැ'යි වදාරා යහපතැ යි කී කල ගිනි නිවේවා යි අධිෂ්ඨානකොට වදාළසේක. එ කෙණෙහි ගිනී තෙමේ ම අන්තර්ධාන විය. ඒ ප්‍රාතිහාර්‍ය්‍යය දැක උරුවෙල කාශ්‍යපයෝ මේ මහණ භවත් ගෞතමයෝ 'අප සේ රහත් ව කෙලෙස් ගිනි නිවන සේ නොදන්නා බව මුත් නිකම් ගිනි නිරායාසයෙන් නිවන සේ දත් මැයි කීහ. තව ද එක් දවසෙක පන්සියයක් ජටිලයන් ඒ නිල්තලා හොයට බැස නහා ශීතයෙන් වෙවුල වෙවුලා සිටි වේලෙහි බුදුහු පන්සියයක් ගිනිකබල් මවා පන්සියයක් ජටිලයන්ට පෙරට ඉන්ද්‍රජාලයක් සේ දක්වා වදාළසේක. ඒ ආශ්චර්යය දැක

උරුවෙල කාශ්‍යපයෝ 'අනුන්ගේ ශීත දුක් නසා ගිනිකබල් තබන සේ දන්නා බව මුත් තමන්ගේ සසර දුක් නසා රහත්මන සේ නො දනිති'යි කීහ.

තව ද එක් දවසෙක අකාල මේඝයක් නගාලා ඒ ගඟ මහ වතුරෙක් දිව හැම වල් ගලාගෙණ නික්මින. බුදුන් වැඩ උන් ලෑනැබත් ගලා දිවෙයි; එ වේලෙහි සවාමිදරුවෝ 'දියවතුර මාගේ ලඟට නො වැද සිසාරා රිදී පවුරක් සේ සිටී ව'යි අධිෂ්ඨාන කොට වදාළ සේක. එ කල වතුර බුදුන්ගේ සක්මන හැරලා සතර අත සතර මහපවුරක් සේ සිටගත. බුදුහු පූර්සාගර් පල්ලම් බැස රුවන් වැල්ලෙහි සිටගත්තාවූ චක්‍රවර්ත්ති රජක්හු සේ දියෙහි නොගැවී දසදිග් නොබලා සක්මන්කොට වදාළ සේක. එ වේලෙහි උරු කාශ්‍යපයෝ 'මහණ භවත් ගෞතමයෝ වතුරෙහි ගියෝ නම් නපුරු'යි කියා ලා ඔරුවක් පැදගෙණ වක මහා දිඹගෙණ ගොස් රිදී ගුහාවෙක සිටිනා සිංහපොව්වකු සේ දිය මද්ධ්‍යයෙහි වැඩ සිට සවණක් රසින් දිලියෙන බුදුන් දැක 'මහණ ගවත් ගෞතමයෝ අප සේ රහත් ව තෘෂ්ණා වතුර රඳවනු සේ නො දන්නා බව මුත් දියවතුර රඳවීමට උන් හා සමාන කෙනෙක් නැතැ'යි කීහ.

ඒ සා වතුර මාගේ ස්වාමිදරුවන්ගේ ශ්‍රී ශරීරය තෙත් කළ නුහුනුවා සේ ම මේ සා පෙලහරක් දැක ද උරුවෙල කාශ්‍යපයන්ගේ ලාඝ ත් තෙත්කළනුහුනුයේ ම ය. එ කල 'භවත් ගෞතමයෙනි! මේ ඔරුවට පැනනැංග මැනවැ'යි කි බස හා සමග බුදුහු ඔරුවෙව් පෙණී ගොඩට වැඩ බුද්ධාසනයෙක වැඩහිඳ සිතා වදාරණ සේක්: කිමෙක් දෝ, මේ උරුවෙල කාශ්‍යපයා මෙතෙක් දා මුළුල්ලෙහි මා විසින් පානාලද දර නො පැළීමෙන් පත්සියයෙක දර පැළීමෙන් පත්සියයෙක, ගිනි නො දල්වීමෙන් පත්සියයෙක, ගිනි නො නිවීමෙන් පත්සියයෙක, ගිනි නිවීමෙන් පත්සියයෙක, ගිනි කබල් මැවීමෙන් පත්සියයෙක, ප්‍රථම නාග දමනයෙන, විතිය නාගදමනයෙන, වරමුන්ගෙන ශක්‍රයාගෙන, බ්‍රහ්මයන්ගෙන, පරසිත් දැන්මෙන, පොකුණෙන, ගල තලින, ශාඛායෙන, අඹයෙන, දඹයෙන, ඇඹුලෙන, අරළුයෙන, මිදුරා මලින, දිය වතුරෙනැ යි තුන්දස් පත්සිය සොළොසක් ප්‍රාතිහාර්‍ය්‍යයෑ දැකත් තමා රහතිමි යි යන මිථ්‍යාදෘෂ්ටි ය නො හරණේ ම ය; මොහුගේ මිථ්‍යාදෘෂ්ටි නමැති ව්‍යාධියට සෙසු පිළියමින් නම් නැත. මාගේ ධර්‍ම්ම නමැති දිව්‍ය ඖෂධ ය කොට මොහු ගොඩ ගණිමි යි

සිතාලා මුඛ නාමැති කරඬුයෙන් නික්මුනාවූ සුවඳ ගඳින් සියලු වනලැහැබ සුවඳ කෙරෙමින් මධුර ස්වර විහිදුවා ධර්මදේශනාවට පටන්ගත් සේක.

එ කෙනෙකෙහි මාගේ ස්වාමිදරුවන් ආකාශ ගඞ්ගාව ගෙණහැර දක්වන්නා සේ, මිහා නිධාන වස්තුවක් ගෙණහැර දක්වන්නා සේ, තමන්ගේ චාරිත්‍රානුකූලවූ පරිද්දෙන් දේශනා කරත් කරත් මෙයෙල දහසක් පමණ කෙලෙශුන් නසා දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටා අන්ධකාරයෙක පානක් නැගුවා සේ, මෙලොම මේ ය, පරලොම මේ ය, බුදුහු නම් මොහු ය, ධර්ම ය නම මේ ය, රහත්තු නම් මූ ය. නො රහත්තු නම් මූ යයි විශේෂ යෙන් දැන බුදුන්ගේ ශ්‍රී පාදය තමන් සිස්මුදුනෙහි තබාගෙණ දතිමි ස්වාමිනි! හැඳින්නෙමි ස්වාමිනි! ශුද්ධෝදන රජ්ජුරුවන් පුතනුවෝ සිද්ධාර්ථ කුමාරයෝ නම් නුඹ ද? එ දා මහාමායා දෙවින් කුසින් සිහිවූ සේක් මහාබ්‍රහ්මයා අත රන්දැලට වැඩියේක් නුඹ වහන්සේ ද? කාලදේවලයන්ගේ ජටානතරයෙහි එ දවස් පෙණී ගියේ මේ ශ්‍රීපාදය ද? වසවත් මරහු පැරද පලාගියේ නුඹ බුදුවූ දා ද, මහපොළොව ගිගුරුයේ නුඹ සවනෝ දත් වේලෙහි ද? බුදුව පළමු කොට ගැත්තවූ ම දැන වදාළයේක්ද? නුඹ බුදුකෙනෙක් නොවෙහි. බුදු වෙසින් මා තාරා ආ මට මැති කෙනෙක් ය. පියානු කෙනෙක ගුරුකෙනෙක. කල්‍යාණ මිත්‍ර කෙනෙක. මෙ තෙක් දවස් නුඹ බුදුවූ බව නො දත්තෙමි, නො හැඳින්නෙමි. ගැත්තවූ නො දැන කළ වරද ක්ෂමාකොට වදාළ මැනව ස්වාමීනි"යි යනාදින් බුදුන්ට සතුති කිය කියා 'දැන් ම ස්වාමීනි! ගැත් මහණවනු කැමැත්තේ ය"යි ආරාධනා කළහ.

එ බසට බුදුහු 'කාශ්‍යපයෙනි! තොපගේ පශීදෙසි හා අදහස් දනුව'යි වදාළසේක. උරුවේල කාශ්‍යපයෝ එ වේලෙහි පන්සිය ශක්ජටිලයන් කරා ගොසින් 'දරුවෙනි! අපගේ ආශ්‍රම පදයෙහි මෙතෙක් දවස් වෙස්වලා හුන් සේක් ලොවුතුරා බුදුහු ය. දැන් මම දතිමි. හැඳින්නෙමි. බණ ඇසීමි. බුදුන් කෙරෙහි මහණ වෙමි. තෙපි කුමක් කරාද'යි විචාළහ. පන්සියයක් දෙනම නුඹ මහණ වනොත් අපිදු මහණවම්හයි කියා ජටාමඬුලු හා පන්සියයක් තවුස් පිරිකර ගඟ දියට දමා බුදුන් කරා දිව අවුදින් බුදුන් පිරිවරා සිටියහ. එ වේලෙහි ස්වාමිදරුවෝ පන්සියයක් දෙනාගේ චරිත බලා බණ වදරා සෝවාන් කොට හැමදෙනම එහිභික්ෂුභාව යෙන් මහණ කළසේක.

ගඟදියෙහි යන ජටාමණ්ඩලු හා තවුස් පිරිකර යටි ගඟ වසන නදීකාශ්‍යප-ගයාකාශ්‍යප දෙබෑයෝ දැක පන්සියයක් ජටිලයන් හා සමග අවුදින් මෙ පවත් දැන තුමූ ද ජටාමණ්ඩලු කපාදමා බුදුන් දැක බණ අසා සෝවාන් ව එහි භික්ෂුභාවයෙහි ම පැවිදිවූහ. මෙසේ බුදුරජාණන් වහන්සේ ගයා නම් ගං හිස ගයා නම් පර්වතය මුදුනට ගෙණ ගොස් එහි දී ආදිත්‍යපර්යාය නම් වූ සූත්‍ර දේශනාව කොට දහසක් දෙනා වහන්සේ ම රහත් කළ සේක.

ඒ කාශ්‍යප තුන් බෑ ආදිවූ දහසක් දෙනා වහන්සේ පෙර කෙසේ වූ පිණක් කොට මෙසේ වූ බුදුශාසනයෙහි මහණවැ සසරින් ගැලවී නිවන් දුටුසේක් දැ? යත්; මෙ කෙතට දෙයානූ කපකින් යට උපන් ඵුස්ස නම් බුදුන් සමයෙහි මෙ තුන් බෑයන් වහන්සේ ඒ බුදුන් සුළු මවුන්ට දරුව මල්වූ තුන්බෑ රජ කුමරුව තුන්මසක් බුදුන් පවරා මෙම පන්සියය, තුන්සියය, දෙසියය, මහා අමාත්‍යයන් දහස හා සමග මහදන්දෙන්නාහු ඒ දහස හා සමගම ඒ තුන් මස මුළුල්ලෙහි සිල් රක්ෂාකළාහු ය. ඒ පිණින් ඒ යානූ කපක් මුළුල්ලෙහි දිව්‍ය ලොක මනුෂ්‍යලොක සුවවිඳ එක්ව ම ඇවිද මේ කල අප බුදුන්ගේ ශාසනයෙහි මහණ ව අමා මහ නිවන් දැක සසරින් ගැලවුනුසේකැ යි දතයුතු.

ඉක්බිත්තෙන් බුදුහු ඒ උරුවෙල කාශ්‍යපාදි දහසක් රහතුන් පිරිවරා, බිම්සර රජහට දුන් ප්‍රතිඥාවෙන් මිදෙනු සඳහා දුරුතු මස මැදි පොහෝද ප්‍රදීප සහස්‍රයෙන් දිලියෙන පහක් ඇඟැයක් සේ රජගහා නුවරට තුන්ගවු පමණ තෙන වැල්මී වැල් වැළඳි හෙයින් යෂ්ටිවන නම් තල්උයනට වැඩ එක් රුකක් මුල සවණක් රසින් දිලිහි දිලිහි දහසක් රසින් දිලියෙන හිරුමඬලක් සේ, දහසක් තරු මැද දිලියෙන සඳමඬලක් සේ, දහසක් අකුරෙන් දිලියෙන සවණ්ණාංකුරයක් සේ, දහසක් මහරහතුන් පිරිවරා වැඩහුන්සේක.

එ කල බිම්සර රජ්ජුරුවෝ බුදුන් තමන්ගේ උයනැ වැඩහුන් පරිදි උයන්ගොව්වා අතින් අසා එක් ලක්ෂ විසිදහසක් අමැති බමුණු පිටු සෙනග ගෙණ දිව අවුදින් සඳ සිසාරා සිටි සඳමඬුල්ල සේ ශ්‍රී මුඛය සිසාරා වටින් සරියන් පමණ තෙන රැළි දිදී කොයෙක් පැයෙන් සිවගත් බ්‍යාමප්‍රභා මණ්ඩලය මැද දිලියෙන ශ්‍රී ශරීරය ඇති ව වැඩහුන් මාගේ ස්වාමිදරුවූ බුදුරජාණන් දැක

පස්වණක් ප්‍රභාත් පිණා පියුම් ගබකට බස්නා රාජහංසයකු සේ ශ්‍රීපාදපද්මයම නැමී පසග පිහිටුවා වැද එකත්පස් ව හිඳගත්හ.

එකල උරුවෙල කාශ්‍යපයෝ නම් එ නුවර නැගූ ධ්වජයක් සේ ඉතා ප්‍රසිද්ධයහ. ඒ කාරණයෙන් ඉන් සම්හර පිරිසක් සිතන්නාහු 'කිමෙක් දෝ හෝ මහණ භවත් ගෞතමයෝ උරුවෙල කාශ්‍යපයන් නිසා වෙසෙද් දෝ හෝ, උරුවෙල කාශ්‍යපයෝ මහණ භවත් ගෞතමයන් නිසා වෙසෙද් දෝ හෝ'යි සැක සිතූවාහු ය. බුදුරජාණන් වහන්සේ ඔවුන් සිතූ සිත් දැන මහතෙරුන් මුහුණ බලා:

කිමෙව දිස්වා උරුවෙලවාසී-පහාසි අග්ගිං කිසකො'වදානො,
පුච්ඡාමි තං කස්සප එතමත්ථං-කථං පහීනං තව අග්ගිහුත්තං-යි.

යන මේ ගාථාව වදාරා 'උරුවෙල කාශ්‍යපය, තාගේ පහීදෙහි සැක තෝ ම හරව'යි වදාළසේක

එ කෙණෙහි උරුවෙල කාශ්‍යප නම් මහතෙරුන් වහන්සේ හුනස්නෙන් නැඟී බුදුන් කරා ගොස් ශ්‍රීපාදය වැද අවසර ඉල්වා ගෙණ චතුර්ථධ්‍යානයට සම වැද ආකාශයට මින තලක් පමණ පැන නැගී නොයෙක් වාරයෙහි දුමා දිලිහි අනනඩනා ව සක්මන් කොට නොයෙක් වාරයෙහි නොයෙක් ප්‍රාතිහාර්‍ය දක්වා ලා, තව ද බුදුන් වැද මෙසේ ම දෙවරක – තුන්වරෙක – සතර වරෙක-පස්වරෙක-සවරෙක-සත්වරක බුදුන් වැද වැද, දෙත ලෙක-තුන් තලෙක-සතර තලෙක-පස් තලෙක-ස තලෙක සත් තලෙක පමණ ය යි ආකාශයට පැන නැගී පෙර සේ ම පෙළහර දක්ව දක්වා ආකාශයෙන් බැස බුදුන් වැද සිංහරාජයකු පෙරට වැ සිටි ඇත්පැටවකු සේ ආදරයෙන් නැඹුරුව සිට 'අනුත්තර වූ සත්ත්ව යෙනි! මාගේ ස්වාමිදරුවන් හා මා හා සම්නොව නො සිතව. බුදුහු මහාමේර සේ ඉතා උස් වූ නුවණ ඇතිසේක මම ලිප්කැටයක් සේ මිටි වූ නුවණ ඇත්තෙමි. බුදුහු මහමුහුද සේ ගැඹුරු වූ නුවණ ඇතිසේක. මම ගෝකුර පැන් සේ ස්වල්ප වූ නුවණ ඇත්තෙමි. බුදුහු මහ පොළොව සේ විපුල වූ නුවණ ඇතිසේක. මම තණපතක් සේ ලඝුවූ නුවණ ඇත්තෙමි. බුදුහු ආකාශය සේ ඉතා විශාරද වූ නුවණ ඇතිසේක. මම අංගුලි පර්වතයක් සේ ඉතා අන වූ නුවණ ඇත්තෙමි. බුදුහු සම්පූර්ණ පණස් යොදුන් හිරුමඩල වැනි සේක. මම කණමැදිරියකු වැන්නෙමි බුදුහු උනු පණස් යොදුන් සඳමඩල වැනිසේක. මම දළිඹුයක් වැන්නෙමි; බුදුහු සියක් යොදුන් උස

ඇති පරසතුරුන වැනිසේක. මම කොබල්ලිල පැලයක් වැන්නෙමි. බුදුහු සෙල සියයක් යොදුන් ගරුඬරාජයා වැනි සේක. මම නැට කිරිල්ලක් වැනියෙමි. චක්‍රවර්ත්ති රජකු හා චණ්ඩාලයකු හා සම කරන්නා සේ, බුදුන් හා මා හා සම නොකරම, මාගේ සවාමිදරු වන් නිසා සංසාරසාගරයෙන් ගොඩනැංගෙමි. බුදුහු මට මවු සේක. පියසේක. ගුරුසේක. සවාමිදරු සේක'' යනාදීන් අප්‍රමාණ වූ බුදුගුණ එක්ලක්ෂ විසි දහසක් පමණ ඒ මහාසේනාවට ඇසෙන සේ කියා බුදුන් වැඳ එකත්පස් ව හිඳහුන්සේක.

එ වේලෙහි ඒ මහපිරිස මිහතෙරුන් වහන්සේ කළ ප්‍රාතිහාර්‍ය්‍ය දුක ඉතා මහත් වූ සාධුකාර කොට කුල්මත් වූවාහු ''බුදුහු මහානුභාව ඇතිසේක. මෙසේ වූ මිථ්‍යාදෘෂ්ටි ගෙණ රහතුම්හ යි බොහෝ කලක් ඇවිද්දා වූ උරුවෙල කාශ්‍යපයන්ගේ දෘෂ්ටි බිඳ විශේෂයෙන් ම දමනලද්දු''යි සතුටු කළහ. එ කල මාගේ සවාමි දරුවෝ ඒ කථා අසා 'අද මේ මහ පිරිසට මේ අර්ථෝත්පත්තියෙහි දී පන්සියපණස් ජාතකයට පළමුවන ජාතක දෙශනා වූ මහා නාරද කාශ්‍යප ජාතකයෙන් බණ කියා මේ පසිඳු දූන් ම සසරින් ගලවම්'යි සිතා වදාරා 'උපාසකවරිනි! මොහු දූන් මතු දමූයෙම් නොවෙමි. පෙර ත් මොහු දමා අපාය මුඛයෙන් ගැලවීමි'යි වදාරා මහ මේඝබක් පළා සඳමඬලක් පානා සේ අතීත කථාව නෙණහැර දක්වා වදාළසේක. ඒ කෙසේ දැ? යත්;

යට ගිය දවස මියුලු නුවර අඞ්ගාති නම් රජෙක් වි ය. ඔහුගේ රුජා නම් වූ ප්‍රිය වූ දුවක් ඇත. ඕ මනොහර වූ රූ ඇත්තී ය. සූක්ෂම වූ නුවණ ඇත්තී ය. අචල වූ ශ්‍රද්ධා ඇත්තී ය. තුදුස් ජාතියක් දක්නා ජාතිස්මරණ ඥාන ඇත්තී ය. ඒ රජ දවස් පතා පස්විසි කරඬුවක් සුවඳ මල් හා සුවඳ පලඳනා දුවට දෙයි. මැදි පොහොයෙන් පොහොයට දන් දෙනු සඳහා දහසින් බැඳ පියලි ද දෙයි. තෙමේ ද දැහැමෙන් සෙමෙන් රජකෙරෙයි. මෙසේ වසන කල පොහෝ දවසෙක බණ කියන්නවුන් නොයා උයනට ගොස් මෙලෝ පරලෝ නැතැ යි මිථ්‍යාදෘෂ්ටි ගෙණ වසන ගුණ නම් නුගුණ ඇති නිවටකු දුක චක්‍රවර්තීති රජකු අතින් ම ඉල්විය යුතු චින්තාමාණික්‍යයක් දුගියකු අතින් ඉල්වන්

නා සේ බුදු සොණකුන් අකින් විචාළයුතු වූ බණ ඒ නිවටා අතින් විචාරණුයේ 'හිම් මෙලෝ පරලෝ පව් පින් විපාක විභාගය විශෙෂ යෙන් ම මට වදාළ මැනවැ යි කී ය. ඒ නිවටා රජුගේ බස් අසා කත බත වැලි උකා ලන්නකු සේ, දකුණත කපන්නකු සේ, කිය නුයේ 'මහරජ කුමක් කියව් ද, මෙලොවෙක් පරලොවෙක් නැත. පින් නැත. පින් පල නැත. පව් නැත. පව් පල නැත. සුගති නම් නැත. දුගති නම් නැත. සත්ත්වයා මියගිය කල ආපො දියව මැද යෙයි. තෙජො ගිනි හා එක් ව යෙයි. වායො සුළං හා එක්ව යෙයි. පඨවි පොළොමට මැද්දෙයි. ජීවිතයෙක් නම් කිම් ද' යි යනාදීන් තමාගේ මිථ්‍යාදෘෂ්ටියෙන් බණ කියමි යි නො බණ කියා නොයෙක් ප්‍රකාරයෙන් රජහු ගිවිස්වා මිථ්‍යාදෘෂ්ටි නමැති මහ වනයේ ඇද පී ය.

එ වේළෙහි මහරජ් ඔහුගේ දෘෂ්ටිය ගෙණ පින්පල නැති පසු වැදීමෙන් කම් නැත්තේ වේදූ යි පළමු වැදලා උන් රජ ඔහු කී බණෙහි අනුශයින් ඔහට අත්හසා නො ලා ඔහු දුටුවක් දක්න මෝ වේදූයි කියා උඟසින් ගොස් ඇතුලු නුවර තමාගේ දන්හල් බිඳ සෙළවා සියලු රාජධර්මයන් හැරපියා අධිකරණ අමාත්‍යයන්ට පාවා දී පරලෝ නැති පසු මේ ලොව ම සුව විඳිමි යි සිතා තමාගේ සඳනම් මහපායට පැහැනැගි පුරස්ත්‍රීන් රැස්කොට පඤ්චකාම අනු භවයට පවත් ගත. මෙසේ කාමයෙන් ප්‍රමාද වූ රජුට තුදුස් දවසක් ගියකල රුජා නම් ඒ දුවනියෝ මෙ පවත් අසා ඔපියානන් ගත් දෘෂ්ටිය අද බිඳිමි යි සිනා ලා පන්සියයක් කුමරියන් හා කිරි මවුන් පිරිවරා තමන්ගේ මාලිගායෙන් බැස මහ පෙළහරින් ගොස් සඳ විමිතකට වදනා සඳ දෙව් දුවක සේ පියරජහුගේ සඳ නම් මහපායට වැද පිය රජහු දක වැඳ තමන්ට ලූ රන් පුටුවෙහි එකත්පස් ව උන්න.

රජ දුවගේ රූපශ්‍රී දක මහත් වූ ප්‍රේම ඇති ව 'කිමෙක් ද? මාගේ ප්‍රිය දුවනියනි! තොපට සළු පලදනා මල් සුවඳ බඩු දවස් පතා ලැබේ ද? කෙළිවලත් ලැබේ ද? සිතට සුවදූ? යි විචාළේ ය. දුවනියෝ කියන්නාහු "සවාමීනි මට කිසි පැපතකින් අඩුවෙක් නැත. ශක්‍රයාගේ දුවට අඩුවෙක් වී නමුත් මට කිසිවකින් අඩුවෙක් නැත. බල, දන්වන්නෙක් ඇත. සෙට මැදිපොහෝදින ය. මා දන් දෙන මසු දහස මට අද දුන මැනවැ'යි කීහ. රජ එ බස් අසා සිනාසී 'පුතණ්ඩ! පෙර නෙපි දන් පින් නොරෙමි යි කියා බොහෝ

රත් වළ දමුව. පෙවස් රකිමි යි රැ රැ සයින් හෙම මිලා ගිය මල් දමක් සේ මැහැර ගිය, ශරීරයට බොහෝ දුක් දුනුම, පිණෙකි පල නැත් ල. පවෙකි ත් පල නැත් ල, එ බැවින් පුතණ්ඩ! අද පටන් පින් නිසා දුක් නො ගණුව, දන් නිසා මස්සකු ත් වියදම් නොකරව, මෙ ලොව ම සුව විඳ ගණුව යි කීය.

ඒ රුජා නම දියනියෝ නම් සවල්ප වූ කෙණෙක් නොවෙති. අකුශල බලයෙන් ස්ත්‍රී ව උපන් බව මුත් පෙර කප්ලක්ෂයක් කල් පැරුම් පුරා බුදුකෙණෙකුන්ට අත් පා මෙහෙකොට සුමාසු දහසක් බම්සකණ්ඩයන් දිවග ලෙලවා මහ නුවණ ඇති මෙමව යි පසඳව සථානයකින් අග්‍ර වෙම්ව යි ප්‍රාර්ථනාකොට ආ, අප බුදුන්ට සසර නෝ ව ඉපැද පිට දුන්, කකුළු ව ඉපැද දිවි දුන්, කොපෙයක් ජාති සහස්‍රයෙහි බුදුන්ට උපකාර කොට ආ, පූර්ණජාතක නානාවජ්ඣ ජාතකාදි ජාති සහස්‍රයෙහි බුදුන් අතින් ද උපකාර විඳ ආ, දන් බුදු වූ ජාතියෙහි පවා ගිරි මේඛලා නම් ඇතු දුක්වා දන කිම අත්වා ලුහුබඳවාපු තෙජස් ඇති, අභීරු වූ, අඡමගි වූ, අනුත්‍රාසී වූ, අපලායී වූ, මාගේ සවාමිදරුවානන් ඉදිරියෙම දෙමදතනයා මෙහෙ යතලද නාලාගිරි නම් ඇතු දිවූ ද කමසී මහසුවගේ ලොවුතුරා බුදුන් කෙරෙහි කළ ප්‍රෙමයෙන් බුදුන් පසුකොට පියා ඇතු පෙරට ව සිට ඇත් මා මරා නමුත් මාගේ බුදුන් නො මරව යි කියා ජීවිත පූජා කළා වූ අපගේ ආයුෂ්මත් අනඳ මහ තෙරුන් වැනත්තේ ම ය මේ වැනි මහාත්මියන් පවා ස්ත්‍රී ජාතියෙහි උපදමාපියන තරම මේ අග් මුල් නැති සසරෙක් මි ය; නුවණ ඇති ජනයන් විසින් මේ සසර හසරක් නො කලමනා මි ය.

එසේ හෙයින් ඒ රුජා නම දුවනියෝ නම තුදුස් ජාතියක් දක්නා නුවණ ඇතියහ. එයින් කියන්නාහු 'සවාමීනි මෙලෝ පරලෝ නැතැ යි නො වදළ මැනව. ඒ ගුණ නම් කුගුණයාගේ මිථ්‍යාදෘෂ්ටිය හැර වදළ මැනව. මෙලොව ත් ඇත, පර ලොව ත් ඇත, මා බාල කෙල්ල ය යි නො සිතුව මැනව, පෙර විසූ කඳපිළි වෙළ දනිමි. කුසල් අකුසල් දෙදෙනාගේ වෙසෙස මා කියන්නෙහි ඇසුව මැනව. පූර්වයෙහි මම පුරුෂයෙකිමි, දැන් මා ස්ත්‍රී වූයේ අකුශල බලයෙකින. තුඹ වැනි රජක්හට දූ වූයේ කුශලබලයෙකින. මම පෙර මෙ තෙනට තුදුස්වන ජාතියෙහි සවර්ණකාර ව අසත්පුරුෂ වූ පාපමිත්‍රයන්ගේ සමවායෙන් පවෙකැ යි නො දැන එක මාර්ගයක

පරස්ත්‍රී සේවනයක් කෙළෙමි. ඒ අකුශල ය අලුයට ගිනිපුපුරක් සේ තිබියදී ඒ ජාතියෙන් ගොස් අනික් කුශලයකින් කොසඹෑ නුවර ධනසිටක් ම ඉපද දන් පින් කොට පෙහෙවස් රැක බොහෝ පින් රැස් කෙළෙමි. ඒ පින් සමූහය පිධානයකින් වැසූ නිධානයක් සේ තිබිය දී ඒ සිටුකුලයෙන් මිය පෙරකළ පරදාරයෙහි පවින් රෞරව නම් නරකයෙහි මැටී දෙ දහස් අවසිය අසූ කෙළක් හවුරුදු මුළුල්ලෙහි නරක දුක් විඳ කම් ශේෂයෙන් අවුදින් හෙණ්ණුන නම් රට බලසම්පන්නවූ බැටළුපෝතකයෙක් ව ඉපද ගියෙමි. එ කල එළුපාලයෝ මොහු මිනු බලසම්පන්න වුව මැනවැ යි කියා මාගේ නහරපස බැඳ සිටුවා ලා ස්ත්‍රී ධූර්තකම් කළා වූ අකුශල බලයෙන් මා හඩ ව සඩ මා තිරිගිපොළු ලාලා මැඩ බීජෝද්ධරණ ය කළහ. ඒ ජාතියෙන් මිය මහවන මැදන වානර ව වඳුරු රජක් හට පුත් ව උපන්මි. මවු වැදිරි මා උපන් වේලෙහි වඩාගෙණ 'කිම් නා පුතු බලගෑ'යි කියාලා පියවඳුරා ඔරට වඩාලූය. වඳුරු මාගේ ම අකුශල බලයෙන් සතාමි යි කියා පලමුකොට ම බීජය කට ලාගෙණ කඩා කෑහ ය.

තව ද ඒ ජාතියෙන් මිය සවණ් නම් රට ගෝ යෝනියෙහි අඳනා ගොන් ම උපන්මි. එ සමයෙහිද එ ම අකුශල බලයෙන් පොලු ලාලා මැඩ බීජෝද්ධරණ ය කළහ. තව ද ඒ ජාතියෙන් මිය වැද්දන්ගේ රට ගැණුත් නො ව පිරිමිත් නො ව නපුංසක පණ්ඩක ව උපන්මි. තව ද ඒ ජාතියෙන් මිය ශක්‍රදේවේන්ද්‍රයාට පිට පිට ම තුන්ජාතියෙක අගමෙහෙසුන් ව ඉපැද සිටුමි කළ බොහෝ කුශල බලයෙන් දිව සැපත් ලදිමි. තව ද ඒ ජාතියෙන් මිය ගොස් ජවන නම් දිව්‍යපුත්‍රයක්හට අගමෙහෙසුන් ව තුන්ජාතියෙක ඉපද දිව්‍යස්ත්‍රී වීමි, එයින් සැව අවුදින් දූන් නුඹවහන්සේට දූ ව රජ කුලෙහි උපන්මි. මෙසේ මා එක ජාතියෙක කළ පරදාර පවින් මේ ජාතිය දක්වා පුරුෂ ව්‍යඤ්ජනයක් නො ලදිමි. මෙයින් ගොස් ශක්‍ර පුරයෙහි මහෙශාක්‍ය දිව්‍යරජක් ව ඉපද ඒ පරදාර පවින් ගැලවෙමි යි සිටුකල කළ පින් බෙලෙන් දිව්‍යලෝක මනුෂ්‍යලෝකයෙහි බොහෝ වූ සැපත් ලදිමි. මේ මේ කාරණයෙන් පවෙහි විපාකත් ඇත් ම ය. පිණෙහි විපාකත් ඇත් ම ය. දූන් නුඹ මෙසේ වූ පරදාරාදි උදාරවූ පව් කොට නරකාදිවූ දුකින් මිදී කවරකාලෙක නම් ඉසක් නගන සේක් දූ යි බුදු කෙණකුන් සේ නිමිලකොට අසා ධාරණ ම ඒ රුජාවෝ පියරජහට මෙ ලෝ පර ලෝ ඇති බව් කියා බණ කීවාහු ය.

රජ පරලොව යයි කී බසට සිනාසී තපස්විහු නම් එකාන්ත යෙන් බොරු නො කියති. තාපසයෙනි! නො වළහා කියව, පර ලොවකු ත් ඇද්ද? මවු නම් පියෝ නම් ඇද්ද? පව් නම් පින් නම් ඇද්දැ? යි විචාළේ ය. බ්‍රහ්ම තාපසයෝ එබස් අසා "බොළඳ වූ රජ මෙ ලොව ත් ඇත. පරලොව ත් ඇත. මවු ත් ඇත. පියො ත් ඇත. සුගතිය ත් ඇත. දුගතිය ත් ඇතැ"යි කියා "තාගේ මේ කිලිඳි වූ දුව දන්නා කටයුතු පමණව ත් තෝ නො දන්නෙහි ද? තෝ තිරිසනෙක්හි දැ"යි කියා කීහ.

එ රජ තව ද තම්හගේ දෘෂ්ටි ය නො හැර එ බසට ත් සිනාසී මේ තාපසයා අද වෙහෙසමි යි සිතා ලා "පරලෝ ඇති බැවින්, තෝ පරලෝ සිට ආ බැවින්, දූන් ම මසු පන්සියයක් මට නය දිපියව්. මම මතු තොපගේ පරලොවට ගියකල ඇපැළි හා සමග මසු දහසක් දෙමි"යි කියා ලා තාපසයන් දසාවට අත දිගුකෙළේ ය. එ බස් අසා බ්‍රහ්මතාපසයෝ "නුවණ නැති රජ! මම තා සේ නො වෙමි. නය දීමෙහි ඉතා තත්වැස්සෙමි. දීය යුත්තන් දනිමි. නො දියයුත්තන් දනිමි. සුඛිතයන්ට නය දුන් කල දියුණු දක්වා එලවාගත හැක්ක. දුඃඛිතයන්ට නය දුන් කල උන්ගේ බැගැපත් කම් දුටු කල නය එලවා ගන්නා තබා තව ද තමා අතින් දී උන් රකිනා රිසි කෙරෙයි. එසේ හෙයින් දුඃඛිතයන්ට දී ලූ නය හද යක් නැතිව ම වදව යෙයි. එසේ හෙයින් තා දුඃඛිත නැතැත්ත වුව දූන් මසු පන්සියයක් දීලා මතු දහසක් කොයේ එලවාගණිම් දැ"යි කීහ.

රජ දුඃඛිත යයි කී බසට කිපී එසේ ද මම දුඃඛිතයෙම් ද, මාගේ මේ සත් යොදුන් මිහුලු නුවර මහත් වූ සිරිසැපත් බල. මාගේ සිවුරඟ සෙනඟ බල. සොළොස් දහසක් පුරඟනන් බල. සඳ නම් පාය බල මාගේ මේ භාණ්ඩාගාරවල උනු නොවන සැපත් බල යනාදීන් මේ ඇඳි කමාගේ රජසිරි සැපත් පා තපස්වී ව සිට තා බොරු කී සේ නො යෙදෙයි. අප වැනියෝ ත් දුඃඛිතයෝ දැ යි කියා බිණී ය. තාපසයෝ එ බස් අසා "තා සේ වූ දුඃඛිතයෙක් නම් රජ! මේ ලෝකයෙහි නැත. තාගේ මේ රජසිරි සැපත් තාගේ නො වෙයි. පින් නො කොට තබා ලා යන හෙයින් මේ හැම ම අනුන් සතු ය. රුවන් කෙතකට වැද අඟුරු උකාගෙණ යන්නා සේ මෙසේ වූ පින්කෙත් වූ මිනිස්ලොව නමැති පින් රුවන් කෙතට

වැද අකුසල් කර්මයකි අගුරු උකාගෙණ තා යන්නේ නිකම් ම ය. තා දූන් කරණ පවින් සංජීව-කාළ සූත්‍රාදි එක්සිය සතිස් නරක යෙහි මැටී පැසී පැසී දදා වැටී වැටී, බොහෝ කාලයක් කොබක් නො දූක දුක්ගන්නා කල ඒ දුක් ඉවසාගත නොහී;

> සමෙව ලංගෙය්‍යං සුගන්ධසම්පදං
> කාරෙමි පූජං සගසා නිරන්තරං,
> මුනින්ද රාජේ භුවනෙ විරාජිතෙ
> නිබ්බාණ සිද්ධාණාව රමාමි සාසනෙ-

කිය කියා හඬා ඇම්දිනෙහි ය. එ දා ඒ නරක මැදට ගොසින් මගේ මිසු දූකය ඉල්මා ගන්ට යොදුන් සියයෙක සිටියවුන් ඇස් පිපිර යන ගිණි සැමියෝ කය ඉල්වා තා කරා මා වැද්ද නො හැකි වුව. ඉදින් එදා දීම් කමුත් තාගේ කඩෙත් නැත. පිඩෙක් නැත. අනෙක් නැත. මිස්සෙක් නැත. නෝ නරක දුක් ගණිත් දී මට නය දෙගි දූ? මා තා හඬන හඬින් මා නය දෙව යි කියන හඬ තව නො ඇසෙන් වුව. තාගේ බැගෑපත් හඬ ඇසූ කල අතින් මිළ දී ත් තා ගලමා ගන්නා කරුණා උපදී. එසේ හෙයින් දූන් තට මා දූන් මිසු පත්සියයෙන් එක් මිස්සෙකු ත් මතු මට නො ලැබෙයි. මේ කාරණයෙන් තා සේ වූ දුඃඛිතයෙක් නැතැ යි යනාදීන් බණ කිය කියා නරකා හසින් රජු වෙවුල්වා එක්සිය සතිස් නරකය රජු ඉදිරියෙහි කඩා ලූවා සේ, රජු එම විට ම නරකයට වැද ගියා, සේ, භයගන්වා තැතිගන්වාපු දූ ය.

රජුගේ මිථ්‍යාදෘෂ්ටිය ගිනි දුටු ලැව් ගින්නක් සේ, සුළං දුටු වලා කඩක් සේ, දිය දුටු කුණපයක් සේ, රජු කෙරෙන් අන්තර්ධාන විය රජු තාපසයන් වැද 'සිමි නුඹ වහන්සේ මට මවු දූ ය. පිය දූ ය. ගුරු දූ ය. දෙවි දූ ය. බඹ දූ ය'යි කිය කියා නුඹ මා ම ගලවන නිසා වැඩි දූ ය. නරක දුකින් මා ගොඩ නැගූ දූ ය. මේ වේලෙහි පටන් මෙලොව දනිමි. පරලොව දනිමි. පව් දනිමි. පින් දනිමි. කුසල් දනිමි. අකුසල් දනිමි. මවුන් දනිමි පියන් දනිමි. මිථ්‍යාදෘෂ්ටි නමැති මහ වේ බැද්දෙන් සම්‍යක්දෘෂ්ටි නමැති රජ මාවතට බැස සුවසේ ගමන් ගනිමි. මාගේ මේ රජ සැපත සැම් නො තබා පින්වතන වපුට කරිමි යි කියා සම්‍යක් මාර්ගයෙහි ගලා සිදු වූ ඉන්ද්‍ර බිලයක් සේ ස්ථිරව ම රජ පිහිටා ගියා. බ්‍රහ්මරාජයාණෝ ද මෙසේ ලොකාර්ථසාධනය කොට තමන්ගේ බ්‍රහ්මලෝකයට ම ගියාහු ය.

මෙසේ මාගේ ස්වාමිදරුවූ බුදුරජාණන් වහන්සේ මේ නාරද කාශ්‍යප ජාතකය පූර්වාපරසන්ධි ගළපා චතුරාර්‍ය්‍යසත්‍ය දේශනා වන් නිමවා වදාරා "උපාසක ජනයෙනි! මේ උරුවෙල කාශ්‍යපයා දැන් මතු දමුයෙම් නො වෙමි. පෙර ත් දැමීම් ම ය. ඒ අඞ්ගාති රජ නම් මේ උරුවෙල කාශ්‍යපයෝ ය, බ්‍රහ්මරාජ්‍යයාණෝ නම් බුදු වූ මම ම වේදැ" වදාළසේක. ඒ දෙශනාව කෙළවර බිම්බිසාර රජ්ජුරුවෝ එකොළොස් නහුතයක් ඇමැතියන් හා සමග සෝවාන් ඵලයෙහි පිහිටා ගියහ. නහුතයක් මනුෂ්‍යයෝ සරණ සීලයෙහි පිහිටා සියහ මෙසේ බුද්ධ වචනයෙහි කුහුල සන්දෙහ දශදහසක් සංඛ්‍යාවෙහි වැමෙන හෙයින් එදා බණ අසන්නවුන් හා දෙළොස් නහුතයෙකැ යි කියන ලද එක් ලක්ෂ විසිදහසක් මනුෂ්‍යයෝ ම පලමුවන මේ ජාතක ධර්මය අසා සංසාර භයෙන් ගොඩ නැංගාහු ය යි දතයුතු.

ඉක්බිති බිම්බිසාර රජ්ජුරුවන් හා අමාත්‍යයෝ පෙර කෙරේ වූ පිණක් කොට මෙසේ වූ බුදුරජාණ කෙණකුන් දැක චක්‍රවර්ති රජක්හට පිසූ අග්‍ර භොජනයක් ලබන්නා සේ අග්‍ර වූ ජාතක ධර්මය ලදින් අග්‍ර නිවන් රස වින්දාහුද? යත්; මෙයට දෙසානූ වන කප ඵුස්ස නම් බුදුන්ට මල් බෑ වූ තුන් බෑ රජුන් තුන් මසක් උවරා දන් දෙන සමයෙහි මේ බිම්සර රජ්ජුරුවෝ එ සමයෙහි එක්ලක්ෂ විසිදහසක් පමණ අයකැමියන්ගෙන් අමු ඔවුන්ට නායක වූ අයකැමි ව එ තුන්මස මුළුල්ලෙහි අප්‍රමාදව දන් විධානය කරවා අනුන් දෙන දනැ යි නො සිතා තමන්ගෙන්ම දෙන දනයක් සේ ම සිතා ශ්‍රද්ධාවෙන් ම දන් විධානය කළාහු ය. ඒ කුශල මූලයෙන් මී එකානුකපක් මුළුල්ලෙහි දිව්‍යලොක මනුෂ්‍ය ලොකයෙහි සම්පත් විඳ මේ ජාතියට අවවන ජාතියෙහි චාතුර්මහාරාජික දිව්‍ය ලොකයෙහි දිව්‍යරාජ ව ඉපද අනූලක්ෂයක් හවුරුදු දිව්‍යශ්‍රී විඳ දවස් යවා එයින් අවුදින් පිට පිට සත් වාරයෙක මෙසේ දඹදිව රාජ්‍යය කළහ. දැන් මේ ජාතියෙහි තුන් සියයක් යොදුන් අඟු-මගධ දෙරටින් හා අසූ දහසක් මහ නියම්ගම්න් හා සැදියා වූ මේ රජගහා නුවර කොළොස් හැවිරිදි ව ඔටුනු පැලඳ එකුන්තිස් හවුරුද්දෙහි අප මහා ගෞතම බුදුන් දැක බණ අසා එම පමිදු හා සමග එක් ව කළ පිණින් එකවිට ම සෝවාන් ව එතැන් පටන් සත්තිස් හවුරුද්දක් මුළුල්ලෙහි බුදුන්ට උපාසක ව මෙසේ සසැ

හවුරුද්දක් ජීවත් ම අනුන්ගේ දත් සමසිත් ව විචාරාලූ පිණින් අමාමහ නිවන් දූත සසරින් ගොඩනැංගාහු ය යි දතයුතු.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ බුදුන් වැද සෙව් දවසට පවරා බුදුන් ප්‍රදක්ෂිණා කොට නුවරට ගියහ. දෙවනදා උදෑසන ඇතුළු නුවර පිටි නුවර වසන අටළොස් කෙළක් පමණ මනුෂ්‍යයෝ ම "ජීවය බුදු කෙනෙක් අපගේ නුවරට අවුල. අපගේ රජ්ජුරුවෝ බණ ය යි කියන දෙයක් ඇසූල. නිවණැ යි කියන රසයක් බුදුහු බෙදූ දුන්නූල. ඒ බුදුහු කෙසේ වූ කෙනෙක් දෝ හෝ, උන්ගේ දහම් නම් කවර දෙයෙක් දෝ හෝ, සුදු දෙයෙක් දෝ හෝ, නිවන් රස නම් කෙබඳු රසයෙක් දෝ හෝ" යි එ නුවර ඇලළ අලුයම් වේලෙහි සඳොස් මිස ගෙහෙග නික්ම බුදුන් වැඩඋන් උයනට තුන්ගවු පමණ මග මිනිසුන්ගෙන් නැති වි ය. උයන අවසරයෙක් නැති වි ය. මනුෂ්‍යයෝ බුදුන්ගේ රූසිරි බලු බලා ඇස් හයාගත නො හෙති. සිත් හයාගත නො හෙති. පා හයාගත නො හෙති. බුදුන් සිනා වඩනට මෙහෙහි අවකාශයෙක් නැත. බුදුහු ජනයන් කෙරෙහි කරුණාමෙන් රූසිරි දිදී වැඩසිඳිනා සේක් ම ය.

එ දා බුදුන් හුන්බිම් වන හෙයින් බුදුන්ගේ පුණ්‍යානුභාව යෙන් සක්දෙව් රජහුගේ පාණ්ඩුකම්බල ශෛලාසන ය රත්කොට පූ යවටක් සේ කකියා ගිනි අලලින් ශක්‍රයාගේ තුන්ගවු උස දිව්‍ය ශරීර ය සුගන්ධිභාජනයන් කැවූ ඉටිකඳක් සෙයින් කකියා පැනනැංග. එ කෙණෙහි ශක්‍රදෙවෙන්ද්‍රයා මරණභයින් වෙවුලා ආසනයෙන් බිමට පැන කිමෙක් දෝ හෝ යි පරීක්ෂාකරණුයේ තමා උපෙක්ෂා වුවහොත් එ දා බුදුන් හුන්බත් වෙති යි දැන තරුණ වූ අභියුක්ත වෙසක් මවාගෙණ ශෝඑ ලියක් අතින් ගෙණ තුනුරුවන් ගුණ අර හයා සතුනි කොට කොට බුදුන් ඉදිරියෙහි සිටගෙණ තමාගේ ශක්‍රානුභාවයෙන් තුන්ගවු පමණ තැන සිටගත් ඒ සා මහපිරිස මූහුදු දිය දෙබෙ කළ ගරුඩ රාජයා සේ දෙබෙ කොට පියා දකුණ'ත ඔසමාගෙණ හඩ ගා ඒ පිරිසට ඇසෙන සේ;

දසවාසෝ දසබලෝ–දසධම්මවිදූ දසභි චු'පෙතො,
සො දස සත පරිවාරො–රාජගහං පාවිසි භගවා.

මේ ආදීන් බුදුන් ගුණ කිය කියා පිරිස් දෙබෙ කොට බුදුන් පෙරට ව ලා පසීත පලා දිවන කාහවෙසන පෝතකයකු සේ පිරිස් පලා නික්මිත.

එ කල ඒ මනුෂ්‍යයෝ මේ තරුණ පුරුෂයාගේ වික්‍රම හා රූප ශ්‍රී දැක "මේ දරු ඉතා රිසියෙන කොයේක. ඉතා බුහුටි කෙනෙක. මෙ වැනි තරුණ පුරුෂයකු මෙතෙක් දවස් මෙනුවර නුදුටු විරූම්හ. තෙපි කොයි සිට ආ කෙණෙක්දැ'යි විචාරණි. එ කල ශක්‍රයා;

යො ධීරො සබ්බධි දන්තො-බුද්ධො අප්පටිපුග්ගලො,
අරහං සුගතො ලොකෙ-තස්සාහං පරිචාරකො යි.

මේ ගාථාවෙන් 'මම තුන්ලෝ මුදුන් වූ බුදුන්ගේ දක්‍ෂ වූ පක්‍ෂපාත එක් අභියුක්තයෙකිමි'යි කියති. එ කල බුදුරජාණන් වහන්සේ ශක්‍රයා විසින් අවකාශ කොට දුන් ඒ මාර්ගයම් දහසක් පමණ රහත් ගණයා පිරිවරා මුහුදු මැද රළු පෙළ දෙබෑ කොට ගමින් ගත් සක්රුවනක් සේ ඒ පිරිස් මුහුදු මැදින් බැලූ බැලූ සතුන්ගේ ඇස් නිවමින්, සිත් නිවමින්, ලය සනසමින්, රූ සිරින් දිලිහි දිලිහී වැඩ ඒ රජගහා නුවරට වන්සේක.

රජ්ජුරුවෝ බුදුන් වැද පෙරමඟට දිව බුදුන් වහන්සේගේ ගොස් බුද්ධාසන පණවා වඩාහිඳුවා බුදුපාමොක් සඟසිරිසට මහදන් දී වළඳා අනතුරෙහි එකත් පස් ව හිඳ "ස්වාමීනි මෙතැන් පටන් ජීවිතාන්තය දක්වා තුණුරුවන් හැර වාසයකළ නො හෙමි. සිතූ සම් විටෙක ම දැක වැඳගන්නා කැමැත්තෙමි. යට්ඨිවන උයන ඉතා දුර; මේ වේළුවන ය-කලන්දක නිවාප ය යි කියන ලද නම් දෙකෙකින් අලඞ්කාර වූ උයන ඉතා ලඟ; සිසාරා සිට ගත් නිල්වලා රැසක් වන් හුනවනයකින් පරික්ෂිප්ත ව ඉතා ක්‍ෂෙම වූ හෙයින් මේ වේළුවන ය යි කියනු ලැබේ යි. කලන්දක නම් ලෙහෙනුන්ට දෙන ලද නිපාප ඇති හෙයින් කලන්දක නිවාප නම් වි ය. ඒ කෙසේද? යත්;

ගිය දවස එ නුවර ම රජකරණ එක් රජෙක් දවසක උයන් කෙළියට ගොස් සොළොස් දහසක් පුරඟනන් හා සමඟ උයන් කෙළි කෙළ රා බී මත් ව සලෑව හෙව සවස නිඳන්නට පටන්ගත. පුර සත්‍රීහු රජු නින්දෙන් ප්‍රමාද වූ සේ දැක අපි ද කෙළ දැන් තින් දෙන් කෙළම්හ යි නිදන වේලෙහි ගස් බිලයෙක වසන නයෙක් රජු ගේ කටින් නික්මුනු සුරාපාන ගන්ධයෙන් කිපී බිලයෙන් පිවත් ව රජු දෂ්ට කෙරෙමි යි ලඟ ලඟා එයි; එ වේලෙහි මඟුල්සල අරගෙන

වෘක්ෂ දේවතාවා රජ මෙලේ නම් මාගේ උයන පාළු වෙයි සිතා ලේනවෙසක් ගෙණ රජු කරා දිවගෙණ අවුදින් කන්මුලට කොඳුරා රජු පුබුදුවා පූය. එ කෙණෙහි කාසා ආපස්සේ නමාගත. රජ තමා ලඟ සිට යන්නා වූ තසි දැක අද මේ ලේනා නිසා, මුත් මාගේ ජීවිත ය නැතැ යි ලේනා කෙරෙහි කල ප්‍රෙමයෙන් මාගේ මේ රාජ්‍යයෙහි ලෙහෙනකු මැරූ කෙනෙක් ඇත් නම් දහස් ගණන් දඩ ගණිමි යි–මගී කසමි'යි කියා රට බෙර ලවා ඒ උයනෙහි ලෙහෙනන් හැම දෙනාම මි දවස් පතා මැටුප් තබා දින. එ තැන් පටන් ඒ උයන කලන්දකයන්ට නිවාප දෙන හෙයින් කලන්දක නිවාප නමුදු වි ය.

එසේ සෙනිය් බිම්සර රජ්ජුරුවෝ ඒ උයන ඉතා රම්‍ය ය සී කියා පිළිගන්නා මැනවැ යි ආරාධනා කොට ඒ ආරාම ය නන්දනොද්‍යාන ය සේ සරහා උයන පටන් රජගෙට බජ පුන්කලස් අහස් වියන් ලදසස්මලිසී සදා, බිම සුදු වැල්ලෙන් තවරා, බුදුන් වඩා ගෙණ ගොස් ස්වර්ණභිංගාරයෙන් බුදුන් ශ්‍රී හස්තයෙහි පැන් වත්කොට වේළුවනාරාමය පිළිගැන්වූහ. එ කෙණෙහි බුදුසස්න මුල් බවට සි සතුටු ම රජුගේ අග්‍ර වූ මර වැඩි දෙන තමා ඉස් මුදුනෙහි තබාලූ පෙලෙසී මාගේ ස්වාමි මට ම හිතයේතැ යි සන්තොෂයෙන් සාධුකාර දෙන පක්ෂපාත වූ මිහිකත සේ මාගේ ස්වාමිදරුවන්ගේ පළමුවක වූ අග්‍රවිහාර ය මා මුදුනෙන් පිළිගතිමි යි ඉතා සතුටු ව මීකාස් ගුගුරා පැනනැගි ය.

දඹදිව තෙලෙහි පොළොව ගුගුරුවා පිළිගත්තාවූ විහාරයෙක්, මේ වේළුවනාරාමය හා, මච්ඡිකාසණ්ඩ නම් නුවර චිත්‍ර නම් සිටාණන් [1]සුධම් නම් මහා ස්ථවිරයන්ට පිළිගැන්වූ අම්බාටක නම් උද්‍යානය පිළිගැන්වූ දවස් හා මේ දවස් විනා පොළොව ගුගුරුවා පිළිගත්තා වූ විහාරයෙක් අනික් තෙනෙක නැත් ම ය. තව ද ශ්‍රී ලංකාද්වීපයෙහි මහමෙවුනා උයන හැර පොළොව ගුගුරුවා පිළිගත් අනික් විහාරයෙක් නැත් ම ය. මෙසේ බුදුහු රජගහා නුවර වැඩි දෙවන ද වේළුවනාරාම ය පිළිගෙණ විනෙය ජනයන් බල බලා වසනසේක.

කීයේ මැනෝ,

අකිලනෙ වෙළුවනෙ විහාරෙ
කථාගතො තත්‍ථ මනොභිරාමෙ
නානා විහාරෙහි විහාසි ධීරො
වෙනෙය්‍ය කාලං සමුදික්ඛමානො–යි.

---

1 මහානාම

බුදුන් වේළුවනාරාමය පිළිගෙණ වසන කල තුන් බුද්ධාන්තරයක් බත් පැන් නො ලත් සුවාසූදහසක් ප්‍රේතයෝ අවුදින් බුදුන් දැක බත් පැන් ලදින් සුඛිත වූහ. හේ කෙසේ දැයත්;

පෙර දෙයානූ වන කප යම් කී ඵුස්ස නම් බුදුන්ට තුන්බෑ රජුන් තුන්මසක් පවරා දන් දෙන සමයෙහි ඒ දන් පිසුවෝ සුවාසූදහසක් සත්ත්වයෝ ය. ඔහු දන් පිසන කල ආදී මුඛයෙහි දමන් හය ඇති ව දන් පිසුවාහු ය. පසුව ත් පසුව ත් දරුවන් අඬන වේලෙහි බාල දරුවන්ට දුන්නෙන් මරද නැතැ යි කිය කියා අග්‍ර භොජනය දරුවන් කාවති. වළඳවා ඉතිරි පස ය මරද නැතැ යි කිය කියා කුඩු ද කති. මෙසේ කකා පසු ව පසු ව සරු නැති ව දුක් ගත් ගත් නෑයෙන් මරද නැතැ යි කිය කියා දන්වැට අග්‍ර භොජනයෙන් කැවාහු ය. ඒ දන්මැට කෑ පවින් ඒ සුවාසූ දහසක් දන් පිසූ පරිවාර ජනයෝ ඒකානූ කපක් මුළුල්ලෙහි නරක දුක් විඳ යම් භද්‍රකල්පයෙහි ප්‍රේත ලොකයෙහි ඉපද බත් නො ලදින් පැන් නො ලදින් ඇවිදිනාහු, පළමුව බුදුවූ කකුසඳ නම් බුදුන් බුදු වූ දා මොහොතක් කල් බුද්ධානුභාවයෙන් සා දුකින් මිදී කෑමිත සනුබාම වැද ගත් වේලෙහි 'මේ උතුමා බුදු වූ පමණෙකින් මෙතෙක් කාලයක් කල් අප සා දුක් තිබී ය. ඔහු කරා ගියමෝ නම් බත් ලැබ ප්‍රෙතදුකින් මිදෙම්හ'යි කියා සුවාසූදහසක් ප්‍රෙතයෝ බෝමැඩට දිව දිව ගොසින් පෙණී "සාමීනි! මේ කප අවගත් දා පටන් බත් උලක් ඇසිනු ත් නු දුටුම් හ. පැන් බින්දුවකු ත් නො ලද්දම්හ. සා පිපාසයෙන් වෙවුලම්හ. අපගේ සා දුක් නිවුව මැනවැ"යි යාච්ඤා කළහ.

එ කල බුදුහු ඔවුන්ට බතක් තමන් වහන්සේ සමයෙහි නො ලැබෙන සේ දැක, කල නම් බොහෝ සේ දැක, උපන් මහා කරුණා ඇති ව "ප්‍රෙතයෙනි! "තොපට දුන් බතෙක් නො ලැබෙයි" කීම නම් ගින්නට ගිනි දැමුවා සේ මොවුන්ට දුක් බෝම ය යි සිතා 'මතු කොණාගමන නම් බුදු කෙනෙක් උපදිති. උන් කරා යව, උන් අතින් විචාරව, ඔහු කියන්නාහු වේ දැ'යි වදාළසේක. එ කල ප්‍රෙතයෝ ඒ බුද්ධාන්තරය මුළුල්ලෙහි බත් නො ලදින් පසු ව ඒ කොණාගමන නම් බුදුන් බුදු වූ දා ද එ සෙයින් ම ගොස් බත් ඉල්වූවාහු ය. උන්වහන්සේ ද 'මතු කාශ්‍යප නම් බුදු කෙනෙක් උපදිති. ඔවුන් කුරා ගොස් විචාරව'යි වදාළසේක.

ඒ දෙවන බුද්ධාන්තරයෙහි ද බත් නො ලදින් කාශ්‍යප නම් බුදුන් බුදු වූ දා ද එසෙයින් ම ගොස් දන බතව යච්ඤා කළහ. ඔබ වදාරණසේක්: දහසක් අවුරුද්දෙන් අගලක් වඩනා පොළොව මෙයින් ආකාශයට යක් ගව්වක් වැඩී ගිය කල මතු ගෞතම නම් බුදු කෙනෙක් උපදිති. උන් සමයෙහි තොපගේ නෑ බිම්සර නම් රජෙක් රජගහා නම් නුවරෙක දී ඒ ගෞතම බුදුන්ට දන් දෙයි.

ප්‍රේතයෝ ඒ එක බුද්ධාන්තරයෙහි බත් ලැබෙති. වදාළ බස් අසා සෙට ලබන බතක් සේ සිතා සතුටු ව ඒ බුදුහු අද බුදුවෙති යි සෙට බුදුවෙති යි සිතා සිතා මෙසා කාලයක ප්‍රාර්ථනා කරණ කැල් ගොවිනෝ වස් හිඳුත් බුදුවනකල් බල බලා වැස බුදුන් බුදු වූ දා අවුදින් රජගහා නුවරට කවර දා වඩනා සේක් දෝහෝ යි පරීක්ෂා කරන්නාහු ඒ රජ්ජුරුවන් බුදුන්ට පලවූවන දන ය දුන් දා පිංදක් නොදී නොහී වෙළුවන ය බුදුන්ට පිළිගැන්වූ දා රෑ මධ්‍යම යාමයෙහි ඒ සුවාසූ දහසක් ප්‍රේතයෝ බඩපොතු අල්වා සෙලුව සිට මහ හඬින් ගුගුරා රජුට හැම දෙන ම පෙණී ගියහ.

රජ්ජුරුවෝ උදෑසනම බුදුන්කරා අවුදින් 'ස්වාමීනි! ඊයේ රෑ මෙසේ බිහිසුණු සත්ත්වසමූහයක් මහ හඬින් හඬන්නා දිටිමි'' යි කීය. බුදුහු වදාරණසේක්; මහරජ ඔහු පෙර තාගේ නෑ සමූහයෙක. ඔහු දන් ප්‍රේත යෝනියෙහි උපන්හ'යි උන් පෙර කළ පව් හා, නරකමල විඳි දුක් හා, මේ බුද්ධාන්තරයෙහි බත් නොලත් බව හා, පෙර තුන් බුදුන් කී ස්වරූප හා, මේ පූජා කථාව දක්වාලා 'තාගේ ප්‍රේත නෑයන්ට අද පින්පෙත් දෙව'යි වදාළසේක.

එ දා බිම්සර රජ්ජුරුවෝ ඒ ප්‍රේතයන් නම්ව බුදුන් ප්‍රධාන වූ දහසක් මහ රහතන්ට මහ දන් දුන්හ. එ දා ප්‍රේතයෝ සුවාසූදහසක් දෙන තුන් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි බත් උළක් නො ගැවුනා වූ කුස් පුරා දිව්‍යභොජන ලදින් පිණා එදා රෑ ගොස් රජ්ජුරුවන්ට පිළි නැති ව පෙණුනාහ. රජ්ජුරුවෝ අනිද්දා උදෑසන බුදුන් කරා ගොස් 'ස්වාමීනි ප්‍රේතයෝ හැම්දෙන ම බත් ලද්දාහු නග්නයෙන් රෑ සිටියා දිටිමි'යි කීහ. බුදුහු 'මහරජ ප්‍රේතයන් ලබන්නේ දුන් දෙයෙක. නුදුන් දෙයක් නො ලැබෙත් ම ය. ඔවුන් නම්ව වස්ත්‍ර දන් දෙව යි වදාළසේක.

එ දා රජ්ජුරුවෝ හැමදෙනා වහන්සේට ම පිළි සමගින් දන් දී පින්පෙත් දුන්න. එවේලෙහි ප්‍රේතයෝ දිව්‍ය වූ වස්ත්‍ර හා දිව්‍ය වූ සුවඳ විලවුන් හා දිව්‍ය වූ සම්පත් ලදින් සතුවූ ම එදා රෑ රජ්ජුරුවන්ට දිව්‍යශරීරයෙන් පෙණී පසු දා බුදුන්ට ද එ සෙයින් ම පෙණුනාහ. බුදුහු සුවාසූදහසක් ඒ ප්‍රේතයන් ප්‍රේතලොකයෙන් ගලවා තිරොකුඩ්ඩ සූත්‍ර දෙශනාව කොට ඒ සුවාසූ දහසක් දෙනා ම අමා මහ නිවන් දක්වා සසරින් ගලවා වදාළසේක. මොහු හැමදෙන බුදුන්සතු දෙය කෑ පවින් මේ සා ප්‍රේතදුක් ගත්හ. දන් පිසූ පිණින් සසරින් ගොඩනැගී අමා මහ නිවන් දුටුවා හු ය යි දැන නුවණැත්තාවූ සත්පුරුෂ ජනයන් විසින් පව් පින් දෙදෙනාගේ විභාගය මෙසේ දැන විසිය යුතු.

තව ද ඒ රජගහා නුවරට නුදුරු තෙන කොලිතය උපතිස්ස ය යි බමුණුගම් දෙකෙක් වි ය. ඒ දෙගම සත්මුත්තක් පරම්පරායෙහි ඔවුනොවුන්ට මිත්‍ර ම අවාහ වූ පින්වත් බ්‍රාහ්මණකාර දෙකුලයෙක කොලිත-උපතිස්ස නම් වූ පින්වත් බ්‍රාහ්මණ කුමාරවරු දෙදෙනෙක් ඇත්තාහු ය. ඒ කොලිත නම් කුමාරයන් උයන් කෙළිනට දිය කෙළිනට නික්මෙන වේලෙහි අශුන් යොදූ රථ පන්සියයෙක් කැටුව ම යෙයි. උපතිස්ස නම් කුමාරයන් හා සමග පන්සියයක් පමණ රන්සිවි ගෙවල් යෙයි. දෙදෙන ම පන්සියයක් පන්සියයක් පිරිවර ඇත්තාහු ය. දෙදෙන ම කොයෙක් ශිල්පයෙහි දක්ෂයෝ ය, කෙළිනළු බලන කල දෙදෙන ම සමග ම හිඳ බලන්නාහු ය. එකවිට ම සතොසා වුවමනා ස්ථානයෙහි සතොසා වෙත් ම ය. සතුති කළමනා විට ම සතුති කෙරෙති. ප්‍රසාද දුනමනා කාලයෙහි එකවිට ම ප්‍රසාදත් දෙති.

මෙසේ මිත්‍ර ව වාසයකොට දෙදෙනාගේ ම නුවණ පිරී හුන් කල දවසෙක ක්‍රීඩාමණ්ඩලයෙහි හිඳ දෙදෙන ම සංසාරයෙහි කල කිරී සන්තොෂ නැති ව 'මේ කෙළි නම් සසරින් ගැලවී යන උපායෙක් නොවෙයි. මෙතැන් පටන් කෙළිනළු නො සොයා නිවන් සොයම්හ'යි මන්ත්‍රණය කොට කවුරුන් ගුරුකොට තපස් කරමෝ දැ යි පරීක්ෂා කොට එ සමයෙහි රජගහා නුවර ලඟ යෙන් යසසින් අග්‍රව වසන සඤ්ජය නම් වූ පරිබ්‍රාජකයන් ගේ ස්වරූප අසා පන්සියයක් රථ හා පන්සියයක් සිවිගෙවල් හා පන්සියයක් දෙනා අත ගමට යවා පන්සියයක් අනැවැස්සන් හැරගෙණ ගොස් ඒ සඤ්ජය නම් පරිබ්‍රාජකයන් කෙරේ තවුස්

වෙස් ගෙණ කීප දවසක් උන් කොට වැස තමන් මහනුවණැ'ති හෙයින් උන්ගේ සමයෙහි නිවන් මගෙක් නැතැ යි දැන මූළු දඹදිව ඇවිද නිවන් මග පාතා තරම් ගුරු කෙණෙකුන් සොයන්නාහු දෙදෙන ම එක්ව ගොස් යම් යම් කෙණෙකුන් අතින් පැන විචාරති. ඔවුන් විචාළ පැන කියහෙන්නෝ නැත. සෙසු ඇමදෙන විචාළ පැන මොහු දෙදෙන කියත්ම ය. මෙසේ දඹදිව තෙසැට දහසක් රාජධානිවල ඇවිද නිවන් මග පාතා තරම් ගුරු කෙණෙකුන් නොලදින් සැවත රජගහා නුවරට අවුදින් 'අප දෙදෙනා අතුරෙන් යමෙක් පළමුව නිවන් මග දුටුවෝ නම් ඔවුනොවුන්ට කියම්හ'යි මිත්‍රාණය කොට මාසය කොරති. එකල මාගේ සවාමිදරුවෝ පෙර කී ක්‍රමයෙන් වැඩ වෙළුවනාරාමයෙහි වසනසේක. පස්වග මහණුන් වහන්සේ අතුරෙහි අස්සජි නම් මහතෙරුන් වහන්සේ මූළු දඹදිව ඇවිද බුදුන් උපන් පරිදි බොහෝ සතුන්ට කියා ලෝවැඩ කොට සැමින බුදුන් කරා රජගහා නුවරට වැඩ වෙළුවනාරාමයෙහි දී බුදුන් දැක එදා රෑ එහි ලැග අනික් දා උදසන නුවරට වැඩ ගෙපිළිවෙළින් පිඩු සිගනා සේක.

එ කල පෙර කී දෙයාළුවන් අතුරෙන් උපතිස්ස නම් පරිබ්‍රාජකයෝ උන්වහන්සේ සිගන්නා දැක 'මේ උපසමය ඉතා සන්හුන් වෙසෙකැ'යි දැක පැහැද පසුපස්සේ ගොස් ඔබ වළඳන වේලෙහි තමන්ගේ පරිබ්‍රාජක පුටුව පිට වාඩිහිඳුවා වළඳා අනතුරෙහි කෙණ්ඩිකායෙන් පැන් අතට ගෙණ ලා මෙසේ පළමුකොට ඇදුරුවතින් ආදර දක්වා 'සවාමීනි නුඹගේ ඉන්ද්‍රියයෝ ඉතා ප්‍රසන්නයහ. නුඹගේ කායවාක් සමාචාරයෝ ද මට ඉතා ප්‍රියයහ. එසේ දහයින් නුඹ නිවන්මග දුටය යි සිතමි කිම්! නුඹගේ ගුරු කවුරුදැ'යි විචාළහ. එ බසට තෙරුන් වහන්සේ 'භවත! මාගේ ගුරු සව්නෙත් ගෙවා දත් බුදුරජය'යි වදාලසේක. පරිබ්‍රාජකයෝ කියන්නාහු 'සවාමීනි! එසේ වී නම් නුඹගේ ගුරුන් වදාළෙන් අවවාද පදයක් මට ද වදාළ මැනවැ'යි කීහ. අස්සජි මහතෙරුන් වහන්සේ මේ පරිබ්‍රාජකවරු නම් බුදුසසුනට ප්‍රතිපක්‍ෂයහ. එසේ හෙයින් මොහට බුදුන්ගේ ධර්මය ගරු බව හඟවා හැර ගන්වමි'යි සිතාලා 'මම අභිනව පැමි භවත! දහම් ඉතා ගරු ය. විශේෂයෙන් කියා තට හඟවාලීම මට පිළිවන්දැයි වදාළසේක. උපතිස්ස පරිබ්‍රාජකයෝ එ බසට කියන්නාහු; සවාමීනි, මට බොහෝකොට වදාරා දුක් නො ගන මැනව.

එක තැනකින් සංක්‍ෂෙප කොට කිව මැනව. නුඹවහන්සේ එක තැනින් කිවා මම සියක් දහසක් දසදහසක් ලක්‍ෂයක් තැනින් විස්තරයෙන් සිතාගන්නා නුවණ ඇතියෙම් යී කීහ. එ කල මහ තෙරුන් වහන්සේ:—

යෙ ධම්මා හෙතුප්පභවා – තෙසං හෙතුං තථාගතො, ආහ
තෙසඤ්ච යො නිරොධො – එවං වාදී මහාසමණො-යි.

යනාදීන් චතුෂ්පදික මේ ගාථාවෙන් බණ වදාළසේක. එ කල උපතිස්ස නම් පරිබ්‍රාජකයෝ ඒ එක ගාථාපදයෙන් පළමුවන දෙපද යෙහි සොළොස්වන අක්‍ෂරයට වදාළ මෙලෙසින් නයසහස්‍ර තැනින් සද්ධර්මය කරතලාමලකයක් සේ දැන සෝවාන් ඵලෙහි පිහිටා ගියහ. අනත දෙපදය සෝවාන් ව සිට අසා සාධුකාර දුන්හ.

මේ ගාථාවගේ කෙළවර ස්වාමීනි, මම නුඹවහන්සේ ගේ ගුණ ත් දැනී ගිය බුදුන්ගේ ගුණත් දැනී ගියෙ. සියලු සද්ධර්ම සාගර ය ත් පෙණී ගිය. එ හෙයින් මට බණ කියන්නට ආයාස නො ගත මැනව. මාගේ බුදුහු දැන් කොයි දැ යි විචාරා ඒ වෙළුවනාරාමයෙහි වැඩහුන් සේක යි අසා තෙරුන් වහන්සේ පසග පිහිටුවා වැදලා සමුගෙණ කොලිත පරිබ්‍රාජකයන් කරා ගොස් නිර්වාණ ධර්මය දුටුයෙම් වේ දැ යි කියා ලා බුදුන් උපන් පවත් කීහ. එ බසට කොලිත පරිබ්‍රාජකයෝ බුදුහු ය සී යන බස හා නිවණැ සී කී බසට ලොමු දැහැ ගන්වා සතුටු ව තොප අ සූ බණ මට ත් කියව යි කීහ. උපතිස්සයෝ තමන් ඇසූ ගාථාව නො වරදවා කීහ. කොලිත පරිබ්‍රාජකයෝ ඒ ගාථාව අසා තිබි වේලෙහි අනන්තාක්‍ෂරය හා සමග සෝවාන් ව බුදුහු දැන් කොයිදැ යි විචාරා වෙළුවනයෙහි යයි අසා 'අපගේ ගුරුන් සඤ්ජය පරිබ්‍රාජකයන්ට ත් අප ලද නිවන් රස දෙමහ'යි ඔවුන්ගේ ආරාමයට ගොස් බුදුන් උපන් පරිදි කියා 'අපි දැන් බුදුන් කෙරේ මහණවන්ට යම්හ, අප හා සමග අවුදින් බුදුන් කෙරේ මහණ වුව මැනවැ'යි කැඳවූහ. සඤ්ජය පරිබ්‍රාජකයෝ, 'පෙර බොහෝ කලක් මම් බොහෝ දෙනාට ගුරුකම් කොට ඇවිද් දෙම්' පසු ව දැන් භවත් ගෞතමයන් කරා ගොස් උන් කෙරේ මහණ ව උන්ට අතැවැසි වීම නම් සැලක් ව පසු ම සාළුවක් වූවා වැන්නෙමි. එසේ හෙයින් මම ඔවුන් කරා නො යෙමි. මෙලොව අඥානයෝ බොහෙව, නුවණැතියෝ මදත, අඥානයෝ අඥාන වූ මා කරා ,එති. නුවණැතියෝ නුවණැත්තාහු වූ භවත් ගෞතමයන් කරා යෙති, එසේ හෙයින් මාගේ පෂීද් බොහෝ වෙති. මම නො යෙමි'යි කියා නො ගිවිස්සාහුය.

ඉක්බිත්තෙන් කොලිත - උපතිස්ස දෙදෙන ආචාර්යයන් නො එක් ලෙස කැඳවා නො ගිවිස්නා හෙයින් 'බුදුන් කරා අපි යමු' හයි කියා නික්මුණෝ ය. ඒ කෙණෙහි සඤ්ජය පරිබ්‍රාජකයන්ගේ පන්සියයක් පමණ එතුමූත් නොරඳා ආරාමය හිස් කොට දෙදෙනා හා කැටිව නික්මුණාහු ය. සඤ්ජය පරිබ්‍රාජකයෝ හිස් වූ ආරාමය දක ලෙත් පැසු නැගී ශෝක හැල්ලෙන් හුණු ලේ හැල්ලක් නගා පීහ. එ වේලෙහි ඒ පන්සියයක් පමණින් දෙසිය පණස් දෙනෙක් ගුරුන් කෙරෙහි කරුණායෙන් රඳාපීහ අනික් දෙසිය පණස් දෙනා හැරගෙණ දෙදෙන ම වේළුවනාරාමයට නික්මුණාහ.

එ දා බුදුරජාණන් වහන්සේ සිවුවණක් මහ පිරිස් පිරිවරා බුද්ධාසන මුදුනෙහි [illegible] මෙන් දිලිහී දිලිහී වැඩහිඳ බණවදාරණසේක් දුර එන්නාවූ ඒ කොලිත-උපතිස්ස දෙයාළුවන් දක බණ අසන්නාවූ සඟපිරිසට ආමන්ත්‍රණය කොට මහණෙනි මා කරා එන තෙල පරිබ්‍රාජකවරු දෙදෙන මාගේ ශාසනය නමැති දිව්‍යරථය අලඞ්කාර කරන්නාවූ දිව්‍යාශ්ව යුග්මයක්සේ මාගේ අගසවු දෙදෙන බුදුන් කරා අවුදින් පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව හිඳ ස්වාමීනි! නුඹ වහන්සේගේ ශාසනයෙහි පැවිද්ද ලබමෝදැ'යි විචාළාහ. එකෙණෙහි බුදුහු දක්ෂිණ ශ්‍රී හස්තය දිගුකොට:—" එථ භික්ඛවෙ ස්වාක්ඛාතො ධම්මො, චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියාය" යි වදාළසේක. එ කෙණෙහි නැම දෙන ම සෘද්ධිමය වූ පාත්‍රා සිවුරු ලදින් වර්ෂ ශතයක් ගුණබම් පිරූ මහතෙර පෙළක් සේ වැඩහුන්සේක.

ඉක්බිත්තෙන් බුදුහු ධර්මදේශනා කළසේක. අගසවු දෙදෙනා වහන්සේ හැර අවශේෂවූ දෙසිය පණස් දෙනා වහන්සේම රහත්වූසේක. මුගලන් මහතෙරුන් වහන්සේ මහණ වූ සත් දවසින් මගධරට කල්ලවාල නම් ගමදී බුදුන් විසින් දුන්නාවූ ධාතුකම්මස්ථානය අසා සෙදගැමි-අනගැමි-අරහත් යන තුන් මාර්ගඵලයට පැමිණ ශ්‍රාවක පාරමිතා ඥාන ය මස්තකප්‍රාප්ත කළසේක. සැරියුත් මහ තෙරුන් වහන්සේ ද මහණ වූ පසළොස් දවසින් බුදුන් හා සමග එම රජගහා නුවරට නුදුරු.තෙහ හූරුකල නම් ලෙන වසනසේක් දීඝනඛ නම් පරිබ්‍රාජකයන් එම ධර්මසෙනෙවි සාමීන් ගේ ම බෑනනුවන්ව වේදනා පරිග්‍රහ නම් සූත්‍ර දේශනාව බුදුන් දේශනා කරණ දා ඒ දේශනාව අසා අතික්කන්තව ලකබතක් උදුරා

ගෙණ කන්නා සේ නමින් වහන්සේ ද සෙදගෑමි අනාගෑමි අරහත් යන තුන් මාර්ගඵලයට පැමිණ අග්‍ර ශ්‍රාවක ඥානයෙහි මුදුන් පැමිණිසේක.

ඉක්බිත්තෙන් එම ද සවස වෙළුවනාරාමයෙහි දී ශ්‍රාවක ගණයා රැස්කොට සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේට අගසවු තනතුරු දී එම ද නවම් මස මැදිපොහොයෙහි චූසස නම් යොගයෙන් මෙසේ මැදිපොහොයක් හා හැම සව්වන් කො සැදවා රැස් වීමක් හා හැම සව්වන් එහි භික්‍ෂුභාවයෙන් ම පැවිදි වූ බවක් හා, හැම සව්වන්ම රහත් වූ බවක් හා මෙසේ වූ චතුරඞ්ගයෙන් යුක්ත ව මැඩහිද එක්දහස් දෙසියපණස් මහරහතන් හා සමග අනන්තාපරියන්ත වූ රජ පිරිස් පලඳනා ලද මුක්තාහාරයක් බඳු වූ අනන්තාපරියන්ත වූ බුදුන් විසින් මුඛාලඞ්කාර කරණලද:

සබබපාපස්ස අකරණං-කුසලස්ස උපසම්පදා,
සචිත්ත පරියොදපනං-එතං බුද්ධාන සාසනං.

යන මේ ගාථාරත්නයෙන් අලඞ්කාර කොට පාමොක් දෙසා වදාළසේක.

එතැන් පටන් ඒ සැරියුත් මුගලන් අගසවු දෙදෙනාවහන්සේ බුදුසසුන් නමැති ආකාශය හොබවා ඇවිදිනා හිරු සඳු දෙදෙනා සේ බුදුන්ම අනුව බුදුසසුන් හොබවා වදාළසේක.

මේ අගසවූ දෙදෙනා වහන්සේ කෙසේ වූ පින් කොට මෙසේවූ බුදුකෙණකුන් වහන්සේට අග්‍රාවක වූ සේක් දැ? යත්;

මෙයට එකාසඞ්ඛ්‍ය කප් ලක්‍ෂයකින් යට අනෝම දස්සි නම් බුදුන් සමයෙහි සැරියුත් ස්වාමි සරද නම් තාපස ව සූසැත්තෑ දහසක් තපස්වීන් පිරිවරා හිමාලය වනයෙහි පන්සලෙක වැස ලක්‍ෂයක් රහතන් හා සමග තමන් වහන්සේගේ පන්සලට වැඩි බුදුන් දැක පැහැද වන මුල් වන ඵලාහාර වළඳවා ලක්‍ෂයක් මල් ආසන පණවා සතර ගව්වක් උස මලස්නෙක බුදුන් වඩා හිඳුවා තුන් ගවු උස මලසුන්වල අගසවු දෙදෙනා වහන්සේ වඩාහිඳුවා ගවු දෙගවු උස මලසුන්වල සෙසු ලක්‍ෂයක් රහතන් වඩා හිඳුවා, බුදුන් හිරසට මහත් මල්කුඩයක් මවා ඒ කුඩය අතින් අල්වාගෙණ සත්දවසක් නිරාහාරයෙන් බුද්ධාලම්බන ප්‍රීතින් සිට ධ්‍යානසුවයෙන් වැඩලන් බුදුන්ට මෙසේ පූජාකොට සිට සත්වනද අගසවුදෙදෙනා

බුදුන් අභිමුඛයෙහි සිඳ මදුරණ බණ අසා 'මම ද බුදුකෙණෙකුන්ට අගසවු ව මුන් වහන්සේ සේ ම නුවණැති ව බණ කීමට දන කියන්නවුන් කෙරෙහි අග්‍රයෙම්ව'යි කියා ප්‍රාර්ථනා කළසේක. බුදුහු ද විවරණ පතුල් දුන්සේක.

තව ද මුගලන් මහාතෙරුන් වහන්සේ ද එ ම සමයෙහි ඒ සරද තාපසයන්ගේ ගිහි යහළු වූ සිරිවඩ්ඪන නම් සිටු ව ඉපවත් අසා මම ද මාගේ යහළුවාකෙන් වහන්සේ කළ ප්‍රාර්ථනාව කෙරෙමියි සිතා නිලුපුල් මලින් මණ්ඩපයක් තිමවා ඒ බුදුන් ප්‍රධාන වූ එක් ලක්ෂ සූහැස්සෑ දහසක් රහතන් පවරා වඩා හිඳුවා සත්දවසක් මහ දන් දී 'මම ද මතු බුදුවන කෙණෙකුන්ට විතීය ශ්‍රාවක වෙම්ව'යි ප්‍රාර්ථනා කළසේය. මෙසේ ඒ දෙදෙනා වහන්සේ එ කල පටන් එකාසඛ්‍ය කප් ලක්ෂයක් මූළල්ලෙහි ම ඔවුනොවුන් හා සමග මිත්‍ර ධර්ම රක්ෂාකොට දිව්‍යලොකයෙහි හා මනුෂ්‍යලොකයෙහි සමපත් එක්ම ම විඳ මේ බුද්ධොත්පාද කාලයෙහි කොලිත-උපතිසස නම් උතුම් වූ බමුණු කුලයන්හි ඉපද එ සමයෙහි එක් ම කළ කුසල බලයෙන් ම අප මහාගෞතම නම් බුදුරජානන්ට අග්‍ර ශ්‍රාවක ශාසන නමැති දිව්‍යරූපයෙහි නිර්මිත වූ දිව ඇස් දෙකක් සේ ශොභමාන වූ සේක යි දතයුතු.

තව ද ඒ මතු කො වෙයි. මේ දෙදෙනා වහන්සේ මාගේ ස්වාමි දරුවන් පාරමිතා භූමියෙහි ඇවිදිනා කල ද පාරමිතා නමැති රථය සුවසේ ගෙණ යන රථ සක් දෙකක් සේ ම බුදුන්ට ද උපකාර ව බුදුන් ගෙන් ද උපකාර ලදින් අනුබල ම වාසයකළ හෙයිනු ත් බුදුහු ඔබ ම අගසවු කළසේක් ම ය. කෙසේ ද? යත්;

සරභංග ජාතකයෙහි ස්වාමිදරුවන් සරභංග නම් ශාස්තෘ ව ලොව බුද්ධොත්පාද කාලයක් සේ කරණ සමයෙහි සාලිස්සර ය-කිසවච්ඡ ය යි යන අනැවැසි මහ තවුස් ව බෝසතුන්ගේ සිත් සේ වාසය කළ සේකු ත් මේ සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේමය. තව ද චුල්ලසුතසෝම ජාතකයෙහි මාගේ ස්වාමිදරුවන් සුත සොම නම් රජ ව රාජධර්මයන් හා සත්‍යපාරමිතාව පූරණය කරණ සමයෙහි ද ජ්‍යෙෂ්ඨ වූ පුත්‍ර ව, ජ්‍යෙෂ්ඨ වූ සෙනාපති ව, අ[illegible]බල ව, පක්ෂපාත ව, කීකරු ව, විසූසේ කු ත් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද විනීල ජාතකයෙහි මාගේ ස්වාමිදරුවන් හංසරාජ ව ඉපද හීන ජාතියෙහි ඇත්තවුන් මිත්‍රා උපකාරයක් ලත් කල උත්සන්න වන පරිදි දක්වා හීන සත්‍රීන් හා සමග ත් උත්තමයන් ගේ සංවාසය වෙයි කියා කාමයෙහි ආදීනව දක්වන්නාවූ සමයෙහි ද ප්‍රිය පුත්‍ර වූ හංසපොතක ව ඉපිද පියාණන් වහන්සේ මිහිස්ලොව ඇවිද්ද නො දී ප්‍රේම සහිත ව විසූයේකු ත් මේ දෙදෙනා වහන්සේ ම ය.

තවද කුරුංගමිග ජාතකයෙහි ස්වාමිදරුවන් කුරුංග නම් මුව රජ ව ඉපද හීන වූ මිත්‍රයාගේ ත් විශ්වාසය උතුම් ම යයි මිත්‍රධර්මයෙහි බල දක්වා වදුරණ සමයෙහි කැරලු ම ඉදිබුව ඉපද බෝසතුන් මල බැඳී ගියදු ජීවිතය රක්‍ෂාකොට සිටියේකු ත් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද මාගේ බුදුරජාතන් වහන්සේ ව්‍යාඝ්‍ර ජාතකයෙහි වෘක්‍ෂ දෙවතාව ඉපද පාරමිතා ධර්මයන් පූර්ණ කාරණ සමයෙහි ද සිංහ ව ව්‍යාඝ්‍ර ව ඉපද ඔබ වසන ඒ මහවනයෙහි සිව්කොණකුන් අත්තක් කපාලිය නො දී මිත්‍රකම් කළයේකු ත් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද කුරුධර්ම ජාතකයෙහි ස්වාමිදරුවන් දාන පාරමිතාව හා ශීල පාරමිතාව පරිශුද්ධ කොට රක්‍ෂා කරණසමයෙහි ද සිටු පුත්‍ර ව ද්‍රෝණමාණවක නම් ඇමැති ව බෝසතුන් සේ ම පංච ශීලය රක්‍ෂා කොට ධර්මයෙන් විසූ යේකු ත් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද සසජාතකයෙහි මාගේ බුදුරජාතන් වහන්සේ සස රාජ ව ඉපද ශීලපාරමිතාවෙහි කෙළ පැමිණ සදම්බලේ බැබැලුනු සමයෙහි වාතර ව සිගාල ව එක් ව සිල්රක්‍ෂාකොට බෝසතුන් ගේ අවවාද නො ඉක් ම මිත්‍ර ධර්මය රක්‍ෂාකොට කීකරු ව විසූයේ කු ත් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද කක්කාරි ජාතකයෙහි දශබලධාරි වූ ත්‍රිලෝගුරු මාගේ බුදුරජාතන් තවුතිසා දිව්‍යභවනයෙහි දිව්‍යරාජ ව ලොකාර්ථ චර්‍ය්‍යාව පූරණය කොට මෘෂාවාදයෙහි ආදීනව පෑ ලොව හය ගැන් වූ සමයෙහි යහළු වූ දිව්‍යරාජයන් ව ඉපද බෝසතුන් හා සමග ලෝමැඹි කොට ඇවිදි යේකු ත් මේ දෙදෙනා වහන්සේ ම ය

තව ද සත්තුභස්ත ජාතකයෙහි මෙ ම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සේනක නම් පණ්ඩිත ව ප්‍රඥාපාරමිතාවේ බල දක්වන සමයෙහි ආයුරක ය පුක්කුස ය යි යන අනුවැසි පණ්ඩිත ව ඔබ ම ගුරුකොට ස්වීකාර ව විසූ සේක් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද තිත්තිර ජාතකයෙහි දිපකදූතනම් වූ මාගේ ස්වාමිදරුවන් වටු ව ඉපද පරම ත්‍රිවේදය නිමවා දන දඹදිව වේද දන්නන් කෙරෙහි අග්‍ර ව දිසාපාමොක් ආචාර්‍ය්‍ය ව මහ වන මැද පන්සලෙක වාසය කොට බොහෝ අනුවැසියන්ට ශිල්ප දී ප්‍රඥාපාරමිතාවෙහි සාරය මැඩගන්නා සමයෙහි එ වෙහෙහි සිංහ ව්‍යාඝ්‍ර දෙයාළුව ඉපද වටු වූ බෝධිසත්ත්ව ආචාරීන් කරා අවුත් අවවාද ඉගෙණ ගෙණ එකාමිත්‍ර ව සම්බන්ධය කළ සේක් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද බිළාර කෝසිය ජාතකයෙහි ස්වාමිදරුවන් ශක්‍ර දෙවේන්ද්‍ර ව ඉපද අග්‍රබිසෝ සතුන් දමා ලොභ හරවා දන්සොඬ කරවා ලෝකාර්ථචර්‍ය්‍යාව පූර්ණය කළ සමයෙහි චන්ද්‍ර-සූර්‍ය්‍ය දිව්‍යපුත්‍ර ම ඉපද උන් වහන්සේට අනුබල සහාය ව මිත්‍රලෝචව ඇ සේක් මේ දෙදෙනා වහන්සේම ය.

තව ද චතුපෝසථිකා ජාතකයෙහි ස්වාමිදරුවන් එක්තරා එක් ගෙසක රුක්දෙවි ම ඉපද දිව්‍යධර්මයන් පූර්ණය කරණ සමයෙහි ද චිත්‍රකූට පර්වතයෙහි දෙබෑවූ රන්වන් හංසව ඉපද ගොදුරුසොයා යන එන කල බෝසතුන් වසන ගස සැතපි සැතපී ගොස් මිත්‍ර ධර්මය නො කසා කථා කොට ප්‍රියයෙන් අවවාද ලදින් ඇවිදි සේක් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද හස්තිපාල ජාතකයෙහි මාගේ ශාක්‍ය සිංහයානන් වහන්සේ හස්තිපාල නම් කුමාර ව ධන හැර ගොස් පැවිදි ව ශීල පාරමිතාවෙහි මුදුන් දක ධ්‍යාන කෙළි කෙළනා සමයෙහි අශ්වපාල නම් ගවපාල නම් කුමාර ම බෝසතුන් හා සමග ම රජය හැර ගොස් මහණ ව ධ්‍යාන කෙළි කෙළි සේක් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද ජවන හංස ජාතකයෙහි මාගේ ශිරෝමාණික්‍ය වූ බුදු රජාණන් වහන්සේ ජවන හංසරාජ ව අපද ඉරු හා ශීඝ්‍ර ජව යෙන් යුද්ධකොට ඉරු පරදවා ඉතා මහත් වූ වික්‍රම දක්වා සතුන්

ගේ ආයුසංස්කාර ය ඉතා ශීඝ්‍ර ව ගෙවෙන පරිදි නොයෙක් උපමා වෙන් දක්වා ලෝවැසියන් මරණයෙහි භයගන්වා කුශල මාර්ගයෙහි පිහිටුවා ලූ සමයෙහි මල්බෑ වූ හංසරාජ ව ඉපද හිරුගේ තෙජෝ ගින්නෙන් දා මියන වේලෙහි බෝසතුන් නිසා ම ජීවිත ය ලදින් ජීවිතාන්තය දක්වා ඔවුනොවුන්ට උපකාර ව විසූ සේකු ත් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද ඛණ්ඩහාල ජාතකයෙහි මාගේ ලොකාධිපති වූ බුදුන් චන්ද්‍ර නම් කුමාරව ඛණ්ඩහාල නම් දෙව්දත්තයාගේ බන්ධනයට පැමිණ මරණ ප්‍රාප්ත වූ සමයෙහි සූර්යගෝත්‍ර නම් චන්ද්‍රගෝත්‍ර නම් සහොදර කුමාර ව ශක්‍රයාගේ බලයෙන් එක් ව ම ජීවිතය ගලවා ගෙණ බොහෝ කලක් එක්ව ම රාජ්‍යය කළ සේකු ත් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද මහාජනක ජාතකයෙහි මාගේ බුදුරජාණන් වහන්සේ පඤ්චකාමයෙහි ආදීනව දැක කාමබන්ධන ය බිඳහැර තපසට වලට යන දා නාරද නම් මිගාජින නම් දෙදෙන ව මහා තාපස ව බෝස තුන් පෙරමග දී දැක වීර්‍ය වඩා බණ කියා කල්‍යාණ මිත්‍ර ධර්මය පිරූ සේකු ත් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද දුතිය තිත්තිර ජාතකයෙහි මාගේ ධර්මරජාණන් වහන්සේ වටුජාතියෙහි ම ඉපද හිමාලය වනයෙහි මහ නුග රුකක් අස වැස බොහෝ ආයු ඇති ව ජ්‍යෙෂ්ඨාපචායන ධර්මයන් පුරණ සමයෙහි ද වඳුරු ව ඇත් ව ඉපද බාලයන් මහල්ලන් තෝරා දැක බොහෝ කලක් බෝසතුන් ගුරු තනතුරෙහි තබා සහවාසය කළ සේකු ත් මේ දෙදෙනා වහන්සේම ය.

තව ද සම්භව ජාතකයෙහි මාගේම ප්‍රඥා ගර්භයා වූ බුදුරජාණන් වහන්සේ ම සත්හැවිරිදි සම්භව නම් කුමාර ව මූළු දඹදිව උපන් පැන කියා ලොව බුද්ධොත්පාද කොට ප්‍රඥාපාරමිතාවෙහි කුළුගන් නා සමයෙහි භද්‍රකාරය සඤ්ජය යන මහලු දෙබෑ කුමාර ව කුඩා මල් වූ බෝසතුන් ගුරු කොට තබා ආදරයෙන් සහොදරව විසූ සේකු ත් මේ දෙදෙනා වහන්සේ ම ය.

තව ද සංකිච්ච ජාතකයෙහි ලොකාචාර්‍ය වූ මාගේ ස්වාමිදරුවාණන් බරණැස රජය කොට දශරාජධර්මයන් පුරණ සමයෙහි ඔවුනොවුන්ට සතුරු වූ නාග මූෂික ජාතියෙහි ඉපද පමා දෙදෙන

ඔවුනොවුන් දූත ඔවුනොවුන් හා මිත්‍ර ම. තමන් දෙදෙනාගේ මිත්‍ර ධර්ම බලයෙන් ම බෝසතුන්ට ඒ සා රාජ්‍යයක් ගෙණ දී උපකාර කළාහු ත් එම දෙදෙනා වහන්සේ ම ය.

මෙසේ මෙසේ කෝ එක් ජාති කෝටියෙහි ද සසර බුදුන් හා සමග ම විසූ හෙයිනු ත් ඔවුනොවුන්ට උපකාර ව විසූ හෙයිනු ත් බුදුහු තමන් වහන්සේ කෙලෙහි ගුණ දන්නවුන් කෙරෙහි අග්‍ර හෙයිනු ත් මෙම දෙදෙනා වහන්සේ අග්‍රශ්‍රාවක කළසේක් ම ය. මේ දෙදෙනා වහන්සේ ත් උතුම් වූ අග්‍රශ්‍රාවක තනතුරු ලදින් බුද්ධශාසන නැමැති සුවර්ණ ගේහකාමෙහි රන් පළපත් සගලක් සේ බුදුසස්න හොබවා වදාළසේක. මෙසේ මේ අග්‍රශ්‍රාවක දෙදෙනා වහන්සේගේ විභාග සංක්ෂෙපයෙන් දතයුතු.

මෙසේ මාගේ ස්වාමිදරුවෝ පස්මග මහණුන් විසින් කරණ ලද අසාධාරණ වූ ප්‍රතිපත්ති පූජාය, යස නම් මහතෙරුන් ආදි පස්පණස් රහතන් විසින් කරණලද විශෙෂ වූ ප්‍රතිපත්ති පූජාය, භද්‍රවර්ගීයෙහි තිස් මහ රහතන් විසින් කරණ ලද උතුම් වූ ප්‍රතිපත්ති පූජාය, උරුවෙල කාශ්‍යපාදි දහසක් මහරහතන් විසින් කරණ ලද අනෝපම වූ ප්‍රතිපත්ති පූජාය, අගසවු දෙදෙනා හා දෙසියපණස් මහ රහතන් කළාවූ උත්තුඞ්ග වූ ප්‍රතිපත්ති පූජාය, සුවාසූ දහසක් ප්‍රෙතයන් ප්‍රේතාත්මභාවයෙන් මිදී දිව්‍යාත්මභාව ලදින් බණ අසා සිවන් දුටු වේලෙහි සන්තොෂයෙන් කළාවූ සාධුකාර පූජාය, බිම්බිසාර රජ්ජුරුවන් හා සමග එක් ලක්ෂ දස දහසක් අමාත්‍යයන් සෝවාන් ආදි මාර්ගඵලයට පැමිණ එකෙණෙහි උපන් සන්තොෂයෙන් කළාවූ සාධුකාර පූජාය, තවද දසදහසක් මිනුෂ්‍යයන් ශරණ ශීලයෙහි පිහිටා දිවි පමණින් කළා වූ බහුමාන පූජාය, ඒ බිම්සර රජ්ජුරුවන් වේළුවනාරාමය පිළිගැන්වූ පූජාය, එ වේලෙහි මහීකාන්තාව කළා වූ මහීගර්ජනා නම් වූ පූජා ය යි මෙසේ දෙලක්ෂ පණස්දහස් තුන්සිය සත් සාලිසක් පමණ මහ පූජා ලත් හෙයිනු ත්, මෙසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, සංසාර සේතු වූ, සංසාර නෞකා වූ, සංසාරප්‍රතිෂ්ඨා වූ සංසාර පාර වූ, සංසාර වාහන වූ, සංසාර ගජ වූ, සංසාර තුරඞ්ග වූ, සංසාර සාගර ඵලක වූ, සංසාර සාගර මීප වූ, මාගේ ස්වාමිදරු වූ,

මාගේ ම ශිරෝමාණික්‍ය වූ මාගේ ම මුදුන් මල්කඩ වූ බුදුරජාණෝ මේ මේ කාරණයෙනුත් අර්හත් නම් වන සේක.

එසේ හෙයින් කියන ලදුයේ මැයි:

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං-ති

මේ පූජාවලියෙහි අප බුදුන් රජගහා නුවරදී ලද
වේළුවනාරාම පූජා කථා නම් වූ
තුදුස්වන පරිච්ඡේදය නිමි.

පසළොස් වන පරිච්ඡේදය.

තව ද අප බුදුන් බන්ධු සමාගමයෙහි දී ලද නිග්‍රෝධාරාම පූජා නම් කවරහ? යත්;

ත්‍රිභුවන චූඩාමාණික්‍ය වූ මාගේ බුදුරජාණන් වහන්සේ මෙසේ රජගහා නුවර වේළුවන නම් ආරාමයෙහි ලෝවැඩ සාදා වසන කල ශුද්ධොදන රජ්ජුරුවෝ 'මාගේ පුතනුවෝ සිද්ධාර්ථකුමාරයෝ ලොවුතුරා බුදුවූල. ධම්සක් දෙසූ ල. දැන් රජගහා නුවර බිම්සර රජහුගේ වේළුවනාරාමයෙහි වෙසෙත් ල. තව දක්මා ත් තමන් මා ඇස දක්වා නො පියති. ඉතා කද වූ කෙණෙක ම පුතණුවෝ'යි කියා එක් ලදරු අමාත්‍යයකු කැඳවා දහසක් ඇමැතියන් ඔහට පාවා දී "තෝ සුදු පිළි හැඳ මඟුල්වෙස් ගෙණ ම පුතනුවන් කරා වෙළුවනයට ගොස් තුඹ වහන්සේගේ පියාණෝ ශුද්ධොදන රජ්ජුරුවෝ තුඹවහන්සේ කැඳවා එවූදෑ ය. තමන්සේ වූ දූති කෙණෙක් නැත. මට සොරා නො කියා ම ගොස් මහණව ගියෝ ය. සතවුරුද්දක් මුළුල්ලෙහි එක දවසෙක ත් මා ඇස පෙණී නො ගියෝ ය. දැන් බුදුවලා ත් නිවන් අමා යයි යන දෙයක් ලෝවැසියන්ට බෙදා දෙතියි ඇසීමි. තමන් වැදූ මැනියන් පියායන් බඩදලයෙන් වෙවුල වෙවුලා සිටි ය දී සෙසු සත්ත්වයන් කවා පොවා පින්කොට ඇවිදිනා කෙණෙක් මෙලොව තමන්මුත් අනික් කිසි කෙණෙකුත් නැත. මම තමන් ගේ පියානා කෙණෙක් වීම් නම් තුමූ මාගේ පුතනු කෙණෙක් වූ නම් වනා මා කරා අවුදින් ඒ දහම් අමා මටත් දෙන්නේය. බොහෝ දෙනා අතින් අසා තමන්ගේ දහම් අමාවම

මා මහත් තාෂණො ඇති පරිදි කියාලවයි උගන්වා ලා දහසක්දෙනා හා සමග ඒ අමාත්‍යයා බුදුන් කරා යවූහ.

ඒ ඇමැති දහසක් දෙනා පිරිවරා සැට යොදුන් මග ගෙවා රජ ගහා නුවරට ගොස් වෙළුවනාරාමයෙහි මහ පිරිස් පිරිවරා හුවන් සඳක් සේ වැඩහිඳ ධම්මදෙශනා කොට වදාරණ බුදුන් දැක රජහු ගේ මෙහෙවර අසුන් තබා මා බණ අසාගෙන මැනවැ යි සිතා පිරිස් කෙළවර සිට බණ අසා සපිරිවරින් රහත් ව එහි භික්ෂුභාවයෙන් මහණ වී ය. රජ්ජුරුවන්ට අසුන් මාත්‍රයකුත් කියා යවන කෙණෙකුත් නැත. රජ්ජුරුවෝ මෙසකාලය ප්‍රාර්ථනා කරන්නා වූ මියුර රාජයාකු ගේ සමීඳ නමැති මහා මෙසාන තවර කලෙක දකිම් දේගහ් යි ප්‍රාර්ථනා කරන්නාහු පෙරමග බල බලා සිඩා ව නැවත අනික් අමාත්‍යයකු හැඳවා දහසක් පුරුෂයන් හා සමග මගුල් වෙස් ගන්වා පෙර සේ ම උගන්වා යවුවාහු ය. ඒ අමාත්‍යයා ද බණ අසා රහත් ව සපිරිවරින් එහි භික්ෂුභාවයෙන් ම මහණ වී ය. මෙසේ රජ්ජුරුවෝ ගිය ගියා වුන් ම පෙරලා නො එන හෙයින් නව වාරයෙක නම මහා අමාත්‍යයකු නවදහසක් පිරිස් දී පෙර සේම යවුවාහු ය. ගිය ගිය ඇමැතියෝ සහ පිරිවරින් රහත් ව එහි භික්ෂුභාවයෙන් ම මහණ ව අසුන් තබා සසුන් වැද සුව විඳිති. එසේ හෙයින් රජ්ජුරුවන් කියා යවන පවත් බුදුන්ට දන්වන එක කෙණෙකුත් නැත.

නව ද ශුද්ධොදන රජ්ජුරුවෝ සක් රුවනක් පතන සක්විති රජකු සේ බුදුන් දැකුම් පත පතා පෙරමග බල බලා සිඩා ව; නැවත බුදුන් හා එක ද උපන් කාළුදායි නම් අග මැතියානන් හැඳවා, 'පුත කාළුදායිනි! තොප හා එක ද උපන. එක කෙළිමඩලෙහි මැඩි තොප හා ඉතා යහළු වූ ම පුතනුවන් සිද්ධාර්ථ කුමාරයන් හැඳවා දහස් දහස් ඇමැතියන් දී නව වාරයෙක නව මහා අමාත්‍යයකු යැවීමි. මේ නව දහසක් දූතයන් අතුරෙන් ම පුතනුවන් ගෙණෙන් නා තබා එක කෙණෙකුන් අසුන් පමණක් කියා එන කෙණෙක් නැත. තෙපි ද දහසක් දෙනා හා සමග මගුල් වෙසින් ගොස් ම පුතනුවන් මා ඇස දක්වා ලිය හෙව්දැ'යි විචාළාහු ය. කාළුදායි කියන්නෝ: මම ගියෙම් නම් නුඹ පුතනුවන් ඇස දක්වා ලම්, බල එතෙක් ඇත, බුදුන් දුටු විට ම බුදුන් කෙරේ මහණ වෙම්, මහණ වන්ට අවසර ලදිම් නම් දැන් ම යෙමි යි කීහ,

රජ්ජුරුවෝ කියන්නාහු: පුත තෙපි මහණ වෙව යි මහණ නො වෙව යි මපුතනුවන් මා ඇස දක්වාපු නම් මට තොප කළ උපකාරයෙක් නැතැයි කීහ. ඉක්බිත්තෙන් ඒ කාළුදායි නම් අමාත්‍යයානෝ රජ්ජුරුවන් වැඳ සමු ගෙණ දහසක් ඇමතියන් ගෙණ සුදු පිළි හැඳ සුදු මල් පැලඳ සුදු විලවුන් ගෙණ ශුබ වූ බුදුන් කරා මෙසේ ශුබ වූ මඟුල් වෙසින් ගොස් පිරිස් කෙළවර සිට බණ අසා රහත් ව එහි භික්ෂුභාවයෙන් මහණ වූහ.

මෙසේ මහණ ව ඒ කාළුදායි නම් මහතෙරුන් වහන්සේ මහණ වූ සත් අට දවසක් ගිය කල මැදින් දින මස මැදිපොහොය සම්ප්‍රාප්ත විය. සියලු හෙමන්ත කාලය ඉක්ම ගිය. වසන්ත කාලය සම්ප්‍රාප්ත විය. හැම භූමිමණ්ඩලය නිල් තෘණයෙන් ගැවසී සිටගත. සියලු වනලැහැබ් නන් මල්පෙළින් සැදී විසිතුරුව සිටගත. බුදුන් නැයන් කරා කිඹුල්වත් පුරයට වඩනා කලැ යි සිතාලා එදා බුදුන් කරා ගොසින් වැඳ බුදුන් අභිමුඛයෙහි ඇඳිලි බැඳ ආදරයෙන් සිට මෙසේ දන්වන සේක.

අඞ්ගාරිනො දානි දුමා භදන්තෙ-ඵලෙසිනො ඡදනං විප්පහාය,
තෙ අච්චිමන්තොව පභාසන්ති-සමයො මහාවීර භගීරසානං.

නාති සීතං නාති උණ්හං-නාතිදුබ්භික්ඛ ඡාතකං,
සද්දලා හරිතා භූමි-එස කාලො මහාමුනි-සි.

යන මේ ආදි ගාථා සැටක් බුදුන් අභිමුඛයෙහි සිට විසිතුරු කොට කියා, ස්වාමිදරු වූ බුදුරජාණෙනි, හෙමන්ත කාලය දැන් අතික්‍රාන්ත විය. වසන්ත කාලය සම්ප්‍රාප්ත විය. අනෙක ප්‍රකාරවූ වෘක්ෂ රාජයෝ තමන් තමන්ගේ පුරාණ පත්‍රයන් නුඹවහන්සේ වඩනා මග කසල හරණවුන් සේ පහකළාහු ය. නන් විසිතුරු කුසුමයෙන් සැදී සැටයොදුන් මග මලින් ගෙණ නුඹවහන්සේට පූජාකොට සිටියවුන් වැනියහ. තව ද අභිනව පල්ලවාඞ්කුරයන් හෙතුකොට ගෙණ ඒ වෘක්ෂරාජයෝ නුඹවහන්සේට ශීතනිවාරණයව ගිනි අඟුරු කබල් ගෙණ සිටිතවුන් වැන්නහ. නොහොත් නුඹවහන්සේට ලොහිතාඞ්ක මාණික්‍ය රාශියෙන් පූජාකරන්නන් වැනියහ. මාර්ගයෙහි පිපි මං හැර වැට කඩහෙලු නැතිව නුඹවඩනා මග නිරවුල් විය. සියලු සතුන්ට රෝ බිය නැත. සියලු ජනයන්ගේ කොටුගෙවල් පිරී ඉතිරී තිබෙන සමය ය. එසේ හෙයින් බත් බුල

තීන් ද සමෘද්ධ ය. ඉතා ඇලුත් නැත, ඉතා ගිමුත් නැත. මේ තැන පවත් කිඹුල්වත දක්වා සැම යොදුන් මාර්ගයෙහි නුඹ වහන්සේට පූජාවට ඉඳුනිල් මිණි පෝරුවක් තතා අතරතුරෙහි රුවන් ගල් ඔබාලුවා සේ උභය පාර්ශ්වයෙහි හටගත්තාවූ නීල තෘණ ජාතීන් අතුරෙහි රතිඳු ගොව්වෙමෝ පෙළ පෙළ දී සිටගත්හ. යනාදීන් මෙසේ මාර්ගය වර්ණනා කළසේක.

ඉක්බිත්තෙන් බුදුරජාණන් වහන්සේ, කිමෙක් ද? උදායි ස්ථවිරය මධුරස්වරයෙන් මගක් ම වර්ණනා කෙරෙහිදැ යි වදාළසේක. ඒ උදායි මහතෙරුන් වහන්සේ ස්වාමීනි, නුඹගේ පියාණෝ ශුද්ධෝදන රජ්ජුරුවෝ නුඹ වහන්සේගේ මේ බුද්ධ මහිම අසා මේ ධර්ම ප්‍රවාහය අසා, මෙ නිමෙන් අසා නුඹ වහන්සේ දූත තුමූ ද ශ්‍රීවිඳුනා ලොභයෙන් මා ඇතුළු ව දසදහසක් අමාත්‍යයන් දශවාරයෙක නුඹ වහන්සේ කැඳවූ මෙහෙවර එවා තව දක්වා දූතන් නොහි මග බල බලා හිරු උදය ප්‍රාර්ථනා කරණ පියුම් විලක් සේ, නුඹ වහන්සේගේ දැක්ම ප්‍රාර්ථනා කොට කොටම හිඳිති. තව ද නුඹ වහන්සේගේ මවු පිය දෙපක්ෂයෙහි බන්ධු සමූහයෝ ද සඳරැස් පතන කොමුද සමූහයක් සේ නුඹවහන්සේගේ නිමල මුඛ චන්ද්‍රයාගෙන් දිවන දේශනා නාමැති රස් ප්‍රාර්ථනා කොට කොට ම හිඳිනාහු ය. ස්වාමීනි! නුඹවහන්සේගේ පිය මහරජ්ජුරුවන් ඇදිවූ බන්ධු සමූහයාට අනුග්‍රහ කොට වැඩ වදාළ මනා කල් වේදැයි වදාළ සේක.

එ වේලෙහි ස්වාමීදරුවෝ පූර්ව බුද්ධවරයන් බන්ධූන්ට සංග්‍රහ කළා වූ කාලය මේ ය යි දැන 'මාගේ බුද්ධවංශ චාරිත්‍ර කෙරෙමි'යි සිතා 'මැනව උදායිය, බන්ධුසංග්‍රහයට යෙමි, භික්ෂූගණයාට තෝ ම ගොස් කියා දූන් ම රැස් කරව' යි වදාළ සේක. තෙරුන් වහන්සේ බුදුන් වදාළ බස් මුදුනෙන් පිළිගෙණ එ කෙණෙහි ම ගොස් එ පවත් භික්ෂූගණයාට සැලකළ සේක.

එ වේලෙහි අඟු-මගධ දෙරටින් මහණ වූ දස දහසක් රහතන් වහන්සේ ය, කිඹුල්වත සිට රජ්ජුරුවන්ගේ මෙහෙවරව අවුදින් මහණ වූ දස දහසක් රහතන් වහන්සේ ය යි මෙසේ විසිදහසක් රහතන් වහන්සේ, මණි කමටයෙන් සන්නද්ධ වූ ගඳැ'ත් පොඹ්වන් සේ, සුපිපි රත් පියුම් වනයක් සේ 'අපි බුදුරජාණන්ට දරු මෑනීකම පිළියෙන් සිවුරු වළඳුමෝදූ'යි ආකාශයට අත් පොවා සඳ වලාපටලයන් ඇදගෙණ හැඳ පෙරව ගත්තා සේ ශෝභා සම්පන්න

වූ සුරක්ත වූ පාංශුකූල චීවරයක් ධරාගෙණ අවුත් බුදුරජානන් පිරිවරා සිට ගත්හ.

එ කෙණෙහි සවාමි දරුවෝ දුරුතුමස පටන් මැදින් දින මස දක්වා දෙමසක් මුළුල්ලෙහි ප්‍රබන්ධයෙන් වාසය කළාවූ ඒ වේළුව නාරාමයෙන් එම මස මැදි පොහෝද ශ්‍රී විසිදහසක් රහතන් පිරිවරා වැඩ කිඹුල්වත පටන් රජගහා නුවර සැට යොදුන් පමණ මාර්ගය සැට දවසකින් යෙමි යි සිතා දවස දවස යොදනක් තැන් බැගින් වඩනාසේක් ගම ගමදී මි මහත් වූ ධර්මදේශනාවන් කොට බොහෝ සතුන් නිවන් දක්ව දක්වා ම වඩනාසේක.

එ කල උදායි නම් මහතෙරුන් වහන්සේ 'බුදුන් නික්මුනු පරිදි පිය රජ්ජුරුවන්ට කියා සතුටු කරමි'යි සිතා බුදුන් නික්මුනු දවස ද උදෑසන ම ආකාශයෙන් වැඩ රජ්ජුරුවන්ගේ ප්‍රාසාදයට බැස සිත ප්‍රසාද කරවා සිටිසේක. රජ්ජුරුවෝ මහතෙරුන් වහන්සේ දැක හැඳින බුදුන් දුටුවා සේ සතුටුව සිංහාසනයෙහි වඩා හිඳුවා තමන්ට පිසන ලද්දාවූ නොයෙක් රසයෙන් යුක්ත වූ රාජ භොජනයෙන් පාත්‍රය පුරා පිළිගැන්වූහ. තෙරුන් වහන්සේ නික්මෙන ආකාරය දැක්වූසේක. රජ්ජුරුවෝ 'පුතනුවන් වහන්ස, මා දැක්ක දී වළඳා වදාළ මැනවැ'යි කීහ. එ බසට තෙරුන් වහන්සේ: බුදුන් කරා ගොස් එක තැන දී වළඳමි යි වදාළසේක. බුදුහු දැන් කොයි දැයි විචාළාහු ය. මහරජ! විසිදහසක් රහතන් පිරිවරා තොප දක්නා නිසා මාගේ ආරාධනායෙන් බුදුන් දැන් වඩිමින් සිටිසේක් වේදැ යි වදාළ සේක එ බසට රජ්ජුරුවන්ගේ සියලඟ නවානූදහසක් ලොම් කීල නැගී කෙළින් සිටගත. රජ්ජුරුවන්ගේ දෙනුවන සතුටු කඳුළු පිරීගත් නිලුපුල සේ පිරී සිටගත.

මෙසේ සතුටු වූ සිත් ඇති ව 'එසේ වී නම් නුඹවහන්සේ මේ බත් මේ ගෙයි දී ම වළඳා වදාළ මැනව. යම් දවසෙක මාගේ පුතනුවන් වහන්සේ මේ නුවරට වඩනාසේක් ද, එ දවස් දක්වා මාගේ ගෙන් ම බත් ගෙණ ගිය මැනවැ'යි ආරාධනා කොට තෙරුන්වහන්සේ එ බත් වළඳවාලා ඒ පාත්‍රය සෝධවා සුවඳ සුන්නෙන් උලා පරිශුද්ධ කොට බුදුන් පෙර ගිහි ව සිටි කල අනුභව කොට පුරුදු අඹවූ තුන් හවුරුදු සුවඳ කවා තුබූ සුවඳ හැල්සාලේ බත් හා නොයෙක් සූප ව්‍යඤ්ජන රසයෙන් පාත්‍රය පුරා: මිපුතනුවන්

මා කෙරේ ප්‍රේම ඇත්තෝ හින් අනික් බතක් නො වළඳා මා ගෙන් ම ගවූ බත් වළඳන්ට වදාළ මැනවැ'යි කියාලා පාත්‍රය තෙරුන් වහන්සේ අත තබාලූහ.

තෙරුන් වහන්සේ "මා මේ තෙන පවත් ආකාශයෙන් යන නියාව ත්, පාත්‍රය බුදුන්ට පිළිගන්වන නියාව ත්, බුදුන් ඒ බත් වළඳන නියාව ත්, රජ්ජුරුවන්ට පෙනේව"යි අධිෂ්ඨාන කොට ලා හුනස්නෙන් නැඟිට සියලු ජනයන් බල බලා සිටිය දී පාත්‍රය ආකාශයට නැඟිටිනා නමින් වහන්සේ නීල භාඩගරාජයක්හු පෙරට කොට පිහුම් වාලයකට නමන් ගත් රාජහංස ලීලාවෙන් ලීලාවෙ ත ව වැඩ පාත්‍රය ගෙණ ගොස් බුදුන් ශ්‍රී හස්තයෙහි තබාලූයේය. බුදුහු එ බත් ම වළඳා වදාළයේය. මේ ම ක්‍රමයෙන් ම තෙරුන් වහන්සේ රජ්ජුරුවන් පහදවා දවස දවස රජගෙන් බත් පාත්‍රයක් බැගින් ගෙණ ගියේය. අනික් බතක් නො වළඳා බුදුහු එ බත ම වළඳා වදාරණ සේක් ම ය. තෙරුන් වහන්සේ ද දවස දවස වළඳා අනතුරෙහි රජගෙට ගොස් 'අද බුදුහු මේ තෙක් යොදුන් වැඩි සේක. අද බුදුහු මේ තෙක් යොදුන් වැඩියේකැ'යි රජ්ජුරුවන්ට හා සියලු රාජකුලයට බුදුගුණයෙන් යුක්තවූ කථා කියා සූර්‍ය්‍යබිංදූය බලත්නාවූ පද්මයන් සේ රාජකුල පද්මයන් සන්තොෂ කරවා පහදවන සේක. ඒ කාරණයෙන් බුදුහු උන්වහන්සේට "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං කුලප්පසාදකානං යදිදං කාළුදායී" යි එතදග්‍ර පාළිය වදාරා තමන් වහන්සේගේ ශාසනයෙහි කුල පහදවන්නවුන් කෙරෙහි අග්‍ර වූ තනතුරු දුන්සේක.

මෙසේ සැට දවසෙකින් වැඩ වෙසඟ මැදි පොහෝ දා බුදුන් කිඹුල්වත් නුවරට වැඩි කල එක්ලක්ෂ සැට දහසක් කුලෙහි ශාක්‍ය රජදරුවෝ 'අපගේ නෑ උතුමා අද බලම්හ'යි රැස්ව බුදුන් වහන්ට සුදුසු තැන් කවරේ දෝහෝයි පරීක්ෂා කරන්නාහු 'නිග්‍රොධ නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ උයන ඉතා රම්‍ය ය. ඉතා සුදුසු ය'යි සනිටු හන්කොට එහි කලමනාවූ රාත්‍රිස්ථාන දිවාස්ථාන චංක්‍රමණාදී විහාර කර්මාන්ත නිමවාලා බුදුන්ට පෙර ගමින් කරන්නාහු. සියලු අලඞ්කාරයෙන් හෙබියාවූ සොළොස් හැවිරිදි සිටු කුමරුවන් සර හා සුවඳ මල් දී පන්සියයක් දෙන පළමු කොට පෙරමගට යවා, දොළොස් හැවිරිදි සිටුකුමරියන් පන්සියයක් සරහා මහතෙල්මල් කලඹ් අතට දී දෙවනු ව යවා, ඉක්බිත්තෙන් පන්සියයක් ශාක්‍ය

කුමරුන් සුවඳ මල් දී මහ පෙරහරින් යවා, සතරවනු ව පන්සිය යක් ශාක්‍ය කුමරියන් සරහා යවා, පස්වනු ව එක්ලක්ෂ සැටදහස ක් ශාක්‍ය රජදරුවෝ මහ පෙරහරින් ගෞස් මහත් වූ පූජායෙන් සුවඳින් මලින් සුවඳ සුන්නෙන් පුද පුදා බුදුන් වඩා නිග්‍රෝධාරාම යට ම ගෙණ ගියාහු ය.

මෙසේ ස්වාමිදරුවෝ ඒ ආරාමයට වැඩ විසිදහසක් රහතන් පිරිවරා පණවනලද බුද්ධාසන මුදුනෙහි සවණක් රැසින් දිලිහි දිලිහී බාලාකී මණ්ඩලයක් සේ වැඩහුන්සේක. ඒ ශාක්‍ය රජදරුවෝ නම් ස්වභාවයෙන් ම මානීහු ය. මානයෙන් මඩනා ලද්දෝහු ය. එසේ හෙයින් සිතන්නාහු: "සිද්ධාර්ථ කුමාරයෝ නම් තමන් බුදු වූ බවක් මුත් අපගේ බාල මලනුවෝ ය, බෑනනුවෝ ය, පුතනුවෝ ය, මුණු බුරාණෝ ය" යනාදීන් කල්පනා කොට බාල රජකුමරුවන් ලඟට කැඳවා කොඳුරා මෙසේ මෙසේ කියති, "දරුවෙනි, තෙපි අපට පෙරට ව සිට සිද්ධාර්ථ කුමාරයන් වැඳලව. අපි තොප හැමට පිටි පසුව ලා නො හඟවා හිඳුම්හ. මුළු දඹදිව රජදරුවෝ ද දූන් උන් වඳිත් ම ය. දෙවියෝ දක්වා ත් වඳිත් ම ය. අප සැම් උන් නො වැන්ද යි සැලව ගියේ නම් සිද්ධාර්ථ කුමාරයන් කෙරෙහි ඔහු ඇම සරු මඳ වෙති. එසේ හෙයින් මේ ගෞරසම නාම ත් සැල නො කරව"යි උගන්නාලූහ. එ බස් අසා බුදුන්ට බාල වූ රජකුමරුවෝ බුදුන් වැඳලා මාලු නෑයන්ට අවසර නොදී දහස්ගණින් ඉඳගත්හ. ඉක්බිත්තෙන් මාලු නෑයෝ ඔවුන් අසු අස්සෙහි සැඟවී හිඳගත්තාහු ය.

මෙසේ ඒ ශාක්‍ය නෑයන් තමින් වහන්සේ නො වැඳ උන් වේලෙහි උන්ගේ අදහස් දැන ලා "මාගේ නෑයෝ තමන් හැම මෝහයෙන් වැඩිමහලු හෙයිනු ත්, බුදුබල නො දන්නා හෙයිනු ත්, දූන් මා නො වඳනාහු ය. පූර්වයෙහි මා සේ ම සර්වඥවරයෝ නෑයන් අතින් කෙසේ වැඳුම් ගත්තු සේක්දෝ"යි බලා සතර ලොව ව අද්භූතවූ යමක ප්‍රාතිහාර්ය දක්වා මුළු ලොව විස්මය පත්කොට නෑයන් අතින් නමස්කාර පූජා ලද්දාහු ය යි දැන, ඒ මාගේ වංශ යෙහි අනන්තාපරියන්ත වූ බුදුන් කළා වූ චාරිත්‍ර ය අද මම ද මේ තෙන දී කොට මේ නෑයන් අතින් වැඳුම් ගණිමි යි සිතාලා ජින කසිණ සමාපත්තියට සමවැද ලා මා ඇඟින් නික්මුනු ප්‍රභාස්කන්ධ යෙන් දසදහසක් සක්වල එකාලෝක වේව යි අධිෂ්ඨාන කොට වදාළ සේක.

එ කෙණෙහි ස්වාමිදරුවන් සිතූ සිත හා සමඟ විදුලිය කලඹක් දිවුවා සේ බුද්ධ ශරීරයෙහි අගලක් හා තෙතින් රැස් කඳෙක් දිව සකිස්ලක්ෂ දසදහස් කුන්සිය පණස් යොදුන් වට ඇති සක්වළ ගබ මුළුල්ලෙහි යුගන්ධර පර්වත ය සියාරා දිවන අනන්ත නම් නාග රාජයා සේ කුන්ඩලක් දිව සක්වළ ගබ අවකාශ නැත්තෙන් අකතිවා බඹ ලොව ගැසී එයින් දසදහසක් සක්වළ මුළුල්ලෙහි ද මෙ සෙයින් ම රන්වන් රසින් පුරාගෙණ සිරු දහස් සුවහස් නැංගා සේ ජිනාලොක කොරෙමින් සිටගත. ඒ ශරීර ප්‍රභාව ඔබ මොබ දිවත්නා දුන දුශ දහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයෝ අපගේ බුදුහු අද විශෙෂ වූ ධර්මදෙශනාවක් දෙසත් වනැ'යි සතුටුව ව නොයෙක් පූජාභාණ්ඩ ගෙණ ඔවුනොවුන් පරයා දිව අවකාශය මුළුල්ලෙහි පිඩුපු සිසිගම් නාඹක් සේ දිලිහි දිලිහි ගගන ව සිට ගත්හ. එ කෙණෙහි ස්වාමිදරුවෝ අවකාශය බලා වදාළසේක. එ වේලෙහි බුදුන්ගේ අභිප්‍රායෙන් දසදහසක් සක්වළ මුළුල්ලෙහි දස දහසක් වැම ගිඳුම්ලුවා සේ දසදහසක් රත්මෙර එක පඩතින් සිට ඒ මුදුනෙහි දසදහසක් සක්වළ පූර්වචක්‍රවාටයෙහි පටන් පශ්චිම චක්‍රවාටය දක්වා මක්දගය් දෙසිය තුන්කෙළ පන්සාළිස් ලක්ෂයක් යොදුන් දිග රුවන් සක්මනෙක් මැවී ගිය.

ඉක්බිත්තෙන් ස්වාමිදරුවෝ මේ රුවන් සක්මන දුත උදය පර්වතයෙහි පැනනැගි ලබිරුමඩලක් සේ මුහුද රළ පෙළ මැඩ එම ද රැ ගුවන්කුසට පැන නැගි සොළොස් කලාවෙන් සම්පූර්ණ චන්ද්‍රයාගේ ශොභා කමින් වහන්සේගේ පාදමූලයට හ ෘගෙණ යුගාන්ත වාතයෙහි පමන් වේගයෙන් අහස්කුසට පැන නැගී සන රන් මෙරක් සේ සමණක් රසින් දිලිහි දිලිහි ආකාශයට පැන නැගී නමන් වහන්සේට අභිමාන කළා වූ නැසන් ඉස්මුදුනෙහි පිය පස් වගුරුවන්නා සේ ඒ රුවන් සක්මන සක්මන් කරන්ට පටන්ගත් සේක. එ වේලෙහි "මේ දසදහසක් සක්වළ මුළුල්ලෙහි බ්‍රහ්මයෝ ද, දිව්‍යයෝ ද, මනුෂ්‍යයෝ ද, සිවුපාවෝ ද, පක්ෂිහු ද දියෙහි වසන සත්තු ද, හැම නරකවල සත්තු ද, ලොකාන්තරිකාදි නරකවල දුක් ගන්නා ප්‍රෙතයෝ ද, සටත් වසයෙන් මේ දසදහසක් සක්වළ මුළුල් ලෙහි කිසිඹි කුහුඹුවන් දක්වා ත් හැම දෙන ම නො වරදවා මාගේ බුඩ ශ්‍රී දකිත්වා"යි අධිෂ්ඨාන කොට වදාළසේක.

එ කෙණෙහි දසදහසක් සක්වළ මුළුල්ලෙහි සියලු සත්හු බුදුන් සිත් සේ බලන්ට පටන්ගත්හ. හැම සත්හු ඔවුනො'වුන් දකිති. බ්‍රහ්මයෝ කුහුඹුවන්ට පෙණෙති. කුහුඹුවෝ බ්‍රහ්මයන්ට පෙණෙති. තව ද දසදහසක් සක්වළ මුළුල්ලෙහි කෙලෙස් ලක්‍ෂ හැටදහසක් පමණ නරකවල ගිනි නිවිනා. ගිනි පලා මහ පියුම් පැන නැංගහ. එ කෙණෙහි ඒ නරකවල දුක් ගන්නා සත්ත්වයෝ හැමදෙන ම දුකින් මිදී සිසිල් වූ ශරීර ලදින් ඒ පියුම් පිටව පැන නැගී බුදුන් දුට දොහොත් මුදුන් දී "අහෝ බුදුරජානෙනි! තෙල සක්මිනින් පහ නොවත්ත. හිමියානෙනි! තම නරකවල තිවුනු ගිනි දෙ වනුව දැල්විය නො දෙනි ස. සාමිනි! බොහෝ දවසක් දුක් ගෙණ ගැලවී ගියම්හ"යි යනාදීන් බැගෑ තෙපුල් කියා කියා බුදුන් බල බලා සිට ගත්තාහු ය.

එ කල බුදුහු තෙජෝකසිණ සමාපත්ති සම වැද දසදහසක් සක්වළ දුමවා සියලගින් ම ගිනිකඳ හරණ්‍යා පටන්ගත් සේක. දස දහසක් සක්වළට ම සියලගින් දියකඳ හරණ්‍යා පටන්ගත් සේක. දකුණු උරමඩලෙන් නාඹ තල්කඳ සා ගිනිකඳෙක් නැගෙයි. වම් උරමඩලෙන් නාඹ තල්කඳ සා දියකඳෙක් බස්සී. ගිනිකඳ නැගි තෙනින් දියකඳෙක් බස්සී. දිය කඳ බට තෙනින් ගිනිකඳ නැගෙයි. දකුණු කන්සිදුරෙන් නාඹ තල් කඳ සා ගිනිකඳෙක් නැගෙයි. වම් කන් සිදුරෙන් නාඹ තල්කඳු සා දියකඳෙක් බස්සී ගිනිකඳ නැගී තෙනින් දියකඳ බස්සී. දියකඳ බට තෙනින් ගිනිකඳ නැගෙයි දකුණු නාසා සිදුරෙන් නාඹ තල්කඳ සා ගිනිකඳෙක් නැගෙයි. වම් නාසා සිදුරෙන් නාඹ තල්කඳ සා දියකඳෙක් බස්සී ගිනිකඳ නැගි තෙනින් දියකඳ බස්සී දියකඳ බට තෙනින් ගිනිකඳ නැගෙයි. දකුණු ඇස්වලින් නාඹ තල්කඳ සා ගිනිකඳෙක් නැගෙයි. වම් ඇස් වලින් නාඹ තල්කඳ සා දියකඳෙක් බස්සී. ගිනිකඳ නැගි තෙනින් දියකඳ බස්සී. දියකඳ බට තෙනින් ගිනිකඳ නැගෙයි. දුන දස ඇඟිල්ලෙන් නාඹ තල්කඳ සා ගිනිකඳ නැගෙයි. නැවත නාඹ තල් කඳ සා දියකඳ බස්සී. දෙප ය දස ඇඟිලි අගින් ද වෙන් වෙන් ව නාඹ තල්කඳ සා ගිනිකඳ නැගෙයි නාඹ තල්කඳ සා දියකඳ බස්සී. අසූසියයක් පමණ සන්ධියෙන් ද නාඹ තල්කඳ සා අසූසියයක් පමණ ගිනිකඳ එකවිට ම නැගෙයි. නැවත එ ම සන්ධිවලින් අසූසියයක් දිය කඳ බස්සී. නවානූ දහසක් රොමකූපයෙන් ද එකවිට ම නාඹ තල් කඳ සා නවානූදහසක් ගිනිකඳ නැගෙයි. නැවත ඒ රෝමකූපවලින්

තවාතුදහසක් දියකඳ බස්සි. නැවත එම අනුඅස්සෙහි සියලගින් හරනා සවණක් රසින් දසදහසක් සක්වළ ඉතිරගෙණ යෙයි. ගිනි කඳ හරණා ක්‍ෂණයෙහි තෙජොකසිණ සමාපත්තියට සම වදනාසේක. දියකඳ හරණා ක්‍ෂණයෙහි ආපොකසිණ සමාපත්තියට සම වදනාසේක. නිල් බුදුරස් හරණා කල නීලකසිණ සමාපත්තියට සමවදනාසේක. රන්මන් රස් හරණා කල පීත කසිණ සමාපත්තියට සමවදනාසේක. සුදු බුදුරස් හරණා කල ඔදාත කසිණ සමාපත්තියට සමවදනාසේක. සෙසු රස් හරණා කල වෙන වෙන සමාපත්තියට සමවදනාසේක. නොයෙක් රස් හරණා කල නොයෙක් සමාපත්තියට එකවිට ම සමවදනාසේක. එ දා බුදුන්ගේ ශ්‍රී ශරීරයෙන් නික්මුණු දිය කඳින් දසදහසක් සක්වළ මුළුල්ලෙහි අල්ලක් සා තැන නො තෙමුනා වූ සිමෙක් නැත්මය. එසේ හෙයින් බුදුන්ගේ ජන්මක්‍ෂෙත්‍රයෙහි සිනෙරුපෙලෙව්වල පස් පවා විමසා බැලූ ව තොත් ධාතු කොට ත් පුද ත් පුදුසු ම ය. එ දා එ දිය තෙමෙනු කැමැත්තන් තෙමෙති. නො කැමැත්තන් නො තෙමෙති. දසදහසක් සක්වළ මුළුල්ලෙහි බම සොඳ දිසා ගිනිකඳින් මකුළු හුයකවත් වන හැකියෙක් නැත. මෙසේ මගේ ස්වාමිදරුවෝ මා සේ වූ එක සත්ත්වයකුගේ මුඛයෙන් කවා දසක් ලක්‍ෂයක් සත්ත්වයන්ගේ මුඛයෙනු ත් කියා නිමවාගත නොහැකි යමකප්‍රාතිහාර්‍ය්‍යයෙන් ලොව විස්මය කොටලා, ඒ සක්මන් සක්මන කරණාසේක.

එ කෙණෙහි දසදහසක් සක්වළ මුළුල්ලෙහි දිව්‍ය බ්‍රහ්මයෝ සක් මතින් එක ඇලුයෙක සේසත් ගෙණ සිටගත්හ. දසදහසක් සක්වළ ශක්‍රයෝ අතික් භාගයෙහි ජයසක් ගෙන සිටගත්හ. සුයාමයෝ පෙළක් මිණිවාමර සලති, සනතුෂිතයෝ පෙළක් මිණිතල්වැට සලති. සෙසු දෙවියෝ මල් වැසි වස්වති. මෙසේ පූජා විද මාගේ ස්වාමිදරුවෝ ඒ සක්මන සක්මන් කරණසේක. සක්මන් කරණ කල දසදහසක් සක්වළ මුළුල්ලෙහි ඇවිද සක්මන් කරණසේක. හැම සතුන්ට නො මරදවා ම පෙණනසේක. බුදුන් සක්මන මහ තැයි මහත් ශරීරයක් මවා ගත්තෙත් නැත. තමන් වහන්සේ කුඩා හෙයින් ඒ සක්මන ද කුඩා කොට ගත්තෙත් නැත. ඒ මාගේ බුදුන්ගේ අචින්ත්‍ය වූ බුද්ධවිෂයයක්මය. තුඩකම සේ ත් නොකොට බණ ත් වදාරණසේක. මෙසේ මේ දසදහසක් සක්වළ බුදුන්ගේ බුද්ධශ්‍රියට ම අවකාශ ය. දසදහසක් සක්වළ සත්ත්වයෝ මේ එක බුදුන්ගේ රූපශ්‍රී බලා ප්‍රාතිහාර්‍ය්‍ය බලා ඇස් සෑහෙන නො ලැබෙති.

ඒ අවස්ථාවෙහි දෙවන ඉරක් දෙවන සඳක් නැංගාසේ, දෙවන කප්රුකක් නැංගා සේ, දෙවන අම්බඳක් නැංගා සේ දෙවන බුදු කෙණෙකුන් මැවූ සේක. දසදහසක් සක්වළ සත්ත්වයෝ ම "කොල! ආදි එක බුදුකෙණෙක, දැන් දෙබුදු කෙණෙක්නැ"යි බල බලා සතුටුව සිටිති. එක් බුදුකෙණෙක් වැඩහිඳිනාසේක. එක් බුදුකෙණෙක් සක්මන් කරණාසේක, සක්මන් කරණ බුදුහු වැඩහිඳිනාසේක වැඩ හුන් බුදුහු සක්මන් කරණ සේක; සම්හරවිට දෙදෙනා වහන්සේම සක්මන් කරණ සේක. එක් බුදු කෙණෙක් බස්නාහිර සක්මන් මෙර්විට සිට වඩනාසේක. එක් බුදුකෙණෙක් නැගෙනහිර දසාවේ සක්මන් මෙර්විට සිට වඩනාසේක. මැද සක්මන දී ඔවුනොවුන් කරා නක්ෂත්තරු දෙකක් සේ පැමිණ ග්‍රහ යුධයෙහි විමනින් විමන ගැසී ඉවත් ව කැමැති සැමැති විපියෙහි යන ග්‍රහ විමන් දෙකක්සේ දෙදෙනා වහන්සේ ඔවුනොවුන් කරා පැමිණ ඔවුනොවුන් කෙරෙහි ආදරයෙන් දෙදෙන ම ඔවුනොවුන්ට මග හැර ඉවත් වන සේක. ඒ දුටුවා වූ දිව්‍යමනුෂ්‍යයෝ සාධුකාර දෙති. එවේලෙහි මවා ගත් බුදුන් විචාරණ පැන ලොවුතුරා බුදුහු කියනාසේක. ලොවුතුරා බුදුන් විචාරණ පැන මැවූ බුදුහු කියනසේක. දෙ බුදුහු ම එක්වැනි වූ උස ඇතිසේක. එක්වැනිවූ මහත ඇතිසේක. එක්වැනි වූ ශරීරප්‍රභා ඇති සේක. එක්වැනි වූ බ්‍යාමප්‍රභා ඇති සේක, එක්වැනි වූ ගමන් ඇති සේක. එක්වැනි වූ දෙශනා ඇති සේක. එක්වැනි වූ කටහඬ ඇති සේක. දසදහසක් සක්වළ මුළුල්ලෙහි මෙසේ දෙදෙනා බුධශ්‍රීපානා වේලෙහි මුන්වහන්සේ ලොවුතුරා බුදුහු ය. මුන්වහන්සේ නිර්මිත බුදුහු ය යි දැනගන්නා වූ එක ද දෙවියෙක් බඹෙක් නැත.

මාගේ ස්වාමිදරුවානන් එකලා වූ බුදුවෙසින් දසදහසක් සක්වළ මුළුල්ලෙහි පළමුව ප්‍රාතිහාර්‍ය්‍ය පානා වේලෙහි ඔබගේ බුධශ්‍රීනට දසදහසක් ලොව එක ගොනකාඹු වැලෙක. යෙළසියයක් යොදුන් ගරුඩරාජයා හිඳගත් වේලෙහි ගොනාඹුවැල නො පොහොනා සේ විය. සතර රියන් ගබඩාවකට හිරුමඬල සඳමඬල වැද හියා සේ බුධශ්‍රීනට ලොකශ්‍රී නත විය. මෙසේ නත වූ ලොකයෙහි බුදුහු දෙදෙනකු වහන්සේ ප්‍රාතිහාර්‍ය්‍ය පානා වේලෙහි ලොව කුඩාවූ නියාවට ත්, බුදුසිරි බොහෝ වූ නියාවට ත්, උපමාවෙක් මාගේ සිතට නො වැටහේ මි ය. දෙලොස් යොදුන් බ්‍රහ්මරාජයන් දෙදෙනකු කැටපත් වටක් සා කිමෙක පෙණී ගියා වැන්නැ යි කියාත් නො කියමි.

මෙසේ අද්භූත වූ, මෙසේ ආශ්චර්‍ය්‍ය වූ, මෙසේ විස්මය වූ, මෙසේ අසදෘශ වූ මෙසේ අනුපම වූ, මෙසේ අප්‍රමාණ වූ, ප්‍රාතිහාර්‍ය්‍යයෙන්

බුඩශ්‍රී දක්වා මේ රුවන් සක්මන මෙසේ සක්මන් කරණ වේලෙහි ධම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ රජගහා නුවර ගිජ්ඣකූට නම් පර්වතයෙහි වැඩවසන සේක් බුදුන්ගේ මේ ප්‍රාතිහාර්‍ය්‍යය දැක ඉතා ආශ්චර්‍ය්‍ය වූ සිත් ඇති ව "මාගේ ස්වාමිදරුවාණෝ අද මුළු ලොවට අද්භූත වූ පෙළහරක් දක්වා වදාරණ සේක. මා දැන් උපෙක්ෂා වතු නො යෙදෙයි. මම එතෙනට ගොසින් බුදුන් හා සමග කථාවක් කෙරෙමි"යි සිතා තමන් වහන්සේගේ පන්සියයක් රහතන් කැඳවා ඇමැත්ති! බුදුන් කරා යමු යි ඔවුන් හා සමග ආකාශයට නැගිලා 'අද මේ සියලු දසදහසක් සක්වල බුදුන්ගේ ප්‍රාතිහාර්‍ය්‍යය බලන සියලු සත්ත්වයෝ ම මා දකිත්ව'යි අධිෂ්ඨාන කොට ලා රුවන් සක්මන බලා නික්මුනු සේක. දසදහසක් සක්වල සියලු සත්ත්වයෝ සැරියුත් ස්වාමීන් වඩනා ශ්‍රී දැක "කොල! ආදි එක බුදුකෙනෙක, පසු ව දෙ බුදු කෙනෙක, තව ත් බුදුකෙනෙක් එති. තුන් බුදුන්ගේ ශ්‍රී බලමිසා"යි කිය කියා සතුටු වෙත්. පන්සියි පන්සියයක් දෙනා වහන්සේ වඩනා දැක 'බුද්දු තුන්දෙනෙක් ම නො වෙති. පන්සියයක් බුද්දු එන්නැ'යි යෙති. සත්ත්වයන් මෙසේ සිත ව සිත වා මහත් වූ ප්‍රාතිහාර්‍ය්‍යය දක්ව දක්වා පන්සියයක් රහතන් පිරිවරාගෙණ අවුදින් රුවන් සක්මන කෙළවරට වැඩ බුදුන් වැඳලා සක්මන් මොවිව වැටි, අගෙක නගාලූ ප්‍රදීපයක්සේ දෑත් මුදුනෙහි තබාගෙණ බුදුන්ගේ ශ්‍රී මුඛය බල බලා වදාරණ සේක්:

කීදිසො නො මහාවීර-අභිනීහාරො නරුත්තම,
කම්හි කාලෙ තයා ධීර-පත්ථිතා බොධි මුත්තමා-යි.

යන මේ ගාථාව බොහෝ දිව්‍යසෙනාව බල බලා සිටිය දී වදාරා: "ස්වාමීනි! ලොවුතුරා බුදුරජාණෙනි! මේ ලොකයෙහි මට වඩා පිණැත්තාවූ සත්ත්වයෙක් නැත. කාරණ කිමි? යත්:

තුඹ වහන්සේ වැනි නිවන් අමා දෙන මෑනි කෙණකුන් ලදිමි. තුඹ වහන්සේ වැනි සසර දුකට පිහිට වූ පියානු කෙණකුන් ලදිමි. තුඹ වහන්සේ වැනි සියල්ල නිමවා දන්නා ගුරු කෙණකුන් ලදිමි. තුඹ වහන්සේ වැනි සඩර්ම මහානිධානයක් ලදිමි. තුඹ වහන්සේ වැනි ස්වාමිදරු කෙණකුන් ලදිමි. තුඹ වහන්සේ වැනි සිතූ සිතු ප්‍රශ්න නමැති රුවන් දෙන සිතුමිණි රුවනක් ලදිමි. තුඹ වහන්සේ වැනි කෙලෙස් නමැති දුක් නසන දිව්‍ය ඖෂධයක් ලදිමි. තුඹ

වහන්සේ වැනි ලෝ උතුමාන කෙණෙකුන්ට අභසච්ච දෙවන තන තුරු ලදිමි. මේ මේ කාරණයෙන් මට වඩා ප්‍රීතිමත් කෙණෙක් මේ ලොකයෙහි නැත් ම ය. අද තුඹ වහන්සේගේ මේ බුඩශ්‍රියට දසදහසක් ලොව එක පැලක් සේ කුඩා වී ය. තුඹ වහන්සේගේ බුඩ ශ්‍රී බොහෝ ම ගිය; තුඹ වහන්සේගේ රූප දශීකාශට දෙවිමිනිසුන්ගේ ඇස් මඳ ව ගිය. රූප ශ්‍රී බොහෝ ම ගිය. තුඹ වහන්සේගේ දෙශනා ගඹනාවට දෙවිමිනිසුන්ගේ කන් තැටි පමා මඳ වි ය. දෙශනා බොහෝ ව ම ගියහ. අද තුඹවහන්සේගේ බුඩාලම්බන ප්‍රීති නමැති මහා වෂ්‍රාවට ලෝවැසියන්ගේ සිත් එක ලියද්දක් සේ මඳ ව ගිය. බුඩාලම්බන ප්‍රීති බොහෝ ව ගිය. මේ බඳු බුඩ ශ්‍රී ලැබීමට පෙර කෙසේ වූ සම්යෙක, කෙසේ වූ අනගි ශීලයක් කොට කෙසේ වූ බුදුකෙණෙකුන් දුන කෙසේ වූ ප්‍රාර්ථනාවක් කළ සේක් ද, ඒ මට විශෙෂයෙන් වදාළ මැනව"යි ආරාධනා කළ සේක.

එකල මාගේ සවාමිදරුවෝ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ තෙපුල් අසා "අද මේ සන්නිපාතයෙහි දී බුඩවංශ දෙශනාව කෙරෙමි. ඒ දෙශනාවගේ තොළුවර බොහෝ සතුන්ට අධිගම ය වෙයි" සිතා තමන් වහන්සේගේ බුඩ කම්කරුණු කරඹුව හැර හැගවී තුබූ නිධාන වසතුවක් දක්වා සිසල සතුන්ට බෙදා දෙන්නා සේ බුඩවංශ දෙශනාවට පටන් ගත් සේක. කෙසේ ද? යත්:

අසව ශාරිපුත්‍රසථවිරය, ගිය දවස ශාරාසඞ්ඛ්‍යය කප්ලක්‍ෂය කින් යට එක් කල්පයක: තණ්හඞ්කරය, මෙධඞ්කරය, සරණඞ්කරය, දීපඞ්කරය යි බුඩදිවාකරයෝ සතරදෙනෙක් ලොව පහළවූහ. එයින් අසඞ්ඛ්‍යයක් කප් බුඩශූන්‍යව ගිය කල එක් කපෙක කොණ්ඩඤ්ඤ නම් බුදුකෙණෙක් උපන්නාහු ය. එයින් අසඞ්ඛ්‍යයක් කප් ගියකල මඞ්ගලය - සුමනය - රෙවතය-සොභිතය යි බුදුහු සතරදෙනෙක් උපන්නාහු ය. එයින් අසඞ්ඛ්‍යයක් කප් ගියකල එක් කල්පයෙක අනොමදස්සීය - පදුමය-නාරද යයි සර්වඥවරයෝ තුන්දෙනෙක් උපන්නාහු ය. එයින් අසඞ්ඛ්‍යයක් කප් ගියකල අපගේ මේ මහා භද්‍ර කල්පයට ලක්‍ෂයක් වන කප පියුමුතුරා නම් බුදුකෙණෙක් උපන්නාහුය. ඒ ලක්‍ෂයක් වන කපින් සැත්තෑ දහසක් කප් බුඩශූන්‍යව ගිය.කල මේ කල්පයට තිස් දහසක් වන කප සුමෙධය-සුජාත යයි සර්වඥවරයෝ දෙදෙනෙක් උපන්නාහුය. එයින් විසිනව දහස් අටසිය දෙයානූකපක් ගිය කල මේයට එක්සිය අටළොස්වන කප පියදස්සීය-අත්ථදස්සීය-ධම්මදස්සී යයි සර්වඥවරයෝ තුන්දෙනෙක් උපන්නාහු ය. එයින් බුඩශූන්‍ය වූ කප් සූවිස්සක් ගිය

කල මෙයට සුවානුවන කප සිද්ධාර්ථ නම් බුදුකෙනෙක් උපන්නාහු ය. එයින් බුඩශූන්‍ය වූ එක් කපක් ගිය කල තිස්ස ය-ඵුස්ස ය යි සර්වඥවරයෝ දෙදෙනෙක් උපන්නාහු ය. එයින් කප් දෑකක් ගිය කල මෙයට එකානුවන කප විපස්සී නම් බුදුකෙනෙක් උපන්නාහු ය. එයින් බුඩශූන්‍ය වූ කප් පණස් නවදෙනකු ගිය කල මෙයට එක්තිස් වන කප සිඛී ය වෙස්සභූ ය යි යන සර්වඥවරයෝ දෙදෙනෙක් උපන්නාහුය මේ මහාභද්‍රකල්පයෙහි කකුසඳය-කෝණාගමන ය--කාශ්‍යප ය යි බුදුහු තුන්දෙනෙක් උපන්නාහු ය. දැන් මම් ගෞතම නම් බුදු වීමි. මතු මෛත්‍රෙය නම් බුදු කෙනෙක් උපදනාහු ය. එසේ හෙයින් මේ කල්පය බුදුන් පස් දෙනකුන් කෙනෙහි උතුම් වූ හෙයින් මහා භද්‍රකල්ප නම් වි ය.

ශාරිපුත්‍රස්ථවිර ය. ඒ දීපඞ්කරාදී සියලු සර්වඥවරයෝ ම සොළොසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් හෝ, අටාසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් හෝ සාරාසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් හෝ, පාරමිතා පූරණය කළාහු ය. ඒ සියලු සර්වඥවරයෝම කෙළවර වෙස්සන්තරාත්ම වන් සමයෙහි මහ පොළොව හුගුරුවා පුත්‍රදාරාදී පරිත්‍යාගයෙන් මුළු ලොව විස්මය පත් කළාහුය. ඒ සියලු සර්වඥවරයෝ ම තුසීපුරෙන් සැව මවුකුස පිළිසිඳ මා යේම ලොවුතුරා බුදුව ලෝවැඩ කළාහු ම ය යි යනාදීන් මෙසේ බුඩවංශ දෙශනාව වදාරා තමින් වහන්සේ ඒ ඒ බුදුන් නො වරදඹා දූත කාල කළ පින් සම්භාරයන් වදාරණ සේක්:

තව ද ශාරිපුත්‍රස්ථවිරය, මම් ඒ දීපඞ්කර නම් බුදුන් සමයෙහි සුමෙධ නම් තාපසව අෂ්ටධර්මයෙන් යෙදී ජීවිතයෙන් පූජා කොට මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි. කොණ්ඩඤ්ඤ නම් බුදුන් සමයෙහි විජිතාවී නම් චක්‍රවර්ති රජව බුදුන්ට තුන් මසක් අසදෘශ මහ දන් දී චක්‍රවර්ති රජය පුදා මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි. මඞ්ගල නම් බුදුන් සමයෙහි සුරුචි නම් බ්‍රාහ්මණව දෙලොස් යොදුන් සත් රුවන් මඩුවෙක කෙළ ලක්ෂයක් රහතන් හා සමග බුදුන් වඩා හිඳුවා චතුමධුර කිරිපිඩු සත් දවසක් වළඳවා කෙළ ලක්ෂයක් සිවුරු පිරිකරදී මේ බුදුබවටම ප්‍රාර්ථනා කෙළෙමි. සුමන නම් බුදුන් සමයෙහි අතුල නම් නාගරාජව කෙළලක්ෂයක් බුදුපාමොක් මහසඟපිරිස් දිව්‍ය භොජන වළඳවා දෙකෙළ ලක්ෂයක් දිවසළු පුදා මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි. රෙවත නම් බුදුන් සමයෙහි අතිදෙව නම් බ්‍රාහ්මණව දහසක් වටනා උතුරු සළුවක් පුදා බුදුන් බල බලා සිට සිසාරු සොලෝ දහසක් බැඳ සතුති පූජා කොට මේ බුදුබවටම ප්‍රාර්ථනා කෙළෙමි සොභිත නම් බුදුන් සමයෙහි සුජාත නම් බමුණුව බුදුන්ට තුන් මසක් මහ දන් දී මේ බුදු බවටම ප්‍රාර්ථනා කෙළෙමි.

අනෝමදස්සි නම් බුදුන් සමයෙහි මහේශාඛ්‍යවූ යක්‍ෂරජව ඉපද සත් දවසක් බුදු පාමොක් මහ සඟ පිරිසට දිව්‍ය භොජන දන් දී මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි. පදුම නම් බුදුන් සමයෙහි සිංහ රාජව ඉපද ධ්‍යාන සුවයෙන් වැඩ හුන් බුදුන් දැක ප්‍රීතින් තුන් යලක් පැදකුණු කොට තුන් යලක් සිංහනාදයෙන් පුදා සත් දවසක් ඇස නො මරා බුදුන් බල බලා සිට ඇස් දෙකින් පූජාකොට මේ බුදු බවටම ප්‍රාර්ථනා කෙළෙමි. නාරද නම් බුදුන් සමයෙහි උග්‍රවූ තාපසව අසූ කෙළක් රහතන් හා සමග මා භාරා වැඩි බුදුන් දැක සත්දවසක් බුදුපාමොක් මහ සඟ පිරිසට උතුරුකුරු දිවින් දිව්‍යාහාර ගෙණවුත් වළඳවා අනඝවූ රත් සඳුනන් බුදුන්ට පුදා එදා ද මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි. පියුමතුරා නම් බුදුන් සමයෙහි ජටිල නම් මහ රැටි ව බුදු පාමොක් සඟ පිරිසට මහදන් හා සිවුරු පිරිකර දී මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි. සුමෙධ නම් බුදුන් සමයෙහි උත්තර නම් මානවක ව අසූකෙළක් ධන එක දා වියදම් කොට දන් දී ඒ බුදුසසුන් වැද මහණව මේ බුදු බවට ම ප්‍රාර්ථනා කෙළෙමි. සුජාත නම් බුදුන් සමයෙහි [illegible] නම් චක්‍ර වර්ති රජ ව ඒ සත්රුවන හා සමග රජය බුදුන්ට පුදා එ දා මහණ ව මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි. පියදස්සි නම් බුදුන් සමයෙහි කාශ්‍යප නම් ධන මානවක ව කෙළ ලක්‍ෂයක් ධන වියදම් කොට සඞ්ඝාරාමයක් කරවා බුදුන්ට දන් දී මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි.

අත්ථදස්සි නම් බුදුන් සමයෙහි සුසීම නම් තාපස ව බුදුන් අතින් බණ අසා එ කෙණෙහි ම දිව්‍යලොවෙන් ශක්‍රයාගේ පරසතු ගස සලා පරසතුමල් වැසිවක් වස්වා පරසතු මලින් දිවමල් මඬුවක් මවා පරසතු මල් කුඩයක් ඒ බුදුන් සිරසට පුදා එදා ද මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි. ධම්මදස්සි නම් බුදුන් සමයෙහි ශක්‍රදෙවේන්ද්‍ර ව ඉපද ඒ බුදුන්ට දිව්‍යමල් සුවඳින් පූජාකොට මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි. සිද්ධාර්ථ නම් බුදුන් සමයෙහි මඞ්ගල නම් තාපස ව දඹදිවට සලකුණු වූ සියක් යොදුන් උස දඹගසින් මහ දියකළ සා දඹ ගෙණවුත් නව කෙළ ලක්‍ෂයක් රහතන් හා සමග ඒ බුදුන් දඹ වළඳවා මේ බුදු බවට ම ප්‍රාර්ථනා කෙළෙමි. තිස්ස නම් බුදුන් සමයෙහි සුජාත නම් රජ තවුස් ව යොදනක් සා කරඬුවකින් දිවමල් පුදා මහ පියුමක් බුදුන් සිරසට පුදා එ දා ද මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි. ඵුස්ස නම් බුදුන් සමයෙහි විජිත නම් රජ ව රජය හැර බුදුන් කෙරේ මහණ ව පිටකත්‍රය ගෙවා දැන බුදුසස්නෙහි ධම්මකථික යන් කෙරෙහි අග්‍ර ව ප්‍රතිපත්තීන් බුදුන්ට පූජාකොට මේ බුදු බවට ම ප්‍රාර්ථනා කෙළෙමි. විපස්සි නම් බුදුන් සමයෙහි අතුල නම් දිව්‍ය නාගරාජන් ව සඳමඬලක් සා මිඹුවෙක දී සත්දවසක්

බුදුන් සඟුන් වළඳවා අනඝ වූ මිණි පලඟක් පුදා එදා ද මේ බුදුබව ට ම ප්‍රාර්ථනා කෙළෙමි.

සිඛී නම් බුදුන් සමයෙහි අරින්දම නම් රජ ව සත් දවසක් මහ දන් දී මඟුලැ'තු සරසා ඇතු උසට කප්පිය භාණ්ඩ පුදා එදා ද මේ බුදුබවටම ප්‍රාර්ථනා කෙළෙමි. වෙස්සභූ නම් බුදුන් සමයෙහි සුදස්සන් නම් රජ ව දහසක් විහාර කරවා බුදුන් පිළිගන්වා රජ සැපතු ත් පුදා මහණ ව තව ද කෙලෙස් ධුතඞ්ග ප්‍රතිපත්තීන් ඒ බුදුන්ම පුදා මේ බුදුබවටම ප්‍රාර්ථනා කෙළෙමි. කකුසඳ නම් බුදුන් සමයෙහි ඛෙම නම් රජ ව සතළිස් දහසක් පමණ රහතන් හා සමඟ ඒ බුදුන් පවරා මහදන් දී සතළිස්දහසක් පමණ පාත්‍රා සිවුරු හා අඳුන් ආදී නොයෙක් බෙහෙත් බඩු දන් දී මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි. කෝණාගමන නම් බුදුන් සමයෙහි පර්වත නම් නරේන්ද්‍ර ව වස් තුන්මසක් බුදුන්ට දන් දී බුදු පාමොක් මහ සඟපිරිසට සළු සිවුරු පිරිකර දන් දී අනගි වූ රුවන් මිරිවැඩි සඟළක් පුදා එදාද මේ බුදුබවට ම ප්‍රාර්ථනාකෙළෙමි. කාශ්‍යප නම් බුදුන් සමයෙහි ජෝතිපාල නම් බමුණු ව ඝටීකාර නම් කුම්භකාරයාගේ මිත්‍රබලයෙන් බුදුසසුන් වැද මහණ ව තුන් පිටකය හොඩා දැන ප්‍රතිපත්තීන් පූජාකොට මේ බුදුබවට ම ප්‍රාර්ථනා කෙළෙමි.

මෙසේ ශාරිපුත්‍ර සර්වීරය, ලොවුතුරා බුදුබව නම් එසේ මෙසේ සාධාගත හැකි සම්පත්තියෙක් නො වෙයි. යම් සේ ලක්ෂ ගණන් මහා ගඞ්ගාවල ජලය මහ මුහුදට අනවකාශයෙන් වදු ත් මහමුහුද උතුරුවාලිය නො හැක්කා සේ, කපක් මුළුල්ලෙහි වස්නා වර්ෂා ජලයෙන් පුරාලිය නො හැක්කා සේ, මේ බුදුබව ද කෙතෙක් පුණ්‍ය සම්භාරයන් රැස්කොට ත් පුරාලිය නො හැක්කේ ම ය. පාරමිතාවන් වැඩූ වැඩූ සේ බුද්ධශ්‍රීත් වැඩි වැඩීම පල දෙන්නේමය. එහි විභාග මඞ්ගලාදි බුදුන්ගෙන් ම දතයුතු.

“මෙසේ දීපඞ්කරාදි නෑම් බුදුන් නො වරදවා ම දූත මෙසේ මෙසේ වූ මාගේ ධන පමණින් කරණ ලද කුසල් නමැති මහා ගඞ්ගා සමූහයන්, පාරමිතා නමැති මහ මුහුදට මෙහෙයා, සාරා සඞ්ඛ්‍ය කප් ලක්ෂයකින් ඒ මුහුද පුරා උතුරුවාගෙණ දන් සිල් නමැති නැවෙහි ඉඳ සිත් සේ ධ්‍යාන පුවයෙන් නිවන් කෙළිය ව පවන් ගතිමි” යි වදාරා මෙසේ සවාමිදරුවෝ විසිතුරු වූ ගාථා දහසකින් ප්‍රතිමණ්ඩිත වූ මේ බුද්ධවංශ දෙශනාව ගෙණ හැර දක්වා වදාරා:

න මේ දෙස්සා උභො පුත්තා-මද්දීදෙවී න දෙස්සියා,
සබ්බඤ්ඤුතං පියං මය්හං-තස්මා පියෙ අදාසහං,

යනාදි වශයෙන් වශ්‍යාපිටකයෙන් මේ බුද්ධවංශ දේශනාව නිමවා වදාළසේක.

මේ දේශනාවගේ කෙළවර අසඞ්ඛ්‍යයක් දෙවියෝ සෝවාන් පෙළෙහි පිහිටියහ. අසඞ්ඛ්‍යයක් දෙවියෝ සෙදගැමි පෙළෙහි පිහිටියහ. අසඞ්ඛ්‍යයක් දෙවියෝ අනාගැමි පෙළෙහි පිහිටියහ. කෙළ ලක්ෂයක් දිව්‍යබ්‍රහ්මයෝ අමාමහ නිවන් දුටු සසරසයුරෙන් ගොඩ නැංගාහ.

තව ද මෙසේ බුද්ධවංශදේශනාව නිමි කල්හි දම් සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ දෙවනාමින්ගේ ධම්මලොභ ය තව නුසුන් සේ දුටු සිවුර එකාංශ කොට බහාගෙණ චක්‍රවර්ති රජක් ඉදිරියට ප්‍රෙම වඩා යන පරිණායක පුත් රුවනක් සේ පියවරක් පියවරක් ඔසවා ගොස් බුදුන්ට මදක් ලංව නමස්කාර කොට සිට දොත් මුදුනෙහි තබා "මාගේ ස්වාමිදරුවූ බුදුරජාණෙනි, නුඹ වහන්සේගේ මේ විශෙෂ වූ දේශනාව අසා මාගේ ද, සියලු සතුරන්ගේද, සියලු කාංක්ෂාවෝ දුරුව ගියහ. තව ද නුඹවහන්සේ ම විසින් 'මතු මේ කප මෛත්‍රෙය නම් බුදුකෙණෙකුත් උපදිති'යි වදාරණ ලද, ඒ මෛත්‍රෙය නම් බුදුහු කවර කලෙක උපදිත් ද, කෙසේ වූ බුද්ධශ්‍රී ඇතියාහු ද, ඒ විශෙෂයෙන් අසනු කැමැත්තෙමි"යි ආරාධනා කළසේක. කියේ මැනෙවි:

සාරිපුත්තො මහා පඤ්ඤො-උපතිස්සො විනායකො,
ධම්ම සෙනාපති ධීරො- උපෙච්ච ලොකනායකං

අනාගතං ජිනාරබ්භ-ආපුච්ඡි කඞ්ඛමත්තනො,
තුම්හානන්තරිකො ධීරො-බුද්ධො කීදිසකො භවෙ,
විත්ථාරෙනෙ'ව'හං සොතුං-ඉච්ඡාමි'වික්ඛ චක්ඛුමා-යි.

මෙසේ දම් සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුහු මහා වර්ෂාවක් පිට වර්ෂාවක් වස්වන්නා සේ නැවත අනාගතවංශ දේශනාවට පටන්ගත් සේක්:— "ශාරිපුත්‍ර ස්ථවිරය, මම මාගේ කරුණා ශාසනය මා නැති පන්දහසක් හවුරුදු තෙක් නැසී සිටිනේ ය. එයින් මත්තෙහි ලොව අබුද්ධොත්පාද වන්නේ ය. සත්ත්වයන්ගේ ආයුඃසංස්කාරය අකුශලයන් උත්සන්නභාවයෙන් ක්‍රමයෙන් පිරිහී දසහවුරුද්දට ආයු වෙයි. එකල සත්ත්වයෝ තිරසනුන් වැනිවූහ. මවුපියෝ යයි වෙනසක් නො දනිති, නැගනියෝ ය, බුහුනනියෝ ය, මසිලනුවෝ ය, බෑනනුවෝ ය, පුතනු

මව් ය, දියණියෝ ය, යනාදි ව්‍යවහාරයෙක් නැති ව තම තමන් කෙරෙහි ම ප්‍රෙම කෙරෙති. පස්මැසි කුමරුවන්ට පස්මැසි කුමරියන් ශරණ පාවා දෙති. සියලු රස ම අනභිඥාත වෙයි. හැල් වී අනභිඥාත වෙයි. වරාකාලේ බත් රජදරුවන්ට අග්‍ර භොජන වෙයි. මෙසේ ලොව සියලු දෙයින් ම හීන වූ කල ත්‍රිවිධ වූ අන්තඃකල්පයන් අතුරෙන් දුෂ්ට සත්ත්වයාගේ ද්වෙෂය උත්සන්න වීම හෙතු කොට ගෙණ ශස්ත්‍ර අන්තඃකල්පයෙන් ලොව විනාශ ය වෙයි. හේ කෙසේ ද? යත්;

අන්තඃකල්පය සත්සත පලමු ම සත්වන දවස කාමාවචර දෙවතා කෙනෙක් අමඟුල් වෙසක් ගෙණ "සත්ත්වයෙනි! මෙයින් සත් දවසක් ගිය කල මෘගසංවිශ්‍රාව ය යි යන විනාශකර වූ මහ වැස්සෙක් සත් දවසක් ධාරානිපාතයෙන් වස්සි, එහි තෙමුනු කෙනෙක් ඔවුනොවුන් ඇසට මුවන් සේ පෙණී ඔවුනොවුන්ගේ ජීවිත විනාශ කෙරෙති. දිවි රක්නා කෙනෙක් ඒ සත්දවසට දිය දර බත් පැන් සහල් ලුණු ඇඹුල් රැස්කොට තබාගෙණ ගල්ගුහා පර්වතගුහා ආදීයට වැද දිවි රකුව"යි කිය කියා කොල ලක්ෂයක් සක්වල ඇවිදිති. ඒ බස් අසා සත්ත්වයෝ තමන් අඥාන හෙයින් "ඒ දුටුවෝ කවුරු ද? ඇසුවෝ කවුරු ද? දැන ආවෝ කවුරු ද? එ නම් කුමක බසක් දැ?"යි නො ගිවිස සිනාසෙති. සමහර නුවණැ'ති කෙනෙක් කවුරු දනිත් ද? යි දෙවියන් කී සැටියේ ම ගල්ගුහා ආදියෙහි දෙදෙනෙක් ඔවුනොවුන්ට නො පෙණෙන සේ හිඳිති.

එ කල මෘගසංවිශ්‍රාව කොලලක්ෂයක් සක්වල මුළුල්ලෙහි එක පැහැර ධාරානිපාතයෙන් වස්නට පටන් ගන්නී. පොද බින්දුවෙකිනු ත් තෙමුනාවූ යම් කෙනෙක් ඔවුනො'වුන් ඇසට මුවන් සේ පෙණෙති. කොල! තෙල මුවා ගණුව, මරව කනුව. කපුකරවයි කිය කියා ඔවුනො'වුන් ලුහුබඳවා ගනිති. තණපත් පරඬලාපත් සිහුම් මුවගත් ඇති කඩුපත් සේ වැවී යෙයි. එ කල සත්ත්වයෝ එ සත් දා මුළුල්ලෙහි මෙසේ ඔවුනොවුන් මරා එක මස් කලවිටක් සේ කොට ලොව ලෙහෙ මුහුදු කෙරෙති. ඉක්බිත්තෙන් වැසි ගල කළු ජීවත් වූ කෙනෙක් එළිබැස මිළු මල නෑයන්ගේ පොලුගෙණ තිබෙන අතුල් පතුල් ඉස් කන් නාසාදි වූ ඇඟ මස් දුන "අපගේ නෑයෝ අප කියා මත් නො ගෙණ හැමදෙන ම දූන් නටහ"යි මහත් වූ කරුණා උපදවා "අපි හැම ජීවත් වූ පමණෙක් ඔවුනො'වුන්ගේ ආත්ම රක්ෂාවෙහි අප්‍රමාද වම්හ"යි ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී ඇති ම

'මේ හැත් පවත් ප්‍රාණඝාත නො කරම්'යි පළමුකොට ප්‍රාණඝාත ය දුරු කෙරෙති. ඒ කුශලයෙන් ඔවුන් වැදූ දරුවන්ට විසි හවුරුද්දට ආයු වෙයි. ඔහු දෙවනු ව අදත්තාදාන ය හැර පියති. උන් වැදූ දරුවන්ට තිස් හවුරුද්දට ආයු වෙයි. තුන්වනුව පර දාරය හැර පියති. උන් වැදූ දරුවන්ට සතළිස් හවුරුද්දට ආයු වෙයි. සතරවනුව මුසා වාදය හැර පියති. උන් වැදූ දරුවන්ට පණස් හවුරුද්දට ආයු වෙයි. පස්වනුව පිසුනා වාච ය හැර පියති. උන් වැදූ දරුවන්ට සැට හවුරුද්දට ආයු වෙයි. මෙම ක්‍රමයෙන් දශවිධ වූ අකුශල ධර්මයන් හැර දශවිධ වූ කුශල ධර්මයෙහි පිහිටා යෙති. ඒ කුශල ධර්මයන්ගේ ම ආනුභාවයෙන් ක්‍රම ක්‍රම යෙන් වැඩී දෙසියයක් හවුරුද්දට ආයු වෙයි. ඒ කාලට දඹදිව ඉතා සමෘඩව බරණැස්නුවර නම් කොසොල් පෙරළී එ නමින් ම ව්‍යවහාර වෙයි.

තව ද එයින් මත්තෙහි කුශල ධර්මයන් වැඩී වැඩී සෙම සත්ත්වයන්ගේ ආයු ක්‍රම ක්‍රමයෙන් ම වැඩී අනූදහසක් හවුරුද්දට ආයු වෙයි. එ කල බරණැස් නුවර නම් පෙරළී උත්පල නම් නුවරෙක් වෙයි. එ නුවර දිගින් පුළුලින් යොදුනක් පමණ මහත් ව සමෘඩ වෙයි. එයින් මත්තෙහි තව ද ආයු ක්‍රම ක්‍රමයෙන් වැඩී ලක්‍ෂයක් හවුරුද්දට වූ කල උත්පල නම් නුවර නම පෙරළී අයම් විතරින් සත් යොදුන් පමණ ඇති පදුම නම නුවරෙක් වෙයි. තව ද වඩ වඩා කුශල ධර්මයන්ගේ ම බලයෙන් අසඞ්ඛ්‍යයක් හවු රුද්දට ආයු වෙයි. එ කල පදුම නම් නුවර නම පෙරළී දොළොස් යොදුන් අයම් විතර ඇති මණ්ඩුර නම් නුවරෙක් වෙයි. ඒ අවධියට මිනිස්ලොව දෙව් ලොවට ත් වඩනේ ය, උපන් කල් නො දනිති, මියන කල් නො දනිති, ජරා විලි පිලි නො දනිති, රොගාන්තරා ය නැත.

මෙසේ සුව විඳීම හේතුකොට ගෙණ දුක් නම් කෙසේ බව ත් නො දැන සත්ත්වයෝ කුශල් කිරීමෙහි ප්‍රමාද වෙති. ඒ අකුශල යෙන් ආයු පරිහාණියට පැමිණ ක්‍රම ක්‍රමයෙන් අසූදහසක් හවු රුද්දට ආයු වෙයි. එ කලට මණ්ඩුර නම් නුවර නම පෙරළී කෙතුමතී නම් රාජධානියක් වෙයි. වදාළේ මැනෝ:—

තදා කෙතුමතී නාම-රාජධානී භවිස්සති,
ද්වාදස යොජනායාමා–සත්තයොජන විත්‍ථතා-යි.

තව ද සාරිපුත්‍ර ස්ථවිරය, ඒ නුවර දිගින් දොළොස් යොදුන. පුළුලින් සත් යොදුන. අවටින් අවතිස් යොදුන. අනන්තයෙහි පොළොව් පළා නැඟි සත්රුවන් පවුරු සතෙක් මැවී නුවර සිසාරා සිට දව රෑ වෙනසක් නො දක්වා ප්‍රභාවත් කෙරෙයි. එහි අනතුරන්තරයෙහි රිදීමය වූ කඳ ඇති, ඉන්ද්‍රනීල මාණික්‍යමය වූ පත් ඇති, සකරත්මය වූ ඵල ඇති, තාලවෘක්ෂ පඞක්තීහු සත් වළල්ලක් බඳවින් වට ගසා සිට ගණිති. සතර දිශාවෙහි සත්රුවන් මය වහසල් සතරෙක් මැවී සත් සත් මහල් ඇති ව, දිවා රෑ වෙන සක් නො දක්වා නුවර අලඞකාර කෙරෙයි. ඒ සතර වාසල්දොර කපරුක් සතරෙක් පොළොව පළා ගෙණ පැන නැගී තන් විසි තුරු වූ සම්පත්තීන් සැදී සිටී. මුළු දඹදිව සත්ත්වයන් කැමැති කැමැති වස්ත්‍රාභරණ ඉන් එක කපරුකෙකින් ගෙණ යත්. ඒ අසුදසයක් අවුරුදු මුළුල්ලෙහිත් ඇද නිමවාගත නො හැක්ක. තව ද ඒ නුවර මැද පැනනැඟී සත්රුවන් මය වූ ශාලාවෙකු දු ඇත. ඒ ශාලාමම සතර දිගද කපරුක් සතරෙක් මැවී තිබෙයි. ඒ කෙතුමතී නම් රාජධානියෙහි දණ්ඩෙන් පහින් කළ ගෙයෙක වසන්නා වූ එක ද සත්ත්වයෙකෙනෙක් නැත. සත්රුවන් ගෙවල ම වාසය කෙරෙති. දිව්‍යමය වූ උයන් හා දිව්‍යමය වූ පොකුණින් ගැවසී ගත.

ඒ කල ඒසා දඹදිව මුළුල්ලෙහි සත්ත්වයන් කෙරෙන් සාත වපුරණ කෙණෙක් වෙළෙඳාම් නවාම් කරණ කෙණෙක් බඩ නිසා දුක් ගන්නා වූ එක ද මනුෂ්‍ය කෙණෙක් නැත. පොළොව පළා ගෙණ ස්වයං ජාත වූ රත් හැල් පැන නැගෙයි. කරල්වල කුඩු නො නැතිව මුතුදැල් සේ සාල් ගෙණ තිබෙයි. එක බිජුවටක් හුනුතෙනින් නැගි පදුරෙන් කරල් කඩා මැඩගත්කල දෙදහස් දෙසිය දෙසැත්තෑ හැල් පුරා සොළොසාමුණු අවළොසක් සාල් ඉතිරි වෙයි. ඒ සාල් මැණික් බඳනෙහි ලා මැණික් උදුනෙහි දී පැසවා ඇම සත්ත්වයෝම අනුභව කෙරෙති. සත්ත්වයන් මළ මූත්‍ර විසර්ජනය කරම්හ යි සිතූ වේලෙහි නිල් වලාකඩෙක් දිවගෙණ අවුදින් තිරයක් සේ සිසාරා සිටගණිති. එකෙණෙහි පොළොව පැළී මහ වළෙක් මැවී යෙයි. එහි ශරීරාධානය කළ කල ඒ වළ අන්තර්ධාන ව පැන් පොකුණෙක් මැවී යෙයි. එයින් උදකකෘත්‍ය ය කළ කල ඒ වලාකඩ අන්තර්ධාන වෙයි. ඒ සමයෙහි ඒ කෙතුමතී නම් රාජධානී ය දිව්‍යපුරයක් වැන්න.

තව ද ශාරිපුත්‍ර ස්ථවිර ය, පෙර දිඹුල්දණ්ඩෙක් ගෙයක් තන වස් වස්වා පින් කළ කුළුපතු-දෙපුතු පියන් අතුරෙන් පුතනුවෝ මාගේ ශාසනයෙහි භද්දිය නම් ථවිර ව නිවන් දකිති. පියානෝ තමන් කළ පින් නුමූ කළ හෙයින් මේ බුද්ධාන්තර ය මුළුල්ලෙහි සදෙව්ලොව හැරිසරා ඇවිද එ කල ඒ කෙතුමතී නම් රාජධානියෙහි සඛ නම් චක්‍රවර්ති රජ ව උපදනාහු ය. ඒ රජහු පෙර කළ ආවාස දානයාගේ කුශලයෙන් පෙර මහාපනාද රජ්ජුරුවන් අසඛ්‍යයක් හවුරුදු හිඳ රාජ්‍යය කළ පස්විසි යොදුන් උස ඇති, සියක් මහල් ඇති, සුවාසූ දහසක් රුවින් ගබඩා ඇති, ඉඳුනිල්මිණිමය වූ බිම ඇති, සහරත්මය වූ ටැම් ඇති, රිදීමය වූ කොඬුරු හා පේකඩ ඇති, ප්‍රවාලමය වූ ව්‍යාඝ්‍ර පඞ්කති ඇති, රන්මය වූ පලසවෙනි ඇති පස්විසි යොදුන් ඒ පාය ආකාශයට නැගනැගී දෙමහ සඳක් සේ අවුදින් නුවර මැද පිහිටා යෙයි. චක්‍රරත්න ය, මාණික්‍යරත්න ය හස්තිරත්න ය, අශ්වරත්න ය, පරිණායකරත්න ය, ගෘහපති රත්න ය, ස්ත්‍රීරත්න ය යි යන සත්රුවන ද පහළ වෙයි. එ රජ තමා හා සම බල දහසක් පුතුන් ඇති වෙයි. ආකාශයෙන් යන සෘද්ධි ඇති වෙයි. සඳුන් සුවඳ වහන ශරීර ඇති වෙයි. මහනෙල් මල්සුවඳ මුඛ ඇති වෙයි. දෙව්යෝ සතර දෙනෙක් සතර දිග කඩු ගත් අත් ඇති ව රකවල් ගෙණ සිටිති. සතර මහා වීථියෙහි මහ සෙන් සමග එකඳ ඇවිද සියලු සතුන්ට පන්සිල් රක්නුව යි අවවාද කියා දවල් බතට සිය නුවරට එයි.

මෙසේ ඒ සඛ නම් චක්‍රවර්ති රජ දිඹුල්දඬු ගෙයි පිණින් ඒ සා මහ පායක් ලබයි. එ ගෙයි ලා ලූ එක ඇඳෙහි පිණින් සුවාසූ දහසක් යහන් ලබයි. එක ඇතිරියෙහි පිණින් සුවාසූ දහසක් ආස්තරණ ලබයි. බැලමෙහෙ කොට දුන් දානයෙහි පිණින් දිව්‍යභොජන ලබයි. ඒ ගෙයි ලා ලූ එක පියෙහි පිණින් සුවාසූ දහසක් සිංහාසන ලබයි. එ කල සම්සිතින් දත් පිසූ ස්ත්‍රිය ප්‍රධාන කොට සුවාසූ දහසක් බිසෝවරුන් පිරිවර යි. එ පන්සල වටා වැට කරවාලූ පිණින් නුවර වටා සත්රුවන් පවුරු සතක් ලබයි. වෙහෙර වටා සිඳුවාලූ තල්පෙළෙහි අනුසසින් සත්රුවන්මය වූ තල්ගස් නුවර සිසාරා සත්වලල්ලෙකින් එලගෙණ සිට ගණිති. සත්වසක් මස් වැස් වූ පිණින් සත්රුවන් ලබයි. වස් අන්තයෙහි නො වරදවා දුන් වස්මාසික සිවුරු පිළියෙහි පිණින් ඒ සා මහත් කප්රුක් ලබයි මෙසේ සඛ නම් චක්‍රවර්ති රජ එ කල ඒ කෙතුමතී නම් රාජධානියෙහි ශක්‍රයා සේ සුව විඳිනේ මැ යි. වදාළේ මැනෝ:-

සංඛො නාම සො රාජා-අනන්තබලවාහනො,
සත්තරතන සම්පන්නො-චක්කවත්ති මහබ්බලො-ති.

තව ද ශාරිපුත්‍ර ස්ථවිරය, ඒ මෛත්‍රෙය බුදුහු අපර මූහුර්ත නම් බුදුකෙනෙකුන් සමයෙහි ප්‍රභාවනාත නම් චක්‍රවර්ති රජක් ව මා සේ ම අෂ්ටාඞ්ග ධර්මයෙන් යෙදී ප්‍රථමාභිනීහාරය ලදින්, එ තැන් පටන් සොළොසාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් පැරුම් පුරා එදුතුරෙහි බුදුවූ දහස් ගණන් බුදුන් අතින් මා සේ ම විවරණ ලදින් කෙලවර විශ්වනත රත්මවත් ජාතියෙන් සැව ගොස් තුසීපුරයෙහි ඉපද. එතැන් පටන් මේ බුද්ධාඞ්කුර ය මුළුල්ලෙහි දිව සුව විඳ එ කල දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආරාධනා ඉවසා පස්බැලුම් බලා බ්‍රාහ්මණවංශය උතුම් යේ දූත කේතුමතී නම් රාජධානියෙහි සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන්ට අග්‍ර පුරෝහිත වූ සුබ්‍රහ්ම නම් බ්‍රාහ්මණ මහාමාත්‍යාණන්ගේ බ්‍රහ්මවතී නම් බැමිණීදේවීන් කුස පිළිසිඳ දසමස් පුරා මැස දසදහසක් දක්වළ දෙව්බඹුන් මධ්‍යයෙහි මෛත්‍රී පිඩක් සේ මහබ්‍රහ්මයා අතට බිහිව අජිත නම් කුමාරව තරු පිරිවරා සඳක් සේ වැඩ දොළොස් දොළොස් යවු උස ඇති සිරිවඩ්ඩක සූ මණිසමාණකය-සිඩාජීවය-චන්ද්‍රකය යි යන සත්රුවන්මය වූ තුන් සාධුමම මෙතා මෙත තුන් පායෙක් වෙයි.

එකි එකි පායෙක්හි සත් සත් මහල; එකි එකි මාලෙක්හි ලක්ෂයක් ලක්ෂයක් කුළුගෙවල. එකි එකි පායට සත් සත් රුවන් පවුරු ය. සත් සත් රුවන් වාසල. එ තුන් පායෙහි පසග තුරු රුවු විසිදුනා රන් රසුදූල් එල්වා තිබෙයි. මුදුනෙහි සත් රුවන් මය වූ ධවජ කණා තිබෙයි. ඒ ධවජ කතුල්වල බඳනාලද රන් මිණි සොභායෙන් නුවර එකතින්නාද වෙයි. ඒ ප්‍රාසාදයන් තුන් දෙනාගේ භිත්ති සත්රුවන්මය වූ නාල පඞ්කතිය, මකරපඞ්කතිය, සිංහ පඞ්කතිය, ව්‍යාඝ්‍ර පඞ්කතිය, හස්ති පඞ්කතිය, අශ්ව පඞ්කතිය, රථ පඞ්කතිය, මයුර පඞ්කතිය. හංස පඞ්කතිය යනාදි නිර්මිත වූ කර්මාන්තයෙන් ශොභමානය. දවස් පතා මල්වැයි වස්නේය. එකි එකි මාලෙක සත්සියක් සත්සියක් රුවන් ගබඩා ය, සත්සියක් සත්සියක් සිංහාසනය, සත්සියක් සත්සියක් සේසත, සත්සියක් සත්සියක් යහන, එකි එකි පාය සිසාරා පිරිවරා ඡද්දන්ත නම් හස්තිරාජයා ප්‍රමුඛ වූ සත් දහසක් සත් දහසක් මඞ්ගල හස්තීහු සැරහී සිටිති. වලාහක අශ්වරාජයා ප්‍රමුඛ වූ සත් දහසක් සත් දහසක් අශ්වයෝ සැරහී. සත්රුවන් ධවජ නැගූ හිරුමඬල සඳමඬල වැනිවූ සත් දහසක් සත් දහසක් රථපඞ්කති සරහ, එකි එකි මාලෙහි සත් දහසක් සත් දහසක් නාටක ස්ත්‍රීහු සැරහී සිටිති.

මෙසේ මහත් වූ ශ්‍රීවිභූතීන් ඒ මෛත්‍රෙය නම් බොධිසත්ත්වයෝ මෙසේ වූ තුන් පායෙහි තුන් සෘතුමෙහි වෙසෙති. සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන් ආදි වූ දඹදිව සුවාසූ දහසක් රජදරුවෝ මඟුල් කඩු ගෙණ බෝසතුන් කරා අවුදින් හිමි තුඹට සේවය කරම්හ යි කියති. මාගේ පෂීද් බෙහෙව. තොපි තොපගේ රාජ්‍යශ්‍රීම විඳුව යි යවත්තාහු ය. කැටි ව දෙව්ලොම සිට අවුදින් එක ද උපන් අටළොස් කෙළක් අමාත්‍යයෝ නිති ම එ බෝසතුන්ට ආරක්ෂා ගෙණ සිටිති.

මේසේ ඒ අජිත නම් මෛත්‍රෙය බෝසතාණෝ බුදු වූ බව කීනු ත් කියා නිමවා ගත නො හැක්කාවූ මහත්වූ ශ්‍රී සම්පත් විඳ අවදහස් හවුරුදු ගිහිගෙහි වැස තුන් පූර්වනිමිති දැක සසර කල කිරී සතරවනු ව දෙවියන් මවා පෑ සන්‍යාසීන දැක මහණවනු කැමැති ව චන්ද්‍රමුඛී නම් අගමෙහෙසි දේවීන් බ්‍රහ්මවර්ධන නම් පුත් රුවන වැදූ ද මහණවෙමි යි සිතා එ කෙණෙහි ම එ ම රුවන්පායෙහි ම පලග් බැඳ මිතු මාල්තෙලෙහි ඉඳ සත් දවසක් දුෂ්කරක්‍රියා පුරන්නාහු ය. එ වේලෙහි සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවෝ සුවාසූ දහසක් රජුන් හා සුවාසූ දහසක් බිසෝමරුන් පිරිවරා පූජාභාණ්ඩ ගෙණ පාය සිසාරා එ සද්ද ම අරක්ගෙණ සිටිනාහුය. එසේ ම දසදහසක් සක්වල දෙවියෝ ද දිව්‍ය පූජාභාණ්ඩ ගෙණ අහස්කුස පුරා සිටිනාහුය.

මෙසේ සත් දවසක් දුෂ්කරක්‍රියා පුරා කිසිකෙණකුත් හා මුළුවෙත් නො බැණ කිසි කෙණකුත් මුහුණ නො බලා දම්ස් යවූ කල ඇම් බුදුන් බුදුවන වෙසග මැදි පොහෝද මහාභිනිෂ්ක්‍රමණ කෙරෙමි යි සිතූ කෙණෙහි එ රත්පාය සත්පවුරු සත්දොරටු පිරිවරා සිටි මහ සෙසතන සමගින් ආකාශයට පැන නැගී බෝමැඩ දිශාවට නික්මෙයි. කැටි ව මහණවනු කැමැති සියලු සත්ත්වයෝ ම සිටි සිටි පළින් ආකාශයට පැනනැගී පියුම් විලකට දිවන රාජහංස පෙළක් සේ යෙති. මෙසේ මහත් වූ පුණ්‍යප්‍රභාවෙන් ගොස් එ රත්පාය මහ සෙනග හා බෝසතුන් ගෙණ බෝමැඩ කරා බස්සී. එ කෙණෙහි මඟුල් කඩුව විදුලියපතක් සේ ගෙන කෙස්වැටිය කපා ආකාශයට දමා මහබඹුන් දුන් සිවුරු පිළිගෙණ මහණ වෙති.

තව ද: මේ බුද්ධොත්පාදයෙහි පින්කොට ප්‍රාර්ථනා කළා වූ ස්ත්‍රී-පුරුෂයෝ බොහෝදෙන එම විට ම මහණ වෙති. චතුර්වේදයෙහි නිපුණ වූ බ්‍රාහ්මණයෝ සුවාසුදහසක් එ ම විට ම මහණවෙති

තව ද: මේ ශාසනයෙහි පින්කළ ඉසිදත්ත ය - පුරාණ ය යි යන දෙබෑ තෙරණක් සුවාසූ දහසක් සුවාසූ දහසක් පිරිස් ගෙණ මහණ වෙති. තව ද: ජිනමිත්‍ර ය - අජිනමිත්‍ර ය යි යන පණ්ඩිතවරූ දෙදෙනෙක් සුවාසූ දහසක් සුවාසූ දහසක් පෂීද් ගෙණ මහණ වෙති තව ද: මේ ශාසනයෙහි පින්කළ සිඬාර්ථ නම් සිටාන තෙණකුන් හා සුනන්ද නම් සිටුදියණී තෙරණක් සුවාසූ දහසක් සුවාසූ දහසක් පුරුෂ ස්ත්‍රීන් හා සමග මහණ වෙති. තව ද: මේ ශාසනයෙහි පින් කළ සඞ්ඝ නම් උපාසක තෙණකුන් හා සඞ්ඝා නම් උපාසිකා තෙණක් සුවාසූ දහසක් සුවාසූ දහසක් පුරුෂ ස්ත්‍රීන් හා සමග මහණ වෙති. තව ද: මේ ශාසනයෙහි පින්කළ යශවතී ය - විශාඛා ය යි යන මෙහෙනියෝ දෙදෙනෙක් සුවාසූ දහසක් සුවාසූ දහසක් ස්ත්‍රීන් හා සමග මහණ වෙති. අවශේෂ වූ රජ - බමුණු - වෙළඳ - ගොවි ලක්‍ෂ ගණන් ඔබ්බෙම මහණ වෙති.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ මහණවෙලා ඒ චන්ද්‍රමුඛී නම් අග්‍ර දෙවීන් දුන් කිරිපිඩු වළඳා එම ද ම සවස අපරාජිත ස්ථානයෙහි පැහැපෑගි විදුරුණුන් නැගී නාග ශ්‍රී බොධියට පිවලා හිඳිනාහු ය. ඒ නාග ශ්‍රී බොධි ය නම්: රිදීකඳක් සේ සමවට වූ කඳ ය එක්සිය විසි රියන් උස ය. පසඳව මහාශාඛාවෝ ද එක්සියවිසි එක්සියවිසි රියන් උස ය. මූල පටන් අග දක්වා දෙසිය සතළිස් රියන් උස ය පූර්ව ශාඛාග්‍ර ය පටන් පශ්චිම ශාඛාග්‍ර ය දක්වා දෙසිය සතළිස් රියන. උතුර ශාඛාග්‍ර ය පටන් දක්ෂිණ ශාඛාග්‍ර ය දක්වා දෙසිය සතළිස් රියන. ශාඛාමණ්ඩල ය වටින් සත්සිය විසි රියන. ඉඳු නිල්මිණි ස්කන්ධයක් සේ ඇම ද ම ශොභාවත් ව තිබෙයි. ඇම ද ම විලික්ෂ ව මැගිරෙණ පතෙකු දු නැත. මුහුකළ පත් ඉන්ද්‍රනීල මාණික්‍යමය ය. අසු ඉස්සෙහි ලිය හා අඞ්කුර ප්‍රවාලමය ය. එ තෙණෙහි ම නාග ශ්‍රී බොධිය මූල පටන් අග දක්වා මලින් සැදී සිටියේ ය. දෙලොස් නැළියක් පැන්ගන්නා පමණ කැකුළු වෙයි. පිපි මල් මහ ගැල් සක් පමණ වෙයි. එකි එකී මලෙක්හි නැළියක් පමණ රේණු වෙයි. එද පිපි මල් අසූදහසක් හවුරුදු පර නොවී තිබී ඒ බුදුන්ගේ පරිනිර්වාණ ය හා සමග හැම මල් පරව නටුවෙන් ගිලිහී පෙත්තකු ත් බිම නො හී ආකාශයෙන් ගොස් දර සෑයෙහි ම වැගිර බුදුන් හා සමග ආදහන වෙයි.

තව ද: බෝමැඩ සිසාරා වටින් දෙගවු දෙගවු පමණ පෙත සත් රුවන් වැලි පැන නැගී තැනී තිබෙයි. එ වට සත්රුවන්මය වූ පවුරෙක් වෙයි. එයින් පිටත වට දොළොස් දොළොස් ගවු පමණ තෙන නන් විසිතුරු වූ සුවඳ මල්ගස් සමූහයෝ ඇමදෙන ම ඒ නාග ශ්‍රී බෝධියට වැඳුම් ගෙණ එක්පඩකා තිත් සිටිනාහු ය.

මෙසේ ඒ මෛත්‍රෙය බුදුහු තමන් සොළසාසංඛ්‍යෙය කප් ලක්ෂයක් මුළුල්ලෙහි පිරූ උග්‍ර වූ පාරමිතාවන් ගේ මහිමයෙන් ම ලබතලද මේ බඳු වූ නා සිරි බෝ පිටලා අට පණස් රියන් වීදුරසුන් නැගී චතුරංග වීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් දසදහසක් සක්වළ දෙවිබඹුන් ගෙන් පූජා විඳ විඳ හිඳිනාහු ය. එ කෙණෙහි මහමතීතිමාරයා මහත් වූ මරසෙනඟ ගෙණ 'ඔහු අද බුදු විය නො දෙමි. දෙ සකුල ගෙණ පරසක්වල ගසමි'යි කිපී දිව සක්වල මුඹවට සිට ඒ මෛත්‍රෙය නම් බුදුන්ගේ මෛත්‍රීපිඩක් බඳු වූ ශ්‍රී මුඛය දැක ලංවිය නො හී හසින් වෙවුලා පැරද දිවපි ය යි. මෙසේ මරසෙන් බිඳ එදා රෑ අලුයම් වේලෙහි ලොවුතුරා බුදු ව අනන්තාපරිමාණ වූ සක්වලට බුදුරස්කඳ විහිදුවති.

තව ද: ශාරිපුත්‍ර සථවිරය, ඒ මෛත්‍රෙය නම් බුදුහු අශෝකය-බ්‍රහ්මදෙවය යි යන අගසවු දෙදෙනාත් හා සමග මහත් වූ ශ්‍රාවක ගණයා ඇතියහ ඇමදා ම දිවා රාත්‍රියෙහි පස්විසි යොදනෙක පවත්නා බ්‍යාමප්‍රභා මණ්ඩලය ඇතියහ. තව ද: ඒ මෛත්‍රෙය බුදුන්ගේ බුඩකාය අටඅසූ රියන් උසය; ශ්‍රීපාදයෙහි පටන් දන ඹඩලට දෙවිසි රියන් උස ය. දණඹඩල පටන් නාභිමණ්ඩලයට දෙවිසි රියන් උස ය. නාභිමණ්ඩලයෙහි පටන් අකුධාතුවට දෙවිසි රියන් උස ය. අකුධාතුවෙහි පටන් ශිරොධාතුවට දෙවිසි රියන් උස ය. දකුණු උරමඩලෙහි පටන් වම් උරමඩලට පස්විසි රියන් පළල ය. විදුලිය දෙකක් වන් කන්පට දෙක සත් සත් රියන. එකී එකී ඇස දිග පස් පස් රියන. දෙව්දුනු දෙකක් වන් බැම සගල පස් පස් රියන. දෙබැම අතුර පස් රියන. නාසිකාව සත් රියන. සුරකතවූ තොල් සගල පස් පස් රියන. සුරකතවූ දිව දස රියන. ශිරොධාතුවෙහි වට පස්විසි රියන. රන්වන්වූ ශ්‍රී මුඛමණ්ඩලය පස්විසි රියන් වට ය. රන් මිහිගක් සේ වට වූ ග්‍රීවා ධාතුව පස් රියනක් උස ය. රන්වන් වූ ශ්‍රී හස්ත දෙක සතළිස් සතළිස් රියන,

එකි එකී අතුල් පස් පස් රියන. ශ්‍රීපාද දෙක තෙලෙස් රියන් එක් වියත් සාඟුල් පමණ දිග ඇත්තේ ය.

මෙසේ ශ්‍රීමත් වූ බුද්ධත්‍වයෙකින් ධර්‍මයක් පැවතුම් සූත්‍ර දෙශනාදි වූ අප්‍රමාණ වූ ධර්‍ම දෙශනා කොට සියලු සතුන් සංසාර සාගරයෙන් ගොඩනගා ඒ මෛත්‍රෙය බුදුහු අසූදහසක් හවුරුදු ආයුශ්‍රී විළඳ හිඳිනාහු ය. ඒ කල සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවෝ තමන්ගේ පස්විසි යොදුන් රන් පාය සඞ්ඝාරාමයක් කොට බුදුන්ට දන් දී සියලු චක්‍රවර්ති රාජ්‍යය බුදුන්ට පුද පෙර තමන් දිඹුල් දණ්ඩෙන් ගේ සාදා මිස්වනයවා කළ පින්බලයෙන් ම කැටි ම පින් කළ ස්ත්‍රිය හා සමග නවකෙළ දහසක් අමාත්‍යයන් ගෙණ බුදු සසුන් වැද මහණ ව අමා මහ නිවන් දක්නාහු ය.

මතු බුදුවන ඒ මෛත්‍රෙය නම් බුදුන් නො දක්නෝ කවුරුදැ? දක සසරින් ගැලවෙන්නෝ කවුරුදැ? යි යත හොත් මවුන් මැරූවෝ ය, පියන් මැරූවෝ ය, රහතන් මැරූවෝ ය, බුදුන් ඇඟින් ලේ සෙල්වූවෝ ය, සඞ්ඝභෙද කළෝ ය යි මේ පඤ්චානන්තරිය කර්‍ම කළා වූ සත්ත්වයෝ ඒ එන මෙතේ බුදුන් දක්ක නොහෙත් ම ය. දගැබ් බිඳ බොධි සාඛා කපා රන්පිළිම පොතු උපුටා බණ පොත් සිඳ මේ පව්කිරීම හා ආනන්තරිය කර්‍මයට ඇතුළු වන හෙයින් ඔහු ත් ඒ බුදුන් නො දකිත් ම ය. සඞ්ඝයා වහන්සේට ආක්‍රොශ පරිභව කිරුවාවූ සත්ත්වයෝ ද, සිල්වතුන්ට බොරුවෙන් වත් දෙස් ඉපද වූ සත්ත්වයෝ ද, ධර්‍මයට අනාදර කිරූ සත්ත්වයෝ ද, යන මොහු ත් ඒ බුදුන් දක්ක නො හෙත් ම ය. දන්වැට කැවෝ ද, කුසලාන් ගසා කැවෝ ද, බුදුන් සතුදෙය කැවෝ ද, ධර්‍මය සතු දෙය කැවෝ ද, සඟ සතුදෙය කැවෝ ද යන මොහු ත් ඒ බුදුන් දක්ක නොහෙත් ම ය. මේ බුද්ධොත්පාදයෙහි අලු හා මිථ්‍යාදෘෂ්ටි ගෙණ මෙලෝ පරලෝ නැතැ යි ඇවිදුනා සත්ත්වයෝ ද ඒ බුදුන් දක්ක නො හෙත් ම ය. හිරසඳ දෙවියන්ට ද, වැසිවලා දෙවියන්ට ද, දෙස් කළා වූ සත්ත්වයෝ ද ඒ බුදුන් දක්ක නොහෙත් ම ය. නරක-තිරිසන්-අසුර යන තුන් අපායෙහි උපන්නාවූ සත්ත්වයෝ ද ඒ බුදුන් දක ගැලවිය නො හෙත් ම ය. අරූතල - අසංඥතල පරයක්වල යනාදියෙහි උපන්නාවූ සත්ත්වයෝ ත් ඒ බුදුන් නො දකිත් ම ය.

තව ද: මේ බුද්ධොත්පාදයෙහි බණ අසා මෙලොව් පරලොව් දුත තමන් තමන් ශක්ති පමණින් දන් පින් කළෝ දකිති. තව ද සිල් රක්‍ෂා කළෝ දකිති. පෙහෙවස් රක්‍ෂා කළෝ දකිති. බඹසරවස් රැක්කෝ දකිති. දාගැබ් දාගරඹු කරවූවෝ දකිති. බෝධි පිහිටුවූවෝ දකිති. පුෂ්පාරාම-ඵලාරාම කැරවූවෝ දකිති. සේදුඹු ලැවූවෝ දකිති. මාවත් එළිකළෝ දකිති. ගොහවුකඳ කැනවූවෝ දකිති. ළිත් පැන් පොකුණු කැනවූවෝ දකිති. කටබුත් අම්බෙහෙර කැරවූවෝ දකිති. බණ කියා ලෝවැඩ කළෝ දකිති. බණ කියවූවෝ දකිති. ධර්මශාලා කැනවූවෝ දකිති. ධර්මාසන කරවූවෝ දකිති. ධර්ම ශාලාවෙහි වියන් බැන්දවූවෝ දකිති. බණපොත් ලියවා දුන්නෝ දකිති. ඒ පොත් අකුරු ගණනේ චක්‍රවර්ති සම්පත් ඇඳීවූ බොහෝ සැපත් ලදින් සුව විඳ මෛතේ බුදුන් දක නිවන් දකිති. කබලිදණ්ඩා සන බණ වසුන් ලැවූවෝ දකිති. ධර්මකථිකයන් පය සේදවූවෝ දකිති. බණ කියන්නන් උපචාරයෙන් සත්කාරයෙන් වඩා ගෙණාවෝ දකිති. බණ කියන කල සාධුකාර දුන්නෝ දකිති. බණට අඩගෑවෝ දකිති. විජිනිපත් දුන් දුන්නෝ දකිති. විජිනි පත් අතට ඔසවා දුන්නෝ දකිති. ධර්මාසනයෙහි මල් සුවඳ පිදූවෝ දකිති. වස්ත්‍රාභරණ පිදූවෝ දකිති. බණ කියන ගෙයි පහන් දල්වූවෝ දකිති. මේ සියල්ල නිමවා බණ පැමැත්වූවෝ දකිති. ගිලනුන්ට අත් පා මෙහෙ කළෝ දකිති. ආමාස දන කරවා දුන්නෝ දකිති. චීවර පිණ්ඩපාත දන් දුන්නෝ දකිති. ලාබත්-පෙහෙබත් අවදිබත් දන් දුන්නෝ දකිති. මවු පියන්ට අත් පා මෙහෙ කළෝ දකිති යවත් වශයෙන් එක මලක් එක පානක් එක බත් කෙණෙස්සක් දන් දී වේ ම යි තුණුරුවන් කෙරෙහි සිත පහදවා වේව යි යම් යම් කෙණෙක් මෛත්‍රෙය බුදුන් දක්නම්වේව යි කියා මාගේ බුද්ධොත්පාදයෙහි ප්‍රාර්ථනා කළාහු වූ නම්, ශාරිපුත්‍ර සර්වීරය ඔහු මතු මෛතේ බුදුන් දක සංසාර සාගරයෙන් ගොඩ නැගෙන්නාහු මී ය යි වදරා මේ අනාගතවංශ දෙශනාව නිමවා වදාළසේක.

මෙසේ මාගේ ස්වාමිදරුවෝ තමන් තො වදුම්හ යි ඔන් කල ඥාතිගණයා මධ්‍යයෙහි ආකාශයට පැනැනැගී ඒ රුවන් සක්මන දී මහත් වූ යමකප්‍රාතිහාර්‍ය්‍ය දක්වා ධර්මසෙනෙවි - සැරියුත් මහ තෙරුන් වහන්සේගේ ආරාධනාවෙන් මේ බුද්ධවංශය හා අනාගත වංශය දෙශනා කොට නිමවා, නැයන්ගේ මත් බිඳ ආකාශයෙන් බස්නා පුන්සඳක් සේ බැස පලමුව වැඩහුන් බුද්ධාසනයෙහි පෙණී සියසේක.

ඒ ආශ්චර්‍ය්‍යය දුටු ශුද්ධෝදන රජ්ජුරුවෝ පුතනුවන් වහන්සේගේ ශ්‍රී පාදමූලයට ගොස් දෙහොත් මුදුනෙහි තබාගෙණ සන්තොෂ බාෂ්පයෙන් දෙනුවන් තෙමා තෙමා: ස්වාමීනි, මාගේ බුදුරජාණෙනි, මාගේ සිද්ධාර්ථ කුමාරයෙනි, මාගේම පුතනුවන් වහන්ස, පුත්‍රවිසර්ජනයෙන් ලොවට වැඩ පිණිස මාගේ ගෙයි උපන් මාගේම පිතෘනාථ වහන්ස, අද පටන් තුඹ මට දරු නොවන දෑ ය. මම තුඹට දරුවෙමි. එසේ හෙයින් මා සේ වූ තුඹගේ දසයකු ත් නො වටනා පියා වූ පියාණ්හට මෙ බඳු වූ ප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වා මුළු ලෝ වෙවුල්වා කුමක් පිණිස දුක් ගෙණ වදාළසේක් ද? මම තුඹවහන්සේ උපන්දා කාලදේවිල නම් සෘෂීන්ගේ කලල්මැද තුඹගේ තෙල සිතුපතුල් දෙක ගෙල ගිණිහිය ප්‍රාතිහාර්‍ය්‍ය දුක සතුටුව එදා ද මේ සිරිපතුල් දෙක හැඳින් නමා වැන්දෙමි. ඒ මාගේ පළමුවන වැඳීම ය. තව ද තුඹ පස්හැවිරිදි කල වප්මගුල් කරණ දා දඹගස මුලදී කළාවූ ප්‍රාතිහාර්‍ය්‍ය දුක සතුටු ම එදා ත් මේ සිරිපතුල්දෙක වැන්දෙමි, ඒ මාගේ දෙවන වැඳීම ය. අද මා වැනිඅකු තබා දිව්‍ය බ්‍රහ්මයනුත් නුදුටු නො ඇසූ විරූ මෙ බඳු වූ ප්‍රාතිහාර්‍ය්‍ය දුක රාජ්‍යය පුද පියෙම් නම් ඒ තුඹ අනුසම දමූ කෙළපිඩක් සේ පිළිකුල්කොට හැරපියා ගිය රාජ්‍යය වුව. ජීවිතය පුදපියම් නම් තුඹගේ බුඩශ්‍රී වඩ වඩා දකිනා ලොභය මාගේ බොහෝ හෙයිනුත් ඒ ජීවිත පූජාව තුඹ නො ඉවසන හෙයිනු ත්, ජීවිතය ත් පුදපිය නො හෙමි. යනාදීන් කිය කියා බුදුන්ගේ ශ්‍රීපාද දෙක ඉස්මුදුනෙහි තබාගෙණ මේ තුන් වන වැඳීම ය යි කිය කියා ඒ ශුද්ධෝදන රජ්ජුරුවෝ සිටගත නොගී මූලින් සිඳහෙළූ කනක රූපයක් සේ බුදුන් පාමුල ම වැද පෙරළී ගියහ.

රජ්ජුරුවන් වැඳි කල එක්ලක්ෂ සැටදහසක් පමණ ශාක්‍ය රජ දරුවෝ සිටි සිටි පළින් සිටගත නොගී යුගාන්තවාතයෙන් හුනු මහ සල්වනයක් සේ වැද පෙරළී ගියහ. එක රජෙකු ත් බුදුන් නො වැඳ සිටිමට සමර්ථ නුවූයේ ම ය. ඇම ශාක්‍යයන්ගේම මානය සුලං දුටු වලාකඩක් සේ සිඳී බිඳී ගියහ.

ඉක්බිත්තෙන් ස්වාමිදරුවෝ ඥාති සමාගමයෙහි මුදුන් පැමිණ කැයන්ගේ මාන භංගකොට වදාළසේක. හැම ශාක්‍යයෝම බුදුන් වැඳ නැගී මන් බිඳ දෙහොත මුදුන් දී නමස්කාර පූජායෙන් සිඳ ගත්තාහු ය.

එ වේලෙහි ශක්‍රදෙවේන්‍ද්‍රයා මලාගිය මලස්නෙක පැන් ඉස්නා ශ්‍රද්ධාවන්ත පුරුෂයකු සේ, බුදුන්ගේ ශාක්‍යකුල නමැති බන්ධු කුසුමයන් සන්තොෂ කරවා මහත් වූ පොකුරු වැස්සක් වස්වා පූජා කෙළේ ය. ඒ පොකුරු වැස්සෙහි තඹවන් දිය යට පොළොවින් දිවෙයි. තෙමෙනු කැමැත්තෝ තෙමෙති. නො තෙමෙනු කැමැත්තෝ නො තෙමෙති. ඒ ආශ්චර්ය්‍ය දුටු විසිදහසක් භික්ෂූහු බුදුන්ගේ බන්ධුසමාගමයෙහි වට පොකුරු වැස්සෙක මහිමයක් බලව යි ස්තුති කළයේක. ස්වාමිදරුවෝ ඒ අත්ථොප්පත්තියෙහි: මහණෙනි, දැන් මතු නො වෙයි. පෙර ත් මාගේ බන්ධු සමාගමයෙහි පොකුරු වැසි වසුයේ ම වේදූ යි වදාරා දහසක් ගාථාවෙන් ප්‍රතිමණ්ඩිත වූ මහා වෙස්සන්තර ජාතකය ගෙණහැර දක්වා ධර්මදේශනා කොට වදාළසේක. එ වේලෙහි ද බොහෝ ප්‍රාණීහු සෝවාන් ආදි මාර්ගඵලයට පැමිණියාහ.

ඉක්බිත්තෙන් ඒ ශාක්‍ය රජදරුවෝ බුදුන් වැඳ ප්‍රදක්ෂිණා කොට බුද්ධදර්ශනයට විෂය තාක් තැන පසු බැගෑ බැස ගොස් දර්ශනාවසානයෙහි සිට නැවත නැවත පසඟ පිහිටුවා වැඳ 'ශාක්‍යසිංහ' 'ශාක්‍යකෙතු' යනාදීන් බුදුන්ට ස්තුති කොට කොට ගියහ.

මෙසේ මාගේ බුදුහු පළමුවන ඥාතිසමාගමයෙහි දී යමකප්‍රාතිහාර්ය්‍ය දක්වූ ද දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්ම රාජයන් කළා වූ දෙලක්ෂ සතළිස්දහසක් නමස්කාර පූජා ය, ශාක්‍ය රජදරුවන් කළ එක්ලක්ෂ සැටදහසක් නමස්කාර පූජා ය, ශක්‍රයා කළ පුෂ්කර වර්ෂා නම් පූජා ය, විසිදහසක් මහරහතන් විසින් කරණලද ස්තුති පූජා ය යි මෙසේ සාරලක්ෂ විසිදහස් එකුතුරු මහා පූජාවක් ලත් හෙයිනු ත්, මෙසේ වූ වික්‍රමයෙන් පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, ශාක්‍යකුල සිංහ වූ, ශාක්‍යකුල තිලක වූ, ශාක්‍යකුල ධ්වජ වූ, ශාක්‍යකුල කෙතු වූ, ශාක්‍යකුල කිරීට වූ, ශාක්‍යකුල චූඩාමාණික්‍ය වූ, ශාක්‍යකුල චින්තාමාණික්‍ය වූ, ශාක්‍යකුල කල්පද්‍රැම වූ, ශාක්‍යකුල මහා නිධාන වූ, ශාක්‍යකුල ප්‍රදීපායමාන වූ, මාගේ ස්වාමිදරු වූ, බුදුරජාණන් වහන්සේ මේ මේ කාරණයෙනු දු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලදුයේ මැයි:

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං යි.

මේ පූජාවලියෙහි අප බුදුන් බන්ධුසමාගමයෙහි දී ලද
න්‍යග්‍රෝධාරාම පූජා කථා නම් වූ
පසළොස් වන පරිච්ඡෙදය නිමි.



යශෝධරා දේවිය බුදුරදුන්ගේ ශ්‍රීපාද මූලයෙහි අඬා වැටීම. 301 පිට බලන්න (18-19)

සොළොස් වන පරිච්ඡේදය

තව ද අප බුදුන් මෙම කිඹුල්වත් නුවරදී ම ලද ශික්ෂාවනාදි අද්භූත පූජා නම් කවරහ? යත්;

මෙසේ මාගේ බුදුරජාණන් වහන්සේ එ දා බන්ධුසමාගමයෙහි මුදුන් පැමිණි සද්ධර්මාමෘතයෙන් අභිෂේක දුන් කල ඒ ශාක්‍ය රජ දරුවෝ බණ අසා සන්තොෂයෙන් නුවරට යන්නාහු සද්ධර්ම ප්‍රීතීන් පිණී මද ව එක රජෙක් වේව යි එක බිසෝ කෙනෙක් වේව යි බුදුන් සෙට දවසට පවරා ගිය කෙනෙක් නැත්තාහු ය.

ස්වාමිදරුවෝ එ දා රෑ ඒ නිග්‍රෝධ නම් ආරාමයෙහි දවස් යවා අරුණෝද්ගමන වේලෙහි මහා කරුණා සමාපත්තීන් නැගී දස දහසක් සක්වළ මුළුල්ලෙහි තමන් වහන්සේගේ නුවණ නමැති දැල දමා බලා සිරැරැසින් ප්‍රබොධවන පද්මයක් සේ, දෙශනා රශ්මීන් ප්‍රබොධවන්නාවූ ආසන්න භූමියට අවක්‍රාන්ත වන්නට නිසි වූ විනෙය ජන පුද්ගලයන් බලා වදාරා අරුණෝද්ගමන වේලාවෙහි සමාපත්තීන් නැගී උපස්ථායකයන්ට අනුග්‍රහ සඳහා ද, ශරීරයට සුව සඳහා ද, දැහැටි කෘත්‍යය නිමවා, භික්ෂාවන වේලාව දක්වා විවික්ත වූ ආසනයෙහි වැඩ හිඳ සම්වත් සුවයෙන් දවස් යවා, භික්ෂාචාර වේලාවෙහි ලාක්ෂාරසයෙන් තෙත් වූ අභිනව ප්‍රබුද්ධ රත් කොබලීල මල් පැහැ ඇති සුරකත වූ දෙපට හඳනා සිවුර රන් කතුරෙන් රත්පියුම් පෙති කලබක් කපන්නා සේ දෙදන ය නාභි ය යන තුන් මඬුල්ල වසා සකසා හැඳ, රත්පියුම් කලබය් රන්පටෙකින් වෙළන්නා සේ විදුලිය පතක් සේ දිලියෙන්නාවූ පටිධාතුව බැඳ, අටළොස් රියන් රුවන් ඇඟෑයක් රත්පලස් කඩෙකින් වසන්නා සේ, රත්ගල් මුදු තෙක ලාක්ෂාරස වත්කරන්නා සේ, අටළොස් රියන් ගජකුම්භයක් ප්‍රවාල කලාපයෙකින් වසන්නා සේ, රන් දාගබක් ඉඟුල්පතෙකින් වසන්නා සේ, චිත්‍රකූට පර්වතයක් බඳු වද මල් රැසකින් වසන්නා සේ, ගමන් ගත් පූර්ණ චන්ද්‍රයා සන්ධ්‍යා වලාපටලයෙකින් වසන්නා සේ, නිග්‍රෝධ ඵල සමාන වර්ණ වූ සුගත් මහ පවුල් සඟළ පෙරව, පාත්‍රා ධාතුව බලා වදාළ සේක.

එ කෙණෙහි පාත්‍රා ධාතුන් වහන්සේ පාත්‍රස්ථවිකාවෙන් ආකාශයට පැන නැඟී රත් පියුම් ගබෙකින් රත් පියුම් ගබකට වදනා ඉන්ද්‍රනීල මාණික්‍ය භ්‍රමරරාජයකු සේ සුරකත වූ ශ්‍රී හස්තයෙහි පෙණීගිය සේක. අනන්තාපරිමාණ වූ සසර ලක්ෂගණන් කොටි ගණන් පාත්‍රා පුරා බුදුන් රහතන්ට පිළිගන්වාපු මාගේ ස්වාමිදරු

වාතත් අතට එන පාත්‍රයක් ආකාශයෙන් අවුත් පෙණී යාම තම කවර ආශ්චර්ය්‍යයෙකැයි කියම් ද. මෙසේ පාත්‍රය දරා වැඩ සිට ගන්ධකුටි වාරය බලා වදාළසේක.

එ කෙණෙහි බොහෝ සත්ත්වයන්ම නිවන්පුර දොර හැරපු කුශලයෙන් ඒ ගඳකිළියෙහි දොර තෙමේ ම 'හැරී වැඩිය මැනව ස්වාමීනි'යි කියන්නකු සේ එකාබගන වි ය. එ කෙණෙහි ස්වාමි දරුවෝ ස්වර්ණ සුරභි පුෂ්පොපහාර සමලඞ්කෘත භූමිභාග ඇති සුගන්ධ ගන්ධයෙන් පිරුණාවූ ගන්ධකුටි මුඛයෙන් මේඝ මුඛයෙකින් නික්මුනු පූර්ණ චන්ද්‍රයා සේ, රන්ගල් ගුහාවෙකින් නික්මුනු කෙශර සිංහරාජයක්හු සේ, පිටත් ම ගන්ධකුටි වාරයෙහි වැඩසිටි සේක. එ කෙණෙහි සුවිනීත වූ සුප්‍රාමාණ වූ ශාන්ත වූ ඉඳුරන් ඇති ශාන්ත වූ සිත් ඇති අල්පේච්ඡ වූ සන්තුෂ්ට වූ ප්‍රවිවික්ත වූ අසංසෘෂ්ට වූ චොදක වූ පාපගර්හි වූ ආරබ්ධවීර්ය්‍ය වූ වචනක්ෂම වූ ශීල සම්පන්න වූ සමාධි සම්පන්න වූ ප්‍රඥා සම්පන්න වූ වීර්ය්‍ය සම්පන්න වූ විසිදහසක් රහතන් වහන්සේ මැණික් සන්නාහ බහාලූ අලඞ්කෘත වූ ගන්ධහස්ති රාජයන් සේ බුදුන් පිරිවරා සිටගත් සේක.

එ කෙණෙහි මාගේ ස්වාමිදරුවෝ පූර්ව බුද්ධවරයෝ කුලගමට වැඩි දු කෙසේ පිඩු සිඟු දෝ හෝ යි පූර්ව බුද්ධචරිතයන් බලා ප්‍රාතිහාර්ය්‍ය දක්ව දක්වා ගෙ පිළිවෙළින් සිඟන යි දැන අද මම ද එසේ ම ප්‍රාතිහාර්ය්‍යයෙන් සිඟම් යි සිතාලා දකුණු ශ්‍රී පාදය ඔසවා වදාළ සේක. එ කෙණෙහි මහ ගැල් සකය් සා පියුමෙක් පැන නැගී ඒ ශ්‍රී පාදය පිළිගත; නැවත වාම ශ්‍රී පාදය ද ඔසවා වදාළ සේක. එසේ ම අනෙක් මහ පියුමක් පැනනැගී ඒ ශ්‍රීපාදය ද පිළිගත. එ කෙණෙහි ස්වාමිදරුවෝ පියුමක් පිට පියුමක් තබත්නා සේ ඒ පැන නැගි පියුම් පිට සිරිපා පියුම තබ තබා නික්මුණු සේක. නැගු නැගු පත්ලෙහි පියුම් පෙණේ ම ය. එසවූ එසවූ පත්ලෙහි පියුම් අන්තර්ධාන වේ ම ය.

එ තැන් පටන් නුවර දක්වා මහ උස් තැන් හෙපිතලයක් සේ තැනී ගිය. මිටි තැන් සුළං පිරූ කඹුරු සමක් සේ පිරී ගිය. තව ද එ කෙණෙහි එක් සුළඟෙක් බුදුන් පෙරට ම දිවගෙණ ගොස් මාර්ගයෙහි කැටදඹු පරඩලා ඇම නො තබා පිසහැර තලිපිටක් සේ තනා ලී ය. එක් වැස්සෙක් දිවගෙණ ගොස් මහ රජස් සන්හිඳුවා පොද සිඳුවෙන් තෙමා ගිය. එක් සමනෙක් වනකුසුමයන් ගෙණ

හැර පුරා මග මලස්තකස් සේ තබා ලිය. වලාකඩෙක් දිව අවුදින් බුදුන් සිරසට පස් පෑ දිස්නා අහස් වියනක් සේ මැවී ආතප නිවා රක්ෂය කෙරෙමින් යෙයි. මෙසේ නැගු නැගු පත්ලෙහි පියුම් දක්ව දක්වා වඩිනා කල පියුම් ගබෙහි පුරක්ත වූ සුගන්ධ මකරන්දයෝ අත වලෝ මුදුන් දක්වා අහසට පැන නැගී රන් පබ්බතයෙක රුවන් සුණු ඉස්නා සේ, ලාක්ෂාරස ඉස්නා සේ, බුදුන්ගේ රන්වන්වූ ශ්‍රී ශරීරය හොබවමින් යෙති.

ඉක්බිත්තෙකෙනෙ: බාහිර වූ පද්මයෙහි උපන් මකරන්දයෙනි, අප සඳෙනා ඉක්ෂු දී අප බුදුන්ගේ ශ්‍රී ශරීරය තෙපි හොබවා සරහව් දැ යි ඒ මකරන්දයන්ට කියනු කරන්නාවුන් සේ, බුදුන්ගේ ශ්‍රී ශරීරයෙහි සමිඤ්ඤිත්ශක බුදුරැස් ශතනු ජලෙකින් වඩනා සවර්ණ රසධාරාවන් සේ, සිලසම්පන්න වූ පුරුෂයන් මග සම් වඩනා වේලෙහි ය මුදුනෙන් නැගෙන රශ්මිජාලාමන් සේ, සවර්ණ සාගරයෙන් නැගෙන මහ රළුපහර සේ, චිත්‍රකූට පබ්බතයෙන් නැගී දිවන සවර්ණ හංසරාජ සමූහයන් සේ, එම සවර්ණ සාගරයෙන් ඉස් නගා ඒ ඒ දිශ්හි දිවනා රශ්මිමත් වූ දිව්‍යරාජ නාගයන් සේ, සුපුෂ්පිත චම්පක වෘක්ෂරාජයෙක්හි සුලං පහරින් පැන නැගී ආකාශයෙහි බම බමා දිවන සපුමල්කඩු සේ ඒ ඒ දිශ්හි නික්මිත.

කෙසේ ද? යත්; දක්ෂිණ භාගයෙන් නාඹ තල්කඳක් සා බුදුරස් කඳෙක් දිව බුදුන් සිඟාරා තුන්යලක් පැදකුණු කොට දකුණුදිගින් අසුරියනක් පමණ තැන් දිව එ දිග හොබවා සිටගත. වාම භාගයෙන් ද නාඹතල්කඳක් සා බුදුරස් කඳෙක් දිව එ ද බුදුන් සිඟාරා තුන්යලක් පැදකුණු කොට අසුරියනක් පමණ තැන් දිව එ දිගද හොබවා සිට ගත. ශ්‍රී මුඛයෙන් ද නාඹතල්කඳක් සා බුදුරස් කඳෙක් දිව මුඛය තුන්යලක් පැදකුණුකොට සඳ මඬුල්ලක්හුගේ ආකාර දක්ව දක්වා අභිමුඛයෙන් අසූරියනක් පමණ තැන් දිව: කොල බුදුහු වඩනාසේක, මග නරුව සි කිය කියා දිවන පක්ෂපාත අභියුක්තයකු සේ පෙරමග හොබවා සිටගත. පශ්චිම භාගයෙන් ද නාඹ තල්කඳක් සා බුදුරස් කඳෙක් දිව තුන්යලක් පැදකුණුකොට අසුරියනක් පමණ තැන් දිව පශ්චිම භාගය ද හොබවා සිට ගත. ශිරොධාතුවෙන් නාඹතල්කඳක් සා බුදුරස් කඳෙක් දිව සිරස තුන්යලක් පැදකුණුකොට දෙව්බඹුන් කැඳවා දෙව්ලොව දිවන දූතයකු සේ අසූරියනක් තැන් ආකාශය හොබවා සිටගත.

එ කල මාගේ ස්වාමීදරුවෝ සක්රුවන් ගොණැස් උ
රුවන් කැණීමඩුල්ලෙන ශොභාවෙක් ඇසේ නම් තමන් වහ
කරාම හය ගසා; තව ද: සඳැස් පිල් විදහා ලීලොපෙත ව ර
තලා මුදුනෙකින් නික්මුනු රන්මින් මයුර රාජයන්හුගේ
පැහැරගෙණ දහසක් රැස් දහසක් දිග විහිදුම විහිදුවා උදයගිරි
මුදුනෙහි ගමින්ගත් ලඞිරු මඬලන්හුගේ රශ්මි ප්‍රභාව නි
කෙරෙමින්; තව ද: සක්රුවන් කුඹයෙන උරවා ලූ සත්
ගොනැස් පෙලක් සේ පෙළ පෙළ බුදුරැස්කඳු විහිදුව විහි
තව ද: ප්‍රවාලමය වූ සිරි පණින් සුසමව වූ රන්කොඳු අදන
සුරඹන වූ සිවුරෙහි අනු අස්ගොන් සුසම වූ බුදුරැස් කොඳු පි
සසම් නයමා මෙසේ වඩනා සේක. එ වේලෙහි උභය හාග
නිල් තණ රත්පට තැඹුමා සේ බුදුරැස් සැසි රන්මන්ව
නො එක් වෘක්ෂලතාවෝ ද බුදුරැස් මලගෙන් තුමූ තුමූ ද රන
ව නීලපත්‍ර පෙරලා බුඩපූජාමට රන්කැමපක් ගෙණ සිටින
රන්වන් පතින් සැදී සිට ගත්හ.

මෙසේ මාගේ ස්වාමිදරුවන් එදා විහිදුහගස් රශනත් පි
මේ හිඳු වූ බුද්ධශ්‍රීන් දිලිහි දිලිහි වඩනා සරිදී 'රත්පියුම් සාග
මැදින් ගමන් ගන්නාවූ ස්වර්ණ නෞකාවක් වැනි සේකැ'යි
නම්: ඒ රන් නම්, මිල් වඩා ඔබගේ ශ්‍රීපාදමූලයෙහි පිදූ කල
ණ වූ චක්‍රවර්ති සමපත් ශක්‍ර සමපත් ආදි වූ බොහෝ සමපත්
ම ය; එසේ හෙයින් ඔබගේ ශ්‍රීපාද පූජාමට ම සුදුසු වූ; ඔබගේ
ගෙණ වසන සච්චන් පමා කුණපයක් කොට සිතා තමන් පා පි
බිස්සට ත් නො ගන්නාවූ; ඒ රන් රසින් නිමියාවූ ඒ
නෞකාව ඔබ වැනි ය යි උපමා කොට කියම් නම් අනාදර වේ
හෝ යි යන සඞින් ඒ උපමාවත් හැර පියමි.

තව ද: මාගේ බුදුන් එදා වඩනා ශ්‍රීවිභූතිය "වෙළුල
පර්වතයෙන් පැනනැගී සතර ගව්වක් තැන් එනාලොක
සුවාසූ දහසක් මැණික් පිරිවරු චක්‍රවර්ති රජන්හුගේ දොරට ග
ගත් චින්තාමාණික්‍ය රත්නයෙහි ශ්‍රී වැනි සේකැ"යි කියම්
එසේ වූ චින්තාමාණික්‍යයෝ දෙදෙනෙක් ඔබගේ ශ්‍රීපාද යුග්ම
පිරිවර සම්ගින් සෙණෙන්නාහු ය; එසේ හෙයින් ඔබගේ ශ්‍රී
යෙහි සැගවී සිටබන 'චින්තාමාණික්‍ය රත්න ය වැනි සේක
උපමා කියා ඔබට නිසි නො කෙරෙමි.

තව ද: මාගේ බුදුන් වඩනා ශ්‍රී විභූතිය දෙ
පාදනෙන සිටිනා තුණ්ඩීසේනාවක් හා, පස්විසි යොදෙ

සිටිනා බ්‍රාහ්මණ මණ්ඩලයක් හා, අවසාළිස් යොදනෙක සිටිනා අමාත්‍ය මණ්ඩලයක් හා, අනූ යොදනෙක රන්කැටි ගෙණ හැරසී සිටිනා යොධ මණ්ඩලයක් හා පන්සියක් යොදනෙක හැරසී සිටිනා මනා පර්ෂද් මණ්ඩලයක් හා මේ සා මහත් පර්ෂදෙකින් දලිහි දිලිහී චක්‍රවාටය වට කෙරෙමින් අහසින් නික්මුනා වූ සප්ත රත්න චක්‍රවර්ති රජකු මැයි සේකැයි කියම් නම්; ඒ චක්‍රවර්ති රජ නම් බුදුන්ගේ සේවකය. බුදුන්ගේ උපාසකය. බුදුන්ගේ කුලගැතිය. එසේ හෙයින් ඒ මාගේ ස්වාමිදරුවානන්ට නින්ද වේ දෝ හෝ යි සිතා ඒ උපමාවත් හැරපියමි.

තව ද: අනූදහසක් සුවර්ණ හංසයන් පිරිවරා ගගන තලයෙහි ගමන් ගත් ධාතරාෂ්ට්‍ර නම් හංසරාජයා වැනි සේකැයි කියම් නම්; ඒ හංසරාජයා නම් බුදුන් ධර්මදෙශනා කරණ වේලෙහි මහ පියුමක් තුඩින් ගෙණ බුදුන්ට පුද පුදා ආකාශයෙහි රන් පැදුරක් අතුලාසේ පියාපත් විදහා තබා සිතියම් ඇඳපු රුවක් සේ, හෙවි බණ අසන්නාවූ හංසරාජයෙක; මෙසේ ඔබට පූජාවට අවුත් සිටිනාවූ ඒ හංසරාජයා ගෙණ ඔබට උපමා කීමෙන් මාගේ බුදුන්ට ම නින්ද වෙති යි ඒ උපමාවත් හළිමි.

තව ද: කොළලක්ෂයක් පමණ සිංහසේනාව පිරිවරා සැට යොදුන් රත්ගලා මුදුනෙහි ගමන් ගත් කෙශර සිංහරාජයකු වැනි සේකැ යි කියම් නම්: එසේ වූ සිංහරාජයෝ දෙදෙනෙක් බුදුන්ගේ ශ්‍රීපාද යුග්මයෙහි සපිරිමරින් පෙණෙති. ඔබගේ ශ්‍රීපාදයෙහි සැඟවී තිබෙන්නාවූ ඒ සිංහරාජයා ගෙණ ඔබට උපමා කීමෙන් ඔබට ම නින්ද වෙති යි ඒ උපමාවත් හරිමි.

තව ද: අගමින් විතරින් උනුපණස් යොදුන් පමණ ඇති, මටින් එක්සිය සත්සාළිස් යොදුන් ඇති, එකද ඇතුලත සවිසි ලක්ෂ දසදහසක් යොදුන් පලායන ගමන් ඇති, එකපැයක් ඇතුලත තෙසාළිස් දහස් පන්සියයක් යොදුන් පලායන ගමන් ඇති, එක විනාඩිකාවක් ඇතුලත සත්සිය පස්විසි යොදුන් පලායන ගමන් ඇති[1] එක සුස්මක් ඔසවා එලාලන ඇසිල්ලෙහි එක්සිය විසි යොදුන් සවිසි ඉසුබු තෙලෙස් යට එක් රියන් එක් වියත් අතරගලක් පලායන තරම් ශීඝ්‍ර වූ ගමන් හා ආනුභාව ඇති, රාශි ග්‍රහයන් දොළොස් දෙනා හා, නකත් ග්‍රහයන් සත්විසිදෙනා හා පාදයන් එක්සිය අටදෙනා හා, පිරිවරා විමාන ග්‍රහයන් දහස් ගණන් හා සමග දෙලක්ෂ පස්විසි දහසක් යොදුන් දිග ඇති, මේෂ ගම් මහා වීථියට බැස අනූන මසීකය ධූමය රජ්ජය රාහුන සත

පඤ්චොපක්ලෙශයෙන් විරහිත ව මේ නානාත් තාරූ පිරිවරා සොළොස් කලාවෙන් සම්පූර්ණ ව මැදි පොහෝද ගුවන් මුදුනෙහි ගමන් ගත් පූර්ණ චන්ද්‍රයා වැනි සේකැ යි කියම් නම්: ඒ චන්ද්‍රයා නම් රාහු අසුරෙන්ද්‍රයා දුටු බා බුදුන් කරා දිවගොස් වැද බුදුන්ගේ ශ්‍රීපාදමූලයට වැද ගැලවුනා වූ දෙවියෙක. සතුරන්ට බා ඔබ කරා වැද ගැලවෙන තැනැත්තවූ ඔබ හා සම්කොට උපමා කියා මාගේ ස්වාමිදරුවන්ට අනාදරයක් නො කෙරෙමි,

තව ද: මාගේ ස්වාමිදරුවන් බුදුරැස් කඳින් දිලිහි දිලිහී වඩනා පරිදි සමපණස් යොදුන් අයම් විතර ඇති, ගෙළ සියයක් යොදුන් වට ඇති, දවසකින් සත්විසි ලක්ෂයක් යොදුන් පලායන තරම් ගමන් ඇති, පැයෙකින් පන්සාළිස් දහසක් යොදුන් පලායන තරම් ගමන් ඇති, විනාඩිකාවෙකින් සත්සිය පණස් යොදුන් තැන් දිවනා, සුස්මක් තාලන ඇසිල්ලෙහි එක්සිය පස්විසි යොදුන් දිවන් නාවූ ගමන් හා ආනුභාව ඇති, තවලක්ෂයක් යොදුන් තැන් පැතිර සිටිනා ප්‍රභාමණ්ඩල ඇති, ප්‍රවාලසාගර මුදුනෙහි දසදිග අඳුරු විදහා ගමන්ගත් ලහිරුමඬල වැනි සේකැ යි කියම් නම් ඒ ලහිරු මඬල නම් රාහු අසුරිඳු දුටු ද ඔහුගේ මුඛයට පැමිණ නයකු මුඛයෙන් ගැලවුනාවූ මැඩියකු සේ මාගේ ස්වාමිදරුවන්ගේ කාරුණා මිත්‍ර බලයෙන් ගැලවී, එතැන් පටන් ඒ මාගේ ස්වාමිදරුවන්ට ශීත නිවාරණය කළමනා වේලෙහි සමපණස් යොදුන් මිණි පෝරුවක් සේ තමාම බුදුන් පිටා'වූවක් ව පූජාකොට ශීත නිවාරණය කෙරෙයි. එසේ වූ ඔබට අත් පා මෙහෙ කරණ ඒ ලහිරු මඬල ගෙණ ඔබට ම උපමා කියා ඔබට නින්දා නො කෙරෙමි.

තව ද: තුන් ගවු පමණ උස ඇති, ගවු පමණ මිණි මොටුනු ඇති, දසදහසක් රියන් පමණ දිග අත් ඇති, තුන් දහසක් රියන් දිග වියත් ඇති, දෙසිය පණස් රියන් දිග අතුල් ඇති, තුන්දහස් සත්සිය පණස් රියන් දිග පතුල් ඇති, යහලක් පමණ සුවඳ විලවුන් ගෙණ සැට ගැලක් පුරා ලන දිව්‍යාභරණ ගෙණ පැලඳ, දෙදෙව් ලොව දෙවියන් පිරිවරා; පුළුල් සැට යොදුන්, දිග දහසක් යොදුන්, සුදර්ශන නම් වීථියට බැස දිව්‍යශ්‍රීන් නික්මුනාවූ ශක්‍රදෙවෙන්ද්‍රයා වැනි සේකැයි ඉදින් කිහම් නම්: ඒ දිව්‍යරාජයා නම් මාගේ බුදුන්ට සක් පිඹිනා එක්තරා උදියෙක, එසේ හෙයින් ඒ උපමාව ත් හළිමි.

තව ද: සුයාම දිව්‍ය ලොකයෙහි දෙවියන් පිරිවරා නික්මූ නාවූ සුයාම නම් දිව්‍යරාජයා වැනි සේකැ යි කියම් නම්, ඒ දිව්‍ය

රාජයා නම් බුදුන් ඇඟට චාමර සලන්නාවූ බුදුන්ගේ ම අතැවැස්සෙක. එසේ හෙයින් ඒ උපමාව ත් හළිමි.

තව ද: සන්තුෂිතයන් පිරිවරා නික්මුනාවූ සන්තුෂිත නම් දිව්‍ය රාජයා වැනි සේනැ යි කියම් නම් ඒ මාගේ බුදුන් ඇඟට මිණිතල් වැට සලන්නා වූ ඡත්‍රධරා අභියුක්තයෙක. එසේ හෙයින් ඒ උපමාව ත් හළිමි.

තව ද: සුනිර්මිත දිව්‍යරාජයා වැනි සේනැ යි කියම් නම් ඒ තමාගේ මිනුවි මාණික්‍ය රශ්මීන් මාගේ බුදුන්ගේ ශ්‍රීපාදයට පූජා කෙරෙයි. එසේ හෙයින් ඒ උපමාව ත් හළිමි.

තව ද: බබුළු හැමදෙනාට ම මඩයාවූ ආනුභාව හා තෙජස් ඇති පරනිර්මිත නම් දිව්‍යරාජයා වැනි සේනැ යි කියම් නම් ඒ මාගේ බුදුසුව කුලගැති වූ සේවකයෙක. එසේ හෙයින් ඒ උපමාව ත් බුදුන් කෙරේයි ගත් ආදරයෙන් ම හළිමි.

තව ද: මාගේ ස්වාමිදරුවානන් විසිදහසක් රහතන් පිරිවරා එදා වඩනා ශ්‍රී විභූතියට "අටසාළිස් ගව්වක් පමණ උස ඇති දෙළොස්ගවු පියන් ඇති, සගවු දිග විශත් ඇති, අඩ ගවු පමණ ඇඟිලි ඇති, සත්ගවු යමාරැඹ දිග පතුල් ඇති, දෙළොස් යොදුන් දිවසළු ඇඳ, සොළොස් ගවු මිණි මොටුනු පැලඳ, එක ඇඟිල්ලෙන් දිවු රසින් දහසක් සක්වළ අලුකෙරෙමින් දස ඇඟිල් ලෙන් දිවූ රසින් දස දහසක් සක්වළ ඒකාලොක කෙරෙමින්, ලක්ෂ ගණන් බ්‍රහ්මසෙනාම පිරිවරා මිනිස්ලොවට නික්මූන සහම්පතී මහාබ්‍රහ්මයා වැනි සේනැ"යි කියම් නම් ඒ බ්‍රහ්ම රජයා නම් මාගේ ස්වාමිදරුවන්ගේ හිරසට කුඩ අල්ලන්නාවූ සරසෙක. එසේ හෙයින් ඔබට මෙසෙනැන් ධුරයකොට සිටි ඒ බ්‍රහ්මරාජයා ඔබ හා සමකොට මාගේ මුඛයෙන් උපමා නො කෙරෙමි.

වැලි කා වැනි සේක් දැ? කෙසේ වූ උපමා ඇති සේක් දැ? යත්; තමන් වහන්සේ සේ ම ලොවුතුරා බුදුකෙණකුන් ශ්‍රාවකගණයා පිරිවරා කුලගම්ට වඩනා ශොභා වැන්නැ යි මේ උපමාව හය නැති ව ම සරිගස්වා කියමි.

මෙසේ මාගේ ස්වාමිදරුවෝ තිඹුල්වත් පුරයට මෙසේ මහත් වූ ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා දක්මා තුන් ලොවම ම කියා ගිවිස්වාලිය නො හැකි, අනුපමෙය වූ අසදෘශ වූ අචින්ත්‍ය වූ අද්භූත වූ අසාධාරණ

වූ බුද්ධශ්‍රීන් දිලිහී දිලිහී වැඩ දකුණු ශ්‍රීපාදය එ නුවර මහවාසල ඉන්ද්‍රඛීලය මුදුනෙහි පළමුකොට තබා වදාළසේක.

එකෙණෙහි ඒ ශ්‍රී පාදය ඇතුළට දිගු කිරීම හා සමග ම ඒ පය පඤ්චාංගුලියෙහි පඤ්චනඛ ග්‍රයෙන් බුදුරැස්කඳ පසෙක් පසුව මහා ගඞ්ග ව දිවුවාසේ ඇතුළු නුවරට දිව නුවර මට තුන්යලක් සිසාරු පවුරු අවලුවල ගැසී ගැසී රැළි දිදී දිව ඇම නුවරෙහි ව්‍යාප්ත ව, ප්‍රාසාද ය, කුළුගෙවල භිත්ති ය, පවුරු ය, පදනම ය, අවලු ය, තොරණ ය, වාසල ය, කවුළු ය, වළඳ යනාදී ය රන්පට පිදීපට පොරවන්නා සේ, රන්දිය වත්කරන්නා සේ, රන්රසයෙන් පුරන්නා සේ, ඒ ඒ දිග්හි දිව එ නුවර දිව්‍ය පුරයක්සේ සම්ණස් රසින් අලුකෙළේ ය.

ඒ ආශ්චර්‍ය්‍යයෙහි බන්ධනාගාරයෙහි වසන හසසැලි අගම මිහුරු සාරිකාදීහු එකතින් නාද කළහ බෙර සක් තිඹිලි කාහලි වීණා ආදි තූර්‍ය්‍ය භාණ්ඩයෝ තුමූ තුමූ ම පූජාවට පටන්ගත්හ. හෙළ! බුදුහු වැඩියහ. ආභරණ ගලවව. සපුන් වැද මහණ ඔම යි කියා පොබවන්නා සේ ඇම භිතිපුත් පලත් කනන කවකා දී ආභරණයෝ එ කෙණෙහි ඉපිල රැවු දීනාංගාහ. මේ මේ කාරණයෙන් මුළු නුවර සත්ත්වයෝ සමුද්‍රය සේ, ඇළල රළපහර දිවන්නා සේ, පෙර මගම දිවන්ට පටන් ගත්හ.

ඉක්බිත්තෙන් මාගේ ස්වාමිදරුවෝ මේ බඳු වූ ප්‍රාතිහාර්‍ය්‍යයෙන් වාසල් එළියේ වැඩසිට: පූර්ව බුදුවරයෝ කුලනුවරට වන් දා පුබිතයන් ගේම දොර සිඟු දෑ හෝ, නො වරදවා ගෙ පිළිවෙළින්ම සිඟු හ යි. දූන් මම ද මාගේ බුඩවංශ චාරිත්‍ර ය නො වරදවා පි සිඟම් යි සිතා චඳරා අපවිත්‍ර පවිත්‍ර ස්ථානයෙහි වෙනසක් නැති ව පවත්නාවූ චන්ද්‍රකාන්තිය සේ, හීන-මධ්‍යම-උත්කෘෂ්ට වූ සකල සත්ත්වයන් කෙරෙහි ම තමන් වහන්සේ සම ව පවත්නා මහා කරුණා ඇති බවට දෙස් කියවන්නා සේ, වාසල් දොර ගෙයි පටන් ගෙණ ගෙයක් පන්වා ගෙයකට නො ගොසින් සපදාන චාරිකාව නො වරදවා ඒ විසි දහසක් රහතන් පිරිවරා එදා ගෙපිළිවෙළින් ම සිඟත්ව පටන් ගත් සේක.

ආරාධනා කිරීම් පාත්‍රා ගැණීම යනාදි ව්‍යවහාර දන්නන් නම නැති හෙයින් කිරි ඉතිර මැගිරෙණ කල උපන් සත්සලයෙන් ගෙ බලා නෙබලැ යි කියන බසක් මූත් දර හයා පියන්නවුන්

නැත්තා සේ ඇම මනුෂ්‍යයෝ ම බුදුන් දක විස්මය පත් ව බල මිලා ම සිටිති. බත් සැන්දක් ගෙණෙන සේ ත් නො දනිත් ම ය. පාත්‍රා ගන්නා සේ ත් නො දනිත් ම ය.

එ වේලෙහි දෙමහල්-තුන්මහල් - පස්මහල්-සත්මහල්-පාවල උඩුමහලින් යටිමහල නො බැස වසන්නාවූ බිසෝවරුන් හා කුල ස්ත්‍රී සමූහයෝ සිවුමැදුරු කවුළුවල දොර හැර දිගු පුළුලැ'ස් නමැති කිලිපුලින් හා, දත් නමැති කොඳ කැකුළින් හා, මූබ නමැති පද්මයෙන් හා, බුදුන්ට පූජාකරන්නාහු සඳමඬුලු රන් කැටපත් බඳු වූ මුබ මණ්ඩලයන් පිටත් කොට බුඩශ්‍රී විඳ විඳ බලන්නට පටන්ගත්හ.

එ කෙණෙහි රාහුල කුමාරයන් වහන්සේට මවු වූ යශෝධරා දේවී බුදුහු දොර දොර පිඩු සිඟති යි අසා: ''සිඬාත්‍ථ කුමාරයෝ පෙර මෙම නුවර රන් රථයකට පැන නැගී සුසැටක් ආභරණ පැළඳ රුවන් රශ්මි දිලියෙන අගසි වූ ඔටුන්නක් පැළඳ ලක්‍ෂයක් අගනා වූ මුක්තාහාරයකින් උරමඬල පුරා ගෙණ, ලක්‍ෂ ගණන් ඇමැති යොධ කළු පිරිස් පිරිවරාගෙණ, ශක්‍රදෙවේන්ද්‍ර ලීලායෙන් රාජශ්‍රී විඳ ඇවිද්දාහු ය. ඒ මාගේ ස්වාමියානෝ දැන් කෙස් මැවි දැලි රවුලු කපාහැර ඒ ශරීරය වසා රත් පවුලක් පෙරව මැටි පාත්‍රයක් අතින් ගෙණ, මෙම නුවර පෙරළා මෙම ජාතියෙහි දොර දොර සිඟමින් සිටියෝල. උන් මහණවන්ට ගිය දා ම මා දිවි තුබූ ආදිතවයෙන් ලාමක වූ, කණට අමිහුර වූ, සිතට අමනොඥ වූ, හද වන හුණුකරන්නා වූ මෙයේ වූ ගතපලක් ඇසීමි. කිමෙක් දෝ හෝ, ඒ සිඬාත්‍ථ කුමාරයන් දුටු යම් කෙණෙක් උන්ගේ මහත් වූ ආනුභාව ම කියති. උන්ගේ සිඟමනු ත් ඉතා ම රිසි යෙහි යෙති. ඒ වෙස උන්ට හෙබිදෝ, නො සොබිදෝ, අද මා බැලුව මැන වැ''යි සිතාලා සත්බුමු මහපායෙහි සිංහපඤ්ජරයෙහි දොර අළහ.

එ කෙණෙහි ප්‍රිය වල්ලභයකු දුරට ගොස් අවුදින් තමාගේ ප්‍රිය කාන්තාව වසන ගෙව දොර හරවා වැද, ප්‍රේමයෙන් ඇය අතින් පැහැර, ගෙට වන් පුරුෂ තම්ගේදැ?යි කියා ගේ කුස බලා ඇවිදුනා සේ, ඇය හළ සිංහපඤ්ජරය හා සමඟ මාගේ ස්වාමිදරුවන්ගේ ශ්‍රීශරීරයෙන් රත්වන්වූ බුදුරස් කඳෙක් ගේ කුසට වැද දේවීන්ගේ රන්වන් ශරීරය පැහැර ගේ කුස සිසාරා තුන්යළක් දිව සියලු ගෘහාභ්‍යන්තරය ඒකාලෝක කොට යන්ත්‍ර නලින් දිවන ස්වර්ණරස ධාරා සේ, බබුළුවා වා කන්කුළු අසු අස්සෙන් පිටත දිවන්නට පටන් ගත.

එ කෙණෙහි ඒ යශෝධරා දෙවි සුවර්ණ සාගරයෙන් ඉස් දිගු කළ ශ්‍රී කාන්තාව සේ, සිංහපඤ්ජරයෙන් පිටතට සිරස දිගු කොට බලන්නී, බුදුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා, අසූ අනුව්‍යඤ්ජනයෙන් හා, සියලඟින් දිවන බුදුරැස් කදින් හා, ලහිරු මඩලක් සේ දිලිහි දිලිහී විසිදහසක් මහරහතුන් පිරිවරා සන් හුන් ලෙසින් වැඩ සිරිපතුල් ඉදිරියට වඩ වඩා සිඟන්නාවූ බුදුරජාණන් වහන්සේ දුටු, දෙනෙත් මුදුනෙහි තබාගෙණ තුන්ගලක් සාධුකාර දී අමාවලෙහි ගලා නගලු කතකරුපයක් සේ, සියලඟ ලොමු දහ ගන්වමින් පස්වණක් ප්‍රීතීන් පිණ පිණා [illegible] 'අහෝ සිද්ධාර්ථ කුමාරයෙනි! එ ද මැදියම් රැ මා වැනි [illegible] වූ සත්‍රියකට ත් නො කියා, රාහුලයන් වැනි එක්වැති පුතකු [illegible] දුක දුක උන් ඇග අතගා සිඹ සතා ත් නො පියා, [illegible] එකලාව පැලැයේ මෙසේ වූ ඇශ්වර්‍ය්‍යයක් ඇති ගමනකට ද, මෙසේ වූ ශරීර ප්‍රභාවක් සොයා ගියා දැ ද, මෙසේ වූ පතිදක් සොයා ගියා දැ ද, මෙ නුවර හැර නුඹ ගිය සේ යහපත් ම ය. නුඹ රජසිරි හැර මහණවූ සේ යහපත් ම ය. නුඹ ලද සැපත නුඹට ම හොබී ම ය. පෙර නුඹගේ ඓශ්වර්‍ය්‍ය රාජ්‍යයට වඩා දැන් නුඹගේ සියලු රාජ්‍යය ම මට ඉතා ම රිසි යෙයි කියා කියා:

"සිනිද්ධ නීල මුදු කුඤ්චිත කෙසො
සූරිය නිම්මල තලාභිලලාටො,
යුත්ත තුඞ්ග මුදුකායතනාසො
රංසි ජාල විතතො නරසීහො"යි.

යනාදීන් නරසීහ ගාථා අටක් කියා බුදුන්ගේ කෙශාග්‍රය පටන් නඛාග්‍රය දක්වා රූපවර්ණනාව කොට පියා එ විගස ම මහිලනුවන් ශුද්ධෝදන රජ්ජුරුවන්ගේ ගෙට දිව වැද "ස්වාමීනි, මහිලනුවන් වහන්ස! නුඹ පුතනුවන් සිද්ධාර්ථ කුමාරයන් දැන් සත් හවුරුද්දෙකින් තමන්ගේ ම නුවරට ආ නොහැක්කවුන්ට එක දවසකුත් නො සිඟවා බත් දී ලිය නො හෙන්නොහි ද? නුඹ සිහා තෑ කෙණෙක් ද? දැන් ඔහු දෙරින් දොර පිඬු සිඟමින් සිටියෝ ය. නුඹ සේ වූ දරුවන්ට දුඃඛ කෙණෙක් නැත. නුඹ ගෙයි හිඳ කුමක් කරන්නෙහි දැ යි යනාදීන් මිහිල් රජහට දෙඩූහ.

ඒ රජ්ජුරුවෝ බුදුන් හා විසිදහසක් මහරහතන්ට පැන් නො වකා චතුමධුරයෙන් කිරිපිඬු පිසමින් තැහු ගෙහලනියන් අතින් පුතනුවන් වහන්සේ සිඟති, යන බස් අසා කඳුළු පිරුණු ඇස් ඇති ව, ඉතා මහත් ලජ්ජා ඇති ව, එකතින් සළු පට රඳව

රඳවා දිව සුවර්ණ සාගරයෙහි දිය පිහිරා දිවන අනන්ත නම් දිව්‍ය නාගරාජයා සේ බුදුරස් පිහිර පිහිරා බුදුන් කරා දිව ක්ෂීර සාගරයෙහි ගැලෙන්නාකු සේ පුතනුවන් වහන්සේගේ චරණ නඛ මයුඛයෙහි ගැලී ගැලී මැද "ස්වාමීනි, මාගේ ප්‍රිය පුතනුවන්වහන්ස, මට මේ සා මහත් පරිභවයක් කුමක් නිසා කොට වදාළසේක් ද? අද මේ මුළු දඹදිව තෙහැට දහසක් රජබෑතියෙහි තෙහැට දහසක් රජුන් හා මහ සෙනග අවූ කමුත් පැන් නො වනා සුවඳ හැල් සාලේ කිරිබත් වදස් පොහොසත්හි. මෙතෙක් රජතන් හා තුඹ වහන්සේට මා බත් දී ලිය නො හෙති යි සිතූ සේක් ද? කුමක් නිසා ස්වාමීනි! මට මෙසා පරිභවයක් කොට දොරින් දොර සිගා වදුරණ සේක්දැ"යි කීහ.

එ වේලෙහි ස්වාමිදරුවෝ වදාරණ සේක් "මහරජ, මේ මාගේ වංශයෙහි සිරිතෙක් ම ය" යි වදාළසේක. රජ්ජුරුවෝ එ බස අසා "පුතනුවන් වහන්ස, කුමක් වදාරණ සේක් ද? තුඹවහන්සේගේ වංශය නම් මහාසම්මතාදී රාජවංශය ය. ඒ මාගේ වංශයෙහි සිගා කෑ එක රජෙකුත් නැත. තුඹවහන්සේගේ ඒ වංශයෙහි එක මුතුන් රජකු සෙසු සම්පත් තබා බෑණ කෑගී බස හා මහනෙල්මල් සුවඳ මුඛයෙන් සතරගව්වක් තැන් දිවෙයි. එක් මුතුන් රජකු අහස බලා අත් පොළාපී කල එ කෙණෙහි දෙව්ලොව වෙවුල්වා සතිස් යොදනක් මානයෙහි දණ පමණ කටි පමණ සත්රුවන් වැසි වැස පියයි. එක් මුතුන් රජකුගේ අමාත්‍යයන්ට ප්‍රසාද දෙමි යි කියා පතුල් දෙක ඉන් ඒ ගටාලූ වේලෙහි චින්තාමාණික්‍යය සේ නැමැති නැමැති සම්පත් වැගිරෙයි. මෙසේ මෙසේ වූ තුඹගේ වංශයෙහි තුන්ලක්ෂ සූතිස් දහස් පන්සිය එකානූවක් මා ඇතුළු වූ රජුන් අතුරෙන් තුඹ සේ සිඟා කෑ එක රජෙකුත් නැත. වංශ චාරිත්‍රයෙකැ යි මාගේ වංශයට හෙළා වදාළසේක් නැ"යි කීහ.

එ කෙණෙහි ස්වාමිදරුවෝ "මහරජ, තාගේ මේ මහාසම්මත වංශය ය, මාගේ දීපඞ්කරාදි බුද්ධවංශය ය. ඒ මාගේ වංශයෙහි එක බුදු කෙණකුන් මවුකුස වසන කල පවා අසූරියන් සෙයි ජනන් නැගුව මැනවැයි නැත. එක බුදුකෙණකුන්ගේ ඇඟින් නික්මුනු රසින් දසදහසක් සක්වළ බබලා හිරු සඳු කද්‍යෝතිඹියන් සේ නිෂ්ප්‍රභ කොට පී ය. එක බුදු කෙණකුන්ගේ ඇඟින් නික්මුනු රශ්මි මණ්ඩලයෙන් පස්විසි යොදුන් තැන් දිවාරාත්‍රියෙහි වෙනසෙක් නැත. මෙසේ මෙසේ ආනුභාව සම්පන්න වූ මාගේ වංශයෙහි

ගැම බුදුහු ම කුල ගම ගෙපිළිවෙළින් සිඟුවාහුමය. එසේ හෙයින් තොපගේ රාජ වංශය ය. මාගේ සිඟන වංශ ය'' යි බුද්ධවංශය සංක්ෂෙපයෙන් වදරා පියරජ්ජුරුවන් මුහුණ බලා අනඝි වූ නිධානයක් ලත් පුතනුවෙකණකුන් ඉන් අනඝි වූ රුවනක් තෝරාගෙණ පියා තන් දැක පළමුව දුටු සතුටු පඬුරට දෙන්නා සේ, තමන් වහන්සේගේ සද්ධර්ම නමැති නිධානයෙහි පිධානය හැර ගාථා නමැති රුවනක් දෙනු කැමැති ව;

උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය-ධම්මං සුචරිතං චරේ,
ධම්මචාරී සුඛං සෙති-අස්මිං ලොකෙ පරම්හි ච

යන මේ ගාථාවෙන් බණ වදාළ සේක. ඒ ගාථාව අසා රජ්ජුරුවෝ සෙල දහසක් කෙලෙසුන් ගෙවා දහසක් නයින් සම්පූර්ණ වූ සෝවාන් ඵලයට පැමිණියාහු ය. නැවත බුදුහු;

ධම්මං චරෙ සුචරිතං-න තං දුච්චරිතං චරේ,
ධම්මචාරී සුඛං සෙති-අස්මිං ලොකෙ පරම්හි ච-යි.

යන මේ ගාථාව වදාළ සේක. ඒ ගාථාවගේ කෙළවර අනාගාසහ රස හා සමඟ රජ්ජුරුවෝ සෙදගැමි මාර්ගයට පැමිණියාහුය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ රාජවීථි මධ්‍යයෙහි දී ම මෙසේ බුදුන් අතින් බණ අස අසා සෝවාන් සෙදගැමි ව බුදුන් අතින් පාත්‍රය ගෙණ විසි දහසක් රහතන් හා සමඟ බුදුන් රජගෙට වඩා ගෙණ ගොස් මධුර වූ ආහාරයෙන් දන් වැළඳ වූහ. වළඳා අනතුරෙහි සතළිස් දහසක් නාටක ස්ත්‍රීහු දිම අවුදින් බුදුන් මැද එකත් පස්ව සිටියාහ. එ වේලෙහි ශුද්ධෝදන රජ්ජුරුවෝ, යේලනියන්ට "පුතණ්ඩ, අවුදින් තෙපි ත් බුදුන් දැක මැද ශොක සන්හිඳුවා ගන්ව" යි කියා යවුවාහුය. එපවත් අසා යශෝධරා දෙවි "තමන් පුතනුවෝ සිඩාළු කුමාරයෝ ඉතා ම දැඩිසහ. තමසට යන්නාහු මට නො කියා පලා ගියහ. මම උන්ව පක්ෂපාත ව විසීම නම්, උන්කෙරේ සබා වූ ගුණ රසයක් ඇති සෙම නම්, ඔහු මාගේ ගෙට එති. ආක ල වඳිනෙමි වේ දැ" යි කියා නො ගියහ. ශුද්ධෝදන රජ්ජුරුවෝ මෙ පවත් බුදුන්ට සැල කළහ.

එ වේලෙහි බුදුහු "ඒ යශෝධරා දේවීන් පෙර සසර බොහෝ කලක් පක්ෂපාත ව ම ආ නියාව ත්, ඒ යශෝධරා දේවීන් මුල් කොට පාරමිතාවන් කුළුගත් නියාව ත්, උන්ගේ ම සහායයෙන් පුත්‍ර භාර්‍ය්‍යාදි පරිත්‍යාග කොට දූන් ලොවුතුරා බුදු ව මුළුලොවට මැඩ

කොරමින් සිටියෙමි' මා විසින් කෘතෝපකාරයෙහි මුදුන් පැමිණි ය මනාවේ දැ'' යි සිත් සිතාලා බුඩාසනයෙන් පැන නැඟී "මහරජ! එ බැවින් යශෝධරාවන්ගේ ගෙට යමහ. පාත්‍රය තෙපි ම ගණුව''යි පාත්‍රා ධාතුන් වහන්සේ දී ලා රජ්ජුරුවන් පල්ලවූකොට ලා තමන් වහන්සේ සස්නෙහි මඛතාසේක් සැරියුත් මුගලන් අගසව් දෙදෙනා වහන්සේ ලගව කැඳවා වදාරණසේක් "මහණෙනි, මම රාගාදි කෙලෙස් මුහුදු පීනා ගොඩ දැක සිටියෙමි. ඒ යශොධරා දේවි තව කෙලෙස් මුහුද ඇවිදිති. මා නැඟියාවූ නොවටව පැන නැංග නුහුනු මු ඕ මට සසර බොහෝ දුක් ගත. මා කෙරෙහි දීඝී කාලයක් නො කැසී පැමිණුනාවූ මහත් වූ ප්‍රේම සමූහයෙක් ඇත්තීය. ඇය සස රින් ගොඩ නොනාගන්නාතෙක් ඇගේ ම චරිතයෙන් ඇයම සනහා, ම සනහනු කැමැත්තෙමි. අද තමා සිත් සේ අඩා පියත ආස්වාදයෙක් කොලද්දී නම් මා කෙරෙහි ශොකයෙන් ලය පැලී මියෙයි. මින් ආස්වාදයක් ලත් නම් මාගේ සසුන් වැද මහණව දහසක් බිසෝවරුන් හා සමග අමා මහ නිවන් දක්නීය. එසේ හෙයින් ඇය තමා සිත්සේ අඩා වැලප ශොක නිවාගන්නා තෙක් කාවුරුත් නො වලකව''යි වදාරාලා දේවීන්ගේ ශ්‍රී යහන් ගබඩාවට මැව පණවන ලද බුඩාසනයෙහි වැඩහුන්සේක.

යසොධරා දෙවී එදා බුදුන් සමන්ගේ ගෙට වඩනා බැව් දැන පන්සියයක් පරිවාර ස්ත්‍රීන් හා සමග කෙස්වැටි කපා හැර කසා පිළී පෙරව බල බලා සිටියාහුය. බුදුහු අවුදින් වැඩහුන් වේලෙහි සාරාසඛ්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි ආවරණයක් නැති ව සම ගින් දිවූමා වූ පෙම් වතුරු රඳවාගත නොහී ප්‍රේමයෙන් ම උමතු ව "මම සත්‍රියකිම් වේ ද, මුන්වහන්සේ ලොවුතුරු බුදු වෙ ද් දැ'' යි සිහි එලවාගත නො හී බුදුන්ගේ ශ්‍රීපාදමූලයට ගොස් මුලින් සිඳ හෙළූ රත්ලියක් සේ ශ්‍රීපාදමූලයෙහි වැටී බුදුන්ගේ දෙපය ගොප්මස අල්වාගෙණ ශ්‍රීපාදය තමන් හිස්මුදුනෙහි තබාගෙණ හඩ හඩා වැද ශොක සන්හිඳුවා සිහි එලවාගෙණ නැවත බුදුන් කෙරෙහි හා ඔසීලනුවන් කෙරෙහි හා උපන් බිහා ලජ්ජාවෙන් විලි ඇති ව මා කෙලෙ කිම් දේ හෝ යි භය ඇති ව එකත් පස් ව හුන්නාය.

ඒ වේලෙහි ශුඩොදන රජ්ජුරුවෝ "මේ කිමෙක් දෙ හෝ යි මේ ලෝකයෙහි දෙවියෙක්, බඹෙක්, මරෙක්, රජෙක්, සිටෙක්, බමුණෙක් බුදුන් ඇඟ අතගාන්ට පොහොසත් වූ එක සතෙක් නැත මේ යෙලී සත්‍රි ව සිට බුදුන්ගේ පය අල්වාපුව, එසේ හෙයින්

බුදුන්ව අනාදර කළා ය, බුදුන් සිත කලකිරී ගියේ දෝ හෝ, ම යේළියව පව් පිරී ගියේ දෝ හෝ' යි සිතා "ඈ ක්‍ෂමා කරවමි" යි කියන්නාහු "ස්වාමීනි! මාගේ යේළතියෝ මේ යශෝධරාවෝ නුඹ වහන්සේ කෙරෙහි අධික වූ ප්‍රේම ඇතියාහුය. නුඹවහන්සේට ඉතා පක්‍ෂපාත යා හු ය. නුඹවහන්සේ මහබිනික්මන් කල ද නුඹ වහන්සේ ස්වහස්තයෙන් ඉසකේවැටිය කපාපීහ යි අසා තුමූ ද ලෙහි අත් ගසා හඬාගෙණ මේ ශ්‍රීයහන් ගබ්බාවට ම දිව අවුදින් උනාපි කල විළඹ පැහැර තුන්පටෙකින් රැලි දී දී ලඹ බලාසිට ගත්තාවූ අඳුන් රැසක්මත් හිසකේ වැටි ය කරණ්ඩ බලා තමා සිය අතින් ම කපා දමාපුව. තව ද නුඹවහන්සේ කාෂායාඹරන් පෙරව ගත්හ යි අසා තොමෝ ද කශීසළු නො හැඳ මේ සත්හවුරුද්ද මුළුල්ලෙහි අද දක්වා පොළොල කෂාපිළිම ඇන්දීය.

තව ද නුඹවහන්සේ එක් වේලේ වළඳනී අසා තොමෝ ද මේ සත් හවුරුද්දෙහි අද දක්වා රෑ බොජුන රස නො දුන්නී ය. තව ද නුඹවහන්සේ මැටිපාත්‍රයක් ගෙණ සිඟහී හී අසා තොමෝ ද මේ සත්හවුරුද්ද මුළුල්ලෙහි රන් වළඳින් නො කා මැටිපාත්‍රයෙකින් ම කෑව. තව ද: නුඹවහන්සේ උසසුන් මහසුන්වල නො සැතපෙති යී අසා තොමෝ ද මේ සත්හවුරුද්ද මුළුල්ලෙහි මහා යානාවෙක වැද නො හොත්තී ය. තව ද: නුඹවහන්සේ මල් සුවඳ නො පලඳිති යි අසා මේ සත් හවුරුද්ද මුළුල්ලෙහි තොමෝ ද මල් සුවඳ නො පැලන්දී ය. තව ද: තමාගේ බොහෝ වූ නෑ රජදරුවන් අපි දකුම්හ. අපි රකුම්හ යි කියා මෙසා වෙන ම බොහෝ පඬුරු එවූකල ගිවිස්නා තබා ඔවුන්ට කෙපුල් පමණකු ත් නො දී නුඹවහන්සේට ම පක්‍ෂපාත ව විසුව. මෙසේ මාගේ යේළ තියෝ නුඹවහන්සේට ම මහත් වූ ගුණ ඇතියහ. ඉතා ශික්‍ෂිත යහ ඇය නො දැන කළ වරද ක්‍ෂමා කොට වදාළ මැනවැ යි" කීහ.

ස්වාමිදරුවෝ වනාහි වෙස්සන්තර ජාතියෙහි බමුණාට බැඳ දෙන වේලෙහි ක්‍රිෂ්ණජිනා නම් ප්‍රිය දියනියන් තමන් වහන්සේ ගේ පය අල්වාගෙණ හඬන වේලෙහි උපන් මහා කරුණා සේ ම දේවින් කෙරෙහි ද පියකු පය අල්වාගෙණ අඬන දුවක කොට සිතා උපන් මහා කරුණාවෙන් වැඩහුන් සේක් ම ය කාරණ කිම ය යත්:-

පෙර සාරසාඛ්‍ය කප් ලක්‍ෂයකින් යම මාගේ බුදුන්ට පළමු වන විවරණ දුන්නාවූ දීපඞ්කර නම බුදුන් සමයෙහි එම රම්‍යව තී

නම් නුවර බහුධන කුලයෙක සුමිත්‍රා නම් කුල සත්‍රියක් ඒ බුදුන් ගිහිකල අගමෙහෙසුන් වූ පදුමා නම් බිසවුන්ගේ අසුරියන් ගෙහි පාන් තොමක ශරීර ප්‍රභා හා රූපශ්‍රී දැක "මම ද මෙසේ වූ රූසිරි ලදිම් නම් මැනවැ" යි සිතා රූ ලබන පින් දනුමැතියන් අතින් විචාරා සිල් රක්‍ෂා කල ස්ත්‍රී රූපයෙන් අග්‍ර වෙති යි අසා තොමෝ ද බොහෝ ධන හැර නවුස් වෙස් ගෙණ පරිබ්‍රාජිකා ව සිල් රක්‍ෂා කරන්නී "මම පිණින් මම මතු රූපයෙන් අග්‍ර ව එක්තරා එක් බුදු කෙණකුන් බුදුවන ජාතියෙහි මේ පදුමා නම් අගබිසවුන් සේ ම දහස් ගණන් ස්ත්‍රීන් පිරිවරා අගමෙහෙසින් වෙම්වා' යි පත පතා නොයෙක් කුසල් රැස් කරන්නාවූ ඒ පරිබ්‍රාජිකාවෝ එදවස් මාගේ බෝධිසත්වයන් විවරණ ලබන කාලයෙහි බුදුන් පෙර මහට මල් ඇගෑ, ඈන් ඇගෑ, බුලත් ඇගෑ, මිල් තොරන්, පාන් තොරණ, බුලත් තොරණ, මල්විට්, මල්කඳු, සුවඳකඳු, ගෙණ පින් ලෝහයෙන් මවු කොටවුන් පරයා දිමන මිනිසුන් දැක තුමූ ද මහ නෙල් මල් අඩි කලම්බක් මුදුනෙහි තබාගෙණ බුදුන් පෙරමගට දිව, ඒ බුදුන්ගේ අසුරියන් බුදුබඳින් දිවන සවණක් රසින් හා, බුදුන්ගේ රූපශ්‍රී හා දෙතිස් අසූ ලකුණු දැක පිණා "මේ ලෝකයෙහි පින්වත් වූ සත්‍රී නම් මේ බඳු වූ ස්වාමියක්හට පක්‍ෂපාත වූ ස්ත්‍රියක් ම ය"යි සිත සිතා බලන තෙනැත්තී පස්සෙහි වඩනා උසභක්ඛන්ධ නම් වූ පුත් මහතෙරුන් සඳුම් අනු වූ කතත් තරුවක් සේ දිලියෙන්නවුන් දැක බුදුන්ගේ ශ්‍රී මුඛය හා පුතනුවන් වහන්සේගේ ශ්‍රී මුඛය හා එක්වැනි සේ බලා බුදුකෙණකුන් හා එක්වැනි වූ මෙවැනි පුත්‍රරුවනක් වදාපි ම බුදු කෙණකුන් ම වැදුවා වැන්න. මෙ සිරි මට ත් මාසනා එව ව" යි සිතූය.

සෙසු සත්‍රීන්ගේ රූප ශ්‍රී බලා මේ රූපශ්‍රී මට ත් වේව යි සිතීම ද, පුරුෂයන්ගේ වික්‍රම බලා මේ පුරුෂයා මට වල්ලභ වේව යි සිතීම ද, අනුන් දරුවන්ගේ සුරතල් බලා මෙ බඳු දරුසිරි මට ත් වේව යි සිතීම ද, සියලු ස්ත්‍රීන්ගේ ස්වභාව ධර්මයක් ම ය.

ඒ කාරණයෙන් යම්කී සේ සිත සිතා බුදුන්ගේ ශ්‍රී බල බලා පුත් මහතෙරුන් එන ලීලා බල බලා පදුමා නම් බිසවුන් ලද දරු සිරි සිත සිතා අත් මුදුන් දී බුදුන් වැද වැද එන්නාවූ ඒ පරිබ්‍රාජිකාවෝ සුවන් මේ කඳුරෙහි දී දිව් දී වැදහොත් බෝධිසත්වයන් දැක "මේ සුමේධ තාපසයෝ මහණෙනි! මතු ගෞතම් නම් බුදුමෙති"යි කියා පෙර කී සේ බුදුන් වදාල විවරණ කථා අසා "මාගේ

ප්‍රාර්ථනාව අද මේ වීරපුරුෂයා නිසා එකාන්තයෙන් සිද්ධ වේ ම ය” යි එම විට ම බෝසතුන් කෙරෙහි ප්‍රේම බැඳ තමා ගෙණ යන මහනෙල්මල් අට කලඹින් පස් කලඹක් ගෙණ; මෙල පිණිසින් පන්මරුන් බින්ද මැණවැ යි කියන්නා සේ, බෝසතුන් තමට පුදා; සිතු තුන් පාගෙහි එක් ව පුම විඳිමට කාරණ පානා සේ තුන් කලඹක් තමන් තමව පුදා; “මේ ස්වාමිහු මතු බුදුවන කල් දක්වා මොහු සිත් සේ වාසය කොට මොහු බුදුවන ජාතියෙහි මේ බුදුන් දුන් විවරණ කථාවෙහි වදාළ යශෝධරා නම් අගබිසෝ ස්ථානතුරු මට ම ලැබෙව යි, තව ද මෙම බුදුන් වදාළ රාහුල නම් පුත්රැමන මාගේ කුසින් ම වදා දෙමිව” යි මෙසේ තුන්යැලුන් පැදකුණුකොට ප්‍රාර්ථනා කළාහුය. මූයෙන් නොබැණ ඉමිහුගෙන් මා කළා වූ ප්‍රාර්ථනාව එකාන්තයෙන් සිද්ධ වේ ම ය යි අධිෂ්ඨානයෙන් සතුටු වූ ඒ පරිබ්‍රාජිකාවෝ නම් දූන් මේ යශෝධරා දේවිම ය. සෙසු අසූමහ සවු-අගසවු ආදිවූ මහාශ්‍රාවකයෝ පමා කප් ලක්ෂයක් හෝ එකා සඞ්ඛ්‍ය කප් ලක්ෂයක් හෝ පැරුම් පුරා ආහුය.

මේ යශෝධරා දේවී දුරේ නිදානයෙහි දී ම ප්‍රාර්ථනා කොට මේ සාරාසඞ්ඛ්‍යෙය කප් ලක්ෂය මුළුල්ලෙහි බුදුන් හා සමග බුදුන් අත් නො හැර බුදුන්ට පක්ෂපාත ව ම ආවාහු ය. මේ බුද්ධශාසනයෙහි මේ යශෝධරා දේවින්ට වඩා හෙතුසම්පත් ඇති ම බුදුන් හා එක්ව පින්කළ කෙණෙක් අනෙක් කිසිකෙණෙකුත් නැත්ම ය. මේ මේ කාරණයෙන් මාගේ ස්වාමිදරුවෝ ඒ පන්සාලිස් හවුරුද්ද මුළුල්ලෙහි දෙවියකු-බඹකු අනගාපිය ක්‍ෂුද්‍රකුමාවූ ශ්‍රීපාද නමැති පියුම් දෙක ස්ත්‍රීව සිට ඒ යශෝධරා දේවින් අල්වාගත් වේලෙහිත් මේ පූර්වචරිත පරීක්ෂා කොට උදාරවූ කාරුණාවෙන් ම වැඩහුන් සේක් මී ය.

තව ද: සතර ඇවිද අසඞ්ඛ්‍ය ගණින් කල් හැර මාගේ බුදුන් බුදුවන මෙම කප උදයභද්ද ජාතකයෙහි ලොකාලොකා දිවාකර වූ මාගේ බෝසතාණන් වහන්සේ උදය නම් රජ ව දශ රාජ ධර්මයන් පූරණය කළ සමයෙහි කනක රූපයක් මැනි වූ ස්ත්‍රී රූපයෙන් සත්සියයක් හවුරුදු එක යානේ සැතපී එක දම්සෙක ත් බ්‍රහ්මචර්යාවව අනතරායක් නො කොට අප දෙදෙනා අතුරෙන් පළමු ව මිය පරලොව ගිය කෙණෙක් අවුදින් උපන් තැන් කියමිහ යි ප්‍රතිඥා කොට පළමු ව බෝසතාණන් වහන්සේ මිය ශක්‍රදෙවේන්ද්‍ර ව ඉපද පෙරකල ප්‍රතිඥාවෙන් මිදෙම් යී තමන් වහන්සේගේ සීල්වත් නම ත් පරීක්ෂා කෙරෙම් යි ලක්ෂයක් අගනා රන් තලියක් අතසී වූ සතරතින් පුරා අත්ලෙහි තබාගෙණ මධ්‍යම රාත්‍රියෙහි සඳල්ලව්වුබැස:

"එතා නිසිත්තා සුචි සඤ්ඤතූරූ
පාසාදමාරුය්හ අනින්දිතඞ්ගි
යාචාමි තං කින්නරනෙත්තචක්ඛු
ඉමෙ'කරත්තිං උභයො වසෙම" යි.

යනාදීන් කියා ඔවුන්ගේ සිවුසැටක් පමණ ස්ත්‍රී ලක්‍ෂණයන් වර්ණනා කොට සියත්සාහු, තොපගේ දිගු පුළුලැ'ස් නමැති නිලි පුලින් හා, දත් නමැති කොඳ කැකුළින් හා මුව නමැති පද්මයෙන් මාගේ කාම නමැති කෞමුදයන් ප්‍රබෝධ කරව, සොඳුර, දෙදෙව්ලොව් දෙවියන්ට අධිපති වූ සක්දෙව් රජ නම් මම ය. මාගේ අඩු තුන් කෙළක් පුරගනන් හැර තොප ම කෙරේ ලොභ යෙන් අයිමි. තොප සමාන් මලෙකෙහින් තොපට පරදාරය ද නැත. මෙ ලක්‍ෂයක් අගනා සතරක් හා ලක්‍ෂයක් අගනා සතරක් තලි ය තොපට පණ්ඩුම කියා දෙමි. අද මේ එක රැයට මට අවසර යක් දෙවනී කි වේලෙහි "දිව්‍යරාජයකු වේව යි මනුෂ්‍ය රාජයකු වේව යි මාගේ ස්වාමින් උදය නම් රජ්ජුරුවන් හැර අන්‍ය සත්ත්ව යකු ප්‍රාර්ථනා නො කෙරෙමි. ශක්‍රය! තෝ අනෙක් දවසෙක මේ දිශාවෙහි නො අවුත් මා කෙරෙහි ආලය හර" යි සිංහ ගර්ජනා කොට ශක්‍රයා යවා, දසදහසක් හවුරුදු මුළුල්ලෙහි පතිව්‍රතා ධර්මය මිල සමාන්ත් වගත්සේ තමාට රක්‍ෂා කළා වූ ඒ උදයභද්ද දෙවි තමූ දූ දූත් මේ යශෝධරා දෙවි ම ය.

තව ද: දශරථ ජාතකයෙහි ත්‍රිභුවන චූඩාමාණික්‍යවූ අපගේ මහබෝසතාණන් රාම නම් රජ ව දිව්‍යලොකයට නැගි අසුරයන් පවා යුද්ධයෙන් ජයගෙණ මිහත්වූ වික්‍රම දක්වා මිනිස්ලෙවට බැස දඹදිව දශ රජධර්මයෙන් රාජ්‍ය ය කොට ශෝක කිරීමෙහි ආදීනව ලෝවැසියන්ට දක්වා ලෝවැඩ කළ සමයෙහි සොළොස් දහසක් හවුරුදු මුළුල්ලෙහි අඛණ්ඩ වූ පතිව්‍රතා ධර්මය රක්‍ෂා කළ ඒ සීතා නම් දෙවි තමූ දූ දූත් මේ යශෝධරා දෙවි ම ය.

තව ද: චම්පෙය්‍ය ජාතකයෙහි කරුණා නිධාන වූ අප මහ බෝසතාණන් චම්පෙය්‍ය නම් දිව්‍ය නාගරාජව නාග භවනයෙ හි දී සිල් රක්‍ෂා කළ නො හැකි හෙයින් මිනුෂ්‍ය ලොකයට එකලා ව අවුදින් පෙහෙවස් ඉටා නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව ය. අධිෂ්ඨාන පාරමිතාව ය, ක්‍ෂාන්ති පාරමිතාව ය, ශීලපාරමිතාව ය යන පාර මිතාවන් සතර දෙනාගේ මුදුන් දුටුවා වූ සමයෙහි අහිතුණ්ඩිකයා අතට සම්ප්‍රාප්ත ව තිස් දවසක් මුළුල්ලෙහි ගොදුරු නො ලදින්

නිරාහාරයෙන් මහ දුක්ගන්නා ද තුමූ සොළොස් දහසක් නාගාඞ්ගනාවන්ට නායක ව, නාගභවනයෙහි සමිණන් වහන්සේ නො දුන උපන් මහා ශෝකයෙන් එකලාව ම නික්ම ඉස අත තබාගෙණ හඩ හඩා නම් සලකුණු බල බලා සමිණන් වහන්සේ ගෙණගිය මහ නො වරදවා ගොස් රජ පිරිස් මැද කෙළමන්නා දුක, රජහු බල බලා සිටියදී මහ හඬින් හඩ හඩා වැලප ඒ රජපිරිස විස්මය පත් කරවා සමිණන් වහන්සේ වූ පරිදි ත්, තමන් වූ පරිදි ත්, රජහට කියා රජු පහදවා ගෙණ බෝසතුන් ගලුවා නාග භවන යට ම ගෙණ ගොස් මෙසේ බොහෝ කලක් ඔවුනොවුන් නොහරහි කරුණා ඇති ව එක්ව ම දිව්‍යශ්‍රීන් හුන්නාවූ එ සමයෙහි ඒ සුමනා නම් අගදේවී තමූ දු දූන් මේ යශෝධරා දේවී ම ය.

තව ද: ජයද්දිස ජාතකයෙහි කරුණා ප්‍රවාහ වූ අප මහ බෝසතානන් අලීනසත්තු නම් රාජකුමාර ව පියාමහ රජ්ජුරුවන් මාරුවෙහි ජීවිතය පූජා කොට, පිතෘපට්ඨාන ධර්මයෙහි කෙළ පැමිණියාවූ සමයෙහි, පෝරිසාද නම් මිනීස් යකුට බිලියමට ගිය දා මම මාගේ ස්වාමීන්ට ඒකාන්තයෙන් පක්ෂපාත විම් නම් පතිව්‍රතා ධර්මය රක්ෂා කෙළෙම් නම් ඒ සබවස හෙතුකොට ගෙණ සමිණන් වහන්සේට ඒ යක්ෂයාගෙන් අද කිසි උපද්‍රවයෙක් නො වේවා යි සත්‍යක්‍රියා කොට තමන් කළ සත්‍යක්‍රියා බලයෙන් ම එදා බෝසතුන් යක්ෂයා කෙරෙන් ගලවාගෙණ බොහෝ දමසක් එක්ව රාජ්‍යය කළා වූ ඒ අගමෙහෙසුන් දෙවී තමූදු දූන් මෙ යශෝධරා දේවී ම ය.

තව ද: චුල්ලසුතසෝම ජාතකයෙහි කරුණා නිධාන වූ අපමහ බෝසතානන් සුතසෝම නම් රජව සුවාසූ දහසක් හවුරුදු රාජ ධර්මයන් පුරා පලමුවන නරය දුක මරණය දිව අවුදීත් පෙරට ව සිටියා සේ භය ඇති ව, අනිත් ලකුණු උපදවා සියලු සතුන් අනිත්‍යයෙහි පිහිටුවා රාජ්‍යය හැර ගොස් මහණ ව නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව හා ශීලපාරමිතාව හා දෙක අල්ලාපු සමයෙහි සමිණන් වහන්සේ නැති රාජ්‍යය මට ඇයි දූ සි දූරි ඇති බඩින් අමාත්‍යයන් රඳව රඳවා සොළොස් දහස් සත් සියයක් බිසෝවරුන් හා සමග වල් ගොස් මහණ ව මහණ වූ පසු දරුවන් වදා, එ දරුවන් දෙව නු ව රාජ්‍යයට එවා, බොහෝ කලක් බෝසතානන් වහන්සේ සේ ම සිල් රක්ෂාකළ ඒ චන්ද්‍රා දේවී තමූ දු දූන් මේ යශෝධරා දේවී ම ය.

තවද මහාජන ජාතකයෙහි කරුණා ආකර වූ අප මහ බෝසතාණන් මහජනක නම් රජ ව මුළු දඹදිව රාජ්‍යය හැර තපසට නික්මුණු සමයෙහි සිවුරග, සෙන් සමග පසුපස්සෙහි ගොසින් නොයෙක් ලෙස යාච්ඤා කොට රඳවා ගත නොහී මග අවුරා වැදගෙණ හඬා, ශ්‍රාන්ත ව මූසපත් ව, වැදහොත් අවසථාවෙහි බෝසතුන් සොරා පලාගිය කල ආ ගිය අතක් නො දැන බෝසතුන් හා සමග නමක් කථා කළ තෙන, නැවතුනු නැවතුනු තෙන, බෝසතුන් සිටි සිටි තෙන, දගබ් බඳවා, නැවත නුවරට අවුදින් පුතනුවන්ට රාජ්‍යය පාවා දී තුමූ ඉසක් තපා මහණ ව සමණන් දකිම්ම සි පතම් සි කිය කියා බොහෝ දවසක් සිල් රක්ෂාකළා වූ ඒ සීවලී නම් දේවී තමුදු දූන් මේ යශොධරා දේවී ම ය.

තව ද: ඛණ්ඩහාල ජාතකයෙහි ලොකාධිපති වූ අප මහ බෝසතාණන් චන්ද්‍ර නම් රාජකුමාර ව ඛණ්ඩහාල නම් දෙවදත්තයාගේ ප්‍රයෝගයෙන් යාගාවාටයෙහි බැඳගෙණ මරා යාග කරම්හයි අල්වාගත් ද, තමන් කළ සත්‍යක්‍රියා බලයෙන් ශක්‍රභවනය කම්පා කොට ශක්‍රදෙවෙන්ද්‍රයා ගෙන්වා, ඔහුගේ අනුබලයෙන් සමණන් වහන්සේ ගලවා ගත්තා වූ ඒ චන්ද්‍රා නම් දෙවී තමුදු දූන් මේ යශොධරා දෙවී ම ය.

තව ද: මණිචොර ජාතකයෙහි ලෝකාලෝක දිවාකර වූ අප මහ බෝසතාණන් සිටුකුලයෙහි ඉපද දුහැමෙන් වැස දවසෙක රථාලඞකාරයකට පැන නැගී දෙමහල්ලන් රාජවිජි මධ්‍යයෙන් යන වේලෙහි ස්ත්‍රී ලොභයෙන් චූඩාමාණික්‍යය රථයෙහි සඟවා බෝසතුන් සොරා මරවා මොහු මැය අගමෙහෙසින් කෙරෙම් සි සිතා බරණැස් රජහු බෝසතුන්ට වධ යොදපු වේලෙහි තමන් කළ සත්‍යක්‍රියා බලයෙන් දෙව්ලොව ඉවුල්වා දෙවියන් එතෙනට ගෙන්වා, දෙවියන් ලවා බෝසතුන්ට පැමිණි වධ රජහට පමුණුවා රජහට පැමිණි රාජ්‍යය බෝසතුන්ට පමුණුවා, තුමූද අගමෙහෙසුන් ව බොහෝ කලක් ප්‍රිය වාසයෙන් විසූ ඒ පතිව්‍රතා දෙවී තමුදු දූන් මේ යශොධරා දෙවී ම ය.

තව ද: අනනුසොචිය ජාතකයෙහි ශෛත්‍රලොක්‍ය චින්තාමාණික්‍ය වූ අප මහ බෝසතාණන් බමුණු මහසල් කුලෙහි ඉපිදැම්, නිධාන කොට තුබූ අසූකෙළක් ධනය හැර තපසට ගිය සමයෙහි පරිතුමූ ද අසා මහත් සැපත් හැර බෝසතුන් හා එක්ව ම ගොස් න්

එක්ව ම මහණ ව ඔවුනොවුන් සංතුරාගයෙන් ඇස දල්වාත් බලා නො පියා එක පන්සලෙහි වැස බොහෝ කලක් පරිශුද්ධ ශීලය රක්‍ෂා කළා වූ ඒ පරිබ්‍රාජිකාවෝ තමු දු දූන් මේ යශෝධරා දෙවී ම ය.

තව ද: විසය්හ ජාතකයෙහි ලෝකාලෝක හිතාකර වූ අප මහ බෝසතාණන් විසය්හ නම් ධන සිටු ව දඹදිව සියලු යාචකයන් රැස්කොට මහදන් වතුරු දී නැතැයි යන බසක් දිවනො වනා දන පාරමිතාවෙහි කුළුගත්තා වූ සමයෙහි, සියලු සැපත් දන් දී ක්‍ෂය ව ගිය කල තදක් හා දෑයක් ගෙණ තණ ද ගෙණවුත් තණ වෙළඳුම් කොට ලද දෙයෙකින් තුමූ ද රැකි යාචකයන්ට ද නැතැයි නො කියා දන් දී, පස් ද සඳ දන් කිසා ම සයින් හිඳ දනෙහි ම නො පසු බැස දුක් ගන්නා කල පවා එක දවසෙකු ත් කුසීතමක් නැති ව බෝසතුන් හා එක් සිත් ව බොහෝ කලක් පින් රැස් කළා වූ ඒ සිටුදේවී තමූ දූ දූන් මේ යශෝධරා දෙවීම ය.

තව ද: සුචි ජාතකයෙහි ප්‍රඥාසාගර වූ අප මහ බෝසතාණන් සවර්ණකාර ව ඉපද සූක්‍ෂ්ම වූ කර්මාන්තයෙන් ලෝකය විස්මය පත්කොට "කඹුරු බොරුවෙහි ඉදිකටු විකිණා යේ" ය යි යන මේ ව්‍යවහාරය ද ලොව උපදවා ප්‍රඥාපාරමිතාව කුළුගෙණ පූ සමයෙහි සවර්ණකාර ජ්‍යෙෂ්ඨයක්හට දූ ව දවසෙක බෝසතුන් දක ප්‍රිය කළා කොට පියාණන් හා ද කරවා බෝසතුන්ගේ වික්‍රම දක්වා ඒ වික්‍රමයෙහි ප්‍රසන්න වූ පියාණන් තමන් සරණ පාවාදුන් කල බොහෝ කලක් ප්‍රියවාසය කොට එ කල ඒ සා සැපතක් ගෙණ දී ලූවාවූ ඒ සවර්ණකාර දෙවී තමූ දූ දූන් මේ යශෝධරා දෙවී ම ය.

තව ද: මනොජ ජාතකයෙහි ශාක්‍යසිංහ වූ අප මහ බෝසතානන් සිංහරාජ ව ඉපද සවර්ණ ගුහාවෙහි වාසයකරණ කල පවා බෝසතුන්ට දරු දෙදෙනෙකු ලදින් ප්‍රෙම සහිත ව විසූ ඒ සිංහදෙන තමූ දූ දූන් මේ යශෝධරා දෙවී ම ය.

තව ද: මහාසුසිම ජාතකයෙහි සංසාර සේතු වූ අප මහ බෝසතාණන් සුසීම නම් පුරොහිත බ්‍රාහ්මණ ව පුරොහිත ධර්මයන් පූරණය කොට රජහට අනුශාසනා කරණ සමයෙහි දමසක මහ පෙරහරින් වීථි මධ්‍යයෙහි යන බොධිසත්ත්වයන් ඒ රජ්ජුරුවන් පැතිනියෝ සිංහපඤ්ජරයෙන් දැක බෝසතුන් කෙරෙහි ප්‍රෙම බැඳ ඇතුන්ට කියන්ට ලජ්ජා ව මේ වැනි පුරුෂයක්හු නො ලදිම් නම් මට ජීවිතයෙන් කම් නැතැ යි යහන් මතුයෙහි නො කා නො බී

හොත්හ; පුතනුවෝ මෑනියන් ලෙබග යි අසා ඇතුළට වැද මෑනියන් දුක විචාරා තමන්ට නො කියන හෙයින් නැමත අවුදින් පරිවාර ස්ත්‍රීන් ලවා මාසමින් විචාරවා තත්ත්වය දැන පුරොහිතයන් ගෙන්වා "ආචාරියනි! මා කෙරෙහි ප්‍රේම ඇතියා නම් අනෙක් බසක් නො කියව" යි බෝසතුන් නො කැමැති කරවා ම වොටුනු පලඳවා රාජ්‍යය පාවාදී මෑනියන් ද අගමෙහෙසින් කොට තුමූ යුවරජ වූහ.

එකල බොධිසත්ත්වයෝ රාජ්‍යය කෙරෙති. රජ්ජුරුවන් මෑනියෝ සොළොස් දහසක් ස්ත්‍රීන්ට නායක ව බෝසතුන් කෙරෙහි බහුමානයෙන් මෙහෙකී, බෝසතුන්ට නර නැත, බාලයහ. බිසවු මැහැල්ලහ. නර ඇත. එක් දවසෙක බිසවු බෝසතුන් ඉස බලන පසාරයෙන් ඉස බල බලා හුන්නාහු මෙ රජ තමා බාල හෙයින් මා මැහැලි හෙයින් ගාරුණා මිද වීතම් තපුර, මොහු ගේ කාරුණා වඩමා ගනිමි'යි සිතා තමන් ඉසින් නරකෙසක් කඩාගෙණ බෝසතුන් අල්ලෙහි ලා 'ස්වාමිනි, තොප ඉස නර බලව, තොප ඉස ත් නර ය. මා ඉස ත් නර ය. හෙයි ත් මහල්ලව, මම ත් මැහැල්ලෙමි. මේ තැන් පටන් මා මැහැල්ලෙහි යි නො සිතව, හිමි මට ම ප්‍රේම කරව'යි කීහ. එ වේලෙහි බොධිසත්ත්වයෝ නරකෙස දැක අතින් ලකුණු උපදවා "මරණය මා කරා දූතයකු එවී ය. මා උපෙක්ෂා වකු නො යෙදෙති, තපසට වලට දැන් ම යෙමි"යි නික්මුනු දෑ ය.

එ වේලෙහි බිසවු මා කළ යොරකම් මට ම සතය ගසාපිය යි විගෝදුකින් වෙව්ලා හිමි තොප ඉස නරයෙක් නො වෙති. මා ඉසින් කඩායත් නරය ය. තොප කෙරෙහි ප්‍රෙමයෙන් බොරු කීමි තෙපි තව බාලයව. ඉතා ලදරුවා තපසට නො යව'යි බෝසතුන් වැඳ දෙපය ගත්හ. එ වේලෙහි බෝසතානෝ 'තොප කියන්නේ බොරු ය. මා ඉස නරම ය යි කියා නො ගිවිස රාජ්‍යය හැර එ ම දා ම වලට ගොස් මහණ ව බොහෝ කලක් ශීලපාරමිතාව පිරූ දෑ ය. දෙවී ද මහත් වූ ශොක කොට බෝසතුන් ගියතැන් පටන් බෝසතුන් නමට ම පතිව්‍රතා ධර්මය රක්‍ෂා කළාහු ම ය. එ කල ඒ රජමාතාවූ අගමෙහෙසින් දේවී මෙකල මේ යශොධරා දෙවීම ය.

තව ද: කුම්මාසපිණ්ඩ ජාතකයෙහි අනන්ත ගුණ සාගර වූ අප මහ බෝසතානන් කොම්පිඩක් දන් දුන් කුශලයෙන් කුම්මාසපිණ්ඩ නම් රජ ව ජානි දන්නා නුවණ ලදින් මහත් වූ දානපති ත්‍යාගයෙකොට ලෝවැඩ කරණ සම්යෙහි තුමූ ද එම පින් බලයෙන්

ජාතිස්මරණ ඥානලදින් කිරිමත්කල සක ඔවුනොවුන්ගේ ප්‍රභාව යෙන් ජ්‍යොතිෂ්මත් වූවා සේ බෝසතුන් හා සම වූ සැදෑ සිත් ඇති ව, 'ස්වාමිනි, එක බත් පිඩකු ත් යාචකයන්ට නො දී නො කම්හ' යි ඔවුනොවුන්ට ප්‍රතිඥා කොට පින් රැස්කළා වූ ඒ අග මෙහෙසින් දේවි නමුදු දූන් මේ යශෝධරා දේවි ම ය.

තව ද: ගන්ධමාල ජාතියෙහි අභී භෝග පමණකු ත් සිල් රක්‍ෂා කිරීමෙහි ආනිසංස දුක් වූ සකලලෝක හිරිඹ වූ අප මහ බෝසතාණන් බරණැස් රජ ව කොට මහත් පින් රැස්කල සමයෙහි සොළොස් දහසක් ස්ත්‍රීන්ට නායක වූ අගමෙහෙසුන් කිසෝ ව ක්‍ෂීර සාගරය හා චන්ද්‍රකාන්තිය එක් ව ප්‍රභා සමපන්න වූවා සේ බෝසතුන් හා එක් සිත් ව පින් රැස් කළා වූ ඒ දේවි නමුදු දූන් මේ යශෝධරා දේවී ම ය.

තව ද: ආදිත්‍ය ජාතකයෙහි සමන්ත භද්‍ර වූ අප මහා බෝසතාණන් භරත නම් නරේන්ද්‍ර ව සමන් මල් දුන්නයන් උතුරු හිමාලයට යවා පසේබුදුන් වඩා ගෙන්වා මහත් වූ දාන පරිත්‍යාග කොට කුශල නිධානයන් රැස්කල සමයෙහි සොළොස් දහසක් ස්ත්‍රීන්ට නායක වූ අගමෙහෙසින් කිසෝ ව කිරිමුහුද පෙණ්ගිය පිදි පව්වක් එක වණියෙන් දිලියෙන්නා සේ, බෝසතුන් හා එක්මැති සැදෑ සිත් ඇති ව පින් රැස්කළා වූ ඒ සමුද්‍ර විජයා නම් දේවි නමුදු දූන් මේ යශෝධරා දේවී ම ය.

තව ද: චුල්ලබොධි ජාතකයෙහි ලෝකාචාර්‍ය වූ අප මහ බෝසතාණන් බ්‍රාහ්මණ මහාසාර සැපත් හැර වල් ගොස් මහණ ව ක්‍ෂාන්ති පාරමිතා කුළුගත් සමයෙහි තුමූ ද සමග ව වල් ගොස් මහණ ව එකවජ්ජිත ව තපස් කොට, බරණැස් රජහු තමන්ගේ රූප ශ්‍රී දුන ලොභයෙන් බෝසතුන් බල බලා හින්ද දී බලාත්කාර යෙන් රජගෙට ගෙණ ගොස් නොයෙක් ප්‍රකාරයෙන් ශීලභෙදයක් කොටගත නො හී තමන් කෙරෙහි ප්‍රසන්න ව කැවත බෝසතුන්ට පාවා දී ගිය කල ද එ තැන් පටන් දස හවුරුද්දක් මුළුල්ලෙහි රජත භාජනයෙහි කිරින් පිරූ කල නිර්මල වූවා සේ බෝසතුන් හා සමග නිර්මල ශීලය එක ස්ථානයෙහි වැස අඛණ්ඩ කොට රක්‍ෂා කළා වූ ඒ සම්පිල්ල හාසිනී නම් පරිබ්‍රාජිකාවෝ නමුදු දූන් මේ යශෝධරා දේවීම ය.

තව ද සුපත්ත ජාතකයෙහි පරදුඃඛ දුඃඛිත වූ අප මහ බෝසතාණන් සුපත්ත නම් ගිවු රාජන් ව බරණැස වාසය කරණ සමයෙහි බරණැස් රජුගේ අග්‍ර භෝජනයට දොළෙණි යි කී කල කපු වූව ඉපද පවා එ දොළ පසිඳ බෝසතුන්ගෙන් උපකාර ලදින් එකල ප්‍රේමයෙන් විසූ සුඵස්සා නම් ගිවුදෙනු නමුදු දූ ත් මේ යශෝධරා දේවී ම ය.

තව ද: චන්දකින්නර ජාතකයෙහි ලෝකාචාර්‍ය්‍ය වූ අප මහ බෝසතාණන් හිමාලය වනයෙහි සඳකිඳුරු ව ඉපද කන් වැලිතලා වල සැනසී සැනසී, සුවඳ මල් පැලඳ පැලඳ දොළවල කෙළි කෙළ මිහිරි දිය කඳුරු වලින් පැන් බිබී ඇවිදිනා සමයෙහි බරණැස් රජු කින්නරාංගනාවන් කෙරෙහි කළ ලොභයෙන් බෝසතුන් විද හෙළාපියා, "සොඳුර! බරණැස් නුවර පිළියක් රජු නම් මම් ය. තී කෙරෙහි කළ ලොභයෙන් තොල සඳකිඳුරා මරාපීමි. තෙපෙල කිරිසතු තිව නුවට දී මා හා සමග වර. සොළොස් දහසක් පුර ස්ත්‍රීන්ට තී ම අගමෙහෙසිය කෙරෙමි'යි කියා රජු කැඳවාලූ වේලෙහි ඔහු කියන ප්‍රේම බස් තමන් කණ ගහුල් බානා සේ සිතා එ තෙතින් දිම පලුම, රජහු පලා ගිය කල මළ සමණින් වඩාගෙණ පර්වතයක් මුදුනට නැගී කොළ ඇතිරියක් අතුට සෙමෙන් සෙමෙන් එහි සතපා බෝසතුන් හිස තමා ඔර තබාගෙණ දෙපය දිගු කොට වලා පමිනාවන් ලියයක් සේ වැති වැණී වන දෙවියන් අයද නමා ලෙස් පැනනැගී ශොකාග්නියෙන් ශක්‍රයාගේ භවනය හුණුකොට එ තෙනට ඔහු ගෙන්වා ඒ ශක්‍රයාගේ ආනුභාවයෙන් බෝසතුන්ගේ ජීවිතාරක්ෂාකොට එ තැන් පටන් ඒ සඳ තම පර්වතයට පැනනැගී බොහෝ කලක් ප්‍රිය වාසය කළාවූ ඒ සඳ නම් කින්නරාංගනාමෝ නමුදු දූන් මේ යශෝධරා දේවී ම ය.

තව ද: උම්මග්ග ජාතකයෙහි පැණසර වූ අප මහ බෝසතාණන් මහෞෂධ නම් මහ පඬි ව නුවණ පාරමිතා නමැති ලිය යශසමල් ගන්වාපු සමයෙහි ඒ හා සැපත් ඉපදවිමෙනි අඳුබල ව පතිව්‍රතා ධර්මය රක්‍ෂා කළාවූ, සේනකාදි පණ්ඩිතවරුන් සතර දෙනා අනඝ වූ රුවන් ගෙණ තමන් කරා ගිය දෑ ද, ශීලභේදයක් නොකොට තමන්ගේ නුවණ බලයෙන් පරාක්‍රම පැවාවූ, රක්‍ෂා කරණ ද තමන් පරීක්‍ෂා කෙරෙම යි දහසින් බඳ පියලි දී මරපුරුෂයන් යවූ වේලෙහි "මේ මිසු දහස නම් මාගේ ස්වාමිහුගේ පාද රජසකු ත් නො වටනේ ය" යි කියා සිංහනාද කොට පතිව්‍රතාව

නො බින්දු වූ, උළුකැන් බත් කැවුම් බිමට දමා තුණ එක්කොට එයින් මිරිකා තමන් හිස පවන් සජීඛකයෙහි ගල්වා ඇම්වේ සිටුව යි කියා තමාගේ ක්ෂමා පරීක්ෂා කළ වේලෙහි පමා දෙමිනස් සිතකින් බෝසතුන් මුහුණ බලා නො පුවාවූ, එ කල ඒ අමරාදේවි නමුදු දුන් මේ යශෝධරා දේවි ම ය.

තව ද: මහාවෙස්සන්තර ජාතකයෙහි දැක්ක ප්‍රමාණ වූ අප මහබෝසතානන් වෙස්සන්තර නම් රජ ව දන පාරමිතා නමැති මහා ප්‍රාසාදයෙහි කොත් පලඳවාපු සමයෙහි රජය හැර තපස ව වංකගිරි පර්වතයට නික්මුනු වේලෙහි ක්‍රිෂ්ණ ජිනාවන් වඩාගෙණ ජාලිය කුමාරයන් ඇඟිල්ල අල්වාගෙණ තුඹු පලුමුම් නික්ම රථයට පැනනැගී 'වහා වැඩිය මැනව! ස්වාමිනි' කියාලා ආපස්ස බල බලා සිටියාවූ, රාජසුඛිමාලයෙන් වැඩි නිය කොඩුන් මිහ ගෙවා බෝසතුන් හා සමග තුනු කුසීතව ම ගියාවූ; තවද වංකගිරි පර්වතයෙහි දී සත් මසක් මුළුල්ලෙහි බෝසතුන් පන්සලින් පිටතව යා නො දී ස්ත්‍රී ම සිට වෙනසි ඇවිද අල මුල් කලන් ඵාරු ඵලාඵල ඇස් පුරා තමන් ඉසින් ඇද පක්ෂපාතම ම අත්පා මෙහෙ කලාවූ;

නැවත ජූජක නම් බමුණාව දරුදෙදෙනා බැඳ දුන් දුක් දු තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි ඒ සා වන ය තුන්ශලක් සිසාරා ඇවිද දරුදෙදෙනා නො දුක දණේබත් ගැසූ කිකිළියක යේ දිම අවුදින් පාපිව වැටී හී මූසපත් වූ වේලෙහි 'මද්‍රිදෙවි එකලාව මෙ වන මැද මිය ගියෝ දෝ හෝ ' යි යන ශෝකයෙන් හුනස්නෙන් පැනනැගී කම්ඩලාවෙන් පැන් මුහුණට ඉස ඔර ඉස කබාගෙණ බෝසතුන් තමින් හදවත අල්වාලූ වේලෙහි බෝසතුන්ගෙන් මේ ආස්වාදය ලදින් ගිනිකදෙක ඇල්පැන් නැමුවා සේ සෝගිනි නිවාගෙණ එ කෙණෙහි මම් තපස්වීම් වේ දූ යි සිතා පැක නැගී "කිම් ම දරුවෝ කොයි දූ" යි කී කල සොඳුර දිළිත්දක්සම දන් දිනිම්. පින් අනුමෝදන් වේව යි කී බස හා සමග මේරු මඥරාදීන් එක විට වෙවුල්වා තුන් යලක් සාධුකාර දුන්නාවූ; නැවත එම වේලෙහි ම සක්දෙව් රජහු බමුණු වෙස් ගෙණ අවුදින් 'කිම් කෙල මද්‍රිදේවින් මවද දන් දෙව'යි කී කල බෝසතුන් තමන් මුහුණ බැලූ බැල්ම හා සමග ම කිරිරුස් දුටු පද්මයක්සේ සතොසෙන් පිරුණාවූ තමන් මුහුණින් බෝසතුන් මුහුණ බලා සිනාසී:

කෝමාරිකස්සාහං භරියා-සාමිකෝ මම ඉස්සරෝ,
යස්සිච්ඡෙ තස්ස මං දජ්ජා-වික්කිණෙය්‍ය හනෙය්‍ය වා-ති.

යන මේ ගාථාවෙන් ප්‍රීති සිංහනාද කොට 'ස්වාමීනි, නුඹවහන්සේම මෑඩෙක් වේ නම් කැමැත්තක්හට මා දන් දී වදාළ මැනවැ'යි කීය. එම ශක්‍රයා ලවා සාධුකාර දෙවාපු එ කල ඒ මද්‍රිදේවි නමුදු දූන් මේ යශෝධරා දේවී ම ය.

මේ මේ කාරණයෙන් මාගේ ස්වාමිදරුවන් වහන්සේ කෙරෙහි ගුණ දත්තවුන් කෙරෙහි අග්‍ර වූ හෙයින් මේ මේ පූර්ව චරිතයන් අපරීක්ෂා කොට ඒ යශෝධරා දේවීන් ශ්‍රීපාදයෙහි අතගා වලප්නා වේලෙහි හුදු කරුණාවෙන් හඬාලූවා සේ, හුදු මුදිතාවෙන් හඬාලූ වාසේ, හුදු උපෙක්ෂාවෙන් හඬාලූ වාසේ, සිත නොකලඹා නිශ්චලව වැඩහිඳ 'ස්වාමීනි! ම යේශ්‍රී නුඹවහන්සේට පක්ෂපාත ය. ඇව ක්ෂමා කොට වදාළ මැනවැ'යි පිය මහ රජ්ජුරුවන් දන්වූ වේලෙහි ස්වාමිදරුවෝ බැණ නැගී බසින් සිතුත් දසනග රසින් සියලු ගර්භාභ්‍යන්තරය ඒකාලෝක කෙරෙමින්, ශ්‍රී මුඛයෙන් නික්මුත් සුවඳින් සියලු ගර්භාභ්‍යන්තරය එක සුවඳපිඩක් සේ කෙරෙමින්, බණ වදාරණසේක් "මහරජ! මා බුදුවන ජාතියෙහි මැය රහත්වන ජාතියෙහි තොප වැනි මසිල් රජක්හු විසින් කරණලද ආරක්ෂා ඇති ව මැ මිව පක්ෂපාතකම ම විසූයේ ආශ්චර්‍ය්‍ය නො වෙයි. පෙර නුඹුහු කලාවූ නුවණ ඇති සමයෙහි මා සඳකිඳුරු කල බරණැස් රජහු මැ කෙරෙහි කල ලෝභයෙන් මා විඳගෙලා පියා 'සොළොස් දහසක් පුර ස්ත්‍රීන්ට නායක කොට තිම අගමෙහෙසින් කෙරෙම් යි මා හා සමග වරැ'යි රජ කැඳවූ වේලෙහි එ බසට කන් නො දී මා කෙරෙහි ප්‍රේමයෙන් මාගේ ජීවිතය රක්ෂා කළා වා ද"යි යනාදීන් යශෝධරා දේවීන්ගේ බොහෝ ගුණයෙන් මේම චන්දකින්නර ජාතකයෙන් බණ වදාළසේක.

එ වේලෙහි යශෝධරා දේවීන්ගේ ශොක සුලං දුටු වලාකුළක් සේ දුරු වී ය. පස්වණක් ප්‍රීතින් පිණා ගියාහ. බුදුන්ට අනාදර වී ද්දෝ යි රජ්ජුරුවන්ට උපන්නාවූ භය ද සන්හුන.

ඉක්බිත්තෙන් ස්වාමිදරුවෝ බුද්ධාසනයෙන් පැන නැගී ඒ යශෝධරා දේවීන්ගේ ගෙයි සිට නිග්‍රෝධාරාමයට වැඩ එදා රාත්‍රි භාගයෙහි දවස් යවා දෙවන දා උදෑසන තමන් වහන්සේ වැඩූ කුඩම්මා වූ මහාප්‍රජාපතී දේවීන් විසින් වදන ලද ශුද්ධෝදන

රජ්ජුරුවන්ට ම ද නන්ද නම් කුමාරයන්ගේ සිරිබඳනා මඟුල, ගෙවදනා මඟුල, ජනපද කල්‍යාණී නම් රාජකුමාරියාව ගරණ රක්‍ෂා කරණ මඟුලය යන මෙතුන් මඟුල ම එම ද පැමිණියේ ය. එ කල බුදුරජාතන් වහන්සේ එ පවත් දැන 'මාගේ මල් නන්ද කුමරුවා කාමබන්ධනයෙහි බැඳී ගියේ නම් යශරින් මුදාගත නො හැක්ක. දැන් ම ගොස් ඔහු මහණ කරවමි යි සිතාලා විසිදහසක් රහතන් ගෙණ දෙවන ද උදෑසන ම මහත් වූ බුඩශ්‍රීන් ඒ නන්ද කුමාර යන්ගේ මඟුල් මාලිගාවට වැඩ පණවන ලද බුඩාසනයෙහි වැඩහිඳ:

තපො ච බ්‍රහ්මචරියං ච-අරියසච්චාන දස්සනං,
නිබ්බාණ සච්ඡිකිරියා ච-එතං මඞ්ගල මුත්තමං.

යනාදින් මඟුල්බණ වදරා මලක්ෂුවක් පැමිදී කරණු කැමැතිව පාත්‍රාධාතුව නන්ද කුමාරයන් කර දිගු කොට වදාළ සේක.

එ කෙණෙහි නන්ද කුමාරයෝ සර්වාභරණයෙන් මඩියල විධාන යෙන් සැරහී සිටියාහු ම බුදුන් දිගුකල පාත්‍රය ආදරයෙන් දෙඅත් ලෙහි තබාගත්තාහු ය. එ කෙණෙහි බුදුහු බුඩාසනයෙන් පැන නැගී වෙහෙර බලා නික්මුනු සේක. නන්ද කුමාරයෝ හිණිමුල දී දොරකඩ දී, පාත්‍රය හැරගන්නා සේක් දෝ හෝ යි සිත සිතා බුදුන් පසු පස්සෙහි නික්මුනාහු ය. බුදුහු පසු නො බලා වඩනා සේක් ම ය.

එ වේලෙහි ජනපදකල්‍යාණී නන්ද කුමාරයන් යන්නා දැන, තමා වසන පායෙහි මතුමාල්තෙලෙහි සිවුමැදිරියෙහි දොර හැර, තමාගේ සඳමඬලක් වන් මූවමඬල දක්වාලා වලාගබෙකින් නික්මුත් විදුලියක් සේ ලීලොපෙත වූ මොළොක'ත දිගු කොට ලා දිගු පුළුල් වූ ඇසින් නන්ද කුමරුන් මුහුණ බලා "ස්වාමියෑ පුත, ඔබ නො රඳ වහා දිව එව"යි කිව. එ තෙපුල් අසා නන්ද කුමාරයන් ලය කම්පිත වී ය. එසේ ද වුව ත් පාත්‍රය ගෙණ වාසල දී ඇරගන්නා සේක් දෝ හෝ යි සිතා ගොස් පසු නො බලා ම වඩනා හෙයින් බුදුන් කෙරෙහි ආදරයෙන් පාත්‍රය ගත මැනවැ යි කිය නො හී තොසි තින් ම වෙහෙරට ගියහ.

ඉක්බිත්තෙන් බුදුහු නන්ද කුමාරයන් ලහම කැඳවා "නන්ද ය, චක්‍රවර්ති රාජ්‍ය හැර මා වැනියන් මහණ වූ කල නාවැතියන්ට

කිසිගෙය ඇයි දැ? දූත් ම මහණව"යි වදාළසේක. නන්දකුමාරයෝ බුදුන් වදාළ බසට අනෙකක් කිය නො හී ජනපදකල්‍යාණීන් සිත සිතා කුමක් කොළමරින් බැලූ බැලුම් සිත සිතා කරබා සිටියහ. බුදුහු "නන්දයා මුමෙන් නොබැණ ඉවසූය"යි සැරියුත් - මුගලන් දෙදෙනා වහන්සේට වදාරා එම විට ම ඔහු ඉසකේ කපා මහණ කළසේක. නන්ද කුමාරයෝ මහණ වූ ද පවන් ජනපද කල්‍යාණීන් ගේ රූව සිත සිතා, ඇය දිගුකළ අත සිත සිතා, කුමන් කොළමරින් බැලූ බැලුම් සිත සිතා, එදා කී බස් සිත සිතා, කඳුළු ගෙණ ගෙණ මහණදම් නැති ව ජනපදකල්‍යාණීන් කෙරෙහි ම ශොක කෙරෙති. මහරහි භික්ෂූන් වහන්සේ ඒ කාරණය දැන "ඇවැත්නි! නොපි බුදුන්ගේ මලනුවන. රජකුලයෙන් පැවිදි වූවහ. ඉතා නොපි සුඛිතයහ, නොපව දුක් කිම් දැ? දවසින් දවස දුබල වෙතැ" යි විචාරණ සේක නන්ද සාමණේරයෝ සබ්‍රම් සරුන්ගේ බස් අසා ස්වාමීනි, මම කිසිදෙයකින් දුක් නැත. ජනපදකල්‍යාණීයට ඉතා මා බඳ කැකිය යි. එසේ හෙයින් දුබල වෙමි"යි කීහ. භික්ෂූන් වහන්සේ එ තෙපුල් අසා බුදුන් කරා ගොස් දැන්වූ සේක. බුදුහු නන්ද සාමණේරයන් කැඳවා "සැබෑ ද නන්දය, තෝ මා වැනි බුදුකෙණකුන් කෙරේ මහණව ස්ත්‍රීනක කෙරේ කළ ලොභයෙන් ශොක කෙරෙහි දැ"යි විචාළ සේක.

නන්ද සාමණේරයන් වහන්සේ "එසේ ය! ස්වාමීනි, ජනපද කල්‍යාණී එ දවස් මා පාත්‍රය අතින් ගෙණ තුඹවහන්සේ පස්සෙහි එන වේලේ "හිමියා පුත, ඉතා ලස්සා වරු යි පුත් කලස් කරක් වන් කමාගේ කර දිගුකොට බැලුම. ඇය සිතූ සිතූ කල ඉතා ම මට ශොක මහත් ය"යි වදාළසේක. බුදුහු නන්දය නාගේ ජනපදකල්‍යාණීයගේ රූව යහපත් ම දැ යි වදාළසේක. නන්ද සාමණේරයන් වහන්සේ ජනපදකල්‍යාණීයන්ගේ රූව බුදුන් ඉදිරියෙහි සිට වර්ණනා කළ සේක.

එ කල නන්ද සාමණේරයන් වහන්සේට උපන්නා වූ කාම නමැති පරිදාහ නිවන් නමැති අමාගගින් නිවමි යි සිතා වදාරා නිදන් බලා බෙහෙත් කොට ව්‍යාධි සන්සඳුවන වෛද්‍යාචාර්යයකු සේ මාගේ මලනුවනුගේ ස්ත්‍රීශොක නමැති සලල ය කෙසේ හැර පියම් දැ හෝ යි සිතා වදාරා උපදෙසක් දැක "නන්දය ජනපද කල්‍යාණීයට වඩා ස්ත්‍රීහු නැත් ම දැ? යි වදාළ සේක. සාමණේර යන් වහන්සේ 'එසේ ය, ස්වාමිනි! ඌන්ට වඩා කෙණෙක් මුළු දඹදිව නැතැ"යි කීහ. බුදුහු 'ඇට වඩා ස්ත්‍රීන් දක්නා කැමැත් තෙහි දැ?'යි වදාළ සේක. ඌන්ට වඩනෝ තව ත් ඇද් දැ යි හී නො හිමිය ඌන්ගේ රූප වර්ණනා කරණ සේක්: නන් විසිතුරු මලින්

සැරසුනාවූ නිල් වරලසින් හා; සත් නමැති මධුගුනාවට ගමින් ගත් නීලභෘඞ්ග යුග්මයක් සේ ඉඳු මිණි නිල්වන් දිගුපුලුල් වූ ඇසින් හා, ඝන නිල් වරල් නමැති මහ මේ කුළින් පැන නැගී දෙව්දුනුවන් දිලියෙන බැම සඟලෙකින් හා, දුටු දුටුවන් දෙපා මැසී යන තරම් රත්හැකිළි සේ සක් පතින් දිලියෙන කන්වැල් සඟලෙකින් හා, කෙම්පල වන් තඹුරු තොල් සඟලෙකින් හා, කොඳ කැකුළු වන් දත්පෙළින් දිවන සුදු රසින් සඳ රස් පරදව මින් සිටි හා, මුව පියුම් බල බලා කර ඔසවා සිටිනා වූ රන්වන් හංස පැටවුන් දෙදෙනකු සේ ලීලෝපෙත ව සිටිනා පිරුණු තන සඟලෙකින් හා, නැබ පියුම්ට මූවරද ලොලින් බස්නා භෘඞ්ගාවලියක් සේ දුටු දුටුවන් සිත් උමතු කරවන නිල් වයාරෝදකින් හා, රන්තිඹිලි කඳක් වන් අසුරෙන් ගන්නා සිඟු වළගෙකින් හා, කාමී පුරුෂයන් මනදෙළ විශාරද කරවන්නාවූ රන්වන් පුළුලුකුලකින් හා, පුරුෂයන්ගේ ධෛර්ය්‍ය මඩනා තිරිඟිකඳ සේ රන් කෙසෙල් කඳට නිගාදුන් මට සිලුටු වූ කලවා යුවලකින් හා, යුක්ත වූ මේ බදු ස්ත්‍රියක් මේ මුළු දඹදිව මා දන්නේ නැතැයි කී යේය. බුදුහු 'ඇත නන්ද ය' යි වදාළ සේක. එසේ වී නම මට උන් පෑව මැන වැ යි කීය.

එ කෙණෙහි ස්වාමිදරුවෝ ලද බොලඳ වූ ඒ නන්ද සාමණෙරයන් වහන්සේ සෘඩියෙන් අත අල්වාගෙණ ශක්‍ර පුරයට වඩනා සේක් මගා වනමධ්‍යයෙහ කඩ දැලි සේනක් මවාලා ගින්නෙන් දා කණුවෙක ද මිනගිය කන් නාසා නගුටු නැති වැදිරි මැහැල්ලක දත් නියාගෙණ ඉතා විරූපී ව උන්නාසේ දක්වාලා 'නන්ද ය, කෙල ද මිනගිය වැදිරි මැහැල්ල දිටි දැ' යි වදාළ සේක. 'දිටිමි, ස්වාමිනී' යි කියා කම්පා වූ සේක.

ඉක්බිත්තෙන් බුදුහු ශක්‍රයාගේ නන්දෝද්‍යානයට වැඩ ඔහුගේ දිව්‍යස්ත්‍රීහු මේ තෙනට රැස්වෙත්ව යි සිතා වදාළ සේක. එ කෙණෙහි ශක්‍රයාගේ අග මෙහෙසියන් වූ කකුටපාදිනී නම් දිව්‍යාඞ්ගනාවෝ පන් සියයෙක් අවුත් බුදුන් පිරිවරා වැඳ එකත්පස් ව සිටියාහු ය. බුදුහු ඔවුන්ට බණ වදාරා නන්ද සාමණෙරයන් වහන්සේට දිව්‍යස්ත්‍රීන් පෑලා ශක්‍රපුරයෙන් වැඩ 'නන්ද ය, මේ දිව්‍යාඞ්ගනාවෝ වඩිද්ද, ජනපදකල්‍යාණී වඩිදැ' යි වදාළ සේක. සාමණෙරයන් වහන්සේ "ස්වාමීනී, දිව්‍යාඞ්ගනාවන් දුටු ඇසට ජනපදකල්‍යාණීන්ගේ රුව අර ජේනේ ද මිය හොත් වැදිරි

මැකැල්ල සේ ම සිතෙති" කීහ. බුදුහු 'නන්දය! එසේ වූ දිව්‍යාභරණාවන් ලද්දෙත් කැමතියෙහි ද' යි වදාළ සේක. සාමණේරයන් වහන්සේ වදාරණසේක් 'ස්වාමීනි, එ වැනි දිව්‍යාභරණාවන් කෙසේ ලැබෙම් ද' යි කී සේක. බුදුහු 'දෙවඟනන් ලබන උපදෙස් මම දනිමි'යි වදාළ සේක. සාමණේරයන් වහන්සේ 'ඒ උපදෙස් මා උගන්වා වදාළ මැනවැ'යි කී සේක. බුදුහු 'නන්දය, දිව්‍යාභරණාවන් කැමැතියෙහි නම් මාගේ සස්නෙහි නිර්මල කොට සිල් රක්‍ෂා රක්‍ෂා කළවුන්ට දිව්‍යාභරණයෝ ලැබෙති. සිල් රක්‍ෂාකරන්නවුන් කරා දිව්‍යාභරණයෝ තුමූ ත් එති. ඒ දෙවඟනන් මා කරා අවුදින් පිරිවරා ඔපි ලෙස් නො ම දුටුයෙහි වේද' යි වදාරා කම්ස්ථාන උගන්වා වදාළ සේක. නන්ද සාමණේරයන් වහන්සේ දිව්‍යාභරණාවන් ලබමි යි යන ලොභයෙන් නිර්මල වූ ශීලය රක්‍ෂා කොට නොබෝ කලෙකින් විදර්ශනා වඩා රහත් ව නන්ද නම් මහ තෙර ම බුදුසසුන් නමැති ආකාශයෙහි කිර සඳ සේ ප්‍රසිද්ධ වූ සේක.

මෙසේ බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩි තුන් වන දා නන්ද මහතෙරුන් මහණ කරවා, සත්වන දා විසිදහසක් රහතන් පිරිවරා සවණක් රසින් දිලිහි දිලිහී පියරජුගේ ගෙට වළඳන්ට වඩනා සේක.

එ කල යශෝධරා දේවී නම් පුතනුවන් සත්හැවිරිදි රාහුල කුමාරයන් කැඳවා ඇකය පිට හිඳුවාගෙණ සිඹ සනහා "පුතණ්ඩ! රාහුලයෙනි! තොපගේ පියාණන් වහන්සේගේ සතර මහා නිධානයෙක් ඇත. ඒ නිධාන සතර: ගවු, දෙගවු, තුන්ගවු සතරගවු පමණ වටින් ඇති යේ ය. ගැඹුර මෙතෙකැ යි පමණ දන්නෝ නැත. උන් වහන්සේ මහණ වූ තැන් පටන් ඒ සතර මහා නිධානය කොතැනෙක බව ත් දන්නෝ නැත; තව ද ඔබගේ චක්‍රවර්ති රාජ්‍යය හා සත්රුවනෙකුත් ඇත, පියන්ගේ සැපත් දරුවන්ට හිමි වේද"යි කියාලා තොප පියාණන් වහන්සේ කරා ගොස් ඒ සතර මහානිධානය හා සත්රුවන් සක්විතිරජය ඉල්වා ගණුව"යි කීහ. රාහුල කුමාරයෝ මුතුන් රජ්ජුරුවන් අදුනන බව මුත් පියන් කවුරුන් බව ත් නො දනිති. එසේ හෙයින් 'අම්ම ම පියානෝ නම කවුරුද' යි කීහ. යශෝධරා දේවි පුතනුවන් වඩාගෙණ සිවුමැදිරියෙහි දොරහැර රාජවීථියෙහි දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලක්‍ෂණයෙන් දිලිහි දිලිහී කසුන් කඳක් සේ සවණක් රස්විහිද විහිදා වඩනා බුදුන් පුතනුවන්ට අත දිගුකොට පෑලා:

"චක්ක වරඞ්කිත රත්ත සුපාදො
ලක්ඛණ මණ්ඩිත ආයත පණ්හි,
චාමර ඡත්ත විභූසිත පාදො
එස හි තුය්හ පිතා නරසීහො.

සක්‍ය කුමාර වරො සුඛුමාලො
ලක්ඛණ විත්ථිත පුණ්ණ සරීරො,
ලොකහිතාය ගතො නරවීරො
එස හි තුය්හ පිතා නරසීහො.

පුණ්ණ සසඞ්ක නිභො මුඛවණ්ණො
දෙව නරාන පියො නර නාගො,
මත්ත ගජින්ද විලාසිත ගාමී
එස හි තුය්හ පිතා නරසීහො.

ඛත්තිය සම්භව අග්ග කුලීනො
දෙව මනුස්ස නමස්සිත පාදො,
සීල සමාධි පතිට්ඨිත චිත්තො
එස හි තුය්හ පිතා නරසීහො.

ආයත යුත්ත සුසණ්ඨිත නාසො
ගොපඛුමො අභිනීල සුනෙත්තො,
ඉන්දධනු අභිනීල භමූකො
එස හි තුය්හ පිතා නරසීහො.

වට්ට සුමට්ට සුසණ්ඨිත ගීවො
සීහ හනූ මිගරාජ සරීරො,
කඤ්චන සුච්ඡවි උත්තම වණ්ණො
එස හි තුය්හ පිතා නරසීහො.

ස්නිද්ධ සුගම්භීර මඤ්ජු සුඝොසො
හිඞ්ගුල බද්ධ සුරත්ත සුජිව්හො,
වීසති වීසති සෙත සුදන්තො
එස හි තුය්හ පිතා නරසීහො.

අඤ්ජන වණ්ණ සුනීල සුකෙසො
කඤ්චන පට්ට විසුද්ධ ලලාටො,
ඔසධි පණ්ඩර සුද්ධ සුඋණ්ණො
එස හි තුය්හ පිතා නරසීහො.

ගච්ඡති නීලපථෙ විය චන්දො
තාරගණා පරිවෙඨිත රූපො,
සාවක මජ්ඣ ගතො සමණින්දො
එස හි තුය්හ පිතා නරසීහො'[1]

යන මේ පෙර නමන් බුදුන්ගේ වියෝග කාලයෙහි බැඳගෙණ එකාවන්නු ම ගාථාසා කොට කොට කිදිනාවූ නරසීහ ගාථා පුතනු වන්ට උගන්වාලා "පුතණ්ඩ කොප පියාතන් වහන්සේ නම් එසේ මෙසේ වූ ස්වල්ප කෙණෙකුන් වහන්සේ නො වෙති. දෙපතුල් පුරා සිටි දෙසිය සොළොසක් මඟුල් ලකුණෙන් හා, රත්නෙලි තුඩු බඳු ව සිනිඳු වූ ඇඟිලි පෙළින් හා, ක්‍රමොන්නත ව රන්වන්වූ ජංඝායුග්මයෙකින් හා, රන්කඳක් බඳු වූ බුදුබඳෙකින් හා, කල්පද්‍රම ශාඛා යුග්මයක් බඳු වූ ශ්‍රී හස්ත යුග්මයකින් හා, පුන්සඳක් බඳු වූ ශ්‍රී මුඛයෙකින් හා, විදුලිය දෙකක් බඳු වූ කන්මැල් සඟලකින් හා කනකාඞ්කුශයක් බඳු වූ උත්තුඞ්ගනාසිකාවෙකින් හා පස්වණක් පැයෙන් දිලියෙන ඉඳුමිණි නිල්වන් ඇස්සඟලෙකින් හා, දෙවුදුනු දෙකක් බඳු වූ ශ්‍රීමත්ත වූ බැමසඟලෙකින් හා, රත්මිණි ගත් බඳු වූ ශ්‍රීමදානනයෙකින් හා රන්කුළු දෙකක් බඳු වූ උරසඟලෙකින් හා සිංහ හනු බඳු වූ හනු භාග දෙකෙකින් හා. රන්පිහුම් පෙත්තක් බඳු වූ සුරක්ත වූ නාස දෙසිදුර ලලාට දෙකන්සිලු පිරිමදනා තරම් දිගුපුළුල් තුනු වූ ජිව්හායෙකින් හා, කතත් තරු පෙළක් සේ දිලියෙන සම සතළිස් දන්තපඞ්ක්තින් හා, මිණිවඩම් දෙකක් සේ සුරක්ත වූ අධරයුග්මයෙකින් හා, සඳවලා ගබින් නික්මුණු සඳලියේ පරදවමින් ශ්‍රී මුඛයෙන් නික්මුණු සුදු බුදුරස් කලඹෙකින් හා, ජාම්බෝනද කනක පට්ටයක් බඳු වූ නලල් තලයෙකින් හා, රන්ගිරි මුදුනෙහි දිලියෙන පුන්සඳක් බඳු වූ ඌර්ණා රෝමයකින් හා, නිල් වලාකුළක් බඳු වූ ඉඳුමිණි නිල්වන් සිරසෙකින් හා මඩුරියන් උඹ ඉන්මුදුනෙන් පැනනැගී දිලියෙන කේතුමාලා නම් රශ්මිකදම්බයෙකින් හා, තිරුරස් කලඹක් වන් සියලඟින් නික්මුණු සවණක් රසින් හා,

උතුම් වූ හංසරාජයක්හුගේ ලීලා පරයන මනොහර වූ ගමනින් හා; හුදු කරුණාවෙන් මවා ලූ රුවක් සේ, හුදු මුදිතාවෙන් මවා ලූ රුවක් සේ, හුදු උපෙක්ෂාවෙන් මවා ලූ රුවක් සේ, හුදුදානයෙන් මවා ලූ රුවක් සේ, හුදු ශීලයෙන් මවා ලූ රුවක් සේ, හුදු ප්‍රඥාවෙන් මවා ලූ රුවක් සේ, හුදු වීර්‍ය්‍යයෙන් මවා ලූ රුවක් සේ, හුදුපෙලහරයෙන් මවා ලූ

රුවක් සේ, පෙර තමන් පහස් ලත් අප මෑනි කාමකිළියන්ගේ වියෝග දුඃඛ නමැති ලැව්ගින්න දල්වන්නා සේ, බඳු වදමල් රැසෙකින් වැසූ චිත්‍රකූටපර්වත රාජයා සේ, සුරකත වූ පාංශුකූල චිවර සඟළකින් තමන් වහන්සේගේ රන්වන් වූ ශ්‍රී ශරීරය වසාගෙණ හිරු පැරදූ තෙජසින් හා, සඳහු මත් බුන් සොම්‍ය ගුණයෙන් හා, බැලූ බැලූවන් ඇස් නිවමින්, කන් නිවමින්, සිත් නිවමින්, පිඳු පිඳු වන්ට දෙව් බඹ සැපත් දෙමින්, තුඩ තුඩ සාධුකාර දෙවමින්, දෙව් බඹ කැලන්ගේ කිරුළු කුළු මිණිරැස් නමැති අමාදියෙන් තමන් පතුල් පිරිසුදු කෙරෙමින් පුතණ්ඩ! තෙලෙ විසිදහසක් රහතන් පිරිවරා ගෙණ මඬුලු සඳක් සේ සිසාරා සිටියත් බ්‍යාමප්‍රභා මණ්ඩලය මැද මහබඹු සේ ගමන් ගත් සේක් තොප පියානන් වහන්සේය.

ඔබ ඇඳින ගන්ම යි පුතනුවන්ට බුදුන් දක්වාලා බුදුන්ගේ රූපශ්‍රීනාව තමන් මූව නොපොහොනා සේ කියා පුතනුවන් මත්කොට ලා "පුතණ්ඩ තොපගේ අතුල් පතුල් හා එක්වැනි වූ යම් මහණරූපයක් දුටු නම් ඔබ තොපගේ පියානන් වහන්සේ ම ය. නො බා ම තොප පියානන් වහන්සේ ලඟට ගොස් සිවුරු කණ අල්වාගෙණ තොපගේ මෙ පතුල් සුං ඔබගේ ශ්‍රී පාද ලඟ තබාලා එක්වැනි ලෙස් දක්වාලව. තොප උපන් දවස් එලිපතින් පිටත සිට දුරදී ම තොප බලා ගිය බව මුත් තම දක්වා තොප නුදුටුසේක. එසේ හෙයින් තොප තමන් වහන්සේහා එක්වැනි රූ ඇති බවත් නො දන්නා සේක. එසේ හෙයින් තොප එක්වැනී ලෙසත් දක්වාලා සුරතල් වූ ප්‍රිය තෙපුල් කියා දරු දායාද ඉල්වාගෙණ පුතණ්ඩ! සතර මහ දිවයිනට අධිපති ව ඒ චක්‍රවර්ති රාජ්‍යය කරන්නැ"යි පුතනුමන් උගන්වාලා නැවත පුතනුවන් වඩාගෙණ ම සත්බුමු මහ පායෙහි යට මහලට බැස මහ පඩිකඳ පිට සිටුවා මෙසේ පුතනුවන් යවා නැවත තුමූ මතු මහලට නැගී සිංහපඤ්ජරයෙන් බල බලා නො පැණී සිටිසහ.

එ කල රාහුල කුමාරයෝ සර්වාභරණයෙන් සැරහී කුමාර පිරිස් පිරිවරා බුදුන් පියානනැයි අසා සතුටු සතුටුව බුදුන් කරා නො බා ගොස් බුදුන්ගේ සිවුරුකණ අල්වාගෙණ බුදුන්ගේ අවතුරාසිංක් මගුල් ලකුණෙන් ශ්‍රීමත් වූ දෙව් බඹුන්ගෙන් පූජා ලබන ශ්‍රීපාද යට නුදුරු තෙන පියානන් වහන්සේ ය යි යන ප්‍රේමයෙන් භය නැති ව තමන් ගේ රන්පෙති දෙකක් වන් පතුල්සුං දෙක සම

රහල් කුමරු බුදුරදුන්ගෙන් දායාද ඉල්ලීම.

321 පිට බලන්න. (20-21)

කොට සබාගෙණ බුදුන්ගේ ශ්‍රී මුඛය බල බලා "මහණ! මට තාගෙන් දායද්ද දේල. මහණ! මට තාගේ සතර මහා නිධානය දේල. මහණ! මට තාගේ සත්රුවන් සක්විති රජය දේල. මම තාගේ දරුවෙම් ල. තෝ මාගේ පියෙහි ල. තෝ මා උපන් දවස් දුර දී දූකලා මා කරු නො වැද සොරා ම ගියෙහි ල. එසේ දුඹ වුව ත් මහණ! තාගේ සෙවන ඉතා ම මට සිසිල. තාගේ රූපශ්‍රීය ඉතා ම මට ප්‍රියකර ය. තාගේ ඇඟින් දිලිහෙන රැස් මා ඇඟට ඉතා ම සුවපහස් දෙයි. එසේ හෙයින් තෝ මාගේ පියෙහි ම ය යි කිය කියා බුදුන් මුහුණ බල බලා ලඳ බොළඳ කෙළිල් කීහ.

එ කල බුදුහු කුමරුවා ඇඟිල්ල ශ්‍රී හස්තයෙන් අල්ලාගෙණ "වරෝ දරුව! දායාද දෙන්සමෙර් වේ ද" යි කිය කියා රජගෙට නික්මුනු සේක. රාහුල කුමාරයෝ සිංහරාජයකු පසුපස්සේ ගමන් ගත් කෙසර සිංහරාජ පැටවකු සේ, සඳ පසුපස්සෙහි ගමන් ගත් වෘහස්පති තරුව සේ, නැම් තරුවට අනුවූ අරුන්ධතී තරුමක් සේ, සත්රුවන් මහ නැවෙක රන් පමුදමින් බැඳ පසුපස්සේ ගමන් ගත් රුවන් ගල් වත් සුහක් සේ, බුදුන්ගේ පසුපස්සෙහි රජගෙට ගියාහු ය.

එ දවස් ශාක්‍ය කෝලිය දෙකුලවරින් රැස් වූ රජදරුවන්ට හා සියලු සත්ත්වයන්ට බුදුන් සමාගම පෙළහර පානා වේලෙහි උපන් සන්තොෂ යේ ම ඉතා මහත් වූ සන්තෝෂ උපන. සාධුකාර නුදුන් එක ද සත්ත්වකෙනෙක් නැත. සතුටු කඳුළෙන් නුවන් නො තෙමූ එක ද දරු ලත් කෙනෙක් නැත. සියලු සත්ත්වයෝ ම මෙවැනි පෙළහරෙක්, මෙවැනි ආශ්චර්යයෙක්, මේ වැනි වික්‍රමයෙක්, මේ වැනි බුහුටිකමෙක්, මේ වැනි නිර්භීතකමෙක්, මදරුවන්ට ත් වේව යි මදරුවන්ට ත් වේව යි කිය කියා ම සිටියාහු ය.

එ කල බුදුහු රජගෙට වැඩ වදාළ සේක. රාහුල කුමාරයෝ දායාද ඉල්ම ඉල්ව බුදුන් ළඟ සිවුර අල්ව අල්වා සිටිත් ම ය. බුදුහු වළඳා අනතුරෙහි බුඩාසනයෙන් පැන නැගී තරුණ රිවිකිරණයෙන් දිලියෙන කනකගිරි ශිඛරයක් සේ නික්මුනු සේක. රාහුල කුමාරයෝ ද බුදුන්ගේ සිවුරු කොණ ගැවී ගැවීම දායාද ලොභයෙන් නික්මුනාහ. බුදුහු ත් රාහුලය තෝ සිට යි කියා ත් නො වදාරණ සේක. රාහුල කුමාරයන් රඳවාලන කිසි කෙනෙකු ත් නැත්තාහු ම ය.

එ කල යශෝධරා දේවී බුදුන් හා නැඟී ව යන පුතනුවන් සිංහ පංජරයෙන් බලා දැක "කිමෙක් දෝ හෝ තනඳ කුමරුවාතන් යේ ම මි පුතනු ත් ගෙණ ගොස් මහණ කරවා ගන්නා උපායෙක් දෝ, දායාද නබා මි පුතුන් ලදිම් නම් මැනවැ" යි සිත සිතා කඳුළෙන් නුවන් තෙම තෙමා සිටියාහු ය.

බුදුහු රාහුල කුමාරයන් වෙහෙරට ගෙණ ගොස් සැරියුත් මහ තෙරුන්වහන්සේ කැඳවා "ශාරිපුත්‍රය! මේ රාහුලයා මා අතින් සත්රුවන් දායාද සම්පත් ඉල්වයි. මොහු මට දරු බවක් සබා ම ය. මා මොහට පිය බවත් සැබෑ ම ය. එසේ හෙයින් මොහට නො නස්නා ධනයක් දෙනු කැමැත්තෙමි. දෙන ධනය ත් මාගෙන් ම දී ලනු කැමැත්තෙමි. මා බෝමැඩ දී ලද්දා වූ සපත විධ වූ ආර්යධනය මොහට දුනමැනව යි, එසේ හෙයින් දැන් ම මොහු මහණ කරව යි වදාළ සේක.

ඒ රාහුල කුමාරයන් වහන්සේ පෙර නමන් වහන්සේ නාභාධි නාර ව ආ හෙයිනු ත් බොහෝ කලක් බුදුන්ට දරු ම නිසරු ව ආ හෙයිනු ත් තුලු මහණකරව යි කී බස් අසා මපියාණන් වහන්සේ අද මට උතුම් ධනයක් දෙනසේක් වනැ යි සිතා හේතුසම්පත් බල යෙන් ම සතුටු සතුටු ව සිටිසේක. ඒ කෙසේ දැ? යත්;

පෙර පියුමතුරා නම් බුදුන් සමයෙහි මේ රාහුලස්වාමි සඩක නම් දිව්‍යනාගරාජ ව ඉපද ඒ බුදුන්ගේ උතුරු නම් පුත් මහතෙරුන් වහන්සේගේ බුදුන් හා එක්වැනි වූ රූපලීලා හා මැනියන්ගේ නියෝගයෙන් දායාද සම්පත් සොයා ගිය ද මහණ ව අමාමහ නිවන් දැක බුදුසසුන් හොබවන්නා දැක 'මම ද බුදුකෙනෙකුන්ට දරුව මෙසේ වූ ශ්‍රී විභූතියක් ලදිම් නම් යෙහෙකැ'' යි සිතා තෝ සුවහස් නා නළුවන් පිරිවරා නාගලෝවින් මිනිස්ලොවට අවුදින් මහත් වූ දිව්‍ය මණ්ඩපයක් මවා එහි බුදු පාමොක් සඟසිරිය් වඩා හිඳුවා සත්දවසෙක දිව්‍ය ආකාර වළඳවා සත්වන දා "මම ද මේ පිණින් මතු තුඹවහන්සේ සේ ම බුදුකෙනෙකුන්ට දරුව මේ උතුරු නම් මහතෙරුන්සේ ම බුදුසසුන් හොබවම්ව" යි ප්‍රාර්ථනා කළ සේක. බුදුහු "තෝ මතු ගෞතම නම් බුදුන්ට පුත් රාහුල නම් මහාස්ථවිර වන්නෙහි ය යි විවරණ පතුල් දුන් සේක. මේ මුන් වහන්සේගේ හේතුසම්පත් නමි. එ තැන් පටන් මේ යප් ලක්‍ෂයක් මුළුල්ලෙහි පැරුම් පුරා ආසේක්මි ය.

නම් ද: සසර දහස් ගණන් කප්වල බුදුන්ට ම දරු ව අවුදින් නොයු කල් නබා අප බුදුන් බුදු වූ මේ මහාභද්‍රකල්පයෙහි ද්ද්දර

ජාතකයෙහි මාගේ ශාක්‍යසිංහයානන් වහන්සේ භාස්කර කුලෙහි සිංහරාජ ව උපද හිමාලය වනයෙහි රිදී ගුහායෙක රිදීපුත්තෙහි නිත්‍ය වාසය කරණ සමයෙහි සිංහ පෝතක ව උපද පියාණන් වහන්සේට පුවව වැ වැස පසු ව සිංහ රාජ්‍යය ලදීන් සහජාත පුත්‍ර වූසේකු ත් මෙම රාහුල නම් පුතනුවන් වහන්සේ ම ය.

නම් ද: මක්ඛටක ජාතකයෙහි ශාක්‍යකුල තිලක වූ මෙම බුදු රජාණන් වහන්සේ බමුණු මහසල් කුලෙහි උපද කෙළ ගණන් ධන හැර වල්ගොස් මහණ ව ශීලපාරමිතාව පූර්ණය කල සම යෙහි තුන් හැවිරිදි බිළිඳි වයස පියාණන් වහන්සේ පසුපස්සේ ගොස් එක දා ම මහණ ව දිගු කාලයක් බ්‍රහ්මචර්‍ය්‍යාව අඛණ්ඩ කොට රක්ෂා කළ සේකු ත් මෙම රාහුල නම් පුතනුවන් වහන්සේ ම ය.

නම් ද: බන්ධනාගාර ජාතකයෙහි ශාක්‍යකුල විතානමාණික්‍ය වූ මෙම බුදුරජාණන් වහන්සේ අප්‍රසිද්ධ වූ කුලයෙක උපිද මාතෘ පට්ඨාන ධර්මයන් පූර්ණය කොට පසුව තපසට යෙමි යි නික්මුනු ද ස්වාමීනි! මා බබ දරු ගබෙහි ගී සත්‍රිය අවුත් හි වේලෙහි පුත්‍රප්‍රෙම යෙන් මපුතනුවන් උපන් කල යෙමි යි සිතා රඳ උපන් පුතනුවන් දක උපන්නා වූ මහා ප්‍රෙමයෙන් මපුතුන් කිරු වන්දවා පී කල තපසට යෙමියි රඳ, පසුව මපුතුන් බත් කැවූකල යෙමි යි සිතා රඳ, පසුව මපුතුන් කොස් බෑ කල යෙමි යි රඳ, පසුව මෙසේ පුතනුවන් කෙරෙහි කළ ලොභයෙන් ප්‍රෙම නමැති මලෙහි බැඳී තපසට යා නොහී පසු ව පුතනුවන් කොස් බෑකල හොරා නැති කොට ගෙණ පුතනුවන් සිඹ සඟ හා "පුත දුන් මා බැඳුනු මලෙහි නෙපි මතු බැඳි කො යව"යි පැතයක් උගන්වාලා හොරා තපසට පලා ගිය ද ය. පියාණන් වහන්සේ තපසට ගියපසු වැඩිවිය පැමිණ පියාණන් වහන්සේ උගන්වාලු අවවාදය නොවරදවා ම නාම්බනින යෙහි නො බැඳී වල්ගොස් තපස් කළ සේකු ත් මෙම රාහුල නම් පුතනුවන් වහන්සේ ම ය.

නව ද: අද්දිත ජාතකයෙහි ශාක්‍යකුල කල්පද්‍රම වූ මෙම බුදුරජාණන් වහන්සේ බ්‍රාහ්මණ මිහාකාර සැපත් හැර අඹුදරුවන් හඬ හඬා සිටිය දී තපසට පලට නික්මුනු ද සත්හැවිරිදි වයස නැයන් රඳව රඳවා සිටියදී ත් පියානන් වහන්සේ හා සමග පලා ගොස් එක්ව මහණ ව වැසි සුලං සීත පීඩා ඉවසා ඒ ඒ රුක්මුල් වල භාවනා කොට හිඳ අභිඥ ලදින් ධ්‍යාන කෙළී කොළ එක්ව ම ගොස් බඹලොව උපන් සේකු ත් මෙම රාහුල නම් පුතනුවන් වහන්සේ ම ය.

තව ද: උරග ජාතකයෙහි ශාක්‍යකුල හෙතු වූ මෙම බුදුරජාණන් වහන්සේ බ්‍රහමචාරිව ඉපද අයියේ ලකුණෙක් ලොව හික්මවා ශක්‍රයාගෙන් ධන පූජා ලත් සමයෙහි එක්සියක් ම දූහැමෙන් වැස පියාණන් මැනි ගුණ රක්‍ෂා කොට ගුණ ඇති ව සපියකු විසින් දශටකරණ ලදු ව මිය පවා පියාණන් වහන්සේට ශොක දුක් නුදුන් සේකුත් මෙම රාහුල නම් පුතනුවන් වහන්සේ ම ය.

තව ද: කුම්භකාර ජාතකයෙහි ශාක්‍යකුල බජ වූ මෙම බුදු රජාණන් වහන්සේ ජාතිභෙද දක්වනු සඳහා කුම්භකාර ජ්‍යෙෂ්ඨ ව ඉපද රජකුලෙන් බුදු වූ පසේබුදුන් සතර දෙනකු වහන්සේ අතින් බණ අසා ගිහිගෙයි උකටලි ව මහණවනු කැමැති ව මෙම පුතනුවන් වහන්සේ ඒ ජාතියෙහි පත් මැති කල භාගයිං වූ මෙම යශොධරා දේවින් ලඟට කැඳවා 'සොඳුර ගිහිගෙයි උකටලියෙමි. මහණ වන්නට දුන් ම වලව යෙමි'යි කී යශොධරාවෝ 'ස්වාමීනි! තොප පුතනුවන් අප දෙදෙනාගේ බලයෙක් ම වඩාගෙණ පසුව අපි තුන්දෙන ම එක් ව ගොස් කපස් කරමහ'යි කියා යැව්කල කොට බෝසතුන් දුන් ම යෙමි යි කියා නො ගිවිස්කා හෙයින් 'එ බැවින් ස්වාමීනි තොපගේ බිලිඳි පුතනුවන් මද ඇසිල්ලක් වඩා හිඳුවා, මං පැන් කළයක් ගෙණා කල ගිය මැහැවැ'යි මායම කියා බෝසතුන් අතට පුතනුවන් ඔබාලා තුමූ කළයක් අතට ගෙණ දෙර මිදුලට බැසලා නැවත ඈපස්ස බලා 'ස්වාමීනි! මා ආ විටෙක මුත් නුඹ පුතනුවන් හැර පලා නො යන්නැ'යි කරනොට ම කියාලා, තුමූ පලාගොස් "අප දෙදෙනා සමයේ බැඳි ගිය මේ දරුමල එකලා මා කරට නගාලා මේ පුරුෂයා නෙමෙ ගැලවී තපසට යනු කැමැති වන. සසර දුක් නම් ස්ත්‍රීත්වය ත් දුඛි ම ය. පුරුෂයන්ට ත් දුඛි ම ය. නිවන් නම් ස්ත්‍රීත්වය ත් මිහිර. පුරුෂයන්ට ත් මිහිර.

තව ද: පින්කල පුරුෂයෝ ශක්‍ර වෙත් ම ය. මාර වෙත් ම ය. චක්‍රවර්ති වෙත් ම ය. පසේබුදු වෙත් ම ය. ලොවුතුරා බුදු වෙත් ම ය. ස්ත්‍රීන් කෙතෙක් පින් කළ ත් ඒ සම්පත් නො ලැබෙත් ම ය. එසේ හෙයින් ස්ත්‍රීත්ව ලැබෙන්නෝ එක නිවන් සම්පත් ම ය මේ මේ කාරණයෙන් සසර ගැලවීම ස්ත්‍රීන්ට දුර්ලභ ම ය පුරුෂයන්ට සසර ගැලවීම් ආශචර්ය නො වේ ම ය. එසේ හෙයින් මොහු මා කරට දමමි යි සිතූ මල ම මොහු කරට දමාලා තපසට යෙමි" යි කළය බැද්දෙක ලා පියා පරිබ්‍රාජිකා වෙහෙරට ගොස් පැවිදිව සිල් රක්‍ෂා කළාහු ය.

බෝධිසත්වයෝ මඟ බල බලා හිඳ හායනීමින් නො එන හෙයින් තපසට ගියහ යි දැන 'මා වැනි වීර පුරුෂයකු සත්‍රියකට බැඳී ගිය සේ ඉතා නො යෙදේ'යි කියා කියා පුතනුවන් කෙරෙහි කළ ප්‍රේමයෙන් දැමියා මහලු ඇතකු සේ පය ඔසවා පලා යා නො හී සවනසනයෙන් ඈර පිය දුර පෑනී ඇද පුතනුවන් මිනත් වූ ප්‍රේම ඇති ව මහා පුතනුවන් ලූණු ඇඹුල් රස දැනගත් අවසථා වෙයි. 'ම පින් කුමාරයන් සේ ය. මා තැයීම ත් රක්ෂා විය හෙයි' දැන පුතනුවන් සිබ සනසා කුල කැයන් තැදවා පාවාදී තමන් වහන්සේ මලට ගොස් පැවිදි වී ධ්‍යාන උපදවා බඹලෝ ගොස් උපන් සේක. මෙසේ මිගණ කුමය ත් හැරපියා ගිනිහෙයි මැය මේ සඃ මහත් දුක් ගෙණ ප්‍රේම කොට වැඩූ සේ ත් මෙම රාහුල නම් පුතනුමින් වහන්සේ ම ය.

තව ද: මඛාදෙව ජාතකයෙහි ශාක්‍යකුල රත්නාකර වූ මෙම බුදුරජාණන් වහන්සේ මඛාදෙව නම් රජ ව බොහෝ දවසක් රාජ්‍යය කොට පලමුවන කාරණය දැන රාජ්‍යය හැර ගොස් මහණ ව ධ්‍යාන සුමයෙන් දමිස් යවූ කමයෙහි මඛාදෙව නම් පුත්‍ර ව එම රාජ්‍යය පරිපාලනය කොට සුවාසුදහසක් හවුරුදු මුළුල්ලෙහි රාජ්‍යය කොට එදැනුරෙහි පියාකන් වහන්සේම ගිවු පසසෙහි උපසථාන කළාවූ ඒ මඛාදෙව නම් පුතනුමන් වහන්සේ ද මෙම රාහුල නම් පුතනුවන් වහන්සේ ම ය.

තව ද: මහා සුදස්සන ජාතකයෙහි ශාක්‍යකුල චක්‍රවර්ති වූ මෙම බුදුරජාණන් වහන්සේ සප්තරත්නාධිපති වූ මහාසුදර්ශන නම් චක්‍රවර්ති රජ ව සතර මහ දිවයිනින් හා දෙදහසක් කොදිව්වලින් පිරුණා වූ මෙ සක්වල ගබ මුළුල්ලෙහි එකාතපත්‍රයෙන් රාජ්‍යය කොට චන්ද්‍ර-සූර්‍ය දිව්‍යපුත්‍රයන් සේ සියලු සතුන්ට ම පෙණී පෙණී සියලු සතුන් පඤ්චශීලය රක්ෂා කරවා ඉඳිනි ඒ පඤ්චශීලය නම්, රහස ත් බිඳපු සත්වයෙක් ඇත්නම් ඔහුගේ ඉස සත් කඩක්ව පැලී යන තරම් උග්‍ර වූ ආඥා තෙජස් ඇති ව දශවිධ වූ චක්‍රවර්ති ධර්මයන් පුරා රාජ්‍යය කළ සමයෙහි අම්ටින් පත්සියයක් ගොද නෙහී හිවි ගැමසී සිපීනා ඒ සා, චක්‍රවර්ති සේනාවෙහි මේ සත්තව යා හුදු පිළී නැමැත්තේ ය. මෙ සත්තවයා රත් පිළී නැමැත්තේ ය. මේ නිල් පිළී නැමැත්තේ ය. මේ රන්වන් පිළී නැමැත්තේ ය. මේ මෙසේ මෙසේ වූ ආභරණ නැමැත්තේ ය. මේ මෙසේ වූ මල්පලඳනා නැමැත්තේ ය. මේ මෙසේ වූ සුවඳ විලවුන් නැමැත්තේ ය. මේ මෙසේ වූ බාද්‍ය භොජ්‍ය නැමැත්තේ ය.

සතාදි වශයෙන් සියලු සතුන් කැමැති කැමැති දෙයින් සියලු සත්ත්වයන් සන්තොෂ කළා වූ පරිණායක රත්න ව දහසක් පුතුන් ව ජ්‍යෙෂ්ඨ වූ ඒ පුතනුවන් වහන්සේ ද මෙම රාහුල නම් පුතනුවන් වහන්සේ ම ය.

තව ද: කෙළවර වෙස්සන්තර ජාතකයෙහි ජූජක නම් බමුණා වංකගිරි පර්වතයට ගොස් 'ස්වාමීනි! නොස පුතු මට ගැති කොට දුන් දෙම' යි කී බස් අසා බා දිව ගොස් සිවුරැස් පොකුණෙහි සැඟවී සිටි කල "පුත! ජාලිය කුමාරයෙනි" යි පියාණන් වහන්සේ එනවිට ම බැණ නැගි බස අසා 'බමුණා මා ගැති කෙරෙ'ම යි මම ද බමුණා ම ගැතිවෙම්ම යි මා වැනි දරුමො ත් මපියාණන් වහන්සේ දෙව්වක් අඩංගාවද්ද"යි නෙලුම්පත් ඉසින් පිහිරා දිමිගොස් අවුදින් "ස්වාමීනි! මා කැමැත්තක් කළ මැනව"යි පියාණන් වහන්සේට දකුණත පැලු කිණරු වූ ජාලිය කුමාරයෝ නුවූ ද මෙම රාහුල නම් පුතනුවන් වහන්සේ ම ය.

මෙසේ පෙර බුදුන් කෙරෙහි කරණලද ප්‍රාර්ථනා ඇති හෙයිනු ත් ජාති කෝටියෙහි දරුව ම ආ හෙයිනු ත් ඔවුනොවුන්ට උපකාර ව ආ හෙයිනු ත් සසර ත් බුදුන්ට කිණරුව ම ආ හෙයිනු ත් "රාහුලයා ඉසකේ කපා මහණකරව"යි වදාළ වේලෙහි උත්තරයක් නො කියා "මපියාණන් වහන්සේ උතුම් වූ දායාදයක් අද මිට දෙන සේක් මැනැ"යි සිත සිතා සතුටු සතුටු ව සිටි සේක.

එ වේලෙහි දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ රාහුල කුමාරයන් ඉසකේ කපා මහණ කරවා වදාළ සේක.

ශුද්ධොදන රජ්ජුරුවෝ මුනුබුරානන් මහණ කළහ යි අසා මහත් වූ ශොක ඇතිවූවාහු ය. කාරණ කිම් දැ? යත්;

රාහුල කුමාරයන් උපන්දා ම පුතනුවන් වහන්සේ මහභිනික්මන් කොට නො කියා ම පලා ගිය හෙයින් පුතනුවන් වහන්සේ කෙරේ උපන් මහ ශොක ඇති ම ත් මුනුබුරානන්ගේ අතුල් පතුල් කත් කාශා පුතනුවන් වහන්සේ හා එක්වැනිය යි කිය කියා මුනුබුරාණන් සත සතා උන්ගේ සුරතල් බල බලා පුතනුවන් වහන්සේ කෙරෙහි උපදනා ශොක තුනී තුනී කොට විසූහ. එසේ හෙයින් එ දා රජ්ජුරුවන්ට මහමෙර සේ ශොක විය. රජ ශොක රඳවාගත නො හෙනුයේ කිපී බුදුන් කරා දිවගොස් මග හඬින් සඩ නඬා "සර්වඥයන් වහන්ස! තුඹවහන්සේගේ සසනය අවිචාරවත් යන්නෙක් ද, මවුපියන් කෙරෙහි සරු නො කරණ ශාසනයෙක් ද

නුඹවහන්සේ ත් මට නො කියා ම සොරා ම ගොස් මහණවූ සේක. මාගේ කුඩා පුතනුවන් නන්ද කුමාරයනු ත් උදුරාගෙණ මහණ කොට ගත් සේක. මා ම ඊබා ගත් මාගේ මුනුබුරාණන් රාහුල කුමාරයන් මට නො කියා ම මහණකළ සේ නො යෙදෙයි'' යනා දීන් බුදුන්ට මැසිවිලි කීහ.

එ කල බුදුහු ගිනිමැලයෙහි ඇල් වැසි වසන්නා සේ පියරජහට බණ වදාරා ශොක සන්හිඳුවා වදාළ සේක. රජ්ජුරුවෝ බණ අසා ශොක සන්හුන් කල ''ම පූතනුවන් වහන්ස, අද මට උපන් සාමූ දරු ශොක ය දරුවන් වැදූ සියලු දෙමවුපියන්ට නො මතු කැඹැක්කෙමි. මට ම අනුග්‍රහ සීසා නුඹවහන්සේගේ ශාසනයෙහි මවුපියන් අනු නො දන්නා මිසණ නෑරවිය නො හැක්කේ ය යි යන ශික්ෂාපදයෙකින් වරක් මට දුනමැනවැ''යි ආරාධනා කළහ. බුදුරජාණන් වහන්සේ පියරජහුගේ බස් අසා ''මහරජ මෙ තැන් පටන් මාගේ ශාසනයෙහි මා ඇති කල වේව යි නැති කල වේව යි දරු කෙණකුන් මවුපියන්ට නො කියා මහණ කළ නො හැක්කේ ය'' ශික්ෂාපද පණවා පියරජහු සතුටුකොට සිඹු දී රජගෙට ම යවා වදාළ සේක.

මෙසේ බුදුරජාණන් වහන්සේ කිඹුල්වතට වැඩි සත්වන දා රාහුල කුමාරයන් මහණ කරවා, අටවන දා උදෑසන භික්ෂුගණයා පිරිවරා පියරජහුගේ ගෙට වැඩ කැඳ අවුළුපස් වළඳා බත් වළඳන වේලා එකතුරෑ රජ්ජුරුවන් හා සාකච්ඡා කොට කොට වැඩහුන් සේක. එ කල ශුද්ධෝදන රජ්ජුරුවෝ ''ස්වාමීනි! නුඹවහන්සේ දුෂ්කරක්‍රියා පුරණ සමයෙහි දේවතාවක් එක් දවසක් රාත්‍රි භාගයෙහි අවුදින් මට කියන්නී: රජ්ජුරුවෙනි! තොප පුතනුවෝ සිද්ධාර්ථ කුමාරයෝ බත් නැතිව වියලී සක්මන් කෙළවර වැටී මළහ යි කීව; ඈග කී බස් අසා මම මාගේ පුතනුවෝ ලොවුතුරා බුදු ම වූ නො මියති යි කීමි. දෙවනු ව කීව. තුන්වනුව කීව. එසේ කීව ත් නො ගිවිස්සෙම ම වේදැ''යි කීහ.

බුදුහු එ කෙපුල් අසා ''මහරජ දැන් මා බුදුවන ජාතියෙහි තොප රහත්වන ජාතියෙහි මා මළහ යි කී බස් නො ගිවිස්සේ ආශ්චර්ය්‍ය නො වෙයි. පෙර ත් නො ගිවිස්සා ම වේදැ''යි වදාරා තුෂ්ණීම්භූත ව වැඩහුන් සේක.

එ වේලෙහි රජ්ජුරුවෝ හුනස්නෙන් නැඟී බුදුන් වැඳ ''මා පුතනුවන් වහන්ස! පෙර නුඹ මළහයි කී බස් මා නො ගිවිස්සේ කෙසේ දැ''යි විචාළහ.

එ කල බුදුරජාණන් වහන්සේ පියරජාණන්ට හැඟවී තුබූ මහ නිධානයක් පිධාන ය ගලවා දක්වන්නාසේ භවයෙක් පටිච්ඡන්නවූ භවාන්තරගතවූ තමන් වහන්සේ හා පියාණන් වහන්සේගේ පූර්ව චරිත සඞ්ඛ්‍යාතවූ ඉකුත්වත් දක්වා වදාළසේක. කෙසේ ද? යත්;

ගිය දවස කසීරට ධම්මපාල නම් ගමෙක මහා ධම්මපාල නම් ජ්‍යෙෂ්ඨයාන කෙනෙක් වූහ. උන්ගේ කුලයෙහි පවත් මෙසයෙන් කෙලි කොල්ලන් දක්වා ත්: ඇම දෙනම රා නො බොති. බොරු නො කියති. සොරකම් නො කෙරෙති. ප්‍රාණඝාත නො කෙරෙති. කේලාම් නො කියති. වාක්පරුෂ නො කියති. මහණ බමුණන් කෙරෙහි ආදර ඇතියාහ කුලදෙටුවන් පුදන්නාහ. මැඩිමහල්ලන් දැක උපසත නො සිඳිනාහ. පන්සිල් රකිති. පෙහෙවස් රකිති. නොයෙක් ප්‍රකාරයෙන් ම කුශල ධර්මය ම පාලනය කෙරෙති. එසේ හෙයින් ඒ කුලය ධම්පාල කුලය යි ප්‍රසිද්ධ ය. නම ද: ඒ කුල යෙහි සත්මුත්තෙන පවත් මෙසේ ම අවිච්ඡින්න ව පවත්නාවූ කුශල ධර්මයාගේ බලයෙන් ඒ කුලෙහි උපන් යම් කෙනෙක් පිළිසිඳ පවත් මවුකුසදී ත් නො මියති. ප්‍රසවකාලයෙහි ත් මවුන්ට දුක් නොදී අන්තරායක් නැතිව ම උපදිති. සිඟිතිකෙණෙකුත් කොර නො වෙති. පිළු නො වෙති. කණ නො වෙති. ගොළු නො වෙති. බිහිරි නො වෙති. කිසිම පියන පමණකුත් විවර රෝගි නො වෙති. මෙසේ නීරෝගි බැවින් මහලු ව මුත් අනන්තරායමරණෙක් සත් මුත්තන් පරම්පරායෙහි කිසි කෙණකුත්ගේ ත් නැත.

එ කල අපගේ අනන්‍යසාධාරණ ගුණගණමණි රත්නාලඞ්කෘත සුවිශුද්ධ ශුද්ධ බුද්ධාඞ්කුර ශ්‍රී මහා බෝධිසත්වයෝ ඒ මහා ධම්පාල නම් ජ්‍යෙෂ්ඨයානන් හට පුත්‍ර ව ඉපද ධම්පාල නම් කුමාරව සොළොස් හැවිරිදි කල දහසින් බැඳි පියලී ගෙණ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාර්යයන් දැක ගුරුපූජා කොට නොයෙක් ශිල්පයට පටන් ගෙණ පන්සියයක් අතැවැසියන් හා සමග ශිල්ප හදාරන්නාහ. එ කල දිසාපාමොක් ආචාර්යයන්ගේ කුඩා පුතනු කෙනෙක් එක්තරා එක් ව්‍යාධියෙකින් මළහ. ඔවුන් දමා අළු හස් කොට හැම නෑයන් හා අතැවැසියෝ හඬති. වලපිති. ධම්පාලයෝ නො හඬති. තොප නො හඬන කාරණ කිම්ද යි විචාළ හෙයින් අපගේ කුලෙහි බාල ව මියන්නෝ නැත. හැම දෙන ම මහලුව මියෙති. එසේ හෙයින් හැඬිමැ යි යන ව්‍යවහාර නො දනුමැයි කීහ.

ආචාර්යයී ඒ තෙපුල් අසා ආශ්චර්යයී වූ සිත් ඇතිව ඒ ධම්පාලයන්ගේ කුලයට ගොස් ආයු බොහෝ වන ධර්මයත් මම උගනිමි යි සිතාලා පරීක්ෂා කරන්නාහු එළුවකු මළ තෙනින් ඇට පුහන් ඇරගෙණ ගොඩාපියා සුවඳ කවා ලා පසියෙහි ලා ගෙණ අතැවැස්සන්ට ගෝරා එක්තරා අතැවැස්සෙකු හා සමග පත් කුඩයක් ගෙණ ඒ ධම්පාලයන්ගේ ගමට ගියහ. ඒ ධම්පාලයන්ගේ පිරිවර ජනයෝ ආචාර්යයන් පෙරමගට ගොස් වැඩිමාලු යොමෙණකැ යි ආදර කොට අතින් පත්කුඩය ගත්හ. ආචාර්යයී ධම්පාලයන්ගේ දොරකඩට ගොස් "තමන් පුතනුවන් ධම්පාල කුමාරයන් අකුරු කැර වූ ආචාරී ආ වතැ යි" කියා යවූහ. මහාධම්පාලයෝ ඒ තෙපුල් අසා පෙරමගට අවුදින් ආචාරීන් තමන්ගේ ඇතුළු ගෙට ගෙණ ගොස් හස්පතක හිඳුවා පය සෝධා උපචාර කොට බත්පැන් විචාරා සැදු කළහ.

ඉක්බිත්තෙන් දියාපාමොක් ආචාර්යයී මහාධම්පාලයන් තමන් ලඟට කැඳවා "තොපට මළකෙණකුන්ගේ අස්තක් කියා අයිමි. සියලු සත්ත්වයෝ ම මරණෙන් නැසෙන්නාහු ම ය. එසේ හෙයින් ධම්පාලයෙනි! මා කියන බසට ශෝක නො කරව. තොප පුතනුවන් ධම්පාලයන් මා කරා අකුරට සිටවුත් දූත අෂ්ටාදශ ශිල්පයන් හා සූසැට කලා ශිල්පයන් උගන්වා නිමවා ලීමි. තොප දරුවෝ ඉතා නුවණැතියහ ඉතා ගුණ ඇතියහ. ඉතා යෙදී සියහ. මොබ එක අවතියෙහි ලෙඩක්වෙලා මිය ගියාහු ය. දූත් උන් දමාපියා ආමි. යහළු මහා ධම්පාලයෙනි! ශෝක නො ගණුව" යි කීහ

ධම්පාලයෝ ඒ තෙපුල් අසා සැත හැණී ම ඇතයේ අත් ගසා අඩගා හුනහ ආචාර්යයී ඔහු නො ගිවිසී යේ දූත පසුඹියෙහි තුබූ එළු ඇට මැත්තොට ලා "බොරු කීහ යි සිතූ ද, තොප පුතනුවන් මළ තෙන තුබූ මේ ඇට බලව" යි කියා පෑහ. ධම්පාලයෝ "මේ බලූ ඇට හෝ එළු ඇට ය. ම පුතුනුවන්ගේ ඇට නො වෙයි. මාගේ කුලෙහි සත් මුත්තෙක පටන් මාලු ව මූත් බාල ව මළ කෙණෙක් නැත එසේ හෙයින් නො ගිවිසිමි" යි කියා නැවත හුනහ. ඉක්බිත්තෙන් ආචාරී නො ගිවිස්නා යේ දූත සතුටුව "මම තොප පරීක්ෂා කරණු පිණිස කීමි. තොප පුතනුවෝ සුවෙන් උන්හ. යාළු තොපගේ කුලෙහි ආයු බොහෝ වන ධර්මයත් මා උගන්ම" යි කීහ. ඒ කල ධම්පාලයෝ තමන්ගේ කුලධර්මයන් කියන්නාහු:—

පුබ්බෙව දාතා සුමනා භවාම
දදම්පි වෙ අත්තමනා භවාම,
දත්වාපි වෙ නානුතපාම පච්ඡා
තස්මා හි අම්හං දහරා න මීයරෙ-ති.

යනාදි වචනයෙන් තමන්ගේ කුල ධර්මය කීවාහු ය. දිශාපාමොක් ඇචාරී ඒ ධර්මය ඉගෙණ තක්සලා නුවරට ගියාහු ය. මහ රජ! එ කල මහාධර්මපාලයෝ නම් සොම් ය, පුත්කුමරෝ නම් මම ම ය. එපරත් මා මළහයි කී බොරු බස් අසා නො සිටියේ ම මේ ද යි ඔදුණු මේ මහාධර්මපාල ජාතකය පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළ සේක.

එ කෙණෙකි ශුද්ධෝදන රජ්ජුරුවෝ ම පුත්කුමරුන් වහන්සේගේ දූත් මතු නො වෙසි. පෙරත් මට දරු වූ සේක් ම ය යි උපන් සන්තොෂයෙන් අනාගාමි මාර්ගයට පැමිණියාහු ය.

මෙසේ බුදුන් පළමුව සිඟාවැඩි ද වීථියෙහි දී වදාළ ගාථා දෙක අසා සෝවාන්-සකෘදාගැමි වූහ; මේ ධර්මපාල ජාතකය අසා අනාගැමි වූහ. පසු ව පිරිනිවන් පානා ද දළුපුඩු ශ්වෙතඡත්‍රයෙන් යුක්ත වූ යහනේ වැදහෙව අමාමහනිවන් දුටුවාහු ය යි දතයුතු.

මෙසේ මාගේ ස්වාමිදරුවෝ පළමුවන ගමනෙහි කිඹුල්වත් පුරයට වැඩ දෙවන ද මහාප්‍රාතිහාර්යයෙන් සිඟා වැඩ ඒ පෙළහරෙහි විස්මයපත් වූ බොහෝ සත්ත්වයන් විසින් කරණලද අප්‍රමාණ වූ සාධුනාද ස්තුතිමඞ්ගල පූජා ය, තුන්වන ද එසේ ම පෙළහරින් සිඟා වැඩ ඒ මඟුලෙහි නන්ද මහතෙරුන් මහණකොට එ තැන් පටන් ඔවුන් විසින් කරණලද ජීවිතාන්ත ප්‍රතිපත්ති පූජා ය, සත්වන දවස ද එම පෙළහරින් සිඟා වැඩ රාහුල් තෙරුන් මහණ කොට ඔවුන් විසින් කරණ ලද මනොහර වූ ප්‍රතිපත්ති පූජා ය, පියමහ රජ්ජුරුවන් තුන්මග තුන්ඵලයෙහි පිහිටුවා ඔවුන් විසිනුදු කරණ ලද අප්‍රමාණ වූ චතුර්විධ ප්‍රත්‍යයදාන පූජාය, නමස්කාර පූජා ය, ප්‍රතිපත්ති පූජා ය යි යනාදි වශයෙන් සංඛ්‍යාපථයට අවිෂය වූ බොහෝ වූ අද්භූත වූ පූජාවන් ලත් හෙයිනු ත් එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත් "අග්ගී පූජානං" යනු හෙයිනු ත් මාගේ බුදුහු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලදුයේ මැ යි:

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං-ති.

මේ පූජාවලියෙහි අප බුදුන් කිඹුල්වත් නුවරදී ලත්,
අද්භූත පූජාකථා නම් වූ
සොළොස් වන පරිච්ඡෙදය නිමි.

සතළොස්වන පරිච්ඡේදය

තව ද අප බුදුන් සැවැත්නුවර දී අනේපිඬු මහ සිටාණන්ගෙන් ලද ජේතවනාරාම පූජා නම් කවරහ? යත්;

මෙසේ බුදුරජාණන්වහන්සේ පළමුවන ගමනෙහි ම මගධ රජානන්වහන්සේ තුන්මින තුන්ඵලයෙහි පිහිටුවා, සඟපිරිස් පිරිවරා, ඒ කිඹුල්වත් නුවරින් නික්ම විසිදහසක් රහතන් පිරිවරා රජගහා නුවර වැඩ එහි සිහ නම් මහාවෙනෙහි වසන සේක. එ කල රජගහා නුවර ධනසිටාණකෙනෙක් ඇතියහ. ඔවුන්ගේ නැගණියෝ සැවැත්නුවර අනේපිඬු මහසිටාණන් කෙරෙහි වෙසෙති. ඔවුන්ගේ නැගණියෝ රජගහා නුවර සිටාණන් කෙරෙහි වෙසෙති. එසේ හෙයින් ඔහු දෙදෙන ගිහිපිළිසකා වූ හුහුරුබෑනු, මුත. එසේහෙයින් ඔහු දෙදෙන තමන් තමන්ගේ නුවරක් පත් සිය පත්සිය බඩුගැල් ගෙණ ඔවුනොවුන්ගේ නුවර ගොස් විකොට එති. නොවිකා නම් ඔවුනොවුන්ගේ ගෙවලම දී යෙති. ඔවුනොවුන්ගේ නුවරට ඔවුනොවුන් වදිනා දවස් ඔවුනොවුන් පෙරමගට ගොස් ගොදෙනෙක පමණ මගපෙළහරින් නුවරට ගෙණෙති. මෙසේ වසන කල අනේපිඬුමහසිටාණෝ සැවැත්නුවර සිට රජගහානුවර ගොස් ගොදෙනෙක සිට තමන් ආ පමණ පෙරසේ ම කියා යවමාහුය.

එදවස් නම රජගහා නුවර සිටාණන් බුදුන් කරා ගොස් බණ අසා සෙට දවසට පවරා අවුත් මහත් වූ දන පිළියෙළයෙහි යෙදී අවකාශයක් නිසිවකු ත් නැති දවසෙක. එසේ හෙයින් සිටාණන් ආ පවත් කියාගතහුනුමෝ නැත. එ කල අනේපිඬුමහසිටාණෝ දන් එයි, දැන් එකී යි පෙරමග බල බලා වෙසෙහි නො එන හෙයින් මග දී දක්නමෝ වේ දෝ හෝ සිතා එන්නාහු මගදී ත් නු දුටුමාහු මාසල දී දකිමි යි සිතා එන්නාහු එසේ ත් නො දුක මිදුලෙහි දී දක්නෙම් වේ දෝ යි සිතා දොර මිදුලට ත් ගොස් එසේ ත් නො දුක සිටාණන්ම යම්කිසි ව්‍යසනයෙක් ඇති වනැයි සිතා ගොස් ඇතුළු ගෙට වන්හ. එකල සිටාණෝ අනේපිඬුමහසිටාණන් දක සැමිවි කථා කරන්ට අවකාශ නැති හෙයින් සිපාගෙණ පියා "කිමෙක් ද? සිටාණෙනි! මග කිදුක් ව සැපයේ පලා ආදු ද, බාලයන්ට දුක් නැද්දු" යි යන මේ දෙබස විතරකින් සාදකොට පෙසු කථාවක් නො කොට "උදුත් බදුව. දර ගෙණෙම යෑන් ගෙණෙම වෙසෙස් මෙයින් ඛාද්‍යභොජ්‍ය සම්පාදනය කරව" යි යනාදි වසයෙන් අප්‍රමාද ව දන පිළියෙළ කොට සවස අනේපිඬුමහසිටාණන් කරා ගොස් සුවදුක් කථාවෙන් සත්හිදී හුන්හ.

අනේපිඩුමහසිටාණෝ කියන්නාහු "සිටාණෙනි! පෙර මා මේ නුවරට ආ කල පෙරගමින් කොට යොදුනක් තැන් ගොස් මහත් වූ සන්තොෂයෙන් පිළිගන්නාහ. අද මට පෙරගමනු ත් නො කළෙව. සත්කාරයකු ත් නො කළෙව. මා හා කැටිව සාකච්ඡාවකු ත් නො කළෙව. මහත් වූ මඞ්ගල විධානයක් ම කරව. අද නොහොත් ගෙයි ආවාහ විවාහාදි මහාමඞ්ගල දිනයෙක් ද? මේ නුවර රජ්ජුරුවන් හා මහ සෙනඟට සෙට අමුතු බතක් දෙව් ද? නොහොත් මහත් යාගයක් කරව් දැ"යි විචාළාහ. එ වේලෙහි රජගහානුවර සිටාණෝ අනේපිඩු මහසිටාණන්ට කියන්නාහු "සඟළු කෙණි නො ඇසූද, සුද්ධෝදන මහරජානන් දරු සිදුහත් කුමාරයෝ දුන් ලොවුතුරා බුදුවූහ. දහම්වැසි වස්වා විනයජනසත්ත්වයන් සන්තොෂ කරමින් සිටි සහ. දෙව්බඹුන් තමන්ගේ ශ්‍රීපාදමූලයට ගෙන්වා කුලගැත්තන් සේ මෙහෙ ගන්නිමින් සිටියහ. එසේ වූ බුදුඋතුමාණෝ දුන් අපගේ සිත වෙතෙහි වාසයකරණ සේක. මම ඒ බුදුන් කරා ගොස් බණ අසා දහම් අමා උයා බී මත් ම සෙට ඒ බුදුන්ම පසදන් දෙම් සි උම්තුවූවාහු නොප හා කුමන සාකච්ඡා කෙරෙම්දැ"යි කීහ.

එ වේලෙහි අනේපිඩුමහසිටාණෝ කමතු දු පෙර බුදුන් දැක පින් රැස්කොට ආ මහ පින්පිඩානන් සෙහිණි හිරුරැස් කලඹක් සා සම්භ සන්තොෂ වූ මහ පියුමක් සේ බුදුහු ය යි කී වචනය හා සමග උපන් මහා සන්තොෂයෙන් සකල ශරීරය පුරා ලොමු දැහැ ගන්වමින් ඉතා විස්මයව පත් ම සඟළු සො වලුනා කියම. බුදු කෙණෙක් ම දැ"යි විචාළහ. බුදුකෙණෙක් ම ය යි කීහ. දෙවනු ව තුන්වනුව ත් විචාළහ; දෙවනුව ත් තුන්වනුව ත් බුදුහු ම ය යි කීහ. එ වේලෙහි අනේපිඩුමහසිටාණෝ "මා ඇසූයේ ඉතා අද්භූත වූ වචනයෙක. කල්ප කොටියකිනු ත් ලැබගත හැක්කාවූ වචනයෙක් නො වෙයි. මට වූයේ වැඩෙයා. මා මෙ නුවරට ආයේ ම යෙනෙකැයි "සඟළුව මට සිනැ ඇතිසා නම් දුන් ම මා ගෙන ගොස් බුදුන් දක්වා පියව"යි කීහ. එ බසට සිටාණෝ කියන්නාහු 'බුදුන් සිතූ සිතූ විට ම දක්නට නො හැක්ක. නො වේලෙහි ගිය කෙණෙක් ඇත්නම් බුදුහු බුධාසනයෙහි වැඩහිඳ ත්, ගන්ධකුටියෙහි වැඩහිඳ ත්, ගන්ධමාලකයෙහි වැඩහිට ත් නො පෑණෙන සේක් ම ය; බ්‍යාන සුව යෙන් හෝ වැඩහිඳිනා සේක. දෙව්ගනට ඔබුන්ට, පෑන සෝ වදාරණ සේක. සක්දෙව්රජහු වැනියෝ පවා නො වේලෙහි බුදුන් කරා ගොස් දැකගත නො හී ආපස්සෙහි පලායෙති. බුදුන්ගේ

අදහස් දක නො හැක්ක. බුදුහු සීවථිකාවක් සමීපයෙහි ත් වසන සේක. මේ මේ කාරණයෙන් බුදුන් දැකිමට මේ වේලාවකුත් නො වෙයි. හෙට උදෑසන ම කැඳවා ගෙණ ගොස් බුදුන් දක්වාලමි. අද එක රැයට සැතපී ගණුව"යි කියා සත්හිඳුවා සිටානන් සත්බුමු මහපායෙහි මතුමාලේ යහන් ගබඩාවේ සැතැප්පූහ.

එ කල අනේපිඬුමහසිටාණෝ ද බුදුන්ගේ නම ඇසූ වේලෙහි පටන් කිසි භාණ්ඩයන්ගේ විධානයකු දු නො කොට කිසි පරිවාර ජනයන් හා ගණනුන් ලා ත් කථාවක් නො කොට බුද්ධාලම්බන ප්‍රීති නමැති අමා දිය උකා බීමෙන් මුසපත්ව ගියා සේ "බුද්ධෝ-බුද්ධෝ"යි කියා කියා යානේ මැදගෙව මෙතෙක් දවස් සේ තිය පැයකින් හිරු නො නැඟී. අද කිප පැයකින් පහන් වී නම් යෙහෙකැයි සිත සිත නිදන්නාහු පළමුවන යම සිහිනෙන් පහන් ව ගියා සේ දැක ඇස් දල්වා බුද්ධාලම්බන ප්‍රීති ශ්‍රද්ධාවෙන් පහන් දහස් දල්වූවා සේ ශෝභන දැක "සැබවින් පහන් ම ගිය ඉර පැනනංගේ මත. කල් යවා නිඳු පිම් වන. මා කොල් කිමෙක් දැ"යි සිත සිතා ගබඩාවෙහි දොර හැර ගොස් සඳල්ලට බැස අහස බලා නැගෙණ හිරක් නො දැක මුදුන බලා සඳ දැක සඳු පියමර බලා දසපෑ ගියේ ය යි දැක නැවත ගබඩාවට වැද නිදන්නාහු දෙවන යමෙහි දු එසේ ම ආලෝක දැක දොරට ගොස් බලා පිසිපෑ ගියේ ය යි දැක, නැවත ගබඩාවට වැද නිදන්නාහු තුන්වන යාමයෙහි දු එසේ ම ආලෝක දැක පහන් නුවූ බැව් දැක අලුයම් රාත්‍රියෙහි දුටු ආලෝකයෙන් සැබවින් ම පහන් වී ම ය යි සිතා බුදුන් කරා යෙමි යි නික්මුනාහ. එ කෙණෙහි සිටානන්ගේ ශ්‍රද්ධාබලයෙන් දෙවියෝ ම තුණුරුවන්ට නමන්ගේ ගෙදොර විවෘතගත කරණ මනතාතෝ ය යි සිටානන් කෙරෙහි පැහැද සත්මාලෙහි මහ දොර සත ම හැර මග අලුකොට එකාබද්ධ කළහ.

එ වේලෙහි අනේපිඬුමහසිටාණෝ මහ වාසලින් පිටත් ව අමු සොහොනකට පැමිණ පළමුවන පයින් එක් මිනියෙක පෑකිළ, දෙවන පයින් අනික් මිනියෙක පෑකිළුනාහ. එ වේලෙහි සිටානන් පයට මිනිය අති සිසිල් ව වැටහින. කුණප ගන්ධය ද නාසයට පැනනැංග. නිලමැස්සෝ ද කිලදී නැංගහ. එ කෙණෙහි මිනිකුණපයෙක් වනැ යි උපන්නාවූ මහාප්‍රතිකූලචිත්තයෙන් බුද්ධාලම්බන ප්‍රීතිචිත්තය පසුබට විය. එසේ හෙයින් සිටානන්ට උපන් ආලෝක අන්තර්ධාන විය. දසදික් අඳුරු විය. එ වේලෙහි සිටාණෝ රාත්‍රිය බවු

දැන අමුසොහොනට පැමිණියෙමි යි සිතා මහත් වූ භය උපද ආපසු යෙමි යි සිතා මඳක් පසුබටහ. එ වේලෙහි ඒ සීවපිකාව සමීපයෙහි රුක වසන [1] සීවක නම් සෝවාන් දෙවතාවා සිවාහන්ට උපන් භය දැන "මතු බුදුන්ට අග්‍රඋපස්ථායක වන පින්වත් සිවාහන්ට අනුබල වෙමි"යි සිතා ආකාශයෙහි විදුලියක් සේ සිවාහන්ට පෙණී කිංකිණිනාදයක් සේ මධුර වූ නාදයෙන් "යහළු සිවාහෙනි! භය නො ගණුව"යි කීහ.

"සතං හත්ථී සතං අස්සා-සතං අස්සතරී රථා,
සතං කඤ්ඤා සහස්සානි-ආමුත්තමණිකුණ්ඩලා;
එකස්ස පදවීතිහාරස්ස--කලං නාග්ඝන්ති සොළසිං"යි.

යන මේ ගාථාව කියා "යමෙක් ඇතුන් ලක්ෂයක්, අසුන් ලක්ෂයක්, රථ ලක්ෂයක්, දෙව්ගනන් බඳු වූ වරඟනන් ලක්ෂයක්, යාචකයන්ට දන් දුන්නේ වී නම් එතෙක් මූ දන විපාකයට ත් වඩා යමෙක් තුණුරුවන් අරභයා වඩින්ට යෙමි. බණ අසන්ට යෙමි යි වෙහෙර කට යේ නම් ඔහු සන්හිඳී යන ගමනෙහි එක් පියවරක් ඔසවා තුබූ කල ඒ පය අග්‍රාඞ්ගුලිය පටන් සිටි පියවර අග්‍රාඞ්ගුලිය දක්වා අනන්තරයෙහි මුෂ්ටිරත්න ප්‍රමාණ වූ පදවීතිහාර නම් භූමිය සොළොස් කොට්ඨාසයක් කොට එයින් එක් භාගයක් ගෙණ, එයි දු සොළොස් භාගයක් කොට මෙසේ මෙසේ ම සොළොස් වාරයක් බෙදූ කල අස්ලොමක් පමණ ඉතා සූක්ෂ්ම වූ භූමියෙක් වෙයි. ඒ එක භූමියෙන් ජනිත වූ කුසල සම්භාරය ම සුවහස් ගණින් වඩ නේම ය. සිවාහෙනි, නො මැලිව යව, දැක් ම ගොස් බුදුන් දකුව, ආපසු නො යව නො යව"යි කීහ. එබසට අනේපිඬු මහසිටාණෝ අහස බලා දෙවතාවා දැක "මම මෙතැන් පටන් එකලා නො වෙමි. දෙවියෝ ත් මා හා සමඟ ඇත්තාහු ය"යි උපන් භය සන්හිඳුවා නැවත බුද්ධාලම්බන ප්‍රීතිසන්තානය උපදවා ගෙණ පෙර සේ ම ආලෝක දැක ඉදිරියට යන්නාහු නැවත දෙවාරයෙහි ත් මිනී යෙක පැකිළුනාහ. එවේලෙහි ද උපන් භය දෙවතාවා ම සන්හිඳ විය. තව ද ගොස් තුන්වන වාරයෙහි දු මිනියෙක පැකිළුනාහ එ වේලෙහි දු උපන් භය දෙවතාවා ම සන්හිඳවි ය.

මෙසේ සිවාහෝ දෙවියන්ගේ බලයෙන් හා ශ්‍රද්ධාවෙහි බල යෙන් අලුයම රාත්‍රියෙහි බුදුන් හුන් වෙහෙරට ගොස් බුදුන් නොදැක ම සිතන්නාහු "මේ ලෝකයෙහි ඇපි බුදුම්හ, ඇපි බුදුම්හයි කියා ඇවිදිනෝ බොහෙව. ඉදින් මොහු සැබෑ බුදුවරයෙක් වූ

1. සීවට්ටක

නම් මාගේ මවුපියන් තුබූ නම් මා මුත් මාගේ අඹුදරුවො ත් නො දක්නාහ. කුල නමින් මට ආමන්ත්‍රණය කොට මා හා සමග කථා කළෝ නම් ඔවුන් සබා බුදුකෙණකුන් නිසා ය. එසේ කළෝ නම් ඔවුන් වදිමි. පුදමි. සත්කාර කෙරෙමි. නම් කියාගත නුහුනුවෝ නම් ඔවුන් නො වදිමි. නො පුදමි. සත්කාර නො කෙරෙමි. ආපස්සේ යෙමි" යි සිතූහ. එවේලෙහි මාගේ ස්වාමිදරුවෝ ඒ එක සමයෙකු සබා අනන්තාපරියන්ත ලෝකධාතුයෙහි සත්ත්වයන් සිතූ සිත සමන්තචක්ෂුස්සේයේ එක සිතින් දැනගන්නා තරම් අසාධාරණ වූ බුද්ධඥාන ඇති හෙයින් සිටාණන් සිතූ සිත කරතලාමලකයක් සේ දැන සිටාණන් කෙරෙහි උපන්නාවූ මහත්වූ කරුණා ඇති ව "මා වැනි ශාසනාවක්හට අග්‍රඋපස්ථායක වෙමි යි ප්‍රාර්ථනා කොට ආ පුණ්‍යවන්තයා පෙරමගට මම ම යෙමි" යි සිතා ගන්ධකුටියෙන් බැහැ ව සක්මන් කොට කොට ගන්ධමණ්ඩලමාලකයෙහි වැඩසිට ප්‍රියපුත්‍රයකුහු ම එන පෙරමග බලන පෙම්බර මවක් සේ සිටාණන් පෙරමග බලා සිට සිටාණන් දැක සක්මනින් ගොස් උන්ට අභිමුඛ ව බුද්ධාසනයෙහි වැඩ සිඳ එ දවස් තමන් වහන්සේ ම සිටාණනන්ට නම කථාලුවා සේ "සුදත්තය! මෙසේ මෑතරා පලා වර" යි වදාළ සේක.

එ වේලෙහි සිටාණෝ සුදත්තය යි කී බස කණ ගීම හා සමගම බුදුන් සබා බුදුන් බව ත්, සව්නේ ගෙමා දත් බව ත් විශේෂයෙන් දැන පහන් දිය විලක් සේ බුදුන් කෙරේ පැහැද බුදුන් කරා දිව ගොස් අමාවිලක් දුටු පිපාසිතයකු සේ බුදුන්ගේ චරණනඛ මයූඛ නමැති අමාවිල්හි ගැලී ගැලී සිත් සනහ සනහා පසග පිහිටුවා වැද එකත්පස් ව දෙඅත් මුදුනේ දී හිඳ සඳට අභිමුඛ ව සුපුෂ්පිත වූ කොමුද වනයක් සේ තමන්ගේ ප්‍රීතීන් ප්‍රබුද්ධ වූ මුඛයෙන් බුදුන්ගේ මුඛ චන්ද්‍රයා බල බලා "කිමෙක් ද? ස්වාමිනි සව්නේ ගෙවා දත් බුදුරජාණෙනි! මා උපන් දවස් නම තුබූදු නුඹ ද? මාගේ නම කවුරු නුඹට කියාලූ ද? ඒ එක බසින් ම නුඹ ලොවුතුරා බුදුබව දත්මි. කසති ඝානාති වීණාවක් කණ හුනුවා වූ ඇත් පොච්චකු සේ ම මම ද නුඹවහන්සේගේ මධුර නාද ය කණ හුනු වේලෙහි පමණක් සබ්දයෙහි මත්විමි. එසේ හෙයින් මෙ වේලෙහි පටන් මාගේ ජීවිතාන්තය දක්වා නුඹවහන්සේට කුලගැති වීමි. කිමෙක් ද? ස්වාමිනි! රාත්‍රියෙහි දවස්හි සුවෙන් සැතපුනු සේක් දැ? යි විචාළහ. එ වේලෙහි ස්වාමිදරුවෝ මතුරෙහි යන එකකුගෙන් පෙණීගිය අවයම්ය්‍ය නොහැර ම ගසා අල්වාගෙණ ගොඩට නමා කරා නයාගන්නාවූ වීර පුරුෂයකු සේ බුදුන් හුන් කී බස ම ගෙණ ඔහට බණ කියා ඔහු සසර සයුරෙන් ගොඩනගා ගන්මි යි සිතා:-

"සබ්බදා වෙ සුඛං සෙති-බ්‍රාහ්මණො පරිනිබ්බුතො,
යො න ලිම්පති කාමෙසු-සීතිභූතො නිරූපධි.

සබ්බා ආසත්තියො ඡෙත්වා-විනෙය්‍ය හදයෙ දරං,
උපසන්තො සුඛං සෙති-සන්තිං පප්පුය්‍ය චෙතසො"යි.

යන මේ ගාථා දෙකින් "එසේ ය, සිටාණෙනි! යමෙක් සවාසනා කෙලෙසුන් නසා ශාන්තියට පැමිණියෙක් සුවසෙන් සැත පෙන්නේ වේ දැ"යි වදරා සිටාණන්ට අනුරූප වූ ධර්මදෙශනා කළ සේක. එ වේලෙහි සිටාණෝ ඍළුදහසක් කෙලෙසුන් ගෙවා දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටා එවේලෙහි වීදුරු පොළොවෙක ගලා හිඳු වූ ඉන්ද්‍රඛීලයක් සේ බුද්ධශාසනයෙහි ස්ථිර ව පිහිටියා වූ අචල ශ්‍රද්ධා ඇති ව බුදුන්ට ශතසහස්‍ර වචනයෙන් ස්තුති කොට "ස්වාමීනි! ගැත්තවු මෙ නුවරට ආගන්තුක ම ඇම ත් මාගේ ශ්‍රද්ධා පමණ දානයක් දී ලන්නා කැමැත්තෙමි. සෙට දවසට ගැත්තවුට අනුග්‍රහ කළ මැනවැ"යි බුදුන් පවරාලා සුහුරු බෑනු සිටාණන්ගේ ගෙට ගොසින් නො එක් භාණ්ඩයෙන් පරීක්ෂා කොට දානසම්භාරයක් රැස්කරන්ට පටන් ගත්හ.

ඒ සිටාණෝ එපවත් දැන "තෙපි ගහළු මෙ නුවරට ආගන්තුක සව. මම මෙ වාසිකයෙමි. තොපගේ නුවර දී මා කළමනා යම් දෙයක් තොපට ම භාරවේ ද? එසේ හෙයින් මාගේ නුවර දී තොප කළමනා දෙය මට ම භාර ය. තොප මාරුවෙහි, දානපරිත්‍යාගය මාගෙන් ම කෙරෙමි යි. තොපි සෙසෙහන් හිඳුව"යි කීහ. අනේපිඬු මහසිටාණෝ එසේ නොකෙරෙමි යි. මාගේ පන්සියයක් ගැල් පුරාගෙණ බඩු එක දවසක් තබා තුන්මසක් ම දන් සඳහා ත් දාන පරිත්‍යාගයට ඇත. මාගෙන් ම දෙමි යි කියා නො ගිවිස්සාහ. එකල රජගහනුවර අසූදහසක් නියම්ගම්වල නායක වූ නේගම ජ්‍යෙෂ්ඨයාණෝ ද අනේපිඬුමහසිටාණන් හා අති විශ්වාස ම හිඳි නෑහු එ පවත් අසා අවුදින් "ගහළු! සියලු දානොපකරණ මා ගෙන් ගණුම"යි කීහ, උන්ගෙනු දු කිසිවක් නො ගත්හ.

බිම්බිසාර රජ්ජුරුවෝ ද "තොපගේ ගමක් කොව ත්, අපගේ භාණ්ඩාගාරයෙන් සියලු පරිත්‍යාග ගෙණ දන්දී ගණුව"යි කීහ. ස්වාමිනි, සියල්ල ම මාගෙන්ම සපයමි. අඩුයෙක් ඇත්නම් සැල කරන්නෙම් වේ දැ යි මායමින් රජ්ජුරුවනු දු යවා තමන්ගේ ම පරිවාර ජනයන් ඇරගෙණ ගිහි දර පැන් ලිප්ගල් දක්වා ත් මිල දී ම ඇරගෙණ මහදන් සරහා, දෙවන දවස් බුදුන් වඩාගෙණවුත්



අනේපිඬු සිටුතුමා ජේතවනෝද්‍යාන භූමියෙහි කහවණු ඇතිරවීම
340 පිට බලන්න. (21-22)

තමන්ගේ නෑගනියන්ගේ මහා පායෙහිදී ම බුදුන් ප්‍රධානවූ විසි දහසක් මහරහතන් වළඳවා වළඳා අනන්තයෙහි "ස්වාමීනි, අපගේ සැවැත්නුවර නම් ඉතා රම්‍ය වූ නගරයෙක. සත්පණස් කෙළ ලක්‍ෂයක් කුල ඇතියේ ය. සත්කෙළක් මනුෂ්‍යයෝ ඇතියාහ. අවුරුදු පතා ලක්‍ෂ නිමක අසූදහසක් නියම්ගම් ඇතියේ ය. තුන් තුන් සියක් යොදුන් කසී-කොසොල් දෙරටින් නුවරට සතර දිගින් වදිනා අය මහමුහුදු රළපෙළ දිවන්නා සේ මුත් අනික් උපමායෙක් නැත. ස්වාමීනි, අපගේ නුවරට වැඩවදාළමනොතින් ගැත්තවුන්ගේ කෙළ ගණන් ධන නිධාන කොට තිබෙයි. කෙළගණන් ධන නය පොළී පිට තිබෙයි. කෙළගණන් ධන අනුභවයට තිබෙයි. මුතුන් මිමුතුන් රැස්කළ ධන මෙතෙකැ යි පමණ නැත. එයින් අටළොස් කෙළක් ධන නය දුන් තැන් නැති ව ගියේ ය. අටළොස් කෙළක් ධන නිධාන කළ තැන මුහුදුබත් වී ය. ගැත්තවුන්ගේ එසේ නිෂ්ප්‍රයෝජනව නස්නා වූ සිවූ සැපත ස්වාමිදරුවන්ගේ සසුන් නමැති කුඹුරෙහි ඉස පියනු කැමැත්තෙමි" යි ආරාධනා කළහ. එවේලෙහි අනන්තා පරියන්ත වූ බුදුන් සද්ධර්මප්‍රවාහ කළා වූ ධ්‍යාන ක්‍රීඩා මණ්ඩපයක්ම නිශ්‍රාව දැන වදාරා එ නුවරට මාත් ගියමනා කල් ම ය යි සිතා "සිටාණෙනි! සර්වඥවරයෝ නම් ශූන්‍යාගාරයෙහි රමණය කරන්නාහු නො වෙත් දැ" යි වදාළ සේක.

එ වේලෙහි සිටාණෝ බුදුන් වදාළ අභිප්‍රායෙන් "බුදුහු මා ලවා වෙහෙරක් කරවනු කැමැති සේකැ" යි දැන "අදහස් දනිමි. ස්වාමීනි! වෙහෙරක් කරවාලා ගැත්තවූ ආරාධනා කොට එවූ කල වැඩවදාළ මැනැවැ" යි ආරාධනා කොට බුදුන් අතින් සියලු ප්‍රතිඥා ලදින් බුදුන් වැඳ සමුගෙණ තමන්ගේ නුවරට යන්නාහු මගයොදනෙන් යොදනෙහි මනුෂ්‍යයන් රැස්කොට "මනුෂ්‍යයෙනි! බුදුහු මේ මග වඩනා සේක. මං සරනව. වෙහෙර කරව. නොපමා වව" යි කිය කියා බුදුගුණයෙන් බොහෝ දෙනා පහදව පහදවා මග පන්සාලිස් යොදනෙහි පන්සාලිස් ලක්‍ෂයක් වියදම් කොට පන්සාලිස් වෙහෙරක් කරවා සැවැත්නුවර ගොස් බුදුන්ට වාසයට මා වෙහෙරක් කරවා ගන්නා පරිද්දෙන් කෙසේ වූ ස්ථානයෙක නුදුරුව නො ළංව සත්ත්වයන් සිත් සේ ගොස් වැඳ පුදා ගන්නා පරිද්දෙන් යොග්‍ය දෝහෝ රම්‍ය දෝහෝ යි නුවර සිසාරා බලා ඇවිදිනාහු ජෙත නම් රාජකුමාරයන්ගේ උයන ඉතා රම්‍ය ය යි දැන උන්කරා ගොස් "රාජකුමාරයන් වහන්ස! තුඹගේ උයන්බිම බුදුන්ට මා වෙහෙරක් කරවා ගන්නා පරිද්දෙන් මාගෙන් මිලගෙණ කිම මට දුන මැනැවැ" යි කීහ. එ බසට රාජකුමාරයෝ "මිද මිලයකට

දෙන්නා තබා ඒ බිම ඔපින් සිටුවා රනින් මසා පුරා දුනු නමුත් නො දෙමි ම ය"යි කීහ. එ බසට සිවාහෝ "එක විට ම කී බසින් ම බිම මට දීපු දෑ ය, උයන ගනිමි, උයන ගනිමි" කියා ඇතයේ අත් ගසා සිනාපූහහ. එ වේලෙහි රාජකුමාරයෝ "සිවානෙනි! තොපට මා උයන දුන්නා නැත. කුමක් දෙඩාදූ"යි කීහ. සිවාහෝ නැවත ත් "මම උයන ගනිමි ම ය" යි කීහ. රාජකුමාරයෝ "මම උයන නො දිනිමි ම ය යි රාජකුමාරයෝ කීහ.

එ වේලෙහි සිවාහෝ "අප දෙදෙනාගේ බසින් නම් නැත. අධිකරණ සභාවට යම්හයි යුක්ති දන්නෝ අප දෙදෙනා කී බස් අසා තුඹම මට උයන දුන්නෑ යි කිවු නම් උයන මාගේ ම ය. නුදුන් නෑ යි කිවු නම් තුඹගේ උයන තුඹගේ ම ය"යි කියා රාජකුමාරයන් කැඳවා ගෙණ අධිකරණ සභාවට ගොස් "අප දෙදෙනා ගේ මේ අධිකරණය මැදහත් ව කිව මැනැවැ"යි කීහ.

එ සම්යෙහි අධිකරණ නායකයෝ දෙදෙනාගේ බස් අසා රජ කුමාරයන් මුහුණ බලා "යම් වෙලෙඳෙමින් කරණ කල වසතු සවාමියා නො වපීනා ගරු අගයක් පලමුකොට කියාපු නම් වසතුව මිල කල නියා ම ය. තුඹ ගරුකොට මිල කියාපී බැවින් ඒ මිල සිවානන් දීගත නුහුනුම්ාහු නම් උයන තුඹගේ ම ය. දීගත හුනු වූ නම් උයන සිවානන්ගේම ය" යි කියා රජ කුමාරයන් පැරදවූහ. එ වේලෙහි රාජකුමාරයෝ පැරද "මාගේ උයන නම් අයම්න් විතරින් වඩුදහස් දහස් රියන් ඇතියේ ය. එසේ හෙයින් එක්යාල දෙලොසමුණක වපයන්නාවූ මහ සීමෙක මේ සා බිමක් මසා රන් ඔපින් සිටුවා පුරා දී ලීමෙක් නම් කවර නම් සතක්හට පිලිවන් දෙයෙක් දෑ"යි සිතා මොහු රනින් පරදවා මාගේ උයන නො දෙම් ම ය යි සිත සිතා "වැලි තොප එසේම තප්පර වූ බැවින් උයන තොපට ම දිනිමි දූන් ම මට රන් දී ලා ගණුව"යි කීහ.

එ වේලෙහි සිවාහෝ ඉතා සතුටුව රාජකුමාරයන් කැඳවා ගෙණ උයනට ගොස් උයනෙහි නිෂ්ප්‍රයොජන වූ විහාරයට නො තරම් ගස් මුලින් සිදුවා දම්මවා සඳුන් කපුරු සපු නා පනා අඹ දඹ දෙඹ ආදී වූ මාහැගි ගස් රඳවා උයන්බිම බෙරඇසක් සේ කනා එවේලෙහි ලියන්නන් මෙල්ලාකමරුන් කැඳවා "මාගේ

සත්මුත්තක් මුළුල්ලෙහි දොර නොහැර තුබූ අසවල් නිධානයෙහි පිධානය හැර එහි තුබූ මසුරන් ඇම ඇද මේ බිම ඇසිල්ලෙකින් පුරව"යි විධාන කළහ. එ වේලෙහි රාජකුමාරයෝ "මොහු කියන්නේ කිමෙක් ද? එක නිධානයෙක වැඩි ගියේ නම් දශලක්ෂයක් හෝ තිබෙයි. විසි ලක්ෂයක් හෝ තිබෙයි. එසේ ත් වැඩි ගියේ නම් සියක් ලක්ෂයක් හෝ තිබෙයි. එ විතර රනකින් මේ සා බිම මසුරන් සුලස්සෙන් සිටුවා පුරාලිය හැකි දැ"යි සිත සිතා සිටියහ.

එ වේලෙහි සිටාණන්ගේ ලියන්නන් හා මෙල්ලාතවරු දිව දිව ගොසින් සිටාණන්ගේ සත් පවුරු සත් දොරටු ඇතුළෙහි තුබූ ඒ නිධානයෙහි පිධානය හැර ඇතුළට වැද බඹසැලෙක වී මැන හරිනා සේ ලාසු මලින් රන් මැන මැන දෙත්. සිටාණන්ගේ ලක්ෂ ගණන් පිරිවර ජනයෝ මැදලා ඔවුනොවුන් පරයා මසුරන් ඇද ඇසිල්ලෙකින් අනූ යාලක් පමණ මසුරන් උයන මැද සැලූහ. එ වේලෙහි සිටාණන් සෑලු සෑලූ රන් ලක්ෂ ගණන් ජනයෝ පිටින් පිටින් ගෙණ එක්යහල දෙලොසමුණක් වප් යන ඒසා බිම කිසිවකු ත් නො පෙණෙන සේ සුලස්සෙන් සිටුම සිටුවා බුමතුරු නෙකින් වසන්නා සේ වසාගෙණ යන්ට පටන් ගත්හ.

එ වේලෙහි සිටාණෝ ද සක්විති රජයක් ලබන දවසක් සේ මහත් වූ සන්තොෂයෙන් පිණා තමන්ගේ පිරිවර සිටුවරුන් ගෙණා මේ සඳුන්ගං ආදි වූ ගසින් වැසී ගියා වූ බිම රන් ලාලිය නො හැක්කේ ය. එසේ කල මාගේ පින්කම් අඩු ව ගියේ නම් නපුරැ යි සිතා තම ත් වඩ වඩා ලාභ පිණිසි ම ලොභ කරන්නාහු ඒ රුක් වට සිසාරු මැන මැන එම සා කෙසු බිම්වල ඒ මාරුවෙහි මසුරන් පුර පුරා ගන්නාහු ය. මහ වාසල් බිම සාබා අවශෙෂ වූ උයන් භූමිය මුළුල්ලෙහි මසුරනින් වසා නිමි කල සිටාණෝ එ වේලෙහි වාසල් බිමෙහි රන් නු ලූ අඩුව දැක මෙ තෙන ද වහා රන් පුරව යී කීහ.

එ වේලෙහි ලියන්නෝ අවුත් "සිටාණන්වහන්ස! තුඹම්හන්සේගේ සත්වැනි මුත්තනුවන් මහන්සේ ඒ නිධාන ය කෙළෙ අටළොස් කෙළක් මසුරනින. ඒ අටළොස් කෙළක් මසුරන් ම මෙ තැනට ගෙණකලද, ඒ නිධානයෙහි අළෙවියක් නු වූ නියාවට ලේකම් බලා වදාළ මැනැව"යි එම නිධානයෙහි සංග්‍රහ කොට තුබූ තඹපත අකුරු පෑහ. එ කල සිටාණෝ අනික් නිධානයෙකින් රන් ගෙණව යි කීහ.

ඒ වේලෙහි රාජකුමාරයෝ සිටාණන් මේ සා සම්පතක් ගෙණත් ගෙණත් වඩ වඩා සතුටු ඇති සියාව ත් මේ සා ධන පරිත්‍යාගයෙක මිද දෙම්නසක් ත් නැති නියාව ත් දැක "එකාන්තයෙන් මූ කරන්නේ මේ සා සම්පත්හාණි ත් වඩහා ඉතා උතුම් වූ කටයුත්තෙක් නිසා වුව මැනව. මූ රන් දී බිම ගන්නා බව එකාන්තම ය. මා ත් මූ හා ම එක්වුව මැනැවැ" යි සිතා "සිටාණෙනි! සුකති බිණිමෙනු ත් මා ම පැරදවූව. රන් දීමෙනු ත් මා ම පැරදවූව එ හෙයින් මා බොහෝ කොට නො පරදම්ව. මේ වාසල් බිම තොපගෙන් මට උපකාර කොට දෙව. එ බිමට රන් නො ගෙන්වව. තොපගේ පින්හි මා ත් එක්කොට ගන්ව" යි කීහ.

ඒ වේලෙහි සිටාණෝ ද "කම කරණ කටයුත්තෙහි මේ මැනි ප්‍රසිද්ධ වූ රජදරුවන් එක්වීමෙන් දෙෂයෙක් නැතැ. උන්හු ත් එක් කෙරෙමි"යි සිතා "යහපතැ" යි ගිවිස එ තෙක රන් නො ලව යි සිටාණෝ නියෝග කොට රාජකුමාරයන්ට වාසල් බිම අල්වා. වාසල් බිම ඇර "එපස් වි තම් තෙපල රන් ගස්කොට ගත මැනව. මට බිම වහා අවසර කොට දුන මැනැවැ"යි කීහ.

ඒ කල රාජකුමාරයන්ගේ සේවකයෝ සියදහස් ගණන් ගොවිපෝරු ලා ලා ඇද මසුරන් උයනින් පිටත රැස්කොට බිම් අවසර කළහ. එ කල සිටාණෝ විහාරකම්මාන්ත පටන් ගන්වා අනන්තාපරියන්ත වූ බුදුන්ගේ ශාසනස්ථාන වූ අවිජහිත භූමියෙහි බුදුන්ට විසිතුරු වූ ගඳ කිළියක් කරවා, මවා සංඝාරාම කරවා රාත්‍රිස්ථාන-දිවාස්ථාන-චංක්‍රමණ-මණ්ඩප - පුෂ්කරණී-විල්-පතැස් පුෂ්පාරාම-ඵලාරාම ආදි වූ නොයෙක් සංඝාරාම දෙවියන්ගේ ද සහායෙන් දිව්‍යකම්මාන්ත සේ විශ්වකර්ම නිර්මිතයක් සේ ඉතා මනෝහර කොට නිමවා සීසාරු සාරදහසක් රියන් හා උසින් අට ලොස් රියන් මත පවුරු කරවා නොබෝ දවසකින් නිම වූහ. එහි බුදුන්ට ම කැරවූ ගඳකිළිය සියක් ලක්ෂයක් මසුරන් වියදම් කොට කෙළක් අගනා සේ කළහ සියලු විහාරකම්මාන්ත ම එක් නිධානයෙක් ම පුරා තුබූ අටලොස් කෙළක් මසුරන් වියදම් කොට කළහ.

ඒ අනේපිඬු මහසිටාණෝ මේ කල්‍යාණ මිත්‍රයන් බහුල කෙණෙක "අපගේ සිටාණන්ගේ මේ පින්කමෙහි අපි ත් එක්වම්හ. අපි ත් එක්වම්හ"යි කිය කියා විශාඛායන් ඔවුනොවුන් පරයා කරණලද කම්මාන්ත හා උන්ගෙන් කරණලද ධනපරිත්‍යාග හා මේ තෙකැ යි පමණ නැත. අවශෙෂ වූ සත්ත්වයෝ ද බුදුන්ගේ නම අසා "බුදුහු ය යි යන කෙණෙක් ල, ඔහු ඉතා සොඳ කෙණෙක් ල,

සිහිරි වූ කටගඩ ඇති කෙණෙක් ල. මනොහර වූ දහම් අමා ඇති කෙණෙක් ල, මොහු කරවන්නෝ ඔවුන් හිඳිනා වෙහෙරෙක් ල, අපි අපි දු ඒ උතුමානන්ට සත්කාර කරම්හ" යි කිය කියා සඬයන් වෙන වෙන කරවාපු කර්මාන්ත හා වෙන වෙන ම කළා වූ ධන පරිත්‍යාග ද මෙ තෙකැ යි පමණ නැත. එ කල ජෙත නම් රජ කුමාරයෝ ද සිටානන් කරන්නා වූ ඒ විහාරකර්මාන්තයෙහි පැහැද "සිටක්හුගේ සම්පත් රජුන්හට ඇසි ද, ඔහු දුන් මිල ඔහුගේ විහාරයට ම පරිත්‍යාග කෙරෙමි"යි සිතා නැගෙනහිරි වාසල් භූමියෙහි එක්සිය පිසිරියනක් අයම් විතර ඇති සත්මහල් මහා මාලිගාවක් මාසල්කොට කරවා සෙසු තුන් මාසල ද එසේ එසේ ම මනොහර කොට සිමවා එ සිම ගස් අටළොස් කෙළක් මසුරන් එම වෙහෙර සතර මහවාසල් කර්මාන්තයට ම පරිත්‍යාග කළහ.

එ කල අනේපිඬු මහසිටානෝ මේ සියලු විහාරකර්මාන්ත නිමි කල බුදුන් පවරා යවුවාහු ය. එ කල බුදුරජාණන් වහන්සේ පසළොස් යොදුනෙහි සිටානන් කැරවූ විහාරයෙන් විහාරයෙහි සැතපි සැතපි පස්සාළිස් දම්සෙකියි සැවැත්නුවර වැඩි සේක. සිටානෝ විහාරය මුළුල්ලෙහි ධජ පතාක පුන්කලස් කෙසෙල් ගස් පිළී තොරණින් දිව්‍යලයක් සේ මහා පූජා කරගා තමන් පුත නුවන් සර්වාභරණයෙන් සරහා පන්සියයක් සිටුකුමරුන් පාවාදී පස්පැහැයෙන් දිලිසෙන පන්සියයක් ධජපෙළ සමග යවුවාහු ය. ඔවුන් පස්සෙහි මහා සුභද්‍රා නම් සිටුදුව හා චුල්ලසුභද්‍රා නම් සිටු දුව හා දූන් දෙදෙනා දෙව්කුමරියන් සේ සරහා සම වයස් ඇති, පන්සියයක් සිටුදූන් හා සමග පන්සියයක් රන් කලස් දී යවුවා හු ය. ඔවුන් ඉක්බිත්තෙහි සිටානෝ තමන්ගේ අග්‍ර සිටුදියණි යන් පන්සියයක් කුලස්ත්‍රීන් හා සමග සර්වාභරණයෙන් සරහා පන්සියයක් රන් පැස දී යවුවාහු ය. ඒ සිටුදූන් ඉක්බිති ව කොසොල් මහරජ්ජුරුවන්ගේ දියණියෝ සුමනා නම් රාජකුමාරි කාවෝ පන්සියයක් රජකුමරියන් පිරිවරා පන්සියයක් රථ නැගී සර්වාභරණයෙන් සමලඞ්කෘත ව ශක්‍රපුරයෙන් නික්මුනු දෙවගනන් රැසක් සේ සුවඳමල් කරඬු ගෙණ එක පෙළ නමා ගත්හ. ඒ රජ කුමරියන් ඉක්බිති ව පන්සියයක් ඇමතියන් ද සර්වාභරණයෙන් සැරහී මල්කලස් ගෙණ නමා ගත්හ. ඔවුන් ඉක්බිති ව මහනුවර වැසියෝ සියලු අලඞ්කාරයෙන් සැරහී සියලු පූජාභාණ්ඩ ගෙණ ගණන් නැති ව ගියාහු ය. ඔවුන් නැමදෙන ම මෙසේ ගියකල අනේපිඬු මහසිටානෝ පන්සියයක් සිටුවරුන් සමග අලුත් සුදු දවලු පිළී හැඳ පූජා මගුල්වෙස් ගෙණ සුවඳ මල් අතින් ගෙණ බුදුන් පෙරමගට ගොසින් දුටහ.

ඉක්බිත්තෙන් බුදුරජානන් වහන්සේ මේ මහපිරිස් පළමු ව පූජාවෙන් නික්මුණු කල තමන් වහන්සේ විසි දහසක් සඟපිරිස් ගෙණ සවණක් රැසින් දිලිහි දිලිහී මහ පෙළහරින් පූජා විඳ විඳ අපරිමෙය වූ බුධශ්‍රීන් දෙව්රම් වෙහෙරට වන් සේක. ඉක්බිත්තෙන් අනේපිඬු මහ සිටාණෝ බුදුන් දක වැඳලා "ස්වාමීනි! මේ වෙහෙර කෙසේ පිළිපදිම් දැ"යි විචාළහ. ස්වාමිදරුවෝ "මහ සිට! මේ විහාරය මේ තෙනට පැමිණි නො පැමිණි සැම භික්ෂූන් උදෙසා සාංඝික කොට දෙව යි වදාළ සේක. එ කෙණෙහි අනේපිඬු මහසිටාණෝ ස්වර්ණාභිංකාරයෙන් පැන් ගෙණ "සතර දිගින් වඩනා බුදුපාමොක් මහසඟනට මේ වෙහෙර සාංඝිකාකොට දිනිම්"යි කියා බුදුන් ශ්‍රීහස්තයෙහි පැන් වත්කළහ. එ කෙණෙහි ස්වාමිදරුවෝ දෙව්රම් වෙහෙර පිළිගෙණ සිටානන් තමන් ම කැරවූ ධම්මණ්ඩපයෙහි බුධාසන පැහැකැගී වැඩහිඳ-

"සීතං උණ්හං පටිහනති-තතො වාළමිගානි ච,
සිරිංසපෙ ච මකසෙ-සිසිරෙ චාපි වුට්ඨියො" යි.

සතාදීන් ආවාසදානයෙහි අනුසස් මහ පිරිසට දෙශනා කොට බොහෝ සතුන් සසරින් මුදා වදාළ සේක.

ඉක්බිත්තෙන් අනේපිඬු මහසිටාණෝ මෙසේ බුදුන්ට ජෙතවනාරාම ය පිළිගන්වා දවස දවස පූජා කරන්නාහු අවලොස් කෙළක් ධන දන පූජාවෙහි වියදම් කොට තව මහත් මූළල්ලෙහි දමය් පතා පූජා කළාහු ය. මෙසේ බිම් ගත් මිල ය, විහාරකර්මාන්ත කැරවූ මිල ය, දන පූජාවට කළ වියදමැ යි මෙසේ සිවුපණස් කෙළක් ධන බුදුන් උදෙසා එක ජෙතවනාරාමයට ම වියදම් කළහ

මේ විහාරභූමිය නම් අනන්තාපර්යන්තවූ සර්වඥවරයන්ට ම අනන්තාපරිමෙය වූ ධනසිටුවරුන් විසින් ම මිල දී ගෙණ කරවා පිළිගන්වා එක වෙහෙරෙක් ම ය. සෙසු සර්වඥවරයන් හැර විපස්සී නම් බුදුන්ට සවසතීසෙන නම් සිටානකෙණෙක් මේ ම බිම සතර ගව්වක් පමණ තෙන රන් අතුළමෙන් මෑ බිම ගෙණ විහාර ය කරවා ඒ විපස්සී නම් බුදුන්ට පිළිගන්වා මහාපූජා කළහ. තව ද සිඛී නම් බුදුන්ට සිරිවඩ්ඪන නම් සිටානකෙණෙක් මෙම බිම තුන් ගව්වක් පමණ තෙන සතරන් සිවැළියෙන් මසා මිල දී බිමගෙණ විහාරය කරවා පිළිගන්වා මහාපූජා කළහ. වෙස්සභූ නම් බුදුන්ට ස්වස්තික නම් සිටානකෙණෙක් මෙම බිම දෙගව්වක් පමණතෙන සතරතින් ගැනූ ඇතු පයින් මසා මිල දී බිම් ගෙණ වෙහෙර කරවා

පිළිගන්වා මහාපූජා කළහ. කකුසඳ නම් බුදුන් සමයෙහි අච්චුත නම් සිටානකෙණෙක් මෙම බිම ගව්වක් පමණ තෙන සත රන් උළින් වසා මිල දී බිම ගෙණ වෙහෙරක් කරවා පිළිගන්වා මහාපූජා කළහ. නව ද කොණාගමන නම් බුදුන් සමයෙහි උග්ගත නම් සිටාන කෙණෙක් මෙම බිම අඩගව්වක් පමණ තෙක රිදීබිබින් පුරා මිල දී බිම ගෙණ වෙහෙර කරවා පිළිගන්වා මහාපූජා කළහ. නව ද කාශ්‍යප නම් බුදුන් සමයෙහි සුමඞ්ගල නම් සිටානකෙණෙක් මෙම බිම සොළොස් කිරියක් පමණතෙන සතරන් උළින් වසා මිල දී ගෙණ වෙහෙර කරවා පිළිගන්වා මහාපූජා කළහ. දැන් අප මහා ගෞතම බුදුන් සමයෙහි මේ අනේපිඬු මහසිටාණෝ බිජු අට කිරියක් පමණ බිම ඔටින් සිවූවා මසුරතින් වසා ඒ මිල දී බිම ගෙණ ජේතවනාරාමය කරවා මෙසේ පිළිගන්වා නව මසක් මුළුල්ලෙහි මහාපූජා කළහ.

එසේ මාගේ ස්වාමිදරුවෝ අනන්තාපරියන්ත වූ බුදුන්ගේ වංශයට ම සුදුසු වූ මේ ජේතවනාරාමය නැමි බුදුන්ගේ චාරිත්‍ර නො වරදවා පිළිගෙණ එ දා පටන් ධර්ම්‍ය පතා දෙසිය සැත්තෑවක් පමණ දවස් මහාපූජා ලත්සෙයින් ත්, මෙසේ වූ පූජා පිළිමට සුදුසු සෙයිනු ත්, ලෝකාචාර්‍ය්‍ය වූ, අනාචාර්‍ය්‍ය වූ, ලෝකාධාර වූ, අනාධාර වූ, ලෝකේශ්වර වූ, අනීශ්වර වූ, ලෝකනාථ වූ, අප්‍රතිනාථ වූ, ලෝක ස්වාමි වූ, මාගේ ස්වාමිදරු වූ, මාගේ ම ගුරු වූ, මාගේ ම මවු වූ, මාගේ ම පිය වූ, මාගේ ම දෙවි වූ, මාගේ ම බඹ වූ, මාගේ ම සමිඳු වූ, මාගේ ම බුදුරජාණෝ මේ මේ කාරණයෙනු දු අර්හත් නම් වන සේක.

එසේ හෙයින් කියන ලද්දේ මැයි:—

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො
අත්ථානු රූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං—යි.

මේ පූජාවලියෙහි

අප බුදුන්ට අනේපිඬු මහසිටානන් විසින් කරණ ලද

ජේතවනාරාම පූජා කථා නම් වූ

සත්ළොස් වන පරිච්ඡේදය නිමි.

අටළොස් වන පරිච්ඡේදය

තව ද: අප බුදුන් විශාඛා මහා උපාසිකාවන්ගෙන් ලද පූර්වාරාම පූජා නම් කවරහ? යත්;

මේ ඒ විශාඛාවන්ගේ පිළිවෙළ කථාව ය:

අප මහා ගෞතම බුදුන් සමයෙහි තුන් සියයක් යොදුන් අඟු මගධ දෙ රටට නායක වූ රජගහ නුවර බිම්බිසාර රජහුගේ විජිත යෙහි මැඩ මහසිටාණෝ ය, ජෝතිය මහාසිටාණෝ ය, ජටිල මහා සිටාණෝ ය, කාකවලිය මහාසිටාණෝ ය, පුණ්ණක නම් මහසිටා ණෝ ය යි මින පොළොව සේ උතු නොමඳ සම්පත් ඇති හෙයින් අමිත භෝගී ය යි මේ නමින් ප්‍රසිද්ධ වූ මහසිටුවරු පස්දෙනෙක් වූහ. එසින් මැඩ මහසිටාණන්ගේ ගෙහි ඔවුන් ඇතුළු වූ මහ පින්වත්හු පස්දෙනෙක් වෙති. සිටාණෝ ය, චන්ද්‍රපද්මා නම් සිටු දියණියෝ ය, ධනඤ්ජය නම් පුතනුවෝ ය, සුමනා නම් ලෙහෙල නියෝ ය, පුණ්ණක නම් මෙල්ලෑකය යි මොහු පස්දෙනෙක් පෙර කළ පිණින් එක ගෙහි මහපින් ඇති ව උපන්නාහ. මේ විශාඛාවෝ නම් ඒ මෙණ්ඩක නම් සිටාණන්ගේ පුතනුවන් ධනඤ්ජය සිටා ණන්ගේ ජ්‍යෙෂ්ඨ භාර්‍ය්‍යා වූ සුමනා නම් සිටුදියණියන් කුස පිළිසිඳ ඒ අඟුරට භද්දිය නම් නුවර මසක කල ඔවුනුසින් උපන. ඒ විශාඛාවන් සත්හැවිරිදි අවස්ථාවෙහි මාගේ කාරුණ්‍ය නිධාන වූ, ස්වාමිදරු වූ, බුදුරජාණන් වහන්සේ සෙලනම් මහබමුණාණන් ආදි වූ වෛනෙය ජනයන් කෙරෙහි කරණලද මහාකාරුණා ඇති ව මහණගණයා පිරිවරා ඒ භද්දිය නුවරට පැමිණියේක.

එ කල මැඩ මහසිටාණෝ ස්වාමිදරුවන් තමන්ගේ නුවරට වඩනා බව අසා මී පුතනුවන්ගේ දූ විශාඛාවන් ඒ තමන්ගේ මිනි බිරිඳුන් ලඟට කැඳවා "පුත තොපට ත් මඟුල, අපට ත් මඟුල, තෙපි තොප හා සම යත් 'හැවිරිදි වයස් ඇති පන්සියයක් සිටු කුමරියන් පිරිවරාගෙණ පන්සියයක් රථ නැගී මහපෙළහරින් බුදුන් පෙරමඟට යව"යි කීහ. එ වේලෙහි ඒ කුමාරිකාවෝ තමන් බුදුසස්නෙහි හැදූ ඇති සත්‍රීන් කෙරෙහි අග්‍ර වූ තනතුරු ලබන පින් ඇති හෙයිනු ත් පූර්ව හෙතුසම්පත් ඇති හෙයිනු ත් බුදුහු ය යි යන නම අසා මී සන්තොෂ ව මුතුන් හිටුහු කී පරිද්දෙන් මහපෙළහරින් බුදුන් පෙරමඟට ගොස් තමින් බාල වුව ද මහනුවණ

ඇති හෙයින් උත්තමයන් පෙරමගට යානා නැගී යාම ආදර පෙ
මත් නොවේය යි සිතා පයින් ගොස් බුදුන් දැක වැද එකත්පස්
සිටියහ.

එ වේලෙහි ස්වාමිදරුවෝ මේ කුමාරිකා කෙසේ වූ පිණ
එකක් දෝ හෝයි පරීක්ෂා කොට මාගේ බුදුසස්නෙහි සියලු ශ්‍රාව
යනට මවු කසාතුරු ලදින් ශ්‍රද්ධාවන්තයන් කෙරෙහි අග්‍ර ව මහත්
දන පරිත්‍යාගයෙන් බුදුසසුන් හොබවන උතුම් ස්ත්‍රියක
දැක එ කෙණෙහි ධම්මදෙශනා කළසේක. ඒ වේලෙහි මහාබෝ
පන්සියයක් කුමරියක් හා සමග සෝවාන් වූහ. ඉක්බිත්තෙ
මැඩ මහ සිටානෝ එම ද බුදුන් කරා ගොස් බණ අසා එම ද
සෝවාන් ව සෙට දවසම බුදුන් පවරා අනෙකප්‍රකාර වූ බා
භෝජ්‍යයෙන් බුදුන් වළඳවා මෙසේ ම දෙපෝයක් මහදන් දුන්
බුදුහු ඒ සද්දිශතුමර අභිප්‍රාය කාලයක් වැස නැවත ජේතව
රාමයට වැඩියේක.

එ සමයෙහි සැවැත් නුවර පසේනදි කෝසල රජ්ජුරුව
නැගණියෝ රජගහා නුවර බිම්බිසාර රජ්ජුරුවන්ට අගමෙහෙසින්
වෙයෙකි. බිම්බිසාර රජ්ජුරුවන්ගේ නැගණියෝ පසේනදි කෝස
රජ්ජුරුවන්ට අගමෙහෙසින් ව වෙසෙති එසේ හෙයින් ඔ
දෙදෙන ඔවුනොවුන් භගිනිපතිකා නම් වූ සුහුරුබනු වූහ.

දවසෙක කෝසල රජ්ජුරුවෝ සිතන්නාහු බිම්බිසාර රජ්ජුරු
වන්ගේ නුවර අමිතභෝගී සිටුවරුන් හා මහපින් ඇතියෝ බෙහෙ
උන්ගේ නුවරට ගොස් අමිතභෝගී සිටානකෙණකුන් ඉල්වාගෙ
මාගේ නුවරට එමි යි සිතා මහපෙරහරින් රජගහා නුවරට ගො
බිම්බිසාර රජ්ජුරුවන් හා ප්‍රියකථා කොට “යහළු, තොපගෙ
නුවරින් අමිතභෝගී මහසිටානකෙණකුන් මට දෙව” යි කීය
රජ්ජුරුවෝ “මේ මහ පොළොව සොල්වාලිය හැකි වී නමුත් ඒ සි
වරුන් පස්දෙන සොල්වාලිය නො හැක්කේ ය” යි කීහ එ බස
කෝසල රජ්ජුරුවෝ “එක් සිටානකෙණකුන් මට නුදුන්නු න
මම මේ නුවරින් නො යමි. තොප හා මා හා විශ්වාසත් නැතැ”
කීහ. එ වේලෙහි බිම්බිසාර රජ්ජුරුවෝ අමාත්‍යයන් හා සම
කථාකොට “මහසිටුවරුන් සවාලීම බැරිවුව ත් එක් තරම් සම්පත
ඇති සිටුකෙණකුන් දෙම්හ” යි කියා මැඩ මහසිටානන් පුත් යට
ධනංජය සිටානන් කැඳවා කොසොල් රජ්ජුරුවන් කී පවා

ඔවුන්ට කියා 'සැවැත් නුවර උන් හා සෑපි ම යම'"යි කීහ. ධනඤ්ජය සිටානෝ 'තුඹවහන්සේ මා යවනසේක් වී නම යෙමි'යි කියා ගිවිස්සහ. එ කල බිම්බිසාර රජ්ජුරුවෝ ඒ ධනඤ්ජය සිටාණන් ගිවිස්වා මහත් වූ සත්කාර කොට කොසොල් රජ්ජුරුවන්ට පාවා දී යවූවාහු ය.

ඉක්බිත්තෙන් කෝසල රජ්ජුරුවෝ සිටාණන් ලත් සම්හි සෙන් සැවැත් නුවරට යන්නාහු අතුරුමග ලැග්මට පැසු තෙනෙක මහසෙනග රඳවා ලැගුම් ගත්හ. එදා ධනඤ්ජය සිටානෝ කොසොල් රජ්ජුරුවන් කරා ගොස් "ස්වාමිනි! මේ කවුරුන් හිමි රට" දැ යි විචාළහ. රජ්ජුරුවෝ මාගේ විජිත ය යි කීහ. තුඹ වහන්සේගේ නුවර මේ තෙනට කෙතෙක් නැත්දැ යි විචාරා සත් යොදනෙකැ යි කී කල සිටානෝ "මාගේ පරිවාරජනයෝ බොහොව. ඇතුළු නුවර වාසයට සම්බාධ ය. මෙතෙන ම වසනු කැමැත් තෙමි"යි කීහ. එ බසට රජ්ජුරුවෝ සමාගි ව මහ සෙනග ලවා කිප දවසක් ඇතුළත එ ම තෙන නුවරක් තිමවා සවස ලැග්මට වන් තෙන හෙයින් සාකෙත නුවර ය යි නම තබා සිටාණන් එ නුවර පිහිටුවා තමන්ගේ සැවැත් නුවර ම ගියාහු ය.

එ කල ඒ සැවැත් නුවර මිගාර නම් සිටාණන් පුතනුවෝ පුණ්ණවඩ්ඪන නම් කුමාරයෝ වැඩිවිය පැමිණියහ. එ කල මවුපියෝ පුතනුවන් කැඳවා තොප කැමැති ශරණක් කියව යි කීහ. පුණ්ණවඩ්ඪනයෝ නම් රූ ඇත්තෙමි යි මත් ඇතියහ. එසේ හෙයින් "ස්ත්‍රියක පාවා දෙතොතින් පඤ්චකල්‍යාණයෙන් යුක්ත වූ උතුම ස්ත්‍රියක පාවා දුන මැනව. නැතහොත් මම ශරණ නො කැමැත් තෙමි"යි කීහ. පඤ්චකල්‍යාණ නම් කිම් දැ යි විචාළහ.

ඒ පඤ්චකල්‍යාණ නම්: කේශකල්‍යාණ ය, මාංසකල්‍යාණ ය, අස්ථිකල්‍යාණ ය, ඡවිකල්‍යාණ ය, වයෝකල්‍යාණ ය යි මෙසේ වූ පසෙක. මෙහි විභාග; මහ පින් ඇති ස්ත්‍රියගේ කෙස් මොනර පිල්කලඹක් සේ ඡවිමණි ඇති ව මුදු හෙළාපිකල ගොප්මස ගැසී තුන් දරණක් ගසා අග් මුදුන් බලා සිටිගන්නී, මේ කේශකල්‍යාණ නම. අධරපුන්ම ය බිම්බඵල දෙකක් සේ පබළුපත් දෙකක් සේ බුලත් කෑ වේලෙහි ත් නො කෑ වේලෙහි ත් හැම වේලෙහි ම ඉතා සුරක්ත ව ඡවිපහස් ඇති ම රත්පැහැ විහි ද විහිද තිබෙයි. මේ ලක්ෂණ ය මාංසකල්‍යාණ නම. දන්තයෝ කොඳ කැකුළු සේ සුදු ව අතුරතුරෙහි සිදුරු නො දී එක් දතක්

එක් දතකට උස් නො ව සමකොට ගා සෝදූ ලූ සක්පත් දෙකක් සේ ප්‍රභාසම්පන්න ව පිහිටි. මේ ලක්ෂණය අස්ථිකල්‍යාණ නම. කෑළි වූ සත්‍රියගේ සම්බඟය අතින් මණියක් නැති ව ගොතා ගෙලා ලූ නිලුපුල් මල්දමක් සේ තිබෙයි. එළිලි වූ සත්‍රියගේ සකල ශරීරය තලකැලලාදී දෝෂයක් නැති ව කිණිහිරි මල්පෙත්තක් සේ තිබෙයි. මේ ලක්ෂණය ඡවිකල්‍යාණ නම. දසවිසිවාරයක දරු ලද ත් සොබබකය දරු නො ලත් සොළොස් හැවිරිදි සත්‍රියක ගේ තිබෙයි. සියක් හවුරුදු පිරුණු කල ත් නිස කරකෙත්දකු ත් නො නැගෙයි. මේ ලක්ෂණය වයකල්‍යාණ නම. මෙසේ වූ සත්‍රියක මට සාමා දුක මැකමැ යි කිහ.

ඉක්බිත්තෙන් මවුපියෝ වේද දන්නා බමුණන් එක්සිය අට දෙනකු ගෙන්වා තිරුදක වූ කිරිබත් කවා සන්තර්පණ කරවා පංච කල්‍යාණයෙන් යුක්ත වූ ස්ත්‍රී දූන් ලොව ඇද්ද යි විචාරා ඇතැ යි කීහ. බමුණන් කි කල ඉනු ත් අටදෙනකු තෝරාගෙණ ඔවුන්ට ප්‍රසාද දී "මුළු දඹදිව ඇවිද පංචකල්‍යාණයෙන් යුක්ත වූ කුමාරිකාවක මුනුබුරුවන්ට සොයව. ඉදින් දුටු නම් මේ ලක්ෂයක් අගනා සවර්ණ මාලාව ඒ කුමාරිකාවන් පලඳවාලා වහා එවයි යවුවාහුය. ඒ බමුණෝ අටදෙන තෙසැව දහසක් රාජධානිවල ඇවිද පංචකල්‍යාණයෙන් යුක්ත වූ ස්ත්‍රියක් නො දැක නැවත සැවැත් නුවරට එන්නාහු ඒ ධනංජය සිටාණන් වසන සාකෙත නුවරට පැමිණියහ.

එ කල එ නුවර අවුරුදු පතා කෙළනා වූ නැකැත්කෙළි නම් උත්සවයෙක් විය. එ දා මිතුමාලෙන් සවිමාලව නො බස්නා, සට මාළලන් එළිපත පැන පිටතට නො යන කුලස්ත්‍රීහු තම තමන් ගේ ගෙවලින් නික්ම පිරිවර හා සමඟ සියලු සතුන්ට ම පෙණී පෙණී උයන් පොකුණු ගංතොට ආදියෙහි සිත් සේ කෙළිමින් සැඟින් ඇවිදිනාහු ය. එ දවස් රජ බමුණු වෙළෙඳ ගොවි සිවු කුලයෙහි ශ්‍රීමත් වූ සල්ලාලපුරුෂයෝ "අද අප හා සමාන කුල ඇති උත්තම ස්ත්‍රීහු සිත් සේ බලම්හයි සුමඳ මල්කඩු ගෙණ ඒ ඒ සන්ධියෙහි සිට ගෙණ කැමැති කැමැති කුලස්ත්‍රීන් කරට මල්දම් දම දමා සිත් සේ කෙළනාහු ය.

එ දා ඒ බමුණෝ අටදෙන ද "අද මේ නුවර කුලස්ත්‍රීහු සැම දෙන ම උත්සවයට පිටත්වෙති. අද එකාන්තයෙන් පංචකල්‍යාණයෙන් යුක්ත වූ උතුම ස්ත්‍රියක දකුම්හ"යි සිත සිතා ගංතොට එක් ශාලාවෙක යන එන්නන් බල බලා සිටියහ.

එ වේලෙහි විශාඛාවෝ පසළොස් සොළොස් හැවිරිදි වයසින් සර්වාභරණයෙන් දෙව්ගනක සේ සැරහී පන්සියයක් පරිවාරස්ත්‍රීන් පිරිවරා ගඟදිය කෙළිනට යන්නාහු ඒ ශාලාව කරා පැමිණියහ. එ කෙණෙහි මහා මේඝයක් නගා වැස්සෙක් දිම ඈය. පන්සියයක් කුමාරිකාවරු ඔවුනොවුන් පරදවා දිව අවුදින් ශාලාමට වන්හ. බමුණෝ ඔවුන් පන්සියයක් දෙකා බලා පංචකල්‍යාණයෙන් යුක්ත වූ එකකු ත් නුදුටුවාහු ය. විශාල වූ ශාලාමට එන විශාඛාවෝ වැසි ගුගුරා දිව ත් ඇඟ බාපෙදකු ත් නො සොල්වා ස්වභාව වූ ගමනින් ම පසු ව අවුදින් ශාලාවට වන්හ. පලන් ආභරණ හා ඉන තිබූ සළුව එන පැහැර තෙමී ගියා.

එ වේලෙහි ඒ බමුණෝ දෙව්ගනක සේ එන විශාඛාවන් දැක දිව දිව සන්සල නොව එන නියාමින් කිසවිල ඇත් ගමනින් ඇඟ නො සොල්වා ස්ත්‍රී ලීලාමෙන් එන නියාම ත් දැක "මිහ පොළොව සේ ධෛර්‍ය්‍යසම්පන්න වූ ඉතා පිණැති දරුවෙක් කෙණෙක් නෑ"යි කිය කියා සිටියහ. එ වේලෙහි ඒ ශාලාමට අවුත් වන් විශාල වූ ගුණ රූ ඇති විශාඛා නම් කුමාරිකාවන් දැක පරීක්ෂා කරන්නාහු සතර මහා කල්‍යාණ ලක්ෂණ දැක දන්ත කල්‍යාණය නො දැක 'මැ හා කථාවක් කරවා මැගේ දන්තකල්‍යාණය හා ශබ්දමාධුර්‍ය්‍යය බලම්හ"යි කියා ඔවුනොවුන්ට ඇස් මරා මහත් කොට සිනාසී "මේ කිසින් රක්‍ෂාකළ සමණ කෙනෙක් ඇත්නම් කාඩි හා නිමුදු සාලේ බත් පමණකුත් ලද්ද නම් යෙහෙකැ යි සමණන් බත් ගෙලෙහි ගත් කල ඉදින් පැන් සොයා ලිඳම උදුසෙකක් සේ ගියෝ නම් පැන් ගෙණ ගෙට එන කලට ඉර හල වැටී යෙයි. සමණෝ ඇස් පෙරළා අඹුවන් පැන් ගෙණෙන තුරු සුවයේ වැදහෝනෝ වේ දැ"යි යනාදීන් වෙහෙසුම් කළහ.

එ බසට විශාඛාවෝ: බමුණනි! කා වෙහෙසා දැ යි විචාළහ. එ බස හා සමඟ ඒ විශාල වූ ශාලාව මිණියක් ගසා ලූ ගඩක් සේ මධුර නාදයෙන් සැදී සිටගත. බමුණෝ ඒ මධුර වූ කටහඬ අසා සතුටු ව තව ද උන් හා කථාකරණු කැමැති ව: සැගනියනි! නුඹගේ සුරුකම කියම්හ. නුඹගේ මේ තෙක් පරිවාර ස්ත්‍රී හැමදෙන ම නො තෙමී මේ ශාලාවට දිවපිහ. නුඹ ඔවුන් හැමදෙනාට පළමුව නො අවුදින් වස්ත්‍රාභරණ තෙමාගෙණ පසුව පියා ආයේ නුඹ අත පය සිඳියි ද යි විචාළහ.

එ බසට විශාඛාවෝ කියන්නාහු "ආචාර්යවරුනි! එසේ නො කියව. මම නාගබල නැත්තෙම් නො වෙමි. කාරණාකරණ දනිමි. දිවීමෙහි ආදීනවයක් නිසා සෙමින් සිට අයිමි"යි කීහ. නැගනියනි! ආදීනව නම් කිම් දු යි බමුණෝ විචාළහ.

එ වේලෙහි විශාඛාවෝ කියන්නාහු "මේ ලෝකයෙහි සතර දෙනෙක් දිවයා අවස්ථාවෙහි ඉතා නො සිරියෙති. ඔහු කවරහ යත්: ඔටුනු පලන් ලොවට අධිපති රජු කැසපට ගොතා ගෙණ කඩු පලග අතින් ගෙණ රාජාඞ්ගනයෙහි බොහෝ දෙනා දක්ක දී දිවී නම් බැලු බැලූ සත්ත්වයෝ "රජකු ලජ්ජා නැති නියා ය. නොම් ගොවියකු සේ දිවෙයි" කියා නින්‍දා බෙණෙති, එසේ හෙයින් රජු දිවන වේලෙහි ඉතා නො හොබනේ ය. ස්වභාව වූ ගමනින් රාජලීලායෙන් යේ නම් බැලු බැලූවන් ඇසට ඉතා හොබනේ ම ය. තව ද රජහුගේ මගුලැත් සියලු හස්ත්‍යලඞ්කාරයෙන් සැරහී මහ වේ මැද දිවේ නම් ඉතා නො හොබනේ ය. ඇත්ගමනින් එ පයින් එ පය තබා යේ නම් ඉතා හොබනේ ම ය. තව ද යම් තාපස කෙනෙක් යෝගියකු සේ දිව දිව යෙත් නම් ඉතා නො හොබනාහු ය. බොහෝ දෙනා අතින් "මේ මහණ සේවායකු සේ දිවන්නේ ය"යි නින්‍දා ම ලබන්නාහු ය. වියදඬු පමණින් දුර නො බලා සන්හුන් ගමනින් නැවනට ඔබාලූ ප්‍රතිමාවක් සේ ඇඟ නො සලා යෙත් නම් ඉතා හොබනාහු ය.

තව ද යම් ස්ත්‍රියක් පුරුෂයකු සේ දිවේ නම් ඉතා නො හොබනී ය. බොහෝ දෙනා අතින් "මෝ තොමෝ ගැහැණියක් නො වෙයි පිරිමියෙකැ"යි කියා නින්‍දා ම අසන්නී ය. ස්ත්‍රී රූපය මිඳ මඳ ගමනින් යන කල ඉතා හොබනේ ය. එසේ හෙයින් මේ මේ කාරණයෙන් රජු ය, මගුලැතු ය, තපස්වි ය, ස්ත්‍රිය යි යන මොහු සතරදෙන නො දිවිය යුත්තාහ. මම ද ඒ සතරදෙනා අතුරෙහි අන්තර්ගතයෙමි. මේ මේ කාරණයෙන් දිව දිව නො ආයෙමි. තව ද අතික් කාරණයෙකු දු ඇත. මවුපියෝ නම් දූදරුවන් අතුල් පතුල් කන් නාසා තෙල් ගා නඹා මල්දම පිරිමසන්නා සේ සතස් කොට ඔබන්නාහු ය. එසේ හෙයින් අපි විකිණි බඩුවක් වැන් නම්හ. විකිණි බඩුව නම්, මඳක් සිඳී බිඳී ගියේ නම් මඳක් මිරිකී ගියේ නම්, මිල බොහෝ නො වෙයි. එසේ හෙයින් අප දුවන වේලෙහි කුරුගුලා පවින් හෝ, කැටකින් හෝ, මුලකින් හෝ, පැකිලී හී අතපය රෙදවී ගියේ නම් දෙමවුපියන්ට ම භාර වම්හ.

ඈ කෙරෙකෙල්ල, අපව ඇයි ද යි පුරුෂයෝ රක්‍ෂා නො කෙරෙති. එසේ හෙයින් දෙමවුපියන්ට ත් මැඩ නැත, අපට ත් මැඩ නැත. මේ මේ කාරණ සලකා ත් නො දිවිමි. සෙමින් සෙමින් ඉසිඹි. වස්ත්‍රාභරණ තෙමී ගියේ වී නම් ඒ දෙවකු ම වියලා ගත හැක්ක. අත පය සිඳී බිඳී ගියේ වී නම් ඒ දෙවකු ම සන්ධි ගලපා ගත නො හැක්කේ වේ දැ''යි කීහ.

එ වේලෙහි බමුණෝ විශාඛාවන් මධුර වූ කථා කරණ වේලෙහි දන්තකල්‍යාණය ත් දැක ඉතා සතුටු ව ප්‍රියකථාවෙහි පැහැද සාධුකාර දී ''අපගේ සිටුකුමාරයන්ට හෙපි ම තරම් ම''යි කියා ලක්‍ෂයක් අගනා රන් මාලාව විශාඛාවන් කර පලඳ වූහ. එ වේලෙහි විශාඛාවෝ බමුණන් ආ නුවර නම හා සැදිමිසිලන්ගේ නම විචාරා අපට සුදුසු වූ කුලයෙක් ම ය යි සන්තෝෂ ව ඒ රන්මාලාව ඉවසා නතතුරු ලත් කල පසින් යාම සුදුසු නො වන්නේ වේ ද යි සිතා, පියාණන්ට කියා යවා පන්සියයක් රථ ගෙන්වා මහපෙළහරින් රථ නැගී නැවත ගෙට ගියහ.

බ්‍රාහ්මණයෝ ද විශාඛාවන් සමග ගොස් සිටාණන් දුටු කමින් ආ නුවර හා සිටු කුලයෙහි නම් හා තමන් ආ කාරණ හා ධනඤ්ජය සිටාණන්ට කීහ. ධනඤ්ජය සිටාණෝ තොපගේ සිටුකුලෙහි සම්පත් කොපමණක් ඇද්ද යි විචාරා; සතළිස් කෙළක් ධනය ඇතැ යි අසා ''ඒ සම්පත් අපගේ දරුවන්ට කාසා කාසා මිලට ත් මඳ; එසේ හෙයින් ඒ සම්පත් අපගේ සම්පත් බැලූ කල අපට ඒ දෙවියව සමාරක් සේ ත් නො සිතෙයි. එසේ ද වී නමුත් කුල සම් කුල බැවින් මාගේ දියනියන්ට ආරක්‍ෂා පමණකු ත් ඇත මනා වේ ද, මැනැවැ''යි ගිවිස එ බමුණන්ට සත්කාර කොට යවූවා හු ය.

බමුණෝ ගොස් විශාඛාවන්ගේ පවතු ත් ධනඤ්ජය සිටාණන් කී පවතු ත් මිගාර සිටාණන්ට කීහ. මිගාර සිටාණෝ එ පවත් අසා සතුටු ව බොහෝ වූ ධන ඇති කුලයෙහි කුමාරිකාවක ලද සේ මැනැවැ යි කල් නො යවා ගෙන්වමි යි සිතා ගොසින් එ පවත් කොසොල් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ ඒ පවත් අසා ''මාගේ නුවර මා ම නිසා ආ උතුම් ධන කුලෙහි ඇත්තෝ ය. ඒ සම්බන්ධය ද වල නො ගොස් මාගේ නුවර සිටු කුලයට එන සේ මැනැවැ''යි සතුටු ව ''ඒ මඟුලට මම ද එමි''යි කීහ. මිගාර සිටාණෝ එ බස්

අසා ධනඤ්ජය සිටාණන්ට කියා යවන්නාහු "අපගේ මඟුලට අපගේ රජ්ජුරුවන්වහන්සේ ත් එති යි කී සේක. උන්වහන් සේගේ සත් කෙළක් පමණ මහසෙනඟ ය, උන්වහන්සේ එන කල ඒ සා සෙනඟ හැම ම එති. කළමනා කිමෙක් ද? බත් බුලත් නවාතැන් දී ලිය නො හැක්කේ වේ ද? සොරා ම මඟුල් කරවා පියමෝ දැ?"යි කියා යවුවාහු ය. ධනඤ්ජය සිටාණෝ එ බසට සිනාසී "එසේ වූ එක රජ සෙනඟක් තබා දස රජුනු හා දස සෙනඟක් ගෙණ සැක නැති ව පලා එව. සියල්ල මි පසිඳිනෙම් ඔම් මි වේ දැ"යි කියා යවුවාහු ය.

එ කල මිගාර සිටාණෝ එ බස් අසා ඔහුගේ වාසි බලම්හ යි රජ්ජුරුවන් හා මහතනුණිය කොට මුළු නුවර වැස්සන්ට කියාලා ඒ සා සැවැත් නුවර ගෙ බලත්කත් හැර සත් කෙළක් පමණ සෙනඟ හා කොසොල් රජ්ජුරුවන් හා කැඳවා ගෙණ ගොස් දෙගව්වක් තෙන මහ පිරිස රඳවා විවා මඟුලට ආම්හ යි කියා යවූහ. ධනඤ්ජය සිටාණෝ රජ්ජුරුවන් ආදි වූ සියලු ඇමති සිටුවරුන්ට සුදුසු සුදුසු අඩුරු පෙරමඟට යවා අද රැ ම ලැග්මට අවමැනැවැ"යි නියෝග කොට දියනියන් ලඟට කැඳවා දියනියන්ගේ නුවණ පරීක්‍ෂා කරණු පිණිස හා දියනියන්ගේ නුවණ බල බොහෝ දෙනාම දක්වනු පිණිස හා "පුත! රජ්ජුරුවන් හා නොපගේ නැදිමයිලන් හා සියලු රජසෙනඟ ම මඟුලට ආවාහු ය. රජ යුවරජ ආදීන්ට කවර කවර ගෙයි නවාතැන් ලවමෝ දැ"යි විචාරා මේ මඟුල් නිමිනා තුරු සියලු සංවිධානය නෙපි ම කරව යි කියා නුවර දියනියන්ට පාවා දුන්හ.

ඒ විශාඛාවෝ තමන් සෝවාන් හෙයිනු ත්, හෙතුසම්පත් ඇති හෙයිනු ත්, පීදුරු සමාන තීක්‍ෂණ වූ නුවණ ඇති හෙයිනු ත්, යහපත යි ගිවිස සියලු තමන්ගේ පරිවාර ජනයන් කැඳවාලා "මේ ගෙය රජ්ජුරුවන්ට සරහව, මේ ගෙය යුවරජ්රුවන්ට සරහව, මේ ගෙය මහඇමැතියන්ට සරහව, මේ ගෙය මාගේ නැදිමයිලන්ට සරහව, මේ ගෙය සිටුවරුන්ට සරහව"යි යනාදීන් සියලු සංවිධාන කොට "මෙ තෙක් දෙන ඇතුන්ට කළමනා දෙය කරව. මෙ තෙක් දෙන අසුන්ට කළමනා දෙය කරව. මේ මඟුල් නිමන තුරු යවත් වසයෙන් රජ්ජුරුවන්ගේ පන්නයන් දක්වා ත් තණ ද නො ඇවිද මඟුල් කෙළි ම කෙළ ඇවිදිත්ව"යි කියා මෙසේ සියලු සංවිධාන කළාහු ය. එ දවස් ම විශාඛාවන් පියාණෝ පන්සියයක් බඩාලුන් රැස්කොට මාගේ දියනියන්ට මෙල පලඳනාවක් කරව යි පසළොස් දසක් සහ රන් හා සතර නැළියක් විදුරු හා එකොළොස් නැළියක්

උතුම් වූ මුතු හා දෙව්සි නැළියක් පබලු හා තෙතිස් නැළියක් මැණික් හා මෙසේ මගධ නැළියෙන් සැත්තෑ නැළියක් අනගි අනගි වූ විදුරු මුතු පබළු මැණික් හා අවශෙෂ වූ සත්රුවන් පාවාදී මෙල පලඳනාවට පටන් ගැන්වූහ.

එ වේලෙහි රජ්ජුරුවෝ මහපෙලහරින් නුවරට මැද නවා තැන් ගෙණ කිප දවසක් සුව සේ දමස් යවා ධනංජය සිටාණන්ට කියා යවන්නාහු "කිමෙක් ද? සිටාණෙනි! මේ සා රජ සෙනගක් හැර ගෙණ අප තොපගේ ගම් කල් යවා උන් කල තොපට දුක් මහත. තොපගේ දියනියන් වහා සරණපාවා දී පියම්" යි කියා යවූහ. සිටාණෝ කියා යමින්නාහු "දූන් අසලම් සම්ප්‍රාප්ත ව ගියේ ය. එසේ හෙයින් මාගේ දියනියන්ට සාරමසක් නතක් නැත. නුඹ වහන්සේගේ සේනාවට උවමනා සියල්ලක් මම භාර ය. නුඹ වහන්සේ මේ සාරමස පුම්සේ ම වැඩහුන මැනැවැ" යි කියා යවුවාහු ය.

එ තැන් පටන් ගෙණ ඒ සාකෙත නම් නුවර ඒ සාරමස මුළුල්ලෙහි ම එක මගුල් ගෙයක් සේ විය. රජ්ජුරුවන් ආදිවූ සියලු ඇමැති සෙනගට මල් සුවඳ වස්ත්‍රාභරණ බත් බුලත් කෑම බොන දෑ හෝනා සිදිනා තැන් සියල්ල ම ධනඤ්ජය සිටාණන්ගෙන්ම අඩුවක් නැති ව පසිඳිත් ම ය. සියලු සත්ත්වයෝ ම "සිටාණෝ අපට ම අඩු නො කොට පසිඳිති. අපට ම සුව දෙති" යි සිත සිතා වසන්නාහු ය. මෙසේ මගුල් කරණ කල තුන්මසක් පුරා ගිය. මෙල පලඳනාවේ කම්මාන්තය නව ද නො නිමියේ ය. සිටාණන්ගේ සේවකයෝ අවුදින් කියන්නාහු "ස්වාමීනි! බතින් බුලතින් වස්ත්‍රාභරණයෙන් තිබි අඩුවෙක් නැත. එක් බඩසැලෙක වී සම භාගක් නුවූයේය. දවසෙක පන්සියයක් ගැල් පිරූ දර නිමියි. එසේ හෙයින් දර සපයාගත නො හැක්කැ" යි කීහ. සිටාණෝ "මාලු ගෙවල් හා මාලු ඇත්ගල් අස්හල් විදා පිසා බත් පිසව" යි නියොග කළහ. මෙසේ මාලු ගෙවල් විදා දර ගෙණ දෙපේයක් බත් පිසූ කල නව ද සිටාණන් කරා ගොස් දර නැත්මය යි කීහ එ වේලෙහි සිටාණෝ "වර්ෂා කාලයෙහි දර සොයා යා නො හැක්ක. මාගේ දියණියන්ට බොහෝ දවසක් කීර්ති පතල මැනැව" යි සිතා පිළිගබඩා ගණ නෙත දෙර හරවා දළ දළ පිළී ගෙණ අත්කර සා වැටි කොට අඹරා තෙල් සැළවල ගල ගලා ලිප්වල උද උදා බත් පිසව. දළ පිළී නිමා ගියේ නම් සිහින් පිළී ගෙණ පිසව සිහින් පිළී නිමා ගියේ නම් පට පිළියෙන් පිසව. එයි ත් නිමා ගියේ නම් සඳුන් දරින් පිසව,

---

1 අනවශ

දර සොයා නො යව" යි නියොග කළහ. මෙසේ එ කල දල පිළී යෙන් ම බත් පිස ඒ සා මහත් සෙනගට දෙපෝයක් බත් දුන්හ. මෙසේ සාරමසක් මිශ්‍රා කාලය ගිය කල මෙල පලඳනාවත් නිමා ගියහ.

ඒ මෙල පලඳනාවෙහි හුයකින් අවුකත ඇවිණිල්ලෙක් නැත. හුයින් කළමනා මෙහෙ රිදී කොත්දෙන් කරණලද. ඒ පලඳනාව හිස් මුදුනෙහි හෙලාපී කල සම්බන්ධය ශොබමානගණ දෙපිටිපත් ලින් පිවත් ව සිවගත්ති ඒ ඒ ස්ථානයෙහි ඇත යතුරෙන් සන්ධි කරණලද ඊහි ගැට සකරන් මිය ය. මල් රිදී මය ය. මුදුනෙහි එක් සන්ධියෙක. දෙනතට දෙසන්ධියෙක. දෙවුරට දෙසන්ධියෙක. දෙමැල මිටට දෙසන්ධියෙක. දෙඋකුලට දෙසන්ධියෙක. දෙදනට දෙසන්ධියෙකැ යි මෙසේ සියලු ශරීරය ඒ ඒ තැන් ශොබමා සිටි සාවූ ඒ ආභරණයෙහි ඒ පලඳනාවෙහි ඉස්මුදුනෙහි එක් මියුර රූපයක් කරණලද. ඒ මොනරාගේ දකුණුලෙයෙහි සකරන් මය වූ පන්සියයක් පියාපත. වමැලයෙහි එසේ ම පන්සියයක් පියාපත. තුඩ ප්‍රවාලමය ව නිමමකලද. ඇස් ඉන්ද්‍රනීල මාණික්‍යමය ය. ග්‍රීවය හා පිල් ද ඉන්ද්‍රනීලයෙන් ම නිමවන ලද. තඹපත් ඝත රනින් ම නිමන ලද. තකුල් ද සකරනින් ම නිමකලද. ඒ පලඳනාව පැලඳ ගත් වේලෙහි විශාඛාවන් ඉස්මුදුනෙහි පර්වතයක් මුදුනෙහි නටන මොනරකු ගේ ශොභමාන ය. දහසක් රන්පත් හූලං ගත්කල පඤ්චාංගික තූර්‍යනාද ගේ මධුරවූ නාද ඇසෙයි දූර සිටියන්ට ජීවමාන වූ මියුරයෙකැ යි සිතෙති. ලග දුටු කෙනෙක් ම පලඳනා ය යි දනිති. මේ මෙල පලඳනාව නව කෙළක් පමණ රන් අග නේය. කල මිල ලක්‍ෂයක් දෙනලද.

මෙසේ භවකෙල ලක්‍ෂයක් අගනා මේ මෙල පලඳනාව කෙසේ වූ පිණකින් ලද්දාහුද? යත්;-මේ මෙල පලඳනාව නම් ධන ඇති කුලෙහි උපන් හැම සත්‍රීන්ට ලැබෙන්නා වූ පලඳනාවක් නො වෙයි. කාරණ කිම? යත්;

මේ මෙල පලඳනාව දරන්නා වූ සත්‍රිය ඇතුන් පස්දෙනකුට බල ඇත මැනැව. ඒ පලඳනාව කරඹුවෙහ ලා ලා අල්ලේ තබාගෙණ ඇවිදිනා වූ කොල්ල ද ඇතුන් පස්දෙනකුට ම බල ඇත මැනැව. නෙසැට දහසක් රජකුමර ඇත්තා වූ මේ සා දඹදිව් තලෙහි මේ මෙල පලඳනාම ලද්දාවූ සත්‍රීහු නම් බන්ධුලමල්ල සෙනාධිපතීන්ගේ

හායනීවූ බන්ධුලමල්ලිකාවෝය. බරණැස සෙනානී නම් සිටාණන් දූ යස නම් මහ තෙරුන්ගේ මවු වූ අප බුදුන් බුදුවන දා කිරිපිඩුදුන් දුන් සුජාතා නම් සිටුදියණියෝ ය. ධනඤ්ජය සිටාණන් දූ වූ මේ විශාඛාවෝ ය යි යන තුන්දෙන ම ලද්දාහු ය. එසේ හෙයින් පින් කළාවූ ස්ත්‍රියකට මුත් මේ මෙල පලඳනාව නො ලැබේ ම ය.

මේ විශාඛාවෝ පෙර කාශ්‍යප නම් බුදුන් සමයෙහි කිකී නම් රජ්ජුරුවන්ගේ සංඝදාසී නම් දූව බොහෝ පින් කරන්නාහු බුදු පාමොක් මහසඟනට අටපිරිකර දී සමයේ මසෙගෙන් ගෙත්තම් මිල හූ ඉදිකටු රදන්නත් දක්වා ත් සියල්ල ම තමන් තමින් නිමවා අටපිරිකර දුන්නාහ. යම් පුරුෂයෙක් දිනි නම් ඒ කුශල යෙන් ලක්ෂ ගණන් කප් සුව විඳ යම් දම්සෙන බුදු කෙනෙකුන් දක්න බණ අසා රහත් ව සෑඩි මිය වූ පාත්‍රා සිවුරු ලත් මෙලඟ නිමා යෙයි. යම් ස්ත්‍රියක් අටපිරිකර දිනි නම් කොයෙක් කල් සසර සුව විඳ මේ මෙල පලඳනාව ලදින් සිමන් දුටු කල නිමා යෙයි. එසේ හෙයින් මේ විශාඛාවෝ ද පෙර තමන් දුන් අටපිරිකර දානයෙහි පිණින් මේ මෙල පලඳනාව ලදහ යි දතයුතු.

එ දා ඒ විසාඛා නම් දියණියන්ට දායාද සම්පත් දෙන්නා වූ ඒ ධනඤ්ජය සිටාණෝ ගැල් පන්සියයක් මසුරනින් පුරා දුන්හ. තව ද පන්සියයක් ගැල් රන්මලදින් පුරා දුන්හ. පන්සියයක් ගැල් රිදී මලදින් පුරා දුන්හ. පන්සියයක් ගැල් ලෝ.මලදින් පුරා දුන්හ. පන්සියයක් ගැල් පටකඩ පිළියෙන් පුරා දුන්හ. පන්සියයක් ගැල් සළුපිළියෙන් පුරා දුන්හ. පන්සියයක් ගැල් ගිතෙල් බඳුනින් පුරා දුන්හ. පන්සියයක් ගැල් තලතෙල් බඳුනින් පුරා දුන්හ. පන්සියයක් ගැල් සුවඳ හැල් සාලින් පුරා දුන්හ. තවද පන්සියයක් ගැල් නගුල් වියදඬු සීවල් කැති උදලු දැකැති ආදිවූ ගොවියා සකින් පුරා දුන්හ. එකී එකී රථයෙහි සර්වාභරණයෙන් සැරහුනු ස්ත්‍රීන් තුන් තුන් දෙනා සිටුවා "මාගේ දියණියන් නව ව, පොව ව. ඇඟ උලව. ඉස්සෝධව. නාවව. මල්සුවඳ පලඳව"යි කියා පන්සියයක් රථ නංවා යෙළදෑසක් යොවන ස්ත්‍රීන් පාවා දුන්හ.

තව ද "මාගේ දියණියන්ට කිරිකන්ව සරක් බානකුත් දුන මනා වේ ද" යි අඹුවන් හා කථාකොට පිය පසකට ගොස් "කොල! මහ ගාල්වල ඉදි නො හැර කුඹා ගාලෙක ඉදි හරු ව" යි කියා කුඹා ගාලෙක ඉදි හැරවූහ. එ වේලෙහි කිණ්මුනා වූ ගවයෝ පුළුලින් ඉස්බක් හා දිගින් තුන්ගව්වක් තෙන ඔවුනොවුන් වල්

පත්වල නොලූ තබා අවකාශයක් නැති ව මහ මුහුදින් දිවූ මහ මස් රළක් සේ ගවරළ සිඹගත්හ. එවේලෙහි සිටාණෝ "මේ තෙක් ගවයෝ මදරුවන්ට ඇනැ" යි කියා ගාල්කඩ ඉදි ලවාපීහ. එ වේලෙහි විශාඛාවන්ගේ පින් බලයෙන් තමත් ව තමත්වා ත් ගාල් කඩා මැත සැට දහසක් ගොන් හා සැට දහසක් දෙනුන් හා පිටත වැගිර මල්පක් උඩට තබා ගෙණ අස්පෙළක් සේ දිවගෙණ තුන්ගව්වෙහි සිටි ගස්ස් රළ පසුපොට පියා පෙර තොත්තියෙහි දිවන්ට පටන්ගත්හ. ඒ වේලෙහි ඒ ආශ්චර්ය දුටු සිටානන් ඇතුළුවූ සියලු සතුන්ගෙන් සාධුකාර නුදුන් එකද සත්වයෙක් නැත. ඒ කෙසේ වූ පින්බලයෙක් ද? යත්;

පෙර මේ විශාඛාවෝ සංඝයාවහන්ගේ සවන සන්නයෙන්ම වළඳ වන්නාහු වළඳ අනතුරෙහි සාමණේර භික්ෂූන් කරා පලාගොස් "ස්වාමීනි! මේ ආහාර මධුර ය, මේ ප්‍රණීත ය, උතුම්, මේ බාද්‍ය භොජ්‍ය මැනැව 'යි කියා කියා නැමත නැමත වඩ වඩාම වැළඳවූවාහු ය. ඒ කුශල බලයෙන් දශාද දී අනාගතයෙහි එක් ලක්ෂ විසිදහසක් ගවයෝ ගාල්කඩ පැනගෙණ දිවූවාහු ය යි දතයුතු. ඉක්බිත්තෙන් ඒ සිටාණන්ගේ බිරින්ද කියන්නාහු "නුඹ මාගේ දියණියන්ට මෙසා සැපතක් දෙතද උන්ට මෙහෙ කරණ කෙලිකොල්ලන් කෙම් කෙපි යවුයයි විභාගයක් නො කෙළෙනැ"යි විචාළහ. සිටුහු කියන්නාහු "සොහැමැති වහලක් කර අල්වා දමා නො යමිහි මාගේ දියණියන් කෙරෙහි ප්‍රේම ඇති කෙනෙක් යෙති. නැති කෙනෙක් නො යෙති" කියා මෙසේ සෙට දවසට ගම්නැගි ගම බෙරලවා එදා රෑ දියණියන් තමන්ගේ ඇතුළු ගබඩාවට කැඳවා දියණියන් සමීපයෙහි සිටුවාගෙණ "පුතණ්ඩ! කුලයෙහි වසන්නා වූ ස්ත්‍රීනම් ශික්ෂිතව මාසය කල මැනැව. හැදිමිගිලෝ නම් මද අවකාශයක් දුටු කල ත් අපවම් තිත්ද කෙරෙති. එසේ හෙයින්: ඇතුල් ගෙන්, ගිනි පිටතට නො යවව. පිටතින් ගිනි ඇතුළට නො ගණු ම. දෙන්නන්ට ත් දෙව, නො දෙන්නන්ට ත් නො දෙව. දෙන්නන්ට ත් නො දෙන්නන්ටත් දෙව සුවයෙන් හිඳුව. සුවයෙන් සැතපෙව. සුවයෙන් ම හිඳ කව ගිනි පිරිමසව. ඇතුළු ගෙහි දෙවියන් පුදව"යි යන මේ අවවාද දශය සතවා මහ නුවණැති දියණියන් හෙයින් ඉගැන්වූහ. විශාඛාවෝ ද පියානන් කී අවවාද තමන්ට විශෙෂයෙන් ම දනෙන හෙයින් විභාග වෙන වෙන ම නො විචාරා සිත තබා ගත්හ. මිගාර සිටාණෝ එ ගබඩාවට දෙවන ගබඩාවෙහි සැතපුනාහු මේ අවවාද කථා අසා අදුරු ගේ කට වන්නා සේ කිසි අර්ථයක් නො දැන "මේ කෙසේ වූ බස්කමෙක් දෝහෝ'යි සැක කළහ.

ඉක්බිත්තෙන් සිටාණෝ දෙවන ද උදෑසන සියලු රජෙසනග රැස්කරවා හැම දෙනා මධ්‍යයෙහි මෙල්ලාසා සිටුවරුන් අමදෙනකු කැඳවාලා "තමාගේ දියනියන් ගිය තෙන කුගුණයෙක් උපන්නේ වී නමුත් නෙපි අවදෙන ඒ පිරිමසාලව"යි කියාලා නව කෙළ ලක්‍ෂ යක් අගනා මෙල පලඳනාව දියනියන් පලඳවා "පුතණ්ඩ මේ තොප නසා නානා මිල නැ"යි කියා සිවු පණස් කෙලක් මසුරන් ගැල් පුරා පාවා දී දියනියන් නික්මෙන වේලෙහි "මාගේ දුරුමන් කෙරෙහි ප්‍රේම ඇති කෙණෙක් උන් හා හැටි ම යව. මා කෙරේ ප්‍රේම ඇති කෙණෙක් රඳව" යි කියා බස්ගම්වල බෙර ලැවූහ. එ කෙණෙහි සියලු පරිවාර ජනයෝ "අපි අපගේ නැගනියන් හා හැටි ව යම්හ. අපි අපගේ සවාමි දියනියන් හා හැටි ව යම්හ"යි යනාදීන් ප්‍රිය තෙපුල් කිය කියා අනුරාධපුර කුමර හා බස්ගම් තුදුසෙන එන කෙණකු ත් නො රඳා අවුදින් අමුතු නැඩූ මහ වතුරක් සේ නමාගත්හ. විශාඛාවන් පියාණෝ රජ්ජුරුමන් මිගාර සිටානන් යුවරජ සෙනෙවිරත් ආදී හැමදෙනාම මහත්වූ සත්කාර කොට නොබෝ තෙනක් ගමන් පසුකොට ගොසින් දියනියන් මහත් වූ මගුලෙන් යවා නැවත ආවාහු ය.

මිගාර සිටාණෝ හැමදෙනාම පසුම රථයෙහි නැගී යන්නාහු ආපස්ස බලා මැඳින්දින මස මස පවන් මෙගයෙන් හමා සියඹරා ගසෙක පත් එනපෙළ දිවන්නා සේ ඔවුනොවුන් පරයා දිවන විශාඛාවන්ගේ පරිවාර දුන "කොල! කොල දිමන්නෝ බුලන් උදුරා නම්හ යි බබරව දිවන මහ පිරිසෙක් ද? නොහොත් සතුරු පිරිසෙක් දැ?"යි විචාළහ. පිරිසෝ කියන්නාහු 'තුමගේ ලේලනියන් ගේ දෑසාද පරිවාර ජනයෝ ය" යි කීහ. සිටාණෝ! "මෙ තෙක් මිනිසුන්ට නවාතැන් කොයි ද? මෙ කෙක් දෙනාට බත් පිළි දෙන්නෝ කවුරු ද? මරා ලුහුබඳව"යි කීහ. විශාඛාමෝ කියන්නාහු 'සවාමීනි! එසේ නො වදාළ මැනැව. එක කෙණකුන් ඉඩදුන මැනැවි. තුමූ තුමූ ම තම තමන්ට බත් උපයා ගණීති"යි කීහ. මිගාර සිටාණෝ "මේ තෙක් සත්ඹයන්ගෙන් අපට කාරිය නැතැ"යි කැමැණී පමණ පරිවාර හැරගෙණ ගොස් සෙසු ජනයන් රඳවා මහත් වූ උත්සවයෙන් ලෙහෙලුතියන් කැඳවාගෙණ සැවැත් නුවරට වන්හ.

විශාඛාමෝ "පච්චජ්ජාන යානාවෙන් යෙම් නම මාගේ රූප සම්පත්තිය හා මෙල පලඳනාව බොහෝ දෙන දක්ක නොහෙති බොහෝ දෙනා සිත් සේ බැලුව මැනැමැ" යි සිතාලා අලඞකාර වූ

රථයානාවෙක සිඳගෙණ බොහෝ දෙනා ඇස් තමින් කට හය හයා මිගා පෙළහරින් ගොස් ගෙට වන්හ. රජ්ජුරුවන් ආදිවූ මුළු නුවර වාසී "ධනඤ්ජය සිටාණෝ සාර මසක් මුළුල්ලෙහි අප අපට බොහෝ සත්කාර කළාහු ය" යි ගුණ කිය කියා විශාඛාවන්ගේ ගෙට බොහෝ පඬුරු යැව්වාහු ය. විශාඛාවෝ ද "මෙ පඬුරෙන් මට කම් නැත. උන් දුන් පඬුරෙන් උන් ඇම දෙනා ම සිත් ගන්මි"යි සිතාලා "මේ මාගේ නෑගණියන්ට දෙව. මේ මාගේ බූනණියන්ට දෙව. මේ මාගේ මයිලනුවන්ට දෙව. මේ මාගේ බෑනැනන්ට දෙව. මේ මාගේ මලනුවන්ට දෙව. බෑනනුවන්ට දෙව"යි යනාදින් වයස් බල බලා සුදුසු සුදුසු වූ නෑකම් කිය කියා උන් ගෙන් යවුවා අතික් ගෙයකට යවා, එ ගෙන් යවූවා අතික් ගෙයකට යවා, ඇම දෙනා ම සිත්ගෙණ නෑයන් සේ තබා ගත්හ.

ඒ මිගාර සිටාණෝ නම් මිථ්‍යාදෘෂ්ටි ගත් කෙනෙක. ලොවුතුරා බුදුන් එම නුවර ජේතවනාරාමයෙහි වැඩ සිටියදී ම රුවන් ආකරයක් බල බලා අඟුරු පස් උනාගන්නා සේ, හැල් කෙත මැද සිඳ කාට්ටසර කන්නකු සේ, චින්තාමාණික්‍යයක් බල බලා දවගේ ගල් ගන්නකු සේ, සඳුන් රුක් බල බලා සුවඳ නිසා රත්ද දඹු කපන්නා සේ, මී අඹගසෙක ඉද කොසඹ පල කන්නකු සේ, ඉපිරය් බල බලා ආලෝක යොයන්නකු සේ, මහගඟ පැන් බල බලා මඩමෙලෙහි ගැලෙන්නකු සේ, මාගේ සවාමිදරුවන් වැනි දෙව්ලෝ නැගෙන රුවන් හිනක් හැරපියා, නිවන් පුරයට යන රජමාවතක් හැරපියා, දහම් නැමැති කන තුඩ තබා අමාමහ නිවන් නමැති කිරි පොවා සියලු සතුන් නමැති දරුවන් සසර දුකින් ගලවන මෙ බඳු වූ නිවන් රජ දෙන මැහැනිකෙණකුන් හැරපියා ඒ සිටාණෝ ද නිගණ්ඨයන්ගේ දෘෂ්ටිගෙණ ඔවුන් රහතුනැ යි කියා පැහැද වාසය කෙරෙති.

ඒ සිටාණෝ පුතනුවන්ගේ ආවාහ මඟුල් කරන්නාහු පැන් ගෙනා වතා කිරිබත් පිසවා පන්සියයක් පමණ නිගණ්ඨයන් පවරා, තම තමන්ගේ ගෙයි දී කිරිබත් කවන්නාහු "මාගේ යෙහෙලනියෙ මාගේ රහතන්වහන්සේ දක වැඳ පව් ගෙවා ගණිත්ව" යි කියා යවුවාහු ය. විශාඛාවෝ තමන් සෝවාන් මාර්ගයට පැමිණ ආර්‍ය්‍යශ්‍රාවිකාවන් හෙයින් රහතුනැ යි අසා යබා රහත් නමක් ඇද්දෙහෝ යි සතුටුව ම සපිරාහරණයෙන් සැරහී නිගණ්ඨයන් බත් කන තැනට ගොසින් බලා උපන් වහා ම ඉඳ බත් කන නිගණ්ඨයන් දක නො සතුටු ව "මෙසේ අලජ්ජී වූ හිරිඔතප් නැති, කොල්ලන්ම

රහතුනැ යි කියා නුඹවහන්සේ මා මේ තෙනට කැඳවූ සේ නො සෙදෙසී" කියා මසිල වන්ව දෙඩා අතිස අතිස යි කිය කියා නිගණ්ඨයන්ට බැණ බැණ අංපස්සේ ගෙට පලාගියහ. එ වේලෙහි පන්සියයක් නිගණ්ඨයෝ "අතිස අතිස, සිටානෙනි! තොපගේ පුතනුවන්ට තරම් ශරණක් ගෙන්වා නො දී මහණ ගවුම් ගෞතම යන්ට ශ්‍රාවිකා වූ, මහා කාලකණ්ණි වූ, කෙල්ල කුමක් කියා පාවා දුනු දැ? තොපගේ ගෙයි සියලු සැපත තෙලැයෙග් පයම වහා අනතඹාත වෙයි. වහා තොපගේ ගෙන් ඇද කොරැම" යි කටින් කටින් බැණ දෙඩූවාහු ය. සිටාණෝ මුන් ගේ බසට මහා ධන ඇති කුලයෙන් ගෙණා කුමාරිකාව යවාපීම සුදුසු නො වෙයි සිතා "ස්වාමිනි බාල දරුවෝ නම් දැන ත් කියති. නො දැන ත් කියති. ක්ෂමා කළ මැනැවැ"යි නිගණ්ඨයන් සන්හිඳුවා යවා ආමු උතුම් වූ යාතෙන සිඳගෙණ තිරුදක වූ කිරිබත් රන් කලියකින් කන්නාහු ය.

එ වේලෙහි රහත් කෙණෙකුන් වහන්සේ සන්සුන් ගුණෙන් නො බැණ දොර මිදුලේ සිහා සිටි සේක. විශාඛාවෝ මසිලනුමන් ඇගට තල්වටක් සල සලා සිටියාහු ය. දොර වැඩ සිටි රහතන් වහන්සේ දැක තුමූ පෙණිලා "ස්වාමිනි! අනික් දෙරකම් වැඩවදල මැනව. මාගේ මසිලනුවෝ පුරාණය කති"යි කිහ එ බසම රහතන් වහන්සේ වැඩපී සේක සිටානෝ "පුරාණය කති"යි යි බසට කිපී අත තුබූ බත් පිඩ දමා ඉදිරියෙහි තුබූ බත් ඉවත් කරමා "මේ කෙල්ල මාගේ ගෙන් වහා ඉවත්කරව, මේ සා මඟුලෙහ උතුම් වූ අග්‍ර භොජනයක් කන්නා වූ මට අසූචි කති යි කිව. මාගේ රහතන් වහන්සේ ත් මැගේ තරම් කියේක. මහා නො ශික්ෂිත එකකැ"යි කිපී "තෙල ඇත ලව"යි කීහ. සිවාතන් එසේ කිම ත් සියලු පරිවාර ජනයෝ ම විශාඛාවන්ගේ ම ගෙයින් කිසිවෙකු ත් මුවෙන් නො බැණ සිටියාහ.

එ කෙණෙහි විශාඛාවෝ කිසි භයකු ත් නැත ව "මසිලනුවන් වහන්ස! නුඹ එන්ට කීකල එන්ට ත් යන්ට කීකල යන්ට ත් මා කලම්බියක නො වෙත්, මාගේ මවුපියන් ඇති වුව, මවුපියන් ඇති දූදරුමෝ තෙල සේ වූ බසට පලා නො යෙත් ම ය. මා එවන දවස් මපියානන් වහන්සේ සියලු පිරිස් හා නුඹවහන්සේ දූක්ක දී කෙලඹියන් අටදෙනකු මට පාවා දීලා "ම දරුවන් ගිය තෙන කිසි යම් වරදෙක් උපන් නම් තෙපි අටදෙන ඒ පිරිමසව" යි කියාලා එවා වදළ සේක් වේ ද, දැනුදු උන් අටදෙනා ම කැඳවාලා මා කළ

වරදක් උන් මැදුමෙහි ගිවිස්සාලව මැනව. එකල නිසඩක් දන් නෙම වේ දැ''යි කීහ. එ බසට සිටානෝ 'ඈ කීමයේ කාරණ ම ය''යි සිතාලා කෙලිඹියන් අවදෙනා එ තෙනට කැඳවාලා ''මේ කෙළි මා, නිරුදක වූ කිරිබත කමින් ඉන්ද දී අශුචි කෑ යි මට කීණුව. ඈ හැරගෙණ තොපගේ ගමට යව''යි කීහ. කෙලිඹියෝ එ බස් අසා විශාඛාවන් මුහුණ බලා 'සබා ද නැගනියෙනි, එසේ ම කියාපු දෑ දැ''යි විචාළහ.

විශාඛාමෝ කියන්නාහු ''මම අසුචි කති''යි නො කියෙමි බල එකෙනෙක් ඇත. පිඩු සිගා මේ දෙරට තෙර කෙණකුන් වහන්සේ වැඩි දෑ ය මූන්වහන්සේ ඔබ දැක දැක ම මූණෙන් නො බැණ කරබා ගෙණ හිඳ බත් කක දෑ ය. එ වේලෙහි මම උන්වහන්සේට 'ස්වාමිනි! අතික් දෙරකට වැඩපුව මැනැව. මාගේ මසිලනුවන් වහන්සේ පුරාණයේ කළ පින් ම අනුභව කරණ දෑ ය. දුන් පින් නො කරණ දෑය' යි සිතාලා 'පුරාණයක් කන දෑ ය' කීමි. සෙසු මා කී දෙයෙක් නැතැ''යි කීහ. එ වේලෙහි කෙලිඹියෝ ''එ කල නුඹමහන්සේ කීපුනේ ඇයි දෑ? අපගේ නැගනියන් කී වරදෙක් නැතැ'' යි කියා සිටානන් අතින් විචාළහ.

සිටානෝ එ බසෙහි අථ දැන එ බසට ක්‍ෂමා කොට ''තව ද එක් දා මධ්‍යම රාත්‍රියෙහි මේ කෙළි දඹුමැට පහන් ගෙන්වාගෙණ ගෙන් පිටතට ගියාහ. ඒ ගිය කාරණ විචාරව''යි කීහ. කෙලෙඹියෝ ''සබා ද නැගනියනි'' යි කීහ. විශාඛාවෝ ''අතික් කවලුන් තක් නිසා නො ගියෙමි. මේ ගෙයි වෙලඹක් දරුවක් වදාපුව. මම ඒ අසා එම වේලෙහි ම දඹුවැට පහන් ගෙන්වාගෙණ ඒ අශ්වශාලාවට ගොස් හුණු පැනින් නාමා සජීඛකයෙහි තෙල් ගල්වා කලමනා සත්කාර ඈව කරමා වැදගොත්තෙමි. අනික් සැකයෙක් නැතැ''යි කීහ. කෙලඹියෝ එ බස් අසා ''අපගේ නැගනියන් වහන්සේ නුඹගේ ගෙයි මහල්ලු ත් නො කලමනා දෙය කරණ දෑ ය. එයි ත් වරදෙක් දැ''යි කීහ.

සිටානෝ එ වරද ත් ක්‍ෂමා කොට ''තව ද: මූන්ගේ පියානෝ සරණ දෙන දා රැ අවමාද පසාරයෙන් දස මායමක් කීහ. එහි අථ මට නො දැනෙයි. එසේ හෙයින් මා මූන් කෙරේ සැක මහත. එහි අථ විචාරණු කැමැත්තෙමි. මූන්ගේ පියානෝ: පුතණ්ඩ! ගෙන් ගිනී පිටත නො දෙව යි කීහ. ඒ කිමෙක් දැ? ඉක්බිති ගෙට ගිනී පමණකු ත් නො දී මූන් අපගේ පුතනුමන්ට දීග ගෙණ බොහෝ දෙනාව වැඩ කරන්නේ කෙසේ දැ''යි විචාළහ. එ බසට

කෙළඹියෝ "සබා ද නැගනියනි"යි කීහ. විශාඛාවෝ එ බසට කියන්නාහු "අපගේ කුලෙහි ගිහිනබා සියලු රත්රුවන් ආදිය ත් ඉල්වා ආ කෙණකුන්ට නැතැ යි යන බසක් කියනු කෙණෙක් නැත. දරදඬු නඩනට ලොභයෙන් ගිනි නො දෙව යි කී නියාය නො වෙයි. පුත තොපගේ නැදිමයිලන්ගේ වේව යි සමණන්ගේ වේව යි මද මද වරදක් දුටු නමුත් බැහැර කිසි කෙණකුන්ට ත් නො කියව. ඊට වඩනා ගින්නෙක් අනික් නැත. එසේ හෙයින් කෝලාම නො කියව යි කී නියා ය"යි කීහ.

සිටාණෝ එ බසට සතුටු ව "තව ද තොපගේ පියාණෝ 'බැහැරින් ගිනි ගෙට නො ගෙණව'යි කිවු ය. තමාගේ ගෙයි ගිනි නිවී ගිය කල බැහැරින් ගිනි නො ගෙණ අවුත් බත් පිස කන්නේ කෙසේ ද"යි විචාළහ. එ බසට විශාඛාවෝ කියන්නාහු "ගිනි නො ගෙණව යි කී නියා නො වෙයි. බැහැර යම් යම් කෙණෙක් පුත තොපගේ නැදිමයිලන් හා සමණන්ගේ යම් යම් කුහුණක් කියාලූ නමුත් තෙපි දෙවනු ව ගෙට අවුදින් අසමල්ලු අසවල්ලු නුඹට මෙසේ මෙසේ කියූය යි කියා ගිනි යේ කුප්පා ගතු නො කියව යි ඉගැන්වූ නියා ය"යි කීහ.

එ වේලෙහි ද සිටාණෝ සතුටු ව සෙසු ඈහ ද පිළිවෙළින් ම යෙහෙලනියන් විචාළහ. යෙහෙලනියෝ ද පිළිවෙළින් ම පැන විසඳන්නාහු "නො දෙන්නට ත් නො දෙව යි කීයේ නම් යමෙක් පිරුළක් ඉල්වා ගන්නා කල මිහිරි කෙපුල් කිය කියා ඇඹිල්ලෙකින් දීලම් යි බොරුයෙන් වඤ්චාකොට පියා හැරගෙණ පලාගොස් [1]නිපිසිකාවන් සේ මුයෙන් නො බැණ වැද සිදියෙන් ද, කොයෙක් වාර යෙයි ගොස් ඉල්ලූ කල ත් අද දෙමි සෙට දෙමි යි කිය කියා කල් යවා නො දෙන්නේ ද එසේ වූ සත්ත්වයාට පුත පිරුළු නො දෙව යි ඉගැන් වූ නියා ය. දෙන්නන්ට ත් දෙව යි කීයේ නම් යම සත්ත්ව කෙණෙක් මෙතෙක් කලින් පාවා දෙමි යි කියාලා නය හෝ පිරුළු හෝ ඉල්වා ගෙණ ගොස් ඉන් තමන් වුව මනා ප්‍රයෝජනයත් විඳ ගෙණ කී අවධියට හෝ පලමු ව හෝ නො නසා ගෙණ අවුත් පාවා දීලති. එසේ සබා වූ සත්ත්වයන්ට නයත් පිරුළු ත් ඉල්ලූ තම් පමණක්ම දෙව යි ඉගැන්වූ නියා ය. දෙන්නන්ට ත් නො දෙන්නන්ට ත් දෙව යි කීයේ නම් දුඃඛිත වූ නෑසිය කෙණෙක් එව්ව යි දිළිඳු වූ යාචකයෝ වේව යි තමා ම ඇසුරු කළෝ වේ ද යි

1 නාපිසිකාවක්-ඇකැමි

අවුදින් යම් යම් සම්පතක් ඉල්ලූ කෙනෙක් ඇත්නම් දෙමනු. දිළිය නොහෙත් කවුත් හෙත් කවුත් පරීක්ෂා නො කොට උන්ට දිය යුතු ය යි කී නියා ය. සුවසෙන් හිඳුව යි කීයේ නම් කාලා බීලා අටල්ලට නැඟිලා ගෙයි ගිහි ගෙණියේ නමුත් නො බැණ දෙවියන් සේ නො සැලී හිඳුව යි කී නියා නො වෙයි   පුත තොපගේ නැඳි මයිලන් හා සමණන් දක නැඟී සිටිනා තරම් උස් පුටුවේ නො සිඳ සැහ නැති ව හිඳිනා තරම් අස්නෙක සුවසෙන් ඉඳුම යි කී නියා ය.

සුවසෙන් කව යි කී නියා නම් හැම දෙන ම සයින් ඉන්ද දී තෙපි පළමු ම සුවසේ කා පුරා පියව යි කී නියා නො වෙයි. තොපගේ නැඳිමයිලන් හා ස්වාමිහු හා සියලු කැවිය යුත්තන් කවාලා කෑවත් නො කෑවත් පරීක්ෂා කොට සියල්ලවුන් ම සත් හිඳුවා පසුව විකෙෂප නැති ම සුවසෙන් හිඳ කම යි කී නියා ය. සුවසෙන් ම වැද හොම් යි කීයේ නම් රුවන්නට පළමුව බඩ පුරා කාලා ඇඳට නැඟීලා මත ගනාහගණ වැදහොව යි කී නියා නො වෙයි නැඳි මයිලන් හා ස්වාමිහු හා බී සැතපුනු කල ඔවුන්ට කළ මනා උපචාර කරමාලා පසුව පුත තෙපි සුවසේ ම සැතපෙව යී කි නියා ය. ගිනි පිරිමසව යි කීයේ නම් ලිප් මුල කෙළිල්ලෙන් වැද හිඳ රැස් දමාලුක් කම් යේ නැතිම ම ගිනි පිඹ පිඹ හිඳුව යි කී නියා නො වෙයි, නැඳිමයිලන් හා ස්වාමිහු නයින් කොට ගිනි කොට සිතව යි කී නියා ය. ඇතුළු ගෙයි දෙවියන් වඳුව යි කීයේ නම් ගේ මැද ගිනි දෙවියන් හෝ පුදම, කුඹගේ ශිවලිඞ්ග දෙවියන් හෝ තබාගෙණ නිරන්තරයෙන් වඳුව යි කී නියා නො වෙයි. එක ගෙයි වසන නැඳි මයිලන් හා ස්වාමිහු දෙවියන් දුටුවා සේ වඳුව, පුදව, ආදර කරව, යි කී නියා ය. යනාදීන් මෙසේ මේ දශ අවවාදයෙහි අර්ථ විශාඛාවෝ විත්‍රකථික වූ පණ්ඩිත කෙණකුන් සේ මයිලනුවන්ට විශේෂයෙන් කීය. සිටානෝ මේ අවවාද කථා අසා ගොදුරක් ගිලූ පිඹුරකු සේ, ඖෂධයක් දුටු නයකු සේ, මුයෙන් නො බැණ ආශාවයීයට පැමිණ උත්තරයක් කියා ගත නො හී කර බාගෙණ උන්න.

එ වේලෙහි කෙළඹියෝ අටදෙන "කිමෙක් ද? සිටානන් වහන්ස! අපගේ නැඟනියන්ගේ කව ත් වරදෙක් ඇද්ද? යි විචාරා "කිසි වරදෙක් නැත," යි සිටානන් කී කල "අපගේ නිවරද නැඟනියන් කුමක් නිසා ගෙන් නෙරනා සේක් ද" යි කීක එ වේලෙහි විශාඛාවෝ "මා නිවරද බවට තෙපි අට දෙනම දෙස් වව, දුන් ම මඹ මාගේ ගමට යෙම්, කෙළි කොල්ලන් රැස් වන්නේ ය. දෑකාද සම්පත් වනා කොලවඹ" යි නිශෙශග කළහ.

එ වේලෙහි මිගාර සිටාණෝ ලග ඉපිල ගී හුනස්නෙන් පැන නැගී සිටුමරුන් අට දෙනා ම අත් අල්වා ගෙණ විශාඛාවන් ක්ෂමා කරවන්නාහු "යෙහෙළි! මා නො දන කියාපි වරද ක්ෂමා කරව. නො යව" යි කීහ. එ වේලෙහි විශාඛාවෝ "මම ක්ෂමා කෙළෙමි ම ය. එසේ ද වුව ත් බුදුසස්නෝ අචල වූ ශ්‍රද්ධා ඇති කුලදුවකිමි. තුඹ මිථ්‍යා දෘෂ්ටි ගත් දූ ය. මා සිත් සේ තුණුරුවනට මැදපුදා දන් දී බණ අසා ගන්නා වරයක් ලදිම් නම් මෙ ගෙයි රඳමි. නැත නො රඳමි" යි කීහ. එ බසට මයිලනුවෝ කියන්නාහු "තොපගේ බුදුන් සඟුන් සිත් සේ ගෙණවු ත් දන් දෙව. බණ අසව" යි වර දුන්හ. එ වේලෙහි විශාඛාවෝ රඳා දෙවන දා බුදුන් ප්‍රධාන වූ පන්සීයක් රහතන් පවරා එම විට ම ගෙණවුත් අලංකෘත කොට ගෙය සරසා උතුම් වූ බුද්ධාසනයක් පණවා බුදු පාමොක් සංඝයා හට නිරුදක වූ කිරිබත් පිසවා බුදුන් වළඳවන්නාහු "මයිලනුවන් වහන්ස! මාගේ බුදුන් හා සංඝයා වහන්සේ වළඳවන්ට අව මැනැවැ" යි කියා යවූහ.

එ වේලෙහි නිගණ්ඨයෝ බුදුන් සිටාණන්ගේ ගෙයි දී වළඳ දන්ට වැඩිය යි අසා "අද අපගේ බත් කෙතෙ අපමක් වෙයි. ඉතී කින් අප නවලා පස් කෙසී. මහණ හවත් ගෞතමයෝ ආවර්තනී මායම් දනිති. උන්ගේ රූප ශ්‍රී දුටු බූ නම් අප ගැමි ජරපත් වඳුරන් කොට ත් නො සිතති. උන්ගේ මධුර වූ නාදයෙන් කියන බණ කථා ඇසුවු නම් අපගේ බස් කැණහිල්ලන්ගේ අඩ කොට ත් නො සිතේ. පලමු ම පලාගොස් ඒ සිටාණන් උන් දක්න නො දෙන ලෙසක් කරමන' 'යි පන්සියයක් නිගණ්ඨයෝ පලමුව දිව අවුදින් සිටාණන් සිසාරා හිඳගෙණ "අපි තොපට තෙමාසිකවමහ. මහණ හවත් ගෞතමයෝ තොපට ආගන්තුක යෝ ය. උන් වළඳන තැනට ගියා නම් නිවන් මග අකුල් ලූවා හා සමාන ය. නො යව" යි යා නුදුන්නාහු ය.

බුදුන් වළඳා අනතුරෙහි වතාවත් කොට තුමූ අනුමෝදනා බණ අසන්නාහු "මාගේ මයිලනුවන් වහන්සේ මා කෙරෙහි සබා වූ කරුණාවක් ඇත් නම් මාගේ බුදුන් අතින් අද එක බණ පදයක් වත් ඇසුව මැනැව" යි කියා යවූහ. එ වේලෙහි සිටාණෝ "මා ලේලි මහනුවණ ඇත්තී ය. ඒකාන්තයෙන් මට අවැඩක් වන දෙයක් නො කියයි. ඇ කීම ම කෙරෙමි" සිතා නික්මුනාහ. එ වේලෙහි නිගණ්ඨයෝ සිටාණන් රඳවාගත නොහී "සිටාණෙනි! තොප යන බැවින් මහණ හවත් ගෞතමයන්ගේ මුහුණ දුටු නම

තොපට බොහෝ පව් රැස් වෙයි. උන් මුහුණ නො බලා කඩතුරාවක් මුවාවෙහි අසුන කරවාගෙණ හිඳ බණ අසව" යි කියා තුමූ පළමුව පලාගොස් සිටාණන්ට බුදුන් නො පෙණෙන සේ මහ තිරයක් ඇඳ බුදුන් මුවා කළහ. සිටාණෝ තිරය මුවාවෙන් ගොස් බුදුන් නො පෙණී බණ අසම් යි හිඳගත්හ.

එ වේලෙහි මාගේ ස්වාමිදරුවෝ ඒ සිටාණන්ගේ හේතුසම්පත් ඇති සේ දැක උන්ගේ චරිත පරීක්ෂා කොට සිය "මිගාර සිට! තෝ තිරයෙහි සිටක උන මැනැවැ. පවුරෙන් පිටත උන මැනැවැ. ගඟින් එ තෙර උන මැනැව. මුහුදින් එ තෙර උන මැනැව. හිමවුගලින් එපිට උන මැනැව. මෙරගලින් එපිට උන මැනැව. සක්වළ ගලින් එ පිට උන මැනැව. පරසක්වළ උන මැනැව. සියක් වන සක්වළ උන මැනැව. දසක් ලක්ෂයක් වන සක්වළ උන මැනැව. අද තා මාගේ බුදුමුඛ නමැති සැතයෙන් දහම් නමැති දැල දමා බඳගෙණ මා පිහිට කරා ගෙණිම් ම ය. දැන් තට සෝවාන් මග අලු කොට සිවසි පූර්ණ අවිම් ම ය. අද පටන් තා මාගේ සස්නෙහි දයාපරයන් කෙරෙහි ඇතුළත් කෙරෙම් ම ය. අද පටන් තාගේ මේ සිටුසැපත මාගේ මේ සසුන් කෙත වපුරුවා හරිම් ම ය" යනාදීන් සිත සිතා සතර මහ දිවයින එක පැහැර වස්නා සත මහා මේඝයක් එක දිවයිනකට වස්වන්නා සේ, සක්වළ ගබ පුරා සිටගත් දිව්‍ය මනුෂ්‍ය සෙනාවට දෙශනා කරන්නාවූ තමන් වහන්සේගේ සඬම්මාත චර්‍යාව එක මේ සිටාණන් කරා මෙහෙයාලා බණ වදාරන්ට පටන්ගත් සේක.

මාගේ ස්වාමිදරුවන් අෂ්ටාඞ්ගසමුපෙත වූ, නානා නය නිපුණ වූ, අනෙකාර්ථ ව්‍යංජන ප්‍රතිවෙධ ගම්භීර වූ, ලීලොපෙත වූ, මධුර ස්වරයෙන් ධර්මදෙශනා කරත් කරත් නිර්මල වූ කැටපතකින් ප්‍රති බිම්බයක් පෙණෙන්නා සේ සිටාණන්ට "මෙලෝ මේ ය. පරලෝ මේ ය. දහම් මේ ය. අදහම් මේ ය. මාර්ග මේ ය. අමාර්ග මේ ය. බුදු රුවන් මේ ය. දම්රුවන් මේ ය. සඟරුවන් මේ ය. තුණුරුවන් මේ ය" යි යනාදීන් විශෙෂයෙන් පෙණෙත් පෙණෙත් එකෙණෙහි උපන් බුද්ධාලම්බන ප්‍රීතීන් එම් තැන ම ඉඳ උතුම් වූ සෝවාන් ඵලයට පැමිණ "මේ ස්වාමිහුගේ දහම් රස මෙසේ මධුර කල උන්වහන්සේ ගේ ශ්‍රීමුඛය කලී උතුම් වන්නේ ම වේ දැයි එ කොබඳු දෙ හෝ යි සිතා නිගණ්ඨයන් නවත ව නවත්වා තිරය දැතින් ඔසවා බලා ස්වාමි දරුවන්ගේ සඳමඬලක් වන් මුව මඬල හා දෙතිස් අසූ ලකුණු හා කණ්ණන් කඳක් වන් බුද්ධ රූපය දැක අමාවලෙහි ගැලුනා සේ

පස්වණක් ප්‍රීතීන් ඔද් ව "මට මේ සා මැබෙස් අයිතකුත් නිසා වූයේ නො වෙයි. මාගේ යේලනියන් විශාඛාවන් නිසා ම වී ය" යි සිවක කරා දිවන පුතකු සේ පළමුකොට යසෙහෙළිනියන් සිටි තැනට ගොස් යසෙහෙළිනියන්ගේ පා ය නමන් මුඛයේ ලාංගණ "අද පටන් තුඹ මාගේ යේලිනී නො වෙයි, මා වැදූ මෑනියෝ නම් තුඹ ම ය. යසෙහෙළිනි මම තුඹගේ පුතනු වෙම් ම ය" යි කියා යසෙහෙළිනියන් මවු තනකුරෙහි තබා දෙවනුව බුදුන්ගේ ශ්‍රී පාද මූලයට ගොස් ශ්‍රී පාද ය මැද හෙම් ශ්‍රී පාද ය තමින් හිසින් පිස පිස "සවාමිනි! මාගේ බුදුරජාණෙනි! මිගාරසිටු නම් වූ තුඹගේ ගැති නම් මම ය. මෙ තෙක් දවස් මම තුඹ නො දක්නෙමි නො හැඳින්නෙමි. අද තුඹ ගුණ සහස්‍ර දුටිමි. අද තුඹගේ දහම් නමැති එළියට බැස මිථ්‍යාදෘෂ්ටි නමැති මහ වෙබැද් දෙහි තුගුණ නමැති කටු කකින බව දයිම්. ගැත්තවු නිසා ම බුදු වූහ යි සිතමි. ගැත්තවු නිසා ම දෙවුරම් වෙහෙර පිළිගත්හ යි සිතමි. ගැත්තවු නිසා ම මේ තුවර වැඩ හුන්හ යි සිතමි. අද පළමුකොට ලොව බලන වේලෙහි ගැත්තවු ම දැක වදාළහ යි සිතමි. ගැත්තවු නිසා ම අද මේ ගමට වැඩවදාළහ යි සිතමි. අද පටන් මේ මාගේ සතළිස් කෙළක් පමණ ධන ය පිරුණු පැන් කළයක් මුහුණියේ නැමුවා සේ කිසි දෙයකු ත් නො තබා තුඹගේ සසුන් නැමැති කුඹුරෙහි වපුරෙමි. අද පටන් ගැති ත් සැදෑ ඇත්තන් කෙරෙහි අනතගිත වූ එක්තරා එක් උපාසකයෙක් ම ය" යි යනාදීන් කිය කියා බුදුන් වැඳ නැගී සිට;

> සොහං අජ්ජ පජානාමි-යත්‍ථ දින්නං මහප්ඵලං,
> අත්ථාය වත මේ භද්‍ද-සුණිසා සරමා'ගතා යි.

ඉත මේ ගාථාව කියා යසෙහලකිනියන්ට සතුති කොට පියා "මාගේ යේලනියන්ගේ මෙ මේල පලඳනාව ඉතා බර හෙයින් අලඞ්කාර දවසෙක මුත් හැම වේලෙහි ම පැලැඳ්ද නො හැක්ක. හැම වේලෙහි ම පලඳනා පරිද්දෙන් මම ද උන්ට ලහු වූ පලඳනාවක් කරවමි"යි කියාලා ලක්ෂයක් වටනා සතළිසට නම පලඳනාවක් කරවා බුදුන් ආදි වූ රහතන් පන්සියයක් පවරා සත් දවසක් මහ දන්දී සත්වන ද යසෙහලකියන් සොළොස් කළයක් සුවඳ පැනින් නාවා දෙමහතක සේ සරහා ඒ පලඳනාව බුදුන් ආදි පන්සියයක් රහතන් පවරා පැලඳ වූවාහු ය.

එ තැන් පටන් ඒ මිගාරසිටාණන්ගේ ගේ නම් මිථ්‍යාදෘෂ්ටි හතුවන්ට පිඟම් දොර වී ය. බුදුන් දරුවන්ට අළු දොර වී ය.

මෙසේ ඒ විශාඛාවෝ මිථ්‍යාදෘෂ්ටි වූ ඒ සිටුකුලය තමන්ගේ නුවණ බෙලෙන් සම්‍යග්දෘෂ්ටියෙහි පිහිටුවා ගෙණ ඒ තීර්ථකවූ මිගාර සිටාණන් බුදුන් දක්වා බණ අස්වා සෝවාන් කරවා ඔහු විසින් මවු තන තුරෙහි තබන ලද හෙයින් එ තැන් පටන් මිගාර මාතාවෝය යි කියෑත් ප්‍රසිද්ධ ව බුදුසස්නෙහි ශ්‍රද්ධාවන්ත උපාසිකාවරුන් කෙරෙහි අග්‍ර වූහ. සියලු සඞ්ඝයා වහන්සේට ම මවු තනතුරු ලද්දාහු ය. දවස තුන් වාරයක විහාරයට එලඹෙන්නාහු ය. පෙරවරු භාගයෙහි එන කල වැළඳිය යුතු දෙයක් නො ගෙණ නො එන්නාහු ය. පස්වරු භාගයෙහි එන කල පානවර්ගාදි පස්වරු වැළඳියයුතු දෙයක් නො ගෙණ නො එන්නාහු ය. සවස් වේලෙහි එන කල මල් සුවඳ පහන් තෙල් බෙහෙත් ආදිය ගෙන්වා ගෙණ එන්නාහු ය.

එ කල විශාඛාවෝ සත්‍රිව සිට බුදුන් අතින් එක් දවසක් "ස්වාමිනි! මට වර අටක් දුන මැනැවැ" යි කීහ. ස්වාමිදරුවෝ "විශාඛාව! බුදුහු නම් ස්ත්‍රීන්ට දිය යුතු වර අතික්‍රාන්ත කළ හු වේ ද" යි වදාළ සේක. එ කල විශාඛාවෝ බුදුන් කෙරෙහි තමන් 'වල්ලභ හෙයින් භය නැති ව "ස්වාමීනි! සත්‍රින් ඉල්ලුව මනා වරයක් නො ඉල්ලමි. ශාසනයට උපකාර වූ සැදෑ ඇතියන්ට සම්පත්කි දෘශ්‍ය වූ උතුම වූ වර අටක් ඉල්වමි" යි කීහ. බුදුහු 'කියග, විශාඛාව" යි වදාළසේක.

මේ තැන් පටන් මාගේ ජීවිතාන්තය දක්වා නුඹවහන්සේ කරු ආගන්තුක ම යම් පමණක් භික්ෂූහු වැඩියාහු වූ නම් "පළමු ද අතික් දොරකට නො ගොසින් විශාඛාවන්ගේ දොරට නැමිදෙනාම අද සිගව" යි වදාරණ වරෙක. තව ද: මා දිවි පමණින් පන් සියයක් භික්ෂූන්ට නිත් දන් දෙනු කැමැත්තෙමි. එසේ වූ වරයෙක. තව ද: මේ බුදුසස්නෙහි ගිලන් වූ යම් කෙණකුන් වහන්සේ ගිලන් පස සිහා මාගේ දොරට ම යවා වදාරණ වරයෙක. ගිලනුන් බලන්නාවූ යම් කෙණකුන් වහන්සේට ද මාගෙන් ම දන් දෙවාලන වරයෙක තව ද: හැම දවස් ම මාගෙන් ම පන්සියයක් භික්ෂූන් හා සමඟ තැඳ අවුළුපත් වළඳ වදාරණ වරයෙක. තව ද: වස් අන්තයෙහි හවුරුදු පතා වස්සාවාසික ලාභ කොට පන්සියයක් අවපිරිකර පිළිගන්නා වූ වරයෙක. තවද: හැමදා ම බෙහෙත් පසක් බෙහෙත් බඩු ත් හැමදෙනා වහන්සේවම මාගෙන්ම පිළිගන්නා වූ වරයෙක. තව ද: බුදුසස්නෙහි හැම දෙනා වහන්සේට ම හවුරුදු පතා කස්පිළිසත් දන්දෙනු කැමැත්තෙමි. එසේ වූ වරයෙක. මෙසේ වූ අට වරයක් මට දුන මැනැවැ"යි ආරාධනා කළහ.

එ කල බුදුහු "සාධු සාධු විශාඛාව" යි තුන් යලක් මදුරා මෙ අට වරය ම දුන් සේක. මෙසේ වූ අටවරයක් ලදින් බුදුසස්නෙහි ශ්‍රද්ධාවන්තව සත්‍රීන් කෙරෙහි අග්‍ර ව පින් කළාහු ය.

තව ද: ඒ විශාඛාවන් වැදූ නිරෝගී ම පුත්තු දසදෙනෙක. නිරෝගී උන් වැනි ම දූවරු දසදෙනෙකැ යි මෙසේ දූ-පුතුන් විසිදෙනෙකු විසි හවුරුද්දක් ඇතුළත ම වැදූහ. එ දරුවෝ විසි දෙන ද එසේ ම විසි විසි දරුවන් වැදූහ. තව ද ඒ මුණුබුරෝ ද විසි විසි දරුවන් වැදූහ. මෙසේ ඒ විශාඛාවන්ගේ ම කුසින් වැදූ දරුවෝ ම විස්සෙක, මුණුබුරෝ ම සාරසියයෙක. මී මුණුබුරෝ ම අට දහසෙක. මොහු හැමදෙනා ම නිරෝගීහ, අකාල මරණයකට පැමිණි යාවූ එක දරුමුණුබුරු කෙණෙකු ත් නැත.

තව ද: එක්සිය විසි ඇවිරිදි වයස් දක්වා ඒ විශාඛාවන් ඉස එක තරකෙස්දකු ත් නො හැංගේ ය. දත් සෙලවීමෙක් වේව යි ඇඟ රැළි වැලඳීමෙක් වේව යි ජරාවට කාරණයෙක් නොපෙණුනේ ම ය. හැම දවස් ම දිව්දලින් ඔප්නැඟූ කනක රූපයක් සෙයින් සොළොස් හැවිරිදි යොවුන් ඇති කුමාරිකාවක ම වැසියහ. මෙතෙක් දරුමුණුබුරන් පිරිවරා විහාරාදියට ඒ විශාඛාවන් නික්මුනු කල නො හඳුනන්නෝ දරුමුණුබුරන් කා කොයි විශාඛාවන් කා කොයි නො දක්නාහුම ය.

තව ද: ඒ විශාඛාවන් ගමන් යන කල දුටුවෝ ගමන් යනකල ම හොබනා දැ ය යි කිය කියා සිටිති. හිටි වේලෙහි සිටිනා රිසියෙහි කියති. උන් වේලෙහි වැද උන් රුව ම රිසියෙහි කියති. හොත් වේලෙහි වැදහොත් ම රිසියෙහි කියති. මෙසේ සතර ඊර්‍යාපථයෙහි ම පියකරු වූ රූපශ්‍රී ඇතියහ.

තව ද: ඇතුන් පස්දෙනෙකුගේ බල ඇතියහ. කොසොල් රජ්ජුරුවෝ එ පමණ් අසා සත්‍රියකට ත් ඇතුන් පස්දෙනකුගේ බල ඇද්දැ යි කියා නො හිමිස එක්දවසෙක අද "ඇගේ බල බලමියි" යි කියාලා දවසෙක පන්සියයක් ස්ත්‍රීන් පිරිවරාගෙණ උන් විථිමධ්‍යයෙන් එන්නා දැක මද නැගි ඇතකු කොහොලින් ඇන කුප්පා ඉදිරියට ලුහුබඳවාලූහ. එ වේලෙහි විශාඛාවෝ ගුගුරා දිවන ඇතු දැක "මේ නුවර මා කෙරෙහි වෛරයක් ඇති කෙණෙක් නැත. මේ රජ විථියෙහි කිසි කෙණකු ත් නැත. රජුගේ සඳල්ලෙ ත් දෙර ඇරලා තිබෙයි. මේ අනික් කාරණයෙක් නො වෙයි. එකාන්තයෙන් මාගේ බල බලම් යි රජු කළ දෙය ම ය"යි නුවණින් දැන ඒ

සත්‍රිත් ඇතු දක බා දිවපී වේලෙහි තුමූ ඇතකු දුටු සිංහධෙනුවක සේ කිසි ම භයක් නැති ව වැද සිට සොඬ හකුළා කන් ලාගෙණ පෙණ කදු ගස ගසා ලහට අවුත් වැද ගිය ඇතු දක "මොහු නරවා අල්වා ගනිමි නම් රජුගේ ඇත් බිය යේ නම් නපුරැ" යි සිතා දෑඟිලි දෙකෙහි සොඬ ලාගෙණ මඳක් මිරිකාලූහ. එ වේලෙහි මහ අඹුවකිය් ගොහෙල්කඳක් මැඩලූවා සේ ඇතුගේ සොඬව මහත් වූ වෙදනා වී ය. එ කෙණෙහි ඇත් දිය සලා ඉලත්ති ලා මරණභයින් යඩ හඬා අංපස්සේ දිවපී ය. ඒ අංශවාසීන දුටු රජ පිරිස සාධු කාර දුන්හ. රජ්ජුරුවෝ ද සමාධි ව විශාඛාවන්ට සතුටු පඬුරු යවූහු ය. මෙසේ ඒ විශාඛාවෝ ඇත්බල ඇතියාහ.

තම ද: ඔහු අභිමඞ්ගල සම්මතයහ. සත් කෙළක් පමණ මනුෂ්‍යයන් ඔහත ඒසා සැවැත් නුවර සත්ත්වයෝ තමන් තමන්ගේ සියලු මඟුලෙහි විශාඛාවන් හා දරුමුණුබුරන් කැමදෙනා ම ගෙණ සොස් කාවා පොවා සත්කාර කරත්නාහු ම ය.

මෙසේ බුදු සස්නෙහි පැහැද බුදුන්ගෙන් බණ අසන විශාඛාවෝ දවසෙක තමන්ගේ නව කෙළලක්ෂයක් අගනා මේල පලඳනාව බණ අසා යන වේලෙහි සඳහන් නැති ව ධර්මශාලාවෙහි තබා ගොස් බුදුන් කෙරේ ආදරයෙන් ඒ මේලපලඳනාව බුදුන්ට ම පුදාපියා "ආවාසදාන කරවා දන් දීමෙහි විපාක මහතැ"යි අසා බුදුන්ට විහාරයක් කරවා දන් දෙමි යි සිතා ඒ මේල පලඳනාව රථයෙක තබා විකුණන පිණිස මුළු නුවර ඇවිදුවා මිල දී හැර ගන්නා තරම් අති ත් සත්‍රියක නැතිහෙයින් තුමූ ම නව කෙළලක්ෂයක් දී හැරගෙණ ඒ මිල දී බිමක් ගෙණ සැවැත් නුවරට නැගෙන හිරි දිග් භාගයෙහි පූර්වාරාම ය කරවත්නාහු යෙළ දහසක් පා පිහි ටුවා දෙමාල් මාලිගාවක් කරවා යටිමාලෙහි පන්සියයක් ගබඩා ය. මතුමාලෙහි පන්සියයක් ගබඩා ය යි විසිතුරුවූ දහසක් ගබඩා නිමවා රන් කොත් පලඳවා සැට කළයක් පැන් ගන්නා මහත ඇති සතරන් මිය පාදෙනි ලවා සැට සැමකළ ය පැන් ගන්නා සතරන් මිය වූ මහ දිය කළ සැටක් ලවා තෙසු රන් කොතලා රන්කෙණ්ඩිකා රන් වළන් රිදී වළන් සාංඝික කොට ම ලවා "මැටියෙන් කළ වළඳක් මාගේ විහාර සීමාවටගෙණ වැද්ද නො හැක්කැ"යි නියොග කොට මේ සියල්ලට තමන්ගෙන් ම රකවල් ලවා පවුරු දෙරටු පැන් පොකුණු උයන් මණ්ඩපආදි සියලු කර්මාන්ත ම නවමසෙකින් නිමවා අසූ මහසව්වන් ඇතුළු වූ සතළිස් දහස් පන්සිය ඒකාසූවක්

බුදුපාමොක් සඟපිරිස් පවරා මුළුනුවර අලලා කරණලද මහා පූජාවෙත් බුදුන් වඩා ගෙණවුත් දසක් ගබඩා වෙන වෙන ම දිව්‍යවිමාන සේ අලංකෘත කොට සාද දසක් යහන් දසක් බුඩාසන පණවා දසක් ආසන මුදුනෙහි රුවන් තම්‍ථානනයන් දිලියෙන දසක් සේසත් නංවා ඇතුළු මළුව තෙලඹර දක්වා බුමුතුරුණින් බිම් වසා වෙන වෙන ම ගබඩාවල් බුදුන්ට සුදුසු කොට බුදුන් අත පැන් වත්කොට ඒ පූජාරාම ය පිළිගැන්වූමාහු ම ය.

එ කල බුදුරජානන් වහන්සේ විශාඛාවන්ගේ පින් ලොභ ය ඉතා මහත් සේ දැන විහාර දස ය උතුම් සේ දැන ඇගේ බුඩාලම්බන ප්‍රීති ය අද වඩවමි යි සිතා ඒ මාළිගාව පිළිවෙළ මැද ගබඩාවෙහි පණවන ලද බුඩාසනයෙහි වැඩහිඳ ‘මා සේ ම දසයක් බුදුහු දසගබඩාවල හිඳිත්ව’ යි අධිෂ්ඨාන කොට වදාළසේක. එ කෙණෙහි දසගබඩාවල නිර්මිත බුදුහු පෙළී සවණක් රැසින් දිලිසි දිලිසී වැඩහුන් සේක. එ කල විශාඛාවෝ බුදුහු කවර ගෙයි වැඩහුන් සේක් දෝ නෝ යි දසගබඩාවල දසගබඩා ගෞතම බුදුන් දැක මහත් වූ ප්‍රීතියට පිණා මත් ව උද්දැන ගාථා පතුරුවා ඇම ගෙවල ම බුදුන් හෙයින් එක තෙනක ත් සිටගත නොහී, නැවත මහපාය දොරකඩ සිටියාහු ය.

එ වේලෙහි විශාඛාවන් සෙහිළි වූ එක් කුල ස්ත්‍රියක් මේ පිංකෙණෙහි මම ත් සමාදන් වෙමි යි සිතා දසක් අගනා පලසක් ගෙණ විශාඛාවන් පෙරට ව සිට “ස්වාමිනි! තුඹගේ ගෙයි මාගේ පිළිය බුමුතුරුණු කොට අතුරණු කැමැත්තෙමි අවසරයක් දුන මැනැවැ”යි කිව. විශාඛාවෝ පිළිය බලා “මේ පිළිය නපුරු යි කීම් නම් මැ සිත කලකිරේ”යි සිතා තමන් වහනුවණැ’ති හෙයින් ඒ පිළිය නපුරු නියාව ඇට ම හඟවමි යි “බුහුමනියෙනි! තෙපි ම මේ පායෙහි දසක් ගබඩා බලා තෙල පිළියට අඩු පිළියක් දුටුවු නම් ඒ පිළිය ඉවත් කොට තොපගේ මේ පිළිය අතුට පින්පුරා ගණුව” යි කීහ. ඒ කුල ස්ත්‍රී දසක් ගෙවල ඇවිද අනගි බුමුතුරුණු බලා තමාගේ පිළිය අඩුසේ දැන නැවත අවුදින් “මේ සා පිංකෙණෙහි එක්විය නුහුනුයෙමි”යි මහ හඬින් හඬ හඬා සිටියා ය.

එ වේලෙහි අප අනඳ මහ තෙරුන් වහන්සේ මැ හඬන්නා දැක “මේ සා පූජාවෙහි කුමට හඬා ද, නැගනියෙනි!”යි විචාරා අඬන කාරණ අසා “තොපගේ පලස අතුරණ තෙනක් මම දනිමි”යි වදාරා විශාඛාවන් නො සැලකූ තෙනක් දැක සඳකඩ පහණ හා පාදෙනිය අතුරෙහි පාපිස්නී කොට ලවා වදාළ සේක. මෙසේ මහැඟි වූ පූජා

විශාඛා මහා උපාසිකාව පූර්වාරාමය කරවා බුදුරදුන්ට පූජා කිරීම,
364 පිට බලන්න. (23-24)

රාම පූජා ව සාරමසක් මුළුල්ලෙහි කළාහු ය. විහාර බිම ගත්තා වූ නව කෙළක් ධන ය, විහාර කර්මාන්තයට නව කෙළක් ධන ය, දන පූජාවට නව කෙළක් ධන ය යි මෙසේ සත්විසි කෙළක් ධන ඒ එක පූර්වාරාම විහාරයට ම තුනුරුවන් උදෙසා ම පූජා කළාහු ය.

මේ විශාඛාවෝ මෙසේ වූ ආශ්චර්ය කුශලයක් පෙර කෙසේ වූ පිණක් කොට ලද්දාහු දැ? යත්;

ගිය දවස අටපිරිකර දුන් පිණින් මේ පළඳනාව ලදහ. කාශ්‍යප බුදුන් සමයෙහි කිකී නම් රජ්ජුරුවන් කුඩා දූ සංඝදාසී ව පන්සිල් රක්‍ෂා කළාවූ පිණින් පඤ්චකල්‍යාණයෙන් යුක්ත වූ උතුම් රූපශ්‍රී ලදහ. පෙර බොරුවක් නොකී කුශලයෙන් සම වූ දූන් පුතුන් ලදහ. බෙහෙත් පස ගිලනුන්ට දන් දුන්නා වූ කුශලයෙන් තුමූ ද නීරෝගීව නිරෝගී වූ දරුමුණුබුරන් ලදහ. බුදුන් සඟුන්ට පෙර කිරිපිඩු දන් දුන් කුශලයෙන් සත්‍රීම සිව ඇතුන් පස් දෙනකුට බල ඇතිවූහ. තව ද ගිය දවස භික්‍ෂූන් පවරා සවහස්තයෙන් වළඳවන කල වළඳා අනතයෙහි එක බත් ආලෝපයක් වළඳ වාලූ කුශලයෙන් දැයාද සරක් දෙන දවස් එක්ලක්‍ෂ විසිදහසක් ගවයෝ ගාල් කඩා පැන වැගිර ගියහ. ඒ මේ කුශලයෙන් උනු නොමන සම්පත් ලද්දාහු ය. පියුමතුරා බුදුන් සමයෙහි කළා වූ ප්‍රාර්ථනාව හේතුකොට ගෙණ කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි දිව්‍යලෝක මනුෂ්‍යලෝක සම්පත් සුම විඳ දූන් අප මහා ගෞතම බුදුන් සමයෙහි සත් ඇවිරිද්දෙහි බණ අසා සෝවාන් ව බුදුසස්නෙහි සැදැහැ ඇති සත්‍රීන් කෙරෙහි අග්‍ර වූ තනතුරු ලදින් දනාදි පින් රැස් කොට සංසාර සාගරයෙන් ගොඩ නැංගාහු ය යි දතයුතු.

මෙසේ තමන් වහන්සේගේ සස්නෙහි සැදෑ ඇති සත්‍රීන් කෙරෙහි අග්‍ර වූ තනතුරු ලදින් විශාඛා මහා උපාසිකාවන් සත් විසි කෙළක් ධනය වියදම් කොට පූර්වාරාම ය කරවා පිළිගන්වා, එ දා පටන් සාරමසක් මුළුල්ලෙහි දවස් පතා කරණලද එක්සිය විසි මහ පූජාවක් ලත් හෙයිනු ත් එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වන සේක.

එසේ හෙයින් කියන ලදුයේ මැයි:

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං යි.

මේ පූජාවලියෙහි
අප බුදුන් විශාඛා මහා උපාසිකාවන්ගෙන් ලද
පූර්වාරාම පූජා කථා නම් වූ
අටළොස් වන පරිච්ඡේදය නිමි.

එකුන්විසි වන පරිච්ඡේදය

තව ද: අප බුදුන් එම පූර්වාරාමයෙහි දී රාහු අසුරේන්ද්‍ර ප්‍රමුඛ සාමණේරාදීන්ගෙන් ලද නමස්කාර දහර ශිෂ්‍ය ප්‍රතිපත්ති පූජා කථා නම කවර? යත්; මේ එහි පිළිවෙළ කථාව යි:-

ඒ රාහු අසුරිඳු නම මෙර පත්ලෙහි දසදහසක් යොදුන් අසුර භවනයෙහි වෙසෙසි. එ තෙමේ සාරදහස් අටසියයක් යොදුන් උස ඇත්තේ ය. පත්ලෙහි පටන් දනහිස්හිසට එක් දහස් දෙසියයක් යොදුනි. දන පටන් නාභියට එක්දහස් දෙසියයක් යොදුන් උස ය. නාභියෙහි පටන් ගලසරට එක්දහස්දෙසියයක් යොදුන් උස ය. ගලසර පටන් ඉස් මුදුනට එක්දහස් දෙසියයක් යොදුන් උස ය. දකුණු උරවට පටන් වම උරවටට එක්දහස් දෙසියයක් යොදුනි. ඉසවට නවසියයක් යොදුන් පමණ ය. නළල තුන්සියයක් යොදුන් පමණ ය. බැම්තුර පණස් යොදුන් පමණ ය. මුඛය දෙසිය යක් යොදුන් පමණ ය. ගැඹුර තුන්සියයක් යොදුන් පමණ ය. අතුල් පතුල් පළල දෙසියයක් යොදුන් පමණ ය. ඇඟිලි පුරුක් පණස් පණස් යොදුන් පමණ ය. එහි එහි පියමර සත් සිය පණස් යොදුන් දිග ය. රියන එක් දහස් දෙසියයක් යොදුන් දිගය. වියත සසියයක් යොදු න් දිග ය. එක ඇඟිල්ලෙන් හිරිමඬල සඳමඬල වසාගනී. මෙසේ වූ උස මහත ඇති හෙයින් "මෙ තුන්ලොව මා මට වඩා උස් මහත් කෙනෙක් නැතැ" යි අභිමාන ව බුදුන් කරා නො එළඹෙයි.

එක් කලෙක බණ අසා ගිය දෙවියෝ බුදුන්ගේ මහිම මෝ හට කියා තොපිත් බුදුන් කරා ගොස් බණ අසව යි කීහ. එ කල රාහු අසුරිඳු "තොපගේ බුදුහු කෙසේ වූ කෙනෙක් දැ"යි විචාළේ ය. අපගේ බුදුහු දෙලොස් රියන් උස ඇති සේක. සරියන් ව්‍යාමප්‍රභා මඬුලු ඇති සේක. මෙසේ අටලොස්රියන් බුද්ධකායක් ඇතිසේක් වේදැයි කීහ. එ බසට රාහු අසුරිඳු සිනාසී "දෙලොස් යොදුන් උස ඇති මහා බ්‍රහ්මයා පමා මාගේ දන අත්ගාපියන තරම් උස නැත් තේ ය. සදෙව් ලොව තුන්ගවු උස දෙවියෝ මාගේ අංගුලි පර්වයක් පමණ උස නැතියහ. තොපගේ දෙලොස් රියන් උස ඇති බුදුන්

කරා ගොස් උන් කොයේ වදිම් දැ"යි කී ය. එ වේලෙහි දෙවියෝ "අසුර ය! තා සේ වූ අසුරයෝ සියයක් දහසෙකු ත් උනුන් පිට සිට බලා ත් අපගේ බුදුන්ගේ අතවලෝ මුදුන් දක්න නො හෙති" යි යනාදීන් බුදුගුණ කීහ. රාහු නම් අසුරිඳු එ බසට කිපී "මහණ භවත් ගෞතමයන් යා උස මහතට වැද කෙරෙම්" යි වාසි කියා බුදුන් කරා ආය.

එ දවස් මාගේ ස්වාමිදරුවෝ අරුණෝද්ගමන වේලෙහි මහා කරුණා සමාපත්තියෙන් නැගී ලොමට නුවණ නමැති දැල දමා වදාරා මේ රාහු අසුරිඳු එ දැ දැල බැඳෙන සේ දැක ඔහු උදෙසා බොහෝ සත්ත්වයන්ට අධිගමය වෙසී දැන අනඳ මහ තෙරුන් වහන්සේ කැඳවා "ආනන්ද ය! රාහු නම අසුරිඳු උස මහතට මා හා වැදගට එම්න් සිටියේ ය. සත්ත්වයන් වැදහොත් කල සියලු ඉරියව්වෙස් තුබාම පෙනෙයි. එසේ හෙයින් ඔහු පෙරම වැදහෝනා කැමැත්තෙම් කෙලෙ උස් වූ ගහනත් ඔසවා පියා බිම බුද්ධාසනයක් පණවාලව"යි වදාළසේක. අනඳ මහතෙරුන්වහන්සේ එ කෙණෙහි එ ගහන ඔසවා බුදුන්ට හුමිගත වූ යහනක් අතුළ සේක. ඉක්බිත්තෙන් ස්වාමිදරුවෝ දකුණුදිගට සිරස ලා, පැළ දිගට පිට ලා, පුපිදිගට ශ්‍රී මුඛය ලා, උතුරු දිගට දෙපය ලා, ශ්‍රීපාද දෙක මිඟු මතුයෙහි තබාගෙණ දක්ෂිණ ශ්‍රී හස්තය හිසට ලා සෙණ වාම හස්තය ශ්‍රී ශරීරය මතුයෙහි ප්‍රවාල සාගරයෙහි ගමන් ගත් රත්වන් වූ දිව්‍ය නාගරාජයකු සේ සුරතන වූ සිවුර මතුයෙහි තබාගෙණ මෙසේ සිංහශෙය්‍යාවෙන් සැතපී වැදහොත් සේක.

එ වේලෙහි රාහු අසුරිඳු බුදුන්ගේ ශ්‍රීපාදමූලයට අවුදින් සිට සිරිපතුල් දෙක දැක සක්ලකුණු දෙකින් හා දෙදහසක් දම්පෙළින් හා දෙසිය සොළොස් මඟුල්ලකුණෙන් විසිතුරු වූ, එ සිරිපතුල් දෙකින් මහ පවුරක් අස සිටිනා කුඩා කොල්ලකු සේ සැඟවී සිට, "මේ මහණ භවත් ගෞතමයන් කුඩා ය යි කීයහ. දැන් උන්ගේ පතුලේ කෙළවරෙක් මට නො පෙණෙයි. මේ කෙසේ වූ විස්මයෙක් දෝ හෝ" යි සිත සිතා බල බලා සිටියේ ය. එ වේලෙහි ස්වාමි දරුවෝ මහ මේ ගබක් බැඳනැංගා සේ බ්‍රහ්මනාදයෙන් "රාහු අසුරිඳ, එසෙවී එසෙවී කුමක් බල යි දැ" යි වදාළ සේක. ඒ ශබ්දය අසා 'මහණ භවත් ගෞතමයෙනි! නොපගේ පත්ලෙහි කෙළවරක් බලම්" යි කී ය. බුදුහු වදාරණ සේක් "රාහු අසුරිද! තා මේ තැන් පටන් භවාග්‍ර ය දක්වා බල ත් මාගේ පත්ලෙහි කෙළවරෙක් තට නො පෙණෙන්නේ ම ය" යි වදාළ සේක.

රාහු අසුරිඳු බුදුන්ගේ ශබ්දය ඇසී සඬතුරාවක් මුඹාවෙහි සිට කථා කරන්නකු සේ බුදුන්ගේ ශ්‍රී පාදයෙන් මුවාම හොස් ශ්‍රී මුඛය නවම දක්න නො හේ මි ය. එසේ හෙයින් රාහු අසුරිඳු "මෙ බඳු වූ සිරි පතුල් දෙකක් හා මෙ බඳු වූ මධුරනාද ඇති හමත් ගෞතමයන්ගේ ශ්‍රී මුඛය කලි ඉතා හොබනේ ය සි මුහුණ බල මි" යි සිතාලා සාරදහස් අටසියක් යොදුන් පමණ ඒ සා මහත් උස ඇති ඒ අසුර රාජයා අහස් මුදුනෙහි තුබූ සඳක් බලන කුඹා කොල්ලකු සේ අක්පත්ලෙන් එසෙව් එසෙව් සැරහී සැරහී කර නගා බලනුයේ බුදුන්ගේ ශ්‍රී මුඛය දක්ක නොහී එ වේලෙහි උස මහත්මිසි යන අභිමානයෙක් ඇත්නම් මහමෙර ගල ලයට පැමිණී උදුන් නැවක් සේ අභිමාන ශූන්‍ය ව "සවාමිනි! බුදුරජාණෙනි! නුඹගේ මහිම නොදැන නුඹ ම උස්මහත් බව නො දැන නුඹම ලෝකස්වාමි යයි නොදැන මෙතෙක් කල් නුඹ මැසී උතුමකු කරා නො ආයෙමි. අද පටන් නුඹගේ ගැත්තෙමි. නුඹගේම පා වඳිමි. නුඹගේ ම සරණයෙමි. ගැති ශ්‍රී මුඛය දැක පව් ගෙවා ගන්නා කැමැති ය' යි අරාධනා කෙළේ ය. එ වේලෙහි සවාමිදරුවෝ මහ මෙගබක් පලා සඳමඬලක් පැවාසේ තමන් වහන්සේගේ ශ්‍රී මුඛ ය ඔහට දක්වාලා බණ වදාළසේක. එ වෙලෙහි සුවාසූ දහසක් දෙවියෝ අමාමහ නිවන් දුටු හ. අසුරයන් හා පරනිර්මිත වශවර්තීන් අවජ්ඣීඥ-අභව්‍ය වන බැවින් ඔවුන් ඉතිගමයට නො පැමිණෙන හෙයින් ඒ රාහු අසුරිඳු මාර්ගඵලයක් නො ලදත් ශරණ ශීලයෙහි පිහිටා සඬම් ප්‍රීතින් මත් ව තමාගේ සසියයක් යොදුන් දිග ඇති අතුල් දෙක ඉස්මුදුනෙහි තබාගෙණ බුදුන්ට තුන්යලක් නමස්කාර පූජා කොට තමාගේ භවනයට ම ගියේ ය.

මෙසේ උසමහතව අභිමාන ගත් රාහු අසුරේන්ද්‍රයන් පමා තමින් වහන්සේගේ බුඬ මහිමයෙන් ම අභිමාන ශූන්‍ය කොට ඔවුන් විසින් කරණ ලද මෙසේ වූ නමස්කාර පූජා ලැබීමට සුදුසු හෙයිනු ත් දේවා'තිදේව වූ, ශක්‍රා'තිශක්‍ර වූ, බ්‍රහ්මා'තිබ්‍රහ්ම වූ මාගේ සවාමිදරුවෝ අර්හත් නම් වන සේක.

තව ද: මේ ම පූර්වාරාමයෙහි දී සත් හැවිරිදි සුමන සාමණේර යන්ගෙන් ලද ප්‍රති පත්ති පූජා නම් කවර? යත්; මෙ එහි පිළිවෙළ කථාව ය:

කපිල වස්තු පුරයෙහි ශුද්ධෝදන රජ්ජුරුවන් මල් අමිතෝදන නම් ශාක්‍යරජ්ජුරුවන්ගේ අගමෙහෙසීන් බිසෝ වූ සඳ නම් දේවින්

මැදූ දරුවෝ මහානාමය අනුරුද්ධය'යි පුතුන් දෙදෙනකු හා රොහිණී නම් දියණි කෙණකුත් හා තුන්දෙනෙකක් වූහ. එයින් අනුරුද්ධ නම් කුමාරයෝ ඉතා මහත් වූ පින් ඇති කෙණෙක. ඔවුන් සත් අට හැවිරිදි කල රජකුමරුවන් තුන්දෙනකු හා සමග පැරදි කෙණෙක් "කැවුම් තලි, දෙම්හ"යි ගිම්හ ගුල කෙළි කෙළි නාහු ය. එ කල අනුරුද්ධ කුමාරයෝ පැරද කියහ. සෙසු රජකුමරුවෝ "කැවුම්තලියක් දුනො ත් මූ ත් නො කෙළම්හ" යි කීහ.

එ වේලෙහි අනුරුඩ කුමාරයෝ තමන් පැරදි බව මෑණියන්ට කියා යවා කැවුම් තලියක් ගෙන්වා දී, මෙසේ ම තුන් වාරයෙක පැරද තුන් මාරයක් කැවුම් ගෙන්වා දී, සතරවන වාරයෙහි ත් පැරද "කැවුම් තලියක් එවන්නේ ය" යි මෑණියන්ට කියා යවූහ. බිසොවු තුන්වාරයෙක කැවුම් යවා කුසි ව "දරුවන් පැරදි පැරදි සේ මම කැවුම් තලි යවා ගත නොහෙමි. ඉතිකින් ගෙයි කැවුම් නැතැ" යි කියා යවුවාහු ය. අනුරුඩ කුමාරයෝ කැවුම් නැතැ යී කියා යවූ බස් අසා තමන් උපන් තැන් පටන් නැතැ යි යන බසක් නො ඇසූ විරූ හෙයින් නැතැ යී යන බසෙහි අර්ථ නො දැන "නැති පූ ය යි යන පූ ජාතියක් ඇතිමනැ" යි සිතා 'එ නැති පූ වනා එවන්නේය" යි කියා යවුවාහු ය.

මෑණියෝ එ බස් අසා තමන් අතුරෙහි සිතාසි "මාගේ පුතනුවෝ තමන් ශ්‍රීමත් කුලෙහි උපන් හෙයිනු ත් මහපින් ඇති හෙයිනු ත් නැතැ යි යන බසෙහි අර්ථ නො දනිති. මපුතනුවන් මිතු රාජ්‍යය කරණ කල නැතැ යි යන බසක් නො කියා රාජ්‍ය ය කල නො හැක්කෝ ම වේ ද, ම පුතනුවන් නැතැ යී යන බසෙහි අර්ථය උගන්වමි" යි සිතාලා රන්තලියක් ශුද්ධකරවා පියා අනික් රන්තලියකින් මසාලා "තෙල නැති පූ මපුතනුවන්ට දෙව" යි කියා නිකම් තලිය යවුවාහුය. එ කෙණෙහි එ නුවර අරක් ගත් දේවතාවා "මාගේ අනුරුඩ කුමාරයෝ මවු කුසින් උපන් දා පටන් නැතැ යි යන බසෙහි අර්ථ නො දත්තාහු ය. අද එ බසෙහි අර්ථ දැන පූ නම් උන්ගේ පින් බලයෙන් මාගේ හිස සත්කඩක් ව පැළී යෙයි', කියා මරණභයින් වෙව්ලා එ ගෙණ යන්නා වූ තලියෙහි දිව්‍ය වූ පුවද කැවුම් මවාලී ය. එ වේලෙහි ගෙණ ගොස් තලිය අනුරුඬ කුමාරයන් ඉදිරියෙහි තබාලා ගෙණ ගිය පුරුෂයා අක් කොළින් මදක් සිතාසී "ස්වාමීනි! තෙල නැති පූ කැව මැනැවැ" යී කියාලා මත්තෙහි තුබූ රන්තලිය ඔසවා පීය. එ කෙණෙහි ඒ දිව්‍ය කැවුමෙහි සුවඳ ඒ සා මුළු නුවර මුළුල්ලෙහි හමා බස්නට පටන්ගත.

එයින් එක කැවුමක් හැරගෙණ දිවඅග තබාලූ වේලෙහි අනුරුඬ කුමාරයන්ගේ සකල ශරීරය පිණවාගෙණ සත්දහසක් නහර රසයෙන් පුරා සිටගත. එ කැවුම් තුබූ ත් කාලා ශෙෂවූත්ම ත් බෙදූ දීලා කෙලනා කෙළි තබාපියා සතුටු සතුටු ව රජගෙට පලා ගොස් මෑණියන් ඔර පිට මැඩහිඳ දෑණින් කර මැලදගෙණ මෑනියන්ගේ මුහුණ හා දෙතන සකා පියා "මෑණියන් වහන්ස! මෙ තෙක් දා තුඹ මට ස්නෙහ නැත්තෝ ඇයි දා, අද මට සෙනහ ඇති ව ගියෙහි නැ" යි විචාළහ.

එ වේලෙහි මෑණියෝ පුතනුවන් කෙරෙහි ප්‍රේමයෙන් සතුටු කඳුළු ගෙණ පියා "පුතනුවෙනි! කුමක් කියන්නෙහිද, මාගේ ඇස් දෙක ත් මාගේ හදවත ත් තුඹ ත් මෙ සහර ම මට සම ම ය. ඒ ඇස් දෙකට ත් හදවතට ත් තුඹ ම මට ප්‍රිය දෑ ම ය" යි කීහ. අනුරුඬ කුමාරයෝ කියන්නාහු 'එසේ තුඹවහන්සේ මට ස්නෙහ ඇතිකල මේ තෙක් දවස් මෙ බඳු වූ රසඇති කැණිලූ මට පිස තුඩුන්නෙ නැ"යි කීහ. බිසොවු කාලිය ගෙණසිය පුරුෂයා අතින් විචාරා මේ පවත් දැන මාගේ පුතනුවන්ගේ පින්බලයෙන් දිව කැවුම් දෙවියෝ මවා දුන්න යි දැන ඉතා විස්මයට පැමිණියහ. එ වේලෙහි අනුරුඬ කුමාරයෝ "මෑණියන් වහන්ස! මා කෙරෙහි සතා ඇත්තේක් වී නම් අද පටන් ගෙන සෙසු කැවුමක් නො කම ම ය. කැණිලූ ම මට පිස එවන්නේ ය" යි කියලා කෙළිනට දිව පීහ. එ දා පටන් කැවුම් කම් යි කියා පුතනුවන් එවාලූ කල මෑණියෝ පෙර සේ ම රන්තලියක් සෝදා, රන්තලියකින් වසා යව යවාලති, පෙර සේ ම දෙවතාවෝ දිව්‍ය වූ කැවුම් එම මවාලති, අනුරුඬ කුමාරයෝ සෙසු කැවුමක් නො කා දෙවියන් මැවූ කැවුම ම කා නැතැ යි යන බසෙහි අර්ථ නො දැන සිහිගෙහි වැඩුනාහු ය. මේ කොසේ වූ පින් බලයෙක් දැ? යත්;

පෙර මේ අනුරුඬ කුමාරයෝ එක් ජාතියෙක දිළිඳු වූ එක් කුලයෙක ඉපැද අනුන්ට තණ දා තණ කත් ඇද ජීවත් වෙති. එ සමයෙහි උපරිට්ඨ නම් පසේ බුදුන් වහන්සේ දැක තමන් බැලමෙහෙ කොට ලත් බත් කොට්ඨාසය උන් වහන්සේගේ පාත්‍රයට පිළිගන්වාලා "මෙ පිණින් මතු මෙසේ වූ දිළිඳු කුලයක නූපදිම්ව යි, උතුම් වූ රජකුලෙහි උපදිම්ව යි, එසේ ඉපැදත් නැතැ යි යන බසෙහි අර්ථ නො දනිම්ව" යි කියා ප්‍රාර්ථනා කළාහු ය. එ පින් බලයෙන් මේ සමයෙහි ශාක්‍ය කුලයෙහි ඉපැද නැතැ යි යන බසෙහි අර්ථ නො දැන දිව්‍ය වූ කැවුම් කා ම වැඩුනාහු ය යි දතයුතු.

තවද: මේ අනුරුද්ධ කුමාරයෝ ය, භද්දිය කුමාරයෝ ය, කිම්බිල කුමාරයෝ ය යන මේ රජකුමරුවෝ තුන්දෙන පසළොස් සොළොස් හැවිරිදි අවස්ථාවෙහි ඔවුනොවුන් හා සමඟ කෙළ කෙළ සිඳ "බත් උපදින්නේ කොහි ද" යි සැක කළහ. එයින් කිම්බිල කුමාරයෝ එක් දවසෙක කෙළ ගෙණ යන්නාහු බඩසලින් වී බානා දැක ඒ සලකුණෙන් "බත් උපදින්නේ බඩසලිනැ" යි කීහ. භද්දිය කුමාරයෝ දවසෙක හැළියෙන් බත් රන් තලියේ ලන්නා දැක එ සලකුණෙන් "බත් උපදින්නේ බඩසලින් නො වෙයි. හැළියෙනැ" යි කීහ. අනුරුද්ධ කුමාරයෝ කොටුවෙන් වී බානා ත් නුදුටු විරූහ. හැළියෙන් බත් ගන්නා ත් නුදුටු විරූහ. ඉදිරියෙහි තන්නට තබා ලූ බත්ම දුටු විරූහ. එහෙයින් "තොප දෙන්නා ම කියන්නෝ නො දත ය. බත් උපදිනා තැන් මම දනිමි. වඩුරියන් උස රන් තැටුළු ඇණි මහ රන් තලියෙහි බත් උපදින්නේ" ය යි කීහ. මෙසේ එම සිත් බලහෙන් බත් උපදිනා තැනු ත් නො දත ගිහිගෙයි සුඛිත ම වාසය කෙරෙති.

එකල අප බුදුන් සමීපයෙහි කුලයෙකින් එක්දරු කෙණකුන් බැගින් මහණ කරවන සමයෙහි මහානාම නම් ශාක්‍යයෝ තමන් මලනුවන් මෙ ම අනුරුද්ධ කුමාරයන් ලඟට කැඳවාලා "මලණුව! බුදුන් කරා ගොස් අප දෙබෑයන් අතුරෙන් එක් කෙණකුන් මහණ වුව මැනැව. මම මහණ වෙම් ද? තෙපි මහණ වවු දැ?" යි විචාළහ. එ බසට අනුරුද්ධ කුමාරයෝ කියන්නාහු "බෑනන් වහන්ස! බුදුන් කෙරේ මහණ වූ කල එක් වේලේ කැව මනාල. එසේ වූ බත ත් දොර දොර සිගා ඇවිදලද මනාල. බඩ සා ය යි කිය නො හැකිල. ඇඹුල් ලුණු බෝ ය, මඳ ය යි කිය නො හැකිල. හුණු කැමැති සිසිල් ලැබෙ ල සිසිල් කැමැති හුණු ලැබෙ ල දිවිහිමියෙන් එකලාව ම හොත මනා ල. රුක්මුල් සුසාන භූමිවල භාවනා කොට ඇවිද්ද මනා ල. එසේ වූ දුක් මම විඳගත නො හෙමි" යි කීහ. එ වේලෙහි මහානාමයෝ සිතන්නාහු "මාගේ මලනුවෝ තමන් සියුමැලි හෙයින් මහණ වන්ට මැලියාහු ය. මම මහණවීම නම ශාක්‍යකුලයට රක්‍ෂාම නැත. මාගේ මලනුවන් මහණ වුව මැනැව, මහණ වෙමි යි උන් ලවා ම උපදෙසකින් කියවා ගණිමි" යි සිතාලා "එසේ වී නම් මලණුව! මම ගොස් බුදුන් කෙරෙ මහණ වෙමි. තෙපි ගිහිගෙයි වසා නම් උපයා ගත ලෙස් මා අතින් ඉගෙණ ගණුව. කර්මාන්ත නො දන්නවුන්ට ගිහිගෙයි වාසය බැරිය" යි කීහ.

එ බසට අනුරුද්ධ කුමාරයෝ "උපහා සෑම නම් කර්මාන්ත නම් කෙසේ වූ දෙයක් දැ" යි විචාළහ. බත් ඉපදවීම ය යි බෑයෝ කිහ. බත් උපදින්නේ රන් තලියෙන් නොවේ දැ යි කිහ. මලණුව! රන්තලියෙන් නො වෙයි. බත් උපදින්නේ සැම කුඹුරෙනැ යි, කිහ. කුඹුරෙන් කෙසේ උපදී දැ යි විචාළහ.

එ වේලෙහි මහානාමයෝ මලනුවන්ට ගිහිගෙහි කරණ අනුශාසනා වශයෙන් ආදීනව දක්වන්නාහු "මලණුව! බත් උපදිනා ලෙස් මා අතින් අසව. සී සෑම නම් සුලං බඳුන්නා සේ ඉතා උගහට දෙයෙක, වියදමෙක, පිට මකෙක, බඩ මනොකෙක, සිමුනෙක, නෙවිල්ලෙක, නගුලෙක, අව සෑවෙක, සී වැලෙක, පෙර ගිලියෙක. පසුගිලියෙක, වියඹැයෙක, සීරුණ දෙකක, අමුඩු බාසොක, සෑව්වෙක, ගොන් ගෙයෙක, ගොවියෙකැයි යන මේ අමලොස් දෙනාගේ එක් විමෙන් යන්නාවූ ගමන සීසෑම නම් වෙයි. මෙසේ සී සානා ගොවියන්හු විසින් පළමුව පලාගොස් කුඹුරෙහි වන අත් ගසා ඇලි මං පෑදගෙණ දෙවනුව ශුභ වූ නැකතකින් ගේ වනා තීම තගා දෙසී තුන්සී සා මියර තපා සෑට තලා පෙරා සා කිජුවව වනා විහි වූ පරිද්දෙන් කුඹුරෙහි මපුට ගහ මැනැම. ඒ මපු ලාවූ කුඹුරෙහි සතා සතුන් සතියක් රැක්ක මැනැව. වැට බැඳ ඉස්තන් නම් එ ගොයම් තිලන අවස්ථාවෙහි කුඹුරමැද රතමල් පැලක් තබාගෙණ මැසි දඬක් ලා ගෙණ ගෙයි දී කන බතෙක රස නො දන ඇඳෙන පිටක් නො තබා රාත්‍රින්දිවාභාගයෙහි එ මැසි දණ්ඩි වැදගෙන ව රාත්‍රින්දිවාභාගයෙහි එක දම්සෙකත් සින්දේ තින් දක් නිඳ නො පිඅා ගෙරින් මීවුන් ඌරන් මුවන් ආදි වූ සතා සතුන් සාරමසක් රැක්ක මැනැව. තරලක් නැගු නෙත පමන් ගෙණ පියත්වා ආදි වූ නොඑක් රෙගයට නෙම් පන්නම් සේ නැතී ව කල මැනැව. දවසින් දවසට කුඹුර සිසාරා අතු තබාලු ව මැනැව. පන් ඇද්ද මැනැව, මෙසේ දුක් ගෙණ ගොයම් රකිනා කල සීතම් කුඹුරෙක් වී නම් තුන්සාරමසක් රක්ක මැනැව මාවී කුඹුරෙක් වී නම් සමසක් සත්මසක් රක්ක මැනැව. මෙ දතුරෙහි ඇලි අම්බුණු පුවවා ආදි වූ බොහෝ කර්මාන්ත අත්කම සේ නැති ව කළ මැනැව. පැසෙන මිස මුළුල්ලෙහි බස බසරල මත තුරු හඬග හඬග, කුඹුරෙහි ඒ මුල්ලෙන් ඒ මුල්ලට දිම දිව නම් ගේ නැති ව කුරුලු-කොබෝ-ගිරා ආදි වූ වී කන සතුන් බිණුව මැනැව. ගොයම් පැහුනු කල දු මැඩ අදවී නම් අදයෙන් එකක් දුන මැනැව. තුතිනෙතම් නම් තුතිනෙ'කක් දුන මැනැම. බලාපු වී නම් නැම වී ම වී හිඹියන්ට දුන මැනැව.

මෙසේ එ වී ලත් කල මාලුසන ය පැල්දෙර ය බොල්පස ලාස ය, කටුමාකතු ය කඳුකඹ ය යනාදි ව්‍යවහාර නො මරදවා දූන මැනැව. තම දැ: රඳවුන්-බෙරවායන්-කම්මෙහෙකරුවන්ට දූන මනා කුලී නො මරදවා දූන මැනැව. සිඟන්නවුන්ට දුනමැනව. ත්‍යාග ය යි කියා දෙනි. පෙර කැ තය යි කියා දෙති. පෙර කැ අත පැන් දියයි කියා දෙති. මෙසේ මෙසේ නො එක් ප්‍රකාරයෙන් එක කුඹුරෙහි වී වියදම් කොට ඉසිරි දෙයක් ගෙණවුත් කොටුවෙක පවමා ගෙණ බිජුවට ය යි එක් භාගයක් තබාගත මැනව. ඇසා ය යි එක් භාගයක් වෙන් කොට තබාගත මැනැව, බිජුවට භාගය නො කා ඇසා භාගය කැව මැනැව එසේ කත කල පමණ නො දූත නො හා අඳුව මේ තෙක් ගත මැනැව. සෙවට මෙතෙක් ගත මැනැවැ යි පමණ දූත කැ ව මැනව. මිතු මේ තෙක් දවස් ගිය කල ගොයම් පැසෙයි එ මිත දක්වා රැකුණ මිනා වේ දූ යි සිත සිතා සුගින් සුය කැම මැකැව මෙසේ එක් සමයෙක දුක් ගෙණ උපයා ගත් කල අතීත් සමයෙහි ත් පෙර කලා සේ ම මෙසේ වියයි කලමිනා ම ය මෙසේ දිකිසිමියෙන් ම යල ත් මාස ත් අප්‍රමාද ව මෙමෙහ කල මැකැව. පරීක්‍ෂා කල කල ගොවිහු නිකම්හිඳිනා දම්යෙක් නම් නැත. ලබ ව හොත් කල ත් උපයා කැ නො හැක්ක. සේවා කම් ආදි වූ නො එක් කම ප්‍රුත්තෙහි නිපුණත ව ගිය කල ත් ගම් හිඳ උපයා කැමි නම නැත් ම ය. මහලු ව ජරාවට පැමිණි කල ත් මෙකි කම්මාන්ත කොට ගත නො හැකි හෙයින් උපයා කැ නො හැක්ක.

එ කල දූතින් දෙදඹු ගෙණ විලි පිලියෙන් විරූප ව කුද ගසා ගෙණ පෙර තමා උපයා කැ රට ම වෙස් බැඳ පාතා විකාර රූපයක් සේ දොරින් දොර සිඟා කැ ඇවිද්ද මනා ය. එසේ හෙයින් මලඹ! නුවණැසින් බැලුවාන්ට මෙ සසර සුව විඳීමෙක් නො වෙයි. දුක් විඳීමෙක් ම ය. කලෙක නෛවසංඥානාසංඥායතනයට පැත නැඟී භවයෙන් අග පැමිණියාහු සුව විඳියෝ පවා, කලෙක සතර අපායට පැමිණ දුක් විඳිනාහු ය කලෙක බ්‍රහ්මරාජන් ව සුව විඳිනාහු කලෙක කදේකිමි ව ත් උපදනාහු ය. කලෙක ශක්‍ර සුයාම සන්තුෂිතාදි දිව්‍ය රාජන් ව සුව විඳිනාහු පවා කලෙක ප්‍රේතලෝකයෙහි ඉපැද ප්‍රෙත දුක් විඳිනාහු ම ය. කලෙක දිවඋයන්වල දිව කෙලි කෙල ඇවිද්දාහු කලෙක අසිපත්‍රවනෙහි කැපි කැපී ඇවිදිනාහු ම ය. කලෙක දිව්‍ය ප්‍රාසාදවල සුව විඳ ඇවිද්දාහු කලෙක නරකාග්නි ජාලාභ්‍යන්තරයට පැමිණෙන්නාහු ය. කලෙක දිව්‍යම ය භොජන ය අනුභව කලාහු කලෙක ලෝගුලී අනුභවයෙනු ත්

දවස් යවන්නාහු ම ය. කෙලෙක දිව්‍යපානීය වගී අනුභව කළාහු කෙලෙක ලෝහ පානීයත් අනුභවකොට නරකවල ඇවිදුනාහු ය. කෙලෙක දිව්‍යමය වූ යහන් වල සැතපුනාහු කෙලෙක කප්ක වූ යපෝලෝවල ශයනය කරන්නාහු ම ය. කෙලෙක දෙවඟනන් පහස් විඳ ඇවිද්දාහු කෙලෙක කටු ඉඹුල් මෙනෙහි ඇවිසා ඇවිසා ත් ඇවිදුනාහු ම ය. කෙලෙක දිව්‍ය ගංගාවල ස්නානයකොට ඇවිද්දාහු කෙලෙක වෙතරණී නම් ක්ෂාරෝදක ගංගාවල ඇවිදිනාහු ම ය. කෙලෙක දිව්‍ය පුෂ්කරණීවලට බැස ජල ක්‍රීඩායෙන් මත් වූවාහු කෙලෙක ලෝකුඹුවල ඉපැද නිරු දුකින් ලමතුම ත් ඇවිදිනා ම ය. කෙලෙක රත්රුමන් කුළු මුදුනෙහි දිව කෙළි කළ ඇවිද්දාහු කෙලෙක අඞ්ගාර පජීත මිණකවල ත් ඇවිදුනාහු ම ය.

කෙලෙක පාණ්ඩුකම්බල ශෛලාසන නැඟී දෙව් පිරිස් පිරිවරා උන්නාහු කෙලෙක දිවස්හුල නැඟී කවුඩු බලු පිරිස් පිරිවරා ත් හිඳිනාහු ම ය. කෙලෙක දිව්‍යරථවලින් ඇවිද්දාහු කෙලෙක කපන වූ අයෝ රථ නැගීත් ඇවිදිනාහු ම ය. කෙලෙක දිව්‍ය සමාන ශක්ති වාහන නැඟී ඇවිද්දාහු කෙලෙක තුමූ අකුත්ම් වාහනව ත් ඇවිදුනාහු ම ය. කෙලෙක සක්විතිරජ ව ඇවිද්දාහු කෙලෙක චණ්ඩාලව ත් ඇවිදුනාහු ම ය. කෙලෙක මිණි ඔටුනු හිරා ඇවිදි ඉසින් කෙලෙක දරමිටි උසුලා ත් ඇවිදිනාහු ම ය. කෙලෙක දිව්‍ය සමාන මට සිලුටු වූ සළුවෙන් සරහා ඇවිද්දාහු කෙලෙක උකුළුකලවේ කුණු රෙදි පිළිවලින් සරහා ත් ඇවිදිනාහු ම ය. කෙලෙක අනගි වූ දළඹුතු හරින් උරමඩල සරහා ඇවිද්දාහු කෙලෙක කප්පට හිරා කර ලා දුටු දුටුවන් අරභයාත් ඇවිදුනාහු ම ය. කෙලෙක බෘහස්පති සමාන නුවණැති ව සකල සත්ත්වයන්ට ආචාරී ව ඇවිද්දාහු කෙලෙක අඥාන ව අව්‍යක්ත ව තුමූ තමන්ට ආචාරිවරුන් සොයා ත් ඇවිදිනාහු ම ය. කෙලෙක මිහිරි වූ කටහඬින් චිත්‍ර කථික ව ඇවිද්දාහු කෙලෙක මූගබධිර ව ඉගිලා ත් ඇවිදුනාහු ම ය. කෙලෙක පුරුෂ ව ඉපැද ස්ත්‍රීන් පිරිවරා ඇවිද්දාහු කෙලෙක ස්ත්‍රී ව ඉපැද පුරුෂයන්ට පතිනිව ත් උපදනාහු ම ය. කෙලෙක ඔවුනොවුන් කෙරෙහි ජීවිත සමාන ප්‍රේමයෙන් ඇවිද්දාහු කෙලෙක ඔවුනොවුන් ශෝවරකොට ත් ඇවිදුනාහු ම ය අහස බලා අත්පොළසන් දී සත් රුවන් වැසි වස්වා ගන්නා තරම් මහාමන්ධාතු සක්විති රජුන් වැනියෝ කෙලෙක මිනී ඉස්කබල් ගෙණ දොරින් දොර හිඟාවනය කොට ගොනටුකද වැද ගෙම් දේහ නික්ෂෙපය කළාහු ම ය.

මේ ආදි කාරණයෙන් මලඬ! මේ සසර නම නුවණැසින් බැලුම්හට විඹම්බනාවක් වැන්න. පිදුරු කැරැල්ලක් සේ අග් මුල් නැති සේ ය. ගුලු නම් ලිහිණියන්ගේ කසල්ලක් සේ පිළිවෙලක් නැති සේ ය. අවුල් හූ මැටියක් වැන්න. දියෙහි නැගි දිය බුබුලක් වැන්න. දියෙහි යන රළ පෙතරක් වැන්න. දියෙහි ඇඳි රෙඛාවක් වැන්න. විදුලියක් වැන්න. සුලං කඩක් වැන්න. දේලා කෙළියක් වැන්න. ඉන්ද්‍රජාලාවක් වැන්න. දර්ශන රූපයක් වැන්න. සිහිනෙන් දුටු රූපයක් වැන්න. ඉතා නිස්සාර දෙයෙක. නපස් කොට නිවන් දුටුම්හට ජරා නැත. මරණ නැත. දුක් නැත. ශෝක නැත. දුගතිය නැත. ඉතා ශාන්ත ය. දාන්ත ය. මලණ්ඩ! මේ සියල්ල ම මා නුඹට කියාලූ බැවින් පිළිවන් වී නම් මා කී සැපීගේ උපගා නා නොම ගිහි ගෙහි වසව. මාගේ ලක්ෂ ගණන් කළඑපිරිස් හා තුන් පාය හා රජ සැපත ත් පාවා ගණුව. මම මාගේ බුදුරජාණන් කරා ගොස් මහණ ම වුව සේ වෙසෙමි යි කීහ.

එ වෙලෙහි අනුරුද්ධ කුමාරයෝ බෑනන් විසින් කියන ලද උපාය නැමෙති දුක් හා සංසාරයෙහි ආදීනව අසා තුන් භවය ගිනි ගත් ගෙයක් සේ කොට සිතා, සසර භය ගෙණ මෙවුලා බෑනන් ගේ සම්පත් නබා තමාගේ ලක්ෂ ගණන් කළඑපිරිස් හා තුන් සෑතු මට කළ තුන් පාය හා සියලු රජ සැපත අලුයම් දුටු කෙල පිඬක් සේ සිතා සැපත් ලොභ ස හැර "බෑනන්වහන්ස! උපාය නැම් නම් සසර නම මෙබඳු වූ දුකෙක් මහැ යි මෙතෙක් දවස් නො දත් තෙමි. රන්තලිවලින් ම බත් උපදිනී යි සිතීමි. මෙසේ වූ දුකක් ඇති ගිහි වාස ය මට නොකැමැත්තේ ය. මට ස්නෙහ ඇතියේ නම් නුඹ මහණ වන්නට නො ගොස් මා ම පළමු කොට බුදුන් කරා යවාපුව මැනැවැ"යි කියාලා බෑනන් අනුදන්වා ලා එ කලට පියානන් නැති හෙයින් මෑනියන් වසන රජගෙට ගොස් මෑනියන් දැක "මෑනියන් වහන්ස! බුදුන් කරා ගොස් මහණ වනු කැමැති වෙමි. මට අවසර දුන මැනැවැ" යි කීහ.

මවු කීසොවු පුතනුවන් කී බස් අසා ල පිරුණු ශොක ඇති ව 'මාගේ ප්‍රිය පුතනුවෙනි! නුඹ පියානන් වහන්සේ නැත. මාගේ හදවත හා දෑස හා නුඹ හා සම වුව. එසේ හෙයින් මට සැප ත් නම් නුඹ හා නුඹගේ බෑනන් වහන්සේගේ දර්ශනය වුව. එසේ වූ දූකකට නුඹ යවාලා මැද හිඳීමට මට බැරි ය. මා දිවි තිබිය දී අනු

නොදනිමි"යි කීහ. එ වේලෙහි අනුරුඬ කුමාරයෝ "මැණියන් වහන්ස! කුමක් කියන සේක් ද, ගංගාවෙහි තිබූත් මහ දියවතුර මහමුහුද මුත් අතුරෙක නො රඳන්නා සේ ම මාගේ ශ්‍රද්ධා නමැති මහවතුර සුගත් මහමුහුදට වැද මුත් නොරඳු මි ය. සමු දුන මැනැවැ"යි කීහ. එ වේලෙහි දු මවුබිසෝවු "බැරිය පුතණුව"යි කීහ. තව ද: අනුරුඬ කුමාරයෝ නො පසු බැස "මැණියන් වහන්ස! ආකාශයෙහි නැඟූ වැසි මහපොළොව මුත් අනික් තෙනෙක නො රඳන්නා සේ මාගේ තෘෂ්ණා නමැති වැසිමෙ සුගත් මහපොළොව වැද මුත් නො රඳු මි ය. සමු දුන මැනැවැ"යි කීහ. තුන්වනුව ද මවු බිසොව "පුතණුව! එසේ වූ බසක් මා කණ නො මකව"යි කීහ. තව ද: අනුරුඬ කුමාරයෝ "මැණියන් වහන්ස! ආකාශයෙන් පතිතාග්‍රයකින් තිබූත් දියකැල්ලක් පතිත ප්‍රාන්තයෙහි රඳන්නා සේ මාගේ තෘෂ්ණා නමැති දියකැල්ල සර්වඥ නමැති නියගලයෙහි ගැලී මුත් නොරඳු මි ය. අවසර දුන මැනැවැ"යි කීහ.

එ වේලෙහි මැණියෝ කම්පිත වූ සිත් ඇති ව ලපිරුණු සිත් ශෝකයෙන් අතිකක් කියාගත නොහී මාසම්ය් දරුවන් නපසව යා නො දෙමි යි සිතා එවක නම් භද්දිය රජ්ජුරුවන් රාජ්‍ය කරණ කාලය හෙයින් "පුත! තොපගේ කල්‍යාණමිත්‍ර වූ එක කෙළි මඩලෙහි වැඩියා වූ ඒක ප්‍රාණ වූ භද්දිය නම් රජ්ජුරුවන්ට කියාලා ඔහු මහණ වෙත් නම් උන් හා සමග ගොස් බුදුන් කෙරෙහි මහණ වව"යි කීහ. එවේලෙයි අනුරුඬ කුමාරයෝ යහපත මැණියෙනි! උන් යෙතොත් යන්නෙම් වේ දූ"යි කීහ. බිසෝවු රජෙක් නම් රාජ්‍යශ්‍රී හැර කවර කලෙක නම් මහණ වේ දූ"යි සිතා "යහපත, යව පුතනුවෙනි!" යි කීහ.

එ වේලෙහි අනුරුඬ කුමාරයෝ රජගෙට නික්ම ම ගදී සිතන්නාහු "මාගේ මැණියන් වහන්සේ "රජ්ජුරුවෝ නම් මහණ වන් නව නො යෙති. උන් කරු යැවූ කල ඔහු මූත් රඳවා ගණිති"යි මායමින් සමු දුන් සේක. රජ්ජුරුවන් මහණ නො වන්නේ ත් නැබැව. මම උපදෙසකින් උනු ත් එක්කොට ගෙණ මහණ වෙම් ම ය"යි සිතා අපගේ ශාක්‍යකුලයෙහි රජදරුවෝ නම් දිවි යේ නමුත් බොරු නො කියති. උපදෙසකින් මහණ වෙමි යි කියවා ගෙණ එ බස මුල් කොට රජහට චෝදනා කොට ලජ්ජා කරවා මහණ වන සේ ගිවිස්වා ගණිම් යි සිතාලා රජගෙට ගොස් භද්දිය රජ්ජුරුවන් දැක රජහු වැළඳ සිඹ සනහා "දේවයෙනි! මා තුඹ කෙරෙහි ඇති ප්‍රේම මේ තෙකැ යි පමණ නො දනිමි. තුඹ මා

කෙරෙහි ඇති ප්‍රෙම මා තරම්ට අඩු යයි සිතමි. ඉදින් තුඹ වහන්සේ මේ රාජ්‍ය ශ්‍රී හැර මහණ වන සේක් වී නම් මම ද මාගේ තුන් ඍතුවට කළ තුන් ප්‍රාය ඇතුළු වූ සුවහස් නළුපිරිස් ආදී වූ සියලු සම්පත් අලුම්ය දැමූ කෙළපිඩක් සේ නො සිතා තුඹ හා එක්ව ගොස් මහණ වෙමි යි ය. එසේ හෙයින් මාගේ තපස පවා තුඹගේ තපස් අනුව පවත්නේ ය. ඉදින් එසේ පළමු ව තපසට යතොත් තුඹගේ තපස් මා හා අනු වේ දැ" යි කීය.

එ වේලෙහි භද්දිය රජ්ජුරුවෝ වැලිකෙළියෙහි පටන් එක්ව ම සුව විඳ ඇවිද්දා වූ ජීවිතය සමාන යහළුවා කෙරෙහි වූ උදාර වූ ප්‍රේම යෙන් උමතු වූවාහු සිහි එළවාගත නොහී මොහුගේ මේ සා සැප තක් හැර මහණ වීමෙක් නම් කවර කලෙක වේ දැ යි සිතා "යහළු තෙපි මහණ වූවාහු නම් මමත් රාජ්‍ය ශ්‍රී හැර තොප හා සමග මහණ වෙමි" යි කීය. එ බසට අනුරුද්ධ කුමාරයෝ අමාදියකදෙකින් අභි ෂෙකයක් ලදුවා සේ ඉතා සතුටුව වූවාහු මා සිතූ සිත එකාන්ත යෙන් සැදෙයා වනැ යි සිතා "දේවයෙනි! එසේ වී නම් තො ඇසූදැ ද, අද ම මහණ වන්නට යෙමි. මා හා කැටිව අව මැනවැ" යි කීය. එ වේලෙහි භද්දිය රජ්ජුරුවෝ පජිනයෙකින් ගැහැටුනු තලක් සේ රාජ්‍යලොභයෙන් කම්පිත වූ සිත් ඇති ව නො සලකා වරදවා කියාපීමි. මා කියයේ කිමෙක් දෝ හෝ යි සිතා යහළු! අපි දෙදෙන ම තව නවයෞවනයෙහි පිහිටියම්හ. දැනට කාමසුව අනුභව කොට මතු මහලු වූ ගියකල සමග ම ගොස් මහණ වම්හ" යි කීය.

එ බසට අනුරුද්ධ කුමාරයෝ "යහළු! ජරා මරණ දෙදෙනාගේ පසු පළමු වීමෙහි විභාගයෙක් නැත. සමහර කලෙක ජරාව පළමුව යෙයි. සමහර කලෙක ජරාවට මරණ පළමුව යෙයි. තෙලෙ නුවණෙක් නො වෙයි. අප බුදුහු එකුන්තිස් ඇවිරිද්දෙහි කාමසුව හැර සත්දවසකින් ලැබෙන සක්විතිරජය හැර මහණ වූහ. උදයසින් ආදි වූ මෙම නුවර මහා ඇමැතියෝ ද නව යෞවනයෙහි මහණ ව අමා මහ නිවන් දැක දුන් අප ඉස පිය පත් මගුරුවා ගෙණ ආකාශ යෙන් ඇවිදිති. අපි ඔවුන් වඳුම්හ. පුදම්හ. සත්කාර කරම්හ මෙසේ දු ලජ්ජාවකට ඇත. කාමසුව විඳීම නම් නැවණැසින් බැලූ කල සුව විඳීමෙක් නො වෙයි. දුක් විඳීමෙක. එකලා ව වලට ගොස් තපස් කිරීම නම් විශෙෂයෙන් බැලූ කල දුක් විඳීමෙක් නො වෙයි. එකාන්ත සුව විඳීමෙක. යහළු දෙබසක් නො කියව. මහණ වන්නට යම්හ" යි කීය.

එ වේලෙහි භද්දිය රජ්ජුරුවෝ තමන් මහා සත්‍යවාදී වූ හෙයින් උත්තරයක් කිය නොහී "එ බැවින් යහළු සත්අවුරුද්දක් රාජ්‍යය කොට පියා දෙදෙන ම එක් ව ගොස් මහණ වම්හ"යි කීය. අනුරුද්ධ කුමාරයෝ "එසේ නො ගිවිසිමි" යි කීහ. "සහවුරුද්දක් බලව" යි කී කල, එසේ ත් නො ගිවිසිමි යි කීහ; "පස් හවුරුද්දක්- සතර හවුරුද්දක් - තුන් හවුරුද්දක් - දෑහැවුරුද්දක් - හවුරුද්දක් බලව" යි කී කල එසේ එසේ ත් නො ගිවිසිමි යි කීහ. නැවත සමසක් බලව - පස්මසක් බලව - සාරමසක් බලව - තුන් මසක් බලව - දෙමසක් බලව - මසක් බලව - දෙපෝයක් බලව" යි කී කල එසේ එසේ නො ගිවිස්සෙ. 'එසේ වී නම් යහළු! මාගේ පුත්‍රදාරාවන්ට අනුශාසනා කොට රාජ්‍යය භාර කොට ලත හෙක් එකසත්දවසක් බලව. මට සෙසා ඇසීගා නම් උත්තරයක් නො කියව" යි කීහ. එ වේලෙහි අනුරුද්ධ කුමාරයෝ "සත්දවස තව ගිවිසීම් යහපතැ" යි කීහ.

ඉක්බිත්තෙන් සත්දවසක් මුළුල්ලෙහි කළමනා සියලු කෘත්‍ය යන් නිම වූ කල සත්වන දවස් ඒ අනුරුද්ධ කුමාරයෝ ය, භද්දිය කුමාරයෝ ය, බුදුන් සුලු පිය වූ ද්‍රොණෝදනයන් දරු අනඳ නම් කුමාරයෝ ය, කිම්බිල නම් රාජකුමාරයෝ ය, භගු නම් රාජ කුමාරයෝ ය, සුප්‍රබුද්ධයන් දරු යශෝධරාදේවීන් බෑණෑ දෙව්දත් නම් රාජකුමාරයෝ ය යි රජකුමරුවෝ සදෙන නම තමන්ගේ පුව හස් ගණන් ඇත් අස් රථ බල පිරිස් ගෙණ ශක්‍රපුරයෙන් ඕව දිව්‍ය භවයන් සදෙනකු සේ උයන් කෙළියට යම්හ යි නුවරින් පිටත් ව ක්‍රීඩා පසාරයෙන් යොදුන් ගණනක් පලා ගොස් එක් බිම්හක සිය සෙනග රදවා ඔවුනොවුන්ට කීගිලා උපාලි නම් කපුවාහන් හා සමග සත්දෙන මහ සෙනගව සොරව වැද වල් හිරා ගොස් පසල් දනවුවතව බැස ඔවුනොවුන් හා කථා කොට එක් ව මී මහණවම්හ යි ඔවුනොවුන් ගිවිස්වා ගෙණ තම තමන් පලන් සත්රුවන් ආභරණ ගලවා උතුරු සළුවෙක පොදිබැඳ උපාලි නම් කපුවාහන්ට දී "මේ සියලු ආභරණ තොප සේ වූ එකක්හු එක් ජාතියක් මුළුල්ලෙහි සුඛිතව ම ජීවිත රක්ෂා කොට ගැන්මට පමණ වන්නේ ය"යි කියා "තෙලෙ සම්පත් තොපට ම දුන්නම්හ අප බුදුන් කෙරේ මහණ වන්නට යම්හ" යි කියා රජකුමරුවෝ සදෙන නික් මුනාහ.

එ වේලෙහි රජකුමරුවන් ය ත් ය ත් උපාලි ආභරණ පොදිය අතින් අල්වාගෙණ බල බලා සිට අතගි වූ සම්පතෙහි ඉතා භය ඇති ව "ශාක්‍යයෝ නම් ඉතා ග්‍රණ නපුරුය. මේ සම්පත් හැරගෙණ

රාජ්‍යයට ගොස් මා මෙ පමණ් කී කල "සම්පත්ති ලොභයෙන් රජ දරුවන් උගත්මා ගෙණ යවාපුයේ මේ කපුමා ය' යි මට කිපී මරා දමාපු නම නපුර. සම්පත් තබා දිවී ගලවා ගතෝතින් යෙහෙක. මෙ මට සැපෙකක් නො වෙයි. විපතට කාරණ ය. මේ වැනි රජුන් සැපත් හැර මහණ වන කල මා වැනියන්ට සැපතින් කම් නැත. මම ද ඔවුන් හා සමඟ මහණ වෙමි" යි සිතා ආභරණ පොදිය පිටිස් ගසකා එල්වා "පලමු ම දුටු කෙණකුන් තෙමෙල හැරගත් නේ ය" යි අත්ගසා රජදරුවන් ගිය පද ලකුණෙන් දිව ගොස් රජකුමරුවන් හඹා ගියහ. එ කල 'අවුනෑ' යි රජකුමරුවන් මීවාළ කල තමන් ආ පමණ් කියා "මම ද මහණ වෙමි" යි කීහ. රජකුම රුවෝ "තොප ආ සේ ම යෙහෙක. මෙරේ ය" යි කියා උනු දු කැඳවා ගෙණ ගොස් එ කලට බුදුන් මල්ල රජුන්ගේ අනුපිය නම් නියම්ගම අනුපිය නම වෙහෙයි වසන තෙනට ගොසින් බුදුන් දැක වැඳ එකත්පස් ව උන්හ.

එ කල ස්වාමිදරුවෝ ඔවුන් ආ කාරණ විචාරා මහණ වන් නට ආ බවු අසා මහණවයි අවසර දුන් සේක. එ වේලෙහි රජදරු වෝ සඳෙහා කියන්නාහු "ස්වාමීනි! අපගේ කුලෙහි ශාක්‍යයෝ නම් ඉතා මානීහ. මානයෙන් ම ඔබනා ලදහ. තුඹවහන්සේ වැනියන් පවා නො වඳුම්හ යි මත් කළ කුලයෙක උපනුම්හ. අප ද මහණ වූ කල එ බඳු වූ මානයෙක් උපනී නම් එ කල මහණදම් මුදුන් පැමිණි ය නොහෙයි. මේ අපගේ උපාලි නම් කපුවානන් පලමුව මහණකොට අප පසුව මහණ කොට වදාළ මැනැව. එසේ කල ඔවුන් අපි වඳුම්හ. පුදම්හ. සත්කාර කරම්හ. එසේ කල අපගේ අභිමාන ත් සිඳෙයි. මහණදම්හු ත් මුදුන් පැමිණෙයි. ඉදින් මතු රාජ්‍යශ්‍රීයෙහි ලොභයකු දු වී නම් "තොපගේ කපුවානන් වැඳ පුද නීචක්‍රියා කොට නැවත රාජ්‍යය කරන්නට අවු දූ' යි ශාක්‍යයන් අපට පරිභව බෙණෙති යි කියා දෙවනු ම රාජ්‍යලොභය ද දුරු වෙයි. මේ මේ කාරණයෙන් උන් පලමු ම මහණ කරවා අප පසුව මහණ කළ මැනැවැ" යි කීහ. ස්වාමිදරුවෝ "තොප කීයේ කාරණ ම ය. ඥාතවත්නායන් සිතුව මනා සිතිවිල්ලෙක් ම ය" යී වදාරා උපාලින් පලමු ව මහණ කොට, රජ සදෙනා දෙවනු ව මහණ කොට උපසම්පදා කරවා කම්ස්ථාන යන් ඉගැන්වූ සේක.

එ කල විදර්ශනා වඩා ඒ මසාන්තය ඇතුළත භද්දිය තෙරුන් වහන්සේ රහත් ව භද්දිය නම් මහතෙර ව බුද්ධශාසන නමැති මහ සරසියෙහි පුපිපී මහා පද්මයක් සේ ශීල සුගන්ධයෙන් තුන්ලෝ

හෙබවූ සේක. ආනන්ද මහතෙරුන් වහන්සේ ද එසේ ම සෝවාන් ව බුද්ධෝපස්ථායකයන් කෙරෙහි අග්‍ර වූ ස්ථානාන්තර ලදින් බුද්ධශාසන නමැති ආකාශයෙහි නැඟු ජයකෙතුවක් සේ ඉතා ප්‍රසිද්ධ වූ සේක. කිම්බිලය-භගුය යි යන දෙදෙනා වහන්සේ ද එසේ ම රහත් ව පන්සිය පන්සිය පිරිස් ගෙණ බුද්ධශාසන නමැති දිව්‍යරූපයෙහි දිව්‍යනෙත්‍රයුග්මයක් සේ ඉතා ශෝභාසම්පන්නවූ සේක. දෙවදත්ත යෝ ද තිස්ස නම් මහ තෙර ව ධ්‍යානලාභී වූහ. ඔවුන්ගේ කථාව මතු කියන ඔවුන්ගේ චරිතයෙන් ම දතයුතු. උපාලි මහතෙරුන් වහන්සේ ද එසේ ම රහත් ව විනයධාරීන් කෙරෙහි අග්‍ර ස්ථානාන්තර ලදින් පන්සියයක් පමීද් ඇති කොට බුද්ධශාසන නමැති මහා ගෘහයෙහි ප්‍රදීපයක් සේ සලූන් බැබළුමූ සේක.

ඉක්බිත්තෙන් අනුරුද්ධ මහතෙරුන් වහන්සේ ද විදර්ශනා වඩා රහත් ව ත්‍රිවිද්‍යාවෙහි කෙළ පැමිණ පෙර තමන් වහන්සේ පියුම තුරා නම් බුදුන් සමයෙහි පාන් පූජා කළා වූ කුශලයාගේ බල යෙන් වැඩහුන් එ ම අස්නේ හිඳ ලෝකයක් සක්වළ තුබූ තලඇටක් සා වස්තුවකු ත් අත්ලෙහි තුබූවා සේ දක්නා තරම් දිවැස් ලදින් එ තැන් පටන් ශාසනාම්බරයෙහි පුන්සඳක් සේ සලුන් නොබව, බුදුසස්නෙහි දිවැස් ඇතියන් කෙරෙහි අග්‍ර වූ තනතුරු ලදින් බුදුන් මල් අනුරුද්ධ මහතෙරුන් වහන්සේ ය යි මෙ නමින් දිව්‍ය මනුෂ්‍යයන් කෙරෙහි ඉතා ප්‍රසිද්ධ වූ සේක.

මේ අනුරුද්ධ මහතෙරුන් වහන්සේ එක් සමයෙක දනවු සැරි සරා ඇමිදිනාසේක් මුණ්ඩ නම් නියම් ගමට සිඟා වැඩි සේක. එහි මහාමුණ්ඩ නම් සිවාන කෙනෙක් වූහ. ඔහු තෙරුන් වහන්සේ පවරා ගෙණ වස් තුන්මසක් දන් දී වස්අන්තයෙහි පිළිතෙල් සහල් උක්සකුරු ආදිය ගෙණවුත් "ස්වාමීනි! මේ වස්වාසික ලාභය පිළිගත මැනැව" යි කීහ. තෙරුන් වහන්සේ උන්ගේ පුතකු වත් මහණ කරවා ගන්නා කැමති ව "උපාසකයෙනි! මා සමීප යෙහි කැප පිළිගන්වාලන සාමණේර කෙනෙක් නැත. එසේ හෙයින් තිළින් මට කම් නැතැ" යි නො පිළිගත් සේක. සිවානන්ගේ මහා සුමන ය-කුඩා සුමන ය යි පුත් කුමරුවෝ දෙදෙනෙක් වූහ. එසේ හෙයින් සිවානෝ "එසේ වී නම් ස්වාමීනි! මාගේ මේ මහා, සුමන නම් පුතනුවත් මහණ කරවා ගත මැනැව" යි කියාලා පාවා දුන්හ. තෙරුන් වහන්සේ ඔහුගේ හෙතුසම්පත් නැති සේ දුක "මහාසුමනයාගෙන් මට කම් නැතැ" යි වදාළ සේක.

සිවානෝ "එසේ වී නම් ස්වාමිනි! මාගේ මේ සත් හැවිරිදි කුඩා සුමන නම් පුතකුවත් මහණ කරවා ගත මැනැවැ"යි කියාලා පාවා දුන්හ. තෙරුන් වහන්සේ තමන් වහන්සේ එ ගමට උන් උදෙසා ම වැඩි හෙයින් "ගහපතෑ"යි කිව්ස එ ම දා ම උන් මහණ කර වම්"යි සිතා කරයක් ගෙන්වා ගෙණ කුමාරයන් ලඟට නැඳවා ඉසකේ කපන සේක් පළමු කොට කුඩිම්බිය කපා එ කෙස්වැටිය කුමාරයන් අතට දීලා "දරුව! තෙල බල බලා සිටුව" යි කියාලා තමන් වහන්සේ උන් ඉසකේ කපන සේක. සුමන කුමාරයෝ එ කෙස්වැටි සුඟ බල බලා "මේ මාගේ ඈදි ඉස් මුදුනෙහි තුබූයේ ය. දැන් මෙ ම විගස ම කුණප භාවයට පැමිණීයේ ය. මින් එක ලොමිකු ස් නන බොන භොජනයෙක වැටී ගියේ නම් බඹ අඹරයි. පිළිකුල් කෙරෙයි. මිනිස් ආත්මය පිළිකුල් තියාය" යි අශුභ ලකුණු උපදවා භාවනා කරන්නාහු ඉසකේ කපා නිම වීම හා සමග ම සිවු පිළිසිඹියා පත් රහත්වූ සේක.

එ වේලෙහි තෙරුන් වහන්සේ සත්හැවිරිදි ඒ සුමන කුමාරයන් රහත් වූ පසු මහණ කරවා ගෙණ එදා පවන් දෙපෝයක් මුළුල්ලෙහි දෙමවුපියන් විසින් කරණලද මහා පූජා විඳ පසුව දා බුදුන් දක්නට යම්හ යි කියා උන්වහන්සේගේ දෙමවුපියන්ට කියාලා සාමණේරයන් වහන්සේ නැඳවා ගෙණ සැවැත් නුවර දිසාවට ආකාශයෙන් වඩනා සේක් හිමාලය වනයෙහි රමණීය වූ එක් ගල්ගුහාවෙක සැතපුනු සේක. එදා රාත්‍රිභාගයෙහි තෙරුන් වහන්සේ අමකාශයක් නැති ව සක්මන් කරණ කල උදරවාතයක් ඇති ව මහත් වූ වෙදනා වී ය. සුමන සාමණේරයන් වහන්සේ ගුරුන් වහන්සේට දුක් මහත් සේ දැක කම්පිත වූ සිත් ඇති ව 'ස්වාමිනි! පෙර මේ රුජාව ගත් කල කුමක බෙහෙත් වැළඳූ කල ගුණ වේ දැ" යි විචාළහ. එ බසට තෙරුන් වහන්සේ "සාමණේර යෙනි! හිමාලය වනයෙහි අනවතප්ත නම් විලෙක් ඇත. එයින් පැන් වැළඳූකල ගුණ වේ ම ය" යි වදාළ සේක. ඉන් පැන් ගෙණෙම් දැ යි සාමණේරයන් වහන්සේ කීසේක. සකති ඇත් තෙහි ද සුමන ය යි ගුරුන් වහන්සේ වදාළ කල "ඒ මට බැරි නො වෙයි ස්වාමීනි"යි කියා සිටි සේක.

එවේලෙහි ගුරුන් වහන්සේ "සුමනය! පැන් ගෙණෙන්නට පොහොසත් වී නම් අනවතප්තවිල පන්නාක නම් දිව්‍යනාගරාජයෙක් අරක් ගෙණ වෙසෙ යි. එ මහත් වූ ආනුභාව ඇතියේ ය. ඔහුගේ ආනුභාවයෙන් එ විල කල් නො වරදවා ම වැසි වස්නේ ය.

එ මා හා පුරුදු ය. මා ලෙඩ බව ඔහුට කියාලා මට බෙහෙත් පිණිස පැන් කලයක් වහා ගෙණෙව"යි වදාළ සේක. එ කෙණෙහි සුමන සාමණේරයන් වහන්සේ 'යහපතැ'යි ගිවිස කලයක් එක අතකින් ගෙණ ආකාශයට පැනනැගී පන්සියයක් යොදුන් පමණ තැන් වැඩ ඒ අනවතප්තවිලට පැමිණි සේක. එ දවස් මනාහි ඒ පන්නග නම් නාගරාජයා ලක්ෂ ගණන් දිව්‍යනාගීන් පිරිවරා ඒ අනවතප්තයෙහි ජලක්‍රීඩා කෙරෙමින් සිටියේ ය. සාමණේරයන් වහන්සේ ආකාශයෙන් එඩනා දැක කිපී "මේ මුඩු මහණු තෙමේ ඉතා ලදරු ය තෙමේ තමා බැව් නො දැක මා ඉස පියපත් වගුරුමින් නාසේ ආකාශයෙන් එයි. කලයකු ත් අතින් එල්වාගෙණ එයි මාගේ විලින් පැනක් ගෙනා එන සැටි ය. මොහුට පැන් අද නො දෙමි" යි දියකෙළි ඇරපියා මහත් වූ නා වේසක් මවාගෙණ පන්සියයක් යොදුන් වට ඇති අනවතප්තවිල සිසාරා දරණ ලෙසෙහි උඩරු ලිංදෙක මුතු මුතුයෙහි උඩරු කබල් සිටවන්නා සේ, මහා මහපවුරක් ලූවා සේ, නොයෙක් පටින් දරණ ලෙසෙණ කලඹක් පැස් පිඟනකින් වැසුවා සේ, එණ ගකින් ඒ සා විල පැන් වසාගෙණ අතක් පොවාලන අවකාශයක් නො පා කිපී කිපී රැසැ'ස් බමමා බමවා කඹුරු සම් මඩනා සේ සුස්ම සුස්මා වැද හොත්තේ ය. ඉක්බිති සුමන සාමණේරයන් වහන්සේ නාගරජයාගේ ආකාර ය දැක "මොහු මට කිපී අහංකාර කොට හොත් සැටි ය" යි දැන ආකාශයෙහි සිට:-

සුණෝහි මේ නාගරජ!-උග්ගතෙජ මහබ්බල,
දෙහි මේ පානීයඝටකං-භෙසජ්ජම්හි ආගතො-ති

යන මේ ගාථාව වදාරා පැන් ඉල්වූ සේක. නාගරාජයා එ බසට සාමණේරයන්ට කිපී "බල මහණ පැටව! මෙ තෙනට නැගෙනහිරි දිග්භාගයෙහි ගඞ්ගා නම් ගඞ්ගාවෙක් ඇත. එහි සියලු ජලය ගොස් මහමුහුද ම වැගිර යෙයි. උවමනා වී නම්, තට නායඹ වී නම්, එ ගඟින් පැන් ඇරගෙණ යව. මාගේ විලින් තට පැන් බින්දුවකු ත් නො දෙම්මය"යි කී ය. එ බසට සාමණේරයන් වහන්සේ "මේ නාගරජයා අද මට ගුණයෙන් පැන් නො දේ ම ය. මොහු නො කැමැති කරවා වී නමුත් බලයෙන් ම අද පැන් ගෙණ යෙමි"යි සිතාලා නාගරජ ය! ශාක්‍යසිංහ වූ අප මහා ගෞතම බුදුන්ගේ දෙබෑයන් දරු මල් දිවැස් ඇත්තන් කෙරෙහි අග්‍ර වූ, දෙව්ලොව් මිනිස්ලොව ඉතා ප්‍රසිඬ වූ, තමින් වහන්සේට එකඩත් කෙණෙස්සක් පමණ ලාලූ සිහන්නන් පවා දෙව්ලොව උපදවා

ශක්‍රයා හා සම වූ, සම්පත් දී ඉන්ද්‍රක නම් දිව්‍යපුත්‍රයා ය යි ප්‍රසිද්ධ කරවා පියන කරම් මහත් වූ ආනුභාව ඇති, ඒ අනුරුද්ධ නම් මහතෙරුන් වහන්සේ මාගේ ගුරුන් වහන්සේ ය. මම උන් වහන්සේගෙන් කරුණා ලදින් ඔබ කෙරෙහි වසන එක්තරා එක් සත් හැවිරිදි සාමණේර ලදරුවෙකිමි. වැලිදු මා බාල තැනැ යි නො සිත. සා යේ මූ කයින් ලක්‍ෂණකු ත් මාගේ හිව සඟවාගෙණ පර සක්වළ ගසා පියන තරම් ආනුභාව ඇතියෙමි. කිරි මඬල-සඳ මඬල ම පාපිස්නා පිසිනාක සේ මා පාවිටම ගෙන්වා ගණු ත් පොහොසත්මි. මේ පොළොව පරඬලා පතක් සේ ඔසවා ගෙණ මෙරගල මිස්සොහි තබාලා වමතින් ඔසවා ගෙණ පත්කුඩයක් සේ අතින් ගෙණ සක්මන් කරණ භික්ෂුකෙණකුන් සේ සක්මන් කරන් පොහොසත්මි. තාගේ මේ පණස් යොදුන් මහවිලෙහි පැන් මාගේ එක අල්ලෙන් දාගෙණ තම පැන්පෙතකු ත් නො තබා හැර ගෙණ යන්ට පොහොසත්මි. තව ත් නායක වූ තාගේ ශක්‍ර දෙමෙනුනා ඔබ්ලා මේම විලින් පැන් ගෙන්වා ගණ්ට ත් පොහොසත්මි.

අද තෝ මට අහංකාරයක් කෙළෙහි නම් බුදුසසුන් වන් සත් හැවිරිදි බාලදරුවන්ගේ පවා මෙසේ වූ මහිම ඇතැ'යි කියා මතු පස්වාදහසක් කල් මුළුල්ලෙහි ධර්මකථිකයන් ලවා ම තුබ තුබ සතුත් කරවා බොහෝ දෙනා විස්මයපත් කරවම් ම ය. ගිනි මට ගිනි නො වෙයි. දිය මට දිය නො වෙයි. ගල් මට ගල් නො වෙයි. යක්කු මට යක්කු නො වෙති. දුෂ්ටයෝ මට දුෂ්ටයෝ නො වෙති. නයි මට නයි නො වෙයි. තව ත් දුෂ්ටයන් අදුනෙම් ම ය. තව ත් වඩා ආනුභාව ඇති තව ද සියදහස් ගණන් නයින් අදුනෙම් ම ය. තෝ මට අහංකාර නො කර. මාගේ ගුරුන් වහන්සේ අද මා ලවා ම පැන් ගෙන්වන සේක් ම ය. මම ද පැන් කළයක් ගෙණ යෙම්ම ය. පසු ව හිඳ ලජ්ජා නොව දූන් පැන් කළයක් දීපි ය''යි දෙව්නු ව වදාළ සේක. එ බසට නාගරාජයා දණ්ඩන් ගැසුවා සේ කිපී ''මහණ! අද තාගේ බල බලම් ම ය. මම ද පැන් නො දෙම් ම ය. පුරයෙහි වී නම් පැන් ගෙණගොස් බලගැ''යි කී ය. 'එසේ වී නම් නෙමල! බය නා සිත තබ''යි මෙසේ ම තුන්විටක් ප්‍රතිඥා හැරගෙණ ''මම එකලාව පැන් ඇරගෙණ ගියෙම් නම් අදුරු ගෙයි නැටුම්ා සේ අප්‍රසිද්ධ වේයි බුදුන් දරුවන්ගේ බල බොහෝ දෙනාට දක්වාලා, සියලු සතුන් තුණුරුවන් කෙරෙහි පහදවාලා, මොහුගේ මාන භංග කොට පැන් ගෙණ යෙමි''යි සිතාලා එ කෙණෙහි ආකාශස්ථ දෙවියන් කරා ය, සතර වරම් දෙවිරජුන් කරා ය යි මතුළු හුයක් ද නො යන ඇසිල්ලෙහි මැඩ ඔවුන් හැම දෙනාට කියාලා.

එයින් අසූරියනකින් ශක්‍රභවනයට වැඩ ශක්‍රයන් ආදි වූ දෙවියන්ට කියාලා. එයින් සුස්මක් එළා නො ලන ඇසිල්ලෙහි වැඩ සුයාම් වැසි දෙවියන්ට කියාලා. එයින් ඇසිපියක් එළා නො එලමන ඇසිල්ලෙහි වැඩ සන්තුසිතයෙහි දෙවියන්ට කියාලා. එයින් පැනක් බී නො පියන ඇසිල්ලෙහි වැඩ නිර්මාණ රතියෙහි දෙවියන්ට කියාලා. එයින් විදුලියක් ගසා අනාතබාක නො වන ඇසිල්ලෙහි වැඩ පරනිර්මිතවශවර්තීයෙහි දෙවියන්ට කියාලා එයින් දික් කළ අතක් වක් නො කරණ තුරු බඹලොවට වැඩ අරූතල අසංඥතලයන් හැර පසළොස් බඹලොව බඹුන් කරා වැඩ ඒ සියලු දෙවියන් තමන් වහන්සේ දුක "ඇයි ස්වාමීනි! වැඩියේක් නැ" යි කී කල "අනවතප්ත විල පන්නාග නම් නාගරාජයා හා මා හා දුන් යුද්ධයෙක් වෙයි. තෙපි තෙපි ඒ තෙනම අවුදින් බුදුසසුන් මැද මහණ වූ සත් හැවිරිදි බාල දරුවෝ ජයගණිද් දෝ හෝ නොහොත් සංකීශ වූ විෂඝෝර නාගි ජයගණිද් දෝ හෝ යි ඒ තෙන බලා සිටුව" යි කියාලා ඇසිල්ලෙකින් නැවත එම තෙනට වැඩ ආකාශයෙහි නිශ්චල ව වැඩ සිටිසේක.[1]

ඒ වේලෙහි දිව්‍යබ්‍රහ්මසෙනාව ඔවුනොවුන් පරයා දිවගෙණ අවුදින් ඒ සා තුන්දහසක් යොදුන් අයම් විතර ඇති හිමාලය වනයෙහි අවකාශ මදනෙහියින් සූක්ෂම වූ වෙස් මවාගෙණ තලෙහ පුරාලූ රන්සුණු සමූහයක් සේ අවකාශයක් නැති ව අහස්තුස පුරා සිට ගත්හ. මේ මහත් දිව්‍යසෙනාව මධ්‍යයෙහි නාගරාජයා අතින් පෙර සේ ම පැන් ඉල්වා වදාළ සේක. පෙර කිවා සේ ම නාගරාජයාත්, "සුරු නම් පැන් හැරගණුව" යි කී ය. මෙසේ තුන්යලක් කියවාගෙණ දෙළොස් යොදුන් මහ බඹ වෙසක් මවාගෙණ ඔහුගේ පණස්යොදුන් පෙණගබ පිටව බැසලාසත්ගවු සමාරක් දිග ඇති පතුල්දෙකින් ඉක්මින් තොව සක්මන් කරණසේක. සක්මන් කොට කොට දෙව්එළොඹින් සැරහි සැරහි මැඩ මැඩ ලන සේක. ඒ කෙණෙහි නයි සුසමන හඬ ත්, මිඩනා වේලෙහි පණ ය සුළං ගන්නා හඬ ත් අහස් ගිගුම් හා මුහුදු රළගිගුම් හා එක එල්ලයට පැමිණ ගියා සේ ඉතා මහත් වූ ඝෝෂා වි ය. ඒ කෙණෙහි නාග රාජයාගේ පෙණගබ මඩු ත් මඩු ත් අසූඅස්සෙන් ජලධාරාමෝ තල් කද සා ව ආකාශයට ගවු දෙගවු උස නැගෙන්නට පටන් ගත්තාහු ය. සක්මන් කරමින් සිට ම ජලධාරාවට කළය අත්ලෙහි තබාගෙණ පැලා පැන් කළයක් පුරාගෙණ "අප අා නම් නිපන නාගරාජ ය! අපි යම්හ මොහුගෙන් දුන් පැන ම අප ගත්

1 පැයක් ඇසිල්ලකින්.

තිසාවට තෙපි තෙපි ත් දෙස් වව" යි දෙවියන්ට ත් කියාලා බ්‍රහ් මාත්මභාවය අන්තර්ධාන කොට මහණ වෙසින් ම නික්මුනු සේක. එ කෙණෙහි දිව්‍යබ්‍රහ්මයෝ තුමූ මහත් වූ සාධුකාර පූජා කළාහු ය.

එ කෙණෙහි නාගරාජයා මහත් වූ ලජ්ජා ඇති ව දෙවියන් තමාට කරණ මෙහෙසුම් ඉවසාගත නොහී "මෙ මුඩුමහණ තනි ව පැන් ඇරගෙණ නො ගොසින් මේ සා වූ දිව්‍යසේනාව මධ්‍යයෙහි මට නින්‍දා කොළේ ය" යි කිපී අද ඔහු කටට අත ලාලා හදවත හෝ කඩා දමමි. දෙකකුල අල්වාගෙණ පරගඟට හෝ ගසමි" යි කිය කියා සැරයක් විදුපුවා සේ සාමණේරයන් වහන්සේ පසු පස්සෙහි ලුහුබඳවා දිව, සක්හුන් ගමිකින් නිශ්චල ව පසු නො බලා වඩනා ස්වාමින් වහන්සේ ගඩාගඟ නොහේ ම ය.

මෙසේ පැන් ගෙණ ගොස් මැඩ ගුරුන් වහන්සේ අතට පැන් පිළිගන්වාලා 'වළඳා වදාළ මැනව. ස්වාමීනි" යි ආරාධනා කළ සේක. එ කෙණෙහි ඒ නාගරාජයා දිව දිව අවුදින් "ස්වාමීනි! අනුරුද්ධ මහ තෙරුන් වහන්ස! කෙලෙ පැන් නො වළඳුව මැනව. නො වළඳුව මැනව. මහණුන් නම් තුඩුන් දෙයක් ඉදුරු ගත නො හැක්කෝ වෙ ද, මෙ සාමණේරයෝ මාගෙන් තුඩුන් පැන් උදුරා ගෙණ ගෙණාවාහු ය" යි කී ය. තෙරුන් වහන්සේ සාමණේරයන් වහන්සේ මුහුණ බලා "සබා ද සුමනය" යි වදාළ සේක. සාමණේර යන් වහන්සේ "මොහු මට දුන් පැන් ම ගෙණාමි, පැන් කැප ය, වළඳා වදාළ මැනැවැ" යි කීසේක. මහ තෙරුන් වහන්සේ "රහත් සාමණේරයෝ බොරු නො කියන්නාහු ම ය" යි දැන පැන් වළඳා වදාළ සේක. එ කෙණෙහි රූජාව අන්තර්ධාන වි ය.

ඉක්බිත්තෙන් නාගරාජයා "මේ සාමණේරයෝ බොහෝ දෙවි යන් මධ්‍යයෙහි මට බොහෝ නින්‍දා කළාහු ය. මූන්ගේ හදවත හෝ කඩා දමමි. දෙකකුල ගෙණ පරගඟට හෝ ගසමි" යි කීය. මහ තෙරුන් වහන්සේ "නාගරාජ ය! තා සේ වූ නයි ලක්‍ෂයකු ත් කෝටියකු ත් සාමණේරයන්ට හානියක් කළ නො හෙති. ඔහු මහත් වූ ආනුභාව ඇතියාහ. තෝ නො දොඩා උන් වැඳ ක්‍ෂමා කරවා ගණැ" යි වදාළ සේක. දෙවියන් වෙහෙසන ලජ්ජාවෙන් සිට ගත නොහී ආබව මූත් නාගරාජයෝත් සාමණේරයන් වහන්සේගේ බල දනිත් ම ය. එසේ හෙයින් වැඳ ක්‍ෂමා කරවා ගෙණ "මෙයින් මතු පැනක් උවමනා විට ගැත්තවුට කියා එවා වදාළ මැනැව. ගැති ම ගොස් පැන් පිළිගන්වාලා එයි" කියා සාමණේරයන් වහන්සේට

ආරාධනා කොටලා නාගරාජයා පලා ගි ය. ඉක්බිත්තෙන් මහ තෙරුන් වහන්සේ බුදුන් වැඩහුන් ඒ පූර්වාරාමයට වැඩි සේක.

තෙරුන් වහන්සේ වඩනා බල බලා බුදුහු විශාඛාමන් කැරවූ ඒ මිගාරමාතු නම් මහ පායෙහි මතු මාල්තෙලෙහි වැඩහුන් සේක. එ වේලෙහි සමහර භික්ෂූන් වහන්සේ පෙරමගට ගොස් මහතෙරුන් වහන්සේ අතින් පාසිවුරු ගෙණ වඩා හිඳුවා පය සෝදවා ඇඟට පවන් සලා ආගන්තුක සත්කාර කරණ සේක. පෘථග්ජන සමහර වහන්දූ සුමන සාමණේරයන් වහන්සේ කරා ගොස් නාස්රොඹුව ඇද ඇද හිසකේ අල්වාගෙණ සල සලා 'කිමෙක් ද? සග පැටවා! තෙනි! කවර ද මහණ වූ දී? රෑ රෑ සයින් මැද්දෙහා හෙවූ ද? ගමට බඩ නො තකියා ද? තොපගේ ගම දී මෑණියන් නාසාග්‍රට මැදලා වත ගසාගෙණ නිදන කල සුව ද? දැන් උදෙසා ම මැදගෙතිනා කල සුව ද? යනාදීන් කෙළියට තිසි මෙහෙසුම් ඔප් ගිය ගියා රහත් බව නො දැන භය නැති ව ම කෙළිනා සේක. බුදුහු මේ කාරණ ය දැක "මේ භික්ෂූහු නයකුගේ ග්‍රීවය අල්වාගෙණ කෙළිනා සත්ව යන් සේ, ගිනෑ'තකුගේ දල අල්වාගෙණ කෙළියෝනාසේ සේ, මේ සාමණේරයන් බල නො දැන ප්‍රාතිහාර්‍යයෙ නො දැන උන් හා කෙළි නාහු ය. අද ඔහුගේ බල දෙවියෝ ඇම දුටහ. භික්ෂුසංඝයාහට ද ඔහුගේ ඇනුභාව අද දක්වමි" යි සිනා වදාළ සේක.

එ කල මහතෙරුන් වහන්සේ බුදුන් කරා ගොස් දැක වැඳ එකත්පස් ව හුන් සේක. බුදුහු උන්වහන්සේ හා කැටි ව පිළි සඳර කථා කොට ලා අනඳ මහ තෙරුන් වහන්සේ කැඳවා "ආනන්ද ය! අද අනවතප්ත විල ජලයෙන් දූන් පාද ධොවන ය කරණු කැමැත්තෙමි. සාමණේරයකු යවා පැන් ගෙන්වව"යි වදාළ සේක. එ වේලෙහි අනඳ මහ තෙරුන් වහන්සේ පන්සියයක් සාමණේර යන් රැස්කොට පාළියෙන් සිටුවාලා "ඇවැත්නි! බුදුහු අනවතප් ත දියෙන් පාදධොවන ය කරණ සේක. පැන් ගෙනෙන්ට පොහොසත් කෙණෙක් කවුරු දැ" යි විචාරා හැමදෙනා ම "අපට බැරි ය, අපට බැරි ය"යි කී කල කෙළවර සිටි සුමන සාමණේරයන් ලඟට ගොස් "අනවතප්ත විලින් පැන් ගෙණ ඉය හෙවු දැ?" යි විචාළ සේක. සාමණේරයන් වහන්සේ "බුදුහු මා ලවා පැන් ගෙන්වන සේක් වී නම් ගෙණෙමි" යි කියාලා බුදුන් කරා ගොස් "ස්වාමීනි! අනවතප්ත විලින් මා ගා පැන් ගෙන්වන සේක්දැ?"යි විචාර "බල ඇත්තෙහි නම් සුමන ය, පැන් ගෙණෙව" යි බුදුන්

වදාළ කල බුදුන් වැඳ සවු ඉල්වාගෙණ දෙවනු ව ගුරුන් වහන්සේ වැඳලා එ වෙහෙර විශාඛාවන් සාංඝිකකොට කරවා ලැවූ සැට සැට කළය පැන් ගන්නා මහදිය කළ සැටින් එක් කළයක් මුව විටින් අල්වා විශලි ගිය ලබුවක් එල්වා ගන්නා සේ එක් අතකින් එල්වා ගෙණ පක්ෂප්‍රහාර කොට ගුවන්කුසට පැන නැගී හංසපොතකයකු සේ සියලු භික්ෂුසංඝයා බල බලා සිටිය දී ආකාශයට පැන නැඟී අනවතප්ත විල දිශාවට නික්මුනු සේක.

නාගරාජයා සාමණේරයන් වහන්සේ දුරදී ම වඩනා දැක චක්‍රවර්තියකුහු දුටු චණ්ඩාලයකු සේ භය ඇති ව පෙර මගට දිව දිව අවුදින් ඔබ අතින් කළය දෑතින් ඇරගෙණ පැන් කළයක් පුරා කමා කරමින් නවා ගෙණ "ස්වාමීනි! වැඩවදාළ මැනැව. ගැති ම කැටි ව ගොස් සැන් නැර දීලා එමි" කියාලා නික්මීන. සාමණේර යන් වහන්සේ "නාගරාජ ය! මාගේ බුදුහු මා ලවා ම පැන් ගෙන්වනු කැමැති සේක. නෝ සිටැ"යි ඔහු රඳවා පියා පැන්කළය අත් ලෙසි නබාගෙණ ආකාශයෙන් වඩනා සේක. බුදුහු දුර එන සාමණේරයන් දැක පෙර කෙලි හැම භික්ෂූන් ලඟට කැඳවා "මහණෙනි! රාජහංස ලීලාවෙන් සුමන සාමණේරයා එන ලීලාවක් බලව" යි කිය කියා වැඩිළුන් සේක.

ඉක්බිත්තෙන් සාමණේරයන් වහන්සේ වැඩ පැන් කළය එකත්පස් කොට තබාලා බුදුන් වැඳ සිටිසේක. එ වේලෙහි බුදුහු ඔබ ගෙණා පැනින් පය සෝදා සාමණේරයන් වහන්සේ මුහුණ බලා "සුමන ය! දැන් තෝ කී හැවිරිද්දෙහි දැ"යි විචාරා "ස්වාමීනි! සත් හැවිරිද්දියෙමි" යි කී කල රජකුට දක්කම් කළාවූ ලදරුවකුට ත් ගරු තනතුරු ලැබේ ම ය. මා වැනි සධර්ම වර චක්‍රවර්තියක්හුගේ ශාසනයෙහි බාල ව සිට දිව්‍ය බ්‍රහ්මයන් මධ්‍යයෙහි මේ සා වික්‍රමයෙකින් සසුන් බල පෑ ලොව විස්මයපත් කළා වූ තට ගරු වූ තනතුරක් දෙමි. මාගේ සස්නෙහි විසිහැවිරිදි වූ කල උපසම්පදා කෝටියක් සංවර ශීලය ලැබෙයි. තෝ දැන් සත් හැවිරිද්දෙහි ම උපසම්පදා ව" යි වදාරා එම විට ම ඔබ උපසම්පදා කොට වදාළ සේක.

තව ද, මේ බුදු සස්නෙහි අතීත් සොපාක නම් සාමණේර කෙණකුන් වහන්සේ හා මේ සුමන සාමණේරයන් වහන්සේ විනා සත් හැවිරිදි වයස උපසම්පදා වූ අනික් එකද භික්ෂු කෙණෙක් නැත්තාහු ම ය. මෙසේ මේ සුමන සාමණේරයන් වහන්සේ

එ තැන් පවත් සසුන් නමැති ආකාශයෙහි දිලියෙන අභිනව පූර්ණ චන්ද්‍රයා සේ ප්‍රසිද්ධ ව අසාධාරණ වූ උත්තම ප්‍රතිපත්තීන් ජීවිතාන්ත ය දක්වා බුදුන්ට පූජා කළ සේක.

මෙසේ රාහු අසුරේන්ද්‍රයා විසින් කරණ ලද මහා නමස්කාර පූජා ය, සුමන සාමණේරයන් විසින් කරණ ලද ප්‍රාණත්‍යාගී ප්‍රතිපත්ති පූජා ය, ආදි ශබ්දයෙන් දක්වන ලද සොපාක නම් සාමණේරයන් වහන්සේ ය, පණ්ඩිත නම් සාමණේරයන් වහන්සේ ය, රේවත නම් සාමණේරයන් වහන්සේ ය, සංකිච්ච නම් සාමණේරයන් වහන්සේ ය, සුඛ නම් සාමණේරයන් වහන්සේ ය යි යනාදි වූ ක්ෂීණාශ්‍රව වූ සත් හැවිරිදි-දෙලොස් හැවිරිදි හෙරණුන් විසින් කරණ ලද අසාධාරණ වූ ප්‍රතිපත්ති පූජා ලත් හෙයිනු ත් එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, මහ පොළොව සේ විශාරද වූ ගුණ ඇති, මහ මුහුද සේ ගැඹුරු වූ ගුණ ඇති, මහමෙර සේ ස්ථිරසාර වූ ගුණ ඇති, ආකාශය සේ අනන්ත වූ ගුණ ඇති, අකනිෂ්ඨ බඹලොව සේ ඉතා උස් වූ ගුණ ඇති, සක්වළ අනන්ත වූවා සේ අපර්‍යන්ත වූ ගුණ ඇති, සත්ත්වලෝකය සේ අවිපාක්‍ය වූ ගුණ ඇති, සංස්කාර ලෝකය සේ කල්පනාවට අවිෂය වූ ගුණ ඇති, ඍද්ධිවිෂය සේ සූක්ෂ්ම වූ ගුණ ඇති, බුද්ධවිෂය සේ අනුන් විසින් නො සිතිය හැක්කා වූ ගුණ ඇති, යුගන්ධර සාගරය සේ වන්සවුන් ගුණ මුහුද ම ගලා ගන්නා වූ, සියුම් වූ ගුණ ඇති, හිරුට වඩා තේජෝ ගුණ ඇති, සඳුට වඩා සෞම්‍ය ගුණ ඇති, මාගේ ස්වාමිදරු වූ, මාගේ ම ගුරු වූ, මාගේ ම දෙවි වූ, මාගේ ම කල්‍යාණ මිත්‍ර වූ, මට ම ශරණ වූ, මට ම පිහිට වූ, මා ම නිසා බුදු වූ, මා ම නිසා මේ සද්ධර්ම දෙශනා කොට තබා ලූ, මාගේ ම ත්‍රිලෝගුරු බුදුරජාතන් වහන්සේ මේ මේ කාරණයෙනු දු අර්හත් නම් වන සේක.

එසේ හෙයින් කියන ලදුයේ මැයි:

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං ති.

මේ පූජාවලියෙහි
අප බුදුන් සුමන සාමණේරාදි හෙරණුන්ගෙන් ලද
දහරභික්ෂු ප්‍රතිපත්ති පූජා කථා නම් වූ
එකුන්විසි වන පරිච්ඡේදය නිමි.

විසිවන පරිච්ඡේදය

නම ද: අප බුදුන් සැවැත් නුවර දී කොසොල් මහ රජුගෙන් ලද අසදෘශ මහා දාන පූජා නම් කවරී? යත්;

ඒ දානයට පූර්වාංගයෙකි පිළිවෙල කථාව මෙසේ දතයුතු. ත්‍රිභුවනචූඩාමාණික්‍ය වූ, මාගේ ස්වාමිදරු වූ, බුදුරජාණන්වහන්සේ තමන් වහන්සේගේ කරුණා නමැති ජලතලාවෙහි පිහිටුවන ලද අභිනීහාර නමැති ජලයෙන් හා, බෝධිසම්භාර නමැති මහානාලයෙන් හා ශීල නමැති විශාල පත්‍ර සමූහයෙන් හා විදර්ශනා නමැති පෙති සමූහයෙන් හා නුවණ නමැති අනන්ත වූ කෙසරු පෙළින් හා, චන්ද්‍රඥාන නමැති මිහි කොමයෙන් හා, සදහම් නමැති පුෂ්කර මධුබින්දු සමූහයෙන් හා, ගුණ නමැති සුවඳ ගඳින් හා, වෛනෙය ජන නමැති බමර කැලන් විසින් හා, ශ්‍රාවක ගණ නමැති හංස සමූහයා විසින් හා, බුද්ධඥාන නමැති සූර්‍ය්‍යාලෝකයෙන් හා, තුන්ලෝ නමැති මහා සරසියෙහි පැන නැගී සර්වඥතාඥාන නමැති මහා පද්මය ප්‍රබුද්ධ කරවා, ප්‍රථම බෝධියෙහි පටන් ලෝවැඩ කරණ කල බුදුවූ විසි හවුරුද්දක් මුළුල්ලෙහි ම නිරන්තරයෙන් අත් පා මෙහෙකළා වූ එක් කෙණෙකුන් වහන්සේ ම ය යි නැත. නාගසමාල ය, නාගිතය, උපවාණ ය, සුනක්ඛත්ත ය, චුන්ද ය, සාගත ය, රාධ ය, මෙඝිය ය යන මේ අටදෙනා වහන්සේ බුදුන්ට මුර ලාගෙණ වතාවත් කරණ සේක.

එ කල මාගේ ස්වාමිදරුවෝ ආයුෂ්මත්වූ ආනන්ද මහ තෙරුන් වහන්සේගේ නුවණ පිරී හුන් සේ දැන දෙව්රම් වෙහෙර දී අසූ මහ සව්වන් වහන්සේ ම රැස්කොට ලා ආමන්ත්‍රණය කොට මහණෙනි! දැන් මාගේ වයස් පස් පණස් හවුරුද්දෙක් පලාගියෙ. එසේ හෙයින් වව යොබ්බන කාල ය ඉක්ම ගියේ ය. ලොවුතුරා බුදුන්ට ජරා විලි පිලියෙක් නො වේ ම ය. එසේ ද වුවත් දැන් මම මහලුවන වයස් ඇති යෙමි. එසේ හෙයින් මහලු නම් වෙමි. සමහර මහණ කෙණෙක් මා හා එක මග යමින් සිට මා යන මග හැර අනික් මගෙක යම්හයි යෙති. සමහර මහණ කෙණෙක් මාගේ පාත්‍ර ය බිම තබා පියා ත් පලා යත්තාහු ම ය. සමහර කෙණෙක් මා පස්සෙහි යමින් සිට අළු ගොඩක් පිට වැදහෙව බලු තපස් කරන්නාවූ මිථ්‍යාදෘෂ්ටිකයුවන් දැක රහතුනැයි කියා උන් කරා ත් ගොස් කථා කරන්නාහු ම ය. එසේ හෙයින් නිරන්තරයෙන් මට අත් පා මෙහෙ කරණ එක් මහණ කෙණෙකුන් තිල වන්නා කැමැති යෙමි"යි වදාළ සේක.

එ බසට සැරියුත්-මුගලන් ආදි වූ අසූ මහ සව්වන් වහන්සේ ම ඉතා මහත් වූ සංවේගයට පැමිණ වෙන වෙන නැඟී සිට "ස්වාමීනි! මම නුඹවහන්සේට මෙහෙ කෙරෙමි. මා හැරගෙණ මෙහෙ ගෙණ වදාළ මැනැව මට ම කරුණා කොට වදාළ මැනව. ඒ සැපත මට ම දී වදාළ මැනැවැයි" යි යනාදීන් ආරාධනා කළ සේක.

එ වේලෙහි බුදුරජානන් වහන්සේ තමන් වහන්සේ රහතන් අතින් මෙහෙ නො ගන්නා හෙයිනුත්, ඒ සෙසු බුදුන්ගේ මාපිත්‍රු හෙයිනු ත්, කප්ලක්ෂයක් පැරුම් පුරා ආ කෙණෙකුන් අතින්ම මෙහෙ ගන්නා හෙයිනු ත් "මෛත්‍රීනම් මතු ආනන්ද නම් ස්ථවිර කෙණෙක් උපස්ථායක වෙති"යි සුවිසි වාරයෙක සුවිසි බුදුන් විසින් වදාරණලද හෙයිනු ත්, බුදුහු "මහණෙනි! තෙපි තෙපි වෙන වෙන ම ප්‍රාර්ථනා කොට මාගේ ශාසනයෙහි වෙන වෙන ම තනතුරු ලදුව. එසේ හෙයින් තෙපි සිටුව-තෙපි සිටුව"යි කියා නො ඉවසා වදාළසේක.

එ වේලෙහි ඇමදෙනා වහන්සේ බුදුන්ගේ අදහස් දැන ආයුෂ්මත් වූ ආනන්ද මහ තෙරුන් වහන්සේ බණවා "ඇවැත්නි! බුදුන් තොප කෙරෙහි අභිප්‍රාය ඇති සැටි ය. තෙපි බුදුන්ට අත් පා මෙහෙ කරව"යි වදාළ සේක. එ වේලෙහි ආනන්ද මහතෙරුන් වහන්සේ සකල ශරීරයෙහි ලොමු දැහ ගන්වමින් අස්වණක් ප්‍රීතීන් පිණා "මම ම බුදුන්ට මෙහෙ කෙරෙමි"යි සිතා වදාරණ සේක් "බුදුහු මා කෙරේ ම අභිප්‍රාය ඇති සේක් වී නම් මම ද බුදුන්ට මෙහෙ කරණු කැමැත්තෙම් ම ය. කරන්නා වූ අත් පා මෙහෙය සපයා කොට කරුණු කැමැත්තෙම් ම ය. මා ඉල්වන්නා වූ වර අටෙක් ඇත. ඒ වර අට බුදුහු මට දුන් සේක් වී නම් අද පටන් ම මෙහෙ කෙරෙමි"යි වදාළ සේක. එ බසට භික්ෂූන් වහන්සේ "ඇවැත්නි! ඒ වර අට නම් කිම ද" යි විචාළ සේක.

එ වේලෙහි ආනන්ද ස්වාමීන් වදාරණ සේක් "මම බුදුන්ට මෙහෙ කෙරෙම් නම්: බුදුන්ට උපන් චීවරයකු ත් නො වළඳිම්මය. බුදුන්ට උපන් පිණ්ඩපාතයකු ත් නො වළඳිම් ම ය. බුදුන් හා එක ගඳකිළියෙහි ත් නො සැතපෙම් ම ය. බුදුන්ට කළා වූ ආරාධනාවෙක වැළඳී මටත් නො යෙම්මය. මෙසේ වූ ප්‍රතික්ෂෙප වර සතරෙක. තව ද මාගේ පාත්‍රයට උපන් ආහාර ය මා කෙරෙහි වෙනසක් නැති ව බුදුන් විසින් වළඳා මා උපාසක තනතුරෙහි තබා වදාළ මනා ම ය. යම් යම් දුරස්ථානයෙක සිට ත් කිසි කෙණෙක් අවුදින් 'දැන් ම මා

බුදුන් දක්මාලුව මැනැවැයි: මට අවුදින් කිවූ නම් එ වේලෙහි බුදුහු සිවනු රජනු දෙවියනු බඹනු හා සමග කථා කරණ සේක් වී නමුත් මම ඔහු හය නැති ව කැඳවා ගෙණ ගොස් බුදුන් දක්මාලා මාගේ වල්ලභ නාම ත් පවිම් ම ය. යම් යම් ප්‍රස්ථාවෙක බුදුහු ධ්‍යානාදියෙන් වැඩ උන් සේක් වී නම් මම් එ විගස ම බුදුන් අතින් විචාරම් ම ය. නම ද: මා නැති ව දෙව්ලෝ බඹලෝ ආදියෙහි දී ත් බුදුහු යම් යම් බණක් වදාලසේක් වී නමුත් දෙවනු ව අවුදින් ඒ බණ මට ත් වදාල මනා මය මෙසේ වූ ආශාවනා වර සතරෙකැයි මේ මා කී අට වරය ලදිම් නම් මෙහෙ කෙරෙම් යි ඒ ඉල්වා දූන මැනැවැ” යි වදාළ සේක.

එ වේලෙහි බුදුහු සාධු සාධු ආනන්දය! අනන්තපරියන්ත වූ බුදුන්ගේ ආගාමිකයන්ගේ ඒ චාරිත්‍රයෙක් මය; ඒ උතුම් වූ වර අට නම සිල්ගෙෂයෙන් ම දිනිම්. තෝ මට මෙහෙ කරව” යි කියා වදාළ සේක.

මෙසේ ඒ අනඳ මහ තෙරුන් වහන්සේ එ තැන් පටන් බුදුන්ට උපස්ථාන කරන්නවුන් කෙරෙහි ය. කෙලෙහි උපකාර දන්නවුන් කෙරෙහි ය. සිවුපස ලාභින් කෙරෙහි ය. මිහිරි වූ කටහඩ ඇති ව බණ කියන්නවුන් කෙරෙහි ය. බහුශ්‍රැතයන් කෙරෙහි ය. යන මේ පඤ්චස්ථානයෙන් අග්‍ර වී එතදග්‍රපාළියෙහි තබන ලදුව. නව ද: ආගම සම්පදා ය, අධිගම සම්පදා ය, පූර්වහේතු සම්පදා ය, අර්ථානර්ථ ප්‍රතිපාචණ සම්පදා ය, තීර්ථවාස සම්පදා ය, යොනිසො මනසිකාර සම්පදා ය, බුද්ධොපනිශ්‍රිත සම්පදායයි යන මේ සප්තසම්පත්තීන් සම්පූර්ණ සේක. එතැන පටන් පස් විසි හවුරුද්දක් මුළුල්ලෙහි අප්‍රමාද ව බුදුන්ට උපස්ථාන කරණ සේක් “ආනන්ද! ය යි බුදුන් ලවා දෙවාරයක් හඬගා පිම් නම් මාගේ කවර නම පක්ෂපාත නමෙක් දැ” යි සිත සිතා දඬුවැට පහන් අතින් ගෙණ තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි ගඳකිළිය සිසාරා ඇවිද පාන් කොට පියන සේක් ම ය.

ඒ අනඳ මහ තෙරුන් වහන්සේ කෙසේ වූ විශ්වාසයක් කිය, මෙසේ වූ ප්‍රේමයකින් බුදුන්ට අත් පා මෙහෙ කළ සේක් ද? යත්;

පෙර පියුමතුරා නම් බුදුන් සමයෙහි නොයෙක් පුණ්‍ය සම්භාර යන් රැස් කොට බුදු කෙණකුන්ට මෙසේ පක්ෂපාතවෙම්යි ප්‍රාර්ථනා කොට ආ සේක් ම ය සසර ද බුදුන්ගෙනු ත් බොහෝ උපකාර ලැබ ආ සේක් ම ය. බුදුන්ට ත් බොහෝ උපකාර කොට ආ සේක් ම ය.

සෙසු කල් හැර මෙම කප ජුණ්හජාතකයෙහි ස්වාමිදරුවන් ජුණ්හ නම් රජ කල උරයෙන් උරය ගැටී ගියා වූ විශ්වාසයෙන් හවුරුදු පතා ලක්‍ෂයක් නිමිත ගම්වර පසක් හා, කෙල්ලන් සියයක් හා, ගවයින් සත්සියයක් හා, පසළොස් දහසක් කහවණු හා, ස්ත්‍රීන් දෙදෙනකු හා මේ ආදි නොයෙක් ධන රැසින් එක දා ලද්දා වූ එ කල බමුණානෝ නමු දු මේ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: භද්දසාල ජාතකයෙහි ස්වාමිදරුවන් භද්දසාල නම් වෘක්‍ෂදෙවතාවූ සමයෙහි බෝසතුන් අතින් අමාද ලදින් එ තැන් පටන් හවුරුදු පතා ලක්‍ෂ වටනා බිලි පූජා කරවූමාහු එ කල ඒ රජ්ජුරුවෝ නමු දු මෙ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: කාලිඞ්ගබොධි ජාතකයෙහි බොධිමණ්ඩලය දූත බුදුන් බුදු වන තැන ය යි අසා බුදුන් කෙරෙහි ම ප්‍රේමයෙන් එ තීම් අවලොස් රියන් උස මහා කනකස්තම්භයක් සිටුවා, අවට, සත් රුවන් වෙදිකා කරවා, මැද රන් සුත්කෙත් කමරා, රුමත් පවුරු රුවන් දොරටුයෙන් සේ ම කරවා, සැට දහසක් සුවඳ මල් මාහසන් පූජා කොට, දවස්පතා ම මෙ සෙයින් ම පූජා කරව යි නියොග කොට ගියා වූ එ කල ඒ කාලිඞ්ග නම් චක්‍රවර්ති නමු දු මෙ කල මේ අනඳ මහ තෙරුන්වහන්සේ ම ය.

තවද: රුරුමිග ජාතකයෙහි ස්වාමිදරුවන් රුරු නම් මුව රජ කල මුවතුඩින් වදාළ බණ අසා පැහැද දියෙහි ගොඩෙහි සියලු සතුන්ට අභයදාන පූජා කළා වූ එ කල ඒ බරණැස් රජ්ජුරුවෝ නමු දු මෙ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: සාලිකෙදාර ජාතකයෙහි ස්වාමිදරුවන් ගිරා රජ ව උපන්කල්හි ගිරා තුඩින් කී බණ අසා පැහැද පැසුනු පිටින් හැල් අවකිරියක් පූජා කළා වූ එකල ඒ සාලිඉඳිය නම් බමුණානෝ නමු දු මේ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: චිත්තසම්භූත ජාතකයෙහි ස්වාමිදරුවන් චිත්ත නම් මහා තාපස කල මිට පිට සතර ජාතියෙක විශ්වාස ධර්මයෙන් ම ඉපැද කෙලවර ජාතියෙහි බෝසතුන් අතින් බණ අසා පැහැද ඒ සා බරණැස් රජය හැර එම දා මහණව ජීවිතාන්ත ය දක්වා පක්‍ෂ පාත ව අත් පා මෙහෙ කළා වූ එ කල ඒ සම්භූත නම් රජ්ජුරුවෝ නමු දු මේකල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: සිවි ජාතකයෙහි ස්වාමිදරුවන් සිවි නම් නරපති ව අන්ධ වූ බමුණාට ඇස් දන් දෙන ද, බෝසතුන්ගේ නියෝගයෙන් ම ඖෂධ බලයෙන් ඇස් දෙක උපුටා දී ලූ. බැරි වූ අඞ්ගපරිත්‍යාග යෙහි පවා අනුබල සහාය වූ, එ කල ඒ සීවක නම් වෙදුතෝ තමූ දූ මේ කල මේ අනඳ මහතෙරුන් වහන්සේ ම ය.

තව ද, රෝහණමිග ජාතකයෙහි ස්වාමිදරුවන් රොහනත නම් මුව රජ ව මල බැඳී ගියා ද, අසූදහසක් මුවන් පැන පලායාදී තමන් එම මලෙහි බැඳී ගියා සේ ප්‍රේම සමැති මල බැඳි 'මා මැරූ කල මුත් කුඹ මරා පිය නො දෙමි'' යි කියා බෝසතුන් ඇඟ එල්බවා ගෙණ සිට ඒ සෙළුහරෙහි වැද්දහු විස්මාපත් කරවා බෝසතුන්ගේ ජීවිතය ගලවා දීලුවා වූ, එ කල ඒ චිත්ත නම් මල් මුමාතෝ තමූ දූ මේ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: මහාබොධි ජාතකයෙහි ස්වාමිදරුවන් මහ තවුස්ව රජුගේ ගෙට ගියාම්බා ද ඇතුළෙහි දී ජීවිතාන්තරායට කාරණ යක් දුත පහිතද ඉව ගිය තබාහණ බුරණ පහාරයෙන් මහත් කොට තට දල්වා "ස්වාමිනි! මේ ගෙට නො එව. රජ්ජුරුවෝ කොප මරන්ට නියෝග කළෝ ය. අතික් අතෙක සිගා වැඩපියව"යි ශුනක භාෂාවෙන් හඬගා කියා බෝසතුන් ඉවත යවා ජීවිතය රක්ෂා කොට දීලුවා වූ, එ කල ඒ කොලෙය්‍ය නම් ශුනකයාතෝ තමූ දූ මෙ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: සොනනන්ද ජාතකයෙහි ස්වාමිදරුවන් සොනනන්ද නම් මහා තාපස කල ඔබ අතින් උරණ අසා හය ගෙණ මෙවුලා සූවිසි අක්ෂෞහිණී මහ සෙනග හා එ තෙක් රජ පිරිස් කැඳවා ගෙණ ගොස් මේ තෙක් දෙනා ලවා පැරැත්ත කියවා ඔබ වහන්සේ වැඳ ක්ෂමා කරවා ගෙණ බොහෝ දවසක් ආදරයෙන් විසුවා වූ, එ කල ඒ නන්ද නම් තාපසයෝ තමූදූ මේ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: චුල්ලහංස ජාතකයෙහි ස්වාමිදරුවන් ධෘතරාෂ්ට්‍ර නම් හංසරාජ ව පිහුම් විලෙහි බැඳී ගිය ද අනූදහසක් හංසයන් ඒ ඒ අත පලාගිය වේලෙහි තුමූ නො ගොසින් සිට බෝසතුන්ගේ ජීවිතය රක්ෂා කොට එ තැන් පටන් ඔවුනොවුන් අත් නො හැර ආවා වූ, එ කල ඒ සුමුඛ නම් හංස සෙනාපති තමූ දූ මේ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: ගුණ ජාතකයෙහි ස්වාමිදරුවන් සිංහරාජයන් කල මඩ වළෙහි වැටී මරණ ප්‍රාප්ත වූ ද ජීවිත රක්‍ෂා කොට එ තැන් පටන් සත් පරම්පරායෙහ විශ්වාස ධර්මය කොට තබා කළා වූ එ කල ඒ කැණහිලාතෝ නමුදු මෙ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: චුල්ලපදුම ජාතකයෙහි ස්ත්‍රියක බෝසතුන් පර්වත මුදුනෙන් හෙළාපු ද පිට හිඳුවා ගෙණ ජීවිකය රක්‍ෂා දීලූමා වූ එ කල ඒ ගොයාතෝ නමුදු මෙ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: තිරීටවච්ච ජාතකයෙහි ස්වාමිදරුවන් තිරීටවච්ච නම් මහා තාපස කල යුද්ධයෙහි දී පැරද ළිඳෙහි බෝසතුන් නිසා දිවි ලදින් එ තැන් පටන් ජීවිතාන්තය දක්වා අල ගොජකාදියෙන් බොහෝ උපස්ථාන කළා වූ එ කල ඒ බරණැස් රජ්ජුරුවෝ නමුදු මෙ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: සිවි ජාතකයෙහි ස්වාමිදරුවන් තාපස ධර්මය ම පූරණය කරණ සමයෙහි ඔබගේ ම උපදෙසින් කුන් කුම්මාංසානුභවය කොට බරණැස් නුවර රාජ්‍යය ලදින් බොහෝ දවසක් ඔබට ම උපස්ථාන කළා වූ එ කල ඒ හසත්‍යාචාරි නමුදු මෙ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: මහා අශ්වාරෝහක ජාතකයෙහි ස්වාමිදරුවන් බරණැස් රජ කල තුමූ ගොවිකුලෙහි ඉපැද එක්ව ම බොහෝ කලක් රජසුව විඳ වූ ඒ කල ඒ ප්‍රත්‍යන්තවාසී වූ පුරුෂයාතෝ නමුදු මෙ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: පීඨ ජාතකයෙහි ස්වාමිදරුවන් මහණදම් පුරණ කල බොහෝ දවසක් ආදරයෙන් ම උපස්ථාන කළා වූ, එ කල ඒ ධන සිටාතෝ නමුදු මෙ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: සුවණ්ණ කක්කටක ජාතකයෙහි ස්වාමිදරුවන් බ්‍රාහ්මණ මහාසාර කල නයකු විසින් දශට කරණ ලදු ව විෂමූර්ඡාවෙන් මරණප්‍රාප්ත වූ ද දිවි රැක දීපුවා වූ, එ කල ඒ රන්වන් කකුළුවාතෝ නමුදු මෙ කල මේ අනඳ මහ තෙරුන් වහන්සේ ම ය.

තව ද: නානාච්ඡන්ද ජාතකයෙහි ස්වාමිදරුවන් බරණැස් රජ ව එක් දවසක රාත්‍රිභාගයෙහි "මේ නුවර මාගේ අධර්මයක් මා ඇසිය දී කියන කෙනෙක් නැත. ඉදින් මාගේ අමැදහත් කමක් පිටත කියන කෙනෙක් ඇත් නමුත් වෙස් වළා ඇවිද අසා ඒ නුගුණයක් හරිමි"යි සිතාලා එකලා වම නුවර ඇවිදිමින් සිටි ද ය. එ වේලෙහි නුවර සොරු ගණනෙක් රා තිබෙන ගෙට මැද රා කළයක් සොරා හැරගෙණ පලා යන්නාහු බෝසතුන් දැක "කොල! මේ සොරෙකැ"යි අල්වාගෙණ එම උතුරු සළුවෙන් අත් කර බැඳගෙණ රා කළය හිසට නගාලා මිර මිරා ගෙණ යෙති. එ වේලෙහි බෝසතාණෝ තම රජ බව නො හඟවා 'දුඃඛිතයෙක්මි මේ හැරගෙණ මා හැරපියව"යි උතුරුසළු දී ගැළවී රජගෙට ම යෙමින් නිදිගත. එ වේලෙහි එනුවර දනුමැති දිළිඳු බමුණානකෙනෙක් ගෙන් මිදුලට බැස අහසය බලා රාජබන්ධන නම් ග්‍රහයෝගයක් දැක ගෙට හඬ ගා බැමිණියව කියන්නාහු "පින්වත් වූ බැමිණියෙ! අපගේ මෙ නුවර රජ දන්ම බන්ධනයකට පැමිණ දන් ම මිදී ගියේ වේ දූ" යි කීහ.

රජ්ජුරුවෝ එ බස අසා සතුටු ව එ ගෙයි අත්තක් ගත්වා රජගෙට ගොස් දෙවන දා උදෑසන හැම නුවර බමුණන් රැස්කොට "ගිය දා රෑ තොප තොප දුටු අමුතු ග්‍රහ යෝගයක් මට කියව"යි විචාරා සියලු බමුණන් වෙන වෙන ගැණ බලා "අමුත්තෙක් නැතැ"යි කී කල සැවත එ බමුණා ගෙන්වා 'තොප දුටු අමුත්තක් මට කියව"යි විචාරා එ බසට "මා විචාරන්නේ කිම් ද? නුඹ මරු බැම්මක් ලදින් ගැළවුනෝ වේ ද, රාජබන්ධන නම් යෝගයෙක් වී ය" යි බමුණන් කී කල බොධිසත්ත්වයෝ උන් කෙරේ පැහැද 'තොප කැමැති වරයක් ගණුව"යි කීහ. එ වේලෙහි බමුණානෝ 'මැනැවැ සී ගෙට ගොස් අා කල වර ගණිමි"යි කියා ගෙට දිවගොස් අඹුදරුවන් බණවා "පින්වත්නි! අද රජ මා කෙරේ ඉතා පැහැද ගිය මා කැමති වරයක් දෙයි. කුමක් ඉල්වා ගණිම් දූ"යි විචාළහ. එ බසට බැමිණී සිනා කවක් සී පියා 'ස්වාමිනි! ඇඹුල් කා පිඬාව ගියෙමි. අතික් සැපතකින් කම් නැත කිරිදෙනුන් සියයක් මට ඉල්වා දී පියව"යි කිව. පුතනුවෝ කියන්නාහු "ස්වාමිනි, අතික් සැපතකින් මට කම් නැත. සිත් යේ මා කෙල ඇවිදපියනා පරිද්දෙන් අසුන් යෙදූ රථ ඉල්වා දී පියව"යි කීහ.

යෙහෙලනියෝ "රථ තබා මට සොඳ රුවන්තෝඩු දෙකක් ඉල්වා දී පියව"යි කීහ. කෙලී කියන්නී "ස්වාමිනි! සෙසු දෙයක් නො ඉල්ලුම් මැනැවැ, පැර ගත්තා වේලෙහි ගෙන් ගෙට ඇවිද

ඉතා වීඩා ව ගියෙමි. වතක්-මෝලක්-කුල්ලක් ඉල්මා දීපුයේ නම් සියලු සම්පත් දුන්නා හා සම ය"යි කීව එ වේලෙහි බමුණානෝ රජ්ජුරුවන් කරා පලා ගොස් "ස්වාමිනි! මර ගැණීම බැරි ය. අපි හැම නානාච්ඡන්දයම්හ. මම ලක්ෂයක් නිමන ගම්වරක් කැමැති යෙමි. මා බැමිණි කිරි දෙනුන් සියයක් කැමැත්තී ය. ම පිත් සිත් යේ කෙළ ඇමිද පියන අසුන් යෙදූ රථයක් කැමැත්තේ ය. මායේලි මිණි කොඩොල් සගලක් කැමැත්තී ය. ගෙලි වතක්-මෝලක්-කුල්ලක් කැමැත්තී ය. එසේ හෙයින් එක්කෙණකුන් කැමැති වරයක් ඉල්වීම් නම් සෙස්සෝ නො කැමැති වෙති. එසේ හෙයින් මර ගැණීම බැරිම ය"යි කීහ. එ වේලෙහි රජ්ජුරුවෝ සිතාසී "තොප කැමැති කැමැති වරම දෙමි, ගණුව"යි කියාලා මේ සියලු සැපත් දී, අග්‍රපුරෝහිත තනතුරු ද දී, බොහෝ දවසක් ඔවුනොවුන් කෙරෙහි කරුණාවෙන් වාසය කළ දූ ය. එකල ඒ පුරෝහිත බමුණානෝ නම්දු මේ කල මේ අනඳ මහතෙරුන් වහන්සේ ම ය.

මෙසේ සසර ද ඔවුනො'වුන්ට උපකාරව ආ හෙයිනුත්, ප්‍රේම ව ආ හෙයිනු ත්, කප්ලක්ෂයක් පිරූ පාරමිතා ඇති හෙයිනු ත්, බුදුහු මේ අනඳ මහතෙරුන් වහන්සේ ම අග්‍රඋපස්ථායක කළ සේක් මි ය. උන්වහන්සේ ද බුදුන්ට පුළුව ම, අන් පා මෙසෙ කළ සේක්ම ය. එසේ හෙයින් පූර්වසන්නිවාසය ව සියලු සත්නට ලාව ම උතුම් ම ය. ප්‍රේමනීය ම ය. වදාළේ මැනෝ:-

පුබ්බෙ ව සන්නිවාසෙන-පච්චුප්පන්න හිතෙන වා,
එවං තං ජායතෙ පෙමං-උප්පලං'ව යථොදකෙ-ති.

මෙසේ අනඳ මහ තෙරුන් වහන්සේ විසින් නොයෙක් ජාති භේදයෙහි ද, වර්තමාන කාලයෙහි ද කරණලද නොයෙක් සත්කාර ලත් හෙයිනු ත් එසේ එසේ වූ උපස්ථාන විදීමට සුදුසු හෙයිනුත් මාගේ බුදුහු අගීක් නම් වන සේක.

තව ද: මේකී ආනන්දබෝධිපූජා නම් කවරහ? යත්;

මෙසේ මාගේ ස්වාමිදරූ වූ බුදුරජානන් වහන්සේ මෙම සැවැත් නුවර වාසය කොට දනවු සැරිසරා වැඩපි සමයෙන සැවැත් නුවර වාසී වූ බොහෝ ස්ත්‍රී පුරුෂයෝ සුවඳ මල් ආදිය ගෙණ වෙහෙරට අවුත් බුදුන් නො දුක ඉතා මහත් වූ ශෝක ඇතී ව බුදුන්ට ගෙණ මල් පිදියයුතු වූ අනික් උතනම වූ සථානයක්

නො ලදින් විහාරෝපචාරයෙහි රැස්කොටපියා පලා ගියහ. අනේපිඩු මහසිටාණන් ආදී වූ බොහෝ උපාසක උපාසිකාවරු එදා මේ වල සලාපු මල් දැක කම්පා ඇති ව "බුදුන් නුදුටු කල අප ඇම් බුදුන් දුටුවා සේ වැඳ පුදා ගන්නාවූ පූජ්‍යස්ථානයක් ලදුමෝ නම් යෙහෙකැ"යි ඔවුහොවුන් හා සමග කථා කොට පසුව බුදුන් දෙව්රම වෙහෙරට මැඩිකල හැම දෙන ම ගොසින් බුදුන් දැක ඉතා මහත් වූ සොම්නසට පැමිණ පසුව අනඳ මහ තෙරුන් වහන්සේ කරා ගොස් "ස්වාමීනි! මේ තාක් දවස් බුදුන් නොදැක වැඳ පුදා ගන්නා දෙයක් නො ලදින් ඉතා මහත් වූ දොම්නසට පැමිණියම්හ. බුදුහු නම් නානා ස්ථානයෙහි ලෝවැඩ කියා වඩනා සේක් ම ය. බුදුන් වෙහෙර නැති කල අප ඇම් වැඳ පුදා ගන්නා පූජ්‍යවස්තුවක් බුදුන්ට සැලකොට ඉල්වා දුන මැනැවැ"යි කීහ.

එ වේලෙහි අනඳ මහ තෙරුන්වහන්සේ බුදුන් කරා ගොස් වැඳ මේ පවත් සැලකොට "ස්වාමීනි! තුඹවහන්සේ දුටුවාසේ පූජා කටයුතු වස්තු කොපමණ් දැ"යි විචාළ සේක. බුදුහු ආනන්ද ය! පූජ්‍ය වස්තු නම් ශාරීරික ය, උද්දේශික ය, පාරිභොගික ය යි තුනෙක් වෙයි. එයින් ශාරීරික ධාතු පූජා බුදුන් අයාමෙහි වන්නේ ය. උද්දේශික පූජා නම් ධම්යට ධාතුවට හා බුදුන් වැනි රූපාදියට වෙයි. පාරිභොගික නම් බුදුන් වැළඳූ පාත්‍ර සිවුරු ආදියට හා පිට දුන් ශ්‍රීමහා බොධියට කරන්නාවූ සත්කාර ය. එසේ හෙයින් ජය ශ්‍රීමහා බොධියෙන් එලශාඛාවක් ගෙණ්වූත් මේ ජෙතවනාරාම යෙහි රොපනය කරවා ඒ බොධිය මා දුටුවා සේ වැඳ පුදා සත්කාර කළහොත් මට කළාවූ සත්කාර හා සම ම ය"යි වදාළ සේක.

එ වේලෙහි අනඳ මහ තෙරුන් වහන්සේ මෙපවත් කොසොල් රජ්ජුරුවන් ආදිවූ හැමදෙනාට කියා එ වේලෙහි ම ජෙතවනයෙහි දොරටුව ගාවා ආවාටයක් කනවා භූමිමණ්ඩලය විසිතුරු කොට සරහා එ වේලෙහි මුගලන් මහ තෙරුන් වහන්සේ කරා ගොස් "ස්වාමීනි! ජයශ්‍රී මහා බොධියට ගොස් එලශාඛාවක් අපට ගෙණ වුත් දුන මැනැවැ"යි ආරාධනා කළ සේක.

එ වේලෙහි මුගලන් මහ තෙරුන් වහන්සේ හැම රජ පිරිස් බල බලා සිටියදී "මා යන කියාව ත්, එලශාඛාව ගෙණෙන කියාව ත්, හැමදෙනාට ම පෙණේවා"යි අධිෂ්ඨාන කොටලා ආකාශයට පැන නැගිලා බොධිමණ්ඩලයට වැඩ නටුයෙන් ගිලිහී එන එලශාඛාවක්

බිම හිය නො දී ආකාශයෙහිදී ම සකලසිවුරුපටින් පිළිගෙණ නැමීත එ කෙණෙහි ම අවුදින් ආකාශයෙන් බැස අනඳ මහ තෙරුන් වහන්සේට දුන් සේක.

අනඳ මහතෙරුන්වහන්සේ දෙහොතින් පිළිගෙණ කොසොල් මහරජ්ජුරුවන් අතට දී 'මහරජ! තොපගේ සවහස්තයෙන්ම බෝධි ප්‍රතිෂ්ඨාව කරව''යි වදාළ සේක. රජ්ජුරුවෝ ඒ ශාඛාව රුවන් කරඬුයෙන් පිළිගෙණ ඉස්මුදුනෙහි තබාගෙණ ආවාටය වටා තුන් යලක් පැදකුණු කොට සිතන්නාහු "රාජ්‍යය නම් නැම දා ම මට ස්ථිර ව නියමයෙක් නැත. එසේ හෙයින් අනික් රජෙක් මතු ඇති වී නම් මා අතින් පිහිටුවූ බෝධියට ආදර නො කෙරෙයි. සිවුවරු නම් මිහපොළොව වැනියහ අනේ පිඬු මහ සිවාතන් අතින් පිහිටුවමි''යි සිතාලා "සිවාතෙනි! තොප අතින් පිහිටුවම ව''යි උන් අතට දුන්හ. එ වේලෙහි ලක්ෂයක් අගනා සහරන් කාලියක ගඳ කලල් පුරා යම් සිදුරු කොට වළ මැද පිහිටුවා ඒ ඵලශාඛාව සිවාතෝ තමන් සවහස්තයෙන් ගඳකලලට වඩාලූහ.

එ කෙණෙහි සියලු සතුන් බල බලා සිටියදී පොළොව පළා පැන නැගියාවූ දිව්‍යනාගරාජයකු සේ මහ නගුලිසක් හා දලුවෙක් ඵලශාඛා පලාගෙණ බුදුන් රහතුන්ගේ අධිෂ්ඨාන බලයෙන් හා රජ්ජුරුවන් ගේ සිවාතන්ගේ ශ්‍රද්ධා කුශල බලයෙන් පැන නැංගාවූ ඒ බෝධිය වැඩි වැඩී මහත් වෙමින් සම සිළුටු වූ මහ පිදි කඳක් සේ පණස් රියන් උස මහ කඳෙක් නැගී එ කෙකදී පණස් පණස් රියන් දිග ශාඛා පසෙක් ඒ ඒ දිගට බෙදී වනස්පති වෘක්ෂ රාජයකු සේ සිටගත. එහි ඉන්ද්‍රනීල මාණික්‍ය වැනි පත්‍රසමූහයෙන් හා, ප්‍රවාලාඞ්කුර වැනි අභිනව පල්ලවාඞ්කුරයෙන් හා, සුරක්ත වූ ඵල සමූහයෙන් හා, එම විගස ම ශොභාසම්පන්න වී ය.

ඒ මහා බෝධියෙහි මූල පටන් අග දක්වා සියක් රියන. පූර්ව ශාඛාග්‍රයෙහි පටන් පශ්චිම ශාඛාග්‍රයට සියක් රියන. උත්තරශාඛාග්‍රයෙහි පටන් දක්ෂිණ ශාඛාග්‍රයට සියක් රියන් උසය. ශාඛාමණ්ඩලය තුන්සියක් රියන. මාගේ සර්වඥරුවන්ගේ අපරිමිත පුණ්‍ය ප්‍රභාවයෙන් ජනිත වූ මේ බෝධීන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය පෙළහර දුටු සත්කෙළක් පමණ මිනිෂ්‍යයන් මසක ඒ සා සැවැත් නුවර සක් රුවන් පහළ වූ දා හැළලි ගිය චක්‍රවර්ති සේනාව සේ ඉතා විස්මයට පැමිණ මහත් වූ පූජා උත්සව කළහ. සාධුකාර දෙන්නවුන් කෙතෙක් දහස් ගණනැ යි කියම් ද? නොයෙක් පූජාභාණ්ඩ ගෙණ

අත්පොළසක් දිදී ඔල්මරසක් දෙන්නවුන් කෙතෙක් දහස් ගණනැයි කියම් ද? අසුරුසක් දිදී නට නටා ඇවිදිනවුන් කෙතෙකැ යි කියම් ද? පිළිලූය සිසාරා උම්තුව නමන්නවුන් කෙතෙක් දහස් ගණනැ යි කියම් ද? නොයෙක් පූජාභාණ්ඩ ගෙණ වෙහෙරට දිවන්නවුන් කෙතෙක් දහස් ගණනැ යි කියම් ද? ඒ සා වෙහෙර අවකාශයක් නැති හෙයින් වාසල් දොරටුයෙන් වැද යා නොහී ගැහැටි ගැහැටී සිටිනා සත්ත්වයන් කෙතෙක් ලක්ෂගණනැ යි කියම් ද? මාගේ ස්වාමි දරුවෝ එම් දම් බුදු වූ සේක් දෝ හෝ යි සිතමි එම දම පෙළහර පෑ සේක් දෝ හෝ යි සිතමි. එම් දම් ලොව විසමාපත් කළ සේක් දෝ හෝයි සිතමි.

මෙසේ ආශ්චර්ය්‍ය වූ වේලෙහි කොසොල් රජ්ජුරුවන් හා, අනේපිඬු මහසිටාණන් හා, විශාඛා මහා උපාසිකාවන් හා, බන්ධුල මල්ලිකාවන් හා, සෝමලා මල්ලිකාවන් හා, වාසභ ඛත්තියාවන් හා යනාදි බුදුන් කෙරෙහි ප්‍රසන්න වූ ස්ත්‍රී පුරුෂයෝ බොහෝ දෙනා ඒ බෝධිය සිසාරා සිවුමහා සත්රුවන්මය බෝධිකොටුවක් කරවා, ඇතුළෙහි සත්රුවන් සුත්තෙන් තනා වේදිකාව සිසාරා රන් පැන පිදී පෑනා-රන්කලස-පිදීකලස තනා මළුව වරා රුවන් මෙහෙයෙන් ම විසිතුරු වූ පවුරු නිමවා, සත්රුවන්මය වූ දොරටු කරවා, සතරත් දොර ලම්ා මාලකයෙහි ද රුවන් වැලි ඉස්වා, වටා රනමල් ලවා, සියලු සතුන්ගේ චිත්තාකර්ෂණ කොට පැතනැගි හෙයින් ද, ආනන්දස්ථවිරයන් වහන්සේගේ නියෝගයෙන් කළ හෙයින් ද සී ඒ ආනන්ද මහා බෝධි ය යි නම් තබා දවස් පතා තම තමන් ගෙන් පූජා කරණ සේ නියෝග කොට එ දවස් නොයෙක් පූජා කොට බුදුන් වැද සිටියහ

එ වේලෙහි අනඳ මහ තෙරුන් වහන්සේ ගොසින් බුදුන් වැදලා "ස්වාමි දරුවාණෙනි! තුඹගේ මහිමි අද පටන් තුඹ වදාළ මැනැවැ යි නැත. අද පටන් මේ ආනන්ද බෝධිය ම ලෝකානන්ද කොට ලෝවැඩ කෙරෙයි. ඒ බෝධියට සත්ත්වයන් කළාවූ සත්කාරය ඉතා උදාර ය. තුඹවහන්සේ ද ඒ ආනන්ද බෝධි ය පිටලා වැඩහිඳ බෝමැඩ වජ්‍රාසනයෙහි ශ්‍රී මහා බෝධිමූලයෙහි දී තුඹවහන්සේ වන් සමවත් සමවැද වදාළ මැනැවැ"යි ආරාධනා කළ සේක, ස්වාමි දරුවෝ එබසට සිනා පහළ කොට ආනන්දය කුමක් කියව් ද, බෝමැඩ දී මා අවන් සමවත් සමවදිනට සුදුසු වූ අනික් භූමියෙක් අනන්තාපරිමාණ සක්වළ වේවා, මේ මඟුල්සක්

වල වේවා බඹලෝ ආදියෙහි වේව යි කිසි තැනෙක ත් නැත්ම ය, ඇතකු බරාලු සැත් වමුකුරැල්ලොත් බරාලිය හෙද්ද"යි වදාළසේක. එ වේලෙහි අනඳ මහතෙරුන් වහන්සේ තමන්වහන්සේ බුදුන් කෙරේ ඉතා වල්ලභ හෙයින් "එසේ වී නම් සවාමිනි! ඒ භූමි ය පොහොනා පමණක් සමවත් සමවැද එ බෝකඳට පිටලා වැඩහිඳ ඒ භූමි ය පාරිභොගික කොට වදාළසේක.

එ වේලෙහි සවාමිදරුවෝ ඒ බොධිමූලයට ගොස් එ බෝකඳට පිටලා පූර්විදිග් බලා වැඩහිඳ එදා රෑ තුන්යම රාත්‍රිය මුළුල්ලෙහි එ තෙන සමවත් සුවයෙන් දවස් ගෑවූසේක. එතැන් පටන් ජෙතවනාරාමය බුදුන් නැති වීට ත් ඇත්තාසේ ම වී ය. ඒ ආනන්ද බොධියට දවස් පතා ලක්‍ෂයක් පරිත්‍යාග කොට කරණ ලද්දා වූ උදාර වූ පූජා වී ය.

මෙසේ තමන් වහන්සේ එක දවසක් පමණ පිට දුන්නාවූ බෝකඳ උදෙසා පවා මේ මහත් වූ පාරිභොගික පූජාලත් හෙයි නු ත් එසේ වූ පූජා විඳිමට සුදුසු හෙයිනු ත් මාගේ සවාමි දරු වූ බුදුරජාණෝ මෙ මේ කාරණයෙනුදු අණික් නම් වත සේක.

තව ද: මෙ ම සැවැත් නුවර තුණුරුවන් කෙරෙහි පැහැදිය වූත් කෙරෙහි අනන්තගීත වූ යට කී බන්ධුල මල්ලිකාවෝ නම් කවරි? යත්;

ඔහු තුමූ බන්ධුල නම් සේනාපතීන්ගේ භාර්‍ය්‍යාවෝ ය. ඒ බන්ධුල සේනාපති නම් කුසිනාරා නුවර මල්ලරජහුගේ බෑනැනියන් පුත් බැනනුවන. මේ සා මුළු දඹදිවු තෙලෙහි ඒ බන්ධුල සේනාපතීන්ට වඩා පඤ්චායුධයෙහි දක්‍ෂ වූ ශූර යෝධයෙක් නැත්තේම ය බාලකල මසිල් රජ්ජුරුවන් තමන්ගේ බල බලමි යි සිතා තමන්ට නො කියා යකාරාව සැවක් කරවා සැට පුරුක් ඇති උණදඬු සැවක් යට ඒ යකාරාව ලා එසේ ම සැට සැට දඬින් සැටමිටියක් බඳවා රාජාඞ්ගනයෙහි සිටුවා තමන් කැඳවා "බෑනැනි! තෙලෙ හුණමිටිසැට එක එක පහරින් කඩුයෙන් පොළුගෙණපු නම් මාගේ මේ මල්ලිකා නම් දියනියන් තොපගේ බැද්දනියන් තොපට ම පාවා දෙමි. නැත අනික් රජක්හට පාවා දෙමි"යි කී වේලෙහි තව ය කාරාව බව නො දැන මසිලනුමන් මුහුණ බලා සිතා සී "මෙයි ත් එක් අංගච්ඡේදයෙක යි සිතූ සේක් ද? ඇත් බදත් වී නමුත් මාගේ කඩු

පත මැද රඳවම් දැ? යි මාසී කියා කඩුව කොපුයෙන් නගා ගෙණ කඩුව මඳක් චිත්‍ර කොට අහසට අසුරිගත් දමා රජපිරිස 'කඩුව අප හිස වැටී යේ දෝ අප හිස වැටී යේ දෝ හෝ' යි වෙවුල වෙවුලා සිටි වේලෙහි කඩුව තමන් අත එලවා ගෙණ කඩුව චිත්‍ර දැක්වාලා.

“ස්වාමිනි! මේ සැට මිටි ය සැට පහරින් කැසීම් නම් ඒ ආශ්චර්‍ය නො වෙයි. සැටපුරුක සැට සැට පහරින් පොලු ගත්මි” යි කියා පලඟය හා සමඟ ගරුඩ පෝතකයකු සේ ආකාශයට පැන නැගීලා අඟපුරුකෙහි පටන් සුරතින් පාරක් ගසා සැටපුරුකක් වගුරුවා පියයි. වමතින් පාරක් ගසා සැට පුරුකක් වගුරුවා පියයි. මෙසේ සැට පිටෙකින් සැට පාරක් ගසා සැට සැට පොල් ලක් බැගින් ඇලඹිඳුන් සේ ගසා යනාරාව හා සමඟ රාජාඞ්ගන යෙහි සිටුරුවා මෙසේ ම සැට මිටිය ම ගසා අනත පහරෙහි දී කඩුව යකාරාවයෙහි වැදගෙණ කඩුව බැණ නැගි හඬින් හුණ පුරුක් යව සිඳා යකාරාව දැන “ඉදින් මා ගසාගත නුහුනතෙහොත් මේ සා පරිශ්‍රමයෙන් ශිල්ප දෙනා මධ්‍යයෙහි මට කළ සේ නො යෙදෙයි. මාගේ බල දැන දැන පරීක්ෂා කළ සේ නො යෙදෙයි” කියා මයිලනුවන්ට කිපී ඉතා මහත් වූ අභිමාන කොට “තුඹ වසන නුවර මම නො රඳමි යි අද ම අනික් රටකට යෙමි” යි මල්ලිකා නම් ඒ බැඳකුමරිය මයිලනුවන් බල බලා සිටියදී අත අල්වා නගා ගෙණ එම විට ම නුවරින් නික්මුනාහ. මයිල් රජ්ජුරුවෝ වේව යි සොඳුර යෝධ කෙනෙක් වේව යි බන්ධුලයන් රඳවාගත නුහුනු එක ද සත්ත්වයෙක් නැත.

ඒ බන්ධුලයෝ පසේනදි කොසොල් රජ්ජුරුවන් හා බාල කල එක පල්ලියෙහි දී ශිල්ප උගත්තාවූ විශ්වාසයෙන් සැවැත් නුවර ගොස් කෝසලයන් දුටහ. කෝසලයෝ බන්ධුලයන් දැක ඉතා සතුටු ව “තොප වැනි යහළුවකු මා ලත් බැවින් මෙසින් මතු මුළු දඹදිව මාගේ ම ය” යි ගජිතා කොට බන්ධුලයන්ට සේනාපති ධුරය දී තමන්ට දෙවනු වූ සම්පත් දුන්හ. බන්ධුලයන් එ නුවරට ගිය තැන් පටන් මුළු දඹදිව රජදරුවෝ ම කෝසලයන් කෙරෙහි භය ඇති වූහ. එ කල මල්ලිකාවෝ බන්ධුලයන්ගේ භාර්‍යාවන් හෙයින් බන්ධුල මල්ලිකා නම් වෙති.

උන් තුමූ ත් විශාඛාවන් සේ ම ඇතුන් පස් දෙනකුට බල ඇතියහ, විශාඛාවන් සේ ම මේල පලඳනා ඇතියහ, විශාඛාවන් සේ ම සැදැ ඇති ව විහාරයට දවස තුන්වාරයෙක එළඹි බණ අසා දන්

පිත් කොට බුදුන් කෙරෙහි ඉතා වලලහයහ. ඒ බන්ධුල මල්ලිකාවෝ තුමූ වඳයහ. එසේ හෙයින් බන්ධුලසෙනාපති "මා සේ ම බල ඇති පුතකු වදා දෙන සත්‍රීකා රක්‍ෂාභරණ කැමැත්තෙමි. තී වඳ පව් ඇති තැනැත්ති ය මට නො කැමැත්තෝ යයි තීගේ මවුපියන්ගේ නුවරට ම පලා ය" යි කියා ගෙන් නෙරපූහු ය.

එ වේලෙහි බන්ධුල මල්ලිකාවෝ තමන් ඉතා මහත් සැදැ ඇති හෙයිනු ත් බුදුන් එම නුවර වසන හෙයිනු ත් මවුපියන්ගේ ගමට යාමට වඩා එම නුවර ම හිඳිනා කැමැති ම ගෙන් නික්මීලා "මාගේ බුදුරජාණන් වහන්සේට සැලකොට ඔබ වදාළො ත් යෙමි. නො වදාළො ත් නො යෙමි" යි සිතා ජේතවනාරාමයට ගොස් පිරිවර හා සමඟ වැඩහුන් බුදුන් දැක වැඳ "ස්වාමීනි! මාගේ මවුපියන්ගේ රටට යෙමි" යි දැන්වූහ. එ බසට බුදුහු "මල්ලිකාව! කුමක් නිසා යෙහි ද" යි වදාළ සේක. ස්වාමීනි! සමණන් වහන්සේ මා ගෙන් නෙරනා සේකැ යි කීහ. බුදුහු "මල්ලිකාව! කුමක් නිසා ගෙන් නෙරිද්ද" යි වදාළ සේක. මල්ලිකාවෝ ද "ස්වාමීනි! මා වඳ හෙයින් අනික් කරණක් ගෙණෙමි යි කියා ගෙන් නෙරිති" යි කීහ.

එ වේලෙහි බුදුහු දිවැසින් පරීක්‍ෂා කොට මල්ලිකාවන් වඳ නො වන සේ දැක "මල්ලිකාව! බන්ධුල සෙනාපති තී වඳ ය යි කියා ගෙන් නෙරි ත් නම් තී නො ගොස් ආ පස්සේ ගෙට ම පලා යා" යි වදාළ සේක. එ වේලෙහි මල්ලිකාවෝ සමාහි ව ගෙට ගියහ. සේනාපති "කුමක් නිසා ආ පස්සේ අවුද" යි විචාරා "බුදුහු මා නො යන්ට වදාළ සේක. එසේ හෙයින් ආමි" යි කී කල්හි බුදුහු නම් නොකාරණයෙහි බසක් නො වදාරණ සේක. එසේ හෙයින් ඒකාන්තයෙන් මල්ලිකාවනට දරුකෙණකුන් ඇත මනා ම ය. මාගේ අභිමතාර්ථ ය සිද්ධ වේ ම ය" යි සතුටු ව එ දා පටන් දෙදෙනා ම ඔවුනොවුන් හා සමඟ ප්‍රියවාසය කෙරෙති.

නොබෝ දවසකින් මල්ලිකාවෝ දරු ගැබගට කාරණ දැක සමණන් තමන් වඳ ය යි නෙරපූ හෙයින් "මෝහට බැරිවූ දොළක් නිසා මෝහට නින්දා කොට වෙසෙමි" යි සිතා සමණන් කරා ගොස් "හිමි, මට දරුදොළක් උපන. පෙර තුඹ මා වඳ ය යි කියා මට එකාවනුව බණන්නේ වේ ද, පිරිමි වූයේ නම් දූන් මට උපන් දරු දොළ පසිඳ දීලුව මැනව විශාලා මහනුවර ලිච්ඡවි රජුන් සත් දහස් සත්සිය සත් දෙනා හා ඔවුන්ගේ බිසෝවරුන් පමණක් බැස දියකෙළිනාවූ සෙසු සත්ත්වයෙකුන් බැස එ පැනෙහි අත ගාපිය

නො හැක්කාවූ ආකාශයෙහි ලෝදැල් වසා තිබෙන පවුරු වාසලින් සුරක්ෂිතවූ මඟුල් පොකුණෙන් බලයෙන් ම බැස නහා පැන් බොනු කැමැත්තෙමි. එ දොළ පසිඳ දීලූයේ නම් නුඹ හා සම වූ කායබල ඇති නීබුන් පුතුන් දෙදෙනකු එකවිට ම වදන කාරණයක් දිටිමි" යි කීහ.

එ බසට බන්ධුල සේනාපති සිනාසී ඇතයේ සැතයක් නැති ම අත් ගසා "සොඳුර! නිව උපත්තෝ ඉතා ම මට සුවිකම් වූ දොළෙක. හිමාලයෙහි හෝ ශක්‍රභවනයෙහි දිව්‍ය වූ පොකුණෙකින් නා පැන් බොනු කැමැත්තෙමි යි නො කියා, හිරු සඳු දෙදෙනා මිණිකොබොල් කරණු කැමැත්තෙමි යි නො කියා, අහසෙහි වලා කැමැත්තෙමි යි නො කියා, අභ්‍යන්තරයෙන් අඹ කැමැත්තෙමි යි නො කියා, ඡද්දන්ත ඇතු දළ කැමැත්තෙමි යි නො කියා, විධුරයන් සේ ම මහා පණ්ඩිතයක්හු හදවත කැමැත්තෙමි යි නො කියා, මෙ මිනිස්ලොව ම, මෙ දඹදිව ම, මා සේ ම පුරුෂයන් නානා මඟුල් පොකුණෙහි බැස නහන්නා කැමැත්තෙමි යි නොප කී සේ මැනැව අද ම එ කුමර ගොය් කොපගේ දොළ පසිඳ දී ලම් මී ය මාගේ පිරිමි බල බලව" යි මාහි කියාලා "රජ්ජුරුවන්ට කීම නම් රජ්ජුරුවෝ තුඹු හෝ සාමා ගණිති. සත් කෙළක් පමණ තමන්ගේ බල සේනග හෝ මා හා සමග එවති. එසේ ගිය කල මාගේ බල නො දනෙයි. රජ්ජුරුමන්ට නො කියා ම, මම ම යෙමි" යි සිතාලා එම විට ම මල්ලිකාවන් කැඳවා ගෙණ අසුන් යෙදූ රථයක් නැගිලා දහසක් පුරුෂයන් නගාලන බාලන තමන්ගේ දුන්න හා හියවුර ඇරගෙණ කඩුව මම්දසරුවෙහි ලා ගෙණ එකලාව ම එම ද උදාසන සැවැත්නුවරින් නික්ම සිවුපණස් යොදුන් මඟ ගෙවා ලිච්ඡවි රජ දරුවන් හා සියලු නුවරවාසීන් දවල් බත් කැමෙන් ප්‍රමාද වූ වේලෙහි විශාලා මහනුවර වාසලට පැමිණ "මා ආ බවට සලකුණක් කෙරෙමි" යි සිතාලා රථසක මූළු නුවරට ඇසෙන සේ වාසල් එළිපෙහි ගසාගෙණ ඇතුළු නුවරට වැද ගියහ. රථ නැඟී වදන වුන් සිය දහස් ගණන් හෙයින් බන්ධුලයන් බව දක්නාවූ එක ද කෙණෙකුන් නැත.

එ නුවර මහාලි නම් ලිච්ඡවී රජ්ජුරුවෝ බන්ධුල සේනාපතීන් හා එක පල්ලියෙහි ශිල්ප හදාළහ. එසේ හෙයින් බන්ධුලයන්ගේ බල දනිති. එ කලට ඒ මහාලි ලිච්ඡවී රජ්ජුරුවෝ ඇස් අන්ධ ව වාසලට නුදුරු වූ මාලිගාවෙක හිඳ සෙසු රජ්ජුරුවන්ට අවවාද දී වාසය කරන්නාහු ය. එ වේලෙහි ඒ රථසක බැණ නැඟී හඬ අසා,

"මේ ඝොෂාව අනිකකු නැගි රථයක ඝොෂාවෙක් නො වෙයි. එකාන්තයෙන් ම බන්ධුලයා නැගි රථයක සඬ මි ය. බන්ධුලයා මේ නුවරට දූත් වන් මි ය. බන්ධුලයා නො කරුණෙක නො ඒ මි ය. ඒකාන්තයෙන් ම අද ලිච්ඡවි රජුන්ට භයෙක් වේ මි ය" යි සිතූහ.

එ වේලෙහි බන්ධුල සේනාපති කිසි භයක් නැති ව ශක්‍රපුරයට වන් අසුරභටයකු සේ ඒ සියලු රජුන් බැඳ තනා මගුල් පොකුණට ගොස් කඩුපතින් භය ගන්වා රකවලුන් ඒ ඒ දිග ලුහුබඳවා සිරස් තැලයක් පොලුගසන්නා සේ ලෝදූල් කඩුයෙන් කපා වගුරුවා පලමු කොට තුමූ බැස නා පියා දෙමිනු ම අශුමන් බස්වා නහවා පැන් පොවා මිනනෙල් මල් සලඳවා එම සිහස ම රථයට පැනනැගීලා මහ වේමැදින් යන්ම වැගලින් පිටත් ම සැවැත් නුවර දක්වාවට මි නමා ගත්හ.

එ කෙණෙහි මේ පවත් රකවලුන් අසින් අසා ලිච්ඡවි රජ දරුවෝ දණ්ඩත් ගැසූ නයින් සේ කිපී හැම දෙනා ම මහාලි නම් ලිච්ඡවි රජ්ජුරුවන් කරා ගොස් මෙ පවත් කියා "බන්ධුලයා අප මෙ තෙක් දෙනා මුහුණ දැලී ගා මේ නා පරිභවයක් කොටලා ගියේ ය. ඔහු පසු පස්සෙහි දිවගෙණ ගොස් ඔහුගේ ඉස ගෙණා කල මුත් බත් කමෝ දැ" යි සනාසිත ව බවුනොවුන් අතුරෙන් පන්සියයක් ලිච්ඡවි රජදරුවෝ සන්නාහසන්නද්ධ ව පඤ්චායුධ ගෙණ පන්සියයක් රථ පනනැගී නමා ගත්හ.

එ වේලෙහි මහාලි නම් ලිච්ඡවි රජ්ජුරුවෝ "දරුවෙනි! තෙලෙ තොප කරන්නේ කටයුත්තෙක් නො වෙයි. මේ මුළු දඹදිව් තෙලෙහි බන්ධුල හා ජයගෙණ පියන යොධයෙක් නැත්තේ මි ය. බන්ධුලයාගේ සැර ය නම් පර්වතයෙක ත් ගත් කල මැද නො රඳා මි ය. එක සැරපහරකින් තොප පන්සියය ම ජයගෙණ පිය ත් පොහොසත් ම ය. දරුවෙනි! නො යව, නො යව" යි කියා රැඳවූහ. ඔහු එ බසට "ඒ පිරිමි ද, අපි ගැණු ද, ඒ කිරි පී ද, අපි මෝරු පූමෝ ද ඔහුගේ එක සැර ය දැඩි ද, අපගේ මෙ තෙක් සැර නො දැඩි ද, ඒ දුනුශිල්ප දත් ද, අපි දුනුශිල්ප නො දනුමෝ ද" යනාදීන් වාසි කියා නො නැවත නමා ගත්හ.

එ වේලෙහි මහාලි නම් ලිච්ඡවි රජ්ජුරුවෝ නො යෙක් සේ කියා රඳවාගත නොහී "දරුවෙනි! තොප නො නැවත යන බැවින් බන්ධුලයා යන රථය යම් තෙනෙක දී දුටු නම් මද නැහැක් දිවූ කල ඔහුගේ රථය පොළොව ගිලී ගොස් සියල්ල මි නො පෙණෙති. ඒ

අතිරේකයක් නො වෙයි. තොප දුන කිපී ඔහු දුන්න නඟන වේලෙහි රථය බිම ගැලී සැඟවී ගිය නියාව ය. මේ කාරණය දුටු කල අා පස්සෙහි පලා එව. තව ද නො නැවත ගියා නම් මද ඇසිල්ලෙකින් සෙණහඬක් සේ ඇසෙයි. ඒ ඔහු තමාගේ දුනුදිය අත් පොළාපී හඬ ය. එ සලකුණෙන් නො ගොසින් අා පස්සේ පලා එව. එසේ ද තව ද නො නැවත ගියා නම් තොප තොප නැඟි රිය හිස්වල සිදුරු දක්නුව. එ වේලෙහි තොප හැමදෙනා ම විත් කැ නියා ය. එ සලකුණෙන් මළුම්හ යි සිතාගෙණ අා පස්සේ පලා එව" යි කීහ. රජදරුවෝ එසේ කිමක් නො නැවත ම "බන්ධුලයා ගණුමෝ ම ය" යි ව සි කිය කියා පසු පස්සෙහි ලුහුබඳවා ගත්හ.

එ කල බන්ධුල සේනාපති තුමූ රථයෙහි පදිනාහු "පස්සෙහි සතුරු කෙනෙකුන් එසේ තුමූත් බලා දුටු සේදයක් මට කියව" යි මල්ලිකාවන්ට කීහ. මල්ලිකාවෝ පස්සෙහි පන්සියයක් රථ නැඟී දිවන පන්සියයක් රජුන් දැක "ස්වාමීනි! රථ සමූහයෙක් පෙණෙයි, තුඹ හා යුද්ධයට සතුරු කෙණෙකුන් එන අාකාරය ය" යි කීහ. බන්ධුල සේනාපති එ බසට සරු සැනි ව ඒ දිශාව නො බලා "එක රථයක් සේ ඇඳ සැණි ම එන වේලෙහි මට කියාලව" යි කීහ. මද ඇසිල්ලෙකින් සම්ප එක් එක් පන්සියයක් රථ ඇද නැතිව ම එකපෙළ සිටගත. එ වේලෙහි මල්ලිකාවෝ "ස්වාමීනි! පළමු ව එන රථය පෙණෙයි. සෙසු රථ හැම ම එකරථයෙන් මුවා ව ගියේ ය" යි කීහ. එ වේලෙහි සේනාපති "එසේ වී නම් තෙපි භය නො කොට මේ රැන අල්වාගෙණ රථය පදුව" යි කියාලා තුමූ දහසක් නගාලන දුන්න සැරගෙණ රථයෙහි පසු කෙළවර දුනු මුඩාව ඔබාලා දුන්න නඟාපීය. එ කෙණෙහි රථය පොළොව ගැලී ගිය. රජ දරුවෝ මේ කාරණය දැකැ ත් නො නැවත දිවෙත් ම ය. දෙවනු ව දුනු දිය අත් පොළාපීහ. එ කෙණෙහි සෙණහඬක් සේ ඇසී ගිය. තව දු නො නැවත දිවෙත් ම ය. තුන්වනු ව හියවුරෙන් එක් දණ්ඩක් හයාගෙණ ඇද මැඩ නියපිට ලෙලවාපියා පගිලිසෙහි ලාගෙණ ලර පුරාලා ඇද අත හැරපීය. එ කෙණෙහි ඒ දිවු සැරය කිහිරි හරින් සාල පන්සියයක් පමණ රථ හිස් විදගෙණ, පන්සියයක් සන්නාහ විදගෙණ පන්සියයක් රජුන්ගේ ලෙන් විද පිපින් පලා ගොස් පොළොවට අසුරියනක් පමණ වැද සැඟවී ගි ය.

රජදරුවෝ සන්නාහබලයෙන් තමන් විත් කැ බවු නො දැන "නො ය නො ය බන්ධුලය! තෝ යෝධයෙක් නම් සටන් දැන පිපිපා

දිවේ ද, අපගේ හා තාගේ හා බල බලම්හ" යි මාසි කියා හඬ නැඟූ. බන්ධුලයෝ එ හඬ අසා සිනාසී "කොල! කුමක් කියා ද, ශූරයෝධයෝ තම් ගැහැනුන් හා ත් සටන් නො කෙරෙති. නිරායුධ ව සිටියවුන් හා ත් සටන් නො කෙරෙති. විය් කොටුම් කැමින් හා ත් සටන් නො කෙරෙති. මළ මිනී හා කැල ම සටන් නො කෙරෙති. තොප දූන් මළවුන් හා කුමන සටන් කෙරෙම් ද" යි හඬගා කීහ.

එ බසට රජදරුවෝ සිනාසී "අප දූන මරණ භයින් නන් දෙඩවයි ද, මළ මිනිස්සු ත් අප සේ කථා කෙරෙද්ද" යි කීහ. බන්ධුලයෝ "කොලෙනි! තොපට සැරයක් හැරපිම්. එ සැරයෙන් තෙපි හැම ම විත් නැත. මා කී බස් නො ගිවිසී නම් තොප තොපගේ රථ හිස්වල සිදුරු බලව. එසේ ත් නො ගිවිසි නම් තොෂ්නියෙහි එන රජ්ජුරුවන් හා පස්සෙහි එන රජ්ජුරුවන් හා දෙදෙනාගේ සන්නාහ මුදු බලව. ඔහු දෙදෙනා මළාහු නම් සෙසු හැමදෙන ත් මළාහු ම ය. එ සලකුණෙන් තොප තොපගේ ගෙවලට පලා ගොස් අඹුදරුවන්ට කලමනා අනුශාසනා කොට යෙහෙන් සෙමෙන් මිය යව" යි කීහ. එ වේලෙහි රජදරුවෝ රිය හිස්වල සිදුරු බලා දූන පසු පළමු රජ දෙදෙනා සන්නාහ මුදු මළ සේ දූන හය ගෙණ ආ පස්සෙහි නුවරට ගොස් ගෙයි ගෙයි දී ම කීවා සේ ම මළාහු ය. බන්ධුල සේනාපති ද එම දා ම සැවැත් නුවරට වන්හ.

එ තැන් පටන් දස මසක් පිරුණු කල බන්ධුල මල්ලිකාවෝ එකම්ව ම ඔවුනො'වුන් හැඳිනගත නො හැකි රන් රූ සේ පුතුන් දෙදෙනකු වැදූහ. එ තැන් පටන් හවුරුදු පතා ම යමක යමක කොට නිමූන් පුතුන් වදන්නාහු සොළොස් හවුරුද්දක් ඇතුළත පුතුන් දෙතිසක් වැදූහ. ඒ පුත්තු දෙතිස ම නිරෝගී වූහ බන්ධුල සේනාපතීන් හා සම වූ කායබල රූපශ්‍රී ඇතියහ. පුතුන් දෙතිස් දෙනා හා සමග සේනාපතීන් සිටි කල පුතුන් නා බව ත් සේනාපතීන් නා බව ත් නො දන්නෝ දුහගත නො වෙති. සේනාපතීන්ගේ දහසක් පමණ සේවකයෝ ඇත. පුතුන් දෙතිස් දෙනාගේ ද දහස් දහස් බැගින් දෙතිස් දහසක් සේවකයෝ ඇත පූර්වයෙහි තමන් දෙමහල්ලන් ම බොරු නො කීවා වූ කුශලයෙන් ද, ඔබලතුන්ට සැරයටි දන් දුන් කුශලයෙන් ද, මහණ බමුණන් දූක සිත පහදවා දුටු සේ මැනැවැ යි සිත සිතා ත්‍රිවිධ වූ චේතනාව පිරිසුදු කොට දන් දුන්නා වූ කුශලයෙන් ද, පිරිසිදු වූ සම වූ මේ සා දරු සිරි ලද්දාහු ය.

තව ද: ඒ බන්ධුල මල්ලිකාවෝ පෙර ජාතියෙහි තමන් දන් දුන්නා වූ එක් අටපිරිකර දානයක්හුගේ කුශලයෙන් මේ ජාතියෙහි ශීල පලඳනාව ලදින් අප මහා ගෞතම බුදුන් දක බණ අසා සෝවාන් ව බුදුන් කෙරෙහි ඉතා වල්ලභ වූහ. බුදුන්ගේ නියෝගයෙන් සිය කුමරට දො ගොස් නැවත ගෙට ආ පසු වැදූ දරුවන් හෙයින් බුදුන් කෙරෙහි අති ප්‍රසන්න ව මෙ තෙක් දරුවන් හා සමග දෙමිසල්ලෝ ම දවස දවස වෙහෙරට එළඹ දවස දවස බුදුන්ට මහත් වූ සත්කාර කොට ඒ ආනන්ද බොධියට ද මහත් වූ පූජා කොට බොහෝ පින් රැස් කළාහු ය.

මෙසේ තමන් වහන්සේ කෙරෙහි පහන් වඩ වඩාලා පහදවා ඔබුන් විසින් කරණ ලද මහත් වූ සත්කාර ලත් හෙයිනු ත් එසේ වූ සත්කාර ලැබීමට සුදුසු හෙයිනු ත්, මාගේ ස්වාමිදරු වූ බුදුරජාණන් වහන්සේ මේ මේ කාරණයෙනු දූ අර්හත් නම් වන සේක.

තව ද: [illegible] මෙසේ වූ බුදුන් කෙරෙහි කොසොල් රජ්ජුරු වන් බන්ධු සමාන ව විශ්වාසී වූ පරිදි කෙසේ දැ? යත්;

කොසොල් රජ්ජුරුවෝ රජගෙට කුදුරු වූ තැන භොජන ශාලාවක් කරවා පන්සියයක් දෙනා වහන්සේට නිති දන්දෙන්නාහු ය. රාජකීයෝගයෙක් මහාදානය දෙන බව ඇත් භික්ෂූන් වහන සේට විශ්වාසයෙන් ප්‍රේම සහිත ව වළඳවාලන්නා වූ සත්වයෝ නැත. එසේ හෙයින් ඒ භික්ෂූන්වහන්සේ රජගෙයි බත් පාත්‍රාවලින් පිළිගෙණ තමන් තමන් වහන්සේගේ විශ්වාස උපාසක-උපාසිකාවරු න්ගේ ගෙවලට වඩනා සේක. ඔහු හැමදෙනා ම තමන් තමන්ගේ කුලුපග වූ ඒ ඒ භික්ෂූන් වහන්සේ දුටු පෙරමගට අවුදින් පාත්‍රා අතින් ගෙණ ගෙට වඩාගෙණ ගොස් ආසන එලවා හිඳුවා රජගෙන් ගෙණ බත් කොමු වී නම්, සහල් වී නම්, කිලුටු වී නම, මඳ මඳ නපුරෙක් වී නම්, පලමු කොට බලා එ බත් හැර තමන් තමන්ව පිසූ බත් හෝ වළඳවාලති. එ බත් රහපත් වී නම්, ව්‍යඤ්ජන මද වී නම්, තමන් තමන්ගෙන් සූප ව්‍යඤ්ජන ලා වළඳවාලති. එසේ ත් කොට ගත නොගෙන දුක්පත් වූ උපාසක උපාසිකාවරු අසුන් පණවා දූවිට් දඬු පැන් ආදිය සපයා මහත් වූ දයා ඇති ව අප දුක්පත් සේ ය යි කිය කියා විශ්වාස පරමයෙන් වළඳවාලති. එසේ හෙයින් රජගෙන් දන් ලත් පන්සියයක් දෙනා වහන්සේ ම එ බත් විශ්වාසයන්ගේ ගෙවලට ගොස් මෙසේ මෙසේ සුව සේ වළඳන සේක් ම ය.

එක් දවසෙක රජ්ජුරුවෝ අමුතු වූ පඬුරක් ලදින් "මේ සංඝයා වහන්සේ වළඳවා ලව" යි කියාලා භොජන ශාලාවට යවූහු ය. භොජන ශාලාවෙහි එ වේලෙහි එක කෙණකුන් වහන්සේ ත් නො දැක අමාත්‍යයෝ එ පඬුරු රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ "සංඝයාවහන්සේ මාගේ බත් කොයි සිද වළඳන සේක් දැ" යි විචාරා, "තමන් තමන් වහන්සේගේ විශ්වාස ගෙවල දී වළඳන සේකැ"යි අසා "මාගේ දත් සෙසු ගෙවල දී වළඳන්ට කාරණ කවරේදැ"යි භික්ෂූන් වහන්සේම කිපී එමවිට ම බුදුන් කරා දිවගෙණ ගොස් බුදුන් දැක වැඳ එකත්පස් ව සිට "ස්වාමීනි! ඔබවහන්සේගේ ශාසනයෙහි වූ භික්ෂූහු ඉතා අමධ්‍යස්ථයහ. මා වැනි රජක්හු ගෙන් දෙන අග්‍ර වූ දානය මාගේ ගෙයි දී නො වළඳ, සෙසු ගෙවල දී වළඳන්නාහු ය. ඒ අමධ්‍යස්ථ නම් වේ දැ, දානයෙහි උතුම් කවරේ දැ" යි විචාළහ. බුදුහු "මහරජ! දානය නම් විශ්වාසය උතුම් කොට ඇතියේ ය. තොපගේ දානය මධුර බව මුත් විශ්වාසය නැත. සෙස් සවුන්ගේ දානය අමධුර වුව ත් විශ්වාසය මධුර ය. යම් කෙණෙක් හුළුකැන් මාත්‍රාවකුත් විශ්වාසය උතුම් කොට ආදරයෙන් දෙත් නාහු වූ නම් ඒ දානය උතුම් ම ය" යි වදාළ සේක. "ස්වාමීනි! භික්ෂූන් වහන්සේ විශ්වාස කොට ගන්නේ කෙසේ දැ" යි විචාළහ. බුදුහු "මහරජ! මාගීඵල ලද්දා වූ සෙබකුලෙහි ඇත්තන් කෙරෙහි හා නෑයන් කෙරෙහි භික්ෂූහු අති විශ්වාසයෙක" යි වදාළ සේක.

එ වේලෙහි රජ්ජුරුවෝ බුදුන් වැඳ රජගෙට ගොස් "බුදුන් හා නෑ වීම් නම් හැම භික්ෂූහු මා කෙරෙහි විශ්වාසී වෙති. බුදුන් හා නෑ වන උපදෙසයක් කෙරෙමි" යි සිතාලා තමන් එ කලට දඹදිවට අධිපති හෙයිනු ත් තමන්ට වඩා බල ඇති අනික් රජක්හු නැති හෙයිනු ත් 'ශාක්‍යකුලයෙන් ශරණක්, ගුණෙන් වේ ව යි තුගුණෙන් වේ ව යි ගෙන්වමි"යි සිතාලා එ කලට ශුද්ධොදන රජ්ජුරුවන් නැති ව බුදුන් හා දෙබෑයන් දරු වූ අනුරුද්ධ මහතෙරුන් වහන්සේගේ බෑනන් මහානාම නම් ශාක්‍ය රජ්ජුරුවන් ශාක්‍ය කුලයට අධිපති ව රාජ්‍යය කරණ හෙයින් උන්ට බොහෝ පඬුරු යවා "තමන්ගෙන් දරු කෙණෙකුන් මට ශරණ එවන්නේ ය යි ශාක්‍යකුලයට නෑ වනු කැමැත්තෙමි" යි කියා යවූවාහු ය.

ශාක්‍යකුලයෙහි රජදරුවන් නම් උභයකුල පරිශුද්ධ හෙයිනු ත් මහාමානී හෙයිනු ත් අනික් රාජවංශයක් හා තමන් නෑ නො වන හෙයිනු ත් මහානාම නම් ශාක්‍ය රජ්ජුරුවෝ දූතයන්ගේ බස් අසා සිතන්නාහු "කොසොල් රජහු කලකිරවා අප මෙහි වැසනත

නො හැක්ක. එ තෙමේ මහා බල ඇතියේ ය. ශරණක් නුදුනො තොත් එ රජ අපට වෛරී වෙයි. දුනොත් කිනු ත් ජාතිසම්භේද වෙයි. ශරණ දුන ත් මැනව. නුදුන ත් මැනැවැ"යි සිතාලා තමන්ගේ මහා මුණ්ඩී නම් දාසි යකුසින් උපන් තමන්ට ම දාව වාසභ ඛත්තියා නම් සොළොස් හැවිරිදි දුව දෙව්ගනක සේ සරහාලා "මාගේ දියණියන් ගෙණ යව"යි දූතයන්ට කීහ.

දූතයෝ සිතන්නාහු "මේ ශාක්‍යයෝ නම් මහා මානම් දනිති. සෙසු රජක්හට ශාක්‍යකුලයෙන් ශරණක් පෙර නුදුන් විරූහ. ඔවු හොවුන් හා මිත්‍රාණ ක් සාලූහ. බාධාවක් නො කියා ම පාවා දුන්හ. කිමෙක්දෝ මේ ගම් තමන්ගේ කෙල්ලකගේ දරුකොට වැඩුදුවක මානම් බිඳා පාවා දෙද් දෝ"යි සිතා "මේ ශාක්‍යයෝ නම් තමන් දුටු මේ සමුන් නො කරම් සෙණකුන් හා කැටි ව නො කත් මය"යි දැන "ස්වාමීනි! අපගේ රජ්ජුරුවන් මහත්සේ කෙරෙහි භය ඇතියම්හ. තුමූ මහත්සේගේ දියනියන් හා හැටිව කෑ සේක්වීනම් ගෙණ යම්හ. නැත හොත් නැත ඇතියම්හ"යි කීහ.

එ බසට රජ්ජුරුවෝ "ගෘහපති! තොප දක්නදී ම හැටිව ත් කමි"යි කියාලා දූතයන් බල බලා සිටිය දී මා අමාත්‍යයන්ට මාග මක් උගන්වාලා එ වේලෙහි පාවාඩය පිට හිඳගෙණ දරුවන් සරහා බත් කන්ට ගෙණෙව"යි කීහ. එ වේලෙහි අමාත්‍යයෝ වාසභ ඛත්තිකාව මහපෙලහරින් වඩාගෙණ ගොස් රජ්ජුරුවන් හා එක පාවාඩයේ හිඳුවාලූහ. එ වේලෙහි රජ්ජුරුවෝ දුව ඉස අතගා පියා "පුත! තොප කොසොල් රජ්ජුරුවන්ට යවමි. එතෙකින් කවර දවසෙක දකිම්දැ"යි බොරු සතාවක් කියා බොරු කඳුලක් ගෙණ පියා "පුතණ්ඩ! බත් කව"යි කියාලා වාසභ ඛත්තිකාව බතට අත පොවාලූ වේලෙහි ඇ බත් අත නො ගා තුරු තුමූ පළමු කොට බත් පිඩක් අතට ඇරගෙණ බත්පිඩ මවා කට තුබූහ. එ තෙණෙහි ආදි ම උගන්වාලූ අමාත්‍යයා බොරුපතක් ගෙණ අවුදින් රජ්ජුරුවන් මම්භව පත දීලා "ස්වාමීනි! පසල් දනව්වෙහි සිට දූතයෙක් ආයා ඇගා ඇඟින් ඛා කඳු වගුර වගුරා ගෙණ මහ වහා දිව අවුදින් "මේ පත වහා ස්වාමීන්ට පෑල' යි කීය. ඒ කෙසේ වූ ඉක්මන් මෙනෙවරක් බව ත් නො දනෙයි. මේ නිමට නිමවා හිද තෙලෙ පත අසුන් බලා වදාළ මැනැවැ"යි කීය. එ වේලෙහි රජ්ජුරුවෝ "පුතණ්ඩ! තෙපි බත් කව"යි කියා දෙවනු ව බතෙහි අත නො ගා වමතින් පත අල්වා ගෙණ, පත් අසුන් බල බලා එහි අමූතු

සම්පා උපදව උපදවා වාසභඛත්තියාව බත් කෑ කිමෙක තුරු අඹුතු කථාමෙන් දවස් යවා එම සංඝලයෙහි දෙවතු ම බත් කැවා සේ අනතුව සෝදපින. වාසභඛත්තියාවෝ බත් කෑමාහු මී ය

දූතයෝ එ වේලෙහි මේ සොරකම් දැකගෙන කොහී තැටුම් ම කැම යි යන සිතින් සැක හැරපියා බොහෝ සාක්ෂිකයන් වාසභඛත්තියාවන් සැවැත් නුවර ගෙණ ගොස් කොසොල් රජ්ජුරුවන්ට පාමා දී මේ පවත් කීවාහුය. කොසොල් රජ්ජුරුවෝ අතුරු නො දුන මිතුරුබැව්හි සතුටු ව මුළුකුමර දිව්‍යපුරයක් සේ සරහා මහත් වූ මඟුලෙන් වාසභඛත්තියාව අගමෙහෙසින් කළහ.

නොබෝ කලෙකින් ඒ වාසභඛත්තියාවෝ රජ්ජුරුවන්ට පුතකු වැදූහ. ඒ කුමරහු උපන් වේලෙහි රජ්ජුරුවෝ අමාත්‍ය යකු කැඳවා "වාසභඛත්තියාවන් මට පුතකු ගෙණකුත් මැදූ නියාම මාගේ මැතියන් වහන්සේට සැලකරව"යි කියා යවූහ. එ වේලෙහි ඒ ඇමැති දිව දිව ගොස් එ පවත් කී ය. මැතියෝ එ පවත් අසා "වාසභඛත්තියාව මේ තැන් පටන් ම පුතකුමක් කෙරෙහි වල්ලභ ය"යි කියා ඔහට මිඟුල් ප්‍රසාද දුන්හ. ඒ ඇමැති තමාගේ කණ මඳක් මාහඹු හෙයින් වල්ලභ ය යි කී බස වරදවා අසා 'විඩූඩභ නමැයි වදාළ සේක"යි රජ්ජුරුවන්ට ගොස් කී ය. රජ්ජුරුවෝ එ බස් අසා "මාගේ මැතියන් වහන්සේ කීයේ මාගේ රාජවංශයෙහි ප්‍රවේණී ගත ව තිබී ආ නමෙක් වනැ"යි සිතා "අද පටන් ම පිත් විඩූඩභ නමැ"යි නම් දුන්න. එ තැන් පටන් වාසභඛත්තියාවෝ ඉතා ශ්‍රීමත් වූහ. අනුන්ට දැසී ව සිට බුදුන් නිසා මේ බඳු වූ රජක් හට අගමෙහෙසින් වීමි යි දවස දවස බුදුන් කෙරෙහි මහත් වූ ආදර කොට අතිප්‍රසන්නවූහ. කොසොල් රජ්ජුරුවෝ ද එ තැන් පටන් බුදුන් කෙරෙහි අතිශ්‍රද්ධා ඇති ව විශ්වාස පරම ව දන් දී ආනන්ද බෝධි ආදියෙහි මහත් වූ පූජා කොට පින් රැස් කළහ.

මෙසේ තමන් වහන්සේ කෙරෙහි විශ්වාසී වූ සත්ත්වයන් අති විශ්වාස කරවා මහත් වූ සත්කාර ලත් හෙයිනු ත්, එසේ වූ සත්කාර පූජා විඳීමට සුදුසු හෙයිනු ත් මාගේ ස්වාමිදරු වූ බුදුරජාණන් වහන්සේ මේ මේ කාරණයෙනු දු අගීන් නම් වන සේක.

තව ද: එම රජහුගේ අගමෙහෙසින් වූ කෝසල මල්ලිකා දේවීන්ගේ උත්පත්ති කථාව නම් කවර? යත්;

එ ම සැවැත් නුවර පන්සියයක් මාලාකාරයන්ට නායක වූ මාලාකාර ජ්‍යෙෂ්ඨයකුගේ දුවක් දෙවඟනක බඳු වූ රූ ඇත්තී ය, රජක් හට අග බිසෝ වන රූ ඇත්තී ය. උතුම් වූ ස්ත්‍රීලක්‍ෂණ ඇත්තී ය. ඕතොමෝ සොළොස් හැවිරිදි අවස්ථාවෙහි පැසක් අතින් ගෙණ මල්වත්තට මල් කඩා යන්නී කොමු පිඩු තුණක් හැරගෙණ ඒ මල් කඩන පැසෙහි ලා ගෙණ මල්වත්තෙහි දී කම් යි සිතාලා ඇතුළු නුවරින් පිටත් වලා කුඩා කෙල්ලන් ගණනක් හා සමඟ යමින් සිටියා ය.

එ කල සර්වඥාභිධාන වූ මාගේ බුදුරජාණන් වහන්සේ අරුණෝද්ගමන වේලෙහි "අද කවර ස්ත්‍රී පුරුෂයක්හට ශක්‍රසම්පත් බ්‍රහ්මසම්පත් මාරසම්පත් සිවුසම්පත් රජසම්පත් දෙවාලම් දෝ හෝ"යි බලා වදාරා මේ කුමාරිකාවට එ දා වන අභිවෘද්ධියක් දැක ආයුෂ්මත් වූ අනඳ මහ තෙරුන් වහන්සේ ආදි වූ පන්සියයක් පමණ ශ්‍රාවක ගණයා පිරිවරා සවණක් රසින් දිලිහි දිලිහී වැඩ ඒ කුමාරිකාව අභිමුඛයෙහි පෙණී ගියහ. එ වේලෙහි ඕතොමෝ බුද්ධාලම්බන ප්‍රීතියෙන් මත් ව 'බුදුන්ට කුමක් පිළිගන්වාපියම් දෝ හෝ"යි සිතා අතික් කිසි දෙයක් නො දැක තමාගේ පැස තුබූ කොමුපිඬු තුණ අතට හැරගෙණ "බුදුහු මේ පිළිගන්නා සේක් දෝ හෝ යි නො පිළිගන්නා සේක් දෝ හෝ"යි සිතූ සිතා සැක ඇති ව නැමී නැමී ලඟට ගියා ය.

එ වේලෙහි ස්වාමිදරුවෝ ඈ කෙරෙහි කළා වූ මහා කරුණාවෙන් වරම් රජුන් විසින් දෙන ලද ශෛලපාත්‍රධාතුව නමා පෑලූ සේක. එ වේලෙහි ඒ කුමාරිකාව කොමුපිඩු තුණ පිළිගන්වාලා බුදුන් වැඳ පස්වණක් ප්‍රීතීන් පිණා බුදුන්ගේ සඳමඬලක් වන් මුව මඬල බල බලා සතුටු සතුටු ව සඳරැස් දුටු කොමුදයන් සේ පිණා පිණා සිටියා ය. එ වේලෙහි බුදුහු සිටියාවූ කුමාරිකාව දැක ඇට එ ම දා ම මහ වැඩක් දැක "මාගේ ශාසනයෙහි මිතු මෝතොමෝ ඉතා වල්ලභ වෙයි" සිතා සිනාවක් පහළ කළ සේක.

බුදුන්ගෙ ත් සිනා ඇද්දැ යි යතහොත්; සෙසු සත්ත්වයන් සේ හඬගා වෙව යි කට දල්වා වෙව යි බුදුන්ගේ සිනා නැත. බුදුන්ගේ සිනාවක් උදෙසා ලෝවැඩකට කාරණයෙක් ඇත් නම් එ වේලෙහි සිනාවක් පහළ කෙරෙති යි සිතා වදාළ කල එකෙණෙහි 'කිරි මුහුදින් දිවු මහ රළ සතරක් සේ, ප්‍රවාල සාගරයෙන් ඉස් නඟ

නික්මුනා වූ හැළි වූ දිව්‍යනාගරාජයන් සතරදෙනකු සේ, බුදුන්ගේ සතර දන්ත ධාතුයෙන් 'තනයෙහින් දිවූ කිරිපිහිරි ශතරක් සේ සුදු බුදුරැස් කඳ සතරෙක් පිටත් ව ශ්‍රී මුඛය තුන් තුන් වාරයෙහි ආවර්තනය කොට දෙලොස් මඬුල්ලක් දක්වාලා 'අනවතප්තයෙන් දිවූ සතරමහා ගංගාව තුන් තුන් වාරයෙහි විල පැදකුණු කොට ඒ ඒ දිගින් දිවුවා සේ' මාගේ සපිඬ නමැති මහා අනවතප්ත යෙන් දිවූ බුදුරැස්කඳ සතර සතරදිගින් ගොස් අහස්කුස පැන නැගී සක්වල ගබ පුරා අකනිටා බඹලොව ගැසී නැවත බුදුන් කරා ම දිව අවුදින් 'රජුගේ නියොගයෙන් ඒ ඒ දිග්හි දිව ගිය ගිය දෙස පරසතුරන් ජයගෙණ නැවත අවුදින් රජුගේ ගෙට වදිනා සතර මහා යොධයන් සේ, ඒ බුදුරැස් කඳ සතර ද සවාමිදරුවන් ගේ ශ්‍රී මුඛයට ම වැද අන්තර්ධාන වෙයි. මේ ආකාරයෙන් භික්ෂූහු "බුදුහු සිනා පහළ කළ සේකැ"යි දැනීසි. එ වේලෙහි ත් සවාමි දරුවෝ ඒ කුමාරිකාව මුහුණ බලා මෙසේ ම සිනා පහළකොට වදාළ සේක.

එ වේලෙහි අනඳ මහ තෙරුන් වහන්සේ "සවාමීනි! බුදුහු නම් අකාරණයෙක සිනා නො පහළ කරණ සේක. කවර කාරණ යෙකින් සිනා පහළ කළ සේක් දැ"යි විචාළ සේක. එ වේලෙහි සවාමිදරුවෝ "ආනන්දය! මේ කුමාරිකාව මට මේ දුන්නාවූ කොමු පිඩු දානයාගේ විපාකයෙන් අද සවස මෙම නුවර කොසොල් රජ හට අගමෙහෙසින් බිසෝ වෙයි. මේ කාරණය සිතා සිනා පහල කෙළෙමි"යි වදාරා ඇතුළු නුවර සිඟා වන් සේක.

එ වේලෙහි කුමාරිකාවෝ බුදුන් වදාළ තෙපුල් අසා "බුදුහු නම් ඒකාන්ත තෙපුල් ඇති සේක. කිමෙක් දෝහෝ රජ්ජුරුවන් අද වකට මේනුවර ත් නැති වුව. කෙසේ වූ විසමයක් දෝ හෝ"යි සිත සිතා මල්වත්තට පලා ගොස් "රජුට අගමෙහෙසින් වෙමි"යි කී බසට මත් ව හඩගා ගී කිය කියා මල් කඩන්නී ය.

පසේනදි කොසොල් රජ්ජුරුවන් පියානන් මහකොසොල් රජ්ජුරුවන් දියනියෝ රජගහා නුවර බිම්සර රජ්ජුරුවන් කෙරේ වැස අජාසත් කුමරු වැදූහ. අජාසත් කුමර දෙව්දතුන්ගේ අසත්පුරුෂ සම්වාසයෙන් පියරජහු මරා රජය ගත. මහකොසොල් රජ්ජුරුවෝ දියනියන්ට දායාද පිණිස දෙනුවරට අතුරෙහි සැවැත් නුවරට කිම් දනව්වක් දුන්හ. පසුව පසේනදි කොසොල් රජ්ජුරු වෝ "සුහුංබඩුනුවන මැරූහ"යි බෑනනුවන් කෙරෙහි කළු

කොසොල් රජුට මල්ලිකා දේවිය හමුවීම   417 පිට බලන්න. (26-27)

කෝපයෙන් නැඟනියන් සතු දනව්ව නමා ගත්හ. අජාසත් කුමර එ පමණක් අසා තමා ත් මහබල ඇති හෙයින් එ දනව්වෙහි අය බලාත්කාරයෙන් ගෙන්වයි. කොසොල් රජ්ජුරුවෝ ත් බල සෙනග යවා බලාත්කාරයෙන් ගෙන්වති. එ කල දෙමයිල් රජුන් ගේ මහා යුද්ධයෙක් වි ය. සමහර දවසෙක අජාසත් කුමර පැරද පලා යෙයි. සමහර දවසෙක කෝසල රජ්ජුරුවෝ පැරද පලා යෙති. එ දවස් ද කෝසල රජ්ජුරුවෝ මහසෙන් සමඟ ගොස් බෑනණුවන් හා යුද්ධ කළහ.

ඒ අජාසත් කුමර උක්කුටිකයෙන් හිඳ අවලොස් රියන් පැන පියසා බල ඇතියේ ය. කඩුව හා සමඟ මහ අඬනයක් අතින් හැරගෙණ කොළිත් සිට අසුරියනක් පැනපියන බල ඇතියේ ය. එසේ හෙයින් මසිල් රජහට තමාගේ බල පවිම් යි සිතාලා කඩුව හා අඬනය ගෙණ කොසොල් සෙනඟ මැදට පැන කෙසෙල්කඳ පොලුගන්නා සේ මසිල් රජහුගේ බලසෙබළුන් සිය දහස් ගණන් පොලු ගෙණ පී ය. එ වේලෙහි සත්කෙළක් පමණ ඇති මහ කොසොල් සෙනඟ රජ්ජුරුවන් නො බලා ම ගිය ගිය අත බිඳී දිවපියහ. කොසොල් රජ්ජුරුවෝ ද අසකු පිටව පැන නැගීලා සැවැත්නුවරට ම දිව එන්නාහු එ මල්වත්තෙහි අබගා ගී කිය කියා මල් කඩන ඒ කුමාරිකාවගේ ශබ්දය අසා ඇගේ පින්බල යෙන් ම ඈ කෙරෙහි ලොභ උපදවා අසුපිටින් ම එ මල්වත්තට දිව ඈ සිටි තෙකට ම ගොස් වැද ගියහ.

එ වේලෙහි කුමාරිකාවෝ රජ්ජුරුවනු ත් හැඳිනලා බුදුන් වදාළ මචනය ත් සඳහන් කොටලා "ඒකාන්තයෙන් අද මේ රජහුට අග මෙහෙසින් වෙම් ම ය"යි සිත සිතා රජහු කෙරෙහි භය නො කොට පැන පලා නො ගොසින් සිනා සිසී වැද සිට අසුගේ තණිසාලම අත ගසාලා අසු අල්වාගත. එවේලෙහි රජ්ජුරුවෝ "තෝ කවරෙක්හි දැ"යි විචාරා "මම මාලාකාර දුවක්මි"යි කී කල "අස්වාමිකයෙහි ද, සස්වාමිකයෙහි දැ" විචාරා "අස්වාමිකයෙමි"යි කී කල අසුපිටින් බැස "අස්පිටින් දිව විඩායෙමි. මදක් නිදාපියනු කැමැත්තෙමි. මදක් තෝ මෙසේ වැදහිඳැ"යි කියාලා ඇගේ ඇකයේ හිස තබාගෙණ සැතපෙක් නැතිව ම මදකලක් සැතපී විඩා සන්හිඳුවා ගෙණ නැඟීසිට එම අසුපිට ඒ කුමාරිකාවන් හිඳුවා ගෙණ රජගෙට පලාගොස් නැවත ඈ දෙමවුපියන්ගේ ගෙට ම යවා එ වේලෙහි ම මඟුල් රථය යවා මවුපියන්ට බොහෝ සත්කාර කොට ඈය රජ පෙළහරින් ගෙන්වාගෙණ බොහෝදෙනා මධ්‍ය යෙහි රුවන්ගොඩක් පිට සිටුවා අභිෂෙක කොට අගමෙහෙසින් කළහ.

---

1 මහ අඩයක් - ඇකෑම.

ඒ කුමාරිකාමෝ ඔල් කඹන කෙත දී දුටු හෙයින් මල්ලිකා නම් ලදහ. කොසොල් රජහට අගමෙහෙසින් වූ හෙයින් කෝසල මල්ලිකා දේවි ය යි මේ නමින් ප්‍රසිඬව පෂ්ඨිඝයක් පුර සත්‍රීන්ට නායක ව රජ්ජුරුවන්ට ප්‍රිය ව ඔත වඩා මෙසත්කාහු බුදුන් නිසා තමන් අගමෙහෙසින් වූ බව තමන් ම දන්නා හෙයින් තුණුරුවන් කෙරෙහි මහත් වූ සැදෑ ඇතියහ. දවස් පතා දහස්ගණන් පරිත්‍යාග කොට ආනන්දබොධි ආදියෙහි මහත් වූ පූජා කරමා බොහෝ වූ පින් රැස් කළාහු මී ය.

මෙසේ තමන් වහන්සේ දූත ගීත පහදමා කොමුපිඩක් පමණ දන දීලු මාලාකාර දූන්ට පවා එම ද මෙසේ අගමෙහෙසින් තන තුරු දෙමා බුදුබල පෑ ඔවුන් විසින් කරණලද මහත් වූ පූජා සත්කාර ලත් හෙයිනු ත්, එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, මාගේ සවාමිදරු වූ බුදුරජාණෝ මේ මේ කාරණයෙකු දූ අහීන් නම් වනසේක.

තව ද: එම සැවැත් නුවර උත්පලගන්ධ නම සිටාණන් කළ ප්‍රතිපත්ති පූජා නම කවර? යත්;

මෙයට කප් ලක්ෂයෙකින් යට පියුමතුර නම බුදුන් සමයෙහි එක් දිළිඳු වූ උපාසක කෙණෙක් තුණුරුවන් කෙරෙහි පැහැද ගොස් බණ අසන දවසෙක බණ අස අසා ධර්මාලම්බන ප්‍රීතීන් මත්ව සාධුකාර දුන්හ ඒ කුශල මූලයෙන් සතර අපාය ඇසින් නො දුක කප් ලක්ෂයක් මුළුල්ලෙහි දිව්‍ය ලොක මනුෂ්‍ය ලොකයෙහි ඇවිද නොයෙක් සියදහස් ගණන් වාරයෙහි ශක්‍ර සම්පත්, චක්‍ර වර්ති සම්පත් ආදි වූ නොයෙක් දිව්‍ය මනුෂ්‍ය සම්පත් අනුභව කොට අප බුදුන් සමයෙහි මෙම කොසොල් රජහුගේ සැවැත් නුවර සතළිස් කෙළක් පමණ ධන ඇති සිටු කුලයෙක උපන්හ. ඔවුන් බැණනැගි කල මුඛයෙන් දිවූ ඔහනෙල්මල් සුවඳ ගේ කුස පුරාගෙණ වාරානතරයෙන් පිටතට නික්මෙයි. එසේ හෙයින් ඔහු උත්පල ගන්ධ නම් සිටාණෝ ය යි මෙනමින් ප්‍රසිඬ වූහ.

කාලකින් ඒ සිටාණෝ බුදුන් කරා ගොස් බණ අසනුයේ ගිහි ගෙයි ආදීනව හා බුදුසසුන් වැද මහණවීමෙහි අට මහා විපාක අසා ගිහි ගෙයි කලකිරුම් ඇති ව සතළිස්කෙළක් පමණ ධන හා සිටු සැපත හැරපියා සසුන් වැද මහණ ව නොබෝ දවසෙකින් විදශීනා වඩා රහත් ව, එ තැන් පටන් උත්පලගන්ධ මහ තෙරුන්වහන් සේ ය යි මෙ නමින් ප්‍රසිද්ධ ව බුදුසසුන් නමැති මහා සරසියෙහි පැනනැඟී ප්‍රබුඬ වූ උත්පල රාජයක් සේ ඉතා ශොභාවත් වූ සේක.

එ කල පසේනදි කොසොල් රජ්ජුරුවෝ සිවාකත් මහණ වූ බව් අසා ''අස්වාමික භාණ්ඩ නම් රාජසන්තක ය'' යි කියා සිවාකත්ගේ සිටු සැපත ත් ගෙන්වාගෙණ උන්ගේ අග්‍ර වූ සිටුදියණියන් අසාධාරණ වූ රූ ඇති හෙයින් තමන් ගේ අන්තඃපුරයට ගෙන්වා ගත්හ. එ කල පන්සියයක් පමණ මහනෙල් මල් කලබ් ගෙණවුත් මාලාකාරයෝ රජ්ජුරුවන්ට දුන්හ. රජ්ජුරුවෝ පිරිවරා සිටි ඒ සිටුදියනියන් ආදී වූ පන්සියයක් පුර ස්ත්‍රීන්ට දුන්හ. ඒ සිටුදියනියෝ තමන්ට දුන් මහනෙල්මල් කලබ අතින් ගෙණ ආඝ්‍රාණ ය කොට මහනෙල්මල් සුවඳින් පූර්වයෙහි තමන්ගේ සිවාකත් සඳහන් කොට ''මාගේ ප්‍රිය වල්ලභයාගේ මුඛ සුගන්ධය වනැ''යි සන්තුෂ්ට ව, ප්‍රීතින් මත් ව, සිඟි එළමාගත නොහී ඉතා මහත් කොට සිනා සී දෙවනුව 'එ වැනි මාගේ ස්වාමිහුගෙන් වියෝගයට පැමිණියෙමි'' යි සිත සිතා ශොක කරන්නී මහත් කොට හඬාපුව.

රජ්ජුරුවෝ මේ කාරණ දෙක ම දැක එ බිසොවුන් ලඟට කැඳවා ''තී මා බල බලා සින්ද දී හය නැති ව සිනා සුනෙක් ඇයි ද, දෙමනු ව ඇඬූයෙ ත් ඇයි ද, මට නො සඟවා කිය'' යි හය ගන්වා විචාළහ. එ වේලෙහි බිසොවු ''ස්වාමිනි! අතික් වරදක් නිසා සුනුයෙම්–ඇඬූයෙම් නො වෙමි. මාගේ පූර්වයෙහි රක්ෂා කල ස්වාමිහුගේ මුඛයෙහි සුගන්ධ ය මේ මහනෙල්මල් සුවඳ අසා සිහි කොට ඔබ කෙරේ ගත් ප්‍රේමයෙන් සිපිමි. ඔබගේ වියෝගයෙන් අඬාපිමි අතික් සිතක් සිතුයෙම් නො වෙමි'' යි කීහ. එ බසට රජ්ජුරුවෝ 'තී කියන්නේ අතීතෙක් ම ය, මිනිසුන් මුඛයෙහි ත් මහනෙල්මල් ගඳ ඇද් දැ යි'' කියා නො ගිවිස නැවත කිපියහ. බිසොවු තව ද හය නැණී ව කියන්නාහු ''මා කී බස් නො ගිවිස්නා සේක් වී නම් ඔබ දැන් බුදුන් කෙරේ මහණ ව දෙව්රම් වෙහෙර වැඩ වසන සේක. බණ කීමෙහි ඉතා දක්ෂ සේක. ඔබ අතින් බණ අසන කල ඔබ මුඛයෙන් හමන මහනෙල්මල් සුවඳ නො ඇසූ සේක් වී නම් පසුව මට කැමැති වධයක් කළ මැනැවැ'' යි කීහ.

රජ්ජුරුවෝ එ වේලෙහි ''ඈ කීයේ කාරණම ය'' යි ගිවිස දෙ වනදා උදෑසන බුදුන් හා, ඒ උත්පලගන්ධ මහතෙරුන්වහන්සේ හා ඇතුළුවූ පන්සියයක්දෙනා වහන්සේ පවරාගෙණ රජගෙට වඩාගෙණ අවුත් වළඳා අන්තයෙහි රජගෙය කසායෙන් පිරිබඩ ගෙණ සුවඳ බඩු පිටත් කරවා ''සුවඳ මලක් නො ගෙණ, නො පැලඳ, සුවඳ ඇඟ නො ගල්වා, ඉස් සොධා නා හැම දෙන ම පිරුවට හැඳ බණ අසන්නට එව'' යි සියලු නුවර වැසියන්ට නියොග කොට, තුමූ ද එසේ ම සුවඳ

ඇඟ නො ගල්වා. සුවඳ මල් නො පැලඳ ශුඞ්ඛාවකයක් හැද යටිමාලෙහි ධර්මාසනයක් පණවා සිටියහ. එ වේලෙහි ස්වාමි දරුවෝ රජුගේ අදහස් දැන "රජ්ජුරුවන්ගේ ශඞ්කාව දුරු කෙරෙමි" යි සිතා සිතා උන්වහන්සේ කැඳවාලා "උත්පලගන්ධ ය! තාගේ පුරාණ දුශ්චරිතාවගේ හය හරවා තෝ ම අද බණ කියව. මම තා අතින් බණ අසමි" යි වදාළ සේක.

එ වේලෙහි මහ තෙරුන් වහන්සේ බුදුන් වැඳ අම්බර ඉල්වා ගෙණ සිංහරාජයක්හුගෙන් ප්‍රසාද ලත් අශ්වපොම්බක්හු සේ නිර් භීත ව ධර්මාසනයට පැන නැගී තුන්යලක් නමස්කාර ය කියා ධර්ම දෙශනාවට පටන් ගත් සේක. එ කෙණෙහි මහ තෙරුන් වහන්සේ බැණනැගි බස හා සමග ම මුඛයෙන් නික්මුනා වූ මහ නෙල්මල් සුවඳ හැම රජගෙයි යටිමාල පුරා ගෙණ මිහදෙරින් පවත් ව හමා බස්නට පටන්ගත. එ වේලෙහි රජ්ජුරුවෝ ඉතා සනතුෂ්ට ව බණ අසා අනතයෙහි බුදුන් කරා ගොස් "ස්වාමිනි! මේ කෙසේ වූ විස්මයෙක් ද? මනුෂ්‍යයන්ගේ මුඛයෙන් මහනෙල්මල් සුවඳ හමා බස්නට කාරණ කිම් දැ" යි විචාළහ.

සද්ධම්මදෙසනා කාලෙ–සාධු සාධූ'ති භාසතො
මුඛතො වායති ගන්ධො–උප්පලං'ව යථොදකෙ–ති

යන මේ ගාථාව වදාරා "මහරජ! මේ සත්පුරුෂතෙම මෙතෙනට කප් ලක්‍ෂයකින් යට උපන් පියුමතුරා නම් බුදුන් සමයෙහි එක් දිළිඳු කුලයක ඉපැද බොහෝ දෙනා සේ ධර්මමණ්ඩලයට ගොස් සැදැ ඇති ව බණ අසයි. බණ අස අසා ඉඳ ධර්මාලම්බන ප්‍රීතීන් බොහෝ සේ, හැමදෙනාට පළමු පළමු ව සාධුකාර දීදී බණ ඇසී ය. ඒ කුසල මූලයෙන් කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි නරකාදී දුක් නො විඳ දිව්‍ය ලොක මනුෂ්‍යලොකයෙහි අප්‍රමාණ වූ ශ්‍රී සම්පත් ලද හ. මෙතුවක් කල් මුළුල්ලෙහි ම මහනෙල්මල් සුවඳ ගඳ මුව ලද, දැන් මාගේ මේ බුද්ධොත්පාදයෙහි මේ සැවැත් නුවර ඉපැද, මාගේ සසුන් වැද මහණව, එම කුශල මූලයෙන් ම අමා මහ නිවන් දැක සංසාර සාගරයෙන් ගොඩට නැංගේ වේ දැ" යි වදාරා රජ්ජුරුවන් ආ දි වූ බොහෝ රජපිරිස සාධුකාර දෙවා බුද්ධාසනයෙන් පැන නැගී අාසඞ්ගණයා පිරිවරා ජෙතවනාරාමයට ම වැඩිසේක.

එ වේලෙහි රජ්ජුරුවෝ ඒ සිටුදේවින් කැඳවා "තොප නිසා මට බොහෝ වූ සද්ධර්මප්‍රීති වී ය" යි කියා එ දා උන්ව ද බොහෝ සැපත් දී එ තැන් පටන් තමන් කෙරෙහි වල්ලභ සත්‍රී කළහ.

මෙසේ කමින් වහන්සේගේ සද්ධර්මප්‍රීතීන් සාධුකාර දුන්නාවූ සත්ත්වයන්ට පමා මේ සා නිවන් සැපතක් දී විශෙෂ වූ සම්‍යක් ප්‍රතිපත්ති පූජා ලත් හෙයිනු ත්, එසේ වූ ප්‍රතිපත්ති පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, මාගේ ස්වාමිදරු වූ බුදුරජාණන් වහන්සේ මේ මේ කාරණයෙනු දු අගීක් කම් වනසේක.

———o———

කව ද: මෙම සැමැත් නුවර දී අනඳ මහ තෙරුන් වහන්සේ ලද සාමක පූජා නම් කවර? යත්;

එක් සමයෙක කොසොල් රජ්ජුරුවන්ගේ පක්සියයක් තිසෝ වරු දවස දවස මෙහෙරට ගොසින් බණ අසාගත නො හී රජ්ජුරුවන් කරා ගොස් "ස්වාමිනි! තුඹවහන්සේ දවස තුන්මාරයෙක බුදුන් කරා ගොසින් බණ අසන සේක් ම ය. මේ නුවර විශාඛා ආ දී වූ සෙසු සත්‍රිහු ද සිය් සේ විහාරයට ගොස් බුදුන් දක බණ අසා මෙබාගයෝ වූ පිස් රැස්කරන්නාහු ම ය. අපි වනාහි තුඹවහන්සේගේ අන්තඃපුරයට සමහ ව, සිත් සේ ගොස් බණ අසා පින් පුරා ගත නො හෙම්හ. මෙබඳුවූ නව මහ බුද්ධෝත්පාද කාලයෙහි ඉපැද අසඞ්ඛ්‍යයෙක් කප් කාලයෙකු ත් "බුදුහු ය" සී යන නාමමාත්‍රය ත් අසා ගිය නොහැක්කා වූ ලොවුතුරු බුදුරජාණන් දිළිඳුන්ගේ දෙර පෙණීගිය කප්රුකක් සේ මෙම නුවර සද්ධර්මශ්‍රීන් ශොභමාන ව ලෝවැඩ කළ දී අපි දුත් මුහුදුමැදට වැද පිපාසායෙන් දුග් ගන්නාවුන් සේ, ආකාශයට නැගී පවා ගැලවී යා නොහෙන ලිහිණියන් සේ, පොලොවට වැද පමා පිහිට නො ලබන්නවුන් සේ, ඉතා මහත් වූ අකුසල් ඇත්තම්හ. මැදිරියෙක වසන පක්ෂීන් සේ නිරන්තර යෙන් කිසිතොතක ඇවිදගත නොහී කුසල්මහ නොලදින් ඉතා මහත් වූ දුග් ගන්නවුන් වැන්නම්හ.

බුදුන් මධුරනාදයෙන් වදාරණ දහම් අසාගත නො හෙන හෙයින් කන් නැත්තවුන් වැන්නම්හ. තුණු රුවනින් එක රුවනක් දවස් පසා දක්ක නො හෙන හෙයින් ඇස් නැත්තවුන් වැනියම්හ. බුදු ගුණයක් කියාගත නො හෙන හෙයින් දිව නැත්තවුන් වැනියම්හ. සද්ධර්මප්‍රීතීන් මාගීඵලයක් නො ලබන හෙයින් සිත් නැත්තවුන් වැනියම්හ. බුදුන් කරා අප පයින් ගොස් බණ අසාගත නො හෙන හෙයින් පා නැත්තවුන් වැනියම්හ. දවස්පසා දක වැදගත නො හෙන හෙයින් පස්කද නැත්තවුන් වැනියම්හ. බණ අසා සිතු සීතු දෑ පුදගත නො හෙන

හෙයින් ධන ඇත ත් නැත්තවුන් මැනියම්හ, එසේ හෙයින් තුඹ වහන්සේ අපට මේ සා මහත් ශ්‍රී සම්පතක් දී මදුරපෝතීනු ත් කොතෙක් ඓශ්වර්‍ය්‍ය ඇත ත් පින් කොටගත නො හෙන හෙයින් අප විඳිනා දුක් නරක දුක් හා සමිය යි සිතම්හ ස්වාමීනි! තුඹ වහන්සේ අප කෙරෙහි විශෙෂ වූ දයාවෙක් ඇත්තේ වී නම් දවස දවස වෙහෙරට යන කල අප හා සමඟ ගොස් බණ අසා හෝ වදාළ මැනැව. එසේ නො කිවිස්නා සේක් වී නම් දවස් පතා අප බණ අසා ගන්නා ලෙසක් හෝ කොට වදාළ මැනැවැ" යි යාච්ඤා කළහ.

එ බස රජ්ජුරුවෝ "ස්ත්‍රීන්හා සමඟ හැම විට ම වෙහෙරට යෑම ඉතා පළිරොධ ය. තොප ඇමට බණ ඇස්වන ලෙසක් කෙරෙමි" යි කියා භික්ෂූවරුන් සන්හිඳුවාලා එ නුවර මුළුල්ලෙහි දක්ෂ ව බණ කියන්නවුන් පරීක්ෂා කොට "ආගමධර වූ අනාගාමී වූ ඡත්තපාණී නම් උපාසක කෙණකුන් ඉතා බලවතැ" එක් දවසෙක උයන දී බුදුන් අතින් ම අසා දත උන් රජගෙට කැඳවාලා "ඡත්තපාණීනි! බුදුහු එක් දවසක් තොපගේ බොහෝ ගුණ මට වදාළ සේක. තොප 'ආගම්ධරයන්හු'යි කියා ත් වදාළසේක ධර්මකථිකය ය යි කියා ත් වදාළසේක. ආර්‍ය්‍ය පුද්ගලයහ යි කියා ත් වදාළසේක. මාගේ අන්තඃපුරයට අද පටන් දවස් පතා තෙපි ම බණ කියව" යි කීහ. ඡත්තපාණී එ බස් අසා කියන්නාහු "ස්වාමීනි! රජදරුවන්ගේ අන්තඃපුරයට බණ කීම් නම් අප සේ සුදුසිළි අඳිනා ගිහි පුද්ගලයන්ට සුදුසු නො වෙයි. තපස්විවරයන්ට ම සුදුසු ය. ස්ත්‍රීහු නම් ගිහින් කෙරෙහි ආදර නො කෙරෙති, සිල්වතුන් කෙරෙහි භය ඇතියහ. එසේ හෙයින් බුදුන් ගෙන් එක්තරා එක් මහතෙර කෙණකුන් වහන්සේ ඉල්වා ගෙණ දවස් පතා අන්තඃපුරයට බණ අස්වා වදාළ මැනැව. එසේකල බණ අසන්නවුන්ට ත් කියන්නවුන්ට ත් වැඩ සැදේ ම ය. තව ද: ශීලයෙහි පිහිටියවුන් අතින් බණ අසන්නාවූ විපාකත් බෙහෙවැ" යි කියා රජ්ජුරුවන් ගිවිස්වා තමන් ඇඟින් ගළවා රජගෙන් ගියහ.

එ වේලෙහි රජ්ජුරුවෝ කාරණ ය සී ගිවිස පන්සියයක් බිසෝවරුන් කැඳවා "තොප හැමදෙනාට බණ වදාරණ පරිද්දෙන් එක් මහ තෙරණුකුන් වහන්සේ ඉල්වා බුදුන් කරා යෙමි. කවර මහ තෙර කෙණකුන් වහන්සේ අතින් බණ අසනු කැමැතියා ද" යි විචාළහ. ආනඳ මහ තෙරුන් වහන්සේ නම් බුදු සස්නෙහි ඉතා මහත් වූ භාග්‍ය ඇතිසේක. සියලු ස්ත්‍රී පුරුෂයෝ ම ඔබ කෙරෙහි ප්‍රේම ඇතියාහු ම ය. තව ද: මධුර වූ කටහඬ ඇතිසේක. එසේ හෙයින් ස්ත්‍රී ජාතිය නම් ශබ්දයෙහි ලොභ ය ඇතිවූවන් හෙයින් අනික් බසක් නො කියා එසේ වී නම් අපගේ ආයුෂ්මත් වූ ආනඳ මහ තෙරුන් වහන්සේ අතින් ම බණ අසනු කැමැත්තම්හ" යි කීහ.

එ වේලෙහි රජ්ජුරුවෝ ජේතවනාරාමයට ගොස් බුදුන් වැඳ "ස්වාමීනි! මාගේ අන්තඃපුරවාසීහු ආනන්ද මහ තෙරන් වහන්සේ අතින් ම බණ අසනු කැමැත්තාහ. උන්වහන්සේ අන්තඃපුරයට බණ කියන පරිද්දෙන් අනුදැන වදාළ මැනැවැ"යි සැලකළහ. බුදුහු ඒ රජ්ජුරුවන් මිඳ දෙයකට විරක්ත වන සේ දැන "මහරජ! තෝ නම් වට තැටියක් සේ, මඬෙහි ඉදුවාලූ කිලයක් සේ, කැමැති පිවකට නමාගත හැකියෙහි ය. ආනන්දයෝ නම් සෝමාන්හ. එ බවු දැන උන් කෙරෙහි පරීක්ෂා ඇති වව. ආනන්දයෝ තාගේ පුරයට බණ කියන්ට සුදුස්සහ. තෝම සිහිපත් ඇති වව"යි රජ්ජුරුවන් අර ඉදුවාලා ආනන්ද මහ තෙරුන් වහන්සේ කැඳවා "ආනන්ද ය! මේ කෝසලයාගේ අන්තඃපුරයට දවස් පතා ගොස් බණ කියව" වදාළ සේක. එ කැන් පටන් ආනන්ද මහතෙරුන් වහන්සේ පන්සිය යක් බිසෝවරුන්ට දවස්පතා බණ වදාරා බොහෝ පින් රැස් කර වන සේක. මෙසේ කාලයක් බණ වදාළ කල ඒ පන්සියයක් බිසෝවරු උන්වහන්සේගේ මධුර වූ ශබ්දයෙහි හස්තිකාන්ත වීණාවෙහි ඇලුනා වූ ඇතින්නක් සේ, චිත්‍රලතා වෙනෙහි ලෝභි වූ දෙවඟනන් සේ, සද්ධර්ම ප්‍රීතීන් ශබ්දානුරාගය කොට උන්වහන්සේ ම අතුල් පතුල් ඇති එක්මැති රන්වන් පුතුන් පන්සියයක් වැදූහ.

ශබ්දය නිසා ත් දරුගැබ සිටී දැයි යත හොත් ස්ත්‍රීන් දරුවන් වදන කාරණා නමෙක් ඇත ඒ කෙසේ දැ? යත්; ස්ත්‍රී පුරුෂයන් ඔවුනොවුන් සා සමග පවත්නා ලෝකාස්වාද රති ය නිසා ත් දරු ගැබ සිටී මය. පුරුෂයන්ගේ ශරීරයෙහි පහස ලැබීමෙනු ත් දරු ගැබ සිටී මය. පුරුෂයන්ගේ ඇඟිල්ලෙන් නාභිය පිරිමැද්දූ පමණ අනුරාගයෙනු ත් දරුගැබ සිටී මය. පුරුෂයන්ගේ මුහුණු එකාවනු බලන්නාවූ දෘෂ්ටානුරාගයෙනුත් දරුගැබ සිටීමය. පුරුෂයන් පලන් මල් සුවඳ පමණ යක් ආඝ්‍රාණ ය කළාවූ පමණකිනු ත් දරුගැබ සිටීමය පුරුෂයක්ගේ ඉස්වක් භෝජනාදියෙහි අනාගතවූ අනුභවානු රාගය නිසා ත් දරුගැබ සිටීම ය, පුරුෂයන් පලන් වස්ත්‍රාභරණ පැලඳී මෙන් උපදනාවූ වස්ත්‍රානුරාගයෙනු ත් දරුගැබ සිටීම ය. මෙස ඍතුවෙහි බලාකාවන් ගබ්ගන්නා හෙයින් වන ඍතුහෙදානු රාගයෙනු ත් දරුගැබ සිටීම ය. පුරුෂයන්ගේ මධුර නාදයෙහි කළා වූ ශබ්දානුරාගයෙනු ත් දරුගැබ සිටීම ය. කියේ මැයි මැනෝ

මෛථුනං තනුසංසග්ගා-නාභ්‍යාමසන දස්සනං,
සායනං සවණං පානං-පටිග්ගාහං තථා උතු
නවමෙහ'නෙහි ඨානෙහි-ගබ්භං ගණ්හන්ති ඉත්ථියො-ති,

යනු හෙයින් භික්ෂුවරු ද එ කල අනඳ මහතෙරුන් වහන්සේගේ ශබ්දයෙහි අනුරාග කොට උන්වහන්සේ සේම එක් වැනි පන්සියයක් පුතුන් වැදූවාහු ය. එ කල බොහෝ දෙන රජ්ජුරුවන් කරා ගොස් “නුඹවහන්සේගේ භික්ෂුවරුන් මැද්දෙ දරුවෝ නුඹ වහන්සේ හා එක්වැනි නොවෙති අනඳ මහ තෙරුන් වහන්සේ හා එක්වැනිය ”යි කියා, මිථ්‍යාදෘෂ්ටීන්ගේ ලබ්ධි ගත්තෝ එකාවනු රජ්ජුරුවන් ලජ්ජා කරවති. රජ්ජුරුවෝ ද එයි සැක කොට බුදුන් කරා ගොස් එ පවත් කීහ. ආදිම කාගේ කරම කට ම කීයෙම් වේ ද යි වදාරා විනයෙහි කියාලූ ක්‍රමයෙන් රජ්ජුරුවන්ගේ ශංකාව දුරුකොට වදාළ සේක. එ වේලෙහි රජ්ජුරුවෝ තෙරුන්වහන්සේ කෙරෙහි පැහැද වැද ක්ෂමා කරවා “නුඹ වහන්සේ කෙරෙහි මා ශඞ්කා ඉපද වූ වරදට මෙම දඬුවම්”යි ඒ පන්සියයක් රජකුමරුවන් උන්වහන්සේට ම පාවාදී පුදා සියහ. ඒ රජ කුමරුවෝ පන් සියක් දෙන ම වැඩී අනඳ මහ තෙරුන් වහන්සේ කෙරේ ම මහණ ව රහත් වූහ.

තව දු: එක් දවසෙක කසි රටින් දහස් දහස් අගනා දහසක් පමණ කසීසළු රජ්ජුරුවන්ට ගෙණාහ රජ්ජුරුවෝ ඒ දහසක් සළු බලා සතුටු වී ඉන් පන්සියයක් සළු පන්සියයක් භික්ෂුවරුන්ට දුන්හ. ඔහු තමන් ලද ඒ සළු පන්සිය ය එදා අනඳ මහ තෙරුන් වහන්සේ අතින් බණ අසා සතුටු ව එතෙපිටම පුදා පරණ සළු හැඳ රජ්ජුරුවන් මේ නිමවන තැනට ගොසින් සිටියහ. රජ්ජුරුවෝ “තොපට මා ඊයේ දුන් සළු නො හැඳ පරණ සළු හැඳගෙණ හවු තැ”යි විචාළහ. භික්ෂුවරු “ස්වාමීනි! අපගේ අනඳ මහ තෙරුන් වහන්සේ අතින් බණ අසා ඔබට ධර්මපූජා කොට පිළිගන්වා පූමි හ”යි කීහ. රජ්ජුරුවෝ විසමන ව “ඒ පන්සියයක් සළු අනඳ මහ තෙරුන් වහන්සේ ම ඇරගත් සේක් දැ”යි විචාරා ‘ගැරගත් සේකැ”යි කී කල “ඒ කාංතනයෙන් මේ තෙක් සළු ලදින් අනඳ මහ තෙරුන් වහන්සේ පිළි වෙළඳම් කරණ සේක් දෝ හෝ යි සිතමි බොහෝ ලාභ පිළිගැන්ම තපස්වීවරුන්ට සුදුසු නො වේ”යි කියා තෙරුන් වහන්සේට කිපී මේ නිමවා අනානයෙහි අත දීග නො සිඳෙන තුරු විහාරයට දිවගෙණ ගොස් බුදුන් කරා නො ගොස් තෙරුන් වහන්සේගේ පිරිවෙණට වැද තෙරුන් වහන්සේ වැඳලා එකත් පස්ව හිඳ ‘ස්වාමීනි! අපගේ භික්ෂුවරු නුඹවහන්සේගෙන් බණ උගණීත්දැ දෑ”යි විචාළහ. තෙරුන් වහන්සේ “මහරජ උගත සුත්තක් උගණිති. ඇසිය සුත්තක් අසති”යි වදාළසේක.

තව ද: රජ්ජුරුවෝ මාහිමින් විචාරන්නාහු "කිමෙක්ද? ස්වාමීනි! ඒ ස්ත්‍රීහු තුඹවහන්සේගේ ඵාසු අඵාසු විචාරද් ද? හඳනා පොරෝනා චීවර සාටක දෙද් ද? නො දෙද් දැ"යි විචාළහ. එ වේලෙහි තෙරුන්වහන්සේ "දෙති මහරජ! ඊයේ සවස අප අතින් බණ අසා පන්සියයක් සළු දන් දුන්නාහුය"යි වදාළ සේක. හැම ම තුඹ වහන්සේ ම පිළිගත් සේක් දැයි විචාළහ. "මහරජ! පිළිගතිමි"යි වදාළ සේක. බුදුන් විසින් එක් භික්ෂු කෙණකුන්ට තුන් සිවුරෙක්ම අනුදන්නා ලද්දේ ද වේ ද, අතිරේක ලාභය ඉවසූයේ ඇයි දැ'යි විචාළහ. "මහරජ! බුදුන් විසින් අනුභොග වශයෙන් තුන් සිවුරක් ම අනුදන්නා ලද මය. කොතෙක් ලාභ ත් පිළිගැනීම වසයෙන් නො වළකන ලද ය. යම් යම් භික්ෂු කෙණකුන්ගේ උත්තරීතර බූ සාග ම්ගයෙන් දෙක්නාවුන්ගේ සිත් පමණ හා ලාභීන්ගේ සිත් පමණ ලාභ ලැබේ මය. මකාවාසී තිස්ස මහ තෙරුන් වහන්සේ සත් ඇඹිපිදී හිඳිද්දී ම එක ද කිරිබත් පාත්‍ර දහසක් පමණ ලත් සේක් ම ය. උන්වහන්සේ එ බත් පාත්‍ර දහස දහසක් දෙනා වහන්සේට දුන් සේක් ම ය. තව ද: උන්වහන්සේ ම එකදා දහසක් පළස් පිළිගත් සේක් ම ය. එසී දු දහසක් දෙනා වහන්සේට දන් දුන් සේක් ම ය. එසේ හෙයින් මම ද මේ සළු පන්සියය පිළිගෙණ මාලුම සියාබූ සගළු ඇති පන්සියයක් භික්ෂූන්ට මහරජ දන් දුනිමි"යි වදාළ සේක. එ වේලෙහි රජ්ජුරුවෝ අලුත් සිවුරු ලදින් මහලුව ගිය සගළු සිවුරු ඒ භික්ෂූහු කුමක් කෙරෙද් දැ යි විචාළහ.

මහරජ! පරණ සගළ තැවත කවු කොහොල් ගෙත්තම් කොට රඳ පොරෝනා සිවුරු කෙරෙති යි වදාළ සේක "පරණ පොරෝනා සිවුරු කුමක් කෙරෙද් දැ"යි විචාළහ. "මහරජ! ඒ නො තර තැන් කපා තර තැන් ගෙණ අඳනා සිවුරු කොට ගණිති" යි වදාළසේක. "පරණ අඳනා සිවුරු කුමක් කෙරෙද්දැ" යි විචාළහ. මහරජ! ඒ පසතුරුණු කොට ඇඳ ඇතිරිලි කොට අතුට ගණිති" යි වදාළ සේක. "පරණ ඇඳ ඇතිරිලි කුමක් කෙරෙද් දැ" යි විචාළහ. මහරජ! ඒ බුමුතුරුණු කොට සාංඝික ගල්ගෑ හොප් තැගු ගෙවල බිම අතුට ගණිති යි වදාළ සේක. පරණ බුමුතුරුණු කුමක් කෙරෙද් දැ යි විචාළහ. මහරජ ඒ පා පිස්නා කිසි කෙරෙති යි වදාළ සේක. පරණ පාපිස්නා බිසි කුමක් කෙරෙද් දැ යි විචාළහ. මහරජ ශ්‍රද්ධාවන්තයන් දීලූ දෙය අභාජනයේ වල දමා පීම සුදුසු නො වේ ම ය. එසේ හෙයින් ඔවුන්ට ම කුසල් වඩනු සඳහා

ඒ දිරා ගිය පාබිසි සිහින් කොට කපා සුණු විසුණු කොට මැටියෙහි ලා අනා සඟසතු ගෙවල බිත්ති තමා නන කරන්නේ වේ දැ යි වදාළ සේක. එ වේලෙහි රජ්ජුරුවෝ තෙරුන් වහන්සේ කෙරෙහි පැහැද බුදු සස්නෙහි අති ප්‍රසන්න ව "ස්වාමීනි! නුඹවහන්සේගේ බුදුසස්නට පැමිණියාවූ දන වස්තුව පාපිස්නා බිස්සෙකුත් වල නො යන නියාව ත් දන් දුන්නවුන්ට පින් බොහෝ වන නියාව ත් විශේෂයෙන් ම දැනිමි ම ය" යි තෙරුන් වහන්සේගේ ගුණ කියා නුඹවහන්සේ වැනි උත්තමයන්හු කෙරෙහි මා ශංකා ඉපැදවූ වරදට දඬුවම් කෙරෙමි"යි එම කෙත හිඳ රජගෙට යවා ගෙයි තුබූ පන්සියයක් සළු ත් ගෙන්වා ගෙණ මහ තෙරුන් වහන්සේට පුදා ගියහ.

මෙසේ ඒ අනඳ මහ තෙරුන් වහන්සේ බුදුසස්නෙහි චීවර ලාභීන් කෙරෙහි අග්‍ර සේක. මෙසේ එකි එකි දා පන්සියයක් පන් සියක් බැගින් පන්සියක් වාරයෙහි ම පන්සියයක් සළු පූජා ලත් සේක. සෙසු ලාභ මෙ තෙකැ යි ගණන් නැත. රජහුගේ සේනාව රජහු නැති ව ගොස් රටක් ජය ගත ත් අසුමල් රජහු ජය ගත්තැ යි කියා සේනාව කළාවූ යුද්ධ කීර්ත්තිය රජහට කියවූවා සේ, වෙල හස් වන් කල අසුවල් වැව හස්වතැ යි වැව ගුණ කියවූවා සේ, බුදුන් ශ්‍රාවකයන් ලද්දා වූ පූජා ද බුදුන් ම ලද්දා ම වන හෙයින් මෙසේ මෙසේ වූ සත්කාර ලත් හෙයිනු ත්, මෙසේ මෙසේ වූ සත්කාර ලැබීමට සුදුසු හෙයිනු ත්, මාගේ ස්වාමිදරු වූ බුදුරජාණෝ මේ මේ කාරණයෙනු දු අභීන් නම් වන සේක.

තව ද අසදෘශ මහා දානයට පූර්වභාගයෙහි ස්වාමිදරුවෝ බොහෝ දවසක් දෙවුරම් වෙහෙර වැස දනවු සැරිසරා වැඩ ගම් නියම්ගම් රාජධානියෙහි ඇවිද බොහෝ දිව්‍යමනුෂ්‍යයන්ට නිවන් වැඩ සදා 'සතර මහ දිවයින ඇවිද ස්වකීය ස්ථානයට පැමිණියා වූ සක්රුවතක් සේ' දිලිහි දිලිහී නැවත දෙවුරම් වෙහෙර ම අවුත් වන් සේක. එ වේලෙහි කොසොල් මහ රජ්ජුරුවෝ බුදුන් වැඩියහ යි අසා පෙර ගමන් කොට ගොස් බුදුන් ජේතවනාරාමයෙහි වඩාලා රජගෙට ගොස් "මාගේ ස්වාමි දරුවානන් මාගේ නුවරට මෙ තෙක් දවසින් වැඩි දා ප්‍රථම දානය මාගෙන් ම දෙනු කැමැත්තෙමි. සෙට දවසට කාගෙනු ත් දන් දීපිය නො හැක්කැ"යි නුවරට විධාන කොට රජගෙන් ම දන් සරහා නුවර මැද මඩුවක් ලා බුදුන් වඩා ගෙණ වුත් එහි දී වළඳවන්නාහු "මාගේ දානය බලන්නට එන්නේ ය" යි අනේපිඩු මහ සිටානන් ආදි වූ බොහෝ

දෙනා රැස්කොට තමන්ගේ දන ය ඔවුන් හැමදෙනාට පැලා බුදුපාමොක් සඟ පිරිස් වැළඳවූහ.

එ දවස් නුවර වැසියෝ හැමදෙන ම "රජ තමාගේ දන් අප හැමට පෑ ය. අපි ද ඔහු පරදවා සෙට දන් දෙම්හ"යි මන්ත්‍රණ ය කොට දන් සරහන්නාහු රජ්ජුරුවන් දුන්නා වූ දානයට දශ විධ වූ ගුණයෙන් වඩ වඩා මහදන් සරහා "අපගේ ද දන් බැලුව මැනැව"යි කියා රජ්ජුරුවන්ට පෑ දෙවන දා බුදුපාමොක් සඟ පිරිස වැළඳවූහ. එ දා රජ්ජුරුවෝ "මම නො පැරදී ම නුවර වැසියන් පරදවමි" යි සිතා ඒ දානයට විසි තිස් ගුණයෙකින් වඩා මහ දන් සරහා නුවර වැසියන්ට පෑ තුන් වන දා බුදු පාමොක් සඟ පිරිස් වැළඳවූහ.

නුවර වැසියෝ නො නැවත රජුගේ දානයට සැට සැත්තෑ ගුණයෙන් ‹ වඩා මහදන් සරහා රජහට පෑ සතර වන දා බුදුපාමොක් සඟ පිරිස් වැළඳවූහ රජ්ජුරුවෝ නුවර වැසියන් දුන් දානයට සියක් දහස් ගුණයෙන් වඩා මහදන් සරහා නුවර වැසියන්ට පෑ පස්වන දා බුදුපාමොක් සඟ පිරිස් වැළඳවූහ.

එදා ඒ දන ය දුටු නුවර වාසීහු "රජහු ජයගත නො හැක්කැ" යි අනෝන්‍යව මහ සිවාකාන් - විශාඛාවන් - ඔකුඹුල මල්ලිකාවන් ආදි වූ සැදැහැ ඇති සුබිතයන්ට කීහ. ඔහු හැමදෙන "අප මෙතෙක් දෙනා සමඟ වූ කල එක රජකු පරදවා පීම කවර ආශ්චර්යයෙක් ද, සෙට දුන් දනින් රජහු මූර්ඡා කරවා දන් දී අප පරද වන්ට පිඹි පලමම්හයි" වාසි කියා "ගෙයෙකින් බත් මාලුවක්, ගෙයෙකින් පල වැලයක්, ගෙයෙකින් පූපා'පූප වගීයක්, ගෙයෙකින් මධුර ඵාණී වගියක්, නො කඩ කොට තමන් තමන්ගේ ශක්ති පමණින් දන් ගෙණෙන්නේ ය" යි නියොග කළහ.

එ දා සත්කෙළක් මිනිසුන් මහත ඒ සා සැවැත් නුවර බුදුන්ට දානයක් නො ගෙණාවා වූ එක ද සත්ත්ව කෙණෙක් නැත. ඔවු නො'වුන් බලා සැදූ නැත ත් "රජු පරදවම්හ යි" යන ලොභයෙන් මිථ්‍යාදෘෂ්ටි ගතුවෝ ද දන් ගෙණාහු ම ය කැවුම් වගී මෙ තෙක් දහස් ලක්‍ෂ ගණිතැ යි ගණන් නැත පූපවගී මෙ තෙකැ යි පමණ නැත. ඵාණිත වගී මෙ තෙකැ යි පමණ නැත. සූප ව්‍යඤ්ජන මේ තෙක් ලක්‍ෂ ගණිතැ යි පමණ නැත බත් සැලවල් මෙ තෙක් දහස් ලක්‍ෂ ගණිතැ යි ගණන් නැත. දන් කඩාගන්නා අවකාශ

නො ම ඇත. දන් ගෙණාවුන් සිටිනා අවකාශ ද නො ම ඇත. පලඹූ ව ගෙණගිය දන් තබා බුදුන් පෙරම සිට දෙහොත් මුදුනෙහි තබාගෙණ "මාගේ ස්වාමිනි! මාගේ දන් වැළඳුම මැනැව. මාගේ දන් වැළඳුව මැනැවැ" යි ආරාධනා කරන්නා වූ ස්ත්‍රී පුරුෂයෝ මේ තෙක් දෙන ය යි ගණන් නැත. දන් වලුන් ඉස් මුදුනෙහි තබාගෙණ "අද අපගේ දන් වැළඳීම් නැත. අප දන් පිය ගත් දුක් සිත් ව යන වනැ" යි කිය කියා සුසුම් ලලා වලුන් හා සමග සිටිනා වූ ස්ත්‍රී-පුරුෂයෝ මෙ තෙකැ යි පමණ නැත. පිටි කුඹුරින් ගෙණෙන දන් කත්පිරින් කර තබාගෙණ මහ ඉඩියර නැති හෙයින් සතර වාසල් දොර ඇණිලා සිටිනා දායකයින්ගේ මෙ තෙක් දහස් ලක්‍ෂ ගණනැ යි පමණ දන්නෝ නැත. දන්වලුන් ගෙන්වා ගෙණ අවුදින් අනේපිඬු මහ සිටාණන් ආදි වූ බුදුන් කෙරෙහි වල්ලභ උපාසකවරුන් මැද වැද "ස්වාමිනි! මාගේ වස්තෙනක් බත් භොජ්‍යයක් බුදුන්ගේ පාත්‍රයට පිළිගන්වාපුව මැනැව. එහතන් ගේ පාත්‍රයට පිළිගන්වාපුව මැනැවැ" යි යාච්ඤා කරණ ස්ත්‍රී පුරුෂ යෝ මෙ තෙක් දහස් ගණනැ යි පමණ නැත.

එ දා රාත්‍රි ය මුළුල්ලෙහි නික්දුස් නො නිඳ, අනෙකාක ප්‍රකාර වූ සූප ව්‍යඤ්ජනයෙන් දන් පිසවා ගෙන්වාගෙණ තුමු තුමූ නො එක් අලංකාරයෙන් සැරසී අවුදින් විශාඛාවන් - බන්ධුල මල්ලිකාවන් ආදි වූ බුදුන් කෙරෙහි වල්ලභ වූ උපාසිකාවරුන් දැක දෙහොත් මුදුනෙහි තබාගෙණ "ස්වාමිනි! තුඹගේ වල්ලභ නම් දකිනත් මාගේ වස්තෙන් බත් භොජ්‍යයක්, මා පිසූ සූපව්‍යඤ්ජනයක්, මා පිසුවාසිත් ඛාද්‍යයක්, භොජ්‍යයක්, බුදුන් රනතුඩ වළඳවාලූ කලැ යි" යාච්ඤා කරන්නා වූ ස්ත්‍රීහු මෙ තෙක් දහසැ යි ගණන් නැත. අසාධාරණ වූ නො එක් උපකරණ රැස් කොට සැරසී දන් පිසම්හ යි වේලා ආසන්න කොට පියා වේලා වැරද යේ දෝ හෝ යි පින් ලොභයෙන් වහා වහා දන් ගෙණ දිවම්හ යි උපන් සන්තෝෂ යෙන් මහ පැකිළ කී දන් වලුන් මහ හෙළා බිඳ "මට වූ හෙණක් බලව" යි ඉසබඩ අත් ගසා නැවත "යගට පිසූ බත් ගෙණ එමි ය" යි සැදූ ශෝකයෙන් ඔබා කඳුළු වගුරුව වගුරුවා ආත ආතා නැස පට ගන්ව ගන්වා නැවත අා පස්සෙ ගෙය බලා දිවන ස්ත්‍රී-පුරුෂයෝ මෙ තෙක් හස් ගණනැ යි පමණ නැත.

එ දවස් වූ දන කොලාහලයට අතීත් උපමාවක් නො කියම් ම ය මාගේ ස්වාමි දරුවානන්ගේ අසාධාරණ දන පාරමිතාවෙන් ජනිත වූ මහ පින්ලියන මල් පිපී ගෙරාන් සළා දූන් දවසෙකැ යි

සිතමි. නොහොත් ඔබගේ මහා පුණ්‍ය නමැති වාපිකාව ඉතිර වහන පලසා දවසෙකැ යි සිතමි. නොහොත් ඔබගේ මහා පුණ්‍ය නමැති මෛඛ්‍යය රත්කොත් පලඳවාපු දවසෙකැ යි සිතමි. නොහොත් එ දා ඔබ දුන්නා වූ සප්තශතක මහාදානය ඵ වේලෙහි ම විපාක දෙන්ට තබාගත් දෝ හෝ යි සිතමි. මෙසේ වූ මහා දානසම්භාරය රැස්කොටපු වේලෙහි නුවර වැසියෝ රජ්ජුරුවන් කැඳවා මේ මහා දානය පැ සමත ද බුදුපාමොක් සඟ පිරිස් වැළඳවූහ.

රජ්ජුරුවෝ එ දන් බලන්නාහු තිම්ණවක් ලුක්ත නො ගී ඉතා විස්මයපත් ව "එසාස්හු විසින් බොහෝ දෙනකු ජයගත නො හැක්කේ ම ය" යි සිතා මෙසේ වූ දානයක් දෙන්නා තබා සිතිනු ත් සිතිය න් නො හැක්කේ ම ය යි නුවර වැසියන්ට පැරද රජගෙට ගොස් උකන් මහා ලජ්ජාවෙන් දවල් බතු ත් නො කා යහනට පැන හැකී ගෙට පිටිපැලා "අනිස, මේ හා රජ සැපතක් ඇති ව මාගේ සේවක වූ නුවර වාසීන්ට පැරද ගිය කල මට ජීවිතය ත් ඇයි ද, දඹදිව රජ්ජුරුවෝ ද මේ පවත් ඇසූ නම් මා රජකු කොට සිත ත් ද, මෙසේ වූ ලජ්ජාවක් බලා ත් අද ම මා මිය ගියේ නම් යෙහෙකැ" යි මහත් වූ රාජාභිමානය කොට කුමක් කෙරෙම් දෝ හෝ යි සිත සිතා සුසුම් ලලා යාන් මතුයෙහි ඔත්ත.

එ වේලෙහි මල්ලිකා දේවී රජ්ජුරුවන්ගේ ශ්‍රී යහන් ගබඩා මට මැද ශොකාතුර ම හොත් රජ්ජුරුවන් දැක "මේ කිමෙක් ද? දේවයෙනි! නුඹවහන්සේගේ ඉන්ද්‍රියයෝ ත් අද විකාරයට පැමිණි යහ. දහවල් මෙහෙ ත් නො තිමවන ලද. ශොකාතුර වන සේක් තැ"යි විචාළහ. රජ්ජුරුවෝ "මල්ලිකා දේවීනි! තෙපි මට වූ ලජ්ජා නො දනු දෑ? යි විචාළහ. නො දනිමි ස්වාමීනි. වදාල මැනැව යි කීහ. සදවසක් මුළුල්ලෙහි ඔවුනොවුන් පරදවා බුදුන්ට දන් දී, අද දින නුවර වැසියන්ට මා පැරද ගියේ වෙමි. අද දුන් දානට වඩා දන් දෙන්නා තබා සරිගස්වා දී ලීම ත් මට බැරි ය යි කීහ.

එ වේලෙහි මල්ලිකා දෙවි නුවර වැසියන් දන් දුන්නා වූ ක්‍රම විචාරා සිතා සි "අනිස, නුඹවහන්සේ රජ ව සිට සේවකයන්ට පැරද ගියෙමි යි කීම ඉතා නො යෙදෙයි. රජෙක් නම් කවර කාලෙක නුවර වැසියන්ට පැරද යේ ද? මාගේ නුවණ සෙට දවස් බැලුව මැනව. නුවර වැසියන් හැම දෙනා ම පරදවා මහ දන් දෙමාලා නුඹ ජයගන්වාලා දීලම්" යි කීහ.

එ බසට රජ්ජුරුවෝ සතුටු ව පැන නැගී යහන් මතුයෙහි හිඳ ගෙණ "කෙසේ දැ යි කියා බල" යි කිහ. මල්ලිකා දෙවී කියන් නාහු "නුවර වැසියන්ගේ නැති නැති දෙයින් පූජා කරම්හ. දඹදිව සල්ගස් නම් උයන්වල විනා සෙසු කොතැන නැත්තේ ම ය. එ සේ හෙයින් උයන් නම් තුඹ මුත් නුවර වැසියන්ගේ නැත. උය නින් සල්ගස් කප්පා ගෙන්වා ගෙණ විශාල වූ ශාල පාදපයන් සිටුවා මහ මඩුවක් කරවාලුව මැනැව. එ මඩුව විසිතුරු කොට රන්කම් කළ පිළියෙන් වියන් බඳවා එහි රන් තරු-රිදී තරු පෙළ පෙළ දවවා රන් තිර අදවා බිම් රත්කම් කළ බුමුතුරුණෙන් වසා මඩුව වටකොට අතරතුරෙහි අවකාශ හැර පන්සියයක් ආසන පණවා ලුව මැනව. සිසාරා එහි බුදුන් ප්‍රධාන වූ පන්සියයක් රහතන් වඩා හිඳුවාලුව මැනව. නමකට ඇතකු බැගින් පන්සියයක් ඇතුන් අතට පන්සියයක් සේසත් දී සිටුවාලුව මැනව. සර්වාභරණයෙන් සැරහුනා වූ බිසෝවරුන් දෙසිය පණසක් තෝරා රත්හල්වැම දී දෙදෙනකු වහන්සේට එක්කෙණකුන් පත් සලන සේ සිටුවාලුව මැනව. දෙදෙනකු වහන්සේට අතරතුරෙහි සලඳු කබා ගෙණ සර්වාභරණයෙන් සැරහුනා වූ පන්සියයක් බිසෝවරුන් දෙපා දිගු කොට ඉඳ රුවන් තෝඩු සල සලා ඇඟ සොලම සොලවා කත්තුරු ආදී වූ සුවඳ බඩු අඹරණ සේ විධාන කොට ලුව මැනම. තව ද පන්සියයක් බිසෝවරුන් ලසා වටනා ගෙලෙමුතුදම් පැලඳ ලසා වටනා කසී සළු හැඳ රුවන් මිණිකොඩොලින් සැරහී සිට පන්සියයක් තිලිපුල්මල් කලඹ ගෙණ මණ්ඩප මධ්‍යයෙහි සිටුවාලුව මැනව

තව ද: සත රන් ඔරු අටක් හෝ දහසයක් හෝ කරවා මණ්ඩප මධ්‍යයෙහි පිළිවෙළින් තබ්බවාලුව මැනව. තව ද: පන්සියයක් බිසෝවරුන් රුවන් පලඳනාවෙන් හා රත්සිපිකණින් දිව්‍යාඞ්ගනාවන් සේ සරහා සිටුවා ඇඹරු ඇඹරු සුවඳ පිඩු ගෙණ ගොස් ඒ සතරන් ඔරුවල ලන සේ නියොග කළ මැනම. ඒ ඔරුවල ලූ සුවඳ පන්සියයක් බිසෝවරු තිලිපුල්මල් කලඹින් ගලා සියලු මණ්ඩපයෙහි සුමඳ ගඳ විහිදුවන සේ නියොග කළ මැනව. මෙසේ අලඞ්කාර කොට බුදුන් වැළඳවූ කල දානය අසදෘශ වෙයි. නුවර වාසීන්ගේ සල්ගස් නැති හෙයින් ශාල මණ්ඩපයෙනු ත් ඔහු ම පරදිති. ඔවුන්ගේ ඇතුන් නැති හෙයිනු ත් පරදිති. සේසත් නැති හෙයිනු ත් පරදිති. උන්ගේ බිසෝවරුන් නැති හෙයිනු ත්

මේ අලඞ්කාරයට පරදිනී. මෙසේ දානය අසදෘශ කොට දී ජයගත මැනැවැ" යි කීහ.

එ වේලෙහි රජ්ජුරුවෝ "තොප කී උපදෙස ඉතා මැනැවැ" යි ගිවිස දෙවන දා බිසොවුන් කිවා සේ ම පූජාව සරහා බුදුපාමොක් සඟ පිරිස් පවරා ගෙණවුත් ඒ ඒ ආසනවල හිඳුවා ඇම්දෙනා වහන්සේට සේසත් ගන්වා ඇතුන් සිටුවන වේලෙහි සාරසිය නවානූ වක් පමණ ඇතුන් කීල කොට එක් කෙණකුන් වහන්සේට හිසට සේසත් ගන්නා ඇතකු නැති හෙයින් රජ්ජුරුවෝ නො සතුටු ව මල්ලිකා දේවීන් සිටි තෙනට ගොස් "දේවීනි! තොප කිවා වූ ක්‍රමයෙන් සියලු සංවිධාන කොටලීමි. සියල්ලෙන් ම අඩුවෙක් නැත. එක් කෙණකුන් වහන්සේට සේසත් ගන්නා ඇතෙක් නැතැ" යි කීහ.

එ බසට බිසොවු සිතා සී "අනීශ, තුඹ වැනි රජකුගේ පන්සියයක් පමණ ඇත්තු නැද්ද" යි විචාළහ. දේවීනි! මගේ හස්ති සේනාව දහස් ගණන. ඔහු මහා චණ්ඩපරුෂයහ. භික්ෂූන්වහන්සේ දැකලා මෙරමා මාතය සේ නො රඳා ගුගුරාගෙණ දිවන්නාහු ය. එසේ හෙයින් පෝසත් ඇතකු සොයාගත නො හැක්කැ යි කීහ. එ බසට මල්ලිකා දේවි නුවණින් සිතාගෙණ "එසේ වී නම් මොළ ඇතකු ම ගෙන්නුව මැනැව. ඔහු සිටුවාලන තෙනක් මම දනිමි. අපගේ අඞ්ගුලිමාල මහ තෙරුන් වහන්සේ දුටු කල මද නැඟී ඇත්තු බා වෙවුලා යෙති. සිඟා වඩනා කල මග වේ මැද කෝ වේ වල දී සම්හර දවසෙක මද නැඟී ඇත්තු උන්වහන්සේ හා එක තැන හසුව ගිය කල භයින් වෙවුලා පියති. බෙටි ත් සලා පියති. එසේ හෙයින් ඔබ ලඟ මොළ ඇතකු සිටුවාලුව මැනැවැ" යි කීහ.

එ වේලෙහි රජ්ජුරුවෝ ඒ උපදෙසයම ඉතා සතුටු ම ඇතරු වන් ලවා මොළ ඇතකු බැඳුම පිටින් ගෙන්වා ගෙණ ඔහු අතට සේසතක් දීලා අඞ්ගුලිමාල මහ තෙරුන් වහන්සේ පිටි පසුයෙහි සිටුවාලා මිනිස්සු දුරුව ගිය. තෙරුන් වහන්සේ තර බාගෙණ වැඩ හිඳ ඔහු නො බලා බත් වළඳා වදාරණ සේක් ම ය. ඒ මොළ ඇත් තෙරුන් වහන්සේ තරා පැමිණ සපීරාජයකු දුටු මැඩි යකු සේ, බිළාලයකු දුටු ඇඹිට්ටිල්ලකු සේ, දිවියකු තරා පැමිණ ගිය මුව පොල්ලකු සේ, සිංහයකු දුටු ඇත්පොව්වකු සේ, ඔබ දැක භයින් වෙවුලා නැඹුරු ව ගෙණ වක ගසා වාලධිය අමුඩු හස්සේ

සඟවා ගෙණ, කන්පත් දෙක කපොලාන්තයෙහි එලා ගෙණ, ඇස දල්වා බලන්ට භය ඇති ව, දෑස පියා ගෙණ ශ්‍රද්ධාසම්පන්න හුදියකු සේ හිසට කුඹය අල්වා ගෙණ මාගේ ස්වාමිදරුවාණන්ගේ ගුණ ගත් අතැවැසියන් දුටු මිතැ තුන් මෙසේ ශික්ෂිත මක කල ඔබ දුටු පාරිලෙය්‍ය නම් වල් ඇතු තුන් මසක් මුළුල්ලෙහි ඔබට අභියුක්ත කම් කෙළේ කවර නම් ආශ්චර්‍ය්‍යයෙකැ යි කියම් ද? ඔබ දුටු ගිරි මෙවුලා නම් මතැතු මහහඬින් ගුගුරුවා පලාගියේ යි නම් පෙළ හරෙකැ යි කියම් ද?

මෙසේ ඒ ඇතු උන්වහන්සේට කුඹය අල්වා ගෙණ සිටිනා නෑව භාවය බලා සාධුකාර දෙන්නෝ දහස් ගණන්හ. ඒ සා මහත් පූජාමෙහි මෙයට වඩනා අතික් ආශ්චර්‍ය්‍යයෙක් නො වී ය මේ ඇතු සිව්ගත්තා වූ ස්වභාවයෙන් ම නුවර වැඩියෝ රජ්ජුරුවන්ට පැරද ගියහ. සෙසු දවසෙක එසේ වූ පෙළහැරෙක් නො වූයේ ය.

මේ අඞ්ගුලිමාල මහතෙරුන් වහන්සේ පූර්වජාතියෙක ගිලන් භික්ෂු කෙණකුන් වහන්සේ දෑක මිරිස්-සිඟුරු-මඟපුල් ආදි වූ කුළුබඩු බෙහෙත් මිඩුවක් දන් දුන්සේක. තව ද: එක් ජාතියෙක ගිතෙලබලක් හා පොරෝවක් දන් දුන්සේක. තව ද: එක් ජාතියෙක හැලින් පිඩා ගන්නා වූ භික්ෂු කෙණකුන් වහන්සේ දෑක පොරෝනා පලසක් දන් දුන් සේක. මේ කුශල මූලයෙන් මේ සා වූ තෙජසක් ඇති සේකැ යි දතයුතු.

මෙසේ උදාර වූ පූජාවෙන් ඒ සත්වන දා රජ්ජුරුවෝ නුවර වාසීන් පරදවා බුදුපාමොක් සඟපිරිස් වැළඳ වූහ. වළඳා අනන්තයෙහි බුදුන් කරා ගොස් බුදුන් වැඳ සිට "ස්වාමීනි! මාගේ මේ පූජාවෙහි මෙ තෙතට රැස් වූ සියලු කප්පිය භාණ්ඩ වේව යි අකප්පිය භාණ්ඩ වේව යි මේ සියල්ල නුඹ වහන්සේට ම දින්මි" යි කියා සියල්ල ම පූජා කළහ. එ දවස් රජ්ජුරුවන් කළ පූජාව සඞ්ඛ්‍යා වශයෙන් තුදුස් කෙළක් පමණ ධනය වී ය. බුදුන්ට පැණවූ බුද්ධාසන ය, බුදුන් පිටට ලාලූ රුවන්මය වූ පිටාටුම ය, බුදුන් සිරසට වැඩූ ඡත්‍ර ය, ශ්‍රීපාද දෙක තබා ලූ රුවන්මය වූ පාදපීඨ සඟලය ය යන මේ සතර අනගි වී ය. මෙසේ වූ දන පූජාමක් සදෘශ කොට දෙවනුව දී ලිය හෙන්නා වූ අන්‍ය සත්වයෙක් නැත් ම ය. එසේ හෙයින් මේ දානය අසදෘශ දාන නම් වෙයි.



අනඳමහ තෙරුන් වහන්සේ විශාලාමහ නුවරට පිරිත් පැන් ඉස
සෙත සැලසීම. 443 පිට බලන්න. (27-28)

බුදුකෙනෙකුන්ට එක වාරයෙක මුත් දෙවාරයෙක නො ලැබේ ම ය. හැම බුදුන් ම ලබන්නා වූ මේ අසදෘශ දාන ය හැමකාලයෙහි සත්‍රියක ම සංවිධාන කිරීම එයි ත් ඒකාන්ත ධර්මයෙක් ම ය.

මෙසේ අනඳ මහ තෙරුන් වහන්සේ විසින් පස් විසි හවුරුද්දක් මුළුල්ලෙහි දවස්පතා කරණ ලද අප්‍රමාණ වූ අග්‍ර වූ උපස්ථාන පූජා ය, ආනන්ද මහා බොධියට නුවර වැසියන් දවස්පතා ම කරණ ලද අප්‍රමාණ වූ පාරිභාගික පූජා ය, බන්ධුල මල්ලිකාවන් දිවි පමණින් කරණ ලද අප්‍රමාණ වූ අති ශ්‍රද්ධා පූජා ය, කොසොල් රජ්ජුරුවන් විසින් කරණ ලද අති විශ්වාස පූජා ය, කෝසල මල්ලිකාවන් විසින් කරණ ලද අති ශ්‍රද්ධා පූජා ය, උත්පල ගන්ධ නම් මහතෙරුන් වහන්සේ විසින් කරණ ලද අසාධාරණ වූ, ප්‍රතිපත්ති පූජා ය, තව ද එම කොසොල් රජ්ජුරුවන් විසින් අනඳ මහ තෙරුන් වහන්සේට කරණ ලද සාවක දාන පූජා ය, එම කොසොල් රජ්ජුරුවන් විසින් අනගි වස්තු සතරක් හා තුදුස් කෙළක් ධන පරිත්‍යාගයෙන් කරණ ලද අසදෘශ මහදාන පූජා ය යි සඞ්ඛ්‍යාවක් කොට ගත නො හැකි හෙයින් අසඞ්ඛ්‍යපථයට පැන නැංගා වූ බොහෝ පූජාවන් ලත් හෙයිනු ත්, එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, හුදු කරුණාවෙන් මවාලූ රුවක් වැනි වූ හුදු මුදිතාවෙන් මවාලූ රුවක් වැනි වූ, හුදු මෛත්‍රියෙන් මවාලූ රුවක් වැනි වූ, හුදු ශීලයෙන් මවාලූ රුවක් වැනි වූ, හුදු ක්ෂාන්තියෙන් මවාලූ රුවක් වැනි වූ, හුදු ප්‍රඥාවෙන් මවාලූ රුවක් වැනි වූ, හුදු සධාමීයෙන් මවාලූ රුවක් වැනි වූ, හුදු සමාධියෙන් මවාලූ රුවක් වැනි වූ, හුදු වීර්යයෙන් මවාලූ රුවක් වැනි වූ, හුදු නිමණින් මවාලූ රුවක් වැනි වූ, මාගේ ම ස්වාමිදරු වූ, මාගේ ම ගුරු වූ, මාගේ ම කල්‍යාණ මිත්‍ර වූ, මට ම ශරණ වූ, මට ම පිහිට වූ, මාගේ ම බුදුරජාණෝ මේ මේ කාරණයෙනු දු අර්හත් නම් වන සේක.

එසේ හෙයින් කියන ලදුයේ මැයි:

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං ති.

මේ පූජාවලියෙහි
අප බුදුන් සැවැත් නුවර දී ම කොසොල් රජහුගෙන් ලද
අසදෘශ මහා දාන පූජා කථා නම් වූ
විසි වන පරිච්ඡේදය නිමි.

එක් විසි වන පරිච්ඡේදය

තව ද: අප බුදුන් විශාලා මහනුවර දී ලිච්ඡවි රජුන්ගෙන් ලද ගඞ්ගාරොහණ පූජා කථා නම් කවරහ? යත්; මෙ එක පිළිවෙළ කථාව යැ:

ගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුගේ අගමෙහෙසින් බිසොවුන් කුස දරු ගැබෙක් වී ය. එ බිසොවු කුස බර වූ සේ දැන රජහට කීහ. රජ්ජුරුවෝ දරුගැබ මඟුල් කොට ගැබ පෙරහර තබා දුන්හ. මෙසේ මහත් වූ සත්කාර ලදින් දසමසක් ගිය කල දවසෙක බිසොවුන් අලුයම් වේලෙහි ලාරසයෙන් තෙත් වූ බඳු වද මල් දමක් සේ ඉතා සුරත වූ මස් වැදැල්ලක් වැදූහ. සෙසු බිසෝවරු රන් පිළිම සේ දරුවන් වදති. අග මෙහෙසින් බිසොවු මස් වැදැල්ලක් වැදූහ යි රජු ඉදිරියෙහි සිට කියා බොහෝ දෙන මාගේ නුගුණ කියන්නාහු ය යි බිසොවු ලජ්ජා ඇති ව එ මස් වැදැල්ල තවමූ සැළියෙක ලා පිධානයෙකින් වසා බැඳ රාජමුද්‍රිකාවෙන් අස් ඔබා දිය නො වදිනා සේ ලාකඩින් මේ කොට ගඟ දියෙහි ලැවූහ.

එ වේලෙහි එ දරුවන්ගේ පින්බලයෙන් ගඟ අරක් ගත් දෙවියෝ රළ පහරින් වේව යි, දණ්ඩකින් ගලෙකින් වේව යි, සලාවෙකින් වේව යි ඒ සැළට අනතරායක් විය නො දී ආරක්ෂා ගෙණ “බරණැස් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසොවුන් දරුවෝ ය”යි රන්පතෙහි දැසිඟුලෙන් ලියා සැළමතුපිට බැඳ තුබූහ. ඉක්බිත්තෙන් මෙසේ ඒ භාජනය නො නැසීම දෙවියන්ගේ ආරක්ෂාවෙන් යටගං බලා යෙයි.

එ සමයෙහි එක් තාපස කෙනෙක් ගවපාලයන් වසන ගමක් නිසා ඒ ගංබඩ පන්සලක් කරවා එහි වාසය කෙරෙති. ඒ තාපසයෝ එ දා උදෑසන දැවිටි කන නිසා ගංතොටට බැස ගං මධ්‍යයෙහි එන ඒ සැළ දැක දියෙන් යන පාංශුකූලයකැ යි දිය පිහිනා ගෙණ ගොස් සැළ අල්වා ගෙණ බලා රන්පත ලියා තුබූ අකුරු දැක හස් කඩා යට තුබූ මස්වැදැල්ල දැක “මේ දරුමලයක, මේ කුණප කණ්ඩයෙකු ත් නැත. බරණැස් රජහුගේ දරුවෝ ය යි පත ලියා තුබුයේ; රැක තබමි”යි සිතාලා පන්සලට ගෙණ ගොස් සතා සතුන් නො වදනා සේ කොණෙක කොට තුබූහ. දවසින් දවස බල ත් බලත්

පසළොස් දවසක් ගිය කල ඒ එක මස්වැදැල්ල දෙකක්ව බෙදී ගියේ. නැවත පසළොස් දවසක් ගිය කල එකී එකී මස් කැටියෙහි දෙ අත ය, දෙ පය ය, ඉස ය යි පස්පළුක් සේ පෙණීලා පසුව දෙතුන් දවසක් ගිය කල ඉතා සශී දූස ය, දෙනාසා සිදුරු ය, දෙකන් සිදුරු ය දෙකණ ය, මුඛ ය යන අවයව හා මලවටත් දිගවටත් නව දොර පෙණී, විසි ඇඟිලි විසි නිය ආදි වූ සටහන් අවගෙණ රන්පිළිම යක්සේ කුමරියක හා කුමරුවකු හා දෙදෙනෙක් වූහ

එ දරුවෝ දෙදෙනා දුටු වේලෙහි තාපසයන්ට දරුප්‍රේම.නට ගත. එ කෙණෙහි තාපසයන් දෑත දස ඇඟිල්ලෙන් කිර ඕරුවැගී රෙත්තම පවන් ගත. දෑගිලි දරුවන් මුඛයෙහි තබාලූ වේලෙහි මවුන් තනය එලිගෙණ කිරි බොන දරුවන් සේ එ දරු දෙදෙන තාපසයන් දෑත ඔවුනොවුන් පරයා එලිගෙණ තලු ගස ගසා කිරි බොන්නාහු ය. දරුවන්ගේ පිණීන් තාපසයන්ට ද එතැන් පටන් ඛාද්‍ය භොජ්‍ය සුලභතාව ලැබේ මය. මෙසේ වැඩෙන දරුවන් අනුභව කල යම් ම භෝජනයෙක් දූවාන කරඹුයෙක තුබූ වස්තුවක් සේ බබයට පෙණේ ම ය. මෙසේ එ දරුවෝ අනුභව කල කල ද පිටතට පෙණෙන හෙයින් ඡවි නැතියාහවැනී යාහුනුයි කියාත් ලිච්ඡවි නම් වෙති. ඔවුනොවුන් හා වෙනසක් නැතිව සමානවූ ඡවි වණී ඇත්තාහු ත්‍රු යි කියාත් ලිච්ඡවි කුමරුවෝ නම් වෙති.

තාපසයෝ මෙසේ ඒ ලිච්ඡවි රජ දරුවන් වඩන්නාහු පූර්වදින් භාගයෙහි ගමකට වැද උදෑසන හිරි රසව මුණලා ගෙණ ගොස් සිගති. පශ්චරු භාගයෙහි නැවත එම හිරි රසව මුණ ලා දරුවන් නිසා ඇවිද බොහෝ දුක් ගණිති. මෙසේ තාපසයන් දමිස් පතා සූය්‍යී තාපයෙන් තැවි තැවී දරුවන් නිසා ඇවිදින්නා දුක් දූත එ ගම් ගවපාලයෝ කියන්නාහු "ස්වාමීනි! තපස්වීවරුන්ට දරුවන් වැඩීම නම ඉතා පලිරොධය. එ දරුවන් අපට පාවා දුන මැනැව. අපි උන් වඩමහ තුඹවහන්සේ මහණ ධම් පුරාගත මැනැවැ"යි කීහ. තාපසයෝ මැනැවැයි ගිවිස්සාහ.

ගවපාලයෝ දෙවන දා ගම පටන් පන්සලට මග බෙර ඇසක් සේ තනා සුවඳ මල් ඉස ධවජ පතාක නගා පූජා කරවාගෙණ බොහෝ දෙනා පන්සලට අවුදින් "දරුවන් අපට පාවා දුන මැනැවැ"යි කීහ. තාපසයෝ "මාගේ දරුවෝ මහ පින් ඇතියාහ. ආදරයෙන් වඩව, වැඩුනු කල ත් මේ කුමරුවාට අනික් කුමරියක් පාවා නො දෙව, මෙ කුමරිය අනික් කුමරුවකුහට පාවා නො දෙව

දෙන්නා ඔවුනොවුන් හා ආවාහ විවාහ කරව. පසුව කිරි-යොද-දී-තෙල්-මෙවඩරු යන පස්ගෝරසයෙන් තොප තොපගේ රජ්ජුරුමින් පහදවාගෙණ බිමක් ලවා ගෙණ එහි ගමක් කරවා තෙලෙ කුමරුවා රජ කොට ගණුව" යි කියා දරු දෙදෙනා පාවා දුන්හ. ඔහු මැනැවැ යි ගිවිස එ දරු දෙදෙනා ගෙණ ගොස් වැඩූහ.

එ කුමරුවෝ වැඩි කෙලනා කල සෙසු දරුවන්ට අතින් පයින් ගසාලති. ඔහු හඩ හඩා තමන් තමන් ගෙවලව යෙති. හඩවුනැ යි මවුන් පියන් විචාළ කල එ දරුවෝ "මවුන් පියන් නැති ව තාපස යකු වැඩූ නිප්පිතික කොල්ලෝ අප මැරූහ" යි කියති. එ කල උන් උන්ගේ දෙමවුපියෝ "මේ කොල්ලෝ අප දරුවන් මරති. අප දරුවන් තයති. අප දරුවන්ට දුක් දෙති. එසේ හෙයින් මේ කොල්ලෝ වජ්ජිතකයන, වජ්ජිතකයන" යි කියති ඒ කාරණයෙන් එ නුවර වජ්ජිත නම් ව පසුව තුන්සියක් යොදුන් තැන් වජ්ජිත රට ය යි මේ නමින් ප්‍රසිද්ධ වි ය.

එ කල එහි නුවරක් තිමවා එ කුමරුවා සොළොස් හැවිරිදි කල රජ කොට එ කුමරිය අගමෙහෙසින් කළහ. ඒ ලිච්ඡවීන් දෙදෙනා මෙසේ ප්‍රිය වාසයෙන් වසන කල ප්‍රථම සංවාසයෙහි ම ඒ ලිච්ඡවි කුමාරිකා දරු ගබ් ලදින් දුවක හා පුතකු එකවිට ම වැදූහ. මෙසේ ම දූන් පුතුන් බැගින් යම්හ දරුවන් සොළොස් වාරයෙක දෙතිස් දෙනකු වැදූහ. මෙසේ ම ක්‍රම ක්‍රමයෙන් සොළොස් සොළොස් යමක දරුවන් බැගින් දරුමුණුබුරෝ ත් වැදූහ. මෙසේ ඒ වංශය බොහෝ වූයේ ගම අවකාශ නැති හෙයින් මහත් මහත් ව ගව්වක් සා වි ය. දෙවන වාරයෙහි දෙගව්වක් සා වි ය. තුන්වන වාරයෙහි තුන්ගව්වක් පමණ වටා මහ පවුරු ලා මහරජ නුවර වි ය. මෙසේ කලින් කල විශාල විශාලව ගිය හෙයින් විශාලා මහ නුවර ය යි මෙ නමින් ප්‍රසිඩ වී ය. ඒ රජ දරුවෝ ද යට කී ක්‍රමයෙන් ලිච්ඡවි රජදරුවෝ ය යි මෙ නමින් ප්‍රසිඩ වූ හ. ඒ රජදරුවෝ තාපසයන් පන්සල වැඩී උත්පත්ති වූ කාරණයෙන් ද, එක මැතියන් වැදූ හෙයින් ද, අන්‍ය ජාතියක් හා ජාති සම්භේදයක් නැති හෙයින් ද, ඔවුනොවුන් කෙරෙහි ද, ප්‍රේම බහුල ව වාදයක් ම නැති ව සාදරයෙන් ම රාජ්‍ය ය කෙරෙති.

අප බුදුන් සමයෙහි මේ විශාලා මහ නුවර දිව්‍යපුරයක් සේ සමෘද්ධ වි ය. ඉතා ජනඝනන වි ය. සම්පත්තීන් අනූන වි ය. කෙළි නළුයෙන් උත්සන්න වි ය. සතාසා මැදි රන් කැටපතක් බඳු වූ ජිවි

වණ්ණ ඇති දිව්‍ය සමාන ලිච්ඡවි රජ දරුවෝ ම සත් දහස් සත්සිය සත්දෙනෙක් වෙසෙති. යුවරජදරුවෝ ම සත් දහස් සත්සිය සත් දෙනෙක් වෙසෙති. සෙනාපති ම සත් දහස් සත්සිය සත්දෙනෙක. භාණ්ඩාගාරිකයෝ ම සත් දහස් සත්සිය සත්දෙනෙක් වෙසෙති. රජ ගෙවල් ම සත් දහස් සත්සිය සතෙක, කූටාගාර ශාලා ම සත් දහස් සත්සිය සතෙක. පවුරු සත් දහස් සත්සිය සතෙක. මෙසේ ඒ නුවර සියල්ලෙන් ඉතා සමෘද්ධ වි ය. මෙතෙක් රජදරුවෝ ම මාරයෙන් වාරයට රාජ්‍යය කෙරෙති. ඒ ලිච්ඡවි රජදරුවන්ගේ රූපශ්‍රී හා කරම් රූ ඇතියෝ මිනිස් ලොව නැත්ම ය. තවුතිසා වැසි දෙවියන් නො හඳුනන්නවුන් ලිච්ඡවි රජුන් බලා හැඳින ගන්නේ ය යි බුදුන් විසිනුත් වදාරණ ලදම ය.

මෙසේ ඒ නුවර දෙව්ලොවින් බට භාගයක් වැනි වී ය. මිනැතුන්ගේ ක්‍රීඩානාදයෙන් හා, අශ්වයන්ගේ හෙෂාරවයෙන් හා, රථවල චක්‍ර නාදයෙන් හා, තළවත් ගානා වීණා වාද්‍යනාදයෙන් හා, මුහුද ගඩ සේ ඝොෂා ඇති මහා භෙරිනාදයෙන් හා, තුඩ තබා පිඹිනා දහස් ගණන් ජයසක් නාදයෙන් හා, දහස් ගණන් වංශීන් විසින් සංගීත කරණ ලද මංගලනාදයෙන් හා, දහස් ගණන් පෙළ පෙළ දී ගසන තාලනාදයෙන් හා, කම්! බොම්! යන ශබ්දයෙන් හා මේ දශවිධවූ ඝොෂාවෙන් ම ඒ නුවර විශාල වූ හෙයිනු ත් විශාලා මහ නුවර ය යි නම ලද් දේ හෝ යි කියා ත් සිතමි. විශෙෂ වූ විශාල ශාලාවෙන් අලංකෘත වූ හෙයිනු ත් විශාලා නමැ යි කියාත් සිතමි. දහස් ගණන් උද්‍යානවල විශාල වූ ශාල වෘක්ෂරාජ සමූහයන් විරාජමාන හෙයිනු ත් විශාලා නමී යි සිතමි.

මෙසේ සමෘද්ධ වූ ඒ විශාලා මහ නුවර කලෙකින් මාගේ ස්වාමි දරු වූ බුදුරජාණන් "සියලු සංස්කාර ධර්මයෝ ම ඒ ඒ ආකාරයෙන් නො පවත්නාහු ය. අනිත්‍යයහ"යි වදාරන්නා වූ අවවාද වචනය සත්‍යම ය යි දෙස් කියවන්නා සේ ඒ විශාලා මහ නුවර ද රොග භය දුර්භික්ෂ භය, අමනුෂ්‍ය භය යි තුන් භයකින් විශාල වි ය. ඒ කෙසේ දැ? යත්;

පළමු ව වැසි නැති ව වැව් අමුණුවල දිය සිඳී ගොයම් මියැ සාය ගසා බැවින් දුර්භික්ෂ වි ය. බත් නො ලබන දිළිඳු සත්ත්වයෝ පළමු පළමු ව මියන්නට පටන් ගත්හ. මළ මළ මිනී සම්භාර කෙණ

තුන් දවසී, මිනී බොහෝ ව ගෙණ යන හෙයින් හැම දවාගෙන නො හි බොටුයෙහි වැල්ලලා පිවතට අදිති. තව ද: මිනී බොහෝව ගෙණ යත හෙයින් එසේ ත් ඇදගත නො හී ගේකුසින් පිවත් කොට වතුකන් මිදුල්කනට අදිති. තව ද: මියන්නවුන් බොහෝ වන හෙයින් පිටිවතුත් කොට ගත නො හී ගෙන් භාගයෙක මළ මිනී ඔවිති. එක් භාගයෙක ලෙඩ ම හැදින් නැගී'සිටි ය නො හෙ නුවෝ හොවිති. මළ මිනි අදින්නෝ නො ම ඇත. ලෙඩ වූවන් බලනුවෝ නො ම ඇත. පැනට කඩන දරුවන් කට පැන් හෙලා පිය නො හී තමන් තමන්ගේ ව්‍යාධි සඳහන් නො කොට දරු ශෝකයෙන් හොත් පොළ ගෙව අඩන්නාවූ මවුපියෝ මේ තෙක් දහස් ගණනැ යි ගණන් නැත. ජීවිත සමාන ප්‍රේම ඇති පුරුෂ යන් පැන් බොමිහයි හඩන වේලෙහි නොක් පළින් නැගී සිට උන් කට පැන් හෙලා ලිය නො හී තමන් තමන්ගේ ව්‍යාධියට වඩා ප්‍රිය පුරුෂයන් නො බලත්නා වූ ශෝක ඉවසාගත නො හී තොඳිරි ගගා හඩන ස්ත්‍රීන් මෙතෙක් දහස් ගණනැ යි ගණන් නැත. ස්ත්‍රීන් පැනට හඩන වේලෙහි උන් කට පැන් හෙළාලිය නො හී එ ම ශෝකයෙන් ම මහ හඬින් හඩ හඬා වැද හෝනා පුරුෂයෝ මෙතෙක් දහස් ගණනැ යි ගණන් නැත මෙසේ ඒ මිනී කුණුපය නිසා ගිනි පිට ගිනී දුමුමාසේ අහිවාතක නම් රෝගයෙක් උපන.

ඒ රෝගයෙන් පළමු ව ගෙයි වසන සූනෝ මියෙති. දෙවනු ව බල්ලෝ බලල්ලු මියෙති. තුන්වනු ව මනුෂ්‍යයෝ මියෙති. ඒ රෝගයෙන් මියන කල සමහරු නො ලෙඩුන් සේ දෙඩ දෙඩා වැද හෙව මියෙති. සමහරු ප්‍රිය කථා කොට කොට ම හිඳ මියෙති. සමහරු සිනා සිසී කෙල කෙළ ම සිට ලා මිය වැටී යෙති. සමහරු යම්න් එම්න් සිට මියෙති. යම සේ සපියන් විෂ වාතය වැද ගත් කෙණෙහි ම මිනුෂ්‍යයෝ විෂ මූර්ඡාවෙන් වනා මියෙද් ද, එසේ හෙයින් ම මේ රෝග ය ද බල බලා සිටිය දී ම මැරෙණ හෙයින් අහිවාතක නම් විය. ඒ මිනීමස් කනු සඳහා ඒ ඒ දිගින් යක්ෂයෝ දිම අවුදින් මුළු නුවර ගලාගෙණ දිවි තුබු තුබූ මිනිසුන් සල්ව සල්වා කන්නට පටන් ගත්හ.

මෙසේ දුර්භික්ෂ රෝග අමනුෂ්‍ය ය යි යන තුන් භයින් සියලු රට හා නුවර වල් නස්නට පටන්ගත් සමයෙහි නො මළ, නො මළ මනුෂ්‍යයෝ හැම්දෙන ම රජ ම මරණ භයින් වෙවුලා "කොල! මේ කිමෙක් ද" යි කියා කියා අඹු දරු නැති ශෝකයෙන් මැසි වැනී රජ්ජුරුවන් කරා ගොස් "රජ්ජුරුවෙනි! තොපගේ නුවර තුන්

භයෙක් උපැද දුන් එක වලහම් ගෙයක් සේ විය. තොපගේ සත් මුත්තක් පරම්පරායෙක මේ නුවර මෙසේ වූ භයෙක් නැත. මෙසේ වූ ශෝකයෙක් නො වී ය. මෙසේ වූ වියෝ දුක්ඛයෙක් නො වී ය. අපට මේ භය මහා සන්සිඳුවා ලුව මැනැවැ"යි කියා හඬා හූකහ.

එ වේලෙහි රජ්ජුරුවෝ සියලු අමාත්‍යයන් සන්ථාගාරයට රැස්කොට "මා කරණ අධර්මයක් ඇත් නම් හැමදෙන ම පරීක්‍ෂා කොට මට කියව"යි නියෝග කළහ. එ කල නුවර වැසියෝ නො එක් සේ පරීක්‍ෂාකොට රජුගේ කිසි අධර්මිෂ්ඨකමක් නො දැක 'ස්වාමිනි! තුඹවහන්සේගේ කිසි ම අමැදහත් කමක් නුදුටුම්හ. මෙ භය කෙසේ සන්හිඳේ දැ"යි කීහ. සමහර කෙණෙක් සෘද්ධි වන්ත වූ කාශ්‍යප කෙණකුන් වඩා ගෙණ'වුත් පූජා කළ කල භය සන්හිඳෙයි කීහ. සෘද්ධිවන්තයෝ නම් කවුරු දැ යි විචාළහ.

එ කල්හි දඹදිව "අපි බුදුම්හ, අපි බුදුම්හ"යි කිය කියා මිථ්‍යා දෘෂ්ටි ගෙණ ලෝමැසියන් මුහුණ වැලි ගසන්නා සේ වඤ්චාවෙන් ඇවිඳිනා වූ පූරණ කාශ්‍යපය, මක්ඛලි ගෝශාලය, අජිත කෙශ කම්බලය, කකුධ කාත්‍යායනය, සඤ්ජය බෙල්ලට්ඨි පුත්‍රය නිගණ්ඨ නාථපුත්‍රය යි ලොව ගසා කා ඇවිදිනාවූ සොරහු සදෙනෙක් ඇත. ගිනි අඟුරෙහි රස දන්නා ඔටු කුකුළන් සේ උන් උන්ගේ ගුණ ගත් මිථ්‍යාදෘෂ්ටි ගත්තුවෝ ඔවුන් සදෙනාගේ ගුණ කීහ

එ කල සුධාභෝජනයෙහි රස දන්නා වූ තව්තිසා දෙවියකු සේ මාගේ ස්වාමිදරුවානන්ගේ දහම් අමායෙහි මිදි රසයක් දන්නා වූ එක්තරා එක් ශ්‍රද්ධාසම්පන්න පුරුෂයෙක් හුනස්නෙන් පැන නැඟී බුදුන් වන දෙසට වැඳලා "සත්ත්වයෙනි! තොප හැම කියන බස් වැසි බා පිහිලි වත්නා සේ නැල් බා දියෙහි ගැලෙන්නා සේ, අවු බා ගිනි වදනා සේ වැන්න. තෙපි තොපට වැඩක් කැමතියා නම් එ පව්වුන්ගේ බස් මා ඇසිය දී නො කියව. මාගේ ස්වාමිදරු වූ සකල ලොක චින්තාමාණික්‍ය වූ බුදුරජානන් මවු කුස පිළිසිඳගත් වේලෙහි ද, මවුකුසින් බිහි වූ වේලෙහි ද, මහණ වන දා නුවරින් නික්මුනු වේලෙහි ද, බුදු වූ වේලෙහි ද, ධම්සක් දෙසූ වේලෙහි ද, කිඹුල්වත රුවන්සක්මන දී යමා මහ පෙළහර පෑ වේලෙහි ද, සැවැත් නුවර රුවන් සක්මන දී යමක ප්‍රාතිහාර්‍ය පෑ වේලෙහි ද, මෙම නුවර පාටිකාරාමයෙහි රුවන් සක්මන දී ප්‍රාතිහාර්‍ය පෑ වේලෙහි දු යි යනාදි වූ නො එක් බුදු මඟුලෙහි දෙතිස් පූර්ව නිමිත්තා දී නො එක් අද්භූතයෙන් මුළුලෝ විස්මයපත් වී මු ය.

ඒ ඒ ස්ථානයෙහි දී ඔබගේ කල්පනාවක් නැති ම පවා ලෝකයෙහි පොකුරු වැසි ත් වට මී ය. මාගේ ඒ ස්වාමිදරුවාණෝ තොපගේ මේ නුවර ඉදින් ශ්‍රී පාද ය තබා වදාළසේක් වී නම් එ පමණෙකින් ම මේ නුවර ඇති සියලු රෝගාන්තරාය හිරු දුටු අන්ධකාරයක් සේ අන්තර්ධාන වේ ම ය. වැසි වැස තොප ඇමගේ සියලු ඇඟ ගිම් දිය දුටු කුණපයක් සේ අන්තර්ධානවේ ම ය. තොප තොපට වැඩක් කැමැතියා නම් මාගේ බුද්ධ නමැති කල්පද්‍රුම ය මෙ නුවරට වඩා ගෙණව"යි කීහ.

එ වේලෙහි සියලු රජ පිරිස සාධුකාර දී "ඒ බුදුහු දැන් කොයි වැඩ වසන සේක් දැ"යි විචාරා "රජගහා කුමර බිම්බිසාර රජ්ජුරුවන් නිසා වෙළුවනාරාමයෙහි වසන සේකැ" අසා ලිච්ඡවි රජුන් දෙදෙනකු තෝරා ඔවුන්ට මහ පිරිස් දී බිම්සර රජ්ජුරුවන් කරා යවූහ. බිම්සර රජ්ජුරුවෝ ඔවුන් අතින් එ පවත් අසා "බුදුහු නම් සියලු සතුන්ට ම සාධාරණ සේක. මාගේ ගම වැඩ හුන් බුදුන් අනික් ගමකට වැඩ වදාළ 'මැනැවැ යි මම ආරාධනා කළ නො හැක්කෙමි. තෙපි ම ගොස් සැලකරව"යි එම ලිච්ඡවි රජදරුවන් දෙදෙනා ම බුදුන් කරා යවූහ. ඔහු දෙදෙන ගොස් බුදුන් දැක තමන් ගේ නුවර උපන් මේ විපත්තිය කියා බුදුන් එ නුවරට වඩනා පරිද්දෙන් යාච්ඤා කළහ.

ස්වාමිදරුවෝ එ වේලෙහි දිවැසින් බලා එ නුවර තමන් වහන්සේ වැඩිකල වැසි වස්නා නියාව ත්, රතන සූත්‍ර නම් දෙශනාවක් කරණ නියාව ත්, එ වේලෙහි සියලු සතුන්ගේ රෝග සන්හිඳෙන නියාව ත්, ඒ දෙශනාම උදෙසා සස්ලක්ෂ අට අසූ දහසක් ප්‍රාණීන් අමා මහ නිවන් දක්නා නියාව ත්, නැවත ඒ දෙශනාව කෙළ ලක්ෂයක් සක්වළ පැතිර පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි ලෝවැඩ කරණ නියාව ත්, කරතලාමලකයක් සේ දැක සත්ත්වයන් කෙරෙහි උපන් මහා කරුණාවෙන් "යහපත, විශාලා මහ නුවරට එමි"යි අනු දැන වදාළ සේක.

බිම්සර රජ එ පවත් අසා බුදුන් කරා ගොස් 'ස්වාමීනි! විශාලා මහනුවරට වඩනා සේක් දැ"යි විචාරා "යෙමි මහරජැ" යි වදාළ කල "එසේ වී නම් ස්වාමිනි! ගැත්තනු මාර්ග සරහා පූජාවක් සපයාලන තෙක් දෙතුන් දවසක් බලා වදාළ මැනැවැ" බුදුන් රදවාලා ඇතුළු නුවරට ගොස් ඇතුළු නුවර පිටි නුවර බෙර ලවා අවලොස් කෙළක් පමණ මහ සෙනග රැස්කොට එම දිව ම නික්ම රජ

ගහා නුවර පටන් දෙනුවරව අතුරෙහි ගංගා නම් ගඟ දක්වා පස් යොදුන් මාර්ගය මුළුල්ලෙහි පුළුලෙන් ඉස්බක් පමණ අවකාශය බෙරතලයක් සේ තනා, යොදුන් යොදුන් තැන විහාරය බැගින් කරවා බුදුන් වඩනා පරිද්දෙන් ආරාධනා කළහ. එ වේලෙහි බුදුහු පන්සියයක් මහ රහතන් පිරිවරා තරු පිරුවරූ සඳ සේ සවණක් රසින් දිලිහි දිලිහී නික්මුනු සේක.

එ කල බිම්සර රජ්ජුරුවෝ ඒ පස් යොදුන් පමණ මඟ කළුවැලි පියා, සුදු මැල්ලෙන් තවරා, දන පමණ කටි පමණ පස්වණක් මලින් තකා, දෙපස කෙසෙල් තොරණ පිළී තොරණ ධවජ පුන් කලස් තකා, බුදුන් සිරසට අතගි වූ මතු මතුයෙහි සේසත් දෙකක් හා පන්සියයක් රහතුන් හිසට පත් සියයක් සේසත් ලවා, තමන් ගේ පිරිවර හා සමග සුවඳින් මලින් පුද පුදා, එකි එකී විහාරයෙහි එකි එකි දවස් බුදුන් සතප සතපා මහත් වූ දන පූජාවෙන් පස්මන ද, ගංතොටට වඩාගෙණ ගොස් නැව් අගුළු සරහන්නට පටන් ගන්වා, එ කෙණෙහි විශාලා මහා නුවරට කියා යවූවාහු ය.

එ වේලෙහි ලිච්ඡවි රජදරුවෝ බුදුන් මගට වැඩි පවතු ත් බිම්සර රජ්ජුරුවන් කැර වූ පූජා ත් අසා "අපි ඔවුන්ට දිගුණුව පූජා කොට බුදුන් වඩා ගෙණෙම්හ" යි වාසි කියා තමන්ගේ විශාලා නුවර පටන් ගංතොට දක්වා තුන් යොදුන් පමණ මාර්ගය කැටක් මුලක් නො තබා තලි පිටක් සේ තනවා, මඟ ධවජ පුන් කලස් ආදියෙන් දිගුණුකොට සරහා, බුදුන් හිසට සේසත් සතරක් හා පන්සියයක් රහතන් හිසට දෙ සේසත් බැගින් දහසක් සේසත් ගෙන්වා ගෙණ අවුදින් ගංතොට සිටගත්හ.

ඉක්බිත්තෙන් බිම්සර රජ්ජුරුවෝ අගුළු දෙකක් අලඞ්කෘත කොට නිමවා එ මතුයෙහි විචිත්‍ර වූ මණ්ඩපයක් නිමවා, මල්දම් ආදියෙන් සරහා, මණ්ඩප මධ්‍යයෙහි සත්රුවන්මය වූ බුද්ධාසනයක් පණවා බුදුන්ට ආරාධනා කළහ. බුදුහු පන්සියයක් මහ රහතන් සමග ඒ මණ්ඩපයට නැගී බුද්ධාසනයෙහි වැඩහුන් සේක. රජ්ජුරුවෝ කර පමණක් දියට බැස බුදුන්ට පසු ගමන් කොට "ස්වාමීනි! යම් දවසක් මේ තෙනට වඩනා සේක් වී නම් එ දවස් දක්වා මම් මේ ගංතොට ම බල බලා හිඳිම්"යි නැවැත්තාහ. එ කල මෙසේ මහත් වූ පූජාවෙන් ඒ මණ්ඩපයෙහි වැඩ ලිච්ඡවිරජුන් සිටි ගංතොටට පැමිණි සේක.

එ කෙණෙහි ස්වාමිදරුවානන් ඒ ලිච්ඡවි රජුන්ගේ සීමාන්තර යට වඩු ත් වඩු ත් තුන් හවුරුද්දක් මුළුල්ලෙහි පොදක් බිම නො හෙළා මේඝ නාදයක් නැති ව තුබූ තුන් සියක් යොදුන් රාජ්‍යය මුළුල්ලෙහි හැම ආකාශය අන්ධකාර ව ගෙණ විදුලිය ගසා මේඝනාද දී, ශතපටල සහස්‍රපටල නගා මැසිවලාකුල් දිවන්නට වන. එ වේලෙහි ස්වාමිදරුවන්ව පෙරගමන් කරන්නාහු කටි පමණක් දියට බැස සත්දහස් සත්සිය සත්දෙනකු පමණ ඇති ඒ ලිච්ඡවි රජදරුවෝ මහත් වූ ආදරයෙන් බුදුන් ගොඩට වඩා ගෙණාහ

එ කෙණෙහි ස්වාමිදරුවන් දක්නුණු ශ්‍රී පාදය ගොඩ තිබීම හා සමග මැ දසදිගින් දිවූ ඒ මහ පොකුරු වැස්ස ධාරානිපාතයෙන් වස්නට පටන් ගත. බිමින් දන පමණ, හිසිමිස් පමණ මිහවතුරු හැලි ගසා ගස දිවෙති. ඒ සා සක මහා වර්ෂාවෙහි තෙමෙනු කැමැත්තෝ තෙමෙති. නො තෙමෙනු කැමැත්තෝ නො තෙමෙති. එ කල ඒ රාජ්‍යය මුළුල්ලෙහි ලක්ෂගණන් මිනීකුණු වතුරෙන් ගෙණ ගොස් ගඟ ලා බිම ඉතා පරිශුද්ධ වී ය. ලිච්ඡවි රජ දරුවෝ ඒ තුන් යොදුන් මාර්ගයෙහි හිසිමිස් පමණ උස සුවඳ, මලින් නනා මහා පූජා කොට යොදුනින් යොදුනෙහි සතප සතපා මහ දන් දිදී විශාලා මහ නුවරට වඩා ගෙණ ගියහ

ස්වාමිදරුවන් එ නුවරට වඩනා වේලෙහි සක්දෙව්රජ දෙදෙව් ලොව දෙවියන් පිරිවරාගෙණ අවුදින් වැද ගියේ ය. මහේශාඛ්‍ය දෙවියන් එ ත් එ ත්, වරම් රජදරුවන් එ ත් එ ත්, අටවිසි යක්ෂ සේනානාධිපතීන් එ ත් එ ත්, දෙතිස් මහා දිව්‍ය පුත්‍රයන් එ ත් එ ත්, සියලු අමනුෂ්‍යයෝ සුලං දුටු පරඬලාපත් සේ ඒ ඒ දිගින් බා වෙවුල වෙවුලා දිවන්නට පටන්ගත්හ.

එ වේලෙහි බුදුරජානන් වහන්සේ නුවර වාසල් දොර වැඩහිඳ ආයුෂ්මත් වූ අනඳ මහ තෙරුන් වහන්සේ කැඳවා "ආනන්ද ස්ථවිරය! තෝ මාගේ රුවන් සූත්‍රය උගෙණගෙණ මාගේ මේ ශෛල පාත්‍රයෙන් පැන් ගෙණ, මහත් වූ පූජාවෙන් ලිච්ඡවි රජ දරුවන් හා සමග මේ නුවර තුන් පවුරු අතුරෙහි සිසාරා ඇවිද, පිරිත් බැණ බැණ පැන් ඉස අරක්ගණු" යි වදාරා අනඳ මහ තෙරුන් වහන්සේ පලඹු ව යමා වදාළ සේක. මෙසේ අනඳ මහ තෙරුන් වහන්සේ පාත්‍රාධාතුයෙන් පැන් ගෙණ නුවර සිසාරා ඇවිද පිරිත්

බණක්නට පටන් ගත් සේක. “යං කිඤ්චි විත්තං” යන ශබ්දය කියා පැන් ඉසලූ වේලෙහි යක්ෂයන් ඇඟට කකියන ලෝබින්දු ගසන්නා සේ භය විය. මනුෂ්‍යයන් ඇඟට අමා බින්දු ගසන්නා සේ ඒ පැන් ශාන්ත විය.

එ කල අමනුෂ්‍යයෝ රඳ මෝහොල් හැරපු මහ සොරොවු සතරෙකින් නමා ගත් දියවතුරක් සේ, සතර මහ වාසලින් පිටතට දිවන්නට පටන් ගත්හ. පවුරු පදනම් බිඳ ඔවුනොවුන් පිටහී දිව එන අමනුෂ්‍යයෙකු ත් ඇතුළෙහි සිට ගත නුහුනුයේය. හැම යක්ෂයෝ ම පැලැහ. එ කෙණෙහි දසවන අවස්ථාවෙහි ලෙඩින් මියන්ට ඔත් සත්ත්වයෝ පිරිත් පැන් ඇඟ වැකී ගිය ඇසිල්ලෙහි අමා පැන් ලද්දවුන් සේ සිහිනයෙහි දුටුවාවූ රෝගයක් සේ, සියලු රෝගම අනතර්ධාන විය. හොත් හොත් පළින් නැගී සිට, සුවඳ මල් පහන් ගෙණ දිව දිම ගොස් මහ තෙරුන් වහන්සේ පිරිවරාගෙණ, සළුපිළි කට නවා, අත්පොළසන් දීදී, ඔල්වරසන් දීදී, අසුරුසන් දීදී, බුදුන් ගුණ කිය කියා, උත්සව කෙළි කෙළ දිමෙති.

රජදරුවෝ එ නුවර මධ්‍යයෙහි නම්න් හැමදෙනා රැස් ව කථා කරණ සන්ථාගාරය සිවුදෑගදින් පිරිබඩගෙණ රන්තරු-රිදීතරුයෙන් නොබහා වියන් බැඳ විසිතුරු වූ රත්තිරයෙන් පරික්ෂෙප කොට අනඝ වූ බුමුතුරුණු අතුට, මණ්ඩප මධ්‍යයෙහි අනඝ වූ බුද්ධාසනයක් පණවා, බුදුන් මහ පූජාවෙන් ඇතුළු නුවරට වඩාගෙණ ගියහ. බුදුහු වැඩ පණවනලද බුද්ධාසනයෙහි වැඩ හුන් සේක. පන්සියක් මහරහතන් හා, සත්දහස් සත්සිය සත් මහා ලිච්ඡවි රජුන් හා, සිය දහස් ගණන් ඇමැති මඬුලු හා, ඇමදෙනා ම බුදුන් පිරිවරා හිඳගත් වේලෙහි ශක්‍ර දෙවේන්ද්‍රයා දෙදෙව්ලොව දිව්‍ය සේනාව හා සමග දිම අවුදින් එ තුන් සියක් යොදුන් රාජ්‍යය මුළුල්ලෙහි වැසි වස්වා සියලු කුණපයන් දුරු කොට හුදියකු බෝමළුවක් හැමද්පුවා සේ, සියලු බිම ම පරිශුද්ධ කරවාලා එ තෙකට අවුදින් ආකාශයෙහි සිතියම් කඩක් විදා පැලුවා සේ, සියලු සතුන්ට පෙණී පෙණී මහපෙලහරින් සමිරි මරින් සිටගත.

එ වේලෙහි අනද මහ මහතෙරුන් වහන්සේ ද නුවර සිසාරා ඇවිද සියලු සතුන්ගේ රෝග පීඩා සන්හිඳුවා මුළු නුවර වැසියන් ගෙණ අවුදින් එකත්පස් ව උන් සේක.

එ වේලෙහි බුදුරජාණන් වහන්සේ මේ රුවන් සූත්‍ර දෙශනා වෙන් ධර්මදෙශනා කොට එ ම ද සුවාසූ දහසක් ප්‍රාණීන් අමාමහ නිවන් දක්වා මෙසේ ම මෙම සූත්‍රය පිට පිට ම සත් දවසක් දෙශනා කොට දවස් දවස සුවාසූදහසක් බැගින් පස්ලක්ෂ අටාසූ දහසක් ප්‍රාණීන් නිවන් දක්වා වදාළ සේක. මෙසේ සුවාසූ දහසක් ධර්මස්කන්ධයෙහි දහස් ගණන් සූත්‍රදෙශනාවන් අතුරෙන් බුදුන් සත්වාරයෙක දෙශනා කළා වූ සූත්‍රයෙක් මේ රුවන් සූත්‍ර විනා නැත් ම ය එසේ හෙයින් බුදුන්ගේ ශ්‍රීමුඛ ශ්‍රී සත්වාරයෙක ලත් හෙයින් මේ රුවන් සූත්‍ර සියලු ධර්මයෙහි ම අග්‍ර වී ය යි දතයුතු.

මෙසේ බුදුහු දෙපෝයක් එනුවර වාසය කොට සියලු රෝගාන්තරායයන් සන්හිඳුවා ලිච්ඡවි රජුන්ට තමන් වහන්සේ වඩනා ආකාර දක්වා වදාළ සේක. නැවත ඒ ලිච්ඡවි රජදරුවෝ දියුණු කොට පූජා කරමින යි මඟ සරහා බුදුන් සිරසට සේසත් අමක් හා පන්සියක් මහරහතන්ට සතර සතර සේසත් බැගින් දෙදහසක් සේසත් සමඟ මහා පූජා කොට බුදුන් වඩා ගංතෙරට ගෙණ ගියහ. ඒ ගංගාවෙහි අධිගෘහීත වූ දිව්‍යනාගරාජයෝ "මනුෂ්‍යයෝ තමන් තමන් ශක්ති පමණින් බුදුන්ට පූජා කළහ. අපි අපි ද අප ශක්ති පමණින් පූජා කරමහ" යි සත්රුවන්මය වූ නැව් මවා ගෙණ සියලු ගඟ පස් පියුමෙන් දිග නො පෙණෙන සේ මවා ගෙණ අවුත් "ස්වාමිනි! ලොවුතුරා බුදුහු නම් සියලු සතුන් ගොඩ නගන සඳහා ම බුදුවූහ. මේ සා වූ දිව්‍ය සම්පත් ඇතිවත් අපි අහෙතුක යෝනියෙහි උපන්නාවූ අකුශල බලයෙන් අපි නුඹවහන්සේ වැනි බුදු කෙණකුන් දක පවා දුන් මාර්ගඵල සුවයක් නො ලබමහ එසේ දුක්පත් වූ නුඹගේ ගැත්තවුන්ට ද අනුග්‍රහ කොට වදාළ මැනැවැ"යි ආරාධනා කළහ.

එ වේලෙහි ස්වාමිදරුවෝ ඒ දිව්‍යනාගරාජයන්ගේ ආරාධනා ඉවසා ඔවුන් මැවූ සත් රුවන් නැවට පැන නැගි සේක. එ කල දිව්‍යනාගරාජයෝ බුදුන් හා පන්සියක් රහතන් තමන් තමන්ගේ පන්සියක් නැව්වලින් තමන් තමන්ගේ භවනයට වඩාගෙණ ගියහ. බුදුහු එදා රෑ දෙවරු දිව්‍යනාග රාජයන්ට ධර්මදෙශනා කොට බොහෝ පින් රැස් කළ සේක. දෙවන දා උදෑසන නැගී තමන්ගෙන් ම දිව්‍ය වූ භොජන න් වළඳවා මහත් වූ සත්කාර කළාහ. බුදුහු එ කල ඒ නයින්ට අනුමෝදිනා බණ වදාරා නාග භවනයෙන් නික්මුනු සේක.

එකෙණෙහි භූමියෙහි වසන්නාවූ විමානසථ දෙවියෝ "මනුෂ්‍යයන් හා නාගයෝ තමන් තමන්ගේ පමණින් බුදුන්ට පූජා කළහ, අපි ද අප පමණින් පුදම්හ"යි මේ සක්වළ ගබ මුළුල්ලෙහි නොයෙක් පර්වත ගිරි කුළු මුදුනෙහි ද, නොයෙක් වෘක්ෂ ලතා මුදුනෙහි ද යි අවකාශයක් නැති ව යවත් වසයෙන් පිල ගස තණ ගස වසන දෙවියෝ දක්වා කුඩ පිට කුඩ නගා පූජා කොරම්න් සක්වළ ගබ සේසතින් වසා සිට ගත්හ. මෙම ලෙසින් දෙවියෝ ඔවුනොවුන් බල බලා ආකාශසථ දෙවියෝ ද, විමානසථ දෙවියෝ ද, අභ්‍රවලාහක ද උෂ්ණවලාහක ද ශීතවලාහක ද වාතවලාහක ද වස්සවලාහකාදි දෙවියෝ ද, චාතුර්මහාරාජිකාදි ස දෙව්ලෝ වැසි දෙවියෝ ද, අරූතල අසඤ්ඤ තලයන් හැර පසළොස් බ්‍රහ්මලෝකවල දෙවියෝ ද යි හැම දිව්‍යයෝ බ්‍රහ්මයෝ "අපි අපි ද ඒ උතුමාට අද සේසත් පූජා කරම්හ" යි ඔවුනොවුන් පරයා දිව අවුදින් නාගභවනයෙහි පටන් අකනිට්ඨ බඹලොව දක්වා මුළුලොව සේසතින් වසමා සිටගෙණ පූජාවට පවත්ගත්හ. එ දවස් දෙවියන් මාගේ බුදුන්ට කළාවූ සේසත් පූජාවට අතීක් උපමාවක් දක්ත නොහෙම් ම ය. කාරුණ්‍යය කප් ලක්ෂයක් මුළුල්ලෙහි පූරණය කළාවූ සමතිංශත් පාරමිතාභූමියෙන් පැනනැංගාවූ ඔබගේ යසස් නමැති මහ ලිය ද එ දා මල් පිපී වැනී ගියා සේ හෝ යි සිතම්.

මෙසේ මහත් වූ පූජා විඳ විඳ බුදුන් ගංතොටට වැඩි කල තීම් සර රජ්ජුරුවෝ බුදුන් වැඳ වැඳ බලා සිටියාහු "මම ද ලිච්ඡවි රජුන් කළ පූජාමට දිගුණකොට පූජා කෙරෙමි"යි බුදුන් සිරසට සේසත් සොළොසක් හා පන්සියක් රහතන්ට අට අට සේසත් බැගින් සාරදහසක් සේසත් හා සමග මහත්වූ පූජා කොට කොට, යොදනෙන් යොදනෙහි සතප සතපා මහදන් දිදී රජගහා නුවර වෙළුවනාරාමයට බුදුන් වඩාගෙණාහ. මෙසේ ස්වාමිදරුවන් පූජා වෙන් ඒ ගඳකිළියට වැඩ ශයනප්‍රාප්ත වූ කල, එම දා සවස් වෙලෙහි භික්ෂුගණයා ධර්මසභාමණ්ඩපයෙහි රැස් ව බුදුන්ගේ ගුණ කථන ය කරන්නාහු "ඇවැත්නි! බුද්ධානුභාවයක් බලව, බුදුන්ගේ පුණ්‍යප්‍රභාවයක් බලව, බුදුන්ගේ යශෝරාශියක් බලව, බුදුන්ගේ මහිමයක් බලව" යනාදීන් බුදුන් ලද ගඞ්ගාරෝහණ පූජාවට ස්තුති කොට කොට වැඩිහුන් සේක.

එ කල ස්වාමිදරුවෝ දෙව් බඹුන්ගේ කිරුළුකුළු මිණිරසින් දිලියෙන විශාල වූ ශාලපංක්තීන් හා, හිතනිසනමහසෝපාන මාලාවෙන් අලඞ්කෘත වූ, ප්‍රාසාද පංක්තීන් හා, චන්ද්‍රකාන්ති සෙයින්

පරිශුද්ධ වූ වාලුකාතලයෙන් හා, විසිතුරු වූ, ලතා මණ්ඩපයෙන්
හා, පස්පියුමෙන් සැදි පොකුණු පඞ්ක්තීන් හා, විරාජමාන වූ
සවර්ණ සුරභි සුගන්ධ පුෂ්පොපහාර සමලඞ්කෘත වූ භූමිභාග ඇති
සුගන්ධ ගන්ධ කුටියෙහි වැඩහිඳ, මහාකරුණා සමාපත්ති - ඵල
සමාපත්ති ආදි වූ අනෙකප්‍රකාර සමාපත්ති සමවදනා සේක්
අත්‍යන්ත පරිශුද්ධ වූ තමන් වහන්සේගේ දිව්‍යශොත්‍ර ධාතුයෙන්
ධම් සභාමණ්ඩපයෙහි උපන්නාවූ ඒ කථා සවරූපය අසා වදාරා.
මේ භික්ෂූහු ධම් සභාවට රැස් ව හිඳ මාගේ ආනුභාවම හා පින්බල
කියති. මා විසින් පූර්ව ජන්මයෙහි කළා වූ කුශල මූලය හසමයෙන්
පටිච්ඡන්න වූ ජාත වෙදයක් සේ භස්මයෙන් පටිච්ඡන්න හෙයින්
මට මූත් ඔවුන්ට අප්‍රකාශ ය. මා ධම්සභා මණ්ඩලයට ගියකල
මේ කථා සවරූපය මට කියති. මම ඒ අපොස්පත්ති කොට
ගෙණ මා පූර්වජාතියෙහි කළා වූ කුශලමූලය ඔවුන්ට ප්‍රකාශ
කෙරෙමි යි සිතා වදාරා.

නානා මණිප්‍රභාවිසර විශ්ඵුරිත විසතීර්ණ මර රුචිර සුගන්ධ ගන්ධ
කුටිමාසය මහා කරුණා ඥානයෙන් දුරුකොට බුද්ධාසනයෙන්
ශුද්ධාශයනයෙන් පැනනැගී ලාක්ෂාරයෙන් තෙත්වූ අභිනව ප්‍රබුද්ධ
රක්තකෝවිලාර කුසුමවර්ණ සුරකත වූ දෙපට සිවුර රන් මෙරක්
සන්ධ්‍යා වලාපටලයෙකින් වසන්නාසේ සිසාරා රන්කතුරෙකින්
රත්පියුම්පෙති කලබක් කපන්නා සේ ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදන වස
යෙන් සංවිධාන කොට හැඳ, රත් වලාගබෙකින් නික්මුත් විදුලියක්
රැළි දෙන්නා සේ, රත්පියුම්පෙති කලබක් රන් පමුදකින්
පරික්ෂිප්ත කරන්නා සේ, සශ්‍රීක වූ පටිධාතුව බැඳ, රත්පළසකඩ
කින් රන්ගලක් වසන්නා සේ, චිත්‍රකූට පර්වතය බඳුවදමල් රුසෙ
කින් වසන්නාසේ, මහ පොළෝ සක්වළගල් මෙරගල් යුගන්ධරාදි
පර්වතයන් එක පැහැර කම්පා කෙරෙමින්, අසාධාරණ ප්‍රාතිහාර්‍ය
යෙන් උපන්නාවූ නිග්‍රොධ ඵල සමාන වර්ණවර රුචිර පාංශුකූල
චීවර ය ධරා, නීල, පීත, ලෝහිත, ඔදාත, මාඤ්ජිෂ්ඨ, ප්‍රභාස්වර යයි
යන සවර්ණක් රැසින් දිලියෙමින් ඝන බුඩරශ්මිමාලාවන් යන්ත්‍ර
නළින් මඩනාවූ සවර්ණරසධාරා සේ, දෙරකවුළු[1] අසු අස්සෙන් බල
බලා දශදිගන්තරයෙහි බ්‍යාමප්‍රභා ව්‍යාප්ත කෙරෙමින්, අපරිමිතවූ
පුණ්‍යප්‍රභාවයෙන් විවෘත වාර ඇති ගන්ධකුටිද්වාරයෙන් මේඝවූඩ
යෙකින් නික්මුත් පූර්ණ චන්ද්‍රයාගේ ලීලා පරදවමින්, රන්ගල් ගුහා
යෙකින් නික්මුත් අභීත කෙශරසිංහ රාජයක්හුගේ වික්‍රම අවික්‍රම
කෙරෙමින්, නීල වලාභ්‍යන්තරයෙන් නික්මුනා වූ සියරැළි විදුලිය

1 ශුද්ධශයනයෙන්,

කලබක්හුගේ ලීලාවට නින්දා කියවමින්, පද්මගර්භයෙක්හි වාසය කොට අභිමතස්ථාන ගත සුවර්ණහංසරාජයක්හු සේ මෙසේ ඒ ගන්ධකුටියෙන් නික්ම දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ශ්‍රී ශොභාවන් කරණකොට ගෙණ සන්ධ්‍යාප්‍රභානුරඤ්ජිත ඉන්ද්‍රචාප විද්‍යුල්ලතා, පරික්ෂිප්ත කනක ගිරිශිඛරයක් සේ දිලිසෙමින්, අචින්ත්‍ය වූ, අනුපම වූ, අසදෘශ වූ, අනන්‍ය සාධාරණ වූ, බුද්ධලීලාවෙන් සම්ප්‍රාප්ත වූ, පසිඳුම අනුරූප වූ, තුන් ප්‍රකාරයෙන් එක්තරා එක් ප්‍රාතිහාර්‍ය්‍යයෙකින් ධර්‍මසභාවට වඩිත්.

කෙසේ ද? බුදුහු සමහර දවසෙක පසිඳ්ගේ අදහස් බලා ගන්ධකුටියෙහි දී පොළොව් කිමිද වැඩ බුද්ධාසනය මැදින් පුහුදුරු මුදුනව පැනනැගි ලසිරු මඬලක් සේ පෙණී පෙණී වැඩ හිඳිනා සේක. සමහර දවසෙක ගඳකිළියෙහි කැණිමඬල දෙබෑ කොට ගෙණ ආකාශයෙන් වැඩ ධර්‍මශාලාවෙහි කැණිමඬල පලාගෙණ බැස, අස්තගිරි පර්‍වතයට ගොසින් බට පුන්සඳක් සේ ධර්‍මාසනයෙ පෙණී යන සේක. සමහර දවසෙක නැගූ නැගූ පත්ලෙහි පිහුම් දක්ව දක්වා මහත් වූ ප්‍රාතිහාර්‍ය්‍යයෙන් ධර්‍මසභාවට වැඩ පණවන ලද බුද්ධාසනයෙහි වැඩසිටිනා සේක.

කෙසේ වූ ධර්‍මසභා මණ්ඩලයෙක් ද? යත්; නෙක බ්‍රහ්මසුරාසුරෝරග දෙව් දානවාදී දිව්‍යසමූහයන්ගේ ශරීරප්‍රභායෙන් හා, අපරිමිත රාජර්ද්ධි සම්පන්න රජාධිරාජ ප්‍රශස්තෝත්තමරාජයන්ගේ කිරුළුකුළුමිණිරසින් හා, රන්රිදී මිණි තරුපෙළින් විසිතුරු වූ විතානපංක්තීන් හා, නානා ස්ථානයෙහි එල්වනලද චම්පක පාරිජාත මන්දාර කෙතකාදි කුසුම් දාමයෙන් හා, ගන්ධ මාලා ධූප දීපාදි නානා ප්‍රකාර පූජාවස්තු විශෙෂයෙන් හා, සුවඳ තෙලින් දිලිසෙන රන්වැට ප්‍රදීප සහස්‍රයෙන් හා, ඒකාලෝක වූ, ඒකොද්භූත වූ ඒකාලඞ්කාර වූ, ඒකප්‍රසන්න වූ, රාජභවන ශ්‍රී මණ්ඩනා වූ, දිව්‍යභවන ශ්‍රී සැදවන්නා වූ බ්‍රහ්මා‘මර නයන රසායන වූ, මෙසේ වූ, අලඞ්කෘත ධර්‍මසභාමණ්ඩලයට සුවිනීත වූ ඇත්මුලක් ලඟව වදනා ගන්ධ හස්ති රාජයක්හු සේ, සිංහසමූහයක් මැදට වදනා අභීත කෙසර සිංහරාජයකු සේ, වැඩ අලඞ්කෘත වූ රත්න මණ්ඩප මධ්‍යයෙහි පණවන ලද බුද්ධාසනයට පැනනැගී, සුපුෂ්පිත වූ ශාලද්‍රුමරාජයක්හු සේ දිලිහි දිලිහී වැඩහිඳ.

තමන් වහන්සේ වීතරාගී වූ සේක්, වීතදොෂී වූ සේක්, වීතමෝහී වූ සේක්, තෘෂ්ණා රහිත වූ සේක්, නිකෙලෙශ වූ සේක්, ස්වයංබුද්ධවූ සේක්, ශාන්ත වූ සේක්, දාන්ත වූ සේක්, සුවිනීත වූ සේක්

සුප්‍රාව්‍රත වූ සේක්, ශාන්ත වූ ඉන්ද්‍රියයන් ඇති සේක්, ශාන්ත වූ සිත් ඇති සේක්, ශාන්ත වූ කාය ඇති සේක්, අලෝපච්ඡ වූ සේක්, සන්තුෂ්ට වූ සේක්, ප්‍රවිවික්ත වූ සේක්, අසංසෘෂ්ට වූ සේක්, චෝදක වූ සේක්, පාපගර්හිත වූ සේක්, ආරබ්ධ වූ වීර්‍ය්‍ය ඇති සේක්, වචනක්ෂම වූ සේක්, ශීලසම්පන්න වූ සේක්, සමාධිසම්පන්න වූ සේක්, ප්‍රඥාසම්පන්න වූ සේක්, විමුක්තිසම්පන්න වූ සේක්, විමුක්ති ඥානදර්ශනසම්පන්න වූසේක්, වන්න දෙෂ ඇති වූ සේක්, භින්නපටධර වූ සේක්, භින්න ක්ලේශ වූ සේක්, ඡින්නබන්ධන වූ සේක්, විජජිත ජටා ඇති සේක්, තමන් වහන්සේ සේම වීතරාගී වූ, වීතදෙෂී වූ, වීතමෝහී වූ, තෘෂ්ණා රහිත වූ, නික්ලේශී වූ, අනුබුද්ධ වූ, ශාන්ත වූ, දාන්ත වූ, සුවිනීත වූ, සුප්‍රාව්‍රත වූ, ශාන්ත වූ ඉන්ද්‍රියයන් ඇති, ශාන්ත වූ සිත් ඇති, ශාන්ත වූ කාය ඇති, අලෝපච්ඡ වූ, සන්තුෂ්ට වූ, ප්‍රවිවික්ත වූ, අසංසෘෂ්ට වූ, චෝදක වූ, පාපගර්හිත වූ, ආරබ්ධ වීර්‍ය්‍ය වූ, වචනක්ෂම වූ, ශීලසම්පන්න වූ, සමාධිසම්පන්න වූ, ප්‍රඥා සම්පන්න වූ, විමුක්ති සම්පන්න වූ, විමුක්තිඥානදර්ශන සම්පන්න වූ, වන්නදෙෂී වූ, භින්නපටධර වූ, භින්න ක්ලේශ වූ, විජජිත ජටා ඇති වූ, ඡින්නබන්ධන වූ, සංඝසමූහයා මධ්‍යයෙහි.

මෘගගණයා පිරිවැරූ මෘගරාජයා සේ, සිංහගණයා පිරිවැරූ සිංහරාජයා සේ, ගරුඬගණයා පිරිවැරූ ගරුඬරාජයා සේ, සියරැස් පිරිවැරූ දිවාකර රාජයා සේ, පහන් දහස් පිරිවැරූ පහන් රුකක් සේ, රත්පිළුම් සාගරමධ්‍යයෙහි ශොභමාන වූ කනක තොරණාවක් සේ, ප්‍රමාලවේදිකා මැද දිලියෙන කනක ප්‍රාසාදයක් සේ, පත්‍රපරිවෘත වූ කෙසර පුෂ්පයක් සේ, කෙසර පිරිවැරූ කර්ණිකා රාජයක් සේ, අවදහසක් ඇතුන් පිරිවැරූ ඡද්දන්ත නම් හස්ති රාජයා සේ, අනූදහසක් හංසයන් පිරිවැරූ ධෘතරාෂ්ට්‍ර නම් හංස රාජයා සේ, දිව්‍යගණයා පිරිවැරූ සුජම්පති නම් සක්දෙව් රජු සේ, බ්‍රහ්මගණයා පිරිවැරූ හාරිත නම් බ්‍රහ්මරාජයා සේ, අශ්වගණයා පිරිවැරූ වලාහක නම් අශ්වරාජයා සේ, මහපිරිස් පිරිවැරූ චක්‍රවර්ති රාජයා සේ, සඳ වලා පිරිවැරූ දිලියෙන නකත් තරුවක් සේ, තරුගණයා පිරිවැරූ ශරච්චන්ද්‍රරාජයා සේ, මණිගණයා පිරිවැරූ සිතුමිණි රුවනක් සේ, කුලපව්වන් පිරිවැරූ කනක මේරුරාජයා සේ, ඉතා මහත් වූ බුද්ධානුභාවයෙන්, බුද්ධශ්‍රීන්, බුද්ධතේජසින්, බුද්ධ වික්‍රමයෙන්, බුද්ධඥානයෙන්, දිලිසි දිලිසී.

ව්‍යාමප්‍රභාමණ්ඩලයෙන් පරික්ෂිප්ත වූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් කරණකොටගෙණ පිළිවෙළින් ගොතා තුබූ චන්ද්‍රයන් දෙතිස් දෙනකුගේ, සූර්යයන් දෙතිස් දෙනකුගේ, චක්‍රවර්ති රජුන් දෙතිස් දෙනකුගේ, ශක්‍රයන් දෙතිස් දෙනකුගේ, බ්‍රහ්මේන්ද්‍රයන් දෙතිස් දෙනකුගේ, ශ්‍රී විභූතියට නින්දා කරවමින් යුගන්ධරා මුදුනෙහි දිලියෙන බාලාර්කමණ්ඩලය සේ, පර්වත මුදුනෙක්හි දිලියෙන ඝනරත්නකඳක් සේ, කාලාන්ධකාරයෙහි දිලියෙන දුරගම්ණී පර්වතයක් සේ, ෂඩ්වර්ණ වූ ඝනබුද්ධරශ්මිමාලාවෙන් සියලු ධර්මසභා මණ්ඩපය එකාපැකැර බබුළුවමින් සපොක්ෂ වූ බුද්ධාසනයෙහි වැඩහිඳ.

රත්මාලිගාවෙක්හි මැව්ගිය ඉඳුනිල්මිණි කවුළු යුගලක් හරණ සේ, තමන් වහන්සේගේ පස්වණක් පැයෙන් දිලියෙන දිගු පුළුල් ඇස් යුගල උන්මීලනය කොට, පඤ්චවර්ණ ප්‍රභා ධර භාණ්ඩරාජ යුගලයක් රත්පියුම් වනයෙක්හි ඇවිදුවන්නා සේ, වාත රහිත ස්ථානයෙක නිශ්චල ව පිපී වැනී ගියා වූ රත්පියුම් වනයක් සේ, මේඝවර්ණ වූ පාංශුකූල චීවර දරා, ක්ෂාන්ත්‍යාදි ප්‍රතිපත්තීන් නිශ්චල ව වැඩහුන්නා වූ සඞ්ඝසමූහයා බලා වදාරා "මේ මාගේ භික්ෂු පර්ෂද ඉතා හොබනේ ය. එක ද භික්ෂුවක්හුගේ කැය පිණ්ඩත කිබිස පියනාහණ්ඩක් වත්, හස්තවලන, පාදවලන, අංගවායස ප්‍රශ්වාසාදි කිසි ම අරගලයෙක් වත් නැත. සර්වාභරණයෙන් සැරසී දෙවගනන් බඳු වරගනන් පිරිවරා මා කරා අවුත් සිටිනා ක්ෂත්‍රිය පර්ෂදක් හෝ, චක්‍රවර්ති පර්ෂදක් හෝ, කාමාවචර දිව්‍යපර්ෂදක් හෝ, රූපාවචර බ්‍රහ්ම පර්ෂදක් හෝ, ඉදින් මේ ස්ථානයෙහි ඇත ත් ඔවුන් සානුරාග වසයෙන් කර ඔසවා බලන එක ද භික්ෂුවකගෙණෙක් නැත. යම් සේ අභ්‍රය, මහීකාය, ධූමය, රජස්ය, රාහුය, යන පඤ්චොපක්ලෙශයෙන් දුරු වූ සම්පූර්ණ චන්ද්‍රයා බලන්නවුන් සේ මාගේ මුඛමණ්ඩලය බල බලා හිඳිති. මේ මාගේ භික්ෂූහු බුද්ධ ගෞරවයෙන් සගෞරව වූවාහු, බුද්ධතෙජසින් නැති ගත්තාහු, මම මාගේ ආයුෂ්කල්පය මුළුල්ලෙහි ත් ප්‍රථමාරම්භ වූ කිසි කථාවක් නො කොට නිශ්ශබ්ද ව හුන්නෙම් වීම් නම් මට පළමු කොට මුඛ සොලවා කථාවක් උපදවන්නා වූ එක ද භික්ෂුවක් මේ පර්ෂදෙහි නැත. මම ම පළමුකොට කථාවක් උපදවමි" යි සිතා වදාරා.

සඳැලාගබෙකින් විහිදී චන්ද්‍රිකාව දක්වුවා සේ තමන් වහන්සේගේ ඉතා සුරක්ත වූ අධරෝෂ්ඨයන් දෙදෙනා අතුරෙන් දන්තශ්‍රී

දක්ම දක්වා තමන් වහන්සේගේ මැග් සුචරිතානුභාවයෙන් ජනිත වූ, දිව්‍යගන්ධයෙන් සුගන්ධ වූ, නානා ගන්ධයෙන් සම්පූර්ණ වූ, රුවන් කරඬුවක් හරණා සේ, මුඛ නමැති පියුම් කරඬුව හැර පාරමිතා නමැති ජලයෙන් පිරුණා වූ, බුද්ධගුණ නමැති සුගන්ධ රශ්මින් ලුබ්ධ වූ, මොළොක් තුනු පලල් ජිහ්වාධාතු නමැති කෙමි ඇති, සමශුද්ධ වූ අවිවරවත්තාළීස දන්තධාතු පඞ්ක්ති නමැති කේසර පඞ්ක්ති ඇති, සුරක්ත වූ, අධරෝෂ්ඨ පල්ලව යුග්ම නමැති පියුම් පත් ඇති, සඬ්ඛ නමැති මධුබින්දු වහනය කරන්නා වූ සශ්‍රීක වූ මුඛ නමැති පද්මයෙන් සුවඳගඳ විහිදුවා බැණනැගි බසින් සිංහලු ධම්සභා මණ්ඩලය එක පැහැර සුවඳ පිඩක් සේ කෙරෙමින්, මධු මද මුදිත ලලිත රතිකර මනොහර කුරවිකනාද නිර්විශෙෂ අෂ්ටාඞ්ගසමුපෙත නානා නය නිපුණ අනෙකාර්ථාභාෂා'නුකූල අර්ථ ව්‍යඤ්ජනසම්පන්න විවිධ ප්‍රාතිහාර්ය ධර්මොපදෙශනා ප්‍රතිබද්ධ ගම්භීර වූ. සර්වසත්ත්ව ස්වකීය භාෂානුරූප ලක්ෂණීය ස්වභාව සානුරාග ශ්‍රවණීය මධුර වූ වචනයෙන් "මහණෙනි! මා එන්නාට පූර්වභාගයෙහි මෙ තෙන කෙබඳු වූ කථාසල්ලාපයෙකින් යෙදී උන්නාහු ද" යි විචාරා වදාළ සේක.

එ කල්හි භික්ෂූන් වහන්සේ ප්‍රේමණීය වූ, කර්ණ රසායන වූ, හෘදයට අමෘතාභිෂෙකයක් වැනි වූ, ශ්‍රී මනොහර නාදය අසා "ස්වාමීනි! නුඹවහන්සේ 'මහණෙනි! මේ මේ කථාවෙහි නො යෙදෙව" යි අප මහණ වූ ද ම අප උගන්වා වදාළා වූ රාජකථා ය, චෞරකථා ය, මහාමාත්‍ය කථා ය, සේනා කථා ය, භයකථා ය, යුද්ධ කථා ය, ඥාති කථා ය, අන්න කථා ය, පාන කථා ය, යාන කථා ය, සයන කථා ය, මාල කථා ය, ගන්ධ කථා ය, තූර්ය කථා ය, ග්‍රාම කථා ය, නිගමකථා ය, නගර කථා ය, ජනපද කථා ය, ඉත්ථිකථා ය, ධූර්ත කථා ය, සූර කථා ය, විසිඛා කථා ය, කුම්භට්ඨාන කථා ය, පුබ්බපෙත කථා ය, නානාවස්තු කථා ය, ලොකක්ඛායික කථා ය, සමුද්දක්ඛායික කථා ය, ශාශ්වතදෘෂ්ටි කථා ය, උච්ඡෙද දෘෂ්ටිකථා ය, වාද කථා ය, කාමසුඛ කථා ය, අත්තකිලමථානුයෝග කථා ය, යන මේ දෙතිස් කථාවෙන් කථාවක් නො කළමහ. මහණෙනි මේ මේ කථාවෙහි යෙදෙව යි නුඹවහන්සේ උගන්වා වදාළා වූ දාන කථා ය, ශීලකථා ය, නෛෂ්ක්‍රම්‍ය කථා ය, ප්‍රඥා කථා ය, වීර්‍ය කථා ය, ක්ෂාන්ති කථා ය, සත්‍ය කථා ය, අධිෂ්ඨාන කථා ය, මෛත්‍රී කථා ය, උපෙක්ෂා කථා ය යි යන මේ දශවිධ වූ කථාවන් අතුරෙන් දානකථාවෙහි අන්තර්ගත වූ කථාවෙක ම යෙදී උනුමහ. ඉතුත්

නුඹවහන්සේ මේ විශාලා මහනුවරට වැඩ ලද්දා වූ මහත් පූජා විශෙෂයක් නුඹවහන්සේගේ ඉතා මහත් වූ බුද්ධානුභාවයක් ම කිය කියා උනුම්හ" යි කී සේක.

එ කල ස්වාමිදරුවෝ "මහණෙනි! මේ සා පූජාවක් මාගේ බුද්ධානුභාවයෙකින් ලදහ යි නො සිතව. මේ ලොකයෙහි සියලු කුශලා'කුශල ධර්‍මයෝ මි තරාදිය සේ ඉතා සූක්‍ෂම වූ වාසි ඇති සාහ. එසේ හෙයින් ලොවුතුරා බුදුවුව ත් පුරාකෘත වූ කුශල ධර්‍මය ම ප්‍රත්‍යය ය වන්නේ ම ය" යි වදාරා තුෂ්ණීම්භූත ව වැඩහුන් සේක.

එ වේලෙහි එක් භික්‍ෂූන්කෙණකුන් වහන්සේ හුනස්නෙන් පැන නැඟී සසාසා කැලු පෙරව කාෂායබන්ධධාරී ව නැමි නැමී ගොස් බුදුන් වැඳ සිංහරාජයකු දුටු ඇත්පැටවකු සේ බුද්ධතේජසින් භය ගෙණ බද්ධාඤ්ජලි ව සිට "ස්වාමීනි! ශාක්‍යසිංහ වූ බුදුරජාණෙනි! තුන් ලොවට ඇසක් වැනි වූ ස්වාමිදරුවාණෙනි! නුඹවහන්සේ දූන් ලද්දා වූ මේ පූජාව අප හැමට ප්‍රත්‍යක්‍ෂ ම ය. පෙර නුඹවහන්සේ මෙසේ වූ පූජාවිශෙෂයක් ලබන්නට කළා වූ කුශල මහිමය කෙසේ ද? ඒ අසනු කැමැත්තම්හ" යි ආරාධනා කළ සේක.

එ වේලෙහි ස්වාමිදරුවෝ පයියකින් වසා තුබූ රන් කැටපතක් හරා පාසා සේ, භවයෙන් වැසී තුබූ තමන් වහන්සේගේ පූර්වචරිත පාරමිතාවක් දක්වා වදාරණ සේක්. මහණෙනි! පෙර මා සසර පාරමිතා භූමියෙහි ඇවිදිනා වූ සමයෙහි ශඞ්ඛ නම් බ්‍රාහ්මණ කල, ඒ ජාතියෙහි මට ම දරු වූ සුසීම නම් පසේබුදුන්ගේ ධාතු පිහිටුවා කළ දාගැබ දුක ඔබකෙරෙහි කළ පුත්‍ර ප්‍රේමයෙන් හා අචල වූ ශ්‍රද්ධාවෙන් එ දා ඒ දාගැබ් මළුවෙහි වටාපතක් සා තෙත තණ පරණලා දුරුකොට කළා වූ කුශලයෙන් මේ රජගහා නුවර පටන් ගෙණ විශාලා මහනුවර දක්වා මේ අට යොදුන් මාර්ගයෙහි පුළුලෙන් සියක් රියන් පමණ තැන් වලගොඩ නැති හෙරිතලයක් සේ සැනුම් ලද. තව ද එම දාගැබ් මළුවෙහි එකුරුතුපපින් ගෙණවුත් වටාපතක් සා තැන තනාලූ වැලිපුජෙහි අනුසසින් මේ අට යොදුන් මාර්ගය සුදුවැල්ලෙන් සැදුම් ලද. තව ද එම දාගැබ වටා එ දවස් මා පුදලූ එක මල් මිටෙහි අනුසසින් ගංගාව ඇතුළු ව නව යොදුන් මාර්ගය පස්වණක් මලින් සැදුම් ලද. තව ද එම මළුවෙහි කම්බලෙන්

එ දා ඉසුලූ පැන් අනලොස්සෙහි පිණිත් එ නුවර මා පය තබාලූ ඇසිල්ලෙහි තුන්සියයක් යොදුන් ලිච්ඡවීන්ගේ රාජ්‍යය මුළුල් ලෙහි ඒ සා මහත් පොකුරු වැස්සෙක් වැසපි ය. තව ද: එම දුගබෙහි නගාලූ වියනක් පමණ පතාකයෙහි පිණිත් හා පුදාලූ එක පත්කුඩයෙහි පිණිත් හාලොව පටන් බඹලොව දක්වා අවකාශ නැති ව අතුරු නො දී උතුරුව උතුරුවා සිට ගත්තා වූ මේ සා මහත් වූ සේසත් පූජා ලදිමි. එසේ හෙයින් මහණෙනි! මේ පූජා ලදුයේ මාගේ බුඩානුභාවයෙකිනු ත් නො වෙයි. දිව්‍ය බ්‍රහම ගරුඩ යක්ෂාදි දෙවියන්ගේ ආනුභාවයෙකිනු ත් නො වෙයි. මා යට කළ කුශල මූලයෙන් ම ය යි වදරා මේ ශඞ්ඛජාතකය නිමවා කෙලවර තුව ද: භික්ෂූන්ට ම අවවාද සඳහා:

මත්තාසුඛපරිච්චාගා-පස්සෙ චෙ විපුලං සුඛං,
චජෙ මත්තාසුඛං ධීරො-සම්පස්සං විපුලං සුඛං යි.

යන මේ ගයින් බණ වදාළ සේක. එ කෙණෙහි ද බොහෝ භික්ෂූන් වහන්සේ සෝවාන් ආදි මාර්ගඵලයට පැමිණි සේක.

මෙසේ තමන් වහන්සේ එ කල විශාලා මහනුවරට වැඩ ගඞ්ගාරොහණ පූජාවෙහි බිම්සර රජහු පළමු ව පූජා කළ දෙකක් උතුරුවූ පන්සියයක් පමණ සේසත් පූජා ය. දෙවනු ව ලිච්ඡවිරජුන් කළ සතරක් උතුරුවූ දහසක් පමණ සේසත් පූජා ය. තුන්වනු ව ඔවුන් ම කළ අටක් උතුරු වූ දෙදහසක් පමණ සේසත් පූජා ය. සතරවනු ව බිම්සර රජහු කළ සොළොසක් උතුරු වූ සාරදහසක් පමණ සේසත් පූජා ය යි මේ සත්දහස් පන්සියතිසක් පමණ ඇති සේසත් පූජා ම ලත් හෙයිනු ත්, තයින් දෙවියන් බඹුන් පිදූ අප්‍රමාණ සේසත් පූජා ලත් හෙයිනු ත්, මෙසේ උදාර වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, මෙසේ මුළුලොවට අද්භූත වූ, මෙසේ මුළුලොවට ආශ්චර්‍ය්‍ය වූ, මෙසේ මුළුලොවට විසමය වූ, මෙසේ මුළු ලොවට සාධාරණ වූ, මෙසේ මුළුලොවට ශොභාසම්පන්න වූ, මෙසේ මුළුලොවට කරුණාසම්පන්න වූ, මෙසේ මුළුලොවට ප්‍රේමණීය වූ, මෙසේ මුළුලොවට කර්ණරසායන වූ, මෙසේ මුළුලොවට නෙත්‍රාඤ්ජන වූ, මෙසේ මුළුලොවට අමෘතෞෂධ වූ, මෙසේ භාග්‍යවත් වූ, මෙසේ පූජාර්හ වූ, මාගේ ස්වාමිදරු වූ, බුදුරජාණන් වහන්සේ මේ කාරණයෙනු දු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලදුයේ මැයි:

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං ති.

මේ පූජාවලියෙහි
අප බුදුන් විශාලා මහ නුවර දී ලිච්ඡවි ආදීන්ගෙන් ලද
ගංගාරෝහණ පූජා කථා නම් වූ
එක් විසිවන පරිච්ඡේද ය නිමි.

දෙ විසි වන පරිච්ඡේදය

තව ද: අප බුදුන් තව්තිසා භවනයෙහි දී සක්දෙව් රජහු ගෙන් ලද පාණ්ඩුකම්බලාසන පූජා කථා නම් කවරහ? යත්;

එහි විභාග කථාව සාවධාන ව කන් තමා මෙසේ අසා දතයුතු. පොළොව පටන් දෙසාළිස් දහසක් යොදනින් මත්තෙහි යුගන්ධර පර්වත ය හා සම වූ ආකාශයෙහි චාතුර්මහාරාජික නම් දිව්‍ය ලොකය සක්වළගල වසා අතුරු නැති ව සිටියේ ය. එහි සත් රුවන්මය වූ දිව්‍යප්‍රාසාද පමණ නැති යේ ය. වරම් රජදරුවන් සතර දෙනාගේ රුවන්මය වූ දෙව්නුවර සතර යුගඳුරු මුදුනෙහි සතර දිශාවෙහි පිහිටියේ ය.

ඒ දෙව්ලොව පටන් දෙසාළිස් දහසක් යොදනින් මත්තෙහි මෙරමුදුන හා සම වූ ආකාශයෙහි තව්තිසා භවනය සක්වළගල් දක්වා පිහිටියේ ය. ඒ මෙරමුදුන ඉන්ද්‍රනීල මාණික්‍යමය ය. එහි පිහිටි පිටිනුවර හැර මැද පිහිටි ශක්‍රපුරය නැගෙනහිරි රුවන් වාසල පටන් බස්නාහිරි රුවන් වාසලට දසදහසක් යොදුන. දකුණු දිග රුවන් වාසල පටන් උතුරු දිග රුවන් වාසලට දස දහසක් යොදුන. ඒ නුවර සියාරා දෙසියපණසක් සත්රුවන්මය වූ මහ පවුරු පිහිටියේ ය. එකී එකී දිශාවෙහි දෙසියපණස් දෙසිය පණස් වාසල් බැගින් රුවන් වාසල් දහසක් හා දොරටු පිහිටියේ ය. රත්නමය වූ ප්‍රාසාද පංක්තීන් හා, රිදීමය වූ ප්‍රාසාද පංක්තීන් හා, සත්රුවන්මය වූ ප්‍රාසාද පංක්තීන් හා, විසිතුරු වූ දිව්‍යෝද්‍යාන පංක්තීන් හා, අලඞ්කෘත වූ දිව්‍ය තටාක පංක්තීන් හා ශොභාවත් වී ය.

තව ද: එම නුවරට පිටත පූර්වදිග් භාගයෙහි සත්රුවන්මය වූ පවුරු හා රිදී දොරටුයෙන් පරික්ෂිප්ත වූ දහසක් යොදුන් පමණ තැන නන්දනොද්‍යානය පිහිටියේ ය. ඒ උයන හා නුවර දෙඅතුරෙහි පණස් පණස් යොදුන් නන්ද නම් චුල්ලනන්ද නම් පොකුණු දෙක පිහිටියේ ය. ඒ දෙ විල්තෙර කෙසෙල් ගොබ සෙයින් සිනිඳු වූ පහස් ඇති පණස් පණස් යොදුන් නන්ද නම් චුල්ලනන්ද නම් රුවන් අතල දෙක පිහිටියේ ය.

එ නුවරට දක්ෂිණ දිග් භාගයෙහි එසේ ම සත් රුවන්මය වූ පවුරු හා දොරටුයෙන් පරික්ෂිත වූ පන්සියයක් යොදුන් චිත්‍රලතා නම් උයන පිහිටියේ ය. ඒ උයන හා නුවර දෙ අතුරෙහි පණස් පණස් යොදුන් චිත්‍රා නම් චුල්ලචිත්‍රා නම් පොකුණු දෙක පිහිටියේ ය. ඒ පොකුණු දෙ තෙර ද පණස් පණස් යොදුන් චිත්‍රා නම් චුල්ලචිත්‍රා නම් දෙරුවන් අතලෙක් පිහිටියේ ය.

තව ද: එ නුවරට පශ්චිම දිග් භාගයෙහි එසේ ම සත්රුවන්මය වූ, පවුරුවාසලින් පරික්ෂිප්ත වූ, පන්සියයක් යොදුන් පාරුෂක නම් උයන පිහිටියේ ය. ඒ උයන හා නුවර දෙ අතුරෙහි පණස් පණස් යොදුන් භද්‍රා නම් චූලභද්‍රා නම් පොකුණු දෙක පිහිටියේය. ඒ පොකුණු දෙ තෙර ද පණස් පණස් යොදුන් භද්‍රා නම් චූල භද්‍රා නම් දෙරුවන් අතල පිහිටියේ ය.

තව ද: පැලදෙසෙහි එසෙයින් ම රුවන්මය වූ පවුරු හා වාසලින් ම පරික්ෂිප්ත වූ පන්සියයක් යොදුන් චිත්‍රලතා නම් උයනෙක් ඇත. ඒ උයන හා නුවර දෙඅතුරෙහි පණස් පණස් යොදුන් චිත්‍රා නම් චුල්ලචිත්‍රා නම් පොකුණු දෙක පිහිටියේ ය. ඒ පොකුණු දෙ තෙර ද පණස් පණස් යොදුන් චිත්‍රා නම් චුල්ලචිත්‍රා නම් දෙරුවන් අතල පිහිටියේ ය.

තව ද: මෙනුවරට උතුරු දිග්භාගයෙහි සත්රුවන්මය වූ පවුරු හා දොරටුයෙන් පරික්ෂිප්ත වූ පන්සියයක් යොදුන් මිශ්‍රවන නම් උයන පිහිටියේ ය. ඒ උයන හා නුවර දෙ අතුරෙහි පණස් පණස් යොදුන් ධම්මා නම් චුල්ල ධම්මා නම් පොකුණු දෙක පිහිටියේ ය. ඒ පොකුණු දෙ තෙර ද පණස් පණස් යොදුන් ධම්මා නම් චුල්ලධම්මා නම් දෙරුවන් අතල පිහිටියේ ය

තව ද: එම ශක්‍රපුරයට ම ඊශානදිග් භාගයෙහි සත්රුවන්මය වූ පවුරුමාලින් පරික්ෂිප්තවූ, සත්දහසක් යොදුන් මිශ්‍රාවන නම් උයනෙක් ඇත. ඒ උයන හා නන්‍දා නම් උයන දෙ අතුරෙහි සත්රුවින්මය වූ දහසක් කුළුගෙවලින් හෙබියා වූ සියක් යොදුන් පමණ නන්‍දා නම් පොකුණෙක් ඇත. එ නුවර මධ්‍යයෙහි තුන් සියයක් යොදුන් උස සත්රුවන්මයවූ ධජමාලාවෙන් හෙබියා වූ සත්සියයක් යොදුන් උස විජයන් නම් ප්‍රාසාදයෙක් ඇත. ඔහු අසුර විජය කළ වේලෙහි පැන නැගි හෙයින් ඒ ප්‍රාසාදය වෛජයන්ත ය යි නම් ලද. එහි බිම ඉන්‍ද්‍රනීලමාණික්‍යමය ය. වැම් සන රන්මය ය. කොත්තුරුපේකඩ රිදීමය ය. ව්‍යාඝ්‍රපඩකති ප්‍රවාලමය ය. කොත්වන් ගොණැස් සත්රුවන්මය ය. ඇලිසවෙනි රත්මය ය. එහි සියයක් පමණ මහල් ඇත. එකි එකි මහලෙහි සත්සියයක් සත්සියයක් බැගින් සැත්තැදහසක් රුවන් ගබඩා ඇත. එකි එකි ගබඩාවෙහි සක් සත් දිව්‍යාඞ්ගනාවන් බැගින් සාරලක්ෂ අනූදහසක් ඔහට මල්ලඟ වූ දෙවඟනෝ වෙසෙති. එකි එකි දිව්‍යාඞ්ගනාව මල් සුවඳ පලඳවා සරහන සත් සත් පරිවාර සත්‍රීන් බැගින් සූනිස්ලක්ෂ තිස්දහසක් පරිවාර දිව්‍යාඞ්ගනාවෝ වෙසෙති. මෙසේ ඒ එක වෛජයන්ත නම් මහ ප්‍රාසාදයෙහි ම එකුන් සතලිස්ලක්ෂ විසිදහසක් පමණ ඔහට මල්ලඟ වූ දෙවතාවෝ වෙසෙති.

මෙසේ වූ ප්‍රාසාදයක් හා ඓශ්වර්‍ය්‍යයක් ඒ සක්දෙව්රජ පෙර තමා මිනිස්ලොව වසන කල මඝින් සනජ්නා අම්බලම් ශාලාවක් කරවාලූ පිණින් ලද. එසේ හෙයින් නුවණැත්තාවූ සත්පුරුෂයන් විසින් සිත පහදවා කළ මහා කුශලයකු ත් කො මද වූ සැපතක් දෙන්නේ ය යි දතයුතු.

තව ද: ඒ ප්‍රාසාදයෙහි නැගෙනහිරි භාගයෙහි ඇතුළුනුවර ඒක පුණ්ඩරීක නම් උයනෙකුදු වී ය. ඒ උයනමැද: කඳෙබාල පත් යොදුන්, කඳවට පසලොස් යොදුන්, කඳඋස පණස් යොදුන් පමණ ඇති, පණස් පණස් යොදුන් පමණ ශාඛා පසක් ඇති, සියක් යොදුන් පමණ උස ඇති, පාරිච්ඡත්තක නම් හෙල කොබෝලීල ගසෙක් වි ය. ඒ ගස දක්ෂිණ ශාඛාග්‍රයෙහි පටන් උත්තර ශාඛාග්‍රයට සියක් යොදුන. පශ්චිම ශාඛාග්‍රයෙහි පටන් පූර්ව ශාඛාග්‍රයට සියක් යොදුන. ශාඛා මණ්ඩලයෙහි වට තුන්සියක් යොදුන. එහි මල් තුන්ගවු උස දේවතාවෝ සේසත් සේ ඉසට කොට ගන්ධමාදනාදියෙහි ක්‍රීඩාකොට ඇවිදුනාහු ය. මෙසේ ඒ මල්සුවඳ අවට සියක් යොදුන් පැතිරෙයි. සඳරැස් කලඹක් සේ ඒ ගසින් දිවූ ප්‍රභාවෙන් පණස් යොදුන් තැන අලු කෙරෙ යි.

මෙසේ වූ තමා සැතපෙනා සෙවනක් පෙර තමා මිනිස් ලොවදී මගීන් සැතපෙන්ම කොබෝලීල ගසක් රොපනය කළාවූ පිණින් ලද.

තව ද: ඒ රුක්මුල දිග සැටයොදුන්, පුළුල පණස් යොදුන්, උස පසළොස් යොදුන්, ඔහු උන් කල පුළුන්තිල්ලක් සේ නැමිය දක්වා ගැලියන පැනනැගී කල හෙරිතලයක් සේ නැගීයන ඔහු හුණු කැමැති කල හුණු පවත්නාවූ, සිසිල් කැමැති කල සිසිල් පවත්නාවූ, බඳුවද මල්පෙත්තකට බඳු වූ පැහැ ඇති, ඉතා සුරක්ත වූ, පාණ්ඩුකම්බල නම් ශෛලාසනයක්හු ද ඇත. මේ සක් දෙවුරජහු පෙර තමා මිනිස්ලොව වසනා කල යන එන මගීන් සැතපී හිඳිනා වූ ගල් පොත්තක් කළාවූ පිණින් ලද.

තව ද: ඒ විජයොත් නම් මහපායෙහි උතුරුදිග සුධම්මා නම් දිව්‍යසභාවකු ද ඇත; එහි බිම ඉන්ද්‍රනීල මාණික්‍යමය ය. හිතති දැවානමය ය. මැම් සතරන්මය ය. කොතුරු පේක්‍ෂ දැවානමය ය. වෑංස්‍රවලලු ප්‍රවාලමය ය. ගොත්වත් ගොණැස් සත්රුවන්මය ය. බඩපල ඉන්ද්‍රනීල මාණික්‍යමය ය. පිවපල සකරන්මය ය. කොත් රිදීම ය. ඒ සභාව අසමින් විනාරින් තුන්සියයක් යොදුන. මට තවසියයක් යොදුන. උස පන්සියයක් යොදුන. මුදුනෙහි හගන ලද සත්රුවන් ධජපෙළින් සොබනේය. එහි ධජනතුල්වල මැවී තිබෙන රන්රසු නාදයෙන් පඤ්චාංගික තූර්‍ය සේ මධුරනාද පැවැත දෙවියන්ගේ සිත් උමතු කෙරෙයි. සදෙව් ලොව ම ඒ සභාවට වඩනා දෙවියන් සිත් අලවනා නෙතෙක් නැත. ඒ සභාව මිනිස් ලොව දී අනුන් කරවන අම්බලම් ගෙයකට රියනක් පමණ දඬු නඹක් ලාලූ සුධම්මා නම් සත්‍රියගේ පිණින් උපන්නී ය.

ඒ සභාවෙහි දී ධර්මදේශනා ත් වෙයි. අධිකරණ විනිශ්චය ය ද දෙවියන්ගේ ඒ සභාවෙහි දී ම වෙයි. දෙවියෝ සභාවට බණ අසනා ද රැස්වෙති. පරසතු කෙළියට රැස්වෙති. අධිකරණයක් ඇති ද රැස්වෙති. බුද්ධොත්පාද කාලයෙහි සඞ්ඝයා වහන්සේ වස් වසන්නාවූ ඇසල මස මැදී පොහෝ ද රැස්වෙති. වස් පවුරුණු ද රැස් වෙති. හේ කෙසේ ද? යත්;

තවුතිසා වැසි දෙවියෝ අවුරුද්දක් මුළුල්ලෙහි "පරසතු ගස කමර ද මල් පිපේ ද? නො?"යි ගොස් බලන්නාහු එහි පත් පඬුවන් වූ කල "නො බෝ කාලකින් පත් වැගිර මල් ගන්නී"යි සතුටුව

සැණකෙළියක් කෙළිති. පත් වගුළ කල ‘‘තෝ බෝ කලෙකින් ලිය අව ගන්නී’’යි සතුටුව සැණකෙළියක් කෙළිති. ලිය අවගත් කල ‘‘මඳ දවසෙකින් පත් ගන්නී’’යි සතුටුව සැණකෙළියක් කෙළිති. පත් දුටු කල ‘‘මඳ දවසෙකින් මල් කැකුළු ගන්නී’’යි සතුටු ව සැණකෙළියක් කෙළිති. මල් කැකුළු දුටු කල ‘‘මඳ දවසෙකින් මිණි දැදිරි ව මල් මෝරයි’’ කියා සතුටු ව සැණකෙළියක් කෙළිති. මිණි දැදිරි වූ කල ‘‘මඳ දවසෙකින් මල් පිපෙයි’’ කියා, සතුටු ව සැණකෙළියක් කෙළිති. මල් පිපි කල ‘‘මල් පිපිතැ යි’’ කියා සතුටු ව සැණකෙළියක් කෙළිති.

එ ගස මල් යමකු විසින් නැගී කැඩුව මැනැවැ යි නැත. එක් සුළඟෙක් එහි පිපි මල් නටුයෙන් ගලවා පිය යි. එක් පවනෙක් කැඩූ මල් රඳවා ආකාශයෙහි සිටී. එක් සුළඟෙක් ඒ මල් සුධර්මා නම් දිව්‍යසභාවට කඳුබැඳ ගෙණ යෙයි. එක් සුළඟෙක් එහි පරමල් ඇමැද යෙයි. එක් සුළඟෙක් නවහම් මලස්නක් සේ හැම මල් අතුට යෙයි. මධ්‍යයෙහි සතර ගව්වක් උස ඔලින් ධර්මාසනයෙක් වෙයි. ඒ මුදුනෙහි තුන් යොදුන් උස සේසතෙක් තිබෙයි ඒ ආසනය ගාවා ශක්‍රදෙවේන්ද්‍රයාට තුන්ගව්වක් උස ආසනයෙක් මැවෙයි. ඔහට ඉක්බිති ව ප්‍රජාපති-වරුණ-ඊශාන ය යි යන ශක්‍රයා හා සම වූ ආනුභාව ඇති දිව්‍යපුත්‍රයන් තුන්දෙනාට දෙදෙගවු පමණ ආසන වෙයි. එයින් ඉක්බිති ව දෙතිස් මහා දිව්‍යපුත්‍රයන්ට ගවු ගවු පමණ ආසන දෙතිසක් වෙයි. ඉක්බිති ව සෙසු මහේශාක්‍ය දෙවියන්ට අඩ අඩ ගවු ආදීන් තරම් තරම් ලෙස ආසන වෙයි. සෙසු දෙවියන්ට මල්කෙමි ම ආසන වෙයි. එ කල දෙවියෝ හැම දෙන ම සභාවට රැස් ව ධර්මාසනය හැර සෙසු තමන් තමන්ගේ මල් ආසනවල ඉඳිති. ඒ මලෙහි රොන් සළා පන්සියක් යොදුන් නැඟී කැණිමඩලෙහි ගැසී නැවත බැස දෙවියන්ගේ රත්කඳගෙන් තුන්ගවු පමණ ශරීර ලාක්ෂාරසයෙන් ඉස්නා සේ තවරා සිට ගන්නී. මේ පරසතු මල් ක්‍රීඩාව සාරමසෙකින් නිමි යි. පරසතු මල් කෙළියට ඒ සභාවට දෙවියන් රැස්වීමෙහි විභාග මෙසේ දතයුතු

බණ කියන දවස් සමහර දවසෙක ඍද්ධිමත් රහත් මහ තෙර කෙණකුන් වහන්සේ හෝ ඒ ධර්මාසනයෙහි වැඩහිඳ බණ වදාරණ සේක. සමහර කලෙක කාලදෙවිලාදීන් සේ ඍද්ධිමත් තාපස කෙණෙක් හෝ දිව්‍යපුත්‍ර කෙණෙක් හෝ බණ කියති. සමහර කලෙක මිනිස්ලොවින් ගොස් උපන් ධර්මකථික දිව්‍යපුත්‍ර කෙණෙක්

හෝ විශාරද ම බණ කියති. සමහර කලෙක සක්දෙව් රජ තෙමේ ම හෝ බණ කියයි. සමහර කලෙක සනත් කුමාර නම් බ්‍රහ්මරාජයාතෝ හෝ අවුදින් තමන්ගේ දෙලොස් සොඳුන් බ්‍රහ්මාත්මභාව ය අන්තර්ධාන කොට පඤ්චශිඛ දිව්‍යපුත්‍රයාගේ වෙසින් ඒ ධර්මාසනයෙහි හිඳ බණ කියන්නාහු ය. ඒ පඤ්චශිඛයාගේ වෙසින් බණ කියන්නට කාරණ කිම? යත්;

ඒ තෙමේ ගිය දවස මිනිස්ලොව පස්කුඩුම්බියක් ඇති ව එහි පස්කොණ්ඩයක් බැඳ බාලකල ගොපල්ලන්ට නායක ව තෙල ඇවිදිනේ සෙසු කොල්ලන් එක්කොට ගෙණ තුන් මං සතර මං සන්ධියෙහි මල්පැල් තනා වල ගොබ තැනූ කපා, ගේදඹු තනා, වැලිසෑ බැඳ නවහම මල් තනා පුදා මෙසේ නොයෙක් පින්කම් කොට ප්‍රියබාල අවස්ථාවෙහි ම මිනිස්ලොවින් මිය අනුලක්ෂයකව හවුරුදු ආයු ඇති තරු පෙණෙන දිව්‍යලොකයෙහි රන්කඳක් බඳු වූ තුන්ගව්වක් පමණ දිව්‍යශරීර ඇති ව සැටගැලක් පුරාලන ආභරණ පැලඳ සෙල යාලක් සුමඳ විලෙවුන් ගෙණ ගන්ධර්වයන් පිරිවරා උපන ඒ තෙමේ තමා කළමා හෙයින් විශෙෂ වූ සැරහුම් දනිති. විශෙෂ වූ හාව භාව දනිති. දෙවියන් ප්‍රියකරවන්නාවූ කථා දනිති. මිනිස්ලොව දී වූ වාසනාවෙන් පස්කොණ්ඩයක් බැඳ වෙන වෙන නොයෙක් පැයෙන් සරහා පිළි කර හෙළා තුන්ගව්වක් දිග දිව්‍යමය වූ වීණාවක් ගෙණ දිව්‍යගායනා කොට කොට දෙදෙව්ලොව ඇවිදිනේ ය. පෙර ප්‍රිය අවස්ථාවෙහි පින් කළ හෙයින් දුනු දු මේ හැම දෙවියන්ට ම ඉතා ප්‍රිය ය. ඒ කාරණයෙන් බ්‍රහ්මරජ්ජුරුවෝ දෙවියන්ගේ චරිත දන මේ පඤ්චශිඛ දිව්‍යපුත්‍රයාගේ වෙස් මවාගෙණ ඒ ධර්මාසනයෙහි හිඳ බණ කියන්නාහු ය. ඒ සභාවෙහි දෙවියන්ගේ බණ ඇසීමෙහි විභාගය මෙසේ දතයුතු.

තව ද: මෙසේ සක්දෙව්රජහු ඒ සුධර්මා නම් දිව්‍යසභාවට වැද උන් වේලෙහි වරම් රජදරුවෝ තමන් තමන්ගේ දිශාවෙහි රැකවල් ගෙණ සිටිනාහු ය. මෙසේ උන් කල අටවක් පෝයෙහි වරම් රජුන්ගේ ලියන්නෝ ද, තුදුස්වක් පෝයෙහි වරම් රජුන්ගේ දරුවෝ ද, පසළොස්වක් පෝයෙහි වරම් රජදරුවෝ තුමූ ම, මිනිස් ලොවට අවුදින් ඒ ඒ තැන් බලා "අද මෙතෙක් පුරුෂයෝ පේවූහ. අද මෙතෙක් ස්ත්‍රීහු පේ වූහ. මේ තෙක් දෙන පන්සිල් රකිති. මේ තෙක් දෙන අටසිල් රකිති. මේ තෙක් දෙන දසසිල් රකිති. මේ තෙක් දෙන සරණසිල් රකිති. මේ තෙක් දෙන

පෙහෙවස් රකිති. මෙ තෙක් දෙන මවුපියන්ට මෙහෙ කෙරෙති මෙ තෙක් දෙන කුලදෙටුවන් පුදති. මේ තෙක් දෙන මල් පහන් පුදති. මේ තෙක් දෙන බණ අසති. බණ අස්වති. මේ තෙක් දෙන දාගැබ් මහබෝ ප්‍රතිමාදියට පුදති. මේ තෙක් දෙන ත්‍රිවිධ වූ සුචරිතයන් පුරති. මේ තෙක් දෙන දසපින්කිරියවත් පුරති" යි යනාදීන් රන්පත්වල දැහිඟුලින් ලියාගෙණ ගොස් ලියන්නෝ වූ නම් ඔහුගේ දරුවන් අතට දෙති. දරුවෝ වෙසවුණු රජන් අතට දෙති. වෙසවුණු රජ්ජුරුවෝ පඤ්චශිඛ දිව්‍යපුත්‍රයා අතට දෙති. පඤ්චශිඛ දිව්‍යපුත්‍රයා මාතලි දිව්‍යපුත්‍රයා අතට දෙයි. මාතලි සඞ්ගාහක ශක් දෙව්රජ අතට දෙයි.

යම් කාලයක මිනිස්ලොව පින්කරන්නාවූ සත්ත්වයෝ මද වූ නම් ඒ පින්කිරියවත් ලියූ පොත කුඩා වෙයි. පින් කරන්නාවූ සත්ත්වයෝ බොහෝ වූ නම් ඒ පොත ලොකු වෙයි. පොත කුඩා වූ කල හැම දෙවියෝ ම පොත බලා "මිනිස්ලොව පින් කරන්නෝ මදය. සතර අපාය පිරෙයි. අපගේ දෙව්ලෝ නො පිරෙ"යි කියා පශ්චාත්තාප වෙති. ඒ පොත මහත් වී නම් "මිනිස්ලොව සත්ත්වයෝ ඉතා අප්‍රමාද ව දවස් යවති. සතර අපාය අඩුවෙයි. අපගේ දෙව්ලෝ පිරෙයි. බුද්ධොත්පාදයෙහි පින්කොට උපන්නාවූ මහෙශාක්‍ය දෙවියන් බල බලා සැණකෙළි කෙළම්හ"යි කිය කියා ඉතා සන්තුෂ්ට වෙති. එ වේලෙහි සක්දෙව්රජ ඒ පොත අතට ගෙණ යොදනක් උස මලස්නකට පැනනැගලා කියවයි. එ වේලෙහි ඔහු සෙමෙන් කියවන කල සොළොස් යොදනක සිට දෙවියන්ට ඇසෙයි. මහත් කොට කියන කල දසදහසක් යොදුන් ශක්‍රභවනයෙහි දෙවියන්ට ද ඇසෙයි. පෝ දවස් දිව්‍ය සභාවට දෙවියන් රැස්වීමෙහි විභාග මෙසේ දත යුතු

තව ද: කප්රුක් නිසා, දිව්‍යාඞ්ගනාවන් නිසා, දෙවියන්ගේ විවාද බොහොම. ඒ විවාදයෙන් උපන් අධිකරණ සක්දෙව් රජහු කරා පැමිණෙයි. සක්දෙව් රජ මෙම සුධර්මා නම් දිව්‍යසභාවෙහි දී දෙදෙව්ලොව දෙවියන් මධ්‍යයෙහි ඒ අධිකරණ සන්හිඳුවා දෙයි. දෙව්තාවන්ගේ දරුවෝ ඔපපාතික ව උන් උන්ගේ ඇකයෙහි පණීයෙති. එ කල ඔවුන්ට අප දරුවෝ ය යි ප්‍රේම කෙරෙති. ස්ත්‍රී ඔවුන්ගේ දිව්‍ය යහන් මතුයෙහි මැවීයෙති. ඔහු භාර්‍ය්‍යා නම වෙති. උන් උන් මල් පලඳවා ආභරණ පලඳවා සරහන්නාවූ

දෙවියෝ යහන මවා පෙණී යෙති. පරිවාර දෙවියෝ ඇතුළු විමාන යෙහි පෙණී යෙති. මෙසේ උපන්නා වූ අඹුදරු පරිවාර දෙවියන් නිසා කරණ වාද නැත. යම් යම් කෙනෙක් දෙවියන්ගේ සීමාන්තර යෙහි ඉපැද ගියෝ නම් "මට හිමි ය. මට හිමියැ" යි යනාදීන් ඔවුනොවුන් හා යුද්ධ කෙරෙති. එ කල ඔහු සක් දෙව්රජහු කරා ගෙණ ගොස් "මේ අපගේ විවාද ය පසිඳ දෙව" යි කියති. එ කල ශක්‍රයෝ පරීක්‍ෂා කොට යමකුගේ සීමාවට භාර වී නම් ඔහට හිමියැ යි හරවා දෙති. ඉදින් සීමාව මධ්‍යයෙහි ඉපැද යමකුගේ විමානයට මුහුණ ලා සිටියෝතින් ඔහු හිමියැ යි පාමා දෙති. ඉදින් කාගේ විමානයකු ත් නො බලා සිටියෝතින් වාද පසිඳිනා නිසා "මා සතු යැ" යි ශක්‍රයා තමාට හැරගන්නී. හේ මෙසේ සී.

අප බුදුන් සමයෙහි කිඹුල්වත රොහිණී නම් රාජකන්‍යාවක් සතරන් දහසක් අගනා භොජන ශාලාවක් කරවා, බුදුන් ආදි වූ මහ සඟනට දන් දී, එ තැන් පටන් රජදූම යි නො සිතා තමා සවහසතයෙන් ඒ ශාලාව පිරිබඩ ගන්නී සවහසතයෙන් පැන් පෙරා හිඳිනා අසුන් පණවා තමා සියඅතින් භික්‍ෂූන් වළඳවා පින් කොට තමන් ආයු කෙළවර හිය ශක්‍රපුරයෙහි දෙවියන් සතරදෙනකුගේ සීමාන්තරයෙහි දෙව්ලොව බබුළුවා තුන්ගවු පමණ දිව්‍ය ශරීර යෙකින් දොළොස් යොදුන් දිවසළුවක් හැඳ දොළොස් යොදුන් සළුවක් එකාංශ කොට ලා සියලඟින් නිකුත් රසින් දෙව්ලොව බබුළුවා පෙණී සියා ය.

එ කල ඒ දෙවියෝ සතරදෙන "මට හිමි ය, මට හිමි යැ" යි දිව්‍යාඞ්ගනාව කෙරේ කළ ලොභයෙන් ඔවුනොවුන් හා යුද්ධ කොට ඈ කැඳවාගෙණ සක්දෙව්රජහු කරා ඒ සුධර්මා නම් දිව්‍යසභාවට ගොස් "අපගේ මේ අධිකරණ ය පසිඳ දෙව" යි කීහ. එ කල සක් දෙව්රජ බුද්ධොත්පාද කාලයෙහි පින්කළ බෙලෙන් රූපශ්‍රීන් දිලියෙන්නා වූ ඒ රොහිණී නම් දිව්‍යාඞ්ගනාව දැක තමාගේ අඩුහුන් කෙළක් පමණ දෙවඟනන් ඇත ත් ඈ කෙරෙහි අධික වූ ලොභ කොට "මෑ මට ම ඇරගණිමි" යි සිතාලා දිව්‍යපුත්‍රයන් සතරදෙනා ලඟට කැඳවා "මෑ දුටු වේලෙහි පටන් තොප තොපට කුමක් සිතේ දැ" යි විචාළේ ය. එකෙක් කියනුයේ "මෑ දුටු වේලෙහි පටන් ආකාශ ගඞ්ගාවක් නො පැකිළ දිවන්නා සේ මාගේ ප්‍රේම නමැති ගඞ්ගාව මෑගේ රූප නමැති නිම්නගලෙහි ධාරා නිපාත මෙහින් සිටියේ ම යැ" යි කී ය. එකෙක් කියනුයේ "මෑ දුටු

වේලෙහි පවත් මෑ නො ලැබෙම් දේ හෝ යි යන ශෝකයෙන් මාගේ ළය පට පටයා ගැසෙන පරිදි සටන් බෙරක් ගසන්නා වැන්නැ" යි කී ය. එකෙක් කියනුයේ "මෑ දුටු වේලෙහි පවත් මෑගේ කේශාන්ත ය පටන් පාදන්ත ය දක්වා මෑගේ රූපශ්‍රීය බලා මාගේ ඇස් ගසා ගන්න ත් නොහෙමි. ඇසිපිය සොල්වා ගන්න ත් නො හෙමි. එසේ හෙයින් ඇස්දෙක කකුළුවකුගේ ඇස් සේ මෑ කරා ම නෙරී ගියේයැ" යි කීය. එකෙක් කියනුයේ "මෑ දුටු වේලෙහි පවත් මෑ නො ලැබෙම් දේ හෝයි යන ශෝකයෙන් මාගේ ළඟ පට පටගා ගැසෙන පරිදි ත් මාගේ සිත සෝ දුකින් වැනි වැනී සිබෙන පරිදි ත් දඟබ් කැරැල්ලක් අග බැඳි පතාකයක් හැම වේලෙහි ම සුළං පහරින් පට පටගා හැසී ගැසී ඔබ මොබ වැනි වැනී සැලෙන්නා වැන්නැ" යි කී ය.

ඉක්බිත්තෙන් සක්දෙව්රජ ඔවුන් සතරදෙනා කී මේ උපමා කථා අසා කියනුයේ "පින්වත්නි! මෑ නො ලද්ද නම් තෙපි සතර දෙන මියන්නා ද, නො මියන්නා දැ" යි විචාළේ ය. ඔහු සතර දෙන ම නො මියම්හ යි කීහ. සක්දෙව්රජ කියනුයේ "පින්වත්නි! මේ දේවතා දුම දූස් ඉදින් මම නොලදිම් නම් මට මාගේ ශක්‍රසම්පත්තීයෙනු ත් කම් නැත. වෛජයන්ත නම් ප්‍රාසාදයෙනු ත් කම් නැත. පාණ්ඩුකම්බලශෛලාසනාදියෙනු ත් කම් නැත. දෙකෙළපණස් ලක්ෂයක් පමණ ඇති මාගේ දිව්‍යාඞ්ගනාවන්ගෙනු ත් කම් නැත. දූත් ම මියන්නෙමි වේ දෑ" යි කී ය.

එ බසට දේවතාවෝ සතරදෙනම ඔවුනොවුන් මුහුණ බලා සිනාසී "අපි ත් තොපගේ ම ය. මේ දෙව්ලොව ත් තොපගේ ම ය. එහි උපන් කෙණකුන් තොපගේ ම ය. එක දෙව්දූවක් නිසා, තොප වැනි දිව්‍යරාජයකු මලෝතින් අපට මී අලාභ ය. සියලු දෙවියන්ගේ කාර්‍ය්‍යාකාර්‍ය්‍යයෙහි අප්‍රමාද වූ තොප වැනි දිව්‍ය රාජයක්හු ලැබගත නො හැක්කෝ ම ය. ස්වාමිනි! නො කියව, තොප කිම් සැපත තෙපි ම ගණුව, අප සතරදෙනාගෙන් ම තොපට සරණ දෙම්හ" යි ඔහට ම පාවාදී ගියහ. ඒ තැන් පටන් සක්දෙව්රජ ඒ රෝහිණී නම් දිව්‍යාඞ්ගනාව අගමෙහෙසුන් කොට ප්‍රියවාසයෙන් විසී ය. ඒ දිව්‍යසභාමෙහි දී කරණ අධිකරණ කථාමෙහි විභාග මේ ආදීන් දතයුතු.

වස් වසනු පවරණ දා දෙවියෝ ඒ දිව්‍යසභාවට රැස් ව "අද කොයි ගොසින් බණ බණ අසමෝද්ද" යි ඔවුනොවුන් හා කථා

කෙරෙති, එහින් සක්දෙව්රජ බොහෝ සේ ම පුවඟු දිවයිනෙන් හෝ ලක්දිව හෝ අවුදින් පවරා පුදා මහබෝ වැඳ යෙයි. සෙසු දෙවියෝ පරසතුමල් දිමගඬාදීන් ගෙණ තමන් තමන් අභිප්‍රාය තැනට ගොස් පවරා වැඳපුදා යෙති. අබුද්ධොත්පාදයෙහි එ ම සභාවෙහි දිම පවරති. වස් වසන පවරණ ද ඒ සභාමඬ දෙවියන් රැස්විමෙහි විභාග මේ ආදීන් දතයුතු.

තව ද: ඒ සක්දෙව්රජහු සියලු දෙවියන් රැස්කරණ වේලෙහි තමාගේ එක්සිය විසි රියන් දිග විජයොත් නම් සක තුඩ තබා එක් පලක් පිඹි කල ඒ නාදය දස දහසක් යොදුන් ශක්‍රභවනයෙහි පැතිර සාරමස් දෙපෝයක් සිඳෙයි. මෙසේ විසිතුරු වූ තවුතිසා දිව්‍යලොකයෙහි රජ කරණ ඒ සක්දෙව්රජ උද්‍යානාදී ක්‍රීඩාමඬ විජයත් නම් තමාගේ මහපායෙන් සෙලවී සිය වේලෙහි දෙදෙව්ලොව දෙවියෝ සක්මිළගල් පයහිනාත ව හැම දෙන හැල්ල යති.

එ කල ධෘතරාෂ්ට්‍ර නම් වරම්රජ තමාගේ මහ සෙනඟ ගෙණ ශ්වෙතවස්ත්‍රාභරණ පැලඳ දූවාකමය කඩුපලඟ ගෙණ කෙළලක්ෂයක් හැළි අසුන් නැංගාවූ කෙළ ලක්ෂයක් පමණ තමාගේ ගඳබ් භවයන් පිරිවරා තෙමේ ද ශ්වෙත වස්ත්‍රාභරණයෙන් සැරසී දූවාකමය වූ කඩුව හා පලඟයක් ගෙණ ශ්වේත අශ්වරාජයකු පැනනැගි කෙළලක්ෂයක් පමණ රිදී වැට ගහතින් දිලිහි දිලිහි පූර්ව සක්වළ මුවවිටියෙහි පිටත බලා සක්දෙව් රජහට අරක් ගෙණ සිටගන්ති.

තව ද: විරූළ්හක නම් වරම් රජ තුමාගේ මහසෙනඟ ගෙණ නීලවස්ත්‍රාභරණ පැලඳ ඉන්ද්‍රනීලමය වූ කඩුපලඟ ගෙණ කෙළ ලක්ෂයක් නිල අශ්වයන්ට පැනනැගී කෙළ ලක්ෂයක් කුම්භාණ්ඩ භවයන් පිරිවරා තෙමේ ද ඉන්ද්‍රනීල වස්ත්‍රාභරණයෙන් සැරසී ඉන්ද්‍රනීලමය වූ කඩුවක් හා පලඟයක් ගෙණ නීලමණි දිව්‍ය අශ්වරාජයකු පැන නැගී කෙළලක්ෂයක් මිණිදඹුවැට පහතින් දිලිහි දිලිහි දකුණු සක්වළ මුවවිටියෙහි සක්දෙව් රජහට අරක් ගෙණ පිටත බලා සිටගන්ති.

තව ද: විරූපාක්ෂ නම් වරම් රජ තමාගේ මහසෙනඟ ගෙණ ප්‍රවාලමය වූ වස්ත්‍රාභරණ පැලඳ ප්‍රවාලමය වූ කඩුපලඟ ගෙණ කෙළලක්ෂයක් පමණ සුරතන වූ අශ්වරාජයන්ට පැනනැගී, කෙළ ලක්ෂයක් නාගභවයන් පිරිවරා තෙමේ ද ප්‍රවාලමය වූ දිව්‍යවස්ත්‍රාභරණයෙන් සැරසී ප්‍රවාලමය වූ කඩුවක් හා පලඟයක් ගෙණ

ප්‍රවාලපත්‍රයක් මැනි වූ දිව්‍ය අශ්වරාජයක්හු පැන නැගී, කෙළලක්‍ෂයක් පමණ පබළු වැටපෙළතින් දිළිහි දිළිහී පැලගත්වල මුවවිටියෙහි සක්දෙව් රජහට ම අරක් ගෙණ සිටගන්නී.

තව ද: වෙසමුණු මහරජ ද තමාගේ මහසෙනග ගෙණ රන් මන් වස්ත්‍රාභරණයෙන් සැරසී, රත්මත් කඩුපලහ ගෙණ කෙළලක්‍ෂයක් පමණ රත්මත් වූ අශ්වරාජයන්ව පැනනැගී, කෙළලක්‍ෂයක් පමණ යක්‍ෂ සේනාව පිරිවරා තෙමේ ද කනකමය වස්ත්‍රාභරණයෙන් සැරසී, කනකමය වූ කඩුවක් හා පලගක් ගෙණ කනක වර්ණ දිව්‍ය අශ්වරාජයක්හු පැන නැගී, කෙළලක්‍ෂයක් පමණ රන් වැටපෙළකින් දිළිහි දිළිහී උතුරු සක්වළ මුවවිටියෙහි පිටත බලා සක්දෙව් රජහට ම අරක් ගෙණ සිට ගන්නී.

තව ද: සුබම්ම නම් ගාන්ධර්ව දිව්‍යපුත්‍රයෙක් තුන්ගවු දිග සජීං තසඳන නම් මහ බෙරයක් කර ලාගෙණ, අටසැටදහසක් හෙරින් සමග ලක්‍ෂගණන් නළුවන් පිරිවරා පැදුම් සක්වළ මුදුනෙහි පණස් යොදුන් තෙක රඟ මඩුලු බැඳ සිටගන්නී. තව ද: තිම්බරු නම් ගාන්ධර්ව දිව්‍යපුත්‍රයෙක් තුන් ගව්වක් පමණ දිග පමුබ නම් මහ බෙරක් ගෙණ, අටසැටදහසක් හෙරීන් හා සමග ලක්‍ෂගණන් නළුවන් පිරිවරා පණස් යොදුන් තැන රඟමඩුලු බැඳ දකුණුසක්වළ මුවවිටියෙහි සිට ගන්නී. තව ද: දික්පමුබ නම් ගාන්ධර්ව දිව්‍ය පුත්‍රයෙක් තුන්ගවු දිග මහාඝාණ්ඩ නම් මහ බෙරයක් කර ලා අටසැටදහසක් දිව්‍යහෙරීන් හා ලක්‍ෂගණන් නළුවන් පිරවරා පණස්යොදුන් තැන මහ රඟමඬුලු බැඳ බස්නාහිර සක්වළ මුවවිටියෙහි සිට ගන්නී. තව ද: පඤ්චසිඛ නම් දිව්‍යපුත්‍රයෙක් තුන් ගව්වක් පමණ සුස්වර නම් මහ බෙරයක් කර ලා, අටසැට දහසක් හෙරීන් හා ලක්‍ෂගණන් නළුවන් පිරිවරා, පණස් යොදුන් තැන මහ රඟමඬුලු බැඳ උතුරු සක්වළ මුවවිටියෙහි සිට ගන්නී.

තව ද: අලම්බුසාදි වූ නාටක ස්ත්‍රීන් අතුරෙන් ගම්භීරා නම් දිව්‍යාඞ්ගනාවක් තමාගේ පිරිවර ගෙණ අවුදින් තුන්ගවු දිග මහ වෙණ නම් වීණාවක් අතින් ගෙණ එකම්වක් ගායි; එතෙණෙහි අටසැටදහසක් වීණා නාද පැතිර දෙව්ලෝ පුරා සිට ගන්නී. තවද: සුධම්මා නම් දිව්‍යාඞ්ගනාවක් සපිරිවරන් අවුත් සිට තුන් ගව්වක් දිග සුනඳර රාව නම් වස් දන්ඩක් පිඹලයි. එ තෙණෙහි අටසැට දහසක් වස්කුලල් තෙමේ ම රැවු දෙයි. තව ද:

1. සාධු.

ආහත්‍යසරියා නම් දිව්‍යාඞ්ගනාවක් සපිරිවරින් අවුත් සිට තුන් ගව්වක් දිග නලබු නම් වීණාවක් ගාලයි. එ කෙණෙහි අටසැට දහසක් වීණා කද තෙමේ ම ගායනා කෙරෙයි. තව ද: මණිමෙඛලා නම් දිව්‍යාඞ්ගනාවක් සපිරිවරින් අවුත් සිට විජයතුරු නම් සනක් පිඹියි. එ කෙණෙහි ද අටසැටදහසක් විජයතුරු නම් සක් තෙමේ ම සමාව නාද කෙරෙයි. තව ද: මනොහරා නම් දිව්‍යාඞ්ගනාවක් තුන්ගව්වක් සා පැළුබිම්බ නම් මිහිගු බෙරයක් ගසයි. එ කෙණෙහි ද අටසැටදහසක් මිහිගුබෙර තෙමේ ම නාද කෙරෙයි. රුවු දෙයි තව ද: අතිවාතතිකා නම් දිව්‍යාඞ්ගනාවක් සපිරිවරින් අවුත් සිට තුන්ගව්වක් සා ආනන්ද ජනක නම් මිහිගු බෙරයක් ගසයි. එ කෙණෙහි ද අටසැටදහසක් ආනන්ද භෙරි තෙමේ ම නාද පවත්වයි. තව ද: මතනකි නම් දෙව් දූවක් සපිරිවරින් අවුත් සිට තුන්ගව්වක් පමණ එකවජ්ද්‍ර නම් ගායනාවක් කෙරෙයි. එ කෙණෙහි අටසැටදහසක් එකවජ්ද්‍ර තෙමේ ම නාද කෙරෙයි තව ද: නන්‍ද නම් දිව්‍යාඞ්ගනාවක් ඝොෂණසවර නම් තුන්ගව්වක් දිග මහා වීණාවක් ගායනා කෙරෙයි. එ කෙණෙහි අටසැටදහසක් ඝොෂණ සවර තෙමේ ම නාද කෙරෙයි. තව ද: යාමා නම් දිව්‍ය ස්ත්‍රියක් තුන්ගව්වක් සා චිත්‍රපුෂ්කර නම් පටහ භෙරියක් ගසයි. එ කෙණෙහි පිරිවර අටසැට දහසක් පටහ බෙර තෙමේ ම රුවු දෙයි. තව ද: ඝොරසවර නම් දිව්‍යාඞ්ගනාවක් තුන් ගව්වක් දිග මන්‍දසවර නම් මිණිපජියක් වය යි එ කෙණෙහි පිරිවර අටසැට දහසක් මිණිපජි තෙමේ ම රුවු දෙයි. තව ද: සර්‍වාඞ්ගශොභනා නම් දිව්‍යාඞ්ගනාවක් තුන්ගව්වක් දස මහාඝොෂා නම් බෙරක් ගසයි. එ කෙණෙහි අටසැට දහසක් පිරිවර මහාඝොෂා නම් බෙර එකවිටම නාද කෙරෙයි. මෙසේ ම නොයෙක් දහස් ගණන් දිව්‍යාඞ්ගනාවෝ ආතත ය – විතත ය – ආතතවිතත ය – ඝන ය– සුසිර ය යන නොයෙක් නාමයෙන් විසිතුරු වූ වාදයෙන් වාද්‍ය කරන්නාහු ය.

මෙසේ නොයෙක් දිව්‍ය නළුවන් පිරිවරා ඒ සක්දෙව් රජ උයන් කෙළිසම් යනුයේ ඇතැම් කලෙක විසවකම්යා මැවූ නාරි වාහන නම් සත්රුවන්මය වූ විසිතුරු මණ්ඩපයකින් යෙයි. ඇතැම් කලෙක දහස් ගණන් දිව්‍ය වූ ශ්වෙත සෛන්ධවයන් යෙදූ පඤ්චවර්ණ වූ ධවජමාලාවෙන් ශොභනා වූ සත්රුවන්මය වූ යෙළ සියයක් යොදුන් විජයන් නම් දිව්‍යරථයෙන් යෙයි. සමහර කලෙක ඓරාවණ නම් හස්තිරාජයා පිටව පැන නැඟී මහත් වූ ඓශ්වර්‍ය්‍යයෙන් යෙයි. ඒ කෙසේ වූ ඇතෙක් ද යත්.

දෙව්ලොව තිරිසනුන් නැති හෙයින් එක් දිව්‍යපුත්‍රයෙක් ඓරාවණ නම් ඇත්වෙසයක් මවාගන්නී. ඔහුගේ දිග යෙළ සියයක් යොදුන, උස අනූ යොදුන, බොල පණස් යොදුන, කුඹු තෙතිසක් ඇත. එකෙකි කුඹෙහි පණස් යොදුන් පමණ දිග ඇති සත්දළ ය. එකි එකි දළෙහි සත් සත් පොකුණු ය. එකි එකි පොකුණෙහි සත් සත් පියුම් ගස ය. එකෙකි ගසෙහි සත් සත් පියුම් වෙයි. එකෙකි පියුමත් සත් සත් පෙති වෙයි. එකෙකි පෙත්තෙහි තුන්ගවු උස දිව්‍යාඞ්ගනාවෝ සත් සත්දෙන නටන්නාහු ය. එකෙකි දිව්‍යාඞ්ගනාව පිරිවරා සත් සත් දිව්‍යාඞ්ගනාවෝ සිටිනාහු ය. මෙසේ එක එක හස්තිරාජයාගේ ම කුඹු තෙතිසක. දළදෙසිය එක්තිසක, පොකුණු එක්දහස් සසිය දසහතෙක, පියුම් ගස් එකොළොස්දහස් තුන්සිය දසනවයෙක. පියුම් සැත්තෑහමදහස් දෙසිය තෙතිසක. පෙති පස් ලක්ෂ සිවුපණස් දහස් සසිය එක් තිසක. නාටකස්ත්‍රීන් අටතිස් ලක්ෂ දෙසොළොස්දහස් සාරසිය දසසත්දෙනෙක, පරිවාර ස්ත්‍රීන් දෙකොළ එක්සැත්තෑ ලක්ෂ සැත්තෑදහස් සමසිය දසනවදෙනෙක. මෙසේ අලඞ්කාර වූ ඒ හස්තිරාජයා මිම සක්දෙව් රජහට දිග පණස් යොදුන්, උස පසළොස් යොදුන්, සත්රුවන් මණ්ඩපයක් හෝ මැවී යෙයි. නොනොක් මඩුයෙහි සුදශීන නම් මහ කුඹ පිට දෙළොස් යොදුන් රුවන් මඩුවෙක් හෝ මැවී යයි.

ඒ මඩුවෙහි හුමාසුදනසක් පමණ සත්රුවන් පා පෙළ වෙයි. එකෙකි පා පෙළ වැළඳ සිටිනා වූ සත් සත් රත්ලිය වෙයි. එකෙකි ලියෙහි සත් සත් මල් නැත් වෙයි. ඒ අතරතුරෙහි සත්රුවන්මය වූ ධ්වජපෙළ වෙයි. තැන තැන එලෙක මිණිකිකිනි දැල් වෙයි. ඒ දැල් මඳමාරුතයෙන් පහළ තළ පඤ්චාඞ්ගික තූර්‍ය්‍යනාද සේ මධුර නාද ඇසෙයි. ඒ මඩුව වටා මිණිමය වූ පදනම් වෙයි. ඒ පදනමින් පිටත අටවිසි යක්ෂසේනාධිපතිවරු ආයුධ ගෙණ සිටිති. ඒ පදනමින් ඇතුළ සක්දෙව් රජහට වලලහ වූ මහෙසාක්‍ය දිව්‍යරාජයෝ සිටිති. තෙතිස්කුඹෙහි මැවූ තෙතිස් රුවන් මඩුවල තෙතිස් දිව්‍යපුත්‍රයෝ සහපිරිවරින් සිටිති. ඒ රුවන් මඩුවල මැද යොදනක් උස් මිණි පලග මතුවෙහි තුන්යොදුන් උස සේසත් යට සක්දෙව් රජ සැට ගැළක් පුරාලන ආභරණ හා හෙලයාලක් සුමඳ විලවුන් ගල්වා, ගවුඋස මිණිඔටුනු පැලඳ මහත් වූ දිව්‍යරාජශ්‍රීන් සොභමාන ව හිඳ ගන්නී.

එ වේලෙහි සුධර්මා නම් අගමෙහෙසුන් දිව්‍යාඞ්ගනා දිව්‍යපලඳ නාවන් සැරසී ලක්ෂගණන් දිව්‍යාඞ්ගනාවන් පිරිවරා සක්දෙව්

රජ හට අභිමුඛ ව හිඳ ගන්නී. සුජාතා නම් වල්ලභ ස්ත්‍රී දිව්‍යාභරණයෙන් සැරසී ලක්‍ෂගණන් දිව්‍යස්ත්‍රීන් පිරිවරා දක්‍ෂිණපස හිඳගන්නී. නන්‍දා නම් දිව්‍යාඞ්ගනා ද සර්‍වාභරණයෙන් සැරසී ලක්‍ෂගණන් දිව්‍ය ස්ත්‍රීන් පිරිවරා වම්පස හිඳගන්නී. චිත්‍රා නම් දිව්‍යාඞ්ගනා සර්‍වාභරණයෙන් සැරසී ලක්‍ෂගණන් දිව්‍යස්ත්‍රීන් පිරිවරා පිටිපස්සෙහි හිඳගන්නී. මෙසේ අගබිසෝවරුන් සතර දෙනා සැරසී ගෙණ පලඟු ව උන් කල්හි නම ද: සක්දෙව්රජහට වල්ලභ වූ තෙයානූදහසක් දිව්‍යාඞ්ගනාවෝ සැරසී රුවන් ස්වාදී පානීය භාජනයන් ගෙණ හාත්පසින් සිටිනාහු ය. ඔවුන් පිරිවරා නොයෙක් ලක්‍ෂගණන් දිව්‍යාඞ්ගනාවෝ පුන්කලස් ගෙණ සිටිනාහු ය. මෙසේ අඩුතුන් කෙළක් දෙව්නාහන් සහ අටවිසි යක්‍ෂසේනාධිපතීන් ආදී වූ දෙදෙව් ලොව දෙවියන් පිරිවරා සූවිසි කෙළක් දිව්‍යනාටකයන්ගේ විසිතුරු වූ දිව්‍යනාටකයන් විඳ විඳ ඔහු නන්‍දනෝද්‍යානාදියට නික්මුනු වේලෙහි මෙලෙසින් ද වන්නේ ය.

මෙසේ ඒ ශක්‍රයාගේ සම්පත් එක මුඛයෙකින් තබා දහසක් මුඛයෙකිනු ත් කියා නිමවාගත නො හැක්කේ මැ ය. මෙසේ වූ ඓශ්වර්‍ය සම්පත් කෙසේ වූ පින් කොට ලද්දේ දැ යි යතහොත්;

මේ තමා මිනිස්ලොව වසන කල මවුපියන්ට සිකරු ව, අත්පා මෙහෙ කෙළේ ය. කුල වැඩිමහල්ලන් දක ආදර කෙළේ ය. සියලු සතුන්ට මට සිලුටු වූ ප්‍රියතෙපුල් කී ය. කේලාම් නො කී ය. අලෝභී වී ය. ඔබ්බර වස් රක්‍ෂා කෙළේ ය. එක දවසෙක ත් අනුන්ට නො කිපියේ ය. මේ සප්ත ප්‍රකාර වූ ගුණධර්‍මයන් හේතු කොට ගෙණ මේ සා ශක්‍රසම්පත් ලැබුයේ යි දතයුතු. මතුලේ මැනෙහි:-

මාතාපෙත්තිභරං ජන්තුං–කුලෙ ජෙට්ඨාපචායිනං,
සණ්හං සඛිල සම්භාසං–පෙසුණෙය්‍යප්පහායිනං.

මච්ඡෙරවිනයෙ යුත්තං–සච්චං කොධාභිභුං නරං,
තං වෙ දෙවා තාවතිංසා–ආහු සප්පුරිසො ඉති යි.

තව ද: මේ සක්දෙව්රජහු ම අප බුදුන් වැදහෙව තුන්කෙළ සැට ලක්‍ෂයක් ආයු ලැබ අසූදහසක් දෙවියන් සමග සෝවාන් වූ පරිදි කෙසේ ද? යත්;

එක් සමයෙක මාගේ ස්වාමිදරු වූ බුදුරජාණන් වහන්සේ මගධරට රජගහ නුවරට පැදුම් දෙසෙහි මග අඹවනයක් සමීපයෙහි ඇති වූ ගෙයින් අඹසැඩ නම් වූ බමුණු ගමට උතුරුදිග

සිඝාරා තිල්මතශෙඛින් පරික්ෂිප්ත වූ හෙයින් වේදිය නම් වූ පර්වත මුදුනෙහි දොර සිටි ඉඳුසල් ගසක් ඇති හෙයින් ඉන්ද්‍රශාල ගුහාය යි ප්‍රසිද්ධ වූ, පවුරු පදනම් දොරටුයෙන් සෙදුනා වූ ගල්ගුහායෙහි වැඩවසන සේක. එ කල ශක්‍රයාට බුදුන් දක්නා රිසි වි ය. තෙමේ ඇම විට ම බුදුන් දක දක ම සිටිනා කැමැත්තේ ය. දෙවියන්ගේ කාර්‍ය්‍ය බොහෝ හෙයින් තමා ඉතා අප්‍රමාද ව ඔබ ත් ව්‍යාපාතවෙයි. බුදුන් කරා ත් ඒ ම ය. එ දවස් වනාහි තමාගේ ආයු ක්ෂය වූ බැ හෙයින් මරණ භයින් වෙවුලා බුදුන් දක්නා කැමැති විය. කෙසේ දැ? යත්;

ඔහු මනුෂ්‍යගණනායෙන් තුන්කෙළ සැවලක්ෂයක් හවුරුදු ශක්‍රසම්පත් විඳ, ආයු ගෙවුනු කල පඤ්චපූර්වනිමිත්ත දැක, තමාගේ ආයු පිරිහී ගිය බව දැක, බුදුන් දක්නා කැමැති විය. එහි මඳ මඳ පිණක් කොට උපන් දෙවියන්ට මරණ කාරණා පෙණුනු කල "අප කළ පින් ගෙවිය. මෙයින් ගොස් කොයි උපදුමෝදෝ හෝ" යි මහත් වූ භය ඇති වෙයි. බොහෝ පින්කොට උපන් දෙවියෝ මරණ කාරණ දුටුකල "මතුමත්තෙහි දෙව්ලොවට නැගෙම්හ" යි සතුටු වෙති.

සක්දෙව් රජහට පූර්වනිමිත්ත පෙණුනු වේලෙහි මේ දසදහස් යොදුන් ශක්‍රපුරය ද, දහසක් යොදුන් විජයත් නම් මහ පාය ද, පන්සියක් යොදුන් සුධර්මා නම් දිව්‍යසභාව ද, සියක් යොදුන් පරසතු මදාරාගස ද, සැටයොදුන්පාණ්ඩුකම්බල ශෛලාසනය ද, අඩු තුන්කෙළක් දිව්‍යාඞ්ගනාවෝ ද, දෙදෙව්ලොව දිව්‍යසේනාව ද, දහසක් යොදුන් නන්දනොද්‍යානය ද, යනාදි තමාගේ ශක්‍රසම්පත් බලා "මේ සා සැපතෙකින් පිරිහෙම්" යි භයින් වෙවුලා ගිය.

ඉක්බිත්තෙන් "කවර මහණෙක් බමුණෙක් දෙවියෙක් බඹෙක් මේ ශෝක නමැති ශල්‍යය මාගේ ලෙන් හයා හැර මාගේ මේ දිව්‍යසම්පත්තිය ස්ථාවර කොට ලන තරුණ පුරුෂයෙක් ඇද්දේ හෝ නැද්දේ හෝ" යි බලා කිසි සත්ත්වයකු නො දැක, නැවත පරීක්ෂා කොට, කාරුණ්‍ය නිධාන වූ පරදුඃඛ දුඃඛිත වූ සබඹ චූඩාමණි වූ මාගේ බුදුන් සිහිකොට "මා සේ වූ එක සත්ත්වයකු තබා සියක් දහසක්-ලක්ෂයක් සත්ත්වයන්ගේ ශොකශල්‍යය බුදුහු හරණා සේක" යි සිතූ වේලෙහි නැමත ඔහුගේ මරණභය සන්හිඳී එවිට ම ගොසින් බුදුන් දක්නට උත්සාහ මැණීක.

එ කල ශක්‍රයා අප බුදුහු කොයේ වූ තැනක දනව්වෙක, කොයේ වූ සත්ත්වයකුගෙන් දන් වළඳා, කොයේ වූ සත්ත්වකෙණකුන්ට දහම් අමා දෙන සේක් දෝ හෝ යි පරීක්ෂා කොට බලනුයේ යවකී ඉන්ද්‍රසාල නම් ගුහායෙහි වැඩහිඳිනා සේ දැක, බුදුන් දක්නට මා හා සමඟ එව" යි තව්තිසා භවනයෙහි දෙවියන් කැඳවී ය.

එකලාව නො ගොසින් කුමක් නිසා ඇම දෙවියන් කැඳවී ද? යත්; පෙර එක් දවසක් මේ ම සක්දෙව්රජ බුදුන් ජේතවනාරාම යෙහි සලලාගාර නම් ගඳකිළියෙහි වැඩවසන කල එකලා ම බුදුන් දක බණ අසන්ට ගියේ. බුදුහු ඔහුගේ අධිගම් ලබන නුවණ තව ලා මස් දැක, "මතු ඉන්ද්‍රසාල ගුහාවෙහි දී අසූදහසක් දෙවියන් සමඟ මාර්ගඵල දෙමි" යි සිතාලා ඔහට එදා අවකාශ නුදුන් සේක. ඒ කාරණයෙන් "එකලා ව ගියෙම් නම් අද ත් අවකාශ නො ලදිම් නම් නො යෙදෙයි. බොහෝ දෙවියන් හා සමඟ ගියකල කිසිකෙණකුන් උදෙසා බණ වදාරණ සේක." යි සිතා තමා නුවණැති හෙයින් තව්තිසා වැසි දෙවියන් ඇම දෙනා ම කැඳවී ය යි දතයුතු.

ඉක්බිත්තෙන් දිව්‍යසේනාව එ බස් අසා "මහරජ! තව මැබෙක් වේව යි, බොහෝ දවසක් ජීවත් වෙම යි, උයන්කෙළි හිමවුකෙළි ගංගාකෙළියට යම්හ යි නො කියා අප බුදුන් කරා යමහ යි සිතූ සේ මැනැවැ" යි සතුටු ව සක්දෙව්රජහුගේ එ කෙපුල් මුදුනෙන් පිළි ගෙණ හැම දෙවියෝ නික්මුනාහ. එ කල සක්දෙව්රජ දිග් කළු අතක් වක් නො කරණ ඇසිල්ලෙහි දෙව්ලොවින් පහ ව ඒ වෙදිය නම් පර්වතයට බැස පෙර එන දෙවියකු බඹකු එ කෙනට බට කල මහත් වූ ආලෝක වෙයි. එ දා දෙදෙව්ලොව දෙවියන් හැම දෙනාගේ ශරීර ප්‍රභායෙන් ඒ පර්වතය හිරුදහස් සඳදහස් නැංගා සේ වි ය.

එ වේලාව නම් සවස මනුෂ්‍යයන් කන බොන බාලදරුවන් දොර හිඳ කෙළිනා වේලාව ය. ඒ කාරණයෙන් එ දනව්වෙහි සියලු මනුෂ්‍යයෝ දිලියෙන පර්වතය දැක "අප බුදුන් කරා මෙ තෙක් කල් දෙවියෝ මධ්‍යම රාත්‍රියෙහි එති. අද පෙරයම් වේලෙහි ම ආවාහු ය. කිමෙක් දෝ මහේශාඛ්‍ය දිව්‍යරාජයෙක් හෝ බුදුන් කරා පැන විචාරන්ට ආ වන. අප බුදුහු කොයේ නම් පැන වදාරණ සේක් දෝ හෝ, එසේ වූ දෙවියන්ගේ පමා සැක හරණ බුදුහු දුන් අපට නුදුරු තෙන වසන සේක. එසේ වූ සවාමි

දරුවන්ට බත් සරළුවක්, කැඳ සරළුවක්, දුන්නා වූ සත්වයන්ට වඩා මේ ලෝකයෙහි පිණැත්තෙක් නැතැ"යි සිත සිතා, කිය කියා, සියලඟ ලෝමහර්ෂ ගෙන්ව ගන්වා දොහොත් මුදුන් බැඳගෙණ සාධුකාර පූජා දහස්ගණන් කොට කොට බල බලා සිටිනාහු ය.

එ කල ශක්‍රදේවරජ පඤ්චසිඛ නම් දිව්‍යපුත්‍රයා කැඳවා "පඤ්චසිඛ ය! මම සරුකී සෙමි. බුදුහු අරගී යේක. එසේ හෙයින් බුදුන්ගේ අදහස් කාටත් නො දැනෙයි. තෝ පළමුකොට පලාගොස් බුදුන් සතුටු කරවා මා ආ බව කියා අවසර ඉල්වා දීලව. එ කල මම ගොස් දැක මඳිමි"යි කීහ. කාරණ කිමි? යත්; මේ පඤ්චසිඛ දිව්‍ය පුත්‍රයා නම් බුදුන් කෙරෙහි වල්ලභ ය. සිතූ සිතූ විට ගොස් බුදුන් හා සමඟ කථා කෙරෙයි. භය නැති ව ගොස් අවසර ඉල්වා දෙන දෙවියෙක් සදෙව්ලොවම මෝහට වඩා නැත. එසේ හෙයින් ඔහු ම යැවී ය.

ඉක්බිත්තෙන් ශක්‍රයා කී බස් ගිවිස ඒ පඤ්චසිඛ දිව්‍යපුත්‍ර තෙමේ තමාගේ බෙලුව පණ්ඩු නම් වීණාම ගෙණ බුදුන් කරා නික්මිය. ඒ කෙසේ වූ වීණාවෙක් දැ? යත්; ඒ වීණාවෙහි පොකුර සතරන්මය ය. කඳ ඉඳුනිල්මිණිමය ය. තත් රිදීමය ය. මෙඬන ය ප්‍රවාලමය ය. වීණාපත්‍ර ය ගව්වක් දිග ය. තත් ගව්වක් දිග ය. කඳ ගව්වක් දිග ය. මෙසේ තුන්ගව් පමණ දිග ඒ වීණාව ඇරගෙණ මූසනින් මූසන් කොට සඳා, නිය ඉඟින් පැහැර, මධුර වූ ගීතස්වර යක් හැර ලා, ඒ වීණාකඳ අල්ලෙහි තබාගෙණ, බුදුන් වැඩහුන් ඒ ඉන්ද්‍රශාලා නම් ගුහාවට වැද, නුදුරු නො ලං ව බුදුන් අභිමුඛයෙහි සිටගෙණ වීණා කඳ වමතින් ගෙණ, දකුණතින් වීණාපත හා සමඟ බුදුන්ට නමස්කාර දක්වා ලා, බුදුන්ගේ ශ්‍රීමුඛය බල බලා, බුදුන්ට ස්තුති කොට කොට, ධර්මයට ස්තුති කොට කොට, රහතන්ගේ ගුණ කිය කියා, කාමගුණ උදෙසා පෙර තමා බැඳගෙණ ගායනා කළ ගාථාවන් කිය කියා, ගායනා කරන්නට පටන් ගත. ඒ මෙසේ යි:

වන්දෙ තෙ පිතරං භද්දෙ – තිම්බරුං සුරියවච්චසෙ,
යෙන ජාතාසි කල්‍යාණි – ආනන්දජනනී මම යි

යනාදී ගාථාවන් කිය කියා වීණාව ද ගායනා කෙරෙයි. එහි අර්ථ කිමි? යත්; එම්බා සුරියවච්චසා නම් ඉතා මනොහර වූ හසන පාදැත් ඇත්ති ය. සිතූ සිතූ විට මාගේ සොම්නස් වඩන්නී ය. පාදතලයෙහි පටන් කෙශාන්තය දක්වා හිරිරස්කලබක් මෙන් සිඟ

ලගින් නික්මෙන්නාවූ ප්‍රභා ඇති හෙයින් සූරියවච්චසා යි නම ලද එසේ සුන්දර වූ රූසිරින් දිලියෙන්නාවූ සූරියවච්චසා නම දිව්‍යාඞ්ගනාව! තීගේ පියාණන් තිම්බරු නම ගන්ධර්ව දිව්‍යරාජයන් තී මට දෙතොත්තින් බැගෙහෙව වදිමි. ශෝකීන්හට මන්දමාරුතයක් සේ පිපාසිතයන්හට අහස් ගඟාවක් සේ, බඩදලයන්හට අමා පාත්‍රයක් සේ, රෝගීයන්හට දිව බෙහෙතක් සේ, රහතන්ට සඞ්ඛමිණක් සේ, ගින්නට ඇල්දිය කඳක් සේ, තී කිසා උපන් මාගේ කාමපරිදාහය ද නිවා හැරපියා. තව ද යම් සේ මිරිඟු සොයා ඇවිදුනා අඳුන වූ ඇත්පොච්චෙක් පස්පියුම් විලකට බැස, ගිම් සේ පැන් බී සොඬ අග විවරක් තිබිය දී සජ්ඣගයෙන් දියෙහි ගැලී ඒ සිහිල් දියෙහි සුව විඳිද්ද, ඒ හස්ති රාජයා සේ ම මම ද තී කන ඔබතුර නමැති සරසියට බැස කවර නම් දවසෙක සිත් සේ සුව විඳිම් ද. තව ද මදයෙන් මත් වූ ඇත් පොව්වෙක් තෝමරාඞ්කුශයෙන් උදවන ලදුයේ කාරණ කාරණ නො දනී ද, ඔහු සෙයින් ම මම ද කාමෝන්මාද වූ සවභාව ඇතියෙම්, විරාගයට සුදුසු වූ කිසි කාරණයක් නො දනිමි. සොඳුර තී කෙරෙහි ලොභසිතින් කිසිවක්බිලි යක්හුගේ බස් මා කණ නො ගේ ම ය. මා තී කෙරෙහි බඳ කාම චේතනාව බිලියක් ගිලූ මසකු සේ ගලවා ගන්ට නො පොහොසතිමි යම් සේ රහතන්ට සවල්ප වූ දනයක් දුන්නාවූ සත්වයන්ට නො එක් දිව්‍යසම්පත් දෙන්නේ ද, එහෙයින් ම තෝ ද අඟ බඹරු ව මතු බලා තිබෙන්නාවූ සිනිඳු වූ කෙශකලාපයන් ඇත්තෙහි ය. තුන්හවුරුදු මුවපොල්ලකු බඳු වූ දිගු පුළුල් ඇස් ඇතියෙහි ය. මට පළමු ව උපන්නාවූ එක්සිත. දැන් තී පිණිස නො එක් සිත් වි ය. රහතන් දන මා කළාවූ නොයෙක් පින් කමෙක් ඇත්තේ වී නම එයින් මට තී හා සමග ම විපාක දේව යි. පෙර මා මිනිස්ලොව දී මිනිසුන්ට දුන් දනෙක් ඇත් නම් තී හා සමඟ ම විපාක දේව යි යම් සේ ක්ෂත්‍රිය වංශයෙහි උපන්නාවූ අප බුදුහු පළමු නිවන් සොයා ඇවිදි සේක් ද එ සෙයින් ම මම ද දැන් තී සොයා ඇවිදිමි.

යම් සේ මාගේ බුදුරජාණෝ බෝධිපර්‍යඞ්කයෙහි හිඳ සව්නෙ ගෙවා දැන බුදු වූ වේලෙහි ඉතා සන්තොෂ වූ සේක් ද එසෙයින් ම මම ද තී ලද්දෙ ඉතා සතුටු වෙමි. ඉදින් අපගේ සක් දෙව්රජ මා කෙරෙහි සන්තොෂයෙන් වරයෙක් දෙනුයේ මේ මාගේ මේ දෙ දෙව්ලොව දිව්‍යරාජ්‍ය ය කැමැත්තෙහි ද, සූරියවච්චසාව කැමැත්තෙහි ද” යි කී නම් ඒ ශක්‍රසම්පත් හැර පියා මම් තී කැමැති වෙමි. සොඳුර! තීගේ පියානන් තිම්බරු නම් දිව්‍යරාජ

ශාමන් නුවර දොර අලුත මල් පිපී සිටි සල්රුකෙක් ඇත. ඒ ශාල රාජයා ඉතා මනොහර ය. ඒ ශාලවෘක්ෂරාජයා සේ ම දිව්‍යශ්‍රීන් හරිත වූ නීපිය ශ්‍රී දිව්‍යරාජයා වඳිම් යි යනාදීන් මෙසේ අමා හා සිරිගි හා, මිය බඳතොත ලාලා හලන්තකු සේ බුදුගුණ සම්මිශ්‍ර වූ ගාථා කිය කියා බුදුන් ඉදිරියෙහි සිටගෙණ අලප්ජිව ගායනා කෙළෙරයි. බුදුහු එකල "පඤ්චසිඛ ය! තාගේ ගීතස්වර ය, හා වීණා ස්වර ය සම ම ය. වීණාස්වර ය හා ගීතස්වර ය සම ම ය. ගීත ස්වර ය තන්ත්‍රිස්වර ය නො ඉක්මෙ යි. තන්ත්‍රිස්වර ය ගීත ස්වර ය නො ඉක්මෙ යි" වදාළ සේක.

අථ බුදුහු ගීතස්වර ය හා වීණාස්වරයාගේ ගුණ කුමක් උදෙසා වදාළ සේක් දැ? යත්; බුදුන්ට ශබ්දනුරාගය හා ඇති වේ දැ? යත්; අගාසම කොලොව දුරුවූවා සේ මාගේ ස්වාමිදරුවා තන්ට ශබ්දානුරාගයෙක් නැත. බුදුහු එක ශබ්දයකු ත් පරවැඩක් සිතා ම වදාරණ සේක. ඉදින් මොහුගේ ගායනාවෙහි ගුණ නො වදාළ සේක් වී නම් ඒ තමාට අවසර දුන්බව නො දන්නේ ය. ශක්‍රයා "තමා පඤ්චසිඛය අවසර නො ලද" ය යි තමාගේ දෙවියන් ගෙණ සැම්ක සලාගියේ නම් දෙවියන්ට මහා අලාභ වෙයි. ඔහුගේ ගුණ වදාළ කල "පඤ්චසිඛ යා අවසර ලද"යි ශක්‍රයා අවුදින් ම අතින් පැන පිටාරති. එ කල අසූදහසක් දෙවියන් හා සමග සෝවාන් වෙයි සිතා මේ කාරණයෙන් ඔහුගේ ශබ්දයෙහි ගුණ වදාළ සේක යි දතයුතු.

මෙසේ බුදුහු ඔහුගේ ගීතස්වරයෙහි ගුණ වදාරා ඉක්බිති "පඤ්චශිඛ ය! තා කියන ගාථා තුණුරුවන් හා කාමගුණ උදෙසා අමා හා සිරිගි සේ විපර්යාස කොට කවර කලෙක ගොතා ගත්හි දැ"යි වදාළ සේක. එ බසට පඤ්චසිඛයා කියනුයේ "ස්වාමීනි! නුඹ වහන්සේ බුදු වූ අටවන සතියෙහි අජපාල නම් වෘක්ෂමූලයෙහි වැඩ බ්‍රහ්මාරාධනාව ඉවසූ සමයෙහි තිම්බරු නම් දිව්‍යරාජයාහට දූ වූ තමින් භද්‍රා නම් වූ සිාලක ප්‍රභා විහිදුනාහෙයින් සුරියවච්චසා ය යි දෙවත නමෙකින් ප්‍රසිද්ධ වූ දිව්‍යාඞ්ගනාවක් සතර වරම් රජුන් හා සමග අපගේ සක්දෙව් රජහට නැටුම් පානට ගියා ය. එ කෙණෙහි සක්දෙව්රජ බුදුන්ගේ යථාභූත වූ, විශෙෂ වූ, ගුණයන් අවබෙදනකු කී ය. ඕ තොමෝ එ දවස් තමන්නී ඒ බුදුගුණ ඇසුව. සක්දෙව්රජ ඈ දුක මාතලී දිව්‍යපුත්‍රයාගේ පුත් වූ ශිඛණ්ඩී නම දෙව්පුතුව ඈ ශරණපාවා දෙනු කැමැති වි ය. එ තැන පටන් මම ද ඈ පතා නොයෙක් ව්‍යසනයෙන් නො ලදිමි. දවසෙක ඈ

තෙරෙහි ලෝභයෙන් මාගේ මේ බෙළුවපණ්ඩු නම් වීණාව ගෙන ඇ බල බලා මේ ගාථා කීමි. ඕ තොමෝ මේ ගාථාවෙන් නුඹවහන්සේගේ ගුණ අසා "මම ඒ බුදුන් නුදුටුවිරිමි. සුධර්මා නම් දිව්‍ය සභාවෙහි දී සක් දෙව්රජහු අභිනු ත් ඒ බුදුන්ගේ ගුණ අවක් ඇසීමි. යම් කාරණයෙකින් තෝ ඒ බුදුන්ගේ ගුණ කියෙහි ද, ඒ උපකාරයෙන් තා හා මා හා අද සමාගම ය වේයි" කීව. එ දවස් නුඹවහන්සේට පිණට ඇ හා මා හා සමාගම ය වී ය. එ දා පටන් ඇ හා මා හා සම්භෝගයක් නවදෑව්වා නො ලදුයෙමි. ස්වාමිනි! තොප ඔට ඇ ලැබෙ දු යි අලජ්ජිත ම් තමාගේ අඹුවගේ පවත් මෙසේ කිය යි.

ශක්‍රයෝ සිව, කල් යත හෙයින් "මේ පඤ්චශිඛ යා දූත් මාගේ මෙවර ගොසින් තමාගේ කටයුතු කිය යි. බුදුන් ඉදිරියේ සිට කාම ගුණ අරභයා නො තරම් වූ කථා කෙළේයි. කළමෝ නම් ඉතා අලජ්ජියහ"යි කියා බැණ "ඉදින් මේ තොමෝ කාමයෙන් මත්ව තව ද නැටීමක් දක්මාලි නම් මාගේ කාරණ බිඳා ය"යි සිතා ඔහු සෙමෙන් නැදවා "පුත පඤ්චශිඛ ය! කථා බොහෝ නො කොට මා ආ බව බුදුන්ට වහා දන්වාලව" යි කී හ. මැනව මහරජ! යි පඤ්චශිඛයා ගොස් "ස්වාමිනි! සක්දෙව්රජ සහ පිරිවරින් නුඹ වඳිනා නිසා ආය"යි දැන්වී ය. එ වේලෙහි බුදුහු "ශක්‍රයා සහ පිරිවරින් එව"යි කියා අවසර දුන් සේක.

එ කල සක්දෙව්රජ ඉන්ද්‍රශාලගුහාවට වැද බුදුන් වැඳ හොත් සේය. ආයු ගෙවා චුත ව නො නැගෙයි. බුදුහු සක්දෙව්රජහු මල දෑ දුත 'බුදුහු නම් සිස්වලා යන්නාවූ වචනයක් නො කියති. ශක්‍රය! ආයු බොහෝ වව යි මා කී කල ඔහු මළහොත් කාරණ නො වෙයි. ආයු බොහෝ වව යි කී කල ආයු ලබන පිණක් ඇතියේ දෝ හෝ"යි ඔහුගේ ජාතිසහස්‍රයක් බලා සසර එක් ජාතියෙක මල් පිදූ මලත්තෙන මලාගිය මලෙහි පැන් අතලොස්සක් මොහු ඉසළූ පිණක් දුක ආයු ලබන පින් ඇතියේ ය යි දුත "ශක්‍රය! සහපිරිවරින් ආයු බොහෝ වව"යි වදාළ සේක.

එ වේලෙහි මාගේ ස්වාමිදරුවානන් තමන් වහන්සේගේ සශ්‍රීකාවූ ශ්‍රීමුඛයෙන් "ආයු බොහෝ වව"යි වදාළ බස් හා සමඟම ශක්‍රයා තුන්කෙළ සැටලක්ෂයක් අවුරුද්දව ආයු ලදින් නැඟී එතන්පස් ව සිටියේ ය. මොහු මල පරිදි එ තොමෝ දන්නේ. බුදුහු දත් සේක. සෙසු කිසි කෙනෙකු ත් නො දන්නාහු ම ය. එ කල බුදුහු සක්දෙව්රජහට "මහරජ! තාගේ කාර්‍ය්‍ය බොහෝ වූව ත් මෙ තෙනට ආයේ

නැතැවැ"යි වදාළ සේක. ශක්‍රයා කියනුයේ "ස්වාමීනි! මම හැම වේලෙහි ම නුඹවහන්සේ දක්නා කැමැත්තෙමි. පොළෝතෙලෙහි පවත් මේ දෙ දෙව්ලොව දෙවියන්ගේ නො එක් කාර්‍ය්‍යයෙහි ව්‍යාපෘත හෙයින් හැම වේලෙහි ස්වාමිදරුවන් කරා නො එළඹෙන්නේ ය. මම එක් සමයෙක නුඹවහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි සලලාගාර නම් ගඳකිළියෙහි වසන කල දක්නට ගියෙමි. එ දා නුඹවහන්සේ එක්කරා එක් සමාපත්තියකට සමවැදලා වැඩඋන් සේක. එ දා වෙසමුණු රජහුගේ භුජංගවතී නම් පාදපරිචාරිකාවක් සෙද ගැමි ම දෙව්ලොව නො කැමැති ව නුඹවහන්සේ කරා අවුත් වැඳ වැඳ සිටියා ය. එ දා ඒ මා දුටු "බුදුන් දක්නට බැරි ය. බුදුහු ධ්‍යානයෙන් වැඩහුන් සේකැ"යි කීව. ඒ අසා මම ද "බුදුන් ධ්‍යානයෙන් නැඟී කල්හි මා ආ නියාව ත් සැලකොට ලා මා නමින් වඳුව"යි කියාලා ගියෙමි. එ දා ඕ මා නමින් වැන්දී ද, සැලකළා ද, සිහි ඇද් දූ යි විචාළෙ ය. බුදුහු "තා නමින් ඕ වැන්දී ය. මට ත් කීව. සඳ සන් ඇත. මම ද එ දා තා නික්මුනු වේලෙහි තාගේ රථසකෙහි හඬ අසා ධ්‍යානයෙන් නැංගෙමි"යි වදාළ සේක.

ධ්‍යානයට සමවන් කල කන්මුල තබාගෙණ ත් පිඹිනා සක් සින් නම් ආදියෙහි අඬ පවා නො ඇසෙන්. සෙණ දහස් සුම්හස් හඬ නො ඇසෙන්. "රථසකෙහි හඬින් ධ්‍යානයෙන් නැංගෙමි"යි වදාළේ ඇයි දැ? යත්; බුදුහු එ දා ශක්‍රයාගේ නුවණ තම ලා සේ දුක "මතු ඉන්ද්‍රශාල ගුහාවෙහි දී බොහෝ දෙවියන් සමග දෙශනා නොව සෝවාන් කෙරෙමි"යි සිතා ඔහට අවසර නො දෙන නිසා ඔහු අවුත් යන තෙක් ධ්‍යානයට සමවන් සේක. මේ කාරණයෙන් ඔහුගේ රථසකෙහි සඬ අසා ධ්‍යානයෙන් නැගී සේකැ යි දතයුතු.

ඉක්බිත්තෙන් සක්දෙව්රජ කියනුයේ "ස්වාමීනි! යම් දෙවි කෙණෙක් අපට පළමු ව අපගේ දෙව්ලොව උපන්නාහු වූ නම් උන් අතීත් බුදුන් ඇති කල ම අපගේ මේ දෙව්ලොව පිරෙයි. සතර අපාය සිස් වෙයි" කියා කන්පුරා ඇසීමි. දැන් මම ඒ ප්‍රත්‍යක්ෂ ව දිටිමි ස්වාමීනි! නුඹවහන්සේගේ මේ බුද්ධරාජ්‍යයෙහි කිඹුල්වත් නුවර වසන ගොපිකා නම් ශාක්‍යරාජ කන්‍යාවක් තුණුරුවන් කෙරෙහි පැහැද පන්සිල් අඛණ්ඩකොට රක්‍ෂා කරන්නී "ස්ත්‍රීභාවයෙහි සිට බුදු විය නො හැක්ක. පසේ බුදු විය නො හැක්ක. චක්‍රවර්තිසම්පත් නො ලැබෙයි ශක්‍රසම්පත් නො ලැබෙයි මාරසම්පත් නො ලැබෙයි බ්‍රහ්මසම්පත් නො ලැබෙයි" යනු අසා ස්ත්‍රීභාවයෙහි

කලකිරී පිරිමි ව උපදිම් යි ප්‍රාර්ථනා කොට වෙහෙරක් කරවා සඟ තුන්දෙනකුන් වහන්සේ පවරා නිරන්තරයෙන් සිවුපසයෙන් දන් දෙයි. බුදුන් කෙරෙහි බණ අසන කල ඕ තොමෝ භයලජ්ජා ඇති ව, ආදර ඇති ව පවිත්‍ර සිලි ව, එයි තෙමහත වැද හිඳ, දෙකොත් මුදුනෙහි තබාගෙණ, දස නො බලා සිසි කෙණකුන් හා කථා නො කොට, බුලත් පමණකුත් නො කා, නො නිදා, එකග වූ සිතින්, බුදුන්ගේ ශ්‍රීමුඛ ය බල බලා, බණ අසා මේ ආදි වූ පින් කොට මිය ස්ත්‍රීභාවයෙන් මිදී, තව්තිසා දිව්‍ය භවනයෙහි ලක්ෂගණන් දිව නළුවන් හා සමග, දහස් ගණන් දිව්‍යාඞ්ගනාවන් පිරිවරා සක්දෙව් රජහට පුත් ම ඉපැද ගොපක නම් දිව්‍යපුත්‍ර ය යි මෙ නමින් ප්‍රසිද්ධ ව ශක්‍රයා හා සම වූ සම්පත් විඳ, ඇව අනුශාසනා කොට දන් මැලඳු භික්ෂූහු තුන්දෙන නිර්මල වූ ශීල ය රක්‍ෂා කොට, ධ්‍යානලාභී ම මියන්නාහු, බණ අසන කල දස බල බලා නිදා නිඳ සරු නැති ම හුන් අකුශලයෙන් මුත්මි ලෝකොත් පතනියෙන් පිරිහී මිය යට තරා දෙවෙණි දිව්‍යලෝකයෙහි පුෂ්පිකානාතික නම් ගන්ධර්වදිව්‍යයන් හා එක් ම ඉපැද ප්‍රභාසම්පන්න ව දිවපුම විඳිනාහු ය. දවසෙක දහස්ගණන් දිව්‍යාළුවන් පිරිවරා ඒ ගන්ධර්වදිව්‍යයෝ තුන්දෙන තුන් ගවු දිග මහාබෙර කර ලා ගෙණ ශක්‍රදේවරාජයාහට සේව ය කරම්හ යි සුධර්මා නම් දිව්‍යසභා වට අවුත් පණස් පණස් යොදුන් නැත රඟම්ඩුලු බැඳ සිටගත්හ. සිල් රක්‍ෂා කොට දෙව්ලොව උපන්නවුන් හෙයින් මොවුන් තුන් දෙනාගේ ශරීරප්‍රභා හා ගායනා හා ඉතා ම මනොඥ ය.

එවක්හි ගොපක නම් දිව්‍යපුත්‍රයා සක්දෙවරජහු ලඟ මලස්නෙක හුන්නේ මේ දිව්‍යපුත්‍රයන් තුන්දෙනා දැක "මේ දෙව්යෝ තුන්දෙන ඉතා ප්‍රභා සම්පන්නයහ. ඉතා රූපත්හ. හීන වූ ගන්ධර්වයන් කෙරෙහි කොයි සිට අවුත් උපන්නු දෝ හෝ" යි පරීක්‍ෂා කරණුයේ "පෙර මූ මහණුන් තුන්දෙනෙකැ"යි දිට. සතත් කොට සිල් රක්‍ෂා කළෝ දෝ හෝ නො කළෝ දෝ හෝ යි පරීක්‍ෂා කොට බලනුයේ සතත් කොට ම සිල් රක්‍ෂා කළහ යි දිට. තව ද: අතීක් ගුණධර්මයක් බලනුයේ ධ්‍යානලාභී වූ යේ දිට. කොයි වැස සිල් රක්‍ෂා කළෝ දෝ හෝ යි බලනුයේ පෙර තමාට කුලූපග ව සිවුපසය වළඳා අනුශාසනා කළහ යි දිට. පිරිසුදු කොට සිල් රක්‍ෂා කළ සත්ත්වයෝ සදෙව්ලොවින් කැමැති දෙව්ලොවෙක උපදනාහු ය. ධ්‍යානලාභී වූ නම් බඹලොව උපදනාහුය. මොහු තුන්දෙන ම ධ්‍යාන ත් ලදින්

බ්‍රහ්ම ලොකයෙහි ත් නූපන්නාහ. සිල් රක්‍ෂා කොට උඹ දෙව් ලොව ත් නූපන්නාහ. හීන වූ ගන්ධර්වයන් කොට ඉපැද ගියහ. මම මුන්ගෙන් බණ අසා අවවාද ලදිම් ස්ත්‍රී ව සිට දෙදෙව්ලොවට අධිපති වූ සක්දෙව්රජහට පුත් ව ඉපැද ගියෙමි. මොවුන් ලජ්ජා වන සේ දෙඹි සි සිතා කිපී මුහුණ බලා "එ දා තෙපි බුදුන් බණ වදාරණ වේලෙහි දශ බලු බලා නිඳ නිඳා කථා කොට කොට වික්‍ෂෙප ව බණ ඇසුව. එ කල මම ස්ත්‍රී ව සිට ශ්‍රද්ධාවෙන් ආදර ඇති ව බණ අසා පින් කොට පාවුකිසා දෙව්ලොව උතුම් ව උපනීමි. තෙපි වනාහි අපට අවවාද දී මහණ දම් පුරා හීන වූ ගන්ධර්වනිකායෙහි ඉපැද පෙර අප හ. එක් ම පින් කොට අපට දුන් බෙර ගසන්නට අවු ද, තෙපි තමා ලජ්ජා නැතියා ද" යි කී ය

ඒ දෙවියන් තුන්දෙනා අතුරෙන් දෙදෙනෙක් සිහන්නාහු "කෙළි නම් ඇනාහු බලන්නවුන්ගෙන් ප්‍රසාද ලැබෙති. මේ ගොපික දිව්‍යපුත්‍රයා අප දුටු වේලෙහි පමණ් ගින්නට දමාලූ ලුණු පුපුරන්නා සේ දුන් නසා නතනති. කාරණ කිමෙක් දෝ හෝ"යි පරීක්‍ෂා කරන්නාහු පෙර තමන් මහණදම් පිරූ බව ත් සිල් රක්‍ෂා කළ බව ත්, ධ්‍යානලාභී බව ත්, මෝහව ම කුලූපග වූ බව ත් දැන උපන් ලජ්ජාවෙන් කර තුබු බෙර ගලවා තබා එ ම දිව්‍යසභා, වෙසී ම සිට භාවනා කරන්නාහු පෙර තමින් බොහෝ දවසක් වසීභූතකළා වූ භාවනා හෙයින් ඇසිල්ලෙකින් අනාගාමී මාර්ග ඵලයට පැමිණ, ඒ තුන්ගවු උස දිව්‍යශරීරය කුණපයක් සේ හැර, එසීන් සැව දෙලොව යොදුන් බ්‍රහ්ම ශරීර ලදින් ඒ ගොපික නම් දෙවතාවා ආදි වූ බොහෝ දෙවියන් බල බලා සිටියදී ඔවුන්ගේ හිස පියපස් ඕනා සේ ගොස් බ්‍රහ්මපුරොහිත නම් බඹලොව උපන්නාහු ය. එතෙක් පංචකාමයෙන් මිදී යා නො හෙනුයේ එකි ම රැඳිත.

සක්දෙව්රජ මේ කථාව බුදුන්ට දන්වා "ස්වාමිනි! අපි ත් ඔවුන් සේ ම නුඹ වහන්සේගේ සස්නෙහි නිවන් දහම් පසක් කරණු සඳහා ආමහ. අවසර ලදිම් නම් පැන විචාරනු කැමැත්තෙමි" යි කී ය. එ කල බුදුරජාරජානන් වහන්සේ "සක් දෙව්රජ! තට සැක වූ යම් ම පැනයක් මා අතින් විචාරව. මම ඒ කියමි" සර්වඥ ප්‍රවාරණයෙන් පැවරූ සේක

එ කල සක්දෙව්රජ බුදුන් අතින් අවසර ලදින් ඉස්සා මච්ඡරියං යන පළමු වන පැනය ය. පියාප්පියං යන දෙවන පැනය ය ඡන්දූ යන තුන් වන පැනය ය. විතක්කො යන සතර වන

පැනය ය. පපඤ්චා යන පස් වන පැනය ය. සොමනස්සං යන සවන පැනය ය. දොමනස්සං යන සත් වන පැනය ය. උපෙක්ඛා යන අට වන පැනය ය කාය සමාචාරෝ යන නව වන පැනය ය වචීසමාචාරො යන දස වන පැනය ය පරියෙසනා යන එකොළොස් වන පැනය ය ඉන්ද්‍රියසංවරෝ යන දොළොස් වන පැනය ය. අනෙක ධාතු යන තෙළෙස් වන පැනය ය. අච්චන්තා නිට්ඨා යන තුදුස් වන පැනය යි යන මේ තුදුස් පැනය විචාළේ ය. සක්දෙව්රජහු පැන විචාළ පරිදි ත් බුදුන් විසඳූ පරිදි ත් දීඝ්සඟියෙහි ශක්‍රප්‍රශ්න සූත්‍රවිභාගයෙන් බලා දතයුතු.

ඉක්බිත්තෙන් ස්වාමිදරුවන් මේ ප්‍රශ්න ව්‍යාකරණය කොට අවසානයෙහි අසූදහසක් දෙවියෝ අමාමහ නිවන් දුටහ. සක් දෙව්රජ සෝවාන් මාර්ගඵලයට පැමිණියේ ය. මෙසේ ශ්‍රද්ධාසම්පන්න වූ ඒ සක්දෙව්රජ රහත් නො ව කුමක් නිසා සෝවාන් වී ද? යත්;

අනේපිඬු මහ සිටාණන් හා විශාඛා මහ උපාසිකාවන් හා දෙදෙන බුදුන්ට අග්‍රවූ බොහෝ උපස්ථාන කොට ත්, තමන් සසර රසි ලොභ ඇති හෙයින් සෝවාන් ව තව සත් ජාතියෙක සසර ඇවිදිති. ඔවුන්සේ ම මේ සක්දෙව්රජ ද ඉතා භවරාගීය, ඒ කාරණයෙන් සෝවාන් ව මේ ජාතියෙහි තමාගේ ආයු පරිද්දෙන් ශක්‍රසම්පත් විඳ එයින් මිය දඹදිව සවාරයක් පිට පිට දීපචක්‍රවර්ති ව රජ කෙරෙසි. එයින් ගොස් චාතුර්මහාරාජික නම් දිව්‍යලොකයෙහි ඉපැද මනුෂ්‍යගණනාවෙන් අනූලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් විඳ, එයින් නැගී තව්තිසා දිව්‍යභවනයෙහි ඉපැද තුන් කෙළ සැටලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් විඳ, එයින් නැගී යාම නම් දිව්‍යලොකයෙහි ඉපැද තුදුස් කෙළ සැටලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් විඳ, එයින් නැගී තුෂිත භවනයෙහි ඉපැද එහි සත්පණස්කෙළ සැටලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් විඳ, එයින් නැගී නිර්මාණරතී නම් දිව්‍යලොකයෙහි ඉපැද එහි දෙසිය තිස්කෙළ සතලිස් ලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් විඳ, එයින් නැගී පරනිර්මිත වශවර්ති නම් දිව්‍යලොකයෙහි ඉපැද එහි නවසිය එක්විසිකෙළ සැටලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් විඳ,

සදිව්‍යලොකයෙහි මෙසේ එක්දහස් දෙසිය අටවිසිකෙළ පණස් ලක්ෂයක් හවුරුදු මුළුල්ලෙහි පඤ්චකාමසුව අනුභව කොට එහි දී කාම විරාගය කොට ධ්‍යාන උපදවා පළමු වන බ්‍රහ්මපාරිෂද්‍ය නම් බඹලොව ඉපැද අසංඛ්‍ය කල්පයක්හුගේ තුන්වන භාගයක් සුව විඳ, එයින් නැගී බ්‍රහ්මපුරොහිත නම් බඹලොව ඉපැද එහි අඩ කල්පයක් සුවවිඳ, එයින් නැගී මහාබ්‍රහ්ම නම් බඹලොව ඉපැද කපක් සුවවිඳ, එයින් නැගී පරිත්තාභ නම් බඹලොව ඉපැද එහි

භ කප් දෙකක් සුව විඳ, එසින් නැඟී අප්‍රමාණාභ නම් බඹලොව ඉපැද එහි සතර කපක් සුව විඳ එයින් නැඟී ආභස්වර නම් බඹලොව ඉපැද එහි අට කපක් සුව විඳ එයින් නැඟී පරිත්තශුභ නම් බඹලොව ඉපැද එහි සොළොස් කපක් සුව විඳ, එයින් නැඟී අප්‍රමාණ ශුභ නම් බඹලොව ඉපැද එහි දෙතිස් කපක් සුවවිඳ එයින් නැඟී ශුභකිණ්ණ නම් බඹලොව ඉපැද එහි සුසැටකපක් සුව විඳ, එයින් නැඟී වෙහප්ඵල නම් බඹලොව ඉපැද එහි පන්සියක් කප් සුව විඳ,

එහි දී අනාගාමී ම එයින් නැඟී ශුද්ධාවාසයෙහි අවිහ නම් බඹලොව ඉපැද දහසක් කප් සුව විඳ, එයින් නැඟී අතප්ප නම් බඹලොව ඉපැද දෙදහසක් කප් සුව විඳ, එයින් නැඟී සුදස්ස නම් බඹලොව ඉපැද එහි සාරදහසක් කප් සුව විඳ, එයින් නැඟී සුදස්සී නම් බඹලොව ඉපැද එහි අටදහසක් කප් සුව විඳ, එයින් නැඟී අකනිෂ්ඨ නම් බඹලොව ඉපැද එහි සොළොස් දහසක් කප් ධ්‍යාන සුව විඳ, මෙසේ එක්තිස්දහස් සසිය විසිකපක් ගියකල එයින් මතු අනාගතයෙහි රහත් ව අමාමහ නිවන් දක්නේ ය යි දතයුතු.

මෙසේ සෝවාන් ව පසන්නා වූ සක්දෙව් රජ එ කෙණෙහි ම පඤ්චශිඛ දිව්‍යපුත්‍රයා කැඳවා "සගළු පඤ්චශිඛ ය! මෙසේ වූ නිවන් සුවයක් තා නිසා ලදිමි බුදුන් අතින් මට අවසර ඉල්වා දී මේ සා වැඩක් කෙළෙහි ය, අද පටන් තෝ මට ගුරු තනතුරෙහි සිට"යි කියා 'මාගේ අර්ථ සිද්ධ වූවා සේ ම, තාගේ ද අභිමතාර්ථය සිද්ධ කොට සූරිය වච්චසා නම් දිව්‍යකන්‍යා පාවා දෙමි' යි තිලකොට 'මාගේ මේ දෙදෙව්ලොව ගන්ධබ්බ සේනාවට අද පටන් තෝ රජව'යි ඔහු ගන්ධබ්බයන්ට රජකොට බුදුන් වැඳ තමාගේ දිව්‍යසේනාව ගෙණ දික්කළ අතක් වක් නො කරණ ඇසිල්ලෙහි ගොසින් තමාගේ ශක්‍ර භවනයෙහි ම පෙණී ගියේ.

මෙසේ එ තැන් පටන් බුදුන් කෙරෙහි අතිප්‍රසන්න වූ ශක්‍ර දෙවේන්ද්‍රයා අසූදහසක් දෙවියන් හා සමග අප්‍රමාණ වූ දිව්‍යරාජ පූජා කෙළේ ය. එ තුමක් කල් මුළුල්ලෙහි ස්වාමිදරුවානන් නමට අප්‍රමාණ වූ ප්‍රතිපත්ති පූජා කෙළේ ය. ස්වාමිදරුවන්ගේ ප්‍රත්‍යක්ෂ පූජාවෙහි පටන් පරිනිර්වාණ පූජාව දක්වා මේ අසීතිවර්ෂය මුළුල්ලෙහි තමාගේ ශක්‍රසම්පත්තියෙහි ලොභය හැර ඔබගේ දර්ශන සම්පත්තියෙහි ලොභය කොට පක්ෂපාත වූ අභියුක්තකයකු සේ ස්වාමිදරුවන් සමීපයෙහි ඡායාවක් සේ වාසයකොට අප්‍රමාණ වූ

සප්පාය වූ අත්පා මෙහෙයෙන් පූජා කොළේ ය. මෙසේ ශක්‍ර දෙවේන්ද්‍රයන් අතින් පවා මහත් වූ පූජා ලත් හෙයිනු ත්, එසේ වූ පූජා විඳිමට සුදුසු හෙයිනු ත්, මට ද, සියලු සත්ත්වන්ට ද, මවු පිය ගුරු වූ, දෙවි වූ, බඹ වූ, මාගේ ම ස්වාමිදරු වූ, තිලෝගුරු බුදුරජාණෝ මේ මේ කාරණයෙනු දු අග්ගීන් නම් මහ ගස්ක. එසේ හෙයින් ම කියන ලදි:—

පූජාවිසෙසං සහපච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානු රූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං-ති.

මේ පූජාවලියෙහි අප බුදුන් සක්දෙව් රජහුගෙන් ලද
දිව්‍යරාජ පූජා කථා නම් වූ
දෙවිසි වන පරිච්ඡේදය යි නිමි.

තෙවිසි වන පරිච්ඡේදය

තව ද: අප බුදුන් ගණ්ඩම්බ නම් වෘක්ෂමූලයෙහි දී ලද යමක ප්‍රාතිහාර්‍ය පූජා නම් කවරී? යත්; එහි මේ පිළිවෙළ කථාව සත්පුරුෂයන් විසින් මෙසේ අසා දතයුතු.

මාගේ ස්වාමිදරු වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මුළු ලොවට අමාවැසි වස්වන්නා සේ, දහම් වහරේ වස්වමින් රජගහා නුවර වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එ නුවර ධනසිටාණෝ පරිවාර ජනයන් ඇරගෙණ ගඞ්ගාවෙහි ජලක්‍රීඩා කරන්නාහු දියෙහි යන මහ දියකලියක් හා රත්සඳුන් හරයක් දැක, එයින් පාත්‍රයක් ලියවා සහල්ලෙන නම්බා දෙර මිදුලෙහි හුණ්දඬු සිටුවා එහි උඩ සැටරියනෙක'පාත්‍රය එල්වා "මේ ලොකයෙහි රහත් කෙණෙක් ඇත් නම් ආකාශයෙන් වැඩ මාගේ පාත්‍රය පිළිගණිත් ව යි එසේ පිළිගණිත් නම් ඔහු වදිමි, පුදමි, සත්කාර කෙරෙමි, ඔහු ම මට දෙවියෝ ය"යි කියා මුළු නුවර අසුදහසක් නියම් ගම් වල හා තුන්සියක් යොදුන් අගු-මගධ දෙරට හැල කළහ.

එ කල දඹදිව පූරණ කාශ්‍යප, මක්ඛලි ගෝශාල, අජිත කෙසකම්බල, කකුධ කාත්‍යායන, සඤ්ජය බෙල්ලට්ඨිපුත්‍ර නිගණ්ඨනාථපුත්‍ර ය යි පන්සිය පන්සිය පිරිස් ගෙණ අපි බුදුමහ,

අපි බුදුම්හ යි ප්‍රතිඥා කොට තමන් තමන් පෙර "බුදුන් නො දකුම්හව"යි බොරු දිවරපුවා වූ අකුශලයෙන් බුදුන් දක්ක නොහී ලොව ගසා සා අඬෙනාවූ සත්ත්වයන් ඔදාගෙණ ඇවිදුනා වූ හොරනු සදෙනෙක් වූහ. ඔවුන් හොර වූ පරිදි කවර?යත්;

ඒ පූර්ණ කාශ්‍යපයෝ නම් දඹදිව එක්තරා එක් තමාතුවක් මෙල්ලාකාමිරූන් ඇති කොළෙඹි පුත්‍රයාත කෙණකුන්ගේ කෙල්ලක කුසින් කොල්ලුන්ගව දම උපන. සිවාමිතෝ "තුඹගේ අසුවල් මිනී පුතකු ලදහ"යි කී බස් අසා සතුටු ව "මාගේ තමාතුවක් මෙල්ලාකාමිරූන් ඇති කුලයෙහි සියය පුරා උපන් හෙයින් පූර්ණ ය"යි කී ය. ඒ බස ගෙණ හේතෙම පූර්ණ නම් වී ය. තබන ලද නමින් කාශ්‍යප නම් වී ය. එසේ හෙයින් පූර්ණ කාශ්‍යප ය යි මෙ නමින් ප්‍රසිද්ධ වී ය යි දතයුතු.

ඔහු බුහුනු පරිදි කවර?යත්; සවාමිදරුවෝ ඔහු සියය පුරා උපන් හෙයිනුත්, මිගුල්මහල මෙල්ලාකියා පුතු හෙයිනුත් ඔහු වෙහෙසා මෙහෙ නො ගන්නාහ. හේතෙම කර්මාන්තයක් නැති ව ස්වච්ඡන්දිකා ව ඇති ම ඔබ්බෙහි වූ කාලයෙහි දු සවාමිදරුවන්ට වැඩක් නො කෙරෙයි. දම්සොක ඒ සවාමිදරුවානතෝ මොහු ගෙන්මා මෝහට ගෑයින් මෙහෙයක් නැති ම පුම්ලද මෙහෙයක් කෙරෙම් යි සිතා "කා මාගේ මේ වහසල්දොරකඩ රකුව"යි නියොග කළහ. හේ තෙම් කිප දවසක් වහසල් දොරකඩ හිඳ ඔබී නොබ පෙර සේ ඇවිද පියන්නට කෙළි මොළ කම් කොට ස්වච්ඡන්දික ව දවස් යවා, පියන්නට බැරිබවු දැන "මොවුනට වැඩක් ම නො කෙරෙම් යි දුරු රටකට මා පලාගියෙ මැනවැ"යි සිතා දවසෙක දෙස් පලා ගියෙ.

එ කල ඔහු මහ මහනමැදකට පැමිණි කල වල්හොරු ඔහු කඩ උදුරා ගෙණ මරන්නට අල්වා ගත්හ. හේතෙම තමා ඇඟ බල ඇති හෙයින් අත ගලවා ගෙණ තන්තයෙන් ම ගැලවී දිව මහවනය පිරාගෙණ එක්තරා එක් දනව්වකට ගොස් ගම්මැදෙක තර බාගෙණ සිටියෙ ය. ගම්වැසියෝ ඔහු දැක තෙපි කවුරු දැ යි විචාළහ. මේ නෙත මම අනිත ක් කිම් නම් මට රතා නැතැ යි සිතා මාගේ බඩ සියලු ශාස්ත්‍රයෙන් සම්පූර්ණ වූ හෙයින් මට පූර්ණ ය යි කියති. ගොත්‍ර වශයෙන් බ්‍රාහ්මණ වංශයෙහි උපන් හෙයින් කාශ්‍යප නම්. දැන් මම රහත්වීම්. පූර්ණ කාශ්‍යප බුද්ධ නම් මම වෙ දැ"යි කී ය. එ වේලෙහි ගම්වැසියෝ ඔහු සෙලු බවු දැක අනෙකප්‍රකාර වූ වස්ත්‍ර ඔහු කරා ගෙණ ගොස් "කිම් මේ හඳුව"යි කියති. හේතෙම "ප්‍රිඳී

හැන්දෙම නම් සත්ත්වයෝ මා කෙරේ සරු නො කෙරෙති"යි සිතා "සත්ත්වයෙනි! පිළී හැඳීම නම් ලජ්ජා වැසීමය, ලජ්ජා නම් පාප ධර්මයෙක ඒ පාපධර්මය සැඟවීම රහතන්ට සුදුසු නො වෙයි. එසේ හෙයින් අපි පිළී නො හඳුම්හ"යි කියා පිළී ගෙණ නො හඳ නේ ය. එ කල මිනුෂ්‍යයෝ ඔහු කෙරේ ඉතා පැහැද වඳිති, පුදති, සත්කාර කෙරෙති. බොහෝ ඛාද්‍යභොජ්‍ය ගෙණෙති. එ කල පන්සියක් දෙන ඔහු හා එක් ව ලාභ ය කියා පිළී ගලවා හැර ඔහු කරා තපසට වන්හ. එතැන් පටන් හේ තෙම පූරණ කාශ්‍යප නම් බුදු කෙණෙකැ යි දඹදිව ප්‍රසිද්ධ වි ය.

තව ද: මක්ඛලි ගෝශාලයාගේ ද උත්පත්තිය කවරි?යත්; එයි දු දඹදිව එක්තරා එක් කෙළෙඹි පුත්‍රයාගේ ගෙයි දාසයෙක, හේ තෙම නමින් මක්ඛලි නම් වි ය. ස්වාමිදරුවන් ගෙන් උදහස් අසා ගොස් අනුන්ගේ ගෝශාලයෙක, වැදහොත් දවස් ඔහු වැදූ හෙයින් ගෝශාල නම් ලද. හේ තෙම එක් දව සෙක ස්වාමිදරුවාහට පස්සෙහි තෙල් කළයක් හිස තබා ගෙණ යෙයි. එ කල ස්වාමිදරුවා දිය මඩ මිශ්‍ර වූ කලල් බිමක් දැක "දරුව! සිහි ඇති ව තෙල්කළය රක්ව" යි කිය කියා යන කල්හි හේ තෙම අලස ව ඔබිනොබ බල බලා යනුයේ කණුයෙක පැකිළ අනික් පය ඉදිරියට දමා එ පය මඩෙහි ලා ගොස් උඩබලා හී තෙල්කළය බිඳ ස්වාමිදරුවා ආපස්ස බලක ඇසිල්ලෙහි පැන නැගී මරති යන භයින් වලට දිව්පි ය. එ වේලෙහි ස්වාමිදරුවෝ ඔහු දිවන්නහු දැක පසු පස්සෙහි ලුහුබඳවා දිව පිළිමුල ගත. හේ තෙම පිළිය ගලවා ස්වාමිදරුවා අතට හැර උපන් වක ම ගැළවී දිව වල් පිහිරා දුර දනව්වකට ගොස් එසේ ම වසනුවා කොට මක්ඛලි ගෝශාල නම් රහතුම්හ යි බොහෝ අඥානයන් පහදවා, පන්සියක් පිරිස් ඇති කොට ඒ ඒ තැන්හි ප්‍රසිද්ධ වි ය.

අජිතකෙශකම්බලයාගේ ද උත්පත්තිය කවරි? යත්; හේ තෙම කුලදරු ය. බොහෝදෙනා තමා එලවන හෙයින් පසිඳගත නොහී තමාගේ රට හැර පසල් දනව්වකට ගොස් රක්ෂාවක් නැති හෙයින් තපස් කෙරෙමි යි සිතා සියලු වස්ත්‍රජාතියෙන් කෙස්මුවා පලස් නම් හීන වූ වස්ත්‍ර ජාතියෙක, හීනයන්ට ම තිබී ආ දෙයෙක. හේ තෙම කෙස්මුවා පලසක් ධරා ඉස මුඩු කොට අත කර වළඳු ලා අජිත කෙශකම්බල නම් රහතුම්හ යි ප්‍රතිඥා කොට "මවජ්

නිගණ්ඨනාථ පුත්‍රයා පාත්‍රය ගැනීමට අහසට නැගෙන්නට සේ පැන් කීයේ. 483 පිට බලන්න. (30–31)

මාංස මැරුම නව ත් පව් සරි ය. කෑවා නව ත් පව් සරි ය. ගස කැපුමාහු, වැල කැපුවාහු, මිනී මැරුවාහු නම් වෙති. අත්ත කැපුවාහු අත කැපුවාහු නම් වෙති" යනාදි දෘෂ්ටි ගෙණ බොහෝ අඥානයන් පහදවා පන්සියයක් තිවටුන් ඇති කොට එයි දු ඒ ඒ තන්හි ප්‍රසිද්ධ වි ය.

කකුධ කාත්‍යායනයාගේ ද උත්පත්තිය කවරි? යත්; එයි දු කුලපුත්‍ර ය, පියන් නැති ව වැන්දඹු එකකු කුසින් උපන. මහ දුඃඛිත හෙයින් ගෙයක් දොරක් නැති හෙයින් ඔහු කුඹුක්ගසක් මුල වදා හෙළා යන ලදු වි ය. එක්තරා එක් බ්‍රාහ්මණයෙක් ඔහු දැක ගෙණ ගොස් කුඹුක්මුල දී උපන් හෙයින් කකුධ නම් ලා ව්‍යවහාර කාමිය හා සමග කකුධ කාත්‍යායන යයි නම් තබා වැඩී ය. හේ තෙම බමුණා මළ කල අනික් රක්ෂාවක් නැති හෙයින් තෙමේ ම තපසව වැද මිථ්‍යාදෘෂ්ටි ගෙණ 'හැල් දිය නම් ප්‍රාණ ය යි හැල්පැන් පුවාහු බිඳුගණනාමෙන් ප්‍රාණඝාත කළාහු නම් වෙති"යි දෘෂ්ටි ගෙණ හැල් පැනින් අතපය ත් නො සෝධයි. හුණුදියෙන් හෝ හුළුකෑසින් හෝ අත සෝධයි. ඇළක් දිය වළක් හොයක් ගඟක් පැන පය පැන් ගා ගෙණ, එතෙර ගියේ නම් "බොහෝ ප්‍රාණීන් නසාගියෙමි. බොහෝ දතනව ගැහැට කොට පිණි. මාගේ සිල් බිඳී ගියේ ය" යි තබා තබා "දඬුවම කෙරෙමි"යි එතනට වැලි ගොඩක් රැස්කොට එ තෙන දී නැවත සිල් ඉවාගෙණ යෙයි. ඒ දුටු මනුෂ්‍යයෝ ද ඔහු කෙරේ පැහැද රහත්හ යි බොහෝ සත්කාර කෙරෙති. එසේ හෙයින් එයි දු පන්සියයක් දෙනා ඇති කොට දඹදිව ප්‍රසිද්ධ වි ය.

සඤ්ජය බෙල්ලට්ඨිපුත්‍රයාගේ ද උත්පත්ති ය කවරි? යත්; එයි දු නමින් සඤ්ජය නම් වී ය. බෙල් ඇටක් බඳුවූ ඉසක් ඇති හෙයින් බෙල්ලට්ඨි නම් වූ අනුන්ගේ දාසියක්හුගේ ම පුත්‍රයෙක. එයි දු සවාමිදරුවන් විසින් නිදහස් කරණ ලදුව නොඑක් ශාස්ත්‍ර ඉගෙණ මහනුවණ ඇති ව තර්කවාද දැන තපසව වැද "මෙලෝ නැත, පරලෝ නැත, කම් නැත, කම්පල නැත, මවු නැත, පියෝ නැතැ"යි දෘෂ්ටි ගෙණ අපාදකයෝ මළ කල අපාදක ව ම උපදිති. විපාදකයෝ මළ කල විපාදකව ම උපදිති. චතුෂ්පාදකයෝ චතුෂ්පාදක ව ම උපදිති. බහුපාදකයෝ බහුපාදක ව ම උපදිති. හීනයෝ හීන ව ම උපදිති. උත්තමයෝ උත්තම ව ම උපදිති. දිව්‍යයෝ දිව්‍ය ව ම උපදිති. මනුෂ්‍යයෝ මනුෂ්‍ය ව ම උපදිති.

යනාදි වශයෙන් ලෝක වාසීන්ට මිථ්‍යාදෘෂ්ටි කියයි. ඒ අසා සමහර කෙනෙක් ගිවිස ඔහට ද සත්කාර කෙරෙති. හේ ද පන්සියයක් රහතුනැ යි කීවවුන් ඇති කොට රහමිම යි කියා වඤ්චාවෙන් ඇවිදි.

නිගණ්ඨ නාථපුත්‍රයාගේ ද උත්පත්තිය කවරේ? යත්; එයි ද එක්තරා එක් නාථ නම් ගොවියකුගේ පුත්‍රයෙකි. එසේ හෙයින් නාථපුත්‍ර නම් වි ය. හේ ද ෂෛරාටික ඥත ලදින් නක්ෂත්‍ර-ගණිත ජ්‍යෝතිෂිකාදි නොයෙක් ශාස්ත්‍ර ඉගෙණ පන්සියයක් අතවැස් සත් රැස්කොට මම ද රහතිමි යි තමා කෙරෙහි නැති ගුණ කියා මාගේ ලෙහි කෙලෙස් ගැටෙක් නැත. මට නො දන්නක ශාස්ත්‍ර ගැටයෙකු දු නැත. එසේ හෙයින් නිගණ්ඨිමි යි කියයි. එ කල ඔහුට නිගණ්ඨනාථපුත්‍ර නම් බුද්ධ ය යි අඥානයෝ පැහැදියහ. යම් සැකයක් ඇති කෙනෙක් තමා කරා ගොසින් විචාළෝ නම් හේ තමා තමාට නො දන්නක හෙයින් කියාගත නො හී පලමු කොට ඔවුන් හා වාදාරෝපණ ය කොට සැක විචාරා ගැන්මට අවකාශ නො දෙනුවය් වඤ්චිත වූ ඥානයෙන් දඹදිව ප්‍රසිද්ධ වි ය.

ඉක්බිත්තෙන් ඒ රජගහා නුවර සිටානන්ගේ පවත් අසා "අපි බුදුම්හ, අපි බුදුම්හ"යි ප්‍රතිඥා කොට ලෝවැස්සන් වඤ්චා කොට ඇවිදුනා වූ ඔහු සදෙන ම එ නුවරට අවුත්, පස් දවසක් මුළුල්ලෙහි සිටානන් පිරිවරා ගෙණ "සිටානෙනි! මේ පාත්‍ර ය අපට දෙව, අපට දෙව, අපි බුදුම්හ, රහතුම්හ, මේ පාත්‍රයට අපි අපි ම සුදුස්සම්හ"යි ඉල්වූවාහු ය. සිටානෝ ද එ පස්දා මුළුල්ලෙහි ම කැමැති කැමැති කෙණකුන් ආකාශයෙන් අවුත් ගත මැනැව නිකම් ආ කෙණකුන්ට නො දෙම් ම යි නො ගිවිස්සහ.

එ කල නිගණ්ඨ නාථපුත්‍ර නො එක් උපාසක කොට පාත්‍රය ලැබගත නො හී තමා අතුරෙහි "කිමෙක් දෙ? මෙ කෙත් දවස් මායම් බලයෙන් භවත් ගෞතමයන් හා සරිගය්වා ඇවිද්දෙමි. ඔවුන්ගේ ශ්‍රාවකයෝ ආකාශයෙන් අවුත් තෙලෙ පාත්‍ර ය ගණිති. එ කල අප හැම ජරපත් ශෘගාලයන් කොට ය් මිනුෂ්‍යයෝ නො සිතති. මෙ තෙන පැමිණීයේ අපට ඉතා ම හානියෙක. බුදුනම් කොට ගැන්ම එත දවස ඉතා ම උගහට වන සැටි ය. අපගේ සෘද්ධියෙක් ප්‍රාතිහාර්‍යයෙක් ආකාශයෙන් ගමනෙක් රහත්බවෙක් බුදුබවෙක් අහසට පොළොව සේ දුර එසේ ද වුවත් සිටානන් මුණ වැලි ගැසුවා සේ මායම් පෙලහරෙකින් සඳුන් පාත්‍ර ය ගණිම්"යි සිතා තමාගේ අතවැසියන් සැදමා 'යව, සිටානන් කරා ගොස්

‘අපගේ බුද්ධ ලාභයක් නිසා තමන්ගේ සැඟවී තුබූ සෘද්ධිගුණ ය නො දක්වන්නාහු ය. සැබවින් සෘද්ධි ඇතියා නම් මේ පාත්‍රය අපගේ බුදුන්ට ම දෙව’යි කියා පාත්‍රය සිටානන් අතින් ගෙණෙව”යි යැවී ය.

එ කල ඒ අනවැසියෝ ද සිටානන් කරා ගොස් ඔහු කී පරිද්දෙන් ම කියා පාත්‍රය ඉල්ලන්නාහු, සිටාණෝ ද “තොපගේ බුදුන් පුරා වුව හොතින් ආකාශයෙන් ම අවුත් පාත්‍රය ගෙණ යන්ට කියව”යි කියා නුදුන්නාහු ම ය. එ කල නිගණ්ඨ නාථපුත්‍ර එ පවත් අසා අනවැසියන්ට “එසේ වී නම් දැන් මා ගොස් ‘ආකාශයට නැඟී දැන් දැන් පාත්‍රය ගණිමි’යි අභියොගයක් කළ කල තෙපි නැමදෙන මා වළක්ව”යි උගන්වා ගෙණ සිටානන්ගේ ගෙට ගොස් අප වැනි බුදුන්ගේ පෙළහර බලා නොපා වැනියන් සත්කාර කරණු විස්මය නො වෙයි. මේ පාත්‍රය අපට ම තරම, අපට ම දෙව”යි ඉල්වී ය.

එ වේලෙහි දූ සිටාණෝ “නුඹ සබා බුදුකෙණකුන් වූවෝතින් අහසට නැඟී පාත්‍රයක් ගත මැනැව. මා ත් උපාසක කොට ගත මැනැව. මා යම කින් මා නො වෙහෙසුව මැනැව. එසේ නො දෙමි”යි කීහ. එ වේලෙහි නිගණ්ඨ නාථපුත්‍රතෙම අනවැසියන් මුහුණ බලා ඝෝර ඉඟියක් ලා “මැලි සිටාණෙනි! අහසට නැගෙමිදූ”යි කී ය. නැංග මැනැමැයි කීහ. තවත් නැගෙමි ම දූ යි කී ය. තව ත් නැංග මනා ම ය යි කීහ. බුදු වූ දවස් පටන් මාගේ රහත් ගුණ ය කිසිවක්හට නො පෑයෙමි. නැගෙමි ම දූ යි තුන්වනුව ද කී ය. බුදුවන්නෝ නම් බොහෝ දෙනාට පෙළහර පෑ, බොහෝ දෙනාට වැඩ කරණ නිසා ම ය. දූනු දූ මඹ වැඩ නිසා පෙළහර පෑව මැනැවැ යි සිටාණෝ තුන්වනුව ත් කීහ.

එ වේලෙහි නිගණ්ඨ නාථපුත්‍ර එක් අතක් එක් පයක් අහසට නගා අහසට පැන නැගෙන අභියොගයක් ශුනකයෙකු කිලි පෙළුවා සේ කෙළේ ය. එ වේලෙහි ඔහුගේ අනවැසියෝ “හිමි! නුඹ වැනි බුදුකෙණකුන් ලාභයක් නිසා පෙළහර කරණු නො යෙදෙයි. අහසට නො නැංග මැනැව. නො නැංග මැනැව. පෙළහර නො පෑම මැනැව. නො පෑව මැනැව. අනිස, ඒ පාත්‍රය නො කැමැත්තෝ ය. නො කැමැත්තෝ ය යි කියා ඔහු අත පය ඇද බිම හෙළූහ. හෙතෙම බිම හී අත පය මැලි පිස “තමක්

බඹු ව සිටිතෙනී, මේ අතවැසියෝ මා අහසට නැංග නො දෙති. ඔවුන් කියන්නෙ ත් කාරණ ම ය. අප වැනි රහතුන්ට වෙහෙස නො දී පාත්‍රය දී පියව"යි කී ය. එ වේලෙහි දු සිටානෝ "තෙල මායමින් මට කම් නැත. අහසට නැගී පාත්‍රය ගත නො හෙතොත් තින් මට ද වෙහෙස නො දී ආපස්සෙහි ගිය මැනැවැ"යි කීහ. එ කල නිගණ්ඨ නාථපුත්‍ර ඒ මායමිනු ත් පාත්‍රය නො ලදින් සුසුම් ලලා ආපස්සේ ගියේ ය.

මෙසේ තීර්ථකයන් ඒ පාත්‍රය නිසා සිටානන් හා බල පෙරර ගන්නා සේ කරන්නා වූ උත්සාහයෙන් සදම්ලෙසක් පලා ගිය. සත්වන දවස් මාගේ සවාමිදරූ වූ සිංගලානුරූ වූ ගෞතම ගොත්‍රයෙහි උපන්නා වූ බුදුරජානන්ගේ ශ්‍රාවකපුත්‍ර වූ ආයුෂමත් වූ මුගලන් මහතෙරුන් වහන්සේ හා ආයුෂමත් වූ පිණ්ඩොල භාර වාජ මහතෙරුන් වහන්සේ හා දෙදෙනා වහන්සේ සිංහසමූහයෙකින් පිටත් වූ සිංහපොව්වන් දෙදෙනකු සේ බුදුන් වසන වෙළුවනාරාමයෙන් පිටත් ව රජගහා නුවරට සිගා පිඬහා සේක් එක් තරු එක් ගලතලක් පිට වැඩහිට සිවුරු මල්ලදනා සේක.

එ වේලෙහි මිග දර පැන් සොයා ඇවිදුනා වූ ස්ත්‍රී පුරුෂයෝ "පෙර මෙ නුවර 'අපි රහතුම්හ, අපි රහතුම්හ'යි කියා ඇවිදුනෝ බෙහෙව ලොව රහතුන් නැති බවු සැක නැති ව ම දතුම්හ. අපුවල් සිටානන්ගේ දෙර සඳුන් පාත්‍රයක් ආකාශයෙහි තිබෙන්නේ අදට සත් දවස ය. අහසින් ගොස් ගත හෙන්නාවූ එකෙකු ත් නැත"යි කිය කියා සාමාන්‍යයෙන් තමස් කරන්නවුන්ට දෙබ දෙඩා බැණ බැණ යන්නාහු ය.

එ වේලෙහි මුගලන් තෙරුන් වහන්සේ ඔවුන් කියන බස් අසා පිණ්ඩොල භාරවාජ මහතෙරුන් වහන්සේගේ මුහුණ බලා "ඇවැත්නි! තෙලෙ සත්ත්වයන් දොඩා ගෙණ යන බස් ඇසූ ද, ඔහු බුදුසස්නට දග ලාලා බැණගෙණ යන්නාහ. අප වැනියන් තොප වැනියන් ඇසිය දී අපගේ බුදුන්ගේ ශාසනයට සත්ත්වයන් අනා දර බිණීම ද අප වැනියන් තොප වැනියන් අසා ඉවසීම ද සුදුස්සෙක් නො වෙයි. යව, තෙපි ආකාශයෙන් ගොස් සිටානන්ට පෙළහරපෑ ඒ පාත්‍රය ගෙණ අප බුදුන්ගේ හා ඔබ දරුවන්ගේ හා බල ලෝක වාසීන්ට දක්වා පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි පවත්නා බුදුසස්නෙහි කුඩ කුඩ සතුණ් කාරවාමියන පරිද්දෙන් ශාසනබලයක් පෑ බලව"යි වදාළ සේක.

එ බසට පිණ්ඩෝල භාරද්වාජ මහතෙරුන් වහන්සේ "ස්වාමීනි! නුඹ වහන්සේ බුදුන් විසින් සියලු ශ්‍රාවකසංඝයා මධ්‍යයෙහි "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ඉද්ධිමන්තානං යදිදං මොග්ගල්ලානො"යි වදාරා මේ සා බුදුසස්නෙහි ඍද්ධිමතුන් කෙරෙහි ම අග්‍රස්ථානව සිටුවනලද සේක. එසේ හෙයින් මේ ප්‍රාතිහාර්‍ය්‍යයක් නිසා ලෝකවාසීන් බුද්ධශාසනයට කියන්නා වූ අනාදරය නුඹ වහන්සේම බිඳින්නා සේ නොවන නිසාද? අප සිටිනා ස්ථානාන්තරයක් නො වන හෙයින් ඒ පෙළහරින් අපට කම් කිම ද, නුඹවහන්සේ ම ගොස් ඒ පාත්‍රය ගෙණ බුදුසස්නෙහි බල දක්වුව මැනැවැ"යි කී සේක.

එ බසට මුගලන් මහතෙරුන්වහන්සේ "නන්දෝපනන්ද නම් දිව්‍යනාගරාජයා අප බුදුන්ට කිපී එක්ලක්ෂ අටසැටදහසක් යොදුන් මහමෙර ගස් දරණපටකින් වෙළා ගෙණ එණගබින් දෙව්ලෝ වසා බැඳගෙණ දමිස් අප තුදුස් දරණපටකින් ඔහු වෙළා ඒ සා එණගබින් මත්තෙහි අපගේ එණගබින් වසාගෙණ අප පෙළහර පෑ දවස් අපගේ බල නුදුටු කෙනෙක් නැත. තව ද අහිවජ්ජකා නම් නාගරාජයා දමූ ද සබුම්සරහු අපගේ පෙළහර දුටහ. සක්දෙව් රජහු වැනියන්ගේ දහසක් යොදුන් විජයන් නම් මහාප්‍රාසාදය ඇස් බමරක් සේ භ්‍රමණය කරවා සක්දෙව් රජහු අමා පෙළහර පෑ දවස් දෙවියන්ගෙන් අප බල නුදුටුවෝ නැත. තව ද: ඍද්ධිමතුන් කෙරෙහි අග්‍ර වූ ස්ථානාන්තර ලද හෙයින් සුව සස් නැඟු මුහුණ ජයගෙණ සිටි යෝධයකු මතු තබා බල දක්වී මෙහි විස්මය නැත්තා සේ, අප වැනියන් පෙළහර පෑමෙහි විස්මය කිම්දැ"යි සිතා 'ඇවැත්නි! තව තොප බල දුටුවෝ නැත. තෙපි ම පෙළහැර පෑ සිවාංතන් දමා අප බුදුන් දරුවන්ගේ බල පාව"යි වදාළ සේක.

එ වේලෙහි භාරද්වාජ මහතෙරුන් වහන්සේ "මහතෙරුන් වදාළේ කාරණ ම ය. වැළි අපි ම පෙළහරක් පෑ ඒ පාත්‍රය ගණුම හ"යි සිතා මුගලන් ස්වාමීන් යවා තමන් වහන්සේ සිටියා වූ එ ම ගලතල අයමින් විතරින් තුන්ගවු සියාරා තව ගවු පමණ මහත් කොට මවා ඒ සා ගලතල ශ්‍රීපාදයෙහි ඇඟිලි අගින් අවුලාගෙණ ආකාශයට පැන නැගී මරවැඩී පෙත්තක් සේ ගෙණ ගොස් ඒ සා මහත් රජගහ නුවර සියාරා පුගන්ධර සාගරය සියාරා ධාවනය කරණ මහාජනසංඝ රාජයක්හු සේ සත් අසුරුසතක් ඇතුළත

සත්වාරයක් ආවර්තන යම පෙළහරක් පෑ අනන්තවාරයෙහි නගරාම්බරයෙහි සැළක් පැන් පියනකින් වැසුවා සේ තුන්ගවු පමණ ඒ සා නුවර වසාගෙණ තමන් වහන්සේ නො පෙණී සිට සියලු මුළු නුවර වාසීන් සැඩපවන් ගත් මහවනයක් සේ වෙවුලා නැගී උපන් මරණ භයින් සිහි එළවා ගත නොහී, අතුල් ඉසට පාමින්, කුලු ආදියෙන් මුවාවෙමින්, ශංකිත වූ කල්හි වලාගබෙකින් පෙණුනු පුන්සඳක් සේ තමන් වහන්සේ පෙණී වදාළ සේක.

එ වේලෙහි සත්ත්වයෝ මහ තෙරුන් වහන්සේ දැක "බොල! මේ අපට උපන්නේ සබා වූ භයෙක් නො වෙයි. අප මහ තෙරුන් කළා වූ පෙළහරෙක් වන, මේ විට දිවි ලදුමහ" යි කිය කියා දෙඅත් මුදුන් දී සිට "මුළු ලොවට අභය දුන් බුදුරජානන්ගේ අනුජාත වූ පුතනුවන් වහන්ස! අපට නුඹවහන්සේ ද අභයදාන දුන මැනව. එතලෙ ගල නුඹවහන්සේගේ පයින් ගැළවී ගියේ නම් අප හැමදෙනාගේ දිවි කිබෙකි යි නො සිතුම මැනැව, තෙලෙ ගල අහසින් ඉවත් කොට වදාළ මැනැව"යි යාවඤ්ඤා කළ කල ගල පයින් පහකොට පෙර තුබූ ස්ථානයෙහි ම පිහිටුවා තමන් වහන්සේ ආකාශයෙන් සිවානන්ගේ මිදුලෙහි අහස්කුස සරාගිරි මඩලක් සේ දිලිසී දිලිසී වැඩසිටි සේක.

එ වේලෙහි සිටානෝ මහ තෙරුන් වහන්සේ දැක අඹුදරුවන් හා සමග මිදුල් මැද වැද පෙරළී "එසේ ද ස්වාමිදරුවානෙනි! මේ පෙළහර ගැත්තවූ නිසා ම කොට වදාළ පෙළහරෙක් ද, ගැති මේ ලෝකයෙහි වසාවාවෙන් ඇවිදියා සොර බුදුන් සදෙනාගේ තරමු ත් දත, නුඹ බුදුන්ගෙ ත් ඔබ දරුවන්ගෙ ත් විශෙෂය ත් දත, ගැත්තවුගේ මිදුල නුඹගේ ශ්‍රීපාද නාමැති පියුම් දෙකින් සරහා වදාළ මැනව, අහසින් බිමට බැස වදාළ මැනැවැ"යි ආරාධනා කළහ. එ වේලෙහි මහ තෙරුන් වහන්සේ ආකාශයෙන් බැස සිවානන්ගේ මිදුල් මැද කප්රුකක් සේ වැඩසිටි සේක

එ වේලෙහි සිටානෝ මහ තෙරුන් වැද ගෙට වඩාගෙණ ගොස් උතුම් වූ ආසනයෙක හිඳුවා මහ තෙරුන් පා දෙවා සුවඳ තෙල් ගල්වා ආකාශයෙහි තුබූ සඳුන් පාත්‍රය බාගෙණ පාත්‍රය සෝදා සුවඳ තෙලින් පිරිමැද ගිතෙල් මී වෙඩරු ශර්කරායෙන් පුරා පාත්‍රය මහ තෙරුන් වහන්සේට පිළිගන්වා "ස්වාමිනි! අද පටන් තුණුරුවන්ට කුලගැති වීම, මම ද නුඹ පියානන් වහන්සේගේ ශාසනයෙහි එක්තරා එක් ශ්‍රඩාමිනානයෙකිමි. යමෙක් නිශිත වූ කඩුවක්

ගෙණ මා ශිෂ්‍යච්ඡේදය කරණුයේ වී නමුත් බුදුන් නු බුදුනැයි නො කියමි, දහම් නො දහමැයි නො කියමි, සඟුන් නො සඟුනැයි නො කියමි" යනාදී හො එක් තෙපුල් කියා තුණුරුවන් ශරණ පිහිටියහ. ඒ වේලෙහි මහ තෙරුන් වහන්සේ සිවාතන් ආදි වූ මුළු නුවරවාසීන්ම අනුරූප වූ බණ වදරා ඇත්ගලින් නික්මුනු හස්ති රාජයකු සේ සිවාතන්ගේ ගෙන් නික්ම පාත්‍රය අත්ලේ තබා ගෙණ නුවරින් පිටත් වලා බුදුන් වසන වෙහෙර බලා නික්මුනු සේක.

ඒ කල නුවර දර පලා යෑයා වලට ගිය සත්ත්වයෝ ද නො එක් කෘෂිකර්මාන්තාදියට බැහැර ගියා වූ සත්ත්වයෝ ද "පිණ්ඩෝල භාරද්වාජ මහ තෙරුන් වහන්සේ මුළු නුවරට පෙළහරක් පෑ සේක. සිවාතන්ගේ සඳුන් පාත්‍රය පිළිගත් සේකැයි" යන බස් අසා 'අපි අපි ද ඒ පෙළහර බලම්හ" උපන් සත්සලයෙන් තමන් තමන් යෙදුනා වූ ඒ ඒ කර්මාන්ත හැර ඔවුනොවුන් පරයා නුවර බලා දිවන්නාහු පාත්‍රය අත්ලෙහි තබාගෙණ වෙහෙරට වඩනා තෙරුන් වහන්සේ දැක වැඳ පෙරළී "ස්වාමිද්‍රව්‍යමානෙනි! මහත් වූ කරුණා ඇති බුදුරජාතන් වහන්සේගේ පුතනුවන් වහන්ස! තුඹගේ පෙළහරකි මහිම අප පින්හිඳ යෙහින් ගියසේ බලාපිය නුහුනුම්හ. තුඹ පියාතන් වහන්සේ වෙසතුරු මහරජ ව සත සතු මහදන් දී මුළුනුවර ක්‍ෂුභිත කොට තපසට වලට යන ද දනට පසු ව පසුපස් පැහි ගොස් දස් ඉල්වූ බමුණන්ට පමා නැතැයි නො කියා අසුන් දුන් සේක. රථ ය දුන් සේ, එසේ ඉතයින් තුඹවහන්සේ ද පියාතන් වහන්සේ යේ ම පෙළහර දක්විමට පසුව හියා වූ අප හැම ද කිසි නම් පෙළහරෙකින් අනෙනාභ කාරවුව මැනවැ'යි කියා කියා මහ තෙරුන් වහන්සේ සිසාරා වැඳ පෙරළෙති.

ඒ වේලෙහි මහ තෙරුන් වහන්සේ ඔවුනු දූ කෙරේ උපන් මහත් වූ කරුණාවෙන් සමහර විටෙක ආකාශයෙන් වඩිමින්, සමහර විටෙක දුමමින් සමහර විටෙක දිලියෙමින්, සමහර විටෙක අහසින් බැස සත්හුන් ගමනින් වඩිමින්, සමහර විටෙක අත්ලෙහි තුබූ පාත්‍රය අහසට හැර ආකාශයෙන් ගෙණ යෙමින් නොයෙක් පෙළහර දක්වා දක්වා ගොස් විහාරයට වත්සේක. ඒ කල දහස් සුවහස් ගණන් සත්ත්වයෝ මහ තෙරුන්ගේ පෙළහර දුක දුක දෙහොත් මුදුන් දිදී මහත් වූ සාධුකාර පූජා ය. ඔල්වරසන් අනු රුසන් පිළී ඉස සිසාරා නැටීමැයි යනාදී වූ අප්‍රමාණ වූ උත්සව පූජා කළහ.

වෙල ගස් මත් කල, ගග ගස්වනැ යි කියන්නා සේ, රජක් හුගේ සේනාව ගොස් එක් රටක් ජය ගත් කල අසුමල් රජ අසුවල් රට ජයගතැ යි ඒ කීර්තිය කලවුන් තිබිය දී රජහට කීර්ති කියන්නා සේ, බුදුන්ගේ ශ්‍රාවකයන් කළා වූ පෙළහර ද ලදුවා වූ අද්භූත පූජා ද, බුදුන් ම ලදුවා නම් මනා බැවින් මෙසේ මේසේ වූ සත්කාර පූජාවන් ලත් හෙයිනු ත්, එ සේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, සත්පුරුෂවූ ජනයන් විසින් බුදුහු අර්හත් නම් වන සේකැ යි දත යුතු.

එ කල ස්වාමිදරු වූ බුදුරජාණන් වහන්සේ එ පවත් අසා භික්ෂුසඞ්ඝයා රැස් කොට "මහණෙනි! අනනතාපරිශන්ත වූ බුදුන්ගේ ශාසනවල දඬු පාත්‍රයක් පිළිගැස් නොකෙණක් නැත, එසේ හෙයින් මාගේ ශාසනයෙහි ද දඬු පාත්‍රයක් පිළිගත නො හැක්ක, ප්‍රත්‍යයක් නිසා ශ්‍රාවකයනු දු ප්‍රාතිහාර්‍ය පෑ නො හැක්කෝ ය"යි ශික්ෂාපද පණවා වදාළ සේක. එ කෑස් පමණ භික්ෂූන් මහන්සේ පෙළහර නො පානා සේක.

එ කල තීර්ථකයෝ රැස් ව ඔවුනොවුන් හා මන්ත්‍රණය කරන්නාහු "මහණ භවත් ගෞතමයෝ සමන්ගේ ශ්‍රාවකයන්ට ප්‍රාතිහාර්‍ය නො පානා පරිද්දෙන් ශික්ෂාපද පැණවූ ය, උන්ගේ ශ්‍රාවකයෝ නම් තමන් දිවි යේ නමුත් උන් කී බසක් නො වරදවන්නාහු ය. ශ්‍රාවකයන්ට පෙළහර පෑ නො හැක්කැ යි ශික්ෂාපද පැණ වූ බැවින් මහණ භවත් ගෞතමයෝ තුමූ ද පෙළහර නො පානාහු ය, අපට වූයේ අනුසිලයෙක, එ හෙයින් අපි අපි දූ ඔවුන් හා සරිගස්වා පෙළහර පාම්හ යි ගජ්නා කොට ඇවිදුම්හ"යි නුවර ඒ ඒ තැන්හි සිට බොහෝ අඥානයන් රැස් කොට "මහණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයන් සේ අපි අපි දූ ලාභ නිසා පෙළහර නො දක්වම්හ. ඔහු පෙළහරක් පෑවූ නම් අපි දශ පෙළහරක් දක්වම්හ. භවත් ගෞතමයෝ දශ පෙළහරක් පෑවූ නම් අපි විසි පෙළහරක් දක්වම්හ"යි යනාදී වශයෙන් තමන් මුඛප්‍රාපත වූ බොහෝ තන් දොඩන්නාහු ය.

එ කල බිම්බිසාර රජ්ජුරුවෝ එ පවත් අසා බුදුන් කරා ගොස් බුදුන් වැඳ එකත්පස්ව හිඳ "ස්වාමීනි! නුඹවහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේ පෙළහර නො පානා පරිද්දෙන් ශික්ෂාපදයක් පණවා වදාළ සේක් දූ"යි විචාළහ. "එසේ ය! මහරජැ"යි වදාළ සේක. එ බසට රජ්ජුරුවෝ කියන්නාහු "එසේ වී නම් ස්වාමීනි!

තීර්ථකයෝ නුඹවහන්සේ ලා ස්පර්ධා කොට තුමූ තුමූත් පෙළහර පාමහ යි දෙබා ඇවිලුනාහු ය, ඊට කළමනා කිම් දැ"යි විචාළහ. ස්වාමි දරුවෝ සිනා පහළකොට "මහරජ! ශක්‍රදෙවේන්ද්‍රයා හා ස්පර්ධා කරණ පාංශුපිශාචකයන් සේ කිසි ගුණලවයක් නැති තීර්ථකයන් හා ලොවුතුරා බුදුන් හා සම සමයෙහි පෙළහර පානා කල බුදුහු කිසියම් පෙළහරක් දක්වන්නෝ වේ දැ"යි වදාළ සේක.

එ බසට රජ්ජුරුවෝ "ස්වාමීනි! පෙළහර පෑ නො හැක්කැ යි ශික්ෂාපද පැණවූ කල දූත් පෙළහර පානෝ කෙසේ දැ"යි විචාළහ. මහරජ ශ්‍රාවකයන්ට ශික්ෂාපද පැණ වූ බවක් මිස මට නො පැණ වූයෙමි වේ දැ යි වදාළ සේක. එ වේලෙහි රජ්ජුරුවෝ "නුඹ වහන්සේගේ ශික්ෂාපද ශ්‍රාවකයන්ට ඇද් ද, නුඹ වහන්සේට නැද් දැ" යිහ

එ බසට බුදුහු වදාරණ සේක් "මහරජ! සමුද්‍රය පවා තප්ත කොට සිඳෙන තරම් සූර්‍ය්‍ය දිව්‍යපුත්‍රයන්ගේ මුළුසක්වල පවත්නා වූ තෙජස් ඔවුන්ගේ සුවුමාල වූ දිව්‍යකායෙන් ලොමකූ ත් හුණු කල නො හැක්කේ ය, සියලු සතුන් හිස්මුදුන් පලාපියන තරම් ආඥා ඇති සිංහරාජයන්ගේ කාදය ඔවුන් තමන්ගේ හිස් මුදුනට නැත. මෙ මෙ කාරණයෙන් වදාරණ සේක් සර්වඥරාජයන්ගේ කෙළ ලක්ෂයක් සක්වළ පවත්නා වූ ආඥාව සර්වඥවරයන් තමන් තමන්ට නැති සේ ම ය. ඊට කාරණ තොප අතින් ම විචාරමි:- මහරජ! තොපගේ උයනෙහි අඹ අනෙකක්හු නො කන්නේ ය යි තොපගේ ආඥාවෙන් බෙර ලැවූ කල අනෙකෙක් කා නම් ඔහට කුමක් කරු දැ"යි විචාළ සේක. ඔහු අතින් දඬගණිමි යි කීහ. ඒ අඹ තොප කෑ කල තොපට දඬ ඇද් ද නැද් දැ යි විචාළ සේක. මා අතින් දඬ ගන්නෝ කවුරු දැ යි කීහ. එබැවින් මහරජ තොපගේ තුන්සියක් යොදුන් අඟු මගධ දෙරට පවත්නා වූ ආඥාව තොපට නැත්තා සේ ම, කෙළලක්ෂයක් සක්වළ පවත්නා වූ බුදුන්ගේ ශික්ෂාපද සඞ්ඛ්‍යාත වූ ආඥාව බුදුන්ට නැත්තේ ම ය.

කාරණ කිම? යත්; බුදු හු ස්වයම්භූයහ, අනාචරියහ, අප්‍රතිපුද්ගලයහ. එසේ හෙයින් බුදුහු තුමූ ම තමන්ට මහණ වූහ. ශ්‍රාවකයන් අනුන් කෙරේ මහණ වන සේ නික්මවති. බුදුහු තුමූ රන්තලියෙන් කිරිපිඬු වැළඳූහ. ශ්‍රාවකයන් රන්පාත්‍ර නො පිළිගන්නා සේ නික්මවති. බුදුහු තුමූ ග්‍රාමාන්තසෙනාසනයෙහි වෙසෙති. ශ්‍රාවකයන් ආරණ්‍ය වෘක්ෂමූල ශ්මශානාදියෙහි රමණීය

කරණ සේ හික්මවති. මේ මේ කාරණයෙන් ශ්‍රාවකයන් කෙරෙහි පවත්නා වූ ඈඳුම බුදුන් කෙරෙහි නො පවත්නේ වේ දැ යි වදාළ සේක.

එ වේලෙහි රජ්ජුරුවෝ කාරණ ගිවිස "ස්වාමිනි! කොයි දී ද ප්‍රාතිහාර්‍ය්‍ය පාන්නේ දැ" යි විචාළහ. මහරජ! අනන්තාපරියන්ත වූ බුදුන් යමාමහ පෙළහර පෑවා වූ සැවැත් නුවර දී වේ දැ යි වදාළ සේක. කෙසේ වූ තැනෙක දී දැ ස්වාමිනි යි විචාළහ. මහරජ! ගණ්ඩම්බ නම් වෘක්ෂමූලයෙක දී ය යි වදාළ සේක. කවර කල ද පෙළහර පාන්නේ ය යි විචාළහ. මෙයින් සාරමසක් ගිය කල ඇසළ මැදිපොහෝ ලද උත්‍රසළ නැකතිනැ යි වදාළ සේක.

එ වේලෙහි රජ්ජුරුවෝ "ස්වාමිනි! මා විසින් කළමනා කිම් දැ" යි විචාළහ. මහරජ! මනුෂ්‍යයන් විසින් කළමනා දෙයක් නැත. මාගේ පාරමිතා බලයෙන් අඹගසෙකු ත් මැවෙයි, ශක්‍රදෙවෙන්ද්‍රයා දෙළොස් යොදුන් තිලුපුල්මණ්ඩපයකු ත් මවා දෙයි. තොප විසින් කළමනා දෙයක් නැත. බුද්ධොත්පාදයෙහි උපන් පින්වතුන් ලබන්නා වූ බුද්ධ ශ්‍රී මහිමය සිත් සේ ලැබ ගණුව යි වදාළ සේක. එ වේලෙහි රජ්ජුරුවෝ බුදුන් වැඳ රජගෙට ගියහ.

බුදුන් "පෙළහර පාමි" යි වදාළ බස් මුළුනුවර සැලවී ගියේ. එ කල සම්‍යග් දෘෂ්ටි ගත්තුවෝ උත්සවයට පවත් ගත්හ. තීර්ථකයෝ එ තෙපුල් අසා ලෙන් නැගී ගිස්සෙන් සුසුම් ලා ඔවුනොවුන් මුහුණ බලා "කොල! එතෙකින් අපි නටුම්හ. මහණ භවත් ගෞතමයෝ පෙළහර නො පවති යි සිතා බොහෝ බස් දෙඩාපිම්හ. දැන් ඔහු පෙළහර පවිත් ල ඔවුන්ගේ ශික්ෂාපද ශ්‍රාවකයන්ට මුත් ඔවුන්ට නැත් ල. මේ සාරම්භ වී තුමූත් අඩුවක් නො පෑ රැකී සම්හ. සොරහු පවා උලට නඟනා තෙක් එක බස ම සිටිනාහු ය යි යන ව්‍යවහාරකි සේ ම හැමදෙන ම තව අඩුමක් නො හඟවම්හ" යි මන්ත්‍රණය කොට නුවර මැද සිට "මහණ භවත් ගෞතමයෝ මායම් දන්නා කෙණෙක; තුමූ මේ නුවරදී පෙළහර නො පවිත් ල, අනික් නුවරක දී පෙළහර පවිත් ල, උන් කියන්නේ මායම් ම ය; අප හැම බා අනික් අතෙක සැඟවී පලායනා මායමක් කරණ සැටිය, එසේ උන් පලා යා නො දෙම්හ. මේ සාර මස අපි දු උන් පිට රකවල් කරම්හ" යි කිය කියා වෙහෙර දොරකඩ රැස් වූහ.

එ සඳ ස්වාමිදරුවෝ තරු පිරිවැරූ සඳක් සේ මෙහෙරින් නික් ම, දහවු සැරිසරු ලෝවැඩි කොට කොට ගමින් ගම් සැතපී සැතපී ගමින් ගම් වළඳ වළඳා ගමින් ගම් දහම් මහරේ වස්ව වස්වා වඩනට පටන් ගත් සේක.

එ කල බුදුහු පෙළහර පානට නුවරින් නික්මුනු සේකැ යි මුඛපරම්පරාවෙන් දෙවියන්ගේ ආනුභාවයෙන් අසා දඹදිව ශ්‍රද්ධාවන්ත වූ ස්ත්‍රී පුරුෂයෝ "අපි අපි දු එ පෙළහර බලම්හ" යි උපන් සන්තොෂයෙන් ගම් ගිහිණාදි සියලු සම්පත්තියෙහි ලොභ නො කොට කිරි බොන දරුවන් දක්වා වඩාගෙණ සම්පත්තින් පිරුණා වූ ගෙවල දොර පතු හයා බැඳ, සෑ එක් නො එක් ගම් හිස් කොට ධජ පතාකාදි නො එක් පූජාභාණ්ඩ ගෙණ ස්වාමිදරුවන් ලැගි ගමිස් ගමට හඬ හඬා ලුහුබැඳ රළපෙළ දිවන්නා සේ දවසින් දවස බුදුන්ට මහ පූජා කෙරෙමින් නික්මුනාහ

එ කල දඹදිව තීර්ථකයන් කෙරේ පැහැද උත්ම මහත් වූ සත්කාර කරන්නා වූ කාලඤ්ඤ නුවර උපාලි නම් සිටාණන් හා විශාලා නුවර සිංහ නම් සිටාණන් හා කිඹුල්වත් නුවර වප්ප නම් ශාක්‍යයන් හා ශ්‍රී වන්තයෝ තුන් දෙනෙක් වූහ. එ කල තීර්ථක යෝ ද මේ ආදී තමන් තමන්ගේ දෘෂ්ටිගතුවන් කරු ගොස් "භවත් ගෞතමයෝ සැගවි පලායන්ට සිතති. අපට සහාය වව ඔවුන් යා න් නො දෙම්හ. අපගේ පෙළහර බලන්ට ත් එව" යි කියා තමන් තමන්ගේ දෘෂ්ටි ගත් බොහෝ අඥාන වූ මහපිරිස් ගෙණ බුදුන් පසු පස්සෙහි සිංහයේනාවක් පසුපස්සෙහි ගමන් ගත් ශෘගාල පිරිසක් සේ නික්ම බුදුන් දහවල් මැළඳූ තෙන තුමූ රෑ ලගිමින්, බුදුන් රෑ ලැගි තෙන තුමූ දහවල් බා ගන්මින්, මෙසේ සාරම්භ මුළුල්ලෙහි බුදුන් පසුපස්සෙහි ම ගියාහ.

එ කල ස්වාමිදරුවෝ ද සියලු ජනයන් විසින් කරණ ලද පූජා සත්කාර විඳ විඳ අපමණ වූ මහ පිරිස් ගෙණ ඇසල මස පුර අටවක සැවැත් නුවර ගොස් වන් සේක.

තීර්ථකයෝ ද "මහණ භවත් ගෞතමයෝ ඉවතෙක නො ගොසින් සැවැත් නුවර බලා ම යන්නාහ. පෙළහර පානා බවු සබා ම සැපි ය, එතෙකින් කුමක් කරමෝ ද, දුටුවක් දතුම්හ" යි සිත සිතා තමන්ගේ මිථ්‍යාදෘෂ්ටි ගත් පිරිස් ගෙණ සැවැත් නුවර වැද තමන් තමන්ගේ උබ්ධි ගත්තා වූ ජනයන් තළුවා

ලක්ෂයක් ලැබගෙණ, ඒ ලක්ෂය වියදම් කොට අපි ද උන් සේ ම මණ්ඩපයෙක දී පෙළහර පාම්හ යි කිය කියා කිසිරි පාදයක් හිඳුවා මනොහර වූ මණ්ඩපයක් කොට හුදු නිල්පුල්මලින් සෙයා නො එක් සැරහුම් කළහ.

කොසොල් රජ්ජුරුවෝ ද බුදුන් වැඩි දවස් අනාථපිණ්ඩිකාදි ශ්‍රද්ධාවන්ත සත් කෙළක් පමණ මනුෂ්‍යයන් ගෙණ මහත් වූ පූජා වෙන් බුදුන්ට පෙරගමන් කොට බුදුන් දෙව්රම් වෙහෙර ලා බුදුන් වැද එකත්පස්ව හිඳ "ස්වාමිනි! මේ මහ පිරිස නුඹ පසුපස් සෙහි කුමක් නිසා එද් ද" යි විචාළහ. මහරජ! මා විසින් දක් වන්නා වූ යමාමහ පෙළහර බලන්නට රැස් වන්නාහ යි වදාළ සේක. ස්වාමිනි! කොතෙනෙක දී පෙළහර පාන සේක් දැ යි විචාළහ. මහරජ! තාගේ නුවර වාසල් දොරට නුදුරු තැන අඹ ගසක් මුල දී ය යි වදාළ සේක. එසේ වී නම් ස්වාමීනි! තීර්ථකයෝ තුමූ ද පෙළහර පාම්හ යි මණ්ඩපයක් කෙරෙති ස්වාමිදරුවන්ට ද අනගි වූ මණ්ඩපයක් කරවාලනු කැමැත්තෙමි යි දැන්වූහ

එ වේලෙහි ස්වාමිදරුවෝ "මහරජ! නොවටී ය, අපට මණ්ඩපයක් කරණ කෙනෙක් ඇතැ"යි වදාළ සේක. එ වේලෙහි කොසොල් රජ්ජුරුවෝ "ස්වාමිනි! මේ මුළු දඹදිව් තලෙහි මා හැර නුඹවහන්සේට මණ්ඩපයක් කරවන කරම් මවු ත් වඩනා කෙනෙක් ඇද්දැ"යි කීහ. ස්වාමිදරුවෝ "මහරජ මනුෂ්‍යයන් කරවන මණ්ඩපයෙක් නම් නොපි ම කරවන්නාවා ද, සක්දෙව් රජ දෙලොස් යොදුන් නිලුපුල් මණ්ඩපයක් මට කොට දෙයි. මේ සා මුළු දඹදිව සත්ත්වයන් හැමදෙනා අවුත් සිටියත් ඒ මණ්ඩප ය ඇතුළෙහි ම ය. තෙපි මුසුප්පු නො ම පෙළහර බලන්නට සැරහී ගණුව"යි වදාළ සේක. ස්වාමිනි! එ පෙළහර පානේ කවර දවස් දැ යි විචාළහ. මහරජ! මෙයින් සත්දවසක් ගියකල ඇසළ මැදි පොහෝ ලද උත්‍රසළ නැකතිනැ යි වදාළ සේක. එ වේලෙහි රජ්ජුරුවෝ ඉතා විස්මය පත්ව තමන් පෘථග්ජන හෙයින් තව දැ: මදක් සැක ඇති ව "ස්වාමිනි! මේ පවත් බොහෝ සත්ත්වයන්ට සැලකර වම් දැ"යි විචාළහ. මහරජ! සැක නැති ව ම පොහොසතු නම් මුළු දඹදිව සත්ත්වයන්ට ත් සැලකරව යි වදාළ සේක.

එ වේලෙහි රජ්ජුරුවෝ සැක නැති ව නුවරට වැද මිගුලැතු සරහා අමාත්‍යයන් ඇතුපිට හිඳුවා "අප බුදුහු මෙයින් සත්දවසක් ගිය කල යමාමහ පෙළහර බලන කෙනෙක් රැස් වව"යි කියා

නුවර මුළුල්ලෙහි රන් බෙර ලවා සැලකළෝහු ය. එවේලෙහි දෙවියන්ගේ ආනුභාවයෙන් ඒ කනක භේරිනාදය දස දහසක් යොදුන් දඹදිව මුළුල්ලෙහි දොර දොර ලමින බෙර සේ දොර දොර සිට හඬ නානා සේ විශේෂයෙන් ඇසී ගියා. දෙවන දවසු දු එසේ ම බෙර ලැවූහ. තුන්වන දවසු දු, සතරවන දවසු දු පස්වන දවසු දු, සවන දවසු දු එසේ ම එ බෙර ලැවූහු ය. එසේ එසේ ම මුළු දඹදිව සත්ත්වයෝ ත් එ බෙරහඬ ඇසූහු ය. සත්වන දවස් උදෑසන බෙර ලැවූ හඬ අසා දසදහසක් යොදුන් දඹදිව මනුෂ්‍යයන් අතුරෙන් යම් යම් කෙනෙක් එ පෙළහර බලමිය යි සිතූ නම් ඒ සිත හා සමග සැවැත් නුවර අවුත් පෙණී ගියාහු ය. මිථ්‍යා දෘෂ්ටි ගතුවා වූ සත්ත්වයෝ ද ගැළවුන මිනා කෙනෙක් අවුත් පෙණී ගියාහු ම ය

එ කල තීර්ථකයෝ "ශ්‍රමණ භවත් ගෞතමයෝ අඹගසක් මුල දී පෙළහර පාන්නේ ය යි සලකා අපි හෝ පලමු කොට ම කියා දමාපු ය. [illegible]සක් ඇත. උන්ගේ බස බොරු කරමහ. මේ නුවර අඹගස් නැති කරමහ"යි මන්ත්‍රණය කොට තමන් තමන්ගේ ලබ්ධි ගත් සිවුවරුන්ගෙන් බොහෝ සම්පත් ඇරගෙණ නුවර අඹගස් ඇති ඇතියන්ට සියක් වටනා ගසට දෙසියයක් දී, දෙසියයක් වටනා ගසට හාරසියයක් දී, මෙසේ මෙසේ ම අඹගස් කපන්නාහු නුවර සිසාරා යොදනක් මානයෙහි තමන්ට විෂය වූ යම් තැනෙක එක් පෙති දෙපෙති අඹපැල දක්වා උදුරා හැර තමන් තමන් අඹ අඹා ම විනාශයට පැමිණෙන නියාවට පලමු කොට ම කාරණ පානා සේ, එ නුවර අඹගස් අඹ අඹා ම පාළු කළහ

ඉක්බිත්තෙන් ඇසල මැදි පොහෝ දිනයෙහි සවාමිදරුවෝ උදය කළමනා සියලු බුද්ධකෘත්‍යය නිමවා පාත්‍ර සිවුරු දරා, මහසඟ පිරිස් පිරිවරා සිඟා වඩනා සේක් නුවර වාසල් දොරට පැමිණි සේක. එ කල රජ්ජුරුවන්ගේ ගණ්ඩඹ නම් උයන් ගොව්වා උයන බලා ඇවිදිනේ දිමිකැදූල්ලෙක සැඟවී මුහුකුරා පිළිකා ව තුබූ කොමඩු පුසුල් සා මී අඹපකක් දැක කඩාගෙණ මේ අකාල ඵල ය රජහට දෙමි යි සතුටු ව රජගෙට යනුයේ සිඟා වඩනා බුදුන් දැක උපන් පස්මණක් ප්‍රීතීන් පිණා "මේ අඹඵලය රජ්ජුරුවන්ට දුනිම නම රජ්ජුරුවෝ දුනා ගහනෝ හ වූ නම මට අව මස්සක් හෝ දෙති. කොළොස් මස්සක් හෝ දෙති නවත් පැහැදු හීනෝ නම මේ ජාතියෙහි රහෙකු පමණක් ගැහක් දෙති. බුදුන්ට පිළිගැන්වීම නම ජාතිසහස්‍රයෙක මට මහත් වූ සම්පත් ලැබෙසි. සසරින් ගැළ

වීමට කාරණ වෙයි. අද මේ බුදුන්ට ම පිළිගන්වමි"යි සිතා මී අඹපක දෑතින් ගෙණ නැඹුරු ව බුදුන් සමීපයට ගොස් "ස්වාමිනි! මේ අඹපක පිළිගෙණ ගැත්තහුට අනුග්‍රහ කොට වදාළ මැනැවැ"යි කියා බුදුන්ගේ ශ්‍රීහස්තයට පිළිගැන්වී ය.

එ වේලෙහි ස්වාමිදරුවෝ අනඳ මහ තෙරුන් වහන්සේ මුහුණ බලා අඹ පක ඔබ අතට දුන්සේක. ඔබ ද තමන් වහන්සේ බුදුන්ගේ අදහස් දන්නා මහනුවණ ඇති හෙයින් ස්වාමිදරුවන් බැලූ බැල්ම හා සමග "බුදුහු අඹපක මෙතෙන දී වළඳනු අභිප්‍රාය ඇතිසේකැ"යි දැන එ කෙණෙහි මී අඹපක පොඩු ගලවා බුදුන්ගේ පාත්‍රයට පිළිගන්වා එ තැන්හි ම බුද්ධාසනයක් පණවා, "ස්වාමිනි! මෝනට අනුග්‍රහ පිණිස මොහු බල බලා සිටිය දී ම මේ අඹපක වළඳා මැනැවැ" ආරාධනා කළ සේක.

එ වේලෙහි ස්වාමිදරුවෝ පණවන ලද බුද්ධාසනයෙහි වැඩහිඳ වළඳන්නට පටන්ගත් සේක. එ කෙණෙහි දෙවියෝ උයන් ගොව්වා හැර සෙසු කෙණකුන්ට නො පෙණෙන සේ බුදුන් සිඟාරා මුවා කළහ. එ වේලෙහි ස්වාමිදරුවෝ ද ඒ අඹපක වළඳා "ආනන්ද ය! කෙලෙ අඹ ඇටය තුලු ලවා මෙ තෙන රෝපණය කරව, එයින් දුන්දක් අඹගසෙක් නැඟෙ"යි වදාළ සේක. එ වේලෙහි අනඳ මහ තෙරුන් වහන්සේගේ නියෝගයෙන් ගේ තෙම ස්වාමිදරුවන් අභිමුඛයෙහි පස් පීරා අඹ ඇටය රෝපණය කෙළේ ය. එ වේලෙහි ස්වාමිදරුවෝ ශ්‍රී හස්තය ශෝධා ශ්‍රී මුඛයෙහි පැන් එතෙන වත්කොට වදාළ සේක. එ කෙණෙහි 'ස්වාමිනි! තුඹවහන්සේ පෙළහර පාන බවට මම් මී දෙස් කියමි"යි මිහිකාන මුව විවර කළා සේ පොළොව දෙසිදුරු කොට ගෙණ ස්වාමිදරුවන්ගේ තේජෝ නමැති සේවකයා තුන්ලෙව්හි ඇවිද ඔබ හා සමයක්හු නො දැක, නැවත ඔබ කරා පැමිණ ඔබ පාදමූලයෙන් පැනනැංගා සේ නගුලි සක් ප්‍රමාණ ඇති සුරක්ෂිත වූ අංකුරයෙක් මහා යන්ත්‍ර කලෙකින් ලාක්ෂාරස නැල්ලක් විද්දා සේ ඇසිපිය නගා නො ලන ඇසිල්ලෙහි පණස් රියන් කඳ ඇති ව පණස් රියන් පසැවමනා ශාඛා ඇති ව එකි එකි ශාඛාවෙහි සුවහස් ප්‍රශාඛාවෙන් විරාජමාන වෙමින් සුරක්ත වූ පල්ලවයෝ පෙරළී නීලවණ් වෙමින් ඉඳුමිණිනිල් පර්වත යක් සේ මුළුනුවර හොබවා වනස්පතී මහ ම අඹ රුකක් සේ මැවී ගිය.

ඒ රුක පූර්ව ශාඛාග්‍රයෙහි පටන් පශ්චිම ශාඛාග්‍රයට සියක් රියන, උත්තර ශාඛාග්‍රයෙහි පටන් දක්ෂිණ ශාඛාග්‍රයට සියක් රියන

ශාඛාමණ්ඩලය සීඝ්‍රා තුන්සියයක් රියන, රිදීකඳක් බඳු වූ මට සිලුටු වූ කඳවට පසළොස් රියන, කඳ බොල පස්රියන. එ කෙණෙහි ම සුවඳස් ගණින් මල්කැන් කඳ පලා අතු පලා පැන නැගී එ කෙණෙහි ම මල් පර ව මලැසි ගෙණ එ කෙණෙහි ම මුහුකුරු විලිස්සී සුවඳස් අඹකැන් බුරා එලෙන්නට පවත්ගත මන්දමාරුතයෙන් විලිකුන් අඹ නටුයෙන් ගිලිහී ගතරන්පිඩු සේ ඒ ඒ තෙත හී වැගිර රුක සීඝ්‍රා සැදී සිටගත. ඒ රුක ගණ්ඩ නම් උද්‍යානපාලයා රෝපණය කළ හෙයින් ගණ්ඩම්බ නම් වී ය.

මාගේ සවාමිදරුවාණන් සංසාරයෙහි ඇවිද තපස් කරණ කල පවා දෙවියන් ඔබට තුන්ගවු පමණ ඇති දිව්‍යමය වූ අඹ උයන් දෙන කල, ඔබ ගිරාව උපන් කල පවා, ඔබ වැඩහුන් රුක සක් දෙව්රජහු සහ මල්පල්ලෙන් මවා ධ්‍රැමඑලයෙන් පූජාකරණ කල, ඔබ කර කොළ වැලඳු රුක පවා එසේ ම දිව්‍යපත්‍රයෙන් අලඞ්කෘත වූ කල, මහෞෂධ පණ්ඩිත වූ කල පමා, හිඳුවාලූ ඇඹුල අලයෙන් එක ද උසින් සැටරියන් ඇඹුලගස් පැන නැගෙන කල, දුන් ලොවු තුරා බුදු ව තුන්ලෝ මුදුන් වූ සමයක් වුව, පැරුම් සයුරු හෙළලපු සමයෙක් වුව, බුදුකෙණකුන්ගේ ඍද්ධියක් හා, රහතුන්ගේ ඍද්ධියක් හා දෙව්බඹුන්ගේ ඍද්ධියක් හා, ත්‍රිවිධ වූ ඍද්ධීන් විරාජමාන වූ සමයෙහි ඔබට එක අඹගසක් පොළොව පලා පැන නැගී සහමල් පල්ලෙන් විරාජමාන වූ නියාව ඔබගේ මිහිමි විශෙෂයෙන් දක්නා වූ මාගේ සිතට කවර නම් පෙළහරෙක්ද, එසේ ද වුව ත් එබඳු වූ අද්භූතයෙක්, එබඳු වූ පෙළහරෙක් මාගේ බුදුන්ට ම හොබනේ ය. එ බඳු වූ පෙළහරට ඔබ හොබනා සේක් ම ය. මිව ද සියලු සතුන්ට ද විසමය ම ය. එ කල පස්සෙහි මිඩනා නො එක් භික්ෂූන් වහන්සේ විලිකුන් අඹ වළඳ මළඳ වඩනා සේක.

ඉක්බිත්තෙන් මුළු නුවර සත්තමයෝ එ තෙනට රැස් ව ඔවුනොවුන් පරයා විලිකුන් අඹ සිය් යේ කලු ගස ගසා නා දිව්‍යපානයෙන් මත් වූ අසුරයන් සේ දිවඅඹරසයෙන් මත් වූවාහු අඹ කකා ඒ ඒ දිග්හී දිව නැ නැ අඹ ඇට මිථ්‍යාදෘෂ්ටීන් ඇගට ගස ගසා, එ ඒ තැන්හී ගඩු නංව නංවා "කොල! අප බුදුන්ට අඹගස් නැති කරම්හ යි දෙපෙති අඹපැල දක්වා උදුරා ඇවිද්දා වා ද, අප බුදුන්ගේ මිහිම බලව, අඹ ගසක් මැවී ගිය ඇසිලි බලව, ගණ්ඩ නම් උද්‍යානපාලයා ඉඳුවූ හෙයින් එ ගස ගණ්ඩම්බ ය යි බුදුන් මදළ බවක් මිස අපි වනාහි අඹ ඇට ගැස්මෙන් නොප සැම්ගේ ඇලපිව

පතුපිට, තලල්පිට, අඹ ඇට ගසා ම ගඩු නැංවූ හෙයින් ගණ්ඩම්බ ය යි කියම්හ" යි යනාදීන් මිථ්‍යාදෘෂ්ටීන් මෙනෙහි මෙහෙසා ඒ ඒ දිග්හි ලුහුබැඳ වූහ.

එ වේලෙහි කොසොල් රජ්ජුරුවෝ සඳල්තලෙහි සිටියාහු නිල් මහමෙකුළක් සේ නුවර දොර දිලියෙන මි අඹ ගස දැක "කොල! තලේ කිම් ද" යි විචාරා "බුදුන්ගේ පෙළහරින් පැන නැගි අඹ ගසෙකැ" යි අසා අනේපිඬු මහසිටාණන් ආදිවූ මුළුනුවර සත්ත්‍ව යන් ගෙණ එ තැනට දිව අවුදින් අඹගස දැක "ස්වාමිනි, ශාක්‍ය සිංහ වූ බුදුරජාණෙනි! මේ වැනි පෙළහරක් නො කළ අපට නො කියා පෑ වදාළේ ඇයි ද, තුඹ පානා සෙම්ව පෙළහර නම් මෙ ද" යි කීවාහු ය. එ වේලෙහි ස්වාමිදරුවෝ සිනා පහළ කොට "මහරජ! මෙ කුමන පෙළහරෙක් ද, කවද පෙළහර තුබුයේ ය. ඉක්මින් නො වම" යි වදාළ සේක. එ වේලෙහි රජ්ජුරුවෝ අති සන්තොෂ වූවාහු මිථ්‍යාදෘෂ්ටි ගතුවන්ගෙන් මේ ගසට කිසි උපද්‍රව යෙක් වීම් නම් නපුරු යි කියා ගස සිසාරා ඇතුන් අස් රථ දුනු වායන් සිටුවා, සන්නාහයෙකින් වැසුවා සේ අඹගසට රකවල් ලවා, සම්‍යග් දෘෂ්ටි ගතුවන් මුත් මිථ්‍යාදෘෂ්ටි ගතුවන් ගස මුලට වැද්ද නො දෙන සේ නියෝග කළහ.

එ වේලෙහි සක්දෙව්රජ වාතවලාහක මහාවලාහක සූර්‍ය්‍ය දිව්‍ය පුත්‍ර ය යි යන මොවුන් තුන්දෙනා කැඳවා "දුත්දස් අප බුදුහු මහ පෙළහරක් පවිති. දපදහසක් සක්වල දෙවියෝ රැස් වෙති. ඔවුන් හැමට පළමුකොට මා විසින් බුදුන්ට දිව්‍යමණ්ඩප යෙකින් පූජාවක් කළ මැනව. මා එන තෙක් තෙපි තුන්දෙන පළමුව ගොස් තීර්ථකයන් පෙළහර පෑමට රිසි පලවව" යි නියෝග කළහ.

එ වේලෙහි ඒ නියෝග අසා වාතවලාහක දිව්‍යපුත්‍රතෙම පළමු ව අවුදින් තමාගේ මහාවෙරම්බවාතයෙහි අගලක් සා තෙතින් පුලං කදක් සැවැත් නුවර බලා මෙහෙයාපි ය. එ කෙණෙහි දිවූ ඒ සැඩ මහ පවන සම්‍යග්දෘෂ්ටිගතුවන් ඇඟට සුවපහස් දෙමින් මිථ්‍යාදෘෂ්ටි ගතුවන් මහ සල්වනයක් සේ පැහැර බිම වගුරුවමින් ඔවුන්ගේ ලක්ෂයක් වියදම් කොට කැරවූ නිලුපුල් මණ්ඩපය පැහැර පෙයා පතක් සේ වෙවුල්වා, කන්තුළ හොණ්ඩැස් දුම ජ්ජාබ මුරුවට සේ සුණු විසුණු කෙරෙමින් කිකිපිසා කිකිරි බණ්වා කලන් පිල් සේ ඔලිඳුපුරා හෙළමින්, නිලුපුල් මල් පිහඹුරා සේ වෙන් වෙන් කෙරෙමින් අහසට කණාගෙණ ගොසින් අගුවි

භූමියට දැමී ය. එ වේලෙහි පෙළහර කරම්හ යි මණ්ඩපයට රැස් ව තමන් තමන්ගේ ලබ්ධි ගතුවන් පිරිවරා ඒ ඒ තැන්හි කැල බැඳ හුන්නාවූ තීර්ථකයෝ මණ්ඩපය සුලඟින් කඩා අහසට නඟන වේලෙහි "අපට වූ මේ නුම්බ මූලාමෙක් ද, අප නළ නළ දෙයෙක් ම නපුරැ ම යෙයි. ලක්ෂයක් වියදම් කොට කළාවූ මණ්ඩපය දුන්දක් නැත. ඇසිල්ලෙකින් අප මදිනා තැනුත් නැත. කෙලෙ කෙනා ගන, එමෙනන ගන, කරයේ ගනැ"යි යනාදීන් කිය කියා මිඩුවෙහි වවුලන් සේ එලිගෙණ මණ්ඩපය රඳවාගත නොහී සමහර කෙනෙක් අත් හැලවී එ කෙන ම හුනහ. සමහරු දිවි යේ නමුත් අප මඩුව නො හරැම්හ යි සාහසිකව මඩුම හා සමග වවුලන් සේ පෙළහර පෑ පෑ ගොස් අශුචි භූමියෙහි ම හුනහ.

ඉක්බිත්තෙන් සූර්‍යදේවතාවා තමාගේ ඝනබිඹ වූ රස් කඳක් මෙහෙයා අඩුන් කැතියා ගිය මැල්ලෙහි ලූ මසුන් සේ හුණු කොට සජීාබිගයෙක් බා සෙලවී ය. එ කල වාත වලාහක දිව්‍ය පුත්‍රයා ද නැමත පවනක් මෙහෙයා නුවර මුළුල්ලෙහි සියලු රජස් මෙහෙයා ඔවුන් හරු සමුණුවා ගොඩ ගත් ශරීර රජසින් පුරා නඹ තුඹස් සේ කෙළේ ය. නැවත වස්සවලාහක දිව්‍යපුත්‍ර ද මුදුන් වලා කඩක් මෙහෙයා තීර්ථකයන්ගේ රජසින් වැකුණු ශරීරවල පන්ව පන්වා පොදබිඳු කෙළා සමහරුන් තිත්තුවන් සේ කෙළේ ය. සමහරු කබුරුගොයන් සේ වූහ. සමහරු දිම්බාමින් සේ වූහ.

එ කල රැස්වූ මහපිරිස ජයඝෝෂ තීර්ථකයන් කරු ගොස් ඔවුන්ගේ නා නා වෙස් දැක "තොපගේ නිලුපුල මණ්ඩපය කොයි ද, බුදුන්ට පලබු කොට කෙපි ම පෙළහර පැයියව. සතිකේමව, සතිකේවව, කෙපි කීත් මුම නම් පෙළහර පානා බුදුකෙනෙක් ද, තෙපි කබුරුගොන් නම් පෙළහර පානා බුදුකෙනෙක් ද, තෙපි දිම්බා නම් පෙළහර පානා බුදු කෙනෙක් ද, රූ පූවන්ගේ ගුණ තොප කෙරේ ඇති හෙයින් තොපගේ රහත් බව සබා ම ය" යනාදී වසයෙන් ඔවුන් ඉස බොල්කොළ හෝනා සේ නොයෙක් වෙහෙසුම් බස් කිය කියා තීර්ථකයන් ඒ ඒ තැන්හි මරු ලූහුබැඳ වූහ.

එ කල තීර්ථකයන් මෙසේ සැඟවුනු කල්හි ඔවුන්ගේ උපාසක වරුන් බුදුන්ගේ උපාසක වරු මට කොට ගෙණ "කිමෙක් ද තොපගේ බුදුන්ගේ මණ්ඩපය පෙළහර පෑවා දුටු ද, තොපගේ සිත් නැති මණ්ඩපය සම්: පෙළහර පානා කාය අපගේ ගිත් ඇති බුදුන්.

පාතා පෙළහර තොපට කුමන විසමයෙක් ද. අපගේ බුදුහු පැරැද් දහ, තොපගේ බුදුවරු දිනා ගියහ. බුදුන් ලදුමෝ නම් තෙපි හැමදෙනා ම ය. මිථ්‍යා දෘෂ්ටි ගතුවෝ නම් තෙපි හැම ම ය" යනාදි වසයෙන් වෙහෙසන්නට පටන් ගත්හ. එකල ඔහු ඒ ඒ තැන්හි සැඟවුනාහ.

එ කල පූර්ණ කාශ්‍යප සෙම ගිය ගිය තැන ම මරා ලුහුබඳ වන හෙයින් කිසි තෙනෙක ත් රඳලිය නොහී "මෙ මුලා විඳිනා බලා ත් දිවි නසා ගන්නේ ම යෙහෙකැ"යි පිටිපාට දිවිබාවකු සේ ම දිවෙයි. එ කල ඔහුගේ එක්තරා එක් උපාසක වූ ගොවියෙක් උදෑසන ම ගොස් සී සෑ කල් තබා ගොන්ගේ මුදා සී රැන්දෙක හා අඹුගෙණ ගිය කලය හා ගෙණ "මාගේ මේ පූර්ණ කාශ්‍යප බුදුන්ගේ පෙළහර බලන්නට කල් තබා යෙමි"යි සිතා සිතා දිව තුමයේ ඔහු දුක "ඉක්මින් ව කොයි දිවනා යේක් ද, සවාමිනි, මා යන්නේ තුඹගේ පෙළහර බලන්නට වේ ද, සිටිය මැනැව, සිටිය මැනැවැ"යි කී ය. එ වේලෙහි පූර්ණ කාශ්‍යපයා "තාගේ වලහම් පෙළහර තබා තෙලේ මට දීපිය"යි කියා කලය හා බාන ඔහු අතින් ඉල්වාගෙණ එහ සිටා ගඟට දිව "ගඟදී මට පාතා පෙළහරෙක් වතැ"යි තමා පසු පස්සෙහි දිව ඔහු බල බලා සිටිය දී තෙමේ ගංඛිනනියෙහි සිට සී රැහෙහි එක් කෙලවරක් කළ තව හා, එක් කෙලවරක් තමා උගුරෙහි බැඳ යංමැදව දැතින් කලය ගෙණ පැන වැටී එක් විටක් කළය උල්පවා, එක්විටක් තෙමේ ඉල්ප කලකටින් නැගෙන දිය බුබුලෙක් හා තමා කාටින් බොන පැනීන් හා තමාගේ ගොවියාව පෙළහර පෑ පෑ දිය බිබී මිය අවීචි මහ නරකයෙහි ඉපැද ගිය.

මෙසේ තීර්ථකයන් පරා ජයවූ කල්හි සවාමිදරු වූ බුදුරජානෝ එ ද පස්වරු අනනතාපරිසනන වූ බුදුන් සමාමහ පෙළහර දක්වූ සත් පැ සමාරක් ගිය සත්තිවයන්ව සුවපහස් දෙන උත්සවයව නොබනා වේලෙහි බුඩශයයා වූ සිංහශයයාමෙන් පැනනැගී සශ්‍රීකවූ සුගත් පාංශුකූල චීවරය දරා නැඟු නැඟු පත්ලෙහි පියුම් දක්ව දක්වා, තෙමේ ම විවෘත වූ වාර ඇති ගන්ධකුටියෙන් රන්ගල්ගුහා වෙත් නිකුත් අභීත කෙශරසිංහ රාජයන්හුගේ වික්‍රම අවික්‍රම කෙරෙමින් කිසි ශඞකාවක් නැති ව පිටත් ම ගඳකිලි නිසවත්තෙහි වැඩසිටි සේක.

එ කෙණෙහි උදයගිරි පර්වතයෙන් පැනනැගි ලහිරි විමනින් නිකුත් සුවහස් රස් සේ, සවාමිදරුවන්ගේ ශ්‍රී ශරීරයෙන් නිකුත් බුදුරස් කඳු බුදුන් තුන් යලක් සිසාරා ආවතීනය කොට එයින්

ගොස් ඒ සා ගැම්මැත් නුවර රත්පටක් අතුරන්නා සේ, රන්වන් කොට, එයින් ගොස් මුළු දඹදිව ව්‍යාප්ත ව රන්කැටපතක් සේ බබුළුවා, එයින් ගොස් සක්වළගල සිසාරා තුන්වාරයක් ඇවිද මුළු සක්වළ රන්මුහුදු කෙරෙමින්, එයින් අහස්කුසට පැන නැගී සදෙව්ලොව, සොළොස් බඹලොව දෙවියන්ගේ ශරීර හා නොයෙක් රන්විමන් කිරෑ දුටු කද්‍යෝපැණියන් සේ නිෂ්ප්‍රභ කෙරෙමින්, එයින් උඩ නැගී අජටාකාශයෙහි ගැසී ගැසී සිටගත.

ශ්‍රීපාදයෙන් නික්මුත් බුදුරස්කඳ ද, දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් මේ සා ඝන බිම් බොල් මහපොළොව විසුරුවාපු රන් පිඩැල්ලක් සේ කෙරෙමින්, යට සාරලක්ෂ අසූදහසක් යොදුන් දියපොළොවට වැද, එකී දිය රන්රසයක් සේ කෙරෙමින් එයින් යට නවලක්ෂ සැටදහසක් යොදුන් වාතමණ්ඩලයට බැස එහි දු රන්වන් කෙරෙමින් එයින් යට අජටාකාශයෙහි ගැසී ගැසී සිටගත. මෙසේ මාගේ ස්වාමිදරුවන්ගේ එක ශරීරයෙන් නික්මුත් බුදුරස් කඳින් මේසා මුළුතුන්ලොව සුමනස් පහන් දල්වූ පහන් රුකක් සේ දිලිහී ඉතා ශ්‍රීවනාන වූ නියාවට, දෙව්බඹ කැලන් බුදුරසින් රැඳී සැදී ගිය නියාවට, කාශ්‍රපජිතයන් රන් පජිතයන් සේ රන්වන් වූ නියාවට නානාවර්ණ වූ සත්ත්වයන් රන්මුත් ව එකවර්ණ වූ නියාවට, අතිශ උපමාවක් දක්නා නො හෙමි. මුළුතුන්ලොව සියලු සත්ත්වයන් තමන් වහන්සේගේ අර්හත් බජයෙන් එ දවස් ම සරනාගන්නාක් වන්නැයි කියා ම සිතමි.

එ වේලෙහි මෙසේ ගන්ධකුටිවාරයෙහි සඳරස් කලබක් සේ, හිරිරස් කලබක් සේ, අමාපිඩක් සේ, තිවන් පිඩක් සේ, ස්වාමිදරුවන් වැඩසිටි වේලෙහි අයමින් විතරින් දොළොස් යොදුනක සා සිසාරා සතිස් යොදුනක් මාකයෙහි නලම්වක් අහසට දමූ කල ඇවිඝුත් කිම ගී යා නො හැක්කා සේ, ගනනව සිටියා වූ ඒ සා මහපිරිස් අතිකක් බැලුවෝ නැත. අතිකක් සිතුවෝ නැත. අහෝ බුද්ධො යනාදීන් එකපැහැර දෙනෙත් මුදුන් දිදී සාධුනාද පූජා කළහ.

එ වේලෙහි සියලු සත්ත්වයන්ට උපන් සන්තොෂ හා උපන් විස්මය හා ස්වාමිදරුවන් වැඩසිටි බුඩලීලා හා විශෙෂයෙන් බලා නුවණැසින් දක මා සිතට උපන් බුඩාලම්බන ප්‍රීති සේ ම සියලු සතුන්ට ම පෙණී ගියේ ය, සිතී ගියේ ය, දුනී ගියේ වී නම් සතර අපාය කඳුකන්නෙහි කාවුරු ද, දෙව්ලොව නො කඳුකන්නෙහි

කවුරු ද, මා වැනියන් වදා ලද බිලිඳි වූ පස්ඇවිරිද්දෙහි බුදු සස්නෙහි ලා මෙවෙනි දහම් අමාවිලෙක සිත්සේ ගැලී සැනහී ඇවිදිනා සේ මට මේ සා වැඩක් සාධා දී මෝහයෙන් ප්‍රේම නො කොට තුමූණීත් ප්‍රේමකළා වූ මාගේ මවුපිය දෙදෙනා ආදිවූ සියලු සතුන්ට ම මෙවෙනි සන්තෝෂයක් උපදවා දීලිය හෙම්වයි, සියලු සතුන් සංසාරසාගරයෙන් ගොඩ නඟම්මයි, මෙසේ මාගේ ස්වාමිදරුවානන් මට ම සන්තොෂ කෙරෙමි යි වැඩසිටියා ය, තුන්ලෝ තිලකයක් සේ, වැඩසිටි වේලෙහි බුදුන්ගේ අදහස් දත් කෝටිගණන් ශ්‍රාවකයෝ පෙළ පෙළ දී අවුත් බුදුන් සියාරා රත්පලස් කඩතුරාවක් ඇද්දා සේ සැදී සිටගත්හ. එ වේලෙහි දෙවියෝ ආකාශයෙන් පරසතුමල් වැසි වැස්වූහ. දස දහසක් සක්වළ දෙවියෝ ආකාශයෙහි සිතියම් තබක් ඇද්දා සේ පෙණි පෙණී දෙහොත් මුදුන් දිදී සිට ගත්හ.

එ වේලෙහි ස්වාමිදරුවන්ගේ ශාසනයෙහි අනාගාමි වූ සෑඩිමත් සරණී නම් කුලසත්‍රියක් අවුත් බුදුන් වැඳ 'ස්වාමිනි! මා බඳුවූ තුඹ දුවක විද්‍යමාන කල්හි තුඹ පෙළහර පෑ විඩාමනු නො යෙදෙයි. මම පෙළහර පවිම්''යි කීහ එ බසට බුදුහු උන් ලවා සිංහනාද කරවනු කැමැති ව තෝ කෙසේ පෙළහර පව් දැ'' යි වදාළ සේක. ස්වාමිනි! මම මේ මහ පොළොව දියපොළොවක් කොට සියදහස් යොදුන් මහ දියනා මෙසස් මමාගෙණ එහි දූපිසක්වලින් හැලී පැලසක්වලින් නැහෙමි. එයින් ගැලී උතුරුසක්වළින් නැහෙමි. එයින් ගැලී දකුණුසක්වළින් නැහෙමි. සක්වළගබ සියාරා කර නඟ නඟා සියදහස් ගණන් වාරයෙහි ඇවිදිමි. එසේ ඇවිද ඇවිද සුවහස් ගණන් වෙස් මවා ඒ ඒ තැනින් ඉස් නඟා පවිමි. කෙපි කවුරු දැ යි විචාළ දෙවි බඹ කෙනෙකුන් ඇත් නම් තිලෝගුරු බුදුන්ගේ පාද රජස් ඉස්මුදුනෙහි පිළිගත් ඔබගේ අතවැසි දුවකිමි යි කියමි'' යි කීහ. එ වේලෙහි ස්වාමිදරුවෝ ''තෝ එ බඳු වූ සෑඩිබල ඇතියෙහි ය. මේ බුදුන් ම පැව මනා පෙළහරෙක. ඒ නිව බැරිය. තෝ සිටැ''යි වදාළ සේක.

ඉක්බිත්තෙන් සුළු අනේපිඩු සිටානෝ අවුත් බුදුන් වැඳ ''ස්වාමිනි! එසේ වී නම් මම පෙළහර පවිම්''යි කීහ. තා පානා පෙළහර කියා බලගැ යි වදාළ සේක. ස්වාමිනි! මම ඇසිපියක් හෙළා නො ලන ඇසිල්ලෙහි අහස් කුසට පැනනැගී මහපිරිස බල බලා සිටිය දී මාගේ මේ වෙස ''අනන්තඝාන කොට සත්ගවු සමාරක් දිග පතුල් ඇති, දෙළොස් ගවු රියන් ඇති, සඟවූ වියත් ඇති

සෝපාලයන් ගවු මිණිඔටුනු ඇති, දෙපාලයන් සොඳුත් මහ බඹවෙසක් මවා ගෙණ එක් ඇඟිල්ලක් ඔසවා දහසක් සක්වළ අලුකෙරෙමින්, දසැඟිල්ලක් ඔසවා දසදහසක් සක්වළ අලුකෙරෙමින්, තුන්ලොවට ඇසෙන සේ අත්පොළසන් දිදී දිව්‍යමනුෂ්‍ය සේනාව වෙවුල්වා "සත් තමයෙනි! මම අභිංකෙහිම් නො වෙමි. තිලෝගුරු බුදුන්ගේ එක් තරා එක් උපටා මෙහිම්"යි නුඹලා කියමි යි කීහ. කෙපි දූ සිටැ යි වදාළ සේක.

ඉක්බිත්තෙන් සත් ඇවිරිදි වයස් ඇති චිරා නම් රහත් සාමණේරී කෙනෙක් සුවහස් ගණන් භික්ෂුණී සේනාව පිරිවරා රත්පියුම් වනයෙකින් පැනනැගී රත්මත් හංස රාජයක් සේ අවුත් බුදුන් මැද, අතුල් සුංදර සිරිමුදුනෙන් තබා ගෙණ "ස්වාමීනි! ස්වාමිදරුවානන්ගේ ශාසනයෙහි ලද බිලිඳි කාලයෙහි රහත් වූ මා වැනි දුවක සිටිය දී ස්වාමිදරුවන් ප්‍රාතිහාර්‍ය පාන සේ නො යෙදෙයි. ශ්‍රාවකයන් ප්‍රාතිහාර්‍ය පානත් නො යෙදෙයි. මම ම පෙළහර පවම්, මට ම මෙ පිහිය යවු මැනව. මම ම තීර්ථකයන් ජයගණිමි. එ කල තීර්ථකයන්ගේ ලබ්ධි ගත් නොයෙක් ස්ත්‍රී සමූහයෝ ද, නොයෙක් ලද්දරියෝ ද මාගෙන් ම පරාජය වන්නාහු ය" යි කීහ. එ වේලෙහි ස්වාමිදරුවෝ වෙස්සන්තර ජාතියෙහි කෘෂ්ණාජිනා නම් දියණියන් කියන්නා වූ සුරතල් සේ, තරුණ සිත් ඇති සේක් "ති වයස්ඇති අවශෙෂ වූ කුඩාකෙල්ලන් ඔවුන්ගේ තනයෙන් තව දක්වා කුඩු නො හැර කිරි බොන්නා සේ වුව. තෝ කුමන පෙළහරක් පව් ද, වැළි කියා බලගැ" යි වදාළ සේක.

එ වේලෙහි සාමණේරී දන්මන්නාහු "ස්වාමීනි! මිඹියගේ බල ස්වාමිදරුවන්ට දැනේ ම ය. එසේ ද වුව ත් මම සක්වළ ගල හා හිමවුකුළු මහමෙර හා තුණ ලාලීවට තුණක් සේ මෙ තෙන ම සිට හයාගෙණ ස්වාමිදරුවන් අභිමුඛයෙහි තබාලා මම රාජ හංස බෙනුවකගේ වෙශක් ගෙණ එක් පර්වතයෙකින් කිමිද, එක් පර්වතයෙකින් නැගෙමි. ඒ පර්වතයෙන් කිමිද, අනික් පර්වතයෙන් නැගෙමි. නැවත ඒ තුන් පර්වතය ම ලාලීවට තුණක් සේ අහසට දම දමා බිම හී සා නො දී ලාලිකෙළි නම් පෙළහරක් පවම්" යි දැන්වූ දූ ය. එ වේලෙහි ඒ සා මහ පිරිසින් සාධුකාර නුදුන් එකද සත්ත්ව කෙනෙක් නැත. සතුටු කඳුලෙන් නුවන් නො තෙමූ කෙනෙක් නැත. දරු ලද්දා වූ සුවහස් ගණන් කුලස්ත්‍රීන්ගෙන් නිකුත් සතුටු කඳුලු වතුරෙන් දිවන්නා වූ දඹපරණලා සේ මිථ්‍යාදෘෂ්ටි ගත්තා වූ

සුවහස් ගණන් ස්ත්‍රී පුරුෂයෝ ඒ ඒ දිශායෙහි පැරඳ දිමින්නට පටන් ගත්හ. සවාමිදරුවෝ "තී එ බඳු වූ පෙළහරක් පෑහ බවු සබා ම ය. මා පෑහ පෙළහර කිම බැරි ය. නොයි ද සිටැ"යි වදාළ සේක

ඉක්බිත්තෙන් පිළිසිඹියා පත් රහත් වූ සත්හැවිරිදි චූණ්ඩ නම් සාමණේරයන් වහන්සේ සගපිරිස් පිහිරා ගෙණ මහත් පියුම්වන යෙකින් පැනනැංගා වූ පියුම් කැකුලක් සේ පැනනැගී අවුත් පිට "සවාමිනි! මම පෙළහර පවම්"යි කියේක. තා කරණ පෙළහර ද කියා බලගැ යි වදාළ සේක. සවාමිනි! මම පත් සියක් යොදුන් උස හිමාලය පර්වතයෙහි සිටි සියක් යොදුන් මහදඹගස ඇතතු පිල අත්තක් අල්වා සලන්නා සේ සලා මහදිඹ කළු සා දඹ ගෙණවුත් මේ සතිස් යොදනෙහි සිටි මහපිරිස දඹ නමා නුඹ අඹ කැවුවා සේ ම මම ද සතුටු කරවා පියමි. තව ද: ශක්‍රදෙවෙන්ද්‍රයාගේ සියක් යොදුන් පරසතුගස කොබළීල අත්තක් සේ සලා ගවු දෙගවු සා මහත ඇති පරසතු මල්වැස්සක් වස්වා මහපිරිස විස්මයපත් කර වමි යි කී සේක. බුදුහු "නොයි ද එ බඳු ආනුභාව ඇතියෙහි ම ය. මා පෑහ පෙළහර තව බැරි ය. නොයි ද සිටැ" යි වදාළ සේක.

ඉක්බිත්තෙන් බුඩශාසන නමැති මහාසරසියෙන් පැනනැගී නීලෝත්පල රූජියක් බඳු වූ සෑඩිමත් ශ්‍රාවිකාවන් කෙරෙහි අග තැන් පත් වූ උපුල්වන් මහා ථෙරිණින් වහන්සේ පන්සියයක් මෙහෙණින්නන් පිරිවරා අවුත් බුදුන් වැඳසිට ඡද්දන්ත නම් හස්ති රාජයා අභිමුඛයෙහි වූ සුභද්‍රා නම් කරෙණරුකාව සේ, කිසි ගයක් නැති ව "සවාමිනි! අප වැනියන් සිටිය දී නුඹ වැනියන් පෙළහර පෑ දුක් ගන්නා කල අප සෑදීමතුන් කෙරෙහි අගපැමිණීමෙහි ප්‍රයෝජන කිම් ද? මේ දසදහසක් සක්වළ රැස් වූ දෙවියන් පමණ සාව මම පෙළහර පවීම්"යි කී දෑ ය. බුදුහු "තී කරණ පෙළහර ත් කියා බලගැ" යි වදාළ සේක. සවාමීනි! මම මේ මහපිරිස බල බලා සිටිය දී ආකාශයට පැන නැගිලා 'මා කරණ පෙළහරක් බලව" යි තුන්ලෝ පුරා සිටි පිරිසට හඩගා කියාලා මාගේ මේ මෙහෙණි වෙස අන්තර්ධාන කොට මේ බිම පුරා සතිස් යොදනෙහි සිටි මනුෂ්‍ය සේනාව සේ ම මම ද සතිස්යොදනෙක සිටි සක්විතිපිරිසක් මවාලා මම සක්විති රජක්හුගේ වෙස් මවාගෙණ ආකාශයෙහි සිට සත් රුවන පිළිවෙළින් නුඹවහන්සේ අභිමුඛයට මෙහෙය මෙහෙයා සත් පූජාවක් කොට අවවනු ම මම මහපිරිස හා සමග ආකාශයෙන් බැස නුඹවහන්සේ මැද වැඳ සිට මහත් වූ සක්විති රාජ නම් පූජාවක් කොට පෙළහර කෙරෙමි" යි කී සේක.

නැවත සෘද්ධිමතුන් කෙරෙහි අග්‍ර වූ මුගලන් මහතෙරුන් වහන්සේ ද පක්ෂියෙක් සගපිරිස් ගෙණ අවුත් බුදුන් වැඳ සිට “ස්වාමීනි! මම පෙළහර කෙරෙමි මා පෙළහර කළ කෙනා තිසාව සියලු දෙව්මිනිස්සු දකිත් ම ය. ස්වාමිදරුවන් වැඩ සිටිනේ යහපතැ” යි ආරාධනා කළසේක. බුදුහු තොප කරණ පෙළහර කිසා බලගැ” යි වදාළ සේක. එ වේලෙහි “ස්වාමීනි! මම එක්ලක්ෂ අටසැට දහසක් යොදුන් මහමෙර අතින් මැඩ උදැල්ලක් සා කොට දත්හස්සෙහි සඟවා ගනිමි. දසදහසක් සක්වළ දසදහසක් මෙරගලුත් එසේ ම හයාගෙණ වෙන වෙන මි දත්හස්සෙහි සඟවා ගනිමි' යි කී සේක. අතික් කුමක් කෙරෙයි ද යි වදාළ සේක. මේ සා මහ පොළොව පෝතාසී කලාලක් සේ හකුළා ඇඟිලි හස්සේ තබා හන් මියි වදාළ සේක. අතික් කුමක් කෙරෙයි ද යි වදාළ සේක. නැවත මේම මහ පොළොව කුඹල්සකස්සේ පෙරළා යට තුබූ අමෘතය සියලු සතුන්ට බෙදා දීලමි යි කී සේක. අතික් කුමක් කෙරෙයි ද යි වදාළ සේක. මේ සක්වළ මහපොළොව සක්වළගල මෙරගල හිමවූ කුළ ගත්කුළපවුවක් හා සමග එක අතෙකින් ඔසවා ගෙණ අතික් සක්වළෙක ලාලමි. ඒ සක්වළ අතික් අතෙකින් ඔසවාගෙණ මේ සක්වළ ලාලමි යි කී සේක.

නැවත කුමක් කෙරෙයි ද යි වදාළ කල “මේ මහපොළොව පරණලා පතක් සේ ඔසවාගෙණ මෙර මත්තෙහි තබාලා මහ මෙර කුඩදණ්ඩක් සේ කොට පක්කුඩයක් ගෙණ සක්මන් කරණ මහණ කෙණකුන්ගේ ලීලා දක්වමි යි කී සේක. එ වේලෙහි ස්වාමිදරුවෝ සිංහසේනාවකයේ ගර්ජනා අසන සිංහරාජයා සේ ශ්‍රාවකයන්ගේ පෙළහර සිංහනාද අසා “මුගලන් මහා සථවිරය! මේ තොප ශ්‍රාවකයන් නිසා බඳනා මල්පුවමෙක් වෙසා වෙයි. මේ තොප බුදුන් කරණ පෙළහර ධුරය අතික් උසුලාලිය හෙන කෙනෙක් නැත. මා ලොවුතුරා බුදු වූ කල් තබා අසහතුක වූ ආජානීය වූ වෘෂභරාජන් ම උපන් කල පවා මා අදිනා ගැල් ඇදලූ කෙණෙක් නැතැයි වදාරණ සේක් :-

යතො යතො ගරුං ධුරං–යතො ගම්භීරවත්තනිං,
තදස්සු කණ්හං යුඤ්ජන්ති–ස්වාස්සුදං වහතෙ ධුරං.
මනුඤ්ඤමෙව භාසෙය්‍ය–නාමනුඤ්ඤං කුදාචන,
මනුඤ්ඤං භාසමානස්ස-ගරුං භාරං උදද්ධරි,
ධනං ච නං අලබ්භෙසි–තෙන චත්තමනො අහු ති,

යන මේ ගාථාද්වයෙන් සකණ්ඨජාතක – නාන්දිවිශාල ජාතක බණ වදරා "මහණෙනි! තොප තොප පොහොසත් වුව ත් නෙපි හැම දෙන සිටුව. බුදුන්ගේ සම්ත්‍රිංශත් බුද්ධකාරක ධර්මයන්ගෙන් අද පසළොස් වන ධර්මය සිද්ධවන දවස ය. අද මා පානා වූ පෙළහර මා සේ ම අනිත් බුදුකෙණකුන් මුත් අන්‍ය සත්ත්වයන්ගට බැරි වූ පෙළහරෙක. අද මහත් වූ ලෝමැහැඩැ මෙයි. බුදුන්ගේ පාරමිතා නමැති මහ කප්රුක අම්‍රඵලයක් දෙන දවසෙහැ" යි වදාරා ගඳ කිළිනිසවත්තෙන් ගන්ධමණ්ඩලමාලයකට බැස ආකාශය බලා වදාළ සේක.

එ කෙණෙහි සක්දෙව්රජ "මාගේ ස්වාමිදරුවන්ගේ පෙළහරට රැස් වූ ජනයන් හැමදෙනා ම ආතපාදියෙන් පීඩා නැති ව සිත් සේ පෙළහර බැලුම් මැනැවැ" යි සිතා දිගින් පුළුලෙන් දොළොස් යොදුන් අවට්හි සතිස් යොදුන් පමණ දිව්‍යමය වූ නිල් පුල් මණ්ඩපයක් මැවී ය. ඒ මණ්ඩපයෙහි සියලු දිව්‍යකර්මාන්ත අහස සඳමඬල පෙණෙන්නා සේ යන්ත්‍රයන්ට විශෙෂයෙන් ම පෙණෙයි. දසදහසක් රන්මෙර රන්පා සේ නැති ඒ මතුයෙහි එක්දහස් දෙසිය තුන්කෙළ පන්සැළිස් ලක්‍ෂයක් යොදුන් දිග ඇති මහ රුවන් සක්මනෙක් මැවී ගිය. එයි දු විශෙෂයෙන් පෙණේ ම ය. එ වේලෙහි මහපිරිස එක පැහැර සාධුකාර දෙමින් ඔල්වරසන් දෙමින්, අසුරුසන් දෙමින් උතුරු සළු ඉස සිසාරමින් "කොල! මේ කිමෙක් ද, මේ කුමන පෙළහරෙක් ද, පෙර මේ මැන්නක් දුටු විරුවෝ කවුරු ද" යි කියමින් අනිකක් බැලුවෝ නැත. අනිකක් සිතුවෝ නැත. අහෝ සාධු අහෝ සාධු යි යන සාධු නාදයෙන් උත්සවයට පටන් ගත්හ.

එ වේලෙහි ස්වාමිදරුවෝ උදයගිරිතලාවට පැනනැගි සරාගිරි මඬල සේ සත්වයන් ඇසිපිය හෙරා නො ලන ඇසිල්ලෙහි රුවන් සක්මනට පැනනැගි සේක. එ වේලෙහි දු අවීචියෙහි පටන් භවාග්‍රය දක්වා ලෝකයූ පුරා සිට සියලු දිව්‍ය මනුෂ්‍ය සේනාව එක පැහැර සාධුකාර දී දොහොත් මුදුන් දුන්හ. එ කෙණෙහි දසදහසක් සක්වළ දසදහසක් ශක්‍රයෝ ද, දසදහසක් විජයතුරා සක් තුම් තබාගෙණ එකවිට ම දසදහසක් ශඞ්ඛධමනි පූජාවට පටන් ගත්හ. දසදහසක් සුයම් රජහු දසදහසක් දිව්‍යචාමර පවනින් බුදුන්ට සුවපහස් දෙමින් එක් පෙළෙක සිටගත්හ. දසදහසක් සන්තුෂිත රජහු හිරමඬුලු සේ දිලියෙන දසදහසක් මිණිතල් වැට ගෙණ එක් පෙළෙක සිටගත්හ. දසදහසක් සුනිර්මිත රජහු රන්තැටපත්

රිදී කැටපත් මිණි කැටපත් පූජා නොයෙක් පෙලහර ගෙණ එක් පෙළෙහි සිටගත්හ. දසදහසක් පරනිර්මිත රජහු රන්කරඬු රිදී කරඬු රුවන් කරඬු ආදි නොයෙක් මඟුල් පෙලහර ගෙණ එක් පෙළෙහි සිටගත්හ දසදහසක් සක්වළ සතළිස් දහසක් වරම් රජදරුවෝ නමින් නමින්ගේ සතළිස් දහසක් දිව්‍ය සේනාව හා සමග නොයෙක් පූජා පෙලහරයෙන් අවුත් පෙළ පෙළ දී සිට ගත්හ. දසදහසක් සක්වළ දසදහසක් සහම්පති මහාබ්‍රහ්මරාජයෝ සඳම්බුලු සේ දසදහසක් සේසත් ගෙණ අවුත් පෙළ පෙළ දී සිට ගත්හ. සෙසු දිව්‍යබ්‍රහ්මරාජයෝ ද දිමිහිල් දීවසුමද ආදීන් බුදුන් පුද පුදා තුන්ලෝ පුරා සිටගත්හ. දෙතිස් මහා පූර්වනිමිත්ත නම් වූ බුදුන්ගේ අද්භූත පූජාවෝ ද බුදු වූ දවස් සේ ම එ කෙණෙහි ම පහළවූහ.

එ කෙණෙහි ස්වාමිදරුවෝ පීත කසිණ සමාපත්තියට සමවැද සියලඟින් රස් කඳු හැර දසදහසක් සක්වළ අවීචිය පටන් භවාග්‍රය දක්වා පහන් ගබඩාවක් සේ ඒකාලෝක කෙරෙමින් "සියලු සත්හු දුන් සිය් සේ මා බලත්ව යි, ඔවුනොවුනු දු විශේෂයෙන් දකිත්ව"යි අධිෂ්ඨාන කළ සේක.

එ කෙණෙහි දෙවියෝ මනුෂ්‍යයන්ට පෙණෙති, මනුෂ්‍යයෝ දෙවියන්ට පෙණෙති, කුරුකුහුඹුවෝ මහබඹුන් දකිති, මහබඹු කුරුකුහුඹුවන් දකිති, බුදුහු සියලු සතුන්ට ම පෙණෙනසේක. සියලු දසදහසක් සක්වළ දශලක්ෂ සතිස්දහසක් නරකවල ගිනි නිවී පියුම් පිපී සිසිල් දියවිල් සේ විය. දසදහසක් සක්වළ සතළිස් දහසක් සමුද්‍රයෙහි සියලු ප්‍රාණීහු ම සිහියෙම් ඇදි මනුන් සේ තණ්පත් වරල්පත් නො සොල්වා වැදහෙම බුදුසිරි බලන්නට පටන් ගත්හ

එ කෙණෙහි ස්වාමිදරුවෝ එක චිත්තක්ෂණයෙහි ම තේජෝ ආපෝ කසිණ සමාපත්තියට සමවන්සේක. එකෙණෙහි නාභියෙන් මත්තෙහි තුන්ලෝ බබුළුවා මහ ගිනිකඳක් පැනනැංග, අධෝකායෙන් ආකාශ ගංගාව නික්මුනා සේ මහා ජලස්කන්ධයෙක් නික්මින. නැවත ගිනිකඳ නැගී පූර්වකායෙන් දියකඳ හෙයි, දියකඳ හුනු අධෝකායෙන් ගිනිකඳෙක් නැගෙයි. උකුළුවල දිසාවෙන් දියකඳෙක් හෙයි, පෙරළී පිට දිසාවෙන් ගිනිකඳෙක් නැගෙයි, ශ්‍රී මුඛයෙන් දියකඳෙක් හෙයි, දකුණැසින් නාඹතල්කඳක් සා ගිනිකඳක් නැගෙයි, වම් ඇසින් නාඹ තල් කඳක් සා දියකඳෙක් හෙයි; නැවත වම්ඇසින් නාඹතල්

කඳක් හා ගිනි කඳෙක් නැගෙයි, දකුණැසින් නාඹතල් කඳක් හා දියකඳෙක් හෙයි. දකුණු කන්සිදුරෙන් නාඹතල් කඳක් හා ගිනි කඳක් නැගෙයි, වම් කන්සිදුරෙන් නාඹතල් කඳක් හා දියකඳෙක් හෙයි, නැවත ගිනි කඳ නැගී තැනින් දියකඳ බස්සී, දියකඳ හුනු තැනින් ගිනිකඳ නැගෙයි. දකුණු දසරැයෙන් නාඹතල් කඳක් හා ගිනිකඳක් නැගෙයි, වම්දසරැවන් නාඹතල් කඳක් හා දියකඳක් හෙයි, ගිනිකඳ නැගී දසරැවෙන් දිය කඳ හෙයි, දියකඳ හුනු අතින් ගිනිකඳ නැගෙයි.

නැවත දකුණු ශ්‍රීහස්තයෙන් නාඹතල් කඳක් හා ගිනිකඳක් නැගෙයි, වම් ශ්‍රී හස්තයෙන් නාඹතල් කඳක් හා දියකඳෙක් හෙයි, ගිනිකඳ නැගි අතින් දියකඳ හෙයි, දියකඳ හුනු අතින් ගිනිකඳ නැගෙයි. නැවත දකුණු ශ්‍රී පාදයෙන් නාඹතල් කඳක් හා ගිනි කඳෙක් නැගෙයි, වම් ශ්‍රී පාදයෙන් නාඹතල් කඳක් හා දියකඳ හෙයි, නැවත ගිනිකඳ නැගි පයින් දියකඳ හෙයි, දියකඳ හුනු පයින් ගිනිකඳ නැගෙයි. නැවත එකි එකි ඇඟිලි අගින් නාඹතල්කඳ හා ගිනිකඳ නැගෙයි, නැවත එ ම ඇඟිලි අගින් නාඹතල්කඳ හා දියකඳ බස්සී. ඇඟිලි අසු අස්සෙකු දු මෙසේ වෙන ම නාඹතල්කඳ හා ගිනිකඳ නැගෙයි. නාඹතල්කඳ හා දියකඳ බස්සී. නවානූදහසක් ලොම්කූපයෙන් නවානූදහසක් ගිනිකඳ නැගෙයි නවානූ දහසක් දියකඳ බස්සී. නැවත හසුහස්සෙකු දු එසේ එසේ ම ගිනිකඳ නැගෙයි. දියකඳ බස්සී. මෙසේ නැගෙන්නා වූ ගිනිකඳ දියකඳ සසුහස්සෙන් සවණක් බුදුරැස් නික්ම ඉන් ඒ වළඳිමින් ඉන් ඊ රැලි දෙවමින් සරනැමෙමින් මුළු සක්වළ මැඩ භව අග දක්වා නැගෙයි. ගිනිකඳ දියකඳ භවඅග ගැසී ගැසී නැවත අවුත් සක්වළ ගල් මුඹිව ගැසී පරසක්වළ මැඩගෙණ දීවෙයි. මෙසේ ම පැන නැගී සවණක් රසුදු භවඅග ගැසී ගැසී නැවත බැස සක්වළ ගල් මුවවිට හී මුළු සක්වළ පුරාගෙණ ශතාත්‍රකලින් ඔබනා සවණ්රසඹාරා සේ මුළු සක්වළ පුරා උතුරුවා දිවන්නේ ය. මෙසේ සත් රුවන් ගොණුැස් උරවාලූ රුවන් කැණීමඩුල්ලක් සේ මුළු සක්වළ සෙබවූයේ ය.

වෙන වෙන ම නීලපීතාදී සම්වනට සම්වදනා සේ ය. එක ක්ෂණයෙහි සමවත් දෙකකට සමවැදීමෙක් අවශෙෂ වූ සැඩිවනා සත්ට අවිෂය මි ය. බුදුන්ගේ වනාහි බොහෝදවසක් වශීභූත කොට ඇා හෙයින් භවාඞ්ගවිත්සාය ඉනා සියුම් වන හෙයින් බුදුනු සමවත් දෙකක් සමවදිනා සේ ය. ක්ෂණ ක්ෂණයෙහි නොයෙක්

සමවත් සමවදිනා සේක. එසේ හෙයින් මේ පෙළහර යමක යමක ව සමාපත්ති සමවැදීමෙන් බුදුන්ට ම ප්‍රතිනියත වූ යමා මහ පෙළහර නම් වී ය. තුඩ නො හැර බණ ත් වදාරණ සේක. වදාරණ බණ තුන්ලෝ පුරා සිටි ඒ සා දිව්‍ය මනුෂ්‍ය සේනාවෙහි එකක් එකක්හුගේ සොළොස් සොළොස් ආකාරයක් බැගින් වෙන වෙන ම සිත් පරීක්‍ෂා කොට වදාරණ සේක.

මෙසේ ස්වාමීන්වහන්සේගේ එක බුදුමකිමයට ම තුන්ලොව හෙළි කෙරෙමින්, පෙළහර පාමින් සිට එක ඇතකු තැංගා වූ තැවතට ඇතුන් දෙන්නකු නැගුවා සේ අනික් බුදුකෙණකුන් මවා වදාළ සේක. දෙදෙනා වහන්සේ ම එක්වැනි වූ රූ ඇති සේක. එක්වැනි වූ කටහඬ ඇති සේක. එක්වැනි වූ පෙළහර ඇති සේක. එක් බුදුකෙණකුන් සක්මන් කරණ කල එක් බුදුකෙණෙක් හිඳිනා සේක් හෝ ය සිටිනා සේක් හෝ ය. එක් බුදුකෙණකුන් විචාළ පැන එක් බුදුකෙණෙක් විසඳන සේක. එක් බුදුකෙණකුන් විසඳු පැනයට එක් බුදුකෙණෙක් සාධුකාර දෙන සේක. මෙසේ ලොවට අද්භූත වූ යමා මහ පෙළහර දක්වා වදාරා දහම්වැසි වැස්වූ සම යෙහි විසිකෝටියක් සත්ත්වයෝ අමාමහ නිවන් දැක සංසාරසාගර යෙන් ගොඩනැගී නිවන් පුර මැද පිණා ගියහ.

මෙසේ මාගේ ස්වාමිදරු වූ බුදුරජාණෝ මේ එක යමා මහ පෙළහර පූජාවෙහි ම මා විසින් දක්වන ලද්දා වූ චන්දනපාත්‍ර ප්‍රාති හාර්‍යයෙහි ලදුමාවූ නොයෙක් පෙළහර පූජා ය, එම පිණ්ඩෝල භාරද්වාජ මහතෙරුන්ගෙන් ලද සම්‍යක් ප්‍රතිපත්ති පූජා ය, රජ ගහා නුවර සිට සැවැත් නුවරට වඩනා දතුරෙහි සාරමසක් මුළුල් ලෙහි දවසින් දවස ලදුමාවූ සියලු සත්ත්වයන් විසින් කරණලද එක්සිය විස්සක් පමණ දවස් පූජා ය, කොසොල් රජහු සත් දව සක් මුළුල්ලෙහි දවසින් දවස කළා වූ ධර්මාභිරම්භකල්‍ය පූජා ය. ගණ්ඩම්බ නම් උද්‍යානපාලයා තමාගේ බල පරිද්දෙන් කළ අඹඵල දන පූජා ය, අඹරුක පොළොව පළා පැන නැගි වේලෙහි ලදුවා වූ අද්භූත වූ මඟුල් පූජා ය, පෙළහර කරණ වේලෙහි සාධීමත් වූ ශ්‍රාවක ශ්‍රාවිකාවන් සඳහනාගෙන් ලද අසාධාරණ වූ සිංහනාද ප්‍රාති හාර්‍ය ප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත වූ අෂ්ටාදශ ප්‍රතිපත්ති පූජා ය, සක් දෙව් රජහුගෙන් ලද දිව්‍යමණ්ඩප පූජා ය, දෙතිස් පූර්වනිමිත්ත පූජ ය, දසදහසක් සක්වළ අනුදහසක් දිව්‍යරාජයන් කළ අනුදහ සක් දිව්‍යරාජ පූජා ය, දසදහසක් සක්වළ අරූතල අසංඥතලයන් හැර එක්ලක්‍ෂ ෂණස් දහසක් බ්‍රහ්මරාජයන් කළ එම් තෙක් බ්‍රහ්ම

රාජ පූජා ය යි දෙලක්‍ෂ සතළිස් දහස් එක්සිය දෙයාසූවක් පමණ මහාපූජාවන් ලත් හෙයිනු ත් සඞ්ඛ්‍යාපථයට අවිෂය වූ අප්‍රමාණ වූ පූජාවන් ලත් හෙයිනු ත්, එසේ වූ පූජා විඳිමට සුදුසු හෙයිනු ත්, මේ මේ කාරණයෙනු දු අර්හත් නම් වන සේක. එහෙයින් කියන ලදී:

පූජාවිසෙසං සහපච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං-යි.

මේ පූජාවලියෙහි අප බුදුන් ගණ්ඩම්බ නම් රුක්මුලදී ලද
සමස්ත ප්‍රාතිහාර්‍ය්‍ය පූජා කථා නම් වූ
තෙවිසි වන පරිච්ඡේදය නිමි.

සූවිසි වන පරිච්ඡේදය

තව ද: අප බුදුන් තවුතිසා භවනයෙහි දී ශක්‍රදෙව් රජහුගෙන් ලද පාණ්ඩුකම්බලාසන පූජා නම් කවරී යත්;

මෙසේ මාගේ ස්වාමිදරුවෝ සමත්වහන්සේගේ ප්‍රථම බෝධියෙහි පටන් බුදු වූ සත් වන අවුරුද්දෙන් ඇසළ මැදි පොහෝ ලද උත්‍රසල නකතින් තිවන ඔථනය කොට රුවන් සක්මන දී අනන්තාපරියන්ත වූ බුදුන්ගේ වංශානුගත වූ ක්‍රමයෙන් යමා මහ පෙළහර දක්වා "පූර්වබුදුවරයෝ මේ පෙළහර දක්වාලා කුමක් කළෝ දෝ හෝ"යි බලා වදාරා "මෙසින් හොස් ශක්‍රයාගේ පාණ්ඩුකම්බලාසන ය පිළිගෙණ එහි ම වස් වසා විජම් දෙසුවාහු ය"යි සොළොස් වන බුඩකාරක ධර්මයන් දැන "මම ද ඒ ධර්ම ය නොවරදවා ම කෙරෙමි"යි සිතා දෙව්ලෝ නැගෙම් යි තවුතිසා භවනය බලා දක්ෂිණ ශ්‍රී පාදය එළිපත මුදුනට පයක් තබන්නා වූ පුරුෂයකු ආයාසයක් නැති ව ස්වල්පයක් පය ඔසවන්නා සේ මූටසීරහත ප්‍රමාණයක් ශ්‍රීපාදය ඔසවා වදාළ සේක.

එ කෙණෙහි ස්වාමිදරුවන් පූර්වබුදුවරයන් දක්ත නො එක් වාර යෙහි දන් දුන්නාවූ, ශයනාසන උපාහනාදි වූ නො එක් පින්බල යෙන් සුවාසූදහසක් යොදුන් උස ඇති යුගන්ධර පර්වතය හුයාපු වෙළෙග් බඩයක් සේ, සක්විතිරජකු දුටු චණ්ඩාලයකු සේ, නැමි නැමී

අවුදින් සවාමිදරුවන්ගේ ඒ ශ්‍රී පාදය මුදුන් මල්කඩක් සේ තමා මුදුනෙහි පිළිගන්න. දෙවනු ව වාම ශ්‍රීපාදය ද එසේ ම මුටසිරතන යක් තැන් ඔසවා වදාළ සේක එ කෙණෙහි එක්ලක්ෂ අටසැට දහසක් යොදුන් උස ඇති මේරු පර්වත රාජයා ද එසේ ම ආදර යෙන් නැමී ඒ ශ්‍රීපාදය ද පිළිගන්න. මෙසේ මිනිස්ලොව පියවරෙක, යුගන්ධර මුදුනෙහි පියවරෙක, මේරු මුදුනෙහි පියවරෙකැ යි ශක්‍ර භවන යට තුන් පියවරෙකින් වැඩි සේක.

මාගේ සවාමිදරුවන් සංසාරයෙහි ඇවිදිනා කල පවා අලීන චිත්ත ජාතකයෙහි මවු කුසින් බිහි වූ දවස් ඔබ දුටු මඞ්ගල හස්ති රාජයන් පවා ආදරයෙන් නැමී තමන්ගේ කුම්භස්ථලයෙන් ඔබ පිළිගත්තා කල. පදුම ජාතකයෙහි දෙව්දත්හු ඔබ ගල්මුදුනෙන් දැමූ දවස් පවා සිරිස්පද වූ ආකාශයෙහි දෙවියන් අවුත් නැමී නැමී තමන් උරමඬලෙහි ඔබ පිළිගත්තා කල. එ ම ජාතියෙහි විෂ ඝෝර දිව්‍යනාගරාජයන් පවා තමන්ගේ එණගබින් ආදර යෙන් ඔබ පිළිගත්තා කල මණිචෝර ජාතකයෙහි ඔබව වධ පැමිණි කාලයෙහි ඒ වධ අනතර්ධාන කොට ශක්‍රදේවේන්ද්‍රයන් පිළිගෙණ මඟුලැතුන් පිටට වඩා රාජ්‍යශ්‍රියට පමුණුවාලන කල. සස ජාතකයෙහි ඇඟ මස් දෙමි යි ගිනි මැදට පිනූ කල පවා ඔබව ගිනි සුව පහස් දෙවා පියුම් පැනනැගී ඔබගේ පාදයන් පිළිගන්නා කල. එයින් සක් දෙව්රජුන් දිව්‍යහස්තයෙන් ඔබ පිළිගන්නා කල. ශඞ්ඛ ජාතකයෙහි ඔබ මුහුදු පීනා විඩා ව පිහිටක් සිතා ආකාශය බැලූ කල දෙව්දූන් අවුත් තමන් උරමඬලෙන් පිළිගෙණ ඔබ දිව්‍යනෞකාවට වඩා පිහිට කරණ කල. කට්ඨහාරි ජාතකයෙහි ඔබ ලද කිළිඳි කල පවා ආකාශයෙහි වැඩහුන් දවස් ඇමැතියන් ඔවුනොවුන් පරයා "අපි පිළිගණුම්හ. අපි පිළිගණුම්හ"යි ඔබ කරා අත් දිගුකරණ කල ඒ පෙළහර දුටු බරණැස් රජ ඔබ තමන් ඇකයෙන් ආදරයෙන් පිළිගත්තා කල.

තව ද: චුල්ලපදුම ජාතකයෙහි සත්‍රියක ව ඔබ ගලින් හෙළූ දවස් පවා හොරුදඹු සා ගොයින් දිව අවුත් පිට දී පා පිළි ඔවුන් ගන්නා කල. ඛදිරඞ්ගාර ජාතකයෙහි මර දෙව්පුතු මැවූ නරක ප්‍රපාතයට ඔබ පා දිගුකළ දවස් මහ ගැල්සක් සා පියුම් නැගී පියුම් කෙමියෙන් එ ශ්‍රී පාදයන් පිළිගෙණ සුවපහස් දෙන කල. ගුත්තිල ජාතක, සාධින ජාතක, නිමි ජාතකයෙහි දෙව්ලොව නැගෙමි යි සිතා ඔබ දක්ෂිණ ශ්‍රී පාදයන් එසවූ කල මාතලි නම් දිව්‍යරථාචාරීන් දිව අවුත් ගෙලසියක් යොදුන් වෛජයන්ත රථ සැ,

ඔබ පාදයන් පිළිගන්නා කල. දූන් සමතිස් පැරුම් පුරා නිමවා ලොවුතුරු බුදු වූ සමයෙහි තමන් වහන්සේ මවුකුස පිළිසිඳ ගත් වේලෙහි, මවුකුසින් බිහි වූ වේලෙහි, මහබිනික්මන් කළ වේලෙහි, ලොව්තුරා බුදු වූ වේලෙහි, ධම්සක් දෙසූ වේලෙහි, කිඹුල්වත දී යමා මහ පෙළහර පෑ වේලෙහි, ගණ්ඩම්බ නම් මාසඹමූලයෙහි දී යමක ප්‍රාතිහාර්‍ය්‍ය පෑ වේලෙහි, යනාදි වූ ඒ ඒ තොප එක් බුදුමඟුලෙහි නළුවන් සේ නටා අත්බඹරක් සේ භ්‍රමණය කළා වූ යුගන්ධර පර්වත මෙරු පර්වත නැමි නැමී අවුදින් ඔබ ශ්‍රීපාදයන් පිළිගත් නියාව ත් තුන් පියවරෙකින් දෙව්ලෝ පැන නැඟි බුද්ධමහිමය ත් මා සිතට කවර මහිමයෙකැ යි කවර විස්මයෙකැ යි කියම් ද, එසේ හෙයින් ඔබ සංසාරයෙහි කළ මහිම මහිම ය යි. සිතමි. එසේ ද වුව ත් මාගේ ස්වාමිදරුවන්ගේ ඒ බුදු මහිම දකුම් ආසමින් විශෙෂ යෙන් බල බලා හැම වේලෙහි ම මා වාසය කරණ හෙයින් මට ද ඉතා ආශ්චර්‍ය්‍ය ම ය. සියලු සතුන්ට ද විස්මය ම ය පෙළහර ම ය. ඒ සන්තොෂයෙන් ජනිත වූ කුශලයෙන් මට ද එ බඳු වූ පෙළහරෙක් මට වාසනා ම වේවා යි, ඒ ඇසූ සත්පුරුෂයෝ ද අමාමහ නිවන් දක්නා සංසාරසාගරයෙන් ගොඩ නැඟෙත්ව යි, ගැලවෙත්වයි, අපාය නො වදනත්ව යි, දෙව්ලොව ම වදනත්ව යි–

මෙසේ මාගේ ස්වාමිදරුවන් එ දා දෙව්ලොව තුන්පියවරින් වැඩි කල්හි සක්දෙව්රජ සිතනුයේ "මාගේ බුදුහු තමාගේ පුරයට වැඩිසේක. මා උදෙසා වස් වසන අභිප්‍රාය ඇති සේක් වනැ"යි බුදුන්ට මාගේ ශක්‍රපුරයෙන් කොතෙනෙක් පරීක්ෂා කරණුයේ තමා ඒකපුණ්ඩරීක නම් උයන් මැද පිඹිරි සියක් යොදුන් පරසතු මඳරු ගස මුල සැටයොදුන් පාණ්ඩුකම්බල නම් ශෛලාසනය උතුම් සේ දැක, තව ද: "මේ අස්න ඉතා මහත, බුදුහු කුඩා සේක. බුදුන්ට හොබී දෝ හෝ නො හොබී දෝ හෝ"යි සිත සිතා එසේ ද වුව ත් ඊට වඩා අතික් උතුම් වූ ආසනයක් නැති හෙයින් 'මා විසින් බුදුන්ට මාගේ උත්තම වූ ආසනය ම පිළිගන්වමි. බුදුන්ට ඒ ම සුදුසු ය"යි සිතා දෙ දෙව්ලොව දිව්‍ය සෙනාව ගෙණ බුදුන් පෙරමඟට නොයෙක් දිව්‍ය පූජා භාණ්ඩ ගෙණ ගොස් මහත් වූ පූජා පෙළහරින්, මහත් වූ උත්සවයෙන්, බුදුන් වඩා ගෙණ ගොස් පාණ්ඩුකම්බලාසනය පිළිගැන්වී ය. එ කෙණෙහි ස්වාමිදරුවෝ දෙලොස් රියන් බුද්ධ කායෙන් ආසනය මුල වැඩහිඳි සේක්

සක්දෙව්රජු හා ඒ සා මහත් දිව්‍යසේනාව හෙළු ඇසිපිය නගා නො ලහ ඇසිල්ලෙහි පසළොස් යොදුන් උස ආසනය මුදුනෙහි අහස්කුස නැඟූ යන්ත්‍රපෘතක් සේ පෙණී වදාළ සේක. එවේලෙහි සිසාරා සිටි දිව්‍යසේනාව කර නගා බුදුන් බල බලා සාධුකාර දුන්හ.

එ ඇවිලෙහි ස්වාමිදරුවෝ සක්දෙව් රජහු සිතූ සිත දැන "මේ ශක්‍රයා තමාගේ අස්න මහතැ යි සිතී ය. මා කුඩා ය යි සිතී ය. බුදුන්ගේ ආනුභාව මෙතෙම පළමුකොට දක්වාලමි"යි සිතාලා තමන් වහන්සේගේ සුගත් වියතින් දිග නවවියත් පුළුල සවියත් තමන් වහන්සේගේ සඟළසිවුර විදා දිව්‍යසේනාව බල බලා සිටියදී ම සතර පටින් පත් නොකොට; දිග දෙසිය සතළිස් ගවු, පුළුල දෙසිය යක් ගවු, උස සැට ගවු, මටින් අටසිය අසූගව්වක් පමණ ඇති ඒ සා මහත් වූ ආසනයෙහි හෙලා ලූ සේක එ කෙණෙහි මහ තෙලි සමිත් කුඩා පුටුවක් වසා ලූවා සේ ආසනය සඟළ සිවුර සතර පටින් වැසී ගියේ. දෙවියන්ට ආසනයෙන් කිසිවකුත් නො පෙණෙයි. බැලූ බැලූ අත ම සඟළ සිවුර ම පෙණෙයි. එ වේලෙහි ස්වාමිදරුවෝ පලග් බැඳ ඒ ආසනයෙහි වැඩඋන් සේක. බුදුන්ට ආසන ය නොබෑනේ ය. ආසනයට බුදුහු ම නොබෑනා සේක. බුදුන් දැක ආසන ය කුඩා වූයේත් නැත. ආසන ය දැක බුදුන් මහත් වූයේත් නැත. මෙසේ අචින්ත්‍ය වූ බුද්ධවිෂයයෙන් බුදුහු ඒ පාණ්ඩු කම්බලාසනයෙහි විරාජමාන ම මුළු සක්වල නැඟූ දිවපහනක් සේ දිලිහි දිලිහී සියලු දෙවියන්ට ම පෙණෙන සේක. මේ සක්වල ම නො වෙයි. දස දහසක් සක්වල ම සිටි දෙවියන්ට ම පෙණෙන සේක. එ කෙණෙහි මේ සා දසදහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මසේනාව ව ස්වාමිදරුවෝ ම දිලියෙන සේක. කීමයේ මැනෝ:

තාවතිංසෙ යදා බුද්ධො – සිලායං පණ්ඩුකම්බලෙ,
පාරිච්ඡත්තකමූලම්හි – විහාසි පුරිසුත්තමො.

දසසු ලොකධාතූසු – සන්නිපතිත්වාන දෙවතා,
පයිරුපාසන්ති සම්බුද්ධං – වසන්තං නගමුද්ධනි.

න කොචි දෙවො වණ්ණෙන – සම්බුද්ධස්ස විරොචති,
සබ්බෙ දෙවෙ අධිගය්හන – සම්බුද්ධොව විරොචති-ති.

එ කල සර්වඥයන් වහන්සේ රුවන් සක්මනින් අනතර්ධාන ව දෙව්ලෝ වැඩි කල බුදුන් නුදුටුවාවූ සතිස් යොදනෙක සිටි මහ පිරිසට හිර ගල හුනු කලක් සේ, සඳ ගල හුනු කලක් සේ, ලෝකාන්ධකාර වී ය. එ කල සත්ත්වයෝ:

ගතොනු චිත්තකූටං වා – කෙලාසං වා යුගන්ධරං,
න තො දක්ඛෙම සම්බුද්ධං – ලොකජෙට්ඨං නරුසභං.

පවිවෙකරතො ධීරො – නයිමං ලොකං පුනෙහිති,
න තො දක්ඛෙම සම්බුද්ධං – ලොකජෙට්ඨං නරුසභං–යි.

යනාදි ගාථා කිය කියා "අප බුදුහු චිත්‍රකූට පර්වතට ගියෝ දෝ හෝ, කෛලාසකූට පර්වතයට ගියෝ දෝ හෝ, යුගන්ධරාම්බුද්‍රනට ගියෝ දෝ හෝ, බුදුහු නම් විවේක වාසය කැමැත්තෝය. මම් සා මහ පිරිසක් මැදයෙහි මෙ බඳු වූ පෙළහරක් මා විසින් කරණ ලදැ යි උපන් ලජ්ජා ඇති ව අතික් දිවයිනකට ගොස් සැඟැවී ගියෝ දෝ හෝ, අප බුදුන් කවර දවසෙක දක්නමෝ දෝ හෝ"යි මහත් වූ විලාපයෙන් හඬාගෙණ මුගලන් මහතෙරුන් වහන්සේ කරා ගොස් "ස්වාමිනි! අප බුදුහු කොයිද්ද"යි විචාළහ. ඔබ තමන් වහන්සේට විශෙෂයෙන් දන්නෙහු දු නො කියා අනුරුද්ධ මහතෙරුන් වහන්සේගේ ගුණ ප්‍රසිද්ධ කෙරෙමි යි සිතා අනුරුද්ධ මහා ස්ථවිරයන් අතින් විචාරව"යි වදාළ සේක. එ කල මහපිරිස ගොස් අනුරුද්ධ මහතෙරුන් වහන්සේ අතින් විචාළහ. ඔබ වදාරණ සේක් "උපාසක වරිනි! බුදුහු තව්තිසා භවනයෙහි වස් වැස දෙවියන්ට විජම් දෙසන්ට වැඩි සේක. තුන් මසක් දෙව්ලොව වැස එජමස මැදි පොහෝ ලද මහා පවාරණ දිනයෙහි මිනිස් ලොවට වඩනාසේකැ'යි වදාළ සේක. එ බස් අසා මහපිරිස "අප බුදුන් දුටු දවසෙක මුත් නො යම්හ"යි එම සතිස් යොදුන් තිම් අතුරු නො දී කඳවුරු බැඳ උන්හ. එතැන් පටන් සත්ත්වයන්ට ආකාශය ම ගෙය වී ය.

එ කල චූළ අනේපිඩු සිටාණෝ "සත්ත්වයෙනි! මාගේ බුදුන් දක්නා තෙක් කිසි උකටලියක් නො වව. බත් බුලත් වස්ත්‍රාභරණ භෝජන හිඳිනා ද නො සොයා මේ සියල්ලම මාගෙන් ගණුව" යි පිරිස් කඳවුරු මැද බෙර ලවා එ කෙක් සත්ත්වයන්ට එ තුන්මස මුළුල්ලෙහි සියලු බත් බුලත් වස්ත්‍රාභරණ මල් සුවඳ නහන බොන පැන් ගිනි දර දක්වා තමන්ගෙන් ම සපයා දුන්හ. ඔවුන් අමිත භොගී සිටාන කෙණකුන් නො ව ත්, කෙසේ සපයා දුන්නු ද? යත්; බුදුන්–රහතුන්–දෙවියන්ගේ ආනුභාවයෙන් ම දුන්නැයි දත යුතු.

දවසෙක මහපිරිසට සියලු උපකරණ සම්භාර දුන් කල්හි සිටාණන්ගේ භාණ්ඩාගාර කෙවල් පිසදැමා සේ හිස් වෙයි. එ කල බුදුන්ගේ ආනුභාවයෙන් රාත්‍රිය මුළුල්ලෙහි දෙවියෝ දීව අවුදින් ඒ සියලු

භාණ්ඩාර ගෙවල් බලල්වා උතුරුවා සියලු සම්පත්තියෙන් පුර පුරලා යෙති. සත්ත්වයෝ සිවාතත්ගෙන් ම දෙන ලද සම්පතැ යි සිත සිතා, සිටාකන් හා ලියන්නෝ දකිති. එහි අතුර සෙසු කෙනෙක් නො දන්නාහු ය.

එ තුන්මස මුළුල්ලෙහි මුගලන් මහතෙරුන් වහන්සේ මහ පිරිසට බණ ත් මඳුල සේක සත්ත්වයන් විචාළ ප්‍රශ්න ත් වදාරා හැම දෙනාවම උකමලියක් වැද්ද තුදුන්සේක ඒ සා මහ පිරිස හුන් තෙන වෙච්චයි මල ගන්ධයෙක් මූත්‍ර ගන්ධයෙක් වේවයි නොවිය. උතුරුකුරුදිව සත්ත්වයන්ට සේ ම සියලු කුණප ම මහ පොළො වට ම අන්තර්ධාන වෙයි. දෙවියෝ ගඳ මහත් පවිටෙන් සුවඳ මඳ පවන් මෙහෙයා මහපිරිස සුවඳ පිඩක් සේ කොට හැම වේලෙහි ම සන්තර්පණ කරවති ඒ තුන්මස මුළුල්ලෙහි ඒ සා මහ පිරිසින් ඔවුනොවුන් කෙරෙහි ආක්‍රෝශ පරිභවයෙක් වේව යි, ඔවුනොවුන්ට අමනාප වචනයෙක් වේව යි, ඔවුනොවුන්ට අමෛත්‍රීන් බැල්මෙක් බැලූ කෙනෙක් වේම යි නැත. හැම දෙන ම ඔවුනොවුන් කෙරෙහි දරුවන් දෙමවුපියන් කල්‍යාණ මිත්‍රයන් සේ මෛත්‍රී ම කළහ. ඒ තුන් මස මුළුල්ලෙහි සියලු සත්ත්වයන්ට ම කාමවිතර්කාදි පාප චෙතනාවෙකු දූ තමා ම නො විය. මේ සියල්ලම ඉද්ධ්‍යනුභාවයෙන් ම වී ය යි දතයුතු.

ඉක්බිත්තෙන් බුදුරජාණන් වහන්සේ තුන්ලොවට නැගු මහා ප්‍රදීපයක් සේ දිලිහි දිලිහී පාණ්ඩුකම්බලාසනයට නැගී සව් සිරි ක්‍රමයෙන් සඹම ලීලාවෙන් වැඩහුන් කල්හි – පෙර මිනිස්ලොව දී සිල්වත් තෙරණකුන් වහන්සේට එක බත් සැන්දක් පමණ පිළිගන්වාලූ ඉන්දක නම් දුගියෙක් එ පිණින් මිය ශක්‍රපුරයෙහි මහෙශාක්‍ය ඉන්දක නම් දිව්‍යරාජයෙක් ව ඉපැද තමා ඇඟින් නිකුත් රසින් සියලු දෙවියන් අභිභවනය කොට වෙසෙසි. තවද මිනිස්ලොව දී දෙළොස් යොදනක් මාතායෙහි කැටිත් කැව ගන්වා ලිප් බඳවා දස දහසක් හවුරුදු මුළුල්ලෙහි මුළු දඹදිව යාචකයන්ට අබුද්ධොත්පාදයෙහි මහදන් දුන්නාවූ අංකුර නම් රජෙක් ඒ පිණින් මහෙශාක්‍ය දිව්‍යරාජයෙක් ව නො එක් ශතසහස්‍ර දිව්‍යඑවින් පිරිවරා උපන. මෙකී අංකුර නම් දිව්‍යපුත්‍රයා හා ඉන්දක නම් දිව්‍යරාජයා හා දෙදෙන ඔවුනොවුන් හා මන්ත්‍රණය කරන්නාවූ “අද බුදුහු පාණ්ඩුකම්බලාසනයෙහි වැඩහිඳ විජම් බණ වදාරණසේක. එ විජම් නම් ඉතා දුකී දෙයෙක් ල. බුදුන් ලඟ හිඳ අපි දෙදෙන සිත්හෙළා බණ

අසම්භ, ඇසිල්ලෙකින් බොහෝ දෙවියෝ රැස්වෙති, එ කල අපට අවසර නො ලැබෙයි. අපි දෙදෙන පළමු ව ගොස් බුදුන්ලඟ හිඳුම්හ යි මන්ත්‍රණය කොට දෙදෙන අත්වැල් බැඳ ගොස් ඉන්දක නම් දිව්‍ය රාජයා බුදුන් දකුණු දනමඬලට තුදුරුව හිඳ ගත. අංකුර නම් දිව්‍යරාජයා වම් දනම්ඬලට නුදුරුව හිඳගත.

එ කල බුදුන් ශක්‍රපුරයට විජම් දෙශනාමම මැඕ බැව් අසා මාතා නම් පුරුෂ දිව්‍යරාජන් ව තුෂිත භවනයෙහි උපන් මෑනියන් වහන්සේ ‘ම පුතනුවන් වහන්සේගේ දහම් අමා මා සිත් සේ උකා බොන දවසෙක. මේ කප් ලක්‍ෂය මුළුල්ලෙහි නො එක් ජාති කෝටියෙහි මා ඔබට කළාවූ දරු ප්‍රේමයෙහි පල විඳගන්නාවූ දවසෙක. මහෞෂධ පණ්ඩිත ව පවා උපන් කොණෙහි මට දිව්‍ය වූ ඖෂධයකින් සංග්‍රහ කළ සේක. වෙසතුරු ව්ජකල මා කුසින් උපන් විගස ම සන්තොෂයෙන් දෑස් දල්වා මා මුහුණ බලා “අම්ම! දන් දෙන වස්තුවක් මා අත තබව” යි මධුර වූ කෙසුල් කියා මා සිත් සැනසූ සේක. මේ ජාතියෙහි ලුම්බිනී වනයෙහි දී මා කුසින් බිහි වලා වැඩ සත් පියවරක් තබා ගොස් මහත් වූ ජය සිංහනාද කොට මාගේ කන්හි අමාමතුර නැමූ සේක.

කෙසු ජාතිවල මට කළාවූ සුරතල් මෙපමණෑ යි පමණ නැත. දූන් ලොව්තුරා බුදු ව තුන්ලෝ මුදුන් වූ සමයෙහි මට මිහිරි වූ නිවන් අමා දෙන සේක. එහි රස බලම්හයි, සිරිබර පුතුන් වැදූ මෑනියන්ගේ සිරිකර තම් පවිහි’ යි සිත සිතා තුන්ගවු උස දිව්‍ය ශරීරයෙකින් හා ගව්වක් උස මිණි ඔටුන්නකින් හා සැට ගැලක් පමණ දිව්‍යාභරණයෙන් හා සවලඞකාත ව යහලක් සුවඳවිලවුන් ධරා ලක්‍ෂ කෝටි ගණන් දිව්‍යාළුවන් පිරිස් පිරිවරා තුසී පුරෙන් බැස සියලු දෙවියන්ගේ ශරීරප්‍රභා නිෂ්ප්‍රභා කෙරෙමින්, පුතනු වන් වහන්සේගේ ශරීරප්‍රභාවෙන් හා තමන් වහන්සේගේ ශරීර ප්‍රභාවෙන් හා හිරු සඳු දෙදෙනාගේ රශ් එකකො‘සට ගියා සේ ඒකාලෝක කෙරෙමින් අවුත් සියලු දිව්‍ය සේනාවට පළමු කොට පුතනුවන් වහන්සේගේ දක්ෂිණභාගයෙහි දෙනොත් මුදුන් දී හිඳගත් සේක.

එ කෙණෙහි දසදහසක් සක්වළ සතළිස් දහසක් වරම් රජ දරුවෝ ය, දසදහසක් ශක්‍රයෝ ය, දසදහසක් සුයාම රජහු ය, දස දහසක් සන්තුෂිත රජහු ය, දසදහසක් සුනිර්මිත රජහු ය, දස දහසක් පරනිර්මිත රජහු ය, එක් ලක්‍ෂ පණස් දහසක් මහාබ්‍රහ්ම රජහු යයි යනාදි සියලු දිව්‍යරාජසේනාව ම ඔවුනොවුන් පරයා දිව

අවුදින් වන්හ. මෙසේ ආනුභාව සම්පන්න දෙවියන් එ ත් එ ත් අල්පේශාක්‍ය දෙවියෝ පසු බැස බැස ගොස් සමහරු සක්වළගල් මුදුනේ ගැහැටි ගැහැටී සිටිති. සමහරු යුගන්ධරාදි සත් කුලපර්වත් තරා පසු බැස එහි දු ගැහැටි ගැහැටි සිටිති. සමහර බලවත් දෙවියෝ පසු බැස බැස ලක්‍ෂයක් දහසක් සියයක් යොදුන් තෙන ගැහැටි ගැහැටී සිටිති.

යම් කී දෙළොස් යොදනෙක ලිප් බඳවා අබුද්ධොත්පාදයෙහි තො සිල්වත් නොතකම දන් දුන් අංකුර නම් දිව්‍යරාජයා තමන්ගේ අබුද්ධොත්පාදයෙහි පින් කළ අඩුවක් මිස, බොහෝ දනපරිත්‍යාග කළ මහ පින් බලයෙන් බුදුන් වම් දණමඬල සමීපයෙක් පසු බස්නේ බොහෝ තෙනක් නො ගොස් දෙළොස් යොදනක් පමණ තැන් පසුබැස හුන්නේ ය.

යට කී සිල්වත් කෙනෙකුන් වහන්සේට එක බත් කෙනෙස්සක් පමණ දන් දුන් ඉන්දක නම් දිව්‍යරාජයා තමා කළ පින් මාහැඟි හෙයින්, තමා මහත් වූ අනුභාව ඇති හෙයින් අගලක් පමණ තෙනු ත් නො සෙල්වී ම බුදුන් දකුණු දණමඬල සමීපයෙහි ම සිනා සිසී කිසි භයක් නැති ව හුන්නේ ය.

බුදුහු ඒ දිව්‍යරාජයන් දෙදෙනාගේ කුශල විභාග ය පළමු කොට මේ දිව්‍යසේනාවට හඟවා සත්ත්වයන් දනයෙහි පළමු කොට පිහිටුවමා පසුව ධර්ම දෙසම් යි සිතාලා දොළොස් යොදනෙක ගොස් හුන් අංකුර නම් දිව්‍යරාජයාට අංකුරය යි මහත් කොට හඬ ගා වදාළ සේක. ඒ ශබ්දය සක්වළගල් පරියන්ත ව බඹලොව ගසා සිටි සියලු දිව්‍යසේනාවට ම ඇසිනි. දෙවියන්ට ම මතු නො වෙයි. මිනිස් ලොව සියලු මනුෂ්‍යයෝ ද ඇසූහ. සැවැත් නුවර සතිස් යොදනෙහි සිටි මහ පිරිස බුදුන් අංකුර ය යි වදාළ බස අසා එකෙණෙහි කොල! අප බුදුන්ගේ කටහඬෙක. බුයෙන් නො බැණව"යි කියා දෙහොත් මුදුන් දී දෙව්ලෝ බලා සිටියහ. එ වේලෙහි සවාමිදරුවෝ:

මහාදනං තයා දින්නං-අංකුර දීඝමන්තරෙ,
සුවිදූරෙ නිසින්නොසි-ආගච්ඡ! මම සන්තිකං-යි.

යන මේ ගාථාව සියලු සතුන්ට ම ඇසෙන සේ වදාරා "අංකුර ය! පෙර තෝ දස දහසක් හවුරුදු දොළොස් යොදනෙක ලිප් බඳවා මහදන් දුන්නෙහි ය, දුර සිටින, මා ලඟට පලා වර, ඉන්දකයා සේම

මා සමීපයේ හිඳ බණ අස. ඉන්දකයා දුන්නේ එක බත් සැන්දක් වුව තා කල පින් බොහෝ වුව. මා ලඟට පලා මරු"යි වදාළසේක. එකල අංකුර නම් දිව්‍යරාජයා හුනස්නෙන් පැන නැඟී බුදුන් වැඳ සිට:

අයං සො ඉන්දකො යක්ඛො-දජ්ජා දානං පරිත්තකං,
අතිරොචති අම්හෙහි-චන්දො තාරාගණෙ යථා-යි.

යන මේ ගාථාව කියා "ස්වාමිනි! පෙර මම අබුද්ධොත්පාද කාලයෙහි ඉපැද සිල්වතුන් නොලදින් බොහෝ දන පරිත්‍යාග කෙළෙමි. සබු වූ කුඹුරෙක යාලක් වපුට පැලක් ලබන්නා සේ නො සිල්වතුන් විෂයෙහි බොහෝ වූ පින් කොට සවල්ප වූ ආනුභාවයක් ලදිමි. තෙල ඉන්දක නම් දිව්‍යරාජයා තෝ සරු වූ කෙතෙක පැලක් වපුට යාලක් ලබන්නා සේ නුඹ වහන්සේගේ බුද්ධොත්පාදයෙහි සිල්වතුන් විෂයෙහි පමණ වූ පිනක් කොට අපමණ වූ ආනුභාව ලදින් අප හැම අභිභවා තරු මැද සඳ සේ දිලියෙන්නේ වේ ද ස්වාමිනි"යි කීය.

එ වේලෙහි බුදුහු ලඟ හුන් ඉන්දකයන් බණ්වා "ඉන්දකය! තා කල පිණු දු කියා බලගැ"යි වදාළසේක. එ තෙම හුනස්නෙන් පැන නැඟී බුදුන්ට දොහොත් මුදුන් දී සිට "ස්වාමිනි! පෙර මම ඉන්දක නම් දුඃඛිතයෙක්මි. දෙරින් දෙර භික්ෂාවනාය කොට ඇවිදුනා වූ මම එක් දොරෙක සිගා සිටියෙමි එ ගෙයි මනුෂ්‍යයෝ මා දුක උපන් මහාකරුණාවෙන් බත් සැන්දක් ගෙණාහ. එ වේලෙහි නුඹවහන්සේගේ සස්නෙහි අනුරුඩ නම් මහ තෙරුන් වහන්සේද පසු ව එ දොරට සිඟා වැඩිසේක. මම එ කල උන්වහන්සේ දුක මහත් වූ සැදූ ඇතිව "පෙර පින් නො කෙළෙන් දුන් දුඃඛිත වීමි. දැන් මෙතෙන කිසි යම් පිණක් පුරා ගන්මි"යි සිතාලා එ බත් සැන්ද ඔබගේ පාත්‍රයට පිළිගන්වාලීමි. එ පමණ පිණින් මෙ පමණ සැපතක් ලදුයෙම් වේද, මාගේ ශරීරයෙන් නික්මුත් ප්‍රභා හැම දෙවියන් මැඩගෙණ පවතිනා ලෙසු ත් මා අභිමුඛයේ හිඳගෙණ දෙවතාවකු නැති නියාව ත් මාගේ මහත් වූ දිව්‍යතෙජස හා පිරිවර ත් බලා වදාළ මැනැව"යි කී ය. බුදුහු එ වේලෙහි:

විචෙය්‍ය දානං සුගතප්පසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ,
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ-යි.

සතාදීන් දුකවිපාකයෙන් බණ වදාළසේක. හේ කෙසේද? යත්: දන් දෙන්නා වූ සත්වයන් විසින් පළමු කොට ත්‍රිවිධ වූ චේතනාව පිරිසිදු කොට සිල්වතුන් වහන්සේ හැඳින පින් කෙත් වෙත බලා දිය යුත්තේ ය. තිරිසනුන් සියක්දෙනාට දුන් දානයට වඩා එක මනුෂ්‍යයෙක්හට දුන්නා වූ දානය ම අප්‍රමාණ වූ විපාක දෙයි. එසේ වූ සාමාන්‍ය මනුෂ්‍යයන් ඒ සියක්දෙනාට දුන්නා වූ දානයට ත් වඩා තිසරණ පිහිටි එක පුද්ගලයක්හට දුන්නා වූ දානය ම මහත් වූ විපාක දෙයි. තිසරණ පිහිටි ඒ සියක් දෙනාට දුන්නා වූ දානයට ත් වඩා පන්සිල් රක්ෂා කරන්නා එක පුද්ගලයක්හට දුන්නා වූ දානය ම මහත් වූ විපාක දෙයි. පන්සිල් රක්ෂා කරන්නා වූ ඒ සියක් දෙනාට දුන්නා වූ දානයට ත් වඩා අටසිල් රක්ෂා කරන්නා වූ එක පුද්ගලයක්හට දුන්නා වූ දන් ම මහත් වූ විපාක දෙයි. අටසිල් රක්ෂා කරන්නා වූ ඒ සියක්දෙනාට දුන්නා වූ දානයට ත් වඩා දසසිල් රක්ෂා කරන්නා වූ එක පුද්ගලයක්හට දුන්නා වූ දානය ම මහත් වූ විපාක දෙයි. දසසිල් රක්ෂා කරන්නා වූ ඒ සියක් දෙනාට දුන්නා වූ දානයට ත් වඩා සතළිස් අඟින් යුක්ත වූ සාමණේරසීලය රක්ෂා කරණ එක හෙරණ පැවිද්දක්හට දුන්නා වූ දානය ම මහත් වූ විපාක දෙයි.

සාමණේර සීලය රක්ෂා කරන්නා වූ ඒ සියක්දෙනාට දුන්නා වූ දානයට ත් වඩා කෝටියක් සංවරසීලය රක්ෂා කරන්නා වූ එක උපසම්පන්න භික්ෂුවක්හට දුන්නා වූ දානය ම මාහැඟි වූ විපාක දෙයි. උපසම්පන්න භික්ෂූන් ඒ සියක් දෙනාට දුන්නා වූ දානයට ත් වඩා එක සෝවාන් පුද්ගලයක්හට දුන්නා වූ දන් ම මහත් වූ විපාක දෙයි. සෝවාන් එක්සියක් දෙනාට දුන්නා වූ දානයට ත් වඩා සෙදගැමි එක පුද්ගලයක්හට දුන්නා වූ දානය ම මාහැඟි වූ විපාක දෙයි. සෙදගැමින් එක්සියක් දෙනාට දුන්නා වූ දානයට ත් වඩා අනාගාමි එක පුද්ගලයක්හට දුන්නා වූ දානය ම මාහැඟි වූ විපාක දෙයි. අනාගාමීන් එක්සියක් දෙනාට දුන්නා වූ දානයට ත් වඩා එක රහත් කෙණකුන්ට දුන් දන් ම මාහැඟි වූ විපාක දෙයි. ඒ රහතුන් ඒ සියක් දෙනාට දුන් දානයට ත් වඩා එක පසේ බුදු කෙණකුන්ට දුන්නා වූ දානය ම මහානිසංස මහාඵල වෙයි. පසේ බුදුන් ඒ සියක් දෙනාට දුන් දානයට ත් වඩා එක ලොව්තුරා බුදු කෙණකුන්ට දුන් දානය ම අසංඛ්‍යෙය වූ, අප්‍රමේය වූ, විපාක දෙයි.

මේ ලෝකයෙහි ලොවුතුරු බුදුන්ට වඩා අග්‍රදක්ෂිණීය පුද්ගල කෙනෙක් නැත්තාහු මැ ය. යම් සාධිවතන කෙනෙක් සක්වළගබ සා හිමෙක මණ්ඩපයක් මවා එහි පසේ බුදුන් රහතුන් පෙළින් පෙළ අතුරා නො දී දනින් දන ගස්වා සිඳුවා චතුමධුර රසයන් දන් දුන්නාහු වී නම් ඒ සා මහත් වූ දානවිපාකය මාගේ බුදුන්ට එක දවසක් දන් දුන්නා වූ බත් කෙණෙස්සෙක්හි සොළොස් වන භාගයකු ත් නො හගනේ ම ය. එසේ හෙයින් මාගේ සවාමිදරු වූ බුදුහු ලොවට අග්‍ර වූ දක්ෂිණීය පුද්ගල යෝය. එසේ වූ බුදුන්ට දුන්නා වූ දානයට ත් වඩා බුදුපාමොක් සඟනට දුන්නා වූ සාංඝික දානය ම තාරකාවන්ට චන්ද්‍රයා අග්‍ර වූවා සේ ම ප්‍රභා සම්පන්නයන්ට සූර්‍ය්‍යයා අග්‍ර වූවා සේ ම, මනුෂ්‍යයන්ට රජුන් අග්‍ර වූවා සේ ම, ගංගාවන්ට සමුද්‍රය අග්‍ර වූවා සේ පින් කැමැත්තා වූ සත්ත්වයන්ට සාංඝික දානය ම අග්‍ර වූ විපාක දෙන්නේ ම ය. වදාළේ මැනෙවි:—

අග්ගි හුතන මුඛා යඤ්ඤා-සාවිත්ති ඡන්දසො මුඛං,
රාජා මුඛං මනුස්සානං-නදීනං සාගරො මුඛං.

නක්ඛත්තානං මුඛං චන්දො-ආදිච්චො තපතං මුඛං,
පුඤ්ඤං ආකඞ්ඛමානානං-සංඝො වෙ යජතං මුඛං යි.

තව ද: ඒ දානයට ත් වඩා යමෙක් තුන් බෝ පිහිටි විහාරයෙක මදුරකවුළු ඇති කරවා කොස්සෙන් දෙර බැර සතර දිගින් වඩිනා මහා සඞ්ඝයා වහන්සේ සුව සේ සැතපෙන සේ ආවාස දානයක් කරවා දන් දුන්නාහට අසංඛ්‍යෙය වූ අප්‍රමෙය්‍ය වූ විපාක දෙයි. මේ හැම පිණට ත් වඩා තුණුරුවනෙහි ප්‍රසන්න වූ සිතින් යමෙක් "තුණුරුවන් සරණ යෙමි" යි ශරණශීලයෙහි පිහිටියේ වී නම් අසංඛෙය්‍ය වූ අප්‍රමෙය්‍ය වූ විපාක දෙයි. ඊට ත් වඩා යමෙක් ශරණශීලයෙහි පිහිටා පන්සිල් රක්ෂා කෙළේ වී නම් එහි පින් මහා ඵල මහානිසංස දෙයි, ඒ පිණට ත් වඩා යමෙක් කිරි සිඳක් දෙනා ඇසිල්ලකු ත් "සබ්බෙ සත්තා සුඛිතා හොන්තු" යි කියා සියලු සතුන්ට මෛත්‍රී භාවනා කෙළේ වී නම් එහි පින් මහාඵල මහානිසංස වෙයි. ඒ පිණට ත් වඩා යමෙක් "අනිත්‍ය ය, දුඃඛ ය, අනාත්ම ය" යි තිලකුණු මෙනෙහි කෙළේ වී නම් එහි පින් මහාඵල මහානිසංස වෙයි. මේ ආදි කුශලයන්ට ත් වඩා යමෙක් ධර්මදානයක් දුන්නේ වී නම් දෙවූයේ වී නම් එහි ම පින් මහානිසංස-මහාඵල වෙයි. වදාළේ මැනෙවි:—

සබ්බදානං ධම්මදානං ජිනාති
සබ්බං රසං ධම්මරසෝ ජිනාති,
සබ්බං රතිං ධම්මරතී ජිනාති
තණ්හක්ඛයෝ සබ්බදුක්ඛං ජිනාති යි.

එසේ හෙයින් මේ ධර්මය නම් සත්ත්වයන්ගේ මෝහඳුරු විදහා වැඩ අවැඩ දක්වන ලද හෙයින් සද්ධර්ම නිසා ම සත්ත්වයන්ට සංසාර සාගරයෙන් ගොඩනැඟීම වන හෙයින් සියලු දානයට වඩා ධර්මදාන ය ම උතුම් ම ය යි දතයුතු.

ඉක්බිත්තෙන් මේ ආදි වශයෙන් වීමවයාදනයාගේ විභාග යෙන් පළමු කොට දානවිපාකය දිව්‍යමනුෂ්‍යයන්ට භාගවා බණ වදාළ සේක. එකල ඉන්දක-අංකුර නම් දිව්‍යරාජයෝ දෙදෙන සෝවාන් වූහ. අවශෙෂ වූ බොහෝ දෙවියෝ ද මාර්ගඵල ලදහ. සතිස් යොදුනෙහි සැමැක්නුවර සිටියා වූ මනුෂ්‍ය සේනාව ද බුදුන් එ පිරිස් මැද වැඩහිඳ වදාළා වූ බණ සේ ම ඒ බණ විශෙෂයෙන් කමන්ට ත් ඇසෙන හෙයින් විඳ විඳ අසා බොහෝ දෙන මාර්ග ඵලයට පැමිණ සාධුකාර පූජා කළහ. "අප බුදුහු නො පෙණෙත් නාහ. අප බුදුන්ගේ මිහිරි වූ කටහඬ ඇසූම්හ" යි යනාදීන් කිය කියා උත්සව කළහ.

එ කල ත්‍රිලෝගුරු බුදුරජාණන් වහන්සේ සුවහස් පහන් දැල්වූ පහන්රුකක් මුදුනෙහි දිලියෙන මහාප්‍රදීපයක් සේ දසදහසක් සක්වළ දිව්‍යසේනාව මධ්‍යයෙහි දිලිහි දිලිහි බුද්ධමහිම දක්වූ කල්හි එකල මැතියන් වහන්සේ ප්‍රධාන වූ සියලු දිව්‍යසේනාව දෙහොත් මුදුන් දී සිට "ස්වාමීනි! බුද්ධාන්තරයක් මුළුල්ලෙහි ලොකයෙහි සැඟවී තුබූ අභිධර්ම නමැති රුවන් නිධානයෙහි නුඹවහන්සේගේ බුද්ධඥාන නමැති කෙස්සෙන් දොර හැර වදාළ මැනව. සයුරමැද ගමන්ගත් තිමිඞ්ගල නම් නම මත්ස්‍යරාජයාගේ විලාස දක්වා වදාළ මැනව ඒ කෙසේ වූ විලාසයෙක් ද? යත්; හේ තෙම මුහුදු මැද නමා සරොයෙහි ගමන් ගත් කල දකුණු කම්පත සෙලවීමෙන් පන්සියක් යොදුන් තැන් මුහුද හළලා ගෙණ, වම් කන්පත සෙලවීමෙන් පන්සියක් යොදුන් තැන් හළලා ගෙණ, දකුණු වරල් : තින් පන්සියක් යොදුන් තැන් හළලා ගෙණ, වම් වරලිනු ද පන්සියක් යොදුන් හළලා ගෙණ, වාලධිය ගැසීමෙන් පන්සියක් යොදුනෙහි දිය රැළි කඩා ගෙණ, ඉසිනු ද පන්සියක් යොදුනෙහි මහ රළකඬු

සවා ගෙණ යයි. තෙමේ ද පන්සියැක් යොදුන. දිගින් සෙල දැසක් යොදුනේ හා පුළුලින් දසදහසක් යොදුන් හා මහමුහුද මහ සැලෙන කකියා නැගෙන දිය සේ ගලලා ගෙණ දිවෙයි. හෙ තෙමේ කියන කල "සබඳයෝ මුහුද ගැඹුර ගැඹුරැ යි කියති. මා පිට ගැලී යන තරම් ගැඹුරු තෙනක් නො ලැබෙමි" යි යෙයි. මෙසේ වූ ඒ තිමිඹගල නම් මත්ස්‍යරාජයා යුගඳුරු මුහුදු බැස සිත් සේ තික්මුනා වූ ලීලා දක්වා වදාළ මැනව. නුඹවහන්සේගේ අභිධර්ම නමැති මහ මුහුදට බැස වදාළ මැනව. ස්වාමීනි! නුඹ බුදු වූ දවස් පටන් පිපාසිතයන් පැන් පතන්නා සේ දෙවියෝ අභිධර්මාමෘතය කවර දවස් අපට දෙන සේක් දෝ හෝ යි ප්‍රාර්ථනා කෙරෙති. සියලු දෙවියන්ගේ සිත් පුරා විජම් දෙසා වදාළ මැනැවැ' යි ආරාධනා කළෙන.

එවේලෙහි බුදුරජාණන් වහන්සේ දශඵනඛ මසක් කුසින් උසුලා මහ පෙම් කළා වූ මෑනියන් වහන්සේ ආදි වූ සියලු දෙවියන් ඇස් සිවමින්, කන් තිවමින්, සිත් සිවමින්, බැණ නැගී බසින් ශ්‍රී මුඛයෙන් නිකුත් සුවඳින් මුළු සක්වල සුවඳ කරඹුවක් සේ කෙරෙමින් "කුසලා ධම්මා, අකුසලා ධම්මා, අව්‍යාකතා ධම්මා" යි යනාදීන් සප්තප්‍රකරණයෙකින් යුක්ත වූ විජම් පිටකය ගලලා අභිධර්ම දෙශනාවට පටන් ගත් සේක. කෙසේ ද? යත්;

සවාමිදරුවෝ "අනන්තාපරියන්තවූ බුදුන් දෙසූ අභිධර්මය නම් බුද්ධඥානයෙන් මුත් කිසිවක්හු විසින් දත නො හැකියේ ය. එසේ හෙයින් මේ දෙවියන්ගේ දිව්‍යඥානයට ද, බ්‍රහමඥානයට ද, අති ගම්භීර ම ය. දෙවියන්ගේ නුවණ පමණක් දෙසමි" යි සිතා මෝහොනක් කල් සිතියම් කඩක් විදා පානා සේ, සියල්ලන්ට ම දැනෙන සේ, උත්තාන දෙශනාවක් කරණ සේක. එකල දෙවියෝ විශෙෂයෙන් දූන් බුදුන්ට සාධුකාර දී දී "මේ අභිධර්මය නම් දුසී දෙයෙකැ යි පෙර ශ්‍රැතපරම්පරාවෙන් අසා දත්තුම්හ. එසේ බවත් මිස අභිධර්මය දුසී නො වෙයි. ඉතා උත්තානි ය. ඉතා සුහම් ය. ඉතා මොලොක් දෙයෙකැ" යි සිත සිතා අසති. එ කල බුදුහු දෙවියන්ගේ සිත් බලා "අභිධර්මය දුසී නියාව දෙවියන්ට මැලි ත් හගවා ලමි" යි සිතා දෙශනා ලීලාව ක්‍රම ක්‍රමයෙන් දුසි කරන්ට පටන් ගත් සේක. එ කල දෙවියන්ට ඡායාවෙන් පෙණෙන රූපයක් සේ සතෘ නො දැනෙයි. හුණක් හුණක් දැනෙයි. එසේ ද උව සු ඔඳින් මඳ සාධු

කාර දිදී අසති. තව ද දැඩිකොට වදාරණසේක; එ කල දෙවියන්ට ස්වප්නයෙන් දුටු රූපයක් සේ ස්වල්ප ස්වල්පයක් දැනෙයි. නැවත අභිධර්මාගරය දක්ව දක්වා බුද්ධඥානයට මුත් අවශෙෂ වූ කිසිවක්හටත් නො දැනෙන සේ අභිධර්මදෙශනාවක් කරණසේක.

එ කල සියලු දිව්‍ය බ්‍රහ්මයන්ට අඳුරු ගෙයකට වන්නා සේ කිසිවකු ත් නො දැනේ ම ය. එ කල දෙවියෝ "බුදුන් වදාරන්නේ මේ කිමෙක්දෝහෝ"යි සිත සිතා ගලෙක ඉන්නක් ඇන්නා සේ කිසිවකු ත් නො දැනෙන හෙයින් තුෂ්ණීම්භූත ම සිතියම් ඇඳි රූ සේ සිටියාහු ය. එ කල ස්වාමිදරුවෝ දෙවියන්ට නැවත දැනෙන සේ වදාරණ සේක. එ වේලෙහි සාධුකාර දිදී අසති. පෙර සේ ම උත්තාන කොට වදාරණ සේක. නැවත නැවත ද වඩ වඩාලා සාධුකාර දී දී අභිධර්මය මොළොකැයි සිත සිතා අසති. නැවත දැඩි කොට වදාරණ සේක. නැවත මෘදුකොට වදාරණ සේක එසේ වදාරන්නා වූ බුදුහු රාත්‍රි දිවාභාගයෙහි ශීඝ්‍රගතියෙන් වදාරණ සේක. සෙසු ශ්‍රාවකයන් එක අකුරක් කියාලන ඇසිල්ලෙහි අනද මහ තෙරුන් වහන්සේ අට අකුරක් කියාලන සේක. ඔබ ඒකාක්ෂරයක් කියාලන ඇසිල්ලෙහි ධර්මසෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේ අක්ෂරයන් අටක් පිරුවා පියන සේක. ඔබ එකාක්ෂරයක් කියාලන ඇසිල්ලෙහි බුදුහු අෂ්ටාක්ෂරයක් වදාරණ සේක. මෙසේ සාමාන්‍ය මනුෂ්‍යයන් එක බසක් කියාලන ඇසිල්ලෙහි බුදුහු සත්සිය දෙළොසක් බස් වදාරා පියන තරම් ශීඝ්‍ර වූ වාග්ලීලා ඇතිසේක. මෙසේ ශීඝ්‍ර වූ දෙශනා ඇති බුදුහු දිව්‍ය ඥානයට අතිශීඝ්‍ර කොට ම වදාරණ සේක.

බුදුන් පූජිතස්ථානයෙහි කළ මිනා බුද්ධකෘත්‍යය නිමවා පශ්චාද්භක්තයෙහි අධිවස්ත්‍රක පාෂාණයෙහි වැඩසිට ශ්‍රීපාදය සෝධා පය දිය වියලෙන තෙක් එතෙකට රැස්වූ භික්ෂූන් වහන්සේට "මහණෙනි! බුද්ධෝත්පාද දුර්ලභ ය, මනුෂ්‍යත්ම ලැබ ගැන්ම දුර්ලභ ය, ක්ෂණසම්පත්ති දුර්ලභ ය, සද්ධර්මශ්‍රවණ දුර්ලභ ය, ප්‍රව්‍රජ්‍යා දුර්ලභ ය, බුද්ධදර්ශන දුර්ලභ ය, අප්‍රමත්ත වව, ත්‍රිවිධ වූ ශික්ෂාවන් සම්පාදන ය කරව"යි යනාදීන් දවසින් දවස වදාරන්නා වූ සුගතොවාද නම් සංක්ෂෙප දෙශනාව බුදුහු එ තුන් මස මුළුල්ලෙහි ශීඝ්‍රගතියෙන් වදාළා වූ අභිධර්ම දෙශනාව විස්තර වශයෙන් පොත් සඞ්ගායනා කරතොත් මිනිස්ලොව සිට ඔබ වැඩහුන් දෙව්ලොව පාණ්ඩුකම්බලාසනය දක්වා පොත් ගොඩ කරත්තොත් උස් තැනෙතැයි නො සිතයි. දැන් පොත් සංගායනා කරතොත් මැදුම් සඟිය පමණ වෙයි.

තව ද: මේ මිනිස්ලොවින් හවුරුදු සියයක් නම් ඒ දෙව්ලොවින් එක දවසෙක, ඒ දිනයෙන් අපගෙන් සියක් හවුරුද්දට ඒ

දෙවියෝ දෙසිය සොළොස් වාරයක් සුසුම් ලති, අපගෙන් මසෙක් නම් ඔවුන්ට අටළොස් සුස්මක් කල, අපගෙන් දස දමසෙක් ඔවුන් සවාරයක් සුසුම් ලත කල, අපගෙන් පස් දමසෙක් නම් ඔවුන්ට තුන් සුසුමක් කල, අපගෙන් සියක් පෑ ගිය කල ඒ දෙවියන්ට එක සුස්මක් කල; එසේ හෙයින් ඔහු මිනිස්ලොවින් හවුරුදු සිය යකට දෙවාරයක් අනුභව කරන්නාහ.

එ කල අප බුදුහු "මිනිස්ලොව දී වැළඳුව මනා වේලෙහි, දෙව් ලොව දී වළඳන සේක් වී නම් දෙවියෝ "බුදුහු නම් කම සේ නැති ව බත් ම වළඳන්නාහ"යි විතර්ක සිතන්නාහු ය, එසේ හෙයින් බුදුහු මේ තුන්මස මුළුල්ලෙහි දිව්‍යයෝනාවට නො හගවා ම ආහාර කෘත්‍යය සම්පාදන ය කළ මැනැව"යි සිතා ලා මිනිස්ලො වට අරුණු නැගෙන වේලෙහි තමන් වහන්සේ ම එක්මැති වූ නිර් මිත බුදුකෙනෙකුන් මවා ඒ හස්නෙහි හිඳුවා "මාගේ දෙශනා ලීලායෙන් ම මේ බුදුහු විජම්දෙසනා කෙරෙත්ව යි, මේ දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මසෙනාව අතුරෙන් කිසි දෙවිබඹෙකෙනෙකු ත් මා මෙයින් බැහැර සියාව නො දනිත් ව"යි අධිෂ්ඨාන කොට ලා දෙව්ලොවින් අනන්තර ව පන්සියක් යොදුන් හිමාලය පර්වතයට බැස එහි පණස් යොදුන් අනවතප්ත නම් මහාසරසියෙහි අනන්ත පර්යන්ත වූ බුදුන්ට ම නියම ව තිබෙන සුගත් නම් මහනාමට බැස නාළිය දුවටි වළඳා මුඛ ශෝධනය කොට, සැටයොදුන් රත් ගල් තලා මුදුනෙහි කෙළවර පිහිටි සත් යොදුන් මහසල්ගස මුල වැඩහිඳ රත් වලාකාඩකින් සඳමඬලක් වසන්නා සේ සුගත් මන පවුල් සහල පෙරම වැඩසිටි කල්හි, බුදුන්ගේ සිත හා සම්ග පාත්‍රා ධාතූන් වහන්සේ සවකීය සථානයෙන් අංකාශයට පැනනැගී ගොස් ශ්‍රී හස්තයට බස්නා සේක. එ කල පාත්‍රය දරා අනුරුසතක් කලින් උතුරකුරු දිවිමැඩ දිව්‍යභෝජන පිළිගෙණ නැමත වැඩ එම ශාලද්‍රැම මූලයෙහි ම වැඩහිඳ වළඳා වදාරණ සේක.

එ කල ධම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ සැවැත් නුවර දී බුදුන් යමා මහපෙළහර පෑ දවස් බුදුසස්නේ පැහැද තමන් වහන්සේ කෙරෙහි මහණ වූ පන්සියක් පමණ වන්ගුලි භික්ෂූන් ගෙණ සංකස්පුර දොර ගොස් එහි වස් විසූ සේක. බුදුන් වැළඳූ අනන වේලෙහි සංකස්පුර දෙරින් වැඩ බුදුන්ට පෙණී බුදුන් වැළඳු පාත්‍රා සෝධා කළ මනා වත් කොට බුදුන් වැද එකත් පස් ව හිඳ "ස්වාමීනි! ඉස්ගේ පශ්වාද්භකතයෙහි පවත් අද අරුණු නැගෙන මේ පන්සැලිස් පැය මුළුල්ලෙහි නුඹවහන්සේ දෙසූ දෙශනා හා නිර්මිත බුදුන් කළ දෙශනා හා මට වදාළ මැනැවැ"යි ආරාධනා කරණ සේක.

එ වේලෙහි සවාමිදරුවෝ "ශාරිපුත්‍රය! දෙවියන්ට කී ලීලා යෙන් ඒ දෙශනාම දැනු දු කෙරෙම් නම් එම තෙක් කල් කම් යේ වුව මැනව. එසේ කල දෙවියන්ට කරණ දෙශනාව පමා වෙයි. තව සංක්‍ෂෙපයෙන් කියමි. විස්තර මසයෙන් ධරා ගණැ"යි වදරා "ඊයේ මේ තෙක් දෙශනා කෙළෙමි. නිර්මිත බුදුහු මේ තෙක් දෙසූහ"යි සංක්‍ෂෙපකාශයකින් මොහොතක් කලින් වදරා පියන සේක.

එකල සැරියුත් මහතෙරුන් වහන්සේ තමන් වහන්සේගේ අසාධාරණ වූ ශ්‍රාවක ඥානයෙන් බුදුන් එක නයින් වදාළා, තමන් වහන්සේ සිය දහස් ලක්‍ෂගණන් නය සිත සිතා ගෙණ විශෙෂ යෙන් ම දරා ගන්නා සේක.

එ කල බුදුහු "තාගේ වග්ගුලි මහණුන් පන්සියය තෙලේ විශෙෂයෙන් ම උගන්වව් ඔහුදු ඥනවන්තයහ. මතු මාගේ ශාසන යට මා හා කා හා ඉක්බිත්ම සප්තප්‍රකරණ ආචාරී වන්නාහ"යි වදරා දෙව්ලෝ වැඩ නිර්මිත බුදුන් අනන්තර්ධාන කොට ඒ ධර්මාසන යෙහි පෙණී නිර්මිත බුදුන් දෙසමින් සිටි අඩුවෙහි පටන් දෙශනා වට පටන් ගන්නා සේක.

එ කල සැරියුත් මහ තෙරුන් වහන්සේ ද, බුදුන් දෙව්ලෝ වැඩිකල තමන්වහන්සේ සංකස්පුර දොර වැඩ ඒ පන්සියයක් වග්ගුලි භික්‍ෂූන් කැඳවා "ඇවැත්නි! අප බුදුහු මිනුෂ්‍යයන්ට නො දන්නා හෙයින් අභිධර්ම නම් වූ දෙශනාවක් දෙවියන්ට දෙව්ලොව දී වදාරණ සේක. බුදුන් දවස දවස කල දෙශනාව දවස දවස මම ගොස් ඉගෙණ ඉගෙණ එමි. තෙපි හැමදෙනම දවසින් දවස මා අතින් උගන්ව, ඉගෙණ අවශෙෂ භික්‍ෂූන්ට මතු විජම් පිටක යට ආචාරි වව"යි කියා තමන්වහන්සේ උගත් දෙය ඒ පන්සියයක් භික්‍ෂූන්ට වදාරණ සේක. ඔබ වදාළ පරිද්දෙන් ඒ වහන්දෑ ද නො වරදවා උගන්නා සේක. එ තුන්මස මුළුල්ලෙහි ම බුදුහු විජම් පිටකය විස්තර කොට වදාළ සේක. බුදුන්ගේ දෙශනාව හා සමග සැරියුත් සවාමි නිමවා ඉගෙණ ත් වදාළ සේක. සැරියුත් සවාමින් අතින් ඒ පන්සියයක් භික්‍ෂූන් වහන්සේත් ඉගෙණ නිමවා වදාළසේක්ම ය. අභිධර්මය ඉගැන්ම හා සමග ම පන්සියයත් දෙනා වහන්සේ ම අමාමග නිවන් දක වදාළසේක් ම ය.

දිව්‍යලෝකයට විෂය වූ මෙසේ වූ අභිධර්ම දේශනාවක් කෙසේවූ, පින්බලයෙකින් බුදුන් දෙව්ලොව වැඩ හින්ද දී ම, දෙව්ලොව දී වදාළ බණ මිනිස්ලොව දී ම දරා ගෙණ අමා මහ නිවන් දුටුයේක්ද? යත්? මේකප තුන්වනුව බුදුවූ කාශ්‍යප නම් බුදුන්ගේ ශාසනයෙහි එක්තරා එක් මහතෙරහු දෙදෙනෙක් විජම්පිටකය නිමවා දැන එක්තරා එක් පබ්භාරයෙක නිරන්තර ම වාසය කරණ සේක් දෙදෙන ඔවුනොවුන් ලා විජම් නාය සාකච්ඡා කොට පෑවජ්ජා ප්‍රතිපෑවජ්ජා වසයෙන් අභිධර්ම ය පිරූවානා සේක. එ කල පබ්භාරයෙහි වසන පත්සියක් කිරිවවුලෝ ඒ අභිධර්ම ශබ්ද මාත්‍රයක් අසා ඒ පිණින් මිය පත්සිය පත්සිය දෙවඟනන් පිරිවරා දෙව්ලොව ඉපැද බුද්ධාන්තරයක් මුළුල්ලෙහි අපාය නො දැක, දිව්‍යසම්පත් විඳ අප බුදුන් සමයෙහි දෙව්ලොවින් චුතව අවුත් සැවැත්නුවර පත්සියක් කුලවල පත්සියක් කෙලෙඹියන්ට දූ ව ඉපැද මෑඹි පූජි විශ්වාස යෙන් ම පත්සියක් දෙන එක් ව ශ්‍රී විඳ මෙයිබන්ධකයෙන් ඇවිදු නාහු බුදුන් යමාමහ පෙළහර පෑ දවස් බුදුන් කෙරේ පැහැද බුදු සසුන් වැද සැරියුත් සාමින් කෙරේ මහණ වි. එක් ව ම මහණධම් පුරා එම බණ ඇසූ කුශලබලයෙන් මෙසේ විජම්පිටකය ධරා ගෙණ එම පිණින් අමාමහ නිවන් දැක සංසාර සාගරයෙන් ගොඩ නැංගාහ.යි දතයුතු.

එසේ හෙයින් මෙහි මෙබඳු වූ විපාකයෙක් ඇතැයි විභාග යක් නො දැන, ධර්මයෙහි ශබ්දමාත්‍රාවක් ඇසූ කිරිවවුලන් පවා මෙ බඳු වූ දිව සැපත්, නිවන් සැපත්, සාක්ෂාත් කළ කල මෙහි මෙ බඳු වූ විපාකයෙක් ඇතැයි කාරණාකාරණ දැක ශ්‍රද්ධාවෙන් බණ අසුවා වූ සත්ත්වයන්ට කලී විපාක වනාහි කා විසිනු ත් කියා නිමවාගත නො හැකි නිසා ය, කීයේ මැනවි:

සාරාසාර විවේක භාව රහිතා පක්ඛීපි කිඤ්චාවිදූ
සුත්වා වග්ගුලියො රවං ච යතිනො පාළිමහි සජ්ඣායතො.
විඤ්ඤාතා මහතිං සිරිං ධිතිකරං කාමිග්ගියං නප්පලා,
සම්පත්තා ජින සෙවිතං සිවපදං තුමතාදිසෙ කා කථා; යි.

මෙසේ සාමිදරුවෝ ඒ වස් තුන්මස මුළුල්ලෙහි යට කී ක්‍රම යෙන් ම අභිධර්ම දේශනා කොට නිමවා වදාළ සේක.

එ කල මාතෘ දිව්‍යරාජන් ව උපන්නාවූ මෑනියන් වහන්සේ කෙළ [1] දහසක් කෙලෙසුන් සහ දහසක් නසීන් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටා, සියලු දිව්‍යසේනාවට පලමුකොට හුනස්

1. සෙළ.

හෙත් පැතතැගී දෙහොත් මුදුන් දී සිට "ස්වාමීනි! සංසාරයෙහි අනන්තාපරිමෙය වූ ජාතියෙහි මට ම පෙම් වඩා, මට ම දරුව, මා කුසින් ඉපැද, මට ම බොහෝ සම්පත් දෙවූ සේක. දුන් නිවන් සම්පත් දී කාකොපකාරයෙහි මුදුන් පැමිණි සේකැ"යි සාධුනාද යෙන් පූජා කළ සේක. හේ කෙසේ දැ? යත්;

සච්ඡංකහාරී ජාතකාදියෙහි මා අනුත්ව දැසි ව උපන් කල පවා නුඹ මා කුසින් ඉපැද බරණැස් රජුන්ට අගමෙහෙසිනි කොට මට ම සම්පත් දෙවාපු කල් මෙතෙකැ යි පමණ නැත. සුසීම ජාතකාදියෙහි පියන් නැති කල ධනයට ශෝකයෙන් හඬන්නා වූ මා 'තො හඬ ම මැතියෙනි' යි සන්හිඳවා නුඹ සත් හැවිරිදි වයස මහත් වූ නුවණ බල පරාක්‍රම පෑ කෝටි ගණන් සම්පත් ගෙණවුත් මට දී මා සතුටු කරවාපු කල් මෙතෙකැ යි පමණ නැත. අලීන චිත්ත ජාතකයෙහි නුඹ මා කුසින් ඉපැද උපන් කෙණෙහි පවා පියන් නැති එක රජය තබා මුළු දඹදිව රජය මට ගෙණ දී සත්‍රි ව සිටි මා හා දඹදිවට රජ කරවාපු කල මෙතෙකැ යි පමණ නො දනිමි. මාතුපොසක ජාතකාදියෙහි නුඹ මා කුසින් ඉපැද හසති රාජ්‍යශ්‍රී විඳිනා කල පවා ඒ ඇත්රජය හැර මා ම නිසා එකලා ව අන්ධ වූ මට ම අත්පා මෙහෙ කොට සොඬින් පැන් ඇද එලාඑල හැඳ මට ම මෙහෙ කොට, මට ම සුව දුන් කල් මෙ තෙකැ යි පමණ නො දනිමි.

සාලිකෙදාර ජාතකාදියෙහි ගිරා රජ ව ඉපැද හැල් කරල් මී අඹ තුඩින් හැද ජරාදුබල වූ මා ම පොෂ්‍යය කළ කල් මෙ තෙකැ යි පමණ නො දනිමි. බන්ධනාගාර ජාතකාදියෙහි දිළිඳු වූ කුලෙහි ඉපිද වැන්දඹු වූ මව ම අත් පා මෙහෙ කෙරෙමි යි අනික් ගෘහ වාසයක් නො කොට දර පැන් පලා බඩු හැද, මට ම සුව දුන් කල්, මා ම නිසා නුඹ දුන් ගත් කල් මෙ තෙකැ යි පමණ නො දනිමි. තව දැ: කුරුධර්ම ජාතකාදියෙහි නුඹ මා බදු වූ ගුණ රක්‍ෂා කොට ජ්‍යෙෂ්ඨාපචායන ධර්මයෙහි මුදුන් පැමිණ ලක්‍ෂ අගනා චන්දනසාර සුවඳ අගනා සුවර්ණමාලාවෙන් මට ම පූජා කළ කල් මෙ තෙකැ යි පමණ නො දනිමි. මහාධර්මපාල ජාතකාදියෙහි නුඹ මා කුසින් ම ඉපැද නුඹට දැ, මට දැ, නුඹ උපන් කුලයට දැ, රෝග ව්‍යසන නැති කරවා අකාල මෘත්‍යු, අකාල සන්ධ්‍යා නැති කොට මව ම පෙම් වැඩූ කල් මෙ තෙකැ යි පමණ නො දනිමි. දශරථ ජාතකාදියෙහි මා ම කුසින් ඉපැද නුඹ දශරාජ ධර්මය පුරා මුළු දඹදිව රජය කොට, මවුන් පියන්ට කීකරු වූ කල් මෙ

තෙකැ යි පමණ නො දනිමි. නන්දිමිග ජාතකාදියෙහි තුඹ බරණැස් රජුට හසුව පවා ඒ මරණයෙහි ශොක නැති ව මට අත් පා මෙහෙ කරණ්ණුවන් නැතැ යි මහත් වූ ශොක කොට එ ම ගුණයෙන් ගැලවී අවුදින් මට දුක් වැද්ද නො දී මෙහෙකළ කල් මෙ තෙකැ යි පමණ නො දන්මි.

කුස ජාතකාදියෙහි තුඹ ම පතා මා පෙහෙවස් රක්ෂා කොට ශීලබලයෙන් සක්දෙව් රජුන් ගෙන්වා මනුෂ්‍ය ස්ත්‍රී ව උපැද පවා, තුඹ සක්දෙව්රජුන්ව ද කොට, මා කුසින් වදා, තුඹගේ ම රාජ්‍ය ශ්‍රී බල බලා මා සැප හුන් කල් මෙ තෙකැ යි පමණ නො දනිමි. එ බඳු වූ රාජ්‍යසම්පත් වැදූ පියන්ව පමා නො දී තුඹ මා කෙරෙහි ම සකත ව, මට ම රාජ්‍ය ය පාවා දී, මට ම සැපක් දුන් කල් මෙ තෙකැ යි පමණ නො දනිමි. සොණ නන්ද ජාතකාදියෙහි තුඹ තපසට යෙමි යි කී කල්හි පවා තුඹ කෙරෙහි කළ පුත්‍ර ස්නෙහයෙන් බ්‍රාහ්මණ සැපත් හැර, තුඹ හා සමග මල් ගොස් මා විසිනු දු තපස් කළ කල් මෙ තෙකැ යි පමණ නො දනිමි. එසේ මා හා සුදෙවුන් මහරජානන් තපස් කරණ කල්හි තුඹ ධ්‍යාන උපදවා ගෙණ ආකාශයෙන් ඒ ඒ තන්හි ඇවිද අනෙකප්‍රකාර වූ අග්‍ර අග්‍ර වූ ඵලාඵලයන් සෘධිබලයෙන් ගෙණහැර මට ම සත්කාර කළ කල් මෙ තෙකැ යි පමණ නො දනිමි.

තෙමිය ජාතකාදියෙහි තුඹ නිසා ම, තුඹ කෙරෙහි කළ පුත්‍ර ප්‍රේමයෙන් ම, අගබිසෝ සැපත් හැර මා ද වල් ගොස් තුඹ යේ ම තපස් කළ කල් මෙ තෙකැ යි පමණ නො දන්මි. අයොඝර ජාතකාදියෙහි තුඹ මා කුසින් උපන් කල්හි තුඹව කිසියම් උපද්‍රව යෙක් වෙති යි සිතා තුඹ ගෙයි ලා වඩා පෙම් කළ කල් මෙ තෙකැ යි පමණ නො දනිමි. උම්මග්ග ජාතකාදියෙහි තුඹගේ බල දුටු රජුන් විසින් මා කෙරේ පැහැද ස්ත්‍රී පලඳනාවෙන් කරණ ලද පූජා සැපත් මා ලද කල් මෙ තෙකැ යි පමණ නො දනිමි. වෙස්සන්තර ජාතකාදියෙහි සක්දෙව් රජුන්ට අගමෙහෙසියන් වූ, දිව්‍යසම්පත් හැර තුඹ ම වදමි යි සක්දෙව් රජුන් අතින් වර ඉල්වාගෙණ මිනිස්ලොවට අවුත් තුඹ මා කුසින් වැදූ කල් මෙ තෙකැ යි පමණ නො දනිමි. මේ ජාතියෙහි යේ ම තුඹ රජසැපත් හැර තපසට පලට යන කල්හි, තුඹ නවතාගත නො හී මා හඬාපු කඳුළු නො එක් ජාතියෙහි සතර මහා සාගරයෙහි දියට ත් බොහෙව යි සිතමි.

නුඹ ද කොතෙක් ජාතියෙහි මා ම පෝෂ්‍ය ය කෙරෙමි යි මව ම ගොදුරු සොයා ගොස් කොතෙක් බන්ධනයට පැමිණි කල් මෙ තෙකැ යි ප්‍රමාණ නො දනිමි. පියුමතුරු නම් බුදුන් දක නුඹව මවුවෙමි යි මා ප්‍රාර්ථනා කළ තැන් පටන් මේ කල්පලක්ෂය මුළුල්ලෙහි නුඹද අනික් මෑණිකෙනකුන් නො සෙවූ දෑ ම ය. මම ද අනික් පුතකුකෙණකුන් නො පැතුයෙම් ම ය.

දුන් බුදු වන ජාතියෙහි ද කිඹුල්වත් පුරෙහි සුදොවුන් මහ රජානන්ට අගමෙහෙසින් ව, මහාමායා නම් බිසෝ ව, මිනිස් ලොව රූ ඇතියනට අගපැමිණි ව වැස, නුඹ මා කුස පිළිසිඳගත් පිණිස් දසදහසක් සක්වළ මහපොළෝ ගුගුරුවා පීමි. මෙරගල්-සක්වළගල් කුලපර්වතන් නළුවන් සේ නටවා පීමි. නුඹ මා කුසින් උපන් වේලෙහි ද නුඹ වැනි පුතුන් වැදූ පිණින් මහබඹුන් අතින් පවා වැඳුම් ලැබ පීමි. මේ ලෝකයෙහි පුතුන් පතන්නාවූ ස්ත්‍රීහු නුඹ වැනි වූ පුතුන් ම ප්‍රාර්ථනා කෙරෙත්ව යි, පෙර මා විසින් නුඹව පොවාපු තනකිරට දුන් නුඹ විසින් මා පොවාපු දහම්කිරි බෙහෙව. ස්වාමිනි! මපුතනුවන් වහන්ස! බුදුකෙණකුන්ට මවුවීමෙහි ආනිසංසයන් ලදිමි යි දුන් මා සිත් පිණා ගිය, නුඹ වැනි ශ්‍රීවත්නයන කෙණකුන් වැදූ කුසින් අනික් ලාමක වූ සත්ත්වයකු නො වදමි. මතු සත් ජාතියකින් වබා සංසාරයෙහි ද නො ඇවිදිමි. ඒ සත් ජාතියෙහි ද දෙව්ලොව බඹලොව විනා අන් තැනෙක ත නො ඇවිදිමි ස්ත්‍රී ආත්මභාවයෙන් ගැලවී පුරුෂ ආත්මභාවයකු ද ලදිමි. නුඹ වැදූ පින්බලයෙන් මාගේ සියලඟින් නික්මුත් දිව්‍ය ශෝභාවෙන් මේ දසදහසක් සක්වළ දෙවියන් බඹුන් මැඩපවත්නා ලෙස් බලා වදාළ මැනැවැ යි යනාදි වසයෙන් සියදහස් වචනයෙන් බුදුන්ට සතුටු කරන්නාවූ ඒ මාතෘ නම් දිව්‍යරාජයානෝ අප්‍රමාණ වූ නමස්කාර පූජා කළහ. මෙසේ ස්වාමිදරුවන්ගේ ඒ අභිධර්ම දෙශනාවසානයෙහි අසූකෙළ දහසක් දෙවියෝ අමාමහ නිවන් දුටහ. කීයේ මැනෝ:-

තං දෙව දෙවො දෙවානං - දෙවදෙවෙහි පූජිතො,
දෙසෙසි දෙවලොකස්මිං - ධමමං දෙව පුරකඛතො - යි.

එ කල ඒ තුන්මස මුළුල්ලෙහි ප්‍රබන්ධ වූ විජම් දෙශනාවෙහි අති ප්‍රසන්න වූ සක්දෙව්රජ පාණ්ඩුකම්බලාසනය ආදි වූ තමාගේ සියලු ශක්‍රසම්පත්තීන් පූජා කෙළේ ය. දසදහසක් සක්වළ දෙලක්ෂ සතළිස් දහසක් දිව්‍ය බ්‍රහ්මරාජයෝ ද, තමන් තමන්ගේ

සක්වළවලට නො නොසිත් ප්‍රබන්ධයෙන් සිට බණ අසා දවසින් දවස අප්‍රමාණ වූ පූජා කළාහු ය. අප බුදුන් බුදු ව වැඩහුන් මේ පන්සාළිස් හවුරුද්ද මුළුල්ලෙහි දසදහසක් සක්වළ දෙවියන් රැස් ව තුන්මසක් මුළුල්ලෙහි ප්‍රබන්ධ වූ පූජාවක් කළා වූ, මෙ බඳු වූ, සමාගමයෙක් අතික් කිසි කාලයෙක ත් නො වී ය. මේ සමාගම ය නම් අනන්තාපරියන්ත වූ බුදුන් ම එකී එකී වාරයෙක්හි ම ලබන්නා වූ එකාන්ත ධම් සමාගමයෙක් ම ය.

මෙසේ මාගේ ස්වාමිදරුවෝ දසදහසක් සක්වළ දෙවියන් රැස් ව පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි කළාවූ දවස දවස දෙලක්ෂ සතළිස් දහසක් ප්‍රමාණ පූජා බැගින් අනූදවසක් මුළුල්ලෙහි කළාවූ දෙකෙළ සොළොස් ලක්ෂයක් පමණ ඇති සඞ්ඛ්‍යා පථයට විෂය වූ, දිව්‍යරාජ පූජාවක් ලත් හෙයිනු ත්, සඞ්ඛ්‍යා පථයට අවිෂය වූ සෙසු අප්‍රමාණ දෙවියන් කරණලද අසඞ්ඛ්‍ය ගණන් දිව්‍යරාජ පූජා ම ලත් හෙයිනු ත්, එසේ වූ පූජා විඳිමට සුදුසු හෙයිනු ත්, සවුනෝ නිමවා දත්, වියත් කමිසි මුදුන් පැමිණි, සත්ත්වයන්ගේ සිත් පමණ දෙශනා ඇති, බලන්නවුන්ගේ ඇස් පහරණ රූපශ්‍රී ඇති, පුදන්නවුන්ගේ දුන පමණ සත්කාරයට සුදුසු වූ පින් ඇති, අසන්නවුන්ගේ කන්පුරා දෙසන දහම් අමා ඇති, එකචක්‍රවාළ ය මගුල්ගේ කොට ඇති, දශසහස්‍ර ලොකධාතු ජාතික්ෂෙත්‍ර කොට ඇති, කෙළලක්ෂයක් ලොකධාතු ආඥක්ෂෙත්‍ර කොට ඇති, අනන්තාපරිමාණ වූ ලොකධාතු විෂය ක්ෂෙත්‍ර කොට ඇති, දෙවාති දෙව වූ, බ්‍රහ්මාති බ්‍රහ්ම වූ, මාගේ ස්වාමි දරු වූ, මාගේ ම බුදුරජානෝ මේ ආදි කාරණයෙනු දු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලදී.

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං–ති.

මේ පූජාවලියෙහි
අප බුදුන් තවුතිසා භවනයෙහි දී සක්දෙව් රජහුගෙන් ලද
පාණ්ඩුකම්බල ශෛලාසන පූජා කථා නම් වූ
සූවිසි වන පරිච්ඡේදය නිමි.

පස් විසිවන පරිච්ඡෙදය

තව ද: අප බුදුන් සංකස්පුර දොරදී ලද දේවොරොහණ පූජා නම් කවරීයත්;

මෙසේ මාගේ ස්වාමිදරුවූ ත්‍රිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවත් නුවර දී යමාමහ පෙළහර දක්වා එයින් නැගී ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි සත්වන වස, වසා දෙවියන්ට අභිධර්ම දෙශනා කොට ඒ මස් අන්තයෙහි මහා පවාරණ දිනයට සත් දවසක් තුබූ කල්හි බුදුන් වඩනා තුරු සතිස් යොදනෙහි කඳ වුරු බැඳ සැමැත් නුවර හුන් මහපිරිස වප්මස පුර අටවක් ලද පොහෝ දිනයෙහි මුගලන් මහ තෙරුන් වහන්සේ කරා රැස්වී "ස්වාමිනි! අප බුදුන් නො දක්මෙන් දූත් අප හැමදෙනාට සොයාසූ දවසෙක් අතික්‍රාන්ත විය. අප බුදුන් කවර දවසෙක දකුමෝ ද, අප බුදුහු කවර දවස් මිනිස්ලොවට වඩනා සේක් ද, ඒ අපට නියම දන වදාළ මැනැවැ" යි කීහ. එ වේලෙහි මුගලන් මහ තෙරුන් වහන් සේ "එ බැවින් මම බුදුන් කරා කවුකිසා හමනයට නැගෙමි යි මා නැගෙන්නා බලා සිටුව" යි මහ පිරිසට කියාලා තමන් වහන්සේ සිටි තැනින් ම දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝනකඩ බොල් මහ පොළොව කිමිද ගොස් මෙර පත්ලෙහි දහසක් යොදුන් ත්‍රිකූටයන් දරාසිටි මහසල පොළොවින් පැනනැගී ඉන්ද්‍රනීල සාගරයෙහි දිලියෙන්නාවූ ප්‍රවාලාංකුරයක් සේ දිලිහී දිලිහී වැඩසිට "මෙ තැන් පටන් මා නැගෙන්නාවූ සියලු සත්ත්වයෝ ම විශෙෂයෙන් දකිත්ව" යි අධිෂ්ඨාන කොටලා එක්ලක්ෂ අටසැට දහසක් යොදුන් උස මහමෙර මහවිදුරු කොරපොණ්ණෙකින් සිදුරුකොට විද නගන් නා සේ කිමිද කිමිද නැගෙන්නට පටන්ගත් සේක.

එ වේලෙහි ජම්බුද්වීපවාසී වූ සියලු සත්ත්වයන්ට ඉන්ද්‍රනීලයක් රත්හුයකින් අවුනා නගන්නා සේ පෙණුන සේක. අපරගොයාන වීපවාසී සත්ත්වයන්ට ලොහිතාඞ්ක මාණික්‍යයක් රත් පලස් හුය කින් අවුනා නගන්නා සේ පෙණුන සේක. උතුරුකුරු වීපවාසී සත්ත්වයන්ට රත් මැණිකක් රත්හුයකින් අවුනා නගන්නා සේ පෙණුන සේක. පූර්වවිදෙහ වීපවාසී සත්ත්වයන්ට ස්ඵටික මාණික්‍ය යක් රත් පලස් හුයකින් අවුනා නගන්නා සේ පෙණුන සේක. මෙසේ සතර මහාවීපවාසී සත්ත්වයන්ට සතරමහ පෙළහරක් දක්වා දක්වා අහස්කුසින් නැගෙන විදුලියක් සේ, විශෙෂයෙන්ම සියලු සතුන්ට ම පෙණී පෙණී මහමෙර පළාගෙණ නැගෙන සේක

එ කල සත්ත්වයෝ "අප මහ තෙරුන්ගේ පෙළහරක් බලව, අප මහ තෙරහු අප බුදුන්ගේ අනුජාත වූ පුත්‍රය, අනුබුද්ධයහ; අනු ප්‍රාතිහාර්‍ය්‍ය ඇතියහ. අපමහ තෙරහු පන්සියයක් යොදුන් උස ඇති

පළමුවන උරගාලින්දයට පැනනැංගහ. දෙවන ගරුඩාලින්දයට පැනනැංගහ. තුන් වන දහවාලින්දයට පැනනැංගහ. සතර වන යක්ෂාලින්දයට පැනනැංගහ සොළොදහක් නැංගහ. දෙ සොළොදහක් නැංගහ. දසසොළොදහක් නැංගහ. සියක්සොළොදහක් නැංගහ දහසක්සොළොදහක් නැංගහ. යුගන්ධර මුදුන ගෙවූහ. සවුමහරජය ගෙවූහ. මෙර මුදුනට ආසන්න වූහ." යනාදී මහසෙයෙන් කිය කියා දෙහොත් මුදුන් දිදී සාධුකාර දිදී දල්වූ ඇසිපිය හෙළා ලිය නොහී, දල්වූ කට පියාලිය නොහී, නැගූ සුස්ම හෙළාලිය නොහී, මහත් වූ සන්තෝෂයෙන්, මහත්වූ විස්මයෙන්, අසුරැගන් දෙමින්, සාධුකාර දෙමින්, දෙහොත් මුදුන් දෙමින්, කොල මේ කිමෙක් දැ යි කියමින් පෙළහරින් මත් ව සිටියාහු ය.

එ වේලෙහි මුගලන් මහ තෙරුන් වහන්සේ මෙසේ වූ සතර මහ පෙළහරක් දක්වමින්, මුළුලෝ විස්මය කරවමින්, මහ මෙර කිමිදැ, බුදුන්ගේ ශ්‍රීපාදයෙහි තමන් වහන්සේගේ සිරස සපශී කෙරෙමින් මහා ජම්බුවෘක්ෂ මූලයෙන් පැනනැගී ස්වර්ණාඞ්කුරයක් සේ දෙව් බඹ පිරිස් බබුළුවා බුදුන් සමීපයෙහි මෑබ සිටි සේක. එවේලෙහි ඒ දිව්‍යසේනාව මහ තෙරුන් වහන්සේ බුදුන් පෙරට ඉන්ද්‍රජාලයක්සේ පෙණීගිය පෙළහර දැක "අප මහ තෙරහු, මේ සා දිව්‍යසේනාවක් මධ්‍යයෙහි බුදුන් ලඟ කෙසේ ඇවිත් පෙණී ගියාහු දැ" යි තුන්ලෝ පුරා සාධුකාර දුන්හ.

එ වේලෙහි මහතෙරුන් වහන්සේ බුදුන් වැඳ නැවු තරුවට අනු වූ අරුන්ධතී තරුවක් සේ බුදුන්ට අනු ව සිට "ස්වාමීනි! තුන් ලොවට ගුරු වූ බුදුරජානෙනි! නුඹවහන්සේගේ අසාධාරණවූ මහ පෙළහර සා මනොහරවූ දෙශනාවෙහි මත්වූ මුළු දඹදිව සත්ත්වයෝ හස්තිකාන්ත වීණාවෙහි මත්වූ හස්තිසේනාවක් සේ එම තුන්මස මුළුල්ලෙහි 'අප බුදුන් අද දකුම්හ. සෙට දකුම්හ'යි සිතා වූහ. බුද්ධ දර්ශනයෙහි සත්ත්වයෝ අතිලෝභී වූහ. මිනිස්ලොවට වඩිනේ කවර දවස් ද, කොසේ වූ ස්ථානයකට වඩිනා සේක්" යි විචාළ සේක.

එ වේලෙහි ස්වාමිදරුවෝ "මුගලන් මහාස්ථවිරය! මෙයින් සත් දවසක් ගිය කල වප්මස මැදි පොහෝ දවස් සකස් පුර දොරට බස්මි. තොපගේ බෑනෝ ශාරිපුත්‍ර ස්ථවිරයෝ ද එහිම වස් විසූහ. තෙපි මාගේ ආනුභාවයෙන් ඒ මහ පිරිස ගෙණ සකස් පුර දොර රැස්කරව"යි වදාළ සේක. එවේලෙහි මුගලන් මහතෙරුන් වහන්සේ නැවත බුදුන් වැඳ සමු ගෙණ එම මෙර මුදුනෙන් කිමිද පෙර සේම මෙර පත්ලට බැස ජල පොළොව ද, පස් පොළොව ද කිමිද තොස් මහ පිරිස මධ්‍යයෙන් සරා සිරිමඩලක් සේ පැනනැගී සේක.

එ වේලෙහි මහ පිරිස මහතෙරුන් වහන්සේට සාධුකාර පූජා කොට "ස්වාමීනි! අප බුදුන් කවර දවස් දක්නමෝද, කුමක් වදාළ සේක් දැ යි විචාළහ. එකල මහතෙරුන් වහන්සේ "උපාසක ජනයෙනි! බුදුහු සත්වන දවස් සංකස්පුර දොරට බස්නා සේක. බුදුන් දක්නා කැමැත්තෝ කොණක් එතෙනම රැස්වව"යි වදාළ සේක. ස්වාමීනි! ඒ සංකස් පුර දොර කම් මේ සැවැත් නුවරට කොතෙක් තැන් දැ යි විචාළහ. උපාසක ජනයෙනි! මේ නුවරට තිස් යොදනකැ යි වදාළ සේක එ වේලෙහි මනුෂ්‍යයෝ "ස්වාමිනි මේ තැනට රැස් වූ බාලදරුවෝ බොහෝ. ජරා දුබ්ලයෝ බොහෝ. පයින් යා නොහෙන ශ්‍රී වනිතාවෝ බොහෝ. ඔහු එ තෙක් තැන් කෙසේ පලා යෙද් දැ යි විචාළහ. එ වේලෙහි මහතෙරුන් වහන්සේ "කිසිකෙනෙ කුත්ව ත් කිසි පීඩාවකු ත් නො වෙයි. දුරෙකැයි නො සිතා මාගේ බුදුන්ගේ හා මාගේ ආනුභාවයෙන් හැම දෙනම නික්මෙව"යි වදාළ සේක. එ බස හා සමග ම මියර ලගුන් මහ වතුරක් සේ සහපිරිස එකවිට ම පෙළඹී නික්මුනාහ.

එ කෙණෙහි බුදුන්ගේ ආනුභාවයෙන් මහ පිරිස ආකාශයෙන් යන සක්විති පිරිසක් සේ ඉක්බිති ගෙයක මගුල් බලන්නට යන්නා සේ, කිසි පීඩාවකුත් කැණී ව පතුල් බොලැව ගැහැටුමකු ත් නැතිව යන්නාහු ස. සම්හරු මුඛයෙහි තිබූ බුලතට සුණු වත තිස් යොදුන් මග ගෙවා ගොස් සංකස් පුර දොරදී කෑහ සම්හරු ඉසකේ බැඳ බැඳ යන්නාහු ඔබ මන් කල ම බැඳ තිබී වූහ. එක් කණෙක කණාභරණ සැවැත් නුවරදී පැලඳ අනික් කණ සංකස්පුර දොරදී පැලැන් දහ. ඔවුනොවුන් පරයා නික්මුනාහු එක් අතෙක හස්තාභරණ පැලඳ අනික් අත හස්තාභරණ සංකස් පුර දොරදී ලූහ. ඔවු නො වුන් පරයා නික්මෙන සත්සලයෙහි පුවසස් අගනා මුත්හර තරම දම්ා කර බඳිනා පමුණෙහි සතුරු ගත්ව ගත්වා ගොස් මැද ගිය උත්තමාඞ්ගනාවෝ කොතෙක් දෙනද. දත් මැද මුහුණ තෙල් ගා එක් ඇසෙක අඳුන් ගා අනික් ඇස අඳුන් ගානා ද තුරෙහි ගොස් මැද ගියා වූ යෞවන ස්ත්‍රී කොතෙක් දෙනද. රන් කැටපත් මණිතින් ගෙණ තමන් මුහුණ වටට කැටපත් වට තපුරැයි විසුළු ගත් වන්නා සේ කැටපත් බල බලා සුවෙන් මැද ගියාවූ දෙවගනන් බඳු වරඟනෝ කොතෙක් දෙන ද.

අපි පසු ව මෝ ඇ හෝ අපි පසු ම මෝ ඇ හෝයි ඔවුනො වුන් පරයා නික්මුනු කල්හි එක් කණෙක සක්පත් තබා අනික් කණ සක්පත තබා තබා ගොස් එ කැනම මැද ගියාවූ කැන සිවි

හොවුන් සිටියෝ කොතෙක් දෙනද. එක මල්ලක් හිස ගත්වා අනික් මල මුකුලිත කොට කොට හිසට දිගු කරණ දෑතුරෙහි දිගුම්ග ගෙවා ගොස් වැද ගිය සලලාල ස්ත්‍රී පුරුෂයෝ කොතෙක් දෙන ද, කිරි බොන දරුවන් වඩාගෙණ නික්ම 'තොපට දුක, දරුවන් මා අතට වඩාපියව'යි පුරුෂයන් දරුවන් කරා දෑත් දිගුකල කල්හි පියන් අතට දරුවන් වඩාලන දෑතුරෙහි ගොස් එ නුවර වැද ගියා වූ ජයම්පතිකාවරු කොතෙක් දෙනද. දහසක් අගනා කසීසළු හැද දෙදහසක් අගනා කසීසළු කරට දම් දමා යහෙන් ගොස් වැද ගියාවූ මත් බමුණෝ කොතෙක් දෙනද.

පෙරැළිම පැන පැන කීප පිම්මකින් සහස්පුර දෙරට ගොස් ‘‘කාල! මෙකිමෙක්ද’’යි ඔවුනොවුන් මුහුණ බලා විස්මයපත්ව නැවත පෙරැළිම පතින්නාවූ ලංඝිකයෝ කොතෙක් දෙනද. නරු තන තනා පිළි හැද හැද එක් මල්ලක් සඹා ගත්සා දෑතුරෙහි හඩාම ගොස් එ නුවර ගියාවූ නළුවෝ කොතෙක් දෙනද. සක් සින්නම් තුඹ තබා එක් දෙයලක් පිඹ නුක්වන ධවනිය කො නගන තෙක් ගොස් වැද ගියාවූ ධවනිකයෝ කොතෙක් දෙනද, රන් පැන, රිදී පැන, රන් කලස, රිදීකලස, රන් කොතලා, රිදී කොතලා, රන්ධජ, රිදීධජ එක් අතකින් ඔසවා ගෙණ අනික් අතට මාරු කොකොට එක අත නො එලෙන තෙක් නොයෙක් පූජා භාණ්ඩ ගෙණ කෙල ගොස් වැදගියාවූ පින් සොඩ වූ සත්වයෝ කොතෙක් දෙනද. සත්තිස් යොදනෙහි අතුරු නොදී හුන් ඒ සා මහ පිරිස ඒ සැවැත් නුවර සිට තිස් යොදුන් මහ ගෙවා පැනක් බී නො පියන ඇසිල්ලෙහි බුලතක් යොද නො ගන්නා ඇසිල්ලෙහි කිසි පීඩාවක් නැතිව සවප්නයෙන් ගිය ගමනක් සේ ඒ සහස්පුර දෙරට ගියා වූ ඒ ගමන් පෙලහර මාගේ සවාමිදරුවූ තිලෝගුරු බුදුරජානන්ගේ මහත් වූ බුද්ධානුභාවයෙන් ම විය. එකල ඒ මහ පිරිස සහස්පුර දෙරට වැද උපන් සන්තොෂයෙන් උත්සව කෙළි කෙළ එ තැන්හි ද කදවුරු බැඳ උන්හ.

එකල බුදුරජානන් වහන්සේ මජමස මැදි පොහෝ දිනයෙහි පාණ්ඩුකම්බලාසනයෙහිදී ම වස් පවරා එ දවස් සක්දෙව් රජහු කැදවා ‘‘සක්දෙව්රජ! අප මිනිස්ලොවට ගියම්නා කලැ’’යි වදාල සේක එ වේලෙහි ශක්‍රදේවේන්ද්‍රයෝ ‘‘ගැත්තකුගේ ගෙයි වැස සවාමිදරුවක්හු යන කල ගැත්තහු විසින් කිසියම් සත්කාරයක් කොට පසුගමන් කලමනාවේම ය. එසේ හෙයින් මමද මාගේ බුදුන්ට මා ශක්ති පමණින් පූජාවක් කොට පසුගමනක් කෙරෙමි. බුදුහු මාගේ පුරයට වඩනා දවස් තුන් පියවරකින් බුද්ධානුභාවයෙන් වැඩි

සේක. දෙව්නුවර මාගේ පුරයෙහි සිට වඩනා ගමන දිව්‍යානුභාවයෙන් වැඩියමනා ම ය. බුදුහු දෙව්ලොවට සත්ත්වයන් සිත් සේ නැගෙන සේ සද්ධර්ම නමැති සෝපානයක් ඉපැද වූ සේක. එසේ වූ බුදුන්ට මම දෙව්ලොව සිට මිනිස් ලොවට වඩිනා පරිද්දෙන් දිව්‍යසෝපාන යෙකින් පූජාවක් කෙරෙමි"යි සිතා මේරුමුදුනෙහි පටන් සකස්පුර දොර දක්වා බුදුන් බස්නා සේ සත්රුවන් හිනක් මවා, දකුණැ'ලයෙහි දෙවියන් පූජා භාණ්ඩ ගෙණ බස්නා සේ රන්හිනක් මවා වමැ'ලයෙහි රිදීහිනක් බ්‍රහ්මයන් සේසත් ගෙණ බස්නා සේ මවාලී ය.

ඒ තුන් හිනෙ ම සුමාසුදහසක් යොදුන් පමණට වඩා බොහෝ වූ උස ඇත්තෝ ය. හිනිඳුන මේරුමුදුනෙහි වී ය. හිනිපාමුල් සකස් පුර දොර වී ය. බුදුන්ට මැවූ සත්රුවන් හිනෙහි එක් පෙත්තෙක් රිදීමය ය. එක් පෙත්තෙක් ප්‍රවාලමය ය. එක් පෙත්තෙක් දුවාණමය ය. එක් පෙත්තෙක් ලෝහිතඞ්කමය ය. එක් පෙත්තෙක් මසාරගල්ලමය ය. එක් පෙත්තෙක් ඉන්ද්‍රනීලමය ය. එක් පෙත් තෙක් සත් රුවනින්ම ය යි මෙන මෙන ම නිර්මිත වූ දිව්‍යකර්මාන්ත යෙන් හොබනෝ ය. ඒ අසාධාරණ වූ දිව්‍යසෝපාන තුණ ම ඉන්ද්‍ර චාප සේ සත්ත්වයන්ට විශෙෂයෙන් පෙණේ ම ය. එ කල මනුෂ්‍යයෝ "කොල! මේ කුමක පෙලහරෙක් ද, පෙර මෙසේ වූ පෙලහරෙක් දුටුවමෝ ඇසුවමෝ කවුරු ද" යි කිය කියා දෙහොත් මුදුනෙහි තබා ගෙණ තුන් ඉනෙහි කර්මාන්ත තමන් ඉනෙහි තුබූ දෙයක් සේ සිත් සේ බල බලා සාධුකාර දි දී සිටිනාහු ය.

එ වේලෙහි සවාමිදරුවෝ පාණ්ඩුකම්බලශෛලාසනයෙන් බැස බණ අසා සිටි දිව්‍යසේනාවට පින් දී, එම දිව්‍යසේනාව පිරිවරා මෙර මුදුනෙන් වැඩ, සත්රුවන්මය වූ දිව්‍යසොපාන මස්තක යෙහි රුවන් ඇගෑණන් මුදුනෙහි මැටී අගෙක දල්වාලූ දිවපහනක් සේ වැඩ සිට, "සියලු ලොකධාතුයෙහි සත්ත්වයෝ ම මා දකිත්ව"යි අධිෂ්ඨාන කළ සේක. එ වේලෙහි අවීචියෙහි පටන් භවාග්‍ර ය දක්වා, භවාග්‍රයෙහි පටන් අවීචිය දක්වා, දසදහසක් ලොකධාතු එකාඞ්ගන වි ය. දෙතිස් මහා පූර්ව නිමිත්ත නම් පූජාවෝ ද පහළ වූහ. සියලු සත්ත්වයෝ ම ආකාශයෙහි සඳ දක්නවුන් සේ බුදුරජා නන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ හා, අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණ යන් හා, අල්ලෙහි තුබූ මිස්සෙක අකුරු දක්නවුන් සේ සිත් සේ

බලන්නට පවත්ගත්හ. දෙවියෝ මිනිසුන්ට පෙණෙති, මිනිස්සු දෙවියන්ට පෙණෙති, මහබඹු කුරුකුහුඹුවන්ට පෙණෙති, කුරුකුහුඹුවෝ මහබඹුන්ට පෙණෙති, සුවහස් පහන් දැල්වූ පහන් ගබඩාවක් උඩින් ගවින් බැලුම්නට යහයා පෙණෙන්නා සේ දසදහස් ලොකධාතුයෙහි සියලු සත්ත්වයෝ ඔවුනොවුන් සිත් සේ බලන්නට පවත් ගත්හ. එ වේලෙහි ස්වාමිදරුවෝ මධ්‍යයෙහි මැවූ රුවන්හිත රුවක් පෙත්තෙහි ශ්‍රීපාදයෙන් ශ්‍රීපාද ය තබ තබා ශ්‍රීපාදයෙහි අවතුරාසියක් මිඟුල්ලකුණු සියලු සත්ත්වයන්ට දක්ව දක්වා බස්නට පටන් ගත් සේක.

එ කල සියලු සත්ත්වයෝ ම මිණිසැමපත් පෙණෙන්නා සේ දිලියෙන බුදුන්ගේ ශ්‍රීපාද දැක බුදුන් බස්නා ලීලා දැක "බුදු රජානෝ රන්පෙත්තට බටසේක. රිදීපෙත්තට බටසේක. සුරක්ත වූ ශ්‍රීපාද ය දවාණපෙත්තෙහි තබා වදාළ සේක. අනික් ශ්‍රීපාදය ඉඳුනිල්මිණි පෙත්තෙහි තබා වදාළ සේක. ලෝහිතඞ්ක පෙත්තට බට සේක. මසාරගල්ල පෙත්නට බට සේක සත්රුවන් හිනිපෙත්තට බට සේක. බුදුන් දකුණුපස්ල ඔසවන්නා බලව. වම්පස්ල ඔසවන්නා බලව. බුදුන්ගේ ශ්‍රීපාදයෙහි සක්ලකුණු බලව. සුවහස් දැවි පෙණෙන්නා බලව. පිදුමුව පෙණෙන්නා බලව. ස්වස්තික පෙණෙන්නා ය. රුවන් පෙතිවල මහිම ත් අප බුදුන්ගේ ශ්‍රීපාදවල මහිම බලව. අපට ම හොබනේම ය"යි කිය කියා මුව නො පොහොනා සේ සාධුනාද කොරමින් සිටිනාහු ය.

එ කල ශක්‍රදේවෙන්ද්‍රයා පක්ෂපාත වූ හුදිගසු සේ ස්වාමිදරුවන්ගේ සුගත් සඟළ හා පාත්‍රය තමා ඉස්මුදුනෙහි තබාගෙණ දැතකින් ඒ පාත්‍රසිවුරු මහවඟා තමාගෙණ අනික් දැතින් තමාගේ විජයතුරු නම් සක තුඩ තබා පිඹ තුන්ලොවට ඇසෙන සේ මහත්වූ ශබ්දනාදයෙන් බුදුන් පුද පුදා බුදුන්ට පලමු ව ලා බස්නේ ය. දසදහසක් ශක්‍රදෙවෙන්ද්‍රයෝ දසදහසක් විජයතුරුසක් පිඹිමින් දකුණැලයෙහි රන්හිත පෙති පෙත්තෙහි සිටගත්හ. දසදහසක් සුයම් රජහු ද දසදහසක් මිණි වාමරගෙණ දසදහසක් මිණිපෙතිවල සිටගත්හ. දසදහසක් සන්තුෂිත රජහු ද දසදහසක් මිණිතල්වැට ගෙණ, දසදහසක් රන්පෙත්තෙහි සිටගත්හ. දසදහසක් සුනිර්මිත රජහු ද එසේ ම පූජාභාණ්ඩ ගෙණ දසදහසක් පෙත්තෙන් බසිති. දසදහසක් පරනිර්මිත රජහු ද මහත් වූ

උත්සවයෙන් බුදුන් පුද පුදා බස්නට වන්හ. වාමභාගයෙහි රිදී හිනින් දසදහසක් සහම්පති මහාබ්‍රහ්මරාජයෝ ද සඳහසක් සඳ මඬුලු සේ සේසත් ගෙණ බුදුන් පුද පුදා බස්නට වන්හ. අවශෙෂ වූ බ්‍රහ්ම රාජයෝ ද පෙතිපෙත්තෙහි සිට ගත්හ. මෙසේ දකුණැල යෙහි රන්හිනි සංකස්පුර දොර පටන් මෙර මුදුන දක්වාම පෙති පෙත්තෙහි අතුරු නො දී සිටගත්තා වූ දිව්‍යසේනාව ඇගෑලෙන පහන් පෙළක් දිලියෙන්නා සේ එකාකාරයෙන් සිටගත්හ. වමැ'ල යෙහි රිදීහිනි ද, පෙතිපෙත්තෙහි සිටගත්තා වූ බ්‍රහ්මසේනාව සංකස්පුර දොර පටන් පෙරමුණ දක්වා ම එසේ ම එකාකාරයෙන් සිටියහ. ස්වාමිදරුවන් බස්නාවූ රුවන් හිනෙහි පය ගානාවූ එ ය ද දෙවියෙක් බඹෙක් නැත, සක්වළගත්ව එකී දූ එක් පෙළගැසෙත. එ කල ස්වාමිදරුවෝ ඒ දිව්‍යබ්‍රහ්ම සේනාව මධ්‍යයෙන් මුළු ලොව සාධුකාර දෙමින් මෙසේ බස්නා සේක.

එ කල රන්හිනින් බස්නාවූ තමන්ට අවකාශ නැති හෙයින් දසදහසක් පඤ්චශිඛ දිව්‍යපුත්‍රයෝ තුන්ගවු පමණ ඇති දසදහසක් බෙලුවපාණ්ඩුනම් දිව්‍ය වීණාගෙණ, සුවහස්ගණන් තතින් සරනා ගවු පමණ දසදහසක් වීණා පඩකතීන් එක පැහැර බුදුගුණ ගායනා කෙරෙමින්, පණස් පණස් යොදනෙහි රනම්බුලු බැඳගෙණ පෙළ පෙළ දී බස්නට පටන් ගත්හ. දසදහසක් මාතලි නම් දිව්‍යරථාචාරීහු, දසදහසක් දිව්‍යඅශ්වයන් යෙදූ දසදහසක් වෛජයන්ත රථ ගෙණ, නො එක් ධවජපතාකාදි පූජා පෙරහරින් අලඞ්කෘත කොට තමන් තමන්ගේ සුවහස් ගණන් දිව්‍යසේනාව ගෙණ, පෙළ පෙළ දී බස්නට පටන් ගත්හ. දසදහසක් ඓරාවණ නම් දිව්‍ය රාජයෝ තෙතිස් කුම්භයෙහි මවන ලද දළ හා, දළෙහි මැවූ පොකුණු හා, පොකුණෙහි මැවූ පියුම් හා, පියුම්පෙතිවල නටන දෙවඟනන් හා හා සමඟ, තුන්ලක්‍ෂ තෙතිස් දහසක් සොඬ නඟා තුන්ලක්‍ෂ තෙතිස් දහසක් සේසත් බුදුන්සිරසට කෙරෙමින් ආකාශයෙන් පෙළ පෙළ දී බස්නට පටන් ගත්හ. සෙසු නට නටා දිව ගී කිය කියා, දිවවීණා ග ගා, දිවකුලල් පිඹ පිඹ, බුදුන් පුද පුදා, බස්නා දෙවඟනන් හා දිව්‍යතළුවෝ මෙ තෙනැයි පමණ නැත.

මෙසේ නො එක් පූජා පෙළහරින් අහස්කුස මුළුල්ලෙහි දෙවියන් මැවූ දිවමඬු, දිව්තොරණ, රුවන් ඇගෑ, පහන් ඇගෑ, ධජ, පුන් කලස මෙ තෙනැයි පමණ නැත. බුදුන්ගේ දහස්ගණන් ජය කාහල කිය කියා, ජයකාලම් පිඹ පිඹ, බස්නා. දෙවියෝ මෙ

1 මෙර බුදුන්.

නොනැ යි ගණන් නැත. දහඹල් ආකාශයෙහි තරු පිපි ගිය. මහ පොළොවෙහි සත්රුවන් ඉපිල ගිය. මහ මුහුද සිය දහස් යොදුන් දිග මත්ස්‍යරජයෝ ඉපිල පැනනැඟී බුද්ධ ශ්‍රී විඳ විඳ බල තම පටන් සත්ත සියලු සතුන් ඇස් නිවි ගිය සිත් නිවි ගිය, කන් නිවී ගිය.

එ වේලෙහි මාගේ ස්වාමිදරුවන්ගේ ඒ බුද්ධ ශ්‍රී හා බුද්ධමහිම හා බුද්ධානුභාව හා බුද්ධ පූජා දැක, අවසථා නො දැක, පිරූ පාරමිතාවක් නැති ම, අවිෂය දෙයක් බලව, නොදැක, මම බුදුවෙම් යි මම් බුදු වෙම්ව යි නො පැතුවාවූ එකද සත්ත්වයෙකුත් නැත සියලු සත්ත්වයෝ මම බුදු වෙම් ව යි මම් බුදු වෙම් ව යි කිය කියා වෙන වෙන ම ප්‍රාර්ථනා කළහ. එදවස් තබා මෙ දවස් වී නමුත් ඒ මාගේ බුදුන්ගේ ඒ පෙළහරපූජාව හා, එ දවස් ඔබගේ බුද්ධානුභාව හා මා සිතට විශෙෂයෙන් දුන් දුනීගියා සේ සියලු සත්ත්වයන්ට විශෙෂයෙන් දුන් දුනී ගියා නම් දැකු දු බුදුබැවුහි ලොභ නො කරණුවෝ කවුරු ද, එ බඳු වූ පුරුෂබල පරාක්‍රමයෙක් කවර නම් සත්පුරුෂ කෙනෙකුන්ට මිහිරි නො වේ ද, එසින් ස්වාමිදරුවන් එ දවස් ලද්දා වූ පූජා මහිම ය නු බුදු ව කවර නම් සත්ත්වයෙකුන් සියක් දහසක් ලක්‍ෂයක් මුඛ මවා ගෙණ ත් කියා නිමවාලන්ට පොහොසත් වෙද් ද, මෙසේ අපරිමෙය වූ බුද්ධලීලායෙන් රුවන් හිනින් බැස අනන්තාපරිමාණ වූ බුදුහුදු මෙසේ ම දෙව්ලොවින් බැස පළමු වන ශ්‍රීපාදය පිහිටුවා වැඩ සිටිනා අවිජයිත භූමියට බැස, සරත්සිරි මඩලක් සේ දිලිහී දිලිහී වැඩසිටි සේක.

අනන්තාපරිමාණ වූ බුදුන් ම යමා මහ පෙළහර පෑම ද, එසින් සෙස් තවුතිසා භවනයෙහි වස් විසීම ද, එහි දී දෙවියන්ට විජම් දෙසීම ද, දෙසූ බණ පළමු කොට අග්‍රශ්‍රාවක වූ මහතෙර කෙණකුන් ධැරීම ද, වස් අන්තයෙහි එම පූජාවෙන් දෙව්ලොවින් සකස්පුර දොරට බැස මෙම භූමියෙහි වැඩසිටීම ද, එ කෙණෙහි මහපිරිසට පළමු කොට එ ම අග්‍රශ්‍රාවක වූ මහතෙරුන් ගොස් බුදුන් වැඳ දෙහොත් මුදුන් දී සිට බුදුන්ගේ ගුණ කිය කියා සිංහ නාද කිරීම ද, එකාන්ත වූ ධර්මතායෙක් ම ය.

සෙසු බුදුන් තබා දීපඞ්කර නම් බුදුන් මෙසේ ම මහ පූජාවෙන් දෙව්ලොවින් බැස අසුරියන් බුද්ධකායෙහින් මෙම භූමියෙහි දිලිහී දිලිහී වැඩසිටි දවස් මහපිරිසට පළමු කොට ගොස් සුමඞ්ගල නම් අග්‍රශ්‍රාවක වූ මහතෙරකෙණෙක් ඔබ ශ්‍රීපාද වැඳ සිටියහ.

කොණ්ඩඤ්ඤ නම් බුදුන් දෙව්ලොවින් බැස අට අසූරියන් බුද්ධ කායෙකින් වැඩසිටි දවස් භද්‍ර නම් මහතෙරහු පලමු ව ඔබ ශ්‍රීපාද වැද සිටියහ. මඞ්ගල නම් බුදුන්ට අට අසූරියන් බුදුබඳින් වැඩ සිටි දවස් සුදෙවු නම් මහතෙරහු ඔබ ශ්‍රීපාද වැද සිටියහ. සුමන නම් බුදුන් එසේ ම රුවන් හිනින් බැස අනූරියන් බුදුබඳින් රන් මෙරක් සේ වැඩසිටි දවස් සරණ නම් මහතෙරහු ඔබ සරණ වැද සිටියහ. රේවත නම් බුදුන් එසේ ම දෙව්පිරිස් පිරිවරා බැස අසූරියන් බුදුබඳින් තුන්ලෝ තිලකයක් සේ වැඩසිටි දවස් වරුණ නම් මහතෙරහු පලමු ව දිව ගොස් ඔබ ශ්‍රීපාද වැද සිටියහ. සොභිත නම් බුදුන් අටපණස්රියන් බුද්ධකායෙකින් එම භූමියෙහි බැස සිටි දවස් අසම නම් මහතෙරහු එ සමියෙහි වැද සිටියහ. අනොම දස්සී නම් බුදුන් අටපණස් රියන් බුදුබඳින් කප් රුකක් සේ වැඩසිටි දවස් නිසභ නම් මහතෙර කෙනෙක් පලමු ව ගොස් වැද සිටියහ. පදුම නම් බුදුන් අට පණස් රියන් බුද්ධ කායෙකින් වැඩසිටි දවස් ශාල නම් මහතෙර කෙනෙක් ඔබ ශ්‍රීපාදය වැද සිටියහ. නාරද නම් බුදුන් අටාසූරියන් බුදුබඳෙකින් සරච්චන්ද්‍රයා සේ වැඩසිටි දවස් භද්‍රශාල නම් මහතෙර කෙනෙක් ඔබ ශ්‍රී පාදය වැද සිටියහ.

පියුමුත්තරා නම් බුදුන් අට පණස් රියන් උසින් තේජො කඳක් සේ දිලිසි දිලිසී දෙව්ලොවින් බැස වැඩසිටි දවස් දෙවෙල නම් මහතෙර කෙනෙක් ඔබගේ පතුල් වැද සිටියහ. සුමෙධ නම් බුදුන් එසේ ම මහාපූජාවෙන් වැඩ තුන්ලොවට රසායනයක් සේ අට අසූරියන් උසින් වැඩසිටි දවස් දෙරණ සේ ගුණ ඇති ශරණ නම් මහතෙර කෙනෙක් පලමු ව අවුත් ඔබගේ පා වැද සිටියහ. සුජාත නම් බුදුන් පණස් රියන් උසින් හිරිව්මතක් සේ වැඩසිටි දවස් සුදස්සී නම් මහතෙර කෙනෙක් ඒ බුදුන් පා වැද සිටියහ. පියදස්සී නම් බුදුන් අසූරියන් බුදුබඳින් රන්කඳක් සේ වැඩසිටි දවස් පාලිත නම් මහතෙර කෙනෙක් ඔබ පා වැද සිටියහ. අත්ථ දස්සී නම් බුදුන් එසේ ම රුවන් හිනින් බැස අසූරියන් උසින් තුන්ලෝ පහනක් සේ වැඩසිටිදා ශාන්ත නම් මහතෙර කෙනෙක් ඔබගේ ශ්‍රීපාදය වැද ලෝකශාන්තියක් සේ වැඩසිටි සේක. ධම්ම දස්සී නම් බුදුන් අසූරියන් කසින් දිව්‍යද්‍රුමයක් සේ වැඩසිටි දවස් පදුම නම් මහතෙර කෙනෙක් පලමු ව බුදුන් වැද සතුති සිංහ නාද කළහ. සිද්ධාර්ථ නම් බුදුන් සැටරියන් බුදුබඳින් බැස එම භූමියෙහි වැඩසිටි දවස් සම්බහුල නම් මහතෙර කෙනෙක් ඔබ ශ්‍රීපාද වැද ප්‍රියබාහුල්‍යයෙන් සිටියහ.

තිස්ස නම් බුදුන් දෙව්ලොවින් බැස සැටරියන් බුද්ධ කායෙකින් වැඩසිටි දවස් සතොතාෂයෙන් මත් වූ බ්‍රහ්ම දෙව නම් මහතෙර කෙනෙක් ඒ බුදුන් වැඳ සිටියහ. ඵුස්ස නම් බුදුන් විජම් බණ වදරා මෙම දෙමොරොහණ පූජා ලදින් අට පණස් රියන් ශ්‍රීශරීරයකින් දිලිහි දිලිහී වැඩසිටි දවස් සුරක්ෂිත නම් මහතෙර කෙනෙක් ඔබ ශ්‍රීපාද වැඳ සිටියහ. විපස්සි නම් බුදුන් අසූරියන් බුද්ධකායෙන් අසූ අනුබ්‍යඤ්ජනයෙන් දිලිහි දිලිහී වැඩසිටි දවස් ඛණ්ඩ නම් මහතෙර කෙනෙක් පළමු ම ඔබ ශ්‍රීපාද වැඳ සිටියහ. සිඛි නම් බුදුන් තුන්ලෝ සිඛි කොරම්හ් රුවන් හිනින් බැස සැත්තෑරියන් බුද්ධකායෙකින් වැඩ සිටි දවස් අභිභූ නම් මහතෙර කෙනෙක් සියලු පිරිස් අභිභවමින් අවුත් ඔබ ශ්‍රීපාද වැඳ සිටියහ. වෙස්සභූ නම් බුදුන් එසේ ම බැස සැට රියන් උසින් තුන්ලෝ ප්‍රදීපයක් සේ දිලියෙමින් වැඩසිටි දවස් සොණ නම් මහතෙර කෙනෙක් ඒ ශ්‍රීපාද වැඳ සිටියහ. කකුසඳ නම් බුදුන් සතළිස් රියන් බුද්ධකායෙන් දෙව් බඹ පිරිස් මැදින් බැස සිටි දවස් විධුර නම් මහතෙර කෙනෙක් ඔබ ශ්‍රීපාද වැඳ සතුති පූජා කොට සිටියහ. කොණාගමන නම් බුදුන් තිස් රියන් බුද්ධකායෙකින් ශ්‍රීමත් ම වැඩසිටි කල්හි සඤ්ජය නම් මහතෙර කෙනෙක් ඔබ ශ්‍රීපාද වැඳ වැඳ පළමු ම කථාකළහ. කාශ්‍යප නම් බුදුන් විසිරියන් බුද්ධකායෙකින් දිලිහි දිලිහී වැඩ සිටි දවස් තිස්ස නම් මහතෙර කෙනෙක් මහපිරිසට පළමු ව අවුත් බුදුන්ගේ ශ්‍රීපාදය වැඳ බුදුන් හා ප්‍රියකථා කළහ.

මෙසේ පූර්වයෙහි වූ අග්‍රශ්‍රාවකයන් කොට ආමා වූ සිරිතක් ම හෙයින්, මාගේ බුදුරජාණන් වහන්සේ ද දෙමොරොහණ පූජා වෙත් දෙව්ලොවින් බැස රුවන් හිණිපාමුල පූර්ව බුද්ධ භූමියෙහි අෂ්ටාදශ හස්ත වූ බුද්ධකායෙකින් ශ්‍රීමත් ව වැඩසිටි වේලෙහි, සැරියුත් මහ තෙරුන් වහන්සේ ද මහ සෙනඟට පළමු ව බුදුන් පෙරටු ගොස් සිට බුදුන්ගේ ශ්‍රීපාදමූලයෙහි හිස තබා වැඳ නැඟී සිට දෙහොත් මුදුනෙහි තබා ගෙණ,

න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ – න'ස්සුතො උද කස්සචි,
එවං වග්ගුවදො සත්ථා – තුසිතා ගණිමා'ගතො–ති.

යනාදීන් බුදුන්ට සතුති කොට "තුන්ලෝ මුදුන් වූ බුදුරජාණෙනි! නුඹ වැනි වූ නිමක් මැහැති කෙණකුන් ලදිමි. නුඹ සේ වූ නිමන්පියාන කෙණකුන් ලදිමි. නුඹ සේ වූ ගුරුකෙණකුන් ලදිමි.

තුඹසේ වූ කල්‍යාණමිත්‍රයකු ලදිමි. තුඹසේ වූ දිව්‍යනේත්‍රයක් ලදිමි. තුඹසේ වූ තිලකාභරණයක් ලදිමි. තුඹසේ වූ මුදුන් මල් කඩක් ලදිමි. තුඹසේ වූ චූඩාමාණික්‍යයක් ලදිමි. තුඹසේ වූ ලයක් ලදිමි. තුඹසේ වූ රක්ෂාස්ථානයක් ලදිමි. තුඹසේ වූ චින්තාමාණික්‍යයක් ලදිමි. තුඹසේ වූ භද්‍රඝටයක් ලදිමි. තුඹසේ වූ කල්පද්‍රැමයක් ලදිමි. තුඹසේ වූ නේත්‍රාංජනයක් ලදිමි. මේ මේ කාරණයෙන් මා සේ වූ භාග්‍යවන්තයෝ නැත. ස්වාමීනි! අද තුඹවහන්සේගේ මේ බුද්ධශ්‍රී බලා බුදුවෙම්හ යි නො පැතූ එක ද දිව්‍ය-මනුෂ්‍ය කෙනෙක් නැත. මේ දසදහසක් සක්වළ රැස්වූවවුන් අතුරෙන් සියලු දිව්‍ය සේනාව හා යක්ෂ ගෝත්‍රකෙහි සිටි මහපිරිස තුඹවහන්සේ කෙරෙහි අතිප්‍රසන්න වූ බොහෝ දෙන ම බුදුබැවු පැතූහ. ස්වාමීනි! ඔහු හැම දෙන ම මතු බුදුවෙත් ද" යි විචාළ සේක.

එ වේලෙහි බුදුහු "ශාරිපුත්‍ර ස්ථවිරය! බුදු වම්හ යි පැතූ සියල්ලවුන්ට ම බුදු බැවු සිද්ධවන්නෝ ම වේ ද" යි වදාළ සේක. එ කල සැරියුත් මහ තෙරුන් වහන්සේ "ස්වාමීනි! පාරමිතා නුපුරා පූජ් හේතුමක් නැති ව, මේ පමණ සන්තානයෙකින් කළ වූ ප්‍රාර්ථනාව ගෙණ බුදුවන්නෝ කෙසේ ද" යි විචාළ සේක. එහි විභාග මෙසේ දතයුතු.

මේ ලෝකත්‍රයෙහි කළ මහා සියලු ප්‍රාර්ථනාවෙන් බුදුවෙම් ව යි ප්‍රාර්ථනා කිරීම නම් විශිෂ්ට ඇත්තාහට ත්, නැත්තාහට ත් උතුම් වූ ප්‍රාර්ථනාවෙක් ම ය. බුදුවම්හ යි ප්‍රාර්ථනා කොට පින් රැස්කළ කල අධික වූ විශිෂ්ට ඇත්තාහු ලොවුතුරු බුදුබවු ම සාධා ගණිති. මධ්‍යම වූ විශිෂ්ට ඇත්තාහු ප්‍රත්‍යෙකබෝධිය සාධා ගණිති. සාධාරණ වූ විශිෂ්ට ඇත්තාහු අසාධාරණ වූ ශ්‍රාවක බෝධිය සාධා ගණිති. එසේ හෙයින් බුදුබවු ප්‍රාර්ථනා කළාහට මේ තුන්බෝධියෙන් එක් බෝධියෙක් සිද්ධ වේ ම ය. යම් සේ තුන් තොටක් ඇති මහත් වූ ගඞ්ගාවකට බැස දිශකපා පිහිනන්නා වූ පුරුෂයෙක් මත්තෙහි තොටින් නැගෙම් යි සිතා විශිෂ්ට කොට පිහිනන කල පුරුෂයේ වී නම් එම තොටින් නැගෙයි. එ තොට වරදවාපුයේ වී නම් මැද තොටින් හෝ නැගෙයි. එ තොට වරදවාපුයේ වී නම් තුන්වන තොටින් ගොඩ නැගේ ම ය. බුදුවන්ට ප්‍රාර්ථනා කළ කල මත්තෙහි තොටින් නැගෙමි යි පිහිනුමා මැන්න. ඔහට තුන් තොටින් එක් තොටකින් නැගීම ඒකාන්ත වන්නා සේ ම බුදුවන්ට පැතුමාහට ද තුන් බෝධියෙන් එක් බෝධියක් ඒකාන්ත වේ ම ය.

මේ මේ කාරණයෙන් බුදුහු "ශාරිපුත්‍රය! මේ සියලු සත්ත්වයන්ට ම අද උන් කළා වූ ප්‍රාර්ථනාව තුන් බෝධියෙන් එක් බෝධියක් සිද්ධ කොට දෙන හෙයින් සාර්ථක වූ ප්‍රාර්ථනාවෙක් ම ය. එසේ හෙයින් බුද්ධාදි වීරපුරුෂයෝ දිව්‍ය-මනුෂ්‍යයන්ට ප්‍රියවන්තාහු ම ය" යි වදාරණ සේක් :—

යෙ ඣානපසුතා ධීරා-නෙක්ඛම්මූපසමෙ රතා,
දෙවාපි තෙසං පිහයන්ති-සම්බුද්ධානං සතිමතං යි.

යන මේ ගාථාව වදරා නැවත එමවිට මි සිතන සේක් "මාගේ ශාසනයෙහි මුගලන් මහතෙරහු සෘද්ධිමතුන් කෙරෙහි අග්‍ර වූ තන තුරු ලදහ. අවශේෂ වූ ශ්‍රාවකයෝ ද වෙන වෙන ම තමන් තමන්ට සුදුසු වූ ස්ථානාන්තර ලදහ. මාගේ ශාසනයෙහි සැරියුත් මහා ස්ථවිරයන්ට වඩා ප්‍රඥාවන්ත කෙනෙක් අද මේ මුළු තුන් ලෙව්හි මි නැත. බුද්ධඥානයට අනුරූප ම පවත්නා වූ ඥානගති ඇතියහ. ඔහුගේ ඥානය ව ලක් තබත් හොත් පසළොස්මහා ගඞ්ගා වෙහි වැලි මිඳ, මුහුදු දිය බිඳු මද, පොළොව පස්බිඳු මද, ඔහුගේ නුවණ බොහෙව. බුද්ධඥානයෙන් මා විසින් දෙසුවා වූ අභිධර්මය එක ශ්‍රැතියෙන් විශේෂයෙන් ධරාගත. අද මේ මහ පිරිස මධ්‍ය යෙහි මොහුගේ නුවණ බල පරාක්‍රම දක්වා මහපිරිය විස්මය පත් කරවා, මෝහට නුවණැතියන් කෙරෙහි අග්‍ර වූ ස්ථානාන්තර දුන් ම දෙමි" යි සිතා මොලොක් වූ උත්තාන පැනයක් වදාළ සේක. ඒ විපැනය පෘථග්ජනයෝ කිහ. ඔවුන්ට නො දෙනෙන අතික් පැනයක් වදාළ සේක.

එ පැනය අසා පෘථග්ජනයෝ තුෂ්ණීම්භූත වූහ. එ පැනය සෝවාන් මාර්ගඵල ලදුවෝ කිහ. අතික් පැනයක් වදාළ සේක. එ පැනයට සෝවාන්හු තුෂ්ණීම්භූත වූහ. සෙදගැමි මග ලදුවෝ කිහ. අතික් පැනයක් වදාළ සේක. එ පැනය සෙදගැමි මග ලදුවන්ට නො දනෙයි. අනාගාමි කිහ. අතික් පැනයක් වදාළ සේක. එ පැනය අනාගාමීන්ට නො දනෙයි. ක්ෂීණාශ්‍රවයෝ කිහ. අතික් පැනයක් වදාළ සේක එ පැනය නිකම් ක්ෂීණාශ්‍රවයන්ට නො දනෙයි. ත්‍රිවිද්‍යාප්‍රාප්ත වූ මධ්‍යම ක්ෂීණාශ්‍රවයෝ කිහ. අතික් පැනයක් වදාළ සේක. එ පැනය මධ්‍යම ක්ෂීණාශ්‍රවයන්ට නො දනෙයි. ෂඩ් අභිඥාප්‍රාප්ත වූ ක්ෂීණාශ්‍රවයෝ කිහ. අතික් පැනයක් වදාළ සේක. එ පැනයෙහි අප සියලු සතුන්ට නො දනෙයි. දළ යෙහි සිටි සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ ඔවුනොවුන් පරයා කී සේක. අතික් පැනයක් වදාළ සේක. එ පැනය මුගලන්

මහ තෙරුන් වහන්සේට ත් නො දැනෙයි. ධම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ සියුම් කරයකින් ඇඹුල දන්ඩක් නො පැකිල කපා හළුවා සේ පැකිලීමක් නැතිව ම කියාපු සේක.

එ කල බුදුහු බුද්ධඥානය අතිගම්භීර නියාව මොහට ද, සියලු සතුන්ට ද, ගහවා මොහුගේ ද නය දන්නා නුවණ ප්‍රසිද්ධ කෙරෙමි යි සිතා බුදුකෙණකුන් මුත් අනික් සත්ත්වයක්හට අවිෂය වූ අති ගම්භීර වූ ප්‍රශ්නයක් විචාළ සේක. එ වේලෙහි සැරියුත් මහ තෙරුන් වහන්සේ බුදුන් විචාළ පැනය අතිගම්භීර හෙයින් විශෙෂ යෙන් අඩ නො දැක මුහුදු පීනා ගොඩක් නො දැක ඔබිනොබ දිවන්නා වූ ශූරපුරුෂයකු සේ සඬම්සාගරයට වැද හලලා නො යෙක් නය කල්පනා කොට තෙරක් දක්ක නො හෙන සේක. එ වේලෙහි ස්වාමිදරුවෝ "භූතමිදං සාරිපුත්ත" යි යන මේ අකුරු සතරින් කිසියම් නයක් දීලූ සේක. ඒ ශ්‍රාවකපිරිසෙන් බුදුන් විචාළ නය කුමක් බව ත් දතුවෝ නැත. එ කල සැරියුත් මහ තෙරුන් වහන්සේ එ පමණ නයෙකින් බුදුන් විචාළ නය විශෙෂ යෙන් අඩ දැක සිය දහස් ලක්ෂ කොටිගණින් නය හෙණහැර දක්වා දක්වා ප්‍රශ්නව්‍යාකරණය කරන්ට පටන්ගත් සේක.

එ වේලෙහි ස්වාමිදරුවෝ මහතෙරුන් වහන්සේ ප්‍රශ්න ව්‍යාකරණය කර ත් කර ත් ප්‍රියපුත්‍රයකුගේ ශිල්ප බලන්නා වූ පෙම්බර පියානකෙනකුන් සේ "සාධු සාධු ශාරිපුත්‍රය! තෝ ඉතා නය දන්නා සූක්ෂම ඥාන ඇතියෙහි ය. බුදුන් අදහස් නො වරදවා කියන්නෙහි ය. බුදුන්ට අනු වූ ඥානසම්පත් ඇතියෙහි ය" යනාදීන් මහ තෙරුන් වහන්සේට සතුති කොට වදරා තෝ මාගේ ශාසන යෙහි ඥානවන්තයන් කෙරෙහි අග පැමිණියෙහිය යි නුවණැත්ත වුන් කෙරෙහි අග්‍ර වූ ස්ථානාන්තර නමැති මහා ප්‍රාසාද දුන් සේක. එ කල සියලු දිව්‍ය-මනුෂ්‍යයෝ මහ තෙරුන් වහන්සේගේ නුවණ බලවික්‍රම දැක අතිප්‍රසන්න වූවාහු ආතත විතතාදි පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය එක පැහැර හවඅග දක්වා ඇසෙන සේ මහා පූජා කළහ.

මෙසේ වූ ප්‍රඥාබලයක් කෙසේ වූ පින්බලයෙකින් ලද සේක් ද? යත්; මේ සැරියුත් මහ තෙරුන් වහන්සේ ගිය ජාතියෙක පුස් පත් ගෙඩියක් හා පත්කිඩක් පමණ බණක් ලියන්ට දන් දුන් සේක. එ පමණ වූ කුශලයෙකින් මේ පමණ වූ ඥාන බලපරාක්‍රම

යක් ලද සේහැ යි දතයුතු. එ වේලෙහි සවාමිදරුවෝ මෙසේ සැරියුත් මහ තෙරුන් වහන්සේගේ ප්‍රඥාව මුළුලෝ වාසීන්ට දක්වා ඒ පර්ෂදට තරම් වූ ධර්මදේශනා කොට වදාළ සේක. එ වේලෙහි තිස්කෙළක් ප්‍රාණීහු අමාමහ නිවන් දුටහ.

මෙසේ මේ දේවාවරොහණ පූජාවෙහි ම සක්දෙව් රජහු විසින් මවන ලද ත්‍රිවිධ වූ දිව්‍යභෝජ්‍යපාන පූජා ය, දෙතිස් පූර්වනිමිත්ත පූජා ය, වරුණ ශක්‍ර සුයාම සන්තුෂිත සුනිර්මිත පරනිර්මිත පඤ්චශිඛ මාතලි වෛරවණාදි දශ දහසක් සක්වළ දිව්‍යරාජයන්ගෙන් දක්වූ එක්ලක්ෂ විසිදහසක් දිව්‍යරාජ පූජා ය, අරූතල අසංඥතල යන් හැර දස දහසක් සක්වළ බ්‍රහ්මරාජයන් කළ එක්ලක්ෂ පණස් දහසක් බ්‍රහ්මරාජ පූජාය යි, දෙලක්ෂ සැත්තෑ දහස් පන්තිස් මහා පූජාවක් ලත් හෙයිනු ත්, සංඛ්‍යාපථයට අවිෂය වූ යෝ කියන ලද අසංඛ්‍යගණන් පූජා ලත් හෙයිනු ත්, එසේ වූ පූජා විඳිමට සුදුසු හෙයිනු ත්, මාගේ ම සවාමිදරු වූ, තුන්ලොවට මෙ සා බුදුමහිම යක් දක්වා නිවන් අමා බෙදූ දීලූ බුදුරජාණෝ මෙ මේ කාරණ යෙනු දු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලදී :–

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො.
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං යි.

මේ පූජාවලියෙහි අප බුදුන් සඞ්කස්පුර දොර දී ලද
දෙවොරොහණ පූජා කථා නම් වූ
පස් විසි වන පරිච්ඡේදය නිමි.

සවිසි වන පරිච්ඡේදය

තව ද: අප බුදුන් මහාප්‍රජාපත්‍යාදි භික්ෂුණීන්ගෙන් ලද ප්‍රතිපත්ති පූජා නම කවර? යත්;

ඒ මහා ප්‍රජාපතී ගෞතමීන් වහන්සේගේ දූන් මං විසින් කියන ලද පිළිවෙළ කථාව සත්පුරුෂ වූ ස්ත්‍රී-පුරුෂයන් විසින් සාවධාන ව අසා බුදුබල දතයුතු.

උන්වහන්සේ නම් දෙවුදූනෑ නම් වූ කොළිය නුවර මහා සුප්‍රබුද්ධ නම් වූ අඤ්ජන ශාක්‍ය රජ්ජුරුවන්ගේ දියණියන් වහන්සේ ය. කිඹුල්වත්පුර සිංහහනු රජ්ජුරුවන්ට නෑ වූ සුද්ධෝදන රජ

ජුරුවන් නැන්දණියන් සුලක්ෂණා නම් වූ මහා යශෝධරා දෙවීන් කුසින් උපන්හ. ඔවුන්ට නම් තබනා මගුලෙහි රැස් වූ නක්ෂත්‍ර පාඨකයෝ ඔවුන්ගේ පඤ්චකල්‍යාණ ආදි වූ නො එක් ස්ත්‍රී මගුල් ලකුණු බලා "මේ කුමාරිකාවෝ මතු පුතකු වැදූ නම් එ පුතු සක්විති රජ වෙයි. දුවක වැදූ නම් එ දූ සක්විති රජක් හට අග බිසෝ වෙයි. තම දු අතික් උතතම ස්ත්‍රියක කුසින් උපන් පුතකු දූ මොවුන්ගේ ම ඔර වැඩී එ පුත් දෙවියකු දූ අතින් මැදුම් ගන්නා තරම මහත් වූ පින් බල ඇති වෙයි, මේ මේ කාරණයෙන් මොහු ලනා මහත් වූ පුත්‍ර පූජාවට පණී වන පින්වත් හෙණෙකැ යි ඔවුන් ව සෙසු නමෙකින් නම් කැතැයි මහා ප්‍රජාපතී ය යි නම් තබා ගියහ. මේ කාරණයෙන් ගෝත්‍ර නාමය හා සමග මහා ප්‍රජාපති ගෝතමී ය යි මෙ නමින් ප්‍රසිඬ වූහ. ඔහු මහාමායා දේවීන් නැගණියහ.

ඔහු දෙදෙන ම ඔවුනොවුන් පරයන ගුණ හා පඤ්චකල්‍යාණ රූසිරි ඇතියහ. දෙදෙන ම එකපද්මයෙක්හි මාසයතරණ ශ්‍රීකාන් තාවන් දෙදෙනකු සේ සුද්ධෝදන රජ්ජුරුවන් කෙරෙහි අග මෙහෙසිනී ව වැඩ මහාමායා දෙවී අප බුදුන් වදා, ඔබ උපන් සත් වන දවසින් මිය තුසී පුරෙහි මාතෘ නම් පුරුෂ දිව්‍යරාජයෙක් ව ඉපැද සියලු දිව්‍ය ඓශ්වය්‍යී බලා බුදුන් වැදූ පිණින් ලද්දාවූ දිව්‍ය ඓශ්වය්‍යී කිශාම දැක පුතනුවන් මහත්සේ කෙරෙහි උපන් මහත් වූ ප්‍රේමයෙන් එ කෙණෙහි ම දෙව්ලොවින් දිව අවුදින් දිව්‍ය ශ්‍රෙණාව හා සශග ශ්‍රී යශස් ගබඩාවෙහි අරක් ගත්හ. එ කල බුදුන් උපන් පස්වන දවසින් මහා ප්‍රජාපතී ගෝතමී නැඳ වන තෙරුන් වදා, එ පුතනුවන් කිරිමවුන්ව පාවා දී බුදුන් ම මහ පෙම් කොට වැඩූහ. එසේ හෙයින් ඔහුහුමු සවල්ප කෙණෙක් නො වෙති. බුදුන්ගේ කුඩා මෑනියහ, මහ පින්බල ඇතියහ. එසේ හෙයින් ඔවුන්ගේ විසිතුරු වූ කථා සත්පුරුෂයන්ගේ මුඛපද්මයන් ප්‍රබෝධ කරවයි, සිත් නමැති කෞමුදයන් පුබුදුවෙයි. කුසල් නමැති මහ ලියය මල් ගන්වයි, කණීයම රසායන කරවයි, එසේ හෙයින් සත් පුරුෂයන් විසින් සාවධානව ම ඇසිය යුතු.

මාගේ ස්වාමිදරු වූ ශාක්‍යසිංහෙන්ද්‍ර වූ තිලෝගුරු බුද්ධරජානන් යට කී ක්‍රමයෙන් ලොවුතුරා බුදු ව බන්ධුසංග්‍රහ පිණිස පලමු වන ගම නෙහි කිඹුල්වත් නුවර වැඩ ද සවස යමා මහ පෙළහර දක්වා බුඬ වංශ-අනාගත වංශ-චය්‍යීා පිටක-වෙස්සන්තර ආදි නො එක් දෙශනායෙන් ධර්මප්‍රවාහ කොට දෙවක දා ධ්‍යාන යව

කී ක්‍රමයෙන් සිඟා මැඩ වීථියෙහි දී වදාළ බණින් සුද්ධොදන රජ්ජුරුවන් සෝවාන් සෙදගැමි කොට රජගෙයි දී වදාළ අනුමෙවුනි බණින් මහා ප්‍රජාපතී ගොතමීන් සෝවාන් කොට පස්වරු යශොධරා දෙවීන්ගේ රජගෙයිදී වදාළ චන්‍දකින්නර ජාතක දෙශනාවෙන් ඔවුන්ගේද ශොක සන්සිඳුවා, තුන් වන දවස් නන්‍ද කුමාරයන් මහණ කොට, සත්වන දවස් රාහුල කුමාරයන් මහණ කොට, මහා ධම්මපාල ජාතක දෙශනාවෙන් සුද්ධොදන රජ්ජුරුවන් අනාගාමි කොට, යට කී ක්‍රමයෙන් ගම් නියම්ගම් රාජධානීයෙහි ලෝවැඩ වඩා වැඩ දෙවුරම් වෙහෙර වාසය කරණ කල්හි ශාක්‍ය කොළිය දෙ නුවර රජුන්ගේ රොහිණී නම් ගඞ්ගාවෙහි දී දිය ඩබරක් නිසා මහා සංග්‍රාමයෙක් වි ය. කෙසේ වූ සංග්‍රාමයෙක් ද? යත්;

ශාක්‍ය-කෝළිය දෙනුවර වාසීහු එක් ව රෝහිණී නම් ගංගාව අවුරා බැඳ දෙභාගයකට දිය නගා ගොයම් කොට පැසවන්නාහු ය. පොසොන් මස පහරණ සැඩ මහ නියගෙහි ගඟ දිය මඳ ව දෙභාගයෙහි ම කරල් නගන ගොයම් මියන්නට පටන් ගත. එ කල දෙනුවර වාසීන්ගේ ක්ෂෙත්‍රපාලයෝ එක් ව කථා කරන්නාහු "ගඟා දිය දෙභාගයට මඳ, එක් භාගයකට ම යේ නම් ඒ භාගයෙහි ගොයම් පැසෙයි. දෙභාගයට දිය ගලහොත් දෙභාගයෙහි ම ගොයම් මියෙයි. අපගේ භාගයට ම දිය හැරපියව. අපගේ භාගයට ම දිය හැරපියැව"යි ඔවුනොවුන් අතින් දිය ඉල්වූහ.

එ කල කෝළිය නුවර ගොවි කියන්නාහු, "තොපගේ නුවර බඩසල් පිරීකියේ නම් තොප හා තොපගේ රජුන්ට සුව ය. අප හැමගේ බඩ පිරී නො යෙසි. අපි දිය නො දෙම්හ"යි කීහ. ශාක්‍ය නුවර ගොවී ද 'තොපගේ නුවර බඩසල් පිරී ගියේ නම් තොප හා තොපගේ රජුන්ට සුවය එද අප හැම් බඩ පිරී නො යෙසි. අප නො වෙහෙසව. අපි දු දිය නො දෙම්හ" යි කියා දිය බැන්දහ.

එ කල කෝළිය නුවර ගොවිහු එ දිය කැපූහ. එ කල කලහ වඩාගෙණ යත් යත් එකෙක් එකකු පහළ, දෙන්නෙක් දෙන්නකු පහළහ, සතර දෙනෙක් සතර දෙනකු පහළ. අට දෙනෙක් අට දෙනකු පහළ. සොළොස් දෙනෙක, දෙතිස් දෙනෙක, යනාදින් වසයෙන් දෙනුවර ගොවීහු ඔවුනොවුන් පැහැර දෙභාගයෙහි ම බල සම හෙයින් එක් භාගයෙක ගොවීන් පරදවා දිය උදුරා ගත නොහී දියධාරා දෙභාගයෙහි වෙන් වෙන් ව ඔවුනොවුන්ට උදලු මිටි අමෝරා ගෙණ සිටි කල්හි ඔවුනොවුන්ට ප්‍රහාර දීගන



මහා ප්‍රජාපතී ගොතමිය අනඳ තෙරුන්ගෙන් අෂ්ටගරුධර්ම පිළිගැණීමෙන්
උපසපන් බැව් ලැබීම. 567 පිට බලන්න (34-35

නො හී වාක් පරුෂයෙන් ජය ගණුම්හ යි ජාති සවතයෙන් බැණ ලජ්ජා කරම්හ යි කෝලිය කුමර ගොව්හු කියන්නාහු "කොල! තෙපි ශොණ ශෘගාලයන් සේ ඔවුනොවුන් කෙරෙහි ලජ්ජා නැති ව කුශ ගොත් නඟුන් පවා කලත්‍ර කොට ඥාතිසම්භෙද කරණ ශාක්‍යයන් ගේ ගැති කොල්ලෙනි! තෙපි අපට දිය නො දෙව්ද" යි කීහ. ශාක්‍යකුමර ගොව්හු එ බසව කිපී 'සජීබගයෙහි ශ්වෙතකුෂ්ඨ ඇති ව මල් වන් ගැහැණියක කුසින් කුෂ්ඨ ඇති ව මල් වන් මිනිසක් ගම දුව කොලොම් සිදුරෙහි දී උපන් ගස් ඔබැල්ලෙහි වවුලන් සේ උපන් අශරණ ව වැඩුනු කෝලියයන්ගේ ගැති කොල් ලෙනි! අපට දිය නො දෙව් ද" යි මෙසේ ඔවුනොවුන්ගේ රජදරුවන්ට කුල සටා කීහ.

එ වේලෙහි සමහරු තම තමන්ගේ නුවරට දිව දිව ගොස් තමන් තමන්ගේ ධුර මුදලිවරුන්ට කලහ බබර හා කීනූ කීනූම් එකක් දෙකක් කොට කීයෙන් නො කීයෙන් කියා සිදවූහ. ඔහු දිව දිව ගොස් එකක් දසයක් කොට කියා මහ ඇමතියන් ඉද වූහ. ඔහු කිපී කිපී ගොස් දසයක් විස්සක් කොට කියා යුවරජුන් සිත් කැලඹූහ. ඔහු ගොස් විස්සක් සියයක් කොට කියා සේනාධිපතීන් කලකිරවූහ. ඔහු කිපී දිව දිව ගොස් සියක් දහසක් කොට කියා තිය පිට ගල් ගැසූ මකුළුන් සේ රජුන් කෝපයෙන් මත් කරවාපීහ.

එ කල අසූ දහසක් ශාක්‍ය රජදරුවෝ සුළං දුටු ගිනිකඳන් සේ කෝගින්නෙන් දිලිහි දිලිහී තමන් තමන්ගේ ඇත් අස් රථ පාබල සෙනග ගෙණ "නඟුන් හා ඥාති සම්භෙද කරණ ශාක්‍යයන් ගේ කඩුවල මුවහත් ඇති නියාව කෝලියයන්ට පෑ බලම්හ. කෙහෙල්කඳන් සේ අද කෝලිය රජුන් පොලු ගසම්හ" යි වාසි කිය කියා දිව දිව අවුදින් විදුලිය සේ කඩුපත් බම බමා සියදහස් ගණන් සෙනහඩ සේ දුනු දිය වල අත් පොලු පොලා ගඞ්ගාවෙහි එක් භාගයෙක ඇනිලා සිටගත්හ.

එ තෙපුල් ඇසූ අසූදහසක් පමණ කෝලිය රජදරුවෝ ද ගිනි දුටු ලුණු සේ කිපී තමන් තමන්ගේ සිවුරඟ සෙනග ගෙණ "කොලොම් සිදුරෙහි උපන් අශරණයන්ගේ කඩුහරඹ ඇති බව ත් මුවහත් ඇති බව ත්, ශාක්‍යයන්ට හඟවා අලම්දන් සේ ඇසිල්ලෙකින් පොලු ගන්නා බලව" යි වාසි කිය කියා දිව දිව අවුදින් ගඟ අනික් භාගයෙහි වැසි ගිගුම් ගත් මහ මුහුදක් සේ ගර්ජනා කෙරෙමින් කඩුපත් බමව බමවා සිටගත්හ.

එ කල ශාක්‍යකුමර උපන් බිසෝවරු කෝලියකුමර රජුන් කෙරෙහි ම වෙසෙති. කෝලිය කුමර උපන් බිසෝවරු ශාක්‍ය රජුන් කෙරෙහි ම වෙසෙති. එසේ හෙයින් තමන් තමන්ගේ මල්බෑයන් මරම්හ යි කිය කියා තමන් තමන්ගේ පිරිවර හා සමග අවුත් අසූ දහසක් ශාක්‍ය බිසෝවරුන් හා අසූදහසක් කෝලිය බිසෝවරුන් හා දෙභාගයෙහි ම සංහසික එ බන්ධුප්‍රේමයෙන් ස්වාමිප්‍රේමයෙන් "අද කවුරුන්ට කුමක් වේ දෝ හෝ" යි කියමින් දෙසෙනඟෙහි ම සම වූ කරුණාවෙන් වැලප වැලප සිටියහ. ඒ සා දෙ නුවර ගේ බලත්තෝ පමණකු ත් නො රඳා දෙ නුවර ම සිස් කොට අවශේෂ වූ සත්ත්වයෝ අවුත් මිත්හ.

එ කල මාගේ ස්වාමීදරු වූ බුදුරජාණන් වහන්සේ එ දා අරුණෝද්ගමන වේලාවෙහි "අද කොයේ වූ ලෝවැඩක් කෙරෙම් දෝ හෝ" යි ලෝකය බලා වදාරණ සේක්, එ දවස් තමන් වහන්සේගේ බන්ධුසමූහයා බොහෝ දෙන නස්නා සේ දැක, තමන් වහන්සේ එ තැනට වැඩියහොත් එ දවස් වන බොහෝ වැඩ දැක, පාත්‍රා සිවුරු තමන් වහන්සේ ම ගෙණ උපස්ථායක වූ අයද මහ තෙරුන් වහන්සේ පමණකු ත් නො කැඳවා, එකචාරී සිංහරාජයකු සේ සවස් වේලෙහි දෙවුරම් වෙහෙරින් නික්ම එ තැනට වැඩ, දෙ සෙනඟ මධ්‍යයෙහි ගං මුදුනෙහි ආකාශයට පැන නැඟී පලග් බැඳ වැඩහිඳ සියලඟ දුමා මුළු ලොව එකාන්ධකාර කොට "මාගේ නෑයෝ දෙදෙනෙක් ඔවුනොවුන්ට නො පෙණෙත්ව යි ඔවුන්ගේ ඇඟින් ලේ බින්දුවක් සෑල්වා ගත නො හෙත්ව යි මාගේ මෛත්‍රී පාරමිතා නමැති මහ දියවතුරෙන් ඔවුන්ගේ කෝගිනි සන්හිඳේව" යි අධිෂ්ඨාන කළ සේක.

එ වේලෙහි ඔවුන්ගේ ඒ සා මහත් සෙනඟ දෙදෙනෙක් ඔවුනොවුන්ට නො පෙණෙති. ඔවුනොවුන්ගේ කටහඬ ත් නො අසති. තමන් තමන් අත තුබූ ආයුධ නො දකිති. එ කල දෙ සෙනඟ ම ලෝඇදිරි නරකයට වන්නාවුන් සේ සවන් තබා අන්ධකාරයෙන් මූර්ජා වූහ. එ කල බුදුහු ඒ අඳුර අන්තර්ධාන කොට ආකාශයෙහි සරාගිරි මඬලක් සේ පෙණී වදාළ සේක.

එ වේලෙහි මරසෙනඟක් සේ දෙගං හිත්තියෙහි සිටි මහ සෙනඟ "කොල! මේ සබා අඳුරෙක් නො වෙයි. අප බුදුන්ගේ පෙළහරෙක. අප බුදුහු අපගේ මේ කලහ දැක අප සන්හඳුවන නිසා වැඩියහ. අප බුදුන් දුටු නෑයන් තබා උන් මරම්හ යි ආ මරසෙනඟ පවා ඒ ඒ දිග්හි පලා ගියහ. උන් මරම්හ යි ගිය

දුකුමායෝ පවා උන්ට කුලගැති වූහ. උන් විදූම්හ යි දුනු හය ගත් කුක්කුටමිත්‍රාදි දරුණු වූ වැද්දෝ පවා උන්ට කුලගැති වූහ. එ බඳු වූ අපගේ නෑ උතුමාතන් දක දක අපි සටන් නො කරම්හ. අපි කලහ නො කරම්හ" යි කිය කියා අත කුබු ආයුධ බිම දමා දෙනුවර එක්ලක්‍ෂ සැටදහසක් රජදරුවෝ ඔවුනොවුන් වැලඳ ගෙන සතුටා ඔවුනොවුන් අත්වැල් බැඳ සිනා සිසී ගොස් බුදුන් පිරිවරා උන්හ. දෙනුවර එක්ලක්‍ෂ සැටදහසක් බිසෝවරු ද බුදුන් දුටු සන්තොෂ හා මල් බැයන් දිවි ලද සන්තොෂ හා පුරුෂයන්ගේ කෝගිනි නිවී ගිය සන්තොෂයෙන් හා, තමන් තමන් වැන්දඹු නො වූ සන්තොෂයෙන් හා, පිණ පිණා ගොස් බුදුන් වැද හිරු දුටු පියුම් වනයක් සේ බුදුන් සිසාරා උන්හ.

එ කල බුදුහු තුන්ලක්‍ෂ විසිදහසක් පමණ තමන් වහන්සේගේ බන්ධුජනයා මධ්‍යයෙහි නරුමැද සඳක් සේ දිලිහි දිලිහී වැඩහිඳ "ශාක්‍ය කෝලිය රජුනි! තොපගේ මේ කුමන උත්සවයෙක් ද, මහ දියකෙළියට අවුහු" යි විචාළ සේක. එ වේලෙහි රජදරුවෝ ඔවුනොවුන් මුහුණු බලා මදක් සී "ස්වාමීනි! කෙළියකට නො ආම්හ. ඔබ රණකට ආම්හ" යි කීහ. බුදුහු "කුමක කලහයෙක්දැ" යි කී සේක, රජදරුවෝ කියන්නාහු "ස්වාමීනි! අපි කිපී යුධයට ආ බවක් මිස කුමක් නිසා වූ කලහයක් බවත් නො දනුම්හ. සේනාධිපතිවරු දනිති" යි කීහ. ඔවුන් අතින් විචාළහ. සේනාධිපතිවරු "අපි නො දනුම්හ. යුවරජුන් අතින් ඇසුම්හ" යි කීහ. යුව රජහු "මහ ඇමැතියන් අතින් විචාළ මැනැවැ" යි කීහ. මහ ඇමැතියෝ "ක්‍ෂෙත්‍රාධිපතීන් අතින් විචාළ මැනැවැ" යි කීහ. ක්‍ෂෙත්‍රාධිපති "ක්‍ෂෙත්‍රපාලයන් අතින් විචාළ මැනැවැ" යි කීහ. ක්‍ෂෙත්‍රපාලයෝ දියබබර වූ කියායෙන් කීහ.

එ වේලෙහි බුදුහු "රදුනි! දිය කොතෙක් අගී දැ" යි විචාළ සේක. ස්වාමීනි! දියෙහි අගයෙක් නැත. ස්වල්පදෙයෙකැයි කීහ. මහ පොළොව කොතෙක් අගී දැ යි විචාළ සේක. ස්වාමීනි! මහ පොළොව අනැගි ය යි කීහ. රජහු කොතෙක් අගිද් දැ යි විචාළ සේක. ස්වාමීනි! රජහු ත් අනැගියෝ ය යි කීහ. බිසෝවරු කොතෙක් අගිද් දැ යි විචාළ සේක. ඔහු ද අනැගියෝ ය යි කීහ. තොප හැමගේ බන්ධුත්වය කොතෙක් අගී දැ යි විචාළහ. ස්වාමීනි! බන්ධුත්වය නම් මහමෙර සේ උතුම් දෙයක් ම වේ දැ යි කීහ. එ බැවින් තොප හැමදෙනා ස්වල්ප වූ මුහුදව යන දියක් නිසා මහ පොළොව සේ අනැගි වූ, රජුන් හා අනැගි වූ, රජ මහිෂීකාවන් හා

අනැඟි වූ, බන්ධුසම්බන්ධය හා නසම්භ යි සිතු සේ ඉතා නොයෙදෙයි; වදරා "තොපගේ වංශයෙහි උපන් බුදුහු පඤ්චවෛරයන් දුරු කොට සුවෙන් වෙසෙති. තොප පඤ්චවෛරයන් පිරිවරා මසනයේ නො යෙදෙයි" යනාදීන් වදරණ සේක්:-

සුසුඛං වත ජීවාම-වෙරිනෙසු අවෙරිනො
වෙරිනෙසු මනුස්සෙසු-විහරාම අවෙරිනො-යි.

යනාදි ධම්මපද ගාථාවෙන් බණ වදරා හැමන ඵන්දන ජාතක තිත්තිර ජාතක-රුක්ඛධම්ම ජාතකාදි නමින් මහත් සේයෙහි නො එක් ජාතිභෙද කථාවෙනු දු විසිතුරු වූ බණ වදරා තෙලමර අත්තදණ්ඩ සූත්‍රයන් දෙශනාව කුළු ගන්වා දෙකුමර රජුන් සමා කරවා කිසෝවරුනු දු වලලහයක්-මල්බැයක් හා සමා කරමා ගඞ්ගා දකය හා යමුනොදකය සේ නො වෙසත් කොට වදාළ සේක.

එ වේලෙහි දෙකුමර රජුන් හා කිසෝවරු "අප බුදුන් අද මේ තෙනට වැඩ වදාළහෙයින් මිස අපට ඉතාමහත් වූ හානි වෙයි. අප බුදුහු අප මෙලොව ත් රකිති. පරලොවත් රකිති. අපගේ නෑ උතුමානෝ බුදු වූයෙන් මිස සක්විති රජ වූ කල අප හැම තබා සතර මහ දිවයින රජහු ම ඔවුන් පිරිවරති. එසේ වූ උතුමානන් අපගේ රජකුලෙන් බුදු ව සෙසු මහණුන් පිරිවරා ඇවිදිනා සේ නො යෙදෙයි. මෙයින් මත්තෙහි රජ මහණුන් පිරිවරා ඇවිද්ද මැනැවැ" යි ඔවුනොවුන් හා මිත්‍රණය කොට ශාක්‍යරජකුමරුවන් දෙසිය පණසක් හා, කෝලිය රජකුමරුවන් දෙසිය පණසක් හා පන්සියයක් රජකුමරුවන් බුදුන්ට පුදා ගියහ. එ වේලෙහි ස්වාමිදරුවෝ ඒ පන්සියයක් රජකුමරුවන් එ තැනදී ම මහණ කොට ගෙණ මිණි පිරිවැරූ සිතුමිණි රුවන සේ රජ මහණුන් ම පිරිවරා දෙවුරම් වෙහෙරට ම වැඩි සේක.

එ කල ඒ පන්සියයක් රාජකුමාරවරුන්ගේ රූප නන්දාවෝය. ඵුල්ලනන්දාවෝ ය, සුන්දරි නන්දාවෝ ය, කල්‍යාණි නන්දාවෝ ය' ශ්‍රී නන්දාවෝය, ලක්ෂණ නන්දාවෝය, පදුම නන්දාවෝ ය, චන්ද බිම්බිය, පදුම බිම්බිය, ආදාස බිම්බිය, සුන්දරී බිම්බිය යනාදි පන්සියයක් කිසෝවරු පුරුෂ වියෝගයෙන් පෙළෙන්නාහු පුරුෂයන්ට සොර පත් යවා සොර පඬුරු යවා ඔවුන් හා පෙර තමන් කළ ප්‍රියකථා හා සලකුණු කියා යවා පුරුෂයන්ට සංවේග උපදවා මහණධම් පිරීමෙහි උත්සාහ මඳකොට සස්නෙහි උකටලී කරවති. එ කල

ස්වාමිදරුවෙමි' මේ කාරණය දැන එ පන්සියයක් රජ මහණුන් ඍද්ධිබලයෙන් හිමාලය වනයට ගෙණ ගොස් එහි කුණාල නම් විල දී කුණාල ජාතකය දෙසා සෝවාන් කොට කිඹුල්වත් පුර නුවර මහ වෙනෙහි දී මහාසමය සූත්‍රය දෙසා අමාමහ නිවන් දක්වා සංසාර සාගරයෙන් ගොඩනගා ගෘහවාසයෙහි ලෝභය හා ස්ත්‍රීන් කෙරෙහි කාම තෘෂ්ණාව අහසට පොළොව සේ දුරු කරවා වදාළ සේක.

පසුව ද එ බිසෝවරු ඔබ රහත් වූ බවු නො දැන පෙරසේ ම සරුප කියා යවති. එ කල ඒ භික්ෂූන් වහන්සේ "ගිහිවාසය මේ ජාතියෙහි තබා මතු ජාතියෙහි ද දුරු කළම්හ. නිවන් සුව විඳිමින් සිටියම්හ. නිවන්සුවයෙහි රස දත්තවුන්ට කාමසුව නම් ගැරඬිල් කුණක් සේ පිළිකුල, එසේ හෙයින් තෙපි තෙපි අප හැම ප්‍රාර්ථනා නො කරවා රහතුන් පැතීම නම් සුළං බඳන්නා වැන්න, සඳට අත දිගු කරන්නා වැන්න. අප නො පතා තෙපි තෙපි දු තපස් කොට සසරින් ගැලවී යනුම"යි කියා යවන සේක.

එ කල පන්සියයක් බිසෝවරු "මැන්දඹු වාසයට වඩා අපි දු තපස් කරමෝ නම් යෙහෙකැ"යි කියා ඔවුනොවුන් හා මන්ත්‍රණය කොට හැම දෙන ම මහා ප්‍රජාපතී ගෞතමී නම් බුදුන් වැඩූ කුඩා මෑණියන් වහන්සේ කරා ගොස් "ස්වාමිනී! අප හැමදෙනා ත් කැඳවා ගෙණ බුදුන් කරා ගොස් මෙහෙණි සස්න අනුදන්වා ගෙණ මහණ වුව මැනවැ"යි යාච්ඤා කළහ. එ සමය නම් ශුද්ධෝදන රජ්ජුරුවන් දළපුඩුසේසතින් යුක්ත වූ ශ්‍රීයානේ වැදහෙව අමාමහ නිවන් දැක පිරිනිවන් පෑ සමය ය.

එ කල බුදුහු පිය මහරජ්ජුරුවන්ගේ ආදහන පූජාවට වැඩ බන්ධුසංග්‍රහ නිසා නිග්‍රෝධාරාමයෙහි වසන සේක. එසේ හෙයින් මහාප්‍රජාපතී ගෞතමීන් වහන්සේ ද ඒ බිසෝවරුන් කී බස් ගිවිස බුදුන් කරා ගොස් බුදුන් වැඳ "ස්වාමිනි! නන්ද කුමාරයන්-රාහුල කුමාරයන් වැනියන් ගිහි ගෙය හැර ගොස් නුඹවහන්සේ කෙරෙහි මහණ ව වසන කල, රජ්ජුරුවනු දු නිවන්පුර ගිය කල, එකලා වූ මා වැනියන් ගිහි ගෙහි විසීමෙන් කම් නැත. මහණවනු කැමැත්තෙමි, භික්ෂුණී ශාසනය අනුදන වදාළ මැනැවැ"යි ආරාධනා කළහ.

එ වේලෙහි බුදුහු ඔබ ම උදෙසා භික්ෂුණී ශාසනය මතු ඇති වන නියාව ත් ස්ත්‍රී ලෝකයහට බොහෝ වැඩවන නියාවත් ස්ත්‍රීන් ගේ පැවිදි වීම නිසා මතු ශාසනයට බොහෝ අභ්‍යාඛ්‍යාන උපදින

නියාව ත්, එ කල බොහෝ අඥාන සත්ත්වයන් ශාසනයෙහි සිත් කල කිරුවා අපාගත මන නියාව ත්, දූන ස්ත්‍රීන්ගේ බහුල වූ යාච්ඤා වෙන් ම උන්ගේ ම නො එක් උත්සාහයෙන් ම පැවිදි දුන් කල ප්‍රව්‍රජ්‍යාව ගරු මන නියාව ත්, පෙවූ අතට දීපු වස්තුවක් අසාර කොට සිතන්නා සේ එක වාරයෙහි කළ යාච්ඤාමට මෙහෙණි සස්න අනු දැනීම නම් ගරු නො වන්නේ ය. මතු අභ්‍යාඛ්‍යානයක් උපන් කල සත්ත්වයෝ "බුදුහු මේ මේ කාරණ දැන ආදීම මැලි වූ සේක. ස්ත්‍රීන්ගේ ම මහත් යාච්ඤා නිසා මහ කරුණාවෙන් මෙහෙණි සස්න අනුදත් සේක. බුදුන්ගේ වරද නැතැ"යි බුදුන් ගේ ගුණ ගෙණ සිත් පහදවා සත්ත්වයෝ සගමොක් දෙකට පැමි ණෙන්නාහුය යි නො එක් කාරණ පරීක්‍ෂා කොට මෙ වාරයෙහි අවසර නොදෙමි යි සිතා "අලං තෙ ගොතමි මා තෙ රුච්චි මාතුගා මස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජා" යි වදරා "මාගේ නිම්ලවූ ශාසනයෙහි ස්ත්‍රීන්ගේ පැවිදි වීමට ගොතමිනි! උත්සාහ නො කරම" යි වදරා ප්‍රතික්ෂෙප කළ සේක.

දෙ වන වාරයෙහි යාච්ඤා කළහ. දෙවන වාරයෙහි ත් බුදුහු ප්‍රතික්ෂෙප කළ සේක. තුන්වනුව යාච්ඤා කළහ. තුන්වනුව ත් බුදුහු නො ගිවිසි සේක. සතරවනු ව බුදුන්ට යාච්ඤා නොවගත හොහී බුධානුභාවයෙන් තැතිගෙණ බුදුන් වැඳ පසු බැස බැස "අතින් වාරයෙහි උත්සාහ කෙරෙම මය, පැවිදි ත් වෙම ම ය" යි සිත සිතා රජගෙට ගියහ.

එ කල සවාමිදරුවෝ එ නුවරින් වැඩ විශාලා මහනුවර කූටා ගාර ශාලාවෙහි ලෝවැඩ වඩවඩා වාසය කරණ සේක. පසු ව මහා ප්‍රජාපතී ගොතමින් වහන්සේ එ පන්සියක් කිසෝවරුන් කැඳවා "දරුවෙනි! බුදුහු ස්ත්‍රීන්ට පැවිදි නො දෙන සේක. තුන්වාරයක් යාච්ඤා කොට පවා මා වැනියන්ට පාවිදි නුදුන් සේක. එසේ හෙයින් බුදුන් අනු දන්වා ගත නො හැක්ක. අපි හැමදෙන ම මහණව ගොසින් බුදුන් දකුම්හ. එසේ කල බුදුහු අප හැම කෙරේ කළ අනුකම්පාවෙන් භික්ෂුණී ශාසනය අනුදන්නා සේක්මය" යි කියා හැමදෙනා ම ගිවිස්වා කෙස්මැටි කපා හැර සිවුරු පෙරව මැටි පාත්‍ර ගෙණ ඒ පන්සියක් දෙනා හා සමග විශාලා මහනුවර බලා නික්මුනු දැ ය.

එ කල ශාක්‍ය-කෝලිය දෙ නුවර රජදරුවෝ උන්වහන්සේ මහණ ව නික්මුනු බවු අසා උපන් මහත් වූ කම්පා ඇති ව කිඹුල් වතින් දෙසිය පණසක් හා දෙවුදුනැ නුවරින් දෙසිය පණසක් හා

පන්සියක් රන්රථ පෙරමගට ගෙණහැර "ස්වාමීනි! මේ රථයෙන් වැඩිය මැනැව. මේ රථයෙන් වැඩිය මැනැවැ"යි ආරාධනා කළහ. එ කල "අපි දූත් රථ නැඟී අලඞ්කාරයෙන් බුදුන් දක්නට ගියමෝ නම් ඒ බුදුන්ට අනාදර ත් නො වෙයි. තපසට අඞ්ග ත් නොවෙයි. අප හැම මහත් වූ කායව්‍යසනයෙන් ගිය කල එම කරුණෙන් කාරුණ්‍ය උපදවා පැවිදි ත් දෙන සේක. පයින් යාමෙන් දරුවෙනි! අප හැමට මහත් වූ වැඩ වෙයි. රථ නො නැඟෙමහ"යි කියා ඒ පන්සියක් රථ ආ පස්සේ ම යවා පයින් ම නික්මුනු සේක.

ඇති වූ දවස් පටන් මතුම්හලින් යටිම්හලට බස්නා කල පවා මහත් වූ මෑසනයෙන් බස්නා වූ, නොප් නැඟු දපීණ භූමියෙහි සක්මන් කරණ කල පවා රත්රුවන් මරවැඩියෙන් සක්මන් කරන්නාවූ, ගිනි තපිනා කල පවා 'මලදන්බෙහි ගිනී ඉතා දූඩි ය, සඳුන් දබෙහි ගිනිදුම් මඳක් දූඩි ය'යි සළුපිළි පටපිළි තෙල්හාලා ගින්නෙන් ගිනි තපිනා වූ, රතස්ගෙට - පැන්ගෙට පිටත් වන වේලෙහි පවා බුබුතුරුණු අහස් විසන් හා සමග ම ඇවිදුනාවූ, කුලයෙහි උපන් අතිසුකුමාල වූ, ශ්‍රීමත්ත වූ, කුලදූන් හෙයින් මොළොක් වූ, පතුල් ඉදිමි ඉගිනි ඇට සේ බිබිලි නැඟී සමහර බිබිලි ගැසී මහත් වූ කාය ව්‍යසන වි ය.

එ කල "මහාප්‍රජාපතීන් වහන්සේ හා පන්සියක් බිසෝවරු මහණ වූ ලු. බුදුන් දක්නට නික්මුනාහු ලු. මහත් වූ වීඩායෙන් පයින් යෙත් ලු"යි දඹදිව බොහෝ තැන සැලවි ගිය. එ කල ඒ ඒ දනව්වෙහි ශ්‍රීවනත වූ චාතුර්ණියෝ පෙර තමන් එ නුවර බිසෝවරුන්ගේ රූපසම්පත් විශෙෂයෙන් අසා දන්නා හෙයින්, 'ඔවුන්ගේ රූපසම්පත් බලම්හ'යි ඒ ඒ දිගින් දිව අවුත් මග බලාගෙණ උන්නාහු උන්වහන්සේ පන්සියක් රජදූන් පිරිවරා සන්හුන් ගමනින් දසදිග් නො බලා තවුස් වෙසින් වඩනා ලෙස් දක වැද පෙරලෙන්නාහු ය. නො එක් දනොපකරණයන් ගෙණ වුත්, පෙරමග ඒ ඒ තන්හි සිට "ස්වාමිනි! අපට අනුග්‍රහ කළ මැනැව. අපට අනුග්‍රහ කළ මැනැව. නුඹ පුතනුවන් වහන්සේ ද මේ මග වඩනාසේක් අපට අනුග්‍රහ කළසේක. අපගෙන් දන් වැළඳු සේක. අපගේ අරම ලැගි සේක. අපට බණ දෙසූ සේක නුඹ ද අපගෙන් වැළඳුව මැනැව"යි ආරාධනා කෙරෙති. සමහරු ඉදිමි ගිය පතුල් දූක, පැසනැගි බිබිලි දූක, ගැසී ගැසී ගිය බිබිලෙන් වහනය වන ලේ දූක, උපන් මහා කරුණාවෙන් මග

හඬින් හඬමින් වැලපෙමින් ඇත්වාහන - අස්වාහන - රථවාහන ඉදෙලු තැනම් ගෙණ අවුත් "මෙයින් වැඩිය මැනැව, මෙයින් වැඩිය මැනැව පතුල්වලට දුක් නුදුන මැනැවි" යනාදීන් කිය කියා ඒ ඒ තැන්හි මුළු බැඳ බැඳ සිටිනා වූ ස්ත්‍රී පුරුෂයෝ මේ තෙනැයි පමණ නැත.

එ කල එන වාහනයකම ත් නො නැගී, දුවු දුවුවන්ට පින් දිදී, පතුල් රෙදම් රෙදමා, දණ අයි ඔබ ඔබා, ඒ ඒ තැන සැතපි සැතපී, එක් පණස් යොදුන් මග ගෙවා විශාලා මහනුවර වැද බුදුන් වසන කූටාගාර ශාලාවේ දොරටුයෙන් පිටත සවස් වේලෙහි මිලානික ව ගිය රත්පියුම් කැලයක් සේ මෙහෙණියෝ පෙල පිරිවරා වෙහෙර දිශාව බල බලා සිටි දැ ය. කුමක් නිසා ඇතුළු වෙහෙරට නො වැද සිටි දැ ද? යත්;

පෙර ඔබ තුන් වාරයෙක මාගේ බුදුන් අතින් පැවිදි ඉල්වා නො ලදිමි. දැනු දු පැවිදි ලැබීමෙහි නියම නැත. මා ආ නියාව දඹදිව බොහෝ තැන සැලව ගිය. මගදී ද බොහෝ දෙන දුටහ. "බුදුන් කරා ගොස් බුදුන්ගේ චුල්ලමාතාවෝ පැවිදි නොලද්දහුල. බුදුහු පැවිදි නුදුන්නාහු ලැ" යි සැලව ගියේ නම් බුදුන්ට ත් නින්දා වෙයි. මට ත් නින්දා වෙයි. බුදුන් නො දැක මේ තෙන සිට පැවිදි ඉල්වා යම්මි. පැවිදි ලදිම් නම් ඇතුළට වැද බුදුන් දකිමි. නො ලදිම් නම් බුදුන් නො දැක ආ පස්සෙහි ම යෙමි. එසේ කල බුදුන්ට ත් නින්දා නො වෙයි. මට ත් නින්දා නො වෙයි. සිතා වෙහෙරට නො වැද දොරටුයෙන් පිටත සිටි දූය.

එ කල අනද මහ තෙරුන් වහන්සේ ඇතුළෙහි බුදුන්ට කල මනා වෙය්‍යාවත් කොට නිසියම් ලද අවකාශයෙක පිටත කල මනා අඩුමැඩි වත් පිළිවෙත් බලා ඇවිදිනා සේක් දොරටුයෙන් පිටත සිටියාවූ මහා ප්‍රජාපතී ගෞතමීන් වහන්සේ හා පන්සියක් බිසෝවරුන් දැක එ තෙනට වහ වහා ගොස් ඉදිම ගිය පතුල්වල බිබිලි හා සම්හරුන් පයින් මැගිරෙන ලේ හා, රජසින් පිරුණු ශරීර හා, නවුස්වෙස් හා මිලානික ම ගිය ශරීර දැක, ලපිරුණු ශොකයෙන් ඇස් පිරුණු කඳුලෙන් "මේ කිමෙක් ද මා මැනැනී යෙනී, තෙලේ කෙසේ වූ වෙස් ද, රජදූනි, ශාක්‍ය කුලයට පරිහානී යෙක් වී ද, රාජ්‍යයෙන් නෙරපූ කෙණෙක් ඇද් ද, මේ කෙසේ වූ අශරණ ගමනෙක් ද, මේ සා කතරෙක කෑදවාගෙණ ආවෝ කවුරු ද, එසේ අවුදිනු ත් මාගේ බුදුන් වැනි නුඹ පුතනු තෙණ කුන් වහන්සේ වැඩහුන් වෙහෙරට නො වැද පිටත සිටියේ කුමක් නිසා දැ"යි විචාළ සේක.

එ වේලෙහි ඔබ කියන සේක් "මපුතනුවන් වහන්ස! නුඹ වහන්සේගේ ශාක්‍යකුලයට ද පරිහානියෙක් නො වී ය. අප හැම තෙරපූ කෙණෙකු ත් නැත මම පෙර තුන්වාරයෙක ම පුත නුවන් වහන්සේ අකින් පැවිදි ඉල්වා නො ලදින් දැන් මම ම මහණ ව අවුත් තව දු: පැවිදි නො ලැබෙම් දෝ හෝ යි යන සැක යෙන් ඇතුළට නො වැද සිටියෙමි පැවිදි ලදිම් නම් ඇතුළට වදිමි යි, නැත ආපස්සෙයි යෙමි" යි කී දැ ය.

එ කල අනඳ මහතෙරුන්වහන්සේ "එ බැවින් මෑනියෙනි! මා පළමු ව ඇතුළට වැදගොස් බුදුනට නුඹ ආ බව දන්වා බුදුන්ගේ අදහස් දැන මා එන තෙක් මඳක් මේ තෙන සැනපී සිටිය මෑනෑවැ"යි කියාලා ඇතුළු වෙහෙරට ගොස් බුදුන් දැක වැද "ස්වාමීනි! මහා ප්‍රජාපතී ගොතමී පන්සියක් බිසෝවරුන් හා සමග කෙස්මැටි කපා මහණ වෙස් ගෙණ පාත්‍ර කරලා මහත් වූ ව්‍යසන ගෙණ දුරු මග ගෙවා පයින් ම අවුදින් දැන් දොරටුව සමීපයෙහි 'පැවිදි දෙන සේක් දෝ හෝ, නො දෙන සේක් දෝ හෝ,' යි හඩ හඩා සිටියහ. පැවිදි ලදිම් නම් ඇතුළට වැද බුදුන් දකිමි යි නො ලදිම් නම් ආපස්සෙහි ම යෙමි යි කීහ. ඔහු බුදුන්ගේ ශාසනයෙහි අනගාරිය වූ පැවිදි ලද්දහු වූ නම් යෙහෙකැයි දැන්වූහ.

එ වේලෙහි ස්වාමිදරුවෝ එ තෙපුල් අසා මතු වන දෙය තමන් වහන්සේ විශෙෂයෙන් ම දන්නා හෙයින් තව ද ස්ථිර කරවනු ම නිසා "ආනන්ද ය! ස්ත්‍රීන්ගේ පැවිදිවීමට උත්සාහ නො කරව"යි වදාළ සේක. නැවත අනඳ මහතෙරුන් වහන්සේ "ස්වාමීනි! මහා ප්‍රජාපතී ගොතමී පැවිදි ලැබිය යුත්තාහු ම ය"යි දැන් වූ සේක. නැවත බුදුහු එසේ ම ප්‍රතික්ෂෙප කළ සේක අනඳ මහ තෙරුන් වහන්සේ තවත් නො පසු බැස "ස්වාමීනි! මහා ප්‍රජාපතී ගොතමී පැවිද්ද ලැබිය යුත්තාහු ම ය"යි දැන්වූ සේක. නැවත බුදුහු "ආනන්දය! එසේ උත්සාහ නො කරව"යි ප්‍රතික්ෂෙප කළ සේක.

එ කල අනඳ මහ තෙරුන් වහන්සේ පසුබැස්මක් නැති ව තමන් වහන්සේ බුදුන් කෙරෙහි ඉතා වල්ලභ හෙයින්, බුදුන් තුන් වාරයක් ප්‍රතික්ෂෙප කළ හෙයින්, සතර වන වාරයෙහි ද දන්වාගත නොහී ප්‍රශ්නයක් විචාරණ පසාරයෙන් තව ද: එම තථාගත බුදුන්ට දන්වන සේක් "ස්වාමීනි! පැනයක් විචාරණු කැමැත්තෙමි" යි කී සේක. ස්වාමිදරුවෝ තෙරුන්වහන්සේ

නො පසුබැස කථාකරණ ආකාරයෙන් සිතින් සමෘති ඇති ව "කැමැති පැනයක් විචාරම''යි වදාල සේක. එ වේලෙහි අනඳ මහ තෙරුන් වහන්සේ "ස්වාමීනි! ස්ත්‍රී බුදුන්ගේ ශාසනයෙහි ඉදින් පැවිදි ලදුවාහු වූ නම් අධිගමයට භව්‍යයෝ ද, අභව්‍යයෝ දැ'' යි විචාල සේක. බුදුහු "ස්ත්‍රීහු භව්‍යයහ''යි වදාල සේක. එබසම අනඳ මහ තෙරුන්සේ සිතින් තුල්මත් ව "එසේ කල ස්වාමීනි! ලොවුතුරා බුදුන් ලෝකයෙහි උපදින්නෝ ස්ත්‍රී ලොකයා හැර පුරුෂ ලොකයා ම සංසාර සාගරයෙන් ගොඩ නඟනා සේකා මී දැ''යි දැන්වූ සේක.

එ වේලෙහි බුදුහු අනඳ මහ තෙරුන් වහන්සේගේ තර්කයෙහි තව ද: ප්‍රිය ඇතියෙක් "එසේ නැත ආනන්දය, සර්වඥයෝ උභය ලෝකයා නිසා ම ඇතිවූහ. දිව්‍යලොකයෙහි බොහෝ ස්ත්‍රී ලෝකයා ගැලවෙන්නාහු ම වේ ද, මනුෂ්‍ය ලොකයෙහි ස්ත්‍රී බොහෝ දෙනෙක් රජගහා නුවරදී මා තිරොකුඩ්ඩ සූත්‍රය දෙසූ දවස් නිවන් දුටුවාහු සුවාසූ දහසක් දෙත්ම්බියෝ නො වෙද් ද, තවුතිසා භවනයෙහි දී මාගේ අභිධම් දෙශනාවෙහි සසපින් ගැලවුනාවූ දිව්‍ය ස්ත්‍රී මෙ තෙකැ යි පමණ ඇද්ද ද, මාගේ අසංඛ්‍ය මණ්ඩලවල දේවදේවිකින්ගේ අභිසමය ද සම සම රේ වි ය මනුෂ්‍ය ලෝකයෙහි ස්ත්‍රීන් පැවිදි නො ලද ත් සෝවාන් ආදී වූ මාගීඵල ලැබී ම ය. එක දවස් විශාඛාවන් හා පන්සියක් කුලදූවරු සෝවාන් වූහ. තව ද: උත්තරාවන් හා පන්සියක් ස්ත්‍රීහු සෝවාන් වූහ. මල්ලිකා දේවීන් හා පන්සියක් කිසෝවරු සෝවාන් වූහ. සාමාවතීන් හා පන්සියක් කිසෝවරු මා කී බණ අනුන් අතින් අසා අනාගාමි වූහ. පන්සියක් කලමනියෝ දමසෙන සෝවාන් වූහ. සුමනාව හා පන්සියක් ලඳුරියෝ සෝවාන් වූහ. මෙසේ මෙසේ ම එකී එකී දවස් මාගී ඵල ලදුවා වූ ස්ත්‍රී ලොකයා පමණ ඇද්ද ද; ආනන්දය! බුදුහු උභය ලොකයා ම ගලවත් ය''යි වදාරා තව ද: අනඳ මහ තෙරුන් වහන්සේගේ ප්‍රතිවචන ය අසන නිසා තුෂ්ණීම්භූත ව නො ගිවිස්සා සේ වැඩඋන් සේක.

එ වේලෙහි බුදුන් මෙ කථාම වදාල කල දෙවියෙක් බණෙක් වී නමුත් එ බසට උත්තරයක් දක්ත නො හේ ම ය. එසේ ද වුවත් අනඳ මහතෙරුන් වහන්සේ තමන් වහන්සේ බුදුන් අදහස් දන්නා නුවණ ඇති හෙයිනු ත්, හෙතුසම්පත් ඇති හෙයිනුත් පසුබැස්මක් නැති ව "ස්වාමීනි! නුඹවහන්සේගේ ශාසනයෙහි භික්ෂුණී ශාසනයක් ඇත මනා කාරණ ඇත්තා ම වුව'' යි දන්වූ

සේක. බුදුහු “කාරණ කියා බලගැ”යි වදාළ සේක. ස්වාමිනි! ස්වාමිදරුවන් ම වදාළ බුද්ධවංශ දේශනාවෙහි සූවිසි බුදුකෙනෙක් “ඛෙමා උප්පලවණ්ණා ච - අග්ගා හෙස්සන්ති සාවිකා” යි යන මේ ගාථා පදය කුමක් නිසා සූවිසි වාරයක් කී සේක් දැ යි දැන් වූ සේක.

එ වේලෙහි ස්වාමිදරුවෝ තමන් වහන්සේගේ අදහස් නො වරදවා ම ඔබ කිවාවූ විශෙෂ වූ උත්තර ය අසා අතිශයෙන් සන්තොෂ වූ සේක්, තව ද මෑතියන් වහන්සේගේ ගුණ කථන ය ඔබ ලවා ම කියමනු කියා ඔබට ප්‍රතිකථාවට අවසර දී වැඩහුන් සේක. එකල අනඳ මහ තෙරුන් වහන්සේ “ස්වාමිදරුවන් තුෂ්ණීම්භූත වනු නො සෙදෙයි. ස්වාමිදරුවන්ගේ ශාසනයෙහි භික්ෂුණී ශාසනය ඇති වන නියාව සූවිසි බුදුකෙණකුනුත් වදාළ කල, පැවිදි ලද්දවුන් ස්ත්‍රීන් මාර්ගාධිගමයට භව්‍ය වන කල, ස්වාමිනි! මහාප්‍රජාපති ගෞතමී කුමක් නිසා පැවිදි නො ලැබෙද් ද, ඔහු බුදුන්ට කොයි වූ අපරාධයක් කළෝ ද, අපරාධයක් කළ කෙනෙක් නොවෙති. බුදුන්ට බොහෝ වූ උපකාර කළ කෙනෙක. ඔවුන් බුදුන්ට කළා වූ උපකාර සිහි කළ කල දූන් බුදුන් විසින් කරන් නා වූ සියලු ලෝවැඩ ඔවුන් ම කළහ යි සිතමි. කෙසේ දැ? යත්;

බුදුන්ගේ කුඹා මෑතියහ. ඉතු දු සෙසු කුඹා මවුන් හා සම කළ නො හැක්ක. ඔවුන් කුස බුදුන් නො උපන් බවක් මිස ස්වාමිදරුවන් උපන් සත්වන දවසින් මවු දේවින් දෙව්ලෝ ගිය කල්හි කිරිමවක බුදුන්ගේ ශ්‍රී ශරීරයෙහි අතක් වකාපිය නො දී තමන් ස්වහස්තයෙන් ම වැඩූහ. බුදුන්ගේ හස්තපාදයන් ලද බිළිඳි ව ඉතා ම කොමල කල්හි බුදුන්ගේ හස්තපාදයෙන් කළ මිතා කෘත්‍ය ය ඔහු තමන්ගේ හස්තපාදයෙන් සම්පාදන ය කළහ. ඒ කෙසේ දැ? යත්;

බුදුන් පයින් ගමන් නො ආහැක සමයෙහි ඔහු තමන් ඇකයෙන් වඩාගෙණ ඨාන-නිසජ්ජා-චංක්‍රමණාදියෙන් ස්වාමිදරුවන්ට පාද කෘත්‍යයන් සාධා දුන්හ. තව ද බුදුන්ගේ ශ්‍රී හස්ත යුග්මයෙන් හස්ත කෘත්‍යයන් සාධාගත නො හෙන සමයෙහි ඔවුන් හස්තයෙන් හස්ත කෘත්‍යයන් සාධා දෙන ලද. එසේ හෙයින් උන්ගේ හස්තපාදයන් බුදුන්ගේ හස්තපාදයන් හා වෙති යි නො සිතමි. තව ද: මේ ලොකයෙහි අන්‍යස්ත්‍රියකට අවිෂය වූ අද්භූත වූ ගුණයකු දු බුදුන්ට කළහ. ඒ කෙසේ දැ? යත්;

බුදුන්ට කිරි මවුන් අතුරෙන් සමයෙහි බුදුන්ගේ අසදෘශ වූ රූපශ්‍රී බලා උදාර වූ පෙම් බැඳ තමන් පුතනුවන් නන්ද කුමාරයන් කිරිමවුන්ට පාවා දී තුමූ බුදුන් වඩන්නාහු ඔවුන් දවසෙක ත් තමන් තනය ඉඳුල් කොට මුව පාරවා පිය නො දී; නො ඉඳුල් වූ පිරිසුදු තමන් තනයෙහි කිරි පොවා බුදුන් වැඩූහ. මෙ මේ කාරණයෙන් මහා ප්‍රජාපතී ගෞතමී බුදුන්ට උපකාරයහ. පැවිදි ලැබීමට යෝග්‍යයෝහු ය''යි දැන් වූ සේක.

එ වේලෙහි බුදුහු ''එතෙකින් භික්ෂුණී ශාසන ප්‍රතිෂ්ඨාවට කල මා විසින් ආයාචනය සඵල කරණ ලදැ''යි සිතා ආනන්ද මහතෙරුන් වහන්සේගේ වාදයෙහි ප්‍රිය ඇති ම 'එ බැවින් ආනන්ද ය, මහා ප්‍රජාපතී ගොතමී මහණවනු කැමැතියා නම් අනන්තා පරියන්ත වූ බුදුන්ගේ ශ්‍රාවිකාවන් පූරණය කොට ආවා වූ ගරු වූ ධර්මයෝ අට දෙනෙක් ඇත. ඒ අටදෙනා පිළිගන්හු නම් එ කෙණෙහි ම ඔවුන්ට, පැවිද්ද ද, උපසම්පදාව ද වන්නේ වේ දැ'යි වදාළ සේක. එ බසට අනඳ මහතෙරුන් වහන්සේ ''ස්වාමීනි! ඒ ධර්මයෝ අටදෙන නම් කවුරු දැ''යි විචාළ සේක.

ආනන්ද ය! ස්ත්‍රී ජාතිහු නම් ඉතා උත්සන්නයහ. චණ්ඩයහ. ක්‍රොධිනීයහ. කලහ කාමැතියහ පුරුෂයන් කෙළා ම දක්නාහ මාගේ ශාසන ය නමැති උත්තම ස්ථානයට පැමිණි කල පෙර කලට වඩා උත්සන්න වෙති මාගේ ශාසනයෙහි ශ්‍රාවකයන් කෙළා දකිති. එසේ කල ඔවුන්ගේ මහණධර්ම අපිසිඩියට නො පැමිණෙති. මාගී වරණය වෙති. එසේ හෙයින් ස්ත්‍රී ලෝක ය නමැති මහා වාපිකාවට මහ මියරක් බැන්ද සේ ස්ත්‍රීන්ගේ අභිමාන ශුන්‍ය වන්නා වූ ඔවුන්ට ම වැඩ වන ධර්මයෝ අට දෙනෙක. ඔහු කවරහ? යත්;

1. සියක් වස් ව ගියා වූ මෙහෙණින්නක් වී නමුත් මාගේ සස්නෙහි අද උපසම්පදා වූ සත් හැවිරිදි ලදරු වූ මහණ කෙනෙකුන් ව ත් දුර දක ම හුනස්නෙන් නැගී පෙර ගමන්කොට වැඳ පුද ආදර කළ මැනැව. මේ එක් ධර්මයෙක. 2. තව ද: භික්ෂුණීන් විසින් සවච්ඡන්දික ව ගිය ගිය තැන්හි වාසය කළ නො හැක්ක. මාගේ භික්ෂූන් වසන්නාවූ ජනපදයෙක එක්වරූ ගොසින් වැඳපුදා අවවාද ඉගෙණ නැවත එන්නට තරම් වූ සමීප වූ මෙහෙණවරෙක ම වාසය කළ මැනැව. මේ එක් ධර්මයෙක. 3. තව ද: දෙපෝයෙන් දෙපෝය කඩ නො කොට භික්ෂූන් කරා එළඹ ''ස්වාමීනි! පෙහෙවස් දිනය කවරේ ද? භික්ෂුණීන්ට අවවාද දුන මැනැවැ''යි ආරාධනා කළ මැනැව. මෙයි දු භික්ෂුණීන්ගේ එක් ධර්මයෙක. 4. තව ද: වස්

අනන්තරයෙහි උභතෝ සඞ්ඝයා කෙරෙහි ම වස් පැවරුව මනා ම ය. මෙසිදු එක් ධර්මයෙක 5. තව ද: ගරුධර්මයෙන් නැගෙන්නා වූ භික්ෂුණීන් විසින් දෙපෝයක් උභතෝ සඞ්ඝයා කෙරෙහි මානත් පුරනැංග මනාම ය. 6. තව ද: උපසම්පදාපෙක්ෂක වූ මෙහෙණීන්නන් විසින් දෑවුරුද්දක් සික්ඛමානා ධර්මයන් පුරා උභතෝ සඞ්ඝයා කෙරෙහි ම උපසම්පදාව ලද මැනව. මෙසී දු එක් ධර්මයෙක. 7. තව ද: කිසි යම් කාරණයෙකින් නු ත් මාගේ භික්ෂූන්ට ආක්‍රොශ පරිභවයක් නො කළ මනාම ය. මෙසි දු එක් ධර්මයෙක. 8 තව ද: භික්ෂුණීන් විසින් මාගේ භික්ෂූන්ට අවවාද කිය නො හැක්කේ ම ය. භික්ෂූන් විසින් භික්ෂුණීන්ට අවවාද කළ මනා ම ය. ඒ අවවාද ඔවුන් විසින් පිළිගත මනා ම ය. මෙසි දු එක් ධර්මයෙක. මේ ගරු වූ ධර්මයෝ අටදෙන නම් මාගේ සසුන් වන් මාතුගාමයන් විසින් දිවි පමණින් එකානතයෙකාම රක්ෂාකළ මනා වූ ගුණධර්ම කෙණෙකැ යි වදාළ සේක.

එ වේලෙහි අනඳ මහ තෙරුන් වහන්සේ හුනස්නෙන් පැන නැගී බුදුන් අභියස් සමු ගෙණ මහා ප්‍රජාපතී ගෝතමින් වහන්සේ වැඩ සිටි තැනට ගොස් තුන් වාරයක් කොට තමන් වහන්සේ ඔබගේ සවරූප බුදුන්ට දන්වා වූ නියාව ත් තුන් වාරයෙහි ම බුදුන් ප්‍රතික්ෂෙප කළ නියාව ත්, තමන් වහන්සේ නො පසු බැස බුදුන් හා ප්‍රශ්නව්‍යාජයෙන් නො එක් කථා කළ නියාව ත්, පසුව මෙහෙණි සස්න අනුදන්වා ගත් නියාව ත්, ගරු ධර්මයන් අටක් වදාළ නියාව ත්, විස්තර කොට කියා ඒ ධර්මයන් අටදෙනා වෙන වෙන දක්වා ඔවුන්ට ත් බුදුන් වදාළ පරිද්දෙන්ම කියාලා “මැහැනියෙනි! මේ ධර්මයන් අටදෙනා දූන් මා අභින් පිළිගතුයේ වී නම් නුඹට ද දූන් ම පැවිදි ලැබෙයි. භික්ෂුණී ශාසනය ද ඇති වෙයි. ඒ අෂ්ට ගරු ධර්මයන් පුරාගත හෙනුයේ දැ” යි විචාළ සේක.

එ කෙණෙහි පැවිදි ලැබෙයි කී බසට කෙශාන්තය පවන් පාදානතය දක්වා ලොමු දහ ගන්වමින්, පස්වණක් ප්‍රීතීන් පිණා බුදුන් දිශාවට දොහොත් මුදුන් දී සිට “යම් සේ ශිරස්නාන ය කොට සිටියා වූ යෞවන පුරුෂ ස්ත්‍රී කෙණෙක් සමන් මල් දමක් හෝ, මහනෙල් මල් දමක් හෝ, යොහොඹු මල් දමක් හෝ ලදින් දෙහොතින් පිළිගෙණ සනොතෂයෙන් තමන්ගේ උත්තමාඞ්ගයෙහි පිහිටුවා ගණිත් ද, එ සෙයින් මම ද මාගේ බුදුන් වදාළා වූ ඒ නිහතමානා වූ ධර්මයන් අටදෙනා පිළිගනිමි පිළිගනිමි පිළිගනිමි”යි තුන් ගලක් කියා ඒ ධර්මයන් අටදෙනා පිළිගත් සේක.

ඒ වචන ය හා සමග උන්වහන්සේට ශාසන ප්‍රව්‍රජ්‍යාව විය. නව කෙළ දහස් අසූ සියක් කෙළ පණස් ලක්‍ෂ සතිස් සංවර ශීලයෙකින් යුක්ත වූ උපසම්පදා ශීලය ද පහළ විය. සෙසු පන්සියයක් බිසෝවරු ද එකෙණෙහි ම පැවිදි ව අෂ්ටගරු ධර්මයන් පිළිගෙණ උභතෝ සඞ්ඝයා කෙරෙහි ම උපසම්පදා ශීල ය ලදහ. එ කල ප්‍රජාපතී ගෝතමීන් වහන්සේ පන්සියයක් බිසෝවරුන් හා සමග මෙසේ පැවිදි ව උපසම්පදා ශීල ය ලදින්, උපන් මහා ප්‍රීතීන් පිණා පිණා වෙහෙරට වැද බුදුන් දක වැද එකත් පස් ව සිටි දෑ ය.

එ වේලෙහි බුදුහු ඔබට අනුරූප වූ ධර්මදේශනාවෙන් සමාධි කරවා අනුශාසනා කොට "මෙතින් මත්තෙහි බුඩමාතාවනී! අප්‍රමාද වව. සත්‍රීලෝකයාව තොප තීසා ම මහත් වූ මැඩෙබක් වෙයි. මාගේ භික්‍ෂුණී ශාසනයට තෙපි ම ප්‍රධානයහ. තෙපි ම රාත්‍රඥයහ"යි ස්ථානාන්තර හා මෙහෙණි සස්න පාවා දී මඝීනුකූල වූ කම්ස්ථාන දෙතැන් වූ සේක. එ කල කොමබි දම්සභින් භාවනා කොට විදර්ශනා වඩා පසළොස්වක අෂ්ටසමාපත්ති උපදවා ත්‍රිවිද්‍යා හා සමග සිවුපිළිසිඹියා පත් රහත් වූ සේක. සෙසු පන්සියක් මෙහෙණින්නෝ බුදුන් නන්දකොවාද නම් සූත්‍ර දේශනාවෙන් නන්ද මහ තෙරුන් වහන්සේව ධර්මදේශනා කරණ දවස් ඒ බණ අසා හැම දෙන ම අමා මහ නිවන් දුටහ.

එ තැන් පටන් උන්වහන්සේ ම මුල් කොට බුදු සසුන් වැද මහණ ව අමාමහ නිවන් දුටුවා වූ ශ්‍රාවිකාවෝ සියයෙක, දහසෙක, ලක්‍ෂයෙක, කෝටියෙකැ යි යනාදීනු දූ මෙ තෙකැ යි පමණ නැති සහ. භික්‍ෂුශාසනයට භික්‍ෂුණීශාසනය ම බොහෝ වූවා සේ ම දනෙයි. භික්‍ෂුණී ශාසනයට භික්‍ෂුශාසන ය ද බොහෝ ව ගියා සේ දනෙයි. එක සරසියෙක පිපී වැනී ගියා වූ පද්මෝත්පල රාශියක් සේ උභය ශාසනය ම ඉතා ගනන වි ය.

මෙසේ මාගේ බුදුන්ගේ ශාසන ය රුවනින් පිරුණු මහා සමුද්‍ර ය සේ, මලින් ගැවසී ගත් පරසතු රුක සේ, සවර්ණාංකුර යෙන් ගැවසී ගත් මහ දඹගස සේ, තරු පිපී වැනී ගිය අහස සේ, ඉතා ගහන වි ය. ඉතා සමෘඩ වි ය. ඉතා නිෂ්කලංක වී ය. ඉතා සශ්‍රීක වි ය. මුළු දඹදිව අහස්කුස බැලූ බැලූ දිශාවෙහි රත්මිණි හංස රාජයන් පෙළ පෙළ යන්නා සේ ඇවිදුනා වූ ශ්‍රාවකයන් හා ශ්‍රාවිකාවන්ගෙන් අතුරු නැතියේ ය. ඒ සා දඹදිව ධ්‍යාන සුවෙන් වැඩ හිඳිනා තරම් විවේක භූමි මඳ හෙයින්, දෙව්ලෝ නැඟී දිව්‍යොද්‍යාන

වල ඒ ඒ රුක්මුල දෙවියන්ගේ ප්‍රාසාදවල වැඩහිඳ ධ්‍යානසුව විඳිනා ශ්‍රාවක ශ්‍රාවිකාවෝ කෙතෙක් දෙන ද, දිව්‍යප්‍රාසාදවල, කූටාගාරවල, හිඳිනා රහතන් වහන්සේ කෙතෙක් දෙන ද, බඹලොවට පැන නැගී මහබඹුන්ගේ ප්‍රාසාදවල වැඩහිඳ ධ්‍යාන සුව විඳිනා ශ්‍රාවක ශ්‍රාවිකාවෝ කෙතෙක් දෙන ද, නාගභවනවලට ගොස් පෙර ඒ ඒ ජාතියෙහි බොහෝ දවසක් දිව්‍ය සුව අනුභව කළාවූ රම්‍යස්ථාන වල වැඩහිඳ දිව්‍යනාගපූජා විඳිනා වූ ක්ෂීණාශ්‍රව ශ්‍රාවකයෝ කෙතෙක් දෙන ද, ගරුඬ භවනවලට පැන නැගී ගරුඬයන්ගේ පක්ෂ නමැති විතාන පූජා ලදින් නිවන් සුව විඳිනාවූ මහණ-මෙහෙණින්නෝ කෙතෙක් දෙන ද, හිමවු කුළට නැගී සුවාසූදහස් රන් කුළු මුදුනෙහි සතර ඉරියව්වෙන් දවස් යවන්නාවූ ශ්‍රාවක ශ්‍රාවිකාවෝ කෙතෙක් දෙන ද,

අසුරයන්ගේ භවනයට වැද ඒ ඒ තැන්හි හිත්සේ වාසය කරන්නාවූ රහත්හු කොතෙක් දෙන ද. තත් තත් රාජ්‍යවල පෙර කමින් රජසුව විඳි උද්‍යානවල සිත් අලවා ගොස් වැඩ හිඳිනා රජ මහණුන් හා රජමෙහෙණින්නෝ කෙතෙක් දෙන ද සත්හැවිරිදි වයස බුදුසසුන් වැද මහණව අමාමහ නිවන් දැක එ කෙණෙහි ආකාශයට පැන නැගී හිරි මඬුලු ආසන කොට ශාසන බල දක්වමින්, සඳමඬුළු පිටාටූ කෙරෙමින්, මෙරගල් සක්වලගල් ලාලීවට කෙරෙමින් මහපොළෝ පත්කුඹ කෙරෙමින්, විෂඝෝර දිව්‍යනාග රාජයන්ගේ ඓශ්වර්‍ය මතුයෙහි සක්මින් කෙරෙමින්, දෙව්බඹුන් ලවා සාධුකාර දෙවමින්, කැලෙක නමත් භාවනා කරණ ගෙවල සක්දෙව් රජුන් ලවා අසුර යුද්ධයෙහි රකවල් ගන්වමින්, තමන් මැළදීමට වේලා ආසන්න වූ කල්හි හිරි දෙවියන් සඳ දෙවියන් ආකාශයෙන් ගමන් යා නොදී සැඩිබන්ධනයෙන් බැඳ රඳවමින්, සිටි පොළ සිට මෙර පත්ලෙහි වැදහොත් සියදහස් යොදුන් දිව්‍යනාග රාජයන්ගේ කුසට අත ලා දකරඹු ගන්වමින්, එකවිට හඬ ගැහඬින් දසදහසක් සක්වල දෙවියන් බණට අඬගාවමින්, නොයෙක් පෙළහර දක්වමින්, දරු ලද්දවුන් සතුටු කඳුළෙන් තෙමවමින්, තුඩ තුඩ සාධුකාර දෙවමින්, ඇවිදුනා වූ මහණ-මෙහෙණි ලදරුවෝ කෙතෙක් දෙන ද.

මෙසේ මාගේ බුදුන්ගේ ශාසනය සම්බන්ධ වූ නියාම ත්, තුන් ලෝවාසින් ඇස්හි එල ලද නියාවත්, සිත්හි එල ලද නියාවත්, කන්හි එල ලද නියාවත්, දිවි එල ලද නියාම ත්, ලොව බුද්ධ

මය ව ගිය නියාව ත් සද්ධර්මයෙන් ඉහිර ගිය නියාව ත්, සඞ්ඝයා ගෙන් රත්නත්‍රය ව ගිය නියාව ත්, මාගේ සියක් දහසක් ලක්ෂයක් මුඛ නැති හෙයින් මා සිතට විශෙෂයෙන් දුනී ගියා සේ අසන්න වුන්ට භගවාලිම මෙ පමණකින් භාරයම ය. මට සේ ම සියලු සත්ත්වයන්ට ම මාගේ බුදුන්ගේ මහිමය විශෙෂයෙන් ම දුනී ගියේ වී නම් මේ ලොකයෙහි තුණුරුවනෙහි පෙම නො කරන්නෝ කවුරු ද, සතර අපාය හඳුනන්නෝ කවුරු ද, දෙව්ලෝ නො හඳුනන්නෝ කවුරු ද, සග මොක් සුවයෙහි නො පිණන්නෝ කවුරු ද.

මේ ජාතියෙහි පටන් මාත් බුදුවන ජාති දක්වා මට උපන් මේ තුණුරුවන් කෙරෙහි සන්තොෂය මාගේ සිතින් නො බිඳේ ව යි, මතු එන පදික ගාථාවක් පමණ අයා සියලු ධර්මයන් ගිරා ගත්තා වූ ඥාන සම්පත්තින් පිණම්ව යි, උපනුපන් බුදුන්ගේ ශාසනවල ද හිරු සේ, සඳු සේ, ප්‍රසිඬ ම සසුන් බබුළුවම්වයි, මට මේ සා වැඩක් කළ මවුන් පියන් ගුරුන් ආදී වූ සියලු සතුනු දු සසර සයුරෙන් ගොඩ නගා ලෝවැඩ කෙරෙම්ව යි.

මෙසේ මාගේ ස්වාමි දරු වූ ගෞතම නම් බුදුරජානන් සර්වාකත වූ ශාසනශ්‍රීන් දිලියෙන කල්හි දවසක දෙව්රම් වෙහෙර භ්‍රමරාමර තර නාග නයන රසායන වූ ධර්මමණ්ඩපයෙහි ධර්මාසනයෙහි සවර්ණක් රශ්මින් දිලිහි දිලිහි තසුන් මෙරක් සේ සඞ්ඝ ලීලාවෙන් වැඩහුන් සේක. එ දම්ස් අසීති මහාශ්‍රාවකයෝ ම අනූන වූ පන්සිය පන්සිය සඟපිරිස් ගෙණ අවුත් ඡද්දන්තවිල සිසාරා පිපී වැනී ගියාවූ රත්පියුම් වනයක් සේ ධර්මමණ්ඩලය සිසාරා අතුරු නො දී උන්හ. ඒ සඟපෙළ සිසාරා රක්තොත්පල වනයක් සේ මහාප්‍රජාපතීන් වහන්සේ ආදිවූ ශ්‍රාවිකාවෝ පෙළෙක් අතුරු නො දී උන්හ. ඒ මෙහෙණීනි පෙළ සිසාරා මඤ්ජුෂක වෘක්ෂ සේ සර්වාභරණයෙන් සැරහී නා නා වර්ණ වස්ත්‍රයෙන් අලංකෘතව රජ බමුණු වෙළඳ ගොවී සිවු සෙනගෙක් මිශ්‍ර වූ පියුම් වන යක් සේ හිඳගත්හ. ඒ පිරිස සිසාරා ශක්‍රපුරයෙහි දෙව්ගනන් එ පුරෙන් අවුත් මිහිම්ඩලට බැසපී කලක් සේ, දහසක් අඟනා කසි සළු හැඳ දෙදහස් අඟනා උතුරු සළු කරලා, ලක්ෂ අඟනා ගෙල මුතුදම් පැලඳ, අනැගි වූ සිරිකණින් ශ්‍රීකාන්තාවන් සේ සැදී සත්‍රී සේනාවෙක් දිව අවුදින් මුඛ නමැති පියුමෙන් හා, ඇස් නමැති නිලිපුලයෙන් හා, දත් නමැති කොඳකැකුළෙන් හා, බුදුන් පූජා කරන්නවුන් සේ දෙහොත් මුදුන් දී බිසින් බසට සාධුකාර දිදී අතුරු නො දී වතුරක් සේ උන්හ.

මෙසේ සිවුවණක් මහ පිරිස මිහිමඬල ගලා හුන් කල්හි ඒ බවු දත් චාතුම්හාරාජික, තාවතිංස, වශවර්ති, බ්‍රහ්ම යයි යන චාතුර් මණ් දිව්‍යලෝකාව දිව දිව අවුදින් සියලු ගුවන්කුස සක්වල ගල් සිඝාරා සීහියෙම් කඩක් ඇන්ද සේ, අහස්කුස පුරා සාධු නාද යෙන් තුන්ලෝ පුරා සිට ගත්හ.

මෙසේ මේ අට මහ පිරිස ආකාශයා හා පොළොවෙහි බුදුන් පිරිවරා සිටි කල්හි සඬාමිදරුවෝ සියලු සතුන් සිත් බලා, ආකාර බලා, වජ්‍රෝපමාවෙන් දසදිග් බලා වැඩහිඳ ලීලෝපෙත අෂ්ටාඞ්ග සමුපෙත දෙශනාවෙන් ධර්මනාද නමැති මේඝනාදයෙන් හා, දන්ත නමැති බලාකා පංක්තීන් හා, කන්වැල් නමැති විදුලියෙන් හා, බැම නමැති දේදුන්නෙන් හා, මීසන්න නමැති මෙඝකූටයෙන් හා විරාජමාන වූ සද්ධර්ම නමැති මහා වර්ෂාව වස්වා දිව්‍ය මනුෂ්‍ය නමැති විනෙය ජන ශස්‍යයන් අභිෂේකය කරන්ට පටන් ගත් සේක.

ඒ වේලෙහි බුදුන්ගේ සද්ධර්මලීලා හා ශ්‍රී විභූතිය දැක, මහා ප්‍රජාපතී ගොතමීන් වහන්සේ පෙර තමන් වහන්සේ චුල්ලධම්ම පාල ජාතකය චුල්ලනන්දිය ජාතකාදී නොයෙක් ජාතිකෝටියෙහි මවුව ත් අවුදින් කෙලවර බුදු වූ ජාතියෙහිදු මහපෙම් කළා වූ පුත්‍ර සෙනහය, බුද්ධසෙනහය, ධර්මසෙනහය යි ත්‍රිවිධ වූ ප්‍රේම නමැති මහ වතුරෙන් සොලවා ලදුව ඉපිල නැංගා සේ හුනස්නෙන් පැන නැගී දෙහොත් මුදුන් දී සිට මෙසේ මහ පිරිසට ඇසෙනසේ සතුති කරණ සේක්;

බහූනං වත අත්ථාය-මායා ජනයි ගොතමං,
බ්‍යාධිමරණ තුන්නානං-දුක්ඛක්ඛන්ධං බ්‍යපානුදී-යි.

යන මේ ගය කියා කියා "සාධු සාධු මා පුතනුවෙනි, ශ්‍රීමත් වූ ගෞතමයෙනි, මෙ බඳු වූ ශ්‍රීයක් තවත් තුඹට ම වඩ වඩා වේව යි තුඹ නිසා මුළු ලෝවාසීන්ට මේසා මහත් වූ වැඩෙක්වී ය. මා බූනැනියෝ මහාමායා දේවී එකාන්තයෙන් මුළුලොවට වැඩ නිසාම මෙතෙක් සත්ත්වයන් අතුරෙන් තුඹ වැනි පුත් රුවනක්ම වදා ලූ දෑස. එසේ හෙයින් මේ තුඹ කරණ ලෝවැඩෙකැ යි නො සිතම් මා බූනැනියන් මහාමායා දේවින් ම මේ ලෝවැඩ කළහ යි සිතමි"යි බුහුනැනියන්ගේ ගුණව්‍යාජයෙන් බුදුන්ට සතුතිකොට පියා නැවත බුදුන්ට ආ මැඩුව මනා කාරණයක් දැක:

චිරං ජීව මහාවීර-කප්පං තිට්ඨ මහාමුනෙ!
සබ්බලොකස්ස අත්ථාය-භවස්සු අජරාමරො-යි.

යන මේ ගාථාව කියා "මහත් වූ වීර්‍ය්‍ය ඇති බුදුරජානෙනි! චිරාත් කාලයක්ම ජීවත් වුව මැනැව. මුළු ලොවට වැඩ පිණිස කපක් මුළුල්ලෙහි වැඩහිඳිනේ මැනව. අජරාමර වුව මැනැව' යි කියා බුදුන්ට ආ බැඳු දැ ය. ඒ බස හා සමග තුන්ලෝ පුරා සිටි මහ පිරිස ද "චිරං ජීව මහාවීර!" යි කියා එකපැහැර බුදුන්ට ආ මඩින්නාහු බඹලොව දක්වා කෝලාහල කළහ.

එ වේලෙහි බුදුහු මහ පිරිස සන්හුන් කල "මහාප්‍රජාපතී ගෞතමීනි! සර්වඥවරයන්ට ආ වඩන්නේ නම් තෙල සේ නො වෙ"යි වදාළ සේක. කෙසේ ද ස්වාමීනි යි විචාළද්දු ය බුදුහු වදාරණ සේක් "සර්වඥවරයෝ නම් ශ්‍රාවකයන් ම ආභරණ කොට ඇතියහ. වල්ලභයන්ගෙන් ශෝභාවත් වූවා සක්විති රජුන් වැනියහ. තාරකාවන්ගෙන් ශොභාවත් වන්නා වූ සඳ දෙව්පුත් වැනියහ. බුදුහු සමඟ වූ ශ්‍රාවකයන් ම දකිනා කැමැතියහ. එසේ හෙයින්:

ආරද්ධවිරියෙ පහිතත්තෙ-නිච්චං දළ්හපරක්කමෙ,
සමග්ගෙ සාවකෙ පස්ස-එසා බුද්ධාන වන්දනා—යි.

යන මේ ගාථාව උගන්වා "අනූන වූ ශ්‍රාමණ්‍යසම්පත්‍යා බල බලා වැඩහුන මැනැවැයි කියම. එසේ වූ වචනය බුදුන්ට ආ වැඩුම් නමැ"යි වදාරා එ තෙනට අනුරූප වූ දෙශනාමෙහෙ බණ සමහර කොට මහපිරිසට සමු දී යවා වදාළ සේක. ඒ වේලෙහි සතර මග සතර ඵලයට පැමිණියා වූ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාදී දිව්‍ය, බ්‍රහ්ම, ගරුඩ, නාග සංඛ්‍යාත වූ අනල්පප්‍රකාර වූ මහපිරිස බුදුන්ට අප්‍රමාණ වූ පූජා කොට ගියහ.

මෙසේ කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයිනුදු, කෙලෙස් නමැති සතුරන් නැසූ හෙයිනුදු, සංසාර චක්‍රයාගේ අර බුද්ධඥාන නමැති කුඨාරියෙන් පලා සුණුවිසුණු කොට, මූලොච්ඡින්න කොට, නැසූ හෙයිනු දු තමන් වහන්සේ රහසත් පවු නො කරණ හෙයිනු දු, මෙසේ මෙසේ වූ ආමිෂ ප්‍රතිපත්ති සංඛ්‍යාත වූ අසාධාරණවූ, පූජා ලැබීමට සුදුසු හෙයිනු දැයි යනාදි වූ, අනෙකප්‍රකාර වූ, අර්ථයෙන් මාගේ බුදුහු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලදී.

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං-යි.

මේ පූජාවලියෙහි
අප බුදුන් මහා ප්‍රජාපත්‍යාදි පන්සියයක්
ශාක්‍ය මෙහෙණින්ගෙන් ලද
භික්ෂුණී ශාසනොත්පත්ති-ප්‍රතිපත්ති පූජා කථා නම් වූ
සවිසි වන පරිච්ඡේදය නිමි.

සත්විසි වන පරිච්ඡේදය

තව ද: උන්වහන්සේ ම අනුන වූ ශ්‍රාවිකාවන්ගෙන් ලද පළමු වන ආදහන පූජා නම් කවරී? යත්;

මෙසේ ඒ මහාප්‍රජාපතී ස්ථවිරීන් වහන්සේ යට කී ක්‍රමයෙන් බුදු සසුන් වැද මහණ ව, අමාමහ නිවන් දැක, භික්ෂුණී ශාසනය ඇති කරවා, බුදුන්ට උතතම ප්‍රතිපත්තින් පුද පුදා, සිංහලු දෙවිමිනී හුන් අතින් තමන් වහන්සේ ද, නො එක් පූජා ලැබෙමින් විශාලා මහනුවර ලිච්ඡවි රජුන් විසින් තමන් වහන්සේට කරවා පිළිගන්වන ලද මෙහෙණවර ම වාසය කොට, එම රජුන්ගෙන්ම දෙන ලද සිවුපස දැහැග වලඳ වළඳා කලින් කලට ගොස් බුදුනුදු දැහැ දැක දහම් අස අසා එනා සේක. බුදුහු ද කලින් කාලට එනුවරට ගොස් උන්වහන්සේ ආදී වූ සියලු සතුන්ට ලෝවැඩ කෙරෙමින් දනවු සැරිසරා යෝ වැඩ වසුරණ සේක් ම ය. එක් කලෙක බුදුරජාණෝ අසූ මහසව්වන් ප්‍රධාන වූ සකළිස් දහස් පන්සිය එකෘසුවක් මහණ ගණ පිරිවරා විශාලා මහනුවරට වැඩ වදාළ සේක.

එ කල සත්දහස් සත්සිය සත් ලිච්ඡවි රජුන් හා, එම නෙක් සිසෝවරුන් හා, සිංහාදි සිටුවරුන් හා, අම්බ පාලිකාදී ගණිකාවන් හා, නො එක් ශ්‍රද්ධාවනත සත්ත්වයෝ බුදුන් පෙරමගට නොයෙක් පූජාභාණ්ඩ ගෙණ ඔවුනොවුන් පරයා ගොස් මහත් වූ උත්සවයෙන් බුදුන් වඩා ගෙණ වුත් කූටාගාර ශාලාවෙහි ලූහ. එ නුවර රුවන් සූත්‍රය දෙශනා කොට, ජනපදරොග භය පලවා, පොකුරු වැසි වස්වා, බුදුන් තමන්ට සුවසෙත් කළ තැන් පටන් එ නුවර වාසීහු බුදුන් යම් කලෙක තමන්ගේ නුවර දී දුටුවූ නම් මෙසේ ම පෙර ගමන් කොට ගොස් බුදුන් පුද පුදා එ දා පටන් සත් සත් දවස් බුදුන් දුටු සතුටෙහි උත්සව කෙළි කෙළිනාහ. එසේ හෙයින් එ දවසුදු උත්සවයට පටන් ගත්හ.

එ දවස් මහාප්‍රජාපතී ගොතමින් වහන්සේ ද බුදුන් වැඩි පවත් අසා සතොසා හැද පෙර ව, පාත්‍ර ධරා පන්සියක් ශාක්‍ය මෙහෙණින්නන් පිරිවරා මණී තවව ලූ පන්සියක් ඇතිනි පෙලක් සේ බුදුන් පෙරමගට ගොස් බුදුන් පුද පුදා වෙහෙරට වඩා පුනනුවන් වහන්සේගේ ශ්‍රාවකයන්ගේ සමෘද්ධියක් හා බුදුන්ගේ ශොභා දැක ගත් සන්තොෂයෙන් පිණ පිණා නැවත තමන් වහන්සේගේ මෙහෙණවරට ගොස් අභිප්‍රයසිංහාසයෙන් වැඩ හිඳ මෙසේ සිතූ සේක. කෙසේ:ද? යත්;

ම පුතනුවන් වහන්සේගේ ශ්‍රාවකයෝ ඉතා අනූනයහ. ඉතා සමගියහ. ශ්‍රාවකයෝ බුදුන්ට ශෝභනාහ. බුදුහු ශ්‍රාවකයන්ට ශෝභනාහ. ආ වඩනා කල පවා ශ්‍රාවකයන් හා සමග තමන් වහන්සේ දිගා වන සේ ආ වඩනා සේක. එසේ හෙයින් බුදුහු අනූන වූ ශ්‍රාවකයන් කැමැති සේක. කිමෙක් දෝ හෝ' මෙ වකට බුදුන්ගේ ශ්‍රාවකයන් අතුරෙන් ඌනයෙක් වූ කෙණෙක් ඇද් දෝ, නැද් දෝ හෝ' යි බලා බුදුන් බුදු වූ දවස් පටන් පිරිනිවන් පෑ එක ශ්‍රාවක කෙණෙකු ත් නැති සේ දැක ඉතා සන්තෝෂ ව "අහෝ සාධු අහෝ සාධු යි" තුන් යලක් ප්‍රීතින් උදන් අනා මෙ පුතනුවන් මහත්සේගේ ශාසනයෙහි ඌනයෙක් කවර කලෙක වේ දෝ හෝ' යි අනාගතය බලා නොබෝ කලෙකින් අඤ්ඤාකොණ්ඩඤ්ඤ-සාරිපුත්‍ර, මෞද්ගල්‍යායන, ඛේමා, උත්පලවර්ණා, නන්ද, රාහුල, යශෝධරාදි මහ පින්වත් ශ්‍රාවකයන් හා ශ්‍රාවිකාවන් බුදුන්ට පළමු කොට පිරිනිවන් පෑ නිවන් පුර යන නියාම ත් පසු ව බුදුන්ගේ ද පරිනිර්වාණය වන නියාව ත්, සියලු සංස්කාරධර්මයන් අනිත්‍ය ම ය නියාව ත් ලෝකවාසීන්ට ප්‍රත්‍යක්‍ෂ වන නියාව ත් කරතලාමලකයක් සේ දැක මාගේ බුදුන්ගේ ශාසනයෙහි මතු වන්නාවූ ඌනතාව මා වැනියන් දක්නේ නො වෙදැයි මපුත නුවන්ගේ අසමාධියක් නො දක්ම ම ය.

මවුපියන්ගේ පරිහානිය, දරුවන් දක්ම ලෝකසාධාරණ වූ ධර්මයෙක, දරුවන්ගේ පරිහානිය, දෙමවුපියන් දක්ම නම් ඉතා නුදුටුවම මනා ධර්මයෙක, එසේ හෙයින් මා මි පළමුකොට මෙ පුත නුවන් දක්නදී සාන්ති පුරයට නික්මුන මනා මි ය; මාගේ අභිඥාබලයෙන් කොතෙක් කල් ජීවත් වෙමි නමුත් පොහොසත්මි, එසේ වූ රහතුන්ගේ ධර්මයක් නො වෙයි, මාගේ මෙ වකට වයස් කෙතෙක් දෝ හෝ', බලන සේක් තමන් වහන්සේ ෂඩ්වකල්‍යාණයෙන් යුක්ත වූ ස්ත්‍රීන් කෙරෙහි අනාතගීත වූ හෙයිනු ත්, මහත් වූ පින්බල ඇති හෙයිනු ත්, බුඩ මාතා වූ හෙයිනු ත්, එවක දක්වා ඉස කරකෙන්දකු ත් නො නැඟි, දන්තවලනාදි විළි පිළියක් නැතිව, සොළොස් හැවිරිදි වයසක්සේ පොණන බවක් මිස එක් සිය විසි හවුරුද්දක් වයස් ගියේ ය යි දැක ආයු සංස්කාරය ද එ වකට කෙළවර වූ සේ දැක බුදුන් දැක අවසර ඉල්වාගෙණ නිවන් පුරයට ශ්‍රාවකයන්ට පළමු ව මා ම නික්මුන මැනැවැයි සිතූ සේක. එ කෙණෙහි ඒ සිත හා සමග මහපොළොව ද වෙව්ලා පැනනැංග, ආකාශය ද ගුගුරා පැනනැංග.

ඒ පෙළහරෙහි කුහුල් වූ සිත් ඇති පන්සියක් ශාක්‍යමෙහෙණින්නෝ තමන් තමන්ගේ නිවාසයෙන් ඔබගේ ආවාසයට රැස්ව වැද සිට "ස්වාමිනි! අහස් පොළෝ ගිගුම් දුන් කාරණ කිමෙක් දැ"යි විචාළහ. "දරුවනි! අනතුරක් නිසා නො වෙයි. මාගේ සිතිවිල්ලක් නිසා ම උපන්නා වූ පෙළහරෙක් ම ය. 'මාගේ බුදුන්ගේ ළඟ වූ ශාසන ය නො දැක පළමු කොට නිවන්පුර යෙමි' යි සිතීමි. මේ කාරණයෙන් අහස් පොළෝ ගුගුරුවාලූ පෙළහර වී ය. නිවන්පුර යනු සඳහා බුදුන් අතින් දුන් අවසර ඉල්වා යෙමි යි කී දැ ය." එ බස් අසා පන්සියක් මෙහෙණින්නෝ ද "එ බැවින් ස්වාමිනි! තාරකාමණ්ඩලය සිටිය දී එකලා සඳහු ගමන් යන කල නො හොබනා යේ, අප හැම සිටිය දී තුඹ වැනියන් එකලා ව ම නිවන්පුර යන කල ඉතා නො හොබනේ ය. මිහිගණවත දවසු දූ තුඹ හා එක්ව ම මහණ වූම්හ. සසරින් ගැලවෙනු වස් ද එක් වලා ම ගැලවියම්හ. දැන් නිවන් පුර යන ද ත් එක් වලා ම යම්හ යි වෙන වෙන කියා සිටියහ.

එ වේලෙහි යශපතැ හි තිවිස ඒ පන්සියක් මෙහෙණින්නන් පිරිවරා මෙහෙණවරින් නික්ම මෙහෙණවරට අරක් ගත් දෙවියන්ට පින් දී, එ පවත් අසා පෙර මගට රැස් වූ සත් දහස් සත් සිය සත් බිකෂ්වරුන් ආදි වූ බොහෝ සත්‍රී සමූහයාට ඔවා තෙපුල් දී, කූටාගාර ශාලාවට ගොස්, බුදුන් දැක වැද එකත්පස් ව සිට දෙහොත් මුදුනෙහි තබාගෙණ මෙසේ දන්වන සේක.

"අහං සුගත තෙ මාතා – තුවඤ්ච වීර පිතා මම,
සද්ධම්මසුඛදො නාථ – තයා ජාතම්හි ගොතමී.

සංවඩ්ඪිතො'හං සුගත – රූපකායො මයා තව,
අනින්දිතො ධම්මතනු – මම සංවඩ්ඪිතො තයා.

මුහුත්ත තණ්හා සමණ – ඛීරං ත්වං පායිතො මයා,
තයා'හං සන්තමච්චන්තං – ධම්මඛීරම්පි පායිතා.

වඩ්ඪනාරක්ඛණෙ මය්හං – අනණො ත්වං මහාමුනි,
පුත්තකාමිත්ථියො යාච – ලභන්තං තාදිසං සුතං.

මන්ධාතාදි නරින්දානං – යා මාතා සා භවණ්ණවෙ,
නිමුග්ගා'හං තයා පුත්ත – තාරිතා භවසාගරා.

රඤ්ඤො මාතා මහෙසී'ති – සුලභං නාමිත්ථිනං,
බුද්ධමාතා'ති යං නාමං – එතං පරමදුල්ලභං.

තස්සාව ලද්ධං මහාවීර – පණිධානං මම නායක,
අණ්ණුතං වා මහන්තං වා – තං සබ්බං පූරිතං තයා.

පරිනිබ්බාතු'මිච්ඡාමි – විහායෙ'මං කලෙබරං,
අනුජානාහි මෙ වීර – දුක්ඛන්ත කර නායක.

චක්කංකුස ධජාකිණ්ණෙ – පාදෙ කමල කොමලෙ,
පසාරෙහි පණාමං තෙ – කරිස්සං පුත්ත පෙමසා.

සුවණ්ණරාසි සඞ්කාසං – සරීරං කුරු පාකටං,
දිස්වා දෙහං සුනිට්ඨං තෙ – සන්තිං ගච්ඡාමි නායක"යි.

යන මේ විසිතුරු වූ ගාථාමෙන් කියා "දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙන් හා, අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් හා, අනුපම වූ රූපකායෙකින් කප් රුකක් සේ බබලන්නා වූ ශ්‍රීමත්නා වූම පුතනුවන් වහන්ස! ගෞතම නම් බුදුරජානෙනි! තුඹ සා පිසපූ බින්ස පවා දෙව්බඹුන්ට මුදුන් මල් කළා වූ වීර පුරුෂයාණෙනි! පෙර මම තුඹට ධම්මපාල ජාතක චුල්ලනන්දිය ජාතකාදි නොඑක් ජාතිවල දී මවු ව ම අයිමි. මේ ජාතියෙහි කුසින් නො වැදූ බවක් මිස තුඹව මහ පෙම් කොට කිරි මවු කම් කෙළෙමි. එසේ හෙයින් මම තුඹගේ මෑනියෙමි. තුඹ මගේ දරු ද ය. එසේ බවක් මිස පෙරළා මෙම ජාතියෙහි ම ආගයි කුසින් වදාළු හෙයින් මම තුඹගේ දියණියෙමි. තුඹ මාගේ පියාණන.

තව ද: ස්වාමිනි! මම පෙර තුඹ වහන්සේගේ නෙල රූපකාය සමණක් පෙම් කොට වැඩිමි. දැන් තුඹවහන්සේ ශාන්ත වූ, දන්ත වූ, අජර වූ, අමර වූ, මාගේ ධම්කාය සහසා වඩාලන ලද. එසේ හෙයින් මා තුඹට කළ දරුමාකමට තුඹ දැන් මම කළා වූ දරු මා කම් ම සිය දහස් ගුණයෙන් මඩනේ ම ය.

තව ද: මෙතෙහොතක් කල් තෘෂ්ණාවගේ සමනය කරන්නා වූ මා තනයෙහි කිරි පොවා, පෙර මම තුඹ නළවා ඇවිද්දෙමි. දැන් තුඹවහන්සේගේ සදහම් තෙපෙනී තුඩ නබා නිවන් නමැති අම, කිරි බී සංසාරව්‍යසනයෙන් නැළවූම් ලදින් තුඹ විසින් අපමණ වූ සංග්‍රහ ලදිමි. එසේ හෙයින් පෙර මා තුඹව පෙවූ තනකිරව දැන් තුඹ විසින් මා පෙවූ නිවන් අම කිරි ම රසයෙන් උතුම් ම ය. අසමාන ම ය.

තව ද: මපුතනුවන් වහන්ස! පෙර තුඹ බාලකල රජගෙන් පිටත් ව ලා අසූදහසක් රජකුමරුවන් පිරිවරා තරු පිරිවැරූ පුන්සඳ සුහක් සේ ඒ ඒ තැන්හි කුමරකෙළි කෙළ ඇවිදුනා

කල්හි, මම නුඹ රාජාඞ්ගනයෙහි බලා නො දක ඒ ඒ තැන්හි සොයා ඇවිදිනෙමි. නුඹ දුටු කෙණෙහි ම දැතින් වඩා මා තනතුරෙහි පිහිටුවා ගෙණ වැසි සුළං ආතප ගම් මසිෂාදි සතුන් ගෙන් පීඩා විය නොදී, මහ පාවලට නැගී ශ්‍රීහස්තවල සතපා බඩ දී වැදහෙව් කලෙව තලවා නිදි ගන්වා ලෝකයෙහි සියලු මවුන් සියලු දරුවන්ට ම කරන්නා වූ සාධාරණ වූ දරුසාත්තකමක් අසාධාරණ වූ නුඹට කෙළෙමි. කිම්යානෙනි! නුඹ විසින් දුන් සංසාරව්‍යසන නමැති දුදුලට වැද, කෙලෙස් සොරුන්ට හසු ව සංසාර බන්ධනයෙන් දුක් ගන්නීය. මා කරුණා-මෛත්‍රී නමැති උභය ශස්තයෙන් මිඩාගෙණ සසුන් නමැති තනතුරෙහි පිහිටුවා, මාර්ගඵල නමැති රථයෙන් ගෙණගොස් නිවන් නමැති මහපායෙහි ධ්‍යාන නමැති ශ්‍රීහස්තව නගා දහම් නමැති නැලවිල්ලෙන් තලව තලමින්, සමවත්සුව නමැති අමා නිදි නිදවා අනික් මවකට පියකුට අවිෂය වූ, අද්භූත වූ, මවුපිය සත කරණලද. එසේ හෙයින් මා විසින් නුඹට කළා වූ පුත්‍ර සෙනහසම නුඹ මට කළා වූ දරු සෙනහසද සුවහස් ගුණෙන් වඩනේ ම ය. එසේ හෙයින් මා නැලවූ නැලවිල්ලට නුඹ නැලවූ නැලවිල්ලම උතුම් වූ නැලවිලි ම ය. මේ මේ කාරණයෙන් බුදු උතුමානෙනි! නුඹ මස්සෙකින් සංග්‍රහ කළාව සුවහස් පිශලි දුන් උදර පුරුෂයක්හු වැනි ද ය. එසේ හෙයින් මා විසින් කළාවූ වැඩීමෙහි රැකීමෙහි මාතෘ [illegible] යෙහි නුඹවහන්සේ අනූන වූ ද ය. මාතුපට්ඨාන ධර්මයෙහි පැමිණී ද ය. මෙලෙව්හි පුතුන් පතන්නාවූ, වදන්නා[illegible] නුඹ වැනි සිරිබර පුතුන් ම පතත් ව යි වදත් ව යි [illegible]ෂහි දශ උපන්නාවූ දරුපෙම හා, දරුසිරි මුළුලෙව්හි ම පින්ව[illegible]හී මවුන්ට කුල ස්ත්‍රීන්ට ම ලැබේව යි මා කළා වූ පින් සියලු ස්ත්‍රී[illegible]ත් පවත් කෙරෙත්වයි. කාරණා කිම? යත්;

[illegible]ැරසර පුතනු
[illegible] තුන්ලෝ වාසින්

මහාමාන්ධාතාදි සක්විති රජුන් පවා මා[illegible]තිම්යානෙනි! කිසියම් යෙහි ගැලී, දුන් දක්වා ගොඩක් නොස්ත්‍රීජාතීහු නම් තු ගුණයට වැදූ කුසින් කාලක චණ්ඩාලයන් වදත්ස්ත්‍රීජාතියෙහි උපන්නෙමි. නා පෙම්ලාං ගැරවිල් ඈ දිග් දූහැයා ඔර වැඩුනු හෙයින් කිසි වදති. තව දක්වා තෙරක් නො දකිනුමෙක් නිග්‍රහ නිසා කියාපු-යෙහි නොඑක් ජාතියෙහි නුඹ බඳු දෙදු ඇත්නම් දුන් මට කෂමා වැදූ නුඹ වැඩූ පින් පමණෙකින් සදූව කෙරෙහි අනුකම්පා කොට නිවන් මහම්ගර බස නැණිව ශ්‍රී චිදින්සේගේ ම සසුන්වැද මහණබම

ඇම්දිනා කල ද එක නම් එක පුතකුට-දුවකට, එක මවකට-
පියකුට-හිමියකුට ගැඹුරු කඳුලට සතර මහා සාගරයෙහි දිය මඳ
මි ය. කඳුළු බොහෝ ම ය. නො මල තැනෙක් නැත නො උපන්
කුසෙක් නැත නො වැදූ සනෙක් නැත. එසේ වූ මම දුන් තුඹට
මවු වූ පිණින් අනිකකු නො වදමි. අනික් කුසෙකින් නො උපදිමි.
අජර වීමි. අමර වීමි. අමාමහ නිවන් දිටිමි. මේ මේ කාරණයෙන්
මා ලදුවාවූ පුත්‍රසම්පත් ලද්දාවූ අනික් සත්‍රියක් නැත.

රජුන්ට මවු වන්නා වූ, අගමෙහෙසිය වන්නා වූ, තනතුරු
ලබන සත්‍රී මේ ලෝකයෙහි සුලභ වන්නාහ. බුද්ධමාතාවෝ ය යි
යන මා වැනි වූ ස්ථානාන්තර ලද සත්‍රී කප් ලක්ෂයෙකිනු ත්
අසංඛ්‍යයකිනු ත් දුර්ලභ වන්නාය. සෙසු කල් නම් මේ සාරා
සංඛ්‍යය කප් ලක්ෂ ය ඇතුළත උපන්නා වූ රාජමහිෂිතාවරු
අසංඛ්‍යය ගණන් වූ ය. රාජමාතාවරු අසංඛ්‍යය ගණන් වූ ය.
බුද්ධමාතාවරු ඇම අටවිසි දෙනෙක් වූ ය. මේ ආදී කාරණයෙනු දු
මා ලදුවා වූ ස්ථානාන්තර ලබන්නාවූ සත්‍රී ඉතා දුර්ලභයහ. එසේ
හෙයින් ස්වාමිනි! මම සත්‍රී ජාතියෙනු ත් අග පැමිණියෙමි.
මා කලාවූ ප්‍රාර්ථනාව ද සාධා ගතිමි. එක්සිය විසි අවුරුද්දක් ආයු
වළඳා ත් සිටියෙමි. තුඹගේ අනුඥා වූ සිම්ල වූ ශාසනයෙහි පළමු
කොට නිවන්පුර යනු කැමැත්තෙමි. මම අවසර දුන මැනව.

නඳරජාණෙනි! බුදුකෙණෙකුනැ යි යන නම්කුදු ඇසීමක්
පමණක් ත් ඉතා දුර්ලභ මි ය. එසේ හෙයින් දුන් මම තුඹගේ
දුනන වූ, න් සේ බලා තුඹ පා වැඳ සිත් සතනා ගන්නා කැමැත්
එසේ හෙ තුඹවහන්සේගේ තෙල අමතුරු සිරක් මගුල් ලකුණෙන්
දරු මා කළ තියම් කල පෙති සේ වූ, දෙව්බඹුන්ට මුදුන්මල්කඩ වූ,

තව ද: දවසිරක් යොදුන් උස රාහු අසුරේන්ද්‍රයන් පවා යට
මා තනයෙහි ක්ෂීරම් ආඬුභාව ඇති සුරකත වූ, ශ්‍රීපාද නමැති
තුඹවහන්සේගේ සඳඹුරා දිගුකොට වදාල මැනව. මාගේ දරුසනා
කිරි බී සංසාරව්‍යසනයෙහි ඝ දිය වතුරු වැපි බැඳ රඳවා ගන්නා
සංග්‍රහ ලදිමි. එසේ හෙයින
තුඹ විසින් මා පෙවූ නීපි දලියෙන තෙල තුඹගේ මනොහර වූ
අසමාන ම ය. වදාල මැනව. තෙල උරමඬලෙන්
වදාල මැනව. සිත් සේ තුඹගේ
තව ද: මපුනනුමන් වනද නු කැමැත්තෙමි" යි බුදුන්ට
ප්‍රවත් ව ලා අසුදනසක් රජකුම්
සුන්සඳ සුහක් සේ ඒ ඒ තැද

එ වේලෙහි සොමිඳුරුවෝ මැතියන් වහන්සේගේ නො එක් ප්‍රේමණීය කථා අසා උපන් මහත් වූ කරුණා ඇති ව, සඳවලා ගබකින් අභිරූපයක් දක්වන්නා වූ සුසෑදී දෙවතාවා සේ සුරකත වූ, චීවර ය වම් දෑසරුවෙන් පහකොට උභයඩවකාය දක්වාලා ප්‍රවාල සාගරයෙන් නික්මුත් රත්පියුම් දෙකක් සේ ශ්‍රීපාද යුග්මය දිගු කොට වදාළ සේක.

එ කෙණෙහි බුදුන්ගේ උභයඩවකායෙන් නික්මුණු බුදුරැස් කඳෙක් අහස් කුසට පැන නැගී අසුරියන් මෙන එකලු කෙරෙමින් දිලිහි දිලිහී සිටගත. ශ්‍රීපාද යුග්මයෙන් නික්මුත් බුදුරැසු ද එසේ ම මහ පොළෝ අසු රියනක් විනිවිද රන් පිඩැල්ලක් සේ කෙරෙමින් සිට ගත. පූර්ව පශ්චිම දක්ෂිණ වාම භාගයෙන්නු ද නික්මුත් බුදුරැස් කඳුදු එසේ ම ඒ ඒ දිගුන් බබුළුවා සිටගත. බුදුන් සිසාරා සිටගත් බ්‍යාමප්‍රභාමණ්ඩලය සඳෙක ලූ මිඹුල්ලක් සේ ඒ රැස් අභිභවා සිටගත.

එ කල මැණියන් වහන්සේ පුතනුවන් වහන්සේගේ රූපශ්‍රී හා, දෙතිස් මහ ලක්ෂණ හා, අසූ අනු ලක්ෂණ හා, සියලඟින් දිවන බුදුරැස් සිරි සේ බලා පිණ පිණා බුදුන් දිගු කළ ශ්‍රීපාදයෙහි ඇඟිලි අගෙහි තමන් වහන්සේගේ සිරස පහරණ සේ වැදහෙව දරු ලදුවවුන් අසා බරාගත නො හැක්කාවූ සැඳුහැ ඇතියන්ට ඉතා ප්‍රේමණීය වූ කාණ්ඩයට ඉතා රසායන වූ නො හඬ, සිටිය නො හැක්කාවූ ශෝකහකාර තෙපුල් කිය කියා බුදුන් ක්ෂමා කරවන සේක.

ස්වාමීනි! මා බුහුනැණියන් මහාමායා දේවීන් කුසෙහි දස මසක් වැස දාකරඹුයෙන රන් පිළිමයක් සේ දිලිහි දිලිහී මවුන්ට සුව දී මහබඹුන් අතට බිහි වූ වීර පුරුෂයාණෙනි! එ තැන් පටන් මා ඔර වැඩි මවුන්ට මෙ බඳු වූ කිරිසර කම් දුන් වැරසර පුතනුවන් වහන්ස! වැදූ මවුන්-පියන් ඇතුළු වූ තුන්ලෝ වාසීන් නො වරදවා දරු කොට ගත් නිවන් මාතිමියාණෙනි! කිසියම සැකයක් ඇතියෙම්, මේ ලෝකයෙහි සත්‍රිජාතීහු තම තු ගුණයට අංකරයහ එසේ හෙයින් ලා මිත වූ ස්ත්‍රීජාතියෙහි උපන්නෙමි. සංසාරයෙහි බොහෝ දවසක් තුඹ මා ඔර වැඩුනු හෙයින් කිසියම් මා කොටපු අපරාධයෙක් දුසි තමෙක් නිග්‍රහ නීසා කියාපු-වාචසික වූ-කායික වූ වරදෙකු දු ඇත්නම් දුන් මට ක්ෂමා කොට වදාළ මැනව, තුඹගේ දුව කෙරෙහි අනුකම්පා කොට වදාළ මැනැව. තව ද, තුඹවහන්සේගේ ම සසුන්වැද මහණබම

පුරමින් නිවණෙහි කල ලොභයෙන් නුඹ වලක්වා වලක්වා තුන් වාරයෙක ස්ත්‍රීන්ගේ පැවිදි වීමට යාච්ඤා කෙළෙමි. ඒ ආයාචන යෙහි දු දොෂයෙක් ඇත්නම් ක්‍ෂමා කොට වදාළ මැනැව.

තව ද: නුඹවහන්සේගේම අනුශාසනාවූ පිළිදෙන් මෙහෙණි සස්න ඇතිකොට බොහෝ ස්ත්‍රීන් මහණකොට බොහෝ දෙනා නික්මවීමි. ඔවුන් අතුරෙන් කිසියම් මට නො නික්මුනු කෙණෙක් ඇත් නමු දු ඒ වරද ද ක්‍ෂමා කොට වදාළ මැනව. තව ද: නුඹ වහන්සේගේ ම දහම් අමා උනා බී සියලු සතුන්ට දහම්රස දෙන් නාවූ ශ්‍රීමත් වූ මුඛය නුඹ බිලිඳි කල මාගේ තන නමැති මස් ගඩුයෙහි පහරමා ඇවිද්දෙමි. තව ද: නුඹ මෙම ජාතියෙහි මට පිය වන බවු නො දැන පෙම් නමැති මොහබලයෙන් පුත්‍රබැවහාර යෙන් ආමන්ත්‍රණය කොට ත් ඇවිද්දෙමි. තව ද: දූත් නුඹ විසූ ගඳකිළිය ද, නුඹ වැඩඋන් ආසනය ද, නුඹ සැතපුනු යහන ද, නුඹ වැළඳූ බාත්‍රය ද, මෙම ජාතියෙහිම තුන්ලෝ වාසීන්ට ධාතු වන බවු නො දැන නුඹ ඉනා ලදරු කල නුඹ මසන ගෙයි මාසය ත් කෙළෙමි. නුඹ වඩාගෙණ එක ආසනයේ හුනිමි. නුඹ බඩදීගෙණ එකයානේ සැතැපින. නුඹ මුවෙහි බත් අනා තබ තබා මම ද එම තලියෙන් බත් අනුභව ත් කෙළෙමි. මේ ආදි වූ පුත්‍රප්‍රේමයෙන් මා කළාවූ වර්ධනය ද අනන්තාපරියන්ත වූ බුද්ධ මාත්‍රාවනු දු කොට ආ සිරිතක් ම හෙයින් එයි මාගේ ම අපරාධ යක් නො දකිමි. එසේ ද වුව ත් ඒ වර්ධනයෙහි කිසියම් නො දැන කළා වූ බුද්ධිමාතා ධර්මයෙහි අඩුවෙක් ඇත්නම් ඒ වරද ද ක්‍ෂමා කොට වදාළ මැනැවැ යි වැඳ හෙව දූන් වූ සේක.

එ වේලෙහි ස්වාමිදරුවාණෝ බැණනැඟී බසින් සියලු ගඳකිළිය එක සුවඳ පිඩක් සේ නෙරෙමින් ඔබට බණ වදාරණ සේක්'

අක්ඛාතො නාම මන්නබ්බං—කිං භවෙ ගුණ භූසනෙ
කිමුත්තරං තෙ වක්ඛාමි—නිබ්බාණාය වජන්තියා—ති

යන මේ ගාථාවෙන් බුද්ධ මාතාවෙනි! තෙල නුවණැ'ති යන්ගේ ක්‍ෂමා කැරවීමෙක් නොවෙයි. අනවතප්තජලය පෙරීමෙන් කම් නැත්තා සේ, චින්තාමාණික්‍යරත්නය ඔප ලීමෙන් කම් නැත්තා සේ, ජාම්බූනද කනක දූවීමෙන් කම්නැත්තා සේ, නිරපරාධයන් අනුන් ක්‍ෂමා කරවීම ත්, නිවරදයන්ට තමා ක්‍ෂමා කිරීම ත් නිෂ්ඵල වන්නේය. එසේ හෙයින් අමාමහ නිවන් දුටුවාතව ඔවුනොවුන් ක්‍ෂමා කැරවීමෙන් කම් නැත. එසේ ද

වුව ත් මෙ තැන මනාහි තොප විසින් බුදුන් කෙරෙහි ආදර නිසා කීයෙක් පූජි ධර්මයෙක් ම ය. බුදුන් විසිනු ද ක්ෂමා කිරීම නම් බුදුන්ගේ ම ධර්ම ම ය එසේ හෙයින් ලෝකධර්ම ව්‍යවහාරයෙන් ලෝවැසියන්ගේ චිත්තාරාධනාව නිසා බුද්ධිමානාවෙනි! ක්ෂමා කළමැන, ක්ෂමා කළමැන"යි වදාරා නැමත බුදුහු:

සුබුද්ධො අනූනෙ මම භික්ඛුසඞ්ඝෙ
ලොකො ඉතො නිස්සරිතුං ඛමෙන,
පභාතකාලෙ ව්‍යසනං ගතානං
දිස්වාන නීයාති හි චන්දලෙඛා-ති.

යන මෙ ගාථාවෙන් "බුද්ධිමානාවෙනි! තොපවැනියන් මාගේ ශාසන පරිහානිය නුදුටුව මනා මි ය. තොප සිතූයේ කාරණයෙක් මි ය. උදය කාලයම් පූර්වභාගයෙහි ම 'ඇසිල්ලෙකින් මාගේ තාරකා බඳුවූ නිෂ්ප්‍රභත්වයට පැමිණෙති. ඔවුන්ගේ ඒ පරිහානිය මම දක්නා නො හෙමි"යි රන්තාක් මෙන් ශසත පර්වත යෙන් සැගවෙන්නාවූ චාතුර්දශී පූර්ණචන්ද්‍රයා සේ, තෙපි දු මාගේ මෙ ශීලාලඞ්කාර ශොභාවෙන් දීප්තිමත් වූ, සම්පූර්ණ වූ, ශ්‍රාවක නමැති තාරකා සමූහයන් සසුන් නමැති ගුවන්හි පුනක් මෙර බබුලුවමින් සිටි කල්හි, කාලකින් ඔවුන්ගේ පරිනිර්වාණ නමැති සූර්‍ය්‍යයාගේ උද්ගමනය නො වන තෙක් නිවන්පුර නමැති හස්තගිරියෙන් සැගවී ගොස් ශාන්තිපුරයෙහි වසව"යි අවසර දී වදාළ සේක.

එ කල උන්වහන්සේ බුදුන් ශ්‍රීපාදමූලයෙන් පැනනැගී රන් මෙරක් සිසාරා යන තරුපිරිවරු සඳක්හුගේ ශ්‍රී ශොභා සේ ඒ පන් සියක් මෙහෙණින්නන් පිරිවරා බුදුන් සිසාරා තුන්යලක් පැදකුණු කොට තව ද: දෙහොත් මුදුන් දී සිට බුද්ධාලම්බන ප්‍රීතීන් උපන්නා වූ සිත් ඇති ව:

න තිත්ති පුබ්බං තව දස්සනෙන
චක්ඛුං න සොතං තව භාසිතෙන,
චිත්තං මමං කෙවල මෙක මෙව
පප්පුය්‍ය තං ධම්මරසෙන තිත්තිං.

තදනො පරිසායනෙත-වාදිදප්පපහාරිනො
යෙ තෙ දක්ඛන්ති වදනං-ධඤ්ඤා තෙ නරපුඞ්ගව.

දීඝඞ්ගුලී තම්බනඛෙ-සුභෙ ආයතපණ්හිකෙ,
යෙ පාදෙ පණමිස්සන්තී-තෙපි ධඤ්ඤා රණන්තගා.

මධුරානි මනන්තානි-දෙසනානි හිතානි ච,
යෙ යෙ වාක්‍යානි සුස්සන්ති-තෙපි ධඤ්ඤා නරුත්තම-සී.

යනාදි නො එක් ගාථා වචනයෙන් "ස්වාමිනි! බුදුරජාණෙනි! තුඹගේ රූපදර්ශනයෙහි මාගේ ඇස ද තෘප්තියක් නො ලැබෙයි. තුඹගේ මධුර වූ තෙපුල් ඇසීමෙන් කණ ද තෘප්තියට නො පැමිණෙයි. හුදක් මාගේ එකලා තෘප්ති ය ම තුඹගේ සිවන් දහම් රසයෙන් පිරී ඉතිරී ගිය සිවුමණක් පිරිස් පිරිවරා ධර්ම ලීලාවෙන් වැඩහුන්නා වූ තුඹගේ සශ්‍රීක වූ ශ්‍රීමුඛය යමෙක් ඇස් පුරා දුටුවාහු වූ නම් ඔහු ම පින්වත්හ. යමෙක් තුඹගේ ශ්‍රීපාදයන් දෙදෙනාට නමස්කාර කළාහු වූ නම් ඔහු ම ධන්‍යවත්හ. යමෙක් තුඹගේ මධුර වූ පෙදෙහි පෙදෙහි සිවන් අමාබිඳු වගන්නා කරන්නාවූ තෙපුල් ඇසූවාහු වී නම් ඔහු ම ශ්‍රීමත්හු ය. එසේ හෙයින් ස්වාමිනි! මට වඩා පිණැතියෝ නැත. මම ම ශ්‍රීමත්තයෙමි, මම ම භාග්‍යවත්තයෙමි. මම ම ඇස් ලදිමි, කන් ලදිමි, සිත් ලදිමි'යි යනාදීන් සිය දහස් වචනයෙන් බුදුන්ට ස්තුති කොට කොට බුදුරූ බල බලා සිටියේය.

එ කල "බුද්ධමාතාවෝ අද පිරිනිවන් පාන්නාල. දැන් බුදුන් අතින් අවසර ඉල්වමින් සිටියෝ ල. ක්ෂමා කරවමින් සිටියෝල. බුදුහු ඔවුන්ට බණ වදාරමින් සිටි සේක් ල" යි සියලු ශ්‍රාවකයන්ට සැලව ගිය. එබස් අසා මහත් වූ ධර්මසංවේගයට පැමිණ "බුද්ධමාතාවූ මහ පින්වතුන්ට පවා නො නවත්නා ධර්මයෙක් වනැ"යි කිය කියා අඤ්ඤාකොණ්ඩඤ්ඤාදි අසූ මහ සව්වෝ පිරිවර හා සමග අවුත් ගඳැත් පෙළක් සේ පෙළ පෙළ සැදී බුදුන් සමීපයෙහි සිටියහ. නන්ද-රාහුල දෙදෙනා වහන්සේ ද පන්සියයක් ශාක්‍යකුල සථවිරයෝ ද ධර්මසංවේගයට පැමිණ සිටියහ. ආනන්ද මහ තෙරුන් වහන්සේ එ වකට තමන් වහන්සේ රහත් නො වන හෙයින් ශොක ධරාගත නොහී "බුද්ධමාතාවගේ පරිනිර්වාණය වනුයේ මාගේ බුදුන්ගේ පරිනිර්වාණ කාලය ආසන්න හෙයින්මය"යි සිතා සිත බාෂ්පධාරා වගුරුව වගුරුවා හඬන්නට පටන් ගත්තේක.

එ කල මහා ප්‍රජාපතී ගෞතමීන් වහන්සේ මහාශ්‍රාවකයනු දු වැද සමු ගෙණ පුතනුවන් වහන්සේ හා මුණුබුරානන් වහන්සේද වැද සමු ගෙණ ආනන්ද මහ තෙරුන් වහන්සේ හඬ හඬා සිටිනා තැනට ගොස් "මට ම ප්‍රිය වූ, මට ම කල්‍යාණමිත්‍ර වූ මට ම උපකාරී වූ මට ම මේ සා නිවන් සුවයක් අනුබල ව සාධා දීලූ, භික්ෂුණී ශාසනයට පිහිට ව මේ සා ලෝවැඩක් කළාවූ, පුතනු

මෙනි! තුඹ බහුශ්‍රැතයන් කෙරෙහි අගපැමිණ සිටි කෙණකුන් වූව. බුද්ධොපස්ථානයෙහි අප්‍රමාද කෙණකුන් වූව. මධුර වූ බණ කීමෙහි ඉතා දක්ෂ වූ කෙණකුන් වූව. බුදු කෙණකුන් අතින් අට මහ වර යක් ලත් ශ්‍රීමන්තභාග්‍ය කෙණකුන් වූව. ධර්මභාණ්ඩාරය රක්ෂා කරණ කෙණකුන් වූව තුඹ වැනියන් හඹනු නො යෙදෙයි. මේ හැඹුව මහා කාලයෙක් නො වෙයි. මාගේ ආනන්‍දමෙහෙරි වූ මහා මඞ්ගල්‍ය කාලයෙක.

එසේ හෙයින් තුඹ වැනියන් ඉතා සන්තොෂ වූව මහා කාල යෙක ඇඟිල්ලෙකින් මා ලබන අද්භූත වූ මිඟුල් තුඹ ම දක්නා දූ ය. බුදුකෙණකුනුදු ලැබගත නො හැක්කා වූ මහත් වූ පූජා දුන් දක් මා ලබන ලෙස් බල බලා සො හඬා වැඩසිටිය මැනව. තුඹ ගේ ම සහායයෙකි පැවිදි ලදිමි. උපසම්පදා ලදිමි. තුඹ මට කළ අනුබල සංග්‍රහය මම් ක් ව්‍යපි නො කෙලෙමි. පූර්වකාලයෙහි මහ පඩි වූ, සියසු වයස් ම කියාවූ, ස්ත්‍රීනු දු සාධාගත නුහුනුවා වූ, දුක්ක තුහුනුමා වූ, රස නො දත්තා වූ, අමාමිහ නිවන් රසයක් දූන් සක්සැම්රිදි කුමාරිකාවරුන්ට පවා සාධා දෙවා පීමි. දක්වා පීමි. රස දක්වා පීමි, සසුන් බල පෑ තුන්ලෝ වාසීන් තුඹ තුඹ සාධුකාර දෙවා පීමි. එසේ හෙයින් තුඹ මට කරවාලූ සංග්‍රහය සප්‍රකොණික ය. මුදූන් පැමිණි අඤ්ජලිත" යි යනාදීන් නො එක් ඔවා කෙපුල් දී උන්වහන්සේ ද අස්මිසා බුදුන් වන දෙස බලා සිටි දූ ය.

එ වේලෙහි සවාමිදරුවෝ "බුද්ධමාතාවගේ වික්‍රම මුළුලෝ වාසීන්ට දක්වා බුදුබල පෑ, පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි පවත්නා මාගේ බුද්ධ ශාසනයෙහි මතු අතිප්‍රසන්න වූ ශ්‍රද්ධාවන්ත කුලස්ත්‍රීන් මේ වික්‍රම අසා උපන් සන්තොෂයෙන් ඔවුන්ගේ මුඛ පද්මයන් ප්‍රබොධ කරවා, ශ්‍රීවන්ත වූ පුතුන් පැතීමෙහි උත්සාහ කරවා, බුද්ධමාතාවන්ගේ බල පරාක්‍රම මුළු ලොවට දක්වා, මතු බුදු වන බුදුන්ට ද මාතා ධර්මයන් පුරන්නාවූ කුලස්ත්‍රීන්ගේ වීර්‍ය ද වඩනා සේ ලෝවැඩක් කරවමි" යි සිතා වදුරා මැනියන් වහන්සේට "මහාප්‍රජාපතී ගොතමිනි! බුද්ධමාතා වූ තොප වැනි පින්වත්හු ලෝකයෙහි ඉතා දුර්ලභයහ. එසේවූ තොප වැනියන් ලෝකවාසීන්ට පෙලකරක් නො දක්වා නිවන් පුරයට අප්‍රතිහත ව පලායනු නො යෙදෙයි. මා තොපට කළා වූ සංග්‍රහ මතු ලෝක ප්‍රසිද්ධ වන සේ හා පෙර ස්ත්‍රීන්ගේ අභිසමයෙහි ශඞ්කා කළාවූ අඥාන වූ සක්ඛයෝ බොහෝය. ඔවුන්ගේ ද ශඞ්කා දුරු කරණ පිණිස දූන් මා මැදූයෙහි තොපගෙන් කිසි ගම් සාධිබලයක් දක්වා බලනු" යි වදාළ සේක.

එ වේලෙහි උන්වහන්සේ බුදුන් වදළ බස් මුදුනෙන් පිළිගෙණ "යෙහෙක සවාමීනි! මා වැනියන්ගේ කුමක බල දක්වම් ද, තුඹගේ බුදුබල ලෝකවාසීන්ට දක්වා සිසියම් පෙළහරක් කෙරෙමි' යි කියාලා බුදුන් වැඳ අවසර ගෙණ ධ්‍යානයට සම්වැද ආකාශයට තලෙක, දෙ තලෙක, තුන් තලෙක, සතර තලෙක, පස් තලෙක, සතලෙක, සත් තලෙකැ යි නැගී නැගී, බැස බැස, සත් වාරයෙක බුදුන් වැඳ නැවත සියක් තල, දහස් තල, ලක්‍ෂයක් තලැ යි ආකාශයට පැනනැගී පුන්සඳක් සේ දිලිහි දිලිහී සිට දසදිග් බලා "මුළුලෝ වැසියනි මේ මාගේ බලයෙකැ යි නො සිතව. මපුතනුවන් ගෞතම බුදුන්ගේ සසුන් මින් සියලු ස්ත්‍රීන්ගේ ම බලයෙක් මි ය. එසේ හෙයින් මා පුතනුවන් ගෞතම බුදුන්ගේ පෙළහරක් බලව" යි හඬගෑ දූ ය. එ කෙණෙහි දසදහසක් සක්වළ සියලු දෙව් බඹපිරිස් රැස් ව තුන්ලෝ පුරා සිට බුදුන්ට සාධුනාදයෙන් සතුතිපූජා කළහ.

ඉක්බිත්තෙන් මෙහෙණින්නස් දෙදෙනකු සේ පෙණී, සතර දෙනකු සේ, අටදෙනකු සේ, සොළොස් දෙනකු සේ, සියක්දෙනකු සේ, දහසක් දෙනකු සේ ලක්‍ෂයක් සේ කෝටියක් සේ පෙණී පෙණී වෙන වෙන රූ මව මවා මේසා මුළු සක්වළ මුළුල්ලෙහි අහස්කුසට අවකාශයක් නො තබා චක්‍රවාට සරසිගෙහි පිපී වැනී ගියා වූ රත්පියුම් වනයක් බුදුන්ට පිදුම් සේ එකලා වෙසින් සිට ඒ සා මහත් ශ්‍රමෙහෙණිනී පිරිස ලවා මා පුතනුවන් ගෞතම බුදුන්ගේ බලයක් බලව යි කටින් කටින් කිය වූ දූ ය. එ කෙණෙහි දු මහත් වූ සාධු නාදයෙන් පූජා වි ය.

නැවත: ඒ සා මහපිරිස හෙළැ ඇසිපිය නගා නො ලන ඇසිල්ලෙහි එ තෙක් රූ අන්තර්ධාන කොට නැවත ගුවන් කුස එකලා වෙසින් පෙණී "මම ය බුද්ධමාතාමෙ"' යයි බැණ නැගී දූය. එ කෙණෙහි දු මහත් වූ සාධුනාද පූජා විය.

නැවත: විදුලියක් සැහවුනා සේ අන්තර්ධාන වූ දූ ය. තුන්ලෝ පුරා සිට ඒ සා මහත් දිව්‍ය සේනාවෙන් උන්වහන්සේ කොයි වන් බවත් දන්නා කෙණෙක් නැත. උන්වහන්සේ දෙව් ලොවත් නැත, බඹලොවත් නැත. මිනිස්ලොවත් නැත. මේ සක්වළත් නැත. පර සක්වළත් නැත. වැළි කොයි වන් සේක්ද? යත්; සිටි තැන ම සිටිසේක. කොයි සැහවුනු සේක් දෝ හෝ යි මහ පිරිස කුහුල් වමින් සිටිය දී නැවත විදුලියක් පෙණී ගියා සේ මහපිරිසට පෙණුනු දූ ය. එ කෙණෙහි දු සාධුනාද පූජා වි ය.

නැවත: පිරිස බල බලා සිටිය දී උතුරුකුරු දිවයින මෙර ගලින් මුවා වූ දැ ය. එ කෙණෙහි දු දන්නෝ නැත. මෙ තෙන ම සිට පෙණෙත්ව යි අධිෂ්ඨාන කළ දැ ය. දැවාහනයකින් වැසූ රන් මල්දමක් සේ ඒ සා මෙරගල විනිවිද විශෙෂයෙන් පෙණුනු දැ ය. එ කෙණෙහි දු සාධුනාද පූජා වි ය.

එයින් ශෙෂ සක්වළ ගලින් මුවා වූ දැ ය, නැවත සක්වළගල විනිවිද පෙණුනු දැ ය, එ කෙණෙහි දු සාධුනාද පූජා වි ය.

නැවත අශෝක්කුස පෙණී "තුන්ලෝ වැසියෙනි! මේ මාගේ බලයෙක් නො වෙයි. ම පුතනුවන් ගෞතම බුදුන්ගේ සසුන් වන් සක් හැම්පිදි කුමාරිකාවරුන්ගේ පවා මෙබඳු වූ පෙළහර ඇත් ම ය. එසේ හෙයින් මෙයි දු බුදුන්ගේ ගුණමහිමයෙකැ"යි හඬගෑ දැ ය. එ කෙණෙහි දු බුදුන්ට දුන් සාධුනාද පූජා තුන් ලෝ පුරා ගි ය.

නැවත "කුමන පෙළහරක් දක්වන සේක් දෝ හෝ" යි මහ පිරිස සිත සිතා සිටිය දී අසුරුසණක් කලින් අහසින් බැස මහ පොළොව කිමිද යට සාරලක්‍ෂ අසූදහසක් යොදුන් දිය පොළොව කිමිද, එයින් නවලක්‍ෂ සැටදහසක් යොදුන් වා පොළොව කිමිද, යට අජටාකාශය බලා, නැවත හුස්මක් නගා නො ලන ඇසිල්ලෙහි දක්‍ෂිණ සාගරයෙන් පැන නැගි දැ ය, එ කෙණෙහි දු සාධු නාද පූජා විය.

නැවත දක්‍ෂිණ සාගරය කිමිද පශ්චිම සාගරයෙන් නැගි දැ ය. පශ්චිම සාගරය කිමිද උත්තර සාගරයෙන් නැගි දැ ය. උත්තර සාගරය කිමිද පූර්වසාගරයෙන් නැගි දැ ය. පූර්වසාගරය කිමිද දක්‍ෂිණසාගරයෙන් නැගි දැ ය. ඒ ඒ කාලයෙහිදු සාධු නාද පූජා වි ය.

නැවත සතර මහා සාගරය සිසාරා කීපවාරයක් සක්මන් කළ දැ ය. නැවත එයින් ආකාශයට පැන නැගී "සියලු සත්හු ම මා දකිත්වා"යි අධිෂ්ඨාන කොට ලා අහස්කුස පලක් බැඳ රන් පිළිමයක් සේ වැඩහුන් සේක.

තව ද: කුමන විසමයක් පානා සේක් දෝ හෝ යි සියලුදෙනා බලන කල්හි ශරීර ය මහත් කොට මව මවා ක්‍රම ක්‍රමයෙන් උස් උස් ව දෙව්ලෝ බඹලෝ ගෙවා ශිරස තබා ගෙණ මේ සා මුළු

තුන්ලොව එක කසින් හැසවා ගෙණ පූර්ව පශ්චිම චක්‍රවාටයෙහි දෙදන මඹුල්ල තබාගෙණ වැඩඋන්නා සේ පෙණී "මම දෙවියෙක් බඹෙක් නො වෙමි. බුදුන්ට කිරිමවුකම් කළා වූ එක්තරා එක් සත්‍රියකිමි. බුදුන්ගෙන් මා ලද කිසියම් ගුණලවයෙක්හි බල බලව"යි කී දැ ය. එ කෙණෙහි දු මහත් වූ සාධුකාර පූජා විය. තුන්ලොව උන්වහන්සේගේ එක මෙහෙණි රූපයට ම අවකාශ වූ කල දෙවි බඹ කැලෝ කොයි වැද සිටියාහු ද? යත්; එසේ නැත. උන්වහන්සේ තමන් වහන්සේගේ ස්වභාව වූ ශරීරයෙන් අගලක් සා තැනු ත් මහත් වූයේ ත් නැත උස් වූයේත් නැත. ඒ අසාධාරණ වූ සෘද්ධි මහිමයෙක් මි ය. එ මෙයි සෘද්ධි ලදුමවුන්ට මූත් නො දුනේ ම ය නො සිතේ ම ය. සෘද්ධිවිෂය ය අචින්ත්‍ය ම ය.

නැවත: එ පෙළහර හැර එක් අහස් පොමා එක්ලක්ෂ අට සැට දහසක් යොදුන් උස මෙරගල කුඩ දණ්ඩක් සේ ගයා ගෙණ අනික් අත දිගු කොට දෙ ලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝන කඩ බොල් මහපොළොව අනික් සක්වළකින් පාත්මාලාවක් සේ ගයා ගෙණ, මෙරගල මතුයෙහි සාබා එක් අගනකින් පත්කුඩයක් සේ ගෙණ, නැගෙන හිරි සක්වළ මූවවිට සිට පැළසක්වළ මූව විටට ය, පැළසක්වළ මූවවිටින් පූර්වසක්වළ මූවවිටට ය, උතුරු සක්වළ ගලින් දකුණු සක්වළ ගලට ය, දකුණු සක්වළ ගලින් උතුරු සක්වළ ගලට ය, සක්වළගල සිසාරා ය යි. නො එක් වාර යෙහි සක්මන් කොට විදුලි සේ නා. එ කෙණෙහි දු සාධුනාද පූජා යෙන් තුන්ලෝ පුරා ගියා.

නැවත: එ පෙළහර හැරපියා සියලඟින් දුම්කඳු හැර හැර මුළුලොව එකාන්ධකාර කළ දැ ය, දෙවියෝ බඹුන්ට නො පෙණෙති. බඹු දෙවියන්ට නො පෙණෙති. මනුෂ්‍යයෝ ද ඔවුනොවුන්ට නො පෙණෙති. "කොල! මේ කුම්න පෙළහරක් ද, අපි ඇම ඔවුනොවුන් නො දකිමෝ, නොප කොයි ද, මම කොයි ද, රුව ගිය තීයා ද, හිරු හල නොහී ම කෙසේ රූ වූ තියා ද"යි යනාදීන් කිය කියා සිටි කල්හි, නැවත ඒ අඳුර අනන්ධීන කොට හිරි රස් කලබක් සේ පෙණී තෙජොකසින සමාපත්තියට සම වැදලා සියලඟින් ගිනි කඳු හැර තුන්ලොව ම ඒකාලොක කොට ගිනිපුලිඟුයෙන් පිරූ දැ ය. ඒ සා මහත් ගින්නෙන් මුළු ලොව මී මකුළු පු දුලකම ත් හානියෙක් නො වී ම ය. එ කෙණෙහි දු "මුළු ලෝ වැසියෙනි! මෙ කප් ගින්නෙකු ත් නො වෙයි. ගෙලු අවැඩකරු ගින්නෙකුත් නො වෙයි. භය නො කරව. මහා

ගෞතම බුදුන්ගේ චුල්ලමාතාවන් කළ පෙළහර වූ ලෝමැඩ ගිනිය සසුන් බල බලමි'යි සබඟ කී දැ ය. එ කෙණෙහි දු දුන් සාධුනාද පූජායෙන් තුන් ලෝ පිරී ගිය.

නැවත: එ ගිනි අන්තර්ධාන කොට පෙණී "මිට ත් වඩා පෙළ හරෙක් තමන් ලෝකයෙහි ඇද් දෙ හෝ"යි මහපිරිස කුතුහල්වමින් සිටිය දී "තව ද පෙළහරක් බලව"යි කියාලා ආකාශයෙහි සිටි පොළ සිට ම, එක් අතක් දිගු කොට කොට පන්සියක් යොදුන් හිමාලය පර්වතයට පොවාලා එහි මුචලින්දය, සිනෙරුය, මන්දරය, දද්දරය, චිත්‍රකූටය, කාලකූටය, කෛලාසකූටය, සුදර්ශනකූටය, ගන්ධමාදනකූටය, චුල්ලකාලය, මහාකාලය, චන්ද්‍රපාර්ශ්වය, සූර්ය පාර්ශ්වය, ජලපාර්ශ්වය, මණිපාර්ශ්වය යි යනා දි වූ සුවාසූ දහසක් පර්වත සමූහයන් අඹබිජු අවුළන්නා සේ, අවුළා එක මිටව ගෙණ අත නගා පෑ සේක. එකෙණෙහිදු මහ පිරිස සාධුකාර දුන්හ.

නැවත: ඒ පර්වතයන් සවකීය සවකීය ස්ථානයට ම හැර දැඟිල්ලක් පොමා එක් ඇඟිල්ලෙකින් පණස් යොදුන් හිරි මඬල වසා අනික් ඇඟිල්ලෙන් උනු පණස් යොදුන් සඳමඬල කිසිවක් නො පෙණෙන සේ වසා පෙළහර පෑ දැ ය. ඒ පෙළහරෙහි ද දෙව් මිනිස්සු ද සාධුකාර දුන්හ.

නැවත: අනික් පෙළහරකුදු බලව යී කියා සිටි පොළ සිට ම එක් අතක් දිගු කොට දසක් සක්වළෙහි හිරිමඬුලු දසක් හා සඳ මඬුලු දසක් හා ගෙණ පෙරට තබා සෑඩි සූත්‍රයෙන් අවුණා මන්ත්‍ර වැල දෙකක් සේ, දැතින් ගෙණ සිටි දැ ය. එ කෙණෙහිදු තුන්ලෝ වැසියෝ මහත් වූ සාධුකාර කොට බුදුන්ට ම මහත් වූ සතුති පූජා කළහ.

නැවත: එ පෙළහර ද හැරපූ සේක. එ කෙණෙහි යම් සේ යපාලමක් රත්කොට කිතිහිරි මුදුනේ තබා කුළු මුදුනෙන් පහළ කල ඒ ඒ දිශ්හි දිවන්නා වූ ගිනිමල් සේ හිරි මඬුලු දසත්, සඳ මඬුලු දසත්, ඒ ඒ දිශ්හි දිවි ය, එසීදු එක් පෙළහරෙක, එ පෙළහර දුටු වේලෙහි සත්ත්වයන්ට උපන් සන්තොෂය ද මෙ තෙකැ යි පමණ නැත.

නැවත: හිරි විම්බ ආසන කොට, සඳවිම්බ ආලම්බන කොට වැඩහිඳ ධ්‍යාන මුහුතීයකින් එක් පෙළහරක් දක්වූ දැ ය. එ කෙණෙහි දු දෙව් මිනිස්සු සාධුකාර දුන්හ.

නැවත: ඒ පෙළහර ද හැර එක් අතක් දිගු කොට සතර මහා සාගරයෙහි දිය එක අත්ලෙන් උකාගෙණ අත ඔසවා පෑ දූ ය. ඒ කෙණෙහි සමුද්‍රයෙහි පැන් නො දුක සියලු දෙව් මිනිස්සු "කොල! මේ කුමන විස්මයෙක් ද, මහමුහුදු පැන් කොයි වත් දූ"යි කියන්නාහු ඒ කෙණෙහි "එම්බා සත්ත්වයෙනි! මහමුහුද පැන් මාගේ මේ අත්ලේ තුබූයේ ය. සියලු ප්‍රාණීන්ට ද කිසි හානියෙකුත් නො වී ය. තෙල පැන් බලව"යි අත්ලොස්සෙහි පැන් මහමුහුදට දුමූ දූ ය. ඒ කෙණෙහි කල්පාන්ත වර්‍ෂාවක් සේ යොදුන්, දෙයොදුන්, සිය දහස් යොදුන් ජලධාරාවෝ මුළු සක්වළ පුරා මැගිර සතර මහා සාගරය පෙර සේ ම පුරා සිට ගත්හ. ඒ පෙළහර දුටු දෙව්, මිනිස්සු සාධුනාද පූජාවෙන් තුන්ලෝ පිරූ හ.

නැවත: "දෙව්මිනිසිනි! තව ද බුද්ධමාහාත්මයන්ගේ පෙළහර බලයක් බලව"යි කියාලා සක්විති රජක්හුගේ වෙසක් මවා චක්‍ර රත්නාදි සත්රුවන මවා, සූවාසූදහසක් රජසෙනග මවා, සතිස් යොදනෙක පැතිර සිටිනා සෙනගක් මවා, ආකාශයෙහි ගමන් ගත් සක්විති රජක්හුගේ ශ්‍රීවිභූති දක්වූ දූ ය, ඒ පෙළහර දුටු සත්ත්වයෝ ද "සක්විති රජකු හා, බුදුකෙණෙකුන් හා, එක සක්වළෙක උපදීමෙක් ඇද් ද, මේ කුමන විස්මයෙක් දූ"යි කිය කියා සිටියහ. ඒ වේලෙහි සමින් වහන්සේ "සත්ත්වයෙනි! මම සක්විති රජෙක් නො වෙමි බුදුන් මවූ මහාප්‍රජාපතී ගොතමී නම් මෙහෙණි ම වේ දූ"යි හඬගා කී දූ ය ඒ කෙණෙහිදු සාධුනාද පූජාවට තුන්ලෝ කුස කුඩා ව ගියා ය යි සිතමි.

නැවත: මහත් වූ ඇත් වෙසක් මවා, සියදහස් යොදුන් තැන් වසා සිට, තුන්ලොව ඇසෙනසේ ගසනා කුඤ්චනාද නම් පූජාවක් බුදුන්ට කළ දූ ය. ඒ ඇත්වෙස ද අන්තර්ධාන කොට ඉතා මහත් වූ ගුරුළු වෙසක් මවා, දෙපියාපයෙන් මුළු සක්වළගබ පියනා සේ වසා ගෙණ පෙණී ගරුඬනාද නම් පූජාවක් කළ දූ ය.

නැවත: ඒ ගරුඬරූපය අන්තර්ධාන කොට මහත් වූ සිංහරූපයක් මවා ආකාශයෙහි පෙණී තුන්ලොවට ඇසෙන සේ ගජනා, කොට සිංහනාදයෙන් බුදුන්ට පිදූ දූ ය

නැවත: ඒ සිංහරූපය අන්තර්ධාන කොට ආකාශයෙහි සවරූප වූ මහණ වෙසින් පෙණී.

මාතුවජ්ජා තෙ මහාවීර-නව සායන කාරිතා
අනුප්පත්තා සඞ්ඛං අත්ථං-සාදෙ ඔකුදකී චක්ඛුමා-ති.

යන මේ ගාථාව කිය කියා ආකාශයෙන් බැස බුදුන් වැඳ "ස්වාමීනි! බුදුරජාණෙනි! මේ පෙළහර කළා වූ මම දෙව් බඹ කෙණෙකුන්ගේ ආනුභාවයෙන් අනික්, කෙණෙකුන්ගේ උපදෙස කින් නො කෙළෙමි. තුඹමහන්සේ උගන්වාලූ උපදෙස් වූ පරිද්දෙන් ම කෙළෙමි. තුඹමහන්සේගේ සසුන් වන් ස්ත්‍රීන්ගේද බල දක්වීමි, තුඹගේ ද බල දැක්වීමි, මම තුඹගේ කුඩා මෑනියෙමි, මහා ප්‍රජාපතී ගෞතමී නම් මම ය"යි යනාදීන් කිය කියා ආකාශයෙන් බැස බුදුන් වැඳ එකත් පස් ව හුන් සේක.

එ කල මේ පෙළහරෙහි පහන් වූ සියලු ස්ත්‍රී පුරුෂයෝ සුභානන්ද මාකායෙන් එක විට නැමුනාවූ මහ හල් වනයක් සේ උන් වහන්සේගේ පාද මූලයෙහි වැද පෙරළී "ස්වාමීනි! මෙතෙක් දවස් බුදු වූ සේක් අප බුදුහු ම ය යි සිතුම්හ. තුඹ ත් බුදු වූ බවු නො ද තුම්හ. පුනානුමන් වහන්සේ පළමු කොට බුදු කොට්ලා තුඹ පසුව බුදු වූ දෑ ද" යනාදීන් ඔබට සියදහස් ගණන් සතුති පූජා කොට "මෙසේ වූ පෙළහර හා මෙසේ වූ ආනුභාවයක් ලැබීමට කෙසේ වූ පිණක් කළ සේක් දැ"යි විචාළහ. එ වේලෙහි "තව ද සත්ත්වයන් වඩ වඩා පින් කැරවීමෙහි උත්සාහ වඩවමි"යි සිතා පෙර තමන් වහන්සේ කළ කුශලමූලය දක්වන සේක් මෙසේ වූ සෘද්ධි බලයක් අනෙක් කාරණයෙකින් ලදුයෙම් නො වෙමි, පූර්වජාතියෙහි කළ කුශලබලයෙකින්ම ලදුයෙමි. ඒ කෙසේ දැ? යත්;

මෙයින් කල්පලක්ෂයෙකින් යට පියුමතුරා නම් බුදුරජාන කෙනෙක් ලෝකයෙහි උපන් සේක. එ කල ඒබුදුන්ගේද චුල්ල මාතා කෙනෙක් ඒ බුදුන්ගේ සසුන් වැද මහණ වූහ; එකල බුදු රජාණෝ සිවු වණක් පිරිස් මැද ඔවුන් රාත්‍රඥයන් කෙරෙහි අග්‍ර කොට භික්ෂුණී ශාසනයට ප්‍රධාන වූ ස්ථානාන්තර දුන් සේක. එ සමයෙහි මම ශ්‍රීමත් වූ කුලස්ත්‍රියක්ව ඉපැද ශ්‍රද්ධා ලදින් කලින් කලට වෙහෙරට ගොස් බුදුන් අතින් බණ අසනුයෙම් ඒ ස්ථවිරීන් ගේ මහිම දැක "මේ ලෝකයෙහි ස්ත්‍රී ජාතියෙහි ඵල ලදුමෝ නම් මේ බඳු වූ ස්ත්‍රීහු ම ය. රෑ ඇතියන් කෙරෙහි අග්‍ර වූහ, රජක්හට අගමෙහෙසිනී වූහ, බුදුකෙණෙකුන්ට මවු වූහ. භික්ෂුණී ශාසනයට ගුරු වූහ. අමාමහ නිවන් දුටහ. සෘද්ධිමතුන් කෙරෙහි අග පැමිණි යහ. මෙසේ එක ජාතියෙහි ම පඤ්චස්ථානයෙකින් අග්‍ර වූහ. මේ බඳු වූ ශ්‍රී විභූතියෙක් මට ද වී නම් යෙහෙකැ"යි පතා පතා ඒ බුදුන් පවරා සත් දවසක් මධුරාහාරයෙන් ලක්ෂගණනක් ශ්‍රාවකයන්

හා බුදුන් වළඳවා පසුව ද අඟැඟි වූ පිරිකර දී "මම ද මේ බඳු වූ සර්වඥතාඥානධරයෙක් වී නම් යෙහෙකැ" යි පතා බුදුන් වැඳ හොත්තෙමි.

ඒ බුදුහු "මේ පිණෙන් මතු නොසිඳු රජකුලයෙක්හි ඉපැද දිව්‍ය සමාන රූප සම්පත් ලදින් ශුද්ධෝදන නම් රජක්හට අග බිසෝ කොට එ කල උපදිනා ගෞතම නම් බුදුන්ට වුල්ලමාතා ව ඔවුන්ගේ සසුන් වැද මහණව භික්ෂුණී ශාසනයට ගුරු ව අමා මහ නිවන් දක ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍යයි ඇතියවුන්ට අග්‍රම රාත්‍රඥ මහාප්‍රජාපතී ගෞතමී ය යි මෙනමින් ප්‍රසිද්ධ වන්නීය" යි විවරණ පතුල් දුන් සේක. එ කෙණෙහි දූ මම අද සේම සියලු සතුන් හා දෙව් මිනිස්සු සාධු නාදයෙන් පූජා කළහ. එතැන් පටන් කප් ලක්ෂයක් මුළුල්ලෙහි දෙව්ලොව මිනිස් ලොව ඇවිදිනා ලදුයෙම් එක් කාලෙකත් සතර අපාය ඇසින් නුදුටුයෙමි. ශක්‍ර, සුයාම, සන්තුෂිත, සුනිර්මිත, පරනිර්මිත වක්‍රවර්ති ආදි වූ දිව්‍ය මනුෂ්‍ය රජුන්ට ම අගමෙහෙසිනී වීමි, මෙසේ සසර සුව විඳ ඇවිඳ,

තව ද: මේ කප කසී රට එක්තරා එක් කුලයෙක උපන්මි. එ කල පියුමෙන් උපන් පදුමවතී නම් බිසොවුන් කුසින් එක ද උපන් පන්සියයක් දරු කුමරහු වැඩී, පසේ බුදුව එක පෙළ අවුත් වස්වසන දවස් මා පෙරට පෙණී ගිය සේක. එ වේලෙහි මම ඒ පන්සියක් පසේ බුදුන් පවරා, පන්සියයක් ස්ත්‍රීන් හා ඔවුන්ගේ පන්සියයක් පුරුෂයන්නු දු සමාදන් කරවාගෙණ, පන්සියයක් ගෙවල් කරවා, පන්සියක් පසේ බුදුන් වස්වස්වා, පන්සියක් අටපිරිකර දිනීමි. එ පන්සියක් කුලසත්‍රි නම් මේ පන්සියක් ශාක්‍ය මෙහෙණීන්නෝ ය, එ පන්සියක් පුරුෂයෝ නම් මේ පන්සියක් ශාක්‍ය මහණු ය. එ සමයෙහි මාගේ වල්ලභයානෝ නම් මේ සමයෙහි ශුද්ධෝදන රජ්ජුරුවෝ ය. පෙර මා විසින් කළා වූ මෙසේ වූ කුසල බලයෙකින් මෙ බඳු වූ සර්වඥතාඥාන හා ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය ලදිමි, යනාදීන් මහපිරිසට තමන් වහන්සේගේ පූර්ව ප්‍රණිධීන් සද්ධර්ම දෙශනා කළ දූ ය. එ වේලෙහි දූ සත්ත්වයෝ දෙගොත් මුදුන් දී සාධුනාද පූජා කළහ.

එසින් සමහර සඞ්ඝකෙණෙක් "මේ පන්සියක් මෙහෙණින් නො ත් මුන්වහන්සේලා එක්ව ම පින් කළාහු ල. ඔවුන්ට ත් මෙ වැනි පෙළහරෙක් ඇද්දෝ හෝ නැද්දෝ නෝ" යි සැක කළහ. එ කල ප්‍රජාපතී ගොතමීන් වහන්සේ සඞ්ඝයන්ගේ ඒ අදහසු දූ දැන ලඟ සිටි පන්සියක් මෙහෙණින්නන් දියාව බලා "දරුවෙනි!

සත්ත්වයන්ගේ සැක දුරු කරවා තෙපි තෙපි ද වෙන වෙන ම පෙළහර දක්වා තොප තොපට මේ සා මහත් වූ අමාමහ නිවන් දුන් මපුතනුවන් ගෞතම බුදුන්ට සත්කාර පූජා කරව"යි කී දැ ය.

එ වේලෙහි උන්වහන්සේ කී බස හා සමග පන්සියයක් මෙහෙණින්නෝ ආකාශයට පැන නැගී එකී එකී දෙන සිය දහස් ලක්ෂ කෝටි ගණන් මෙහෙණිසි රූ මව මවා, නො එක් පෙළහර පානාහු දක්ෂ වූ ස්වර්ණකාරයකු එකසත රන්පිඩක් ගෙණ නානාසණ්ඨාන වූ රූපාලඞ්කාරයන් මව මවා දක්වන්නා සේ, එකී එකී දෙන ශත සහස්‍ර ගණන් වෙන වෙන රූ මව මවා, නො එක් පෙළහර පෑ කරු කැලයෙන් දිලිසෙන ආකාශය සේ සියලු ගුවන්කුස නොබවා, නොඑක් මාරයෙහි දු මා දිලිහී අනන්ත ගාන ව පෙණී ඉතා මහත් වූ අද්භූත දක්වා බුදුන්ගේ මහිම පෑ මහත් වූ සතුති පූජාවෙන් ලෝ කුස් පුරා, ආකාශයෙන් බැස බුදුන් රහතන් මැද මහා ප්‍රජාපතී ගෞතමීන් වහන්සේට "ස්වාමීනි! මේ සා මහත් වූ ශ්‍රීයක් අපට ගෙණ දීලු දැ ය. තුඹ වහන්සේගේ ම සහායෙන් පින් කොට දෙව්ලොව මිනිස්ලොව සුව විඳ ත් ඇවිදියම්හ. දැනු දු තුඹගේ ම බලයෙන් බුදු සසුන් මැද මහණ ව අමාමහ නිවන් දැක සංසාර සාගරයෙනු ත් ගොඩ නැංගම්හ. එසේ හෙයින් තුඹ ම අපට ඉතා මහත් වූ වැඩක් කළ දැ ය"යි යනාදීන් ඔබට මුව නො හැමෙන සේ සිය දහස් ගණන් ස්තුති කොට කොට උන්න.

ඉක්බිත්තෙන් මෙසේ අවසර ලදින් මෙ බඳු වූ පෙළහර පාලෝවැඩ කොට හුනස්නෙන් නැගී බුදුන් මක දෙස වැද වැද ඒ මහාප්‍රජාපතී ගෞතමී නම් වූ බුද්ධමාතාවෝ සපිරිවරින් මෙහෙණ වර බලා නික්මුනු දැ ය. එ කෙණෙහි මහපොළොව ද කම්පිත වි ය. රැස් වූ දෙව් මිනිස්සු ද කම්පිත වූහ.

එ වේලෙහි සවාමිදරුවෝ සඟපිරිස් බලා "මහණෙනි! බුද්ධමාතාවෝ නම උත්තමයන්ගෙන් ආදර ලැබිය යුත්තාහ. ඔවුන්ට පසු ගමන් කරම්හ"යි හුනස්නෙන් පැන නැගී තමන් වහන්සේගේ මඟුල්ලකුණෙන් දිලිසෙන ශ්‍රී පාද යුගලයෙන් මිහිකත සතන සනහා පෙර තමන් වහන්සේ දම්පල් නම් කුමාර කල මහා ප්‍රතාප නම් වූ දෙව්දත් රජහු තමන් වහන්සේ අහසට දම දමා අසිමාල නම් වධ කරවා මෛත්‍රී පාරමිතාව කුළුගැන් වූ දවස් "මා කළ වරදට තෙල වධ මට ම කරව, මා පුතනුවන්ට වධ නො කරව, ඔහු නිරපරාධයහ"යි යනාදීන් මහත් වූ විලාපයෙන්

සඬ හඬා රත්මිණුම් පෙණී සේ! රාජාඞ්ගණයෙහි ඒ ඒ තැන්හි කපා විසුරුවන ලද අතුල් පතුල් හිසලා සමහරක් තුරුල්ලෙහි ලලා "නොප නො නවත්නා බැවින් අතුල් පතුල් කැපූ බැවින් කන් නාසා කැපූ බැවින් සෙල කොට සුහනුමන් මට දීපියව, එ නොසිත් හැරපියව, එ නෙතින් හැරපියව"යි යනාදීන් කියා කියා හඬ හඬා පවත්ගත් ප්‍රේතයන් සේ රාජාඞ්ගණයෙහි ඒ ඒ තැන්හි පෙරළි පෙරළී ඔබට කරන්නා වූ මඩ තුඹු කමාට කරන්නා සේ ඉමිසාගත නොහී ඔබගේ ජීවිතක්ෂයට පලමුකොට ශ්‍රාන්ත ව, ල පැළී මලා වූ උන් වහන්සේ නමින් මහන්සේට එ දමස් කළා වූ අපමණ වූ දරුසනාමට ම මෙ දමිස් පසුගමින් සීමවා සංග්‍රහ කරන්නා සේ, ශ්‍රාවක සෙනඟ හා සමඟ මෙහෙර දෙරටුව දක්වා ඔබට පසු ගමනින් පූජා කළසේක. මේ බුදුසස්නෙහි සත්වයන්ට ලෝවැඩ නීසා සවාමිදරුවන් විකොයජන පුද්ගලයන්ට පෙර ගමින් කළ තැන් බොහෝ සේ පෙණේ ම ය. බුදුන්ගෙන් පසුගමින් පූජාවක් ලද කෙනෙක් මේ මහාප්‍රජාපතී ගෞතමීන් වහන්සේ විනා අනික් කිසිකෙනෙකුන් නැතැයි දත යුතු.

මෙසේ සවාමිදරුවන් ගොස් ඉන්ද්‍රනීල මණ්ඩපයෙහි රත්ගල් වාරසෙක සිටි සිංහරාජයකු සේ වැඩ සිටි කල්හි නැවත බුදුන්ගේ ශ්‍රීපාද වැඳ සවාමිනි! මා ඇතුළු වූ සියලු සතුන්ගේ මෑණියෙනි! පියාණෙනි! තුඹගේ අම්ාකඳක් බඳු වූ මේ රූපකාය හා, පුන්සඳක් බඳු වූ මේ ශ්‍රී මුඛ ය හා, නවහම් පිල්මාලාවක් බඳු වූ මේ ශ්‍රී පතුල් හා, මේ මාගේ අන්තිම වූ දශීනය ය. නම් ද මට සබූ දුක මැනැවැ"යි කියා කියා බුදුන් පාදමූලයෙහි වැඳහොත් දැය එ වෙලෙහි දූ නො එක් දෙව්මිනිස්සු කම්පිත වූහ, එ වේලෙහි සවාමිදරුවෝ තමන් වහන්සේගේ මුඛ නමැති පද්මයෙන් සුවඳගඳ විහිදුවා වදාරණ සේක්.

නිබ්බායිස්සාමි ඉචෙඡම්-කිං වක්කාමි වදන්තියා
යස්ස දානිචච මෝ කාලං-මඤ්ඤසීති ජිනො බ්‍රැවි යි.

සන මේ ගාථාව වදාරා "සියලු සතුන් නිවන් පුරයට ම මෙහෙ යන්නාවූ ඔම දුන් නොප නිවන් පුරයට යමහ යි අවසර ඉල්වනු වන්ට කුමක් නම් කියම් ද, යෙහෙක, කල් දනුව"යි අවසර දී වදාළ සේක.

ඒ කල උන් වහන්සේ සපිරිවරින් ගොස් මෙහෙණවරට වැද ආසනයට පැන නැගී පර්‍ය්‍යඞ්කයෙන් වැඩහිඳ ප්‍රථමධ්‍යානයට සම්වැදලා, එයින් ද්විතීයධ්‍යානයට සම්වැදලා එයින් තෘතීයධ්‍යානයට සම්වැදලා, එයින් චතුර්ථධ්‍යානයට සම්වැදලා එයින් ආකාසානඤ්චායතන ධ්‍යානය, විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය, ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය යි නො එක් ධ්‍යානයට අනුලෝම-ප්‍රතිලෝමයෙන් නො එක් ශතසහස්‍ර වාරයෙහි සම්වැද පහනක් නිවුවා සේ චේතනාව නිරුද්ධ කොට නිවන්පුර ගොස් කනක ප්‍රතිමා රූපයක් සේ වැඩහුන් සේක. එසේ ම පන්සියයක් මෙහෙණින්නෝ ද තමන් තමන්ගේ ශයන මතුයෙහි අඩ පර්‍ය්‍යඞ්කයෙන් ම හිඳ එම ක්‍රමයෙන් ම ඒ ක්ෂණයෙහිම චේතනාවන් නිරුද්ධ කොට ප්‍රතිබිම්බ මෙන් උන්හ.

ඒ ක්ෂණයෙහි ම මහී නමැති කාන්තා සියදහස් ගණන් වාරයෙහි මහහඬින් ගුගුරා වෙවුලා පැන නැගී ආකාශයෙහි අකුණු සෙන විදුලිය ශතසහස්‍රයන් දක්වා අකාලයෙහි මේඝනාද පතුරුවා මහහඬින් ගුගුරා පැන නැංග. සියලු දෙවතාවෝ ද අහෝ ඛේද ය! අහෝ ඛේද ය යි තුන්ලෝ පුරා ගුගුරා පැන නැංගහ. මහමේර කුඹල්සකක් සේ භ්‍රමණය කොට කම්පිත ව නැමින. මහමුහුද හැළිලි ගියෙ. ආකාශයෙන් මල් වර්ෂා වැස්ස.

ඒ වේලෙහි සම්භර දෙවියෝ වහ වහා දිව ගොස් "ස්වාමීනි! බුදුන් මවූ වූ මහාප්‍රජාපතී ගොතමී නමැති ගුවන්සඳ ශාසනාම්බරයෙන් ගිලිගී පහීන වී ය. පන්සියයක් ශාක්‍යමෙහෙණිනී තරු සමූහයෝ ද ගිලිහුණහ. තුඹගේ ශාසනය ඌනු වී ය' යි බුදුන්ට දැන්වූහ. ඒ වේලෙහි ස්වාමිදරුවානෝ ආයුෂ්මත්වූ අනඳ මහතෙරුන් වහන්සේ බණවා "ආනන්දය! මාගේ ශ්‍රාවිකා සඞ්ඝයාට මේ පවත් කියව අද බුද්ධමාතාවෝ නිවන්පුර ගියහ. ඔවුන්ගේ ලොවට ඉතා අද්භූත වූ බුදුකෙනෙකු දු ලැබගත නො හැක්කා වූ අදහන මඞ්ගල්‍ය පූජා කාලයෙකැ''යි වදාළ සේක. ඒ තෙපුල් අසා අනඳ මහ තෙරුන් වහන්සේ දැස් පිරුණු කඳුලෙන් සෝදුක් ඉවස ඉමසා සියලු භික්ෂු සඞ්ඝයා කරා ගොස් ඒ පවත් සැලකළ සේක. ඒ කෙණෙහි බුදුන්ගේ අදහස් දත් දෙවියෝ ද දසදහසක් යොදුන් දඹදිව මුළුල්ලෙහි වසන්නා තුණුරුවන් කෙරෙහි පහන් වූ සියලු ස්ත්‍රී පුරුෂයන් හා සියලු සඞ්ඝගණයා කරා දිව බුදුන් මවු මහාප්‍රජාපතී ගොතමීන්ගේ අද ආදහන මඞ්ගල්‍ය පූජාමෙක් විශාලා මහනුවර දී වෙයි. නැමදන ම නික්මෙව''යි මුළු

දඹදිවට සැලකළහ. දඹදිවට මතු නොවෙයි, මේ සක්වළ දෙවියෝ දසදහසක් සක්වළ මුළුල්ලෙහි දිව්‍ය බ්‍රහ්ම සේනාවට ද දිව දිව ගොස් මේ තෙපුල් කියා මොහොතක් සාලින් රැස් කළහ.

එ කෙණෙහි දෙව්ලොව බඹලොව නාලොව ආදියෙහි ධ්‍යාන නිසා ගොස් වැඩහුන්නාවූ රහතන් වහන්සේ දක්වා බුදුන් සිතූ සිත හා සමඟ දික් කළ අතක් මක් නො කරණ ඇසිල්ලෙහි අවුත් බුදුන් පෙරට පෙණුනු සේක. ඒ සා දඹදිව ප්‍රත්‍යන්තවල සිය දහස් යොදනෙහි පවා වසන පෘථග්ජන භික්ෂූහු බුඩානුභාවයෙන් පාත්‍ර චීවර ධරා එම වෙහෙර බෝමළුවෙහ වත් පුරන්නට යනුවන් සේ කිසි පීඩාවක් නැතිව ම ගොස් ඒ වෙහෙර ම පුරා ගත්හ. දඹදිව තව ද ශ්‍රද්ධාවන්ත වූ නො එක් ස්ත්‍රී පුරුෂයෝ බාල දරුවනු දු වඩාගෙණ ඉක්බිති ගෙයක නොළියක් බලන්නට යනුවන් සේ කිසි පීඩාවක් නැතිව ම පෙළ පෙළ දී කෙළ කෙළ ගොස් ඒ එක විශාලා මහනුවර ම රැස්වූහ. තෙසැට දහසක් රාජධානි ඇති දඹදිව් තෙලෙහි තුණුරුවන් කෙරෙහි පහන් රජ බමුණු වෙළඳ ගොවි චාතුවිණ් ස්ත්‍රී පුරුෂයන් අතුරෙහි එ නුවරට නො ගියා වූ එක ද සත්ත්වකෙණෙක් නැත. මොහු එකනුවර කෙසේ සිටියාහු ද? යත්;

බුදුන්ගේ ආනුභාවයෙන් ම සිටියහ. සතර මහදිව මනුෂ්‍යයන් ආව ත් තවත් අවකාශ පෙණේ ම ය. තව ද එක් මහිමයෙක් ඇත: එතෙක් සත්වයන් අතුරෙන් යම් යම් කෙණෙක් යම් යම් කෙණෙකුන්ගේ දර්ශනයෙහි ප්‍රිය ඇතියාහු වූ නම් ඔහු ඔවුනොවුන්ට පෙණෙන්නාහු ම ය. යම් යම් කෙණෙකුන්ගේ දක්මෙහි අරුචි ඇතියාහු වූ නම් ඔහු ඔවුනොවුන්ට නොපෙණෙන්නාහු ම ය. මෙසි දු මාගේ ස්වාමිදරුවන්ගේ බුඩ මහිමයෙක් මැ ය. අචින්ත්‍ය ම ය. අසදෘශ ම ය. අද්භූත ම ය, ආශ්චර්‍ය්‍යම ය, පෙළහර මැ ය, විස්මය මැ ය. තව ද දසදහසක් සක්වළැහි රැස් වූ දිව්‍ය සේනාවට ද එම නය ම ය. එම ප්‍රකාර මැ ය.

මෙසේ වූ දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා ය යි යන අෂ්ට මහා පර්ෂදෙහි සමාගමය කෙතෙක් ඇසිල්ලෙකින් වී ද? යත්; මාගේ ස්වාමිදරුවන් ඒ අධිෂ්ඨාන චිත්තය කෑව ගඳකිළියෙන් පිටත් ම ගොස් වෙහෙර දොරටුවෙහි ඉන්ද්‍රඛීලමස්තකයෙහි ශ්‍රීපාද දිගුකරණ ඇසිල්ලෙහි, මේ සා මහත් වූ සමාගමයෙක් වී ය යි දතයුතු. මෙසේ වූ අනූන වූ සමාගමයෙක් බුදුන් බුදු ව වැඩහුන් පන්සාළිස් හවුරුද්ද මුළුල්ලෙහි අනික් කිසි කාලෙකක් නුවූයේ ය.

එ කෙණෙහි විශ්වකර්ම දිව්‍යපුත්‍රයා අවුදින් "අද මාගේ කර්මාන්ත විෂයෙහි ඵල ලැබ ගන්නා කලෙක් මැ ය. අනික් ශිල්පියක්හට මේ පින්කම කොට දෙම් මැ ය' යි සිතා පන්සියක් රන් සිවි ගෙවල්, අසුරුසංඝාටිකින් මවාලා මෙහෙණවර පිළිවෙළින් තබා පන්සියක් සිරිසඳ දෙවියන් විමන් හා සමග අහසින් බැස පූජාවට මිහි මඬලෙහි සිටගත්තා සේ රුවන්මඩු ශොභාවෙන් සියලු නුවර ඒකාලෝක කොට තෙමේ පෙරට සිටගත.

එ කෙණෙහි එ නුවරින් දිවූ සත්දහස් සත්සිය සත්දෙනකු පමණ ඇති ලිච්ඡවි ක්ෂත්‍රියරු උරෙහි අත් පැහැර පැහැර අවුදින් සබා මුඛපත් ව සන්නිදි පන්සියක් මෙහෙණින්නන් වහන්සෙන ලෙස් ඔබා පන්සියක් රන්සිවි ගෙවලව වඩා සියාරු අතුරු නො දී සිටියහ. දසදහසක් සක්වළ සකලිස් දහසක් වරම රජදරුවෝ "බුදුන් මැණියන් වහන්සේට අපි අපි ම මගුල් මෙහෙ කරමහ' යි දිව අවුදින් පන්සියක් රුවන් මඩු ඔසවා තමන් තමන් කරින් උසුලාගෙණ නික්මුනාහ. දසදහසක් සක්වළ ශක්‍ර-සුයාම-සන්තුෂිතාදී පණස් දහසක් දිව්‍යරජදරුවෝ තමන් තමන්ට අවකාශ නැති හෙයින් සූක්ෂ්මවූ අත් මවා එක කැණිමඬුල්ලට බොහෝ ගොකැස් ඉරවූවා සේ අත් දිගු කොට පන්සියක් රුවන්මඩුවල කුළුගෙවලට අත් දි දී ගෙනි.

එ කල ස්වාමිදරුවෝ ශ්‍රාවක ගණයා පිරිවරා පසු පස්සෙහි වඩනා සේක. එයිදු එක් පූජාමෙක. දස දහසක් සක්වළ සෙසු දෙවියෝ අහස්කුස් පුරා තමන් තමන්ගේ ශක්ති පමණින් පූජා කෙරෙමින් ගෙනි. බ්‍රහ්මයෝ බ්‍රහ්මසාධින් පූජා කෙරෙති සමහර දෙවියෝ දිව්‍යසාධින් පූජා කෙරෙති. අසුරයෝ අසුර සාධින් පූජා කෙරෙති, නාගයෝ නාග සාධින් පූජා කෙරෙති. ගරුඩයෝ ගරුඩ සාධින් පූජා කෙරෙති. ගන්ධර්වාදී සෙසු දෙවියෝ තමන් තමන්ගේ සාධින් පූජා කෙරෙති. සමහර දෙවියෝ අහස් වියන් බරා ගෙති හිරිමඬල සඳමඬල ආකාශයෙහි පෙණී පෙණී සිටගත. සක්වළගබ මුළුල්ලෙහි සියලු තාරකාවෝ ද දිලිහි දිලිහී පෙණෙන්නට පටන් ගත්හ. මධ්‍යාහ්න සූර්යයා රාත්‍රි චන්ද්‍රයා සේ සෞම්‍ය පහස් දෙන රශ්මි පතුරු වන්නට පටන් ගත. තව ද එක් පෙළහරකුදු ඇත. රුවන් මඩු උසුලා යන දෙවියෝ මිනිසුන්ට නො පෙණෙති. උසුලා යන මනුෂ්‍ය කෙණෙකු දු නැත. පන්සියක් සඳමඬුළු ආකාශයෙන් යන්නා සේ පන්සියක් නකත් තරු පෙළක් සේ, පන්සිය රුවන් ආකාශයෙන් තෙමෙ ම යෙයි. මේයි දු එක් පෙළහරෙක.

පළමු ම ගත ලිච්ඡවී රජුන් ආදි වූ මුළු දඹදිව මනුෂ්‍ය යෝතා ය, පසුපස්සෙහි වඩනා බුද්ධරජාතන් හා අසූ මහ සව්වන් හා, ඔවුන්ගේ පන්සිය පන්සිය පිරිවර හා, අවශේෂ වූ ලක්‍ෂගණන් කෝටිගණන් සඟ පිරිසෙන, ආකාශයෙන් ගත මහත් වූ දිව්‍ය යෝතාවෙන, මෙයි ද එක් පෙළගැරෙන, මෙසේ මහත් වූ දිව්‍ය මනුෂ්‍ය යෝතාවෙන් සවාමිදරුවානෝ ආදෘශත භූමියට වැඩ ශ්‍රාවකයන් බණවා "මහණෙනි! මෙසේ වූ ආදෘශත පූජාවෙක් බුදුකෙණකුන්ගේ සත්කෙක බුදුකෙණකුන් පූජාකරණ වෙත නැතෙත් නැත. එසේ හෙයින් බුද්ධමාතාමින්ගේ ආදෘශතයෙහි අනූන වූ ශ්‍රාවක සංඝයා සහිත වූ බුදුකෙණකු ද පූජා කළහ. මේ මේ කාරණයෙන් මේ ආදෘශත පූජාව මහණෙනි, අද්භූත ම ය අසදෘශ ම යයි වදාරණ සේක්:—

න බුද්ධො බුද්ධනිබබානෙ— කො පදිසසති භිකඛවො
බුද්ධො ගොතමි නිබබානෙ—සාරිපුත්තාදී කා තථා:–යි.

යනාදින් බණ වදාළ සේක. එ වේලෙහි ද මහපිරිස සාධුකාර දුන්හ. එ කෙණෙහි ලිච්ඡවි රජදරුවෝ ද පන්සියක් සඳුන් දරසැ බැඳ එහි වඩා ආදෘශත පූජා කරන්නාහු හුමඳ කෙල් සුවඳ සුණු ඉස ඉස මහ පෙළහරින් ආදෘශත පූජා කළහ. පන්සියක් භික්‍ෂුණීන්ගේ ධාතු නිරවශෙෂයෙන් ම ආදෘශත විය. මහා ප්‍රජාපති ගොතමින් වහන්සේගේ ධාතු මුතු රැසක් සේ කො ද මතුබු යේ ය. අනද මහතෙරුන් වහන්සේ ඔබයේ ධාතු බුදුන්ගේ පාත්‍ර ධාතුවට වඩා ධාතුයෙන් ධාතු ගෙණ බුදුන්ගේ ශ්‍රීහස්තධාතුවට දුන්සේක. බුදුහු ඒ ධාතු ඔලා ධර්මසංවේගයට පැමිණ අශීති මහා ශ්‍රාවකයන් ආදිවූ සියලු මහසඟනට දක්වා සුරක්තවූ තමන් වහන්සේගේ ශ්‍රීහස්තයෙන් කොදකැකුළු සේ මුතු සුණු සේ ඒ ධාතු පැ පැ:–

පණ්ඩිතාසි මහාපඤ්ඤ–පුථුපඤ්ඤ තථෙ'ව ච,
රතතඤ්ඤූ භිකඛුණීනං සා–එවං ධාරෙථ භිකඛවො.

ඉද්ධියා ච වසී ආසි–දිබබාය සොතධාතුයා,
චෙතො පරියඤ්ඤාණසස–වසී ආසි ච ගොතමී,

පුබබ නිවාසං අඤ්ඤාසි–දිබබ චකඛුං විසොධිතං,
සබබාසවා පරිකඛීණා–නතථි තසසා පුනබභවො.

අතතාදීපගතා හොථ– සතිපටඨාන ගොචරා,
භාවෙතවා සතතබොජඣඞග–දුකඛසස'නතං කරිසසථ සී.

යනාදි ගාථා වදාරා "මහණෙනි! මේ මහා ප්‍රජාපති ගොතමී තොමෝ මහ නුවණ ඇත්තී ය. මහමුහුදු සේ ගැඹුරු වූ නුවණ ඇත්තී ය. ආකාශය සේ විශාරද ව පතිත්තා වූ ඥාන විශෙෂයන්

ඇත්තී ය. මාගේ ශාසනයෙහි සියලු භික්ෂුණීන් අතුරෙන් රාත්‍රඥයන් කෙරෙහි අග්‍ර වූම. අසාධාරණ වූ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍යී ඇත්තාහු ය. ලක්‍ෂයක් සක්වල ක්‍ෂුද්‍ර ප්‍රාණීන්ගේ දක්වා සියලු ශබ්ද විශේෂයෙන් තමා කන්මුල දී කරණ කථාවක් සේ අසන්නට සමර්ථවූ අසාධාරණවූ දිව්‍යකන් ඇතියහ. සියලු සතුන්ගේ සිත් දන්නා නුවණ ඇතියහ. ලක්‍ෂ ගණන් කප්වල උපන් උපන් ජාති එක දවසෙක කළා වූ කටයුත්තක් සේ විශේෂයෙන් දන්නා ජාතිස්මරණ ඥාණ ඇතියහ. ලක්‍ෂයක් වන සක්වළ තිබූ අබ බිජු දක්වා විශේෂයෙන් දක්නා දිව්‍යැස් ඇතියහ සියලු ආශ්‍රවයන් ක්‍ෂය කළහ. එ වැනි මහතුන්ට පමා නො නැවැත්නාවූ මේ ස්වභාව ධර්මයෙක. මහණෙනි! තෙපි තෙපි දු තොප තොපට සිතා නම් අප්‍රමාද ව සාමිකාමෙහි යෙදී සංසාර දුඃඛයෙන් ගොඩනැඟී ඔවුන් සේ ම අමාමහ නිවන් දක්නුව"යි බණ වදාරා, ඒ ධාතු එ නුවර ම පිහිටුවා ලිච්ඡවි රජුන් ලවා මහාචෛත්‍යයක් කරවා එහි දු අපමණ වූ පූජා කරවා, දවස් පතා නො එක් සත්කාර කරණ සේ නියෝග කොට තමන් වහන්සේ ද එ සැය මලින් ගඳින් පුදා ශ්‍රාවකයන් හා සමග මහසැය සිසාරා ප්‍රදක්‍ෂිණා කොට සියලු සතුන්ට බණ වදාරා, නොඑක් ලෝවැඩ කොට එයින් ශ්‍රාවකයන් පිරිවරා දෙවුරම් වෙහෙරට ම වැඩි සේක.

මෙසේ මේ මහා ප්‍රජාපතී ගෞතමීන් වහන්සේ ආදි වූ පන් සියක් ශාක්‍ය මෙහෙණීන්නන් විසින් කළාවූ යථොක්ත වූ පන් සියක් ප්‍රතිපත්ති පූජාවන් ලත් හෙයින් ද මා විසින් පවා සඞ්ඛ්‍යාවක් කොට ගත නො හැක්කාවූ අප්‍රමාණ වූ ප්‍රාතිහාර්‍ය්‍යාදී නො එක් පූජාවන් ලත් හෙයින් ද, ඔබට තමන් වහන්සේ කැරවූ මේ ආදහන පූජාව ඔවුන් හිමි සැපත් දරුවන් හිමි වන හෙයින් තමන් වහන්සේ ම ලදුවා නම් වන හෙයිනු ත් මාගේ බුදුහු අෂීක් නම් වන සේක. එසේ හෙයින් කියන ලදුයේ මැයි:-

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොක නාථො,
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං—යි.

මෙම පූජාවලියෙහි අප බුදුන් මහාප්‍රජාපතීයාදි ශ්‍රාවිකාවන්ගෙන්ලද
භික්ෂුණී ප්‍රතිපත්ති පූජා කථා නම් වූ
සත් විසි වන පරිච්ඡේදය නිමි.

අටවිසි වන පරිච්ඡේදය

තව ද: අප බුදුන් ජීවකයන්ගෙන් ලද ජීවකාරාම පූජා නම් කවරහ? යත්; එහි පිළිවෙළ කථාව සාවධානව ම ඇසිය යුතු.

ඒ නුවර මහාමන්ධාතෘාදි සක්විති රජුන්ගෙන් ම පරිගෘහිත වූ හෙයින් ද, වෙභාරාදි පර්වතරාජයන් විසින් පරිගෘහිත වූ හෙයින් ද, සියලු සත්ත්වයන්ගේ ගෙවල් රජුන්ගේ ගෙවල් හා සම වූ හෙයින් ද, නොයෙක් සර්වඥරාජයන්ට පිණ්ඩපාත ගෘහයන් බඳු වූ හෙයින් ද, බුද්ධෝත්පාදයෙහි බුද්ධදර්ශනය නිසා රැස්වන්නාවූ මන්ද්‍ර සුගන්ධාදි රාජග්‍රහයන්ගෙන් පරිග්‍රහ වන හෙයින් ද යි නානාවිධ වූ අර්ථයෙන් ඒ නුවර රාජගෘහ ය යි නම් වී ය. එසේ හෙයින් ඒ නුවර බුදුන් දවස ද චක්‍රවර්තීන් දවස ද නුවර වෙයි. සෙසු කල යක්ෂරාක්ෂසයන්ගෙන් පරිගෘහිත ව ඔවුන්ට ම වසනොඤ්ඤනයන් ගේ තිබෙ යි

ඔහු ජීවකය කොමාරභච්චය යි නම් දෙකක් කුමක් නිසා ලදුවාහු දැ? යත්;

ලෝකයෙහි ආවත්ථික ය, ලිඞ්ගික ය, නෙමිත්තික ය, අධිච්ච සමුප්පන්න ය යි නාමයෝ සතරදෙනෙක් වෙති. එයින් කොලු ය, කෙලි ය, කොඹු ය, කෙඹි ය, වසු ය, වැසි ය, ලදරු ය, ලදරි ය, මහලු ය, මැහැලි ය යනාදී වශයෙන් සත්ත්වයන්ගේ ඒ ඒ වයස් බලා කියන නම් ආවත්ථික නම. කළු ය, එළලු ය, කුරු ය, කුදු ය, කාණ ය, සථූල ය, ශිඛණ්ඩි ය, දූත්කා ය, කුන්තනා ය, පලගයා ය, ඡත්‍රපාණී ය, දණ්ඩපාණී ය යනාදී වශයෙන් සත්ත්වයන්ගේ ම සංඥාව නිසා කියන නම් ලිඞ්ගික නම. ධම්මධර ය, පණ්ඩිත ය, බහුශ්‍රැත ය, සථවිර ය, ශ්‍රොතාපන්න ය, ආයසීය, සර්වඥ ය, දසබලධර ය යනාදි වශයෙන් සත්ත්වයන් පැමිණියා වූ ගුණධර්මයන් ගෙණ කියන නම් නෛමිත්තික නම. සිරිවඩ්ඪ ය, ධනවඩ්ඪ ය, අජිත ය, සිද්ධාර්ථ ය, ගෞතම ය, ශාක්‍යසිංහ ය, ආදිච්ච බන්ධු ය, පරාක්‍රම බාහු ය, වික්‍රම බාහු ය, වීර බාහු ය, විජය බාහු ය, ජය බාහු ය, නිස්සඞ්කමල්ල ය, ත්‍රිභුවන මල්ල ය, සාහස මල්ල ය, භුවනෛක බාහු ය, ගජ බාහු ය යනාදි වශයෙන් සත්ත්වයන්ගේ ඉච්ඡානුරූප වූ පරිද්දෙන් තබන ලද නාමයෝ අධිච්චසමුප්පන්න නම් වෙති.

මේ තැන වනාහී රාහු ලො ජාතො, බන්ධනං මෙ උප්පන්නං. යි වචන ම නිසා "රාහුල" නම් ලදුවා සේ, අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො යි වදාළ වචන ය නිසා "අඤ්ඤාකොණ්ඩඤ්ඤ" නම් ලදුවා සේ, සජීවා වන භො රාජකුමාරා යි කී වචන නිසා

"ශාක්‍ය" නම් ලදුවා සේ, කුමාර පෙරහරින් වැඩී හෙයින් "කුමාර කාශ්‍යප" නම් ලදුවා සේ, පන්ථයෙහි ජාත හෙයින් "පන්ථක" නම් ලදුවා සේ, සුවර්ණසාරයක් බඳු වූ රූපසාරයක් ඇති හෙයින් "බිම්බිසාර' නම් ලදුවා සේ, මහා ප්‍රජාවට පති හෙයින් "මහා ප්‍රජාපති" නම් ලදුවා සේ, මහා යශස් ධරණ හෙයින් "යශෝධරා" නම් ලදුවා සේ, කපිල නම් සෘෂීන්ගේ මණ්ණකාග්‍රා භූමියෙහි උපන් හෙයින් "කපිල වස්තු" නම් ලදුවා සේ කොළිය වෘක්ෂභූමියෙහි ජාත හෙයින් "කොළිය" නම් ලදුවා සේ, ශ්‍රාවස්ති නම් සෘෂීන්ගේ පන්සල් භූමියෙහි ජාත හෙයින් "ශ්‍රාවස්ති" නම් ලදුවා සේ, මොහු ද අභය රාජ කුමාරයන් විසින් ජීවතෝ යි කී වචනය නිසා "ජීවක" නම් ලදහ. ඒ කුමාරයන් විසින් වඩනලද හෙයින් කොමාර භච්ච නම් ලදහ යි දතයුතු. මෙ ඔවුන්ගේ පිළිවෙළ කථාව ය.

විශාලා මහනුවර අම්බපාලි නම් ගණිකාවක් ඇත, ඕතොමෝ දිව්‍ය සමානවූ ශරීරවර්ණ ඇත්තී ය, ස ලාලයන් මන වඩන්නාවූ රූපවිලාස ඇත්තී ය. දහස් ගණන් පරිවාර ජනයන් ඇත්තී ය සත් දහස් සත්සිය සත් ලිච්ඡවි රජුන් කෙරෙහි ද ඉතා වල්ලභ ය. ඒ නුවර නැගූ ධවජයක් වැන්නී ය. සල්ලාලයෝ දවස දහසක්දී ඇම පාවිතා කරන්නාහු ය. ඒ නුවර ඇගෙන් ම කොබන්නෝ ය යි දඹදිව ප්‍රසිඬ විය.

එ කල රජගහා නුවර බිම්බිසාර රජ්ජුරුවෝ එ පවත් අසා "චක්‍රවර්තීන් උපදනා වූ අමිතභොගී සිටුවරුන්ගෙන් හා අවශේෂ කෙළක් කුලයක් ශොභාවත් වූ මාගේ මෙබඳු වූ ශ්‍රී නගරයක් විශාලා මහනුවරට එක ගණිකාවක නිසා අඩු වනු නො යෙදෙයි. මාගේ නුවර ද වෙශ්‍යාවකගෙන් ශොභාවත් කරමි" යි සිතා එ නුවර මුළුල්ලෙහි රූපත් වූ ස්ත්‍රීන් පරීක්ෂා කොට සාලවතී නම් කුමාරිකාවක උතුම් රූ ඇති සේ අසා ඇය රාජාඞගනාවට ගෙන්වා මුළු නුවර වැස්සන් රැස් කොට, මේ පවත් කියා "අපි ම ඇති කරම්හ" යි මන්ත්‍රණය කොට නුවර වැසියන්ගෙන් මසුරන් දෙලක්ෂයක් හා තමන්ගෙන් ලක්ෂයක් හා මෙසේ තුන් ලක්ෂයක් මසුරන් හා වෙශ්‍යාවන්ට සුදුසු වූ රුවන් පලඳනා හා පිරිවර ජනයන් හා උයන් පොකුණු බත්ගම් ආදි වූ නො එක් සැපත් හා සත්බුමු මහ පායක් දු දී, එ නුවරට අග්‍ර වූ වෙශ්‍යා තනතුරු දී දවස දෙ දහසක් දී, ඇය කරා පුරුෂයන් වදිනා සේ නියෝග කොට අම්බපාලී නම් ගණිකාවට දියුණු වූ ස්ථානාන්තර හා සම්පත් දුන්හ. එ තැන් පටන් ඒ සාලවතී නම් ගණිකාවද එ නුවර නැගූ ධවජයක් සේ ප්‍රසිඬ විය.

එ කල ඒ නුවර බිම්බිසාර රජ්ජුරුවන්ම පුත් වූ අභයනම් රාජ කුමාරයෝ ද ඒ වේශ්‍යාව කරා වදිනාහ. එසේ හෙයින් ඒ රාජ කුමාරයන් ඇය කරා වැදගිය දවසෙක ඒ රාජකුමාරයන් උදෙසා ඇට දරුගැබෙක් උපන; රාජකුමාරයෝ නො දන්නාහ. වේශ්‍යාවෝ නම් දරුවන් ඇත ත් නැත්තා සේ පුරුෂයන් මුළා කරණ ස්වභාව ඇත්තාහ. පුතුන් ලද කල වල දමන්නාහ. දූන් ලද කල නො හගවා වඩන්නාහ. එසේ වූ ධර්මයක් ඇති හෙයින් ඕ ද තමා දරු ලදහ යි නුවරට හැඟුම ගියේ වී නම සල්ලාලයෝ මා කෙරෙහි සරු නැති ව යන්නාහ. මාගම් කෙරෙම් යි සිතා පරිවාර ස්ත්‍රියක කැඳවා "මා කරා අා කෙනෙක් ඇත් නම මා ලෙඩහ යි කියා පුරුෂයන් ඇතුළට නො ගෙණු" යි උගන්වා දසමසක් ගිය කල පුතකු වදා ඔහු කුලුම්ල්ලෙක ලවා මකුළුයෙහි කසළ ලා වසා "මොහු නුවරින් පිටතට ගෙණ ගොස් උක්කාර භූමියෙහි ලා පියව" යි එම කෙල්ල අත යවා දම්මමවා තමාගේ ගෙය හුමඳ පිරිබඩ ගෙණ ලෙඩින් ගොඩ නැංගා සේ අතුරක් නො හඟවා පෙර සේම මෙසෙයි.

එ දවස් අභය රාජකුමාරයෝ එනුවර ක්‍රීඩාමෙන් ඇවිදිනාහු ය. එකල කපුටුවෝ කුමරහු කරා රැස් ව මිස්මැදුල්ලෙකැ යි සිතාරා අතුරු නො දී කුඩු අමෝරා ගෙණ කුමරහුගේ පින් බල යෙන් කිසිවක් කොට ලිය නොහී කාරැස් බඳිති. එ කල රාජ කුමාරයෝ "එතල කපුටුවන් කාරැස් බඳගෝ කුමක් කුණපයකට ද" යි විචාරා "ස්වාමිනි! මල දමාපු බාල දරුකෙනෙකුන්ට ය" යි කී කල ජීවත් ද අජීවත් දූ යි විචාරා "ස්වාමිනි ජීවතැ" යි කීකල "ඔහු මෙසේ ගෙණව" යි ගෙන්වා කුමරහු දැක කුමරහුගේ ඒ ජාතියෙහි සෝවාන් වන පින් බලයෙන් හා තමන්ට ජාත වූ පුත්‍ර ස්නේහයෙන් හා ආද්‍ර වූ සිත් ඇති ව එ කෙණෙහි දරුපෙම් බැඳ රජගෙට ගෙණ ගොස් කිරිමවුන්ට පාවා දී කුමාර පෙරහරින් නො එක් මඟුල් කරවා වැඩූහ. ජීවත් දූ යි කී බස නිසා ජීවක නම් වූහ. කුමාරයන් වැඩූ හෙයින් කොමාර භච්ච නම් වූහ.

මෙසේ වැඩෙන්නා වූ ඒ ජීවකයන් සත් අට හැවිරිදි වූ කල කෙළි මඩලෙහි සෙසු රජකුමරුවෝ "මවුන් නැත්තව" යි කිය කියා බැණ බැණ කෙළිති. එ කල ජීවකයෝ ලජ්ජා ඇති ව අභය රාජ කුමාරයන් කරා පලාගොස් "ස්වාමිනි! මා වැදූමවු කවුරුද" යි විචාළහ. එ කල රාජකුමාරයෝ මිඳක් සී "තොප පියාණෝ නම මම ය, තොප මවුන් කා බව ත් නො දන්මි. තොප වල දමා පියා ඔත් තැන දැක වඩා ගතිමි" යි කීහ.

එ හැන් පටන් ජීවකයෝ තමන් වූ පවත් දැන "මාගේ කිසි නෑසිය කෙණෙකු ත් නැත, මතු මට කිම් වන කුලසැපෙතකු දු නැත, එසේ හෙයින් මා විසින් ශිල්පයක් හදුරා ගත මැනව. ශිල්ප බලයෙන් බොහෝ දෙනා නෑ කොට ගෙණ ධන උපදවා ගත මැනැව, කෙසේ වූ ශිල්පයක් හදුරම් දෝ හෝ" යි නිරවද්‍ය වූ ශිල්ප පරීක්‍ෂා කරන්නාහු "අෂ්ටාදශ ශිල්ප හා සූසැට කලා ශිල්පයෙන් සෙසු ශිල්ප පරපීඩා පරහිංසා මිශ්‍ර ය, වෛද්‍ය ශිල්පය හදුරා ගනිම් නම් වෛද්‍යාචාර්යයී යන නම් ඇසූ කල ම සත්ත්වයෝ මවුන් පියන් ගුරු කොට සිතා ඔවුන් කෙරෙහි ප්‍රිය ඇති වන්නාහු ය, වෛද්‍ය ශාස්ත්‍රය නම් දතුවාහට මෙ ලොව ත් වැඩ වෙයි. පරලොව ත් වැඩ වෙයි. පින් වෙයි. එසේ හෙයින් වෛද්‍යශාස්ත්‍රය ම උගනිම්" යි සිතා තක්ෂලා නුවර ගොස් දිසාපාමොක් ආචාරීන් දැක තමන් ආ පවත් කියා සිටියහ.

ආචාරී "තෙපි කවුරු දැ"යි විචාළ කල "අනිකක් කීම් නම් මා කෙරෙහි ආදර නොකරති" යි සිතා "රජගහා නුවර බිම්බිසාර රජ්ජුරුවන්ගේ මුනුබුරා තෙම්. අභය නම් රාජකුමාරයන් පුතනු මෙම්" කීහ. කුමන ශාස්ත්‍රයක් උගණු දැ යි විචාළහ. වෛද්‍ය ශාස්ත්‍රය උගණිම් නි කීය, ආචාරිහු "ආචාරිභාග ය ගෙණවු දැ"යි විචාළහ. "දෙ මවු පියන්ට නො කියා ශිල්ප ලොභයෙන් සොරා ආයිම්. එසේ හෙයින් ආචාර්‍යභාගය නො ගෙණාමෙම්. නුඹවහන්සේට මෙහෙ කොට ධර්මාන්තෙවාසික ව ශිල්ප හදුරම් යි කීහ. එ කල ආචාරී "මෙ තෙම පින්වත් පුරුෂයෙකැ"යි සිතා ශුභ මොහොතකින් වෛද්‍යය පටන් ගැන්වූහ.

එ වේලෙහි "බුදුන්ට පිළිගම් කෙරෙමි"යි කප්ලක්ෂයක් පැරුම් පුරා ආ කෘතාධිකාර පුණ්‍යවන්තයා හෙයිනු ත්, බුදුනු දු දිව්‍යමය වූ පිළිගම් ලදමනා පිණිනු ත් ශක්‍රයාගේ භවනය කම්පා වි ය. එ වේලෙහි ශක්‍රදේවේන්ද්‍රයෝ මොහු දැක, "මාගේ බුදුන්ට මතු පිළිගම් කරණ වෙදහුට මම ආචාරී වෙමි" යි සිතා එ කෙණෙහි ම අවුදින් ආචාරීන් මුඛයෙහි අධිශාසිත ව ශක්‍රයෝ ම අසන තැන් කියන්නට පවන් ගත්හ. අසන තැන් කියා අන්තයෙහි ශක්‍රයෝ ආචාරීන් ඇඟින් පහ වෙති, ජීවකයෝ "ආචාරීන් ම අසන තැන් කියති" යි සිතති. ආචාරී තමන්ගේ බලයක් නො වන නියාව ත් දෙවියන්ගේ බලයෙන් ම අසන තැන් කියන නියාව ත් විශේෂයෙන් ම දනිති. කුමක් නිසා දනිද් ද? යත්; ජීවකයන් උගන් දිව්‍ය ඖෂධ මල නාම ආචාරී කුමක් බවු නො දනිති. ජීවකයන් තමන්

අතින් අසාගෙණ සන්හිඳුවාලන ව්‍යාධි ආචාරි සන්හිඳුවාලිය නොහෙති. මේ කාරණයෙන් ආචාරි දෙමියන්ගේ බල බැව් විශෙෂයෙන් ම දනීති.

එ කල කර්මාන්විත වූ ව්‍යාධියක් හැර අවශෙෂ වූ ව්‍යාධි, එක ආලෙප මාත්‍රාවකින් අන්තර්ධාන වන තරම් දිව්‍යමය වූ ඖෂධ උගන්වන්නා වූ ශක්‍රයෝ ජීවකයන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි වෛද්‍යශාස්ත්‍රය උගන්වා නිමි වූහ. ශක්‍රයන්ගේ ආනුභාවයෙන් උගන්නා ශිල්පය කල් පමා කොට ලා ගියෙ යම්ද? එසේ නැති; අනුන් සොළොස් හවුරුද්දෙකින් උගන්වන්නා වූ ශිල්පය ශක්‍රයෝ තමන්ගේ ආනුභාවයෙන් ජීවකයන් සත් හවුරුද්දෙකින් ඉගැන්වූහ.

එ කල ජීවකයෝ වෛද්‍යය තමන්ට සිමි සේ දූත ආචාරීන් කරා ගොස් “ස්වාමීනි! නුඹගේ මේ ශිල්පයෙහි නිමාවෙක් කවර කලෙක වේ ද” යි විචාළහ. ආචාරි “මොහුගේ ආනුභාවයෙන් ජීවකයන් ශක්ති පරීක්‍ෂා කෙරෙමි”යි සිතා එසේ වී නම් පුත තෙපි මේ නුවර සතර වාසලින් පිටත් වලා, සතර දවසක් සතර යොදනක් තැන් වෙන වෙන ම ඇවිද ඖෂධයකට නො ගත හැකි මුලක් මිලක් පොත්තක් අත්තක් එලයක් පතක් සොයා ගෙණ අවුත් මට පෑ බලගෑ” කීහ. එකල ජීවකයෝ යහපතැ යි ගිවිස සතර දවසක් දිවාභාගය මුළුල්ලෙහි සොළොස් ගවු තැන ඇවිද ඖෂධයකට නො තරම් වූ කිසි යම් ද්‍රව්‍යයක් නො දූත ආචාරීන් කරා අවුත් “ස්වාමීනි! මේ මිනිස්ලොව කම පූජීයෙහි ඖෂධයෙන් ම මවනලද වන, ඖෂධ සපිකාවක් මැන්න. ඖෂධයකට නො ගත හැකි වස්තුවක් නො ලද්දෙමි” යි කීහ. එ වේලෙහි ආචාරි සමාධිව “පුත! තොපට වෛද්‍යය අද පටන් නිමියේ ය. මේ මුළු පොළොව තොප තරම් වෛද්‍යාචාරි කෙණෙක් නැත. මම තොපට ආචාරි කමට අයොග්‍යයෙමි, තෙපි මට ආචාරි වව”යි කියා ජීවකයන් සිඹ සනහා ගමට යව යි සමු දුන්හ. එ වේලෙහි ශක්‍රයා ද මුඛයෙන් පහ වී ය.

එ වේලෙහි ආචාරි සිතන්නාහු “මේ කුමර මහාපුණ්‍යවන්ත යෙක, මා ගුරුකම් කළා යි යන නාමමාත්‍රයක්වත් මුත් මේ තෙමේ දිව්‍ය ගුරුන් ඇතියේය, දිව්‍යමය වූ ඖෂධ දතුයේ ය. මෝහට මාගෙන් උපකරණ දී, මිනිසුන් දී, සියනුවරට යැවීම නම් මොහුගේ

ජීවක තුමා බුදුරදුන්ට බෙහෙත් කැවූ මල් තුනක් පිළිගැන්වීම
606 පිට බලන්න. (37–38)

ශිල්පානුභාව ය නොපෙණේ'යි සිතා එක් දෙ දවසකට මාර්ගෝප කරණයක් ලාලා සමු දී යවූහ. එ කල ජීවකයෝ ගුරුන් වැඳ සමු ගෙණ සිය නුවරට යන්නාහු "මගට බතක් සාලක් උව මැනැවැ 'යි සිතා අතුරුමග සාකේත නම් නුවරට පැමිණියහ.

ඒ නුවර අසූකෙළක් ධන ඇති සිටානන්ගේ සිටුදේවින්ට ශිරෝබාධයක් ඇති ව සත් හවුරුද්දක් මුළුල්ලෙහි මහත් වූ ව්‍යසන වි ය. දඹදිව බොහෝ වෛද්‍යාචාරීවරයෝ "අපි සන්හිඳුවම්හ, අපි සන්හිඳුවම්හ"යි මාසි කිය කියා අවුත් නො එක් පිළියම් කොට සම්පත් ගෙණ යන්නාහුය, ශිරෝබාධය ඇසිල්ලෙකුත් සන්හිඳුමා ලිය නුහුනුමාහුය. ජීවකයෝ එපවත් අසා ඒ සිටානන්ගේ සත් වන වාසලට ගොස් සිට "වෛද්‍යෙයෙහි බලවත් ආචාරී කෙනෙක් වාසල සිටියෝ ය"යි කියා යවූහ. සිටුදේවී එ පවත් අසා ජීවක යන්ගේ වයස් විචාරා බාල දරුකෙණෙකැ යි අසා සිතාසි "දඹදිව ප්‍රසිද්ධ ආචාරීවරහු අවුත් මා ඇසිල්ලකු ත් නිදවාපිය නුහුනුවන. කිරිබොන තරම් බාලදරුකෙණෙක් කුමක් කෙරෙද්දැ"යි කියා "තමන් බඩසා වුව හොත් බත් ලවාගෙණ කන්ට කියව. අතික් කිසි අඵාසුවෙක් ඇත් නම් ඉල්වා ගෙණ යන්ට කියව. තන් නො දෙඩා ආපස්සෙහි යන්ට කියව" කියා යවූය.

ජීවකයෝ එ පවත් අසා "ශාස්ත්‍රය නම් බාලය වැඩිමහලු යයි යන බැවහැර නැත්තේය. නුවණ නම් වයස් නිසා ඇති වන දෙයෙක් නො වෙයි. මා දත් ශාස්ත්‍රය මුත් මාගේ වයසින් තමන් වහන්සේට ප්‍රයෝජන කිම් ද? තෙල රුජාව සන්සිඳුවා මිස නො යෙමි වැළිදු ධනසානියකුත් නො කෙරෙමි. මාගේ ශාස්ත්‍රබල දක්වා මුත් කිසිවක් නො ගන්මි"යි කියා යවූහ. සිටුදේවී ජීවක යන්ගේ නිර්භීත වූ සාරභාර තෙපුල් අසා ඉතා සතුටු ව පෙර ගමන් කොට ගොස් ජීවකයන් කැඳවා සාමීචි කථාකොට බත් බුලක් දී සනපා හිඳිනා අසුන් දී "පුතනුවනි! සත් හවුරුද්දක් මුළුල්ලෙහි නින්දක් නො ලද්දවූ මා එක දවසක් නිදවාපිය නො හෙනුයේ දැ"යි විචාළහ. ජීවකයෝ "ඇසිල්ලෙකින් සන්සිඳුවා ලම්හි යි පසතක් පමණ ගිතෙල් උව මැනැවැ" යි කියා ගෙන්වා, ගෙණ තමන් අතින් නො එක් ඖෂධ`ලා තෙල් සිඳ නිවා නස්‍ය කළහ. තෙල ඉසට උරාගැන්ම හා සමඟ තෙලින් භාගයක් ඉසට නැංග භාගයක් මුඛයට බට. මුඛයට බට තෙල් බිමට දමා "තෙල් ලෙනි! තෙල තෙල් පුලුනෙක ඉඳ රැස තබව"යි කියා තෙල් ඉඳුමා හැබිවූහ. එ වේලෙහි ජීවකයෝ කිම් නුහු තෙලීස්ත හිඳිනා දැක

මා කෙළේ කිම ද? තෙල් බින්දුවට පවා මේ සා වූ ලෝභ කරන නෑහු මට දියයුතු කුලී කෙසේ නම් දීපිහෙද් දැ"යි සිත සිතා කල කිරී සිටියහ. සිටුදේවි ජීවකයන් අදහස් දැන "පුත! කුමක් සිතා සිටිනේ දැ"යි විචාළහ.

ජීවකයෝ "දේවින් වහන්ස! තුඹගේ සමපත් ලෝභය සිත සිතා සිටියෙමි; මා අතින් බොහෝ ඖෂධ නසා මේ තෙල් නසා ලමි· බිම වැගිර ගිය තෙලිත්තකට තුඹ වහන්සේ මෙසේ ලෝභ කල සේක්නම් කෙසේ මට මිල දෙනුයේ ද, මා අනා තුබූ බෙහෙත් බඩු යෙතුත් නොවෙම් දෝ හෝ යි සිතමි" යි කීහ. එ බසට සිටුදියනියෝ කියන්නාහු 'පුතණුවෙනි! එසේ නො කියව. අපි උපයන අවස්ථාවෙහි මෙසේ සියුම් ව උපයන සේක් දැනුම්හ. වියදම් කරණ අවස්ථාවෙහි උදාර කොට දෙන සේ ක් දනුම්හ. අනාථයේ මල දමන සේ නො දනුම්හ. බිම ගිය තෙළිත්තකෙන් කිසිවක් හට ප්‍රයෝජන නැත. පුළුනින් ගත් තෙළිත්ත පහනක හෝ අවුළුවා ලිය හැක්ක. තණ හෝ තබාගත හැක්ක. දුක්පත් කෙනකුන් අතපය හෝ ගාපිය හැක්ක. ඒව තුඹ නො සිතා තුඹ කලමනා පිළියම් කරන්නැ"යි කීහ. සිටුදේවින් තෙල ඉසට නැඟීම හා සමග ඉස රුජා අන්තර්ධාන වි ය. හිස ඉතා ලඝු විය. මෙතෙක් කථාකරන්නාහු ද රුජාව සන්හුන් බව දැන සතුටු සතුටු ම ම කථා කළහ.

ඉක්බිත්තෙන් සිටුදේවි සිටානන් මුහුණ බලා "මාගේ හිස රුජා අන්තර්ධාන විය. මට පෙර දවස් මෙන් ම ඉස ලඝු විය. මේ සත් හවුරුද්ද මුළුල්ලෙහි තුඹ මට කැරවූ ප්‍රතිකාරයෙන් මෙ බඳුවූ සැපයක් නො ලද්දෙමි. මපුතණුවන්ට සමාධියක් කරන්නැ"යි කීහ. එ වේලෙහි සියලු පරිවාර ජනයෝ සාධුකාර දුන්හ. ඉක්බිත්තෙන් ජීවකයන්ට සිටානන්ගෙන් සාරදහසක් හා, සිටුදේවින් ගෙන් සාරදහසක් හා, පුතනුවන්ගෙන් සාරදහසක් හා, යෙහෙල නියන්ගෙන් සාරදහසක් හා, මෙසේ සොළොස් දහසක් නීලකර්ෂාපණ සංඛ්‍යාත වූ රන් දී අසුන් යෙදූ රථයක් හා දාස දාසීන් ගව මහිෂයන් ආදි වූ බොහෝ සමපත් දුන්හ. අසූ කෙළක් ධන ඇති කුලෙහි සමපත් මදකොට දුන්නාහුද? සත්; බැමහාර රතින් වීස් සෙක් නම් නීල කර්ෂාපණයෙන් එකෙක් වෙයි. තුන්ලක්ෂ විසිදහ සක් මසුරන් දෙන්නාහු ඔවුන් හා කැටිව බොහෝ සමපත් ගෙණ යන පරිවාර ජනයන් මිදහෙසීන් මාහැඟි වූ රතින් සොළොස් දහ සක් ආදි වූ බොහෝ සමපත් දුන්හයි දතයුතු.

ඉක්බිත්තෙන් ජීවකයෝ පළමු වන පිළියමෙහි ම මෙ සා සැපතක් ලදින් ඒ සැපත් ගෙන්වා ගෙණ ඒ රථයට නැගී රජ ගහා නුවරට ගොස් පියානන් දැක තුමන් තක්සලා නුවර ගොස්

වෛද්‍යශාස්ත්‍ර ය හදාළ නියාවත්, සිටුදේවීන්ගේ ආබාධය පිළිසම් කොට සම්පත් ලද නියාවත්, යනාදි සරූප කියා "මේ මා ලද පළමු වන සැපත නුඹවහන්සේ මා වැඩි පොෂාවතිත මිලයට ගෙණ වදාළ මැනැවැ"යි කීහ.

අභය රාජකුමාරයෝ එ පවත් අසා "තොප මිල තියා වැඩූ යෙම් නො වෙමි. තොප සාලවතී නම් ගණිකාව වැදූ දවස් දමාපු තැන දැක මට තොප ද බවු නො දැනම පුත්‍රස්නෙහ උපදවා දරු කොට වැඩිමි. තොප මට ද බවු පසුව දත්මි. එසේ හෙයින් තෙපි මාගේ සහජාත පුත්‍රයහ. තොල සැපත් තෙපිම ගන්ව. තවද මාගෙ නුදු සැපත් ගෙණ මාගේ රජගෙය සමීපයෙහි ගෙයක් තනවා ගෙන මා ලඟ සුව සේ වසව' යි කීහ. එ කල ජීවකයෝ පියානන් ගේ රජගෙම් නුදුරු තෙන ගෙයක් තනවා ගෙණ වාසය කෙරෙති.

එ කල එ නුවර බිම්බිසාර රජ්ජුරුවන්ට භගන්දරාබාධයෙක් ඇත. කලින් කලට පිළිකය පැළී රජ්ජුරුවන්ගේ සළුපට ලෙහෙයෙන් තෙමී යෙයි. බිසෝවරු රජහුගේ සළුපට ලේ දැක "අපගේ දේවයෝ උතුනී වූහ. දරු උපනක් සිටිනා සැටි ය, නොබෝ කලෙකින් දරුවෙකුන් වදන සේක. දූ දෙ හෝ පුතකු දෙ හෝ දුවක් වී නම් දඹදිව තවර රජක්හට ශරණ පමා දෙන සේක් දෙ හෝ, පුතෙක් වී නම් යහපත්ම ය. මතු මේ නුවර රජ කෙරෙති"යි යනාදීන් කිය කියා එකාමතුව රජ්ජුරුවන්ට මෙහෙසුම් කෙරෙති.

රජ්ජුරුවෝ ලජ්ජා ඇතිව දඹදිව බොහෝ වෙදවරුන් ගෙන්වා නො යෙක් මාරයෙහි පිළියම් කරවා සාධ්‍යයක් කරවාගත නොහී එක් දවසෙක අභය රාජකුමාරයන් තනි කොට කැඳවා මෙ පවත් කියා "වෛද්‍යකෙණකුන්ගේ සේරුමක් කියව'යි කීහ. එ වේලෙහි අභය රාජකුමාරයෝ කියන්නාහු "ස්වාමීනි! මාසේ පුතෙක් ඇත. හේ තෙම වෛද්‍ය ක්‍රියා වෙහි ඉතා දක්ෂය. ඔහු ගෙන්වා වදාළ හොත් යහපතැ'යි කියා ජීවකයන් තමන් මඩාගත් පවතුත් ඔවුන් ශිල්ප උගත් පරිදිත් කල්‍යාණවූ ගුණ ඇති පරිදිත් කීහ. එවේලෙහි රජ්ජුරුවෝ සමාධි ව "එසේ වී නම් තෙපි ම ඔහු මා කරා කැඳවා ගෙණ එව"යි කීහ.

අභය රාජකුමාරයෝ එ වේලෙහි තමන්ගේ ගෙට ගොස් ජීවකයන් කැඳවා රජ්ජුරුවන් කී පවත් කියා "රජගෙට මා හා කැටිව එව'යි කීහ. එ වේලෙහි ජීවකයෝ යහපතැ යි ගිවිස ඒ ව්‍යාධියට තරම් වූ ඖෂධයක් භාවිත කොට නියහන්සේ සඟවා ගෙණ පියානන් හා කැටිව රජගෙට ගොස් රජ්ජුරුවන් දුටුහ. රජ්ජුරුවෝ

ජීවකයන් දුන උන්ගේ දර්ශනයෙහි පැහැද ඔවුන් කැති කොට මතු මාලව ගෙණගොස් තමන්ගේ ව්‍යාධිය දැක්වූහ. එවේලෙහි ජීවකයෝ ව්‍යාධිය බලා "අද ම සන්හිඳුවා ලමි. දිවි පමණින් මතු ඇති වියත් නො දෙමි. මාගේ පුරුකම බලා වදාල මැනැවැ"යි වාහි කියාලා එ විවම නියනස්සෙහි තුබූ ඖෂධය මැත් කොට පිළිකය මතුයෙහි ආලේප කළහ. එ කෙණෙහි ඒ ආලේපය හා සමග භගන්දරාබාධන සන්හිඳී පිළිකය ඇතිවූ තැන කොතක බවක් නො දැනෙන සේ අනතර්ධාන වී ය.

එ කල රජ්ජුරුවෝ ජීවකයන් කෙරෙහි අතිප්‍රසන්න ව "මේ මට අභ්‍යන්තර ව ආත්මරක්‍ෂාවට තරම් දේ හෝ නො තරම් දේ හෝ තරම් වී නම් අභ්‍යන්තර ව රක්‍ෂා කෙරෙමි, නො තරම් වී නම් පිටත තබා රක්‍ෂා කෙරෙමි" යි සිතා රාජමාගයෙකින් ජීවකයන්ගේ තරම් පරීක්‍ෂා කරන්නාහු පන්සියක් බිසෝවරුන් සර්වාභරණයෙන් සරහා රජගෙයි පිළිමෙළින් හිඳුවා බොහෝ දෙනා රැස් කොට ජීවකයන්ගේ ගුණ කියා 'බිසෝවරුනි! මේ තොප් දවස් මට තෙපි හැමදෙන බොහෝ වෙහෙසුම් කළෝ වේ ද, දූත් ඒ ව්‍යාධි සන්හිඳී ගියේය. මිපුහනුමන් ජීවකයන්ට තොප තොප පලන් සියලු පලඳනාවෙන් පුදව"යි කීහ. එ කෙණෙහි පන්සියක් බිසෝවරු තමන් තමන් පලන් දහස් දහස් ගණින් සත රන් පලඳනා ගලවා ජීවකයන් පෙරට රැස් කළහ. රුවන් පලඳනා ගොඩ ජීවකයන් උසට ත් උස් වි ය, කළ මිල හා රුවන් කමීනත හැර සත රන් ම පස්ලක්‍ෂයක් පමණ වි ය. එ වේලෙහි රජ්ජුරුවෝ ජීවකයන් මුහුණ බලා "පුත! තෙල රත්නාභරණ තොපට ම දින්මි, හැර ගන්ව' යි කීහ.

එ වේලෙහි අභය රාජකුමාරයෝ තමනුත් රජ හෙයින් රජ්ජුරුවන්ගේ අදහස් දැන "මේ පලඳනා මපුහනුවෝ ජීවකයෝ නොගන්නු නම් යහපතැ' යි සිත සිතා සිටියාහ. රජ්ජුගේ අදහස් දන්නා අමාත්‍යයෝ ද ඔවුනොවුන් මුහුණ බලා එසේ ම සිත සිතා සිටියහ. ජීවකයෝද තුමූ ඔවුන් හැමටත් වඩා තමන් මහ නුවණැති හෙයින් ඒ කාරණය දැන "දේවයන් වහන්ස! මේ සැපතින් මට කම් නැත. බිසෝවරුන් වහන්සේ අත කර ලූ පලඳනා මා වැනියන්ට සුදුසු නො වෙයි, නුඹවහන්සේගෙන් කරුණා සම්පත් දෙවා වදාළ මැනැව"යි කියා නො ඉවසූහ. එ වේලෙහි රජ්ජුරුවෝ ද "උත්තම පුරුෂයෙකැ"යි ජීවකයන් කෙරේ ඉතා පැහැද එ පලඳනා හැමත බිසෝවරුන්ට ම පාවා දී ජීවකයන්ට හවුරුදු ඉතා ලක්‍ෂයක් කිමන නියම ගමක් හා, පවුරු පදනමක් පුරක්‍ෂිත වූ

අඹළයනාන් හා, සියගණන් පරිවාර ජනයන් හා, සත්බුමු මහ පායක් ආදි වූ බොහෝ සම්පත් දී තමන් ඇතුළු වූ අන්තඃපුරයට හා බුදුන් ඇතුළු වූ මහාසඞ්ඝයාට පිළියම් කරණ සේ ස්ථානාන්තර දී තමන්ට අභ්‍යන්තර කොට රක්‍ෂා කෙරෙති.

තව ද එම රජගහා නුවර අසූ කෙළක් ධන ඇති සිටාණ කෙණෙකුන්ට ද ශිෂ්‍රාබාධයක් ඇති ව ඉස්මුල් හැත් ලාලා ලියා හරණා සේ මහත් වූ වේදනා උපැද මරණප්‍රාප්ත වූහ. ආචාරිවරයෝ දෙදෙනෙක් අවුත් සිටාණන් බලා නිදන් දැක ව්‍යාධිය අසාධ්‍ය කියාවත් සිටාණන් නො රැකෙත. කියාව ත් දැක එක් කෙනෙක් "සිටාණෝ පස්දවසෙකින් මියෙති, පිළියමින් කම් නැතැ"යි කියා ගියහ. එක්කෙනෙක් "සත් දවසෙකින් මියෙති, මේ ලොවට පිළියම් නො කරමා පරලොවට ප්‍රතිකාරයක් කොට ගන්ව'යි' කියා ගියහ. එ පවත් බිම්බිසාර රජ්ජුරුවෝ අසා ඉතා මහත් වූ කම්පා ඇති ව "මාගේ නුවර නැගූ ධවජයක් සේ ඉතා මහත් වූ ප්‍රසිඬ වූ සිටාණෝ මලාහු නම් මට මහත් වූ හානි වන්නේය"යි සිතා ජීවකයන් කැඳවා "පුත ජීවකයෙනි! මාගේ අසවල් සිටාණන් රැක දීලව'යි කියා ජීවකයන් යවූහ.

එ කල ජීවකයෝ ගොස් සිටාණන්ගේ අවස්ථා දැක පෙර ආචාර්වරුන් දෙදෙනා කියා ගිය පවතුත් අසා තුමූ ද පරීක්‍ෂා කොට දිවසින් දුටුවා සේ දැක "ඔවුන් කීයේ සැබෑව. නුඹ ඉස මත්ථලුඞ්ගභෝජක නම් පණුවෝ දෙදෙනෙක් අවගත්හ. එයින් එකෙක් මහත, එකෙක් කුඩාය. මහත් පණු හිස්මුල් පස් දවසෙකින් කා නිමයි, කුඩා පණු සත්දවසෙකින් කා නිමයි. ඔහු දෙදෙනා මි කමෙක් තමන්ගේ ශාස්ත්‍රයෙන් පණුවන් දෙදෙනා වෙන වෙන ම දුටහු. මහ පණුවා දුටු ආචාරි කුඩා පණුවා නුදුටුවහ; කුඩා පණුවා දුටු ආචාරි මහ පණුවා නුදුටුවහ. මම දෙදෙනාම දිටිම්. එසේ හෙයින් සත් දවසත් නො වෙයි. පස් දවසක් නො වෙයි. තුන් දවසක් ඇතුළත මරණ වෙයි. මේ ලෝකයෙහි මා විනා නුඹ දිවිරැක දිලියහෙන අන් කෙනෙක් නැතැ"යි කීහ.

එ බසට සිටාණෝ නැවත ද මරණ භයින් වෙව්ලා "පුතනුවෙනි! මාගේ දිවි රැකදීලූයේ වී නම් මාගේ මේ සියලු අසූ කෙළක් පමණ සිටුසැපතත් දෙමි. මම ද නුඹව ම ගැති වෙමි"යි කීහ. එ වේලෙහි ජීවකයෝ "එසේ නො වදාළ මැනැව, මම නුඹවහන්සේට ගැති නො වෙම් දැ" කියා භය නො ගත මැනැවි, මා කිම කව ලැබුණේ නම් නුඹ දිවි රැක දී ලම්"යි කීහ. එ වේලෙහි

සිටාණෝ සන්තොෂ ව "නුඹ කී යම් ම දෙයකට ලැබෙමි"යි කීහ. ජීවකයෝ සිතන්නාහු "මුන්ට ගරු කොට කියා ලඝු කොට ගොඩ නගමි"යි සිතා "මා කී දෙයකට ලැබෙන සේක් වී නම් රැක ලමි, කෙසේද?යත්; උඩුකැල්ලා ම සත් මසක් මුළුල්ලෙහි නො සෙල්වී ම වැද හොත මැනැවැ. එසේ ම දකුණැලයෙන් සත් මසක් වැද හොත මැනැව. වමැලයෙහු දු සත් මසක් නො සෙල්වී ම හොත මැනැව, එසේ පිළිවන් දැ"යි විචාළහ. සිටාණෝ ජීවිතාසා වෙන් නො කළ හැකි දෙයක් කියාව සිහි එළඹා ගන නො හී පිළිවනැයි ප්‍රතිඥා දුන්හ. එ වේලෙහි ජීවකයෝ සිටාණන් වහන්ස! වෙදවරු නම් නිග්‍රහ කොට දරුවන්ට දුක් දී හික්මවා මතු සුව දෙන්නා වූ මවුන් පියන් ගුරුන් වැනියහ. එසේ හෙයින් නුඹව ද කිසියම් පීඩාවක් කොට මුත් ගොඩනගා ලිය නො හැක්කැ. මා කරණ යම් නිග්‍රහයෙක් ඇත් නම් මා කෙරෙහි වෛරයක් නු උපදවමි යි කියා ත්, පවු නැතැ යි කියා ත්, වර දුන මැනැවැ" කීහ. සිටාණෝ "නුඹ කරණ යම් ම දෙයකට වෛරයක් නො කෙරෙමි යි, පවු නැතැ"යි වරදුන්හ.

එ වේලෙහි ජීවකයෝ සිටාණන් ඇඳෙක උඩුබැලා වැදහොවා සිහලග නො සැලෙන සේ ඇඳ හා එක් කොට පටපිළියෙන් වෙළා සිටාණන් ඉස්දෙර වැදසිඳ සූක්ෂම වූ සැතක් ගෙන සිටාණන් ඉස්බොල්ල පළා තුන්සන්ධිය වෙන්කොට හිස්මුල් කන පණුවන් දෙදෙනා සැත්තුඩින් ගෙණ එළියේ ලූහ. එළියේ ලා "මේ සත්දවසින් කා මරණ පණුය, මේ පස්දවසින් කා මරණ පණුය"යි කියා පෑහ. ඒ විසමය දුටු මහ පිරිස එකවිට ම සාධුකාර දුන්හ. එ වේලෙහි ජීවකයෝ සිටාණන් හිස්බොල්ල පෙර සේ ම සන්ධි කොට ලොම කුත් අඩුමැඩි නො කොට තබා බැහැනි ගෙණ ඖෂධ ගල්වා සිටාණන් සත්දවසක් එම ශය්‍යාවෙන් සතපා, දකුණැලයෙන් සත්දවසක් සතපා, වමැලයෙන් සත්දවසක් සතපා පෙර එක්විසි මසකට නියම කරවා ගත් පිළියෙම් එක්විසි දවසින් ගොඩනගා සිටාණන් හිස්මුල් අවගන්වා පැළූ තෙන නො පෙනෙන සේ වණය සුව කළහ.

එ කල සිටාණෝ අරොගී වූවාහු ජීවකයන් කෙරෙහි පැහැද "සියලු සිවු සැපත හා මාත් නුඹට පාවා ගන්නැ"යි කීහ. ජීවකයෝ "එසේ වූ බස් නො වදාළ මැනැව, මේ නැත් පවත් නුඹ වහන්සේ ද මාගේ පියානන් වහන්සේ ම ය"යි කියා සිටාණන් හා නැ ව "මා සනාතන වූ මේ සියලු සැපත නු ඹවහන්සේව ම

දින්මි"යි සිටානන්ට ම හැර රජ්ජුරුවන්ට ලක්‍ෂයෙක තමන්ට ලක්‍ෂයෙකැ යි දෙලක්‍ෂයක් සම්පත් හා ගව මහිෂාදි කැමැති පමණ සැපත් ගෙණ ගොස් නුවර වැද රජ්ජුරුවන්ට ගෙණ ගිය ලක්‍ෂයක පඬුරු කොට දී තුමූ සෙසු සම්පත් අනුභව කොට එම නුවර වෙසෙති. එ තැන් පටන් ජීවකයෝ මුළු දඹදිව තැගූ ධජ යක් සේ ඉතා ප්‍රසිඬ වූහ.

කවදා බරණැස අතික් සිටු පුත්‍රයාණ කෙනකුන්ට ද අනතර ගණ්ඨි නම් ආබාධයෙක් ඇති වි ය. කෙසේ වූ ආබාධයෙක් ද යත්? ඒ සිටාණන් තරුණ කල කරනම් පැන ක්‍රීඩාවක් කරණ දවසෙක බඩවැල උඩට නැගී මධ්‍යයෙහි දී ගැට ගැසී ගිය. ඒ කාරණයෙන් සිටානන් අනුභව කල යම්දෙයක් බඩවැලින් මල මාර්ගයට යා නො හැකි පාතයට ත් නො යෙයි, මලමූත්‍රයෙක් තමා ම නැත, එක් වේලෙක අනුභව කල දෙය එක් වේලෙක තහා පියා ජීවිතය රක්‍ෂා කෙරෙති. එ කල සිටානෝ ශුෂ්ක කාෂ්ඨයක් සේ වියලී දවසින් දවස බැහැර පඬුවත් ව ගියහ. තෙල්පතක් මැලැන්ද සේ සර්වාඞ්ගයෙහි ධමනි පෙනෙන් නට පටන්ගත එ පවත් අසා දඹදිව බොහෝ වෙදවරු අවුත් අවසථා නො දැන විසමය ප්‍රතීකාර කොට සමනයක් කොට ගත නොහී යන්නාහු ම ය. සිටානන්ගේ ගෙට අපි අපි ය යි වාසි කිය කියා මුළු බැඳ එන වෛද්‍යාචාරීන් විසින් හා පිළියම් කොට සමනයක් කොට ගත නොහී "අපට බැරි ය, අපට බැරිය"යි කියා ආපස්සේ යන වෙදවරුන් විසින් හා උන්ගේ මාසල් දොර අතුරු නැතියේ ය.

ඒ සිටානන් පියානෝ, බාරාණසෙය්‍යක නම් සිටානෝ ජීවක යන්ගේ පවත් අසා රජගහ නුවරට ගොස් බිම්බිසාර රජ්ජුරුවන් දැක නො එක් සතුටු පඬුරු දී රජහු සන්තොෂ කරවා පුතනු වන්ගේ ව්‍යාධියෙහි පවත් කියා ජීවකයන් ඉල්වූහ. එ වේලෙහි රජ්ජුරුවෝ ද ජීවකයන් කැඳවා සිටානන් ආ පවත් කියා සිටානන් හා කැටිව ගොස් උන් පුතනුවන් බලා එව" යි කියා සිටානන් හා කැටිව ම ජීවකයන් යවූහ. ජීවකයෝ ද බරණැස් නුවර ගොස් ව්‍යාධිගත වූ සිටානන් දැක ඒ ව්‍යාධියෙහි ද නිදන් බලා දිවසින් දුටුවාසේ ම දැක "සිටානන් වහන්ස! නුඹවහන්සේගේ බඩ ගැට ගෙණ තිබෙන ගුණ්ඨයෙක් ඇද්ද"යි විචාළහ. එ බඳු වූ ගුණ්ඨයෙක් ඇතැ යි කීහ. ක්‍රීඩාවක් කල දවසෙක සිට ඒ ගුණ්ඨය ඇති වී දැ යි විචාළහ.

එසේ ම යහි තිබ; මල-මූත්‍ර නැද්ද යි විචාළහ; නැතැ යි කීහ. අධෝමාර්ග නැද්ද යි විචාළහ; නැතැ යි කීහ. එසේ වී නම් තුඹ බඩ අභ්‍යන්තරගණ්ඩ නම් ආබාධයෙක. තුඹගේ බඩවැල මැදින් ගැට ගැසී ගියේය. ඒ සත්හිඳුවා දීලම්, සඟ නො කළ මැහැමැ යි අස් වසාලා සිටුදේවින් පමණක් සිටුවා සෙසු ජනයන් පිටත් කොට අගුළු ගෙණ සිවාතන් යහිමාලෙහි මැද, තප නො සැලෙන සේ බැඳ සිටුවා සිවාතන් මුහුණ මිසා පටපිළියක් බැඳ සූක්ෂම වූ සැතක් ගෙණ සිවාතන්ව නො දුක්ෂන සේ බඩ බෙහි මහු සම පළා බඩවැල පිටත් කොට සිටුදේවින්ට සැට ගැහිගිය තැන් පෑ ගැට උනා හැර නැවත බඩවැල ඇතුළෙහි ලා බැහැනි ගෙණ ඖෂධ ගල්මා සිවාතන් සනමහයෙක් උනා ලාමෙහායි සනහා රඟ උළුකැන් පොවා තුන්දවසින් ගොඩනැඟුහ. ඒ සිවාතෝ ද එ තැන් පටන් පෙර සේ ම නීරොගී වූවාහු, ජීවකයන් හා සමඟ ම උන් කෙරෙහි මහත් වූ පෙම් බැඳ සොළොස් දහසක් මසුරන් හා අසුන් සෙදූ රථ දාසි දස් ගව මහිෂාදී බොහෝ සම්පත් දී සතුම්භයෙන් යවූහ. ජීවකයෝ ද මහ පෙලහරින් රජගහා නුවරට වැද රජ්ජුරුවන් දැක තමන් කළ පිළියම් කීහ. රජ්ජුරුවෝ ද ඉතා විස්මය වූවාහු ජීවකයන්ට නො එක් සම්පත් දුන්හ.

එ තැන් පටන් ජීවකයන්ගේ පමණ ඇසූ ඇසූ දඹදිව බොහෝ වූ ශ්‍රීමතුනයෝ "එසේ එසේ වූ ව්‍යාධියෙක් අපට ද වී නමුත් උන් හා විශ්වාස ව ඉඳුම්හ" යි නො එක් සතුටු පඬුරු ගෙණ ජීවකයන් කරා එන ශ්‍රීමතුනයෝ මෙ තෙනැ යි පමණ නැත. තමන් කරා ගෙන්වා ගත නොහී ජීවකයන් කරා එක ව්‍යාධිගත සත්ත්වයන්ගෙන් උන්ගේ දොර අතුරු නැතියේ ය. එක කල මහනඹින් හඩ නඩා නො එක් ව්‍යාධියෙන් පෙළී පෙළී අවුත් ජීවකයන් දැක දිව්‍ය ඖෂධ ලදීන් අමෘදිය ලදුවන්සේ ව්‍යාධි අනතඝීත ව නීරෝගී ශරීර ලදින් ජීවකයන්ට සාධුකාර දිදී සන්තොෂයෙන් මත් ව තමන් තමන්ගේ සියනුවරට යන්නාවූ සත්ත්වයන්ගෙනුදු එ නුවර අතුරු නැතියේ ය. බුදුන්ට පිළියම් කෙරෙමි යි කප් ලක්ෂයක් පැරුම් පුරා ආ කෘතාධිකාර පුරුෂයානන් හෙයිනු ත් බුදුන් නිසා ම ඔවුන් ඇති වූ හෙයිනු ත්, බුදුන් නිසා ම දිව්‍ය ඖෂධ ලැබ ගත් හෙයිනු ත්, මේ සා මහත් වූ සත්ත්ව ශාන්තියකු දු මාගේ සවාමිදරු වූ බුදුරජානන් නිසා ම ලොවට පහළ වී ය. එසේ හෙයින් මෙහි දු මාගේ බුදුන්ගේ ම පෙළහරෙක් ම ය.

මෙසේ ඒ ජීවකයන් දඹදිව දිව්‍යද්‍රැමයක් සේ ප්‍රසිද්ධ වූ සම යෙහි ම උදේනි නුවර චණ්ඩප්‍රද්‍යොත නම් රජහට ද පාණ්ඩුරොග යෙකින් ආබාධයෙක් වී ය. ඒ රජ්ජුරුවෝ ද නො එක් පිළියම්

කරමා ශාන්තියක් නො ලදින් ජීවකයන්ගේ පමිත් අසා නො එක් රජපඬුරු දී බිම්බිසාර රජ්ජුරුවන් කරා දූතයන් නො එක් වාරයෙහි එවති. රජ්ජුරුවන් යව යි කී කල ඒ රජුගේ පමිත් ආදි ම නමක් අසා දන්නා හෙයින් "ඔහුගේ ව්‍යාධි සන්හිඳුවාලීම පිළිවන් නො මන්නෝ ය"යි කියා ජීවකයෝ ද නො එක් වාරයෙහි ප්‍රතික්ෂෙප කොට නො යෙති. කාරණ කිම? යත්;

ඒ රජ්ජුරුවෝ තුමූ තෙලෙහි ප්‍රතික්කූල ඇතියහ. කිසි යම් තෙල ජාතියක් ඇඟ ද නො ගාවති. අනුභව ද නො කෙරෙති. තෙල් මැඩසහනු දු නො බලති. මලකඩ පහන් රජගෙහි නංවති. තෙලෙහි සඹ නිමන්වා ක්‍රොධ කෙරෙති. තෙලෙහි කුමක් නිසා ප්‍රතික්කූල ඇතියාහු ද? යත්; ඒ රජ්ජුරුවෝ ගෝනුස්සක්හව දෑ වූහ. කෙසේ දෑ වූ දැ? යත්; ඒ රජ්ජුරුවන්ගේ මෑතියන්ගේ පූර්ව ජන්මයෙහි වල්ලභයා බිසොවුන් කෙරේ සිත් තබා මිය අනෙහතුක ප්‍රතිසන්ධියෙහි ගෝනුසු ව ඉපැද එම රජගෙහි බිසවුන්ගේ ශ්‍රී ශායනය යට මාගය කෙරෙයි. එක් දවසෙක බිසොවුන් උතුනී ම නහා මල් සුවඳ පැලඳ යානෙන් වැදහොත් කල්හි ගෝනුසුහු බිසොවුන් කෙරෙහි ප්‍රෙම බරාගත නො හෙනුයේ "රජහව පලමූ මම මෑ හා ආසවාදයක් කෙරෙමි"යි යානට නැඟී බිසොවුන් නාභියෙහි පරාමශීනය කෙල් ය. එවේලෙහි නාභිපරාමශීනය හා සමග ම බිසොවුන්ට ද රතිචලන ය විය. මවගේ උතුනී භාවයක් හා එක්තරා එක් ආකාරයෙකින් කාමියන්ගේ චලන ය වීමක් හා, සත්ත්වයක්හුගේ ඉපදීමක් හා, මේ තුන්දෙනාගේ සමාගමයෙන් ම දරු ගබක් හටගන්නා හෙයින්, එ වේලෙහි රජ්ජුරුවෝ ද ගෝනුස්සාට දෑ ව පිළිසිඳ ගත්හ. මේ කාරණයෙන් ඒ රජ්ජුරුවෝ ද විචක්ෂයන්ගේ මණී ඇතියහ. විචක්ෂයන් සේම තීර්ගුණීයහ. ඉතා ම චණ්ඩයහ. එසේ හෙයින් චණ්ඩප්‍රද්‍යොත යයි නම ලදහ. ගෝනුස්සන්ට තෙල් ජාති නම් විෂ හෙයින් ඒ රජ්ජුරුවන්ට ද තෙල් ජාති විෂ හා සමානය. මේ කාරණ දූත "තෙලක් වළඳවා මූත් විරෙකයක් කවා මුත් පාණ්ඩු රොග ය සන්හිඳුවා ලිය නො හැක්කැ"යි කියා පිළිකම්ව නො යෙති.

නැවත ද බිම්බිසාර රජ්ජුරුවන් කරා පඬුරු හා දූතයන් පැවූහ. එකල රජ්ජුරුවෝ ජීවකයන් කැඳවා "පුත! චණ්ඩප්‍රද්‍යොත රජ්ජුරුවෝ මා හා අති විශ්වාසී ය. මේ වාරයෙහි උත්තර නො කියා ගොස් උන් කිවාට වැනී ව උන් බලාපියා වී නමුත් එව" යි

කියා ජීවකයන් යවූහ. එ කල ජීවකයෝ උදේනි නුවර ගොස් රජ්ජුරුවන් දක අවස්ථා බලා මායමකින් බෙහෙත් තෙලක් පොවා මේ රජහුගේ ජීවිත ය රැක දෙමි"යි සිතා "මා වැනි වෙදක්හු ඇස පෙනී ගිය ව්‍යාධිගත රජක් කැසී යාම සුදුස්සෙක් නො වෙයි. එසේ ද වුව ත් මේ රජ චණ්ඩ ය. කාරණාකාරණ පරීක්ෂා නො කෙරෙයි. තෙල් පෙවූ විට ම ක්‍රොධයෙන් මා මරවයි. මායමකින් තෙල් පොවා මොහුගේ ද මාගේ ද ජීවිත රක්ෂා කළ මනා වේ දැ"යි සිතා "දේවයන් වහන්ස! මෙ ව්‍යාධි ය සන්සිඳුවා ලමි. කිසි භයක් නො කල මැනැව. බල එකෙක් ඇත. වෙදවරු නම් ඖෂධයට ලොභිය හ. අනුන් ලවා බෙහෙත් නො ගන්වති. ඒ ඒ යොගයෙහි ඒ ඒ ඖෂධයන් තුමූ තුමූ ම සවහස්තයෙන් ගන්නාහු ය. එසේ හෙයින් මා ත් තුඹූගේ මේ නුවර කැමැති වාහනයක් නැගී කැමැති වාසලකින් කැමති යම් වේලෙක මා සිත්සේ ම යන එන සේ රැකවල් කල මැනැවැ"යි කීහ.

ඒ චණ්ඩප්‍රද්‍යොත රජ්ජුරුවන්ගේ අසාධු වූ දිව්‍යසමාන වූ වාහන පසෙක් ඇත. කෙසේ වූ වාහන පසෙක් දැ? යත්; භද්‍රවතී නම් ඇතින්නක් දවසක් ඇතුළත පණස් යොදුන් ගොස් පණස් යොදුන් එන පමණ ගමන් ඇත්තී ය. දෙවියන් විසින් මැවූ ඔපපාතික වූ කාක නම් දාසයෙක් දවස සැට යොදනක් ගොස් සැට යොදනක් එයි. නාලාගිරි නම් ඇතෙක් සියක් යොදුන් ගොස් සියක් යොදුන් එයි. මුඤ්ජකෙශී නම් වෙලඹක හා තෙලකණ්ණී නම් අශ්වයකු හා දෙදෙන එක්සිය විසි යොදුන් ගොස් එක්සිය විසි යොදුන් එන්නාහ. මුළු දඹදිව මෙසේ වූ පඤ්ච මනා වාහන ඇති එක රජෙකුත් නැත. ඒ කෙසේ වූ පින් බලයෙකින් ලද්දාහු දැ? යත්;

ඒ රජ්ජුරුවෝ ගිය දවස දිළිඳු වූ කුලයෙක ඉපැද අනුන් විසින් දන්දෙතලද බත්පාත්‍රයක් සමසිතින් තමන් කර තබා ගෙණ වහ වහා දිව ගොස් වේලා නො වරදවා පසේබුදු කෙණකුන් වහන්සේට පිළිගන්වා තමන් අතින් දුමැපි පැන් පෙරා දී වළඳවා "ස්වාමීනි! නුඹ උදෙසා අද මා විසින් කළ කාය වෛයාවෘත්‍යයෙහි අනුසසින් මතු මෙසේ වූ දුඃඛිත කුලයෙක නූපදිම්ව යි, රජකුලෙහි උපදිම්ම යි, මේ බත්පාත්‍ර ය ඉසිළු පිණින් මතු මා උපුළන ශීඝ්‍ර වාහන ලබම්ව"යි ප්‍රාර්ථනා කළහ. එ වේලෙහි පසේ බුදුන් වහන්සේ ද ඔහට මතු වන වැඩ දැක:—

ඉච්ඡිතං පත්ථිතං තුය්හං — ඛිප්පමේව සමිජ්ඣතු.
පූරෙන්තු චිත්තසංකප්පා — චන්දෝ පණ්ණරසෝ යථා–යි.

යනාදීන් බණ මඳුරා වැඩි සේක. පෙර කල එබඳු වූ කුසලයෙකින් මෙබඳු වූ රජකුලෙහි ඉපැද පඤ්චමහා වාහනාධිපති වූහ යි. දත යුතු.

එ වේලෙහි රජ්ජුරුවෝ ජීවකයන් කී පවත් අසා "මාගේ මේ මාසක පසින් නොප කැමති යම් වාහනයක් නැගී කැමති වාසලකින් කැමැති වේලාවක, සිත් සේ ඇවිදුව"යි රකවල් අලූහ. එ කල ජීවකයෝ ද කීප දවසක් එසින් කැමැති කැමැති වාහන නැගී ඒ ඒ වාසලින් වේලෙහි නො වේලෙහි ලබමොබ ඇවිද නුවරවාසීන් හා රජ්ජුරුවන් තමන් කෙරෙහි සැක හරවාගෙණ එක් දවසක් නො එක් ඖෂධ භාවිත කොට බෙහෙත් තෙලක් කකාරා රන්නැටියෙන් ගෙණ "දේවයෙනි! මේ බලවත් වූ කෂායෙක, මැලිය නො හැක්ක, හිඹිබ නො දැක්ක, එසේ කොලෝතින් ඖෂධයෙහි විශ්‍රී සිද වෙයි, එසේ හෙයින් ඇස පියාගන මැනැවැ" යි කියාලා රජ්ජුරුවන් ඇස පියාගත් කල්හි "රස නො බලා එක හුස්මෙන් පුව මැනැවැ"යි බෙහෙත් අතට දුන්හ. රජ්ජුරුවෝ ද එක අතෙකින් නාසය මැඩ අල්වාගෙණ බෙහෙත් මුඛයට දිගු කළහ.

එ කෙණෙහි ජීවකයෝ එ තැනින් පහව "මෙසේ මෙසේ වූ වෙද බත් වෙදමාලුයෙන් රජ්ජුරුවන්ට ප්‍රතිකාර කරව"යි අභය නතරයන්ට කියාලා ඇත්හලට දිව ගොස් භද්‍රවතී නම් ඇතින්න නැගී නුවරින් පිටත් ව සුළං වේගයෙන් රජගහා නුවර දිසාවට දිවෙන්නාහු දවල් බතට පණස් යොදුනක් ගොස් කොසඹෑ නුවර ශාලාවට වැද ඇතින්න සැත් උනා සැනපී හිඳ "රජුගේ පණස් යොදනක් මේ ඇසිල්ලෙහි මා හඹා අවුත් අල්වා ගන්නා තරම් සේනාවක් නැත, ඔවුන් නම් දවාසා එවති, ඇතු එවති, අසු එවති, වෙලඹ එවති. මා ඇඟ ඇතුන් පස්දෙනෙකුව බල ඇති හෙයින් ඔහු මා නො කැමැති කරවා ගෙණ යා නො හෙති. අනෙකෙක් ඇත් නම් රජුගේ ඇතින්න පාවාදී යවමි" සිත සිතා මඟ බල බලා "දහවල් බත් මෙතැනදී කමි"යි සිත සිතා උන්හ

එ වේලෙහි රජ්ජුරුවෝ බෙහෙත් තෙල එක හුස්මෙන් බී නැල්ලක් හගා තෙල් බවු දූන ජීවකයන් කෙරෙහි ඉතාමහත් වූ

ක්‍රෝධ කොට සුළං දුටු ගිනිකඳක් සේ කිපී "ජීවක යා මා විෂ තෙල් පොවාපී ය. දූත්දක් මියෙමි. මා සතුරා ගෙණ ඵල අන්ව"යි නියෝග කෙළේ ය. එකෙණෙහි රජහුගේ අමාත්‍යයෝ ජීවකයන් බලා නො දැක "භද්‍රවතිය නැගී පලා ගියේ ය" යි අසා අවුත් "දේවයනි! ජීවකයා පලා ගියේ මේ ද, තෙමෙම මතු නො වෙයි. නුඹගේ භද්‍රවතී නම් ඇතින්න ද හැරගෙණ ගියේ වේ දැ" යි කීහ. එ වේලෙහි රජ්ජුරුවෝ නැවත කිපී කාක නම් දූතයා කැඳවා, "කොල! දිව ගොස් ජීවකයාත් මාගේ ඇතින්නත් මහා ම ගෙණවුත් පෑල"යි කියා නියෝග කොට නැවත "ජීවකයා නම් සොර, මිහත් වූ මායම් දන්නි, තා සලා මරාපියන් පොහොසත. ඔහු දුන් දෙයක් නො කා"යි උගන්වා යවූහ.

එ කෙණෙහි දූතයා පණස් යොදුනක් දිම ගොස් කොසඹෑ නුවර ශාලාවෙහි උන් ජීවකයන් දැක "නුඹ නො හැර ගෙණ යන්ව රජ්ජුරුවෝ කීහ. ආපත් සෙහි නික්මුණ මැනැවැ" යි කී ය. ජීවකයෝ ද එ වේලෙහි තමින් බල ඇති නියාව ත්, නො හැමෙති කරවා ගෙණ යා නොහෙන නියාව ත් නො ගනවා "එබැවින් යහළුව මා බඩසා ය, මා බත් කා පියන තෙක් මඳක් බලව"යි කියාලා ඔහු අස්වසා බත් කන්නාහු "තෙපි ද බත් කව"යි කීහ. දූතයා තෙමේ රජහු කී බස් සිහි කොට "මම බත් නො කමි" යි කී ය. ජීවකයෝ ඔහු සිතෑ සොරකම ද දැක "කොපස සසින් ඉත්දදී මබ බත් නොසේ කම් ද, බත් නො කන බැවින් මේ ඇඹුලපක අනුභව කොට පැන් බොම"යි කියාලා ඇඹුලපක නියඅගින් බෙහෙදක් ඔබා දුන්හ. හේ තෙමේ ඒ සොරකම නො දැන ඇඹුලසෙන් අඩක් කා මූර්ඡාවිය. තුබූ අඩිය බිම හෙළා තෙමේ ද බිම හී ජීවකයන් ගෙණ යන්නා තබා තොමේ තමා බවු නො දන්නි.

එ කල ජීවකයෝ සුවසේ ඉඳ බත් කා විඩා ත් නිවාගෙණ ඇතින්න ද පැන් පොවා ඇගේ ද විඩා සන්සිඳුවා දූතයා කරා ගොස් "දරුව වැලි අප හැරගෙණ නො යාදැයි" කීහ. එ වේලෙහි දූතයා ඇස දල්වා ජීවකයන් බලා දෙතොත් මුදුනෙහි තබා "හිමි නුඹ ගෙණ යන්නා තබා මම මා ගෙණ යා නො හෙමි, මා වැනි දූතයෙක් මේ මුළු දඹදිව් තෙලෙහි නැත. මා වැනියක්හු නොමරා දිවිරක වදාළ මැනැව, බල නුඹ කැමැත හොත් නුඹ හා සැටිව යෙමි" යි කී ය. එවේලෙහි ජීවකයෝ සිනා සී "භය නොකර. තා මිය යා නො දෙමි"යි ඔහු අස්වසා අතික් ඇඹුලපතක් ගෙණ අතික් නිය අගෙකින් ඔෂධයක් ඔබ "තෙල් කා බලගෑ"යි දුන්හ.

ගේ තෙමේ එයි ත් භය ඇති ව ජීවකයන් මුහුණ බලා "ස්වාමිනි, ඈඳි කෑ ඇඹුලපලින් ඉස ඔතවා ගත නො හෙමි. මේ විට සැකයෙකින් මේ පණ පලායන උපදෙසෙක් දැ යි භය ඇතියෙමි"යි කීය. ජීවකයෝ කියන්නාහු මා උපන් දවස් පටන් අද දක්වා ලෙහෙබිල්ලක ත් නො බින්දෙමි. මාගේ ප්‍රාණය නස ත් නමුත් අනික් ප්‍රාණයක් නො නසමි. භය නො කොට කා බලගෑ,'යි කීහ.

යෝ තෙම ඒ ඇඹුලය අනුහව කොට අමාදියෙහි ගැලුවා සේ ස්වප්නයෙකින් දුටු දෙයක් සේ, කිසි පීඩාවකු ත් නැති ව පැන නැගී සිනාසිසී "මට කිසි කුසුවෙකුත් නැත ස්වාමිනි"යි කී ය. එ වේලෙහි ජීවකයෝ "තෝ මිතු නොවෙහි, තාගේ රජ ද මෙ තෙකට ගොඩ කැංශේෂ් ම ය. අද පටන් ඔබගව ද කිසිවක් ලෙබ නැත. ඔහු කරා මම නො යෙමි. කිප දවසක් ගිය කල මාගේ අරුම තාගේ රජහට ම දැනෙති. ඔනව ද එපවත් කියාල"යි උගන්වා ඇතින්න ද ඔහුටම පාවා දී, ඔහු ආපස්සෙහි යවා, එකලාව ම රජගහා නුවරට ගොස් රජ්ජුරුවන් දැක තමින් පිළිගම් කල පරිදි ත්, ගැලමුනු උපදෙසුත්, රජ්ජුරුවන්ට කී ය. රජ්ජුරුවෝ එ පවත් අසා "තොප ගැලවී ගියේ යෙහෙකැ"යි කියා තමින් ගෙන් ජීවකයන්ට ප්‍රසාද දුන්හ.

මෙසේ ජීවකයන් එ නුවර වසන කල මාගේ ස්වාමිදරු වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේගේ ශ්‍රී ශරීරයට ද කිසියම් ආබාධයක් වි ය. එ කල ස්වාමිදරුවෝ "ජීවකයා ද කොට ආ ප්‍රාප්තකාම සිද්ධ කොට ඔහු ප්‍රසිද්ධ කෙරෙමි" සිතා ආයුෂමත් වූ අනඳ මහ තෙරුන් වහන්සේ කැඳවා "ආනන්දය! බුද්ධකායට ද කිසි යම් ආබාධයක් ඇත. විරේචනයෙක් වී නම් යහපතැ"යි විදාළ සේක. අනඳ මහ තෙරුන් වහන්සේ ද බුදුන්ගේ අදහස් දැන ජීවකයන් කැඳවා "බුදුන්ට කිසියම් ආබාධයෙක් ඇත. විරේචනයක් කොට බලව"යි කී සේක.

එ කල ජීවකයෝ "මාගේ ස්වාමිදරුවෝ මාගේ අභිමතය සිද්ධකරණ සේක් වනැ"යි ඉතා සන්තොෂ වූවාහු නුවරට ගොස් "අද බුදුන්ට විරේක කරමි'යි රජ්ජුරුවන් ආදි වූ ශ්‍රද්ධාවන්තයන්ට කියාලා වෙහෙරට අවුදින් මහනෙල් මල් තුනක් ගෙණ එහි නො එක් ඖෂධයන් ගල්වා බුදුන් ශ්‍රී හස්තයට දී "ස්වාමිනි! මේ පළමුවන මල එක්වාරයක් ආඝ්‍රාණය කළ කල දශවාරයක් විරේක ම ශරීරයෙහි උගු වූ දොෂ පලා යෙයි. දෙවන මහනෙල් මල ආඝ්‍රාණය කළ කල ද දශවාරක් විරේක ම මධ්‍යම වූ දොෂ

යෙයි. පසු ව තුන්වන මහනෙල්මල ආඝ්‍රාණය කළ කල ද දශ වාරයක් විරේක ව සියුම් වූ දෝෂ පලා යෙයි" කියා මහනෙල්මල් තුන බුදුන් ශ්‍රී හස්තයෙහි පිළිගන්වා "බෙහෙත් පිණිස ඉඹ වදාළ මැනැවැ"යි කප්පිය වචනයෙන් ආරාධනා කොට ආඝ්‍රාණය කරවා සමතිස් වාරයක් විරේක කරවා බුදුන්ට ද අද්ගුන වූ පිළියම් කළහ. එ දවස් "බුදුන්ට විරේකයක් කළහ"යි අසා 'අද බුදුන්ට ස්නෙහ භොජනයක් අප අපගෙන් දෙමහ"යි අටළොස් කෙළක් පමණ කුලෙහි ශ්‍රද්ධාවන්තයෝ තමන් තමන්ගේ බලානුරූප වූ පරිද්දෙන් මස දන් වතුරු කළහ.

එ වේලෙහි ආයුෂ්මත් වූ මුගලන් මහ තෙරුන් වහන්සේ 'බුද්ධකාය නම් ඉතා සුකුමාලය. සම්පිස්විරෙවනයෙකින් අති පිරිසුදු වූ කයට රුස්සා වූ භොජනයෙක් සුදුසු නො වන්නේ ය. මෙ තෙක් දෙනාගේ භොජනයෙන් මාගේ බුදුන්ට තරම් වූ භොජනයෙක් නැත. අප වැනියන් කිවක් අමා වැලඳවූ බුදුන්ට කෙසේ වූ භොජනයක් ගෙණෙම්දෝ හෝ" යි දිවසින් බලා "මුළු දඹදිවු තෙලෙහි රජ සිටු බමුණු මෙළෙඳ ශ්‍රීමත්ත වූ චාතුර්වර්ණයන් අතුරෙන් කවරක්හු අනුභව කරණ භොජනයෙක් උතුම් දෝ හෝ"යි දිවසින් බලා එම රජගහා නුවරම නුදුරු තැන චම්පා නම් නුවර කොළිවිස නම් වූ සෝණ සිටානන් අනුභව කරන්නා වූ සුවඳ හැල්සාලේ බත ඉතාම බුදුන්ට සුදුසු යයි දුටු සේක. කෙසේ වූ සුවඳ බතෙක් දැ? යත්,

ඒ සෝණ සිටාණෝ නම් ශ්‍රීමත්ත කෙනෙක. පවුරු අවලු නැති ව වීපි මාසල් සාදා තිබෙන දහස් ගණන් ගෙවල් ඇති මහගම් නියම් ගම් තම. එසේ වූ අසූදහසක් නියම් ගමට නායක යහ. ඒ සෝණසිටානෝ උපන් තැන් පටන් බිම පය නොගැ කෙණෙක කාරණ කිම? යත්;

ඒ සිටානන්ගේ ඉඟුල් පතක් වැනිවූ සුරක්ත වූ යටිපත්ලෙහි අතිනීල වූ රොමරාජි පෙළ පෙළ දී දක්ෂිණාවෘතනව නැමී හිඟුල් පතෙක අඳුන් කැටෙකින් සිතියම් කළා සේ, රත්මලය්නෙක දිය මෙරලිය මල් පිදුමා සේ, රොමරාජින් විරාජමාන විය. මවුපියෝ ඒ සිටානන්ගේ මේ ආශ්චර්‍ය්‍ය දැක පය බිම නො ගැදී මහපෙල හරින් වැඩුහ. දඹදිවු වාසි සත්ත්වයෝ එපවත් අසා තමන් තමන් අතුරෙහි විස්මයපත් ව සිංහල ද්වීපවාසී සත්ත්වයන් සමතොල දක්නට යන්නා සේ කැල බැඳ ගොස් සිටුපුත්‍රයානන්ගේ යටිපත්ලෙහි ලොම් බලා ස්තුති කොට කොට යන්නාහු ය. සිටානන්

කොළු කෙළි කෙළිනා සමයෙහි "කිසි අවකාශයෙක පය බිම ගා පියක්"යි මවුපියෝ ඇතුළු අඩගනයෙහි ඒ ඒ තැන්හි බිම නො පෙණෙන සේ අනැගි වූ පලසින් බුමුතුරුණු ලැවූහ. තව දු: ඒ සිටානන්ගේ සුවකස් ගණන් පරිවාර ජනයෝ ඇතියහ. සෙසු සිටුවරුන් සේ උන්ගේ ගෙයි පහරක් ගැසීමෙක් වේව යි, වධයක් කිරීමෙක් වේව යි, දඟගෙයි ලීමෙක් වේව යි, නිග්‍රහ වශයෙන් එසේ වූ ව්‍යවහාරයෙක් නැත. කෙසේ ජනයන් හික්මවා ගනිද් ද? යත්;

සිටාණෝ පරිවාර ජනයන්ට උදහස් වෙත් නම් "දූන්දන් පය බිම ගා පියමි"යි එක් පයක් බිමම දිගු කෙරෙති. එ කෙණෙහි සිටාණන්ගේ පින්බලයෙන් සියලු ජනයෝ වෙවුලා පැන නැඟෙති. හැමදෙනාම සිතලය සැත් කම් කරන්නා සේ, හිස කුළු හෙළන්නා සේ, හෝ එක් මඩ කරන්නා සේ, වැව හෙයි. එ කල ජනයෝ "හිමි එකෙණෙහි පහව ගියම්හ. අපට වධ නො කැරවුව මැනැව"යි මැදුමගෙණ හොවිති. එවේලෙහි සිටාණෝ බොහෝ දෙනාගේ කාරුණ්‍යවෙන් පය ඇකයට හයා ගණිති. එ වේලෙහි සිව හැම දෙනාට ම උපන් පීඩා නැති ව හය සන්හිඳෙයි. එසේ හෙයින් ජනයෝ ශික්ෂිත ව ම කම්ාන්තයත් කෙරෙති. පක්ෂපාත ත් වෙති. මෙසේ වූ තෙජස් හා සම්පතක් කෙසේ වූ පින්බලයෙකින් ලදුවාහු ද? යත්;

ඒ සිටාණෝ ගිය දවස වෙහෙරක් කරවා පසේ බුදු කෙණකුන් වහන්සේ වස් වස්වා නිරන්තරයෙන් උපස්ථාන කරන්නාහු දවසෙක පසේබුදුන් සක්මන්ගෙයි සක්මන් කරණ වේලෙහි පයට පිහිඩා මහත් සේ දැක අනගි වූ පීඩාමක් සක්මන් ගෙයි බුමුතුරුණු කොට අතුට ඒ මතුයෙහි සක්මන් කැරවූහ. මෙසේ වූ පින්බලයෙකින්, මේ ජාතියෙහි මේ සා මහත් සිවු සැපතක් ලදින් පය බිම ගා නො පියන තරම් යටිපත්ලෙහි ලොම් නැඟෙන තරම් මේ සා මහත් තේජස් ඇතිවන තරම් ශ්‍රීමත් වූ කුලයෙක උපන්නාහු ය යි දතයුතු.।වදාළේ මැනෝ:-

කත්ථි චිත්තෙන පසන්නමහි—අප්පිකා නාම දක්ඛිණා,
තථාගතෙ වා සම්බුද්ධෙ අථවා—තස්ස සාවකෙ-යි.

තව දු: එම සිටානන් සුවඳබත් කමන පරිදි කෙසේ ද? යත්; සොළොස් කිරියක් මාතයෙහි කුඹුරු ලියදි අතුල්තල සේ තනා සිසාරා පවුරු බැඳ ආකාශයෙහි ලෝ දූලින් වසා කුඹුරු දරඬයෙහි

සිය දහස් ලක්‍ෂ ගණන් මහසැළි පිළිවෙළින් තබා කස්තුරි ජබාදු, උරුලෑ තෙල් කපුරු සඳුන් ලමග කළුවැල් දෙව්දුරු යනාදි නො එක් සුවඳ පැනින් සැළුවල් පුර පුරා ගේ මැද්ද දවස් පටන් සෙසු පැනක් කුඹුරට වැද්ද නො දී සුවඳ දියෙන් ඔබ කලල් කොට වපුළ දිය බැඳ ගොයම් පැසවන්නාහු ය. ඒ කෙත ගොයම් ගසු ත් සුවඳ ය. කරලු ත් සුවඳ ය. කෙත සිඹාරා ඇම්ද අඩු වැඩි බලා පිවත් වූ ගොවින් ඇඟ පවා සුවඳ ගත්ති. ගොයම් හැසුනු කල සෙසු සැපියෙක ඇසව ගෙති සිටානන්ගේ සියලු පරිවාර ජනයෝ එක විට ම කෙතට වැද ලා කරල් තියෙන් සිඳ එකී එකී අසුරක් බැගින් ගොළොස් කිරියෙහි කරල් සිඳ ගෙණ ගෙති. එ කල සඳුන් දඬෙන් ගුළක් කරවා සඳුන් පෝරු අතුට ගුළුපත්ලෙහි තන් ජාතියෙහි සුවඳබඩු රියනක් උස අතුට එ මතුයෙහි කරල් පෙළුක, එ මතුයෙහි සුවඳ පෙළුකැ යි යනාදි ඔහොයෙන් ගුළුමාසල දක්වා පුරා ගුළෙහි අගුළු ගෙණ හස් ඔබා තුන් සවුරුද්දක් නොසොල්වා බා වි කරල් සුවඳ කැ කල ගුළෙහි දොර හරණ්නාහු ය. එ කෙණෙහි එ ගුළෙහි දොර හැරී ම හා සමග ඇතුළෙන් නිකුත් සුවඳ මුළු නුවර එක සුවඳ පිඩක් සේ කොළේයි.

එ කල නුවර වාසී සත්වයෝ මේ සුවඳ අසා "සෝණ සිටානන්ගේ සුවඳ කරල් ගුළු අද දොර හලු වන්නා"යි ගෙයි ගෙයි හිඳ කියති. එ දවස් පටන් දවසින් දවස සිටානන්ගේ අනුභව යට වීවර සුවඳ කරල් ගෙණ සඳුන් පුවරු එබූ කිම වළෙහ දී මැඩ සඳුන් මොහොලින් පැර සඳුන් වනෙහ දී පැස කුඩු නො හැර දිමුතු මුතු සේ සහල් කෙරෙති. එ කල බුතියෝ දඹගේ හා කුඩු ගෙණ සළුදෙයෙහි ලා අඹරා සියලඟ ගල්වා උක්සම කෙළි කෙළිති. එසේ පැසගත් සුන්සාල් අවුළා ගෙණ සුවඳ පැනින් සත් අට වාරයක් දෙවුන් ගෙණ තවමු භාජනයෙහ බහා උදුන නගා සුවඳ දරින් ඒ බත් පිසත්නාහු ය එ තරම සුගන්ධමය වූ සූපව්‍යඤ්ජනයෙන් සිටානන් බත් කමින්නාහු ය. එක් වේලෙක අනුභව කරණ භොජන ය ම ලක්‍ෂයක් අගනේ ය. මෙසේ වූ ආහාර සම්පත්තියක් පෙර පසේ බුදුන් වය් වස්වා ප්‍රසන්න වූ සිතින් දමසින් දවස ඇද හිලි සිතින් දුන් දානසම්පත්තීන් ම ලදහ යි දතයුතු.

එ කල ආයුෂ්මත් වූ මුගලන් මහතෙරුන් වහන්සේ සිටානන්ගේ මේ භොජන ය දැක "ඔහු කරා ගොස් ඒ බත ගෙණෙම්"යි සිතා එ කෙණෙහි සිවුරු මැළඳ පාත්‍රය ඔරා, වන් කළු ඇතක් දිගු කොටකරණ ඇසිල්ලෙහි රජගහා නුවරින් වමසා නුවරට වැඩ සිටා

කන්ගේ සඳල්ලෙහි සඳවලාපටලයෙකින් වැසුම් ලද ඉන්ද්‍රනීලමිණි පර්වතයක් සේ සියලඟින් නිලරශ්මි විහිදුව විහිදුවා වැඩ සිටිසේක. එ වේලෙහි සිවානෝ තෙරුන් වහන්සේ දැක පස්වණක් ප්‍රීතීන් පිණා වැද පාත්‍රය ගෙණ තෙරුන් වහන්සේ වඩා හිඳුවා තමන්ට සපයා තුබූ යම කී සුවඳහැල් සෑලේ බතින් පාත්‍රය පුරා අතට පිළිගැන්වූහ. තෙරුන් වහන්සේ ගමනාකාර දක්වා "අප බුදුහු අද විරේචනයෙකින් පිළියම් ලද සේක. එසේ හෙයින් බුදුන්ගේ සුකුමාරවූ ශරීරයට තොපගේ මේ ආහාරය ම සුදුසුය. බුදුන් උදෙසා සියා ආම්හ" යි වදාළ සේක.

සිවානෝ එ පවත් අසා ඉතා සන්තොෂ ව "ස්වාමිනි! මා ගලවා තුඹ වහන්සේට දුන් භෝජනය තුඹවහන්සේ ම වළඳා වදාළ මැනව, බුදුන්ට ද මාගෙන් ම දන් යවමි"යි කියා, ඔබ එ බත වළඳවා නැවත පාත්‍රය සෝධා, සුවඳපැනින් පිරිසුදු කොට එම සුවඳ බතින් පාත්‍රය පුරා "මේ බත මාගේ ආරාධනාවෙන් බුදුන් වළඳවාලුව මැනවැ"යි කියා තෙරුන් වහන්සේට පාත්‍රය දුන්න. එ වේලෙහි තෙරුන් වහන්සේ ද සිවානන් බල බලා සිටියදී ම ආකාශයට නැගී වෙළුවනාරාමයට වැඩ පාත්‍රය බුදුන් ශ්‍රී හස්තයට පිළිගැන්වූ සේක.

එ වේලෙහි බිම්බිසාර රජ්ජුරුවෝ ද "අද විරේචන දිනයෙහි මාගේ බුදුහු කෙසේ වූ භොජනයක් වළඳන සේක් දෝ හෝ"යි තමන්ට පිසූ රාජභොජනයෙන් නිමන්ත්‍රණය කෙරෙමි යි සිතා වෙහෙරට ගොස් බුදුන් ලඟ සිටිසාහු එ බත් පාත්‍රයෙහි පිධානය හැරීම හා සමඟම සියලු වෙහෙර ආරාමයෙහි සුවඳ අමා බත්නව පවණ්ගත් කල රජ්ජුරුවෝ විස්මයපත් ව මුගලන් මහතෙරුන් වහන්සේ මුහුණ බලා "ස්වාමිනි! මේ මිනිස්ලොව බතෙක් නො වෙයි. ශක්‍ර භවනයට වැඩිසේක් ද, නොහොත් උතුරුකුරු දිවයිනට වැඩිසේක් දැ"යි විචාරා තමන්ගේ රාජභෝජනය බුදුන් වළඳවමි යි අවුත් බුදුන්ට උපන් භෝජනයෙහි තෘෂ්ණා බැන්දහ.

බුදුහු රජ්ජුරුවන්ගේ අදහස් දැන "මහරජ! දිව්‍ය භොජනයෙකු ත් නො වෙයි. උතුරුකුරු දිවයිනෙන් ගෙණා බතෙකු ත් නො වෙයි. මනුෂ්‍ය භොජනයෙක් ම ය. තොපගේ චම්පා නම් නුවර, තොපට ම මෙ වන සේවක වූ සෝණසිවානන් දවස් පතා අනුභව කරණ බත් වේ දැ"යි වදාරා ඒ සිවානන්ගේ ශ්‍රීමත් කම හා ඔවුන්ගේ පත්ලෙහි ලොව ඇති තිසා හා ඔවුන්ගේ නො

එක් පින්බල වදාරා "මහරජ! මෙ වැනි බතක් තොප ත් අනුභව කළවිරූ නැත. තෙපි ත් අනුභව කරව"යි වදාරා රජ්ජුරුවන්ට ත් දෙවා, බුදුහු එ බත් වළඳා වදාළ සේක.

කුමක් නිසා බුදුහු උපාසක ධම්මයෙහි පිහිටියා වූ රජ හට බත් දෙවා වදාළ සේක් ද?යත්; මතු වන ලෝමැඩක් උදෙසා ම රජ්ජුරුවන් බත් කැවූ සේක. කෙසේ වූ ලෝමැඩෙක් ද? යත්; රජ්ජුරුවෝ මෙ බතෙහි රස දැන විස්මයපත් වූවාහු සිවානන් පත්ලෙහි ලොම් දන්නා නිසා "සිවානන් දක්නා කැමැත්තෙමි" කියා යවති. එ කල ඒ සෝණසිවානෝ අසූදහසක් පමණ නියම් ගම් වාසීන් ගෙණ රන්සිවි ගෙණෙකින් අවුත් රජ්ජුරුවන් දකිති. එ කල රජ්ජුරුවෝ උන් පත්ලෙහි ලොම් ආදි වූ ආශ්චර්‍ය්‍ය හා රූපලීලායෙහි පැහැද තුමූ මෙ ලොවින් අනුශාසනා කොට "පරලෝ වැඩ නිසා ගොස් බුදුන් දකුම"යි කියති. එ කල සිවානෝ අසූදහස් ජනයන් හා සමඟ අවුත් මා දැක බණ අසා සෝවාන් ව, ඒ සා මහත් සිටු සැපත් හැර මා කෙරේ මහණ ව, අමාමහ නිවන් දැක, සෝණ නම් මහතෙර ව, බුද්ධශාසන නමැති ශ්‍රී නගරයෙහි නැඟූ ධවජ කේතුවක් සේ, ඉතා ප්‍රසිද්ධ වන්නාහු ය යි මෙසේ වූ ලෝමැඩක් දැක බුදුහු ඒ භොජනයෙන් රජුම සංග්‍රහ කළසේක යි දතයුතු.

එ දවස් බුදුන් වළඳා අනාතයෙහි ජීවකයෝ ද බුදුන් කෙරෙහි අතිප්‍රසන්න වූවාහු අනැඟි වූ සිවෙය්‍ය ශාටකයෙන් බුදුන් පිදූහ. ඒ කෙසේ වූ වස්ත්‍රයෙක් ද? යත්; සිවි රට සත්‍රී පුළුන් රල් තුණින් තුණ බදා මිකුළුහු සේ ඉතා සූක්ෂ්ම වූ හූ කටිනාහ. ඒ හුයින් වියන ලද සළු කෙහෙල් ගොබි සේ සියුම් පහස් ඇති ව මිනිස්ලොවින් ඉතා මිාහැඟි වෙයි. එයි දු සිවෙය්‍ය ශාටක නම්. මේ වනාහි එ සේවූ සළුවෙකු ත් නො වෙයි. උතුරුකුරු දිව කප්රුකින් උපන්නාවූ දිම සළුවෙක. සීවපිකා නම් අඹුසොහොනෙන් උපන් සළුව හෙයින් සිවෙය්‍ය ශාටක නම් වි ය. එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු:—

ඒ උතුරු කුරු දිවයින නම් අයමින් විතරින් අටදහසක් යොදුන් පමණ මහීමණ්ඩලයක් ඇත්තේය. සියාරු සූවිසි දහසක් යොදුන් පමණ ඇත්තේ ය. ඒ සා මහත් භූමි මණ්ඩලයෙහි වළෙකු දු නැත. හොඩෙකු දු නැත, පර්වතයෙකු දු නැත. ගසෙකු දු නැත, වැලෙකු දු නැත. දිමුතු මුතුතලාවක් බඳු වූ පරිශුද්ධ වූ වාලුකාතලයෙන් ම ගැවසී ගත්තේය. සකසා හැමැදි ඍර්මළුවක් සේ, දපිණ හිතකියක් සේ, නිෂ්කලඞ්ක ව හැමදා ම තිබෙයි.

එහි මධ්‍යයෙහි පැනනැඟි: කඳබොල පස් යොදුන්, ඇණි පසළොස් යොදුන් වට ඇති, පණස් යොදුන් උස කඳ ඇති, පණස් පණස් යොදුන් උස ශාඛා පසක් ඇති සියක් යොදුන් උස ඇති, තුන් සියක් යොදුන් වට ශාඛාමණ්ඩලය ඇති, එකි එකි ශාඛාවෙහි දහස් සුවහස් ශාඛා ප්‍රශාඛාවන් විරාජමාන ව ශ්‍රීමත් වූ මහා කල්පවෘක්ෂ රාජයා පිහිටියේ ය. එ රුක විළිකුළු පත් නම් දිව්‍යමය වූ, රන් වන් වූ වස්ත්‍ර සමූහයෝ ම ය. මුහුකුළු පත් නිලවණ් වූ දිව්‍ය වස්ත්‍ර සමූහයෝ ම ය. ලපල්ලවයෝ නම් සුරකත වූ දිව්‍ය වස්ත්‍ර සමූහයෝ ම ය. ඒ ඒ තන්හි දිලියෙන අනේකවර්ණ වූ ශ්වේතවස්ත්‍රාදි දිව්‍ය වස්ත්‍රයෝ මෙතෙකැ යි ගණන් නැත. ඒ රුක අංකුරයෝ නම් ප්‍රවාල ලෝහිතාංකාදි දිව්‍ය රත්න සමූහයෝ ම ය. ඒ රුක ඵල නම් මුතුමැණික් ආදී වූ තවරුවන් ම ය. එ කප්රුකෙහි මැවී තිබෙන්නාවූ දිව්‍ය සම්පත් එක මුඛයෙකින් තබා සියක් දහසක් ලක්ෂයක් මුඛ මවා ගෙණ ත් කියා නිමවාගත නො හැක්කේ ම ය. එහි සත්ත්වයන් මේ ලෝකයෙහි යම් සම්පතක් ලව මැනැවැ යි සිතාලා කප්රුකට අත දිගු කළ කල්හි සිතූ සිත හා සමග හස්තයෙහි පෙණී යයි. යොදුන් දහසෙක සිට ත් කප්රුක දිසා බලා අත දිගු කළ කල්හි ප්‍රිය පුත්‍රයකු කරා අත දිගු කරණ පෙම්බර මවක සේ, කප්රුකින් ශාඛාවෙක් ඔහු කරා දිව අතට සිතූ සැපතක් දීලා, නැවත ගොස් ස්වකීය ස්ථානයෙහි ම සිට ගනී.

ඒ සා වීපය මුළුල්ලෙහි සත්ත්වයෝ පූජාමළුවකට රැස් ව ගහන ව සිටිනා මහ පිරිසක් සේ කප්රුක සිසාරා අතුරු නොදී ම වාසය කෙරෙති. එ තෙක් සත්ත්වයන් අතුරෙන් නාශි වණික් ආදී වූ කර්මාන්ත කරණ කෙනෙක්, බඩ නිසා දුක් ගන්නා කෙනෙක්, නැත. ගෙයක් දොරක් නැගීමෙක් පුත්‍රදාරාදි බන්ධු ව්‍යසනයක් විඳිනා කෙණෙකු දු නැත. ව්‍යාධියෙන් පෙළෙන කෙණෙකු දු නැත. ඔවුනොවුන් හා සංග්‍රාමයක් කරණ කෙණෙකු දු නැත. ඔවුනො'වුන් කෙරෙහි ආක්‍රොශ පරිභවයක් කරණ කෙණෙකු දු නැත. ස්ත්‍රී පුරුෂයන්ගේ කලහව්‍යවහාරයකු දු නැත. තව ද දිව්‍යලොකයෙහි දෙවියන්ගේ කප්රුක් නිසා දෙව ගනන් නිසා කලහ ඇතියේ ම ය. මේ උතුරුකුරු දිව වනාහි එසේ වූ කලහයෙකු දු නැත. එසේ හෙයින් ඒ දිවයින දෙව්ලොවට ත් වඩනේ ම ය යි දතයුතු.

තව ද: ඒ වීපයෙහි අනික් ආශ්චර්යයෙකු දු ඇත. ඒ කවරි? යත්; ලෝකයෙහි සත්ත්වයන් සුව විඳිනෝ ප්‍රාසාද නගර දොරටු අවලු උද්‍යාන පැන් පොකුණු ආදී වූ සම්පත් නිසා ම ය. ඒ වීප

යෙහි ප්‍රාසාදයෙකු ත් නැත. පවුරෙක් අටල්ලෙක් නුවරෙක් අගලෙක් පුෂ්පාරාම ඵලාරාමයෙක් පුෂ්කරණියෙක් සිසිදෙයෙකු ත් නැත. එසේ සල මනුෂ්‍යයෝ කෙසේ වූ සුව විඳිද් ද? යත්; එපාද සින්දුවකු ත් ආකාශයෙන් හී ඔවුන් නො තෙමන හෙයිනු ත් සුමඳ මඳපවනක් මුත් සුලං ශීතපීඩාවක් තමා ම නැති හෙයිනු ත් සෙවිලිනු දු ප්‍රයෝජන නැත. සතුරන් නැති හෙයින් පවුරු අවලු අගල පදනමින් ප්‍රයෝජන නැත. සිතූ සිතූ යම් මල් ඵලාදිය කප් රුකින් ම ලැබෙන හෙයින් උද්‍යානවලිනු දු ප්‍රයෝජන නැත. සිතූ සිතූ විට උදක නිර්මිත වන හෙයින් පැන්පොකුණුවලිනු දු ප්‍රයෝජන නැත වැලි නුවර කම් කමරේ ද? යත්; ඒ ද්වීපය සිතාරු සිටියා වූ සවර්ණ සාගරය ම පවුරු නම්. තව ද ඒ සා ද්වීපය මුළුල්ලෙහි අහස් වියනක් බැන්ද සේ, වලාපටලයෙක් සිවගෙණ ගේපළයක් සේ, සත්ත්වයන්ට වැසි සුලං අවු පීඩා විය නො දෙයි. එසේ හෙයින් ඒ ද්වීපය එක මඟුල් ගෙයක් වැන්න. වැසි වස්නා කල ආකාශයෙහි යොදුනක් පමණ තැන වැසි වැස ගොස් පොදබින්දුවකු ත් ජනයන් ඇඟ නො හෙළා මුහුද ම වැගිරෙයි. මහිටුම්යන් ආදි වූ හිමයෙනු දු වන පීඩාවෙක් නැත. සිංහ ව්‍යාඝ්‍ර සා පොළොං මැසි මදුරුවන් ආදි වූ සතුන්ගෙන් වන පීඩාවෙකු දු නැත.

තව ද: එක් ආශ්චර්යයෙකු දු ඇත. එ තෙක් සත්ත්වසමූහයා අතුරෙන් මූ අසවලුන් පුත්‍රයහ. අසවලුන් නැගනියහ. අසවලුන් මැනියන. අසවලුන් පියානන යනාදීන් වෙනස් වූ ව්‍යවහාරයෙකු දු නැත. මොහු මාගේ භාර්‍යාවයහ, මොහු මාගේ පුත්‍රයහ යි එක ප්‍රේමයෙකු දු නැත. හැමදෙන ම ඔවුනොවුන්ට මවුන් වැනියහ. පියන් වැනියහ. සහෝදරයන් වැනියහ. කල්‍යාණ මිත්‍රයන් වැනියහ. එසේ හෙයින් ඔවුනො'වුන් කෙරෙහි සම වූ මෛත්‍රිය ඇතියහ. උපන් දවස් පටන් අඛණ්ඩකොට රක්‍ෂා කරන්නාවූ පන්සිල් ඇතියහ.

ඒ සා ද්වීපය මුළුල්ලෙහි ඒ ඒ දිග්හි අතුරු නැති ව පෙළ පෙළ දිදී දිව්‍යමය වූ යහන් සරහා තිබෙයි. දිව්‍යමය වූ ඛාද්‍යභොජ්‍ය මැවී තිබෙයි. දිව්‍යමය වූ වස්ත්‍රාභරණ මැවී තිබෙයි. දිව්‍යාභරණයෙන් සමලංකෘත වූ දෙව්ලොව දෙවඟනන්ට අපහාස කරන්නාක් වැනි වූ උත්තම ස්ත්‍රී සිය දහස් ලක්‍ෂ ගණන් ඒ ඒ තැන්හි කැල බැඳ සිටිනාහු ය. යන්නාහු ය. එන්නාහු ය. නන්නාහු ය. බොන්නාහු ය. නටන්නාහු ය. ගී කියන්නාහු ය. වීණාදී නන් විසිතුරු ගායනා කරන්නාහු ය. ඔවුනො'වුන් අත්වැල් බැඳ ඒ ඒ තැන්හි සිට පුසඹු කෙළිනාහු ය. එ කල දිව්‍යමය වූ වස්ත්‍රාභරණයෙන්

සමලඞ්කෘත වූ දිව්‍යාභරණයන් බඳු වූ පුරුෂයෝ ද, සිය දහස් ලක්ෂ ගණන් දෙක ඔවුනොවුන් හා අත්වැල් බැඳ ඒ ඒ දිග්හි දිවාරාත්‍රි යෙහි උත්සව කෙළි කෙළ මි ඇවිදිනාහු ම ය.

මෙසේ ක්‍රීඩාවෙන් මත් ව ඇවිදිනා කල මලමූත්‍ර වහනය කරම්හ යි සිතූ කම්හ ඔවුන්ගේ පින්බලයෙන් එ කෙණෙහි නිල්වලා පවලයෙක් දිව අවුදින් ඔහු සිසාරා වසා සිට ගණිති. එ කෙණෙහි පොළොව දෙකඩක් ව පැළී වළෙක් පෙණී යෙයි. එහි මලමූත්‍ර වහනය කළ කල නැවත ඒ වළ අනන්තර්ධාන ව පස්පියුම් විලෙක් මැවී යෙයි. එයි උදක කෘත්‍යය කොට අභිප්‍රාය ඇත්තේ වී නම් බැස ජලස්නානය කොට කැමැති කැමැති මල් බිඳ පැළඳි කල්හි ඒ විල ද අනන්තර්ධාන වෙයි. එ කල පොළොව පළා නැඟි නාගමානවක යන් සේ නිම්ල ව සිටිනාහු ය.

නැවත බත් අනුභව කරම්හ යි සිතූ කල්හි ඒ ඒ තන්හි සරහා තිබෙන දිව්‍යභෝජනයන් අනුභව කරන්නාහු ය. කාය සතපම්හ යි සිතූ කල්හි දුටු යම් දිම්ගහතකට නැඟී කාය සතපන්නාහු ය. හිඳුම්හ යි සිතූ කල්හි දුටු යම් දිව්‍යාසනයෙක හිඳිනාහු ය. කාම්සුව යක් අනුභව කරම්හ යි සිතූ කල්හි දුටු යම් ස්ත්‍රීයක හා සමග කාමාස්වාදය විඳිනාහු ය. එහි වෙනසෙක් නම් රාත්‍රිකාලයෙහි මවුන් දුටු කල මවුන් තනයෙන් ක්ෂීරධාරාවෝ නික්මෙති. එ කල ඒ සලකුණෙන් මොහු අප මෑනියන යි හැඳින වැඳ පුද සම්මා කරවා යෙති. පියන් කරා දූන් පැමිණි කල්හි පියන්ගේ තනයෙනු දු ක්ෂීර ධාරාවෝ නික්මෙති. එ සලකුණෙන් අප දියනියන යි හරිති.

ගර්භනී ස්ත්‍රීන් ක්‍රීඩාවෙන් යන කල්හි ගැබ් වලන ය වී නම්, එ කෙණෙහි දිවයනක් කරා එළඹ ධර්මකාරකයෙහි දියත්තක් සේ, අත තුබූ මැණිකක් යහනෙහි තබන්නා සේ කිසි ව්‍යසනයකු ත් නැති ව දරුවන් වදා යහනෙහි ලා කිසි කුණපයකු ත් නැතිව තමන් යන ගමන් ගොස් පෙර සේ ම කෙළනාහුම ය. පසුව අනික් ස්ත්‍රීයක් එ දරුවන් නාවා යෙයි. අනිකක් අඳුන් ගා යෙයි. අනිකක් තෙල් ගා යෙයි. අනිකක් මල් පලඳවා යෙයි. අනිකක් සුවඳවිලෙවුන් ගල්වා යෙයි. අනිකක් එ දරුවන් නළවා යෙයි. අනිකක් වඩාගෙණ සිඹ සනහා කිරි පොවා තනතුරෙහි තිදි ගන්වා යෙයි. අනිකක් රෑව ගියේ නම් එ දරුවන් බඩ දී නළව නළවා සැතපෙන්නී ය. මෙසේ එක දරුවන් කෙරෙහි නැම ස්ත්‍රී ම සම්මෙත් ඇති ව මාතෘ ධර්මයෙන් පෝෂ්‍ය ය කරණ හෙයින් වැදූ මෑනියෝ - පියාණෝ තමන් වැදූ දරුවන් බව ත් නො දන්නාහ. දරුවෝ ද වැදූ මවුන්

පියන් කවුරු ය් බවත් නො දන්නාහ. මෙසේ කියා නිම්වා ගත නො හැකි දිව්‍යමය වූ සම්පත් ම අනුභව කරන්නාහ. ඔවුනොවුන් කෙරෙහි සම ව ඇති මෛත්‍රීබලයෙන් හා අඛණ්ඩ වූ පඤ්චශීලයාගේ බලයෙන් හා, ඒ උතුරුකුරුදිව උපන්නා වූ ස්ත්‍රී පුරුෂයෝ හැම දෙන ම, හැම කාලයෙහි ම, අඩුවැඩි නැති ව, ජරා විලි පිලි නැති ව, රොග ව්‍යසන නැති ව, දහසක් හවුරුදු ම ජීවත් වන්නාහ.

දහසක් හවුරුද්දෙහි ස්ත්‍රී පුරුෂයන් කාලක්‍රියා කළ කල ගිනි දර ය යි යන ව්‍යවහාර ඒ විෂයෙහි නැති හෙයින් මිනී දැවීමු දු නැත. වැලි කුමක් කෙරෙද්ද? යත්; මළවුන් සියලඟ නො පෙණෙන සේ දිව්‍යාභරණයෙන් සරහා කප්රුකකින් උපන් දිව සළු හඳවා, දිවසළුවෙකින් වසා, රන්සිවිගෙන් මහපෙළහරින් ගෙණ ගොස් අමුසොහොනෙහි තබා එති. එ කල ඉතා මහත් වූ ඇතුන් පවා ගසා ගෙණ පලා යන තරම් ඇත්ගිජු ලිහිණියෝ ය යි යන හිමාලයෙහි වසන පක්ෂිජාතියෙක් ඒ මිනී ගෙණ ගොස් මහ මුහුදු මැද යුගන්ධරාදි පර්වත මුදුන්හි ද, හිමාලය පර්වතයෙහි ද ඒ ඒ තැන්හි හිඳ මස් කා ඇටසැකිලි ඒ ඒ තැන්හි හෙළන්නාහු ය.

එසේ ම මිනිසක් ලිහිණියෙක් ගෙණ, ආකාශයෙන් හිමාලය බලා යන කල්හි උතුරු සළු දෙකක් දඹදිවට කුඩුරු වූ මහ වනයෙක වැටී ගිය. එ කල ඒ සළුදෙක යට කී චණ්ඩප්‍රද්‍යෝත රජ්ජුරුවන්ගේ විජිතයෙහි මැද්දෙ වනයෙහි තුබුවා දැක අනැගි වූ වස්ත්‍රජාතියෙකැ යි ගෙණ'වුත් තමන් රජහට පාවා දුන්හ. රජ්ජුරුවෝ එ සළුදෙක බලා අගය කරවා ඒ සළු ලක්ෂයක් කෝටියක් පමණව ත් එම වඩනා සේ දැක මුළු දඹදිව සියලු රජුන්ගේ සළුපිළි එක් කළත් එ ම වඩනා සේ දැක "මේ මැනි අනැගි වූ වස්ත්‍රයෙක් කවුරුන්ට තරම් දෙ හෝ"යි කල්පනා කරන්නාහු ජීවකයන් සිහි කොට "ජීවකයෝ නම් මා දිවි රැක දුන් යහළුවන. තමන්ගේ ජීවිතයව ත් නො සිතා මාගේ ජීවිතය රැක දුන් හෙයින් මට කල්‍යාණ මිත්‍රයහ. නො එක් වාරයෙහි මා විසින් කැඳවා යවතු දු මා කළ තුගුණ සිතා මා කරා නො එන්නාහ. ඉදින් අවු නම් මාගේ රාජ්‍යයෙන් අඩක් දෙමි ම ය. ඔවුන් නො එන බැවින් මේ අනගි වූ දිවසළු දෙක උන් කරා යවමි" යි සිතා නො එක් රන් රුවන් ඇතුළු වූ රජ පඬුරු බිම්සර රජ්ජුරුවන්ට යවා ඒ ශාටක යුග්මය ප්‍රධාන වූ නො එක් සම්පත් ජීවකයන්ට යවූහ.

ජීවකයෝ ඒ ශාටක යුග්මය බලා ඉතා මාහැඟි සේ දැක "මේ අනිකක්හට තරම් වස්ත්‍රයෙක් නො වෙයි. ලොවුතුරා බුදුන්ට ම පූජාවට තරමැ"යි සිතා බුදුන්ට තමන් විජේවත ය කැරවූ දවස්

සෝණ සිටාණන්ගෙන් ගෙණ සුවඳ හැල් බත වැළඳූ අනන්තරයෙහි ඒ සාටක යුග්මය ගෙණ ගොස් බුදුන් ශ්‍රීපාදමූලයෙහි පුදා ''ස්වාමි දරුවූ බුදුරජාණෙනි! නුඹගේ ප්‍රථම බොධියෙහි පටන් මෙවකට විසි අවුරුද්දෙක් අතික්‍රාන්ත විය, මෙතුවක් කල් මුළුල්ලෙහි නුඹ වහන්සේගේ සියලු භික්ෂුගණයා ම පාංශුකූල චීවර ධාරීන, අද දක්වා ගෘහපති චීවරයක් පිළිගන්නා භික්ෂුකෙණෙක් නැත, අනාගතයෙහි ත් එසේ ම පවතී නම් ශ්‍රද්ධාවන්ත වූ බොහෝ සත්ත්වයෝ තමන් තමන්ගේ භොග පමණින් ලද උතුම් වූ වස්ත්‍රදානය දී බොහෝ පින් රැස් කොට ගත නො හෙන්නාහ. බොහෝ දෙනාට වන ලෝවැඩ ත් නිසා නුඹවහන්සේගේ ශ්‍රීමත් කුලෙන් මහණ වූ සබ්‍රහ්මචාරී ඵාසු ත් නිසා, මට ම අනුග්‍රහ ත් නිසා, මාගේ මේ අනර්ඝ වූ සළුසඟළ නුඹවහන්සේ පිළිගෙණ 'මෙයින් මත්තෙහි ගෘහපති චීවරය භික්ෂූහු ත් පිළිගන්නා පරිද්දෙන් ශික්ෂාපදයක් පණවමි'යි යන වරයෙකින් ගැත්තවූම මේ පිළියම් කළ තැනට ප්‍රසාදයක් දී වදාළ මැනැවැ''යි ආරාධනා කළහ.

එ වේලෙහි ස්වාමිදරුවෝ ජීවකයන් කී පවත් අසා සකාරණ සේ දැන 'මාගේ ශාසනය රූක්ෂ ප්‍රතිපත්තියෙන් ම, එකාකාර යෙන් ම, පවතී නම් බොහෝ කාලයක් නො පවත්නේ ය. තමන් තමන් බලානුරූප වූ පරිද්දෙන් ශ්‍රාවකයෝ ප්‍රතිපත්ති පුරත් නම් මාගේ ශාසනය බොහෝ කලක් පවත්නේය'' ''බොහෝ ශ්‍රද්ධාවන්ත යෝ ත් ගැලවෙන්නාහුමය''යි සිතා ලෝක ශාසන දෙක්හි උපන් මහ කුළුණු ඇති ව එ වේලෙහි භික්ෂුගණයා රැස්කොට තමන් වහන්සේ ඒ සාටක යුග්මය පිළිගෙණ ''අනුජානාමි භික්ඛවෙ ගහපති චීවරං, යො ඉච්ඡති පංසුකූලිකො හොතු, යො ඉච්ඡති ගහපති චීවරං සාදියතු, ඉතරීතරෙනපහං භික්ඛවෙ සන්තුට්ඨිං වණ්ණෙමි'' යි පාලි වදාරා ගෘහපති චීවරය පිළිගන්නා පරිද්දෙන් ශික්ෂාපද පණවා එ වේලෙහි ජීවකයන්ට අනුරූප වූ ධර්මදෙසනා කළසේක. එ වේලෙහි ජීවකයෝ බුදුන් අතින් වරලද සන්තොෂ යෙන් පිණ පිණා බණ අසන්නාහු යෙළ දහසක් කෙලෙසුන් නසා දහසක් නයින් පිරුණාවූ සෝවාන්ඵලයට පැමිණියහ. සිවපීනා යෙන් උපන් සාටක හෙයින් ඒ සළුසඟල සිවෙය්‍ය සාටක නම් විය.

බුදුහු එ වේලෙහි ''මෙසින් මතු බොහෝ ශ්‍රද්ධාවන්තයෝ මාගේ ශ්‍රාවකයන්ට අනැගි වූ බොහෝ වූ වස්ත්‍රදානය ත් දෙන්නාහු ය. ඒ වස්ත්‍රයන් නිසා මතු සොරුන් සතුරන්ගෙන් මාගේ භික්ෂූන්ට

බොහෝ උපද්‍රව වන්නේ ය, ශ්‍රාවකයන් ඒ උපද්‍රවයෙනුදු ගොඩ නගා සඞ්ඝයාට ශ්‍රමණසාරූප්‍ය වූ පරිද්දෙන් අනැඟි වූ පිළී අගය නැති වන සේ, ගිහි පුද්ගලයන්ට ප්‍රයෝජන නො වන සේ, කපා කිරීම් චීවර ව්‍යවහාරයක් උපදවමි"යි සිතා අනඳ මහ තෙරුන් වහන්සේ බණවා, ඒ ශාටක යුග්මය ඔබ අතට දී "ආනන්දය! කිඹුල්වත් පුරයෙහි කුඹුරු බලගැ"යි වදාළ සේක.

එ වේලෙහි අනඳ මහ තෙරුන් වහන්සේ පෙර තමන් වහන්සේ බුදුන්ගේ අදහස් දන්මියි ප්‍රාර්ථනා කොට කප්ලක්ෂයක් පැරුම් පුරා ආ මහා ප්‍රඥා ඇති හෙයින් බුදුන් වදාළ එ තෙවචන මාත්‍රයෙන් බුදුන්ගේ අදහස් සකසා දැන ඒ ශාටක යුග්මය ගත් කපා හැර මැඩිලි තිසක් පොළු ගෙණ ඒ තිස පස් අත්තක් කොට ඒ අතුපස එක් කොට කපා කරණ ලක්ෂණයා කිඹුල්මත කුඹුරු වූ නියාවට ම උපදවාලා බුදුන් සිතූ සැටියේ ම සඟළු සිවුර නිමවා කිණිහිරිමලක් සේ රඳු බුදුන් ශ්‍රීහස්තයට දුන් සේක. බුදුහු සිවුර බලා අදහස් නො වැරැදි සේ දැක "සාධු සාධු ආනන්දය! බුදුන් අදහස් දන්නෙහි අග්‍රයෙහි ය"යි ඔබට සතුටු වදාරා "මෙසින් මතු මාගේ භික්ෂූනුදු තුන්සිවුර ත් මෙසේ ම කපා කොටා වළඳන්නේ ය"යි නියෝග කළ සේක. එ තැන් පටන් සිවුරු කපා කිරීම් ව්‍යවහාර උපන.

එ තැන් පටන් ජීවකයෝ බුදුන් කෙරේ අභිප්‍රසන්න වූවාහු අචල වූ ශ්‍රද්ධායෙහි පිහිටියාහු 'මේ තැන් පටන් මාගේ බුදුන් දවස දවස තුන් වාරයක් දුට මැනව. මාගේ මාසයට වෙළුවනාරාම ය ඉතා දුර මාගේ අඹවන ය ඉතා ලඟය, රම්‍යය, සිත්කලුය, එසිදු බුදුන්ට පිළිගන්වමි"යි සිතා උයන සිසාරා අටළොස් රියන් මහ පවුරෙන් සුරක්ෂිත කොට මාසල් මණ්ඩප පැන්පොකුණු රාත්‍රිස්ථාන දිවාස්ථාන චංක්‍රමස්ථාන ගන්ධකුටි ධර්මශාලාදී සියලු කර්මාන්තයෙන් දිව්‍යොද්‍යානයක් සේ සරහා බිම්සර රජ්ජුරුවන් ආදිවූ එ නුවර අටළොස් කෙළක් මනුෂ්‍යයන් හැමදෙනා හා සමග මහත් වූ පූජා කොට බුදුන් ප්‍රධානවූ එක්දහස් දෙසිය පණස් මහ රහතන්ට අඹ උයන පිළිගන්වා සත්දවසක් මුළුල්ලෙහි අප්‍රමාණ වූ පූජා කොට මින් රැස් කරන්නාහු තමන්ගේ ධන පමණින් ම බුදුන් පිදූහ.

මෙසේ මේ එක කථාවෙහි දක්වන ලද අසාධාරණ විරෙවන ප්‍රතිකාර පූජා ය, අටළොස් කෙළක් සත්වයන් තමන් තමන්ගේ භොග පමණින් එ දවස් කළ ආමිශදාන පූජා ය, බිම්බිසාර රජහු

කළ අග්‍රභොජන පූජා ය, සෝණ සිවාතන්ගෙන් ලද සුගන්ධ ශාලි භොජන පූජා ය, එම සිවාතන් අසූදහසක් පුරුෂයන් හා සමග සෝවාන් වූ දවස් පටන් සිවුසම්පත්තින් කළ පූජා ය, ඔවුන් ම සසුන් වැද මහණව අමාමහ නිවන් දක්මෙන් කළාවූ ජීවිතාන්ත ප්‍රතිප්‍රත්ති පූජා ය, ජීවකයන් අතැඟි වූ ශ්‍රාවක යුග්මයෙන් කළ පූජා ය, ඔවුන් ම සෝවාන් ව දිවිපමණින් කළ සම්‍යක් ප්‍රතිපත්ති පූජා ය, ඔවුන් ම තමන් තමන්ගේ භොග පමණින් බුදුන් පුද අවලොස් කෙළක් මනුෂ්‍යයන් හා සමග සත් දවසක් ප්‍රබන්ධයෙන් කළා වූ ජීවකාරාම පූජා ය යි මෙසේ සත්වයන් තමන් තමන්ගේ භොග පමණින් කරණ ලද අපමණ වූ පූජා ලත් හෙයිනු ත් එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනු ත්, මාගේ ම ස්වාමිදරු වූ, මට ම දෙවි වූ, බඹ වූ, අමා වූ, මට ම ශරණ වූ, මා ම තිඝා ලොකයෙහි උපන් නාක් මැනි වූ, මාගේ බුදුරජාණෝ අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලදී:

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානු'රූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං-සි.

මේ පූජාවලියෙහි අප බුදුන් ජීවකයන්ගෙන් ලද
ජීවකාරාම පූජා කථා නම්වූ
අට විසි වන පරිච්ඡේදය නිමි.

එකුන්තිස් වන පරිච්ඡේදය.

කවද: අප බුදුන් දෙවදත්තාවසරයෙහි ලද සම මෙන් නො එක් ජාතිභෙද පූජා නම් කවර? යත්;

ඒ දෙව්දත් යම් දවසෙක බුදුන්ට යම් රත්තලියක් නිසා ආඝාත බැඳ එතැන් පටන් සංසාරයෙහි දු ඔබව වෛරී ව ම අවු දින් සසර අටවාරයෙක්හි ම මහ පොළොව ගලන ලදුව බුදුවූ ජාතියෙහි බුදුන්ට නො එක් වාරයෙහි වධක ප්‍රයොග කොට, ඔබට හානියක් කොට ගත නොහී, කෙළවර දෙවුරම් වෙහෙර පොකුණු තීරය දී ඔහු මහ පොළොව ගැල නව නව වාරයෙහි අවීචි මහ

නරකයට වන් නියාව ත්, ඔහු ම නිසා බුදුන් නො එක් පූජා ලත් නියාව ත්, පන්සිය පණස් ජාතකයෙන් නො එක් උදාහරණ දක්වා මා විසින් කියන්නාවූ මේ කුශලා කුශලයාගේ විභාගය හා වෙෂයාගේ ආදීනවය හා මාගේ බුදුන්ගේ ක්ෂාන්ති පාරමිතාවගේ විභාගයත් සත්පුරුෂයන් විසින් සාවධාන ව ඇසිය යුතු.

මේ මහා භද්‍රකල්පයට පස්වැනි වූ බුද්ධශූන්‍ය කල්පයෙහි මාගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝ සතර පාරමිතා භූමියෙහි ඇවිදිනා සේක් වෙළෙඳ කුලෙහි ඉපැද, බඹිඹිසට ම වෙළෙඳාම් කොට ඇවිද, කුටුම්බ සණ්ඨාපනය කරණ සේක. දෙව්දත් බොළඳ වූ වෙළෙඳව, අඥාන ව, සොර වෙළෙඳාම් කොට සෙරිවාණිජ නම් වෙළෙඳ ව අධර්මයෙන් ජීවත් වෙයි. එ කල බෝසතාණෝ ඔහු හා සමග එක් නුවරෙක වෙළෙඳාම් කොට දවසෙක ඇවිදිමින් සිටියාහ.

එ නුවර පෙර අසූ කෙළක් ධන ඇති සිටුකුලයෙක් ක්‍රමයෙන් පිරිහී දුඃඛිත ව මුත්තනියක හා මිණිබිරියක හා දෙදෙනෙක් ව අනුන්ට බැලමෙහෙ කොට ජීවත් වෙති. එ ගෙයි පෙර සිටානන් බත් අනුභව කල ලක්ෂයක් අගනා රන්තලිය දීර්ඝකාලයක් නො මැදී මෙන් පැහැ පෙරළී මැටි තලියක් සේ තිබෙයි. ඔවුන් දෙදෙනාගේ පින් නැත්තෙනු ත් මැටිවළඳක් සේ තිබෙයි. එ කල දෙව්දත් ඒ වීථියට පැමිණ 'වළලු ගණුව දූරියයි''යි ගඩගෑය, කුමාරිකා එ තෙපුල් අසා "මුත්ත! මා අත වළලු ලම''යි හැඬුව. එ වේලෙහි මුත්තනියෝ "කම් කල දුව! කුමක් කිය වු ද, අනුන්ට බැලමෙහෙ කොට ජීවත් වන හෙයින් කිසි සරණක් නැති වූම, කොයේ තී අත වළලු ලම් ද'' යී කීහ.

නැවත කුමාරිකා මිදුල පියමා යන වෙළෙඳහු බලා වළල්ලෙහි ලොභයෙන් දෙහොත් මුදුනෙහි තබා ගෙණ මුත්තනියන් වැඳ වැඳ "තෙල සපිගුල නිෂ්ප්‍රයෝජන ව දමා පියා තිබෙන මැටිතලිය දීලා වී නමුත් මට වළලු ලවාලන්නැ'' යි කීව. මුත්තනියෝ ද දුම තලවා ගත නො හී වෙළෙඳහු කැඳවා හිඳිනා හසුන් දී "පුතණ්ඩ! නුඹගේ මේ නං වළල්ලට අඩයි, මේ මැටිතළිය ගෙණ මස්සෙක වළලූ ඇ අත ලා පියන්නැ''යි කියා තලිය දුන්හ. එ වේලෙහි සොර වෙළෙඳ තලිය බර හෙයින් "මේ මැටිවළඳෙක් නොවේ'' යි දූන තලිය පිට යකටුවකින් සිරා සතරන්තලිය බවු දූන මොහු වෙළෙඳ කමක් නො දන්නා බොළඳ කමක් ඇති කෙණෙක. සත රන් තලිය එක මස්සකට දෙත් ල. එක මස්සකුත් නො දී බූන්

බූහුණු වැලි ගසා පියා නිකම් ම මා හැර ගත මැනැව. මා අත තුබූ බඩු විකොට ගතහැකි බඩු ය. නෙව ගොස් බිදීගිය වළඳු ගෙණවුත් දීලා මස්සකු ත් නො නසා දූත්දක් හැරගෙණ යෙමි" යි සිතාලා "මේ තලිය මස්සක් තබා අඩමදවකුත් නො වටී. එ මට නැයි ද" යි බිමට දමාපියා කුඩා කෙල්ල හඬ හඬා සිටිය දී නිෂ්කරුණා ව ම පලා ගියේ ය.

ඔහු ගිය පසු මූර්තිමත් වූ කරුණාපිඩක් සේ මාගේ බෝධිසත්වයෝ දෙව්දත්හුගේ ඝෝර වෛරදම් නමැති ගිනි ගත් මහ හැල් පැන් ඉස්නාසේ ධර්මශීල වූ වෙළඳමෙන් ඇවිදිනා සේක් ඒ වීථියට පැමිණ "කැමැති කෙනෙක් වළඳු ගෙණුව" යි හඬගෑ ද ය. බෝසතුන්ගේ මධුර වූ තෙපුල් අසා "මොහු මෘදු වූ බස් ඇති කෙනෙක, රූක්ෂ වූ කෙනෙක් නො වේ" යි වචනානුසාරයෙන් බෝසතුන්ගේ ගුණ දැන ගෙට කැඳවා හිඳිනා හසුන් දී පෙර සේ ම කියා බෝසතුන් අතට තලිය දී මස්සෙක වළඳු ඉල්වූහ. බෝසතාණෝ ද, පරීක්ෂා කොට සතරන්තලියක් බව දැන ඔවුන් කෙරෙහි උපන් මහාකරුණා ඇති ව "මෑනියෙනි! තුඹ මෙසේ ම බොලඳ සැයි ද, මේ තලිය මට පැවා සේ අනිකක්හට නො පානේ ය. මේ රත්රන් දහසකින් කළාවූ ලක්ෂයක් අගනා සතරන්තලි ය. තුවණැකි වූම කොතින් එක් කුලයෙක ඇත්තන් එක් ජාතියක් මූළල්ලෙසි ජීවත් ම යානැකි ධනයෙක. සඟවා තබාගත මැනැවැ යි කී දැ ය.

එ බසට මැහැලි වහන්සේ "තෙල අා වෙළඳහෝ අඩමිදව කුත් නො වටිය යි කියා බිමට දමා ගියහ. දූන් තුඹගේ පිණින් සතරන් වූ කිය ය. එ තුඹ ම ගෙණ තුඹගේ කැමතියක් අත වළඳු ලා උත්තේ හැඹුම් සත්කිඳුමා උන් කළමා දීලුයේ නම් ඒ ලක්ෂය ම ලද්දා සා සම්යෑ" යි කියා තලිය බෝසතානන්ට ම පාවා දුන්හ. එ වේ ලෙහි බෝසතාණෝ 'මැහැණියෙනි! මේ තලිය වටිනා මිල යක් මාගේ නැත. එසේ හෙයින් තුඹදෑගෙන් නිකම් දුන්නා හා සම ය. මම ද මාගේ ශක්තිපමණින් සංග්‍රහ කෙරෙමි" යි කියාලා අත තුබූ මසු දහසක් අගනා බඩුපසිය බදමිනින් ම පාවාදී ඔරු කුලියට එක රන් අවමස්සක් හා පසුඹිය පමණක් උන් අතින් ම ඉල්වා ගෙණ "ලද ධනය උපායෙන් රක්ෂා කළ මනා වේ ද" යි සිතා එ තැන නොරඳා වහ වහා පලා ගොස් ඔරු කුලියට අවමස්ස දී ඔරුවට පැනනැගි මතු තමන් වහන්සේ සර්වඥගන්ධාවට බන්නාව දෘෂ්ටාන්ත පැවා සේ එ ගං මැදට වැද ගිය සේක.

ඉක්බිත්තෙන් දෙවිදත් තමාගේ ගෙට ගොස් සුත් බුත් මළුලු අවුත් තල් යවා පිසා තැබලි වළලු ගණනක් හැරගෙණ දිව දිව අවුත් එ ගෙට වැද "වැලි තොප දුක්පත් බැවින් මස්සක් වටිනා දෙයකු ත් දීගත නො හෙන බැවින් මින් වළලු ගණනක් හැරගෙණ අර තලිමාල්ල දීපියව. අපගේ ගෙහි සෙල්ලෝ කිපදවසක් කා දමා පියති" යි මානම් කී ය. එබසට දෙපුතුම්වූ ඕහට නොයෙක් පරුෂ බැණ "සොල චණ්ඩාලයකු ත් නො වටිනා සොර මෙලෙඳ! තා මින් සකු ත් නො වටිනි යි කී තලිය ලක්ෂයක් වටී ල, තට සවාමිදරුවකු බඳු වූ ධර්මිෂ්ඨ මෙලෙඳු තෙමෙණ් ඒ දූහ අපට මසු දහසක් දී අප අතින් ම ඉල්වාගෙණ ගියහ. උන් අපට දුන් අකැගි වූ නො එක් බඩු බලගැ"යි කියා බිණුම. එ බසට දෙවිදත් සටි ගුල බලා ආදි තුබූ තැන තලි ය නො දක උපන් මහා ශොකයෙන් කඹුරුසමික් මැබපුම සේ සුස්මක් ලා පියා "එ බඳු වූ ලක්ෂයක් ධනයෙන් පැරද ගිසෙම්" යි උපන් ධනශොකයෙන් උමතු ව තෙමේ තමා බවු නො දක අන තුබූ දහසක් අගනා බඩු එම ගේම බහා හිත තුබූ කඩ ද දමා උමතු වූ ශුනසයකු සේ අපගත වස්ත්‍රයෙන් පළමිදඩ අඝෝරා ගෙණ බෝසතුන් පසුපස්සේ සං තොටට දිව බෝසතුන් අසුනොට ගත කොහි "සොල තොටි ය! තුලු දුන් අටමස්සව මම සොලොස් මස්සක් දෙමි. ඔරුම ආපස්සේ පදුව" යි කී ය. තොටියා එ බසට ආපස්ස බලා ඔහු සත්තයෙන් පොල්ලක් කර තබාගෙණ වීයරු හුත්‍ර ආකාරයෙන් සිටියා දක එ බසට සරු නො කොට ඔරුව පැද බෝසතුන් එ තෙර කෙළේ ය.

එ වේලෙහි දෙවිදත් බෝසතුන් කෙරෙහි ආඝාත බැඳ මහත් වූ ක්‍රොධයෙන් දත් සතා "මෙ බඳු ධනහානියක් කොට මාගේ රන් තලි ය හැරගත්තා ජාති ජාතියෙහි නසම්ව යි, කිසි කලෙක ත් තා දුටු දුටු විටෙක තා කෙරෙහි මාගේ ක්‍රොධයක් මුත් කරුණා වෙක් අනසව පොලොව සේ දුරු වේව" යි කියා කියා ධන ශොක යෙන් එ කෙණෙහි ම ලය පැලී මිය එ තැන්හි ම පස් කඳ හෙළී ය

බෝසතාණන් වහන්සේ ද මොහු කරණ ප්‍රාර්ථනාව අසා, ඔහු ලය පැලී මළ සේ දක, ඔහු කෙරෙහි උපන් මහ කුළුණු ඇති ව "තෝ මා නසයි නම් මම තා නො නසම්ව යි, තාගේ ක්‍රොධාග්නි මාගේ මෛත්‍රීජලයෙන් නිවම්ම යි, තෝ තාගේ වෛෂයෙන් මාගේ ඇඟ මස් කඩ කඩ කොට කපයි නමුත් එ දවස් මම මාගේ ක්ෂාන්ති පාරමිතාව කුළුගණිම්ව යි, තෝ යම් දවසෙක මාගේ අඹුදරුවන්

ආදීය උදුරා බැඳගෙණ ගියේ නමුත් එ දවසු දූ දානපාරමිතාව කුළුගැණීමට යි යාචකාදීන් තෝ මට අනර්ථයක් කෙළෙහි නම් මම මාගේ පාරමිතාපිරීමෙන් වැඩක් ම සාධා ගණීමට යි, දූන් මා තා කෙරෙහි කළාවූ මෛත්‍රිය ම බුදුබව මට සාධාදීලව''යි කියා සම්‍යක් ප්‍රාර්ථනා ම කොට ගත්තේය. එ දවස් කළාවූ ද්වේෂයෙන් බුදු වූ දවස් දක්වා දෙව්දත් බුදුන්ට වෛරී වී ය යි දතයුතු.

සසර ඇවිදිනා කල ත් ඔහු බුදුන්ට අවැඩක් ම සිතූ නිසාව ත් ඔබට අනර්ථයක් කුවූ නිසාව ත්, මොහු තමාගේ ද්වේෂයෙන් ම තමා ම නට නිසාව ත්, මේ මා මතු කියන ජාතිභෙද කථාවෙන් අසා දූන සත්පුරුෂයන් විසින් අනුන් කෙරෙහි ද්වේෂයක් නො කොට සංසාර සාගරයෙන් ගැලවිය යුතු.

නලපාන ජාතකයෙහි දෙව්දත් අති ක්‍රොධයෙන් මිය මහා වන මධ්‍යයෙක විලෙක උදක රාක්ෂස ව ඉප ද විල දිය සඳහා බටු බටුවාවූ බොහෝ ප්‍රාණීන් අල්ව අල්වා ගෙණ සල්ව සල්වා කා බොහෝ පව් රැස් කෙරෙයි. මාගේ ශ්‍රී මහා බොධිසත්ත්වයෝ ඒ ජාතියෙහි අසූ දහසක් වඳුරන්ට රජ ව ඉපැද ඒ වෙනෙහි ඇවිදිනා සේක් ඔහුගේ විලට පැමිණ බලබලා සිටියදී ම හුණදඬු තුඩ තබා ගෙණ ගොඩ සිට ම සිත් සේ පැන් උරා බී අසූදහසක් නෑයන් හා සමග ජලස්නානය කොට වැඩි සේක. දෙව්දත් 'මාගේ මේ සතුරා හා නෑයන් අද සිත් සේ කාපිය නුහුනුයෙමි'' යි සුසුම් ලලා අනානඩාෂ වී ය. මෙසේ ඒ ජාතියෙහි දු රාක්ෂස ව ඉපැද පවා ඔබ නසා ගත නුහුනුයේ ම ය. එ දවස් ඔබ කළා වූ වික්‍රමය කල්පාන්තය දක්වා පවතිමින් සිටියේ ම ය.

නව ද: කුරුඬගමිග ජාතකයෙහි සවාමිදරුවන් කුරුඬග නම් මුවරජ කල දෙව්දත් රෞද්‍ර වූ වැදිකුලෙහි ඉපැද ප්‍රාණඝාත කොට කොට වෙනෙහි ඇවිදිනේ බෝසතුන් දූක "මේ මාගේ සතුරා සවර දවසක මරා ඇඟවිස් සිත් සේ පලහා කාපියම් දෝ හෝ'' යි සිතනුයේ බෝසතුන් එලාඑල අවුළා කන ගස්මල උඩ මැසි බැඳ එහි සැඟවී හිඳ රාත්‍රියෙහි නිදි වරා යන එන මග ඌගුලු ලා වෙහෙසනුයේ තෙමේ ම වෙහෙසී වීඩා වූ බව මුත් බෝසතුන් නසාගත නුහුනුයේ ම ය.

නම ද: මහාශීලව ජාතකයෙහි සවාමිදරුවන් මහා ශීලව නම් රජ ව, දශරාජ ධර්මයෙන් රාජ්‍ය ය කරණ කල්හි දෙව්දත් දුෂ්ට වූ අමාත්‍ය ව ඔබ නිසා ම වසනුයේ, ඔබගේ ම පුරෙහි අසූ ව තමා නො මරා ඇරපු කල්හි නවත් ඔබව ම විනාශ ය සොයනුයේ,

කොසොල් රජහු කරා ගොස් ඔහු උගන්වා ගෙණ, රජපිරිස් ගෙණ, පෙරළා අවුත් බෝසතුන්ගේ රාජ්‍ය ය ගෙණ, නිරපරාධ වූ බෝධිසත්ත්වයන් හා දහසක් ඇමැතියන් කට පමණක් වළ තලවා අමුසොහොන්හි ලවා මිනත් වධ කරවා පසුව බෝසතුන්ගේ ගුණ දත් දෙවියන් සවකීය වූ රාජ්‍ය ය ගෙණ දුන් කල්හි මේ තෙමේ ම තමාගේ නුගුණ දත් තමා ම ගෙණා සතුරන් විසින් අතින් පයින් තළා දමන ලදු වි ය. ස්වාමිදරුවෝ ද ඒ ජාතියෙහි මෛත්‍රී පාරමිතාව කුළුගත් සේක් ම ය.

තව ද: වානරින්ද්‍ර ජාතකයෙහි මේ මාගේ බෝධිසත්ත්වයන් වහන්සේ වඳුරු ව ඉපැද ගඞ්ගාවක් සමීපයෙහි වාසය කොට සතර ධර්මයෙන් ජයගත් සමයෙහි, මෙ ම දෙව්දත් එම ගඟ මහඹරුවක්හා කිඹුල් ව ඉපැද බෝසතුන් කමි හි උත්සාහ කොට ගලතල පිට සැඟවී මැදහෙව තමා කවට පෑකසු ද පවා කෑපිය නුහුනුයේ ම ය.

තව ද: කුම්භිල ජාතකයෙහි දෙව්දත් කිඹුල් ව ම ඉපැද වඳුරු ව උපන් බෝධිසත්ත්වයන් තමා පිට හිඳුවා ගෙණ ගං මැදට ගෙණ ගොස් පවා එ දවසු ද කසාගත නුහුනුයේ ම ය.

තව ද: තයො ධර්ම ජාතකයෙහි දෙව්දත් අසූදහසක් වඳුරන්ට රජ ව උපන. බෝසතාණෝ ඔහට පුත්‍ර ම උපන් සේක. එ කල පවා බෝසතාණන් සකාත පසාරයෙන් මරම් යි උත්සාහ කොට එසේ ත් නසාගත නො හී දියරකුස්සා ලවා කවා මරවා පියම්හි සිතා රකුසුවිලකාව යවා එසේ ත් කසාගත නො හී, පසුව බෝසතුන්ගේ ඓශ්වර්‍ය්‍ය වඩ වඩා ගෙණ යත් යත් තෙමේ ම ශොකයෙන් ලපැළී මළේ ය. පසු ව බෝසතාණෝ අසූදහසක් වඳුරන්ට රජ ව සවසථයෙන් වාසය කළ සේක.

තව ද: දුම්මෙධ ජාතකයෙහි දෙව්දත් මගධරට රජ ව ඉපැද බෝධිසත්ත්වයන් සජීවක ධවල ව නම්හව මගුලැත් ව උපන් සමයෙහි පවා, බෝසතුන් පර්වතයක් මුදුනෙන් හෙළවා මරම් යි උත්සාහ කොට එ කෙණෙහි බෝසතුන් කර්මජ වූ ඍද්ධි ලදින් ආකාශයට නැගී ගිය කල්හි තෙමේ ම හස්තිවාහනයෙන් පිරිහී පරිහවයට පැමිණියේ ය.

තව ද: අසම්පදාන ජාතකයෙහි මාගේ ස්වාමිදරුවන් ශඞ්ඛ නම් ධනසිටු ව දිළිඳු ව ආ තමාට සතළිස් කෙළක් පමණ සම්පත් දුන් කල්හි තෙමේ ම තමාගේ රට ගොස් පිළිය නම් සිටු ව සම්පත් විඳිනේ පසුව බෝසතුන් එ ම ජාතියෙහි දුඃඛිත ව තමා කරා ගිය ද බොල් වී තිඹක් දී අසත්පුරුෂ ධර්මයෙහි කෙළ පැමිණියේ ය.

තව ද: ගොධ ජාතකයෙහි ස්වාමිදරුවන් ගොධරාජව ඉපිද හිඳිනයන්ගේ විශ්වාසයෙහි ආදීනව දක්වා මදුල සමයෙහි දෙව්දත් කටුසු බොහොඩ ව ඉපි ද පවා ඔබ නසමි යි උත්සාහ කොට ගෝ වැද්දන්ට බිල ය පෑ දුම්සලා දෙවා නො එක් උත්සාහ කොටත් ඔබ නසා ගත නොහී තෙමේ තමා දිවි නසා ගත.

තව ද: සිගාල ජාතකයෙහි මේ මාගේ බොධිසත්වයන් වහන්සේ සිගාල රාජව ඉපැද සුසානභූමියෙහි කාරණාකාරණ දන්නා නුවණින් වාස ය කරණසේක්. දෙව්දත් සුරාධූර්ත ව ඉපැද බෝසතුන් දැක දැකැම මාංසමකින් මරමි යි සිතා පොල්ලක් අතින් ගෙණ සොහොන් වැද ඇස පෙරළා, දත නියාගෙණ, මළ මිනිසකු සේ වැදහොත්තේ ය. මාගේ බොධිසත්වයෝ සොහොන්වල කඩ රෙදි බලා අවිදිනා තපස්වී රාජයකු සේ ගොදුරු බලා ඇවිදිනා සේක් මළ මිනිසෙකැ යි මොහු කරා පැමිණ අත තුබූ පොල්ල දැක "මළ මිනී අත පොලු කිමබන්නේ කාරණයෙක් නො වෙයි. අපට මුන්ගේ මස් නො කෑමැක්කේ ය" යි ආපස්සේ නික්මුනු සේක; දෙව්දත් පොල්ල දමාලා ගසාත් වරදවා තෙමේ ම පැරද ගියේ ය.

තව ද: චුල්ලපදුම ජාතකයෙහි ස්වාමිදරුවන් පදුම නම් රජ ව රජ ය හැර ගොස් තපස් කරණ කල; අත් පා කන් නාසා කපා කමා දියට දමාපී කල්හි දියෙන් ගොඩ නගා වණ සුව කොට බෝසතුන්ගෙන් ජීවා සංග්‍රහයක් ලදින් පසුව සත්‍රි ය උගන්වා ගෙණ බෝසතුන් සෙලින් හෙලවා දූජින කම් කලාවූ කන් නාසා කොටා කම්බු දු මෙම දේවදත්තයා ම ය.

තව ද: කාෂාව ජාතකයෙහි ස්වාමිදරුවන් අසූදහසක් ඇතුන් හා සමග පසේ බුදුන්ට උපස්ථාන කොට පාරමිතා භූමියෙහි ඇවිදිනා කල දෙව්දත් හස්තීමාරක වැදිකුලෙහි ඉපිද පසේ බුදුන්ගේ වෙස් ගෙණ, කඩුවක් ගෙණ කාෂාපිළිය යට සඟවා හස්ති මාර්ගවල සැඟවී ඝොර තපස්වෙසින් හිඳ පවා දිවි පමණින් උත්සාහ කොට බෝසතුන් නසාගත නුහුනුයේ ම ය.

තව ද: රොම ජාතකයෙහි ස්වාමිදරුවන් පාරාපත යෝනියෙහි උපන් කල දෙව්දත් කූට ජටිලයෙක් ව "මේ පරවියා අල්වා ගෙණ මරාපියා මස් කා පියමි" යි නො යෙක් සොරමායම් කොට හසු කොට නුහුනුයේ ම ය.

තව ද: ජවසකුණ ජාතකයෙහි ස්වාමිදරුවෝ කැරලව උපන් සේක. දෙව්දත් එම වෙනෙහි සිංහ ව ඉපැද නො එක් සතුන් මරා මස් කනුයේ මස්ඇටක් උගුරෙහි සරස ව මහත් වූ වේදනාවෙන්

මරණප්‍රාප්ත ව කට දල්වා ගෙණ ආත ආසා හොත්තේ ය. එ වේලෙහි බෝධිසත්ත්වයෝ මොහු කෙරෙහි උපන් මහ කුළුණු ඇති ව "යහළු! මේ කිමෙක් දැ" යි විචාරා මස් ඇට ගෙලෙහි ගත් පවත් දැන මොහුගේ ආකාරයෙන් අසත් පුරුෂයකු බව ත් දැන දඬුකඩක් තුඩින් ගෙණ ඔහු දෙකල්ලෙහි අවුළුවාලා යටව වැද ඇට ගසා හළ දැ ය. දෙව්දත් ඇට ගැලවුනු බවු දැන "මෑ බඩ දළ ත් දැඩි ය. සත් දවසක් ගොදුරු නො ලත් හෙයින් සතකු දිව අල්වා ගන්ට බලත් නැත. එ හෙයින් මොහුගෙන් මට කම් නැත කටට වත්නහු නො හරිමියි. දෙහනු ගසාලි ය එ කෙණෙහි දඬුකඩ යටි තල්ල හා උඩුතල්ලෙහි හැනී කිලයක් සේ සිට ඉනු දු වේදනා වි ය. බොධිසත්ත්වයෝ මොහුගේ මේ කාරණය දැක යන ගම නෙහි ම පයින් දඬුකඩ ගසා හැර පිටතට පලා ගොස් "යහළු! මා නිසා එ තෙකින් දිවි ලදුව. මට කුමක සංග්‍රහයක් කරවු දැ" යි විචාළ දැ ය. දෙව්දත් "මා මැනි සිංහයක්හු කටට වැද නා දිවි ලද්දේ ම එක් උපකාරයෙක් නො වේ දැ" යි අසත්පුරුෂ බස් කී ය.

තව ද: සාලික ජාතකයෙහි මාගේ බොධිසත්ත්වයන් සත් හැවිරිදි කුමාර ව ගසක්මුල වැලි කෙළිනා සමයෙහි දෙව්දත් වෙද කුලෙහි ඉපැද මිහ යනුයේ බෝසතු දැක උපන් මහා ක්‍රොධයෙන් ඔබ තොබ බලකුගේ ගසඋඩ බිලයෙක්හි කරපොවා හොත් නයකු දැක "නයි ලවා මොහු කවා මරවා පියමි" යි සිතා "සැටම! තෙල බිලයේ කර පොවාලා හෝනා සැලලිහිණි පැටියක් අල්ලාගෙණ නො කෙළිතේ නෑ" යි කී ය. බොධිසත්ත්වයෝ ඔහුගේ වඤ්චාව නො දැන සැලලිහිණියෙකැ යි යන සිතින් ගස උඩට නැඟී නයිගේ ග්‍රීවය අතින් අල්වා ගෙණ සුස්මාපු හඬින් නයා බව දැන "අත හළ හොත් මා අත ම කඩා කයි" සිතාලා නයි බොටුව මිරිකා ම අල්වාගෙණ නයි බිලයෙන් ඇද ඒ වෙදැ කරපිටට දැමූ දැ ය. නයා ඔහු බොටුවේ ම දරණ ලා ඒ ඒ තන්හි කර මටතොට කඩා කා එ තැන්හි ම මරා හෙළී ය. මෙසේ බෝසතුන් නසමි යි ඒ ජාතියෙහි දු තෙමේ ම නට.

තව ද: සවණ්ණ කක්කටක ජාතකයෙහි සවාමිදරුවාන් බ්‍රාහමණ මිහාසාරව කෙත්වත් බලන්ට ගිය ද, දෙව්දත් තෙමේ කපුටු ව නයක්හු ලවා බෝසතුන් කවා එදත් මරුගත නුහුනුගේ ම ය. තෙමේ ම කකුළු නළින් බොටුව සිඳුනා ලදුව නයී හා සමඟ ම දිවි නසාගත.

තව ද: පරන්තප ජාතකයෙහි දෙව්දත් පරන්තප නම් රජ ව පර පීඩාවෙන් අධර්මයෙන් රජ කරණුයේ බෝසතුන් තමහට පුත් ව උපන් කල්හි "තමහට ආ සතුරන් කරා බෝසතුන් යවා මරවමි"යි උත්සාහ කොට යවා ත් බෝසතාණන් නසා ගත නුහුනුයේ ම ය. පසු ව තෙමේ ම ඒ සතුරන් අත නස්නා ලදුව ජීවිතයෙනු දු රාජ්‍යයෙනු දු විනාශයට පැමිණියේ ම ය.

තව ද: කුක්කුටක ජාතකයෙහි දෙව්දත් බරණැස් රජ ව ඉපැද ස්වාමිදරුවන් වලිකුකුළු ව උපන් කල පවා දෙව්දත් පියා උකුසු ව ඉපැද පවා බෝසතුන් අල්වා ගණිමි යි උත්සාහ කොට නසාගත නො හී තෙමේ විනාශයට පැමිණියේ ම ය.

තව ද: මහාපදුම ජාතකයෙහි දෙව්දත් බරණැස් රජ ව ඉපැද අවිචාරයෙක් ම රාජ්‍යය කරණුයේ මහාපදුම නම් කුමාර ව බෝසතුන් තමහට ම පුත්‍ර ව උපන් කල්හි දුෂ්ටවූ ස්ත්‍රිය කී බස් ගිවිස රන්පියුමක් වන් මුවපියුමක් ඇති ඒ පියුම් නම් බෝසතුන් කෙරෙහි උපන් මහා ක්‍රොධයෙන් පුත්‍රප්‍රෙමයක් නො සිතා බෝසතුන් දෙකකුල් ගෙණ ශතපුරුෂ ප්‍රපාතයෙන් අධඃශීර්ෂ කොට දමාපී ය. ඒ වේලෙහි මාගේ ස්වාමිදරුවෝ දුර්ජන වූ ඒ ස්ත්‍රිය කෙරෙහි ද, ගලින් හෙලන පියානන් කෙරෙහි ද, සියලු සතුන් කෙරෙහි ද සම මෙත් කළ සේක. එ කෙණෙහි ඒ පර්වතයෙහි අරක් ගත් දේවතාවා උඩට දමූ පුතකු අත හෙලවා ගත් මවක සේ බෝසතුන් දෙ අත්ලෙහි හෙලවාගෙණ උරපිට වතුරුවා දිවපහස සිත් නිදිගන්වා, එම පර්වතයෙහි වසන දිව්‍ය නාගරාජයාගේ එණ ගැබියට වඩාලී ය. නාරජ බෝසතුන් දැක මහාප්‍රේමයෙන් තමන්ගේ දිව්‍යසම්පත්තීන් අඩයක් දී රක්ෂා කෙළේ ය. සැරියුත් මහතෙරුන් වහන්සේ වැනියන් එම පර්වතයෙහි දිව්‍යරාජ ව උපන් කල අනඳ මහතෙරුන් වහන්සේ වැනියන් එහි ම නාග රාජ ව උපන් කල මාගේ ස්වාමිදරුවන් දෙව්දත්හු වැනියෝ කෙසේ නම් නසා ගණිද් ද.

තව ද: අම්බ ජාතකයෙහි ස්වාමිදරුවන් චණ්ඩාල ව ඉපැද බ්‍රාහ්මණ කුලයෙහි උපන් දෙව්දත්හට ආචාරී වූ සමයෙහි තෙමේ ජාතිමානයෙන් බෝසතුන් වලඟා අනිකෙක්හු නම කියා ගුරුද්‍රොහි කොට දිව්‍යාම්‍ර ඵල ගන්නාවූ එබඳු වූ අනර්ඝ වූ දිව්‍යමන්ත්‍රයෙකින් පිරිහී එම ශොකයෙන් ජීවිතයෙනු දු පිරිහී ගියෙ.

තව ද: රුරුමිග ජාතකයෙහි ස්වාමිදරුවන් රන්වන් මුව රජ කල දෙව්දත් දියෙහි මියන්නේ බෝසතුන් නිසා දිවි ලදින් ඔබ කී මග ම ජනපදේ ගොස් ඔබ වසන තැන් බරණැස් රජුට කියා, ඒ සා රජ පිරිසක් ගෙණ බෝසතුන් කරා අවුත් ඒ සා භයක් උපදවා බෝසතුන්ගේ වික්‍රම දක්වූ බව මුත් තමාගේ ම නුගුණ දක්වූ බව මුත් ඔබට අවැඩක් කොටගත නුහුනුයේ ම ය.

තව ද: සොමනස්ස ජාතකයෙහි මාගේ ස්වාමිදරුවන් බරණැස් රජහට පුත්‍ර සොමනස්ස නම් රාජකුමාර ව උපන් කල්හි දෙව්දත් කූට ජටිල ව, රජ්ජුරුවන් හා "තොප පුතු මරව" යි නො එක් දුර්මන්ත්‍රණ කොට බෝසතුන් නසා ගත නුහුනුයේ ම ය තෙමේ ම බෝසතුන් ගුණ දත් අමාත්‍යයන් විසින් මරා දිවි නසන ලදුයේ වී ය.

තව ද: චම්පෙය්‍ය ජාතකයෙහි ස්වාමිදරුවන් චම්පෙය්‍ය නම් නාගරාජ ව එක විෂධූමියෙකින් මුළුලොව දමාපියන ආනුභාව ඇති ව පවා තපස් කරණ සමයෙහි දෙව්දත් අහිතුණ්ඩික ව ඉපැද ඔබ දූන අල්ලා ගෙණ දියබරණකු යේ හෙළවා නො එක් නිග්‍රහ කරණුයේ ඔබගේ පාරමිතාවට අන්තරාය කොට ගත නුහුනුයේ ම ය.

තව ද: ඡද්දන්ත ජාතකයෙහි දෙව්දත් සොණුත්තර නම් වැදි ව ඒ සා උත්සාහයෙකින් හිමාලය වනයට ගොස් බෝසතුන් විද මැරී ය. බෝසතාණන් වහන්සේ එ වේලෙහි පවා ඔහු කෙරෙහි සිත නො කලඹා ඔහු ම මුල්කොට දානපරමාර්ථ පාරමිතාව සිද්ධ කොට ගෙණ බුදුබව පත පතා දළ දෙක කපා දන් දුන් සේක.

තව ද: මහා කපි ජාතකයෙහි ස්වාමිදරුවන් අසූදහසක් වඳුරන්ට රජ ව, මී අඹගස හසු ව බරණැස් රජුගේ දුනුවායන් සිසාරා සිටිය දී සියලු නෑයන් හින වැලක් බැඳ ගලවා අන්‍යව වෘක්ෂායෙහි මුදුන් පැමිණි ද දෙව්දත් එ වක බෝසතුන්ට සේවක ව වසනුයේ එ ද ඒ අවකාශය දැක බෝසතුන් පිටට පැන දෙපයින් පිරී මැඩ වසට කඩා ජීවිත හානි කොට ඔබ බලයෙන් ම හැලවී පලා ගිය. බෝසතාණන් වහන්සේ ද ඔහු දෙපයින් වසට තලන වේලෙහි ද වෛරයක් නො සිතා තමන් වහන්සේගේ පාරමිතා නමැති ප්‍රාසාදයෙහි කූටාසඞ්ග්‍රහණයට පහරණ අතකුළු අහරක් කොට සිතා බුදුබව ම ප්‍රාර්ථනා කළ සේක.

තව ද: භූරිදත්ත ජාතකයෙහි මේ මාගේ ස්වාමිදරුවන් භූරිදත්ත නම් නාගරජ කල්හි දෙව්දත් වැදිපුත්‍ර ව ඉපැද බෝසතුන් දුටු උපන් මහාක්‍රෝධ ඇති ව, බෝසතුන් අල්ලා ගෙණ ඉස සිසාරා බිම අපුළා විළඹෙන් තුන් වාරයක් මැඩ කට ඇල් වගුර වගුරා දළ කඩා හැර නො එක් පීඩා කෙරෙයි. මාගේ ස්වාමිදරුවෝ "අද මම ක්‍රෝධයක් කෙළෙම් නම් මාගේ එක දත් හස්සෙකින් ගියා වූ එක විෂ බිඳුවකින් මොහු තබා මුළුලොව්ත් දවාපියම් සී මොහුගේ ක්‍රෝධයට මම ත් ක්‍රෝධ කෙළෙම් නම් මොහුගෙ ත්, මාගෙ ත් වෙනසෙක් කිම් දැ"යි සිතා ඇකෙයේ හිඳ අසින් මිටින් ගසන පුහක්හු කෙරෙහි පහරින් පහරට සනා වඩන පියාසකොණකුත් ගේ මොහු කෙරෙහි මෛත්‍රී ම කළ සේක අමෛත්‍රි නො කළ සේක.

තව ද: මණිචෝර ජාතකයෙහි දෙව්දත් අධර්මිෂ්ඨ වූ රජ ව, නිරපරාධ වූ බෝධිසත්ත්වයන් මැණික් මායමකින් සාපරාධ කොට බෝසතුන් ඉස කප්පමි යි සිතා තමා ඉස කප්වා ගෙණ, බෝසතුන්ම රාජ්‍යය දී තෙමේ ඝෝර මහා නිරාවල ගීන.

තව ද: ධම්මධජ ජාතකයෙහි බෝසතුන් ධම්මධජ නම් පණ්ඩිත ව ධම්මධජය නගා ලෝකාර්ථ කළ සමයෙහි ද, දෙව්දත් කාළ නම් සේනාධිපති ව බෝසතුන්ට නො එක් මරණ ප්‍රයෝග කොට ඔබ මරාගත නුහුනුයේ පසු ව බොහෝ දෙන තමාම අල්වා ගෙණ මරා දමාපිග.

තව ද: උපාහන ජාතකයෙහි ස්වාමිදරුවන් හස්ත්‍යාචාර්ය කල දෙව්දත් ඔබ අතින් ශිල්ප ඉගෙණ ඔබ හා ම ශිල්පයට වාද කොට ගුරුද්‍රෝහ කොට පැරදී එ කෙණෙහි ද බොහෝ දෙනා විසින් අතින් පයින් තැළුම් ලදින් මිය අපාය ගත වී ය.

තව ද: ගුත්තිල ජාතකයෙහි මාගේ ස්වාමිදරුවන් ගුත්තිල නම් ගන්ධර්ව කල ද මේම දෙව්දත් මූසිල නම් ගන්ධර්ව ව, ගුරුන් හා වාද කොට තෙමේ ම පැරද රජපිරිස අතින් පයින් තැළුම් ලදින් මිය ගොස් අපාය ගත වී ය.

තව ද: තිත්තිර ජාතකයෙහි මාගේ ස්වාමිදරුවන් වටු ව ඉපිද පවා වෙදත්‍රය නිමවා දූත දිසාපාමොක් ආචාරිධුරයෙහි සිව පන්සියක් දෙනාට ශිල්ප දුන් සමයෙහි දෙව්දත් කූට ජටිල නම් ඝෝර තාපස ව ඇවිදිනේ බෝසතුන් දුටු, එ දවස් රත්නලියෙහි

කළා වූ වෙෂය මේ දමස් දක්වා හුනුන් හෙයින් අවකාශයක් ලදින් බෝසතුන් මරා සිත් සේ ඇසෙමින් කා එ කෙණෙහි ම, මතු ඔබට ම අගසවු වන ව්‍යාඝ්‍රරාජයා විසින් මරණ ලදුව එකෙණෙහි ම අපාය ගත වි ය.

තව ද: ඛණ්ඩහාල ජාතකයෙහි ස්වාමිදරුවන් චන්ද්‍ර නම් රාජකුමාර කල දෙව්දත් තෙමේ ඛණ්ඩහාල නම් පුරෝහිත ව බෝසතුන් මරා යාග කරමි සි එ දවසුද හො එය් උත්සාහ කොට ඔබ නැසිය නුහුනුයේ තෙමේ ම මහජනයා විසින් නට.

තව ද: මහ උමංදයෙහි ස්වාමිදරුවන් මහෞෂධ නම් මහ පඬි ව ලොව බුද්ධොත්පාද කාලයක් සේ කොට කුමණ තමැකී මහ ලියයෙහි මල් රොන් සළා දෙවූ සමයෙහි මෙම දෙව්දත් කෙවට නම් පුරෝහිත බමුණු ව අටළොස් අක්ෂෞහිණී මහ සෙනගක් අවුත් ඔබ වැඩහුන් නුවර සිසාරා හිඳ සාරමසක් මුළුල්ලෙහි හො එක් යුද්ධ කරවා නසා ගත හො හි ධර්මයුද්ධයෙක ජය ගණිමි සි ඔබකරා අවුත් තෙමේ ම පැරද නලළ ක් ලේ ලවා ගෙණ, ගොස් පසු ව විවාහ මන්ත්‍රණයෙන් ඔබ මරවමි සි සිතා අවුත් තෙමේ ම පැරද පතුපිට පහරකා දිවිලෙකකට වන් මුවපොල්ලකු සේ හයින් වෙවුල වෙවුලා ම, ගොස් නැවත තමාගේ නුවරට බෝසතුන් උපායෙන් ගෙන්වා ගෙණ මරම්මි සි උත්සාහ කොට නුව රට වැඩිදු ම තමාගේ පාය බිඳිනා වේලෙහි තෙමේ ම හුණපත් තෙන් පහර කෑ ය. ලක්ෂයක් අගනා රන් තලියට ඔබට වෛරව යමක් කරන්නා තබා ඔබට ම කමා අතින් ලක්ෂයක් අත්ලස් දී තමාගේ, ගෙය පමණක් ගලවා ගෙණ මෙසේ ඒ ජාතියෙහි ත් බොහෝදෙනා අතින් අපහාස ම ලද.

තව ද: මහාපිඞගල ජාතකයෙහි මෙම දෙව්දත් මහාපිඞගල නම් රජ ව ජම්බුද්වීපයෙහි දෙර දෙර හුනු සෙණක්සේ බොහෝ දෙනාට නිග්‍රහ කොට, අධර්මයෙන් රාජ්‍යය කෙරෙයි. සොලොස් දහසක් බිසෝවරු මොහු ඇස හුනු කසලක් සේ නුරුස්සති. රජ යුව රජ මහ ඇමැතියෝ මුයෙහි තිබූ ඔකින් සැපිගිය අකුරක් සේ ඔහු නො කැමැතියහ. රාජ්‍යවාසී සමයේ තමන් තමන් පය ඇනුනු කවුමක් කොට සිතති. එ කල මාගේ බෝධිසත්ත්වයෝ ගිනිවලෙ කින් මහ පියුමක් පැන නැංගා සේ මෑහට පුත්‍ර ව ඉපැද බොහෝ දෙනා ඇසට රසාඤ්ජනයක් සේ ප්‍රිය වූ යේක. මෙ තෙමේ බෝසතුන්ගේ ඓශ්වර්ය්‍ය වඩ වඩා ගෙණ යස් යස් උපන් ශොක

යෙන් තෙමේ ම මිය හොත් නරකයෙහි වැටීගියේ ය. එ කල රාජ්‍යවාසී මොහු දවා අළු හස්කොට බෝසතුන් ඔවුනු පලදවා සිංහාසන මතුයෙහි හිඳුවා මොහු මළ සතුටින් උත්සව මඟුල් කෙරෙති. මොහුගේ වාරපාලයා මිනී මළ තැනක් සේ මහ හඬින් හඬයි. බොහෝදෙන මොහු එකලාව ම සිට හඬන්නහු දැක "කොල! මේ කුමන විසමයෙක් ද, පිංගල රජු මළ දවස් පටන් ගෙණ හැම දෙන සන්තානයෙන් කති, බොති, නටති, ගී කියති දෙම්නසක් ඇති කෙණෙක් නැත. රජු තට දීපු සම්පත් බොහෝ ම ද" යි විචාළහ.

වාරපාලයා කියනුයේ පිංගල රජුට ශොකයෙන් නොවෙයි මා හඬන්නේ. පිංගල රජ මේ රජගෙට නමා වදනා යම් ම විටෙක ද පිටත් වන යම් ම විටෙක ද මා හිස්මුදුනෙහි ටොංකු අවක් අවක් බැගින් ඇන මහත් වූ වේදනා කෙරෙයි. ඔහු මළ දවස් පටන් ගෙණ දුන් මා හිස සැනපී ගොස් මා ම රාජ්‍යය ලද්දා කොට සිතමි. ඒ මෙ කෙනට ගොස් නරකයෙහි වැටී යෙයි. තමා ගුණ නපුරු හෙයින් මට සේ ම යමයනුදු ඔළුවෙහි ටොකු අනිති. යම්පල්ලු ඔහු අතින් ටොකු කා විඩා ව පියා 'අපගේ නරකයට මොහු නො කැමැත්තෝ' යි නැවත ගෙණවුත් මෙම රජගෙහි ලා පියා යෙද්දේ හෝ දෙවනු වත් ඔහුගේ දුක්මෙක් මට සම්ප්‍රාප්ත වේ දෝ හෝ යි මා කෙරෙහි ම කළ ශොකයෙන් හඬමි" යි කී ය. එ කෙණෙහි මහරජ පිරිස ඔල්වරසන් දී මහ කෙළි කෙළියහ. මෙසේ දෙව්දත් ඔබ කෙරෙහි වෛෂ කොට තෙමේ මිය පවා බොහෝදෙනා අතින් කරුණා නො ලදුයේ ම ය.

තව ද: මහා වෙස්සන්තර ජාතකයෙහි දෙව්දත් ජූජක නම් බමුණු ව ඒ සා මහත් පුත්‍රදානයෙහිදී ත් නො එක් පරුෂ වාක් කියා ත් ඔබ දුක්ක දී දරුවන් මරා ත් ඔබ සිත කලඹා ගත නුහුනුයේ ම ය. පසුව තෙමේ ම ජීවිතයෙනු දු පිරිහිණ. අමිත්තතාපනා නම් අඹුවගෙනුදු පිරිහිණ. ඒ සා මහත් ධන සමූහයෙනුදු පිරිහිණ. සවාමිදරුවෝ වූ කලි තමින් වහන්සේගේ නො යෙක් ජාති නමැති නවරුවන් වැලයෙහි රුවන් ඝෝර ඇටෙකින් මරු සම්භසය කොට ලුවා සේ, පාරමිතාවන් නිම්වා සත්වාරයක් මහ පොළොව ගුගුරුවා දෙවියන් ලවා සත්රුවන් වැසි වස්වා මහත් වූ දන කොලාහල කොට එයින් මැඩ තුසී පුරයෙහි උපන් සේක් ම ය.

තව ද: සසර දෙව්දත්හු මහපොළොව ගිලූ ජාති අට නම් කවර?. යත්; ශීලවනාග ජාතකයෙහි ස්වාමිදරුවන් ශීලව නම් ඇත් රජව වෙනෙහි එකලා ව තපස් කළ සමයෙහි දෙව්දත් දිළිඳු කුලයෙක ඉපැද කිසි කටයුත්තෙකින් වල්වැ දු, වල්මත් ව, දිශා මූළ ව, සත්දවසක් නිරාහාර ව මරණ ප්‍රාප්ත වූ දු ඔබගේ ම කරුණාවෙන් ඒ වනයෙන් ගැලවී පසුව ඔබ කරා ම ගොස් තුන් වාරයක් දළ දත් ඉල්වා තුන්වාරයෙහි පොලු පොලු බැගින් දළ කපා තමහට දත් දුන් කල්හි අනන්තවාරයෙහි මොහුගේ දූජිත භාරය ධරාගත නො හී මහපොළොව පැළී සල්වා ගැල මහ නිරාවල ගියා.

තව ද: ධම්පාල ජාතකයෙහි දෙව්දත් මහාප්‍රතාප නම් රජ ව තමහට ම දුව උපන් මාගේ බෝධිසත්ත්වයන් ධම්පාල නම් සත් මැසි කුමර කල බෝසතුන් වඩාගෙණ මෑනියන් වහන්සේ නමා දැක්ක දී උස උන්හ යි කිපී බෝසතුන්ට අසිමාලක නම් වධයක් යොදා අහසට දම දමා කඩු පහරින් සිංලග නා කපා තු තු කොට ඒ සා රාජාඞ්ගනයෙහි මස් කිඩුයෙන්, ලේ බිඳුයෙන්, වදමල් කපා වස්නා සේ විසුරුවා පී ය.

මාගේ ස්වාමිදරුවෝ වසි කාරවන දෙව්දත්හු කෙරෙහි ද, ඔහුගේ නියෝගයෙන් කඩුයෙන් සිංලග පොලු ගන්නා වධකයා කෙරෙහි ද, පිහුම් පෙති සේ රාජාඞ්ගනයෙහි විසිර ගිය අතුල් පතුල් තන් නාසා අවුළ අවුළා සමහරක් ගිනා ලාගෙණ, සමහරක් තමින් ලෙහි තබා ගෙණ. දරුශොකයෙන් තඩා පෙරළෙන ඒ මෑනියන් වහන්සේ කෙරෙහි ද මෙසේ වූ වධ විඳිනා තමන් වහන්සේ කෙරෙහි ද, සම වූ මෛත්‍රී කොට තමන් වහන්සේ ගේ ක්ෂාන්ති පාරමිතා නමැති ඡග ගැල් කොත්යි අද මාගේ වප් මඟුල් දිනයෙකැ යි සිතා වතුළ යේක. එකෙණෙහි ද මහපොළෝ පැලී ඔහු සල්වා ගැල මහ නිරාවල ගියා.

තව ද: ක්ෂාන්තිවාදී ජාතකයෙහි මේ මාගේ ස්වාමිදරුවන් ක්ෂාන්තිවාද නම් තාපස කල දෙව්දත් කලාබු නම් රජ ව ඔබ "ක්ෂාන්ති වාදිමි" කී බසට කිපී "අද තාගේ ක්ෂාන්තිය බලමි" යි දූත් දෙපා තන් නාසා කප්වා කටු සැමිටියෙන් මරවා නො එක් වධ කොට 'ක්ෂාන්ති වාදිමි" යි කියන බස හරවාගත නොහී, තව ද ක්‍රොධය රඳාවගත නො හී දිව ගොස් ලෙහි තමාගේ විළුඹින් පහරක් ඇන්නෝය එවේලෙහි ද මාගේ ස්වාමිදරුවෝ ඔහු කෙරෙහි වෛරයක් නො සිතා "මොහුගේ මේ විළුඹ පහර නම් මට ඒ වධ

යෙක් සෝ වෙසි. මාගේ ක්ෂාන්ති පාරමිතා නමැති මහමාලිගාවෙහි කූටසන්ධිග්‍රහණයෙන් ස්ථාවරත්වය පිණිස ගැසූ අත කුළු පහරක් වැන්නැ"යි ක්ෂාන්ති පාරමිතාව ම තර කළ සේක. එ කෙණෙහි දු දෙව්දත් මහ පොළොව පැළී සල්ව සල්වා ගැල් ගොස් නරක ගින්නට බත් වී ය.

තව ද: චේතිය ජාතකයෙහි ස්වාමිදරුවන් කපිල නම් මහාඍෂි කල දෙව්දත් තෙමේ චෙතිය නම් රජ ව බෝසතුන් මලනුවන් කොට "කෝරකලම්බයන් වැඩි මහලු කෙරෙමි යි, බෝසතුන් බාල කෙරෙමි"යි ලොවට පළමු වන බොරු උපදවා එ කෙණෙහි ම ආකාශයෙන් බිමට වැටී මහ පොළොව පැළී සල්ව සල්වා ගෙණ ගොස් මහ නිරාවල ගිය.

තව ද; චූලනන්දිය ජාතකයෙහි ස්වාමිදරුවන් වානර යෝනියෙහි ඉපැද මහානන්දිය නම් වඳුරු රජ ව චූලනන්දිය නම් මලනුවන් හා සමග අන්ධ වූ මෑණියන්ට මෙහෙ කොට මාතුපට්ඨාන ධර්මය පූරණය කළ සමයෙහි දෙව්දත් වැදි ව වෙනෙහි ප්‍රාණඝාත කොට ඇවිදිනේ දවසෙක බෝසතුන්ගේ අන්ධ වූ මෑණියන් දුක විදිමි යි යී හැරයක් උරපුරා හයාගත. එ කෙණෙහි බෝසතානෝ "මා මෑණියන් හැර පියව, මා ඇගමිස් ගණුව" යි කිය කියා මෑණියන් වහන්සේ පසුකොට ලා සිට ගත් දෑ ය. ඔහු තෙමේ දයාවක් නැති ව එම හැරයෙන් බෝසතුන් විද හෙළා අනික් හැරයක් හයා ගත. චූලනන්දිය නම් මලනුවෝ ද එසේ ම යාච්ඤා කොට "අප දෙදෙනාගේ මස් ගෙණ අප මෑණියන් හැරපියව"යි කියා හී පසව පැමිණියහ. උනුදු විද හෙළා අනික් හැරයෙකින් අන්ධ වූ මැදිරි මෑහැල්ල ද විද මෙසේ තුන්දෙනාම ජීවිත හරණය කොට එ දවස් දූ මහ පොළොව පැළී ගොස් සල්ව සල්වා මහ නිරාවල ගිය.

තව ද ධම්ම ජාතකයෙහි මාගේ ස්වාමිදරුවන් ධර්ම නම් දිව්‍ය රාජ ව ඉපැද මුළුලොව ධර්මයෙහි පිහිටුවා ලොකාර්ථචර්‍යාව පූරණය කළ සමයෙහි දෙව්දත් කෙසේ දේ අත වැරද ගිය කුශල ධර්මයෙකින් අධර්ම නම් දිව්‍ය රාජන් ව ඉපැද ලෝවැසියන් අධර්ම සමාදානයෙහි පිහිටුවමින් ඇවිදිනේ දවසෙක බෝසතාණන් හා "අධර්මය වැඩි ය, ධර්මය අඩු ය"යි තෙමේ අධර්ම වාද කොට බෝසතුන්ගේ ධර්ම වාදයට පැරද එ කෙණෙහි දු ආකාශයෙන් බිම හී මහ පොළොව පැළී ගොස් මහ නිරාවල ගිය.

තව ද පණ්ඩර ජාතකයෙහි ස්වාමිදරුවන් ගරුඩරජන් ව උපන් සමයෙහි දෙව්දත් අචේල නම් තාපස ව ගරුඩයන් දුටු කල

නයින්ම අනපී උගන්වා, නයින් දුටු කල ගරුඬයන්ට අනපී උගන්වා, මෙසේ දෙපක්ෂයට මිත්‍ර ස්වරූපයෙන් අමිත්‍රකම් කොට මෙසේ මිත්‍රද්‍රෝහ බලයෙන් ඒ ජාතියෙහි දු සත්කඩක් ව සිය පැලී අධඃ ශිඛී ව මහ පොළොව පැලී ගොස් මහ නිරවල ගිය.

තව ද: මහාකපි ජාතකයෙහි මෙම මාගේ බෝධිසත්ත්වයන් වහන්සේ මහාවානරේන්ද්‍ර ව ඉපැද මහ වන මැදෙක වාසය කරණ කල දෙව්දත් කාශී බ්‍රාහ්මණ ව ඉපැද කිසියම් ප්‍රයෝජනයෙකින් මහ වෙනෙහි ඇවිදිනේ සැටපියන් තරම්ලෙස මෑරී සත් දවසක් නිරාහාරයෙන් දුක් ගන්නී. එ කල බෝධිසත්ත්වයෝ මොහු දැක උපන් මහා කරුණාවෙන් නො එක් උත්සාහයෙන් මොහු ගොඩ නගා ගෙණ විඩා සන්සිඳුවන පිණිස ඔහු ඔබ ඇතෙලේ සෑහෙ නැති ව ඉස තබා මඳක් සැතපී ගත් දැ ය. එ කෙණෙහි දෙව්දත් එ තෙකින් මොහුගෙන් මට කම් නැත. මොහු මරා ඇගමස් කා කාසබල උපදවාගෙණ මලින් හෙලිබැස පියම්'යි සිතාලා පහණෙක් අතින් ගෙණ පැහැර බෝසතුන් හිස් මුදුන පළාපී ය. එ කෙණෙහි බෝධිසත්ත්වයෝ පිබිද මොහුගේ ආකාරය දැක ඇසිල්ලෙකින් ගස උඩට පැන නැගී ඔහු කෙරේ ආඝාතයක් ම නො කොට "මොහුගේ දුර්ජනකම් නිසා මෝහට එ තෙකින් සහායක් නොවීම නම් හෙලි බැස ගත නො හී මේ වෙනෙහි ම මියෙයි. එ කල මා ගේ කාරුණ්‍ය පාරමිතාව කෙසේ මුදුන් පත් කොට ගණිම් දැ"යි සිතා වදරා ඇස මසා වැටීගිය මස් වැදැල්ල එක් අතෙකින් ඔසවා ගෙණ අතු අත් තට පැන පැන ගොස් ඕහට මග පෑ මනුෂ්‍යපථයට ලූ සේක. දෙව්දත් මනුෂ්‍යපථයට ගොස් මිත්‍රද්‍රෝහකම් කළාවූ පවින් සජීවගයෙහි කුෂ්ට කිලාස ඇති ව මනුෂ්‍යප්‍රේත ව සත් අවුරුද්දක් මුළුල්ලෙහි ගෙයක් නැති ව, දොරක් නැති ව, ඇවිද පසුව බරණැස් රජ්ජුරුවන්ගේ උයනෙහි රජපිරිස බල බලා සිටිය දී මහ පොළොව පැළී සල්ම සල්මා ගැල ගොස් මහ නිරාවල ම ගිය.

මෙසේ මේ දෙව්දත් බුදුන්ට එක වාරයෙහි කළාවූ වෛරය නිසා "සසර නො එක් වාරයෙහි ඔබ නසම්"යි උත්සාහ කොට නො එක් වාරයෙහි තෙමේ ම විනාශයට පැමිණී ය. සසරදී ම අටවාරයෙක්හි ඔහු මෙසේ මහ පොළෝ ගිලී ය. බුදුන් බුදු වූ ජාතියෙහි හා නව වාරයෙක ඔහු මහ පොළෝ ගිලී ය. වෛරය නම් තෙමේ සත්පුරුෂ වූ ජනයෙනි! එම කඩින් හුනු ගින්නෙන් එම කද දවන්නා සේ යත්වයාගේ වෛරාග්නිය ඔහු ම නසන්නේ ම ය. අනුන් නැසිය නො හෙන්නේ ම ය. සත්පුරුෂයන් විසින්

කිපුනහු මෛත්‍රීන් ජයගන්නේය, අසත්පුරුෂයා සත්පුරුෂ ධර්මයෙන් ජයගත යුත්තේය, දිළිඳුහු දානයෙන් ජයගත යුතුය, බොරු කියන්නහු සබා කීමෙන් ජය ගත යුතු මැ යි. වදාළේ මැනෝ:

අක්කොධෙන ජිනෙ කොධං-අසාධුං සාධුනා ජිනෙ,
ජිනෙ කදරියං දානෙන-සච්චෙන අලිකවාදිනං,

තව ද: ඔහු බුදුන් සමයෙහි පොළොව ගිලූ පරිදි කවරේ? යත්: මෙසේ සංසාර සාගරයෙහි දු නො එක් ජාතිශතසහස්‍රයෙහි බුදුන්ට වෛරී ව ඇවිදුනා වූ දෙව්දත් මේ බුද්ධොත්පාද කාලයෙහි කෝළිය නුවර සුප්‍රබුද්ධ රජහු තිසා සුදෙවුන් රජානන් නං අමිතා නම් බිසොවුන් කුස පිළිසිඳ යශොධරා දේවීන්ට බෑ ව, බුදුන්ට ඌරෙහි ද, සුහුරුබඩු ව බුදුන්ගේ වංශයෙහි ම උපන. ඔහු මහණ වූ පරිදි පෙර කී අනුරුඬාදී රජුන්ගේ මහණ වීමෙහි කියන ලද මය. එ දවස් මල්ලරජුන්ගේ අනුපිය වෙනෙහි දී බුදුන් කෙරේ මහණ ව කම්සථාන උගෙණ භාවනා කරන්නාහු පෘථග්ජන වූ ධ්‍යාන උපදවා ගෙණ ආකාශයෙන් ඇවිදුනා කරම් කැමැති රූපයක් මවා ගන්නා තරම් සෘධි ලදහ. අවශෙෂ වූ සත්වයන් මේ පළමු වන සෘධිය ලත් කල සංසාරසාගරයෙන් ගොඩ නැගීමට පසුරක් බැඳ ගන්නා සේ ප්‍රතිෂ්ඨාවම කාරණ වෙයි. මොහු ලදුවා වූ සෘධිය ශුනකයක්හු නාසයට මැඩි මුවපිත සේ ඔහට ම අනර්ථකාරී වි ය. හේ කෙසේද? යත්; ශුනකයා නාසයට මුවපිත වැඩි කල්හි හෙතෙම සතුන් ගැන්මෙහි ඉතා ගිජු ව ඇත්පොව්වන් පවා පස්සෙහි දිව ගොස් හය නැති ව ඇතු කරා වැද ඔහු ඇත්පියෙන් කිහිඹියක සේ ගැහැටී තෙමේ ම විනාශයට පැමිණෙන්නේ ය. එහෙයින් ම මොහු ලද ධ්‍යානය ද මෝකව අභිමාන මඩා විනාශයට මූලික වි ය. හේ කෙසේ ද? යත්;

“මා හා සමග මහණ වූ රජදරුවෝ ඇමදෙන ම පන්සිය පන්සිය පිරිස් සිටුවා, ලාභයෙන්, යසසින් අග පැමිණියහ. මම තව දක්වා එකලා යෙමි, ජාතියෙන් යසසින් ඔවුන් හා ම සම්ය. දැන් මහණධම් පිරීමෙන් අඩු වෙම් ද යි මහත් වූ අභිමානයක් උපදවා මම ද පක්ෂදක් ඇති කෙරෙම් යි, පක්ෂදක් ඇති කරණ කල පළමු කොට ලාභය ඉපැදවුව මැනැව, නිරායාශයෙන් ලාභයක් උපදවා ගන්නා කල රජක්හු ම පහදවා ගත මැනව. කොශල බිම්බිසාරාදි මහා ප්‍රඥාවන්ත රජදරුවෝ තමන් මහ නුවණැ'ති හෙයි ය බුදුන් රහතන් කෙරෙහි අති විශ්වාසයහ. එසේ හෙයින් ඔවුන් නැම කෙරාටික ඥානයෙන් පහදවා ගත නො හැක්ක, මට

තරම් අඥාන වූ මූර්ඛ වූ රජෙක් කවරෙක් දෝ හෝ"යි පරීක්ෂා කොට "තෙසැට දහසක් රාජධානි ඇති මුළු දඹදිවින් රජගහා නුවර බිම්සර රජහු පිත් අජාසත් කුමර කාරණාකාරණ නො දන්නී. තවුත් මතවුත් නො දන්නි මවුපියන්ට නොකිකරු ය. ඉතා ශ්‍රීවන්තය. එසේ හෙයින් ඔහු ඇසිරෑ කාලේ ද සිතූ සිතූ දෙයක් කොට ගන්නාහ, ඇසිල්ලෙකින් සුබිත වන්නාහ මතවුන්ට සංග්‍රහ නො කරණ බවක් මිස, තමා පහන් කෙණකුන්ට සංග්‍රහයක් කෙරේ නම් නො කාලට වස්නා මහා වර්ෂාවක් සේ පමණ නැති ව දෙයි. මේ ඇම් කාරණයෙන් මම ඔහු පහදවා ගනිම් නම් ලාභය උපදවා පිරිස් සිටුවාගත හැක්කැ"යි සිතී ය.

ඒ අජාසත් රජහුගේ උත්පත්ති කථාව කවරී යත්; පෙර සැවැත් නුවර මහ කොසොල් රජහු දූ රජගහා නුවර බිම්සර රජහට අගමෙහෙසින් ව වැස අජාසත් කුමරහට දරුගබ ගත. ඔහු කුස පිළිසිඳ ගත් වේලෙහි බිසොවුන්ට රජහුගේ දකුණු උරයෙන් ලේ බොන දොළක් උපන. බිසොවු තමන්ට උපන් දොළ ලජ්ජාවෙන් කිසි කෙණෙකුන්ටත් නො කියා වැහැර මලා ගිය මල්දමක් සේ වූහ. රජ්ජුරුවෝ බිසොවුන් වහන්සේ දුක නො එක් වාරයෙහි විචාරා දොළ නො කියන හෙයින් "දොළ නො කීයෙහි නම් තී මට සතුරු නීයා ය"යි කීහ. යත්නයෙන් විචාරා ලේ බොන දොළ ගේ දන "තීව උපන් දොළ ඉතා මට හුවකාමූ වූ දොළෙකැ'යි සතුටු ව, මහ වෛද්‍යාචාන් ගෙන්වා රන්සැතින් උරය පලුවා රන්තැටියෙහි ලේ වත් කොට පැන් හා සමග බිසොවුන් පෙවූහ. එ කෙණෙහි දොළ සන්සිඳින. නිමිති දන්නා ආචාරීවරයෝ මේ දොළ අසා "බිසොවුන් කුස පුතෙක් උපන. එ පුත් රජුට සතුරු ය. ඔහු නිසා රජ නස්සි. එ තෙමේ මහපින් ඇණියේ ය. පියරජහු මරා මේ නුවර රජ කෙරෙයි" කීහ. බිසොවු එ බස් අසා රජ්ජුරුවන්ට සොරා උයනට ගොස් දරුගබ මඩවති. ඒ කුමරහුගේ පින් බෙලෙන් දරු ගබ නො සේ ම ය. රජ්ජුරුවෝ බිසොවුන් බොහෝ සේ උයනට යන්නා දුත සැක ඇති ව විචාරා එවූ කාරණ අසා "තී කුස පුතකු බවූ ද දුවක බවූ දූ නො දන්නෙයි. අසමල් රජ තමන් හට උපන් දරුවන් මෙසේ කෙලෙල ලැ යි දඹදිව් කෙලෙසි රජ දරුවෝ මට නින්ද බෙණෙති. මතු එසේ නො කරැ"යි කිපී බිසොවුන්ට රැකවල් ලැවූහ. බිසොවු "පුතෙක් වී නම් ඔහු උපන් විට ම මරම්"යි සිතූහ. රජ්ජුරුවෝ ඒ සිත හා දූත විත්තමුවත් උගන්වා කුමරු උපන් විට ම බිසොවුන් ඇස නො පෙන්වා ම පහකරවූහ.

ඉක්බිත්තෙන් ඒ කුමර දෙතුන් හැවිරිදි වූ කල සරහාලා බිසොවුන් ඇස දක්වාලූහ. බිසොවු පුත්‍රප්‍රේමයෙන් පෙර තමන් සිතූ සිත සඳහන් නැති ව මහත් වූ සනා කොට වැඩූහ. මරන්නට නොපොහොසත් වූහ. ඔහු මවුකුසින් ජාත නොව ම පියහට සතුරු වූ හෙයින් අජාසත් කුමර ය යි නම් තුබූහ. ඔහු සොළොස් හැවිරි දි කල ම පියරජානෝ යුවරජ කළහ.

මෙසේ ඔහු තමන්හට තරම් ලෙස් දැක දෙව්දත්හු ධ්‍යානලාභී ව බුදුන් කෙරේ. වසන්නාහු බුදුන් කොසඹෑ නුවර ඝොසිතාරාමයෙහි වසන කල දෙව්දත්තයෝ පාත්‍ර සිවුරු ගෙණ එකලා ව ම රජගහා නුවර ගොස් බුදුන්ගේ වෙළුවනාරාමයෙහි ලැග දෙවන දා උදෑසන "කෙසේ වූ පෙළහරෙකින් ඔහු පහදවා ගණිම් දෝ හෝ"යි සිතා "පළමුකොට රජහු තැතිගන්වා පෙළහරක් පාම්"යි කල්පනා කොට ගෙණ එ කෙණෙහි ම ශ්‍රමණ රූපය අන්තර්ධාන කොට විකුර්වණ සෘද්ධි බලයෙන් අත්මල වළලු ඇති, ඉසකේ නො බැඳ, ලදරු වූ දිව්‍යකුමාරයකුගේ වෙසක් මවාගෙණ නයින් සත්දෙනකු මවා ගෙණ දෑත, දෙපය වළලු ලුවා සේ නයින් සතර දෙනකු වෙළා ගෙණ එක් නයකු මල්දමක් සේ ඉස්මුදුනෙහි වෙළාගෙණ එක් නයකු ග්‍රීවයෙහි සිනාරා ගෙණ, මහ හැළි නයකු මුත් හරක් සේ උරෙහි එකාංශ කොට ලාගෙණ ආකාශයෙන් ගොස් අජාසත් රජහු මහපිරිස් පිරිවරා තමාගේ රාජාඞ්ගනයෙහි උන් වේලෙහි අහසින් බැස ඔහුගේ ඇකයේ සැකයක් නැති ව ඉන්ද්‍රජාලයක් සේ පෙණී ගියහ.

එ කෙණෙහි නයි සත්දෙන වෙන වෙන ම එණ කෙරෙමින් නාඹුරු සක මඩින්නා සේ සුස්මි සුස්මා රජහු කරා තුඩු දිගු කෙරෙමින් භය ගැන්වූහ. එ වේලෙහි අජාසත් කුමර මහ පිරිසට ඇසෙන සේ තුන්හඬක් හඬා "කොල! මේ කවරෙක් ද, දත් දත් නයින් ලවා කවා මරව යි, මේ නාගයක්ෂයාගෙන් මා රකුව රකුව"යි කීය. එ වේලෙහි අමාත්‍යයෝ ද භය ගෙණ වෙවුලා ඉපිල පැනනැංගහ. රජකුමර "සෙලවී නැගෙම් නම් නයි මා කත් දෝ හෝ"යි යන භයිනුත් රාජධෛර්යයෙනුත් වෙවුලා වෙවුලා නො නැගී හුන්නේ ම ය.

එ වේලෙහි දෙව්දත්තයෝ "මහරජ! නො බව, මම යකෙකිම නොවෙමි. තොපට අවැඩක් නිසා නො අමි. තොප පහදවාගන්නා නිසා ආමි. සුදෙවුන් රජානන් බෑනා වූ, ගෞතම බුදුන් සුහුරු බඩු වූ, සයානුලක්ෂණයක් දෙවගතනන් බඳුවූ වරගතන් පිරිවරා ශ්‍රීමත්

තව ශ්‍රී විදුනා වූ, යශෝධරා බිසෝවුන් බෑනෑයෝ, රහල් තෙරුන් මයිලනුවෝ, දෙවදත්ත තිස්ස නම් මහාස්ථවිරයෝ මම ම වෙම් දැ"යි කීහ. අජාසත් කුමාරයෝ එ බස් අසා "හිමියානෙනි! තුඹගේ සෘද්ධිබල දුටිමි. තුඹ දෙව්දත් මහතෙර වී නම් මට මේ සා මහත් භයක් නොදී පැතනැගී මා පෙරට ව සිටියේ නම් වඳිමි. පුදමි. සත්කාර කෙරෙමි. තුඹව උපාසක වෙමි"යි කීහ. එ වේලෙහි දෙව් දත් මහ තෙරහු ඒ රූපය අන්තර්ධාන කොට පාත්‍රසිවුරු ධරා මහණ වෙසින් රජු පෙරටුව සිටියහ. එකල සුසානු ජාතකයෙහි නිර්ගුණී වූ, අසුන් කඩා කා මණි සාරණි අශ්වාරූජයන් දෙදෙනා ඔවුනොවුන් කරා පැමිණ, ඔවුනොවුන් තොලු සිඹ, ඔවුනොවුන් ගේ තොලු ලෙව් ලෙව, අතිවිශ්වාසයෙන් සිටගත්තා සේ මොහු දෙදෙන ම සමාන ධාතුකයන් හෙයින් ඔවුනොවුන් කෙරෙහි අති ප්‍රසන්න වූහ.

එ දවස් පටන් පහන් වූ රජ දෙව්දත් මහතෙරුන්ට අලඩකාන වූ වෙහෙරක් කරවා එහි ලා මධ්‍යම පුරුෂයන් දසදෙනකුට එකී එකී වස්තක් සෑහෙන නියායෙන් පන්සියක් බත්වලුන් දවස් පතා නබා දුන්හ. මහපිරිස් ගෙණ පන්සියක් රථ නැගී දවස තුන් වාරයක් වෙහෙරට අවුදින් දෙව්දත් මහතෙරුන් හා සාකච්ඡා කොට යන්නාහ. දෙව්දත් මහතෙරුන්ට රජහුගෙන් දෙන්නාවූ රාජභෝජනය ම පන්දහසක් සත්ත්වයෝ සුව යේ අනුභව කරන් නාහු ම ය. පන්සියයක් මහණුන් ද ඇති කළහ. එසේ හෙයින් එ තැන් පටන් ලාභයෙන් යශයෙන් අග්‍ර වූහ. මෝහට පැමිණීනා වූ ඒ සත්කාරය සත්පුරුෂ වූ මහණ කෙනකුන් කරා පැමිණියේ වී නම් ශාසනාම්බරයෙහි පුන්සඳ සේ ප්‍රසිද්ධ ව යා හැකි ම ය. මෝහට පැමිණියාවූ ලාභය හා යශස ම ඔහට ම අනර්ථ මූලික වී ය. වදාළේ මැනෝ:

ඵලං වෙ කදලිං හන්ති - ඵලං වෙළුං ඵලං නළං,
සක්කාරො කාපුරිසං හන්ති - ගබ්භො අස්සතරිං යථා-යි.

මෙසේ තමහට නො තරම් වූ ලාභය ලදින් අභිමානයක් උප දවා "බුදුහුත් රජණහ, මමත් රජිමි, මේ සා සත්කාරයක් ලත් කල බුදුන්ට මා අඩු කිම් දැ"යි අභිමාන චිත්තයක් ඉපැදවූහ. රජහු ගෙන් ලද ඓශ්වර්‍යය රජහුට අපක්ෂපාතකම් කළ කල පහව ගියා වූ ශ්‍රීකාන්තාව සේ, ඇඟීන් පහවූ දේවතාවක්හු සේ, ඔහු බුදුන් ගෙන් ලද ධ්‍යානය ද ඔහු කෙරෙන් පහ වී ය. එ වේලෙහි ඒ කාර ණය දත් කකුධ නම් මහෙශාක්‍ය වූ දිව්‍යරාජයාණෝ කොසඹෑ නුවර ගොස් තමන්ට කුලුපග වූ මුගලන් මහතෙරුන් මහන්සේට

දෙව්දත්හු සිතූ විතර්කයක් ධ්‍යානයෙන් පිරිහුණු නියාවත් කීහ. මුගලන් මහ තෙරුන් වහන්සේ එපවත් අසා ගොස් බුදුන්ට සැල කළ සේක. ස්වාමීදරුවෝ ඔවුන් කෙරෙහි උපන් මහත් වූ කරුණා ඇති ව:—

මහා වරාහස්ස මහිං විකුබ්බතො
භිසං ඝසානස්ස නදීසු ජග්ගතො,
භිඞ්කොව පඞ්කං අභිභක්ඛයිත්වා
මමානුකුබ්බං කපණො මරිස්සති-යි.

යන මේ ගාථාව වදාරා "නිර්මල වූ භිෂයන් අනුභව කරන්නාවූ හස්තිරාජයාගේ ක්‍රියාව කෙරෙමි යි, පඞ්කභිෂයන් අනුභව කොට ඉදිට තස්නාවූ හස්තිභිඞ්කයා සේ මාගේ ක්‍රියාව කෙරෙමි යි තෙ ද විනාශයට පැමිණෙන්නේ වේ දැ" යි වදාරා ස්වාමීදරුවෝ "යම්හ මහණෙනි! රජගහා නුවර" ය යි කොසඹෑ නුවරින් නික්ම ක්‍රම ක්‍රමයෙන් දනවු හැසිරරා රජගහා නුවර වෙළුවනාරාමයට වැඩි සේක.

මෙසේ බුදුන් වෙළුවනයෙහි වැඩවසන කල දෙව්දත් මහ තෙරහු තමන්ගේ පක්ෂයක් පමණ මහණුන් ගෙණ බුදුන් කරා ගොස් බුදුන් වැඳ එකත්පස්ව සිඳ මහත් වූ අහඞ්කාරයෙන් ලාභයෙන් යශසින් උමතු ව තුමූ තමන් නො හැඳින දන්මන්නාහු "ස්වාමිනි! මේ ලෝකයෙහි රජුන්ගේ යුවරජ සේනාධිපති ය යි රජුන් සුවච්ඡන්ද දී ම රාජ්‍යය විචාරනුවෝ ඇතියහ, නුඹ වහන්සේ ද සද්ධර්ම චක්‍රවර්ති බුදුරජාන කෙණකුන් වූව, එසේ හෙයින් නුඹ වහන්සේට සේනාධිපතියක්හු ඇත මනා වේ ද, එහේ හෙයින් නුඹ වහන්සේ බුද්ධරාජ්‍යශ්‍රී වුන මැනැව, මට ධර්මසේනාධිපති ධුරය දුන මැනැව, ස්වාමිනි! ශාසනය මට පාවා දුන මැනැවැ" යි කීහ.

එ වේලෙහි ස්වාමීදරුවෝ ඔහුගේ සත්කාර සිලෝකයෙන් උපන්නාවූ අභිමාන හෙපුල් අසා "මේ තෙම ක්ෂාන්ති මෛත්‍රී දයා වක් තමාගේ සන්තානයෙහි නැති ව මාර්ගඵලයකුත් නැතිව මා විසින් දුන් ධ්‍යාන පමණකුත් රඳවාගත නොහී, සක්රැවන පතන චණ්ඩාලයකු සේ සිතුමිණිරුවන ඉල්වන අපුණ්‍යයා සේ, රත්ගල් මුදුනක් පතන සෘගාලයකු සේ, තෙමේ බුදුන් මාරුයෙහි ශාසනය විචාරමි යි ස්ථානාන්තර ඉල්වයි, තෙමේ තමා නො දන්නේ ය" යි සිතා "එදමදනානයා මූබයට පැමිණී ගොචරය වල දමා ඔබ්බෙන් ගොදුරු සොයන්නා වූ අඥානයා සේ, අතට පැමිණියා වූ මස්සක් පමණක් රඳවාගත නො හී වල දමා දහසින්බඳ පියලි පතන්නා වූ

අලසයා සේ උගුරෙහි තුබූ බත් ගැලගත නො හී මූසපත්ව උගුර හඩ හඩා නැවත බත් පිඬු කොට කට තබන්නා වූ අකීලෝහිහු සේ, පැමිණියා වූ ධ්‍යානයත් නසා ගෙණ ධර්මසේනාධිපති ස්ථානාන්තර ප්‍රාර්ථිතා කෙරෙහි ද, තෝ තා හොඳක්හි ද, මාගේ සැරියුත් මුගලනුන් වැනි පරිඥායක පුත්‍රයන්ට මාගේ ස්ථානාන්තරය නො දෙනුයෙමි බෙලපිණ්ඩාපමී වූ තා වැනියකුට මාගේ ස්ථානාන්තරය දෙම් ද, හස්තිරාජයක්හු අදිනා වූ ඝනට භාරය මට්ටුවෙක් හැද ලිය හේ ද"යි වදාළ සේක.

එ වේලෙහි දෙව්දත් බුද්ධ කෝපජනිත් වෙවුලා ප්‍රතිවචනයක් කියාගත නොහී "බුදුහු බැහැරින් අවුත් තමන් කෙරේ මහණ වූ බමුණන් පවා ගරු කොට සිතති. තමන් හා සම රජකුලෙහි උපන් මා බෙලපිණ්ඩාපමිකයෙක් අඩුකොට සිතූහ" යි එ දවස් බුදුන් කෙරෙහි පළමු වන ආඝාතය බැඳ තමන්ගේ වෙහෙරට ගියහ

එ කල එක් දවසක් දෙව්දත් මහ තෙරහු අජාසත් කුමාරයන් තනි කොට මන්ත්‍රණයක් කරන්නාහු "අජාසත් කුමාරය! පෙර මනුෂ්‍යයන්ගේ ආයු බොහෝ ය, දැන් මිනිසුන්ගේ ආයු මඳය, දැන් තෝ සොළොස් හැවිරිදියෙහි ය, මතු කවර කල රජය ලබන බවත් නියම් නැත. මම තට උපදෙසක් කියමි. මා කීවා කරතොත් තා පියා මරා රජය ගණුව, මම බුදුන් මරා බුදුරජය ගණිමි. එකල අපි දෙදෙනම සිත් සේ සුව විඳුම්හ"යි කො එක් සේ මන්ත්‍රණය කොට පියරජහු මරන්ට ගිවිස්වා පී ය.

එ කල අජාසත් රජ සතුටුව 'අපගේ මහතෙරහු මහානුභාව ඇතියහ. මහ නුවණ ඇතියහ. ඔවුන් නො දන්නා දෙයෙක් නම් නැත. මිට කීයේ මැබෙක් ම ය" යි ගිවිස තමා කලවයෙහි කොට්ය බැඳගෙණ දෙවන දහවල් රජගෙට ගොස් වැද වෙවුල වෙවුලා බලා සිටියේය. එ වේලෙහි අමාත්‍යයෝ ඔහු අල්වා ගෙණ පය තිබූ කොට්ය දැක "අප රජහු මරන්සට ම ආය" යි සැබවින් දැන "මොහුත් දෙව්දත්තයාත් ඔහුගේ මහණුනුත් මරම්හ" යි ඔවුනොවුන් අතුරෙහි මන්ත්‍රණය කොට "රජ්ජුරුවන්ට නො කියා නොමරම්හ" යි රජ්ජුරුවන්ට මෙ පවත් සැල කළහ. රජ මේ පවත් අසා "පුතු මරම්හ" යි මන්ත්‍රණය කළ අමාත්‍යයන්ට උරණ ම නො මරම්හ යි මන්ත්‍රණය කළ අමාත්‍යයන්ට ප්‍රසාද දී ලඟට කැඳවාගෙණ "පුතණ්ඩ! කුමක් නිසා මා මරම්හි සිතූ ද"යි විචාළහ. කුමාරයා "රාජ්‍ය ලොභයෙනැ" යි කී ය. තොප රාජ්‍යයෙහි ලොභී කල තොපගේ රජය නෙපිම ගණුව, පුතණ්ඩ, මට කුමට ද්‍රෝහ සිතූ ද" යි කියා කුමරු සිඹ සතසා රාජ්‍යය හැම පාවා දුන්හ.

එ කල රජකුර රජගහා නුවර හැම රාජ්‍යය ලදින් සතුටු ව දෙවදත්තයා කැඳවා "ස්වාමිනි! නුඹ කී උපදෙස් කොට පිය රජහු මරණ නුනු බව මුත් රාජ්‍යය ලදිමි, මාගේ මනොරථය සිද්ධ වී ය"යි කීය. දෙව්දත් එ බසට කො සතුටු ව "තා ලත් රාජ්‍යය මීයක් තුළෙල් ලා ඇද සැදූ බෙරයක් ලද්දා වැන්න. රජුන්ගේ මායම් තා දන්නි ද, සතුරන්ට ප්‍රසාද දී සතුටු කරවා නයක ලෙස නොදන්නි ද, කිසි දවසෙකින් තාගේ නිහරසර බලා තා මරවා රාජ්‍යය ගන්නි, සැක නොකර" යී කී ය. එ කල රජ කුමර හයින් වෙලා "මැලි ස්වාමිනි! කුමක් කෙරෙම් දැ"යි කීය. දෙව්දත් "හො ලබා තා පියා මරා පියව" යි කීය. අජාසත් කුමර කියනුයේ "ආඥායෙන් මපියානන් වහන්සේ මැරිය නො හැක්ක. කෙසේ මරම් දැ" යි කීය, දෙව්දත් "බත් වැද්ද නො දී මරමා පියව" යි කී ය.

එ කල අජාසත් කුමර පියරජ්ජුරුවන් සිරගෙයි ලා "ම මැනියන් වහන්සේ මුත් අනික් කිසි කෙනෙකුත් ඇතුළව වැද්ද නො දෙව" යි රකවල් ලැවී ය. එදා පටන් බිසෝවු රන්තැටියෙන් බත් හින කබාගෙන සිරගෙට වැද රජ්ජුරුවන් කවා එති. රජ්ජුරුවෝ එබත් කා ජීවත් වෙති. සත් අව දවසක් ගිය කල අජාසත් කුමර 'මපියානන් වහන්සේ කෙසේ රකෙන සේක් දැ" යි විචාරා මෙ කාරණ අසා "අද පටන්ම මැනියන් වහන්සේ හිතින් කිසි දෙයක් ගෙණ සිරගෙය ඇතුළට යා නො දෙව" යි රකවල් ලැවී ය. එදා පටන් බිසෝවු හිතින් බත් ගෙණයා නො හැක්කෙන් රන්තැටියෙන් බත් මුහුලස යට සඟවා තබා ගෙණ ඇතුළට වදිති. එ බත් අනුභව කොට සත් අව දවසක් රජහු ජීවත් වූ කල අජාසත් කුමර මෙ පවත් අසා "ම මැනියන් වහන්සේ හිස කේ බැද ගෙණ ඇතුළට වැද්ද නො දෙව" යි රකවල් ලැවී ය. එදා පටන් බිසෝවු ඉසකෙස් යටින් බත් ගෙණයා නොදෙන හෙයින් රන්මරවැඩි යට අග බෝජුන් පුරාලා තියනින් වසාලා පයින් බත් ගෙණ සිරගෙට වැද සමණන් කවා එති. එබත් කා සත් අව දවසක් රජ්ජුරුවන් ජීවත් වූ කල අජාසත් කුමර එ පවත් අසා "මැනියන් වහන්සේ මරවැඩි ලාගෙණ සිරගෙට යා නො දෙව" යි රකවල් ලැවී ය. එ ද පටන් බිසෝවූ අනික් උපදෙසක් නො දැක සුවඳ පැනින් නා සවඳී, ඔහුයෙහි චතු මධුර ගල්වාගෙණ උතුරු සළුවෙන් ඇඟ වසා ඇතුළට වදිති. රජ්ජුරුවෝ බිසෝවුන් ඇඟ ලෙව කොට ජීවත් වෙති. මෙසේ සත් අව දවසක් ගිය කල අජ[illegible]ත් කුමර මේ පවත් අසා "ම මැනියන් වහන්සේ මෙතැ[illegible]න් ප[illegible]තුළට යා නො දෙව" යි

නියෝග කෙළේය. එදවස් බිසොවුන් දොරකඩ රකවල්හු රැඳ වූහ එවේලෙහි බිසොවු මහත් වූ ශොකයෙන් නැවී දොරමුල සිට ' සවාමිනි! බිම්සර රජ්ජුරුවෙනි, ඔහු බාල කල ම (මරා පිය තුදුන් නව, තොප සතුරා තොපි ම වැඩුව. අද මේ තුඹ ා මා ගේ හිමාම් දුක්ම ය, අද පටන් තුඹ දුක්මක් නො ලැබෙමි. සත්‍රීන් ගේ නම් වරද බෙහෙව. මා කළ වරදෙක් ඇත් නම් ක්‍ෂමා කළ මැනැවැ'' යි කිය කියා සමණන් වැඳ ක්‍ෂමා කරවාගෙණ හඬ හඬා නැවත ගියහ. එ දා පටන් රජ්ජුරුවන්ම නිරාහාරය.

සෝවාන් රජ්ජුරුවෝ මාගීඵල සුවයෙන් සක්මන් කොට ජීවත් වෙති. රජ්ජුරුවන්ගේ ශරීරප්‍රභාව අඩුවෙක් නැත. මෙසේ කීප දවසක් ගිය කල "ම පියානෝ කෙසේ ජීවත් වෙත් දැ"යි විචාරා "සක්මනින් යැපෙන සේක. ශරීරයෙහි අඩුවෙක් නැතැ'' යි අසා "මපියානන් අද පටන් සක්මන් නොකළ දෙව. දෙපතුල් කර සෙන් සැත් හෙව ඇඹුල් ලුණු තෙල් ගල්වා ගිනි අඟුරව පැ විටි විටි යන අනුකරණ මන තුරු පැසව''යි නියෝග කොට කරනැවැ මියන් ගැවීය.

පිය රජ්ජුරුවෝ නම්හ් කරා එන කරයෑවැමිය සත් දැක "මපුත තුවෝ කිසි කෙණකුන්ගේ අවවාද ලදින් සත්හිදුනාහු වන්හ. මොහු අද මා දුළීරවුලු හපා අත්දමි තබත්ට එත්වාහු වනැ'' යි සිතුවාහු ය. ඔහු ගොස් රජ්ජුරුවන් වැඳලා සිටියහ. රජ්ජුරුවෝ "දරුවෙනි! කුමකට අවුතැ'' යි විචාළහ. පුතනුවන් මහත්සේ කියා එවූ වධක පවත් කීහ. රජ්ජුරුවෝ එ පවත් අසා කෝපයක් නො කොට "තොපගේ රජහු කීවා කරව'' යි අස්නහි හිඳ පතුල් දිගු කළහ. ඇමැත්තෝ රජ්ජුරුවන් වැඳ සිට "සවාමීනි! අපගේ වරද නැත. රජහුගේ නියෝගයෙන් කරමහ. අපට ක්‍ෂමා කළ මැනව. තුඹ වහන්සේ වැනි ධර්මිෂ්ඨ වූ රජක්හට මෙ මේ තරමෙක් නො වෙ'' යි කිය කියා හඬ හඬා වමතින් ගොප්මස අල්වා ගෙණ දකුණතින් කරය ගෙණ රජුගේ දෙපතුල් පලා ලුණු ඇඹුල් තෙල් හල්වා කිහිරඟුරට පැ විටි විටි යන අනුකරණය දක්වා පැසවූවාහුය.

මෙසේ ධර්මිෂ්ඨ සෝවාන් රජ්ජුරුවෝ, මෙසේ වූ ව්‍යසනයක් කෙසේ පමෙකින් ලද්දාහු ද? යත්! පූර්ව ජාතියෙහි දඟබ් මලුයෙහි කරුණක් නැති ව වහන් පය ගා ගෙණ ගියා වූ එක් පවෙක. තමද එක් ජාතියෙක සබඝයා මැඩුහුන් සමිකඩක් නො දැන මැඩ පියා ක්‍ෂමා කරවා නොගත් එක් … වකැයි … අකුසල් දෙක මේ ජාති … සිකය … ගෙති විපාක දිනැ යි ද…

පය පැසවන වේලෙහි රජ්ජුරුවන්ට මහත් වූ වේදනා විය. "අහෝ බුද්ධෝ අහෝ ධම්මෝ - අහෝ සඞ්ඝෝ" යි කියා කියා දතුරඹු යෙහි පුදා ලූ මල්දමක් මලා ගියා සේ රජ්ජුරුවෝ පය පැසවන වේදනායෙන් මිය චාතුර්මහාරජික නම් දිව්‍යලෝකයෙහි ජනවසභ නම් දිව්‍යරාජ ව ඉපැද ගියහ. මේ ජාතියට පූර්වභාගයෙහි එක් ජාතියෙක එම දිව්‍යලෝකයෙහි මහත් වූ දිව්‍යසුව වූහ. එයින් අවුදින් පිට පිට මෙසේ සවාරයෙක දඹදිව රජ කළහ. දැන් මේ සත්වයා මාර්ගයෙහි එම දිව්‍යපුරයෙහි ඉපැද අද දක්වා සුව විඳිති.

මෙසේ පියරජහු මළ දා ම අජාසත් රජහුගේ පුතෙක් උපන. පුතනුවන් උපන් නියාව ද, පියානන් මළ නියාව ද යි පත් අසුන් දෙන එක විට ම ගෙණ ගොස් අමාත්‍යයෝ "පළමු කොට ප්‍රිය හසුන් කියමහ" යි පුතනුවන් උපන් අසුන් පත රජු අත තුබූහ. එ කෙණෙහිම පුත්‍රප්‍රේමයෙන් රජුගේ සර්වාඞ්ගය පිරී ඇට මිදුලු හසා සිට ගෙණ ලෝමනඹී ගත. එ කෙණෙහි පියානන්ගේ ගුණ සිහි කොට "මා උපන් වේලෙහිත් මපියානන් වහන්සේට ද මෙසේ ම සතා උපන්නේය ම ය, කොල! වහා ගොස් මපියානන් වහන්සේ සිරගෙන් හැර පියමයි කීහ. එකල අමාත්‍යයෝ රජහු මළ පවත් ලී අසුන්පත අතට දී පැහ. පත බලා පියා පියරජහු මළ සේ දැන උපන් මහත් ශොකයෙන් මෑනියන් වසන රජගෙට ගොස් හඬා වැලප "මෑණියන් වහන්ස! මා උපන් දා ත් මපියානන් වහන්සේට දරූ සතා මෙසේ ම උපන්නේ වේදැ"යි කීය.

මෑනියෝ ද එ වේලෙහි හඬා වැලප "පව් කළ පුත! කුමක් කියයි ද?, තොප බාල කල ඇඟිලි අග පොළෙක් නැංග, එ කල තොප හඬා නො නැලැවෙන හෙයින් පිඹා ගෙණ ගොස් අධිකරණ මධ්‍යයෙහි අමාත්‍යයන් පිරිවරා සිංහාසනයෙහි උන් තොප පියානන් ඔරව වැඩූහ. එ කල තොප පියරජ්ජුරුවෝ තොප හඬන සේ දැන එ පොළ ඇති ඇඟිල්ල තමන් කට ලා ගත්හ. එ වේලෙහි පොළ මුඛයට සිල් විය. එ වේලෙහි තොප පියානෝ තොප කෙරෙහි කළ ප්‍රේමයෙන් ලේ මුසු වූ තොප ඇඟිල්ලෙහි ඒ සැරව දමා නො පියා ගැලපුවාහු වේ දැ" යි කියා "තොප පියානන් තොප කෙරෙහි ඇති ප්‍රේම මෙසේ වේ දැ" යි කීවා හු ය. එ කල අජාසත් රජ හඬා වැලප ගොස් පියරජහු දවා අලු හස් කැරවී ය.

දෙව්දත් මෙසේ බිම්සර රජහු මරවා "බුදුන්ගේ අග්‍ර උපාසකවූ රජහු පිපි දැක ගණිමි. එතෙකින් බුදුන් මරවා මම්ද බුදුරජය ගණිමි" යි දවසෙක අජාසත් රජහු කරා ගොස් "මහරජ පියරජහු මරා තොප රජය ලත් හෙයින් තොපගේ මනොරථය සිද්ධවි ය. බුදුන් මරා මාගේ ද මනොරථය සිඩකරව" යි කී ය. අජාසත් රජ 'මා විසින් කළ මනා යම් දෙයක් කෙරෙමි යි, සෑක කැතිම් වදාළ මැනවැ යි" කී ය. එ බසට දෙව්දත් කියනුයේ "සෙසු කෙණකුන් ලවා බුදුන් මරවා ගත නොහැක්ක. රැක්මවූ දුනුවායන් ලවා විද්දා මරවා පියනු කැමැත්තෙමි. තොපගෙන් දුනුමායන් මට පාවා දෙව"යි කීය. රජ්ජුරුවෝ පන්සියයක් දුනුවායන් රැස්කොට එයින් අක්ෂණ වෙධීන් එක්තිස්දෙනකු තෝරා තෙපි "දෙව්දත් මහ තෙරුන් කරා පලා ගොස් උන් කිවක් කරම්" යි යැවීය. දෙව්දත් ඔවුන් දැක සතුටුව ඔවුන් අතුරෙන් ජ්‍යෙෂ්ඨ වූ දුනුවායා තනිකොට ගෙණ "මා කියන රහස කිසිවක්හට නො කියව. මට කීකරු වව. අජාසත් රජහු රාජ්‍යය ලත් තිශාව දුටුයෙහි වේ ද, නොයි දූ මා කීවක් කෙළෙහි නම් තාන් ඉසුරුමත් කරමාලමි" යි කීය. "නුඹ කී යම් ම දෙයක් කෙරෙමියි වදාළ මැනැවැ" යි ඔහු විසින් කී කල "බුදුහු ගිජ්ඣකූට පර්වතයෙහි අසුවල් තැන සක්මන් කෙරෙති තොප එතෙනට පලාගොස් බුදුන් විද මරා පියා අසුවල් මඟින් නාවත් නො පෙණී පලා වරැ" යි ඔහු පලමුව යවා දුනුවායන් දෙදෙනකු "අසවල් මඟින් එන දුනුවායා තෙපි දෙදෙන මරාපියවයි" උගන්වා යවා උන් දෙදෙනා මරණ සේ සතරදෙනකු යවා, උන් සතර දෙනා මරණ සේ අටදෙනකු යවා, උන් අටදෙනා මරණ සේ සොළොස් දෙනකු යවා, උන් සොළොස් දෙනා අා කල පසුව මම් ම නිහඬ දන්නෙම් වේ දැ" යි සිතා මොස් තමා කළ සොරකම කිසිවක්හු නණට නොගිය මැනව යි සිතා බුදුන් මරණ සේත් දුනුමායන් එක් තිස් දෙනා මරණ සේත් එක කවයුත්තක් දෙදෙනකු නොදන්නා නියායෙන් සංවිධාන ෟකාවලිය.

එ දවස් මාගේ ස්වාමිදරුවෝ අරුණොද්ගමන වේලෙහි මහා කරුණා සමාපත්තීන් පැන නැගී මුළුලොව බලා වදාරණ සේක් එ දවස් දුනුවායන් එක්තිස්දෙනා තමන් වහන්සේගේ නුවණ දැලෙහි බැඳී සංසාර නමැති පාප ලවණ සාගරයෙන් ගොඩනැගී නිවන් අමාමුහුද සිත්සේ බැස කෙළනා පින් ඇති බවු දැක තවද පෙර තමන් වහන්සේ සසර ලදරු කුමාරව පසේ බුදුන් දැක ක්‍රීඩා නිසා ඔබ ඇඟට ගල්ගසා වඩනා මිඝ අකුරු බොරලූ රැස්

කළ අකුශලය ද එ දවස් විඳුමන බවු දැක තමන් කරා එන දරුවන් පෙරමඟ බලන පෙම්බර මවක සේ පෙරමඟ බල බලා මහ කුළුණෙන් සක්මන් කරණ සේක.

ඉක්බිත්තෙන් පළමු ව එවූ දූනුවායා කඩුමක් උරෙහි ලා හීය උරපිට බැඳ මැඩගගු දුන්න ගෙණ සන්නද්ධ ව දෙව්දත්හුගේ සල කුණෙන් ගොස් බුදුන් දැක විෂ පෙවූ සැරයක් ගෙණ උරපුරා හයා ගත. එ කෙණෙහි උන් වකත්සේ සසර මුව ව උපන් කල පමා විදිම් යි දුනු හයා ගත් රජුන් පමා රූප ශ්‍රීන් දැක සැරය මුදපිය නො හී චිත්‍රකාර රූප සේ සිටිනා කල, දුන් ලොවුතුරා බුදු ව තුන්ලෝ මුදුන් වූ සමයෙහි ඔහු අතින් සැරය නො හැරෙණ නියාව කිකම් පෙළහරෙකැ යි කියම ද, එසේ ද වුවත් ඔහු දකුණත යී අඟිලිය හා දුඹුදිය හැලී ගිය. වමත දුනුම්ට හා ඊ මුත්ද හැලී ගිය. ඔහු වේගයෙන් යන්ත්‍රයෙක ලා පෙළන්නා සේ සම්බාධයෙහි ඇම මූරු මූරු යන අනුකරණය ව මහත්වූ වේදනා විය.

එ වේලෙහි හීගේ සවාමිදරුවෝ මොහු සිටිනා ලෙස දැක ඔහු කෙරෙහි ද, ඔහු එවූ දෙව්දත්හු කෙරෙහි ද, ඔහුට උපස්ථායක වූ අජාසත් රජ කෙරෙහි ද, සුදෙවුන් මහරජානන් කෙරෙහි ද, රහල් තෙරුන් කෙරෙහි ද, ශුචි අශුචි භූමියෙහි සම ව පවත්නා චන්ද්‍රකාන්තිය සේ සියලු සතුන් කෙරෙහි සම ව පවත්නා මහා කරුණාවෙන් ඔහු මුහුණ බල බලා මධුර වූ නාදයෙන් "දරුව! අපට කැලි කම් කොට නො වෙහෙසී මෙසේ පලා එව" යි වදාළ සේක. එ කෙණෙහි සවාමිදරුවන් බැණනැගී බස හා සමග ඔහු අතින් දුන්න හා සමග සැරය බිම වැටී ගිය, කඩුව හා හියවුරුද වැටී ගිය තෙමේ හයින් වෙවුල වෙවුලා ගොස් බුදුන් ශ්‍රීපාද වැඳ "සවාමීනි! කරුණා මැනියනි! දුෂ්ජන වූ දෙව්දත්හුගේ බස් ගෙණ තුඹ වැනි උතුමානන් කෙණෙහුත්ට අපරාධ කෙළෙම් ගැත්තහු කළ වරද ක්ෂමා කළ මැනවැයි කිය කියා එකත් පස් ව හුන්නේ ය. එ කෙණෙහි සවාමිදරුවෝ ඔහට බණ වදරා සෝවාන් කොට දරුව, දෙව්දත්හු කී මඟ ගියානම් තොපට අනතරායෙක් පෙණෙයි! අතික් මඟෙක යව"යි ඔහට සමුදී වදාළ සේක.

ඉක්බිත්තෙන් ඔහු මරම්හ යි සිටියාවූ දෙදෙන, සිට වෙහෙසී ඔහු නො දැක "කාරණ කිම දෝ හෝ" යි පරීක්ෂා කරන්නාහු ගොස් බුදුන් දුටුහ. සතර දෙන ද, අට දෙනද, සොළොස් දෙන ද, එම ක්‍රමයෙන් ගොස් බුදුන් දැක බණ අසා සෝවාන් ව, තිදුන් ව, තුවරට නොස් එක්තිස් දෙන ම ඔවුනොවුන් හා මන්ත්‍රණය කොට

තමන් තමන්ට මරණ යෙදූ නියාමත්, බුදුන් නිසා දිවි ලත් නියාවත් දැන දෙව්දත්හට පරිභව බැණ බැණ "ගිහිගෙයි නො රඳම්හ"යි අඹු දරුවන්ට කළම්නා සංග්‍රහ කොටලා එක්තිස් දෙන ම බුදුන් කරා ගොස් බණ අසා රහත් ව එහි භික්ෂුභාවයෙන් ම පැවිදි ව එක්තිස් මහා තෙර ව, එතැන් පටන් එක්තිස්කල වාසීන්ට ශාන්ති පිණිස ම, බුදුන් විසින් ඇති කළා වූ ශ්‍රාවක මණ්ඩිසක් සේ, එක්තිස් මහීතලයට නගාලූ එක්තිස් මහා ධවජයක් සේ, දෙව්මිනිසුන් කෙරෙහි ප්‍රසිද්ධ ව බුදුන්ට උත්තම ප්‍රතිපත්තින් පූජා කළ සේක.

මෙසේ තමන් වහන්සේ විඳ මරම්හ යි ආ දූනුවායන් පවා තමන් වහන්සේ මරන්නා තබා, තමන් වහන්සේට උපද්‍රවයෙක් වේ නම්, තමන් වහන්සේට පළමු කොට අපගේ ජීවිතය දෙම්හ යි සිතන තරම් මහත් වූ ප්‍රේම උපදවා ගෙණ, ඔවුන් විසින් කරණලද ජීවිතාන්ත ප්‍රතිපත්ති පූජා ලත් හෙයිනුත්, එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වන සේක.

තව ද: දෙව්දත්හු දූනුවායන් ලවා බුදුන් මරවා ගත නොහී වැලි "අනුන් ලවා මරවන්ට බැරි බැවින් මම ම ගිය අතින් බුදුන් මරම්"යි සිතාලා දවසෙක ස්වාමිදරුවන් එම ගිජ්ඣකූට පර්වතච්ඡායාවෙහි සක්මන් කරන්නා දැක, තෙමේ පර්වත මුදුනට නැගී බුදුන් සිබාවට මහු ගල් පර්වතයක් පෙරළා පී ය. එ වේලෙහි නායක් හැලුවා සේ ඒ පර්වතය ගලින් ගල ගැසී, ගල් ලැහැල්ලක් උපුර උපුරා බුදුන් කරා දිවේ. ස්වාමිදරුවෝ දෙව්දත්හු තමන් වහන්සේ ඉසට ගල පෙරළූ බව් දැන "මේ කෙසේ: වූ අකුශලයෙක් දෝ හෝ"යි සසර බලා පෙර තමන් වහන්සේ සසර දී වෙමාතෘක භාතිකයක්හු ධනලෝභයෙන් ගිරිදුර්ගයෙකින් හෙළා පතුල් නොයා හැකි සේ තලා කළා වූ අකුශලය ද, සසර දුක් දී එ තැන්හි මූලෝච්ඡින්න වන බව් දැන මහා කරුණා සමාපත්තියට සම්වැද මිදුරු පොළොවේක ගලා හිඳු වූ වජ්‍රකීලයක් සේ නිශ්චල ව වැඩ සිටි සේක.

එකල පර්වතය දීව අවුදින් යුගාන්තවාතයෙන් දිවූ මහ පර්වතක් සේ අවුත්, ස්වාමිදරුවන්ගේ ශිරෝධාතුයෙන් පැනනැගී දිලියෙන වඩුරියන් උස කේතුමාලා නම් රශ්මිකදම්බයෙහි හැසී හැසී පවන් වේගයෙන් සැලෙන අහස් පතක් සේ, වෙවුල වෙවුලා සිටගත. එ කෙණෙහි මහ පොළොව පලා ගල්කුළු දෙකක් පැන නැගී ඒ පර්වතය පිළිගෙණ සිටගත.

මාගේ ස්වාමිදරුවන් සසර ඇවිදිනා කල පවා සත්‍රිය පර්වත මුදුනෙන් හෙළාපු දා, ගොයි පවා පිට දී ඔබව දුක් වැද්ද නො දෙන කල, පූර්ණක නම් යක්‍ෂයා සැට යොදුන් කාළගිරිපර්වතයෙන් හෙළාපු දා ඔබ මුහුණ පියුමක් සේ කීවූ කල, මණිචෝර ජාතකයෙහි ඉස කපන්නට ය යි ඔසවා ගත් පොෂරාව පෙරළී රාජාභිෂෙකයට පැමිණි කල, දූත් සමතිස් පැරුම් පුරා නිමි සමයක් වූ ව, අම්මා මහ නිමක් දුටු සමයක් වූ ව, තුන්ලෝ වාසීන් දරුකොට ගත් සමයක් වූ ව, ලොවුතුරා බුදු ව මරහු මත් බිඳපූ සමයක් වූ ව, ඔහු දමූ චක්‍රායුධය අනස්විනක් කොටපූ සමයක් වූ ව, අලවු යකු දමූ වෙස්ත්‍රායුධය පවා පාබිසි කරපූ සමයක් වූ ව, දෙතිස් අසූ ලකුණෙන් රූසිරි ලද සමයක් වූ ව, හිරි මඩලක් සේ සවණක් රසින් දිලියෙන සමයක් වූ ව, මී කන සාධුකාර දෙන සමයක් වූ ව, මහමෙර සක්කුල පමණින් අතින් වැදුම් ගත් සමයක් වූ ව, තවුතිසා භවනයට තුන් පියවරකින් වඩිනා තරම් සෘද්ධිබල ඇති සමයක් වූ ව, දශවිධ වූ ඥානබල ලද සමයක් වූ ව, තුදුස් බුද්ධකාරක ධර්මයෙන් යෙදී සැදී ගිය සමයක් වූ ව, දෙව් බඹ කැලන් කළ පූජා ලද සමයක් වූ ව, සදෙව්ලෝ වැසි දෙවියන් අතින් මෙහෙ ගන්නා සමයක් වූ ව, මහබඹුන් ලමා කුඩ අල්ලවාපු සමයක් වූ ව, ඔහු බුදුන් හිසට පෙරළූ ගල අහස සිටගත් නියාවත්, පොළොවින් නැඟී ගල් එ ගල පිළිගත් නියාවත්, මාගේ ස්වාමිදරුවන් නිල්වලාකුලක් සේ දිලියෙන පුන්සඳක් සේ වැඩසිටි නියාවත්, මට කවර ආශ්චර්යය කැයි කියම්ද; එ කෙණෙහි එක දෙවියෝ සාධුකාර නාද සහස්‍රයෙන් පූජා කළහ.

ඉක්බිත්තෙන් දෙව්දත් "මහණ භවත් ගෞතමයෝ ජීවිතයෙන් ගැහැටී සුණුවිසුණු ව ගියේ දෝ ය, කෑ සේ තපුර, පූ සේ තපුර, උන් සේ තපුර, සිටි සේ තපුර යනාදීන් බහෙහි බහෙහි දෙස් දී ඇවිදිනා ගමන්හි රිය ගිය දෝ යි, අප වැනියන්ට පවා අගසවු තනතුරු නො දී බැහැරින් ආ බමුණන්ට තනතුරු දීමට රිසි පැලෑ දෝ යි, අද මාගේ මනදොළ සිද්ධ වී ය"යි සතුටු සතුටු ව බලනුයේ තමන් පෙරළූ ගල බුදුන්ට ලගාවිය නුහුනු නියාවත්, ගින්නෙහි ලූ ය පාලමක් සිසාරා නැඟෙන වග්නිජාලා සේ ගල සිසාරා බුදුරස්කඳු නැඟෙන නියාවත්, ගල ද බුදුරශ්මි රත්වන් ව දිලියෙන් නියාවත් සිතුමිණිරුවනක් සේ දිලියෙන බුදුරුවන් දුක උපන් මහා ශෝකයෙන් සුසුම් ලලා තමාගේ වෙහෙරට ම පලා ගියේ ය.

මෙසේ තමන් වහන්සේ සිරසට පෙරළෑ සිත් පින් නැති ගලින් පවා සේසත් පූජා ලත් හෙයිනුත්, එසේ වූ අචේතනික වස්තූන්හු දු, පවා පූජා ලබන තරම් පින්බල ඇති හෙයිනු දු පූජා ලබන තරම් සෘද්ධිබල ඇති හෙයිනු දු මාගේ බුදුහු අර්හත් නම් වන සේක.

තව ද: දෙව්දත් "බුදුන් කොයේ පිටි දකිම් දෝ හෝ"යි උත් සාහ කරණුයේ අතික් උපදෙසක් දැක, එ දවස් අජාසත් රජහු කරු පලා ගොස් නිකට අත් තබා ශෝකාතුර ව සුසුම් ලලා මුහුණ බුමාගෙණ සිටියේ ය. මේ කාරණ දුටු රජහු විසින් "ස්වාමිනි! තුඹට කුමන ශෝකයෙක් දැ" යි විචාළහ. දෙව්දත් කියනුයේ "මහරජ! තොප සිත ඇත්ත සැදින. අප සිත් මඳ හෙයින් අප සිත ඇත්ත නො සැදෙයි. තොප ඇසක් නැත්තා හා සම්වුව. බුදුන් මරවාපිය නො හෙන කල තොපගෙන් අපට කම් කිම් දැ"යි කී ය. එ බසට "තුඹ කළ කළ දෙයින් බුදුත්ව වැඩ වන බවක් මුත් අවැඩක් වන්නා නැත. තවත් කිමෙක් කෙරෙමි"යි කී කල්හි "යහපත උපදෙසෙක් ඇතැ"යි කිය. එ බසට රජ්ජුරුවෝ කියාසි "වහන්ස! තුඹගේ උපදෙසෙහි කෙළවරක් නැත. තවත් බුදුන්ගේ ම පින් මහිමයක් දක්වා පියන උපදෙසෙක් දැ"යි කීහ.

දෙව්දත් "මීට වඩා උපදෙසෙක් නැත. තොපගේ නාලාගිරි නම් මහැත් චණ්ඩ ය. පරුෂ ය. කාරණාකාරණ නො දන්නී. බුදුන්ගේ රූ විභාගය නො දන්නී. දහම්හි රස නො දන්නී. තිරිසනු හෙයින් බුදුහු ඔහු තිවන් දක්වාගත නො හෙති. ඔහු මට පාවා දුනු නම් බුදුන් මරවා ගණිමි"යි කී ය. රජහු යහපතැ යි ගිවිස ඇත් ගොව්වන් තමහට පවා දුන් කල්හි එම විට ම ජ්‍යෙෂ්ඨ ඇතරුවා අත අල්ලාගෙණ රජගෙන් පිටත් ව "තෝ මා සිතුවා සැදූ දීලි නම් අප රජහුගේ සේසත හැර තා කැමැති සැපතක් ඉල්වා දීලමි"යි කීය. "තුඹ කී යම් ම දෙයක් කෙරෙමි යි වදාළ මැනැව"යි ඔහු කී කල "එසේ වී නම්, මට සිත ඇත්තෙහි නම්, බුදුන් සෙට සිඟා වීථියට එන වේලාවට තාගේ නාලාගිරි නම් මහැතු මෙ නෙක් දවස් පොවන රා අට කළයට දිපුණු කොට සොළොස් කළයක් රා පොවා, ඇත්කොහොලින් ඇන කෝප උපදවා බුදුන් ඉදිරියට මෙහෙයා බුදුන් මරවාලය"යි කී ය. එ බසට ඇතරුවා හා පන්සියක් ඇත්ගොව්වෝ යහපතැ යි ගිවිස "සෙට අපගේ බල බැලුව මැනැවැ"යි වාසි කීහ.

ඒ බසට දෙව්දත් සම්භාර ව ඔවුන්ම අත්ලස් දී මෙසේ සංවිධාන කොට ගියේ ය. මේ බස් ක්‍රමක්‍රමයෙන් මුළු නුවර පැතිර ගියේ ය. මනුෂ්‍යයන් අතින් භූමිස්ථ දෙවියන් කරා ගියේ ය. ඔවුන් කෙරෙන් ආකාශස්ථ දෙවියන් කරා ගියේ ය. ඔවුන් කෙරෙන් වරම රජදරුවන් කරා ගියේ ය. මෙම ක්‍රමයෙන් සදෙව්ලෝ වැසි දෙවියෝ ඇසූහ. පසළොස් බඹලොව බ්‍රහ්මයෝ ඇසූහ. මෙසේ තුන්ලෝ වැසි දෙවියෝ දෙවදතුහු සෙට කරණ සොරකම් අද ම අසා "අප බුදුන්ගේ සෙට මහත් වූ බුද්ධ ශ්‍රී විභූති යක් පහළ වෙයි. මනෝහරවූ දෙශනාවකු දු වෙයි" යනාදින් කිය කිය, උක්සමයට පමණ ගත්හ. ඉක්බිත්තෙන් සැදැහැ ඇතියෝ පස්වරු, බුදුන් කරා ගොස් වැද "ස්වාමිනි! දෙව්දත්හුගේ ප්‍රයෝග යෙන් සෙට නුඹ වහන්සේ සිඟා රාජවීථියට බට කල නාලාගිරි නම් ඇතු නුඹ කරා මෙහෙයෙති යි යන බසෙක් සැල විය. ගැත්තවුන්ට අනුග්‍රහ කොට සිඟා නො වැඩිය මැනව. වෙහෙරට ම දන් බාම්හ"යි ආරාධනා කළහ.

ඒ වේලෙහි ස්වාමිදරුවෝ "සෙට බොහෝ දෙනාට වැඩෙක් වන වනැ යි, බුදුන්ගේ මහත්වූ ආනුභාවයෙක් බොහෝ දෙනා දක්නා වනැ යි, පෙර මා සසර හස්ත්‍යාචාරී ව පසේ බුදුන් දක කෙළි නිසා ඔවුන් කරා ඇතු මෙහෙයා භය ගන්වා කළා වූ ක්‍රීඩා පාපය ද සෙට විපාක දී නිමක දවසෙක් වනැ"යි සිතා වදරා "ඊට නිහඬ අපි දන්කමෝ මේ දූ"යි වදරා "තෙපි යව"යි උපාසකවරුන් යවා තමන් වහන්සේගේ පසුව මහා බුද්ධකෘත්‍යයෙන් ඒ දිනය අතික්‍රාන්ත කොට උදය කළ මනා සියලු බුද්ධකෘත්‍යය සම්පාදනය කොට ගන්ධකුටියෙන් ප්‍රවිෂ්ට ව රත්මෙරක් සඳවලාගබෙකින් වසන්නා සේ තමන් වහන්සේගේ අසාධාරණ පාංශුකූල චීවරය ධරා පාත්‍ර ධාතුව ශ්‍රීහස්තයෙන් ගෙණ, මහ මේගබින් නිකුත් පුන් සඳුගේ ලීලාවට අපහාස කෙරෙමින් ගන්ධකුටියෙන් බාහ්‍ය ව ගඳකිළි පිරිවෙන්හි වැඩ සිට, අනඳ මහ තෙරුන් වහන්සේ කැඳවා "ආනන්දය, මේ මාගේ මෙ වෙළුවනාරාමය පිරිවරා සිටි අටළොස් මහ වෙහෙර සඟුන් රැස්කරවා අද ශ්‍රාවකයන් හා සමග සිඟා යෙමි"යි වදාළ සේක. ඒ කෙණෙහි අනඳ මහ තෙරුන්වහන්සේ බුදුන් වදාළ තෙපුල් මුදුනෙන් පිළිගෙණ අටළොස් මහා විහාරයට ගොස් මේ පවත් ශ්‍රාවක ගණනට සැලකළ සේක.

ඒ කෙණෙහි පන්සියක් පන්සියක් සඟපිරිස් පිරිවරා අසූ මහ සව්වන් වහන්සේ ම අවුදින් රන්මෙරක් වටා සිටගත් හිරි මඹුලු අසුවක් සේ පඳ මඹුලු අසුවක්සේ බුදුන් පිරිවරා සිටගෙණ "ස්වාමිනී

ස්වාමිදරුවන්ගෙන් අදහසක් ලදුමෝ නම් අද මේ හසති දමිනය අපි කරම්හ, අපි කරම්හ, නන්දෝපනන්ද දමනයෙහි මුගලන් මහ තෙරුන් නුඹ බල පෑවා සේ ම අපි අපි දු අද නුඹගේ බල දක්වා ඒ හයතිනු දමා පෙළහර දක්වම්හ"යි මෙසේ අසූ මහ සව්වන් වහන්සේ ම වෙන වෙන ම වාසි කියා බුදුන් අතින් අවසර ඉල්වූ සේක. ස්වාමිදරුවෝ සිංහ මුලක් බලන සිංහරාජයකු සේ ශ්‍රාවකයන් මුහුණ බලා "මහණෙනි! අද බොහෝ බුද්ධ වෛනෙය්‍යයන්ගේ මගුල් දිනයෙක. එසේ හෙයින් කෙපි තොපි මා හා කැටි ව එව, ප්‍රාතිහාර්ය්‍ය පිළිමන් වේ දැ"යි වදාළ සේක.

එ කෙණෙහි නුවර වැසියෝ දෙගොඩයක් ව බෙදී මිථ්‍යාදෘෂ්ටි කතුවෝ "අද මහණ හමක් ගෞතමයන්ට මිශිරි නළුා කියා බදු ගන්නට මිනිසෙක් නො වේ දෝ ය, රා මඳ කැඟී ඈතෙක් දෝ ය, ඌට දහමින් කම් නැද්දෝ ය, ලන්ගේ ශූරෑකම් අද බලම්හ, දන් දක් පඊනයකට හසු වූ මැසිපිලාමකු සේ ඈත් පයින් මිරිකා දමයි. දළින් ඇන අහසට දමා අනුන් දූම්මට පිඹී පලවයි. රද අපගේ සතුරා සිටි දක්නා මගුල් දවසෙකැ"යි කිය කියා කුල්මත් වූහ. සම්‍යක් දෘෂ්ටි ගතුවෝ බුදු බල දන්නා හෙයින් "අපගේ ස්වාමිදරුවන්ට ඇතෙක් නම් කුමක් කොරේ ද, ඔබ තොළුදනයක් ඇතුන්ට බල ඇති වුව. මිරහුගේ ගිරිමේඛලා නම් මහැතු පවා දන කිම් අන්වා ලුහුබඳවා පුව. අද අපගේ බුදුන්ගේ මගුල් පෙළහර දිනයෙකැ" යි කිය කියා උත්සවයට පමණ ගත්හ.

එ කෙණෙහි ම එ නුවර සියලු සත්ත්වයෝ වැසි ගිගුම් ගත් මහ මුහුද සේ කැලඹී සිට, මැසි බැඳ නැගී එ සේත් බිම් මඳ හෙයින්, පවුරු අට්ටාල සඳලු මහරුක් ගේපලවල නැගී පොළ පොළ ව උනුන් සන යනා ගැහැටි ගැහැටි මහ වේ සිස් කොට "වතුරු දිය නැගූ කල්හි අතුරු නැති ව අතුපතුවලට නැගී පිරී හුන් කුහුඹු කැලසේ' ගේපල බිඳ නමා පියන්නා සේ ගහන ව සිටියහ. එ කෙණෙහි ආකාශයෙහි සිතියම් කළ වියනක් සේ තුන් ලෙව්හි දිව්‍ය සේනාව ද ගැහැටි ගැහැටී සිටගත්හ. ඒ සා රාජවීථියෙහි "ඇතු දුන්දක් අරිති, දුන්දක් අරිති"යි කිය කියා එක මනුෂ්‍ය කෙණ කුත් නැතිව සිස් විය. එකෙණෙහි සමහරු 'අද බුදුහු නො වඩිත් ම ය"යි කියති, සමහරු "දුන්දක් බුදුහු වඩිති"යි කියති. සමහරු බුදුන් පෙරමග බලති, සමහරු ඇතු පෙරමග බලති.

එවේලෙහි මාගේ ස්වාමිදරුවෝ කෙසරුබරසර සලාදී මනැතක් හු නරා දිව්ක කෙසර සිංහරාජයකු සේ සනලිප් දහස් පන්සිය

එකාසූවක් ප්‍රමාණ ගන්ධ සමූහයා පිරිවරා සවණක් රසින් තුන්ලෝ රැලි දෙමින්, නැගු නැගු පියෙහි පියුම් දක්වමින්, බැලූ බැලූ දෙසෙහි භාණ්ඩාගාර දෙමමින්; ශ්‍රී මුඛයෙන් නික්මුණු දසනහරසින් සියලු ජනයන් කිරිමුහුද ගල්වමින් බැණ නැගි බසින් කණ කණ අමා පුරවමින්, මහාපලඟරින් වැඩ මංසල් දොරට පැමිණ දකුණු පය ඉන්ද්‍රඛීලයෙහි තබා වදාළ සේක. එකෙණෙහි පඤ්චාඞ්ගුලි යෙන් දිවු බුදුරස් කඳු පාසක් ඇතු බඳිනව දමූ රිදීයොත් පසක් සේ දිව මුළුනුවර ව්‍යාප්ත ව සියලු සතුන්ට බුදුන් නුවරට වන් බව පහළ කෙළේ ය. ඉක්බිත්තෙන් ස්වාමිදරුවෝ තබරශ්මි ජාල යෙන් පරිශුද්ධ වූ රජවීථියට බැස මහ සඞවන් පිරිවරා ගෙපිළි වෙළින් සිඟායාකට පටන්ගත් සේක.

එ කෙණෙහි ඇත්ගොව්වෝ ඇතු සොළොස් කළයක් රා පොවා මත් කොට, නියපිව ගල් ගසා කොහොලින් ඇන කුප්වා, සක් සින්නම් බවුර බෙර ඩමර බෙර එකවිට අතෙව මහත් වූ අඝිල කොට ගිනිපිට කොල් හැමූවා සේ ඇතු ඉදවූහ. එ කෙණෙහි ඇත් කල්පාන්ත ගිනිකඳක් සේ කිපී මහහඬින් ගුගුරා එක පහරින් පා මෑසූ දම කඩා, ඇත්හල ඇන හෙළා සුණු විසුණු කරමින් යමුගු රෙන් පොළොව අපොළොන්නා සේ සොඩ බිම ගස ගසා, කඹය කඩා සොඩ හස්සෙන් හගවා ගෙණ, ගැසූ පයින් පස්කඳු කඩා පිවව දම දමා, දුටු දුටුවන් ලුහු බඳවා හපුවූවන් දළගින් ඇන දම් දමා, පවුරු කණුසම ගිතනි පදනම් ඇන දම් දමා, මහමෙණක් සේ වීථිමධ්‍යයට වැද ගියේ. අබෞද්ධයෝ ඇතු දිවන වේගය දැක සතුටු වන්නට පටන් ගත්හ. ශ්‍රද්ධාවන්තයෝ කුමකින් කුමක් වේ දෝ හෝ යි සැක සිතන්නට පටන් ගත්හ. පෘථග්ජන වහන්ද "ස්වාමීනි! මදනැගී ඇත් දිවන්නේ ය. ඒ තුඹවහන්සේ ගේ ගුණ නො දන්නි. මදක් ඇළවෙලා සිටියොත් යහපතැ"යි කියන සේක. ස්වාමි දරුවෝ සිනා පහළ කොට මුඛයෙන් නික්මුනු දසනහරසින් සියලු විථිය සදමින් ඇතු ඉදිරියට සන්හුන් ගුණෙන් වඩනාසේක් ම ය.

එ කෙණෙහි අනඳ මහ තෙරුන් වහන්සේ දීඝීකාලයෙහි තමන් වහන්සේ බුදුන් කෙරෙහි අවිනෂ්ට ව කළා වූ මහ පෙම් වතුරු රඳවා ගත නො හී දැස් පිරුණු කඳුළෙන් "මේ ඇත් මා පළමුව මරා මුත් මාගේ බුදුන් නො මරාව"යි කිය කියා ඇතුවත් බුදුන්වත් මධ්‍යයෙහි ගොසින් සිටගත් සේක. බුදුහු "ආනන්දය! ඇළ ව ඇළ ව යා, ඈතෙක් මට කුමක් කෙරේ ද, තා බොලඳ ඇගී ද, මා බල නුදුටු වීරී ද"යි වදාරණ සේක. බුදුන් එසේ

වදුරතුන් අනඳ මහ තෙරුන් වහන්සේ ඇල්ල නොවන සේක්ම ය. එ කෙණෙහි බුදුන්ගේ ආනුභාවයෙන් පොළොව කුඹල් සකක් සේ පෙරළී උන්වහන්සේ පසු කොට බුදුන් පලමු කෙළේ ය. නැවත අනඳ මහ තෙරුන් වහන්සේ බුදුන් පලමු වූ සේ දැක ඇතු ලං වන සේ දැක, ඉදිරියට දිව බුදුන් පසු කොට පියා ඇතු ඉදිරියෙහි සිටගත් සේක. එ විට ද පොළොම පෙරළී උන්වහන්සේ ම පසු කෙළේ ය. මෙසේ ම තුන් වාරයෙක්හි ම බුදුන් පසු කොට ඇතු පෙරට වූ සේක. තුන්වාරයෙහි පොළොව ම සිඟැරී උන්වහන්සේ පසු කොට බුදුන් වහන්සේ පලමු කෙළේ ය.

එ කෙණෙහි ප්‍රිය පුත්‍රයකු වඩාගෙණ "ඇත් කෙළි බලමි"යි වීථියට බට ස්ත්‍රියක් ඇතු දිවත් දිවත් ඇතු කෙරේ කල හසින් වෙවුලා මරණ සංඥාවෙන් පුත්‍රසංඥාව සිඳිකොට යා නොහී බුද්ධ පූජාවට මල්දමක් දමුවා සේ, පුතු බුදුන් හා ඇතු මැදට දමා නොමෝ කෝවියකට වැද ගියා ය. එ කෙණෙහි කුමරු අනික් ශරණක් නො දැක බුදුන් දිසාව බල බලා මහහඬින් හඬන්නට පටන් ගත. ඇත් ගිනි කඳක් සේ කිපි කිපී බුදුන් කරා දිවනුයේ කුමරහු දැක ඔහු කරා දිවී ය. එ කෙණෙහි ස්වාමිදරුවෝ මිණිරුවනකට තුඹ දිගු කරණ නාරජකු සේ කුමරහු කරා අග දිගු කරණ ඇත් රජු දැක "මා පැමිණියා වූ මේ වීථියෙහි මේ මද නැති ඇත් තිහිඹියක ගණවා මරාපී නමුත් මාගේ කවර නම් බුද්ධානුභාවයෙක් ද"යි සිතා වදුරා නමන් වහන්සේගේ කරුණා නමැති අකුස්සෙන් පැහැර ඇතු රඳවාලා "නාලාගිරිය! තා මෙ වීථියට නළුයේ තෙල කුමාරයා නිසා නො වෙයි, අප නිසා ය, ඌ කරා නො ගොස් අප වරැ"යි වදාළ සේක.

එ කෙණෙහි මාගේ ස්වාමිදරුවන්ගේ මධුරනාද නමැති හස්ති කාන්ත වීණා නාදය ඔහු කණ වැටී යාම හා සමඟ ම ඔහුගේ රුම්ද සිඳී ගියේය. එ තෙපුල් නමැති අමාහැල්ලෙන් කෝප ගිනිකඳ නිවී ගිය. එ කෙණෙහි කුමරහු හැර බුදුන් දිසාවට කර නමා බුදුන් බලනුයේ දෙතිස් අසූ ලකුණෙන් හා, සියාරා සිටි බැමමඩුල්ලෙකින් හා ආකාශයෙහි පිපී මැති ගිය තරුකැලයක් සේ පිරිවරා සිටිනා රහත් පෙළකින් හා පුන් සඳු සේ දිලියෙන ස්වාමිදරුවන්ගේ ශ්‍රී විභූතිය දැක, සඳරැස් දුටු කුමුදු කැලක් සේ සියලඟ සන්තොෂයෙන් පිණවමින් බුදුන් කරා දිව එ කෙණෙහි ම හිරි ඔතප්ලද තියාවට කාරණ පැවා සේ වාලධිය අමුඩු කස්සෙහිගන්වා ගෙණ, වන හස ගසා සොඩ හකුළ කම්ලා ශ්‍රී පාදය සොඩින් පිරි මැද මැද බුදුන් පාමුල්හි වැද හොත්තේ ය.

එ කොණෙහි පාද නඛරශ්මීන් අඳුන් කුලක් වන් ඇතු, රිදී කඳක් වැනි ව ගිය නිසාව ඔබගේ ම තුන්ලෙව්හි ව්‍යාප්ත වූ යශස කිසි තෙනෙක්හි රඳලිය නො හී නැමත ඔබ කරා ම අවුදින් ඔබ පාමුල්හි ම ශසතිරූප ව්‍යාජයෙන් පණීත වූවාක් වැන්නැ යි සිතමි. එ කොණෙහි දෙව්මිනිසුන් දුන් සාධුකාර පූජාවට තුන්ලෝ කුඩා ව ගියේය යි සිතමි. සියලු ජනයන් හත් පලන් වස්ත්‍රාභරණ දමන්ට පටන්ගත් නිසාව දෙවියන් වස්වන රුවන් වැසි වැන්නැ යි සිතමි. නාරිලතා වෙනෙහි පවන් වේගයෙන් පත් සැලෙන කලක් සේ, රන්ලිය වන් ලියෝ, රුවන් පලඳනා කඩා දමන්නට පටන් ගත්හ. දහස් ගණන් සිවුමැදිරිවල දොර හැර මුව පියුම් පිටත් කර බලන්නා වූ උත්තමාඞ්ගනාවන්ගේ තොඳ තැකුළුවන් දනන පංක්තීන් පෙණෙන නියාම බුදුන්ගේ යසරැස් කට දක්වා උතා බිපු වේලෙහි මුඛයෙන් ඉතිර ඉතිර වැගිරෙන්නාක් වැන්නැ යි සිතමි. දහස් ගණන් ශොබන ස්ත්‍රීන් උපන් සන්තොෂයෙන් උතුරු සළු දමා පයොධර භාරයෙන් ඇතු පිරිවරා සිටිනා නිසාව මල්සළුගෙලා මල් සුවඳින් පුද ගහන ව සිටිනා රන්පෝරුවින්නක් වැන්නැ යි සියාක් සිතමි.

පෙර ශ්‍රී ඇතු දුටු කල හඩ ගසා ඒ ඒ දිග්හි දිවන කුඩා කෙලි කොල්ලන් දිව අවුදින් ඇතු කෙරේ භය නැති ව අත්පුං ඇතුපිට ඔබ ඔබා ඇතු ඇඟ මැතිර සිට කෙලනා නිසාව හසති නමැති මහාජම්බුවෘක්ෂය සිසාරු පැන නැගී සුවර්ණාඞ්කුර සමූහයකැ යි කියාත් සිතමි. රිදී කුළුවල හංස පැටවුන් කෙළිනා සේ භය නැති ව දල වැළඳ ගෙණ කෙලනා බාල දරුවෝ කෙනෙක් දෙන ද; කුඹසක් පිටට නැගී අවු තපිනා නගින් දහස් ගණන් සේ ප්‍රීතීන් පිණා ඇතු පිටට කඩා දමාපු ඒ ඒ තැන්හි රැළි දී තිබෙන භූෂණාභාර කෙනෙතකැ යි කියම් ද; එ දවස් සත්ඩණන්ට උපන් සන්තොෂ හා, කරණ උත්සව හා, බුද්ධපූජා හා, ඔල්වර සන් හා, අත්පොළසන් හා, වෙන මෙන කියම් නම් මාගේ සියක් දහස් ලක්ෂ ගණන් මුඛ නැති හෙයින් එක මුඛයෙකින් කියා නිම වාගත නො හෙම් ම ය. එ නුවර අටළොස් කෙලක් මිනුෂ්‍යයන් තුන් ගව්වක් දිග ඒ එක රාජ වීථි කොටුවෙහි කෙසේ සැලසී සිටි බවත් නො දනිමි. තුන්ලෙව්හි දෙවියන් ඒ එක නගරාම්බරයෙහි කෙසේ සිටි බවත් නො දනිමි. මිථ්‍යාදෘෂ්ටි ගතුවන්ගේ මුහුණු හැඹුල් මැඩගත් දෙසිලෙලියේ හැකිළ ගියේ ය. සම්‍යක් දෘෂ්ටි ගතුවන් මුහුණු හිරි රස් දුටු මහපියුම් සේ පිපී ගිය.

එ වේලෙහි සවාමිදරුවෝ කළු මලයක්හෙත රත්පියුමක් තබන්නා සේ ඇත්කුඹ මතුයෙහි පුරණ්තවූ ශ්‍රීහස්තය තබාලා "තව ද අද්භූත වූ පෙළහරක් ලෝකවාසීන්ට දක්වා මේ තිරිසන් වූ ඇතු කථා කරවා ඔහට පන්සිල් දෙමි"යි සිතාලා සමන්වහන්සේ දැන් බුදු වූ කල තබා පෙර සසර ගොම පැණියන් ලවා අසනා රජු හා කථා කරවාපු ඔහන් වූ ආනුභාව ඇති හෙයින් "මේ ඇත් තමාගේ තිරිසන් භාෂාව හැරපියා මනුෂ්‍ය භාෂායෙන් හැම දෙනාට තේරෙණ සේ පන්සිල් ගණීව"යි අධිෂ්ඨාන කොට ලා "දරුම නාලාගිරිනි! පන්සිල් ගණුව"යි වදාළ සේක. එ කෙණෙහි නාලාගිරි ඇත් මනුෂ්‍ය භාෂායෙන් හැම පිරිසට ඇසෙන සේ "ගණිමන සවාමිනි"යි කී ය. එ බස හා සමග අටලොස් කෙළක් මනුෂ්‍යයෝ එක පැහැර ම සාධුකාර දුන්හ. දෙවනු ව "බුදුන් සරණ ගණැ"යි වදාළ සේක. ඇත් "බුදුන් සරණ ගතිම් සවාමිනි" යි කී ය. "දහම් සරණ ගණැ"යි වදාළ සේක. ඇත් "දහම් සරණ ගතිම් සවාමිනි" කී ය. "සඟුන් සරණ ගණැ"යි වදාළ සේක. ඇත් "සඟුන් සරණ ගතිම්. සවාමිනි"යි කී ය. පණිවායෙන් විරමණය කරව යි වදාළ සේක. ඇත් 'පණිවායෙන් විරමණය කෙළෙම් සවාමිනි"යි කීය. අදත්තාදත විරමණය කරව යි වදාළ සේක. ඇත් "අදත්තාදාන විරමණය කෙළෙම් සවාමිනි"යි කී ය. පරදර විරමණය කරව යි වදාළ සේක. ඇත් "පරදර විරමණය කෙළෙම් සවාමිනි"යි කී ය. මුසාවාද විරමණය කරවයි වදාළ සේක. ඇත් "මුසාවාද විරමණය කෙළෙම් සවාමිනි"යි කී ය. සුරාපාන විරමණය කරව යි වදාළ සේක. ඇත් "සුරාපාන විරමණය කෙළෙම් සවාමිනි"යි කී ය. මෙසේ ඔහු ශරණශිල-පඤ්චශීලයෙහි පිහිටුවා සවාමිදරුවෝ දෙව්මිනිසුන්ගේ තම ද ධර්මලොභ ඇති සේ දත මහ පිරිසට බණ වදරා එ කෙණෙහි සුවාසූදහසක් ප්‍රාණීන් අමාමහ නිවන් දක්වා ලෝවැඩ කොට වෙළුවනාරාමයට වැඩි සේක. නාලාගිරි ඇත් ද එ තැන් පටන් හැදූ ඇති ශික්ෂිත හුදීගකු සේ රා බින්දුවකුත් නො බී, ප්‍රාණයකුත් නො නසා, පඤ්චශීලය ශරණශීලය අඛණ්ඩ කොට ම රක්ෂා කෙළේ ය.

මෙසේ මාගේ සවාමිදරුවෝ මහත් වූ පෙළහරින් දෙව්මිනිසුන් විසින් කරණ ලද පූජා ලබන පින් බල ඇති හෙයිනුත්, නාලාගිරිහු වැනි තිරිසනුන් පවා දමා ඔවුන් විසින් දිවි පමණින් කරණ ලද ප්‍රතිපත්ති පූජා ලත් හෙයිනුත්, එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනුත්, මාගේ බුදුහු මේ මේ කාරණයෙනු දු අර්හත් නම් වන සේක.

ඉක්බිත්තෙන් සවාමිදරුවන්ගේ මේ සාධාරණ වූ පෙලහර දුටු රජ්ජු කෙරෙහි වල්ලභ වූ අමාත්‍යයෝ එ දවස් රජ්ජු කරා ගොස් බුදුන්ගේ ගුණ වර්ණනා කොට, දෙව්දත්හුගේ නුගුණ වර්ණනා කොට, "දේවයෙනි! දුර්ජන වූ දෙව්දත්හුගේ බසින් තොප බුදුන්ට අනර්ථ කරණ සේ නපුර, ඔහුගේ සම්වායෙන් පිතෘඝාතක කර්මය කොට දැන් අවීචි මහ නරකයට නියැලි සිටියව. බුදුන්ට ද අනර්ථ සිතා ජීවිත් මිඩා දව් රැස් කරව. තොපි තොප නසන සතුරකු වැසියව. දෙව්දත් තොප නසම්හි ආ සතුරකු වැනියේය. දෙව්දත් නමැති කුඩා කොල්ලා සිත් සේ තෙලනා වූ තෙපි පෙතැලි රුවක් වැනියහ. දෙව්දත් නමැති ලදරුවා අතට පැමිණි තෙපි ලාලි වමක් වැනියව. කපුටුවන්ට කොසඹ ගෙඩි අමා වූවා සේ, දෙව්දත්හුගේ ගුණ තොපට මිහිරිවූ සේ මැනැවැ" යි නො එක් ප්‍රකාරයෙන් බැණ රජහු ලජ්ජා කැරවූහ. එ කල අජාසත් රජ මහත් වූ ලජ්ජා ඇතිව දෙව්දත් හට කිපී ඔහට නමාගෙන් දවස් පතා දෙන පන්සියක් බත් වසුන් කඩවා පී ය. එතැන් පටන් දෙව්දත් ලාභයෙන් පිරිහිණ. ලාභය පිරිහුණු හෙයින් පන්සියක් පමණ්ද ඒ ඒ දිශ්හි ඔහු හැර ගියහ. එසේ හෙයින් පරිවාරයෙනු දු පිරිහිණ.

දෙව්දත් එ කල එකලා ව පසුන් සුත් ද සුසුම් ලලා නුවර සිඟා ගියේය. එ කල නුවර වැසියෝ මොහු දැක "සවත් මේ නුවර ඉඳ බත් කයි දෑ"යි කිපී ගල් ගසා පාත්‍රය බිඳ පිටතට නෙරියහ. දෙව්දත් අනික් වදනා අහක් නැතිව "එ තෙකින් බුදුන් මුත් මට අනික් රක්ෂාවෙක් නැත පොළොම පැකිළ හුනුවන්ට එම පොළොව මුත් සතික් සරණක් නැත්තාසේ, බුදුන් මුත් අනික් සරණෙක් නැතැ"යි ඉස පණු හුණු ගෘහකයකු ගස්ව ගස්වා වදනා සේ, අලජ්ජීව නැවත බුදුන් ම කරා ගොස් වාසය කරණසේ-නව ද, නමා කල කාම බොහෝ හෙයින් බුදුන්ට අසාත මී කරණුයේ 'සංඝයා හෙද කෙරෙමි"යි සිතා කොකාලිකාය, මොර තිසසය, ඛණ්ඩදෙව් පුත්‍රය, සමුද්දදත්තාය යි නමින්ගේ මන්ත්‍රිවරුන් සතරදෙනා එක් කොට ගෙණ මන්ත්‍රණය කරණුයේ "බුදුන් මරා බුදුරජය නත නොහෙන බැවින් සංඝයා හෙදකොට ගෙණ අපි හැම වෙන් ව පලා ගොස් බුදු වම්හ"යි කී ය. "තෙපි හැම මට සහාය වූ නම් තොප තොපට ද වෙන වෙනම සඵානාතර දෙමි"යි කීය. එ කල ඔහු සතර දෙන "අපි තොප කීවක් කරම්හ. අප හැරගෙණ සිත් සේ බුදු වව"යි කීහ

එ වේලෙහි දෙව්දත් "කිහම් අප ඇම් ගිය කල කාරණ නො වෙයි, බුදුන් කෙරෙහි වරදක් පිහිටුවා යම්හ. අනික් වරදක් යොදු

ගත නො හැක්ක ගලින් පැන් උකමා ගත නො හැක්කා සේ බුදුන්ගෙන් ලැබගත නො හැක්කාවූ පස්මහ වරයක් ඉල්වම්හ. එකල බුදුහු ඒ වර නො දෙති, ඒ ව්‍යාජයෙන් බුදුන් හැර යම්හ' යි මන්ත්‍රණය කොට එ දවස් බුදුන් කරා ගොස් බුදුන් වැඳ එකත් පස්ව හිඳ දෙව්දත් මහතෙර බුදුන්ට මෙසේ දන්වූහ:– "ස්වාමීනි! බුදුරජාණෙනි! මුරයෙන් මුරයෙහි ම නුඹවහන්සේ මා ඉල්වූ වරයක් ම නො දෙන සේක. සුදෙවුන් රජහට බෑනනුවෙමි. බුදුන්ගෙන් වර ලැබීමට අයෝග්‍යයෙකිම් නො වෙමි. පස්වරයක් ඉල්වා අයිමි. ඒ පස් වරය මට දී වදාළ මැනැවැ"යි කීහ.

ස්වාමිදරුවෝ ඔවුන් තබා මුළු යස්වල යන්නවුන් සිතූ සිත් තමන් වහන්සේ දන්නා හෙයින් ම ඔහු කී බස හා සමග ම ඔහු සිතූ සොරකම් දන වදරා මඳක් සිනා පහළ කොට "කියා බල හැ"යි වදාළ සේක. එ වේලෙහි දෙව්දත් මහ තෙර "ස්වාමීනි! මේ ලෝකවාසීහු රූක්ෂ වූ ප්‍රතිපත්ති පුරණ භික්ෂූන් කෙරෙහි ඉතා ප්‍රසන්නයහ. එසේ හෙයින් ලෝමැස්සන් බුදුන්ගේ ශාසනයෙහි ප්‍රසාද කරන්නාවූ වරපසක් ඉල්ලමි. කෙසේදැ? යත්; ශාසනය පවතිනා යම් කාලයක් දක්වා හැම භික්ෂූන් ම ආරණ්‍යකාඞ්ගය ම පුරා වල් වාසයෙහි ම වාසය කරන පරිද්දෙනුන්, ග්‍රාම්‍යවාසයෙහි වාසය නො කරණ පරිද්දෙනුන් ශික්ෂාපදයෙකින් මට වරයක් දී වදාළ මැනැවැ" යි කීහ.

එ වේලෙහි ස්වාමිදරුවෝ අතීතයෙහි බුදුවූ අනන්තාපරියන්තවූ බුදුනුදු නො පැණවූවා වූ ශික්ෂාපදයක් ම හෙයින් පෙම්බර මවක සේ තමන් වහන්සේගේ සියලු සංඝයා කෙරෙහි උපන් මහ කුළුණු ඇති ව 'දෙව්දත්තය! තා ඉල්ලූ වරය මිරිඟු සොයා ඇවිදිනා වූ මෘගයකු සේ බුදුන්ගෙන් නො ලබන්නාවූ වරයක්ම ය. මාගේ ශාසනය බොහෝ කලක් නො පවත්නා වූ සසුන් නමැති දිව්‍යදුමයට කෙටේරියක් බඳු වූ අවැඩ කරු වූ වරයෙක් ම ය. කාරණ කිම්? යත්; මාගේ ශාසනයෙහි දහම් අමා උකා බී උමතුව, තමන් සුබුමාල බව නොදන මහණ ව, මහණ ධම් පුරන්නාවූ රජ, බමුණු වෙළඳදී සුබුමාලයෝ පමණ නැතියහ, ඔහු මතුමාලෙන් යටිමාල නො හැඳින පියුම් සේ වැඩියාහු වල කෙසේ වැස සිත් අලවා ගණිද්ද ද. තව දු: මාගේ දහම් අමායෙහි මත් ව ඔවුන්ගේ නන වලින් තුඩුහැර මවුන් පියන් හඬව හඬවා මාගේ සසුන් වැද මහණ ව වසින්නා වූ සුබුමාල වූ කුමරුවන් හා කුමාරියෝ වල් වැද කෙසේ මිදුරු පීඩාවෙන් සිත් එකඟ කෙරෙද්ද?

තව ද: ජනසඤ්චාරයෙන් දුරුව වැසලිය නොහෙන අති ගිලන් භික්ෂූහු ජනශූන්‍යස්ථානයෙහි වැස කෙසේ දවස් යවද්ද. හස්තිකාන්ත වීණාවෙහි ප්‍රලුබ්ධවූ හස්තීන් සේ, මාගේ ශ්‍රාවකයන්ගේ ධර්මසාකච්ඡාවෙහි ඉතා ප්‍රලුබ්ධවූ අති ශ්‍රද්ධාවන්තවූ රජබිසෝවරුන් ආදී ශ්‍රීවන්ත සත්පුරුෂයෝ තමන් තමන් කැමැති විට ඔවුන් කරා ගොස් තමන් සිත් සේ පෘච්ඡා ප්‍රති පෘච්ඡාවෙන් පින් රැස් කරන්නාහු ආරණ්‍යයට ම සිතූ සිතූ විට කෙසේ නම් ගොසින් පින් රැස් කෙරෙද්ද මේ මේ කාරණයෙන් තා ඉල්ලූ පළමු වන වරය ම ලෝක ශාසන නමැති මහාශාලික්ෂේත්‍රයෙහි දරහඬ බඳනා සේ ය. වීර්‍ය ඇති කෙණෙක්, නිරෝගී ඇති කෙණෙක්, ලදරු නොවන කෙණෙක්, කැමැත්තෝ නම් ආරණ්‍යයෙහිත් වෙසෙති, අවශේෂවූ සුඛුමාල මාගේ ශ්‍රාවකයෝ ග්‍රාමාන්ත සේනාසනයෙහි ම වෙසෙති, යමෙක් ගම වේව යි, වල වේව යි, සෙල වේව යි, ගල්දූලෙක වේ වයි, මට ම පක්ෂපාතව, මම ම කීකරුව, මාගේ ශික්ෂාපදයන් පුරා, පාපයෙන් දුරු ව, මෙසෙක් නම් ඔහු මදරුවෝම ය, ඔවුන් වසන තැන් ම රමණීය භූමිය"යි වදාරණ සේක්:—

ගාමෙ වා යදි වා’රඤ්ඤෙ-නින්නෙ වා යදි වා ථලෙ,
යත්ථ අරහන්තො විහරන්ති-තං භූමිං රාමණෙය්‍යකං -යි.

වදාරා "තව ඒ වරය නො දෙමි"යි ප්‍රතික්ෂෙප කළ සේක.

එ වේලෙහි දෙවිදත් මහතෙර සිතින් සමාධිව දෙවන වරය ඉල්වන්නාහු "එ බැවින් ස්වාමීනි! ලෝකවාසීහු පිණ්ඩපාතිකාංගය පුරන්නවුන් කෙරෙහි අති ප්‍රසන්නයහ. සියලු භික්ෂූන්ට පිණ්ඩපාතිකාංගයෙහි උත්කෘෂ්ටය, පුරා දවසින් දවස සිඟා ගොස් ලද භොජනයක් අනුභව කරණ පරිද්දෙනුත්, වෙහෙරට ගෙණා ගෘහපතී භොජනයක් නො වළඳනා පරිද්දෙනුත් ශික්ෂාපදයක් පණවා වදළ මැනැවැ" යි කීහ.

එ වේලෙහිදු මාගේ ස්වාමිදරුවෝ පූර්වබුද්ධචරිත බලා අප්‍රඥප්ත වූ වරයක් බව දැන "තා ඉල් වූ ඒ වරයත් සඳට අත දිගු කළා සේ බුදුකෙණකුන්ගෙන් ලැබිය යුතු වරයෙක් නො වෙයි, මොඝ පුරුෂය! ගිලන් භික්ෂූහු දවසින් දවස කෙසේ සිඟා ඇවිද් ද. පාත්‍රය ධරාගත නො ගෙණ ඉතා ලදරු වූ හෙරණයෝ ආචාර්‍ය උපාධ්‍යාය යන් හැර බැහැර යා නොහෙන්නාහු කෙසේ භික්ෂාටනය කොට ජීවත් වෙත් ද, ආගන්තුක ගමිකාදි නො එක් දනයෙන් පින් රැස් කරන්නාවූ නො එක් කුලපුත්‍රයෝ ඒ බත් කවුරුන්ට දන් දී පින් පුරා ගණිද් ද; ඔහු කෙසේ නම් ගැළවෙද් ද, මේ මේ කාරණයෙන් ඒ වරයත් ලෝක-ශාසන නමැති රස උක් වනයට මාඤ්ජෙෂ්ඨිකා නම් වූ රෝගය සේ ශාසනය නො පවත්නා වූ වරයෙක. එයි ද තව නො දෙමි" යි වදළ සේක.

තව ද: දෙව්දත් සිතින් සමාධි ව අනික් වරයක් ඉල්වන්නාහු "ස්වාමීනි! පාංශුකූල චීවර ධාරී වූ ශ්‍රාමණයන් කෙරෙහි සත්වයෝ අතිප්‍රසන්නයහ, එසේ හෙයින් හැම භික්ෂූන් ම සොහොන් කඩින් ම සිවුර කොට වැළඳ පාංශුකූල ධරණ පරිද්දෙනුත් අවශෙෂවූ වස්ත්‍රයෙන් කළ ගෘහපති චීවරය පිළි නො ගන්නා පරිද්දෙනුත් අනුදන මැනැවැ"යි කීහ.

එ වේලෙහිදු ස්වාමිදරුවෝ පූර්ව බුද්ධවරයන් එ බඳු වූ ශික්ෂා පදයක් නො පැණ වූ බව දැන තා ඉල්වන්නාවූ වර නම් ගලින් පැන් උනවාගත නො හැක්කාසේ බුදුන්ගෙන් නො ලැබෙන්නා වූ වරයෙක. මාගේ සසුන් වත් මල ගිහියකුත් කුදුවූ විරූ කුලපුත්‍රයන්ට ගිනි දුවූකළ ප්‍රතික්කූල වෙයි, සොහොන්කඩ ද එසේම සම හරුන්ට ප්‍රතික්කූල වෙයි. ඒ නිසා සමහරුන්ට ව්‍යාධි වෙයි, එසේ කල ඔවුන්ගේ ධ්‍යානභාවනාවට බාධක වෙයි, යම් කෙනෙක් එබඳු වූ චරිත ඇතිව වීර්‍ය ඇති කෙනෙක් නම් එයින් පුරත් මි ය. අශක්ති කෙනෙක් ගෘහපති චීවරත් පිළිගණිත් මි ය. නවද එසේම භික්ෂූහු පාංශුකූල චීවරයම ගණිත් නම් ශ්‍රද්ධාවන්තයෝ මාගේ ශ්‍රාවකයන්ට උතුම් උතුම් වූ වස්ත්‍රදානයන් දී අප්‍රමාණ වූ දිව්‍යලෝක මනුෂ්‍යලෝක සම්පත් කෙසේ ලැබ ගණිද්ද, මෙ මේ කාරණයෙන් තා ඉල්වූ ඒ වරයත් ලොක ශාසන නමැති මහ ඇල්කෙතට ශෙව තාසපිකා නම් රෝගය වැන්න, එයි දු තට නො දෙමි" යි වදාළ සේක.

එ වේලෙහි දු දෙව්දත්තෙර සොරසිතින් සමාධි ව සතර වන වරය ඉල්වන්නාහු "එසේ වී නම් ස්වාමිනි! හැම භික්ෂූන් ම හැම කාලයෙහි ම රුක්මුල්වල හිඳ ධ්‍යාන භාවනා කොට වෘක්ෂමූලිකා ඞ්ගය ම පුරණ පරිද්දෙනුත්, තණින් සෙවූ ගෙයකට නො වදිනා පරිද්දෙනුත් ශික්ෂාපදයක් පණවා වදාළ මැනැවැ"යි කීය.

එ වේලෙහි ද ස්වාමිදරුවෝ පූර්වබුද්ධවරයන් කෙරෙහි නො පැවැත්තාවූ වරයක් බැව් දැන "තා ඉල්වන්නාවූ වරය නම් සුළඟට දූල් බඳිනා සේ ලැබගත නො හැක්කා වූ වරයෙක් ම ය. මාගේ ශ්‍රාවකයෝ වර්ෂාකාලයෙහි රුක්මුල්වල කෙසේ දවස් යවද් ද, මැසි මදුරු අවු සුළං බාන සුකුමාලවූ භික්ෂූහු කෙසේ මහණධම් පුරද් ද, මාගේ සද්ධර්මය මතු නොනැන්සි තබා රක්ෂා කෙරෙද් ද, ආවාස දන් දී බොහෝ පින් රැස්කරණ සත්පුරුෂයෝ කෙසේ ඒ පින් ලැබගණිද් ද, එ බඳු වූ වීර්‍ය්‍යවන්ත වූ ශ්‍රාවක කෙනෙක් වර්ෂා සාර මස හැර නියං අටමස වෘක්ෂ මූලකාඞ්ගයත් පුරත් මැය. එසේ පුරා ගත නො හෙන කෙනෙක් තණ කුටියෙහිත් වෙසෙත්මය ප්‍රසාදදී

හෙයින් මෙසේ ම ය. මේ මේ කාරණයෙන් තා ඉල්වූ ඒ වරය ද ලෝක ශාසන නාමැති මඟ සඳහන් රූකව නරාවක් සේ ශාසනසම්පත්තියට ප්‍රතිපක්ෂ වූ වරයෙක. එයි දු නො දෙමි"යි වදාළ සේක.

එ වේලෙහි දු දෙව්දත් මහතෙර අනික් වරයක් ඉල්වන්නාහු 'එසේ වී නම් ස්වාමීනි හො එක් ලබ්ධිගතුවා වූ සත්ත්වයෝ ද මත්ස්‍යමාංසානුභවය නො කරන්නාහු ය. ලෝකවාසීහු ද මත්ස්‍යමාංසානුභවය නො කරන්නවුන් කෙරෙහි ඉතා පහදිති. නුඹ වහන්සේගේ ශාසනයෙහි භික්ෂූන් මත්ස්‍යමාංස අනුභව කරණු ඉතා නොයෙදේයි. එසේ හෙයින් මිථ්‍යාදෘෂ්ටිහු ද ශාසනයෙහි නු ගුණ කියති. ශාසනයට ම වැඩ පිණිස සියලු භික්ෂූන් ම මත්ස්‍යමාංසානුභව නො කරන්නේ ය යි කියා ශික්ෂාපද පණවන්නේ ය"යි කී ය.

එ වේලෙහි දූ ස්වාමිදරුවෝ පූර්වබුද්ධවරයන් එ බඳුවූ ශික්ෂාපදයක් නො පැණ වූ බවු දත "තා ඉල්වන්නාවූ වරය නම් පශ්චිම පෙළා පැක් නො ලබන්නා සේ සර්වඥවරයන්ගෙන් ලැබගත නො හැක්කා වූ වරයෙක් ම ය. දෙවදත්තය! අනුන් පිරිමූල හෙලීමෙන් ගමින් යන ජාත්‍යන්ධයන් සේ සර්වඥවරයෝ අනුන් කීවා කාරණ ය යි නො ගිවිස්නාහු ය. මේ ලෝකයෙහි සර්වඥවරයන්ට වඩා කුශලාකුශල ධර්මයන්ගේ විභාගයෙහි සාරය දන්නා සත්ත්වයෙක් නැත් ම ය. එසේ හෙයින් කැවූ නව පාපයෙක් වේ නම් මහා කරුණා සම්පන්නාවූ බුදුහු වරද ය යි හරවන්නාහු ය. මේ ලෝකයෙහි ආහාර විහාරාදි චතුර්විධ වූ ප්‍රත්‍යය දුන දුන්නා වූ සත්ත්වයන්ට ජනිත වන්නාවූ කුශලය ඒ දන් අනුභව කළාවූ ශ්‍රාවකයන්ට හා සම නො වන්නා සේ මාංසය ද මැරූවානට වූ පාපය, කැවූවානට නැත්තේ ම ය. යමෙක් ලොභය නූපදවා මේ ජීවිත බ්‍රහ්මචර්‍ය්‍යාව රක්ෂා කරන්නාහු අනුභව වස්තුවෙක් වනැයි දිවි රැක සිල් රකුම්හ යි සිත සිතා අනුභව කළාහු වූ නම් පව් නැත්තේ ම ය. එසේ හෙයින් මාගේ ශ්‍රාවකයෝ ද යම් යම් දෙශයෙක, යම් යම් විෂයෙක, යම් යම් දෙයක් අනුභව කොට සත්ත්වයෝ ජීවිතවෘත්තිය කෙරෙත් නම් ඒ ඒ භෝජනයන් අනුභව කොට ශාසනය රක්ෂා කොට ලෝ වැඩ කරන්නාහු ම ය. එසේ හෙයින් ත්‍රිකොටි පරිශුද්ධ දශවිධ වූ මාංසයෙන් පිටත් වූ කප්පිය මාංසය අනුදන්නෙමි. ඒ වරයක් නො දෙමි ම ය"යි වදාරා මෙසේ පස් මහ වරය ම නො ගිවිස "මාගේ ශාසනයෙහි ශික්ෂාපදයන්ගේ නිමාව නම් නිර්වාණය කෙළවර කොට ඇත්තේ ය. එසේ හෙයින් සමහරු ආරණ්‍යයෙහි වැස භාවනා කොටත් රහත් වෙති. සමහරු ග්‍රාම්‍ය මාංසයෙහිත් දිම්‍යසමාන මග පාමුඳුන්හි යහත් මතුයෙහි සිදත්

ඒ ඒ අරමුණෙන් රහත් වෙති. සමහරු පිණ්ඩපාතිකාඞ්ගය පුර පුරාත් රහත් වෙති. සමහරු ගෘහපති භොජන වළඳාත් රහත් වෙති. සමහරු පාංශුකූල චීවර ධරාත් ශුන්‍යාකහුම්‍යාදියෙහිත් රහත් වෙති. සමහරු ගෘහපති චීවර ධරා හිඳත් රහත් වෙති. සමහරු රුක්මුල්හි හිඳ භාවනා කොටත් රහත් වෙති. සමහරු විහාර සෙනාසනාදියෙහි හිඳත් රහත් වෙති. සමහරු මත්ස්‍ය මාංසානුභවයෙහි යෙදීත් රහත් වෙති. සමහරු අවශෙෂානුභව යෙහිත් යෙදීත් රහත් වෙති. එසේ හෙයින් මේ මේ කාරණයෙන් බුදුන්ට ප්‍රයෝජන නම්, බුදුන් ලොකයෙහි පහළ වූයේ නම් සත්ත්වයාට නිවන් අමා දෙන නිසා ය. යමෙක් නිවණට බාධක වී නම් එසේ වූ වරද සව්ඥවරයෝ වළකන්නාහු මැ ය. යමෙක් මාර්ගාවරණ ය නො කෙරේ නම් එසේ වූ වරද සව්ඥවරයෝ වරදට නො ගන්නාහු මැ ය. එසේ හෙයින් තා ඉල්වූ වර පස ම බුදුහු නො දෙති" වදාළ සේක.

එ වේලෙහි දෙව්දත් මහතෙරහු තමන්ගේ කොකාලිකාදී සතරදෙනා මුහුණ බලා ඝොර හිගි ලා සිනින් සමාධි ඇති ව හුනස්නෙන් පැනනැඟී බුදුන් වැඳ "ස්වාමීනි! නුඹවහන්සේ මා ඉල්වූ යම් යම් වරයක් නො දී වදාරණ සේක් ම ය. මා කෙරෙහි සරුවක් නැති සේක් ම ය"යි කියා තමන්ගේ විහාරයට ම ගොස් බොහෝ අඥානයන්ට තමන් රූක්ෂ ප්‍රතිපත්තියෙන් බුදුන් අතින් වර ඉල්වූ නියාවත්, ඒ වර බුදුන් නුදුන් නියාවත්, "මෙයින් මතු අපි අපි ම එ පිළිවෙත් පුරම්හ. අද පටන් මම ද මෙතන ම බුදුකම් කෙරෙමි"යි කියා අලුත අලුත මහණ වූ, පෘථග්ජන වූ කුසල් ලා වූ, මගණුන් ලා නො එක් දුමිත්‍රණ කොට පන්සියක් මහණුන් උගන්වා ගෙණ තෙමේ වෙන්ව ගොස් සඞ්ඝභෙදකඛන්ධයෙහි කී පරිද්දෙන් සඞ්ඝයා භෙද කොට, තෙමේ වෙන වෙන ම පොහෝ පවුරුණු කොට, එයින් ගයා නම් ගඞ්ගාව සමීපයෙහි වෙහෙරක් කරවා එහි තෙමේත් බුදු වීමි යි කිය කියා බුදුන් සැපියට දවස් යවයි.

එ කල ස්වාමිදරුවෝ ඔහු උගන්වා ගෙණ ගිය පන්සියක් මහණුන්ගේ නුවණ පිරි හුන් බවු දැන සැරියුත් - මුගලන් දෙදෙනා වහන්සේ කැඳවා "තෙපි දෙදෙන පලා ගොස් දෙව්දත්හුගේ මහණුන් ගෙණෙව" යි වදාළසේක. එ කල අගසවු දෙදෙනා වහන්සේ ගොස් දෙව්දත්හුගේ ආරාමයට වන් සේක. එ දවසු දු දෙව්දත් තමාගේ මහණුන් දෙපෙළ හිඳුවා ගෙණ තෙමේ ධර්මාසනයෙක පැන නැඟී සිංහයකුගේ වික්‍රම දක්වා හුන් කැනහිලකු සේ, බුදුන් සේ ම

බණ කියයි. එ වේලෙහි අගසවු දෙදෙනා වහන්සේ ආරාමයට එදනා දුටු භික්ෂුහු ගොසින් දෙව්දත්හට කීහ. දෙව්දත් "තමන් කෙරේ වසන්නට ආහ"යි සිතා සතුටු විය.

ඇලයේ හුන් කෝකාලිකයා කියනුයේ "ඔහු දෙදෙන නම හවත් ගොලුම්හට වඩා සොරහ. තොප කෙරේ වසන්නට ආහ යි නො සිතමි. තොපට විනාශයට ආහ යි සිතමි. ඔවුන් ඇතුළට නො ගන්ව"යි කී ය. එ බසට දෙව්දත් "කුමක් දොඩයි ද, බුදු හුත් මම ත් සමවූ කල ඇතියම්හ. මම ඔවුන්ට ගුරුකමට නො තරම් ද, මට අගසවු නමට අවු ය. හැන නො කොට ම ඇතුළට ගන්ව" යි කියා දෙදෙනා වහන්සේ ම ඇතුළට ගෙණ ප්‍රිය කථා කොට සැරියුත් මහ තෙරුන් වහන්සේ තමහට දකුණත ආසන යක හිඳුවාගෙණ, මුගලන් මහ තෙරුන් වහන්සේ වමත ආසන යෙක හිඳුවාගෙණ, අසැදෑකොණ්ඩසැදෑ සවාමීන් මාරුවට කෝකාලික මහල්ලා තමහට පිටිපස්සේ හිඳුවාගෙණ, එතෙකින් තෙමේ හැඩියක් ම බුදුව ගියෙමියි සිත සිතා තමා ඔවු නො දන්නේ බණ ය යි කියා කියා තමා කවච ආ යම් ම දෙයක් දොඩා වඩා ම ගොස් "බුදුන් සේ ම මම ත් ශ්‍රාවකයන් ලවා බණ කියවමි" යි සිතා "ශාරිපුත්‍රස්ථවිරයෙනි! බණකියා වඩා ව ගියෙමි. පිට මදක් රිදෙයි. මා මදක් සැතපී ගත දී තෙපි බණ කියව" යි කියාලා තමේ ආසනයෙන් බැස සැරියුත් සවාමීන් අත්තෙහි හිඳුවාලා තමේ ආසනය පිටිපස්සෙහි බිතන් බඹ මැදහෙව "හො හො සාරිපුත්ත! සාධු සාධු සාරිපුත්ත!! දෙසෙථ ධම්මං සාරිපුත්ත!!!" යනාදීන් බුදුන් ඔබට කරණ සතුති සැපියව තෙමේත් සතුති කොට කොට සිඳ, මහ පිඹුරකු සේ සුස්ම සුස්මා තෙමේ තමා කොයි හොත් ඔවක් නො දන්නී.

එ වේලෙහි සැරියුත් සවාමි ආකාශ ගඩගාව ගෙණහැර දක්වන් නා සේ, මුහුද-මහරළකඳු දිවන්නා සේ, අනේක නයින් අනුබුද්ධව ධම් දෙශනා කරණ සේක. එ කෙණෙහි දෙව්දත්හුගේ පන්සියක් මහණු පිළිසිඹියාපත් රහත් ව ගියහ. ඔවුන් රහත් වූ බැව් දන දෙදෙනා වහන්සේම පියුම් විලෙකින් අහස්කුසට නැගි රාජහංස යන් දෙදෙනකු සේ ආකාශයට නැගී බුදුන් වසන දෙස බලා නික් මුණු සේක. සොල්මනකින් එක පැහැර අහස්කුසට පැනනැගි ලිහිණි පෙලක් සේ, පන්සිය යක් රහත් සඟහුද උන් උන් පොළින්ම ආකාශයට පැනනැගී දෙදෙනා වහන්සේ පිරිවරා බුදුන් කර ම ගියහ. එ කල දෙව්දත්හුගේ ආරාමය සිස් විය. තම ද දෙව්දත් පරමනි නිද්‍රා ම ය.

එ වේලෙහි කෝකාලික තෙම හැම මහණුන් ගිය බවු දැක තමා හා දෙව්දත්හු එකලා වූ සේ දැක තමා ම ලෙඩි අත් ගස ගසා දෙව්දත්හු කරා දිම විළුඹෙන් ලෙඩි ගැන පුබුදුමා "කොල! තෝ මා කිය මන් නො ගත්තෙහි වේ ද, තාගේ හැම පිරිස් ගෙණ අගසව්වෝ ගියෝ වේ ද, එසෙකින් තෝ බුදුකම් කෙසේ කෙරෙයි දැ"යි බැණ බැණ දතකිස තමාලා ඔහු ලෙඩි කුළුපහරක් සේ ඇන්න. එකෙණෙහි දෙව්දත් හුණු ලේසැල්ලක් සපින් දමා එම ව්‍යාධිය මුල් කොට එතැන් පටන් නවමසක් ලෙඩ ව හෙව, පසු ම තමා එකාන්තයෙන් ම මියන බව දැන තමා බුදුන්ට කළ නො මක් අපරාධ සිහි කොට උපන් හයින් "මියන ගමෙහි බුදුන් වැඳ ක්ෂමා කරවමි"යි සිතා "මා බුදුන් දක්වාල පියව"යි කීහ. අතවැසියෝ "තොප බුදුන්ට කළ ද්‍රෝහ තොපි ම නො දනු ද, බුදුහු තොපි නො දක්නා සේකැ"යි කීහ. එ වේලෙහි දෙව්දත්:-

"වධකෙ දෙවදත්තෙ ච-චොරෙ අංගුලිමාලකෙ,
ධනපාලෙ රාහුලෙ චෙව-සබ්බත්ථ සම මානසො" යි.

යනු හෙයින් "බුදුහු මා කෙසේ අපරාධ කළත්, මා කෙරෙහි ආඝාතයක් නැතියහ"යි කියා තමා ඇඳකින් උසුළුවා ගෙණ එවත බුදුන් දෙව්රම බවු අසා ඔබ නික්මිත.

ඔහු එන බවු අසා බුදුන් කරා ගොස් "ස්වාමීනි! දෙවදත්තයෝ නුඹවහන්සේ දක්නට එමින් සිටියෝ ය"යි භික්ෂූන්වහන්සේ සැල කළ සේක. බුදුහු "මහණෙනි! දෙව්දත් මා දක්ත නොහෙ"යි වදාළ සේක. නවද භික්ෂූන් වහන්සේ "ස්වාමීනි! දෙවදත්තයෝ යොදනක් අවු ල. දෙගව්වක් තබා අවුල. ගව්වක් තැනට අවුල. අඩගව්වක් පමණ තැනට අවුල. දුන් අඩසතක් පමණ තෙන අවුල. වෙහෙරට පෙණෙන තෙනට අවුල" යනාදීන් කොසින් දන්වන සේක. බුදුහු "මහණෙනි! දෙව්දත් මා ඇතින් පස්වරය ඉල්වා ගිය තෙක් පටන් බුද්ධ දර්ශනයට අභව්‍ය වී ය. ඔහු කළ කම් බෙහෙව. මා සේ බුදුහු සියක්හුත් දහසක්හුත් මේ වකට ඔහු ගොඩනැගිය නො හෙති. මේ ගණිමණ්ඩල මාලකයට ආ නමුත් මා දක්න නොහෙයි. ඇසිල්ලෙකින් ඔහට වන කම් දක්නා වා දැ"යි වදාළ සේක.

එකල දෙව්දත්හුගේ අතවැසියෝ ඔහු උසුළා ගෙණවුත් ජෙතවන දොරටුව සමීපයෙහි වූ පොකුණ තීරය මතුයෙහි ඔහු ඇඳපිටින් තබාලා තුමූ නාන්නට දියට බටහ. එවේලෙහි දෙව්දත් දෙව්රම දොරටුව දැක "දූත් දක් බුදුන් දකිමි"යි යන දක්ෂාහණ සන්

කම්ජවූ බලයක් ලදින් මෙතෙක් දවස් නැගී සිටින නො හෙතුයේ එ දවස් ඇඳින් නැගී දෙපය බිම තබා වෙවුල වෙවුලා හුන්නේය. එකෙණෙහි මහපොළොව දෙකක් ව පැළී දඹදිව යට වලුත් වත් තන් ඒ ඒ මතුයෙහි තුබුම්ාසේ, ක්‍රමයෙන් තුබූ අට මහා නරකයම එක රැහු ව යට තුබූ අවීචි මහානරකයෙන් ගිනිකඳෙක් පැන නැගී පාශයකින් බැඳුවා සේ මොහු දෙකකුල් ගත. එකෙණෙහි කකුළුවකු පණුවකු සල්ව සල්වා ගලන්නාසේ දන දක්වා ගැල-නාභිය දක්වා ගැල-කනකිස දක්වා ගැල-ක්‍රම ක්‍රමයෙන් මෙසේ කර දක්වා ගැලපීය.

එ වේලෙහි දෙව්දත් "කොල! මා ගණුව, මා ගණුව" යි මහ හඬින් හඬ හඬා බුදුන් සඳහන් කොට "යශෝධරා දේවීන් බෑනැනනුයෙමි, රහල් තෙරුන් මයිලනුයෙමි. සුදෙවුන් රජානන් බෑනැනනුයෙමි. එසේ හෙයින් ශාක්‍ය සිංහ වූ ලොවුතුරා බුදුනි! තුඹ සුහුරුබඩුයෙමි. නැක්නවූ අපරාධ කළත්, තුඹ නැයන් බලා වී නමුත් අද මා රැක ගන්නැ"යි බුදුගුණ කියනුයේ,

ඉමේහි අට්ඨීහි තමග්ගපුග්ගලං
දේවාතිදේවං නරදම්මසාරථිං
සමන්තචක්ඛුං සතපුඤ්ඤලක්ඛණං
පාණේහි බුද්ධං සරණං උපෙමි.

යන මේ ගාථාව කියා බුදුන් සරණ ගෙණ බුදුන්ට සතුති පූජා කෙලේ ය.

ඉක්බිත්තෙන් ඔහු ගෙණගොස් අවීචි මහා නරකයෙහි හෙළී ය, එහි උපන් ඔහුගේ උසම සියක් යොදුන් වෙයි, ගිනිගෙණ, දිලියෙන ශරීර වෙයි. පජීතයක් සේ ගිනිගෙණ දිලියෙන ඉස ම පස්විසි යොදුන. ගිනිගත් බඳ පස්විසි යොදුන. සියක් ගවු දිග සිනින් කකුල් වෙයි. සියක් ගවු දිග ගිනිකඳ වන් කලව වෙයි. දෙසියයක් ගවු දිග ගිනිගත් දැත් වෙයි. ගිනිගෙණ දිලියෙන නාඹ තල්කදක් සා යකිලයෙක් ලෙන් ඇනී පිටින් නැගී පූර්වපශ්චිම දෙහිතනියෙහි හැනී සිටී. එසේම අනික් යකිලයෙක් දකුණැලයෙන් හැනී වම් ඇලයෙන් නැගී උතුරු දකුණු දෙහිතනියෙහි හැනී සිටී එසේ ම අනික් ය කිලයෙක් ඉස්මුදුනෙක් හැනී අධොභාගයෙන් නික්ම යට යපොළොම පවන් උඩ යපොළොව හැනී සිටී. මෙසේ නිශ්චල වූ බුදුන්ට කළාවූ අපරාධයට නපක් මුළුල්ලෙහි නිශ්චලව සිට විඳිනා ප්‍රේත දුකට ම භාජන විය. බුදුහු ඔහට මේ සා මුළාවක් වන බවු දැන කුමක් කියා මොහු මහණ කළ සේක් දැ? යත්;

මේ තෙමේ බොහෝ දවසක බුදුන්ට වෛරී ව ම ආ බුද්ධද්‍රෝහීය ය. එසේ හෙයින් ඉදින් මහණ නො කළහොත් ගිහිගෙයි වෙසේ නම් බුදුන්ට කරණ අපරාධ මීටත් වඩා බොහෝ වෙයි. කප් අසංඛ්‍යයෙකිනුත් ගැලවුම් නැති පව් කෙරෙයි. මහණ කිරීමෙන් කරණ යම් ම අපරාධයක් ඝොර ඝොරා සත ගෙණ ගෙණ කෙරෙයි, එසේ කරණ දෙයක් බොහෝ කොට කොටගත නොහෙයි මහණවූ හෙයින් මරණ කාලයෙහි බුදුන් දකිම් හි ආශ. පොළොව ගිලන වේලෙහි චතුෂ්පද ගාථාවෙකින් බුදුන් ගුණ කියා බුදුන්ගේ සරණ ගත පඤ්චානන්තය්‍යීය කර්‍ම්‍ය කළවුන්ට අවීචිය එකාන්ත හෙයින් බුදුන් සිහි කළත් අවීචියෙහි හින. එහි බොහෝ කලක් දුක් ගෙණ බුදුන් සරණ ගියාවූ කුශලයෙන් අනාගතයෙහි කප් ලක්‍ෂයක් ගිය කල සට්ඨිස්සර නම් පසේ බුදු ව, සැව අසුරන් ගැසූකලක් ජීවත්ව නිරුපධිශෙෂ නිර්‍වාණධාතුයෙන් පිරිනිවී අමාමහ නිවන් දක සංසාර සාගරයෙන් ගැලවෙන්නෝ ය යි මෙතකු පරීක්‍ෂා නොකොට බුදුහු මහණ කළ සේක් යි සත්පුරුෂයන් විසින් දතයුතු.

තව ද අප බුදුන් සමයෙහි මේ දෙව්දත් මතු නොවෙයි. ඔහු සේ ම වරදවා පස්දෙනෙක් මහපොළොව හැල එම ආත්මයෙන් අවීචි මහා නරකයට ගියාහු ය. ඔහු කවරයත්? 1 උපුල් වන් මහා සථ්විරින් වහන්සේ දූෂණය කළාවූ භාගිනෙය්‍ය සිවු පුත්‍රය, 2 තමා රුවට නිඳු කළෑ යි බුදුන් කෙරේ ආඝාත බැඳ සත් දවසක් බුදුන්ට අනාදර බැණවූ මාගන්දි නම් බැමිණී ය, 3. මිථ්‍යා දෘෂ්ටීන්ගෙන් අත්ලස්ගෙණ සිවුවණක් පමිත් මැදයෙහි සිට බුදුන්ට අනාදර බිණූ චිඤ්චමානවිකාව, 4. බුදුන් කෙරෙහි ආඝාත බැඳි මෙම දෙව්දත්හුගේ පියානෝ සුප්‍රබුද්ධ නම් කෝලිය රජ්ජුරුවෝ ය, 5. මෙම් දෙවදතනයෝ ය යි පස් දෙනෙකැයි දතයුතු.

මෙසේ මාගේ සවාමිදරුවෝ මේ දෙව්දත්හුගේ නොයෙක් ජාතිවල ද, බුදු වූ ජාතියෙහි ද, අනෙක ප්‍රකාරයෙන් ඔහු තමන් වහන්සේට කරණ ලද, නොයෙක් වධක ප්‍රයෝගයෙහි මෙසේ මෙසේ නොයෙක් පූජාවන් ලත් හෙයිනුත්, එසේවූ පූජාවිඳීමට සුදුසු හෙයිනුත්, වැදූ සුදොවුන් මහරජානන් කෙරෙහි ද, කඩුවක් ඉස සිසාරා තමන් වහන්සේ මරා "ඇඟිලි කපමි, නොය නොය මහණැ" යි කිය කියා දිවූ අඟුල්මල් සොරහු කෙරෙහි ද, "පය ගෙණ පරසක්වල කසමි" යි ගඩගසා දිවූ අලව් යකු කෙරෙහි ද. මේ සා වධක ප්‍රයෝගයක් කළා වූ දෙව්දත්හු කෙරෙහි ද, තමන් සහජාත පුත්‍ර වූ රහල් තෙරුන් කෙරෙහි ද, එක සම්වූ මෛත්‍රී ඇති මාගේ බුදුහු අර්හත් නම් වත සේක. එසේ හෙයින් කියන ලදී.

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං–සි.

මේ පූජාවලියෙහි අප බුදුන් දෙව්දත්හු නිසා ලද

සම මෙත් පූජා කථා නම් වූ

එකුන්තිස් වන පරිච්ඡේදය නිමි.

—:—

තිස් වන පරිච්ඡේදය

තවද: අප බුදුන් අජාසත් රජුගෙන් ලද ජීවිතාදි පූජ නම් කවර? යත්;

දෙව්දත්හු යම හී ක්‍රමයෙන් පොළොව හැල මිහ තීරු වන් කල්හි රජගෘ නුවර මහත්වූ සැණකෙළියෙක් විය. නුවර වැසියෝ එනුවර දෙව්පුරයක් සේ සරහා සැණ මෙන් ගෙණ හැඳ පැලඳ දෙව්යන් සේ කෙළිනාහු ය. එකල අජාසත් රජ්ජුරුවෝ මැදි පොහෝදා රෑ චන්ද්‍රකාන්තින් පිදී කලුයෙන් දිවත්නාවූ ක්ෂීරධාරා වන් සේ, රජත ප්‍රාසාදයෙන් නික්මුනු මුතුවැල පංක්තියේ, සමන් මල්දම් සේ, ක්ෂී සාගරයෙන් දිවන මහරළපතර සේ, චන්ද්‍රකාන්තින් දිලියෙන්නා වූ රාත්‍රියෙහි අමාත්‍ය මණ්ඩලයා පිරිවරා දළුපුඩුසේසත යට සිංහාසන පැන නැඟී හුන්නේ ය. කුමක් නිසා හුන්නේ ද? යත්;

නිදි වළකන සඳහා ය, කුමක් නිසා නිදි වළකා ද? යත්; මේ රජ පියරජහු මැරූ තැන් පටන් ගෙණ ඇස පියාලූ විට ම ඉස කුළ හෙලන්නා සේ, සිය දහස් ගණන් සැත් ලාලා ඇග සැත්කම් කරන්නා සේ, වැටහෙන කල මහහඬින් හඩ හඬා වෙවුල වෙවුලා පුබුදින්නේ ය. කිම් ද යි විචාළ කල ලජ්ජාවෙන් නොකියා අතීතක් කිය යි. ඒ කාරණයෙන් මෝහට පියරජහු මැරූ තැන් පටන් ගෙණ නිදි ලැබීමෙක් නම් නැත. නිදි නො රිසියේ ම ය. මේ කාරණයෙන් නිදි වළකන නිසා සිද මේ රාත්‍රිය චන්ද්‍රකාන්තින් ඉතා හොබනේ ය. ඉතා රමණීය ය, සිත් පහදවා කවර මහණ බමුණු කෙණෙකුන් කරා යමෝ ද්‍ය, කවර මහණ බමුණු කෙණෙක් ගිය කලඅප සිත් අලවද්දැ''යි විචාළේ ය,

එබසට එක් අමාත්‍යයෙක් "දේවයන් වහන්ස! අපගේ පූරණ කාශ්‍යප නම් බුදුන් කරා ගියෙහොත් ඉතා ම මැනැවැ"යි කීය. රජ්පුරුවෝ එබසට මුයෙන් නොබිණූහු ය. අනෙක් අමාත්‍යයෙක් "දේවයන් වහන්ස! අපගේ මක්ඛලි ගොසාල නම් බුදුන් කරා යම්හ"යි කීය. අනෙකෙක් "අපගේ අජිත කෙසකම්බලයන් කරා යම්හ" යි කීය. අනෙකෙක් "කකුධ කාත්‍යායනයන් කරා යම්හ" යි කීය. අනෙකෙක් "සඤ්ජය බෙලට්ඨි පුත්‍රයන් කරා යම්හ" යි කීය. අනෙකෙක් කියනුයේ "ඉතා ම කිසි පලිබෝධයක් නැතිව, පිළී පමණකුත් නැත ඇතිව ඉත නොගා. ඔවුහු සිස් උපන් වනු ම ඇවිද උග්‍රවූ තපස් රක්‍ෂා කරන්නාවූ අපගේ නිගණ්ඨනාථ පුත්‍රයන් කරා යම්හ" යි කීය. මෙසේ ඒ අමාත්‍යයන් සඳුරෙහි රස, කසඹිලියෙහි සිහිල, වර්ණනා කරණුවන් සේ තමන්ගේ ලබ්ධි ගත් නිවටුන්ගේ නම් වෙන වෙන ම කී කල මී අඹයේ ලොය සාරණ පුරුෂයකු කඳුරු පලෙක්හි තෑණ්ණා හැත්තා සේ එබස් නො ගිවිස මුයෙන් නොබැන හිඳ තමන් ලඟ හුන් ජීවකයන් බණවා "යහළු ජීවකය! තෝ තෙල් වැලඳූ ගරුඩ පොව්වකු සේ මූයෙන් නොබැණ හිඳිනෑ" යි කීය.

රජ්ජුරුවෝ මෙතෙක් කථා කරන්නාහු ජීවකයන් සඳහා ම කීහ. කාරණ කිම? යත්; තමන් කැඳවාගෙණ යොයි බුදුන් දක්වන සඳහා කීහ. තුමූ ගොස් බුදුන් දක්ක නොහෙන්නාහු දැ? යත්; තමන් බුදුන්ගේ උපාසක වූ රජහු මැරූ අපරාධ ඇති හෙයිනුත් දෙව්දත්තයා හා එක්ව බුදුන්ට කළ අපරාධ බොහෝ ව ඇති හෙයිනුත්, බුදුන් දක්නට භය ඇති ව "ජීවකයා හා සමග ගොස් ඔහු පිටිපස හිඳ බුදුන් දකිමි"යි සිතා මෙ තෙක් පර කථා ඉපැදවූහ.

රජ්ජුරුවන්ගේ අභිප්‍රාය ජීවකයෝ නො නොදන්නාහු දූ"යි යත්? දනිත්ම ය; වැළි කුමක් නිසා නො බැණ හුන්නාහු දූ"යි යත්; තමන් තමන් හැම දෙනා කැමැති කැමැත්තක් දෙබා විකෂෙප කරනා තුරු හුන්හුය. කෙසේ දැ? යත්; ඒ සභාවෙහි ඒ මිථ්‍යා දෘෂ්ටීන් සඳෙනාගේ ලබ්ධි ගත්තාහු බොහෝ දෙන ය. "මම පළමු කොට බුදුගුණ කියන්ට පටන් ගතිම් නම් නැගී සිට අසූ අය්සේ තමන් තමන්ගේ නිවටුන්ගේ ගුණ කියති. එ කල මා කියන බුදුගුණ නිමාවට නො පැමිණෙයි. රජ වනාහි පෙර ම ඒ නිවටුන් සඳනා කරා එළඹ ඔවුන්ගේ සාරගුණයක් නැතැ යි දන්නා හෙයින් මා අතින් විචාරයි. එවේලෙහි මම බුදුන්ගේ ගුණ කියා මෙ රජ බුදුන් කරා ගෙණයෙමි"යි සිතාලා රජ්ජුරුවන්ගේ අභිප්‍රාය දැනත් මූයෙන් නො බැණ ම හුන්නාහුය.

ඉක්බිත්තෙන් අජාසත් රජ්ජුරුවෝ ඒ අමාත්‍යයන් කියන වෙන වෙන කථා අසා “යම් සත්ත්ව කෙනෙකුන්ගේ කථා නො අසන්නා කැමැත්තෙම් ද, ඔහු පෙරළ පෙරළා කථා කෙරෙති; යම්කුගේ බස් අසනු කැමැත්තෙම් නම් ඒ ජීවකයා මං හා සමග කථා නො කෙරෙයි. ඉතා මට මහත්වූ හානියෙකැ”යි සිතා “මේ ජීවකයා උපශාන්තවූ ගුණ ඇති බුදුන්ගේ උපාසක ය. තෙමේ ද උපශාන්ත ය, එසේ හෙයින් මෙත් සම්පන්නවූ භික්ෂු කෙනෙකුන් සේ මුවෙන් නො බැණ ම හිඳිනේ ය.. මා කථා නො කළ කල ඒ කථා නො කෙරෙයි. ඇත්බඳක් මඩනා කල ඇත් පයින් මැඬිය මැනැවැ”යි සිතා ජීවකයන් මුහුණ බලා “ජීවකය! මේ අමාත්‍යයන් තමන් තමන් ලබ්ධිගත්තවුන්ගේ ගුණ කියන්ට මුඛ නො සැහෙති. ඔවුන් සේම තාගේ ලබ්ධිගත් මහණ බමුණු කෙනෙක් නැද්ද? මාගේ පිතාණන් වහන්සේ කට කිසි සැපතකුත් නුදුන් සේක් ද? දුඃඛිතයෙහි ද? කොහොත් සැදෑ නැතියෙහි ද? යි විචාළාහු ය.

එ සල්ගි ජීවකයෝ “මේ රජ්ජුරුවෝ මා ලවා බුදුන්ගේ ගුණ කියවනු කැමැත්තාහු වන. දුන් මා නො බැණ හිඳිනා කල් නො වෙයි” සිතාලා “යම් සේ සෙසු අමාත්‍යයෝ රජ්ජුරුවන් මැද මැද තමන් තමන් නිවටුන්ගේ ගුණ කියත් ද? බුදුන්ගේ ගුණ මම එසේ නො කියමි”යි සිතාලා හුනස්නෙන් පැනනැගී බුදුන් දිශාව බලා පසඟ පිහිටුවා වැඳලා දෝතින් මුදුනෙහි තබා ගෙණ “රජ්ජුරුවන් වහන්ස! එසේ මෙසේ මහණකු තරු මා එළඹෙතියි නො සිතුව මැනව. මාගේ බුදුන් මවුකුස පිළිසිඳ ගත් වේලෙහි ද, මවුකුසින් බිහි වූ වේලෙහි ද මහභිනික්මන් කළ වේලෙහි ද, බුදු වූ වේලෙහි ද, දම්සක් දෙසූ වේලෙහි ද, යමා මහ පෙළහර පෑ වේලෙහි ද, යනාදි නො එක් බුදුම්ගුලෙහි දසදහසක් සක්වළම ගුගුරා කැංග. මෙසේ යමා මහ පෙළහර පෑ සේක. විජම් බණ දෙසූ සේක. මෙසේ දෙවෝගණයකළ සේක වැළි මාගේ බුදුන්ගේ ගුණ කියමි. රජ්ජුරුවන් වහන්ස! සිත් එකඟ ව අසුව මැනැවැ”යි කියාලා;

අයං දෙව භගවා අරහං සම්මා සම්බුද්ධො අම්හාකං අම්බවනෙ විහරති මහතා භික්ඛුසංඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි, තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා ති, තං දෙවො භගවන්තං පයිරුපාසතු. අප්පෙව නාම දෙවස්ස භගවන්තං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍යා” ති.

බුදුන්ගේ ගුණ කියන්නාහු "මහරජ! අප බුදුහු මාගේ අඹවන යෙහි එක් දහස් දෙසිය පණස් මහාශ්‍රාවකයන් පිරිවරා දූත් වැඩ වසන සේක. නුඹ වැනි සියක් දහසක් ලක්ෂයක් දුටක් සිත් ගෙණ ම බණ වදාරණ සේක. සිත්සේ බුදුන් කරා එළඹ පැන විචාළ මැනැව" යි කීහ. රජ්ජුරුවන් බුදුගුණ අසත් අයත් සම්බන්ධය ම පස් වණක් ප්‍රීතින් පිණා ගිය.

එ වේලෙහි බුදුන් කරා යනු කැමැත්ම "මා නො වේලෙහි බුදුන් කරා යන කල යානාවන් සරහන්ට ජීවකයන් විනා අනික් කිසිවෙක් ම සුදුසු නො වේ" යි සිතා "යහළු ජීවකයෙනි! සත්සුන් බුදුන් කරා යන්නවුන් සත්සුණ් යානාවෙන් ගිය මැනව. නෙපි ගොස් ඇත්යාන් සරහාලව" යි කීහ. එකල ජීවකයෝ "රජ්ජුරුවෝ මෙ වේලෙහි ම බුදුන් දක්නට යනු කැමැතියහ. රජ්ජුරුවන්ට සතුරෝ බොහව, අතුරුමග කිසි උපද්‍රවයක් වී නම 'ජීවකයා රජ්ජුරුවන් ගිවිස්මා කෙණ ගොස් රජු නසාපියා'යි රාජ ද්‍රෝහ වූ බසු ද මට උපද් දී. බුදුන්වක් නින්ද කෙරෙති. එ බැවින් මට ද මාගේ බුදුන්ට ද නින්ද නොවන සේ යම් සේ රජහට ඉතා නෙම වූ ආරක්ෂා වේ ද, එ සෙයින් ම අරක්ගන්මම්"යි සිතාලා සත්‍රින් නිසා පුරුෂයන්ට භය නම් නැත. සත්‍රින් පිරිවරා සුවයෙන් රජු හය නැති ව ගිය මැනැවැ'යි පන්සියක් ඇතින්නන් සඳා පන්සියක් නාවක සත්‍රිස් පිරිමි වෙස් ගන්වා, ඇතින්නන් පිටට නංවා රජ්ජුරුවන් පිරිවරා යන සේ යොට නැවත සිතන්නාහු "කෙසේ බුදුන් දුටත්, කෙසේ බණ ඇසුවත් පියරජහු මරා ආනන්තරිය කම්යෙහි යෙදුනු හෙයින් මෙ රජ මාගීඵල නො ලැබෙම ය. බුදුහු නම් සත්වයන්ගේ අධිගම් බලා බණ වදාරණ සේක ඒ කාරණයෙන් බොහෝ දෙන රැස් කොට ගෙණ ගියෙම නම් එයින් කිසි කෙණකුන්ගේ අධිගම බලා බුදුහු බණ වදාරණ සේක් ම ය. එසේ කල ඒ දෙශනාව බොහෝ දෙනාට වැඩවේයි සිතා නුවර බෙර ලවා "අද රෑ රජ්ජුරුවෝ බුදුන් දක්නට යෙති. හැම්දෙනා ම තමන් තමන්ගේ සනුමානයෙන් අවුදින් රජ්ජුරුවන්ට රැකවල් ගන්නේ ය"යි නියොග කැරවූහ,

එ කල බොහෝ ජනයෝ "අපගේ රජ අද බුදුන් දක්නට යේ ල, ඔහට බුදුන් වදාරණ ධම්දෙශනා කො බඳු දෝ යි සැණකෙළි හැර පියා හැම්දෙන ම ගඳ-මල්-පහන් ගෙණ රජ්ජුරුවන් පෙර මගට ගොස් බල බලා සිටගත්හ. එ වේලෙහි ජීවකයෝ "රජ්ජුරුවන් වහන්ස! ඇතුන් සදහලද, නික්මුන මැනැවැ"යි කීහ. එ රජ පන්සියක් ඇතින්නන් නැගී කඩු තෝමර ගත් පන්සියක් සත්‍රිසෙනාව පිරිවරා තෙමේ මඟුලැත්කඳට නැගී දහස්ගණන් මිණි දඹු වැට පහනින් හිරු නැගී කලක් මෙන්, එකාලෝක කරවා මහත් රජර්ධීන් නුවරින් පිටත් විය.

මෙසේ පක්ෂියක් සක්‍රීහු කොස්වැටි බැඳ, දසරුවෙහි කඩු ලා, මිණිදඹු තෝමර ගෙණ, රජු පිරිවර නික්මුනාහ. ඔවුන් ඉක්බිති සොළොස් දහසක් පමණ ක්ෂත්‍රිය නාටකයෝ රජු පිරිවර නික්මුනාහ. ඔවුන් ඉක්බිති කුරු කුදු කිරාතාදි දස මෙහෙ තැන් ද නික්මුනාහ. ඔවුන් ඉක්බිති ව රජගෙය රකිනා රජ්ජුරුවන්ට විශ්වාසී වූ ඇමති පෙළෙක් නික්මුනාහ ඔවුන් ඉක්බිති ව සුපිපි කිණිහිරි මාකඳයන් සේ කනකාභරණයෙන් දිලිසෙන්නා වූ සැට දහසක් පමණ මහ ඇමතියෝ නික්මුනාහ. ඔවුන් ඉක්බිති ව මඤ්ජුසක මාකඳයන් සේ නානාවර්ණ වූ අලංකාරයෙන් සෙබියා වූ විද්‍යාධර ස්ත්‍රීන් බඳු වූ අනූ දහසක් පමණ රජදරුවෝ නික්මුනාහ. ඔවුන් ඉක්බිති ව සීයක් වටනා සළු හැඳ පන්සියක් වටනා උතුරු සළු එකාස් කොට කරව දමා නහා ගඳවිලෙවුන් ගෙණ නන් විසිතුරු වූ ආභරණ හා මල්දම් පැළඳ දස දහසක් පමණ බමුණෝ දකුණත් ඔසවා භට්ටාබග කියා කියා නික්මුනාහ. ඔවුන් ඉක්බිති ව පඤ්චාඞ්ගික තූර්‍ය්‍යනාදයෙනාව සමුද්‍රඝෝෂාවක් සේ පොළොව ගුගුරනා හඬ ඇති මහා ඝෝෂා කෙරෙමින් නික්මුනාහ.

ඔවුන් ඉක්බිති ව රත්හියවුරු පිට හෙළා රන්දුනු ගත් දුනු සේනාමී නික්මුනාහ. ඔවුන් ඉක්බිති ව ඔවුනොවුන් ඇඟ ගැසි ගැසි පව්ත පෙළක් සේ ඇත් සෙනඟ නික්මුනාහ. ඔවුන් ඉක්බිති ව රළපහර දීමන්නා සේ කරින් කර පැහැර අශ්වසේනාව නික්මුනාහ ඔවුන් ඉක්බිති ව සකින් සක ගැසී රථසෙනඟ නික්මුනාහ. ඔවුන් ඉක්බිති ව උරයෙන් උර ගැසී ගැසී යන පඤ්චායුධ ගෙණ යොධසේනාව නික්මුනාහ. ඔවුන් ඉක්බිති ව තමන් තමන්ට නිසි වූ ආභරණ හා ආයුධ ගෙණ අටළොස් කුලෙහි බලපිරිස් නික්මුනාහ. යම් සේ කොළවර සිව් බලසම්පන්න දුනුවායකු උරපුරා ඇද විදපු සැරයෙක් රජු කරා නො පැමිණේ ද, එ සෙයින් ම ජීවකයෝ මේ රජසෙනඟ තුදුස් වළල්ලක් කොට සංවිධාන කොට ලා 'ඉදින් රජ්ජුරුවන්ට කිසි උපද්‍රවයෙක් වී නම් හැමදෙනාව පලමු කොට රජුට මාගේ ජීවිතය දෙමි'යි තුමූ රජහු ලඟ මහත් වූ කඩුවක් ගෙණ යන්නාහු ය. ලියවැට, මිණිදඹු වැට පහන් මේ තෙක් දහස් ගණනැ යි පමණ නැත.

මෙසේ මහත් වූ රාජානුභාවයෙන් දෙතිස් මහදොරක් හා සූසැට සුළුදොරක් ඇති ඒ රජගහා නුවර නැගෙනහිර මහවාසලින් නික්ම නුවර මහපවුර හා ගිජ්ඣකූට පර්වතය අතුරෙහි ජීවකයන් ගේ අඹඋයනට සමීප ව ගිය කල, ජීවකයන්ගේ විධානයෙන් ම බුදුන් කෙරෙහි ආදරයෙන් ඒ සා සෙනඟ කිසි අරගලයක් කළ

නො දී නිශ්ශබ්ද ව රළ නැති මුහුදක් සේ, සුළං නැති වනයක් සේ සන්හිඳී යන වේලෙහි අජාසත් රජ්ජුරුවන්ට භයෙක් උපන. කෙසේ වූ භයෙක් උපන් ද? යත්;

එක්දහස් දෙසියපණස් මහරහතන් සමගින් බුදුන් වැඩහුන් අඹ උයනෙහි නැසපියන කිබිසපියන හඬකුත් නො ඇසෙයි. ජීවකයා උපායෙන් මා තුමරින් පිටත් කොට පියා ඉදිරියෙන් බට සෙනඟක් ගෙණවුත් මා මරා තෙමෙ මේ රජය ගණිම් යි සිතී ද්‍රෝහෝ, මේ ජීවකයා නම් ඇතුන් පස්දෙකෙකුට බල ඇත්තේ ය. එසේ වූ නැනැත්තේ මහත් කඩුවක් ගෙණ මට ලං ලංව ම යෙයි. මා සමීපයෙහි සත්‍රීන් මුත් ආයුධ ගත්තා වූ එක පුරුෂයෙකුත් නැත. අද මට වූයේ ඉතා මහත් වූ හානියෙකැ යි මරණ භයින් වෙවුලා "යහළු ජීවකය! මා නොනසා"යි කීහ. එ කෙණෙහි ජීවකයෝ "මේ රජ මා සෝවාන් තියාමත්, ලේඩිල්ලකුත් නො බිඳිනා තියාවත්, අනුන් සතු ද හු වැලයකුත් නො ගන්නා තියාමත්, මාගේ මාත්‍රා නො දන්නී. මේ රජහු අශ්වසා නොලීම් නම් මරණ භයින් මියේ ද්‍රෝ හෝ"යි සිතා "මහරජ! භය නො කළ මැනැව. මාගේ බුදුන් වැඩහුන් ගන්ධමණ්ඩල මාලකයෙහි දඹුවැට පහන් දිලියෙන්නා බැලුව මැනැවැ"යි කියා අත නගා පෑහ. එ කල්හි රජ්ජු දොරටුයෙන් පිටත ම සිට ඇතුපිටින් බිමට බැස සිටියේ ය.

එ කල මාගේ සවාමිදරු වූ බුදුරජාණෝ අජාසත් රජහු තමන් වහන්සේ දක්නට එන සේ දැක, උඹ භය පත් වූ සේත් දැක, තමන් වහන්සේගේ මහා කරුණාව ඔහු කරා මෙහෙයා තමා අභිමුඛයට එන පුත් කුමරක් හට අත දිගු කොට ඔහු පිරිමදනා සේ තමන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් බුදුරස් කඳක් හැර රජුගේ ශරීරයෙහි පහළ සේක. එකෙණෙහි රජුට භය සන්හිඳී ගියෙ. බුදුන්ගේ තේජසින් රජුගේ සර්වාඞ්ගයෙහි බා සෙල්වී නත් සළු තෙමී ගියා සේ වි ය. නැවත නැවත තමා බුදුන්ට කළ අපරාධය සිහි කොට බුදුන් කෙරේ මහත් වූ භය ඇතිව, රජ බ්‍රහ්මස්ථානයෙන් නිර්භීත ව ගොස් බුදුන් දක්ත නොහී ජීවකයන් අත අල්වා ගෙණ උයනෙහි කම්‍යානන බලා ඇවිදිනා සේ "ජීවකයෙනි! නොප මේ විහාරය කැරවූ තියා යහපත. මේ පවුර යහපත. මේ පදනම යහපත. මේ මණ්ඩප යහපත, මේ පැන් පොකුණ යහපත" යනාදීන් ගුණ කිය කියා අනුක්‍රමයෙන් ගොස් ගන්ධමණ්ඩල මාලකයට වැද තරු මැද සඳ සේ සඟ පිරිස් මැද දිලියෙන බුදුන් බල බලා මා "යහළු ජීවකය! බුදුහු නම් කවුරුන් වහන්සේ ද"යි විචාළහ.

සමනරූ නො හැඳින ම විචාරන්නාහු ය. මේ අජාසත් රජ තමා ඇපා කල පියරජ්ජුරුවන් හා සමඟ ගොස් බුදුන් දුටු විරී ය. පසු ව පාපමිත්‍ර වූ දෙව්දතුගේ සහායෙන් බුදුන්ට අපරාධ කොට බුදුන් දක්නට නො ආ බව මුත් බුදුන් අඳුනේ ම ය. බුදුහු වනාහි දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ හා අසූ අනුව්‍යඤ්ජන ලක්‍ෂණයන් ඇති සේක. සවණක් රැසින් දිලියෙමින් වැඩහුන් සේක් ම ය. මේ රජ තමාගේ ඓශ්වර්‍ය්‍යයෙන් මත් ව බුදුන් හැඳින හැඳින ම "බුදුහු කොයි දැ" යි විචාළේ ය. දැන දැන ත් "මොහු කවුරු දැ" යි විචාරීම රජදරුවන්ගේ සිරිතෙක් ම ය.

ජීවකයෝ "බුදුහු කොයි දැ" යි කී බස් අසා "මේ රජ බිම සිට බිම කොයි දැ යි විචාරන්නා සේ, අහස බලා සඳු කොයි දැ යි විචාරන්නා සේ, උදය පර්වතය බලා හිරු කොයි දැ යි විචාරන්නා සේ, බුදුන් බල බලා ම සිට බුදුහු කොයි දැ යි විචාරයි. එ බැවින් මෝහට බුදුන් දක්වමි" යි සිතා ලා ඇඳිලි බැඳ සිට "මහරජ! ධර්ම මණ්ඩල යෙහි මැද මැඹව සිට ලා පැදුම් දෙස බල බලා සඟපිරිස් පිරිවරා බුද්ධාසන මැද දිලියෙන බුදුන් බලව" යි කීහ

එ වේලෙහි රජ්ජුරුවෝ බුදුන් ලඟට ගොස් බුදුන් හා රහතන් බලා මේ බඳු වූ උපශාන්ත වූ බුදු පිරිසෙක් වතැ යි සතුටින් පිණ පිණා එකාක්පස් ව සිට වාත රහිත ස්ථානයෙහි පිපී වැනී ගියා වූ රත්පියුම් වනයක් සේ, ක්‍ෂාන්ත්‍යාදි ප්‍රතිපත්තීන් නිශ්චල ව වැඩ හුන්නා වූ සඟපිරිස් දැක "සර්වාභරණයෙන් සැදී අවුත් සිටි මේ සා රජපිරිසක් එක භික්‍ෂු නමෙකු ත් සරු ඇති ව කර ඔසවා බලන කෙනෙක් නැත. හැම දෙනා වහන්සේ ම හස්තපාද චලනාදියක් නැතිව ම බුදුන්ගේ ශ්‍රී මුඛය බල බලා ම හිඳිනා සේක" යි සඞ්ඝයාගේ උපශාන්ත වූ සම්පත් දැක පැහැද ඔබ නැති විලක් සේ සන්හුන් ගුණ හා ශාන්ත වූ ඉඳුරන් ඇති මේ සඟපිරිස නැවත නැවත බල බලා මෙබඳු වූ උපශාන්ත වූ ශ්‍රී විභූතියෙන් මාගේ පුතනුවන් උදය කුමාරයන්වත් වේව" යි සිතූහ. උතුම් වූ රසයක් දැක ද, උතුම් වූ වික්‍රමයක් දැක ද, උතුම් වූ ගුණයක් දැක ද, උතුම් වූ ඓශ්වර්‍ය්‍යයක් දැක ද, උතුම් වූ රූපයක් දැක ද, මෙබඳු ශ්‍රීයක් මාගේ දරුවන්ට ද වේව යි සිතීම සියලු ලොකවාසීන්ගේ ම මත යෙක; එසේ හෙයින් රජ්ජුරුවෝත් බුදුන්ගේ ඓශ්වර්‍ය්‍යය දැක පුතනුවන් සඳහන් කළහ යි දතයුතු.

එ වේලෙහි සවාමිදරුවෝ රජු සිතු සිත දැන "මෙ රජ මා වඳින්නට භය ඇතියේ ය, මා හා සමඟ කථා කරන්නට භය ඇතියේ ය, මා මුඛයෙන් නොබිණූ කල කිසිවෙක් මා හා සමඟ කථා

කොට ගත නොහෙයි. එක වචනයෙකින් මොහුගේ භය හරවමි"යි සිතාලා තමන් වහන්සේගේ අෂ්ටාඞ්ගයෙන් ලීලෝපෙත වූ බ්‍රහ්ම නාදයෙන් රජු හා සමඟ කථා කරණ සේක් "මහරජ! පචිත මුදුනෙක වටුවා වූ වර්ෂාවෙක වතුරුදිය ගොස් මලනැනෙක මැගිරෙන්නා සේ, මාගේ ශාසනයෙහි උපන්නා වූ තාගේ ප්‍රේම නමැති වතුරු තාගේ පුතු කරා ම ගොස් මැද සිටියේ දැ"යි වදාළ සේක.

එ කෙණෙහි රජ පස්වණක් ප්‍රීතීන් පිරුණා වූ ශරීර ඇති ව 'බුදුන්ගේ ගුණ අපමණ බව දැන් ම දත්මි. මා සේ වූ බුදුන්ට අපරාධ කළාවූ බුදු ද්‍රෝහියෙක් අනික් කිසි තැනෙකත් නැත්තේ ම ය. මා විසින් බුදුන්ගේ අග්‍රඋපාසක වූ රජ්ජුරුවන්නු ත් මරණ ලද. දෙව්දත්තුගේ බසින් බුදුන් මරන්ට දුනුවායන්නු ද මෙහෙයීමි. තව ද ඔහුගේ ම බසින් බුදුන් මරන්ට නාලාගිරි ඇතු මෙහෙයීමි. මාගේ ම පිහිට බලයෙන් දෙවදත්තයා බුදුන් ඉහට ගලු ත් පෙරළි ය. මේ සා අපරාධ කළාවූ මා වැනි ද්‍රෝහියකු දැක බුදුහු ප්‍රිය කෙපුල් ම වදාරණ සේක. ඉතා ආශ්චර්‍ය්‍යය. බුදුහු අසංඛ්‍යප්‍රකාර වූ උතුම් ගුණයෙහි ම පිහිටි සේක. මෙ බඳු වූ කරුණා නිධානයක්, කරුණා ආකරයක්, කරුණා ප්‍රවාහයක්, කරුණා ගංගාවක් හැර පිය, රුවන් හැර අඟුරු ගත්තා සේ නිෂ්කාරණ වූ ආතුරයක් කරා ඇවිද් දෙමි"යි කිය කියා, සන්තාපයෙන් පිණ පිණා, රජ සිය හැර පුතු කෙරෙහි තමා ප්‍රේම ඇති පරිදි කිය කියා, බුදුන් වැඳ පෙරළී ගිය වේලෙහි සිහිල් වූ දිය විලකට වැදගිය පුරුෂයකු ගොඩ නො නැගෙන්නා සේ, නො එක් වාරයෙහි බුදුන් වැඳ, "සඟපිරිස් වඳිමි නම් බුදුන්ට පිරිපැව මැනැවැ" යි සිතා සඟපිරිස බැසනෙව නො වැද, ඇඳිලි බැඳ ආදර දක්වා අෂ්ටප්‍රකාර වූ නිෂද්‍ය දොෂයෙන් වර්ජිත ව එකත්පස් ව හිඳගත.

නිෂද්‍ය දොෂ අට නම් කවරී?යත්;

කර අඹරා බලන සේ පිටිපසුව ලා නො හිඳීම ය. දෘෂ්ටි පලා බලනසේ බ්‍රහමස්ථානයෙහි නොහිඳීම ය, දොඹන කල ඇඟට කෙළ නො ඉසෙන සේ ඉතා ලං ව නො හිඳීම ය, අඬගා කථා කරණ සේ ඉතා දුරු ව ලා නො හිඳීම ය, තමා ඇඟ ගත් සුළං බුදුන් ඇඟට යන සේ උඩුසුළඟට ව ලා නො හිඳීම ය, බුදුන් ඇඟ ගත් පවන් තමා ඇඟ ගන්නා සේ යටිසුළඟට ව ලා නො හිඳීම ය, කර ඔසවා බලන සේ උස් තෙනකට ම ලා නො හිඳීම ය, කර හෙළා බල බලා කථා කරණ සේ ඉතා වලතැනට වලා නො හිඳීම ය යන මේ අට වැදෑරුම් වූ නිෂද්‍ය දොෂ නම්. කීයේ මැනෝ:-

න පච්ඡතො න පුරතො - නපි ආසන්නදූරතො,
න කච්ඡෙ නො පටිවාතෙ - න චාපි ඔනතුන්නතෙ;
එතෙ දොසෙ විවජ්ජෙත්වා - එකමන්තනානි වුච්චති-යි

මේ නිර්දේශ අට සම් බුදුන්ට මතු නො වෙයි, සියලු උතුමියන් සමීපයෙහි හිඳ කථා කරන්නන්හු විසින් දුරු කළ යුත්තේ ම ය. එ දා මෙසේ ඒ අජාසත් රජ්ජුරුවෝ බුදුන් සමීපයෙහි එකත් පස් ව හිඳ පැන විචාරන්නට අවසර ඉල්වූහු ය. එ කල 'මහරජ තා සිතට වැටහුනු යම් පැනයක් විචාරව, මම ඒ තට කියමි"යි සර්වඥප්‍රවාරණයෙන් පැවරූ සේක.

එ කල රජ්ජුරුවෝ බුදුන් අතින් අවසර ලදින් කියන්නාහු "ස්වාමිනි! මේ ලෝකයෙහි සත්වයෝ හස්තිශිල්ප අශ්වශිල්ප රථ ශිල්පාදි නො එක් ශිල්ප නිමවා දතගෙණ, ඒ ශිල්ප බලයෙන් රජ සුව රජ මිස ඇමතියන් පහදාගෙණ ධන උපදවා ගෙණ, ඒ ධනයෙන් අඹුදරුවන් රකිති, නෑයන් මිත්‍රයන් රකිති. තුමූත් සුව විඳ රැතෙති, එම ධනයෙන් පින් කොටගෙණ පරලොවත් සුව විඳිනාහු ය. එසේ හෙයින් ශිල්ප දත්තාහට මෙ ලොවත් සුව ම ඇත; පරලොවත් සුව ම ඇත. නුඹවහන්සේගේ ශාසනයෙහි ශීල නමැති ශිල්පය හදාරා, මහණබම් පුරන්නා වූ භික්ෂූන්ට පරලොව දිව්‍ය සම්පත් බ්‍රහ්මසම්පත් මෝක්ෂසම්පත් ලැබේ ම ය, මෙ ලොව එක් වේලේ සගින් ගොපිති, දොරින් දොර පිඬු සිඟති, රුක්මුල් සුසානාදියෙහි ශීත සුළං මැසි මදුරු ආදීන් පීඩා විඳිති, හුණු කැමැති කල සිහිල් ලැබෙති, සිහිල් කැමැති කල හුණු ලැබෙති, අඹුවන් නැතියහ. දරුවන් නැතියහ, දිවිහිම්යෙන් එකලා වෙසෙති, මෙසේ මහණදම් පුරන්නාහු මෙලොව මහත් වූ දුක් ම ගණිති, පරලොව සුව විඳිති, එසේ හෙයින් නුඹවහන්සේගේ ශාසන ශිල්පය ඉගෙණ මහණත්තවුන් මෙ ලොව දී ලබන්නාවූ සුවයෙක් ඇද්දැ"යි විචාළෝය.

ඉක්බිත්තෙන් බුදුහු "මේ රජු හා සමඟ මෙ තෙනට ආ මිථ්‍යා දෘෂ්ටි ගත්තුවෝ බොහෝ, පළමුකොට උන්ගේ මානය බිඳ සන්හිඳුවා පසුව මොහුට මේ පැනය කියමි"යි සිතාලා "මහමහරජ! තා විචාළේ පැනයෙක් මය, පෙරත් මේ පැනය මහණ-බමුණන් අතින් විචාළවිරි දැ"යි වදාළ සේක. රජ්ජුරුවෝ කියන්නාහු "ස්වාමිනි! නුඹවහන්සේ අතින් නො විචාළ බව මුත් අපි බුදුම්හ, අපි බුදුම්හ යි කියා ඇවිදිනා පූරණකාශ්‍යපාදි නිමවුන් සදෙනා අතින් ම විචාළෙමි, ඔහු මේ පැනය මා විචාළ කල අන් කාගේ දැ යි විචාළ කල, ගොත් වන්නක් කාගේ ය යි කියන්නා සේ, සඳ නැං

යේ දැ යි විචාළ කල මා ආයෙ පිටි මග ය යි කියන්නා සේ "අම්බං පුට්ඨො – ලබුජං බ්‍යාකරොති" යනු හෙයින් මා විචාළ දෙය හැර පියා අතික් තමන් සිතූ සිතූ දෙයක් ම කියන්නාහු ය, එ වේලෙහි මම කිපී 'මේ කොල්ලන් මරවමි' යි සිතා 'අසුමල් රජ නමාගේ නුවරට ගිය්‍යාවූ මහණ බමුණන්ට අනාදර කෙරෙයි කියා නුගුණ සැල වේ දෝ හෝ යි යන භයින් නො මරා හැරපීමි" යි කීවාහුය. එ කෙණෙහි නො එක් ලබ්ධි ගත්තාවූ මිථ්‍යාදෘෂ්ටි නගින්ට විෂමූල් පැවා සේ' භයගෙණ නිශ්ශබ්ද වූහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ "ස්වාමීනි! මහණදම් ඵල මිට වදාළ මැනැවැ" යි කීහ.

බුදුහු වදාරණසේක් "මහරජ, තා අතින් ම විචාරමි; තාගේ එක් කීකරු වූ ගැත්තෙක් තට මෙහෙ කොට විඩා ව පියා 'මේ රජත් මිනිස, මමත් මිනිසිමි, මේ රජ දිව්‍යයකු මැනියේ ය, මහපිරිස් ඇතියේ ය, මහ රට ඇතියේ ය, පඤ්චකාමගුණයෙනුත් මෙ මී අග්‍රය, මාත් දන් පින් කොට මේ රජු හා සම වුව මැනැව, ඉදින් දිවි හිමියෙන් දන් දෙමි නම් මොහු එක දවසක් දුන් දන් සියක් වන කොටස්සයකුත් දීලිය නො හෙමි. එසේ හෙයින් දන් දී මොහු ජය ගත් නො හෙමි, මොහු දිවිහිමියෙන් දුන් දානඵලයට එක දවසක් රක්නා කළාවූ ශීල ඵල මහත, එසේ හෙයින් සිල් රක්නා කොට මෝ භව වඩා පින් රැස් කෙරෙමි'යි සිතා මාගේ සසුන් වැද මහණ ව, ශීල නමැති ශිල්පය නිමවා දූතගෙන් අපිස් සන්තොස්ව, ගුණධර්ම පුරණුයේ වී නම් එ කල තෝ වනාහි 'මාගේ අසුවල් කොල අවුදින් මට මෙහෙ කරන්නේ ය'යි කිය යි ද? නො කිය යි දැ යි විචාළ සේක රජ්ජුරුවෝ කියන්නාහු "ස්වාමීනි! ඔහට මේ කියන්නා තබා ඔහු උස ඉඳුම්ලා වඳුම්හ පුදම්හ, සිවුපසයෙන් දන් දෙම්හ"යි කීහ. මහරජ! තෝ තාගේ කොල්ලාට ඒ සා සත්කාරයක් ශීල ශිල්පයාගේ බලයෙන් කෙරෙහි නම් මෙම ජාතියෙහි ඔහු සුව විඳිනේ වේ දැ යි වදාළ සේක.

රජ්ජුරුවෝ ස්වාමීනි! මෙ ම ජාතියෙහි ඔහු විඳිනා සුව ම ය," යි කියා තුන්ශලක් සාධුකාර දී "ස්වාමීනි! මෙම ජන්මයෙහි අතික් සුවයක් ම හා දුක්විය හෙද්දැ" යි විචාළහ. බුදුහු "මහරජ! ඒ පැනයක් තා ම විචාරමි. තාගේ කිරියක් සාකා ගොවියෙක් තට උපය විඩා ව පියා එසේම තා කෙරෙහි අභිමානකොට මාගේ සසුනයෙහි මහණව සිල්වත් ව ගුණ පුරා නම් එ කල තෝ 'මාගේ අසුවල් ගොවියා අසුවල් කිරිය සානේ, කිරිය සා මට වී දෙන්නේ' ය යි කියා එලවයි ද? නො එලවයිදැ" යි විචාළ සේක. රජ්ජුරුවෝ කියන්නාහු "ස්වාමීනි! ඔහු අතින් වී එලවන්නා තබා ඔහට අපගේ වීත් දන් දෙම්හ.

වඳුම්හ, පුදම්හ, සත්කාර කරම්හ”යි කීහ. “මහරජ! මාගේ සසුන් වන්නවුන් මේම ජාතියෙහි විඳිනා මෙයින් එක් සුවයෙක් වේ දැ”යි වදාළසේක.

රජ්ජුරුවෝ “එකාන්තයෙන් මීට වඩා සුව විඳිමෙක් නැතැ”යි සන්තුෂ්ට ව තුන් යලක් සාධුකාර දී “තවද, ස්වාමීනි, පැවිදි වූවන් මෙම ජාතියෙහි විඳිනා සුව ඇද්දැ?”යි විචාළහ. ඉක්බිත්තෙන් බුදුරජාණෝ “ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මා සම්බුද්ධො” යි යනාදීන් ක්‍රමයෙන් බුද්ධෝත්පාදයෙහි පටන් ගෙණ අර්හත්ඵලය කෙළවර කොට ආකාශගඞ්ගාව ගෙණ හැර දක්වන්නා සේ බණ දෙශනා කොට “මහරජ! මෙම ජාතියෙහි විඳිනා ශ්‍රාමණ්‍යඵලයට වඩා අනික් උතුම් ඵලයක් මේ ලොකයෙහි නැතැ”යි වදාළ සේක. ඒ අජාසත් රජ්ජුරුවන් පැන විචාළ පරිදිත් බුදුන් විසඳූ පරිදිත්, දික්සඟියෙහි ශ්‍රාමණ්‍යඵලසූත්‍රදෙශනාව කළ පරිද්දෙන් බලා දතයුතු.

එ දා රජ්ජුරුවෝ නැමත නැමත සාධුකාර පූජා කොට කොට ඇදි මිථ්‍යාවසානය සකස් කොට බණ අසා “ස්වාමිදරුවාණෙනි! මෙතෙක් දවස් බොහෝ මහණ බමුණන් දැක දවසෙක පැර සාලැවක් නො ලබන්නා සේ සාරත්වයක් නො ලද්දෙමි. නුඹවහන් සේගේ ගුණ සම්පත්තිය ඉතා මහත. පහන් දහසක් ආලෝක කරන්නා සේ මාගේ නුමණපනත ඉතා ප්‍රසන්න කොට වදාළ සේක. අද වනාහි අමා පිරූ කළයක් සේ නුඹවහන්සේගේ ගුණ පිරුණා වූ ශරීර ඇතියෙම් බොහෝ දවසක් සැඟවී තුබූ නිධාන වස්තුවක් මට පැවා වැනියේය. අඳුරු ගෙයක ප්‍රදීප සහස්‍රයක් දල්වූවා වැනිසේක. මුණින් හමා තුබූ වස්තුවක් මතු බලා තුබූවා වැනි සේක, අද පටන් ජීවිතය හරිම් නමුත් නුඹුරුවන් සරණ නො හරිමි. ඉදින් යමෙක් සියුම් වූ කඩුවකින් හිස සපා නමුත් බුදුන් නො බුදුහැ යි නො කියමි. දහම් නො දහමැ යි නො කියමි. දූන් ම මා නුඹවහන්සේගේ සරණ ගිය බවත්, අද පටන් උපාසක වූ බවත් නුඹවහන්සේට මා කප්පියකාර වූ බවත්, දූන වදාළ මැනව. අද පටන් මාගේ මේ තුන්සියක් යොදුන් අඟුම්ගඩ දෙරට හා රජගහා නුවර මෙ නැම රජසැපත නුඹුරුවන් විෂයෙහි දන පරිත්‍යාගයෙව පූජා කෙළෙමි” යනාදීන් කියකියා “මා කළ වරද ක්ෂමා කළ මැනැවැ”යි දෙහොත මුදුනෙහි තබාගෙණ බුද්ධදර්ශනයට විෂය නාක් නැත් බුදුන්ට පිටි නො පෑ පසු බැස බැස ගොස් දර්ශනාවසානයෙහි සිට තුන් යලක් පසඟ පිහිටුවා වැඳලා සතුති කොට කොට රජගෙට ගියෝ ය.

රජ්ජුරුවන් ගියකල බුදුහු "මහණෙනි! මේ රජ ඉදින් පිතෘඝාත කර්මය නො කෙළේ වී නම්, අද ම සෝවාන් වෙයි. පවිටු වූ මිත්‍රයන්ගේ සංසර්ග දෝෂයෙන් ඒ සා සැපතක් නො ලද්දේ ය. එතෙකුදු වුවත් අද මා කරා එළඹ මා කෙරෙහි ප්‍රීති උපදවා තුණුරුවන් සරණ පිහිටියේ ය. ඒ පිණිස් යම් සේ රාජද්‍රෝහ කළ පුරුෂයෙක් ළුල අත්නා වරද ඇතිවත්, රජහුගේ ප්‍රසාදයෙන් මස්සක් පමණ දඬ දී ඒ ද්‍රෝහයෙන් ගැලවේ ද, එ සෙයින් ම මේ රජත් අවීචි මහා නරකයෙහි නො වැටී මිඳ පච් ගලවුන් ගෙන ලෝකුම්බු නරකයෙහි වැටී තිස් දහසක් හවුරුද්දෙන් සැළ පත්ලට බැස තිස් දහසක් හවුරුද්දෙන් සැළ මුවවිටට නැගී එයින් ගැලවී දැන් කළ සත්කාර බලයෙන් කප්ලක්ෂයක් දිව්‍යලෝක මනුෂ්‍යලෝක සම්පත් විඳ මතු විජිතසේන නම් පසේබුදු ව සසරින් ගැළවෙන්නේ වේ දැ"යි වදාළ සේක.

ලොවුතුරා බුදුන් උපදනා කල්පෙක මුත් පසේබුදුන් චක්‍රවර්ති රජුන් නො උපදනා හෙයින් "මේ අජාසත් රජ්ජුරුවන් දෙවදත්තයන් සුමන නම් මාලාකාරයන් බුදුන් මුහුණ සතුටින් බැලූ බකමුහුණා ආදීවූ සතුන් කප්ලක්ෂයකින් මත්තෙහි පසේ බුදු වෙති"යි බුදුන් ම වදාළ හෙයින් එ කප ලොවුතුරා බුදුකෙනෙකුන් නූපදීමට කාරණ ය යි එකාන්තයෙන් දතයුතු.

ඒ අජාසත් රජ්ජුරුවෝ පියරජහු මැරූතැන් පටන් ගෙණ රෑ දවල් නින්දක් නො ලබන්නාහු බුදුන් අතින් බණ අසා උපන් සන්තොෂයෙහි පටන් ගෙණ සුව සේ ම නිදි ලබන්නාහ. දිවි පමණින් තුණුරුවන් අරභයා බොහෝ ධන පරිත්‍යාග කොට මහත් වූ පූජා කළාහු ය. පෙර බුදුන් පිරිවන්ව සඟාය ට ඇවිදි රජ බුදුන් දුටු තැන් පටන් "බුදුහු පිරිනිවන් පෑසේක්දැයි යන බසක් පමණ ඉදින් ඇසී නම්, මේ රජ ද එබස හා සමග බුදුන් කෙරෙහි ප්‍රේම ධරාගත නො හී ඒකාන්තයෙන් මියන්නේ ම ය"යි ලෝමැසියන් ලවා සිතමාපී ය. මෙ බුදුසස්නෙහි පෘථග්ජන සැදෑ ලදුවන් කෙරෙන් මේ රජහට වඩා බුදුන් කෙරේ ප්‍රේම ඇතියෙක්, මොහුට වඩා බුදුන් නො දක ගතෘ වහතුයෙක්, අතික් කිසි තැනෙකත් නැත් මී ය, මෙසේ 'දිවි යේ නමුත් තුණුරුවන් සරණ නො හරිමි'යි බුදුන් පෙරට ව සිට එ රජහු කී හෙයින් තමාගේ ජීවිතය බුදුන්ට පිදූ නම.

මෙසේ වැදූ පියහු මරා පියත තරම් යක්ෂයන් සේ දැඩි වූ, දරුණු වූ, අජාසත් රජහු වැන්නවුන් එක වචන මාත්‍රාවෙන් දමා බණ ඇදුරු, එකෙණෙහි ඔහුගෙන් ජීවිත පූජා ලත් හෙයිනුත්, ඔහු දිවි

පමණින් අප්‍රමාණ ධනයෙන් කරණලද අප්‍රමාණ පූජා ලත් හෙයිනුත්, මෙසේ මෙසේ වූ, අද්භූත වූ, පූජා විඳීමට සුදුසු හෙයිනුත්, දිව්‍ය-බ්‍රහ්ම-නාගරාජයන්ගේ මුදුනෙහි තබනා ශ්‍රීපාද ඇති මාගේ ස්වාමිදරු වූ ත්‍රිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ මේ කාරණයෙනු දු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලදුයේ මැයි:-

"පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං"ති.

මේ පූජාවලියෙහි

ජීවකාරාමයෙහි දී අප බුදුන්ට අජාසත් රජුගෙන් ලද

ජීවිකාදී පූජා කථා නම් වූ

තිස් වන පරිච්ඡේදය නිමි.

එක්තිස් වන පරිච්ඡේදය.

තව ද: අප බුදුන් රජගහා නුවර දී යශෝධරාමහාථෙරින් ගෙන් ලද ප්‍රාතිහාර්‍ය්‍යාදි ප්‍රතිපත්ති පූජා කථා නම් කවර? යත්:-

මේ එහි පිළිවෙළ කථාම ය. සත්පුරුෂ වූ ස්ත්‍රී පුරුෂයන් විසින් සාවධාන ව කන් නමා ඇසිය යුතු.

ඒ යශෝධරාදේවී නම් අප බුදුන්ට සංසාරයෙහි දු ඔබගේ පාරමිතා නමැති මහලියයට උදකසේතුවක් සේ අනුබල ව ආ කෙනෙක. ඔහු තුමූ මෙසේ සංසාරයෙහි දු ඔබ හා සමඟ අවුත් කෙළවර වෙස්සන්තර ජාතියෙහි දත් පැරුම් කුළු ගන්වාලා ඔබ හා සමඟ ම ගොස් තුසීපුරයෙහි ඉපැද බොහෝ කලක් එක් ව දිව්‍ය සම්පත් විඳ ඔබ සුදොවුන් රජාතන් නිසා මහාමායා දෙවින් කුස පිළිසඳ ගත් වේලෙහි එම ඇසළමැදිපොහෝ ලද උතුරාසළ නකතින් තුමූ ද තුසීපුරයෙන් සැව අවුත් කොළිය නුවර මහාමායා දේවින් බෑනන් සුප්‍රබුද්ධ රජ්ජුරුවන් නිසා, සුදොවුන් රජාතන් නැඟනියන් අමිතා නම් බිසොවුන් කුස පිළිසඳ බුදුන් හා සමයේම දෙතිස් මහා පූර්වනිමිත්ත නම් අද්භූත වූ ප්‍රතිසන්ධි පූජාවන් ලදින්, ඔබ සේ ම ගබ්පෙරහර මඟුල් ලදින්, බුදුන් උපන් වෛශාඛ යොගයෙන් ම එම විගස ම තුමූ ද මවුකුසින් බිහි ව බුදුන් සේ ම ප්‍රසව මංගල පූජා ලදහ.

එකල ශුද්ධෝදන රජ්ජුරුවෝ කාලදේවල නමස්කාරයෙහි පුත්නුවන් වහන්සේ බුදු හෝ සක්විතිරජ හෝ වන මහ පින් ඇති බව දැන "ම පුතනුවන් හා එක වේලෙහි උපන් පින්මත් කෙනෙක් කවුරු දෝ හෝ"යි පරීක්ෂා කරන්නාහු, ඒ එක දඹදිව තබා අනන්තාපරියන්ත වූ සක්වළ දිව්‍යලෝකමනුෂ්‍යලෝකවල ද බුදුන් හා එක වේලෙහි ප්‍රතිසන්ධියක් වේව යි, උත්පත්තියක් වේව යි, චුත වීමක් වේව යි, නො වන්නා එකාන්ත ධර්මතාවක් බැවින් අතික් කිසි සත්ත්ව කෙනකුන් නො දැක තමන් නෑගැතියන් දියණිකෙනකුන් එ විගස ම ලද බව අසා ඉතා විස්මිත පත් ව "එකාන්තයෙන් ම පුතනුවෝ මහ පින්වත්හ. උන් හා එක වේලෙහි උපන් ස්ත්‍රියක නම් උන් හිඳා ම උපන මැනැව. මට ගෙහෙළි ව උපන් හෙයිනු දු ම පුතනුවන්ට ම භාර වන භාග්‍යාධිකම වුව මැනැව. එසේ හෙයින් එසේ මෙසේ අල්ප එකෙක නො වුව මැනැව. ම පුතනුවන් හා සම සම ව පින් රැස් කොට ආ මහ පින්වතක වුව මැනැ වැ"යි සෞභාග්‍යවතියක් කෙරෙහි මහ පෙම් බැඳ බුදුන්ට කිරිමවුන් තෝරණ සමයෙහි ඔවුන්ට ද උතුම් උතුම් වූ කිරිමවුන් තෝරා යවා එ තැන් පටන් සියලු මඟුල් ම බුදුන් සමසමයෙහි එකී එකී වේලෙහි ම කරවා ගෙනෙළ්ළීයනු දු මහ පෙළහරින් වැඩූහ.

එ කල ඔහු බිම්බරූපයක් බඳු වූ රූපශ්‍රී ඇති වූහ. එසේ හෙයින් බිම්බා නම් ලදහ. තමන් උපන් ගෙයි පහන් නො කැමින බරම් දිව්‍ය සමාන ශරීරප්‍රභා ඇතියහ. පඤ්චකල්‍යාණයෙන් කල්‍යාණවූ රූපශ්‍රී ඇතියහ. බුදුන්ට අනුවූ ලක්ෂණ සම්පත් ඇතියහ. මුළු දඹදිව් තෙලෙසි ඔවුන්ට වඩනා ස්ත්‍රීරත්නයෙක් නැත. මෙසේ බෝසතුනු දු, ඔවුනු දු, සොළොස් ඇවිරිදි වයස් වූ කල ශුද්ධෝදන රජ්ජුරුවෝ "ම පුතනුවන් කාමබන්ධයෙන් බැඳ තපසට යා නො දෙමි යි, සක්විති රජ කරවමි යි, මේ ගෙහෙළි එ කල ස්ත්‍රීරත්න වන්නී ය' යි කියා මහත් වූ මඟුල් කොට බිම්බා දේවීන් සරණ පාවා දී බෝසතුන් හා දෙදෙනා ම එක වේලෙහි ම ඔටුනු පලඳවා අභිෂෙක කොට රාජ්‍යය පුරුදු කරවූහ එ තැන් පටන් ඔහු සයානුලක්ෂයක් ස්ත්‍රීසේනාවට අධිපති ව, බෝසතුන්ට අග මෙහෙසි ව මහ වඩා වැස පද්මයට පැමිණි ශ්‍රීකාන්තාව සේ ශ්‍රීසම්පත් වුන්හ

පසු ව තමනු දු, බෝසතුනු දු, එකුන් තිස් හැවිරිදි වූ කල මහත් වූ යස පිරිවර ධරණ හෙයින් යශෝධරා දේවී ය යි දඹදිව දෙමින නමින් ප්‍රසිද්ධ වූ කල රාහුල නම් පුතනුවන් වහන්සේ තමන් වැදූ දවස් ය ම කී ක්‍රමයෙන් බුදුන් මහභිනික්මන් කොට අනෝමා නම් ගංතෙර දී පැවිදි වූ දවස් ම තුමූ ද "ඔබ හළු සැපත් හැර මම ද වල්

ගොස් තපස් කෙරෙමි"යි උත්සාහ කළහ. එකල ශුද්ධෝදන රජ්ජුරුවෝ යෙහෙළිනියන් කෙරෙහි මහත් වූ අනුකම්පායෙනු දූ පුතනුවන් වහන්සේ දෙවනු ව රාජ්‍යයට ගෙන්වා ගණිමි යි යන සිතිනුදු යෙහෙළිතියන් තපසට යා නො දී, උනුදු තමන්ව සොරා ම පලා යෙති යි බෝසතුන්ට කළා සේ ම නුවර සිසාරා යොදනක් මාතයෙහි සන්නාහයකින් වැසුවා සේ, ඇත් අස් රථ දුනුවායන් සිටුවා රකවල් ලා නුවර සේම කරවූහ ස්ත්‍රියකට මෙ සා ම තරයේ රකවල් ලවන්ට කාරණ කිම්? යත්:- අතික් කාරණයකුදු ඇත. යශෝධරාවෝ නම් දඹදිව් තලෙහි අග්‍ර වූ රූපසම්පත්ති ඇත්තහ. එසේ හෙයින් ම පුතනුවන් තපසට ගිය බව් අසා දඹදිව බොහෝ රජදරුවෝ ඔවුන් ප්‍රාර්ථනා කරන්නාහු බලයෙන් ගෙණ යම්හයි ඉදින් ආ හොතොත් ඇත් සමූන් කුම්කින් කුමක් වේ දෝ හෝ'යි සැක සිත් ඇති ව රකවල් ලැවූහ යි දතයුතු.

එ කල යශෝධරා දේවී "මා තපසට යා නො දෙන පසු උන් වහන්සේ මගේ බඹ පිරිමෙත් විඳිනා යම් ම දුකෙක් ඇත් නම් මම මේ රජගෙයි දී ම දුක් විඳ, ඔබට ම පක්ෂපාත නම් කෙරෙමි"යි සිතා මිනිසුන් ගමා බුදුන් දවස් යවන ලෙස් නියම දන්නාහු ඔබ ගෙසෙස් සැපූ බව මගෙණ වූ බව, පිඬු සිඟා ජීවත් වන ලෙස්, මිනිතිකා භාජනයෙන් අනුභව කරණ ලෙස්, එක් වේලේ වළඳන ලෙස්, උසසුන් මහඅස්නෝ නො සැතපෙන ලෙස් ද අසා උපන් මහත් වූ කාම්පා ඇති ව "එහා රජගෙයි බොහෝ දවසක් ශ්‍රීසම්පත් විඳ උන් වහන්සේ ඒ හැර දූත් මේ සා දුකක් විඳින්නේ මතු වන වැඩක් උදෙසා ම ය ඔබට මිතු වන වැඩක් මිට ද වී නම් යෙහෙක"යි සිතා තුමූ ද කෙස් වැටිය කපා හැර කාෂාය වස්ත්‍ර ධරා, මැටි පාත්‍රයෙන් කා එක්වේලේ සයින් තෙව උසසුන් මහඅස්නේ නො සැතපි, නීවාසකවල ම හැතපි, බුදුන් දක්නා සත් අවුරුද්ද මුළුල්ලෙහි තුමූ ද නො එක් ව්‍යසන ගෙණ, ඔබට අනු වූ ගුණයෙන් ප්‍රතිපත්ති පූජා කළහ. පසු ම බුදුන් ලොවුතුරා බුදු ව, යට කී ක්‍රමයෙන් පළමු වන ගම්කෙහිබන්ධු සංග්‍රහය නිසා කිඹුල්වත් නුවර වැඩි දෙ වන දවස් වළඳා අනානයෙහි තමන්ගේ රජගෙට වැඩ තමන් ඔබගේ ශ්‍රීපාද ගොප්මිස දක්වා අල්වා මහ හඬින් හඬා එකත් පස් ව හුන් වේලෙහි පියම්හරජ්ජුරුවන්ට උපන් සැක හා තමන්ට උපන් භය සන්හිඳුවනු සඳහා චන්දකින්නර ජාතකයෙන් බණ වදරා;

"උපකාරී ච යා නාරී – සමානා ච සුඛේ දුඛේ
අත්ථක්ඛායී ච යා නාරී – සුනඛී චානුකම්පිකා,
එවං ධම්මම සුවිණ්ණානං – සදා සධම්මචාරිනං
ධම්මචාරී සුඛං සෙති – අස්මිං ලෝකෙ පරම්හි ච"යි.

යනාදීන් මුව නො පොහොනා සේ බුදුන් තමන්ගේ ගුණ වදුරා එක් ලක්ෂ සැටදහසක් බන්ධුසේනාව සාධුකාර දෙමාපු දවස් තුමූ ද මහත් වූ සන්තොෂයෙන් පිණා එ දවස්හු දූ මහණ වනු කැමැති වූ හ. භික්ෂුණී ශාසනයට ඔබ පළමු ව මහණ නො කළ මනා හෙයිනුත්, ඒ සථානාන්තරය තුළ මැතියන් වහන්සේ ම ලදමනා හෙයිනුත් බුදුහු නො ඉවසා වදාළ සේක. මහිල්රජ්ජුරුවෝ ද නැවතුන පසු ව සත්වන දවස් රාහුල නම් පුතනුවන් වහන්සේ සර්වාභරණයෙන් සරහා නරසිහ ගාථා උගන්වා "තොප පියානන් වහන්සේ අතින්, පුතණුවෙනි! දායාද සම්පත් ඉල්වා ගන්න" යි බුදුන් සිකා වඩනා රජවීථියට යවූ දවස් "බුදුන් වෙහෙරට ගෙණ ගොස් ඔබ මහණ කරවා ගත්හ" යි අසා උපන් මහත් වූ දරු සෙනහයෙන් සෝදුක් ඉවසාගත නො හී "මෙ බැවින් ම පුතනුවන් ද මට නොදී උදුරා ම ගත් බැවින් මම ද ගිහිගෙයි නො වෙසෙමි; මහණ වෙමි" යි සාහසික වූහ.

එ බව් අසා මහිල් රජ්ජුරුවෝ යසෙහෙළිනියන්ගේ රජගෙට ගොස් "යසෙහෙළිනි! එ දවස් වදාළ වෙසසන්තර ජාතකයෙහි තොප වැදූ දරුවන් බමුණාව බැඳ දුන් කල පවා තොප ඉවසූ ලෙස් නො ඇසූ ද, තොප එ දවස් මෙම ගෙයි දී වදාළ බණෙහි තොප වැදූ දරුවන් ම යාචකයන්ට බැඳ දුන් වැල් පමණක් රැස් කරන්නාන් මෙර පරයා සිටිනා ලෙස් නො ඇසූ ද? කිසි කලෙක ත් තොප දෙමියසක් නුවූහ යි වදාළ බස් නො ඇසූ ද, දූන් උන්වහන්සේ ලොවුතුරා බුදු ව මා ඇතුළු වූ මුළුලෝවාසීන් දරු කොට ගත් සම්යෙහි තමන්වහන්සේ ම වදා ගත්, තමන් වහන්සේගේ ම, පුතනුවන් මහණ කරවා ගනුයේ කවර වරදෙකැ යි කියමෝ ද, උන් මහණ කැරවූහ යි අසා මම ඔබට කිපී ගොස් ඔබ අතින් බණ අසා උපන් සන්තොෂයෙන්, යසෙහෙළිය, තොප අතික් දරු කෙනෙකුන් නො වැදූ හෙයින් ම ය, මාගේ එ වැනි අතික් මුනුබුරු රුවනක් නැති හෙයින් ම ය, උනු දූ ඔබ කෙරෙහි මහණ කරවා පියනු කැමැති වීමි. අද තෙපි ද ඔබ අතින් බණ ඇසූ කල්හි එ පුතනුවන් සඳා අතික් පුතනු කෙනෙකුන් මා නො ලද සේ ය යි සිතනුවූ ම ය. පෙර බොහෝ දරුවන් ඔබට වදා දී, බොහෝ දරුවන් දන් දෙමාපු තැනැත්තන් දූන් එක පුතනුවන් නිවන් සුව විඳිනට තමන්වහන්සේ කරා ගෙණ ගත්හ යි තොප දොම්නස් වන සේ, සෝක කරණ සේ, ඉතා නො යෙදෙයි. ඒ තොප වැනියන්ට සුදුස්සෙක් නො වෙයි. බුදුහු තොප පුතනුවන්ට උතුම් වූ වැඩක් ම කළහ දූන් තොප පුතනුවන් සුන්දර වූ මහණ වෙසක් ගෙණ පියානන්

වහන්සේ ළඟ සඳට අනු වූ නකත් තරුවක් සේ සිටිනා ලෙස් දුටු නම් මේ ලෝකයෙහි දරු ලදුවාතට අනික් එ බඳු සතුටෙක් නැත. මෙතැන්හි දී, යශෝහළි තෙපි මහණ වූ නම් තොපගේ සැදෑහැයෙක් නො පැණෙයි. තොප දරු ශෝකයෙන් ම මහණ වූවා සේ ලෝ වැසියෝ තොප හෙළා දක්නාහ. මේ ආදි කාරණයෙන් මෙ තැන්හි මහණ නො වව"යි කියා නො එක් කාරණයෙන් ගිවිස්සා රැඳවූහ.

පසු ව ශ්‍රී මසිල් රජ්ජුරුවන් දලපුබුලේසතින් යුක්ත වූ යහනෙහි වැදහොව අමාමහ නිවන් දැක පිරිනිවන් පෑ සමයෙහි "මෙවිව මහණ වෙමි"යි උත්සාහ කළහ. එ කල මහාප්‍රජාපතීගෝතමී නම් වූ නැන්දනියන් වහන්සේ "පුතණුව! මා වැනි මවුන් පවා තුන්වාරයක් යාච්ඤා කොටත් ස්ත්‍රීන්ට පැවිදි නුදුන් සේක. තොප බුදුන් බුදු වූ දා කබා ඔබ ගිහිගෙයි වසන කල පවා, තොප අග මෙහෙසින් ව වැස ඔබ කෙරෙහි ඉතා වල්ලභ සමයෙහි පවා ඔබ පෙරට සිටි භය ලජ්ජාවෙන් පුරා බස් දෙකකුත් කියා ගත නො හෙව. දැන් ඔබ අයින් පැවිදි ඉල්වා ගැන්ම තොප වැනියන්ට බැරි ය. තව ද මම් ම ගොස් පැවිදි ඉල්වා බලමි. පැවිදි ලදිම් නම් මා මහණ වූ දවසෙක තෙපි මහණ වව"යි නැවතූ දූ ය. පසු ව ඒ මහාප්‍රජාපතී ගෝතමීන් වහන්සේ යව කී ක්‍රමයෙන් බුදුන් කරා ගොස් මෙහෙණී සස්න අනුදන්වා ගෙණ මහණ ව අමාමහ නිවන් දැක බුදුසසුන් ශොබවා විශාලාමහනුවර වැස ලෝවැඩ සසුන් වැඩ කරණ සේක.

එ කලට බුදුන්ගේ පිරිවර හා තුන්පාය හා තළුපිරිස් ඇතුළුවූ සියලු රජසැපත ය, මහාමායා දේවීන් වහන්සේගේ සියලු ඓශ්වර්ය්‍ය සම්පත්තිය, සුද්ධෝදන රජ්ජුරුවන්ගේ සියලු ඓශ්වර්ය්‍ය හා රාජ්‍ය සම්පත්ති ය, නන්ද රාහුල දෙදෙනාට හිමි ව තුබූ සැපතය, දෙව්දත් කුමාරයන් තමන්ගේ බෑනනන් නැරපියා ගිය ලක්ෂගණන් පරිවාර ජනයන් හා රජ සැපත ය, පියානන් සුප්‍රබුද්ධ රජ්ජුරුවන්ගේ සියලු සම්පත්තිය ය, මහා ප්‍රජාපතී ගෝතමීන් වහන්සේගේ සියලු ඓශ්වර්ය්‍යය හා සියලු සම්පත්තිය ය, යන මේ සියලු පරිවාර ජනයන් හා සියලු සම්පත් මහමුහුදට වදනා ගංගාප්‍රවාහයක් සේ ඒ යශෝධරා දේවීන්වහන්සේ කරා පැමිණියේ ය. මහ මේරුව ගලා සිටිනා මහාසමුද්‍රය සේ ඒ සා මහත් සම්පත්තිභාරයක් උසුලන් නාහු, ඒ සා සැපත තමන් ග්‍රීවයෙහි බැඳි අහිකුණපයක් කොටය නො සිතා පඞ්කයෙන් ඉපැද පඞ්කයෙහි අමිශ්‍රවූ පදුම්රජයක්හු සේ, දියෙහි තිබී දිය හා එක් නො වන පියුම්පතක් සේ, තුඹු ද සම

පත් හා එක් නො ව ලොහානු අහසට පොළොව සේ දුරින් දුරු කොට බුදුන් හා වියෝගශෝකය හා පුතනුවන් වහන්සේ එක් වත් නො දක්නා ශෝකය හා මේ දෙ ශෝක භාරය පමණක් බරා ගත නො හී "සත්හැවිරිදි ම පුතනුවන් රහල්කුමරුවන් වැනියන් බුදුන් කරා ගොස් දූත් මහණ බම පුරණ කල එකලා වූ මා වැනියන්ට මේ සම්පත්තියෙන් කම් නැත. එහෙයින් ගොස් මම ද මහණ වෙමි ම ය"යි අධිෂ්ඨාන කොට බෝසතාණන් කෙරෙහි ඉතා මල්ලෙහ වූ දහසක් පමණ බිසෝවරුන් ද ගිවිස්වා ගෙණ ඒ දහසක් සත්‍රීහු ද පිරිවරා කිඹුල්වත් පුරයෙන් නික්මුනුදැ ය.

එ කෙණෙහි ශාක්‍ය කෝලිය දෙ නුවර වැසි ගිගුම් ගත් දෙමුහු දක් සේ හැලල දෙනුවර වාසීහු පෙරමයට අවුත් නො එක් ප්‍රකාර යෙන් යාච්ඤා කොට රඳවාගත නො හී "දේවීනි! නුඹ එකාන්ත යෙන් නො රඳනන බැවින් බුදුරජානන් වහන්සේ පවා අශ්ව යානා මෙන් මහාභිනික්මන් කළ සේක. නුඹවහන්සේ ද කෙළ කොමල වූ ශ්‍රීපාදයට දුක් නො දී යානා නැගී වැඩිය මැනවැ"යි කිය කියා හිරි මඬුලු සඳමඬුලු සේ රන් රිදී කම්මාන්තයෙන් දිලිහෙන රථ දහ සක් ගෙණ අවුදින් පෙරමිග පිළිවෙළින් තබා "අපගේ රථයෙන් වැඩිය මැනැවි. අපගේ රථයෙන් වැඩිය මැනව" යි ආරාධනා කළහ.

එ කල උන්වහන්සේ දහසක් බිසෝවරුන් බලා "නගිනි! අප ඓශ්වර්ය සම්පත් හැර පැවිදි වන්නට යනුවන් රථ නැගී අලඞ්කාර පිටින් යාම නපුරට අංග නො වෙයි. අප බුදුහු රාජ්‍යවාසීන්ට ශෝරා යන හෙයින් මහණ වන දවස් අශ්වානීකයෙන් නැගී වැඩිසේක. එසේත් අනෝමා නම් ගංතෙර දී අසුපිටින් බට තැන් පටන් සතවුරුද්දක් මුළුල්ලෙහි පාදම්‍යසනයෙන් මැ ඇවිද දූන් තුන්ලෝ මුදුන්පත් සේක. එසේ ම අපි ද පයින් ම යම්හ"යි කියා රථ නො නැගී ඔවුන් දහසක් දෙනා පිරිවරා මහත් වූ විනීයෙන් එකුන් පණස් යොදුන් මඟ ගෙවා ගොස් විශාලා මහනුවර වැද මහාප්‍රජාපතී ගෝතමීන් වහන්සේ දක ආ පවත් කියා. උන් වහන්සේ කෙරේ මහණ ව ගෙණ උභතෝ සඞ්ඝයා කෙරෙහි උපසම්පදා ව ලදමනා හෙයින් තමන් වහන්සේගේ දහසක් භික්ෂුණීනු ද අවශෙෂ වූ බොහෝ ශ්‍රාවිකාවන් ද ගෙණ 'බුදුන්ගේ අදහස් කුමක් බවුත් නො දනිමි මා කැඳවාගෙණ ගොස් බුදුන් හා ම පුතනුවන් මට දක්වා වදාළ මැනවැ"යි මහාප්‍රජාපතී සළුවිරීන් වහන්සේට කියා ඔබ ද කැඳවා ගෙණ සැවැත් නුවර බලා නික්මුනු සේක. එ තෙපුල් ඇසූ දඹදිව් නොයෙක් ශ්‍රද්ධාවන්තයෝ මල් සුවඳ ධවජපතාකාදී

නො එක් පූජාභාණ්ඩ ගෙණ ඔවුනොවුන් පරයා දිව දිව දවසින් දවස මහත් වූ සත්කාර කෙරෙමින් යොදනින් යොදනෙහි සතප මින් ගමින් ගම මහ දන් වතුරු කෙරෙමින් වඩාගෙණ යන්නාහ.

එ කල මහා ප්‍රජාපතී ස්ථවිරීන් වහන්සේ ඔබ කැදවා ගෙණ ගොස් බුදුන් දක්වා ඔබ ආ ලෙස, මහණ වූ ලෙස බුදුන්ට දන්වූ සේක. එ කල රාහුලමාතාවන් වහන්සේ ද බුදුන් වැද එකත්පස් ව හුන්සේක.

එ වේලෙහි ස්වාමිදරුවෝ ඔබගේ වීර්‍ය වඩනා සේ, ඔබගේ නො එක් ගුණ සමූහයන් මුව නො පොහොනා සේ වදාරා, උභතො සංඝයා කෙරෙහි උපසම්පදා කරවා ඔබට සුදුසු කම්ස්ථාන උගන්වා "රාහුල මාතාමෙනි! බුද්ධොත්පාද දුර්ලභ ය, ක්ෂණසම්පත්තිය දුර්ලභ ය, බුද්ධ දර්ශනය දුර්ලභ ය, මනුෂ්‍යත්මභාවය දුර්ලභ ය, ප්‍රව්‍රජ්‍යා දුර්ලභ ය, සද්ධර්ම ශ්‍රවණ දුර්ලභ ය, අප්‍රමත්ත ව ත්‍රිවිධ වූ ශික්ෂාවන් සම්පාදනය කරව"යි යනාදි වශයෙන් අවවාද කොට දුන් සේක. එ කල උන්වහන්සේ විදර්ශනා වඩා දෙපෝයක් ඇතුළත රහත් ව විශාඛාදි ශ්‍රද්ධාවන්තයන් විසින් කරවා පිළිගන්වන ලද මෙහෙණවරෙක වාසය කරණ සේක.

එ කල එක් වේලෙක ගොස් බුදුන් දැක වැද බණ අසා එන සේක. එක් වේලෙක ගොස් පුතනුවන් වහන්සේ විචාරා එන සේක. සමහර දවසෙක රාහුල සාමණේරයන් වහන්සේ ගොස් මෑනියන් වහන්සේගේ සුවදුක් විචාරා එන සේක. එ කල උන් වහන්සේ මහණ වූ පවත් අසා දඹදිව බොහෝ ශ්‍රද්ධාවන්ත වූ රජ බමුණු වෙළෙඳ ගොවි ස්ත්‍රී පුරුෂයෝ සියගණන් ගැල් පුරා නො එක් දනෝපකරණ ගෙණ මහමුහුදට වදනා ගංගා සමූහයන් සේ, මුළු මුළු ව අවුත් සැවැත් නුවර වැද උන්වහන්සේට මහත් වූ දන් වතුරු කෙරෙමින් බුදුන් සගුන් වැද, නො එක් පින් රැස්කොට යන්නාහ. එ කල උන්වහන්සේ බුදු සස්නෙහි ලාභයෙන් යශසින් ඉතා අග්‍ර වූ සේක. කොසොල් රජ්ජුරුවන් ආදි වූ ශ්‍රද්ධාවන්තයන් ඔබට කරණලද සත්කාර අභ්‍යන්තර ජාතක–සුපත්ත ජාතක නිදානාදියෙහි මෙන් පමණ නැතියේ ය.

එ කල උන්වහන්සේ බුදුන් වැද "ස්වාමිනි! ගෘහවාසයෙහි බොහෝ සම්පත් හා පිරිවර හැර විවේක වාසය නිසා මහණ වීමි. දැන් මා මහණ වූ දවස් පටන් මට උපදනා ලාභයන් හා සත්කාර හෝ අපමණ වන්නාහ. මට සත්කාර නිසා රැස් වන්නා වූ ශ්‍රද්ධාවන්තයන්ගෙන් මාගේ වෙහෙර පෙර රජගෙහි මිදුල සේ ම අතුරු

කැතිය් ය. එසේ හෙයින් මේ නුවර මට සත්කාර බෙහෙව. අනික් නුවරකට යෙමි"යි බුදුන් අතින් සමු ගෙණ නැවත විශාලා මහ නුවර ගොස් මහාප්‍රජාපතී ගෞතමීන් වහන්සේ සමීපයෙහි වාසයට පමින් ගත් දැ ය.

ඔබ එ නුවර වැඩි බවු අසා එ නුවර මිසක සත්දහස් සත්සිය සත් ලිච්ඡවී රජුන් හා සත්දහස් සත්සිය සත් අගබිසෝවරුන් හා අනගි වූ මෙහෙණවරක් කරවා ඔබට පිළිගන්වා දවස තුන්මාරයක් වෙහෙරට එළඹ බුදුන් දුටුවා සේ පෙර කලට දිවුණ දිවුණා මහත් වූ සත්කාර කෙරෙති. ඔබ ම උදෙසා එ නුවර දී දහස් ගණන් සත්‍රීහු පැවිදි ව සසරින් ගැලවුනාහ. දඹදිව වාසී එ නුවරට රැස් ව පෙර සේ ම සත්කාරයට පමින් ගත්හ. එ නුවර කලක් වැස එහි දු සත්කාර බෙහෙවැ යි හැර රජගහා නුවර ගොස් එහි දු මෙහෙණවරෙක වසන සේක. එ කල එ නුවරට වැඩි බවු අසා එ නුවර අවලෝස් කෙලක් මිනුෂ්‍යයෝ ය, තුන්සියක් යොදුන් අඟු-මගධ දෙරට වාසී ය, අසූදහසක් නියම්ගම්වාසී ය, අමිතභෝගී ය සී යනාදි සත්ත්වයෝ ඔවුනොවුන් පරදා අවුත් බුදුන් දුටුවා සේ වඳින්නාහ. පුදන්නාහ. නො එක් සත්කාර කරන්නාහ. දවසින් දවස උත්සව මඟුල් කරන්නා සේ පෙර දෙනුවරමත් වඩා දිවුණ දිවුණා සත්කාර කළහ. මහත් වූ දන පූජා කළහ. මෙසේ උන්වහන්සේ ලාභසෙන්-යශයින් මිණීන් අග පැමිණි සේක. මහමුහුද රළපෙළ දිවන්නා සේ නො එක් ප්‍රත්‍යදනය ඔබ කරා ම පැමිණෙමි ය. එහි විපාක නම් පෙර බෝසතුන් සප්තශතකාදි මහදන් දෙන සමයෙහි තමන් වහන්සේ ද මසුරු සිතක් නො සිතා තිරි වත්කළ සක ඒකවණී වූවා සේ ඔබ හා එක්සිත් ව පුරණය කළා වූ දනපරිත්‍යාග මහිමයෙන් උපන් මහ පින්බල ය යි දතයුතු. එහින් කීම අපදානයෙහි:

පුබ්බක මමස්ස සුකතස්ස - කස්ස විතතං පසාදයිං,
දෙව මානුසකං භොගං - අනුභොත්වා අසංඛියා,
අනුභවිත්වා සුඛං දුක්ඛං - දෙවෙසු මානුසෙසු ච,
පච්ඡිමෙ ච භවෙ සන්තෙ - අජායිං සාකියෙ කුලෙ,
රූපවතී භොගවතී - යස සීලවතී තතො,
සබ්බඞ්ගසම්පදා හොමි - කුලෙසු අභිසක්කතා,
ලාභං සිලොකං සක්කාරං - ලොකධම්ම සමාගමං,
චිත්තඤ්ච දුක්ඛිතං නාසි - වසාමි අකුතො භයා,
නිබ්බින්දිත්වාන සංසාරෙ - පබ්බජිං අනගාරියං,
සහස්සපරිවාරෙන - පබ්බජිත්වා අකිඤ්චනා,

අගාරං විජහිත්වාන - පබ්බජිං අනගාරියං,
අඩ්ඪමාසෙ අසම්පත්තෙ - චතුසච්චං අපාපුණිං,

චීවරං පිණ්ඩපාතඤ්ච - පච්චයං සයනාසනං,
උපනෙන්ති බහූ'නෙකෙ - සාගරස්සෙව ඌම්මියො-ති.

මෙසේ තමන් වහන්සේට සංසාරයෙහි පක්ෂපාත නම් කළා වූ ස්ත්‍රීන්ට පවා මේ සා සත්කාරයක් දෙවාලූ හෙයිනුත්, ඒ සත්කාර තමන් වහන්සේ ම ලදුවා නම් වන හෙයිනුත්, මාගේ බුදුහු අතීන් නම් වන සේක.

මෙසේ රාහුල ස්වාමීන්ට මවු වූ හෙයින් රාහුල මාතාවෝ ය යි බුදු සස්නෙහි ප්‍රසිද්ධ වූ ඒ යශෝධරා මහාසත්විරින් වහන්සේ ලාභයෙන්, යශසින් අග්‍ර ව අම්මාමහ නිවන් දක්නා බුදුසසුන් නැමැති සඳුන් විල්හි මහ පියුමක් සේ බුදුසසුන් හොබවා ලෝවැඩ සසුන් මැඩ කොට එම රජගහා නුවර වාසය කරණ කල, මාගේ ස්වාමිදරු වූ ශාක්‍යසිංහ වූ ත්‍රිභුවන චූඩාමණි වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ තමන් වහන්සේ ලොවුතුරා බුදු වූ තෙසාළිස් වන අවුරුද්දෙහි සැවැත් නුවරින් වැඩ, අනොමණ්ඩල බාහිරමණ්ඩලා දී ගම් නියම්ගම් රාජධානිවල සැරිසරා ලෝවැඩ කොට ඇවිදිනා සේක් අනුක්‍රමයෙන් රජගහා නුවර වැඩ ගිජ්ඣකූට පර්වත ප්‍රාන්තයෙහි වූ එක්තරා එක් මණ්ඩාගර ප්‍රාග්භාරයෙක වාසය කරණ සේක.

එ කල යශෝධරා සත්විරින් වහන්සේ දහස් ගණන් භික්ෂුණී පිරිසක් පිරිවරා ගොස් බුදුන් දැක වැඳ එකත්පස් ව හිඳ බණ අසා ගොස් තමන් වහන්සේගේ මෙහෙණවර වැද පසුම් දා පශ්චාද් භක්තයෙහි අඩි පර්‍ය්‍යඞ්කයෙන් රහෝගත ව වැඩහිඳ මෙසේ සිතන සේක. නන්ද-රාහුල දෙදෙන ද, අගසව්වෝ දෙදෙනද, අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙන ද, ශුද්ධෝදන - මහාප්‍රජාපතී දෙදෙන ද, අඤ්ඤ-කොණ්ඩඤ්ඤාදී ප්‍රසිද්ධ වූ සත්විරයෝ ද මෙවකට පිරිනිවන් පෑ නිවන් පුර ගියහ. මම වනාහි බුදුන් හා එක් වේලෙහි උපන්මි. ඔබ හා සම වූ වයස් ලදිමි. සම වූ මඟුල් ලදිමි. සම වූ අදහස් ලදිමි. සම වූ මහණ ධම් ලදිමි. සම වූ නිවන් අමා ලදිමි. අනූ වූ රූපශ්‍රී හා සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය ලදිමි. මේ මේ කාරණා හෙයින් බුදුන්ගේ පරිනිර්වාණය හා මාගේ පරිනිර්වාණය එක දවස් වන කාරණ ම ය. එසේ වූ කල ලෝක වාසීහු එක වේලෙහි ලොවට ශාන්ති දෙකක් ධරාලිය නො හෙන්නාහු ය.

එසේ හෙයින් ඒ පරිනිර්වාණයන් දෙදෙනාගේ පසු පළමු භාවයත් වුවමනා ය. කල්පද්‍රැමරාජයාගේ වියෝගයෙහි කල්පලතාවගේ විද්‍යමානභාවය නොහොබනා සේ, කල්පලතාවගේ වියෝගයෙහි කල්පද්‍රැමරාජයාගේ විද්‍යමාන භාවයෙහි තව ද අශොභාවක් නැත්තා සේ, බුදුන්ගේ පරිනිර්වාණය මා වැනියන් දැකිම සුදුස්සෙක් නො වෙයි. තව ද මාගේ පරිනිර්වාණය බුදුන් දැකීම නොබෙන් ම ය. පූර්වකාලයෙහි වූ අනන්තාපර්‍යන්ත වූ බුද්ධ පතිව්‍රතාවරු ද ඒ ඒ බුදුන්ට පළමු ව ම පිරිනිවන් පෑහ. එසේ හෙයින් මා විසිනුත් පළමුව නිවන් පුර යිගමනා ම ය" යි සිතා "මෙවකට බුදුන්ට ද මට ද අට සැත්තෑවක් වයස් සම්පූර්ණ විය. මෙයින් දෑවුරුද්දක් ගිය කල අශීති වර්ෂයෙහි දී ම බුදුන්ගේ පරිනිර්වාණය වේ"යි දැන මම ද දැන් ම ගොස් බුදුන් අතින් අවසර ඉල්වා ගෙණ අද රෑ ම ශාන්ති පුරයට නික්මෙමි"යි මෙසේ සිතූ දා ය. එ කෙණෙහි මිහිකත් ගුගුරා පැන නැගී ය. ආකාශය මේඝ නාදයෙන් කම්පිත ව ගිය. මහමෙර කිළි පොළාපී ය. සක්වළගල සක්වළල්ලක් සේ බමා ගිය.

මේ අද්භූතයෙහි මේ කුමක් දෝ හෝ යි කම්පිත වූ සිත් ඇති ඔබගේ දහසක් පමණ මෙහෙණින්නෝ එකල ඔබ කරා දිව අවුත් "ආර්‍ය්‍යාවෙනි! මේ කුමක පෙළහරෙක් දැ"යි විචාළහ. එකල ඔබ වදාරණ සේක් "භවත්නි! මා සිතූ සිතිවිල්ලක් නිසාම වූ පෙළහරෙක, අද රෑ පිරිනිවන් පවිමි"යි සිතීමි. මා හා සැපි ව එව. දැන් ම ගොස් බුදුන් දැක වැඳ අවසර ඉල්වා ගෙමි. පාසිවුරු ගන්ව"යි කියා ඒ දහසක් මෙහෙණින්නන් පිරිවරා ගෙණ තමන් වහන්සේ ද පාත්‍ර සිවුරු ධරාගෙණ වෙහෙරට අරක් ගත් දෙවියන්ට පින් දී ගෙණ එ තෙපුල් අසා අවුත් පෙරමහට රැස් වූ නො එක් ශ්‍රද්ධාවන්ත ස්ත්‍රී පුරුෂයන්ට ඔවා තෙපුල් දී ගෙණ මහමුහුදට නිකුත් අමා ගඞ්ගාවක් සේ ගොස් බුදුන් වසන වෙහෙරට වැඩ බුදුන් දැක මෙර සිසාරා නිකුත් තරු පිරිවර සඳක් සේ තුන් විටක් පැදකුණු කොට බුදුන් පසග පිහිටුවා වැඳ සඳත් රජුට අනු වූ සුභද්‍රා නම් කණේරුකා ධේනුව සේ බුදුන්ට එකත්පස් ව ඇඳිලි බැඳ හිඳ මෙසේ දන්වන සේක.

"ස්වාමිනි! සත් දවසෙකින් ලැබෙන සක්විති රාජ්‍යයක් හා උනු නොවන සැපත් ඇති සතර මහානිධානයක් හා, කිඹුල්වත් නුවර වැනි දිව්‍ය සමාන පුරයක් හා සුදෙවුන් රජාකන් වැනි පෙම්බර පියාන කෙණෙකුන් හා, සතළිස් දහසක් ක්ෂත්‍රිය කාවක ජනයන් හා, සයානුලක්ෂයක් ක්ෂත්‍රිය කන්‍යාවන්ට අධිපති වූ මා වැනි ක්ෂත්‍රිය කන්‍යාවක් හා, එක්වැනි රහල් තෙරුන් වැනි රූබර පුතකු

කෙණකුන් හා මේ සා සැපතෙහි තෘෂ්ණාවක් නැතිව නැගු දළපුවු යෝසත් කෙළ පිඩු කොටත් නොබලා, එකලාව ම ගොස් මහණ ව සාහවුරුද්දක් දුෂ්කරින් දවස් යවා, මිහත් වූ වික්‍රමයෙන් පස් මරුන් බිඳ බුදු ව දූන් මේ සා නිවන් අමාවක් මුළු ලොවට බෙදා දී, මා ඇතුළු වූ සියලු සතුන් එක ආයෑ කුසින් වදා, මුළු ලෝ වාසීන් නො වරදවා දරු කොට ගත් නීවත් මාහිමියාණෙනි! මා විසින් දන්වන කෙපුලක් අසා වදාළ මැනැව, දූන් මට අට සැත්තැවක් වයස් ගියා, එසේ හෙයින් පරිභාර දසකයට පැමිණියෙමි, ස්වාමි දරුවන්ට පළමු කොට ජරා- විලි- පිලි නොදක නිවන්පුර යනු කැමැත්තෙමි, ඉඛුදු අද රෑ ම සෙත් පුරයට පැමිණෙමි. ස්වාමි දරුවන් විසින් මට කලමනා වූ සංසාර රක්‍ෂාව කොට වදාරණ ලද, මා විසිනු දු පිළිගත්තා ලද, එසේ හෙයින් මම ද සංසාර සාගර යෙන් ගොඩනැගී සිත් ඇස් නිවන් මග ඔයරව පැමිණියෙමි, එසේ ද වුවත් සියලු ආයාසීවත් ම පරිනිර්වාණ දිනයෙහි අවුත් බුදුන් අතින් සමු ගැන්ම ද බුදුන් ක්‍ෂමා, කරගැන්ම ද, සාධාරණ ධම් වන බැවින් මම ද ස්වාමිදරුවන් ක්‍ෂමා කරවා ගෙණ අවසර ලබනු කැමැත්තෙමි, සසර බොහෝ දවසක් ස්වාමිදරුවන්ට ජායාවක්සේ සහවාසය ඇයිමි. ඒ ඒ තන්හි මා විසිනු දු පක්‍ෂපාතව ම එකලද, එසේ ද වුවත් සත්‍රී ජාතිහු නම් ඉතා ලාමක වූ සවල්ප වූ සිත් ඇති යහ. කිසියම් නොනෙක අපරාධයක් පෙණෙසි, ඒ ඒ වරද ද නුව ණැයින් බැලූ කල ස්වාමිදරුවන්ගේ පාරමිතාවට අනුබල වූ නැතෙක් ම ය, මා විසින් කළ දූඩිකමක් නිසාත් වැඩක් ම සාධා දින්මි.

“යෙසු කල් හැර මා දූඩිකම් කළෑ සී යන කුසජාතකයෙහි ස්වාමිදරුවන් කුසරජ කල මා ප්‍රභාවතී නම් ව, රූමදයෙන් මත් වූ සම්යෙහි වෙස් වලා මා ඇහට ඇත්බෙටි අස්බෙටි ගෑසූ දවස් ඇතුපිට හිඳ හසනවිකාර-මුඛ විකාරයෙන් මට උපුළු ගැන්වූ දවස් පවා නො එක් පරුෂවාක් බස් කියනුයෙම් නො හැදින ම කිමි, අවෙනන වූ කර්මයෙක් නැති හෙයින් එහි දු මා වරදක් නො දක්මි. මගුල් පොකුණෙහි සැගවී සිට “මම ය කුසරජ” යයි පෙණී මා අත ගත් දවස් මෙ බඳු පුත්සඳකට නිඤු කරණ ප්‍රසන්න වූ ශ්‍රී මුඛය පසේ බුදුන්ට ආක්‍රෝශයෙන් බැලූ තුඹවහන්සේගේ ම කිසියම් පාපයක් නිසා, අතිරස පූවක් සේ ඉතා අප්‍රසාද වූ හෙයින් බැලූ වන්ව භ සඩකර හෙයින් “රජක්හුගේ මෙ බඳු වූ මුඛයෙක් ඇද්දූසි එකාන්තයෙන් යක්‍ෂයෙක් ම යැ”යි සිතා එ දවසු දු යක්‍ෂයකුහට ම නිඤු කෙළෙමි. එසේ හෙයින් එ තැන්හි දු මා වරද නැත. එ

දවස් මාගේ පිරිවර ගෙණ කුසරජ්ජුරුවන් හැර සෙවච්ඡාපර ව මාගේ සියනුවරට ගිය ගමන පෙර කළ ප්‍රාර්ථනාවක් නිසා ම වූ හෙයින් එ තැන්හි දු මා වරද නැත.

“තව ද: එ සත්මස මුළුල්ලෙහි ස්වාමිදරුවන් මාගේ නුවරට වත් දවස් පටන් මම ද යහනෙක නො සැතපී බිම ම සැතපීතිමි. ස්වාමිදරුවන්ගේ ම අකුසල බෙලෙන් ඒ සා දුකකට පැමිණි බවක් හිත මා විසින් සැබවින් කළා වූ නිසෙනනයක් කො වක නියාවට දවසින් දවස ගත්නා දුක් බල බලා අකුත්ම සො සගම් ම මී අතුරෙහි හැඹු සඩ එ දවස් මාගේ ගුණ පරීක්ෂා කරන්නු නිසා වසුන් කද කර තබා ගෙණ සිඬිපාමුල හුනු හඩ අසා ලෙහි බබැ අත් සප සිත් කඳුලු ධාරා වගුරමින් යහන් ගබඩාවෙන් මා දිවූ දවස ම පක්ෂපාත කමට ම දෙස් කියා සිටීම ය. තව ද: එ සත් මසෙහි ස්වාමින් පිසූ බත් මා අනුභව කළෑ යි සන්‍රිඛම්ය වරදවා පීඩැ යි සිතත් තමුස් දවසෙකත් ඔබ පිසූ බත් දිවගත් නො ගැහෙම් ම ය. එ බත් කුදව දී කුදගේ වැටුප් ගාලෙන් පිසූ නිවුඩුසාලේ දැසි භොජනය ම අනුභව කෙළෙමි. එ කල මා අනුභව කළ භොජනය සිතූ කල කුසරජ්ජුරුවන් අනුභව කළ වසුන් පල්ලෙහි දඹුකඩ භොජනය තවත් රසවත් දෙ හෝ යි සිතමි. එගේ රුවිදයෙන් මත් වූයෙම් පවා ස්වාමිදරුවන්ට මද අනාදරයක් නො කෙළෙමි. ඒ ඒ ජාතියෙහි ම විසින් කළා වූ කිසියම් අපරාධයක් ම නිසා මා පතක්නා වූ ස්වාමිදරුවන්ට මැනියන් මහත්සේට පාමා දුන් රාජ්‍ය දනාදියෙන් දාන පාරමිතාව සිද්ධ විය.

“ඒ ජාතියෙහි මාගේ පහස් ලද් තැන් පටන් මා කෙරෙහි තද් ප්‍රේමයෙන් අත්‍යසක්‍රිත ප්‍රාර්ථනා නො කොට රැකි පඤ්චශීලාදීයෙන් ශීල පාරමිතාව සිද්ධ විය. මා ම පතා ඒ සා රාජ්‍යය හැර එකලා ව ගිය ගමිනින් නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව සිද්ධ විය. නො එක් කර්මාන්ත විශෙෂයන් මා ම ලදෙසා නිර්මිත කිරීමෙන් ප්‍රඥා පාරමිතාව සිද්ධ විය. රාජසුඛුමාල ව මා ම පතා එක දවස් සාර සියක් ගවු වැඩවදල ගමිනින් හා සත්මස මුළුල්ලෙහි දිය දර ඇදීමෙන්, වසුන් ගේදීමෙන්, රෑ නිදි මැරීමෙන්, තුන් වේලෙහි වසුන් පිසීමෙන්, වසුන් කත් ඇදීමෙන්, ගත් දුක් සමූහයෙන් ම වීර්‍ය්‍ය පාරමිතාව සිද්ධ විය. තව ද: මුළු දඹදිවව අග රජ ව “බලාත්කාරයෙන් මෑ ගෙන්වා ගණිමි”යි නො සිතා මා කෙරෙහි ක්‍රොධයක් නො කොට මා කී කළු රූක්ෂ වූ නෙපුල් ඉවසීමෙන් ක්ෂාන්ති පාරමිතාව සිඩ විය. “කුසරජ්ජුරුවෙනි! බොහෝ කිම්හි දන්නෙහි! මා තොපට අඹු නො වෙයි යි කීහ, මා පතා තම

ගලින් පැන් උනමන්නා මැන්න, සූලං බඳන්නා මැන්න, සඳුව අත දිගු කරන්නා මැන්න, මා නො පතා තෙපි නොපසේ සියනුවර රට යව' යි එ දවස් මා සිතින් සිහිනස ඇති ම ද මාගම් තෙපුල් කී කල "පුරුෂවිශේෂයෙක් ඇතියෙම් නම් තී මා අගමෙහෙසිනි කෙරෙමි යි තී හැර සියනුවර නොයෙම් ම ය"යි කිවාවූ සාහසික වචනය ම පසුව ගබා කිරීමෙන් සත්‍ය පාරමිතාව සිද්ධ විය. එකවිට දුමු සත පසළොස් පැයක් භ්‍රමණය කිරීමෙන් අධිෂ්ඨාන බලයෙන් නොඑත් විරහකම්පතක රූපයන් මව විනා සෙසු සත්ත්වයන්ට නො දක්වීමෙන් ශක්‍රභවනය කම්පාකරවීමෙන් අධිෂ්ඨාන පාරමිතාව සිඩ විය. තමන් නො තරම් බව නො දැන, බල නොදැන, මුළු දඹදිවව අගරජුන්ගේ අගබිසෝවුන් පතා ආවාවූ සතුරු රජුන් සද්දෙනා උතුරුසළුවෙන් පිටිතල හයා බැඳ ගෙණවුන් දක්වාලූ වේලෙහි ඔවුන්ට කෝපයක් නො කොට ජීවිතදානය දීමෙන් සත්‍රී දානය දීමෙන් කළා වූ කරුණාවෙන් ම මෛත්‍රී පාරමිතාව සිඩවිය ඒ සියලු නැක්සි ම අකම්පිත ව, මහමෙර සේ නිශ්චල ව කොට ගත්තා වූ අපි සිද්ධියෙන් ම උපෙක්ෂා පාරමිතාව සිඩ විය. තව ද; මා ම කීයා සතුරන් ජයගණිම් යි "අභංකුසො" යි කිවා වූ සිංහනාද වික්‍රමය දුන් කුන්ලෝවාසීන් තුඩ තුඩ විය.

"එ දවස් මා ම කීසා ජයගත් යුඩයෙහි සනතුෂ්ට වූ ශක්‍රදේවේන්ද්‍රයා අෂ්ටවංක වෛරෝචන මාණික්‍යරත්නය ශක්‍රපුරයෙන් ගෙණවුත් ග්‍රීවාභරණ කොට පලඳවා ලී ය, ඒ දිව්‍යරත්නලාභය ද මා ම නිසා විය. එසේ හෙයින් සවාමිනි! අඥාත වූ ලෝකවාසීහු මා ප්‍රභාවතී නම් ව සවාමිදරුවන්ට දූෂිකම් කළැ යි සෙති, මම වනාහි සිතින් දූෂිකමක් නො කෙලෙමි, සිතින් සෙනෙහස ම කෙලෙමි, සෙසු ජාතිභෙදවලැ එකි එකී පාරමිතාවන් ම පිරූ සේක. මා දූෂිකම් කළ ජාතියෙහි පාරමිතාවන් දසදෙන මී වෙන වෙනම සැදූ දෙවාලිමි, තුඩ තුඩ වික්‍රම කියවාලිමි, කුශලාකුශල ධර්මයන්ගේ විභාගය ද ලෝකවාසීන්ට හඟවා ලොකාර්ථය ද කෙලෙමි, එසේ හෙයින් ඒ ජාතියෙහිද මා වරදක් නො දක්මී, කිසියම් වරදක් ඇතියේ වී නමුත් එ දවස් ම කලල් පිට වැදහෙම:-

"සා ඉමා රතති අතිකකනතා- සා ඉමා දෙව තයා විනා,
මජෙඥ නෙ සිරසා පාදෙ-මා මෙ කුජ්ඣ රථෙසභ"- යි.

යන මේ ගාථාව කියා කුස රජ්ජුරුවන් ක්ෂමා කරවා ගත්මී, එ වේලෙහි කුසරජ්ජුරුවෝ:

"එවං තෙ යාචමානාය-කිං න කාහාමි තෙ වචො,
විකුද්ධො ත්‍යසමි කල්‍යාණි-මා ත්වං භායි පභාවති"-යි

"යන මේ ගාථාව කියා ක්ෂමා කළහ. එසේ හෙයින් ඒ ජාතියෙහි මා කළ වරදෙක් ඇත්නම් මේ ජාතියට නො සිබුයෙමි, තවද පසේබුදුන්ගේ පාත්‍රයට මා පිළිගැන්වූ අතිරස කැවුම් සපත්නි රොෂයෙන් පාත්‍රයට අත ලා ලා හැරගත් දවස් පසේබුදුහු සුන්බත් වූයේ වී නම් සතියෙහි ධ්‍යානයෙන් නැගී දවස හෙයින් පිරිනිවන් පානාසේක, එ දවස් ස්වාමිදරුවන්ට ආනන්තරීය කර්මය සිද්ධ වන දවස ය. එ කෙණෙහි මම කලකිරී ගිතෙල් පිළිගන්වා නුඹවහන්සේ කළාවූ අපරාධය සාපරාධ ම හෙයින් දුෂ්ට වූ ප්‍රාර්ථනාවක් නොව ලජ්ජා කරවා එ ම කැවුම් ඔබ ම අතින් පිළිගන්වා එ සා පාපයෙ කිය ගොඩගණවා පිළිවකල් වීමි. ඒ ජාතියෙහිදු මා වරදෙක් නැත

"තව ද: බන්ධනාගාර ජාතකයෙහි ස්වාමිදරුවන් මා හැර තපසට නික්මුණු කල මා දූරි ඇති බවු කියා ඒ දරුවන් වැදූ කල ගිය මැනව, සිරු වැන්දවූ කල ගිය මැනව බත් කැවූ කල ගිය මැනව, කොස් බෑ කල ගිය මැනවැ යි යනාදීන් මා රැඳවූ කලු දූ, ස්වාමි දරුවනු දූ, මාගේ බසින් ම තපසට නො ගොස් රඳ රඳා ගිය කල පසුව මවත් සොරා තපසට ගිය කල මා එකලාව දරුමලෙහි බැඳී බොහෝ දුක් ගත් කලු දූ ඇග. තපසට මා කළබාධා ඇත, එසි දූ සංසාර දෙහ බව මිස මා වරද යෙහි නො සිතමි. සියලු ස්ත්‍රී-පුරුෂයන්ගේ ම සාධාරණ ධර්මයෙක.

"තවද ස්වාමිදරුවන් හා මා හා කුම්භකාර කර්මාන්තයෙන් නිරවද්‍ය ජීවිකා කළ සමයෙහි, පසේබුදුන් දැක දන් දී බණ අසා ස්වාමිදරුවෝ මට පලමුව මහණ වෙමි යි සිතූසේක. මම ස්වාමිදරුවන්ට පළමු ව මහණ වෙමි යි සිතිමි. එ කල රාහුල නම් මෙම පුත නුවන් පස්මැසි කල එ දරුවන් හා ගම හැර ස්වාමිදරුවානන් තපසට නික්මුණු කල රඳවාගත නො හී එ දරුවන් ස්වාමිදරුවන් අතට වඩා "මා පැන් කළයක් ගෙණ කල ගිය මැනවැ" යි මායමක් කියා කළය ගෙණ පැන් සොයා යන පසාරයෙන් වංචාවෙන් වලට ගොස් මහණ වීමි. මහණධම් පිරීම නම්, සසර සපුරෙන් ගොඩ නැගීම නම්, සියලු සතුන්ට මී මිහිරි වන දෙයක් හෙයින් තපස් නිසා කී කල මායමෙකි දූ, සොරා ගිය ගමනෙකි දූ, අපරාධයක් නො දක්මි.

"එ කල පුතනුවන් සතර පස් හැවිරිදි වන තුරු නුඹවහන්සේ එකලාව, පිරිමි ව සිට, දමින් බැඳී ඇතකු සේ දරු මලෙහි බැඳී එක් වේලෙක බැල මෙහෙ කොට කිරි සොයා ගෙණෙමින්, අඳුන් තෙල් ගෙණෙමින්, එක් වේලෙක දරුවන් නහවමින්, නිදි ගන්වමින්, බඩ දී ගෙණ සැතපෙමින් "ගැහැණි අද ඒ දේ, සෙට ඒ දේ

නෝ"යි මා ගිය මග බලමින් "ගෑනැණි මා වෙහෙසාලූව"යි කියමින් එක් අතෙකින් සත දම දම්මා මලන් උකමින්, එකලාව ඒ මලන් තලමින්, පිගලමින්, පලනමින්, විකුණමින්, දවසින් දවස දෙපුතු පියන් බඩ අදිමින්, ගත්තාවූ පුත්‍ර ව්‍යසනය හා සත්‍රාසත යේ සාලාවූ දරුසනාවට ඒ පුතනුවන් වහන්සේ ම වෙස්සන්තර ජාතියෙහි බමුණාට දන් දෙන වේලෙහි උපන් හයින් මල් මැද සිවුරැස් පොකුණෙහි නෙළුම් පත් පීරා සැඟවී සිට නුඹවහන්සේ "පුතණ්ඩ! ජාලිය කුමාරයෙනි" යි අඩ ගැසූ අඬ අසා දැනීන් නෙළුම් පත් පීරා ගෙණ "බමුණා මා ගැසී තෙරේව යි මිපියානන් වහන්සේට මා වැනි ශික්ෂිත දරුවෝ ත් ජීවිතයක් නිසා සැඟවෙද්ද" යි දිව දිව අවුත් "මපියාණෙනි! මම මෙ තැන සිටියෙමි. කැමැත්තක්හව මා දන් දුන මැනැවැ' යි කියා කියා අත් පුං දිගුකල වේලෙහි ම ප්‍රත්‍යුපකාර කොට තිබුවාලුයේත. එ කල මවුන් නැති ව ඔබව කල දරුසනාවට ඔබ ම සසර සපුරව අත් දුන් සේක.

තව ද මේ ජාතියෙහි දෑසාද සම්පත් නොයා එවාලූ දවස් "රාහුලයා ඉසකෝ කපා මනණ කරව" යි වදාළ වේලෙහි සත් හැවිරිදි වයසැ මවුන් සඳහන් නො කොට කර බාගෙණ උත්තරයක් නො කියා, බුදුහනුවන් වහන්සේට ත් මව ත් කියා නො එවා, සවාමිදරුවන්ට ම කීකරු ව, ඉසයක් කපන්ට නමා පෑලූ ශික්ෂිත කමින් ම, එ දවස් ගත් මහත් දුකට මෙ දවස් ප්‍රත්‍යුපකාර කල සේක් දෝ හෝ යි සිතමි. එසේ හෙයින් එ සමයෙහි සවාමිදරුවන් මා නිසා කලාවූ පුත්‍රව්‍යසනය සවාමිදරුවන්ට ම පිරිවහල් වී ය. එසේ හෙයින් එ තැන්හි දු මා වරදක් නො දක්මි.

තව ද: එක් ජාතියෙක සවාමිදරුවන් රජ කල, මා අගබිසෝ කල සවාමිදරුවන් සග යහයින් මා මැලි හෙයින් "සම්වයස් පෑ පෙම වඩා ගන්මි" යි සිතා ඉස බලන පාසාරයෙන් මා හිසින් තරයක් කඩා පෑ "හිමි! තොප ඉස තර බලුව" යි ස්නෙහ දෙෂයෙන් එක බොරුවක් කීමි. එ කෙණෙහි ඒ තරය දුක "ජරාවට පැමිණියෙමි" යි අනිත් ලකුණු උපදවා මා හා සියලු රාජ්‍යවාසීන් හඬව හඬවා සිටිය දී ඇමැතියන් වලක්වා වලක්වා රාජ්‍යය හැර ගොස් ජීවිතාන්තය දක්වා තපස් කොට ගොස් බඹලොව උපන් හෙයින් මා කීවාවූ ඒ ජාතියෙහි එක් බොරුවක් නිසා සවාමිදරුවන්ට නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව හා ශීල පාරමිතාව හා පාරමිතාවන් දෙදෙනකු සාධා දී ලී ය. එසේ හෙයින් ඒ මාගෙ මාදයෙහි දු මා වරදක් නො දක්මි.

තව ද: කුරුධම්ම ජාතකයෙහි සවාමිදරුවන් රජ කල මා අග බිසෝ කල සුමරජහු මුහුණ දවසෙක සාතුරාගයෙන් බලාපු වරදෙක් ඇත. ඒ වරද නො සඟවා ''මාගේ ශීලාන්තරය විදේ හෝ යි මෙසේ වූ වරදක් සිතීමි''යි මා කී හෙයින් වරද නො සැඟවූ හෙයින් එ තැන්හි දූ මා වරදක් නො දක්මි.

තව ද: අභ්‍යන්තර ජාතක-සුසිම ජාතකාදි කිසියම් තෙනෙක අවශෙෂ වූ රජුන්ට මා අගමෙහෙසින් වූ තැ හුදු පෙම්ණි, සංසාරය නම් අග් මුල් නැති හෙයින් එසේ එසේ වූ වරද නිවරද ම ය. තව ද: අභ්‍යන්තර නම් අඹයට මා දෙළුන කල මට අඹ ශෝකයා ඇවිදිනා ඒ රජුගේ සේවකයෝ සවාමිදරුවන් ගා පන්සියක් තවුසන් සිත් සේ ධ්‍යාන සුව විඳිනා අතිරම්‍ය වූ මිගුල් උයනින් තෙරියහ. එ තැන්හි ද සක්දෙව් රජහුගේ මුත් මා වරදක් නො දක්මි. එසේ ද වුවත් මේ ආදි තැන්හි මා විසින් කළාවූ කිසියම් අපරාධයෙක් ඇත් නම් මේ අන්තිම වූ ක්ෂමාව ය. අන්තිම වූ දැකීම ය. අන්තිම වූ ජාතිය ය. මට නිඃශෙෂයෙන් ම ක්ෂමා කොට වදාරා ශාන්තිපුරයට අවසර දුන මැනවැ යි දන්වූ දෑ ය. එයින් කීහ අපදානයෙහි:-

ඒකස්මිං සමයෙ රම්මෙ-ඉද්ධෙ රාජගහෙ පුරෙ,
පබ්භාරම්හි විවේකම්හි-වසන්තෙ නරනායකෙ.

වසන්තියා නම්හි නගරෙ-රම්මෙ භික්ඛුනුපස්සයෙ,
යසොධරා භික්ඛුනියා-එවං ආසි විතක්කිතං.

නන්දො රාහුලභද්දො ච-සාවකග්ගා සහෙව ච,
සුද්ධොදනො මහාරාජා-ගොතමී ච පජාපතී.

අභිඤ්ඤාතා මහාථෙරා-ථෙරියො ච මහිද්ධිකා,
සන්තිං ගතාච ආසුං තෙ-දීපච්චිව නිරාසවා.

ලොකනාථෙ ධරන්තෙ ච-අහම්පි ච සිවං පදං,
ගමිස්සාමීති චින්තෙත්වා-පස්සන්ති ආයුමත්තනො.

පස්සිත්වා ආයුසංඛාරං-තදහෙව ඛයං ගතං,
පත්තචීවරමාදාය-නික්ඛමිත්වා සකස්සමා.

පුරක්ඛතා භික්ඛුණීනං-සහස්සෙහි තහිං තහිං,
බණෙණ මහිද්ධිකා පඤ්ඤා-සම්බුද්ධං උපසඞ්කමි.

සම්බුද්ධං අභිවාදෙත්වා-සත්ථුනො චක්කලක්ඛණෙ,
නිසින්නා එකමන්තම්හි-ඉදං වචනමබ්‍රවී.

අට්ඨසත්තතිවස්සාහං-පච්ඡිමො වත්තතී වයො,
පබ්භාරම්හි අනුප්පත්තා-ආරොචෙමි මහාමුනෙ.

පරිපක්කො වයො මය්හං-පරිත්තං මම ජීවිතං,
පහාය වො ගමිස්සාමි-කතං මෙ සරණමත්තනො.

වයෙ ච පච්ඡිමෙ කාලෙ-මරණං උපරුජ්ඣති,
අජ්ජ රත්තිං මහාවීර-පාපුණිස්සාමි නිබ්බුතිං.

නත්ථි ජාති ජරා ව්‍යාධි-මරණඤ්ච මහාමුනෙ,
තත්ථ ගච්ඡාමහං වීර-ගතො යත්ථ න දිස්සති.

යාවතා පරිසා අත්ථි-සම්මුඛා සන්ති සත්ථුනො,
අපරාධං පජානං මෙ-ඛමන්තු සම්මුඛා මුනෙ.

සංසරන්තා ච සංසාරෙ-ඛලිතඤ්චෙ මමං තයි,
ආරොචෙමි මහාවීර-අපරාධං ඛමස්සු මෙ-යි.

මෙසේ ඒ යශෝධරා ස්ථවිරීන් වහන්සේ අනෙකප්‍රකාර වූ කථා වෙන් සසර තමන් වහන්සේගේ පූර්ව විශ්වාසය හගවා බුදුන් අතින් අවසර ඉල්වූ වේලෙහි ස්වාමිදරුවෝ උන්වහන්සේ තමන් වහන් සේට සංසාරයෙහි කළාවූ බොහෝ උපකාර හා අපරිමිත වූ ගුණ දැක "මේ යශෝධරාව වැනි පින්වත් ස්ත්‍රියක් මාගේ බුද්ධොත්පාද යෙහි නැත. දැන් මෝ නොමේ අසඞ්ඛ්‍ය ගණන් කප්වල ජාති දක් නා නුවණ ඇත්තී ය. අසාධාරණ වූ දිවැස් ඇත්තී ය. විශෙෂ වූ දිවකන් ඇත්තී ය. නසන ලද ආශ්‍රවයන් ඇත්තී ය. ත්‍රිවිද්‍යායෙහි මුදුන් පැමිණියා ය. බුදුන්ට අනු වූ ඍද්ධිප්‍රාතිහාර්‍ය ඇත්තී ය. තාමං රහත් වූ දවස් පටන් බුදුන් කෙරෙහි කළාවූ මහත් වූ ආදර හා බහු මානයෙන් පෘථග්ජන මෙහෙණින්නක් සේ නිහතමාන ගුණයෙන් තමන්ගේ ඍද්ධිබලයක් නො දක්වා විසුව. එසේ හෙයින් මැගේ පෙළහර බල දුටුවෝ නැත. මතු ලෝකවාසීහු රාහුලමාතාවෝ නම් කෙසේ වූ කෙනෙක් දෝ හෝ, රහත් වූ දෝ හෝ, නොවූ දෝ හෝ පෙළහර ඇතියෝ දෝ හෝ, නැතියෝ දෝ හෝ යි ශංකා උපද වන්නාහු ය. මතු සත්ත්වයන්ට උපදනා ඒ ශංකා දුරු කරවා මැගේ ඍද්ධිබල වික්‍රම හා පූර්වචරිතය මැ ලවා ම දක්වා, මැගේ ගුණ මතු මාගේ ශාසනයෙහි ප්‍රසිද්ධ කරවමි" යි සිතා "යශෝධරා ස්ථවිරීනි තොප වැනි පින්වතුන් ලෝකවාසීන්ට ආනුභාවයක් නො දක්වා අප්‍රසිද්ධ ව නිවන් පුරයෙහි සැඟවෙනු නො යෙදෙයි. දැන් තොප ගෙන් කිසියම් පෙළහරක් මා මැදයෙහි දක්වැ බලගැ" යි වදාළ සේක. එසින් කීහ අපදානයෙහි:-

සුත්වාන වචනං තස්සා-මුනින්දො ඉදමබ්‍රවී,
කිමුත්තරං තෙ වක්ඛාමි-නිබ්බානාය වජන්තියා

ඉද්ධිඤ්චාපි නිදස්සෙහි-මම සාසනකාරිකෙ,
පරිසානඤ්ච සබ්බාසං-කඞ්ඛං ඡින්දස්සු සාසනෙ-යි,

එ වේලෙහි "යශෝධරා සළුවිරිත් වහන්සේ අද රැ පිරිනිවන් පානා සේක් ල, දන් අවුත් බුදුන් මැද ක්ෂමා කරවමින් සිටි සේක් ලැ"යි එම තෙපුල් සියලු භික්ෂුසඞ්ඝයා කෙරෙහි පැලව ගියේ. එ කල "රාහුල මාතාවන්ගේ පරිනිර්වාණය වනුයේ කුමි; අද බුදුන්ගේ ද පරිනිර්වාණය ආසන්න වන හෙයින් ම දැ" යි කියා කියා ක්ෂීණාශ්‍රවයෝ සංවේග උපදවමින්, පෘථග්ජන භික්ෂූහු කඳුළු ධාරා වගුරමින්, දහස්ගණන් ශ්‍රාවකයෝ අවුත් බුදුන් පිරිවරා සිටගත්හ. එ තෙපුල් ඇසූ ඒ රජගහා නුවර කෝටි ගණන් සත්ත්වයෝ ද, ඔවුනොවුන් පරණා දිව දිව අවුත් රැස්වූහ. එ කල යශෝධරා මහා සළුවිරිත් වහන්සේ "අද බුදුහු මා හා පෙළහරක් කරවා මා හා සිංහනාද කරවනු කැමැතිසේක් වන. පෙර නො එක් ජාතියෙහි ඔබට හිතරුව මි අවුත් කෙලවර ජාතියෙහි වදලක් කළමනා මී ය.

"බුදුන් අදහස් වූ පරිද්දෙන් ම මාගේ ඍද්ධිබල දක්වා පෙළහරක් කෙරෙමි යි, බල එහෙක් ඇත. මේ පර්ෂදෙහි සරාගී සත්ත්වයෝ බෙහෙව. ඔහු ස්ත්‍රීභාවයෙහි සිට මා දක්වන්නාවූ පෙළහර බලා මා වූ පමත් නො දැන මා කෙරෙහි ලොභ සිත් උපැදවූ නම් එ පවින් ගොස් අපායගත වන්නාහ. පළමුකොට ඔවුන්ට මා වූ පමත් හඟවා ඔවුන්ගේ විතර්ක සිත් දුරු කොට පෙළහරක් දක්වමි"යි සිතා බුදුන් වසන දෙස වැඳ සිට "සියලු බෝසත්වරුන් අටාසංඛෙය්‍ය කල්පලක්ෂයෙකින්, සොළොසාසංඛෙය්‍ය කප් ලක්ෂයෙකින් කරන්නාවූ වීර්‍ය්‍ය සාරාසංඛෙය්‍ය කප්ලක්ෂයක් ඇතුළත සාක්ෂාත් කොට මා වැනි ස්ත්‍රීයකගේ අනුබලයෙන් පුරා නිමවා ගත් අධික වූ වීර්‍ය්‍ය ඇති බුදු රජාණනි! නුඹ වැනි බුදු කෙනකුන් ඉදිරියෙහි පෙළහර පානා වූ මම දෙව්-බඹකෙණකුන්ගෙන් උපදෙස් ලත් අනික් ඍද්ධිවන්ත කෙනෙක් නො වෙමි. නුඹ වහන්සේ පෙර සිද්ධාර්ථ කුමාරයෝ ය යි දඹදිව ප්‍රසිද්ධ ව, සක්‍රදෙවේන්ද්‍ර ලීලාවෙන් රාජ්‍යය කරණ කල, සසානුලක්ෂයක් පුරස්ත්‍රීන්ට නායක ව අග්‍ර මහිෂිකා වූ යශෝධරා දේවී නම් මම ය.

එ කල: රූපයෙන් - ශෝභනයෙන් - කුලයෙන්-යශසින් - ආචාරයෙන් අග්‍ර වූ ත් ස්ත්‍රීසමූහයා දිව්‍යාඞ්ගනාවන් දුටුවා සේ මා ම වදිති, පුදති, සත්කාර කෙරෙති. මේ ලෝකයෙහි බුදුන් විනා රූපයෙන්-යශසින් මට වඩනා සත්ත්ව කෙනෙක් නැත. එසේ වූ සැපත් හැර මම ද සවාමීදරුවන් සමීපයෙහි මහණ ව උපදෙස් වූ පරිද්දෙන් විදර්ශනා වඩා අමාමහ නිවන් දුටිමි රහත් වීමි. කෙලෙසුන් ගෙවීමි. කෙලෙස් මුහුදු පිනීමි. කෙලෙස් සතුරන් දුරු කෙළෙමි. සංසාර සාගරයෙන් ගොඩ නැංගෙමි. මතු ජාති

යෙක නො උපදිමි. අනික් පුරුෂයකුට භාර්‍යා නො වෙමි. අසාධාරණ වූ සෘද්ධි ලදිමි. විශෙෂ වූ දිවකන් ලදිමි. විශෙෂ වූ දිව ඇස් ලදිමි. අසංඛ්‍යගණන් ජාති දන්නා නුවණ ලදිමි. මැළි දූන් මා විසින් දක්වනලද නුඹවහන්සේගෙන් දෙවා වදාළ කිසියම් සෘද්ධිබලයක් බලා වදාළ මැනවැ' යි සිංහනාද කොට තමන් වහන්සේ වූ පවත් මහපිරිසට හඟවාලා බුදුන්ගේ ශ්‍රීපාද පද්මයට බස්නා රාජහංසධෙනුවක සේ නොහොත් ශ්‍රීපාදපද්මව බස්නා ශ්‍රී කාන්තාව සේ බුදුන්ගේ ශ්‍රීපාද මැද අවසර ඉල්වාගෙණ ධ්‍යානයෙන් ධ්‍යානයට සමවැද වැද ආකාශයට තලක් නැගී බැස බුදුන් වැද, එසේ ම දෙ තලෙක, තුන් තලෙක, සතර තලෙක, පස් තලෙක, සා තලෙක, සත් තලෙකැ යි සත් වාරයක් ආකාරයට නැගී බැස සත් වාරයක් බුදුන් වැද වාරයෙන් වාරයෙහි:-

යසොධරා අහං වීර-අගාරෙ තෙ පජාපතී,
සාකියම්හි කුලෙ ජාතා-ඉත්ථියඞ්ග පතිට්ඨිතා-යි.

යන මේ ගාථාවෙන් සත් වාරයක් සිංහනාද කොට, නැවත සියක් තලෙක දහසක් තලෙක සුවහස් තලෙකැ යි යනාදීන් නැගී නැගී බැස බැස නැවත නැවත බුදුන් වැද වැද; තවද: ආකාශයට නේ සුවහස් තල පමණ නැගී පුන් සඳක් සේ සියලු සතුන්ට පෙණී පෙණී සිට සියලු සත්හුම් මා දකිත්ව යි අධිෂ්ඨාන කොට "දෙවියනි! බමුනි! යශෝධරා සප්විරි නම් මම ය. අද බුදුන්ව මා විසින් කරණ ප්‍රාතිහාර්‍ය්‍ය පූජා දක්නට එව" යි දසදහසක් සක්වළ දෙවියන් ඇසෙන සේ අඬනැ දූ ය. එතෙපුල් දස දහසක් සක්වළ මුළුල්ලෙහි සැට දහසක් කාමාවචර දිව්‍යලෝකවල දෙවියන්ට ඇසී ගිය, එක් ලක්ෂ පණස් දහසක් බඹලොවට ද ඇසී ගියෙ. එ වේලෙහි දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්ම සෙනාව මොහොතක් කලින් දිව අවුත් තලෙත තුඹ පුණු පිරුවා සේ අහස්කුස් පුරා බඹලොව දක්වා ගැහැටි ගැහැටී සිටියහ. ඒ මධුර වූ නාදය කණ හුනු මුළු දඹදිව සි ලු සත්‍රී පුරුෂයෝ ම අහස් බලා පුන් සඳක් සේ වැඩසිටි උන්වහන්සේ විශෙෂයෙන් දූක දොහොත් මුදුන් දෙමින්, සාධුකාර දෙමින්, ඒ ඒ ගම් නියම් ගම් රාජධානි ප්‍රත්‍යන්ත දෙශවල ද තමන් තමන්ගේ දොර දොරවල ම සිට බලති.

එ වේලෙහි උන්වහන්සේ ආකාශයෙහි පෙණී පෙණී සිට තෙජෝකසිණ සමාපත්තියට සමවැද-සියලඟින් දුම් කඳු හැර මුළුලෝ දුමින් වසා, සියලඟින් ගිනිකඳු හැර මුළුලෝ ගිනි පුලිඟු දැන් පුරා "මම ය, අතීතෙකකිම් නොවෙමි. බුදුන් ගිනිගෙයි වසන

කල ප්‍රජාපතී වූ රහල් තෙරුන් මවු වූ, යශෝධරා නම් ස්ථවිරීමි" යි හඬගා කියා මුළු ලෝ සාධු නාදයෙන් පුරවමින් නැවත කලක් පෙණී පෙණී සිට කලක් අන්තර්ධාන වන දැ ය. නැවත එක මෙහෙණීති රූපයෙන් විකාපීණ වූ සෑඩි දක්ව දක්වා එක කොපුලෙහෙන් සුවහස් කඩුපත් ගයා පානා සේ, සත් සුවහස් එක්වැනි වූ මෙහෙණීන් වෙස් මවා මුළු සක්වළ පුරා සිටුවා ඒ සා මහත් වූ භික්ෂුණී පිරිසක් ලවා "මම ය, බුදුන්ට පාරමිතා සාදා දුන් යශෝධරා ස්ථවිරීමි" යි තුඹ තුඹ කියවා තුන් ලොමු එක කොලාහල කළ සේක. එ කෙණෙහි සියලු දෙව් මිනිසුන් දුන් සාධුකාර ශෙනු දු මුළු ලොව එක කොලාහල වී ය.

නැවත 'මාගේ බුදුන්ට ගරුඬ විකාශයකින් පූජාවක් කෙරෙමි" යි මේරගල සා ශිඛාවෙකින් හා සඳමඬුලු සා ඇස්සගලෙකින් හා, සක්වළ ගල සා මුඛ තුණ්ඩකින් හා පූර්වවිදේහ දිවයින සා දකුණු පියාපතකින් හා අපරගොයාන දිවයින සා වම් පියාපතකින් හා ජම්බුද්වීපය සා ශරීරයෙකින් හා උතුරුකුරු දිවයින සා පුසකින් හා මහ ගුරුළු වෙසක් මවා දෙපියාපතින් මේ සා මුළු සක්වළ සිතියම් වියනකින් වැසුවා සේ අතුරු නොදී වසා සිට, සියක් යොදුන් මහ දඹගස මුලිනුපුරා ගසාගෙණ මල් විදුනාවක් සේ බුදුන් ඇඟට සල සලා මොහොතක් කල් සුවඳ මඳ පවනින් බුදුන් ඇඟට සුව පහස් දෙවමින් මහත් වූ ගරුඬ නාදයෙන් තුන්ලොව වෙවුල්වා "මම ය, සත්ත්වයෙනි! දිව්‍යනාගරාජයෙනි! ගරුඬරාජයෙක් නොවෙමි. භය නොගන්ව, යශෝධරා මහාස්ථවිරීමි" යි හඬගා කී දෑ ය. එ කෙණෙහි දු මහපිරිස සාධුකාර දුන්හ.

එ පෙළහර හැර නැවත දහස් සුවහස් යොදුන් අහස්කුස වසා සිටිනා තරම් දිව්‍යහස්ති රූපයක් මවා මුළුලොවට පෙණී පෙණී සිට ශක්‍රපුරයට අත දිගුකරලා පරසතු මිඳුරා ගස හගාගෙණ බුදුන් සිරසට මල් සේසතක් සේ කෙරෙමින් මොහොතක් කල් සිට නැවත බුදුන් ඇඟට මිලස්තක් සේ සලා මල් සුවඳින් බුදුන් පුද පුදා එ කෙණෙහි මහපිරිස අහෝ! සාධු අහෝ! සාධු යි එක පැහැර සාධුකාර දී සිම් තුඹ කවුරු දැ යි විචාළ කල "මම අතිනෙකිම් නො වෙමි, ගෞතම නම් බුදුරජානන් ගිහිගෙයි වසනකල ප්‍රජාපතී වූ එක්තරා කුලස්ත්‍රියකිම. බුදුන්ගෙන් මා ලද කිසියම් ගුණ ලවයක් බලව" යි කියා තුන් ලොවට ඇසෙන සේ මහත් වූ කුඤ්චනාද කොට, තුන්ලොව වෙවුල්වා හස්තිමාන නම් වූ පූජාවක් කළ දෑ ය. එ කෙණෙහි දු මහත් වූ සාධුකාර පූජා විය.

නැවත එ පෙළහැර එසේ ම මහත් වූ දිව්‍ය අශ්ව රූපයක් මවා සක්වළ ගල සිකාරාශ, යුගන්ධරාදි සත්කුලපර්වතන් සිසාරා යයි

සුවහස් වාරයෙහි ආවර්තනය කරවා නැවත සක්වළගැබෙහි මුළු සක්වළ කුස එක අශ්වරූපයෙන් බැලූ බැලූ දිග්හි අපමණවූ අශ්ව සේනාව දක්ව දක්වා, නැවත එකරූපයෙන් සිට මුළු ලොවට ඇසෙන සේ ඝෝෂාරව කෙරෙමින් "මමය, දෙවියෙක් බඹෙක් නො වෙමි, යශොධරා ස්ථවිරීමි" යි හඬගා කියා දිව්‍ය මනුෂ්‍යයන් ලවා සාධුකාර දෙවූ දැ ය.

ඒ පෙළහර හැර එම මෙහෙණිනී වෙසින් පෙණී "ස්වාමීනි! කල්පාන්ත වාතයෙහි මහා පඨවි රාජයන් ආකාශයට නැගෙන ලෙස්, ඉන් ඒ ගැසී සුණු විසුණු වන ලෙස් පුලුන් පෙදක් සේ බමන ලෙස්, මාගේ බුදුනු ඍද්ධියෙන් ඉතා පට දක්වා වදාළසේක. මම ඍද්ධිබලයෙන් දූස් එ ගෙණ හැර පාමි. සිත් සේ බලවයි කියන් නාක්හු මෙන් අහස්කුස කල්පාන්තවාතය සේ මහාවාතමණ්ඩලයක් මවා මහාපඨවිරාජයන් පොළොවින් නැගී, ඉන් ඒ ගැසී ගැසී සුලං වේගයෙන් ඒ ඒ දිග්හි ඇවිදිනා ලෙස්, පෙයාපන් සේ පුලුන් පෙද පෙද සේ බමන ලෙස්, දක්වා මහපෙළහරක් පෑ බුදුන් පිදූසේක. එ වේලෙහි දු මුළුලෝ විස්මයපත් විය.

නැවත ඒ පඨවියන් අනන්තඕක කොට අහස්කුස මහා සමුද්‍රයක් මවා, සුවහස් රළපතර මවා, දහස් සුවහස් යොදුන් දිව්‍ය මත්ස්‍ය රූපයක් මවා, ඔහු කන්පත් වරල්පත් ලෙලවමින්, මහමුහුද ඇවිදිනා ලෙස් දක්වා, ඔහු සක්වළගැබෙහි ඇවිදවීමෙන් මහ මත් රළ සේ දක්ව දක්වා, ජලරාජ නම් වූ ඍද්ධි පූජාවක් කළ දැ ය. වේලෙහිදු මුළු ලෝ විස්මය පත් විය.

නැවත "ස්වාමීනි! දහවල් තරු පිරිවර සඳක් දුටු විරූද" යි කියාලා ඌනපණස් යොදුන් සඳමඬල මවා, සියාරා මඹුලු මවා, රජ ග්‍රහතරු අට හා නක්ෂත්‍ර තාරකාවන් සත්විසිදෙනා හා පාදයන් අවතුරාසියක් දෙනා හා රාසිග්‍රහයන් දොළොස් දෙනා හා යනාදි වූ සුවහස් ගණන් තරු මවා, අසමාන වූ චන්ද්‍රවිමාන නම් ඍද්ධි පූජා වෙකින් බුදුන් පුදා "ස්වාමීනි! මේ පෙළහර කරණ තුඹ කවුරුද" යි දූත දූතම නමන් වහන්සේගේ සිංහනාද අසන පිණිස දිව්‍ය මනුෂ්‍ය යන් හඬගා විචාළ වේලෙහි "ස්වාමීනි! මම ය, සඳදෙවියෙක් නො වෙමි. ගෞතම නම් බුදුරජානන්ගේ පාරමිතා නමැති කෞමුදයන් පුබුදු කරවා දිළු යශොධරා චන්ද්‍රිකාවෝ නම් මම ය" යි තුන්ලොවට ඇසෙන සේ හඬ ගා කී සේක. එ වේලෙහි උපන් සන්තොෂයෙන් තුන්ලෝ පුරා සිටි දිව්‍ය මනුෂ්‍ය ස්ත්‍රී සෙනගෙන් "මම ද බුදුවන මහතාක්හමම පාදචාරිකා වෙම්ව යි මෙබඳු වූ

ශ්‍රීයෙක්, මෙබඳුවූ පෙළහරෙක්, මවත් වේවා"යි කියා කියා ප්‍රාර්ථනා නො කොට සිටි එක ද සත්ත්වයෙක් නැතැයි සිතමි. සියල්ලෝම එක පැහැර පතමින් සාධුකාර දුන්හ.

නැවත ඒ පෙළහර ද හැර පසස් යොදුන් හිරිමඬල මවා, දහසක් රැස්කඳු දසදිග විහිදුවා "ස්වාමීනි! මම ය සූර්‍ය්‍ය දෙවතාවා නොවෙමි. යශෝධරා ස්ථවිරිමි" යි හඬ ගා කියා සියලු සත්ත්වයන්ගේ මුඛපද්මයන් ප්‍රබෝධ කරවා බුදුන්ට සූර්‍ය්‍යවිමාන නම් වූ අසමානවූ සාධුපූජාවක් කළසේක.

නැවත එක්ලක්ෂ අවසැටදහසක් යොදුන් උස මහමෙර මවා මෝරුමතක් පෙරළන්නා සේ එ පිටින් මෙ පිට පෙරළු පෙරළා සතර දිග සතර වර්ණය මෙන මෙනම දක්වා සිනෙරු සිටි යක්සුරු සත් කුලපව්වන් මෙන මෙනම දක්වා මහත් වූ සාධු පූජාවක් කළ සේක.

නැවත එ පෙළහැර "ස්වාමීනි! මාගේ බුදුහු ශක්‍රයාගේ සම්පත් නොපව සද්ධර්මයෙන් දක්වූ සේක. දැන් මම ද නොපව සෘද්ධිබලයෙන් දක්වමි, බලව" යි කියන්නාක් මෙන් මොහොතක් කලින් ඔහුගේ ශක්‍රපුරයෙහි දහසක් රුවින් දෙරටු ය, දෙසිය පණසක් රුවන් පවුරු ය, නොයෙක් උයන් පොකුණු ය, වෛජයන්ත ප්‍රාසාදය, සුධර්මා නම් දිව්‍ය සභාමණ්ඩපය යනාදී වූ නොයෙක් කර්මාන්ත විශේෂයෙන් විශේෂ වූ ශක්‍රපුරය දුන එලකයෙහ සඳ තුබූ දූ ඉත් තන් පාතා සේ නිම්ලකොට දක්වා, නැවත ඔහු දෙවගනන් පිරිවරා පාණ්ඩුකම්බල ශෛලාසන පැනනැඟී හුන් ලීලා ය, දිවපිරිස් පිරිවරා සුදර්ශන නම් රත්වීථියෙහි නික්මුත් ශ්‍රීවිභූතිය තෙතිස්කුඹෙහි වෙනවෙන මැවූ දළින් හා දළෙහි මැවූ දිව්‍ය පොකුණෙන් හා පොකුණෙහි මැවූ පියුම් ගසින් හා ගසෙහි ගසෙහි මැවූ පියුමෙන් හා පියුමෙහි පියුමෙහි මැවූ පෙති පෙත්තෙන් හා පෙත්තෙහි පෙත්තෙහි බැස නටන දිව්‍යාඞ්ගනා පෙළින් හා සැදුම් ලද ඓරාවණ නම් දිව ඇත් රජහු පැන නැඟී දෙදෙව්ලොව දෙවියන් ගෙණ ඔහු තඳුනුයන් නික්මුත් දිව්‍යශ්‍රීදූයි යනාදි මගයෙන් ශක්‍රයාගේ රූපය මවා පෑසේක. එකෙණෙහි එතැනට රැස්වූ දසදහසක් සක්වළ දසදහසක් ශක්‍රදේවෙන්ද්‍රයෝ "ඍකාලා! මූ නොසි ශක්‍රයෙක් දූයි අපටත් වඩනා ශක්‍රයෙකැ යි කිය කියා දෙහොත් මුදුන් දී වැඳ සාධුනාද පූජා කළහ.

එවේලෙහි ස්වාමීනි! මම ය, ශක්‍රයෙකිම නොවෙමි. තමන් මවු කුසින් උපන් වේලෙහි පටා දසදහසක් ශක්‍රදේවෙන්ද්‍රයන් අතින් වැඳුම් ගත්තාවූ ගෞතම නම් බුදුරජානන් වහන්සේ ගම වසන

කල අග මෙහෙසින් වූ යශෝධරා දේවීමි" යි හඬගා කී සේක. එ වේලෙහි මුළු ලොව සාධුනාදයෙන් ඒක නින්නාද වී ය. මම ද බුදුවෙම්ව යි ප්‍රාර්ථනා නො කළ එක ද පුරුෂයෙක් නැතැයි සිතමි. මම ද බුදු කෙණකුන්ට සසර ප්‍රජාපතී වෙම්වයි නොපතා සිටි එක ද ස්ත්‍රියක් නැතැයි සිතමි. ඒ සන්තෝෂයෙහි නුවන් නො තෙමූ එක ද පෘථග්ජන කෙණෙක් නැතැයි සිතමි.

නැවත ඒ ශක්‍රරූපය අන්තර්ධාන කොට සක්වළ දහසක් වසා සිටිනා තරම් මහත්වූ දිව්‍යරූපයක් මවා ගෙණ එක් පත්ලක් ඔසවා ගෙණ, දහසක් සක්මළ වසා තබමින් අනික් පත්ලෙන් අනික් දහසක් සක්වළ වසමින්, මෙසේ දහසක් සක්වළට පියවරක් පිය වරක් බැගින් ඔබමින් මොහොතක් කලින් අනන්තාපරිමාණවූ සක්වළ ඇවිද බුදුහු යයි යන නාම මාත්‍රාවක් නො ඇසූ විරූ සත්ව යන්ට මේ මඟුල් සක්වළ බුදුන් උපන් බව අස්වා අස්වා, බුදුන්ගේ නාමය ද අස්වා අස්වා තුණුරුවනේ නම කිය කියා ඇසිල්ලෙකින් මේ සක්වළට පැමිණ "මම් ය, යශෝධරා දේවිමි" යි හඬගා කීදැ ය. ඒ ශබ්දය කෝටියක් සක්වළට ඇසිනි. එ කෙණෙහි දූ තුන් ලොව පුරා සිටි දිව්‍ය මනුෂ්‍ය සේනාව අප්‍රමාණවූ සාධුනාද පූජා වෙන් තුන්ලොව පිරූහ. එවේලෙහි උන්වහන්සේ විසින් දක්වූ නො එක් පෙළහර පූජාවන් හා සත්වයන් කළ අද්භූත පූජාවන් වෙන වෙනම විශේෂයෙන් ගෙණහැර දක්වම් නම් මාගේ එක මුඛයකින් තබා සියක් දහසක් ලක්ෂයක් මුඛයෙකිනුත් කියා නිමවාගත නො හැක්කේ ම ය.

මෙසේ නො එක් පෙළහරින් මුළුලෝ විස්මයපත් කරමා තමන් වහන්සේගේ නොයෙක් සෘද්ධිබල දක්වා පූර්වේනිවාසානුස්මෘතිඥාන සෘද්ධි දක්වා මහපිරිසට දේශනාවක් කෙරෙමි යි සිතා ඒ දිව්‍යරූපය අන්තර්ධාන කොට දෙලොස් යොදුන් මහබඹ වෙසක් මවා දැත දසඟිල්ලෙන් දිවූ දසරස්කඳින් දසදහසක් සක්වළ ඒකා ලෝක කරවමින් "මාගේ බුදුන් නාරද නම් බ්‍රහ්මරාජන් සමයෙහි නුදුටු කෙණෙක් දැන් මා දකුව" යි කියන්නා සේ මුළුලොවට පෙණී පෙණී ආකාශයෙහි පලග් බැඳ වැඩහිඳ එකෙණෙහි එක්ලක්ෂ පණස් දහසක් බ්‍රහ්මරාජයන් ආදිවූ සියලු දිව්‍යමනුෂ්‍ය සේනාව අහෝ! සාධු අහෝ සාධු යි එකපැහැර කියා, කිම් නුඹ කවර සක්වලෙකින් වැඩි බ්‍රහ්මරාජ කෙණෙක් ද, මේ දස දහසක් සක්වල ම බ්‍රහ්මරාජයෝ නුඹ වඳින්නාහ. පුදන්නාහ. නුඹ සියලඟින් දිවන බඹරස්කඳින් සියලු දසදහසක්

සක්වළ බ්‍රහ්මයෝ කණාමැදිරියන් සේ නිෂ්ප්‍රභ වූහ. නුඹ කවුරු දැ" යි දූත දූත ම තමන් වහන්සේගේ සිංහනාද අසන නිසා විචාළ කල්හි සත්වයෙනි! මම දෙවියෙක් බඹෙක් නොවෙමි. ගෞතම නම් බුදුරජාණන්ට සංසාරයෙහි පක්ෂපාත ම ආ එක්තරා එක් කුලදුවකිමි. සෙසු කල් තබා ඔබ මහා සුදර්ශන නම් චක්‍රවර්ති රජ ව දොළොස් යොදුන් සත්රුවන්මය වූ නුවර අසංඛ්‍යයක් හවුරුදු රජසිරි වුන් සමයෙහි සුවාසූ දහසක් සිගෝවරුන්ට අධිපතිවූ සුභද්‍රා නම් අගදේවී නමුදු මම ම ය.

"මණිචෝර ජාතකයෙහි සත්‍යක්‍රියා බලයෙන් ඔබ දිවි රැක දී ඔබ ලවාම මුළු දඹදිව අග රජය කරවාලූ ශීලබල වික්‍රම ඇති සුජාතා නම් අගදේවි නමුදු මම ම ය. සුරුචිජාතකයෙහි ඔබගේ ප්‍රඥා පාරමිතාවට අනුබල ව ඔබ ශ්‍රීවනත කරවාලූ සුවණ්ණකාර ධීතෘකාවෝ නමුදු මම ම ය. කුම්භාසපිණ්ඩ ජාතකයෙහි ඔබ මුළු දඹදිව දශරාජ ධර්මයෙන් පිරූ සමයෙහි දානපාරමිතා ලතාව මල් ගන්වා දෙවාලූ මල්ලිකා දේවි නමුදු මම ම ය. ආදිත්‍ය ජාතකයෙහි ඔබ භරත නම් රජ කල්හි සත්‍යක්‍රියා බලයෙන් තමන් දූතයන් උතුරු හිමාලයට යවා පසේ බුදුන් ගෙන්වා මහදන් දෙවා පින් රැස්කරවාලූ සමුද්‍රවිජයා නම් දේවී නමුදු මම ම ය. චුල්ලබොධි ජාතකයෙහි ඔබ බ්‍රාහ්මණ මහසාර සැපත් හැර වල් ගොස් තපස් කළ සමයෙහි ඔබ හා සමග ම ගොස් සමග ම මහණ ව, දස හවුරුද්දක් එක පන්සලෙහි වැස දවසෙකත් බ්‍රහ්මචර්‍යාවට අන්තරායක් නොසිතුවාවූ ශීලපාර-මිතාව සාධා දුන් සම්මිල්ලභාසිනී නම් ඒ පරිබ්‍රාජිකාවෝ නමුදු මම ම ය. විසය්හ ජාතකයෙහි ඔබ විසය්හ නම් ධන සිටුව මහත් වූ දාන ප්‍රවාහ කළා වූ සමයෙහි දු කැතෑ යි යන බසක් නොකියා දවසෙක් කුසීත නො ව දානපාරමිතාව සාධා දුන් විසය්හ නම් සිටුදේවී නමුදු මම ම ය.

"උදය භද්ද ජාතකයෙහි ඔබ උදය භද්ද නම් රජ කල්හි සත්සියයක් හවුරුදු එක ගෘහයෙහි සැතපී බ්‍රහ්මචර්‍යාවට අන්තරායක් නොකළාවූ තමන්ගේ ගුණධර්මයෙන් ශක්‍රදෙවෙන්ද්‍රයා ලවා සාධුකාර දෙවාපු මහපින්වත් ඒ උදයභද්‍රා දේවී නමුදු මම ම ය. දශරථ ජාතකයෙහි ස්වාමිදරුවන් රාම නම් රජ ව සොළොස් දහසක් හවුරුදු දශවිධ වූ රාජධර්මයෙන් පිරූ සමයෙහි ඔබට පතිනී ව විසූ ලොකයෙහි ගුණවත් ස්ත්‍රී නම් සීතා දේවී ම යැ" යි තුඹ තුඹ කියවාපු ඒ සීතා දේවී නමුදු මම ම ය. චන්ද කින්නර ජාතකයෙහි ශීල බලයෙන් සක්දෙව් රජහු ගෙන්වා ඔහු ලවා ඔබ දිවිරැක දෙවාලූ

සඳ නම් ඒ කින්නරාඞ්ගනාවෝ නමු දු මම් ම ය. චම්පෙය්‍ය ජාතකයෙහි ඔබ චම්පෙය්‍ය නම් නාගරාජ කල්හි අහිතුණ්ඩිකයා අතින් ගලවා සවකීයවූ නාගභවනයෙහි ම පිහිටුවාලූ සුමනා දේවී නමු දු මම් ම ය. ජයද්දිස ජාතකයෙහි ඔබ ජයද්දිස නම් රජ ව යක්‍ෂයක් හට බත් වූ දවස් ශීලානුභාවයෙන් ඔබ දිවි රැක දී බොහෝ දවසක් එක්ව රාජ්‍යශ්‍රී අනුභව කළාවූ රාජමහිෂිකාවෝ නමුදු මම් ම ය. චුල්ලසුතසෝම ජාතකයෙහි ඔබ සුතසෝම රජ ව සුවාසූ දහසක් ගවුරුණු රාජ්‍යය කොට පලමුවන තරකෙස දුක රජය හැර තපසට යන ද සොළොස් දහස් සත්සියයක් බිසෝවරුන් හා සමඟ එක්ව ගොස් තපස් කළා වූ චන්ද්‍රාදේවී නමුදු මම් ම ය.

“මහාජනක ජාතකයෙහි ඔබ මහාජනක නම් රජ කල්හි ඔබ හා සමඟ ම රජය හැර ගොස් තපස් කළාවූ සීවලී නම් අග දේවී නමුදු මම් ම ය. ඛණ්ඩහාල ජාතකයෙහි ඔබ සඳ නම් රජකුමාරව ඝාතක නිසා මරණ ප්‍රාප්තවූ සමයෙහි සත්‍යක්‍රියා බලයෙන් ඔබ දිවි රැකදී බොහෝ දවසක් එක්ව ම රාජ්‍යශ්‍රී අනුභව කළාවූ සඳ නම් දේවී නමු දු මම් ම ය. විධුර ජාතකයෙහි ඔබ විධුර නම් මහ පඬිව මහත් වූ නුවණ බල වික්‍රම දක්වූ සමයෙහි දහසක් ස්ත්‍රීන්ට නායකවූ ප්‍රජාපති දේවී නමුදු මම් ම ය. අනනුසෝචිය ජාතකයෙහි උපෙක්‍ෂා පාරමිතාව සාධා දුන් සම්මිල්ලහාසිනී නම් පරිබ්‍රාජිකාවෝ නමු දු මම් ම ය. ඔබ මහෞෂධ නම් පඬි කල ඒ සා මහත් සැපතක් උපදවා ගැන්මෙහි අනුබල වූ බොහෝ දවසක් ප්‍රේමණීය ව විසූ අමරාදේවී නමු දු මම ය. මහා වෙස්සන්තර ජාතකයෙහි සත් වාරයක් මහපොළොව ගුගුරුවා දෙවි බඹුන් ලවා සාධුකාර දෙවා දානපාරමිතාව කුළුගන්වා දෙමාලු මද්‍රිදේවී නමු දු මම් ම ය.

තව ද: මනොජ ජාතක-ලක්ඛණ ජාතක-සුසන්ධි ජාතක-චක්කවාක ජාතක යනාදීවූ ජාති සහස්‍රයෙහි ඔබ හා සමඟ ම වැස ඔබගේ පාරමිතාවන්ට මා අනුබල වූ කල් මෙතෙකැ යි පමණ නැත. නො එක් ජාතියෙහි ස්වාමිදරුවෝද මට උපකාරී ම වූ සේක. මම ද ස්වාමිදරුවන්ට පක්‍ෂපාත ම වීමි. කල්‍යාණ වූ පුරුෂයන් විසින් ස්ත්‍රීන්ට ආදර සහිත වූ තෙපුල් කීම ය, අනාදර මිශ්‍ර වූ තෙපුල් නො කීම ය, සොඳුරුවන් හැර පරඳුරුවන් කෙරෙහි සහන නො වීම ය, භොජන සංවිධානයෙහි ස්ත්‍රීන් ම නායක කොට තිබීම ය, කලින් කලට තරම් වූ වස්ත්‍රාභරණ සපයා දීම ය යන මේ පඤ්චවස්ථාන සංග්‍රහයෙන් මට සංග්‍රහ කළ සේක් මි ය.

"මම ද කල්‍යාණ වූ ස්ත්‍රීන් පුරුෂයන්ට කළ මනාවූ මනාව කරණලද කර්මාන්ත විධානය, මනාකොට ආශ්‍රිත ජනයන් සිත් ගැන්ම ය, ස්වාමිහු හැර පරපුරුෂයන් කෙරෙහි සක්ත නොවීම ය, රැස්කළ සම්පත් රක්‍ෂාකිරීම ය, සියලු කාර්‍ය්‍යාකාර්‍ය්‍යයෙහි අලස නොවී දක්‍ෂ වීම ය යි යන මේ පඤ්චස්ථානයෙන් ඔබට විශේෂයෙන් සංග්‍රහ කෙළෙම් ම ය. එහෙයින් මේ සංසාරයෙහි ඔබ ද මා පඤ්චස්ථාන සංග්‍රහයෙන් පිදූ සේක. මම ද ඔබ පඤ්චස්ථාන සංග්‍රහයෙන් පිදීමි.

"තව ද: පින්වත් ස්ත්‍රී-පුරුෂයෙනි! දිව්‍යාංගනාවෙනි! මේ ලෝකයෙහි ස්ත්‍රී-පුරුෂයෝ නම් චක්‍රයන් දෙදෙනාගේ සම වූ යොගයෙන් සම ව ගමන් යන්නා වූ රථයන් වැනියහ. එසේ හෙයින් සම සම වූ අදහස් ලැබිය යුත්තාහ. කල්‍යාණ ස්ත්‍රීන් විසින් වල්ලභයෝ නම් ආදර කටයුත්තාහ. දෙවියන් සේ, ගුරුන් සේ මවුන් සේ පියන් සේ සිතිය යුත්තාහ. පුරුෂයන්ට අනාදර කළාවූ ස්ත්‍රීහු එ පවින් ගොස් අපායගත වන්නාහ. පුරුෂයන්ට ආදර කළා වූ ස්ත්‍රීහු එ පිණින් සුගතියෙහි උපදනාහ.

"වධක භාර්‍ය්‍යා ය - චෞර භාර්‍ය්‍යා ය - ස්වාමි භාර්‍ය්‍යා ය - මාතෘ භාර්‍ය්‍යා ය - භගිනි භාර්‍ය්‍යා ය - සඛී භාර්‍ය්‍යා ය - දාසි භාර්‍ය්‍යා ය යි ලෝකයෙහි පුරුෂයන්ට ස්ත්‍රීහු සත් දෙනෙක් වන්නාහ. ඔවුන් අතුරෙන් වධක භාර්‍ය්‍යා නම් කවර? යත්;

යම් ස්ත්‍රියක් ස්වාමියා කෙරෙහි හැම වේලෙහි ම දුෂ්ට වූ අදහස් ඇත්තී ද, සිතින් ප්‍රේමයක් නැති ව වඤ්චාමයවූ ප්‍රේම හඟවන්නී ද, ස්වාමිහු කෙරෙහි ඇලුම් නැති ව පරපුරුෂයන් කෙරෙහි සක්ත ව ඇවිදිනී ද, පරපුරුෂයන් ගරු කොට සිතන්නී ද, ස්වාමි පුරුෂයා ලඝු කොට සිතන්නී ද, ගලින් පැන් උකවාගත නො හැක්කා සේ පුරුෂයා දුඃඛිත වූ අවස්ථාවෙහි ඔහට බැරි බැරි වූ සම්පත් එලවන්නී ද, ස්වාමිහු දක්ක දී උස්පුටු ආදියෙහි ඉඳීමෙන් ආක්‍රොශ-පරිභව කිරීමෙන් අනාදර කරන්නී ද, එසේ වූ ස්ත්‍රී තොමෝ දිව්‍ය සමාන රූ ඇත්තී නමුත්, උතුම් වූ ජාති ඇත්තී නමුත්, අපමණ වූ ධනාද සම්පත් හා දාසිදස් පිරිවර ජනයන් ඇත්තී නමුත්, ඕ තොමෝ ඔහට භාර්‍ය්‍යාවක් නො වන්නී ය. ඔහුගේ අකුසල් නමැති වධකයා ඔහට වධ පිණිස මවාලූ අනුබන්ධනයක් වැන්නී ය. උරචක්‍රමාලාවක් වැන්නී ය. ඔහට හැම වේලෙහි ම අඝෝරා ගෙණ සිටිනා වධකා ඛුධයක් වැන්නී ය. කෙහෙලොමින් බැඳ සිරෝමුදුන් කළාවූ කඩු මුවහතක් වැන්නී ය. මේ ආදි කාරණයෙන් ඕ තොමෝ වධකභාර්‍ය්‍යා නම් වන්නී ය යි දතයුතු. එයින් වදාළසේ:-

පදුට්ඨචිත්තා අහිතානුකම්පිනී
අඤ්ඤෙසු රත්තා අතිමඤ්ඤතෙ පතිං
ධනෙන කීතස්ස වධාය උස්සුකා
යා එවරූපා පුරිසස්ස භරියා
වධකා ච භරියා ති ච සා පවුච්චති-යි.

තව ද: චෞර භාර්‍ය්‍යා නම් කවරී? යත්; යම් ස්ත්‍රියක් තොමෝ තමා සිත් සේ වෂන්නී ස්වාමිහු ඇසිල්ලකුත් ගෙයි රඳනු නො දී කෘෂි වණික් ආදී නො එක් කර්මාන්තයෙහි යොදා ද: ඒ ඒ තන්හි යවන්නී ද, නො එක් පාපක්‍රියාවෙහි යොදන්නී ද, ඔහු ගෙණා ගෙණ සැපත් නසවන්නී ද, ඒ ඔහට නොපානී ද, පරපුරුෂයන්ට දක්වන්නී ද, ඔහු කී රහස් තමා හා විශ්වාසයනට කියා ඇවිදිනී ද, තමාට දිලු සැපතෙහි සරු නො කරන්නී ද, නුදුන් සැපතක් එල වන්නී ද, ස්වාමිහුගේ විශ්වාසයන් බන්ධූන් ආශ්‍රිතයන්ට සංග්‍රහ නො කරන්නී ද, තමාගේ බන්ධූන්-විශ්වාසයන්ට ම දෙන්නී ද, සත්පුරුෂ සංග්‍රහයෙහි ආදර නැත්තී ද, අසත්පුරුෂ සංග්‍රහයෙහි උත්සාහ ඇත්තී ද, එබඳු වූ ස්ත්‍රී තොමෝ ඒ පුරුෂයාට භාර්‍ය්‍යා නම් නො වන්නී ය. ඔහුගේ ඇඟ නැඟී ගඩක් වැන්නී ය. පොලුක් වැන්නී ය. අසාධ්‍ය වූ ව්‍යාධියක් වැන්නී ය. ඔහුගේ අකුසල් නමැති යමදූතයා ගෙණහැර ඔහු කෙරෙහි පිහිටුවාලූ චෞර සත්‍රියක් මැන්නී ය ඔහුගේ සම්පත් නමැති වනයට පැමිණි ලැව්ගිනි කඳක් වැන්නී ය. කුසල් නමැති රුකට කෙටේරියක් වැන්නී ය. මේ ආදි කාරණයෙන් ඕ තොමෝ චෞර භාර්‍ය්‍යා නම් වෙයි දතයුතු. එයින් වදාළහ:-

යා ඉච්ඡති වින්දති සාමිකො ධනං
සිප්පං වණිජ්ජාච කසිං අධිට්ඨහං,

අප්පම්පි තස්සා අපහාතුමිච්ඡති
චෝරී ච භරියාති ච සා පවුච්චති-යි.

තව ද: ස්වාමිභාර්‍ය්‍යා නම් කවරී? යත්; යම් සත්‍රියක් පුරුෂයා හට අනර්ථයක් කැමති වන්නී ද, හැම වේලෙහි ම ගෙයහැර ඒ ඒ තන්හි ඇවිදීමෙන් - ගෙයි දොර සිත් නැති වීමෙන්-පරපුරුෂ සේවනාදියෙන් - අලස ම පවත්නී ද, බොහෝ කොට අනුභව කරන්නී ද, තමා උපන් ජාතියට නො තරම් වූ සම්පත් ප්‍රාර්ථනා කරන්නී ද, තමා සය මුත් අනුන් සය නො දන්නී ද, ස්වාමිහට අනාදර කොට ස්වාමිදූවක මෙන් පවත්නී ද, ස්වාමිහට අනිවණ්ඩ වූ

අතිලාභීන වූ පුරුෂයා වධකයෙක් කියන්නී ද, ඔසී ද ඕහට භාර්‍යා වක් නොවන්නී ය. ඔහුගේ අභාග්‍ය කමැකි යමරජහු ඕහට නිග්‍රහ කරව යි එවාලූ යමදූතියක වැන්නී ය. මේ ආදී කාරණයෙන් ඕ තොමෝ ස්වාමි භාර්‍යා නම් වෙයි–දතයුතු. එහින් වදාළහ:

අකම්මකාමා අලසා මහග්ඝසා
යා එවරූපා චණ්ඩී දුරුත්තවාදිනී,

උට්ඨායකානං අභිභුය්‍ය වත්තති
අයිරා ච භරියාති ච සා පවුච්චති–යි.

මේ වධක භාර්‍යා ය, චෝර භාර්‍යා ය, අයිරා භාර්‍යා ය යි දක්වූ පාප ස්ත්‍රී තුන් දෙන දුශ්ශීල ව වාක්පරුෂයෙන් යෙදී පුරුෂයන්ට අනාදර කළා වූ මිත්‍රද්‍රෝහ සංඛ්‍යාත වූ අකුසල් බෙලෙන් මිය නරකයෙහි ඉපැද බොහෝ කලක් දුක් ගන්නාහ. එසේ හෙයින් සත්පුරුෂ වූ ස්ත්‍රීන් විසින් එ බඳු වූ පාපගුණයන් අහසට පොළොව සේ දුරින් දුරුකොට එබඳු පුරුෂයන් කෙරෙහි පක්‍ෂපාත ව විසිය යුතු. එහින් වදාළෙ බුදුහු:—

යා චා'ම භරියා වධකාති පවුච්චති
චෝරී ච අයිරාති ච යා පවුච්චති,

දුස්සීලරූපා ඵරුසා අනාදරා
කායස්ස භේදා නිරයං වජන්ති තා–යි.

තව ද: මෙහි මාතෘභාර්‍යා නම් කවරී යත්; යම් ස්ත්‍රී කෙනෙක් රක්‍ෂා කළ ස්වාමිහු කෙරෙහි හැම වේලෙහි ම මවකට බඳු වූ. අනු කම්පා ඇතියාහු ද, දූහා ද සම්පත් රක්‍ෂා කරණ මවුන් සේ ස්වාමිහු රැස්කළ ධනය රක්‍ෂා කෙරෙද් ද, වේලා නො වරදවා පුරුෂයන් කවන්නාහු ද, පොවන්නාහු ද, උලන්නාහු ද, නාවන්නාහු ද, හැම වේලෙහි ම පුරුෂයන්ගේ සුවදුක්හි ම යෙදී වෙසෙද් ද, ස්වාමිහු පාපයක් කරණ වේලෙහි ද, විමාදයක් කරණ වේලෙහි ද, එළු සොර කම් – මී සොරකම් – ගෙවදිනා සොරකම්–ආදි වූ නොකටයුත්ත කට නික්මුනු වේලෙහි, "මෙසේ මෙසේ වූ වරද කර නම් නොප කෙරෙහි නො වසම්හ. අපි අපගේ කුලගෙට යම්හ"යි යනාදීන් තදින් – මොළොකින් නො එක් තෙපුල් කීමෙන් ඒ පාපයෙන් වළකද් ද "කෘෂි වණික් ආදි වූ නිරවද්‍ය කර්මාන්ත කරව, රජුන්ට පක්‍ෂපාතව වසව. පෙහෙ වව. බණ අසව. කුසල් කරව" යනාදීන් පුරුෂයන් කුශලධර්මයෙහි පිහිටුවාලද් ද එසේ වූ ස්ත්‍රී නම් ඒ පුරුෂයන්ගේ කුශල් නමැති දෙවියන් ඔවුන්ට අරක්ගෙණ සිටුවාලූ මවුන් වැනියහ. ශ්‍රීකාන්තාවන් වැනියහ. දෙමහා ධූත්

වැනියහ. ඔවුන්ට ශ්‍රී ශෝභා දෙන දිව්‍ය මන්ත්‍රයක් වැනිහ. ඔවුන්ගේ අකුසල් නමැති ව්‍යාධීන් සංසිඳුවා දෙන දිව්‍යෞෂධයක් වැනිහ. ඔවුන්ට යැපත් ශෝභා දෙන කල්පලතාවක් වැනිහ. මේ ආදී කාරණයෙන් ඒ ස්ත්‍රී මාතෘ භාර්‍යා හ යි දතයුතු. එයින් වදාළහ:-

යා සබ්බදා හොති හිතානුකම්පිනී
මාතා'ව පුත්තං අනුරක්ඛතෙ පතිං,
තතො ධනං සම්භතමස්ස රක්ඛති
මාතා ච භරියා ති ච සා පවුච්චති-යි.

තව ද: මෙහි භගිනී භාර්‍යා නම් කවරි? යත්; යම් ස්ත්‍රී කෙනෙක් තමන් රක්‍ෂා කළ පුරුෂයන් කෙරෙහි මලුන් බෑයන් කොට සිතා නගුන් බුහුනුන් සේ මනත් වූ භයලජ්ජාවෙන් හැකිළ හැකිළ උදූර වූ ආදරයෙන් පවත්නාහුද, "සියලු පුරුෂයන්ගේ ස්ථානාන්තර හා ඓශ්වර්‍ය්‍ය හා සම්පත් තමන් පුරුෂයන්ට ම වේව" යි සිතන්නාහු ද, පතන්නාහු ද, පරපුරුෂයන් කෙරෙහි ලෝභ නො කරන්නාහු ද, ස්වාමිපුරුෂයන් කෙරෙහි ම ඇලුම් ඇත්තාහු ද, එසේ වූ ස්ත්‍රී නම ඒ පුරුෂයන්ගේ ම පිණින් දෙවියන් ඔවුන් හරා එවාලූ නගුන් බුහුනුන් වැනිහ. මේ ආදී කාරණයෙන් ඔහු භගිනී භාර්‍යා නම් වන්නාහයි දතයුතු. එයින් වදාළහ:

යථා'පි ජෙට්ඨා භගිනී කනිට්ඨා
සගාරවා හොති සකම්හි සාමිකෙ,
හිරිමනා භත්තු වසානුවත්තිනී
භගිනී ච භරියා ති ච සා පවුච්චති-යි.

තව ද: මෙහි සඛී භාර්‍යා නම් කවරි? යත්; යම් කල්‍යාණ වූ ස්ත්‍රී කෙනෙක් තමන් රක්‍ෂා කළ පුරුෂයන් බැහැර ගිය කල්හි දූ එක්වන් සිහි කොට කොට හිඳිනාහු ද, ඔවුන් එන මග එක්වන් බලන්නාහු ද, හැම වේලෙහි ම ඔවුන්ට මහීයනය කරන්නාහු ද, තමන් පුරුෂයන්ගේ සරුපයක් ඇසූ කල්හි හිරුරස් දුටු පියුමක් සේ අති සන්තොෂ වන්නාහු ද, තමන් පුරුෂයන්ගේ දර්‍ශන යෙහි දු ඉතා සන්තොෂ වන්නාහු ද, තමන් පුරුෂයන්ගේ සතුරන් මිතුරු කොට නො වසන්නහු ද, මිතුරන් සතුරු කොට නො වසන්නාහු ද, සතුරන් සතුරු කොට ම - මිතුරන් මිතුරු කොට ම වසන්නාහු ද, තමන් පුරුෂයන්ගේ නුගුණයක් ඇසූ කල නුගුණ සඟවා ගුණයෙහි ම පිහිටුවන්නාහු ද, පුරුෂයන් ආක්‍රොශ කරන්නවුන් නවතන්නාහු ද, ගුණ කියන්නවුන්ට ප්‍රශංසා කරන්

නාහු ද, තමන් පුරුෂයන්ගේ ගුණ හා බල වික්‍රම අනුන්ට හඟවන්නාහු ද, තමන් ඇසූ රහස් තමන් තමන් පුරුෂයන්ට නොසඟවා කියන්නාහු ද, පුරුෂයන් කී රහස් බහයේ රක්ෂා කරන්නාහු ද, අභාවයෙහි ශෝක කරන්නාහු ද, විභවයෙහි සන්තෝෂ වන්නාහු ද, උතුම් වූ භෝජන පුරුෂයන් සිහිගනාට නොකොට අනුභව කරන්නාහු ද, ඔවුන්ටත් මේ ලැබේවයි සිතන්නාහු ද, එසේ වූ ස්ත්‍රී නම් පුරුෂයන්ගේ කුසල් නමැති දෙවියන් පාවාදුන් යෙහෙළියන් වැනියහ. මේ ආදී කාරණයෙන් ඔහු සඛී භාර්‍ය්‍යා නම් වන්නාහ යි දතයුතු. එයින් වදාළහ:

යා'චීධ දිස්වාන පතිං පමෝදිතා
සඛී සඛාරං ව චිරස්සමාගතං,
කොලෙය්‍යකා සීලවතී පතිබ්බතා
සඛී ච භරියා'ති ච සා පවුච්චති-යි.

දාසී භාර්‍ය්‍යා නම් වූ කවරේ? යත්; යම් ස්ත්‍රී කෙනෙක් තමන් තමන්ගේ වල්ලභයන් කොපා නිග්‍රහයක් කළත්, වධ දණ්ඩනාදී පීඩා කරනත් පුරුෂයන් කෙරෙහි ද්වේෂ නො කරන්නාහු ද, ක්‍රෝධයෙන් නො බලන්නාහු ද, නො කිපී ම බලන්නාහු ද, සියලු කර්මාන්තයෙහි නො කුසී ව අප්‍රමාද වන්නාහු ද, අභිචාරාදි පාපයෙන් දුරු ව වසන්නාහු ද, පුරුෂයා පළමුව කවා පොවා අශ්‍රිත ජනයනු දු සන්හිඳුවා, තුමූ පසුව අනුභව කිරීමෙන් සුචිපවිත්‍රවූ කර්මාන්ත කිරීමෙන් ස්වාමිහු පළමු කොට සතපා සියලු සංවිධාන කොට, තුමූ පසුව සැතපීමෙන්, ස්වාමිහට පළමු කොට කොත් පොළින් පැනනැගීමෙන්, පුරුෂයන්ට වඤ්චා නොකිරීමෙන්, කී විසදමක්ම කිරීමෙන්, ශුචි පවිත්‍ර වූ කර්මාන්ත කිරීමෙන්, ස්වාමිහු ගුණ පරජනයන්ට ප්‍රකාශ කිරීමෙන්, නානා විධ වූ නිහතමාන ගුණයෙන් යුක්තයෝ ද, එසේ වූ ස්ත්‍රී නම් පුරුෂයන්ගේ පින්බලයෙන් මිපසළ වන ගෙයින් කුසල් නමැති දෙවියන් පාවා දුන් දාසීන් ම වැනියහ. අකුසල් නමැති ශරනිවාරණයට ඔහට එලනා යුධයක් සමානයහ, මේ ආදී කාරණයෙන් ඔහු දාසී භාර්‍ය්‍යා නම් මේ වන්නාහ යි දත යුතු එයින් වදාළහ:

අදුට්ඨචිත්තා වධදණ්ඩතජ්ජිතා
අදුට්ඨචිත්තා පතිනො තිතික්ඛති,
අක්කොධනා භත්තු වසානුවත්තිනී
දාසී ච භරියා'ති ච සා පවුච්චති-යි.

මෙ ශ්‍රී මාතෘ භාර්‍යාවෝ ය, භගිනී භාර්‍යාවෝ ය, සඛී භාර්‍යාවෝ ය, දාසී භාර්‍යාවෝ ය යි කල්‍යාණ වූ ස්ත්‍රීහු සතර දෙන අසාධාරණවූ ආචාරශීලයෙන් හා පතිපූජාවෙන් යෙදුනා වූ ගුණබලයෙන් මේ ජාතියෙන් මිය අපාය ඇසින් නො දක්නාහ. දෙව් ලොව ම උපදනාහ. රූපයෙන් යශසෙන් අග්‍ර ව දිව්‍යරාජයන්ට ම අග්‍රමෙහෙසින් ව ශ්‍රීසම්පත් විඳිනාහ යි දූත කල්‍යාණ වූ ස්ත්‍රී ලොකයා විසින් එබඳු වූ ගුණගණාංගයෙන් යෙදී දිව්‍යලොක මනුෂ්‍යලොක සම්පත් හස්තප්‍රාප්ත කොට කෙළවර නිවන් සම්පත් සාක්ෂාත් කට යුතු එයින් වදාළහ බුදුහු:

යා චි'ධ මාතා භගිනී සඛී ච
දාසී ච භරියා'ති ච යා පවුච්චති,
සීලෙ ඨිතත්තා චිරරත්තසංවුතා
කායස්ස භෙදා සුගතිං වජන්ති තා-ති.

පින්වත් වූ ස්ත්‍රී පුරුෂයෙනි! දිව්‍ය දිව්‍යාංගනාවෙනි! මම මනාලී ව මේ සංසාරයෙහි ඇවිදිනා කල මාගේ මේ ගෞතම නම් බුදුරජාණන්ට කලෙකත් වධක භාර්‍යා නො වීමි. චෞර භාර්‍යා නො වීමි. ස්වාමි භාර්‍යා නො වීමි. කෝටිගණන් ජාතියෙහි මාතෘ භාර්‍යා ව උපන්මි. භගිනී භාර්‍යා ව උපන්මි. සඛී භාර්‍යා ව උපන්මි. දාසී භාර්‍යා ව උපන්මි. ඔබගේ පාරමිතා ලිය දලු ලවා දිතිමි. ඒ පිණින් මම ද ඔබ සේ ම තේරස අභව්‍ය ස්ථානාදි අකුශලභූමියෙක නූපන්මි. දිව්‍යලොක මනුෂ්‍යලොකයෙහි ම බොහෝ කලක් සුව විඳ ඇවිද්දෙමි. මේ දැතුරෙහි අතික් ස්වාමියකු ප්‍රාර්ථනාත් නො කෙළෙමි. ස්වාමිදරුවෝද මා විනා අන්‍ය ස්ත්‍රියක වල්ලභ නො කළ සේක. ඔබ හා සමඟ ම මද්‍රි නම් අගබිසෝ ව, පාරමිතා සාගරයෙන් නැඟී ගොස් තුසීපුරයෙහි ඉපැද, එයින් ඔබ හා සමඟ ම අවුත් මිනිස්ලොව ඉපැද මහත් වූ ශ්‍රී සම්පත් විඳ, ඔබ කෙරේ ම මහණ ව අමාමහ නිවන් දිටිමි; සත්ත්වයෙනි! ආකාශයෙහි සිඳ බ්‍රහ්මරූපයෙන් මේ ධර්මදෙශනා කළාවූ මම දෙව් බඹ කෙනෙක් නො වෙමි. ඔබ ගම් වසන කල අගමෙහෙසිනී වූ බිම්බා දේවී නමුදු මම ම ය යි හඬගා කීය, බුදුකෙණකුන් සේ ආකාශයෙහි ම වැඩහිඳ බණ වදාරා තමන් වහන්සේගේ දෙශනා මහිම හා චිත්‍ර කපිත වූ මාක් ලීලා දක්වා මුළුලොව විස්මය පත් කළ දූ ය.

එවේලෙහි සියලු දිව්‍ය මනුෂ්‍යයන්ට බුද්ධලීලායෙන් ඔබ කළ දෙශනා හා සියලු සතුන්ට උපන් සන්තොෂ හා තුඩ තුඩ දුන් සාධුකාර හා සියලු ස්ත්‍රී පුරුෂ ලොකයාගේ මුඛ නමැති පද්මයන්

ප්‍රබොධ ව, ශ්‍රද්ධා නමැති පවනින් සාධුකාද නමැති මුවරද පෙළ පෙළ දිදී, තුන්ලොව පුරනත් ලෙස් මා සිතට මැවෙනන්නා සේ, දහම් ඇසින් මට විශෙෂයෙන් පෙණෙන්නා සේ සියලු සත්ත්වයන්ට ම දුනු දු විශෙෂයෙන් පෙණී ගියේ වී නම්, සිතී ගියේ වී නම්, ඒ පිණින් අපායෙහි නම් දන්නෝ කවුරු ද, දෙව්ලොවව නො නැඟෙන්නෝ කවුරු ද, සංසාර සාගරයෙන් නො ගැළෙවෙන්නෝ කවුරු ද-

දූත් අනාගතඥානයෙන් මාගේ බුදුන්ගේ ගුණ විශෙෂයෙන් මට පෙණෙන්නා සේ ම, නො එක් ජාතිකෝටියෙහි සියලු සතුන්ට ද කුශලාකුශල ධර්මයන් විශෙෂයෙන් දක්වාලන තරම් ලොකාව වයනීයෙහි යෙදෙම් ම යි ඒකපදික ගාථාමක් අසා සියලු ධර්මයන් දන්නා තරම් බුද්ධිවන්නීයෙහි මුදුන් පැමිණෙම් ම යි මට මෙ සා වැඩක් කළා වූ මවුත් පියන් ගුරුන් වතුන් ආදී වූ සියලු සතුනු දු සංසාරසාගරයෙන් ගොඩ නගා ඥත්‍යවචනීයෙව සාක්ෂාත් කොට ලොවුතුරා බුදු ව ධර්මයක් පවත්වන දවස් දක්වා මෙ තුණුරුවන් ප්‍රීතිය මා සිතින් නො මිදෙ ම යි, නො නැරේ ව යි, ඖෂධයන් භාවිත කොට තකාරා ගත් කිරින් නැගූ තෙලෙහි දු ඖෂධ ගුණය නො නැරෙන්නා සේ ම, මාගේ සිතිනු දු නො එක් ජාතියෙහි ශ්‍රද්ධාගුණ-ශීලගුණ-ප්‍රඥගුණ-තුණුරුවන් ගුණ එක් කලෙකත් නොර නො වේව යි බුදුබව ම සාක්ෂාත් වේව යි. එසින් නිත අ දනයෙහි:

පුත්වා තං මුනිනො වාචං - භික්ඛුනී සා යසොධරා,
වන්දිත්වා මුනිරාජං තං - ඉදං වචනමබ්‍රවි.

යසොධරා අහං වීර - අගාරෙ තෙ පජාපති
සාකියම්හි කුලෙ ජාතා - ඉත්ථියංගෙ පතිට්ඨිතා.

ඉත්ථීනං සතසහස්සානං - නවුතීනං ච ජ උත්තරිං,
අගාරෙ තෙ අහං වීර - පාමොක්ඛා සබ්බඉස්සරා

රූපාචාරගුණූපෙතා - යොබ්බනට්ඨා පියංවදා,
සබ්බා මං අපචායන්ති - දෙවතා විය මානුසා.

කඤ්ඤාසහස්සපමුඛා - සක්‍යපුත්ත නිවෙසනෙ
සමානසුඛදුක්ඛා තා - දෙවතා විය නන්දනෙ.

කාමධාතුමතික්කන්තා - සණ්ඨිතා රූපධාතුයා,
රූපෙන සදිසො නත්ථි - ඨපෙත්වා ලොකනායකං,

එවමාදීනි වත්වාන - උප්පතිත්වාන අම්බරං,
ඉද්ධි අනෙකා දස්සෙසි - බුද්ධානුඤ්ඤා යසොධරා.

චක්කවාළ සමං කායං-සීසං උත්තරතො කුරුං,
උභො පක්ඛා දුවෙ දීපා-ජම්බුදීපං සරීරතො.

දක්ඛිණානං සරං පිඤ්ජං-නානාසාඛා වුපත්තකා,
චන්දසුරියවිසාලක්ඛි-මේරුපබ්බතතො සිඛං.

චක්කවාළ ගිරිතුණ්ඩා-ජම්බුරුක්ඛං සමූලකං,
වීජමානා උපාගම්ම-වන්දතෙ ලොකනායකං.

හත්ථිවණ්ණං තථෙවාස්සං-පබ්බතං ජලජං තථා,
චන්දසුරිය මහාමේරු-සක්කවණ්ණං ච දස්සයි.

යසොධරා අහං වීර-පාදෙ වන්දාමි චක්ඛුම,
සහස්සලොකධාතූනං-ඵුල්ලපාදෙන ඡාදයි.

බ්‍රහ්මවණ්ණඤ්ච මාපෙත්වා-ධම්මං දෙසෙසි සඤ්ඤතා,
යසොධරා අහං වීර-පාදෙ වන්දාමි චක්ඛුමා-ති.

ඉක්බිත්තෙන් ඒ යශොධරා මිහාසථවිරීන් වහන්සේ ආකාශයට පැනනැගී දක්‍ෂ වූ ස්වර්ණකාරයකු එක රත්‍රන් පිඩක් ගෙණ නානා ජාතියෙහි ආභරණ විශෙෂයන් දක්වන්නා සේ, කුම්භකාරයකු එක මැටි පිණ්ඩයෙන් නානා ජාතියෙහි භාජන විශෙෂයන් දක්වන්නා සේ, බුදුමුඛයෙකින් මුත් කියා නිමවාගත නො හැකි යම කී සේ, නො එක් පෙළහර දක්වා බුඩලීලායෙන් බණ වදුරා තමන් වහන්සේ වූ පවත් මුළුලොවට අස්වා, බුදුන්ට නො එක් සතුණු පූජා කරවා, සක්විති රජකු තරු ආකාශයෙන් බස්නා සක් රුවනක් සේ, අස්තගිරියට බස්නා පුන් සඳක් සේ. මිහපොළවට බස්නා කනක් තරුවක් සේ, දිව්‍ය විමානයක් සේ, අසමාන වූ දශ්‍යමාන වූ පෙළහරින් ආකාශයෙන් බුදුන් හා මහපිරිස් මැදට බැස බුදුන්ට මැද සුරාසුරාදේවතාවාට අවතාන වූ මහපියුමක් සේ, බුදුන්ට අවනත ව දෙහොත් මුදුන් දී සිට "ස්වාමිනි! ගෞතම නම බුදුරජාණෙනි! තුන් ලෝ වාසීන්ගේ පෙම්බර පියාණෙනි! මේ සා පෙළහරක් දක්වූ මම අතික් දෙව්බඹ කෙණෙකුන්ගේ උපදෙසකින් නො කෙළෙමි. නුඹ වහන්සේගේ උපදෙස් වූ පරිද්දෙන් ම කෙළෙමි. යමකප්‍රාතිහාර්‍ය්‍ය ඥානයෙන් යුක්ත වූ ලොව්තුරා බුදු කෙණෙකුන් සිත් ගෙණ පෙළහර කිරීම නම් ඉතා උගහට දෙයෙක. මා පෑවා වූ පෙළහරෙහි, කීවා වූ බණෙහි, කිසියම් වරදෙක් වී නමුත් ඒ වරද ද ක්‍ෂමා කොට වදාළ මැනව.

ස්වාමිදරුවන්ට සංසාරයෙහි පක්‍ෂපත ව මම අවුත් මේ මාගේ අන්තිම වූ දර්ශනය යි, මේ ලෝකයෙහි මා බඳු වූ පින්වත් ස්ත්‍රී කෙණෙක් නැත්තාහ, නුඹ වැනි බුදුකෙණෙකුන්ට සංසාරයෙහි මා

කල පක්ෂපාත කම් පාරමිතාවන් සාධා දුන් ලෙස් මා වැනියන්ගේ දිවැසට පවා දුන් විශෙෂයෙන් දැනෙසකල ස්වාමිදරුවන්ගේ බුඩ ඥානයට සකසා පෙණේ මය. එහි විශෙෂ මට පෙණෙන හෙයින්, ස්වාමිදරුවන්ට ද පෙණෙන හෙයින්, ස්වාමිදරුවන් ද, මා ද, කෙලෙස් මුහුදු පීනා සසරින් ගොඩනැගී සිටි හෙයින්, මේ තැන්හි කිමෙකි එල නැත; එසේ ද වුවත් මෙ තැන්හි රැස්වූ සරාග වූ, පෂිදෙහි සැක හරණා නිසාත්, බොහෝ ස්ත්‍රී ලොකයාට අවවාද නිසාත්, බුඩපතිව්‍රතාවන්ගේ ගුණමහිම දක්වනු නිසාත්, මා කෙලෙන් කිසියම් පක්ෂපාත කමක් දක්වමි. දැන් මේ තැන්හි සිව් ම සංසාරය බලන්නා වූ මම සසර නො එක් ජාතියෙහි මාගේ ජීවිතය පුදා ස්වාමිදරුවන්ගේ ජීවිතය රක්ෂා කරවා දීලූ තැන් ම් අසංඛ්‍ය ගණන් ජාති දකිමි. සසර නුඹවහන්සේ රජකල, මා අග බිසෝ කල ම මහා වෙස්සන්තර ජාතියෙහි සෙසින් ම, යාචකයන් අවුත් මා ම දන් ඉල්ලූ කල නුඹවහන්සේ මා මුහුණ බැලූ කල්හි කිසි දොම්නසක් නැති ව:

කොමාරිකස්සාහං භරියා-සාමිකො මම ඉස්සරො,
යස්සිච්ඡ තස්ස මං දජ්ජා-විකකිණාතු හනාතු මා-ති.

යන මේ ගාථාවෙන් මා සිංහනාද කොට "ස්වාමිනි! මා හැමැත් තක්හට දන් දී වදාළ මැනවැ" යි කී කල, එ කෙණෙහි මා අත අල්වාගෙණ මිනිකත ගඩව හඩවා යාචකයන්ට දන් දුන් කල්හි හ යනී පරිත්‍යාගයෙහි මුදුන් පැමිණි කල්, දාන පාරමිතාව කුළු ගත් කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තව ද: නො එක් ජාතියෙහි යක්ෂ රාක්ෂසාදීන් වෙස් මලා අවුත් මා ම දන් ඉල්ලූ කල ඔවුන්ට මා දන් දුන් කල්, ඔවුන් මා යල්ව සල්මා කෑ කල එකල්හි දු මා කිසි දොම්නසක් නො වූ කල්, නො එක් සතුන්ට ගොදුරු නිසා මා ම දුන් කල්, එබඳු තන්හිදු දන්ලියග මා ම මිල්ගන්වා දීලූ කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තව ද: නො එක් ජාතියෙහි නුඹවහන්සේ ජීවිත වාතතිය නිසා මා විකොට කෑ කල්, මා අනුන්ට දරමිටි පැන්කළ ඇදි කල් මිඝිමෙහෙ කළ කල්, එබඳු තැන්හි දු නුඹවහන්සේ කෙරෙහි සිහිතෙනුත් මා දොම්නසක් නො වූ කල්, අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තව ද: සසර නුඹවහන්සේ නො එක් දණ්ඩනාදියෙහි හසුව මා ම උකස් කොට පාවාදී ගැලවී ගිය කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තව ද: සසර නුඹවහන්සේ උදුර වූ අදහස් ඇති බැවින් තෑගි සඳහා උපකාර සඳහා මා ම පාවාදුන් කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තව ද: සසර නො එක් ජාති ජාතියෙහි නුඹවහන්සේ හා මා හා එක මග යන කල්හි සිංහයන් ව්‍යාඝ්‍රයන දිවියන් වලසුන් කිඹුලන් යක්ෂ රාක්ෂයන් ගුගුර ගුගුරා නුඹවහන්සේ කරා දිවූ කල්හි දිව ගොස් නුඹවහන්සේ පසු කොට ඔවුන් මුඛයට පැන මා ඔවුන්ට බත් වූ කල්, නුඹ වහන්සේ ගේ දුක් කල්, මාගේ ජීවිතයට නො සිතා නුඹවහන්සේ ගේ ජීවිතයට දිවි රැකම සිතූ කල්, අසංඛ්‍ය ගණන් ජාති දකිමි.

එ කල "ස්ත්‍රියකගේ ජීවිතය දීලා මා වැනියෝත් දිවි රකිද්දැ"යි තුඹවහන්සේ ද මා ම නිසා දිවි දුන් කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තව ද සංසාරයෙහි යක්ෂ-රාක්ෂසාදීන් තුඹවහන්සේ අල්වා, ගෙණ ගොස් එක් පිඩා කරණ කල්හි මාගේ ජීවිතය ඔවුන්ට බිලියම් කොට දී තුඹවහන්සේගේ ජීවිතය රක්ෂා කළ කල්, නොයෙක් ආබාධයක් මිදූ කල්, අසංඛ්‍ය ගණන් ජාති දක්මි. තව ද බුදුරජතෙනි! තුඹවහන්සේ සංසාර දෙෂයෙන් ඒ ඒ අනුබන්ධනාදියට පැමිණි කල්හි එහි මා උකස් ව ඌන් කල්, ඒ ඒ දුකින් තුඹවහන්සේ ගැලවූහු කල්, මා ම ඒ දුක් වූන් කල්, අසංඛ්‍ය ගණන් ජාති දක්මි. තව ද: සසර තුඹවහන්සේ නො එක් වධයට පැමිණි කල්හි ඒ වධ මට පමුණුවා ගත් කල්, තුඹවහන්සේ ගොඩනැගූ කල්, එම පක්ෂපාතකමෙහි ප්‍රශස්ත වූ වධයක් ලවා මා ද ගැලවී මාගේ ගුණ බෙලෙන් ම අප දෙදෙනා ම සුවපත් වූ කල්, අසංඛ්‍ය ගණන් ජාති දකිමි.

තව ද: සසර තුඹවහන්සේ මා හැර ගොස් පරස්ත්‍රීන් කෙරෙහි හසුව නො එක් වධයට පැමිණි කල්හි එ බැවු අසා කාමක්‍රොධයක් නැති ව පුත්‍රයක්හුගේ අපාදයෙක්හි කම්පිත වන ශිවක යේ, මහ හඬින් හඩ හඩා එ තැනට ගොස් මා පලන් වස්ත්‍රාභරණ ඔවුන්ට අල්ලස් කොට දී තුඹවහන්සේ ගලවා ගත් කල්, මාතෘ භාග්‍යා වූ කල්, අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තව ද: සසර තුඹවහන්සේ මාරුගෙහි මා විකුණුම් කා දූස් වූ කල්, තුඹවහන්සේ නිදහස් වූ කල්, අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තව ද: සසර තුඹවහන්සේ ම නිසා, තුඹවහන්සේ ම පතා, හත් පලන් වස්ත්‍රාභරණ දක්වා පරිත්‍යාග කළ කල්, අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තව ද: සසර නෑට්ටිගණන් සම්පත් හැර කුල නැයන්ට නොරා එකලාව ම තුඹවහන්සේ පසු පස්සෙහි පලාගිය කල්, සිය අතින් මෙහෙ කොට කෑ කල්, බැලමෙහෙ කොට තුඹවහන්සේව ගෙණා කල්, තුඹවහන්සේ ද බැල මෙහෙ කොට මා රක්ෂා කළ කල්, අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තව ද: සසර තුඹවහන්සේ දන් පැරුම් පුරණ කල, ගේ පිරුණු සම්පත් අසංඛ්‍ය ගණන් ජාතියෙහි දිනිමි. ගම් පිරුණු පිරිවර හා ගව මහිෂාදීන් අසංඛ්‍ය ගණන් ජාතියෙහි දිනිමි. වී පිරුණු බඩසල් දිනිමි. රාජ්‍ය දිනිමි. හස්ති-අශ්ව-රථ-වාහන අසංඛ්‍ය ගණන් ජාතියෙහි දිනිමි.

තව ද: සසර මා ම කුසින් වැදූ දරුවන් තුඹවහන්සේ යාචක යන්ට බැඳ පාවාදුන් කල්, අසංඛ්‍ය ගණන් ජාති දකිමි. එ දරුවන් දන් දෙන කල ඒ ඒ දින්හි දිව පියන් අතට හසු නො වන

කල්හි කිරි පොවන තලවන පසාරයෙන් දරුවන් අල්වාගෙණ නුඹවහන්සේම දරුවන් පාවා දීලූ කල්, එ දරුවන්ට මා දුඃඛිතම් කළ කල්, නුඹවහන්සේට මා කිකරු වූ කල්, අසංඛ්‍ය ගණන් ජාති දැකිමි. එ දරුවන් දන් දුන් කල නැවත දරුවන් වඳ දුන් කල්, නුඹවහන්සේ දන්සොඬව එ දරුවනු දූ නැවත නැවත යාචක යන්ට දෙන කල මා කිසි දෙම්නසක් නොවූ කල්, අසංඛ්‍ය ගණන් ජාති දැකිමි. තව ද: සසර නුඹවහන්සේගේ සියලු සැපත් යාචක යන්ට දන් දී තව ද: දන්සොඬ ව මා පලයක් පලඳනා ගලවා දෙන කල මා දෙම්නසක් නොවූ කල්, සොම්නසින් ම පිණා පිණා සිටි කල්, අසංඛ්‍ය ගණන් ජාති දැකිමි. තව ද: සසර සක්විති රාජ්‍යය හැර, ප්‍රදෙශ රාජ්‍යය හැර, බ්‍රාහ්මණසාර සැපත් හැර සිටු සැපත් හැර, තපසට වල යන කල්හි මා ද එක්ව ම ගොස් තපස් කල කල්, නුඹවහන්සේ පන්සලින් බැහැරව ගා කො දී වන මුල් වන පලා පල පැස් පුරා මාගිසින්ම ඇදීකල්, සිල පාරමිතාව මා ම කුළු ගන්වා දෙවාලු කල් අසංඛ්‍ය ගණන් ජාති දැකිමි.

මේ ආදී කාරණයෙන් මා කළාවූ පක්‍ෂපාතකම් හා ගත් දුක් හා පාරමිතාවන් සාධා දූන් ලෙස් මා මැසියන්ගේ දිවැසව පවා පෙණෙන කල සවාමිදරුවන්ගේ බුද්ධදෙහයට විශෙෂයෙන් පෙණෙන්නේ ම ය. බුදු ඇසිනු දූ බලා වදාල මැහැවෑ හි යනාදීන් සසර නමන් වහන්සේගේ පුරාදූකම දක්වා, නො එක් ජාති දක්නා නුවණ මහපිරිසට හගවා සිංහරාජයක්හු පෙරම සිටි අභීත සිංහ ධෙනුවක් සේ බුදුන් පෙරටුව වැඩසිට අභීත සිංහනාද කල සේක. එසින් කිහ. අපදානයෙහි

යාමිසහං පුරිමං කම්මා-කුසලං සරසෙ මුනෙ,
තුය්හත්ථාය මහාවීර-පුඤ්ඤං උපචිතං මයා.

අභබ්බට්ඨානෙ වජ්ජිත්වා-පාවයන්තං අනාචරං,
තුය්හත්ථාය මහාවීර-සඤ්චත්තං ජීවිතං මයා.

නෙකකොටි සහස්සානි-භරියත්ථාය'දාසි මං,
න තත්ථ විමනා හොමි-තුය්හත්ථාය මහාමුනෙ.

නෙකකොටි සහස්සානි-භොජනත්ථාය'දාසි මං,
න තත්ථ විමනා හොමි-තුය්හත්ථාය මහාමුනෙ.

නෙක කොටි සහස්සානි-උපකාරාය'දාසි මං,
න තත්ථ විමනා හොමි-තුය්හත්ථාය මහාමුනෙ.

නෙක කොටි සහස්සානි-ජීවිතානි පරිච්චජං,
භයමොක්ඛං කරිස්සන්ති-වජාමි මම ජීවිතං,

අබ්භුග්ගතෙන අලංකාරෙ-වත්ථෙ නානාවිධෙ බහු,
ඉච්ඡිභණ්ඩ න ගණ්හාමි-තුය්හත්ථාය මහාමුනෙ.

ධනධඤ්ඤපරිච්චාගං-ගාමානි නිගමානි ච,
ඛෙත්තා පුත්තා ච ධීතා තෙ-පරිච්චත්තා මහාමුනෙ.

හත්ථී අස්සා ගවා චාපි-දාසියො පරිචාරිකා,
තුය්හත්ථාය මහාවීර-පරිච්චත්තා අසංඛියා.

යං මය්හං පතිමන්තෙසි-දානං දස්සාමි යාචකෙ,
විමනං මෙ න පස්සාමි-දදතො දානමුත්තමං.

නානාවිධං බහුදුක්ඛං-සංසාරෙ ච බහුබ්බිධෙ,
තුය්හත්ථාය මහාවීර-අනුභූතං අසංඛියං

සුඛප්පත්තා න මොදාමි-න ච දුක්ඛෙ ච දුම්මනා,
සබ්බත්ථ තුලිතා හොමි-තුය්හත්ථාය මහාමුනෙ-යි.

මෙසේ උන්වහන්සේ තමන්වහන්සේගේ සසර පක්ෂපාතකම් හා පුරුදුකම් සිංහනාද කළ කල්හි, මහපිරිස සාධුකාර දී මහත් වූ උත්සව කොට "කිමෙක් දෝ හෝ මුන්වහන්සේ සසර මෙසේ ම බුදුන්ට පක්ෂපාත ව දූනු දු ඍද්ධි සම්පත්-නිර්වාණ සම්පත් මෙසේ ම උදාර ව ලැබීමට පූර්වයෙහි කෙසේ වූ කුශලයක් කළසේක් දෝ හෝ"යි ශඞ්කා ඉපැදවූහ. එ වේලෙහි ස්වාමිදරුවෝ මහපිරිස සිතූ සිත් දැන "යශෝධරා ස්ථවිරීනි! තොප බුදුන්ට පක්ෂපාත වීමට පූර්ව ප්‍රණිධිය දක්වා තොපගේ පසිඳට උපන් කාංක්ෂාවත් තොපි ම දුරුකරව"යි වදාළසේක. එ වේලෙහි උන්වහන්සේ "ස්වාමිදරුවෝ මාගේ පූර්වප්‍රණිධිය ද මා ම ලවා කියවන අභිප්‍රාය ඇති සේක් වනැ"යි සිතා බුදුන්ට වැඳ සිට මහපිරිස දිසාව බලා 'සත්වයෙනි !මා සවල්ප වූ පින් කල ස්ත්‍රියක් ය යි නො සිතව. මා බඳු වූ හේතු සම්පත් ඇති කෙනෙක් මේ බුද්ධොත්පාදයෙහි නැත. කාරණ? කිම යත්; අසූමහ සවුවෝ කල්පලක්ෂයක් පැරුම් පුරා ආහ. අගසව්වෝ එකාසංඛ්‍යය කල්පලක්ෂයක් පැරුම් පුරා ආහ. මම වනාහි දුරෙ නිදානයෙහි පවත් මේ සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි ස්වාමිදරුවන් හා සමඟ ම පාරමිතා පුරා අයිමි. ඊට පළමු බ්‍රහ්මදෙව නම් ගෞතම බුදුන් දක ඔබ මනොප්‍රණිධි ලබන සමයෙහි දු ඔබ හා එක්ව ම අයිමි.

පසුව ඔබ හා එක්ව දිවකුරු නම් බුදුන් දක සුමෙධ නම් මහ තවුස් ව සුමත් මේ කඳුරෙහි දී අෂ්ටාංග ධර්මයෙන් යෙදී පළමු වන විවරණශ්‍රී ලබන සමයෙහි මම වනාහි බමුණු මහසල් කුලයෙහි සුමිත්‍රානම් ධනමානවිකාව ඒ බුදුන් ගිහිගෙයි වසන කල ඔබට

අගමෙහෙසින් වූ පදුමා නම් බිසෝවුන්ගේ අසූරියන් ගෙහි පහන් නො ලත ශරීරප්‍රභා හා එ බුදුන් හා එක්වැති වූ උසභක්ඛන්ධ නම් පුතනුවන් වහන්සේගේ වික්‍රම හා නො එක් පෙළහර දැක, මම ද එ බඳු වූ පින් ප්‍රාර්ථනා කොට ගෑපත් හැර මල් ගොස් තවුස් වෙස් ගෙණ සුමිතා නම් පරිබ්‍රාජිකාව සිල් රක්‍ෂා කරණුයෙම් එ දවස් මහනෙල් මල් අටමිටක් ගෙණ බුදුන් පෙරමඟට ගොස් මුන්වහන්සේට එ බුදුන්:

පස්සථ ඉමං තාපසං-ජටිලං උග්ගතාපනං,
අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ-අයං බුද්ධො භවිස්සති.

ඝතාදීන් විවරණ පතුල් දෙන සමයෙහි මම ද චිරානුගත වූ විශ්වාසයෙන් ඔබ කෙරෙහි පෙම් බැඳ, එ මල් අටකලඹින් පස්කල බක් මුන්වහන්සේ නමට පුද තුන් කලබක් මා නමට පුද "මම මේ වීරපුරුෂයානන්ට සංසාරයෙහි පක්‍ෂපාතව ම මෙහෙම්ව යි, ඔබගේ පාරමිතාවට අනුබල වෙම්ව යි, බුදුන් මේ විවරණ කථාවෙහි වදාළ යශෝධරා නම් නම මට ම වේව යි, ඒ රාහුල නම් පුත් රුවන, මා කුසින් ම වදා දෙම්ව" යි කියා ප්‍රාර්ථනා කෙළෙමි. ඒ දීපඞ්කර නම් බුදුහු එ කෙණෙහි ම මට ද විවරණ දුන් සේක. මම ද එ තැන් පටන් ඔබ හා සමඟ නිධානයක් රක්‍ෂා කරන්නියක සේ ඔබගේ පාරමිතා නමැති මහානිධානය රක්‍ෂා කොට දිහිම ම ය. මෙසේ දූරෙ නිදනයෙහි දී ම මම ද ඔබ ප්‍රාර්ථනා කෙළෙම් ම ය.

තව ද: ඔබ කොණ්ඩඤ්ඤ නම් බුදුන් දක විජිතාවී නම් චක්‍රවර්ති රජ ව දිව්‍යසමාන වෙහෙරක දී, තුන්මසක් අසදෘශ මහ දන් දී, දෙවන විවරණ පූජාව ලත් සේක. එසමයෙහි, මම ද සුවාසූ දහසක් බිසෝවරුන් පිරිවරා ඒ දානය මා සිය අසින්ම පිස දී මමද මුන්වහන්සේ ම ප්‍රාර්ථනා කෙළෙමි. තව ද: මඞ්ගල නම් බුදුන් සමයෙහි ඒ බුදුන් දක සුරුචි නම් බ්‍රාහ්මණ ව දෙලොස් යොදුන් මණ්ඩපයක දී බුදුපාමොක් මහ රහතුන්ට සත් දවසක් මුළුල්ලෙහි අසදෘශ වූ චතුර්මධුර දානය දී තුන්වන විවරණ පූජාව ලත් සමයෙහි මම ද ඔබට ප්‍රජාපති වූ බ්‍රාහ්මණ මහාසාරිකාව මා සිය අතින් ඒ දානය පිස දී මම ද මුන්වහන්සේ ම ප්‍රාර්ථනා කෙළෙමි. තව ද: සුමන නම් බුදුන් දක අතුල නම් දිව්‍යනාගරාජන් ව ඉපද සඳ මඬුලු සා මඩුවෙක දී අසදෘශ වූ දිව්‍ය දානය සත් දවසක් දී ඔබ බුදුබවු පැතු සතරවන විවරණ පූජාව ලත් සමයෙහි, මම ද ඔබට ම අගමෙහෙසින් ව කෝටිගණන් නාගාඞ්ගනාවන් පිරිවරා කෙළගණන් කඩුපුල් මල් ඔපිඩුපින් පුද ඒ සඳ්ද මුළුල්ලෙහි බුදුන් රහතුන්ට දිව්‍යතාන්‍යාදීයෙන් පුද මම මුන්වහන්සේ ම ප්‍රාර්ථනා කෙළෙමි.

තව ද: රේවත නම් බුදුන් දක අතිදෙව නම් බ්‍රාහ්මණ ව උතුරුසළුවලින් පුදා දහසක් ග්‍රන්ථරචනාවෙන් ඒ බුදුන්ට සතුති ගී කියා බුදු වෙම්ව යි පතා පස්වන විවරණ පූජාව ලත් දවස් මම ද ඒ ස්වාමිදරුවන්ට ප්‍රජාපතිව එ පින්හි දු සමාදන් ව ස්වාමි දරුවන්ම ප්‍රාර්ථනා කෙළෙමි. තවද ශෝභිත නම් බුදුන් දක සුජාත නම් බමුණු ව තුන්මසක් අසදෘශ මහදන් දී සවන විවරණ පූජාව ලත් සමයෙහි මම ද ඒ දානය මා සිය අතින් පිස දී මෙම බුදුරජාණන් ප්‍රාර්ථනා කෙළෙමි. තව ද: ඔබ මහේශාක්‍ය වූ යක්ෂ රාජන් ව කෙළක් යක්සෙන් පිරිවරා ගොස් අනෝමදස්සි නම් බුදුන් දක සත් දවසක් දිව්‍යදානය දී සත්වන විවරණ පූජාව ලත් සමයෙහි මම ද අගමෙහෙසින් ව දිව්‍යාභරණාව ඒ දානයෙහි දු සමාදන් ව මෙම ස්වාමිදරුවන් ම ප්‍රාර්ථනා කෙළෙමි. තව ද සිංහරාජන් ව උපැද මෙතෙහි ඇවිදිනා කල පදුම නම් බුදු රජාණන් දක සත් දවසක් අතිමිස ලොවත පූජා කොට ඔබ අටවන විවරණ පූජාව ලත් දවස්, මම සිංහ ධෙනු ව ඔබ හා අනුව ම සිට මුන්වහන්සේ ම ප්‍රාර්ථනා කෙළෙමි. තව ද: නාරද නම් බුදුන් දක උග්‍ර තාපස ව සත් දවසක් සෑඩි දානය දී මුන්වහන්සේ නවවන විවරණ පූජාව ලත් දවස්, මමද පරිබ්‍රාජිකාව එ පින්හිදු සමාදන්ව මුන් වහන්සේ ම ප්‍රාර්ථනා කෙළෙමි.

තව ද: පියුමුතුරා නම් බුදුන් සමයෙහි ජටිල නම් මහ රැෂි ව මහදන් දී අසූව දා බුදුපාමොක් මහසඟ පිරිසට සියලු පරිෂ්කාර දානය දී බුදු බවු පතා මුන්වහන්සේ දසවන විවරණ පූජාව ලත් දවස්, මම ද ප්‍රජාපතී ව මුන්වහන්සේ ම ප්‍රාර්ථනා කෙළෙමි. තව ද: සුමෙද නම් බුදුන් දක උත්තර නම් මානවක ව එක ද අසූ කෙළක් ධන බුදුන්ට පුදා බුදුන් කෙරෙහි මහණ ව එකොළොස්වන විවරණ පූජාව ලත් සමයෙහි මම ද ඔබ හා සමග ම මහණ ව ඔබ ම ප්‍රාර්ථනා කොට සිල් රක්ෂා කෙළෙම් මි ය. තව ද: සුජාත නම් බුදුන් දක චක්‍රවර්ති රජ ව සක්විති රජය පුදා මහණ ව දොළොස්වන විවරණ පූජාව ලත් දවස්, මම ද සුවාසු දහසක් කිංෂෝවරුන්ට අධිපති වූ ස්ත්‍රීරත්න ව ඔබ හා සමග ම මහණ ව ඔබ ම ප්‍රාර්ථනා කොට සිල් රක්ෂා කෙළෙම් මි ය.

තව ද: පියදස්සි නම් බුදුන් දක කාශ්‍යප නම් ධන මානවක ව කෙළ ලක්ෂයක් ධන වියදම සඟිකාරාමයක් කරවා බුදුන්ට පිළිගන්වා විහාර පූජා කොට ඔබ තෙළෙස්වන විවරණ පූජාව ලත් දවස් මම ද එම වෙහෙර පිළිගන්වා ඔබට පතිනී ව එ පින්හි දු සමාදන් ව ඔබ ම ප්‍රාර්ථනා කෙළෙම් මි ය. තව ද ඔබ සුසිම

නම් මහ නුවුස් ව පරසතු මදාරා මල් පූජාවෙන් අත්ථදස්සී නම් බුදුන් පුදා තුදුස්වන විවරණ පූජාව ලත් දවස්, මම ද පරිබ්‍රාජිකා ව එ තැන්හි ම සිට ඔබ ම ප්‍රාර්ථනා කෙළෙමි මි ය. තව ද: ඔබ ශක්‍රදෙවෙන්ද්‍ර ව ශක්‍ර සම්පත්තීන් ධම්මදස්සී නම් බුදුන් පුදා පසළොස්වන විවරණ පූජාව ලත් දවස්, මම ද අඩුතුන් කෙළක් දෙවඟනන් පිරිවරා අවුත් ඔබ ම ප්‍රාර්ථනා කෙළෙම් මි ය. තව ද: මඞ්ගල නම් මහ නුවුස් ව ජම්බුඵල දානයෙන් සිද්ධාර්ථ නම් බුදුන් පුදා සොළොස් වන විවරණ පූජාව ලත් දවස්, මම ද අඩුතුන් කෙළක් පරිබ්‍රාජිකාවන්ව නානාගම සිල් රක්ෂා කොට මුන්වහන්සේ ම ප්‍රාර්ථනා කෙරෙමි මි ය. තව ද: ඔබ සුජාත නම් මහරජ ව රාජ්‍යසම්පත්තීන් තිස්ස නම් බුදුන් පුදා මහණ ව සතළොස් වන විවරණ පූජාව ලත් දවස්, මම් ද අගමෙහෙසියක් ව ඔබ හා සමග මහණ ව ඔබ ම ප්‍රාර්ථනා කොට සිල් රක්ෂා කෙළෙම් මි ය. තව ද විජිතාවී නම් රජ ව මුළු දඹදිව රාජ්‍යයෙන් පුෂ්‍ය නම් බුදුන් පුදා අටළොස්වන විවරණ පූජාව ලත් දවස්, මම් ද ඔබ හා සමග මහණ ව ඔබ ම පතා පතා සිල් රක්ෂා කෙළෙම් ම ය.

තව ද: ඔබ අතුල නම් දිව්‍ය නාගරාජ ව පණීය සොඳුන් දිව්‍යමණ්ඩපයෙක දී සත් දවසක් මුළුල්ලෙහි දිව්‍යදානයෙන් විපස්සී නම් බුදුන් පුදා එකුන්විසි වන විවරණ පූජාව ලද දවස්, මම ද අගමෙහෙසියක් වූ නානාඛ්‍යනාම් සුවහස් නාගකන්‍යාවන් පිරිවරා සද්දා මුළුල්ලෙහි බුදුන්ට උපකාර කොට මුන්වහන්සේම ප්‍රාර්ථනා කෙළෙම් මි ය. තව ද: අරින්දම නාම රජ ව මහත් වූ රාජඍද්ධින් සිඛී නම් බුදුන් පුදා විසිවන විවරණ පූජාව ලද් දවස්, මම ද අග බිසෝ ව ඒ දානය පිස දී සිය අතින් බුදුන් සඟුන් වළඳවා මුන්වහන්සේම ප්‍රාර්ථනා කෙරෙම් ම ය. තව ද: සුදර්ශන නම් රජ ව රජ මහාවිහාර දුසක් කරවා පිළිගන්වා වෙස්සභූ නම් බුදුන් පුදා රජය හැර එක්විසි වන විවරණ පූජාව ලද් දවස්, මම ද අගමෙහෙසින් ව ඒ දානය සිය අතින් දී මහණ ව සිල් රක්ෂා කොට ඔබ ම ප්‍රාර්ථනා කෙළෙම් මි ය. තව ද: ඛෙම නම් නරපති ව රාජ්‍ය දානයෙන් කකුසඳ නම් බුදුන් පුදා දෙවිසි වන විවරණ පූජාව ලද් දවස්, මම ද අගමෙහෙසියක් ව එතැන්හි දී ම මහණ ව සිල් රක්ෂා කොට ඔබ ම ප්‍රාර්ථනා කෙළෙම් මි ය. කොණාගම නම් බුදුන් සමයෙහි තව ද: පර්වත නම් නරෙන්ද්‍ර ව වස් තුන් මස් බුදුන්ට අසදෘශ මහදන් දී බුදුපාමොක් දානය දී තෙවිසි වන විවරණ පූජාව ලද් දවස්, මම ද අගබිසෝව දානසංවිධානය කොට ඔබ ම ප්‍රාර්ථනා කෙළෙම් මි ය. තව ද: ජෝතිපාල නම් බ්‍රාහ්මණ ව ධන පමණින් කාශ්‍යප නම් බුදුන් පුදා මහණ ව සූවිසි වන

විවරණ පූජාව ලද දවස් මම ද බ්‍රාහ්මණ මානවිකාව ඔබ හා සමග ම මහණ ව පිසිදසක් හවුරුදු සිල් රක්‍ෂා කොට ඔබ ම ප්‍රාර්ථනා කෙළෙම් මි ය. එසේ හෙයින් සත්වයෙනි! මම ස්වල්ප වූ පින් කෙළෙම් නො වෙමි. මේ මාගේ බුදුරජානන් වහන්සේ යම් යම් බුදුකෙණකුන් දක යම් යම් පිණක් රැස්කළ සේක් වී නම්, මම ද ඔබ හා සමග ම ඒ ඒ බුදුන් දක වෙන වෙනා ම ප්‍රාර්ථනා කෙළෙමි. එසේ හෙයින් සංසාරයෙහි ඔබට පක්‍ෂපාතව ම සිටිමි. පාරමිතා ලතාව මල් ගන්වා දෙමාලිමි. දැන් මේ ජාතියෙහි ඔබට ම අගමෙහෙසින් ව යශෝධරා නමින් දිව්‍ය සමාන මනුෂ්‍යසම්පත් විඳ දැන් ඔබගේ සසුන් වැද මහණ ව අමාමහ නිවන් දිටිමි. සංසාර සාගරයෙන් ගොඩ නැංගෙමි. පෙර මම ඔබට අනුබල වීමි. දැන් ඔබ මට අනුබල වූ සේක. අසාධාරණ වූ සෘද්ධි ලදිමි, විශෙෂ වූ දිවකන් ලදිමි. නිර්මල වූ දිවැස් ලදිමි. පර සිත් දන්නා නුවණ ලදිමි. යනාදීන් සිංහනාද කොට තමන් වහන්සේගේ පූර්ව ප්‍රණිධි සංඛ්‍යාත වූ නො එක් සෘද්ධි බල දක්වූ සේක. එයින් කීහ. අපදානයෙහි.

බ්‍රහ්මදෙවඤ්ඤුව සම්බුද්ධං-ගොතමං ලොක නායකං
අඤ්ඤෙසඤ්ච ලොක නාථානං-සම්මුඛමෙතෙ බහුං මයා

අධිකාරං බහුං මය්හං-තුය්හත්ථාය මහාමුනෙ,
ගවෙසන්තො බුද්ධ ධම්මං-අහං තෙ පරිචාරිකා.

කප්පෙ ච සතසහස්සෙ ච-චතුරො ච අසංඛියෙ,
දීපඞ්කරො මහාවීරො-උප්පජ්ජි ලොක නායකො.

තෙන කාලෙන හං ආසිං-කඤ්ඤා බ්‍රාහ්මණ සම්භවා,
සුමිත්තා නාම නාමෙන-උපගඤ්ඡිං සමාගමං

අට්ඨ උප්පලහත්ථානි-පූජනත්ථාය සත්ථුනො,
ආදාය ජනසම්මද්දෙ-අද්දසං ඉසි මුග්ගතං

චිරානුගත දයිතං-පතිං කන්තං මනොරමං
දිස්වා තදා අමඤ්ඤිහං-සඵලං ජීවිතං මම.

පරක්කමන්තං සඵලං-අද්දසං ඉසිනො තදා,
පුබ්බකම්මෙන සම්බුද්ධෙ-චිත්තං චා'පි පසීදි මෙ.

භීය්‍යො චිත්තං පසාදෙසිං-ඉසෙ උග්ගත මානසෙ,
දෙය්‍යං අඤ්ඤං න පස්සාමි-දෙමි පුප්ඵානි තෙ ඉසෙ.

පඤ්චහත්ථා තවං හොන්තු-තයො හොන්තු මමං ඉසෙ,
තෙන සිද්ධී සමා හොතු-බොධත්ථාය තුවං ඉසෙ.

ඉසි ගහෙත්වා පුප්ඵානි–ආගච්ඡන්තං මහායසං,
පූජෙසි ජනසම්මජ්ඣෙ–බොධත්ථාය මහාඉසෙ.
පස්සිත්වා ජනසම්මජ්ඣෙ–දීපඞ්කරො මහාමුනි,
වියාකාසි මහාවීරො–ඉසිං උග්ගතමානසං.
සමචිත්තා සමකම්මා–සමකාරී භවිස්සති,
විසයා හෙස්සති තෙ කම්ම–තුය්හත්ථාය මහ ඉසෙ
සුදස්සනා සුප්පිනා ච–මනාපා පියවාදිනී,
තස්ස ධම්මෙසු දායාදා–පියා හෙස්සති ඉත්ථිකා.
යථාපි භණ්ඩසාමුග්ගං–අනුරක්ඛන්ති සාමිනො,
එවං කුසල ධම්මානං–අනුරක්ඛිස්සතෙ අයං.
තස්ස තං අනුකම්පන්තී–පූරයිස්සති පාරමී,
සීහො'ව පඤ්ජරං භෙත්වා–පාපුණිස්සති බොධියං–යි.

මෙසේ උන්වහන්සේ තමන් වහන්සේගේ පූර්වප්‍රණිධීන් බුදුන් වහන්සේගේ පෙරව ච මැඩසිට සිංහනාද කළ කල්හි සිහාරා සිටි දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය සෙනාව එකපැහැර දෙහොත් මුදුන් දී සිට මහත් වූ සාධුනාද පූජාවෙන් තුෂ්ලොම පුරා පූජා කළහ. සියලු ස්ත්‍රීලොකයා ද එ බඳු වූ ගුණ සම්පත් – ආචාර සම්පත්–ඥාතු සම්පත්–ප්‍රඥා සම්පත්–සෘද්ධි සම්පත්–නිර්වාණ සම්පත් ප්‍රාර්ථනා කළහ. මෙසේ උන්වහන්සේ මුළුලොව විස්මය පත්කොට බුදුන් මෑද ක්ෂමා කරවා අවසර ඉල්වා වදාළ සේක. ස්වාමිදරුවෝ ද උන් වහන්සේගේ වික්‍රම මුළු ලෝ වාසීන් දත් සේ දක්ව මෙ විට අවසර දුනමනා කලැ යි සිතා:–

අක්ඛන්තා නාම මිත්තබ්බං–කිං භමෙ ගුණභූසනෙ,
කිමුත්තරං තෙ වක්ඛාමි–නිබ්බාණාය වජන්තියා–යි.

යන මේ ගාථාවෙන් "යශෝධරා ස්ථවිරීනි! ජාම්බූනද ශාංගී සවර්ණ චාමීකර ශාතකුම්භ ය යි යන චතුර්ජාතියෙහි සතරන් මල දුවීමෙන් තම නැත්තා සේ, චතුරාශීතිසහස්‍රයක් අවරොධය කළාවූ තොප වැනි අභිර මග නිවන් දුටුඔන්ව ඔවුනොවුන් ලා ක්ෂමා කැරවීමෙහි එල නැත. තොප තබා මුළු ලෝ වාසීන් නිවන් පුරයට ම මෙහෙයන්නාවූ මම දුන් එම පුරයට අවසර ඉල්වන්නාවූ තොපට කුමක් නම් කියම් ද, තොප සිතුයේ කාරණ ම ය. බුදුන් ගේ පරිනිර්වාණය තොප වැනියන් නුදුටු මිනා ම ය. මෙයින් සුවිසි මසක් අතික්‍රාන්ත වූ කල බුදුහු ද එම පුරයට නික්මෙන්නාහ. තොප වැනියන් ක්ෂමා කැරවීමෙහි එල නැතත් ලෝක ව්‍යවහාර නිසා ක්ෂමා කළමිහ ක්ෂමා කළමිහ ක්ෂමා කළමිහ යි තුන් යලක් මදුරු ශ්‍රීමුඛයෙන් නික්මුත් සුමිඳගඳින් මුළුලොම සුවඳ කරඹුවක් සේ කරවමින් නික්මෙවසි අවසර දී වදාළ සේක.

එ වේලෙහි උන්වහන්සේ නැවත නැවත බුදුන් වැඳ තුන් වාරයක් බුදුන් ප්‍රදක්ෂිණා කොට දහසක් මෙහෙණිනි සෙනඟ හා සමඟ අවසරගෙණ නික්ම බුදුන්ගේ දර්ශනයට විෂය තාක් තැන් බුදුන්ට අභිමුඛව පසුබැස ගොස් බුද්ධදර්ශනය මුඹහ වන තැන්හි සිට නැවත පසඟ පිහිටුවා වැඳ බුදුන් වසන දෙස බල බලා උදාර වූ ආදරයෙන් තමන් වහන්සේගේ මෙහෙණිවර බලා නික්මුනු සේක. එ වේලෙහි ශ්‍රාවකයන් වහන්සේ ද බුදුන්ගේ අදහස් දැන විහාරොපචාරය දක්වා ඔබට පසු යමින් පූජා කල සේක.

උන්වහන්සේ ගොස් මෙහෙණිවරට වැද එදා රෑ සන්හුන් රාත්‍රියෙහි අඩපලඟ් බැඳ මැඩහිඳ ධ්‍යානයෙන් ධ්‍යානයට සමවැද පිරිනිවන් පෑ නිවන්පුර ගිය නියාව ද, මුළු දඹදිව සත්ත්වයන් රැස්වූ නියාව ද, දෙවි-බඹකැලක් පූජා කල නියාව ද, තමන් වහන්සේ ජද්දන්ත නම් හස්තිරාජයා ව සොණුත්තරයාගේ සැරපහරින් මළ දවස් සුභද්‍රා නම් කරේණුකාව අටදහසක් ඇතුන් හා පන්සියක් පසේබුදුන් හා සමඟ තුන්යම් රෑ එ දවස් කල මහා ආදාහන පූජාවට මේ දවස් සංග්‍රහ කොට නිමන්නා සේ, බුදුරජාණන් වහන්සේ ද ශ්‍රාවක සේනාව හා දිව්‍ය-මනුෂ්‍ය සේනාව පිරිවරා තුන්යම් රෑ වැඩසිට ඔබගේ ආදාහන පූජාව කල නියාව ද, එ නුවර වැසියන් ලවා ඔබගේ ධාතු වඩා යශෝධරා නම් මහසෑය බැඳවූ නියාව ද, එහි දවස් පතා නොයෙක් පූජා කරණ සේ ව්‍යවස්ථා කැරවූ නියාව ද, සියලු සත්ත්වයන් එම සෑය නිසා ම පින් රැස්කොට දෙව්පුර නිවන්පුර පැමිණී නියාව ද, බුදුන් ඒ රජගහා නුවරින් නැවත සැවැත් නුවරට වැඩි නියාව ද, මහා ප්‍රජාපති ස්ථවිරීන් වහන්සේගේ ආදාහන පූජාවට යට කී පරිද්දෙන් ම නුවණැතියන් විසින් විස්තර වශයෙන් බලා දතයුතු:

මෙසේ තමන් වහන්සේට සසර පක්ෂපාත ව විසූ ස්ත්‍රීන් අතින් පවා මෙ බඳු වූ ප්‍රාතිහාර්‍ය්‍ය - ප්‍රණිපතනි ආදි වූ අනෙකප්‍රකාර වූ පූජා ලත් හෙයිනුත් එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වන සේක. එසේ හෙයින් කියන ලද්දේ මැයි:-

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං-ති.

මේ පූජාවලියෙහි
අප බුදුන් යශෝධරා මහා ස්ථවිරීන්ගෙන් ලද
ප්‍රණිපතනි පූජා කථා නම් වූ
එක්තිස් වන පරිච්ඡේදය නිමි.

තේතිස් වන පරිච්ඡේදය

තව ද: අප බුදුන් ධර්‍මාශෝකාදී ජම්බුද්වීපයෙහි රජුන්ගෙන් ලද උද්දේසික පූජා කථා නම් කවරැ? යත්;

මෙහි උද්දේසික පූජාවෝ මහාහි බුදුන් අයාමෙහි වන්නාහ. එසේ හෙයින් බුදුන්ගේ පරිනිර්‍වාණය දක්වා මුන් මිතු කථා උපදවා ගැන්මට මුඛ නො වන බැවින් ඒ ඒ කථා පරිනිර්‍වාණ සූත්‍ර-මහාවංශාදියෙහි සෙයින් විස්තර වශයෙන් කියයේ. ග්‍රන්ථය විසාරද වන හෙයිනුත් අසන්නවුන් ද කුසිත වෙති යි සිතා මිතු කියන ඒ උද්දේසික කථා සංක්‍ෂෙපයෙන් දක්වමු ලැබෙයි. දනුමැතියන විසින් සාවධානව ඇසිය යුතු.

මෙසේ මාගේ ස්වාමිදරූ වූ බුද්ධරජාණන් වහන්සේ දීපඞ්කර පාදමූලයෙහි පටන් සාර සී යේ ම සමතිස් පැරුම් පුරා කුසීපුරෙන් වැඩ, බුදු වූ ජාතියෙහි මවුකුස පලග් බැද සියලු සත්ත්වයන්ට පෙණි පෙණී දසමසක් වාසය කළාවූ මේ පළමුවන බුද්ධකාරක ධර්‍මය ය. දස දහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයන් මධ්‍යයෙහි මවුකුසින් බිහි ව, කලක් ගිහිගෙයි වැස මහාභිනිෂ්ක්‍රමණ කොට දුෂ්කරක්‍රියා පුරා බුදු වන ද කිරිපිඬු වළඳ වැළඳූ කලින් නාගභවනයට ගළවාවූ දෙවන බුද්ධකාරක ධර්‍මය ය. තව ද: කණ්පලයෙහි පූර්‍වදිග් බලා චතුරඞ්ගයන් ඉටා වැඩහුන්නා වූ තුන්වන බුද්ධකාරක ධර්‍මය ය. තව ද: එම හස්නේ හිඳ ආනාපානා කර්මස්ථානයන් මෙනෙහි කළාවූ සතර වන බුද්ධකාරක ධර්‍මය ය. තව ද: එම හස්නේ හිඳ මරසෙනග ජය ගත්තාවූ පස්වන බුද්ධකාරක ධර්‍මය ය. තව ද: එම පල්‍යඞ්කයෙහි වැඩහිඳ බුදු වූවා වූ සවන බුද්ධකාරක ධර්‍මය ය. තව ද: එම පල්‍යඞ්කයෙහි දී ම හට් අසාධාරණ ඥාන ලද්දා වූ සත්වන බුද්ධකාරක ධර්‍මය ය.

තව ද: එම පල්‍යඞ්කයෙහි දී ම බුද්ධඥාන ලද්දා වූ අටවන බුද්ධකාරක ධර්‍මය ය. තව ද: බුදු වූ සත්සතියක් නිරාහාරයෙන් දවස් යවූ නවවන බුද්ධකාරක ධර්‍මය ය. තව ද: මහාබ්‍රහ්මයාගේ ආරාධනාවෙන් ධර්‍මදෙශනා කළාවූ දසවන බුද්ධකාරක ධර්‍මය ය. තව ද: ඉසිපතනයෙහි වැඩහිඳ ධම්සක් දෙසුවාවූ එකොළොස් වන බුද්ධකාරක ධර්‍මය ය. තව ද: සවම් මැදි පොහෝ ද චතුරංගයෙන් ප්‍රාතිමොක්‍ෂ දෙශනා කළාවූ දොළොස් වන බුද්ධකාරක ධර්‍මය ය. තව ද: බන්ධු සමාගමයෙහි දී බුද්ධවංශ දෙශනා කළාවූ තෙළෙස් වන බුද්ධකාරක ධර්‍මය ය. තව ද: ජේතවනාරාමයෙහි මි

වාසය කළාවූ තුදුස් වන බුද්ධකාරක ධර්මය ය. තව ද: සැවැත් නුවර දී යමාමහ පෙළහර පෑවාවූ පසළොස් වන බුද්ධකාරක ධර්මය ය. තව ද: තවුතිසා භවනයෙහිදී විජම්බණ දේශනා කළාවූ සොළොස් වන බුද්ධකාරක ධර්මය ය. තව ද: සකස් පුර දොරටම දෙව් ලොවින් බැසීසාවූ සතළොස්වන බුද්ධකාරක ධර්මය ය. තව ද: දවස දවස අටසාළිස් කෙළ ලක්ෂයක් ඵල සමවත් සමවන්නාවූ අටළොස්වන බුද්ධකාරක ධර්මය ය. තව ද: දවස දවස වෛනෙය ජනයන් බලන්නාවූ දසනව වන බුද්ධකාරක ධර්මය ය. තව ද: දුටු දුටු වරදෙහි ශික්ෂාපද පණවන්නාවූ විසි වන බුද්ධකාරක ධර්මය ය. තව ද: අර්ථොත්පත්තියෙහි ජාතක දේශනා කරන්නාවූ එක්විසිවන බුද්ධකාරක ධර්මය ය. තවද: ආගන්තුකයන් හා පටිසන්ථාර කරන්නාවූ දෙවිසිවන බුද්ධකාරක ධර්මය ය. වස් අන්තයෙහි අනාපුච්ඡා ගමන් නොවඩනාවූ තෙවිසිවන බුද්ධකාරක ධර්මය ය. තව ද: දමසින් දමස නොමරදවා කරණ පූර්වභක්ත කෘත්‍යය නම් වූ සුවිසිවන බුද්ධකාරක ධර්මය ය. තවද: පශ්චාද්භක්ත කෘත්‍යය නම්වූ පස්විසි වන බුද්ධකාරක ධර්මය ය. තවද: ප්‍රථම යාම කෘත්‍යය නම් වූ සවිසි වන බුද්ධකාරක ධර්මය ය. තවද මධ්‍යම යාම කෘත්‍යය නම වූ සත්විසිවන බුද්ධකාරක ධර්මය ය. තව ද: පශ්චිම යාම කෘත්‍යය නම්වූ අටවිසි වන බුද්ධකාරක ධර්මය ය. පරිනිර්වාණ දිනයෙහි මාංසරස භෝජනය අනුභව කළාවූ විසිනවවන බුද්ධකාරක ධර්මය ය. තව ද: දීර්ඝකාලයක් ප්‍රියවාසයෙන් එක ගෙයි විසූ කල්‍යාණමිත්‍රයකු වියොග වන කාලයෙහි නො එක් විට වැලඳ සිඹ සනහා අත් හරණා සේ, තමන්වහන්සේ බුදුවූ දා පටන් දවසදමස වසීභූත කළාවූ සුවිසි කෙළ ලක්ෂයක් ඵලසමාපත්තියට සමවැද එයින් නැගී පරිනිර්වාණය කරන්නාවූ තිස් වන බුද්ධකාරක ධර්මය ය යි යන මේ හැම බුදුන් නො වරදවා කරන්නා වූ සේ සමත්‍රිංශත් බුද්ධකාර ධර්මයන් ම තමන් වහන්සේත් නො වරදවා ම සම්පූර්ණ කොට-

එක්සිය විසි හවුරුද්දට ආයු කාලයෙහි ඉපැද, එකුන් තිස් හවුරුද්දක් ගිහිගෙයි වැස, සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කොට, පන් තිස් හැවිරිද්දෙහි ලොවුතුරු බුදුව, සද්ධර්ම චක්‍රවර්ති ව, එ තැන් පටන් බුදුව පළමු වන හවුරුද්දෙහි බරණැස් නුවර ඉසිපතනාරාමයෙහි වස්වැස, දෙවන-තුන්වන-සතර වන හවුරුද්දෙහි ක්‍රමයෙන් තුන් වසක් ම රජගහා නුවර වේළුවනාරාමයෙහි වස්වැස, පස්වන හවුරුද්දෙහි විශාලාමහ නුවර කූටාගාර-නම් ශාලාවෙහි වස්වැස, සවන හවුරුද්දෙහි මාකුල පර්වතයෙහි වස්වැස, සත්වන හවුරුද්දෙහි සක්දෙව් රජහුගේ ඒකපුණ්ඩරීක නම් උයනෙහි පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි වස්වැස, අටවන හවුරුද්

1. විපුල.

දෙහි සුංසුමාර ගිරියෙහි වස්වැස නවවන හවුරුද්දෙහි කොසඹෑ නුවර කොසම්බිය නම් වෙහෙර වස්වැස - දසවන හවුරුද්දෙහි පාරිලි වනයෙහි පාරිලෙය්‍ය නම් මතෑ'තඟු ඇතින් උපස්ථාන ලදින් සල් රුක් මුල ගල් අතුලෙහ වස්වැස,

එකොළොස් වන හවුරුද්දෙහි නාල නම් බමුණු ගම් නාල නම් ආරාමයෙහි වස්වැසා, දොළොස් වන හවුරුද්දෙහි වෙරඤ්ජා නම් බමුණු ගම් එක්තරා එක් ශාලාවෙක වස්වැස, තෙළෙස් වන හවු රුද්දෙහි චාලිය නම් පර්වතයෙහි දෙවියන්ගේ ආරාධනාවෙන් වස්වැස. තුදුස් වන හවුරුද්දෙහි ජේතවනාරාමයෙහි වස්වැස, පසළොස් වන හවුරුද්දෙහි කිඹුල්වත් නුවර නිග්‍රොධාරාමයෙහි හිණිගුහායෙක වස්වැස, සොළොස් වන හවුරුද්දෙහි අලව් නුවර අලව් නම් රජහුගේ අලව් නම් උද්‍යානයෙහි වස්වැස, සතළොස් වන හවුරුද්දෙහි නැවත රජගහා නුවරට වැඩ වෙළුවනාරාමයෙහි ම වස්වැස, අටළොස් වන හවුරුද්දෙහි ද, දසනව වන හවුරුද් දෙහි ද, පිට පිට ම දෙවසක් චාලිය නම් පර්වතයෙහි ම වස්වැස, විසිවන හවුරුද්දෙහි නව ද රජගහා නුවරට වැඩ වේළුවනාරාම යෙහි ම වස්වැස, මෙ තැන් පටන් ක්‍රමයෙන් ම තොරදමා මි දසනව හවුරුද්දක් දෙව්රම් වෙහෙර ම වස්වැස, තුබූ සහවුරුද් දෙහි විශාඛාවන්ගේ ආරාධනාවෙන් පූර්වාරාමයෙහි මිගාරමාතු ශිනපායෙහි වස්වැස,

බුදු ව මෑබහුන් පන්සාළිස් හවුරුද්දෙ හි ම මෙසේ මේසේ ලෝවැඩින් සෙදී විලි පිලි නො දක්වා අසීයි වර්‍ෂයක් ජීවත් ම ලක්‍ෂ යක් හවුරුදුත් ජීවත් වන්නාවූ බුදු කෙණෙකුන් කළමනා වූ බුද්ධ කෘත්‍යයන් මෙදතුරෙහි නිමවා සුවිසි කෙනෙක වැඩහිඳ වදාළාවූ බණින් සුවිසි අසංඛ්‍යයක් සත්වයන් සෝවාන් කොට, සුවිසි අසං ඛ්‍යයක් සතුන් සෙදගැමි කොට සුවිසි අසංඛ්‍යයක් සතුන් අනාගැමි කොට, සුවිසි අසංඛ්‍යයක් සතුන් අර්‍හත්‍ව සිවත් දක්වා, එසේක, දසයෙක, සියයෙක, දහසෙක, ලක්‍ෂයෙක, කෝටියෙක, යනාදීන් නො එක් වාරයෙහි, නො එක් දෙශනාවෙහි සසරින් ගොඩ නැගුවාවූ සත්වයන් හැර අසංඛ්‍යය වූ පථයෙහි ම සත්‍යානු අසංඛ්‍යයක් ප්‍රාණීන් සංසාර සාගරයෙන් ගොඩනගා තෙලවර අජාසත් රජ්ජුරුවන්ට අට වන හවුරුදු වෙසග මැදි පොහෝ ලද අඟහරුවාදා විසානැකතින් කුසිනාරා නුවර මල්ල රජුන්ගේ සල්උයනෙහි යුග්ම ශාලයන් දෙදෙනාගේ අනතරයෙහි පණවන ලද පරිනිර්‍වාණ මඤ්චකයෙහි උතුරු දිගට හිස ලා නැගෙනහිරට පිට ලා, පැළ දිගට මුහුණ ලා, යමදිගට පයලා සිංහ ශය්‍යාවෙන් වැදහොත් සේක. එ කෙණෙහි බුදුන් උපන් දා සේ ම පශ්චිම වූ දෙතිස් මහා පූර්‍වනිමිත්ත පූජාවෝ ද දසදහසක් සක්වළම පැවැත් තාහු ය.

තව ද: තුෂිත භවනයෙහිදී බුදුවන්ට දෙවියන් ආරාධනා කළ ද "මවුකුස ප්‍රතිසන්ධිය කෙරෙමි"යි ඉවසූ වේලෙහි බොහෝ ආයු ඇති මරමාරණ නම් දිව්‍යපුත්‍රයෙක් "උතුමාණන්ගේ ප්‍රසව මඞ්ගලයට මල්පූජාවක් කරමහ"යි සිතා තමාගේ දිව්‍යසේනාව හැරගෙණ මල් ගොතන්නට පටන් ගත, ඒ මල් ප්‍රසව පූජාවටත් ගොතා නො නිමිය, මහාභිනික්මන් පූජාවටත් නො නිමිය. බෝධි මණ්ඩලයෙහි බුද්ධ පූජාවටත් නො නිමිය, ධම්සක් පැවතුම් පූජාවටත් නො නිමිය, දේවෝරෝහණ පූජාවටත් නො නිමිය, ආයුසංස්කාර හරණ දවසටත් නො නිමිය, බුදුන් පරිනිර්වාණය කරණ මේ පූජාව දක්වාත් අසූ හවුරුද්දක් මුළුල්ලෙහි ගොතාත් එ මල් දම නො නිමියේ මය. එ කල සෙසු දෙවියෝ ඔහු කරා දිව ගොස් "කොළ මරමාරණ නම් දිව්‍යපුත්‍රය! තෝ තෙල මල් පූජාවට ගොතයි ද; අද බුදුහු පිරිනිවන් පැමිණි, දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්ම සේනාව රැස්ව පරිනිර්වාණ පූජා කෙරෙමින් සිටියාහු වේ ද"යි කීහ.

එ වේලෙහි දේවතාමා ලෙහි අත් ගසා ගොතන මල් අතින් හෙළා "කොල! ඒ කුමක විසමයෙක් ද"යි කිය කියා හැඟී සිට මහත් වූ පශ්චාත්තාපයට පැමිණ "බුදු කෙනෙක් ලක්ෂයක් අසඞ්ඛ්‍යයක් කප්හිනුත් දුලිභයහ. එසේ වූ බුදුහු අද ම ඉපැද, අද ම මහාභිනික්මන් කොට, අද ම බුදු ව, අද ම දහම් දෙසා, අද ම සියලු සතුන් සසරින් මුදා අද ම පිරිනිවන් පවිද් ද, දෙ දවසක් ජීවත් වියයා වූ පිණකුත් නො කළාහු ද, මල්ගෙතීමක් නිසා ඒ බුදුන් අතින් දහම් පදයක් අසා නො ගතිමි"යි මහහඬින් හඬහඬා ගොතා නො නිමි මල්දම ගෙණ එක්ලක්ෂ අවසැට දහසක් යොදුන් මහාමේරු මුදුනට නැඟිලා "අද දවසකුත් ජීවත් නොව, මේ සා ලෝවැඩක් කළා වූ ඒ උතුමාට මේ නො නිමි මල්දම පූජා වේව"යි කියාලා මල්දම මුළු සක්වළට දමාලීය. එ කෙණෙහි සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් වට ඇති සක්වළගල වසාගෙණ වට ගෙයක පලසක් සේ සිටගත.

මෙසේ දෙවියන් පූජාවට පටන් ගත් වේලෙහි "ස්වාමි දරුවාණන්ගේ පශ්චිම දශීන ය"යි කිය කියා මහත් වූ ධර්මසංවේගයට පැමිණ ත්‍රිපිටකය ගෙවා දත් සත් ලක්ෂයක් පමණ මහතෙර පෙළක් අවුත් බුදුන් සිහාරු සිටගත්හ. සෙසු භික්ෂූන් වහන්සේ මෙ තෙනැයි ගණන් නැත. එ වේලෙහි ස්වාමි දරුවෝ "මාගේ දහම් නාමැයි පතන පන් දහසක් හවුරුදු මුළුල්ලෙහි ලෝ මිණ උන්තා සේ ම මොහඳුරු දුරු කෙරේමය"යි අධිෂ්ඨාන කොටලා තව ද: "මාගේ ශරීරධාතු තුන්තරමෙක බෙදී මුළුලොම විසිර ඒ ඒ

පූජාවෙහි ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා ලෝවැඩ කෙරෙම්" යි අධිෂ්ඨාන කොට ලා—පඤ්ච මහා අධිෂ්ඨානය හා මහා ශබ්දයෙන් උපන්නා වූ සූක්ෂම වූ අධිෂ්ඨානය යි ශතසහස්‍ර සංඛ්‍යාත වූ අධිෂ්ඨානයන් කොට, ප්‍රථම යාමයෙහි මල්ලරජුන්ට බණ වදාරා, මධ්‍යම යාමයෙහි දෙවියන්ට බණ වදාරා, පශ්චිම යාමයෙහි ශ්‍රාවකයන්ට බණ වදාරා අවවාද දී, අලුයම් රාත්‍රියෙහි දසදහසක් සක්වල මියපොළෝ එක් ලක්ෂ විසිදහසක් වාරයෙහි කම්පිත කරවා ඵලසමවතින් නැගී නිරුපධිශේෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවි සේක.

එ කෙණෙහි මල්ලරජදරුවෝ අනඳ මහ තෙරුන් වහන්සේ අතින් අසා දිව අවුදින් කල්පවිනාශයෙන් හුණු හල්වනයක් සේ හඬා ගිලූසපත් ව, රහතන් සේ අවමාදයෙන් නැගී ස්වාමිදරුවානන්ගේ ශ්‍රීශරීරයට සත් දවසක් මුළුල්ලෙහි අප්‍රමාණ වූ පූජාකොට සත්වන දා අනඳ මහ තෙරුන් වහන්සේගේ විධාන වූ පරිද්දෙන් චක්‍රවර්ති රජුන්ට කළමනා චාරිත්‍ර කොට, පස් පන්සියයක් සළුපට, පුලුන් පටින් බුදුන්ගේ ශ්‍රී ශරීරය වෙළා, සත රත්මය වූ මහ දෙනකට වඩා, එක්සිය විසි රියන් සඳුන් දරසෑයක් බැඳ ආදාහන පූජාවට පටන් ගත්හ. එ කෙණෙහි දන පමණ කටී පමණ පරසතු මඳාරා මල් වැසපිය, දසදහසක් සක්වළ දෙවියෝ රැස් ව අහස්කුස පුරා සිට ගත්හ.

මල්ලරජහු අට දෙනෙක්—සොළොස් දෙනෙක්—දෙතිස් දෙනෙක් බැගින් සැරහි සිව් රන් තල්වැට සලාත් ගිනි දල්වාගත නුහුනුවහ. කාරණ කිම? යත්; "මහසුප් මහ තෙරුන් වහන්සේ අවුත් බුදුන් වැඳි කල මුත් ගිනි නොගණීව" යි බුදුන්ගේ කළ අධිෂ්ඨානය; ඔබට මිත්‍ර වූ දෙවියන් ගෙනුත් අධිෂ්ඨානය එ කල රජදරුවෝ අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ අතින් මෙ පවත් අසා, "සාධිවනතවූ මහ තෙරකෙණෙක් තව ම මෙතනට නො ආවෝ ල, උන් මෙ තෙනට නො ආ හෙයින් දරසෑයෙහි ගිනි නො ගැණී ල, එවැනි සාධිවනතයන් ඇති පසු බුදුන් නැතත් ලොවට හානි කිම දෑ" යි සන්තුෂ්ට ව "එ තෙරහු කෙබඳු වූ රූපවිලාස ඇත්තෝ දෝ හෝ උන් බලම්හ' යි සුවඳමල් ධවජ පතාග ගෙණ පෙරමගට දිවුවාහුය.

ඒ මහසුප් මහ තෙරුන් වහන්සේ කොයි වැඩ බුදුන්ගේ ආදහනයට පසු වූ සේක් ද? යත්; පෙර සැවැත් නුවර ජේතවනාරාමයෙහි බුදුන් හා සමග මුන්වහන්සේ වසන කල එ නුවර එක්තරා එක් උපාසිකාවක් මහසුප් මහතෙරුන් වහන්සේ දුටු තමා පූර්ව ජාතියෙහි උන්වහන්සේට මවු ව උපන් හෙයින්, පුත්‍රප්‍රේම බැඳ

එ තැන් පටන් ඔබට දවස දවස බත්සැන්දක් තබා දෙසි. ඒ මහසුප් මහතෙරුන් වහන්සේ තම් බුදුන්ට සතරහලකට මිපි බව මුත් බුදුන් හා එක්මැනි වූ පැ ඇති සේක. එසේ හෙයින් ඔබ දුටු කල බොහෝ සේ සත්ත්වයෝ "බුදුහු වැඩිසේකැ"යි කියති.

එක් දවසක් ස්වාමිදරුවෝ එකචාරි සිංහපෝච්චකු සේ අප්‍රසිඩ ව දෙතිස් අසු ලකුණු සගවාගෙණ සෙවනෙය පුද්ගලයන් උදෙසා එ නුවර පිඩා ඇවිදිනා සේක. එ වේලෙහි ඒ ස්ත්‍රී බුදුන් දැක මහ සුප් මහතෙරුන් වහන්සේ ය යි සිතා ඔබට නමා ලන්නාවූ බත් සැන්ද බුදුන්ගේ පාත්‍රයට පිළිගන්වා පුව.

බුදුන් ම දොර පියවා වැඩපී කල මහසුප් මහතෙරුන් සිහා වැඩි සේක. එ වේලෙහි ඒ ස්ත්‍රී "මපුතනුවන් වහන්සේ යයි අතීත් මහණක්හට මාගේ බත් සැන්ද නො හැඳින ලා පිමි"යි කිය කියා "මා කිය හුනු සෙණක් බලව"යි කිය කියා තොමෝ තමාට ම අව අවා, බුදුන් පසිඟාගෙණ ගොස් "මිදක් සිටින වහන්සේ ය"යි කිය කියා බුදුන්ගේ පාත්‍රයට අත ලාලා එ බත් සැන්ද දෙවනුව උදුරා ගෙණ ගියා ය.

එ වේලෙහි මාගේ ස්වාමිදරුවෝ "මේ කිමෙක් දෝ හෝ යි දිව්‍ය-බ්‍රහ්ම කාරෙකුයෝ තමන් තමන්ගේ දිව්‍යභොජනයන් මාගේ පාත්‍රයට නොසෙ ලා පියමෝ දෝ හෝ යි ප්‍රාර්ථනා කෙරෙති; මේ ස්ත්‍රී එසේ වූ මට බත් සැන්දක් ලාලා දෙවනුව ඇරගෙණ ගියා ය. මේ ලෝකයෙහි සත්ත්වයෝ පූර්වයෙහි උපකාරයක් කළ කෙණෙකුන්ට මුත් උපකාරයක් නො කෙරෙත් ම ය. මෝ තොමෝ පෙර මාගෙන් සංග්‍රහයක් ලද් දෝ හෝ, නො ලද් දෝ හෝ"යි පූර්වචරිත බලා සාරාසංඛ්‍යය කප් ලක්ෂයක් මුළුල්ලෙහි, තමන් වහන්සේ දානපාරමිතා නමැති මහවූහුද හළුව හළලා තුන්ලෝ වෙවුල්වා සතනසනකාදි මහදන් දෙන සමයෙහිත් මෝ තොමෝ මාගෙන් බත්උළක් පමණ සංග්‍රහයකුත් නො ලද්දී ම ය. පර සක්වල ම ඇවිද්දී ම ය"යි දැක ඈ කෙරෙහි උපන් මහා කරුණාවෙන් වැඩ වදළ සේක.

එ වේලෙහි මහසුප් මහ තෙරුන් වහන්සේ බුදුන්ට මෑ කළාවූ අනාදරය දැක "මාගේ නිවන් මෑනියන් හා මා හා එක නුවර සිහන හෙයින් වේ ද මේ සා පරිභවයක් වූයේ ය"යි මහත්වූ සංවේග උපදවා "අද පටන් ජිවිතාන්තය දක්වා බුදුන් හා එක ගමෙක නො සිඟමි"යි අධිෂ්ඨාන බැඳ එ ම දා ම හිමාලය වනයට වැඩ එක්තරා එක් පබ්භාරයෙක වසනයේක් "ඉදින් බුදුහු මා

කෝමැදයෙහෙත් පිරිනිවි සේක් වී නම් මේ ලෙනදොර සිටි මේ වෘක්ෂයෙහි මේ මල් එ ද පර ව බිම වැගිරේව යි මේ සලකුණෙන් බුදුහු පිරිනිවියහ යි දනිම්"යි අධිෂ්ඨාන කොට බොහෝ දවසක් එහි වාසය කරණ සේක් බුදුන්ගේ පරිනිර්වාණය හා සමග ම ගස මල් පර වූ සේ දැක "මාගේ තුන්ලෝ පහන අද නිවිනිමතැ"යි දැන උපන් මහත් සංවේග ඇති ව, එකෙණෙහි පන්සියක් පමණ රහතන් පිරිවරා දෙවනු බුදුකෙනෙකුන් උපන්නා සේ මහත් වූ පූජාවෙන් වැඩ, දරසෑය සිසාරා තුන්යලක් ඇවිද ශ්‍රීපාදය දිසා වෙයි ආකාශයට පැන නැගී බුදුන් මැද හොත් සේක.

එ කෙණෙහි දිය පත්‍ර පැනනැගී මහ පියුම් දෙකක්සේ ස්වාමි දරුවන්ගේ ශ්‍රීපාද දෙක පන්සියක් පුළුන්පට පන්සියක් සළු පට රන්දෙණ දරසෑය දෙබෑ කොට ගෙණ, වලාගබින් පෙණී ගිය පුන්සඳමඩලක් සේ පිටත් ව දිව්‍ය-මනුෂ්‍යයන් බල බලා සිටිය දී මහතෙරුන් වහන්සේගේ තලල් මැදෙහි පෙණී ගියහ. එ වේලෙහි දිව්‍ය මනුෂ්‍යයන්ට බුදුන් පිරිනිවන් පෑ කලටත් වඩා ශෝක බොහෝ වී ය. එ කල මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේගේ රත් පියුම් පෙති සඟලක් වන් අතුල් දෙකින් බුදුන්ගේ පතුල් දෙක අල්වාගෙණ වැද ධර්මසංවේගයට පැමිණි සේක. මහතෙරුන් වහන්සේ වැඳි පසු ශ්‍රීපාද දෙක වලාගබෙකින් සැඟවුනු පුන් සඳක් සේ රත්දෙන තුළට වන. එකෙණෙහි දරසෑය තෙමේ ම ගිනි ගත. ඒ ආශ්චර්‍ය්‍ය දුටු මිනුස්සයෝ තෙරුන්වහන්සේ කෙරෙහි පැහැද ශෝක තුනී කළහ. ආයු බොහෝ සර්වඥවරයන්ගේ ආදාහනයෙහි දී ශාරීරිකධාතු නො විසිර එක රන්පිළිමයක්සේ තිබෙයි. ආයු මඳ සර්වඥවරයන්ගේ ධාතු විසිරෙයි. එසේ හෙයින් මාගේ ස්වාමිදරුවන්ගේ සතර දන්ත ධාතු ය අකු ධාතු දෙක ය ලලාට ධාතු දෙක ය යන මේ ධාතු සත තිබිය දී අවශෙෂ ධාතු මුංබියලි සා ය, කඩ සාලැට සා ය, අබ ඇට සා ය, යන තුන් තර මෙක විසිර මුතු දෙනක් සේ වී ය.

ඉක්බිත්තෙන් ගිනි සන්හුන් කල ආකාශයෙන් හා පොළො-වින් හා ජලධාරාවෝ දෙදෙනෙක් දිව අවුදින් ගිනි නිවූවාහු ය. එ කල මල්ල රජදරුවෝ මහත්වූ පූජාවෙන් ආදාහන කෘත්‍යය කොට තමන්ගේ නුවර මැද සන්ථාගාරය සිවුදෑ ගඳින් පිරිබඩගෙණ ලද පස්මල් ඉස, රන්ගරු රිදිගරුයෙන් විසිතුරු වූ වියන් බැඳමල් දම් රන්දම් රුවන්දම් එල්වා, වච්තිර ඇද, සන්ථාගාරයෙහි පටන් බුදුන් ආදාහන කළ ඒ මකුට බන්ධන චෛත්‍යය දක්වා

දෙපෙළ තිර ඇද අහස් වියන් බැඳ ධජ පතාක නංවා, දෙපෙළ රන්කලස තබා, මිණිදඹු මැට පහන් තබා, අලඞ්කෘත වූ ඇතකු පිට රන්දෙණ තබා, මලින් සුවඳින් පුද පුදා මහා උත්සව කෙළි යෙන් ඇතුළු නුවරට වැද, සන්ථාගාර මධ්‍යයෙහි සප්තරත්න පර්‍ය්‍යඞ්කයක් කරවා ඒ මතුයෙහි රන්දෙණින් ධාතු තබා, සේසත් නගා, කඩුගත් යෝධයන් පදනම් වටා, උරෙන් උර ගසා සිටුවා එයින් පිටත කුම්බින් කුම්බ ගසා, ඇත්පෙළක් සිටුවා, එයින් පිටත කණින් කණ ගසා අස්පෙළක් සිටුවා, එයින් පිටත සකින් සක ගසා රථ සෙනගක් සිටුවා, එයින් පිටත උරින් උර ගසා යෝධසෙනගක් සිටුවා, එයින් පිටත පිළින් පිළ ගසා දුනු ගත් සෙනගක් සිටුවා, මෙසේ වට යොදනක් මාතයෙහි සන්නාහයෙකින් වැසුවා සේ අතු රක් නො දී සතුරන් නිසා රකවල් ගත්හ.

මෙසේ මල්ල රජුන් ධාතුවට රකවල් ගත්වා උත්සව කෙළි කෙළ පූජාවට පවත් ගත්හ. එකල රජගහා නුවර අජාසත් රජ්ජුරුවෝ මෙ පවත් ඇසූහ. කෙසේ ඇසූද? යත්; ඔවුන්ගේ අමාත්‍යයෝ බුදුන් පිරිනිවි බවු අසා "පෘථග්ජන වූ ශ්‍රද්ධාවන්තයන් ගෙන් අපගේ රජ්ජුරුවන්ට වඩා බුදුන් කෙරෙහි ප්‍රේම ඇති රජෙක් නැත. මෙ පවත් රජහට සෙසු වේලෙක කීමෝ නම් ශොකාග්නියෙන් රජ ද මියෙයි" සිතා ඔරු තුනක් ගෙන්වා චතුර්මධුරයෙන් පුරා රජ්ජුරුවන් කරා ගොස් "දේවයන් වහන්ස, රාත්‍රිභාගයෙහි නුඹවහන්සේව නපුරු වූ කාරණයක් දුටුම්හ, ඒ නපුර දෙසා පියන පරිද්දෙන් සුදු කඩක් හැඳ නාසය හා කන් සිදුරු නො ගැලෙන සේ තෙල ඔරුවෙහි ගැලී හොත මැනැවැ"යි බොරුවක් කියා රජ්ජුරුවන් පළමු වන ඔරුවෙහි ගැලී හොත් කල එම ඇමැති හිසයක් විදා අවමඟුල් වෙසක් ගෙණ රජ්ජුරුවන් පෙරට ව සිට ඇඳිලි බැඳ "රජ්ජුරුවන් වහන්ස! කුසිනාරා නුවර දී ලෝකනායක වූ අප මහා ගෞතම බුදුහු පිරිනිවන් පෑවාහු වේ ද යි" කීහ.

රජ්ජුරුවෝ එ බස කන හුනු වේලෙහි ම දෙකණ හැසූ යවුල් දෙකක් සේ වෙවුලා ගොස් බුදුන් කෙරෙහි පැනනැගි ශොකගින්නෙන් මූර්ඡා වූ හ. රජ්ජුරුවන්ගේ සර්වාඞ්ගය රත්කොළපු යකදක් සේ ඝ්කියවා ඔරුව පිරූ සිහිල් වූ චතුර්මධුර කකියවාපු ලෝදිය සේ සුරු සුරු යන අනුකරණ දක්වා හුණුසුම් නැංග. එ වේලෙහි අමාත්‍යයෝ අත දව දවා රජ්ජුරුවන් ඒ ඔරුවෙන් ඔසවා ගෙණ අනික් ඔරුවේ ලූහ. එ වේලෙහි රජ්ජුරුවෝ සිහිලසයෙහි ගැලී සිහි එළවා ගෙණ "තොප කියේ කුමක් ද" යි විචාළහ. නැවත ඇමැතියෝ "හිමි තොප බුදුහු පිරිනිවියහ" යි

කීහ. නැවත රජ විසංඥ ව ඒ බරුව ද හුණු කෙළේ ය. නැවත ඇමතියෝ රජ්ජුරුවන් තුන්වන බරුවෙහි ලා, එහි ද ආශ්වාස ලදින් "තොප කීයේ කුමක් දැ"යි විචාළ කල "හිමි කොප බුදුහු පිරිනිවන් පෑහ" යි කීහ. තව ද: රජ්ජුරුවෝ විසඥ වූහ. එ වේලෙහි අමාත්‍යයෝ රජ්ජුරුවන් ඔසවා ගෙණ සොළොස් කළයක් ඇල්පැන් ඇඟ සලා සිංහාසන යෙහි හිඳුවා සමහරු බල්බවා ගෙණ සිටියහ.

එ වේලෙහි රජ්ජුරුවෝ සිහි එළවා ගෙණ, ඉසහෝ වැටිය රන් පෝරුවක් වන් පිපි ලමද හෙළා ගෙණ, ප්‍රමාලාඹකුර වැනි දෙ අතින් සිය ලෙහි පැහැර, සිය පහර ලත් මනැසකුගේ මහගඬින් ගුගුරා, වියරු හුනු පුරුෂයකුසේ මහ වේ මැදට බැස, පළමු වෙළු වනාරාමයට ගොස් "මාගේ බුදුන් මිකාහ ගුගුරුවා පළමුව පිළිගත් වෙහෙර යැ"යි කිය කියා එ කෙස හිඳ හඬා, එයින් නැඟී. ජීවකාරාමයට ගොස් එහි තමන් පළමු ව බුදුන් දුටු පැහැ විචාළ ගඳකිළියට වැද, එ තෙන හි හඬා එයින් නැඟි බම්බොලාවෙහි බුදුන් වැඩ හුන් බුද්ධාසනය බල බලා හඬ හඬා, නො එක් විලාපයෙන් වැලප, එ තෙන හිඳ ගාථා සැටෙකින් බුදුගුණ කිය කියා වැලප නැවත සිහි එළවා ගෙණ "දුන් මා හැඹිමෙන් කම් නැත. බුදුන්ගේ ධාතු ගෙණ වුත් බුදුන් දුටු සේ පුදමි"යි සිතාලා "මාගේ බුදුහු කොයිදී පිරිනිවි සේක් දැ"යි විචාරා කුසිනාරා නුවර දී ය යි අසා "මාගේ බුදුන්ගේ ධාතු බලයෙන් ගෙණවුත් පුදමි"යි එ කෙණෙහි ම රජ ගෙට දෙවනු ව නො වැද අවලොස් කොළක් පමණ මහ සෙනග ගෙණ ලක්ෂගණන් ඇත් ඇති අස් ඇති රථ ඇති බල ඇති ගෙණ මහමුහුදින් දිවූ මහරළ පෙළක් සේ දුරුමඟ නොවා දිව කුසිනාරා නුවර කඳවුරු බැඳ සිට ගත්හ.

තව ද: මේ පවත් අසා විශාලා මහනුවර සත්දහස් සත්සිය සත්දෙනකු පමණ ඇති ලිච්ඡවි රජදරුවෝ ද තමන් තමන්ගේ බල පිරිස් ගෙණ එසෙයින්ම දිව ගොස් එම නුවර පිරිවරා හිඳ ගත්හ. මේ සෙයින් ම කිඹුල්වත් පුරෙහි ශාක්‍ය රජදරුවන් හා මහසෙනග ය. තව ද: අල්ලකප්ප නුවර රජදරුවන් හා මහ සෙනගය. තව ද: රාම නම් නුවර කෝළිය රජදරුවන් හා මහ සෙනග ය. තව ද: වෙඨ නම් නුවර රජදරුවන් හා මහසෙනගය. තව ද: පාවෙය්‍යක නම් නුවර රජදරුවන් හා මහසෙනග ය යි මෙසේ සත් රජයෙක සත් සෙනගක් හා රජදරුවෝ දිව ගොස් නුවර සිසාරා හිඳ ගෙණ "ධාතු අපට ම එවන්නෝ ය"යි යුද්ධ කෝ කරන්නෝ ය යි වෙන වෙනම වාසිකියා ඉල්වති.

එ බස් අසා මල්ල රජදරුවෝ "බුදුන් අපගේ නුවර දී පිරිනිවන් පෑව මැනැවැයි අප ආරාධනා කෙළෙත් නැත, බුදුහු තමන් වහන්සේ ම අපගේ නුවරට වැඩ පිරිනිවි සේක. තමන් තමන්ගේ නුවර යම් යම් රුවරෙක් උපන් නම් තමන් තමන්ට හිමියා සේ ම අපගේ නුවර උපන්නාවූ ධාතුරත්නය අපට ම හිමි ය. තොප කිරි බොහොද අම් මෝරා නුපූම් හ. තොපගේ මිතු සෝ වෙයි. අපගේත් ඇත් අස් රථ පාබල සෙන් ඇත, තොපගේ මිතු නො වෙයි. අපගේත් සාඩු මුම්ගසක් ඇතැ"යි යනාදීන් මත් වඩනා වෑසී බස් කියා කලහ මැඩූ හ.

ඉදින් යුද්ධ වී නම් සත් නුවරක් තබා දඹදිව් හෙසැට දහසක් රාජධානිවල රජසෙනඟ ආවත් ධාතු තුබූ නුවර හෙයිනුත්, ලක්ෂ ගණන් රාක්ෂයන්ගේ අධිෂ්ඨාන බල ඇති හෙයිනුත්, සියලු දෙවතාවන්ගේ ආරක්ෂා බල ඇති හෙයිනුත් කුසිනාරා නුවර මල්ලරජදරුවෝ ම ජයගන්නාහු මි ය.

එ වේලෙහි දඹදිව සියලු රජුන්ට ශිල්ප දුන් රාජ ගුරු වූ ද්‍රෝණ නම් බ්‍රාහ්මණ ආචාර්ය කෙනෙක් සැම රජුන් සන්සිඳුවා එක තැනක රැස්කොට "දරුවෙනි! බුදුන් උදෙසා ඔවුනොවුන් හා යුද්ධ නො කරව. බුදුහු නම් ක්ෂාන්තිවාදී සේක. බුදුහු නම් සියලු සතුන්ට ම සාධාරණයහ"යි යනාදීන් නො එක් බණ කියා ගිවිස්වා ධාතු අට කොටසක් කොට මගධ නැළියෙන් දෙනැළිය බැගින් අට ද්‍රෝණයක් ධාතු රජදරුවන්ට බෙදා දෙනුයේ, දකුණු දළදා වහන්සේ රජදරුවන් කථා කල දී සොරා ඇරගෙණ තමා හිස කෙස් යට සඟවා ගත. එ වේලෙහි සක්දෙව්රජ 'සියලු සතුන්ට ධර්මදේශනා කළාවූ මුඛයෙහි ජාත දන්තධාතුවට උපකාර කිරීමට මේ බමුණු සුදුසු නො වේ මී යැ"යි සිතා සූක්ෂ්ම වූ අතක් මවාලා දන්තධාතුව ඔහු හිසින් සොරා හැරගෙණ රුවන් කරඬුවකට වඩා ශක්‍රපුරයට ගෙණගොස් සිළුමිණි සෑයෙහි වඩා අද දක්වා පූජා කෙරෙයි. බමුණු ධාතු බෙදා අන්තයෙහි හිස අත ගා බලා දළදා නො දැක ශෝක කොට "මටත් වඩනා සොරෙක් ඇරගතැ" යි සිතා ලජ්ජාවෙන් කාටත් නොහඟවා ධාතු මිනූ ලාස්ස රජදරුවන්ට කියා ඉල්වා ගත.

ධාතු බෙදූ ඉක්බිත්තෙන් අජාසත් රජ්ජුරුවෝ තමන්ගේ ධාතු කොටස ගෙණ ඒ කුසිනාරා නුවර පටන් රජගහා නුවරට පස් විසි යොදුන් මාර්ගය පුළුල අට ඉස්බක් කොට හෙරිතලයක් සේ තනා, අනතරනතරයෙහි විපි සඳ, බුදුන්ගේ ධාතු සත් රුවන් [1]මඩුවකට වඩා, තමන්ගේ ආඥාක්‍ෂෙත්‍රයෙහි මනුෂ්‍යයන් රැස් කොට, මෙසේ ධාතු පූජා කොට කොට රුවන් රථයේ පසු කෙළවර සපරකඩට ගිය කල සත් දවසක් බැගින් රඳ රඳා, මහා පූජා කොට සත් හවුරුදු සත් මස් සත් දවසෙකින් රජගහා නුවරට වැද, මහත් වූ දාගබක් බඳවා ශක්ති පමණින් පූජා කළාහු ය. සෙසු රජදරුවෝ ද තමන් තමන්ගේ නුවරට ගෙණ ගොස් මෙසේ ම දාගබ් බඳවා මහත් වූ පූජා කළාහු ය. ද්‍රෝණ නම් බමුණානෝ ද ධාතු මිනූ කුරුණිය ගෙණ තමන්ගේ නුවර කුම්භ නම් දාගබක් බඳවා තමන්ගේ ධන පමණින් පූජා කළාහුය. පසුව ධාතු සොයා ආ පිප්පලි මොලිය නම් දෙනුවර රජ දරුවෝ ධාතු නො ලදින් "මේ අපට ධාතු ය" යි ආදාහන භූමියෙහි රැස් කොට තිබූ අඟුරු රත් කරඬුයෙන් වඩා මහාපරහැරින් ගෙණ ගොස් අඞ්ගාර ථූප නම් දාගබක් බඳවා තමන් ශක්ති පමණින් පූජා කළාහු ය. කීයේ මැනෝ:—

එකො ථූපො රාජගහෙ-එකො වෙසාලියා පුරෙ,
එකො කපිලවත්ථුස්මිං-එකො ච අල්ලකප්පකෙ.
එකො ථූපො රාමගාමෙ-එකො ච වෙඨදීපකෙ,
එකෙ සාරීරිකා ථූපා-ජම්බුදීපෙ පතිට්ඨිතා,
අඞ්ගාර කුම්භ ථූපෙන-දසථූපා භවන්ති තෙ-යි.

දස ථූප කථා

මේ කීයේ බුදුන්ගේ ස්කන්ධ පරිනිර්වාණ පූජා කථා ය. ධාතු පරිනිර්වාණ පූජා නම් කවර? යත්; ක්ලේශ පරිනිර්වාණය - ස්කන්ධ පරිනිර්වාණය - ධාතු පරිනිර්වාණය යි බුදුන්ගේ පරිනිර්වාණයෝ තුන් දෙනෙක් වන්නාහ. එයින් ක්ලේශ පරිනිර්වාණය බොධිමණ්ඩලයෙහිදී සමාසතා සකලක්ලේශයන් නසා බුදු වූ වේලෙහිම වි ය. ස්කන්ධ පරිනිර්වාණය මෙතී ක්‍රමයෙන් කුසිනාරා නුවර මල්ල රජුන්ගේ උයන සමක ශාලාභ්‍යන්තරයෙහිදී ම විය. ධාතු පරිනිර්වාණය පන්දහසක් හවුරුදු අතික්‍රාන්ත ව ප්‍රතිවෙධ ප්‍රතිපත්ති පර්‍ය්‍යාප්ති සංඛ්‍යාත වූ ත්‍රිවිධ ශාසනයාගේ අන්තර්ධානයෙහි ම වෙයි. එයි දූ බෝ මැඩදී ම වන්නේ ය යි දතයුතු. ඒ කෙසේ ද? යත්;

1 රථයක.

එහි පිළිවෙළ කථාව සත්පුරුෂවූ කල්‍යාණ පෘථග්ජනයන් විසින් සාවධාන ව අසා බුද්ධෝත්පාදයෙහි අරුම දැන, අබුද්ධෝත්පාදයෙහි ඵල නැති බැව් දැන බුද්ධෝත්පාද නමැති රත්නාකරයෙහි ම උපන්නාවූ සත්ත්වයන් ශ්‍රී මිනත බව දැන අබුද්ධෝත්පාද නමැති ශූන්‍ය ගෘහයෙහි උපනුවන් අශ්‍රීක බවු දැන, තමන් තමන් ලද්දාවූ දුර්ලභ වූ, උතුම්වූ මනුෂ්‍යාත්මය සඵල කොට, මත්තට නිර්වාණ ප්‍රතිෂ්ඨාව සාධා ගතයුතු.

මාගේ ශ්‍රීවතනවූ, මූදුන්මල් කඩක් වැනිවූ, සද්ධර්මධවජයක් වැනි වූ, තුන්ලෝ තිලකයක් වැනිවූ, තිවන් පිඩක් වැනිවූ ගෞතම ගොත්‍රයෙහි උපන් බුදුරජානන් වහන්සේගේ ප්‍රථම බෝධියෙහි පවත් සම්පූර්ණවූ, පන්සියයක් අවුරුදු ධ්‍යානාංග සම්පූර්ණ වූ, සිවු පිළිසිඹියා පත් ක්ෂීණාශ්‍රව ස්ථවිරයෝ වන්‍දු සුගතී දිව්‍ය පුත්‍රයන් සේ එකශ්‍රැති ඥාන ලදින් බුදුසසුන් හොබවන්නාහුය. ඔවුන්ගේ විභාගය; උපාලිය, දාසකය, සොනකය, සිග්ගවය, මොග්ගලීපුත්තය, මහින්දය, නාගසේනය, යනාදිවූ මහා ස්ථවිරයන්ගේ කථාවෙන් වෙන වෙන ම බලා දතයුතු. එතැන් පටන් ඒ මහා ක්ෂීණාශ්‍රවයන් පිරිනි ගිය පසු සිවුපිළිසිඹියා උපදවා ගත නොහෙන ෂඩ්අභිඥා ලාභීවූ මහා ක්ෂීණාශ්‍රව ස්ථවිරයෝ පන්සියයක් අවුරුදු ශාසනය පවත්වති. එයින් මත්තෙහි ඒ අභිඥාත් උපදවා ගත නොහෙන්නාවූ ත්‍රිවිද්‍යාවට පැමිණි සජී සනිෂ්ඨ ක්ෂීණාශ්‍රව ස්ථවිරයෝ බුද්ධශාසනය පන්සියයක් අවුරුදු පවත්වා සසුන් පිහිටුවා බබුළුවති. මෙසේ එහි විශේෂවූ විභාග සතර මහා සගියෙහි වෙන වෙනම දක්වූ පරිද්දෙන් දතයුතු.

මෙසේ දෙදහසක් අවුරුදු ත්‍රිවිධවූ මහරහතන් වහන්සේගේ වසංයෙන් ශාසනය පැවැති කල්හි, එයින් මත්තෙහි කාල නිශ්චයක් නැතිව, ක්‍රම ක්‍රමයෙන් ධර්මශාසනය පිරිහෙනුයේ ඒ ත්‍රිවිද්‍යාත් උපදවාගත නොහෙන්නාවූ ආශ්‍රවයන් විතරක් ක්ෂය කළාවූ සෘඩි නැති රහතන් වහන්සේ කිසි කාලයක් පවත්වති එයින් මත්තෙහි ආශ්‍රවයන් තිම්මා ක්ෂය කොට ගත නොහෙන්නාවූ අනාගාමි මාර්ග ප්‍රාප්තවූ ස්ථවිරයෝ ශාසනය පවත්වති එයින් මත්තෙහි සෙදගැමිමග ලද මහා ස්ථවිරයෝ ධර්මශාසනය පවත්වති. එයින් මත්තෙහි සෝවාන් මග ලද බුද්ධපුත්‍රයෝ අඩුවක් නැතිවම ශාසනය රක්‍ෂා කෙරෙති. එයින් මත්තෙහි කාලය නැතිව ගෙණ යත් යත් ක්ලේශයන් උත්සන්නව ගෙණ යත් යත් එක මාර්ගඵල යකුත් උපදවා ගත නොහි එබඳුවූ රහතන්ගේ ගුණයෙන්ම හෙයින් රහත් බවු නො රහත් බවු දැනගත නො හැක්කා වූ, ක්ලෙශයන් සමත කොට වසන්නා වූ, වජ්‍ර ඥාන ඇති මහාස්ථවිරයෝ ලක්ෂ සුවහස් ගණන් පැනනැගී අප බුදුන්ගේ ශාසනය පවත්වති. එහි කිසියම් උදාහරණ කථාවක් මෙතන්හි දක්වම්හ.

ශ්‍රී ලඞ්කාධිපති වූ එක්තරා එක් රජ්ජුරු කෙනෙක් මහ තෙර කෙනකුන් හා අතිවිශ්වාස ව වසන්නාහු ය. මහ තෙරුන් නො රහත් වුවත්, මහතෙරුන්ගේ ගුණ මහිමයෙන් රහතැ යි කියති. රජ්ජුරුවෝ මහතෙරුන් බොහෝ කාලයක් මුළුල්ලෙහි රහත් බවත්, නො රහත් බවත් දැනගත නො හෙන්නාහු, දවසෙක සඞ්ඝයා උදෙසා එක්තරා එක් ඵලජාතියක් ගෙන්වා මහතෙරුන් අභිමුඛයෙහි හුනූ හිඳගෙණ, තමන් සවහස්තයෙන් ඒ ඵලජාති ඇඹුල් හා කුළුබඩුයෙන් යොදා අතින් මැඩ මැඩ මහතෙරුන්ගේ මුහුණ බැලූහ. එ කෙණෙහි මහතෙරුන් මුඛසම කෙළ උනා නැංග. එ දවස් පටන් රජ්ජුරුවෝ මහතෙරහු නො රහත් බවු දත්හ.

තව ද මහතෙරහු දෙදෙනෙක් එක් ම විහාර ම ඔවුනොවුන් හා අතිවිශ්වාස ව බොහෝ කලක් එක ගෙයි වෙසෙති. දෙදෙන ම නො රහත්හ. දෙදෙන ම ඔවුනොවුන් රහතැ යි සිතති. එසින් එක් මහතෙර කෙනෙක් අනික් මහතෙරුන් "රහත් බවු නො රහත් බවු පරීක්ෂා කෙරෙමි"යි සිතා දවසෙක ඔවුන් ගඞ්ගාවෙකට බැස ජල ස්නානය කරණ කල්හි අතවැස්සකු ලගෙන්වා "කෝ දිය කිමිද ගෙණ නො පෙණී ගොස් මහතෙරුන් කකුල අල්ව"යි යවූහ. එ තෙම එසේ ම ගොස් මහතෙරුන් කකුල කන මහතෙරහු "කිඹුලෙක් මා පය ගතැ"යි කියා හඬ ගෑහූහ. අනාමැසි "කිඹුලෙක් නො වෙමි ස්වාමිනි මම ය. තුඹ පරීක්ෂා කරණු නිසා අයිමි. මට ක්ෂමා කරන්නැ"යි ක්ෂමා කරවා ගියෙ. එ දවස් පටන් මහතෙරුන් නො රහත් බවු අනික් මහතෙරහු දත්හ. බුදුන් ගුණ ගෙණ වසන කල්‍යාණ පෘථග්ජන වූ මා ඇතුළු වූ සියළු බුදුන් දරුවන්ට ම මෙසේ මෙසේ වූ ගුණ මහිම වාසනා ම වේව යි. එක් ම ම මහණ වූ ල. එකගෙයි වෙසෙත් ල. උන් උන් රහතැ යි සිතත් ල. මෙ බඳු වූ ගුණ මහතුන් සිහි කළා වූ මා ඇතුළු වූ සියලු සතුන්ව ම සතර අපාය නො වේ ම ය. සගමොක් සුව ඒකාන්ත වේ ම ය.

එසේ එසේ වූ ක්ලේශයන් සහිත කොට වසන්නා වූ වජ්‍රඥාන ඇති මහාස්ථවිරයෝ ලක්ෂ සුවනස් ගණන් පැහැනැගී "අප බුදුන්ගේ ශාසනයෙහි මාර්ගඵල ලදුවෝ පිරිහී ගියහ. එසේ හෙයින් ඇවැත්නි, යම් යම් කාංක්ෂාවෙක් ඉපැද ගියේ නම් රහතන් නැති හෙයින් ඒ දුරු කොට ලනුවෝ නැත. මෙයින් මත්තෙහි සද්ධර්මය නිධාන සේ අප්‍රමාද ව රක්ෂා කළ මනා ම ය. ධර්මශ්‍රැත පරම්පරාව පිරිහී ගියේ නම් නපුර, පොත් සඞ්ගායනා කරම්හ"යි සුවාසූ දහසක් ධර්මස්කන්ධය බුදුන්ගේ මුඛපාළි පමණක් පොත්වල ලියා එයින් පදයක් පිල්ලක් නො වරදවා, තුන්පිටකය ම පොත් බැ'

වනපොත් කොට සිත හා පොත හා සම බල බලා ධර්මශාසනය නිර්මල කොට රක්ෂා කොට ලෝවැඩ සසුන් වැඩ කරන්නාහු ම ය.

එසේ කාලයක් ගිය කල පොතෙහි ලියා තුබූ පාළි ධර්මයන් ඒ ඒ තැන් සැක බහුල ව පුච්ඡා ප්‍රතිපුච්ඡා බහුල වෙයි. එ කල මහා ප්‍රඥාවන්ත වූ බුද්ධඝෝෂක රක්ෂාවෙහි අතිලෝභී වූ අර්ථකථාචාර්යවර යෝ නො එක් අර්ථකථා උපදවා ධර්මය නිර්මල කොට තබන්නාහු ය. එ තැන් පටන් පාළි වශයෙන්, අර්ථ වශයෙන් ටීකාවශයෙන් බලා ඉගෙණ බොහෝ දවසක් ධර්මශාසනය පවත්වන කල්හි නැවත කාලයෙකින් අර්ථකථාව ද ගණ්ඨික ම ගෙණ යෙයි. එ කල මහා ප්‍රඥාවන්ත වූ ස්ථවිරයෝ එක් ව ටීකාර්ථ කථා උපදවා තබන්නාහු ය. එ තැන් පටන් පාළි වශයෙන්-අර්ථ වශයෙන් ටීකා වශයෙන් බලා ඉගෙණ බොහෝ ධර්මධර මහා ස්ථවිරයෝ ධර්මශාසනය කාලයක් ශාසනය පවත්වන්නාහු ය.

එසේ ශාසනය පැවත පැවත යන කල්හි කලියුගයෙහි උපදනා රජදරුවෝ ආයුෂයෙන්, පිණින්, සම්පත්තියෙන්, පරිවාර යෙන් ක්‍රම ක්‍රමයෙන් අඩුව යන්නාහු ය. රජුන්ගේ සම්පත් අඩු වීමෙන් පූර්ව රජුන්ගේ චරිත බලා "අපි ද එසේ එසේ ම සුඛිත වම්හ. ආයු පතුරුවම්හ. සම්පත් උපදවම්හ. ධන ධාන්‍ය උපද වම්හ. ගම් මහියෙන් උපදවම්හ. මහපිරිස් සිටුවම්හ"යි උත්සාහ කිරීමෙන් ජනයන්ට පීඩා කරන්නාහ. නො මද අය ගන්නාහ. අධර්මයෙන් දඩ - මුඩ - ඉස්රත් - මිස්රත් ආදීන් ලොකවාසීන් පෙළන්නාහ. රජහු නම් ලෝකවාසීන්ට මවුපියන්ගේ තනතුරෙහි පිහිටියහ. මවුන් පියන් දරුවන්ට දුඛකම් කරණ කල, නො කවන කල, නො පොවන කල, දානාදී නො දෙන කල, අවවාද නො කියන කල, පාපයෙන් නො වළකන කල, මවුන් පියන්ට ද, දරුවන්ට ද, වැඩක් නොවන්නා සේ, රජුන් ලොවට අධර්ම පීඩා කිරීමෙන් රජුන් ලෝවැසියෝ රක්ෂා නො කෙරෙති. ලෝවැසියන් රජහු රක්ෂා නො කෙරෙති.

මෙසේ රජදරුවන් අධර්මසමාදාන වූ කල යුවරජ මහ ඇමැති යෝ ද අධර්මිෂ්ඨ වන්නාහ. රජුන්ගෙන් ඇමැතියන්ගෙන් පීඩා ලබන්නා වූ දනවු වැසි සත්ත්වයෝ ද අධර්මිෂ්ඨ වන්නාහ. එ කල මේ භාතිය දුටු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ද අවවාද කළාහු වූ නම් එයිදු නො ගිස්විනාහ. එ කල බුද්ධපුත්‍රයෝ ලෝකවාසීන්ගේ අධර්ම සමාදානය බලා, මතු ලෝකශාසනයට වන පරිහානිය බලා, රජුන් කරා ගොස් අවවාද කියති. රජහු ඇමැතියන් ඇග වරද ලා තුමූ නිවරදයා සේ ධර්මයට අවශ්‍ය කෙරෙති. ඇමැතියන් කරා

ගොස් එ පමත් කියා අවවාද කළ කල ඔහු රජුන් කෙරෙහි හෝ රාජ්‍යවාසීන් කෙරෙහි හෝ ඒ වරද පිහිටුවා තුමූ නිවරදයා සේ හඟවති. නැවත රාජ්‍යවාසීන් කරා ගොස් අවවාද දී දූනැමින් වසව යි කී කල, ඔහු රජුන් ඇමැතියන් කෙරෙහි වරද පිහිටුවා තුමූ නිවරදයා සේ අවවාද නො පිළිගෙණ "රජුන් ධර්මයෙහි පිහිටුවා ගත මැනව. එකල අපි දු ධර්මයෙහි පිහිටන්නමෝ වේ ද"යි කිය කියා අවවාද කළ උත්තමයන් කී බස් නො ගිවිස්නාහු ය. වදාළේ මැනෝ බුදුන් විසින් රාජෝවාද ජාතකයෙහි:

ගවං චෙ තරමානානං-උජුං ගච්ඡති පුංගවො,
සබ්බා තා උජුං ගච්ඡන්ති-නෙත්තෙ උජු ගතෙ සති.

එවමෙවං මනුස්සෙසු-යො හොති සෙට්ඨ සම්මතො,
සො චෙ'පි ධම්මං චරති-පගෙව ඉතරා පජා;
සබ්බං රට්ඨං සුඛං සෙති-රාජා චෙ හොති ධම්මිකො-යි.

එසේ හෙයින් රජුන්ගේ ධර්මසමාදානයෙන් ලොවට වැඩ වන හෙයිනුත්, අධර්මසමාදානයෙන් ලොවට අවැඩ වන හෙයිනුත්, දේවතාමෝ කලකිරී කලට වැසි නො වස්වති. වැසි වස්වන් නම්: සය නැත්තවුන්ට බත් දෙන්නා සේ, සය ඇත්තවුන්ට බත් නො ලන්නා සේ, බත් කැමැතියන්ට පැන් ඕනා සේ, පැන් කැමැතියන්ට බත් ලන්නා සේ, ප්‍රයෝජන ඇති ඇති කාලයෙහි වැසි නො වස්වා නිෂ්ප්‍රයෝජන කාලයෙහි විෂම වර්ෂා වස්වන්නාහු ය. පූදිනා කිරි වදිනා කරල් නගනා කාලයෙහි නියං කරවාත් නසාලති. සතවැසි වැස්වීමෙනුත් දගත මැඩගත නො දී ශස්‍යයන් නසාලති. එසේ හෙයින් ශස්‍යයෝ සිත් සේ පල නො දෙන්නාහු ය. ශස්‍යයන් පල නො දීමෙන් ලෝකයෙහි ආහාර විපත්තිය වෙයි.

සුඛිත වූ කාලයෙහි ම සත්ත්වයන් කුසල් කිරීමෙහි වීර්‍ය්‍ය ඇති බවු මුත් දුඃඛිත වූ කාලයෙහි අකුසල් කිරීමෙහි වීර්‍ය්‍යවත් වන බැවින් "කුසල් කරන්නා තබා අපි අප කෙසේ රක්‍ෂා කරමෝ දෝ හෝ යි අපි අපගේ පුත්‍ර කලත්‍රමිත්‍රයන් පමණ කෙසේ පෝෂ්‍යය කරමෝ දෝ හෝ"යි ශාසන රක්‍ෂාවෙහි ලොභ නැති ව ආත්ම රක්‍ෂාවෙහි ම ලොභ වඩන්නාහු ය. මෙ මේ කාරණයෙන් එ කල ශාසනයට ප්‍රත්‍යය දායකයෝ ඉතා දුර්ලභ වන්නාහු ය. සුලභ නො වන්නාහු ය.

එ කල භික්ෂූහු ගිය ගිය තැන්හි ප්‍රත්‍යය නො ලදින් සිවුපස දුගයෙන් ක්ලාන්ත වන්නාහු "ශාසනරක්ෂාව භාරයැ"යි සිතා අන්තේවාසිකයන්සද්ධිවිහාරිකයන් සමගව රක්‍ෂා කොටලිය නො හී එක ලාව වසන භණ්ඩ නසකිරාජයන් සේ, ත්‍රිපිටකධාරී වූ මහාස්ථවිරයෝ

එක් දෙ අතවැස්සන් ගෙණ, ඒ ඒ තැන්හි එකලා එකලා ව වසන්නාහු ය. මෙසේ මහාස්ථවිරයන් එකලාව විසීමෙන්, අන්තෙවාසිකයන් ඒ ඒ තැන්හි ස්වච්ඡන්දිකව විසීමෙන්, පෘච්ඡා ප්‍රතිපෘච්ඡා කොට සිතූ සිතූ සැක හැරගෙණ සජ්ඣායනා කොට ගෙණ සද්ධර්මය රක්‍ෂා කරණුවෝ බාහුලික නො වන්නාහු ය. භික්‍ෂූන්ට සැක මුදලන ගුරුවරයන් විද්‍යමාන වූ ස්ථානයෙහි ප්‍රත්‍යය දායකයෝ අවිද්‍යමානයහ. ප්‍රත්‍යය දායකයන් විද්‍යමාන වූ ස්ථානයෙහි ශඞ්කා දුරි කරණය කරණ ධර්මඥයන වූ ගුරුවරයෝ අවිද්‍යමානයහ.

රජ දරුවෝ නම් බුදුන් රජකුලයෙහි උපන් හෙයිනුත් රජුන් ශාසන රක්‍ෂාවෙහි යෙදී වසන හෙයිනුත්, ලොවට අධිපතිව වසන හෙයිනුත්, ශාසනයට මාතෘස්ථානයෙහි පිහිටා, සර්වස්ථානයෙහි සම කාන්ති පතුරුවන්නාවූ චන්ද්‍රදිව්‍යපුත්‍රයා සේ, සර්වඥශාසනය ම සම වූ ශ්‍රද්ධාවෙන් රක්‍ෂා කටයුතු වූ ප්‍රවේණී ධර්මයන් ඇතියහ. එසේ වූ රජදරුවෝ එ කල තම තමන්ගේ සම්පත අඩු හෙයිනුත් සම වූ ශ්‍රද්ධාව අඩු හෙයිනුත්, පත්ව පත්වාලා වන්නා මණ්ඩල වශීවක් සේ, තමන් තමන් කෙරෙහි කුලූපග භික්‍ෂූන් පමණකට සංග්‍රහ කොට රක්‍ෂා කරන්නාහුය. කුශල සංග්‍රහයෙන් දුරු ම, විවේකාභිරාම ම, ඒ ඒ තැන්හිම වසන්නාවූ මහා ලජ්ජී පුද්ගලයන් කෙරෙහි උපෙක්‍ෂා ම වසන්නාහු ය. මේ මේ කාරණයෙන් රජුන්ගේ ම ගුණ මූලිකව පළමු කොට ආඥාචක්‍රය පිරිහුණු කල, ආඥාචක්‍රය නිසා පවත්නාවූ ධර්මචක්‍රය ද පරිහානියට පවත් ගන්නී.

මෙසේ දුක් ගන්නා භික්‍ෂුහු ධර්මය මේ මේ කාරණයෙන් සියල්ලම ධරා ගත නොහී කලෙකින් ටීකා කථා හැර අර්ථ පාළි වශයෙන් පවත්නාහු ය. කලෙකින් අර්ථකථාවද පවත්වා ගත නොහී ඒ හැර පාළි කථා වශයෙන් ධර්මය රක්‍ෂා කරන්නාහුය. කලෙකින් පාළි පමණකුත් නිමවා ධරාගත නොහී දුඛ දුඛ තැන් හැර සුගම සුගම තැන් පවත් වන්නාහු ය. ඒ කෙසේ ද? යත්;

තුන් පිටකයෙන් පළමු කොට අභිධර්ම පිටකය පිරිහෙයි, එයි දු පිරිහෙන කල එකවිට ම නො පිරිහී පළමු කොට මහා ප්‍රකරණය අග පටන් මුල දක්වා ක්‍රමයෙන් පිරිහී, දෙවනුව යමකය පිරිහී තුන්වනු ව කථා වස්තු පිරිහෙයි. සතර වනුව පුද්ගල ප්‍රඥප්ති පිරිහෙයි. පස්වනුව ධාතුකථා පිරිහෙයි. සවනුව විභඞ්ගය පිරිහෙයි සත් වනුව ධම්සඞ්ගණී පිරිහී මෙසේ පිරිහී සප්තප්‍රකරණය ම අග පටන් මුල දක්වා ක්‍රම ක්‍රමයෙන් පිරිහී විජම් පිටකය අන්තර්ධාන වෙයි.

එ තැන් පටන් භික්ෂූහු විනය පිටකය හා සූත්‍ර පිටකය රක්‍ෂා කොට කාලයක් ශාසනය රක්‍ෂා කෙරෙති. දෙවනු ව සූත්‍ර පිටකය ද එසේ ම පරිහානියට පටන් ගත්හ. එයින් දු පිරිහෙන කල අංගුත්තර නිකායෙහි කෙළවර එකාදස නිපාතයෙහි පටන් මූල එකක නිපාතය දක්වා, නවදහස් පන්සිය සත්පණසක් පමණ ඇති සූත්‍ර සමූහයෝ අන්තර්ධාන වෙති. පසුව සංයුක්ත සඟියෙහි මහා වග්ගය, සළායතන වග්ගය, ස්කන්ධ වග්ගය, නිදාන වග්ගය, සගාථා වග්ගයයි පඤ්ච මහා වග්ගයෝ මෙසේ අග පටන් පිරිහී සත්දහස් සත්සිය සදසැටක් පමණ ඇති විසිතුරු වූ සූත්‍ර සමූහයෝ අන්තර්ධාන වෙති. නැවත මජ්ඣිම නිකායෙහි උපරි පණ්ණාසකය, මජ්ඣිම පණ්ණාසකය, මූලපණ්ණාසකයයි තුන් පණ්ණාසකය ද එසෙයින්ම පිරිහී එක්සිය දෙපණසක් ප්‍රමාණ ඇති මහා සූත්‍ර සමූහයෝ අන්තර්ධාන වෙති. ඉක්බිත්තෙන් දීඝ නිකායෙහි දු අග පටන් පාථිය වග්ග, මහාවග්ග, ශීලස්කන්ධ වග්ග දක්වා සිව් සුතිසක් ප්‍රමාණ වූ මහා සූත්‍ර සමූහයෝ ද බ්‍රහ්මජාල සූත්‍රාන්ත කොට අන්තර්ධාන වෙති. නැවත ඛුද්දක සඟියෙහි ඛුද්දක පාඨය, ධම්මපදය, උදානය, ඉතිවුත්තකය, සූත්‍රනිපාතය, විමානවස්තුය, ප්‍රේතවස්තුය, ථේරගාථාය, ථේරීගාථාය, නිද්දේශය, ප්‍රතිසම්භිදාය, අපදානය, බුද්ධවංශය, චරියා පිටකයයි අග පටන් ක්‍රමයෙන් පිරිහී පන්සිය පනස් ජාතකය හා විනය පිටකය හා කාලයක් රක්‍ෂා කොට භික්ෂූහු ශාසනය රක්‍ෂා කෙරෙති.

එ කල මෙසේ කාලයක් ගිය කල පන්සිය පනස් ජාතකය ද ක්‍රමයෙන් අග පටන් පිරිහෙනුයේ පළමු කොට වෙස්සන්තර ජාතකයෙහි වන වර්ණනාව දක්වා හෙයින් පිරිහෙයි. ධර්මකථිකයෝ වනයක් සේ ඒ වනයට නො වැද පන්වාලා ජාතකය පමණක් බණ කියති. පසුව ජාතකය ද පිරිහෙයි. මෙසේ ම පිළිලොමින් විධුර ජාතකය, නාරද කාශ්‍යප ජාතකය, භූරිදත්ත ජාතකය, ඛණ්ඩ හාල ජාතකය, මහා උම්මග්ග ජාතකය, නිමි ජාතකය, සාම ජාතකය, මහාජනක ජාතකය, මූගපක්ඛ හෙවත් තේමිය ජාතකය යි මෙසේ දස මහා ජාතක අන්තර්ධාන වෙති. එයින් මත්තෙහිදු අසීති නිපාත, සත්තති නිපාත, සට්ඨි නිපාත, පණ්ණාස නිපාත, චත්තාළීස නිපාත, තිංස නිපාත, වීසති නිපාත, පකිණ්ණක නිපාත තෙරස නිපාත, වාදස - එකාදස නිපාත, දස - නව - අට නිපාත, සත්ත නිපාත, ඡ-පඤ්ච නිපාත, චත්තාරි-තික-දුක-එකති නිපාත ය යි මෙසේ වාවීසති නිපාතයෙහි පන්සිය පනස් ජාතක සමූහයෝ ම අපණ්ණක ජාතකාවසාන කොට අන්තර්ධාන වන්නාහු ය.

ඒ කල විනය පිටකය පමණක් කලක් පවත්වා භික්ෂූහු ශාසනය රක්ෂා කෙරෙත් මු ය. එයි දු පිරිහෙනුයේ අග පවත් ම සොළොස් පරිවාරය, ද්වාවිංශති ප්‍රභේද වූ චූලවග්ග-මහාවග්ගයෙහි කඳු වත් අන්තර්ධාන ව, පසු ව උභය විභංග සංඛ්‍යාත වූ පරිජි-පචිති අන්තර්ධාන ව, සතර පාරාජිකා ධර්මයෝ කිසි කාලයක් පැවත, ඔහු ද අන්තර්ධාන වෙති. මෙසේ බුදුන්ගේ පිටකත්‍රයෙහි සුවාසූ දහසක් ධර්මස්කන්ධයන් අග පවත් මුල දක්වා ක්‍රමයෙන් පිරිහී, හැමදෙනාම අන්තර්ධාන වූ කල්හි, බුදුන්ගේ ත්‍රිවිධ වූ ශාසනය ම අන්තර්ධාන වූවා නම් වෙයි. ඒ කාලට බුදුන් පිරිනිවි පන් දහසක් හවුරුදු ද අතික්‍රාන්ත ව බුද්ධෝත්පාදක්ෂණ සම්පත්තිය ද සත්වයාට අන්තර්ධාන වූවා නම් වෙයි.

ඒ කාලය නම්: සඳ නැති රාත්‍රියක් මැන්න, හිරු නැති දහවලක් මැන්න, සිත් නැති රූපයක් මැන්න, ගුණ නැති ලයක් මැන්න, හස් නැති විලක් මැන්න, මස් නැති විලක් මැන්න, පියුම් නැති සරසියක් මැන්න, රජුන් නැති රටක් මැන්න, මනුෂ්‍යයන් නැති ජනපදයක් මැන්න, හර නැති ගසක් මැන්න, පහන් නැති ගබක් මැන්න, සත්වයෝ කිරිසතුන් මැනියග මෙලෝ-පරලෝ නො දන්නාහ, සුගති දුගති නො දන්නාහ, අන්ධකාරයෙහි ගමන් සතුන් මෙන් මෙලෝ-පරලෝ මේ ය යි නො දැන කල්යවන්නාහ. එ දවස් උපදනා රජදරුවෝ මෙ දවස් උපදනා රාජොබුන් නො වවනා හ. දූෂ් රාජසාඹු රා බී මත්ව නන් දොඹන්නාහු තිලකුණෙත් ගෙදුනා වූ බත් කියන්නාහු මි ය, තුණ්ඩුරුවන්ගේ නමුත් කියන්නාහු ම ය, එහෙයින් දූන් උපන් සත්වයෝ ම දිවි ලදූවාහු මි ය යි සත්පුරුෂයන් විසින් දතයුතු.

මෙසේ සද්ධර්ම ශාසනය අන්තර්ධාන වූ කල්හි, එ කල උපන් රජදරුවෝ බුදුන්ගේ පවත් මුඛපරම්පරාවෙන් අසා ඒ බුදුන්ගෙන් දහම් පදයක් දන්නෝ කවුරු දෝ හෝ යි විචාරා දන්නවුන් නො දැක මඟුලැතු හු සරහා ඇතුත් පිට සත රන් දහසින් බැඳ පියලි තබා, ඝෝෂක් කරවා, බෙර-සක්-තිඹිලි ආදීන් මහත් වූ තූර්‍ය්‍යනාද කරමින්, ඒ ඒ දිග්හි ඇවිදුවා "බුදුන්ගෙන් චතුෂ්පදික වූ එක ගාථාවකුත් දන්නා කෙණෙක් ඒ අපගේ රජහට කියා මේ සත රන් දහසින් බඳ පියල්ල ගන්ව"යි කියා ඇවිදුවති. එ කල අමාත්‍යයෝ මෙසේ ම තුන් වාරයක් ඒ ඒ දිග්හි ඇවිද එක ගාථාවකුත් දන්නවුන් නො දැක, නැවත රජුන් කරා අවුදින් "දේවයෙනි! දහම්හි යි යන දෙයක් දන්නෝ නැත, ලෝකය ධර්මයෙන් ශූන්‍ය වි ය, ශූන්‍ය වි ය"යි කියා ඒ සතරන් පියලි භාණ්ඩාරයට ම නංවති. එ කල බුදුන්ගේ පර්‍ය්‍යාප්ති ය පිරිහුණුවා නම් වෙයි.

එ කල ධාතුපරිනිර්වාණය ද වෙයි. හේ කෙසේ දැ? යත්; මෙසේ මැදි පොහෝ ලද වෛශාඛ යෝගය යෙදුනු දවස් මේ සියලු ශ්‍රී ලංකාද්වීපයෙහි මහියංගන, දීඝනාග, කැලණි, තිස්ස මහ වෙහෙර, ගිරි හඬු මැඩිලිගිරි, දඹුළු, මුගසෙන්ගමු, මිහින්තලා, දෙනානක, බගිරිනක, තුඹුරුපා ආදිවූ සුවහස් ගණන් මහසෑ කුස්වල පිහිටි නො එක් ධාතූන් වහන්සේ ඒ ක්ෂණයෙහි ම ඒ ඒ දාතුස් හැර ආකාශයට පැන නැගී ගමන් ගත් තාතත් තරු පෙළක් සේ, අනුරාධපුර නුවර රුවන්වැලි මහ සෑ කුස දුටුගැමුණු රජ්ජුරුවන් කැරවූ අසූරියන් ශිලාධාතු ගර්භයෙහි මැද පිහිටියා වූ කෙළක්. අගනා රිදී රුවනෙහි පත්පැලක් පමණ ධාතූන් වහන්සේ හා එක් තැනට පැමිණෙන සේක. එකල් දක්වා ඒ දාකුස නැඟූ සිංහතෙල පහන් නො නිවී තිබී එ දවස් එපානද නිවී යයි. එ වේලෙහි සියලු ලක්දිව සියලු ධාතූන් වහන්සේ එ තැනින් අහස් කුසට පැන නැගී එක හුයක අවුලූ මුතුවැල පෙළක් සේ බවුතොවුත් පසු පස්සෙහි සීක්ෂම මණිනාග දිවයින එ දවස් දෙමිළ් නාරජ්ජුන්ගෙන් පිළිගෙණ අප බුදුන් වැඩ හිඳ බණ දෙසූ මිණිපලඟ මතුයෙහි රැස් වන සේක. එහින් නො එක් කෙළගණන් දිව්‍යනාගරාජයන් ගෙන් පූජා ලදින් ඒ මිණිපලඟ හා සමඟ ආකාශයට පැනනැගී ගොස් බෝමඬ අප බුදුන් මරසෙන් බිඳ බුදු වූ අපරාජිත භූමියට බස්නා සේක.

එ කෙණෙහි දිව්‍යලෝක-බ්‍රහ්මලොක-නාගලොකාදී ඒ ඒ තැන්හි පිහිටි ධාතූන් වහන්සේ ද, අවශෙෂ වූ ඒ ඒ තොදෙව් වල පිහිටි ධාතූන් වහන්සේ ද, දඹදිව් දසරටුපාදී ඒ ඒ රාජධානි වල පිහිටි ධාතූන් වහන්සේ ද, ඒ ඒ තැනින් පැනනැගී පියුම් විලක් කරා දිවන රාජහංස සමූහයක් සේ, බුදුන්ගේ පශ්චිම දශීන නමැති මෙඝ කාලයෙහි ගුවන්කුස් පැනනැගී දිවන බලාකා පංතියක් සේ, ආකාශයෙන් වැඩ බෝමැඩ එම් ධාතූන් වහන්සේ හා එක් වන සේක. එ කල බුදු වූ දවස් සේ ම පොළොව පළා ගෙණ තුදුස් රියන් වජ්‍රාසනයෙන් පැනනැගී ඒ ධාතු පිළිගන්නි ය.

එ වේලෙහි ඒ සියලු ධාතූන් වහන්සේ ම ජීවමාන වූ බුදුන් ගේ රූපය මවා ලලාට ධාතූන් වහන්සේ ලලාටයෙහි ම පිහිටන සේක. ඒ මතුයෙහි උණ්ණරෝම ධාතූන්වහන්සේ පිහිටන සේක. අක්ෂුයෙහි අක්ෂුධාතූන් වහන්සේ පිහිටන සේක. සතර දළදා වහන් සේ සතර දන්තස්ථානයෙහි ම පිහිටන සේක ග්‍රීවධාතූන් වහන් සේ එසේම ග්‍රීවයෙහි ම පිහිටන සේක. දෙකෙළ පණස් ලක්ෂයක් පමණ කෙශධාතූන් වහන්සේ ඒ ඒ ස්ථාන නො වරදවා ම පිහිටන සේක. නවානූදහසක් ලෝමකූප ධාතූන් වහන්සේ ද ඒ ඒ ලෝම

කූපෙනොවරදවා ම පිහිටනු යේක. අවශෙෂ වූ තුන් තරමෙහි විසුරුණා වූ බුදුන්ගේ සොළොස් හැළියක් පමණ ධාතූන් වහන්සේ ද තමන් තමන් වහන්සේ පෙර පිහිටි පිහිටියා වූ ස්ථාන යෙහි නො වරදවා ම පිහිටනු යේක. ඉක්බිත්තෙන් දෙතිස් මහා පුරුෂ ලක්ෂණ හා අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණ හා පෙර සේම නිර්මිත වෙති. එ කල බුදු වූ දවස් සේ ම සියලඟින් සවණක් රැස් හැර සියලු ලෝකධාතු ඒකාලෝක කරණයේක. එ වේලෙහි දසදහසක් සක් වළ දිව්‍ය බ්‍රහ්මයෝ බුදුරැස් දැක 'අද අප බුදුන්ගේ ධාතු පරිනිර්වාණ දිනය වන, කෙළවර පෑනා පෙළහර බලමින"යි නො එක් පූජා භාණ්ඩ ගෙණ අවුදින් බෝමඩ සිසාරා තුන්ලොව පුරාසිටගන්නාහු ය.

එ වේලෙහි ධාතු බුදුහු ආකාශයට පැන නැගී ගණ්ඩම්බ නම් වෘක්ෂමූලයෙහි දී පෑ යමක ප්‍රාතිහාර්‍ය්‍ය සේම, මහ පෙළහර දක්වා, නැවත ආකාශයෙන් බැස බෝමඩ විදුරසුන් නැගී මැඩහිඳිනා යේක. එ වේලෙහි ඒ ධාතු ස්කන්ධයෙන් තේජස්කන්ධයෙක් පැනනැගී බෝමඩ පටන් බ්‍රහ්මලෝකයට ඇවිළ සිට ගෙණ ධාතු ආදාහන වන්නට පටන් ගත්හි. එ වේලෙහි දසදහසක් සක්වළින් රැස්වූ දෙවියෝ "අප බුදුන්ගේ මේ පශ්චිම දර්ශනය ය. අද තුන් වනුවූ ධාතුපරිනිර්වාණය ය, බුදුකෙණකුන්ගේ නමක්, කප් අසංඛ්‍යයකිනුත් ඇසිය නො හැක්ක, දක්ක නො හැක්ක, එසේවූ බුදුහු අද අන්තර්ධාන වෙති, අහෝ ඛෙද ය. අහෝ ඛෙද ය, ලෝකය ශූන්‍ය වි ය. ශූන්‍ය වී ය"යි කිය කියා අහස්කුස් පුරා සිටි දෙවියෝ නිම්මඩලෙහි කඳුළුධාරා නමැති මහවැසි වස්වති, එ කල අබබිජක් හා ධාතුවකුත් නො තිබී සැම ධාතු ම ආදාහන වූ කල් ගිනිකඳ තෙමේ ම අන්තර්ධාන වෙයි. එකෙණෙහි ඒ ඒ තන්හි පිහිටියාවූ දිව්‍යනිර්මිතාදී ප්‍රතිමාද, ශිලාරූප-කාෂ්ඨරූප-ලොහරූප-රත්රන් රූප-සුවර්ණ රූපාදී සියලු බුධප්‍රතිමා ද අන්තර්ධාන වෙයි. එ කල දසදහසක් සක්වළ ආකාශයෙහි සන පිරිවරින් සිටියා වූ එක්ලක්ෂ පණස් දහසක් මහාබ්‍රහ්මරාජයන් හා අනූදහසක් කාමාවචර දිව්‍ය රාජයන් හා බොධි මණ්ඩලයට බැස තමන් තමන්ගේ භාග්‍ය පමණින් මහත් වූ දිව්‍ය පූජා කරන්නාහු පරිනිර්වාණ පූජාව සේ ම අප්‍රමාණවූ පූජා කොට පවත්වා යන්නාහ.

මෙසේ මාගේ බුදුහු තමන් වහන්සේගේ ධාතු පරිනිර්වාණ දින යෙහි පවා මේ සා මහත් වූ දිව්‍ය පූජාවන් ලත් සෙයිනුත්, එසේ වූ පූජා විඳීමට සුදුසු සෙයිනුත්, මාගේ බුදුහු අර්හත් නම් වන සේක යි දතයුතු.

ධාතු පරිනිර්වාණ පූජා කථා මෙසේ දතයුතු.

---

1. අමුතක්.

තව ද: ත්‍රිවිධවූ සංගායනා පූජා කළා නම් කවර? යත්; යවනි ක්‍රමයෙන් බුදුන් යමහල දී පිරිනිවි කල්හි මහසුප් මහ තෙරුන් වහන්සේ බුදුන්ගේ ආදාහන පූජාව කරමා, සුභද්‍ර මහ පවුල හා බුද්ධරාජ්‍යය ලදින්, අඤ්ඤබුද්ධ වූ සේක්, එ දවස් ආදාහනයට රැස් වූ සත් ලක්ෂයක් මහාසංඝයා අතුරෙන් විවරයන් හා ප්‍රමාණාතික්‍රාන්ත භික්ෂූන් අතුරෙන් බුදුන් කෙරේ මහණ ව ඒහි භික්ෂු පැවිද්දට යෑගී තුන් පිටක ධර වූ, උනු පන්සියයක් මහ රහතන් තෝරා ගෙණ රජගහා නුවරට වැඩ අජාසත් රජ්ජුරුවන් ගෙන්වා "මහරජ! බුදුන් විසින් දෙසූ වාවු ධර්මය නො එක් ජාතියෙහි, මිල් එන මිලස්නොන සැළවා සේ ඒ ඒ සත්ත්වයන් උදෙසා දෙසාපු හෙයින් පිළිවෙළක් නැති ව අනාගතයෙහි නො පවත්නා ලෙස තුබුයේ ය, එසේ හෙයින් දූන් මම ධර්ම සංගායනාව කරවනු කැමැත්තෙමි. ඒ සංගායනා වට මිථ්‍යාදෘෂ්ටි ආදීන්ගෙන් වන්නාවූ අනතුරක් ඇත රජෙකුගේ පිටු බලයක් නැති ව කළ නො හැක්ක, එසේ හෙයින් මහරජ මට සහාය වව" යි වදාළ සේක.

එ වේලෙහි අජාසත් රජ්ජුරුවෝ "මැනවි ස්වාමිනි" යි ගිවිස තමන් කරණ ධාතු පූජාව නො කඩ කොට කරණ සේ අමාත්‍යයන් ට නියෝග කොට තුමූ එ නුවර පිරිවරා සිටි අටළොස් මහාවිහාරය ම නවකර්මාන්ත නිමවා එ නුවරට දකුණු දිග වේභාර නම් පර්වතද්වාර යෙහි විශ්වකර්ම නිර්මිතයක් සේ අසාධාරණවූ රුවන් මණ්ඩපයක් නිමවා කනක-රජත-මණිතෝරණයෙන් විසිතුරු වූ වියන් බඳවා ලක්ෂයක් වටනා බුමුතුරණු අතුරුවා, සියාරා අනැගි තිර අඳිද, පන්සියයක් ආසන පණවා, මධ්‍යයෙහි එකළක් අගනා ධර්මාසනයක් පණවා නිමවා එහි දනාතමීයවූ විජනියක් තබා, සියාරා රහවල් ලමා මහසුප් ස්වාමීන් කරා ගොස්, ස්වාමිනි! යම් දවසෙක ධර්ම සංගායනා තිමා ද, එ දවස් දක්වා රැස් වූ යම් පමණ භික්ෂූන්ට සිවු පස දනය ද සද්ධර්ම පූජා ද, මටම භාර ය. ධර්ම සංගායනා කළ මැනැවැ"යි ආරාධනා කළහ.

එ කල මහසුප් මහ තෙරුන් වහන්සේ අනඳ මහ තෙරුන් වහන්සේ කැඳවා "ආනන්දයෙනි! ධර්මසංගායනාව තොප නැතිවත් කළ නො හැක්ක. තොප අධිගමය නො කළ හෙයින් ඇතිවත් කළ නො හැක්ක ධර්මභාණ්ඩාගාරය බුදුහු තොප අත තබා වදාළසේක, ඇවැත්නි! වීර්‍ය්‍ය කරව"යි වදාරා උනු පන්සියයක් රහතන් ගෙණ අනඳ මහ තෙරුන් වහන්සේට අවකාශ තබා තමන් තමන් වහන්සේට පැණවූ ආසනවල වැඩහුන්සේක.

එ කල අනඳ මහ තෙරුන් වහන්සේ තුන්යම් රාත්‍රියෙහි සක්මන් කොට, භාවනා කොට, අධිගමයක් නො ලදින් "අලුයම් වේලෙහි මඳක් කය සතපා වියයි කෙරෙමි"යි සිතා ලා ශයනස්ථාන යට වැඩ ශ්‍රී ශරීරය ඇඳ පිට තබාලීමත්, දෙපය ඔසවාලීමත්, අමා මහ නිවන් දැකීමත්, මේ තුන ඒකක්ෂණයෙහි ම විය. මේ බුදුසස් නෙහි නො සිඳ, නො හෙව, නො සිට, නො ඇවිද, රහත්වූ අනඳ මහතෙර සාමීන් හැර අනික් නැතැත්තාහු ම ය. මෙසේ රහත් වලා "මා අධිගමය ලත් නියාව දිව්‍ය – මනුෂ්‍යයන්ට සැල කරමි"යි එ කෙණෙහි පොළොව කිමිද තමන් වහන්සේගේ ආසන යෙහි බැලෑහී මණ්ඩලය සේ පැනනැගී සේක.

එ කෙණෙහි මහසුප් මහතෙරුන් වහන්සේ "අද බුදුහු ඇත් නම් ආනන්ද ස්ථවිරයන්ට සාධුකාර දෙන සේක් ම ය"යි සන්තුෂ්ටව තුන් වරක් සාධුකාර දුන් සේක. එ කෙණෙහි දිව්‍ය මනුෂ්‍යයෝ ද සාධුකාර දුන්හ. ඉක්බිත්තෙන් මහසුප් මහතෙරුන් වහන්සේ බුදුහු පිරිනිවි සාරමසක් ගිය කල ශිකින්නිය අව දියවක ඒ රජ ගහා කුමර වේභාර නම් පර්වතාරයෙහි දී මෙසේ පන්සීයයක් රහතන් හා සම්ග සත් මසෙකින් පලමු වන ධර්මසංගායනාව කොට නිම්වා වදාළ සේක. අජාසත් රජ්ජුරුවෝ ඒ සත් මස මුළුල්ලෙහි අප්‍රමාද ම දවසින් දවස ධර්මපූජා කළාහු ම ය.

ප්‍රථම සඞගිති කථා.

එ තැන් පටන් අජාසත් රජ්ජුරුවෝ මහසුප් සාමීන්ගේ විධාන වූ පරිද්දෙන් ඒ ඒ නුවරවල තුබූ ධාතු රහතන් ලවා ගෙන්වා සාමීන්ගේ රජගහා නුවර මහා ධාතු නිධානයක් කරවා, ශාසනයට උපකාර ව බොහෝ කලක් එම නුවර වාසය කොට, පසුව පසල් දනව්වෙහි වැදි කෙණකුන් නිසා රට මැස්සන්ට භය මහත් හෙයින්, ඒ දනව්වට ගොස් ගංගා නම් ගංගාවෙහි ගෝතම නම් තොටට කුදුරු තෙන පාටලි නම් නියම් ගම් පාටලිපුත්‍ර නම් වූ මහ රජ නගරයක් කරවා එහි වැස දනාදී පින්කම් කොට රට රැක රාජ්‍යය කළාහු ය.

පසු ව ඔවුන්ගේ දරු උභයභද්ද නම් රජ පිය රජහු මරා එ නුවර හිඳ රාජ්‍යය කෙළේ ය. පසුව ඔහු පිත් අනුරුධ නම් රජෙක් ද එම නුවර හිඳ රාජ්‍යය කෙළේ ය. පසුව ඔහු පිත් මහා මුණ්ඩ නම් රජෙක් එම නුවර හිඳ රාජ්‍යය කෙළේ ය. පසුව ඔහු පිත් නාගදාසක නම් රජෙක් ද එම නුවර හිඳ රාජ්‍යය කෙළේ ය. පසුව ඔහු පිත් සුසුනාග නම් රජෙක් ද එම නුවර හිඳ රාජ්‍යය

කොළේ ය. පියන් මරා රජ කළාවූ ඒ මගධ රජුන් සදෙනා අයා මෙහි සත්වනු ව කාලාශෝක නම් රජෙක් විය. ඔහට දසවන් හව අප බුදුන් පිරිනිවි හවුරුදු සියයෙක් පලා ගියෙ. එ කලට බුදුන් කෙරේ මහණ වූ භික්ෂු කෙණෙකුන් වහන්සේ ද තොම ඇත. ආනඳ මහ තෙරුන් වහන්සේ කෙරෙහි මහණ වූ බුදුන් පිරිනිවන් පානා වකාට ඉසා ලදරු වූ බුදුන්ගේ රූපය විවරක් දුටු විරූ සබ්බකාමි නම් මහ තෙර කෙණෙකුන් වහන්සේ එක්සිය විසි හැවිරිදි වයස් ඇති ම "බුදුන්ගේ රූප සම්පත්තිය මම බාල කල දුටු විරිමි"යි වදාරණ සේක.

දඹදිවු වැසි බොහෝ සත්වයෝ "උන්වහන්සේ බුදුන් ගඳුනති" යි අසා ගඳ දුම් මල් පහන් ගෙණ, සිංහල විප වාසී සත්වයන් සමනොළ දක්නට යන්නා සේ ම වැල නො කැඩී ම යෙති. එ කලට දසදහසක් පමණ වැදී මහණහු විශාලා මහනුවර එක් ව ධර්ම පෙරළා ගෙණ දස වස්තුවක් උපදවා ශාසනය හෙද කළාහු ය. එකල යස නම් මහතෙර කෙණෙකුන් වහන්සේ දොළොස් දහසක් භික්ෂූන් අතුරෙන් සබ්බකාමී නම් මහතෙරුන් වහන්සේ ඇතුළු වූ සත්සියයක් පමණ රහතුන් තෝරා ගෙණ එම විශාලා මහනුවර වාලුකාරාමයෙහි දී කාලාශෝක නම් රජහුගෙන් ආරක්ෂා ඇතිව, අටමසෙකින් ධර්මසංගායනා කොට දසදහසක් අලජ්ජීන් දුරු කොට ශාසනය පරිශුද්ධ කොට වදාළසේක. එ කල ඒ කාලාශෝක නම් රජ්ජුරුවෝ ද, ඒ අටමස මුලුල්ලෙහි දවස දවස අප්‍රමාණ වූ පූජා කළහ.

ද්විතීය සංගීති පූජා කථා.

මෙසේ ඒ කාලාශෝක නම් රජහු අයාමෙන් ඔහුගේ දරුවෝ: භද්‍රසේන ය, කෝරණ්ඩ ය, මංගුර ය, සර්වංජහ ය, ජාලික ය, උභක ය, සඤ්ජය ය, කෝරව්‍ය ය, නන්දිවර්ධන ය, පඤ්චමක ය යි දස බෑ රජහු රජ කළාහ. ඔවුන් අයාමෙහි උග්‍රසේන නන්ද ය, පණ්ඩුක නන්ද ය, පණ්ඩුගති නන්ද ය, භූතපාල නන්ද ය, රට්ඨපාල නන්ද ය, ගෝවිෂාණ නන්ද ය, දසසිද්ධක නන්ද ය, කෙවට්ට නන්ද ය, ධනපාල නන්දය යි යන නවනන්ද රජදරුවෝ එම නුවර හිඳ රාජ්‍යය කළහ. ඔවුන් අයාමෙන් පෙර විඩූඩභ යුද්ධයෙහි රටින් ගියාවූ ශාක්‍යපුත්‍රයන් විසින් කරණලද මෝරිය නම් නුවර උපන්නාවූ එම ශාක්‍යවංශයෙහි උද්භූතවූ චාණක්‍ය නම් බමුණා ගෙන් උපදෙස් ලදින් චන්ද්‍රගුප්ත නම් රජෙක් එම පාටලීපුත්‍ර

නම් නුවර රාජ්‍යය කෙළේ ය. පසුව ඔහු පිත් බිඳුසාර රජහුගේ එක්සිය යක් පමණ පුත් කුමරුවෝ වූහ. ඔවුන් අතුරෙන් ධර්මාශෝක නම් කුමර පියරජහු අයාමෙන් පැනනැගී සුමා හා කුඩ සොහොත් තිස්ස නම් රජකුමරුවා හැර, තව අනූවක් පමණ මල් රජුන් මරා, තමන්ගේ බාහු බලයෙන් ම ජයගෙණ මුළු දඹදිවට ඡේසත් නගා, දඹදිව හැමරජුන් තම හට සේවයට එන සේ ආඥ පතුරුවා එම පාටලී පුත්‍ර නම් නුවර රජ කෙළේ ය.

ඒ ධර්මාශෝක නම් රජ ඉතා මහත් වූ තේජස් ඇත්තේ ය. මහත් වූ ශ්‍රද්ධා ඇත්තේ ය. මහත් වූ පින්බල ඇත්තේ ය. ඔහුගේ ආඥ පොළොවිත් යොදුනක හා ආකාශයෙන් යොදුනක පැතිරෙයි. අනවතප්ත විලින් සොළොස් කළයක් පැන් දවස දවස දෙවියෝ රජහට ගෙණ දෙත්. එ රජ සැට දහසක් පමණ සංඝයා වහන්සේ නමාගේ යටිමාලේ දී දවස් පතා වළඳවයි. සොළොස් දහසක් පමණ පුර ස්ත්‍රීන් පිරිවරකොට ඇති අසන්ධිමිත්‍රා නම් අග බිසෝ කෙනෙක් ඇත, ඒ බිසොවු නම් කෙශාන්තය පටන් පාදාන්තය දක්වා අසවල් තැනෙක සන්ධියෙක් ඇතැයි දතහැක නො හැක්ක. ජාම්බූනදයෙන් මවාලූ කනක රූපයක් වැනිය. ඔතොම සැඟවී තිබෙන සන්ධි ඇති හෙයින් අසන්ධිමිත්‍රා නම් වෙති. ඒ බිසොවු මෙසේ වූ රූප ඓශ්වර්‍ය්‍යී පිණක් ගිය ජාතියෙහි මී දත් දෙන ගෙයක් අත නගා පෑලූ කුශලයෙන් ලදහයි දත යුතු. මේ නාටක ස්ත්‍රීන්වත්, භික්‍ෂූන්වහන්සේවත්, හිමාලයෙන් නාලිය දූහැටි දවස් පතා දෙවියන් ලවා ගෙන්වා දෙති.

තව ද: දිව්‍යමය වූ ඇඹුල ද, දිව්‍යමය වූ අරළු ද, මහ දියකළු හා අඹ ද, දවස් පතා ම දෙවියෝ හිමාලය වනයෙන් ගෙණවුත් රජහට දෙති. තව ද: දවස් පතා පස්වණක් පෑ ඇති දිව්‍යසාවන පුස්ඹයක් හා රන්වන් අත්පිස්නාවක් හා දෙවියෝ ගෙණ දෙත් ම ය. තව ද: දවස් පතා දිවසුවඳ හා දිවසමන්මල් පටක් හා දිව්‍යමය වූ අඳුන්කෑවක් හා නාගභවනයෙන් නයි ගෙණවුත් දෙති. තව ද: ඡද්දන්ත විලින් ස්වයංජාත රත් හැල් නවදහසක් ගැල ගිරවු ගෙණැවිත් දවස් පතා බඩහල් පුරා යෙති. ඒ වී මීයෝ පොතු ගලවා හාල් කොට යෙති. හැම දා ම රජහට ඒ රත්හැල් සාලේ බත් ම අනුභවයට වෙයි. මීමැස්සෝ අවුදින් මහා භාජන-කත්කුළු ආදී ස්ථානයෙහි මී බැඳ පුරා පෙදකුත් තනා බී යෙති. වලස්සු යකඩ කර්මාන්තයෙහි කුළු ගසති. දිවියෝ දවල් ම සරක් රැක සවස ආනා ගෙණවුත් ගෙරි ගාල්වල ලාලා රාත්‍රිභාගයෙහි තුමූ ගොදුරු සොයා යති. මධුර නාද ඇති පක්‍ෂීහු අවුදින් රජගෙයි පලපදනම පිට හිඳ මධුරනාද පවත්වා සේවය කොට යෙති. මියුරයෝ අවුදින් රජහට පෙණෙන තැන සිට නටා සේවය කොට යෙති.

ඒ ධර්මාශෝක රජ මෙසේ වූ ආඥා තේජසක් කෙසේ වූ පින් බලයෙකින් ලද්දේ දැ? යත්; සිය දවස ගිලන් භික්ෂු කෙනකුන් දැක මී පාත්‍රයක් පුරා දන් දී "මේ පාත්‍රයෙහි මී ඉතිර බිම වැගිර ගියා සේ ම, මතු මුළු දඹදිව් තෙලෙහි මාගේ ආඥාව පැතිර පොළොවින් යොදනෙක දක්වා පවතිව යි, ඉතිර නැගි මධුබිඳු සේ ම මාගේ ආඥා ආකාශයටත් නැගේවා"යි කියා ප්‍රාර්ථනා කෙළේ ය. එ දා ඒ මී පාත්‍රය පුරා දන් දුන් පිණින්, මෙ දා ධර්මාශෝක නම් රජ වි ය. එ දවස් ඒ භික්ෂූන්ට මී පිළම් අත නගා පෑලූ ස්ත්‍රී මෙ දා සොළොස් දහසක් ස්ත්‍රීන්ට නායක ව අසන්ධිමිත්‍රා නම් අගමෙහෙසින් වූහ යි දතයුතු.

තව ද: මේ ධර්මාශෝක රජ මෙසේ තුණුරුවන්හි ප්‍රසන්න වූ සිතින් දඹදිව රාජ්‍යය කරන්නේ දවසෙක ඇමැතියන් කැඳවා "බුදුන් සමයෙහි උපනිම් නම් මුළු දඹදිව් රාජ්‍යය බුදුන්ට ම පූජා කෙරෙමි. මා පින් මඳ හෙයින් බුදුන් නො දැක්කෙමි. බුදුන් සඳුනන්නාහු කවුරු දැ"යි විචාළේ ය. අමාත්‍යයෝ "මංජෙරික නම් නාගභවනයෙහි මහා කාල නම් නාරජ්ජුරුවෝ කපකට ආයු ඇතියහ. මේ කප බුදුවූ සතර බුදුන් ම දුටුවාහු ය"යි කීහ. රජද එ බස් අසා "ඒ නාරජ්ජු ගෙන්වා බුදුන් රූ බලමි"යි සිතා රන්හැකිල්ලක් කරවා තමන් අතින් ගෙණ"තුණුරුවන්හි සැබවින් පැහැදියෙම් නම්,සැබවින්ම සැදෑ ඇතියෙම් නම්,මේ හැකිල්ල ගොස් ඒ නාරජ්ජු බඳ ගෙණෙණවයි"යි සත්‍යක්‍රියා කොට පොළොවට ගැසී ය. එ කෙණෙහි මහපොළොව කපාගෙණ පවීනයක් පලා දිවන කඟ වෙණකු සේ ඒ හැකිල්ල පැකිල්ලක් නැති ව ඇසිල්ලෙකින් දිව ගොස් ඒ නාරජහු වාලධිය ගත නාරජ දිවසින් බලා රජ්ජුරුවන්ගේ අචල වූ ශ්‍රද්ධාබල හා තේජස් දැක, එ කෙණෙහි ම දහස් ගණන් නා නළුවන් පිරිවරා රාජාංගනයෙහි පොළොව පලා පැන නැගී රජ්ජුරුවන් පෙරට ව දෘශ්‍යමාන ව පෙණී සිටගත.

රජ්ජුරුවෝ ඒ කාල නම් නා රජ්ජුරුවන් දැක උපචාර කරවා "සතර බුදුන් දුටු දැ"යි විචාළහ. "මහරජ! දිටිමි"යි කීහ. එ බසට රජ්ජුරුවෝ සාධුකාර දී දෙහොත් මුදුනෙහි තබා ගෙණ "සතර බුදුන්ගේ වෙස් මවා මා දක්වව" කීහ. නා රජ්ජුරුවෝ "මම සරාගියෙමි. බුදුහු අරාගි සේක. මා තබා මහබඹු වී නමුත් බුදුන් රූපය සකසා දක්වාලිය නොහේම ය. එසේ වී නමුත් බුදුන් රුව ඒක ලේශයක් බැලුව මැනවැ"යි කියාලා කකුසඳ බුදුන්ගේ සතළිස් රියන් බුද්ධකාය මවාගෙණ සතළිස් දහසක් රහතන් පිරිවරා ඒ

බුදුන්ගේ ලීලා දක්වා මොහොතක් කල් අහස්කුස සිටියේය. එ කෙණෙහි රජ්ජුරුවෝ ප්‍රීතිමත් ව "ජීවිතයෙහි ඵල ලදිමි" යි කියා සාධුකාර දුන්හ. දෙවනු ව කොණාගමන නම් බුදුන්ගේ තිස්රියන් බුද්ධකාය මවා තිස්දහසක් පමණ රහත් ගණයා හා සමග අහස්කුස පෙණීගියා සේ දක්වා ලීය. එවේලෙහි රජ්ජුරුවන් හා මහපිරිස සාධුකාර සහස්‍රයෙන් පූජා කළහ. තුන්වනු ව කාශ්‍යපනම් බුදුන්ගේ විසිරියන් බුද්ධකාය මවා විසිදහසක් පමණ රහත් ගණනා සමග අහස්කුස වැඩසිටියා සේ දක්වා ලීය. එ වේලෙහි ද මහත් වූ උත්සවයෙන් පූජා විය. සතරවනු ව අප මහා ගෞතම බුදුන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ-අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් විරාජමාන වූ අටළොස් රියන් බුද්ධකාය මවා ගෙණ බෝමඩ වජ්‍රාසන පැනනැගී මාරපරාජය කෙයි වැඩහුන්නාවූ ශ්‍රීවිලාසය දක්වා ලීය. එ කෙණෙහි රජ්ජුරුවෝ බුද්ධාලම්බන ප්‍රීතීන් පිණා මුළු දඹදිව රාජ්‍යය බුදුන්ට පුදා සොළොස් දහසක් පුරසත්‍රීන් හා සමග අනිමිස ලොචනයෙන් බුදුන් බලා සිට සත් දවසක් මුළුල්ලෙහි පූජා කළහ.

එ තැන් පටන් දවස දවස මහ වඩාලා තුණුරුවන්හි ප්‍රසන්න වූ රජ්ජුරුවෝ මුළු දඹදිව් තෙලෙහි සුවාසූ දහසක් රාජධානි ඇති කරවා බුදුන්ගේ එකි එකී ධර්මස්කන්ධයට එකි එකී රජමහා විහාර යක් බැගින් කරවමි"යි සිතා සයානූ කෙළක් ධන වියදම් කොට සුවාසූදහසක් රාජධානියෙහි සුවාසූදහසක් දාගැබ් බඳවා ධාතු පූජා කළහ. සුවාසූදහසක් බෝධි පිහිටුවා බෝධි පූජා කළහ. සුවාසූ දහසක් රත්වන් මහපා සඞ්ඝාරාම කරවා සඞ්ඝපූජා කළහ.

මෙසේ තුන් හවුරුද්දක් මුළුල්ලෙහි සුවාසූදහසක් විහාර නිමවා රජකාන්කරු ගොස් "ස්වාමිනි! මාගේ විහාරවල කොත්මගුල් පූජා එක දා ම කරවනු කැමැත්තෙමි, හැම දක්නාත් කැමැත්තෙමි. දඹදිව මහත, කෙසේ මාගේ චිත්තප්‍රසාදය කොට ගනිම් ද"යි විචාළහ. එ වේලෙහි රහතන් වහන්සේ "මැනැව මහරජ! සියලු වෙහෙරවල් එක දවස් එක වේලෙහි ම පූජා කොට, කොත් පලඳ වන සේ නියෝග කොට කියා යව"යි වදාරා එ වේලෙහි රජ්ජුරුවන් අත අල්වා ගෙණ ආකාශයට පැනනැගී "සියලු විහාර පූජා ම මෝහට අපණෙම්"යි අධිෂ්ඨාන කොට වදාළ සේක.

එ කෙණෙහි රජ්ජුරුවෝ සුවාසූදහසක් විහාරපූජා ම විශෙෂයෙන් දුක පස්වණක් ප්‍රීතීන් පිණා දෙහොත් මුදුනෙහි තබාගෙණ සාධු සාධු බුද්ධශාසනයට හිමිවීමි, හිමිවීමි යි තුන්යලක් කීය.

එ වේලෙහි රහතන් වහන්සේ "මේ රජ්ජුරුවන්ගේ දරුවක් නිසා ම මතු ශ්‍රීලඞ්කාද්වීපයෙහි සසුන් පිහිටමයි දැන ඔවුන් මහණ කර වනු සඳහා මහරජ ශාසනයට තව හිමි නුවූයෙහි වේ දැයි වදාළ සේක. එ වේලෙහි රජ්ජුරුවෝ "ස්වාමීනි මා වැනි ශ්‍රද්ධාවන්ත රජක්හු නුඹවහන්සේගේ ශාසනයට දායාද නො ලද්දේනම් කවරෙක් ලැබේ දැ" යි විචාළහ. මහරජ! දරු කෙණකුන් වදා මහා බුදුසස්නෙහි මහණ කරවාලු කෙණෙක් ශාසනයට හිමියාහුය. එසේ නො කළ කෙණෙක් කොතෙක් පින් කළාහු වූ නමුත් හිමි නො වන්නාහු ම වේ දැ"යි වදාළ සේක.

රජ්ජුරුවෝ 'ඒ පිණත් පුරමි"යි සිතා දකුණැ'ළයෙහි සිටි මිහිඳු නම් පුත් කුමාරයන් මුහුණ බැලූහ. එ වේලෙහි මිහිඳු කුමාරයෝ පියානන්ගේ අදහස් දැන "ස්වාමීනි! මම දැන් ම මහණ වෙමි"යි කීය. වමැ'ළයෙහි සිටි සඞ්ඝමිත්තා නම් දියණියන් මුහුණ බැලූහ. ඕ ද දැන්ම මහණ කැරවුව මැනැව"යි කීහ. එ වේලෙහි රජ්ජුරුවෝ ඉතා සතුටු ව එම පූජාවෙහි ඒ මිහිඳු නම් කුමාරයන් හා සඞ්ඝමිත්‍රා නම් දියණියන් හා දෙබිසිස්සන් මහණ කරවා බුදුසසුනට හිමි වූහ. මෙසේ ශ්‍රද්ධාවන්ත වූ රජ්ජුරුවෝ "මිථ්‍යාදෘෂ්ටි ගතුවන්ට බත් නො ලත්හෝය"යි මුළු දඹදිව බෙර ලැවූහ.

එ කල දඹදිව් තෙලෙහි අළු ගා මිථ්‍යාදෘෂ්ටි ගත්තාවූ එක ද සත්ත්වයෙකුත් නැත. තීර්ථකයෝ බත් නොලද්දින් මහණවනු සඳහා විහාරවලට එති. ඒ භික්ෂූන්වහන්සේ ශාසනය හෙද කෙරෙති යි සිතා ඔවුන් මහණ නො කරමින සේක. එ කල ඔහු තුමූ තුමූ ම සිවුරු පොරොවා ගෙණ සැටදහසක් පමණ මිථ්‍යාදෘෂ්ටිගතුවෝ මහණව වෙස්වළා අලජ්ජීන් හා එක් ව ශාසනය කිලුටු කළහ. එ කල සත් හවුරුද්දක් මුළුල්ලෙහි රහතන් වහන්සේ පුද්ගලයන් සපුර හෙයින් උපෝසථය නො කළ සේක එ කල මොග්ගලි පුත්ත තිස්ස නම් මහ තෙරුන් වහන්සේ දසදහසක් පමණ රහතන් වහන්සේ හා සමග එම නුවර ධර්මාශෝක රජ්ජුරුවන් කරවූ අශෝක නම් ආරාමයෙහි වැඩහිඳ බුදුන් පිරිනිවී දෙසිය අටළොස් අවුරුද්දකින් එම ධර්මාශෝක රජ්ජුරුවන්ට සතළොස් වස්නෙහි එම රජ්ජුරුවන්ගෙන් ආරක්ෂා ලදින් නව මසකින් තුන් වන ධර්මසඞ්ගායනාව කොට සැටදහසක් පමණ අලජ්ජීන් දුරුකොට ශාසනය පරිශුද්ධ කොට වදාළ සේක.

තෘතීය සංගීති පූජා කථා.

මෙසේ තමන් වහන්සේ පිරිනිවී දෙසිය අටළොස් අවුරුද්දක් ඇතුළත පරිනිර්වාණ දිනයෙහි කළ වාරණ නම් දිව්‍යපුත්‍රයා මාල ජාලාමෙන් කළ පූජා ය, දෙතිස් මහා පුෂ්පනිමිත්ත පූජා ය, එම වේලෙහි දසදහසක් සක්වළ දිව්‍යරාජයන් කළ පරිනිර්වාණ පූජා ය, මල්ල රජුන් කළ ආදහන පූජා ය, සත් අවුරුදු සත් මස් සත් දවසක් මුළුල්ලෙහි අජාසත් රජ්ජුරුවන් දවස් පතා කළ ධාතු පූජා ය, සෙසු රජුන් ශක්ති පමණින් දවස් පතා කළ ධාතු පූජා ය, අජාසත් රජ්ජුරුවන් සත්මසක් මුළුල්ලෙහි දවස් පතා කළ ප්‍රථම සඞ්ගායනා පූජා ය, කාලාශෝක රජ්ජුරුවන් අටමසක් මුළුල්ලෙහි දවස්පතා කළ ද්විතීය සඞ්ගායනා පූජා ය, ධර්මාශෝක රජ්ජුරුවන් නවමසක් මුළුල්ලෙහි දවස් පතා කළ තෘතීය සඞ්ගායනා පූජා ය, තව ද: එම ධර්මාශෝක රජ්ජුරුවන් කළ ජම්බුද්වීප පූජා ය, ඔවුන් ම කළ සුවාසූදහසක් පමණ චෛත්‍යඞ්ගන පූජා ය, සුවාසූ දහසක් පමණ බෝධ්‍යඞ්ගන පූජා ය, සුවාසූදහසක් පමණ සඞ්ඝාරාම පූජා ය, තව ද: එම ධර්මාශෝක රජ්ජුරුවන් විසින් ම කරණලද අනිමිස ලොචන පූජා ය, සාධුකාද පූජා ය, මිහිඳු කුමාරයන් හා සඞ්ඝමිත්‍රාවන් දෙදෙනාගේ මහණ පූජා ය.

තව ද: සැටලක්ෂ පන්සියයක් ක්ෂීණාශ්‍රව ස්ථවිරයන් හා සමග මහාකාශ්‍යප ස්ථවිරයන් සද්ධර්ම ප්‍රතිෂ්ඨාමෙන් කළා වූ සම්‍යක් ප්‍රතිපත්ති පූජා ය, යශ නම් මහාස්ථවිරයන් දොළොස් දහසක් පමණ මහරහතුන් හා සමග ශාසනප්‍රතිෂ්ඨාවෙන් කළා වූ විශෙෂ වූ ප්‍රතිපත්ති පූජා ය, මොග්ගලි පුත්තතිස්ස නම් මහා ස්ථවිරයන් දස දහසක් මහරහතුන් හා සමග ශාසන ශුද්ධතාවෙන් කළා වූ විශෙෂ වූ ප්‍රතිපත්ති පූජා ය, මතු ලබන ධාතුපරිනිර්වාණ පූජා ය යි මෙසේ තුදුස් ලක්ෂ සත්පණස් දහස් නවසිය සයානූවක් පමණ උද්දේසික පූජා ලත් හෙයිනුත්, මෙයින් පිටත් වූ අප්‍රමාණ පූජා ලත් හෙයිනුත්, එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනුත්, මාගේ ස්වාමිදරු වූ බුදුරජාණෝ මේ මේ කාරණයෙනු දු අර්හත් නම් වන සේ හැ යි කියම්. එහෙයින් පූර්වාචාරීන් විසින් කියන ලදුයේ මැයි:

පූජාවිශෙෂං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං-යි.

මේ පූජාවලියෙහි
අප බුදුන් ධර්මාශෝකාදි ජම්බුද්වීප රජුන ගෙන් ලද
උද්දේසික පූජා කථා නම් වූ

දෙතිස් වන පරිච්ඡේදය නිමි.

තෙ තිස් වන පරිච්ඡෙද ය

තව ද: මිහිඳු මාහිමියන් වහන්සේ මේ ලක්දිවට වැඩ බුදුසසුන් පිහිටුවා කළ සම්‍යක් ප්‍රතිපත්ති පූජා නම් කවරහ? යත්; එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු.

මේ ශ්‍රී ලඞ්කා ද්වීපය නම් අබුද්ධොත්පාද කාලයෙහි යක්ෂයන්ට ම නිවාස වෙයි. බුද්ධොත්පාද කාලයෙහි ම මනුෂ්‍යයන්ට වාස වෙයි. සමහර බුදුන්ගේ ප්‍රථම බොධියෙහි ම මෙහි යක්ෂයෝ ප්‍රලය ව මනුෂ්‍යයන්ට වාස වෙයි. සමහර බුදුහු තමන් වහන්සේ ම වැඩ යක්ෂයන් ප්‍රලය කොට මනුෂ්‍යවාසය කරවා සසුන් පිහිටුවන සේක. අනන්තාපරියන්ත වූ බුදුන්ගේ බොධිවල දක්ෂිණ ශාඛා හා ධර්මධාතු ශාසන ප්‍රතිෂ්ඨා වනු ඒකාන්ත හෙයින් මේ ලඞ්කාද්වීපය බුදුන්ගේ ම ය. තුණුරුවන් පිරූ භාණ්ඩාරයක් වැන්න. එසේ හෙයින් මේ ලක්දිව මිථ්‍යාදෘෂ්ටි ගතුවන්ගේ වාසය නම් පෙර යක්ෂයන්ගේ වාසය සපිර නුවූවා සේ ම සපිර නො වේ ම ය. මිථ්‍යාදෘෂ්ටි ගත් රජෙක් ලක්දිව බලාත්කාරයෙන් කිසි කලෙක රාජ්‍යය කෙළේ වී නමුත් ඔවුන්ගේ වංශ ප්‍රතිෂ්ඨා නො වනු බුදුන්ගේ ම ආනුභාව විශෙෂයෙක් ම ය. එසේ හෙයින් මේ ලක්දිව සම්‍යග්දෘෂ්ටි ගත් රජුන්ට ම සිහෙන හෙයින් උන්ගේ කුලප්‍රවේණිය පවතින්නේ ම ඒකාන්ත ම ය. මේ මේ කාරණයෙන් ලංකාධිපති රජුන් විසින් බුදුන් කෙරෙහි ස්වභාව වූ ආදර බහුමානයෙන් ශාසනප්‍රතිෂ්ඨා මෙහි අප්‍රමාද ව ආඥාචක්‍රය හා ධර්මචක්‍රය රක්ෂා කොට රාජ්‍යය කොට කුලප්‍රවේණිය රක්ෂා කට යුතු.

පූර්වයෙහි වූ සෙසු බුදුන් කථා මෙම කප පළමුව බුදු වූ කකුසඳ නම් බුදුරජානන් සමයෙහි මේ ද්වීපය ඕජ ද්වීප නම. අනුරාධපුරය අභය පුර නම. රජ්ජුරුවෝ ද අභය නම් වූහ. මහමෙවුනා උයන මහාතිත්ථ වන නම. උයනට නැගෙනහිර නුවර විය. පියල්කුළු නම් වූ මිහින්තලා ගල දේවකූට නම. එ කල ඒ අභය පුරය ආදිවූ ජනගහන ධන ධාන්‍යයෙන් සමෘද්ධ වූ මේ ද්වීපය මුළුල්ලෙහි ජ්වර රෝගයෙක් ඇතිව, අප බුදුන් සමයෙහි විශාලා

මිහිනුවර සේ ම ඉතා මහත් වූ ජනපීඩාවක් ව සකල සත්ත්වයෝ ම
මියන්ට පටන් ගත්හ. බුද්ධානුභාවයෙන් යක්ෂයෝ විපනව වැද්ද
නො හී මිනීකුණප ගඳයන් බල බලා පුල පුලා මුහුදුපිට සිසාරා
සිටිති. එ කල කකුසඳ බුදුහු නො මඳ වූ මේ ඔජ දිප වාසීන්ගේ
පින් මඳ වූ බැව් දැන, උපන් මහා කරුණා ඇති ව, සතළිස් දහසක්
පමණ ආය්‍යගණයා පිරිවරා ගෙණ එ කෙණෙහි ම ආකාශයෙන් වැඩ,
තරුපිරිවර සඳක් සේ දෙවකුටයට බැස සවණක් රසින් දසදිග්
බබුළුවා "මෙ ඔජ දිවයෙහි සියලු මනුෂ්‍යයෝ ම මා දකිත්ව යි, මා
දුටු කෙණෙහි ම සියලු රෝග අනතර්ධාන වේව යි, නිදුක් ව ඇසිල්
ලෙහින් අවුත් මා පිරිවරා සිටිත්ව"යි, අධිෂ්ඨාන කළ සේක.

එ කෙණෙහි ඒ අධිෂ්ඨාන චිත්තය හා සමග ගුවන් සඳ දක්නා
වුන් සේ සියලු දිවවැසිහු ම බුදුන් දැක නොයෙක් ජ්වරරෝග
අනතර්ධාන ව අමා දිය ලද්දවුන් සේ හොත් හොත් පොළින් පැන
නැඟී ගමක් මැද ශාලාවකට රැස්වන්නවුන් සේ පව්තය සිසාරා
රැස්වූහ. එ කෙණෙහි රජ යුවරජ මහ ඇමැතියෝ බුදුන් මැද
මහත් වූ උත්සවයෙක් මහා තීර්ථ වන උයනට පවරා ගෙණ ගොස්
අලංකෘත වූ මණ්ඩපයක් කිමවා අතැඟි වූ බුද්ධාසනයක් හා සතළිස්
දහසක් ආසන කිමවා මහත් වූ පූජාවෙන් උයන බුදුන්ට පිළිගැන්
වූහ. එ කෙණෙහි මහ පොළොව ගුගුරා පැනනැඟී සියලු උයනෙහි
ගස් මුල පටන් අග දක්වා අකාල කුසුමයෙන් සැදී සිටගත. මේ
පෙළහරෙහි පහන් සත්ත්වයෝ මහත්වූ පූජාවෙන් බුදුපාමොක්
මහ සඟ පිරිසට චතුමධුර දන වළඳවා භෝග පමණින් ගන්ධ-
පුෂ්පාදීන් බුදුන් පුදා එකත්පස් ව උන්හ. එ කල්හි බුදුහු බණ
වදාරා සතළිස් දහසක් ප්‍රාණීන් සසරින් මුදා එ තැන දිවා විහාර
කොට, සවස මහ බෝ මලුවට වැඩ මොහොතක් ධ්‍යාන සුවයෙන්
වැඩහිඳ නැඟී පූර්ව බුද්ධචරිතය කෙරෙමි යි සිතා දක්ෂිණ ශ්‍රී හස්තය
බෝමැඩ දිසාවට දිගු කොට "මාගේ ශාසනයෙහි සැද්ධිමින් භික්ෂු
ණීන් කෙරෙහි අග්‍ර වූ රුචිනන්දා නම් ශ්‍රාවිකා මාගේ ශ්‍රී මහා
බොධියෙහි දක්ෂිණ ශාඛාව ගෙණ අවුත් මේ තැන්හි පෙණේව"
යි අධිෂ්ඨාන කළ සේක.

එ කෙණෙහි ශ්‍රාවිකාවන් වහන්සේ ද බුදුන් සිතූ සිත දැන
ඛෙමවතී නම් නුවර ඛෙමවතී නම් රජහු ලවා සිරියෙල් රෙඛා දෙවා
එතෙමේ ම සවච්ඡින්න ව ආකාශයට පැනනැඟී දක්ෂිණශාඛාව රන්
තලියෙන් ගෙණ, මහත් වූ දිව්‍යපූජාවෙන් පන්සියයක් භික්ෂුණීන්
හා සමග ආකාශයෙන් අවුදින්, බුදුන් දිගු කළ ශ්‍රීහස්තයට වඩාලූ
දැ ය. එ වේලෙහි බුදුහු අභය රජ්ජුරුවන් මුහුණ බලා "මහරජ
පෙර නොපා ගේ මෙ දිවයට ඉසුරු වූ පින්වත් රජුන්ගේ සිරිතක්

කරව"යි ඒ රජහු ලවා ම බොධිප්‍රතිෂ්ඨාව කරව. එතෙකට උතුරු දිග්භාගයෙහි වූ එ කලට සිරීසමාලක යයි කියන ලද ලෝවා මහපා තන්හි වැඩහිඳ ධර්මදෙශනා කොට විසිදහසක් ප්‍රාණීන් සසරින් මුදා, එයින් වැඩ ථූපාරාම භූමියෙහි වැඩහිඳ ධ්‍යානයෙන් නැගී බණ වදරා එ විට දසදහසක් දෙනා සසරින් මුදා "මෙ තෙන වසා චෛත්‍යයක් කොට වැඳ පුදා සසරින් මිදෙව" යි තමන් වහන්සේගේ ධර්මකරකය පාවා දී, එම රුචිනන්දා නම් ශ්‍රාවිකාවන් හා පන්සියයක් භික්ෂුණීන් හා මහාදෙව නම් මහ තෙරුන් වහන්සේ හා දහසක් භික්ෂූන් මේ ද්වීපයෙහි රඳවා එයින් වැඩ දේවකූටයෙහි ආදිවූ මහසල සැ පියිටි තන්හි ම වැඩ සිට, සියලු ද්වීපවාසීන්ට අනුශාසනා කොට, සියලු සත්ත්වයන් බල බලා සිටියදී ම, ජම්බුද්වීපයට වැඩි සේක. එ තැන් පටන් ඒ බුද්ධොත්පාදය මුළුල්ලෙහි ම උපනුපන් රජදරුවෝ ද තුණුරුවන් පුදා නිවන් පුර ම ගියහ.

තව ද: දෙවන කොණාගමන නම් බුදුන් සමයෙහි මෙම ද්වීපය වර දීප නම. මහමෙවුනා උයන මහා අනොම වන නම. උයනට දකුණු දිග නුවර වඩ්ඪමානක පුර නම. සමිද්ධ නම් රජක්හු විසින් සියල්ලෙන් සමෘද්ධ විය. දෙව කූටය සුමන කූට නම. එ කල්හි ශ්‍රීවත්ත චාතුර්වර්ණයන් විසින් හා දෙවගනන් බඳු වරඟනන් විසින් හා භවමහීපාදි සියලු සම්පත්තීන් ශ්‍රීමත්ත වූ වර දිපය කලාතුරක් වැසි නැති ව, අප බුදුන් සමයෙහි බැමිණිටියා සාය සේම මහත් වූ දුර්භික්ෂ භයකින් ආකූල ව, ආහාර විපත්තියක් විය. බුදුන්ගේ දෙශනාව නම් තිලකුණු පසයිතන කොට ඇති හෙයින් බුදුහු කල් බලා සත්ත්වයන්ට උපන් දුර්භික්ෂ භය දුක,දුඃඛයක් උපන් කල සත්ත්වයන් ශ්‍රද්ධාවෙහි පිහිටුවාගත හැක්කැ යි සිතා තිස් දහසක් රහතන් හා සමඟ ආකාශයෙන් වැඩ සුමනකූට මස්තකයෙහි පෙර බුදුන්ගේ පාදලාඤ්ඡන ස්ථානයෙහි ම වැඩ සිට දසදිග් බලා "මේ ද්වීපයෙහි වැවු අමුණු පුරා මෙතෙකණෙහි වැසි වසිව"යි සිතා වදාළ සේක.

එ කෙණෙහි ස්වාමිදරුවන් සිතූ සිත හා සමග ම අහස් නමැති දර්පණයෙහි පර්වතයන්ගේ ඡායා පෙණෙන්නා සේ නීල මෙඝකූට ගණයෝ පෙණෙන්නට පටන් ගත්හ. අහස් කුස්හි මනින්නට ඉන්ද්‍ර නීලමාණික්‍ය යෂ්ටීන් ඔසවා ගන්නා සේ ඝන සඝන ගණන් මෙඝ යෂ්ටීහු පෙණෙන්නට පටන් ගත්හ. බුද්ධපූජාවට දෙවියන් තූර්‍ය්‍ය ඝොෂාව පටන් ගන්නා සේ අහස මෙඝනාදයට පටන්ගත; බුද්ධපූජාවට දෙවියන් නැගූ දිව තොරණ සේ දෙවුදුනු දහසක් පෙණෙන්නට පටන්ගත. ඒ ඒ දිග්හි දෙවියන් පුදන ධ්වජ මාලාවක් සේ විදුලිය දහස් ගණන් පෙණෙන්නට පටන්ගත. දෙවියන්

බුදුන්ට පුදනු මුක්තා කලාපයන් සේ ජලධාරා සහස්‍රයෝ නීලමේඝ කූටයන් පලා නික්මුනාහ. වර්‍ෂාමේඝ නො තෙමෙමින සි පිල් කුඹ ඉසව ගත්තා සේ මයුරසහස්‍රයෝ පිඤ්ජාවතීනයට පටන් ගත්හ. එ කෙණෙහි මේ ද්වීපය මුළුල්ලෙහි සත මහ වැස්සෙක් වැස වැවු-අමුණු-ගංහෝ පුරා ගෙණ කෝපයෙන් රතත ව සමී නමැති සතුරා කොයි වත් දෝ හෝ යි සොයා ඇවිදිනා සේ තඹ වතුරු ධාරා ඒ ඒ දිශ්හි දිවත්නට පටන්ගත. මෙසේ අකාල මේඝයෙන් බුදුහු සම් නිර්වාපණය කොට, වැසි අන්තර්ධාන කොට, තමන් වහන්සේ සියලු සත්‍ත්‍වයට පෙණී ආපෝකසිණ සමාපත්තියට සම වැද සියලඟිනු දු දිය කඳු හැර ජන ශාන්ති කොට, පර්‍වත මුදුන්හි රත් කඳක් සේ මෑඩ සිටි සේක. මේ පෙළහරෙහි පහන් සියලු මේ වරම්පමාසී ශක්තිවයෝ බුදුන් කරා රැස් ව වරණකබමයුබයෙහි ගැලී ගැලී වැඳ බුදුන් මහා අනෝම නම් උයනට වඩා ගෙණාහ.

බුදුහු එ දා මහ පොළොව ගුගුරුවා ඒ උයන පිළිගෙණ වදාළ අනන්තයෙහි බණ වදරා තිස්දහසක් ප්‍රාණීන් සසරින් ගලවා සවස් වේලෙහි පෙර සේ ම ඉවා ශොභන නම් නුවර ශොභන නම් රජහු ලවා උදුම්බර බෝධියෙහි දක්ෂිණ ශාඛාව සට කී ක්‍රමයෙන් ම ස්වච්ඡින්න කරවා කනකදත්තා නම් ශ්‍රාවිකාවන් ප්‍රධාන වූ පන්සියයක් භික්ෂුණීන් ලවා මොහොතක් කලින් ගෙන්වා, සමිද්ධ නම් රජහු ලවා බෝධි පිහිටුවා එ කල නාගමාලක නම් වූ ලෝවා මහ පා භූමියෙහි වැඩහිඳ බණ වදරා විසිදහසක් දෙනාට මාර්‍ග ඵල දී එයින් ගොස් ථූපාරාම භූමියෙහි වැඩහිඳ ධර්‍මදෙශනා කොට, දස දහසක් ප්‍රාණීන් සසරින් මුදා, විදුලියක් වන් පරි ධාතුව හා එම කනකදත්තා නම් ශ්‍රාවිකාවන් ප්‍රධාන වූ පන්සියයක් භික්ෂුණීන් හා සුධර්‍ම නම් මහා ස්ථවිරයන් ප්‍රධාන වූ දහසක් භික්ෂූන් හා මේ ද්වීපයෙහි රඳවා එයින් සුදස්සන මාලක නම් වූ මහසල සෑ පිහිටි තැන වැඩසිට සියලු සතුන්ට අවවාද දී මේ ද්වීපයෙන් ජම්බුද්වීපයට ම වැඩි සේක. එ තැන් පටන් ඒ බුද්ධෝත්පාදය මුළුල්ලෙහි උපනුපන් රජදරුවෝ හැම මනුෂ්‍යයන් හා තුණුරුවන් පුද නිවන්පුර පුරා ගියහ.

තව ද: තුන්වනු ව බුදු වූ කාශ්‍යප නම් බුදුරජානන් සමයෙහි මේ ද්වීපය මණ්ඩද්වීප නම. මහමෙවුනා උයන මහාසාගර උයන නම. ඊට පශ්චිම දිශාභාගයෙහි නුවර විශාලාපුර නම්; ජයන්ත නම රජෙක් රාජ්‍යය කෙරෙයි, සුමන කූටය, ශුභ කූට නම, එ කල මේ වීප වාසීන් හා රජ-යුවරජ-මහ ඇමතියෝ දෙභාගව ඔවුනොවුන් කෙරෙහි මන් බැද මහත් වූ සංග්‍රාමයක්

කරත්තාහු සිවුරඟ සෙන් ගෙණ යුද්ධයට සන්නද්ධ ව ඔවුනොවුන් මරා ලේ මුහුදු කරම්හ යි ප්‍රහාරයම් පවත් ගත්හ. එ කල ඒ බුදුහු ඒ සංග්‍රාමයෙහි නස්නා බොහෝ දෙනා දැක උපන් මහා කරුණා ඇති ව විසි දහසක් රහතන් පිරිවරා ආකාශයෙන් වැඩ ගුහ කූට යට බැස මහ අඳුරක් මවා දෙදෙනෙක් ඔවුනොවුන්ට නො පෙණෙත් ව යි අධිෂ්ඨාන කොට අන්ධකාරයෙන් මූර්ඡා කරවා දෙම්නු ව ඒ අඳුර දුරු කළ සේක. තව ද: සත්වයෝ යුද්ධයට පවත් ගත්හ. නැවත සියලු විපය දුමමා, තව ද සත්වයන්ගේ ක්‍රෝධය නුසුත් සේ දැක තෙජෝකසිණ සමාපත්තියට සමවැද විසි රියන් උස බුද්ධකායයෙන් ගිනිකඳු හැර මුළු හෙලදිව එක ගිනි ගත් කෙණෙක් සේ භයපත් කළ සේක.

එ කල සත්වයෝ අහසින් දිවෙන ගිනිකඳු හා ගෙහි ගෙහි උස උස ගෙණ ගිනිපුලිඟු දැක "කොල! මේ කුමක භයෙක් ද, කප නස්නා දවසක් වන, අප ඔවුනොවුන් හා යුද්ධ කරණුයේ රාජ්‍යය නිසා වේ ද, දුන් ඒ රජය දැයි, අඹුදරුවෝ දැයි, සැපත් දැයි, කොත්වත් දසිදස් අපි ද දැ මියම්හ, අප කරන්නේ කුමක යුද්ධ දැ"යි මරණ භයින් වෙවුලා අත අත කුබ්බ ආයුධ හෙලා ඔවුනොවුන් කෙරෙහි දයාබැඳ දෙ කෙනෙග සමඟ වූහ. මෙසේ බුදුහු කවුරෙන්කවු නැගුවා සේ, සුගතාග්නියෙන් කොපගිනි නිවා දෙ ගිනි ම අන්තර්ධාන කොට, ගුවන් සඳ සේ සියලු සතුන්ට ම පෙණුනු සේක. එ වේලෙහි මනුෂ්‍යයෝ හැම දෙන ම බුදුන් දැක දෙහොත් මුදුන් දී සිට "ස්වාමිනි! ගිනිදෙවියා නම් තුඹ ද, නොහොත් සූර්‍ය්‍ය දේවතාවා ද, තුඹ මුහුණ පුන්සඳක් වැන්න. සියලඟ අමා කඳක් වැන්න. එසේ බවක් හිස තුඹ ඇඟින් දිවූ ගිනි ඉතා සාකීන ය. දියෙනුත් ගිනි නැගේ ද, ස්වාමිනි! තුඹ කෙසේ වූ කෙනෙක් ද"යි විචාරා ලොවුතුරා බුදුන් බැව් දැන උදාර වූ සන්තොෂයෙන් උත්සව කළහ.

ඉක්බිත්තෙන් බුදුහු එ දවසුදු මහපොළොව ගුගුරුවා එම උයන පිළිගෙණ මළුඳ අනතයෙහි, දෙශනාරශ්මින් විනේය ජන කුමුදු පුබුදුවා විසි දහසක් ප්‍රාණීන්ට මාර්ගඵල දී සවස ශ්‍රී මහා බොධි භූමියට වැඩ පෙර සේ ම අධිෂ්ඨාන කොට බරණැස බ්‍රහ්ම දත්ත නම් රජහු ලවා නිග්‍රොධ බොධි දක්ෂිණ ශාඛාව සොච්ජින්න කරවා සුධර්මා නම් ශ්‍රාවිකාවන් ප්‍රධාන වූ පන්සියයක් භික්ෂුණීන් ලවා මොහෙතක් තලින් ගෙන්වා ජයන්ත නම් රජහු ලවා බොධි පිහිටුවා අශොකමාලක නම් වූ ලෝවාමහපා භූමියෙහි වැඩහිඳ කළා වූ දෙශනාවෙන් සාරදහසක් ප්‍රාණීන් සස

රින් මුදා එයින් ථූපාරාමස්ථානයට වැඩ බණ වදාරා දස දහසක් ප්‍රාණීන්ට මාර්ගඵල දී තමන් වහන්සේගේ ජලසාටකය හා සුධර්මා නම් භික්ෂුණීන් ප්‍රධාන වූ පන්සියයක් භික්ෂුණීන් හා සර්වනන්ද නම් මහතෙරුන් ප්‍රධාන වූ දහසක් භික්ෂූන් වහන්සේ මේ ද්වීපයෙහි රඳවා එයින් සෝමනස්ස මාලක නම් වූ තුන්වන මහසල මහ සෑ කන්හි වැඩසිට සියලු මණ්ඩ ද්වීප වාසීන් හා දෙවි මිනිසුන්ට අනුශාසනා කොට අහස් කුසට පැන නැගී තරු පිරිවරු සඳක් සේ දඹදිව් ම වැඩියේක.

මෙසේ විසිදහසක් හවුරුදු පැවැත්තාවූ ඒ කාශ්‍යප බුදුන්ගේ බුද්ධෝත්පාදයෙහි ද මෙහි උපනුපන් සරාගික වූ සත්ත්වයෝ ද තුණුරුවන් පුදා නිවන් පුර පුරා ගියහ.

මෙ කප බුදු වූ තුන් බුදුන් මෙලක්දිවට වැඩිකථා
සංක්ෂෙපයෙන් මෙසේ දතයුතු.

තව ද: සතර වනු ව බුදු වූ අප ගෞතම බුදුරජාණන් වහන්සේ බුදු වූ නවවැනි මස උරුවෙලා නම් දනව්වෙහි වැඩහිඳ "මතු මාගේ ශාසනය මා අයාමෙහි තිමිල කොට කොයි පිහිටා දෝ හෝ" යි බලා වදාරා මේ ශ්‍රීලංකාද්වීපය දැක "ඒ දූන් යක්ෂයන්ට ම නිවාසය දූන් ම මම ගොස් ඒ යක්ෂයන් ප්‍රලය කොට ශාසන ප්‍රතිෂ්ඨාවට ආධාර වනසේ අරක්ගන්මි"යි සිතා වදාරා දුරුතු මැදි පොහෝ දිනයෙහි ලක්දිව් වැඩ ශ්‍රී ලංකාද්වීප නමැති ඒ පද්මයෙහි කර්ණිකාවක් බඳු වූ මණ්හෙද නම් දනව්වෙහි ලංකාංගනාව පලන් මුක්තාහාරයක් බඳු වූ මහා වාලුකා නම් ගඞ්ගාව සමීපයෙහි දිග තුන් යොදුන්, පුළුල යොදුන් පමණ ඇති මහා නාගවන නම් ඒ උද්‍යානයෙහි කඳවුරු බැඳ අතුරු නොදී සතුරුව හුන් මහා යක්ෂ කඳවුරට වැඩ ආකාශයෙහි සිට අහස පොළොව ගුගුරුවා යක්ෂයන් තැති ගන්වා පෙණී "අපටත් හිලින් වැද හිඳිනා තරම් අවකාශයක් දෙව"යි ඉල්ලා වදාළ සේක. එ වේලෙහි යක්ෂයෝ "මේ උයන කුඩා හෙයින් සියුම් වෙස් මවා ගෙණ ගැහැටි ගැහැටී වසම්හ. භවත්නි! තොපට කෙසේ අවකාශයක් දෙම්හෝ දූ"යි කීහ. එවේලෙහි බුදුහු සියලඟ දුම්වා දුම්කඳු හරනව පවින් ගත්සේක. එ වේලෙහි යක්ෂයෝ දුමින් පීඩා විඳ "මොහු මහා සාතිවනත කෙණෙක, දූත්දක් දිලිහී ගියෝ නම් අප හැම දවා අළුමිටක් කරවා පියති. කිමෙක් අරුමහ" යි මන්ත්‍රණය කොට ඔවුනොවුන් ඇඟ වැතිර වැතිර සම්භඩකට කිම හැර "මහතානෙනි! මේ අවකාශ

යෙහි වැඩහිඳුව, අපට අභය දානය දෙම" යි යාච්ඤා කළාහ. ඉක්බිත්තෙන් බුදුහු සඟල සිවුර සතරපටින් අතුට පූර්වදිග් බලා වැඩහිඳ තේජෝකසිණ සමාපත්තියට සමවැද සතරදිගින් ගිනිකඳු සතරක් මවා යක්ෂයන් කරා මෙහෙයූ සේක. එ කෙණෙහි ගුගුරා දිවත් දිවත් යක්ෂයෝ ගිනි භයින් වෙවුලා ඈඳී සම්බාධකව කිමි දිගත නුහුනුවෝ තුන් යොදුන් උඩ්ඩාන භූමිය බුදුන්ට ම අවකාශ කොට පිටතට දිවත ද, ගිනි ගුගුරා දිවන හෙයින් ලඞකාද්වීපය මුළුල්ලෙහි නො එක් පර්වත වන දුර්ගවලට වැද ගිය ගිය තැන්හි ම ගිනිකඳු ම දිවන හෙයින්, මෙසා මහත් ලඞකාද්වීපයෙහි අල්ලක් සා අභයස්ථානයක්හුත් නො ලදින් සියලු යක්ෂයෝම මුහුදු බස් මත්තට පවත් ගත්හ. එ වේලෙහි ස්වාමිදරුවෝ යක්ෂයන් කෙරෙහි අනුකම්පා ඇතිව යක්ගිරි දිවයින අධිෂ්ඨාන කොට ගෙන්වා යක්ෂයන් ඊට නංවා නිදුක් කොට දුරු කළසේක.

ඉක්බිත්තෙන් සමනොළ සමන් දෙවි රජ්ජුරුවන් ආදි වූ ලක්දිව ඒ ඒ පර්වතවල, වෘක්ෂවල අරක් ගෙණ වසන දිව්‍යසේනාව අවුදින් බුදුන් පිරිවරා වැද නො එක් පූජා භාණ්ඩ ගෙණ සිටියාහ. එකෙණෙහි බුදුහු බණ වදාරා ශතසහස්‍ර දෙවියන් සසරින් මුදා වදාළ සේක. එ වේලෙහි සෝවාන් වූ සමන් දෙවි රජ්ජුරුවෝ බුදුන් වැඳ සිට 'ස්වාමීනි! තුඹවහන්සේගේ බුද්ධොත්පාදය මුළුල්ලෙහි මේ ලක්දිව ශාසනාවාස කොට වන පරිද්දෙනුත්, අප වැඳ පුද ගන්නා පරිද්දෙනුත්, පාරිභෝගික ධාතුවක් දෙවා වදාළ මැනවැ"යි ආරාධනා කළහ. එ වේලෙහි ස්වාමිදරුවෝ සුරක්ත වූ ශ්‍රීහස්තයෙන් ශිරොධාතුව පිරිමැද කේශධාතු මිටක් දී වදාළ සේක. සමන්දෙවි රජ්ජුරුවෝ රුවන්කරඬුවෙකින් කේශධාතු පිළිගෙණ බුදුන් වැඩ හුන්නාවූ ස්ථානයෙහි රුවන් රැසක් පිට වඩා සත් රියන් උස ඉඳුනිල්මිණි කරඬුවෙකින් වසා, අප්‍රමාණවූ දිව්‍යගන්ධ කුසුමාදියෙන් පූජා කළහ. මෙසේ බුදුහු පළමුවන ධාතු ප්‍රතිෂ්ඨාව කොට ලක්දිව සිසාරා තුන්යලක් ප්‍රදක්ෂිණා කිරීමෙන් අරක් දී වෙළුවනාරාමයට වැඩිසේක. පසුව සරභූ නම් මහාතෙර කෙණකුන් වහන්සේ බුදුන්ගේ ග්‍රීවාධාතුව වඩා මෙඝවර්ණවූ පාෂාණයෙන් දොළොස් රියන් උස ඒ වසා සළ දාගැබක් මවා මහත් වූ පූජා කළ සේක. පසුව චූළාභය නම් රජෙක් ඒ මතුයෙහි තිස්රියන් මහසෑයක් බඳවා භොග පමණින් පූජා කෙළේය. පසුව දුටුගැමුණු රජ ඒ වසා අසූරියන් උස මහසෑයක් බඳවා සතරන් පණින් වසා ධන පමණින් පූජා කෙළේය. එහේ හෙයින් කීයේ මැනෝ; මහාවංශයෙහි:

ජොතෙසං පාණකොටීනං-ධම්මාභිසමයො අහු
සරණෙසුච සීලෙසු-ඨිතා ආසුං අසංඛියා.

සොතාපත්තිඵලං පත්වා-සෙල සුමනකූටකෙ,
මනාසුමන දෙවින්ද-පූජාය යාව පූජියං.

සිරං පරාමසිත්වාන-නීලාමලසිරොරුහෙ,
පාණිමත්තෙන අදා කෙසෙ-තස්ස පාණිහිතො ජිනො.

සො තං සුවණ්ණචඞ්ගොටි-වරතොදය සන්තුතො,
නිසින්නට්ඨාන රචිතෙ-නානාරතන සඤ්චයෙ.

උච්චෙතා සත්තරතනෙහ-ථූපෙත්වාන සිරොරුහෙ,
තං ඉන්දනීල ථූපෙන-පිදහෙසි නමස්සි ච.

එවමච්චායිතං කම්මං-කරොන්තා ච ගුණාකරා,
කරොන්ති පුඤ්ඤං සප්පඤ්ඤා - සංසාර භය භීරුකා - යි.

මෙසේ බුදුහු තමන් වහන්සේගේ ඉසින් හළ කෙස් පමණකට පවා මේ සා මහත් පූජා ලත් හෙයිනුත්, එසේ වූ පූජාවිදීමට සුදුසු හෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වන සේක.

ප්‍රථමාගමන කථා යි.

තව ද: අප බුදුහු බුදු වූ පස්වන හවුරුදු බග අව පසළොස්වක් දිනෙක් එදා උදය මුළුලෝ බලා වදාරණ සේක් චූලෝදර මහෝදර නම් දෙමිහිල් නාරජුන්ගේ සීමාන්තරයෙහි පැනනැගි මිණිපලඟක් නිසා කරණ යුධයෙහි නස්නා බොහෝ නයින් දැක, ඔවුන් කෙරෙහි උපන් මහාකරුණාවෙන් පූර්වභාගයෙහි දෙවුරම් වෙහෙරින් නික්ම, දෙවුරම් දොරටුව සමීපයෙහි පිහිටි කිරිපළු රුක අරක් ගත් සමිදි සුමන නම් දිව්‍යරාජයා විසින් උදුරා සිරසට කරණ ලද එම කිරිපළු රුක් නමැති ඉඳුමිණි නිල් සේසත් ධරා නිල් මේ කුළක් යට ගමන් ගත් පූර්ණ චන්ද්‍රයාගේ ලීලා පරදවමින්, ආකාශයෙන් ම මණිනාග දිවයිනට වැඩ ඝෝර වූ යුද්ධයට පටන් ගත් නාගසේනාවට පෙණී අහස පලඟ් බැඳ වැඩහිඳ නොයෙක් පෙළහර දක්වා සාමග්‍රිතාවයට නිසි වූ බණ වදාරා, දෙශනා නමැති අමෘත වර්ෂයෙන් නයින්ගේ කෝපාග්නි සන් සිඳුවා සමගිවූ දෙමහිල් නාරජුන් විසින් පිළිගන්වනලද මිණිපලඟ මතුයෙහි වැඩහිඳ, ඔවුන් විසින් ම දෙන ලද දිව්‍යභෝජනය

වළඳා අනුමෝදනා බණ වදාරා, අසූ කෙලක් නයින් ශරණශීලයෙහි පිහිටුවා "භික්‍ෂූ මා දුටුවා සේ වඳුව-පුදව" යි කිරිපලු රුක හා සමඟම මිණිපලඟ නයින්ට ම පාවාදී මෙසේ ධාතු ප්‍රතිෂ්ඨාවෙන් ලක්දිවට අරක් දී දෙවුරම් වෙහෙරට ම වැඩි සේක.

මෙසේ තමන් වහන්සේ මොහොතක් කල් මැඩහුන් ආසනයට පවා ශාසනාන්තය දක්වා දිව්‍යනාගරජයන් විසින් අද දක්වා කරණ ලද පූජා මහිම ඇති හෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වන සේක.

තිතීයා'ගමන කථා යි.

තව ද: අප බුදුහු බුදු වූ අටවන හවුරුද්දෙහි සුනාපරන්ත නම් ශික තෙරුන්ගේ ආරාධනාවෙන් පන්සියක් රහතන් හා සමඟ සක්දෙව් රජහු මවා දුන් පන්සියක් රුවන් මඩු නැඟී සුනාපරන්ත දනව්වෙහි මුහුළු නම් අරම චන්දන ශාලාව පිළිගෙණ කීප දවසක් එහි දවස් යවා, දෙශනාරශ්මින් බොහෝවූ විනෙය ජන පද්මයන් ප්‍රබොධ කරවා, එයින් නම්මදා නම් ගඟට වැඩ එහි වසන නම්මදා නම් දිව්‍ය නාගරාජයා විසින් දෙන ලද දිව්‍යාහාරය සඟපිරිවරින් වළඳා, ඔහට බණ වදාරා, සරණසීලයෙහි පිහිටුවා, අමාමහ නිවන් දක්වා, එම නාරජහුගේ ආරාධනාවෙන් ඒ ගංතෙර රළින් මුවා වන තැන ඔහට ශ්‍රීපාදයක් ඔබා එයින් සච්චබන්ධ නම් පර්වතයට වැඩ, එහි පෙර බොහෝ කලක් මිථ්‍යා දෘෂ්ටි ගෙණ, විසූ සච්චබද්ධක නම් ජටිලයන්ට බණ වදාරා, ඔහු සරණ සීලයෙහි පිහිටුවා ඒහිභික්‍ෂු භාවයෙන් පැවිදි දී, එම සච්චබද්ධක නම් මහතෙරුන්ගේම ආරාධනාවෙන් ඒ ගල් මුදුනේ සිඳ, ඉටියෙහි එබූ හසක් සේ පාදලක්‍ෂණ හා සමග ශ්‍රීපාදයක් ඔබා, එයින් මහොදර නාරජහු මයිල් මිණි ඇසි නම් නාග රාජයාගේ ආරාධනාවෙන් වෙසඟ මැදි පොහෝ දිනයෙහි ලක්දිව් වැඩ, කැලණි මහසෑය පිහිටි තැන වැඩහිඳ, ඔහු විසින් මවන ලද දිව්‍යමණ්ඩපයෙහි අතසී වූ දිව්‍යාසන නැඟී වැඩහිඳ, ඔහු විසින් ම දෙන ලද දිව්‍යභොජන සඟපිරිවරින් වළඳා, බණ වදාරා, එම නාරජහුගේ ආරාධනාවෙන් කැලණි ගඟ ගට ද ඔහට පාද ලාංඡනයක් දී නෝ සුමනස් නයින් තිසරණ ගන්වා ඔහු විසින් කරණ ලද අප්‍රමාණ වූ දිව්‍යපූජා ලත් සේක.

එ කෙණෙහි දිව්‍යනාගරජයන් බුදුන්ට කරණ පූජා කෝලාහල යෙන් පැළඳීග් බැලූ සමනොල කූළල වසන සමන් දෙව් රජ්ජුරුවෝ "අප බුදුහු අද ලක්දිව් වැඩි වන්හ. අද මාගේ මනදෙළ සිඩ

මන වන්නැ''යි සන්තුෂ්ට වූවාහු එ කෙණෙහි දෙව්පිරිස් පිරිවරා පර්වත මුදුනෙහි බුද්ධපූජාවට අතුට තුබූ පියවිලි පටක් බඳු වූ කැලණි ගඟ අනුසාරයෙන් ආකාශයෙන් දිව, බුදුන් සහපිරිවරින් වැද දොහොත් මුදුන් දී සිට "කරුණා නිධාන වූ ත්‍රිලෝගුරු බුදුරජාණෙනි! මේ නැගෙනහිරි දිශාභාගයෙහි පස් ගව්වක් උසින් ඉඳු මිණිගල් පර්වතයක් සේ ආකාශයෙහි ගැහැටි ගැහැටී සිටිනා සේ පෙණෙන්නාවූ සමනනකූට පර්වතය නම් එසේ මෙසේ වූ පර්වතයෙක් නො වෙයි. අනන්තපරියන්ත වූ බුදුන්ගේ පාද ශ්‍රී ලබන්නා වූ පර්වතයෙක. දැනු දු, තුඹවහන්සේ ද, මාගේ කුළු නමැති ඔටුන් නෙහි තෙල ශ්‍රී පාද නමැති අගමිණිරුවන පලඳවා ලෝවැඩ කළ මැනවැ''යි ආරාධනා කළහ.

එ වේලෙහි ස්වාමීදරුවෝ පූර්වදිග් බලා ලංකා නමැති අඞ්ගනාව තමින් වහන්සේට පෙරමඟ බලා, ගර නගා සිටියාක් වැනි වූ, මුදුන් කුළු නමැති කෙශ කලාපයකින් හා පෙර මීට දෙවාරයක් වැඩ ඔබ පාදස්පර්ශය නුදුන් සේකැයි ශෝකයෙන් හඬන කඳුළු ධාරා දෙකක් වැනි මහවැලි ගඟ හා කැලණි ගඟ වැනි ගඞ්ගා යුග්මයකින් හා තව ද: පාදවියෝගයෙන් බෙද ව ඇය විසින් කඩ ඉස්නා ලද රත්නාභරණ සමූහයක් සේ වනය සිසාරා පිහිටි සිඟදනස් රත්නාකර සමූහයෙන් හා ශ්‍රීමත් ව දිලියෙන සමනොළකුළ දැක "අද මම ද පෙර බුදුන්ගේ සිරිත් කොට ලඞකාඞගනාව සතුටු කරවමි" යි සිතා වදුරා දිව්‍යනාග-ගන්ධර්වාදි පූජා විඳ විඳ පන්සියයක් මහ රහතන් හා සමඟ ආකාශයෙන් වැඩ පර්වත මුදුනෙහි සතරන් කඳක් සේ දිලිසි දිලිසී වැඩසිටි සේක. එ කෙණෙහි පර්වතය මෙවූලා මුදුන් කුළු ආකාශයට නැගී බුදුන්ගේ ශ්‍රීපාදය පිළිගෙණ අහසින් බැස පෙර සේ ම පිහිටා ගියෙ. ඉක්බිත්තෙන් ස්වාමිදරුවෝ මුරු බඹකැලන් කරණ පූජා විඳ විඳ පැලදිග බලා වැඩසිට මේ ශ්‍රී ලඞකාවීපනමැති තුණුරුවන් භාණ්ඩාගාරය තමන් වහන්සේට හිමි නියාවට ම හසක් එබුවා සේ, අටතුරා සියක් මගුල් ලකුණෙන් ශ්‍රීමත් වූ දෙව් බඹුන්ට මුදුන් මල්කඩ වූ, එක්රියන් නව අඟුලක් පමණ අයම විතර ඇති වාම ශ්‍රීපාද සලක්ෂණ කොට ඔබා වදාළ සේක.

එ කෙණෙහි බුද්ධාන්තරයක් මුළුල්ලෙහි ශ්‍රීපාද වියෝගයෙන් ශෝකී වූ ලඞකාඞගනාව එ කෙණෙහි නිශ්ශෝකී ව, එම විට ම පහළ වූ අකාල මෙඝජල නමැති අමාදියෙන් සනායන කොට, මුළු දිව ව්‍යාප්ත වූ ෂඩ්වර්ණ බුද්ධරශ්මි නමැති අනේකවර්ණ වූ පූජා වස්ත්‍රයන් ධරා, දිවමල් වෂ්‍රා නමැති අංගරාගයන් තවරා රුවන්

වශී නමැති ආභරණ පැළඳ, සමුද්‍රඝෝෂා නමැති තූර්‍ය්‍යවාද පතුරුවා, භාණකයාද නමැති ගායකයා කොට, අකාල කුසුම් නමැති මල්දම් පැළඳ, මහීනාද නමැති සාධුකාරයෙන් සතුති ගීතිකා කිය කියා' මේඝනාද නමැති අත්පොළසන් දිදී නටා, සන්තෝෂයෙන් පූජා කළා ය.

මෙසේ ස්වාමිදරුවෝ ලබ්කාබ්ගතාම් සතුටු කරවා සමනොළ ශ්‍රීපාදය බබා එ ගල් පාවිට වූ භගවත් නම් ලෙන වැඩසිද සමවත් සුවෙන් දිවාවිහාර කොට එයින් සිරිලක ඇතුලත් කොට, අනුරාධපුරයට වැඩ, දකුණු මහසෑය පිහිටි තැන, මහමෙව්නා උයන් මැද ශ්‍රීමහාබොධිය පිහිටි තැන ය. ලෝවාමහාපාය පිහිටි තැන ය. පිරිත්ලාගෙය පිහිටි තැන ය. දනානාදර නම් පොකුණ පිහිටි තැන ය. ථූපාරාමය පිහිටි තැන ය. සත්‍යස්භූමියෙහි රුවන්මැලිමහ සෑය පිහිටි තැන ය. මිහින්තලෙයි මහසල සෑ පිහිටි තැන ය යි යන මේ අටමස්ථාන ය පූර්වබුද්ධවරයන්හු ද වැඩහුන් බිම් හෙයින් තමන් වහන්සේ ද ධ්‍යානසුවයෙන් වැඩහිඳ, එ තෙනට රැස් වූ දෙවියන්ට බණවදරා, නොඑක් දෙවියන් සසරින් මුදා, එයින් වැඩ රුහුණු දිඝානක පිහිටි තැන ය යි මෙසේ මේ ලක්දිව තුන්වාරයෙහි කැවිම තුදුස් තැනෙක තුදුස් මොහොතක් කල් තුදුස් සමවතෙකින් තුදුස් බුද්ධකාරක ධර්මයකින් ශොභිතා වූ අප බුදුහු මෙසේ පාරිභොගික ධාතු ප්‍රතිෂ්ඨාවෙන් ලක්දිව්ට අරක් දී දෙව්රම් වෙහෙරට ම වැඩි සේක.

මෙසේ තමන් වහන්සේ මොහොතක් කල් වැඩහුන්නා වූ තුදුස් තැනට දෙව්මිනිසුන් දූත් දක්වා කරණලද මහත් වූ උද්දේසික පූජා ඇති හෙයිනු ත් මාගේ බුදුහු අහීන් නම් වන සේක.

තෘතීයාගමන කථා යි.

තව ද: ලක්දිව රජුන් ඇතිව මනුෂ්‍යවාස වූ පරිදි කෙසේ ද? යත්; එහි විස්තර කථාව මහාවංශයෙහි එන බැවින් මෙතෙන වනාහි රාජවංශ සංක්‍ෂෙපයෙන් දක්වා ශාසන කථා සංක්‍ෂෙපයෙන් දක්වමහ.

පෙර කලිඟු රජහු දූ වඟුරට වඟු රජහු කෙරේ වැස දුවක ලද. ඕ වැඩි කිසියම් අකුශලයෙකින් එකලා මල් ගොස් අතර මග සිංහයකු හට හසු ව ඔහු කෙරේ වැස සිංහබාහු ය සිංහවල්ලී ය යි පුතකු හා දුවක ලදහ. පසු ව සිංහබාහු රජ සිංහවල්ලී නම්

තමාගේ නැග ම බිසෝ කොට ලාව රට රජ කොට විසී ය. මොවුන් දෙදෙනා දරු විජය කුමර අප බුදුන් පිරිනිවි වේලෙහි සක්දෙව් රජහුගෙන් අරක් ලදින් සත්සියයක් යොධයන් ගෙණ තම්මැන්නා දිවයින් බැස කුවේණි නම් යකින්නගේ සහායයෙන් අනතුරෙහි තා ගොසින් හුන් යක්ෂයන් මරා ලුහුබැඳ එම තම්මැන්නායෙහි නුවරක් කරවා එහි අවතිස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. පසු ව ඔහුගේ උපතිස්ස නම් අමාත්‍යයෙක් තෙමේ හවුරුද්දක් රාජ්‍යය කොට දඹදිව් යවා විජය රාජයන්ගේ බෑනනුවන් පඬුවස් දෙව් රජහු ගෙන්වා ඇලසර නම් කැරවූ උපතිස්ස නම් නුවර ලා තිස්හවුරුද්දක් රාජ්‍යය කැරවී ය.

බුදුන් සුළුපිය අමිතෝදන නම් ශාක්‍ය රජ්ජුරුවන් දරු වූ පාණ්ඩුශාක්‍යයන් දූ කසසින් දේවී තමන් හා කුසහොත් දසබෑ තෙණකුන් සමග ලක්දිව් බැස ඒ පඬුවස්දෙව් රජහු කෙරේ වැස පුතුන් දසදෙනෙකු හා දුවක ලද. මහලූ පිත් අබා නම. බාල තං උන්මන්සිත් නම. ඔවුන්ගේ යවනි මයිලන් දසදෙනා අතුරෙන් රාම නම් ශාක්‍යයන් විසූ තැන් රාමගෝන නම් විය. රොහණ නම් ශාක්‍යයන් විසූ තැන් රොහණ නම් විය. දිගා නම් ශාක්‍ය යන් විසූ තැන් දීඝාමඩුළු නම් විය. උරුවෙල නම් ශාක්‍යයන් විසූ තැන් මහවැලිගම් නම් විය. අනුරාධ නම් ශාක්‍යයන් විසූ තැන් අනුරාධ පුර නම් විය. විජිත නම් ශාක්‍යයන් විසූ තැන් විජිතපුර නම් විය. ඒ පඬුවස්දෙව් රජ්ජුරුවන් මාලු පිත් අභය නම් රජ විසි හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය.

ඔවුන් තං උන්මත්සිත් නම් බිසොවුන් තමන් මයිල් දීඝ නම් ශාක්‍යයන් දරු වූ දීඝගාමණී නම් කුමරුවා කෙරේ වැස දෙවන පණ්ඩුකාභය නම් කුමරහු වැදූව. එ කුමර වැඩී තමාගේ මයිලන් නවදෙනකු මරා තමන් මයිල් [1]ගිරිකණ්ඩ නම් රජහු දූ රන්පෙලි නම් බිසොව රක්‍ෂා කොට අනන්තාපයසිත්ත වූ සජීඥ නමැති රාජහංස ශ්‍රී ලබන සරසියක් වැනි වූ ලංකා නමැති අංගනාවට සිරිඟනක් වැනි වූ අනුරාධපුර නුවර ශ්‍රීමහා බොධිස්ථානයට උත්තර දිශාභාගයෙහි සතර ගව්වෙක් පමණ අයම් විතරින් හා සොළොස් ගව්වක් තැන් වටින් ගෙණ දිව්‍ය පුරයක් සේ නුවරක් මූල්පිස කරවා කසා වැව බඳවා සැත්තෑ හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු පිත් මුටසිව නම් රජ මහමෙවුනා උයන කරවා සැට හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. එ කලට අප බුදුන් පිරිනිවි දෙසිය සතිස් හවුරුද්දක් ගිය කල්හි මුටසීව නම් රජහු පිත් දෙවනපෑතිස් නම් රජෙක් විය. එ රජ සැලයට නැගූ පහනක් සේ

1 ගිරිකණ්ඩ නම් රජහු

අත්තොගත ශ්‍රොතාපත්ති මාර්ග නමැති ප්‍රදීපාලොකයෙන් දිලියෙන මහ පින් බල ඇත්තේ ය. දඹදිව අග රජ කරණ පින් ඇතිව ද කිසියම් අකුශලයෙකින් හෙලදිව උපන. හේ කෙසේද? යත්;

පෙර තුන් බෑ කෙණෙක් වල් ගොස් මී සලා මී වෙළඳාම් කොට ජීවත් වෙති. දවසෙක මහලු දෙබෑයක් මී සලා වලම යෑදී ගම හුන් මල්, පිල හිඳ මී විකුණනුයේ, ගිලන් භික්ෂු කෙණෙකුන් වහන්සේ දුක මී පාත්‍රයක් පුරා දන් දී සවස මහලු දෙබෑයන් ගෙට ආ කල "සන්හුන් ගුණෙන් යුත් තුටු ගිලන් මහණ කෙණෙකුන් දුක මී පාත්‍රයක් දන්දින්මි, පින් අනුමෝද ව"යි කියා කී ය. එ බස් අසා මහලු දෙබෑයෝ "අපි වල ඇවිද මී සොයා දුක් ගණුමෝ ද, තෝ ගම හිඳ වියදම් කෙරේ දැ"යි කිපි එකෙක් "තාගේ මහණ ගෙණ සැඬොල්ගම ලා පියව"යි කී ය. එකෙක් කියනුයේ "තාගේ මහණ ගෙණ මුහුදින් එ තෙර ලා පියව"යි කී ය. එ බසට මල්, මූණෙන් තො බෑන ඉවසා පසුව දෙදෙනා සන්හුන් කල අවවාද කියා කල පිස් දෙදෙනා ම සමාදන් කැරවී ය. ඒ පිණින් පසු ජාතියෙහි මල්, මුළු දඹදිවට අග රජ ව ධර්මාශොක නම් රජ විය. සැඬොල්ගම ලා පියව යි කී බෑයෝ ඒ ජාතියෙන් මිය රජක් හට දුව බිසෝවක බව හෙව, සැඬොල්ගම මැදෙක තුග ගහක් මුල අනාථ ව ඉපැද වැඩ පසු ව සමාදන් වූ පිණින් බුදුසසුන් වැද මහණ ව අමා මහ නිවන් දුක නිග්‍රොධ නම් මහතෙර විය. අනික් බෑහෑ මුහුදින් එ තෙර ලා පියව යි කී පවින් දඹදිව නො ඉපැද ලක්දිව මුටසීව රජ හට පුත් ව දෙවන පෑතිස් රජ ව සිරිලක ඔටුනු පැලඳ අභිෂෙක විය. දුක සමාදන පින්බල ඉතා මහතැ යි දතයුතු. එසේ හෙයින් කියනලදී-

නත්ථි චිත්තෙ පසන්නම්හි-අප්පිකා නාම දක්ඛිණා,
තථාගතෙ වා සම්බුද්ධෙ-අථවා තස්ස සාවකෙ-ති.

මෙසේ දෙවනපෑතිස් රජ සිරිලක ඔටුනු පැලඳ අභිෂෙක මගුල් කල දවස් සිරිලකට අද්භූත වූ නො එක් රුවනු දූ පහළ විය. මුහුදින් ශ්වෙත අශ්ව ආකෘති ඇති හය නම් මුතු ය, ශ්වෙත හස්ති ආකෘති ඇති ගජ නම් මුතු ය, මහ ඇඹුල පක් සා ආමලක නම් මුතු ය, සක්මළලු බඳු වූ සටහන් ඇති වලය නම් මුතු ය, සක් මුදු බඳු වූ සටහන් ඇති අංගුලි මුද්‍රිකා නම් මුතු ය, කුඹුක් පක් බඳු වූ සටහන් ඇති කකුධ ඵලක නම් මුතු ය, හුණපුරුකේ සටහන් ඇති වෙණුක නම් මුතු ය, ස්වභාව මුතු ය යි මෙසේ උතුම් උතුම් වූ මුතු අට ජාතියෙක් උපන.

තව ද: එක් හුණ පඳුරෙක ලතායෂ්ටි ය, කුසුමයෂ්ටිය, ශකුනයෂ්ටි ය යි රථ කැවිරි සා හුණලි තුණෙකුදු දිව්‍ය නිර්මිත යක් සේ උපන. එයින් ලතා යෂ්ටිය තෙමේ රිදීකඳක් සේ අති ධවල ය, මූල පටන් අග දක්වා විසිතුරු කොට සිතියම් කළා සේ රන් වන් වූ ලියසමූහයෙක් දිලියෙන්නේය. කුසුම් යෂ්ටිය ඉන්ද්‍ර නීලයක් සේ නිල් ව පස්වණක් පැහැ ඇති නන් විසිතුරු මල්ජාතීන් අතුරු නැති ව විසිතුරු විය. ශකුන යෂ්ටිය ප්‍රවාල වර්ණ ය, නො එක් ජාතියෙහි නන් පැහැ ඇති පක්ෂි සමූහයා විසින් විසිතුරු ව බලා ඇස් හයාගත නො හැකියේ ය. මේ ආදී වූ උතුම් උතුම් රුවන් හා ෂඩ්ව රාජ කකුධ භාණ්ඩයන් හා ධර්මාශෝක රජ්ජුරුවන්ට යවා උන් හා යහළු ව පූර්වසන්නිවාස හෙතුවෙන් ඔවුනොවුන් කෙරෙහි ප්‍රේම ඇතිව වෙසෙති. ධර්මාශෝක රජ්ජුරුවෝ ද දඹදිවින් නො එක් පඬුරු හා:-

අහං බුද්ධං ච ධම්මං ච-සඞ්ඝං ච සරණං ගතො,
උපාසකත්තං වෙදෙසිං-සක්‍යපුත්තස්ස සාසනෙ-ති.

යනාදීන් තුණුරුවන් පඬුරු හා ගඳකලල්-පිරිත් පැන් ආදි වූ නො එක් පඬුරු යවා යහළුව හිඳිති. දෙවනපෑතිස් රජ්ජුරුවෝ ද තුණුරුවන් පඬුරෙහි අසුන් අසා "මෙහි කවර දවසෙක සසුන් පිහිටුවා ගණිම් දෝ හෝ"යි සිත සිතා සක් රුවනක් පතන සක්විති රජකු සේ තුණුරුවන් පත පතා හිඳිති. එකලට අනුරාධපුර නුවර උඩුම්හල් නම ලක්ෂයකින් හා බිම්මහල් අනූලක්ෂයකින් හා ශ්‍රීමත්න වූ චාතුර්වර්ණයක් විසින් හා හස්ති අශ්ව රථ වීණා මෘදඞ්ග ශබ්ද සමම කාල බාද්‍ය භොජ්‍ය යන දශවිධ නාදයෙනුත් සම්පූර්ණව, සම්පත්ති භාරයෙන් දෙව්ලොවින් බැස මිහිමඬලට රඳාගිය දිව්‍ය පුරයක් සේ ශ්‍රීමත්න විය.

අනුරාධපුර උත්පත්ති කථායි.

——:o:——

එ කල පෙරකී මොග්ගලිපුත්ත තිස්ස මහ තෙරුන් වහන්සේ ධර්මාශෝක රජහුගේ සහායයෙන් ඔහුගේ ම අශෝකාරාමයෙහි දී, සව කී සේ තුන්වන ධර්ම සඞ්ගායනාවසානයෙහි දසදහසක් රහතන් අතුරෙන් මජ්ඣන්තික මහ තෙරුන් වහන්සේ ය, මහාදෙව නම් මහ තෙරුන් වහන්සේ ය; රක්ෂිත නම් මහ තෙරුන් වහන්සේ ය, යොනක ධර්මරක්ෂිත නම් මහ තෙරුන් වහන්සේ ය, මහා ධර්මරක්ෂිත නම් මහ තෙරුන් වහන්සේ ය' මහාරක්ෂිත නම් මහ තෙරුන් වහන්සේ ය, මධ්‍යම නම් මහ තෙරුන් වහන්සේ ය.

ශෝණක නම් මහ තෙරුන් වහන්සේ ය, ධර්මාශෝක රජ්ජුරුවන් දරු මිහිඳු මාහිමියන් වහන්සේ ය යි ගිය ගිය තන්හි අනුබුද්ධ ව බණ වදරන්ට සමර්ථ වූ මහත් ඍද්ධි ප්‍රාතිහාර්ය්‍ය ඇති ව මහා සත්ථවිරයන් කැඳවා "ආයුෂ්මත්නි! මතු ආගත කාලයෙහි මධ්‍යමණ්ඩලයෙහි ජනශූන්‍ය වෙයි. ප්‍රත්‍යන්තයෙහි දෙශවල් සමෘද්ධ වෙයි. එසේ හෙයින් තෙපි තෙපිද අපි සසරින් ගැලවුනුමෝ? වේ දැයි උපෙක්ෂා නො ව ඒ ඒ දෙශවලට ගොස් ශාසන පිහිටුවා කොපට මේ බඳු වූ අමා මහ නිවන් සුවයක් දීලූ බුදුරජාණන්ට කෘතොපකාරයෙන් යෙදී උතුම් වූ ප්‍රතිපත්ති පූජා කරව"යි නියොග කොට වදාළසේක.

එ කල එයින් මජ්ඣන්තික නම් මහතෙරුන් වහන්සේ හිමාලය වන ප්‍රාන්තයෙහි කාශ්මීර-ගන්ධාර දෙශයට මධ්‍ය වූ අරාවාල නම් නාගරාජයාණන් අරවාල නම් විලට වැඩ විලපිට සක්මන් කරණ සේක. එ වේලෙහි නාගරාජයා "මාගේ පවිත්‍ර වූ විල පැන් තමාගේ පාද රජසින් අපවිත්‍ර කරණුයේ මුණ්ඩ-භින්න පට ධාරී වූ මේ කොයි මුඩු මහණකෙණෙක් ද"යි කිපි විසඳුම් හැර, විසගිනි හැර නො එත් අපි වැසි වස්වා, කර්කශ වූ වාක්පරුෂයෙන් ආක්‍රොශ කොට, තෙරුන් වහන්සේට කිසි පීඩාවක් කොට ගත නොහී, තෙරුන් වහන්සේගේ ඍද්ධි ප්‍රාතිහාර්ය්‍ය දැක "මොහු මහ තෙද ඇති රහත් කෙණෙක, නන්දොපනන්ද නම් නාරජහු මැති, අහිච්ඡත්‍ර නම් නා රජහු වැනි, පන්නක නම් නාරජහු වැනි, මට ශතසහස්‍ර ගුණයෙන් වඩනා නාගරාජයෝ පමා රහතන්ට මත් කොට පස්වා දහස් මුළුල්ලෙහි ලොකවාසීන් අයින් නිඳා අසමින් සිටියහ. දත්දක් මොහු බඹවසක්-ගුරුළු වෙසක් මැවූ නම් මා ගිරිගැඩවුලකු සේ මවනා මත් කරවා පියති. මම ම පළමු කොට ඔවුන් පා වැඳ කළ වරද ක්ෂමා කරවමි"යි සිතා මන තෙරුන් වැඳ ක්ෂමා කරවා අනසීවූ මිණිපලඟක් මවා එහි මහ තෙරුන් වඩා හිඳුවා තෙමේ එකත්පස් ව නා කළුවන් පිරිවරා හුන්නේ ය.

එ වේලෙහි මහ තෙරුන් වහන්සේ බුදුකෙණෙකුන් සේ වැඩහිඳ බණ වදරා සුවාසුදහසක් නයින් හා ලක්ෂගණන් යක්ෂ-ගරුඬ ගන්ධර්වාදීන් ද සරණසිල් ගන්වා, පණ්ඩක නම් යක්ෂ සේනාධිපතිහු හා හාරිති නම් යක්ෂණිය හා පන්සියයක් දරුවන් සෝවාන් කොට, ඉක්බිත්තෙන් කාශ්මීර-ගන්ධාර දෙශවාසීන් හවුරුදු පතා එම නාග රාජයාට දෙන නාග බලි පූජාව ගෙණ, රැස්වූ මහපිරිසට එම අත්තෙන් වැඩහිඳ සංයුත්ත ගියැ සළසින් වග බුදුන් වදාළ ආසිවිසොපම සූත්‍රය බණ වදරා, සුවාසු දහසක් දෙනාට මාගීඵල දී, ලක්ෂයක් පුරුෂයන් මහණ කොට, එ තැන් පටන් ඒ කාශ්මීර-ගන්ධාර දෙ දෙශයෙහි ධර්ම ශාසනය පිහිටුවා ලෝවැඩ කොට බුදුන්ට උතුම් පතිපත්තීන් පූජා කළ සේක.

මිහිඳු මහරහතන් වහන්සේ දෙවනපෑතිස් රජුට ආමන්ත්‍රණය කිරීම.

763 පිට බලන්න. (17-18)

තව ද: දෙවන මහාදෙව නම් මහතෙරුන් වහන්සේ මහිස මණ්ඩලයට වැඩ මැදුම්සඟියෙහි උපරි පණ්ණාස වදාළ දේවදූත සූත්‍රයෙන් බණ වදාරා, සතළිස් ලක්‍ෂයක් ප්‍රාණීන් නිවන් දක්වා සතළිස් දහසක් පුරුෂයන් මහණ කොට එහි සසුන් පිහිටුවා ප්‍රතිපත්තීන් පූජා කළ සේක.

තව ද: තුන්වන රක්ඛිත නම් මහ තෙරුන් වහන්සේ ද දහම් අනාවාස ව තුබූ වනවාස නම් දනව්වට වැඩ, අහස්කුස පුන් සඳක් සේ දිලිහි දිලිහී වැඩහිඳ, සියලු සතුන්ට ම පෙණී පෙණී සංයුත් සඟියෙහි වදාළ අනමතග්ග සූත්‍රය දෙශනා කොට, සැට දහසක් ප්‍රාණීන් නිවන් දක්වා, සැත්තෑදහසක් මනුෂ්‍යයන් මහණ කොට, පන්සියයක් මහා විහාර ඇති කරවා ලෝවැඩ කොට අප්‍රමාණ වූ ප්‍රතිපත්තීන් පූජා කළ සේක.

තව ද: සතර වන යොනක ධර්මරක්ෂිත නම් මහතෙරුන් වහන්සේ ද අපරන්ත නම් ජනපදයට වැඩ අංගොත්තර සඟියෙහි වදාළ අග්ගික්ඛන්ධෝපම සූත්‍රයෙන් බණ වදාරා, සත් තිස් දහසක් ප්‍රාණීන් එක දා නිවන් දක්වා, රජකුලයෙන් ම දහසක් පුරුෂයන් හා දහසක් ස්ත්‍රීවරුන් මහණ කරවා, එහි සද්ධර්ම ප්‍රදීපය බබුළුවා උත්තම ප්‍රතිපත්තීන් පූජා කළ සේක.

තව ද: පස් වන මහා ධර්මරක්ෂිත නම් මහ තෙරුන් වහන්සේ ද මහාරාෂ්ට්‍ර නම් ජනපදයට වැඩ කුදුගත් සඟියෙහි වදාළ මහා නාරද කාශ්‍යප ජාතකයෙන් බණ වදාරා එ ම දා ම සුවාසූදහසක් ප්‍රාණීන් නිවන් දක්වා, තෙළෙස් දහසක් මනුෂ්‍යයන් මහණ කොට එහි ධර්මශාසනය පිහිටුවා, සම්‍යක් ප්‍රතිපත්තීන් බුදුන්ට පූජා කළ සේක.

තව ද: සවන මහා රක්ෂිත නම් මහ තෙරුන් වහන්සේ ද යෝනක දෙශයට වැඩ දිග් සඟියෙහි ශීලස්කන්ධ වර්ගයෙහි වදාළ කාලකාරාම සූත්‍ර දෙශනාවෙන් බණ වදාරා, එක් ලක්‍ෂ සැත්තෑ දහසක් ප්‍රාණීන් එක දා ම නිවන් දක්වා, දසදහසක් යොතුන් මහණ කොට, දහස් ගණන් විහාර ඇති කොට, මෙසේ යෝනක දෙශයෙහි ධර්මශාසනය පිහිටුවා, බුදුන්ට උත්තම ප්‍රතිපත්තීන් ම පූජා කළ සේක.

තව ද: සත් වන මජ්ඣිම නම් මහතෙරුන් වහන්සේ ද පඤ්ච මහා ස්ථවිරයන් සමග හිමවන්ත නම් දනව්වට වැඩ, පළමු වන ධම්සක් පැවතුන් සූත්‍රයෙන් බණ වදාරා, එක දා අසූකෙළක් ප්‍රාණීන් නිවන් දක්වා, පස් ලක්‍ෂයක් රහත් සඟුන් ඇති කොට, මෙසේ බුදුන්ට අප්‍රමාණ වූ ප්‍රතිපත්තීන් පූජා කළ සේක.

තම ද: අට වනු වූ සෝණ නම් මහ තෙරුන් වහන්සේ ද සුවර්ණභූමි නම් දනව්වට වැඩ, එ රට රජකුලෙහි උපනුපන් දරුවන් හා කා පියා පලා යන තැකීග වූ යකින්නක දැක, එ දවස් දු උපන් රජකුමරුවා බිලිගණිමි යි ආ වේලෙහි, නොයෙක් පෙළහරින් තමන් වහන්සේ ඒ කුමරුව අරන්ගෙණ යකින්න හය ගන්වා, ඇය දුරපලවා දිවයින සිසාරා යක්ෂයන් වැද්ද නො හැකි සේ සීමා බැඳ, ඒ පෙළහරෙහි විස්මය පත්ව රැස් වූ මනුෂ්‍යයන්ට බ්‍රහ්මජාල සූත්‍රයෙන් බණ වදාරා සැටදහසක් ප්‍රාණීන් නිවන් දක්වා තුන්දහස් පන්සියයක් පුරුෂයන් හා එක්දහස් පන්සියයක් ස්ත්‍රීන් මහණ කරවා මෙසේ ධර්මශාසනය පිහිටුවා දිවි පමණින් බුදුන්ට අප්‍රමාණවූ උතුම් වූ ප්‍රතිපත්තීන් පූජා කළ සේක.

මෙසේ ලොවුතුරා බුදුන් පවා ලොභය හරවන නිවන් සුව ලදින්. ධ්‍යාන සුවයෙන් ඒ ඒ තැන්හි වැඩසිඳ සුව විඳ විඳ නොපියා මේ ස්ථවිරයන් පවා නිවන් සුව හැර, ඒ ඒ තැන්හි ඇවිද, ලෝ වැඩ කළ මතු සංසාරයෙහි දවස් යවන්ට සිතන්නාවූ නුවණැති කවර පුද්ගල කෙණෙක් ලෝවැඩෙහි උපෙක්ෂා වෙද්ද? එසේ හෙයින් නුවණැත්තා වූ ශාසනගත භික්ෂූන් විසින් අප්‍රමාද ව දවස් යැවිය යුතු. එසේ හෙයින් කියන ලදුයේ මැයි:

මහාදයස්සාපි ජිනස්ස කඩ්ඪනං
විහාය පත්තං අමතං සුඛම්පි තෙ
කරිංසු ලොකස්ස හිතං තහිං තහිං
භවෙය්‍ය කො ලොකහිතෙ පමාදවා-යි

ඉක්බිත්තෙන් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි මෝහාන්ධකාරයෙන් වැසී තුබූ ශ්‍රී ලංකා ද්වීපයෙහි සද්ධර්ම සූර්‍ය්‍යයා නැගී සද්ධර්ම රශ්මි පතුරුවා, උදා වුව මනා කල්හි, එදා නව වනු වූ මිහිඳු මාහිමියන් වහන්සේද ගුරුන් මදල තෙපුල් මුදුනෙන් පිළිගෙණ, ඉට්ඨිය නම් මහතෙරුන් වහන්සේය, උත්තිය නම් මහ තෙරුන්වහන්සේය, සම්බල නම් මහතෙරුන් වහන්සේය, භද්‍රශාල නම් මහතෙරුන් වහන්සේය යි තමන් වහන්සේ ඇතුළු වූ මහතෙර පස් නමක් හා නැගනියන් සංඝමිත්‍රාවන් වැදූ සත්හැවිරිදි සුමනසාමණේර නම් බෑනනුවන් හා අනාගාමිව, මහණ වනු කැමති ව, ආ දෙවිනිත්තත් දරු භණ්ඩුක නම් බෑනනුවන් හා මෙසේ රහතන් සද්දෙනකු ගෙණ පියරජ්ජුරුවන් විසින් දෙන ලද රජ පඬුරු හා දහම් පඬුරු ගෙන්වා ගෙණ එයින් ආකාශයට පැන නැඟී ශ්‍රී ලංකා

විපයට වැඩ අප බුදුන් පිරි නිවි දෙසිය සතිස් වන හවුරුදු ධර්මාශෝක රජ හට අටළොස් වන හවුරුදු, දෙවන පෑතිස් රජහට පළමු වන හවුරුදු, පොසොන් පුර පසළොස්වක මිහින්තලා බැස ජ්‍යෙෂ්ඨා සම්පන්න මී අඹ ගසක් මුල වූ අඹතලා නම් ගලතල සදෙනා වහන්සේ පිළිවෙළින් වැඩහුන් සේක.

දෙවන පෑ තිස් රජ්ජුරුවෝ පළමු සද්දම්සෙන පවත් නුවර දෙව් පුරයක් සේ සරහා සැණකෙළි කෙළනාහු එ දවස් මහ තෙරුන් වහන්සේගේ ආනුභාවයෙන් "අද මුව දඩ යෙමි"යි සිතා සතළිස් දහසක් පමණ කැමැති කැමැති ඇමැති සෙනඟ පිරිවරා ඒ වනයට පැන නැංගහ. එ වේලෙහි ඒ පර්වතයෙහි අරක් ගත් දෙවියා මහ තෙරුන් වහන්සේ රජහට දක්වම් යි සිතා රෝහිත මුව වෙසක් මවා, තණ කන ආකාරයෙන් පිරිසට නො පෙණී රජහට ම පෙණී ගියේ. රජ්ජුරුවෝ ඔහු දැක "ගොදුරු කන මුවා සොරා සිට විදීම පුරුෂ බලයෙක් නො වෙයි. මෝහට පෙණී විදිමි"යි සිතා දුනුදිය අත් පොළා මුවා උගුලුම්හා සැරයක් අළහ. ඒ මුවදෙවියා සැරඟ පා හස්සෙන් යවා රජහු ලජ්ජා කරවා මහ තෙරුන් වැඩ හුන් ගල තල කරා දිව අනතර්ධාන විය. රජ්ජුරුවෝ ද යොධයන් පසු කොට මුවා පසුපස්සෙහි තීසැරවේගයෙන් දිව එ තෙනට පත්ව මුවා ආ ගිය අත් නො දැක ඔබිනොබ බලති.

එ වේලෙහි මිහිඳු මාහිමියන් වහන්සේ රජ්ජුරුවන් දැක "මෙ රජ මහණ වෙස් නො හඳුනයි. හැම්දෙනා හා සමඟ පෙණිම් නම් රජ භය ගන්නී"යි සිතා සෙසු සදෙනා නො දැකිමයි" අධිෂ්ඨාන කොටලා තමන් වහන්සේ ම රජහට පෙණී "තිස්සය මා කරා වරැ"යි වදාළ සේක. එ බසට රජ්ජුරුවෝ "මේ ලක්දිව මුළුල්ලෙහි මට තිස්ස ය යි කිය හෙන සතෙක් නැත. කවරෙක් දෝ හෝ"යි බලා මහ තෙරුන් වහන්සේ දැක බිපි "ඉස මුඩු වූ, දනහුදු වූ රත් පවුල් පෙරෙවි ජිනන-භින්න පවධාරිය! තෝ කවරෙක්හි දැ"යි කීහ. එ බසට මහ තෙරුන් වහන්සේ පුරතල් කියන පුතක්හු දුටු පියාන කෙණකුන් සේ රජහු මහ කුළුණෙන් බලා:

සමණා මයං මහාරජ!–ධමමරාජසස සාවකා
තමෙව අනුකම්පාය – ජම්බුදීපා ඉධා'ගතා–යි.

යන මේ ගයින් බණ වදුරා, වන දෙවියන් ලවා සාධුකාර දෙවා "මහරජ! තොප කෙරෙහි කළ අනුකම්පායෙන් දඹදිවින් ලක්දිවට ආමෝ බුදුන් දරු වම්හ. අප බුදුන්ගේ සපුත් වැද මහණ වූ බිළිදි දරුවන් පවා එ දෑ පා පිසපු තිස්ස මහබඹුට මුදුන් මල්කඩ වෙයි, අන් ලෝ වැසි සියලු සත්හු ම තුණුරුවන් දාසයන, එසේ හො කියම්"යි වදාළ සේක.

රජ්ජුරුවෝ ද පෙර ම තුණුරුවන් පවත් අසා, තමන් ද තුණුරුවන් පැය පතා ම වසන හෙයින්, "බුදුන් දරු වම්හ"යි කී බසට සියලඟ ලොමු දහ ගන්වමින් සන්තොෂයෙන් මත් ව අත තුබූ ආයුධ බිම හෙළා, මහතෙරුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්හ. එ කෙණෙහි සතළිස් දහසක් යෝධයෝ ද ගොසින් රජහු පිරිවරා ගත්හ. එ කෙණෙහි අනික් සදෙනා වහන්සේ ද දක්වා වදාළ සේක. එ කෙණෙහි රජ්ජුරුවෝ "මේ සදෙනා වහන්සේ කවර විට අවුදැ"යි විස්මය පත් ව විචාළහ. "මහරජ! මා හා කැටි ව ම අවු ය, තොප නුදුටු බව මුත් කැලත් මේ තෙන ම උන්හ"යි වදාළ සේක. රජ්ජුරුවෝ මේ පෙළහර දුටු "ස්වාමිනි දඹදිව තවත් රහත්හු ඇද් ද"යි විචාළහ. එ බසට ස්වාමිදරුවෝ,

තෙවිජ්ජා ඉද්ධිපප්පත්තා ච – චෙතොපරියාය කොවිදා,
දිබ්බසොතා ච අරහන්තො – බහූ බුද්ධස්ස සාවකා–යි.

යන මේ ගය කියා "මහරජ! දඹදිව සෘඩිමතාන වූ රහත්හු පමණ නැතියහ"යි වදාළ සේක. රජ්ජුරුවෝ "තුඹවහන්සේ මීට කෙසේ වැඩිසේක් දැ"යි විචාළහ. "මහරජ! දියෙහුත්, ගොඩිනුත් නො ආම්හ"යි වදරා "ආකාශයෙන් වැඩිසේක් වනැ"යි රජ්ජුරුවන් සිතූ කල "රජහුගේ නුවණ ප්‍රශ්නයෙහින් පරීක්ෂා කෙරෙම්"යි සිතා, එ තෙන සිටි මී අඹගස බලා "මහරජ! මේ කිනම් ගසෙක් දැ"යි වදාළ සේක. රජ්ජුරුවෝ අඹගස ය යි කී ය. මහරජ! මේ හැර තවත් අඹගස් ඇද් දැ යි වදාළ සේක. රජ්ජුරුවෝ බොහෝව ස්වාමිනියි කීහ. එයින් පිටත් ගස් ඇද් දැ යි විචාළ සේක. අඹයෙන් පිටත් සෙසු ගස් පමණ නැත ස්වාමිනි යි කීහ. සෙසු අඹගසුත් නො අඹගසුත් හැර පිටත් ගස් කවරේ දැ යි විචාළ සේක. මේ අඹගස එයින් පිටත් වේ ද ස්වාමිනි යි කීය. මහරජ! මේ පැනය තොප කී සේ මැනවැ යි වදරා, නව පැනයක් විචාරණු කැමැති ව "මහරජ! තොපගේ නෑයෝ ඇද්ද, නැද් දැ"යි විචාළ සේක. බොහෝම, ස්වාමිනි යී කීහ. නො නෑයෝ ඇද් ද නැද් ද මහරජ යි කී සේක. නෑයන්ට වඩා නො නෑයෝ බොහෝව ස්වාමිනි යි කීහ. තොපගේ නෑයන් හා නො නෑයන් හැර අනික් කවුරු මෙහි ඇද්දැ යි විචාළ සේක. මම ඇත්තෙම් වෙම් ද ස්වාමිනි යි කීහ. එවේලෙහි මිහිඳු මාහිමියන් වහන්සේ "රජ්ජුරුවෝ ධර්මවිනය දැන ගන්නා තරම් බුඩි ඇත්තාහු ය"යි දැන එ වේලෙහි මැඳුම් සඟියෙහි බුදුන් වදාළ චූළ හත්ථිපදොපම සූත්‍රයෙන් බණ වදාළ සේක. එ කෙණෙහි රජ්ජුරුවෝ සෝවාන් වූහ. සතළිස් දහසක් ඇමැතියෝ කැමැති ව ම තුණුරුවන් සරණ ගියහ.

රජ්ජුරුවෝ දූත දූත ද "ස්වාමීනි! රාත්‍රියෙහි අනුභව කරන්නේ ඇද්ද නැද්ද"යි විචාළහ. මහරජ! විකල් බොජුන් දුරුකළමෝ වේ දූ යි වදාළ කල "එබැවින් දූත් මා රජගෙට වැඩිය මැනවැ"යි ආරාධනා කොට "මහරජ! අද රූ මෙතැන්හි ලගිනා කටයුතු ඇද්දැ"යි වදාළ කල "එසේ වී නම් ස්වාමීනි! මේ භණ්ඩුකයන් අප ලා නැවිව එම වදාළ මැනවැ"යි කීහ. එබසට "මහරජ! ඔහු අනාගාමීහ. ගිහි ගෙයි නොලගිති, අද රූ ම මහණ වෙති"යි වදාළ සේක. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ "සෙට මිඟුල් රථය එවාලමි, එයින් වැඩිය මැනවැ"යි ආරාධනා කොටලා භණ්ඩුකයන් තනි කොට විචාරා ධර්මාශෝක රජ්ජුරුවන් අගබිසෝ වෙදිස මහා දේවීන් කුසින් උපන් ශාක්‍යකුලයෙන් ආ උභයකුල පරිශුද්ධ වූ සංඝමිත්‍රා ස්ථවිරින් හා මිහිඳු මාහිමියන් වහන්සේ බව අසා "සක් රුවනක් හා සිතුමිණි රුවන් එකක් වූවා සේ, මාගේ අණසකට දහම් සකත් රජ කුලෙන් ම ලදිමි"යි කිය කියා සතුටින් පිණ පිණා රජගෙට ගියහ.

එ කෙණෙහි සිරු හසනගන විය. පුන්සඳ උදා වි ය. මාහිමියන් වහන්සේ භණ්ඩුකයන් කෙස් බාවා මහණ කොට ගෙණ සුමන සාමණේරයන් වහන්සේ හඬගා ලඟට කැඳවා" සුමනයෙනි! බණ අසන්ට දෙවියන් හඬනාව"යි වදාළ සේක. එ බසට බෑනනුවන් වහන්සේ "ස්වාමීනි! සක්වල දහයෙක දෙවියන් හඬගා කැඳවම් ද, සියක් සක්වල දෙවියන් හඬගා කැඳවම් ද, නොහොත් සතිස් ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් වට ඇති මේ මිඟුල් සක්වළට ඇසෙන සේ හඬගාම් ද නොහොත් මේ සියක් යොදුන් ලක්දිවට ඇසෙන සේ හඬගාම් දැ"යි විචාළ සේක. එ බසට මාහිමියන් වහන්සේ "මේ ලක්දිව පමණකට ඇසෙන සේ හඬ ගාව"යි වදාළ සේක. ඉක්බිත්තෙන් මේ ලංකාවිපය මුළුල්ලට ඇසෙන සේ තුන් යලක් සුමන සාමණේරයන් වහන්සේ හඬ ගා වදාළ කල, ඒ හඬ අසා මහත් වූ දිව්‍ය සමාගම විය. එ වේලෙහි මිහිඳු මාහිමියන් වහන්සේ බුදුන් වදාළ සමචිත්ත පරියාය නම් සූත්‍ර දේශනාව කොට අසංඛ්‍යයක් දෙවියන් අමාමහ නිවන් දක්වා නාග-සුපර්ණාදීන් ශරණ ශීලයෙහි පිහිටුවා වදාළ සේක.

ඉක්බිත්තෙන් පහන් වූ කල රජ්ජුරුවන් එවූ මිඟුල් රථයට නො නැගී පළමු කොට රථාචාරීහු යවා තමන් වහන්සේ සිවුරු මැලඳ පාත්‍ර ධරා, රහත් සදෙනා හා සමඟ ආකාශයට නැඟී රථාචාරීහු පසු කොට කොළොම් තෙරට බැස සත්හුන් ගුණෙන් වැඩ නැගෙනහිරි මහවාසලට අභිමුඛ වූ සේක. එපවත් රථාචාරී රජ්ජුරුවන්ට දූන් විය. රජ්ජුරුවෝ ද මේ පවත් අසා සතුටු සතුටු ව පෙර මඟට දිව පසඟ පිහිටුවා වැඳ පාත්‍රය ගෙණ, දිව්‍ය

පුරයක් සේ නොඑක් පූජා පෙළහරින් සදහාලද රජමිපිය මධ්‍යයෙහි රජගෙම වඩා ගෙණ ගොස්, රන්මල් යේසනින් සැදුම් ලද සිංහාසන මතුයෙහි වඩා හිඳුවා රාජ භොජනයෙන් සනතර්පණය කොට මල් සුවඳින් පුද අනතඃපුර හා සමග රජාඛනය පුරු පිරිවරා උත්හ.

එ වේලෙහි මාහිමියන් වහන්සේ විමාන වස්තුය, ප්‍රෙතවස්තුය සච්චසංයුත් සූත්‍රය, දෙශනා කොට අනුලා දේවීන් ප්‍රධාන වූ පන්සියයක් කිලෙසේවරුන් සෝවාන් කොට, කාලාගිරිහු වයේ රජගෙන නුවර සේ තමන් වහන්සේගේ දශින ශ්‍රීයට හැලලුනා වූ මනුෂ්‍යයන්ට අනතඃපුරය සම්බාධ හෙයින් පස්වරු හසතී ශාලාවෙහි දහම් පලක් තැගී වැඩහිඳ දෙවදූත සූත්‍රය දෙශනා කොට, දහසක් පුරුෂයන් සෝවාන් කොට, එ ගොනත් සම්බාධ හෙයින් නුවරට දකුණු දිග නඤු නම් උයනෙහි ධර්මාසන තැගී වැඩ හිඳ, මැදුම් යාමයෙහි උපරිපණ්ණාසකයෙහි බුදුන් වදාළ බාලපණ්ඩිත සූත්‍රය දෙශනා කොට, දහසක් පමණ කුලස්ත්‍රීන් සෝවාන් කොට. එදා රෑ මහමෙවුනා උයන දමස් යමා;

දෙවන දා උදසන මහපොළොව ගුගුරුවා මහාමෙවුනා උයන පිළිගෙණ එ කෙනෙහි අකාල කුසුමාදීන් නොඑක් පෙළහර දක්වා රජ්ජුරුවන් පහදවා, එයින් මතු මහාසංඝයා රැස් වන රාශිමාලක නම් භූමියෙහි පුළිල ගස මුල ය. එයින් මතු බොහෝ රතනත් දූවට් සාන්‍යය කරන්නාවූ උතතම සථානයයැයි දකනාධර නම් පොකුණු භූමියට වැඩ, එයින් ශ්‍රීමහාබොධීන් පිහිටුවන තැනට වැඩ, එයින් ලෝවා මහ පාය පිහිටන්නාවූ මහ මිදෙල් ගස මූලට වැඩ, එයින් මතු පිරිත්ශාලා ගෙය වන පැහඹ මිලුවට වැඩ, එයින් මතු බොහෝ හතන්ට ඛත් සබදන චතුශ්ශාලා නම් භූමියට වැඩ එයින් මතු රුවන්මැලි මහසෑය පිහිටන රත්නමාලකසථානයට වැඩ, මෙහේ ස්ජන සථානය ම උතතම සථානයයි බුදුන් රහතුන්ගේ පාරිභොගික භූමියයි සතුටු කොට, සමන් මල් අට අට මිටින් පුද සත් විටක් මහපොළොව ගුගුරුවා, නොඑක් අද්භූත දක්වා, එයින් රජගෙට වැඩ, දහවල් වළඳා අන්තරෙහි අඞගුතතර සගීතියෙහි වදාළ අග්ගික්ඛන්ධෝපම සූත්‍රයෙන් බණ කියා දහසක් දෙනා නිවන් දක්වා;

තුන් වන දවස් ආශිර්විෂොපම සූත්‍රය වදාරා දහසක් පුරුෂයන් සෝවාන් කොටා, සතර වන දවස් අනමතග්ග සූත්‍රයෙන් බණ වදාරා, දහසක් පුරුෂයන් නිවන් දක්වා, එ දවස් නුවර සිකාර

සීමා බඳවා පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි පවත්නා සේ බුද්ධශාසන ප්‍රතිෂ්ඨාපනය කොට, පස් වන දවස් ධජ්ජනීය පරියාය සූත්‍රයෙන් බණ වදාරා දහසක් දෙනාට මාර්ගඵල දී, සවන දවස් ගෝමය පිණ්ඩ නාම සූත්‍රය දේශනා කොට දහසක් දෙනාට මාර්ගඵල දී, සත් වන දවස් ධම්මසක් පැවතුන් සූත්‍රයෙන් බණ වදාරා දහසක් දෙනාට නිවන්ඵල දී මෙසේ නුවරව වැඩී සත්දවස ඇතුළත අවදහස් පන්සියයක් මනුෂ්‍යයන් නිවන් දක්වා, රජ්ජුරුවන් විසින් කරවා පිළිගන්වන ලද සෑගිරි මෙහෙර වස්වැස, මස් අනන්තරයෙහි සුමන සාමණේරයන් වහන්සේ ශක්‍ර දෙවේන්ද්‍රයන් කරා යවා, ඔහු කෙරෙහි තුබූ දකුණු අකුධාතුව ගෙන්වා ථූපාරාමයෙහි පිහිටුවා, පලමුවන ධාතු ප්‍රතිෂ්ඨාවෙන් එ දවසු දූ මහපොළොව ගුගුරුවා,

නැවත එම සුමන සාමණේරයන් වහන්සේ දඹදිව් යවා ධර්මාශෝක රජ්ජුරුවන් කෙරෙහි තුබූ බුදුන් වැළඳූ පාත්‍ර ධාතුව හා ධාතු පාත්‍රයක් ගෙන්වා ලක්දිව ඒ ඒ තැන්හි ධාතු පිහිටුවා, රජ්ජුරුවන් බෑනනුවන් අරිට්ඨ නම් කුමාරයන් අත කියා යවා නැගණියන් සංඝමිත්‍රා නම් මහාස්ථවිරීන් ලවා මහබෝ වඩා ගෙන්වා එම ශ්‍රී මහා බෝධිය පිහිටුවා, මහපොළොව ගුගුරුවා, එ දවස් පසැඩ මහා ශාඛාවෙන් වුහුටු පසැඩ මහ ඵල සාධා රජ්ජුරුවන් ලවා ම රෝපණය කරවා, පිරිත් පැන් ඉස එකී එකී ඵලයෙන් අට අට පැළයක් බැගින් පැනනැගී වනස්පති ව සිටි, සතළිස් මහා බෝධිය ලක්දිව සතළිස් මහා ස්ථානයෙහි පිහිටුවමා සංඝමිත්‍රා තෙරණින් ලවා අනුලා දේවීන් ප්‍රමුඛ ව පන්සියයක් කිසෝවරුන් හා ලක්ෂගණන් ස්ත්‍රීන් මහණ කරවා, භික්ෂුණී ශාසනය ද පිහිටුවා,

තමන් වහන්සේ රජ්ජුරුවන් මලනුවන් මත්තාභය නම් රාජ කුමාරයන් හා අරිෂ්ට නම් අගමැතියානන් ප්‍රධාන වූ දසස්-ලක්ෂ ගණන් පුරුෂයන් මහණ කොට භික්ෂුශාසනය ද පිහිටුවා, බුදුන් වදාළ සුව සූදහසක් ධර්මස්කන්ධය දඹදිවින් පොතක් පතක් නො ගෙන්වා, තමන් වහන්සේගේ සිත් නමැති භාණ්ඩාගාරයෙන් පිටත් කොට, දහස් ගණන් ස්ථවිරයන්ට ආගම් උගන්වා, සම්මා ප්‍රතිෂ්ඨාවෙන් අද දක්වා ශ්‍රී ලංකාද්වීපයෙහි බුද්ධශාසනය නිෂ්කලංක ව පවත්නා සේ ලෝ වැඩ සසුන් වැඩ කළ සේක.

මෙසේ මාගේ බුදුරජාණන් වහන්සේ මේ එක මිහිඳු මාහිමියන් වහන්සේ විසිනු දු කළා වූ ශ්‍රී ලංකාද්වීපයෙහි බුද්ධාගමනයෙහි ප්‍රතිෂ්ඨා ය, බෝධි ප්‍රතිෂ්ඨා ය, ධාතු ප්‍රතිෂ්ඨා ය, ශාසන ප්‍රතිෂ්ඨා ය, සද්ධර්ම ප්‍රතිෂ්ඨා ය යි යනාදි වූ අප්‍රමාණ වූ ප්‍රතිෂ්ඨා පූජා ලත් හෙයිනුත්, නොකියන ලද අප්‍රමාණ වූ ස්ථවිරයන් විසින් කරණලද අප්‍රමාණවූ ප්‍රතිපත්ති පූජාලත් හෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වන සේක, එසේ හෙයින් කියන ලදී.

පූජාවිසෙසං සහපච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං-යි

මේ පූජාවලියෙහි අප බුදුන් මිහිඳු මාහිමියන් ගෙන් ලද
ප්‍රතිපත්ති පූජා කථා නම් වූ

තෙතිස් වන පරිච්ඡේදය නිමි.

සූතිස් වන පරිච්ඡේදය

නම් දා: අප බුදුන් ශ්‍රී ලංකාද්වීපයෙහි හැම රජුන්ගෙන් ලද උද්දෙසික පූජා කථා නම් කවරීයත්;

අනාගත කාලයෙහි පන් දහසක් හවුරුදු පවතින බුද්ධ ශාසනයට මිතු වන තො එක් සිංහලාධිපති වූ පින්වත් රජුන් විසින් කරණ උද්දෙසික පූජා අප්‍රමාණ වන බැවින් එහි වර්ණනාව ධර්ම කථිකයන්ට ම හළිමි. මේ තෙක මහානි බුදුන්ගේ සද්ධර්මාමෘත ගංගාවට බැස සිත් ගේ ඇවිදිනා සමයව පූර්වභාග යෙහි උපන් සිංහලාධිපති රජුන් බුදුන්ට කළ උද්දෙසික පූජා සංක්ෂෙපයෙන් පවසමි

අප මහ ගෞතම බුදුන්ගේ ප්‍රථම බෝධියෙහි පටන් මාගේ මේ සතුටු පූජාවගේ අවසානයට, එක්දහස් අටසිය සූපණස් හවුරුද්දෙක් අතික්‍රාන්ත විය. මේ මෙකාව සිංහලාධිපති රජහු එක්සිය තෙපණස් දෙනෙක් මොවුනු පැලඳ රජ කළහ.

ඔහු කිනම්හ? යත්; පළමු වන විජය රජය, උපතිස්සය පණ්ඩුවාසය, අභය, පණ්ඩුකාභය ය, මුටසිවය, දෙවන පෑතිස්ස, උත්තිය ය, මහ සිව ය, සූරතිස්ස ය, අසේලාචාරී ය,

අසේල ය, එළාල ය, මානා රජ ය, යටාල තිස්ස ය, ගොළු අබා ය, කාවන් තිස්ස ය, දුටුගැමුණු ය, සැදෑ තිස්ස ය, තුල් නම් රජ ය, ලැමැණි තිස්ස ය, කලුන්නා ය, පංච ද්‍රවිඩ ය, වලගම් බාහු ය, මහදැළිතා තිස් ය, චොරනාග ය, කුඩා තිස් ය, බලත් සිවුවා ය, වටුක ය, පෙරවි ය, වාසුකී ය, බැල තිස් ය, අනුලා ය, මකලන් තිස් ය, භාතිය ය, මහදැළියා ය, අඩ ගැමුණු ය, කිණිහිරි දැළි ය, කුඩා අබා ය, සීහ වල්ලි ය, එළුන්නා ය, සඳ මුහුණු ය, යස සිළු ය, ශුභ බලතා ය, වහප් රජ ය, වක් නා තිස් ය, ගජ බාහු ය, මහලු මා නා රජ ය, භාතිය තිස්ස ය, චූල තිස්ස ය, කුහුන්නා ය, කුඩා සිරි නා ය, වොහාර තිස්ස ය, අභය තිස්ස ය, සිරිනාග ය, විජයිඳු ය, සඞ්ඝ තිස්ස ය, දැහැමි සිරිසඟබෝ ය, ගොඨාභය ය, කල කැත් තිස් ය, මහසෙන් රජ ය යි මහාවංශයෙහි පෙනුනු පැලඳ රජ කළා වූ රජුන් තෙසැට දෙනෙකු හා,

චූලවංශයෙහි::- කිත් සිරිමෙ රජ ය, දෙට තිස් ය, බුජස් රජ ය, උපතිස්ස ය, මහා නාම ය, සෙන් ගොත් ය, ලැමැනි තිස් ය, මිත්සෙන් කරල් සොරා ය, ස රජ ද්‍රවිඩ ය, දාසෙන් කැලි ය, සීගිරි කසුබු ය, මුගලන ය, කුමාරදාස ය, කිර්ති සේන ය, මැඩි සිවු ය, ලැමැනි උපතිස්ස ය, අඹ හෙරණ ය, දාපුළු සෙන් ය, දල මුගලන, කුඩා කිත්සිරි මෙවන, සෙනෙවි මහරජ ය, ලැමෙනි සිගානා ය, අග්බෝ රජ ය, කුඩා අග්බෝ රජ ය, සඟ තිස ය, ලැමෙනි බොනා ය, අසිග්ගාහක ය, සිරි සඟබෝ ය, ලැමෙනි කාශ්‍යප ය, දළුපතිස් ය, පැසුළු කසුබු ය, දාපුළු ය, ලැමෙනි දළුපතිස් ය, පැසුළු දළුපතිස් ය, සිරි සඟ බෝ ය, වල්පිපි වැසි දතක ය, හුනන්නරු රියන් දල ය, මහ ලැපාණෙනෝ ය, අග්‍ර බෝධි ය, සෙන් මහරජ ය, සුළු කසුබු ය, මිහිඳෙල ය, සුළු අග්බෝ ය, කුඩා අග්බෝ ය, සලමෙවන් මිහිඳු රජ ය, උදා රජ ය, සොම්හිඳු ය, මැදි අග්බෝ ය, දාපුළු ය, පැසුළු අග්බෝ ය, සෙන් මහරජ ය, මුගසින් සෙන් ය, උදා රජ ය, කසුප් රජ ය, පැසුළු කසුබු ය, දාපුළුය, කුඩා දාපුළු ය, උදා රජය, සෙන් රජ ය, උදා මහරජ ය, පැසුළු සෙන් රජ ය, මැදි සෙන් රජ ය, කුඩා මිහිඳෙල, සලමෙවන. මිහිඳු රජ ය, වික්‍රම බාහු ය, මහලේ රජ ය, වික්‍රම පාණ්ඩි ය. ජගත් පාල ය. පරාක්‍රම පාණ්ඩි ය, ලෝකේශ්වර සෙනෙවි ය, මහලු විජය බාහු ය, ජයබාහු ය, වික්‍රම බාහු ය, මහලු පරාක්‍රම බාහු ය, පණ්ඩිත විජයබාහු ය, කිලිංග කස්සප? මිහිඳු ය, කිර්ති නිශ්ශංකමල්ල ය, වීර බාහු ය, වික්‍රම බාහු ය, චෝඩගංග ය, ලීලාවතී ය, සාහස මල්ල ය,

කල්‍යාණවතී ය, ධර්මාශෝක ය, අනිකඟ ය, ලීලාවතී ය, ලෝකේශ්වර ය, ලීලාවතී ය, පරාක්‍රම පාණ්ඩි ය, මාඝරාජ ය, විජයබාහු ය, පරාක්‍රමබාහු ය, යි සුළුවංසයෙහි රජය කළ අනූ දෙනෙකු හා මෙසේ වූ රජ එක්සිය තෙපණස් දෙනෙක් සිරිලක රජය කළහ. එයින් පින්වත් රජුන් බුදුන් පිදූ පරිදි කවරේ? යත්;

ශ්‍රී ලඞ්කාධිපති වූ පින්වත් රජ යුවරජ මහ ඇමැතියන් විසින් සාවධාන ව ඇසිය යුතු. සිරිලක යත් වනු ව ඉපැද පින්වත් වූ යට කී ඒ දෙවන පෑතිස් රජ්ජුරුවෝ මිහිඳු මාහිමියන් වහන්සේගේ අනුශාසනා වූ පරිද්දෙන් ලෝවැඩ සසුන් වැඩ කරන්නාහු මහබෝ වඩා ආ ක්‍ෂත්‍රිය කුමරුවන් අටදෙනා අතුරෙන් බෝගොත් කුමාරයන්ට ලක් මහ ලේනා තනතුරු දී, සුමිත් කුමාරයන්ට ජය මහ ලේනා තනතුරු දී, සදගොත් කුමාරයන්ට විල්බාමුල රජුන්ගේ තනතුරු දී, දෙවුගොත් කුමාරයන්ට මහරුම්නා තනතුරු දී, ඔහදුම්ගොත් කුමාරයන්ට මහසිමු නා තනතුරු දී, හිරුගොත් කුමාරයන්ට හොකුරුගානා තනතුරු දී, සිසිගොත් කුමාරයන්ට සඳ නා තනතුරු දී, ජිනින්ධර කුමාරයන්ට අරක් මේ නා තනතුරු දී, ශ්‍රී ලඞ්කාවිජය මුළුල්ලෙහි යොදනෙන් යොදනෙහි දාගබක් සංඝ වාසයක් බැගින් සුවාසූ දහසක් දාගබ් බඳවා පූජා කළහ. සුවාසූ දහසක් සඞ්ඝාරාම කරවා පූජා කළහ. තිසා වැව බඳවා ලෝවැඩ කළහ. මෙසේ චෛත්‍ය පූජා ය, සංඝාවාස පූජා ය, බෝධ්‍යඞ්ගන පූජා ය යි යනාදී වූ අප්‍රමාණ වූ පූජා කරවා ඒ දෙවන පෑතිස් රජ්ජුරුවෝ සතළිස් හවුරුද්දක් දැහැමෙන් රාජ්‍යය කොට දෙව්ලොවට ගියහ.

ඔහු මල් උත්තිය නම් රජ දස හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මල් මහාසිව නම් රජ දස හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මල් සූරතිස්ස නම් රජ දස හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහුට ඉක්බිති ව ලක්දිවට අසුන් ගෙණා අශ්වාචාරි දෙබෑ කෙනෙක් දෙවිසි හවුරුද්දක් රාජ්‍යය කළහ. මේ දෙමළුන් දෙදෙනා මරා ලුහුබඳවා ඒ දෙවන පෑතිස් රජහු මල් අසේල රජ දස හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. සොළී රටින් එළාල නම් දෙමළ රජෙක් ලක්දිවට බැස අනුරාධපුර නුවර ගෙණ අසේල නම් රජහු මරා රුහුණ හැර, ලක්දිව මුළුල්ලෙහි සසුන් නසා දෙසිය දෙමළ කඳවුරක් ඇති කරවා, විසි මහා යොධකෙණකුත් ඇති ව, සුසාළිස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය.

යට කී දෙවන පෑණිස් රජහු මල් මානා රජ තමාට විෂ ගෙණ යෙදූ අඹ එවූහ යි බැද බියෙහොවුන් තොරෙහි කලතිරි බැහැනත් රාජ්‍යය කරණ සමයෙහි ම රුහුණු ගොස්, රජය කොට, යටාල තිසුන් ලදහ. ඒ යටාල තිස් රජ කැලණි වෙහෙර තිස් මහ පසය ඇතුළු වූ කැලණි වෙහෙර කරවා එහි ම රජය කෙළේ ය. ඔහු පිත් ගොඨ අබා නම් රජ රුහුණු ගොස් රාජ්‍යය කෙළේ ය. ඔහු පිත් කාවන් තිස් රජ කැලැණි වෙහෙර තිසසමහ වෙහෙර දෙමට ගල් සිතුල් පවු, මහගම් ඉතාමල්ල තරගල්පවු, කළුම්හුදු ගිරි, උතුරු මරා, තිසම් පවුත්, ගලු, බිසොවළු, රත්කරවු, දෙරවේරු, සඳගිරි වෙහෙර ආදී වූ විහාර මූල් පිස කරවා මහත් වූ පූජා කොට කැලැණිතිස් රජහු දූ වෙහෙර නම් ලද බිසොව අගබිසෝ කොට, දුටුගැමුණු රජු හා සැදැතිස් කුමරුවා හා දරු දෙදෙනා ලදින් රුහුණෑ සිඳ ම රාජ්‍යය කොට දෙව් ලොව ගියේ ය

ඔහු පිත් දුටුගැමුණු මහ රජ පියරජහු අගාමෙහි මේ ලඞකා ද්වීපයෙහි දෙතිස් දෙමළ කඳවුරු බැද වෙහෙර සපුත් නසා ලක්දිම පුරා හුන් එළාල රජු හා දෙමළ මහසෙන් දුක බුද්ධිශාසනයෙහි උපන් මහා කරුණා වෙන් "පරසතුරන් නසා ලක්දිව සපුන් කෙළි කළ දම්සෙක මුත් දෙපය දිගු කොට වැද නො හෙමි" යි මහත් වූ අභිමානයෙන් මත් බැද තමාගේ එකොළොස් දහස් එක්සිය දස මහ යොධයන් ගෙණ කඩොල් නම් ඇත්රජහු පැනනැගී රුහුණු රජයෙන් රැහැණී ව, රජසෙන් ගෙණ, තික්ම, දෙතිස් දෙමළ කඳවුරෙහි දෙතිස්, දෙතිස් දහස් බැගින් ඇති ලා හුන් දශ ලක්‍ෂ සූතිස් දහසක් පමණ දෙමළුන් මරා, එළාල රජුහු ද මරා, අනුරාධපුර නුවර ගෙණ, වොට්නු පැලද, එතැන් පටන් දශ රාජ ධර්මයෙන් රාජ්‍යය කෙළේ ය. ඒ රජ මෙසේ වූ වික්‍රමයක් ගිය දවස බෝමළුවක් හැමිඳපු කුසල් පමණකිත් ම ලදහ යි දතයුතු.

ඒ රජ මෙසේ වූ ලෝකශාසනයට මවිත සේ ලක්දිව මිථ්‍යා දෘෂ්ටීන් දුරු කොට ශාසනොපකාර කරණුයේ නව අනුවක් පමණ රජමහා විහාර කරවා, එකුන් සියක් මහපූජා කෙළේ ය. තව ද: මිරිස් පැස්සක් බුදුන් දරුවත්ට නො දී, සඳහන් මිද ව, කෑවා වූ දඹු වමට, එකුන් විසි කෙළක් පමණ ධන වියදම් කොට මිරිසවිටි නම් මහසෑය කරවා ලක්දිව මහසඞ්ඝයා රැස්කොට සත් දවසක් මහ දන් දී පූජා කෙළේ ය. තව ද: අයමින් විතරින් එක්සිය විසි රියන් පෙළෙක සතළිස සතළිස බැගින් සතළිස් පෙළක් ඇති එක් දහස් සසියක් මහටැම් හිඳුවා, නව මහල් ඇති, දහසක් කන්කුළු ඇති, ලෝවාමහපාය තිස් කෙළක් පමණ ධන වියදම් කොට කරවා,

සඞ්ඝාරාම කොට පිළිගන්වා, සත් දවසක් මුළුල්ලෙහි මහත් වූ දාන පූජා කෙළේ ය. තව ද: එක්සිය විසි රියන් රුවන්මැලි නම් මහසෑය බඳවා, අනන්ත නම් නාගරාජයා කෙරේ තුබූ ද්‍රෝණයක් පමණ ධාතු දොළොස් සැවිරිදි සොණුත්තර නම් සාමණේර කෙණෙකුන් ලවා බලාත්කාරයෙන් ගෙන්වා, ඒ දාගබ පිහිටුවා සහස්‍ර කෙළක් පමණ මහරහතන්ට සත් දවසක් මහ දන් දී අනර්ඝ වූ වස්ත්‍ර සූවිස්සක් හා දෙකෙළ දහසක් පමණ ධන පරිත්‍යාගයෙන් ඒ රුවන්මැලි නම් මහා චෛත්‍යය පූජා කෙළේ ය.

එ සමයෙහි පූජා කරණ සතියෙහි සයානුකාලක් මහරහතන් වැලඳු පාත්‍ර සේධු බයා නම් මහ වැ පත්ලෙහි සතරඟලක් පමණ තෙලගිතෙල් මිදී සිටගත. ඒ වැ පත්ලෙහි සමගත්තා වූ ගුණ්ඩිලාදියෙහි අද දක්වාත් ගිතෙල් ගුණය නො නැරේ ම ය. තව ද: ඒ රජ සූවිසි වාරයෙක බුදුන් උදෙසා ම වෙසක් පූජා සූවිස්සක් කෙළේ ය. මේ ශ්‍රී ලඞ්කාද්වීපයෙහි නැම භික්ෂූන්ට නො වරදවා තුන් වාරයෙක අටපිරිකර දී පූජා කෙළේ ය. යත් සත් දවස් බැගින් ශ්‍රී ලඞ්කාද්වීපයෙහි පස් වාරයෙක බුදුන්ට පූජා කෙළේ ය. දවස් පතා තෙලගිතෙල් පහන් දොළොස් දහසක් බැගින් ම පූජා කෙළේ ය. දවස් පතා ගිලන්පස අටළොසක් තබා දීය. අටළොස් ස්ථානයෙක බෙහෙත් බඩු තබා දින. සුනාලිය ස්ථානයෙක පැන් නො වතා පිසූ කිරිබත් තබා දවස දවස දින. තව ද: තෙලගිතෙල බැදි පුළුප් බඳනා තබා දින. තව ද: ලඞ්කාද්වීපය මුළුල්ලෙහි සියලු විහාර ම නො වරදවා මසකට අටවාරයක් බැගින් පහන් පූජාවට තෙල් තබා දින.

තව ද: ධර්ම දානයෙහි ආනිසංස බෙහෙමැයි අසා තමන් තෙවලා නිම වූ හෙයින් තමන් කැරවූ ලෝවා මහ පායට මහසඟ පිරිස් රැස්කොට තුමූ ධර්මාසන නැඟී මඞ්ගල සූත්‍රයෙන් බණ කියමි යි හිඳ දොළොස් දහසක් පමණ රහතන් දැක, උපන් අස්ථාන හසින් බණ කිය නොහී, සජ්ඣායෙහි බා සෙල් වී, ධර්මාසනයෙන් නැගී, "ස්වාමිනි! බණ කියන්ට භය ඇතියෙමි. ධර්ම දානයෙහි පින් කෙසේ ලැබේ ද"යි විචාරා "මහරජ! තොප තමින් වෘත්ති දී බණ කියවව"යි වදාළ කල එ තැන් පටන් ගෙණ ධර්ම කථිකයන්ට මහත් වූ සත්කාර කොට, ශ්‍රී ලඞ්කාද්වීපය මුළුල්ලෙහි නැම විහාරවලට තමන් නමින් ම බණ පවත්වා, මස් පතා, එතෙකි ධර්මකථිකයන්ට හට ගිතෙල් උක්පැණි සකුරු නැළි නැළි බැගින් දී, සතරඟුල් වැල්මී කඩක් පිළිසගලක් බැගින්, මස්පතා මෙ තී වෘත්ති තබා දී, එකී එකී ධර්මශාලාවෙහි අනැඟි වූ විතානක්

ධර්මාසනයක්, ඇතිරිලියක්, දණ්ඩාසනයක්, ඛණ්ඩවස්තක්, කම්බිලියක්, විජිනිපතක්, ඛණ්ඩපොතක්, බැගින් ලවා මෙසේ ධර්මයට ද සත්කාර කොට, බුදුන් උදෙසා ම අප්‍රමාණ වූ පූජාවෙන් පින් රැස් කොට සුවිසි හවුරුද්දක් දශ රාජධර්මයෙන් රාජ්‍යය කොට, "මෙමත් බුදුන්ට අගසවු වෙමි" යි පතා ගොසින් තුසීපුර ඉපැද විය.

ඔහු මල් සැදුතිස් රජ පදිකටුන්තරා, දිවගුණ්ඩු, උතුරල, හැපිගොව, ගොදිගමු, මාලදෙණි, මාමඩලා, කැදලා, රුදලා, මහගුළු, රුන්ද, කා තොලෙ ආදි වූ දොළොස් වැවක් බඳවා, දිගානකාදි වෙහෙර කරවා මහ පූජා කොට අටලොස් හවුරුද්දක් රාජ්‍යය කොට තුසීපුර ම ගිය.

ඔහු පිත් තුළුනා රජ උඳු වෙහෙර කරවා එක්මස් දසදවසක් රාජ්‍යය කෙළේය: ඔහු මල් ලැමැණිතිස් රජ නම හවුරුදු අටමස් දෙපෝයක් රාජ්‍යය කෙළේය. ඔහු මල් කලුන්නා රජ සහවුරුද්දක් රාජ්‍ය කෙළේ ය. ඔහු මල් වලගම් අබා රජහු පස්මසක් රාජ්‍යය කළ කල, සොළී රටින් දෙමළ සත්දෙනෙක් සත්සෙනඟක් ගෙණ, සත් තොටකින් ලක්දිව් බැස, ඔහු ලුහුබඳවා රජය ගෙණ, එකෙක් පාත්‍ර ධාතුව ගෙණ ගිය. එකෙක් රජහුගේ සොමි නම් බිසොව ගෙණ ගිය. සිටි දෙමළ පස්දෙනා පිළිවෙළින් තුදුස් හවුරුදු සත් මසක් රජය කොට සිටි කල, වලගම් අබා රජ මායා රජයේ හිඳ බල පිරිස් ගෙණ, දිව ගොස් නුවර වැද, ඒ දෙමළුන් මරා රජය ගෙණ, ලඹකාවීපයෙහි ගල්ලෙනවල පෙර තමා වල වසන කල ප්‍රයෝජන දුන, කටාර කොටවා දොළොස් හවුරුදු පස් මසක් රාජ්‍යය කෙළේ ය. බැමිණිටියා-සායක් මොහු සමයෙහි ම විය. මොවුන් දමස පන්සියයක් රහතන් වහන්සේ අලුලෙන වැඩහිඳ පොත් සඞ්ගායනා කළ සේක.

පෙර කී කලුන්නා රජ පිත් මහ චූලිගා තිස් කුමර තුදුස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. පසුව වලගම්බා රජහු පිත් චොරනාග නම් රජ අටලොස් වෙහෙරක් බුලිනුපුරා නසා, බොහෝ පව් පුරා, දොළොස් හවුරුද්දක් අධර්මයෙන් රාජ්‍යය කොට පසුව ලක්දිව් වැස්සන් විසින් නස්නා ලදු ව, ලෝඇදිරි නරකයෙහි කාලකඤ්ජක නම් මහා ප්‍රේත ව මේ කප මුළුල්ලෙහි ම ප්‍රේත දුකට භාජන විය.

ඔහු ඉක්බිති මහචූලිගා තිස් මහරජහු පිත් කුඩා තිස් නම් රජ තුන් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු අඹු අනුලා නම් බිසොවක් ඒ රජුට වස දී මරා බලත් සිවුවා ලවා එක් හවුරුදු දෙමසක් රජය කැරවූම, ඔහු වස දී මරා වඩුක නම් දෙමළකු ලවා එක්

හවුරුදු දෙමසක් රජය කැරවුව. ඔහු වස දී මරා පුරෝහිත බමුණා ලවා සමසක් රජය කැරවුව. ඔහු වස දී මරා වාසුබී නම් නැකැත්තා ලවා එක් හවුරුදු මසක් රජය කැරවුව. ඔහු වස දී මරා තොමෝ සාරමසක් රජය කළා ය.

පෙර කී සුභවිවංශයෙන් ආ කුඩ තිස් මහරජහු පින් මකලන් තිස් රජ තමා පියා තන්ට වස දී මැරූ බිසොව මරා, තෙමේ දෙ විසි හවුරුද්දක් රජය කෙළේ ය. ඔහු පින් භාතික නම් රජ රුවන්මැලි දාගැබ ඇතුළත රහතන් වහන්සේ පිරිත් බණන හඬ අසා "ඇතුළට වැද බණ අසා මුත් නො නැගෙමි" යි නිරාහාර ව, සලපතළේ වැදහෙව ශක්‍රභවනය කම්පා කොට ශක්‍රයා ගෙන්වා, ඔහුගේ සහයෙන් ධාතුගර්භයට වැද, සිත් සේ වැඳ බලා පිටත් ව, තමා දාගැබ් කුසැ දුටු තාක් ප්‍රතිමා රූප මණ්ඩපයක කරවා, රුවන් මැලි දාගැබට නො එක් වාරයෙහි පූජා කොට අටවිසි හවුරුද්දක් දැහැමෙන් රජය කෙළේ ය.

ඔහු මල් මහදැළියා මානා රජ සෑගිරියේ අම්බුලු දාගැබ කරවා ධාතු පූජා කොට, කොළොම් ගොය සිට පාදෙම පිණවිළිපිටින් හොය සෑගිරිය වඳනා ලෙස අලංකාර කොට, ලක්දිව් වාසීන් දෙන අය නො ගෙණ අනුරාධපුර නුවරට සතරදිගින් සතර සතර ගවු තැන උයන් කරවා, එහි සීනිද්ද, බෝලිද්ද, දෑසමන්, සපු, නා, දෙඹ, දුනු කේ, මැටකේ ආදි වූ සුවඳ මල්වතු කරවා තමන් කැරවූ සෑගිරි දාගැබ හා රුවන්මැලි දාගැබ හා දෙක වටා කිල හිඳුවා සුවඳ මල් තොත අග සලා දාගැබ නො පෙණෙන සේ මල්වරුසෙන් වසා, මෙසේ මහත් වූ මල්පූජාවක් කොට, සියක් යොදුන් ලංකාවීපය සිසාරා ලක්දිව මැද පටන් මුහුදු පිට යොදනක් පමණ තැන් යතා හොරු අනවකාශ කොට, තබා හොරු පිට ඇවිරි බඳමා, තැන තැන මණ්ඩප කරවා සුවිසි දහසක් මහසඞ්ඝනා මුහුදුපිට වඩා හිඳුවා, පෙරවරු මහ දන් දී තුලාභාර දන් දී, තුන් යම් රාත්‍රියෙහි ලංකාවීපය සිසාරා, එක පාන් ඇගැයක් සේ හෙළගිණෙලින් ම පාන් පූජා කෙළේ ය. මෙසේ ඒ රජ ද කුසල් කොට දොළොස් හවුරුද්දක් දැහැමෙන් රජය කොට දෙව් ලොව ගියා.

ඔහු පින් අමණ්ඩගාමිණි මහ රජ මුළු හෙළදිව අමාවලක් සේ කරවා, සතුන් නො මරණ පරිද්දෙන් බෙර ලවා, සියලු සතුන් පව් කළ නො දී පින් කොට නව හවුරුදු අටමසක් රජය කොට දෙව් ලොව ගියා. ඔහු මල් කිණිහිරිදල මහරජ බෑරජහු මරා තෙමේ තුන් හවුරුද්දක් අධර්මයෙන් රජය කොට අපායගත විය. පෙර

නී අමඬගැමුනු මහරජහු පින් කුඩ අභා මහරජ හවුරුද්දක් රජය කෙළේ ය. ඔහුනං සිංහවල්ලි නම් බිසෝ සාරමසක් රජය කළා ය. අමඬ ගැමුනු රජහු බෑන ඵළුන්නා මහරජ ඇය නෙමහව බිසෝ කොට සහවුරුද්දක් රජය කෙළේ ය. ඔහු පින් සඳමුහුණු රජ අට හවුරුදු සත්මසක් රජය කෙළේ ය. ඔහු මල් යසසිළු නම් රජ සත්හවුරුදු අටමසක් රජය කෙළේ ය. ඔහු මරා සුභ නම් බල තෙක් සහවුරුද්දක් රජය කෙළේ ය. ඔහු මරා ලැම්ණි වංශයෙන් ආ වසභ මහරජ අනුරාධපුර නුවර එකී එකී අතින් සතර සතර ගව්වෙහි යොජොස් ගවු සිසාරා මහ පවුරක් ලවා නිතුපත්පැන කොළොම්ගළු, රේරු, මාකා, කැටි, කැලි, කොළොමිනා, කැලිවසා මගුණු, අස්මඩුත්තා, රතුපුල, කළු, සිඹලැ, මිකුළු, මුගුණු, අක් මඩුත්තා යන මහවැව් සොළොසක් බඳවා, ථූපාරාමයෙහි වටදාගෙය කරවා, මේ ආදී වූ නොඑක් කුසල් කොට, බුද්ධපූජා කරවා සුසාළිස් හවුරුද්දක් රජය කොට දෙව්ලොව ගිය.

ඔහු පින් වක් නැගැ තිස් නම් රජ තුන් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු පින් ගජබාහු නම් රජ තමා දවස ලක්දිවින් මිනිසුන් කාවේරියේ මෙහෙවට ගෙනී. යනු අසා අමාත්‍යයන් ගෙන්වා විචාරා උදහස් ව, පියරජහු කැරවූ යොධයන් පන්සියයක් ඔසවා දීලක තමන්ගේ යගදාව ගෙණ, ප්‍රදක්ෂිණා කොට සමුරු පැහැර පින් බොලෙක් දිය දෙබෙ කොට පිටිපතුල් නො තෙමා සොළී රටට ගොස්, තමාගේ බල පා, කාවේරියේ මෙහෙවට ගියවුන් හරවා, එතෙන සිට, කාවේරියේ මෙහෙයට ලක්දිව් වැස්සන් නොගන්නට ව්‍යවස්ථා කරවා, බුහුදුකරය වටා රතවල් ලවා අවුත් ලක්දිව් බෙර ලවා බොහෝ කුසල් කොට දෙවිසි හවුරුද්දක් රාජ්‍යය කොට දෙව්ලොව ගියා

ඔහු පින් පුහුරැඹඩු මහලු මානා රජ සහවුරුද්දක් රජය කෙළේ ය. ඔහු පින් භාගිය තිස්ස රජ් නාගදිවයින කිරිපලු ගස මූල කිරිපලු දාගෙය කරවා, සුවිසි හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මල් චූලතිස්සරජ අටළොස් හවුරුද්දක් රාජ්‍යය කෙළේය. ඔහු පින් කුහුන්නා රජ දෑහැවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මරා කුඩනා රජ හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු බෑන කුඩ සිරිනා රජ එකුන් විසි හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු පින් වේරතිස්ස නම් රජ දෙවිසි අවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මල් අභාසෙන් නම් රජ අට අවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. පෙර කී වේරතිස්ස රජහු පින් සිරිනාග නම් රජ දෑහැවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු පින් විජසිඳු රජ සහවුරුද්දක් රාජ්‍යය කෙළේය. ලැම්ණි කඹින් ආ සහතිස්ස නම් රජ සතර හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය.

ඔහු ඉක්බිතිව දැහැම් සිරිසඟබෝ රජ නමා රාජ්‍යය කරණ කල දුර්භික්‍ෂයෙන් වැසි නො වස්නා බව දැන, තමන්ගේ ශීල තේජසින් වැසි වස්වා රුහුණු රජයෙහි රතැස් නම් රාක්‍ෂසයාගේ හයින් පීඩා වූ කල "ඔහු දක මුත් නො නැගෙති" යි පෙරෙමින් ඉවා වැදහෙව, තමන්ගේ ශීල තේජසින් ඔහු ගෙන්වා "කුමක් නිසා මාගේ රාජ්‍යයට පීඩා කෙරේ දැ"යි විචාරා "එක් ගමෙක මිනිසුන් දුනහොත් සෙසු සතුන්ට පීඩා නො කෙරෙමි"යි කීකල 'එසේ නොපිළිවනැ"යි ක්‍රමයෙන් ඔහු ගිවිස්වා "එකෙකු දුන මැනවැ" යි කී කල "මා හැර ගණ, අනිකකු නො දෙමි" යි කී කල "තුඹ වැනි ධර්මිෂ්ඨ රජකු කන්ට මා වැනි රාක්‍ෂසයන් සියයකටත් බැරි මය"යි කී කල, රජ ඔහු කෙරේ පැහැද ඒ රතක්‍ෂියාට ගමක් පාසා බිලිදෙන නියායෙන් ගිවිස්වා, ඔහු විසින් මත උපද්‍රව සන්හිඳුවා බිලිබතැ යි යන ව්‍යවහාර ඇති කොට, මෙසේ දැහැමෙන් රාජ්‍යය කොට ලැමැනි ගොළු අබා රජහු අවුත් රජය ගත් කල, ඔහුගේ බයින් රජය හැර වල්වැද, මහණ වෙසින් මායාරට කැලණි මහ වෙහෙරට ඊශානී දිග්භාගයෙහි හත්මකගලු නම් වෙහෙර වටදා ගෙය පිහිටි ස්ථානයෙහි වල සැහවී වැස "දැහැම් සිරිසඟබෝ රජහු හිස ගෙණා එකක් හට බොහෝ සැපත් දෙමි"යි ගොළු අබා රජහු බෙර ලැවූ කල, එපවත් අසා තමන් දුටු දිළිඳෙක්හට කියාතුබුයෙන් අත පැන් වත් කොට, අත මැකි දියෙන් කරවටා ඇඳ, බුදුබව පතා ඔහට හිස දන් දී, ඔහු ගෙණගිය හිස ඉදීමැ මහත් වූ හෙයින් රජු හා ඇමතියන් නොගිවිස්නා වේලෙහි ඔහු හිස අනයට දුමූ කල අගස්කුස රඳා:-

රාජා හ' මෙව සුහදෙ සිරිසඞ්ඝබෝධි
සීසප්පදත විදිනා'සම් සමිද්ධවිතෙනා
නාක්‍ෂවාසි රජ්ජසිරිලාභසුඛෙන දෙව
එසො ච නොතු පටිපන්නානහසසල්ලාභො-ති.

යන මේ ගයින් "දැහැම් සිරි සඟ බෝ රජ නම මම මැ" යි දෙවියන්ගේ බලයෙන් කැපූ හිසින් දෙස් කියවා, ඒ දිළිඳුහට බොහෝ සැපත් දෙවා දැහැවුරුද්දක් මෙසේ දැහැමෙන් රජය කොට දෙව් ලොව ගිය

ඒ ගොළු අබා රජ ඔහු කෙරේ පැහැද හිස දන් දුන් තැනට අවුදින්, එතන වට දා ගෙයක් කරවා, මහත් වූ පූජා කොට, නැවත අනුරාධපුර නුවර ගොස් ලෝවා මහ පායෙහි පස්මහලක් කරව තෙළෙස් හවුරුද්දක් රජය කොට දෙව්ලොව ගිය.

ඔහු පිත් කලකෑන් දෙම තිස් රජ නැගී පියරජහු සාධා ගත තුහුනු ලේ ලැමෑස්තන් සැවදෙහකු අල්වා මරා උල හිඳුවා, රජය ගෙණ, එකාතපත්‍ර කොට පියාතත් කරවා තො නිමි ලෝවා මහ පායෙහි තුබු සතරමහල නිමවා කොත් පලඳවා මහපූජා කොට, හෙළුග්ගමු, මහටබු, දෙමටෑ පිසත්නා, වඩුනමු, බමුණුගමු යන මහ වෑවු සයක් බඳවා; පැඳුලා පිරිවෙණ, මූල්ගිරි වෙහෙර, බඳුලු වෙහෙර, එළිගල් වෙහෙර යන මහාවිහාර සතරක් කරවා මහත්වූ පූජා කොට, මෙසේ දස හවුරුද්දක් දැහැමින් රාජ්‍යය කොට දෙව් ලොව ගිය.

ඔහු මල් මහසෙන් රජ රජ ව යකුන් අතින් ද මෙහෙ ගෙණ මිනිහිරි වෑම බඳවා, කරගහෑ මිනිහිරි වෑවට දිය යන ලෙසට අමුනු බඳවා, දෙවියන් පෑ සලකුණෙන් තලවතු ඇල හිඳුවා, දිය පාවා' විසි දහසක් කුඹුරු කිරි කරවා, දෙනා නකයෙහි සඞ්ඝයාට දන් වරෑ සපත්කොට ලවා; තෑමත: මූවගමුව, සුරුල්ල, කැණදිය, දෙර මහමිණිය, කොත්කාදතවු, සකුරොබොරු, රත් මල්තබ, තවුඩු මාහලු, සූළුගලු, සලවාණ, කිඹුල්වාණ, හැටූප්, මාදරගලු, වෙලන් පිටි, වඩුන්න, සිරුවලා, රත්තියෑ, මිනිහිරි ඇතුළුවූ මහවෑවු සහ ලොසක් යකයන් හා මනුෂ්‍යයන් අතින් මෙහෙ ගෙණ බඳවා දෙනානක නම් මහ සෑය බඳවා ධාතු තැන්පතෙන් දෙවියන්ට අසද ආකාශය බැලී ය. එ කොණෙහි දෙවියෝ අප බුදුන් බැඳි පටි ධාතුව ගෙණ ආකාශයෙහි එල්වා පෑහ.

රජ සතුටුව පටි ධාතුව වැඳ දෙනොත දිගු කෙළේ ය. දෙවියෝ මිඳක් ඔසවා පෑහ රජ ද මිඳක් අත ඔසවා පැලීය; තව ද: රජහු වෙහෙසනු නිසා ඔසවා ගත්හ. තව ද එසවි රජ අත දිගු කෙළේය. තව ද ඊටත් වඩා දෙවියෝ ඔසවා පෑහ එකල රජ කිපී කඩුපත හයා ඉස සිසාරා අසූ රියනක් අහසට පැන පටිධාතුව මැදින් පොලු හත. දෙවියෝ අත තුබූ අත් දෙව්ලොව ගෙණ ගියහ එ රජ තමා කපා හැර ගත් පටිධාතු අඩ මහ පූජාවෙන් ගෙණ ගොස් දාගබ පිහිටුවා මහත් වූ පූජා කොට, සත්විසි හවුරුද්දක් රාජ්‍යය කොට දෙව්ලොව ගිය. විජය රජු පටන් මේ මහසෙන් රජහු අවසන් මහා වංශයෙහි වොටූනු පලන් රජ දරුවෝ තෙසැට දෙනෙක් වූහ යි දතයුතු මෙ මහවංස කෙළවරව අප බුදුන් පිරිනිවි අවසිය සූසාළිස් හවුරුදු නවමස් පස්විසි දවසක් ගියේ ය යි දතයුතු.

ඉක්බිත්තෙන් සුළු වංශයට ආදියෙහි මහසෙන් රජහු පිත් කිත්සිරිමෙවන් රජහු රජය ලත් නවවන්නෙහි දඹදිව කාලිඟුරට දන්තපුරයෙහි ගුහසීව නම් රජහු ද රන්මාලි නම් කුමරිය හා

දන්ත නම් රජකුමරුවා හා දෙමහල්ලෝ වෙස් වළා බමුණු වෙස් ගෙණ දළදා වඩා ගෙණවුත් ශ්‍රී ලඞ්කාද්වීපයට බෑස රජහට දැන්වූහ. රජ දළදා දුටු ප්‍රාතිහාර්‍ය්‍යයෙහි පැහැද එ කෙණෙහි මුළු ලක්දිව දන්තධාතුවට බුදුන් උදෙසා පූජා කොට, තුන්දා දෙර වඩා අප්‍රමාණවූ මහත් පූජා කොට අටවිසි හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මල් දෙටතිස් රජ දළකඩ, සඳුන්දඬු, කිරිසලායෙන් තමා සිය අතින් පිළිම තනා, මිනු ලංකාමට ඇඳුරු, කමට තබා, නටබුන් වෙහෙර හැම කරවා, ලෝවැඩ කොට නව හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය.

ඔහු පිත් බුජස් රජ ලක්දිව දස ගම්කට වෙදකු තැනැත්තකු, බළිබතකු, බණ කියන පණ්ඩිත යෙකු බැගින් ඇති කරවා ලෝවැඩ කොට අනුරාධපුර නුවර මහවෙහෙර පස්විසි රියන් ජ මහල් පමණ ඇති තිල් බිත්ති, හිල්පදනම්, තිල් සෙවෙනි ආදීන් මයූරාකාර වූ මොනර පා නම් මහපායක් කරවා, සාංඝික කොට පිළිගන්වා සඟ පන්සියයකට තිති දන් දෙවා, ගොළුගම්, මහණගම් දන්වරු පෙත් කරවා මේමොනර පා පිරිවෙණ ආදිවූ බොහෝ සඞ්ඝාරාම කරවා, බුදුබව පතා, එකුන්තිස් හවුරුද්දක් දුහැමෙන් රාජ්‍යය කෙළේය. ඔහු පින් උපතිස්ස නම් රජ පලාවතු පිරිවෙණ කරවා, තෝපා වැව බඳවා දෙසාළිස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මල් මහානාම නම් රජ දෙවිසි හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. එ කල බුද්ධඝොෂ නම අටුවාචාර්‍ය්‍යක් වහන්සේ දඹදිව සිට මේ ලඞ්කාද්වීපයට වැඩ, බුදුන් වදාළ දෙලක්ෂ පන්සැත්තෑදහස්දෙසිය පණස්ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට, තුන් ලක්ෂ එක්සැට දහස් සත් සිය පණස් ග්‍රන්ථ සඞ්ඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැඟුයේකැයි දතයුතු.

මේ මහානාම රජහු නො සමාන දරු වූ සෙන් ගොන් රජ පෙරවරු රජව, දවල් සභා රදුන් විසින් දුන් විෂ කා පස්වරු මළේය. සභා රදුන් බිසෝ කොට ලැමැණි තිස් රජ හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහුට ඉක්බිතිව මිත්සෙන් නම් කරල් සොරෙක් රජය ලදින් දවසෙක දළදා වඩිනට ගොස් නැවත රජගෙට එනුයේ දළදා ගෙසි දෙර සිට ''මඟුලැතු ගෙණෑ''යි කී ය. ඇමැතියෝ මඟුලැත් පසු වී ය, මදක් බලව මහරජැ''යි කීහ. එබසට රජ කිපී, ඵලින් සුත්තෙන් බැඳි නැඟු මහ ඇත් රුවක් බලා 'තෝ මට පිට නො දෙහී දැ''යි කී ය. එ කෙණෙහි ළළ ඇත් රජු කරා අවුදින් පිට සිඳුවා නුවර පැදකුණු කොට රජු ගෙසිලා ගියේ ය. මෙසේ වූ ආශ්චර්‍ය්‍යක් ගිය ජාතියෙහි සිත පහදවා පිදූ

එක මිලෙකින් ලදක යි දත යුතු. මෙසේ ඒ කරල් සොර රජ හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. එ කල සොළී රටින් දෙමළ සදෙනෙක් බලසෙන් ගෙණ ලක්දිව් බැස ඒ කරල් සොර රජහු මරා පිළිවෙළින් වෙන වෙන ම සත්විසි හවුරුද්දක් රාජ්‍යය කළහ.

එ කල දාසෙන් කෑලි නම් රජ කුමර සසුන් වැද මහණ ව, වෙස් වළා මෑඩී, සිවුරු හැර මායා රට බලසෙන් ගෙණ, නුවරට ගොස් පසු ව රජ කරණ දෙමළා මරා රජ ව, කලාබලලු, කෙල වසා බදුලු, කාළුත්සරු, දතා, වැල්ලා, උදන්මිපි, පණාගමු, මාතා, මිහුකිත්විනී, මහබඹරු, සංගමු, සුරුලුමිහමිදලා, මිහළුළි, ආදී අටළොස් මහ වැව් බඳවා, අටළොස් මහා විහාරයක් කරවා, අටළොස් මහා පූජාවක් කොට, අටළොස් හවුරුද්දක් දැහැමෙන් රාජ්‍යය කෙළේ ය. ඔහු නො සමාන දරු සීගිරි කසුබු රජ පිය රජහු මරා, සීගිරි ගල කරවා, එහි වැස, අටළොස් හවුරුද්දක් අධර්මයෙන් රාජ්‍යය කොට කපක් කල් දුක් දුග් ගන්නා අවීචි මහා නරකයෙහි හිඳ. එ ම දාසෙන් කෑලි රජහුගේ සමාන දරු වූ මුගලන් රජ සීගිරි රජහුගේ භයින් දඹදිව් ගොස්, බලපිරිස් ගෙණ ලක්දිව් බැස පියරජහු මෑරූ සීගිරි කසුබු රජු මරා, අටළොස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු පිත් කුමර දස් රජ මහ පණ්ඩිත ව, නව හවුරුද්දක් රාජ්‍යය කොට කාලිදාස නම් සහලුවා මිල දා තෙමේ ද ගිනි වැද පරලොව ගියේ. ඔහු පිත් කීර්තිසේන නම් රජ ද නව හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මරා ලැමැණි උපතිස් රජ එක් හවුරුදු දසමසක් රජය කෙළේ ය. ඔහු මහසිල් මැඩිසිවු රජ බෑනා මරා පස්විසි දවසක් රජය කෙළේ ය. ඔහු මරා ලැමැණි අඹහෙරණ සලමෙවන් රජ තෙළෙස් හවුරුද්දක් රජය කෙළේ ය.

මේ රජහු දවස දම් ද දඹදිවින් ආව යි දත යුතු. ඔහු පිත් දාපුළුසෙන් රජ සමසක් රජය කෙළේ ය. ඔහු මරා බෑනා දළ මුගලන් නන් රජ විසි හවුරුද්දක් රජය කෙළේ ය. ඔහු පිත් කුඩ කිත්සිරිමෙවන් රජ එකුන් විසි හවුරුද්දක් රජය කෙළේ ය. ඔහු මරා ඔකාවසින් ආ සෙනෙවි මානා රජ තුන් හවුරුද්දක් රජය කෙළේ ය. ඔහු මරා ලැමැණි සිහාන් සලදළනාවෝ නව හවුරුද්දක් රජය කෙළේ ය. ඔහු මරා මානා රජහු බෑනා අග්බෝ මහරජ කුරුඳු වැව බඳවා මානාරද පිරිවෙණ කරවා සුතිස්හවු, රුද්දක් රජය කෙළේ ය. ඔහු දවස දැහැමි මහතෙරහු සුතත් වදාළහ යි දත යුතු. දැමි තමල්, බෑබිරි අනුරුත් දළ ගොත් සූරියබාහු, පුරවඩු, දළ සල කුමර, කිත්සිරි, කසුබි කොට ඈපා ය යි ගත මේ දෙළොස් මහා කවි ම මේම මානා රජු දවස වූහ.

මොහු බෑන කුඩා අග්බෝ රජ ගගතලා, ගිරිකලා, ගොංවටු කෙරළු, ඹාංමොඹු, සිරුවිලා, සකැපිය, එබෙරගලු, සළුත්තරු, මහ උදලු, කැත්ගමු, මාදූත, කලම්මැවි, ආදී වැව් තුදුසක් බඳවා ගග විට වෙළුන්නා වෙහෙර කරවා මහත්වූ පූජා කොට දශ හවුරුද්දක් රජය කෙළේ ය. ඔහු මල් සඟතිස් රජ දෙමසක් රජය කෙළේය. ඔහු මරා ලැමැණි බෝනා මුගලන් සහවුරුද්දක් රජය කෙළේ ය. ඔහු මරා අසිගහක රජ නව හවුරුද්දක් රජය කෙළේය. ඔහු පිත් සිරිසඟබෝ රජ සොළොස් හවුරුද්දක් රජය කෙළේ ය. ඔහු පරදෙසට තෙරා ලැමැණි කඹුර දෙටතිස් රජ පස් මසක් රජය කෙළේ ය. නැවත සිරිසඟබෝ රජ පරදෙසින් බළ පෙරළා ගෙණ නැර දෙටතිස් මරා රජය ගති. ඔහු මරා ලැමැණි දළුපතිස් රජ පලාවතු වෙහෙර කරවා පූජා කරවා දෙළොස් හවුරුද්දක් රජය කෙළේය. ඔහු මරා සිරිසඟබෝ රජහු මල් පැසුළු කසුබු රජ නම හවුරුද්දක් රජය කෙළේය.

නැවත ඔක්කාක වංශයෙන් ආ ශුපුලු නම් රජ් රුහුණින් අවුදින් අනුරාධ පුර නුවර හිඳ නැවත රුහුණු වෙහෙර පිළිම වෙහෙර, කිරොල, බෙරගල්, විඩුත්තා, කොටදෙර, පවුරණ, සම්බෙගමු, පාඩික්කුලම්, කසගලු, දළ කසුප් ගිරි, පෙහෙර ගම්, කප් කදුරු, කෙවිල්ලගම්, කුඹන, වෙරළුගිල්, පූල් කවුඩු, මහ දිවුළු ලියල්, යන මේ එකුන් විස්සක් පමණ රජමහා විහාර කරවා තුන් හවුරුදු තුන් මසක් රජය කෙළේ ය. නැවත ලැමැණි දළුපතිස් නම් රජ කපාරා පිරිවෙණ කරවා නම හවුරුද්දක් රජය කෙළේය ඔහු බෑ සිරිසඟබෝ රජ පියන්ගල් පිරිවෙණ කරවා, දෙව්නුවර කරවා, දෙව්රදුන්ගේ සහායෙන් සොළොස් හවුරුද්දක් රාජ්‍යය කෙළේය.

ඔහු ඉක්බිති ව ඔක්කාක වංශයෙන් ආ වල්පිටි වැසි දත්ත මහ රජ දෑහවුරුදු සමසක් රජය කෙළේය. ඔහු ඉක්බිතිව හුනන්නරු රියන් දළ සමසක් රජය කෙළේය. පෙර කී පැසුළු කසුබු රජානන් දරු මහලැපාණෝ පර දෙසට ගොස් කාවට්ටි රටින් බළසෙන් ගෙණ අවුත් හුනන්නරු රියන්දළු මරා, රජය ගෙණ, උතුරළමුල වාදූමුල කපුගම පිරිවෙන්, දෙමටගල්, අළගිරි, සත් වැලිස උතුරු පිරිවෙන් කරවා දෙව්නුවර කරවා, පන්තිස් හවුරුද්දක් රජය කෙළේය. ඔහු පිත් අග්බෝ රජ සහවුරුද්දක් රජය කෙළේය. ඔහු මල් කසුබු මහ රජ හෙලගම පිරිවෙණ කරවා සත් හවුරුද්දක් රජය කෙළේය. ඔහු මල් මිදෙලි රජ තුන් හවුරුද්දක් රජය කෙළේය. ඔහු බෑ දරු අග්බෝ රජ සතළිස් හවුරුද්දක්

රජය කොළේ ය. මිදෙලැපානන් දරු කුඩා අග්බෝ රජ සහවු රුද්දක් රජය කෙළේ ය. අග්බෝ රජුන් දරු සලමෙවන් මිහිඳුරජ බලාත්කාරයෙන් රජය ගෙණ විසිහවුරුද්දක් රාජ්‍යය කෙළේය. ඔහු ඉක්බිති උදා මහරජ පස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු ඉක්බිති ම හැළිගැරවිල් හිය කෑ සොම්හිළු රජ සතර හවුරුද්දක් රජය කොළේ ය. ඔහු ඉක්බිති අග්බෝ රජ එකොළොස් හවුරුද්දක් රාජ්‍යය කොළේ ය. ඔහු මල් දපුළු මහරජ මහ බෝ ගෙය කරවා රන් බුදුන් කරවා, මහත් වූ පූජා කොට සොළොස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු දරු අග්බෝ මහ රජ පස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මල් සෙන් මහරජ ගිරිගල මිණිමෙවුලෑ පාය ද කරවා, දෙනා වෙහෙර මිණිපා පිරිවෙණ කරවා, සගරම් අරම් කරවා, සංඝසන් පිරිවෙණ කරවා, මහත් වූ පූජා කොට විසි හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. මොවුන් දවස ද අනුරාධපුර කුමර පැහැර ජයබෙර මිණිපා ගෙණ ගියහ.

ඔහු මල් මුගසින් වැසි සෙන් නම් මහරජ ශ්‍රී ලංකා වීපයෙහි සිංහල බලසෙන් ගෙණ දිව ගොස් පඬිරජය පැහැර, පාඬින් ලුහු බඳවා ජයබෙර මිණිපා ගෙණවුත්, ලෝවා මහපාය කටු කොටොල් පෙරළවා, එහි රන් බුදුන් කරවා, තුන් නිකය දහම් ගන්වා, ලෝසපුන් සෙමෙහි තබා, පන්තිස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මල් උදා මහරජ රුහුණු රට මහතුඹරුප් වෙහෙර කරවා, රන් රිදී පතින් වසා, නොඑක් පූජා කොට, එකොළොස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු ඉක්බිති කසුප් මහරජ තුන් නිකා ගෙයි සලපිළිමගෙව රන් පේසත් කරවා, බගිරි නිකා මහසැය බඳවා කුඹා කපාරා මහකපාරා පිරිවෙන් කරවා, මහත් වූ පූජා කොට සතළොස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු ඉක්බිති කසුබු රජ දසහවුරුද්දක් රජය කෙළේ ය.

එ කල ඔහු නං සගා රදූ නම් බිසෝ ලෝවා මහ පාය කටු කොටොල් පෙරළවා කොත් පැළඳවූහ. පසුව දපුළු නම් කුමර සත් මසක් රජය කෙළේ ය. ඔහු මල් කුඩා දපුළු නම් කුමර සොළී රටින් ආ දෙමළුන් මරා ලුහුබඳවා දොළොස් හවුරුද්දක් රජය කෙළේ ය. මොවුන් ආශයන් උදා මහරජ අට හවුරුද්දක් රජය කෙළේ ය. මොහු මල් සෙන් නම් රජ තුන් හවුරුද්දක් රජය කෙළේ ය. ඔහු ඉක්බිති උදා මහ රජ තුන් හවුරුද්දක් රජය කෙළේ ය. පසුව සෙන් නම් මහ රජ නව හවුරුද්දක් රජය කෙළේ ය. ඔහු පින් සෙන් නම් මහරජ තුන් හවුරුද්දක් රජය

කෙළේය. ඔහු අයාමෙන් කුඩා මිහිඳෙල් රජ සොළී රටින් හුරා පෑතාටට බට දෙමළ රජකු හා මහසෙනගක් සාඩා, සොළොස් හවුරුද්දක් රජය කෙළේ ය.

ඔහු අයාමෙහි සලමෙවන් රජ රජ ව මහ මලුන් මරවා, ඔහු බෑ කෙත්සෙනෙවි රදුන් දඹදිව් ගොස් සහානුදහසක් පමණ දෙමළ බල පිරිස් ගෙණ, ලක්දිව් බෑස ඔවුන් හා යුධ කොට කො.ට දස හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මල් මිහිඳු රජ අවසාළිස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු පිත් වික්‍රමබාහු රජ පිය රජහු සමයෙහි ලක්දිවට බෑස පුරා හුන් දෙමළ බල පිරිස් මරා, දිව පිට කාංචා රුහුණෑ හිඳ, දොළොස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය පසුව මහලේ රජ තුන් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. පසුව වික්‍රම පාඬි නම රජ තුන් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය ඔහු ඉක්බිති ජගත්පාල නම රජ සතර හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු අයාමෙත් පරාක්‍රම පාඬි නම රජ හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. එ කල සොළී රටින් පසානුදහසක් දෙමළ නැවත ලක්දිව් බෑස ලොකා ශාසන නැසුහ. එ කල ලෝකේශ්වර නම සෙනෙවි ලක් දිව රජුන් නැත්තෙන් රුහුණෑ හිඳ යුධ කොට සහවුරුද්දක් රාජ්‍යය කෙළේ ය.

පෙර කී සලමෙවන් රජහට දෙවන දූරුතු පුර හැටවක පමත් ඒ ලෝකේශ්වර සෙනෙවියන්ගේ සහවුරුද්ද ඇතුළු ම සහානු දහසක් පමණ සොළී රටින් ආ සොළීන්ට වසග වූ දෙමළුන් කිඹි ම තුබූ ලංකාවිපයෙහි, මහලු විජයබාහු නම රජ පැනනැගී ලක්දිව හුන් දෙමළුන් මරා ලුහුබැඳ, තුන් රජය එකාතපත්‍ර කොට මලුකම් කරවමි යි මුළු ලක්දිව ගණපූරණයට පමණ සිල්වත් භික්ෂූන් නැති හෙයින්, දෙමළුන් විසින් තව ශාසනයෙහි උපන් මහත් වූ, කරුණා ඇති ව, රජ වැලප, ලක්‍ෂගණන් මුතුමැණික් අරමණයට යවා, අරමණයෙන් සිල්වත් සථවිරයන් විසි දෙනකු ගෙන්වා, ආගමය ද, ගෙන්වා, මලු කම් කරවා දහස් ගණන් භික්ෂූන් ඇති කරවා, ලක්දිව මුළුල්ලෙහි නටබුන් වෙහෙර සසුන් කරවා, අප්‍රමාණ වූ ශාසන මැඩ, ලෝවැඩ කොට, රාජනීතිය ලෝකනීති නො වරදවා, පුපණස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු මල් විජයබාහු රජ තුදුස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. ඔහු අයාමෙන් මහලු විජයබාහු පිත් වික්‍රමබාහු රජ අවවිසි හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. පසු ව කිත්සිරි මෙවන් රජහු පිත් මහලු පරාක්‍රම බාහු නම මහ රජ තෙමේ වොටුනු

පැලඳ රජකම් පත් ව, මලගම්බා රජයෙහි පවත් භින්න නිකාය ව, තුබූ ශාසනය සමඟ කොට, පොළොන්නරුවේ සැඟිරියේ අට ආයතනයට මහපාය කරවා මහපිළිම ගෙය, හොත්පිළිම ගෙය, රන්වන් සුළුවාදෙනි ගෙය, පැන් පැල් දෙරටු දාගබ් සීමා පවුරු කරවා, බොහෝ මහ සඞ්ඝයා වස් වස්වා හෙරණ පැවිදි කරවා, අට ආයතනයට ම පොළොන්නරු වරුපෙතින් වටනා පස ලවා, එහි ද මහදන් පවත්වා පූර්වාරාම දක්ෂිණාරාම පශ්චිමාරාම උත්තරාරාම, කපිල, ඉසිපතන, කුසිනාරා, වේළුවන, ලඞ්කාතිලකය, ත්‍රිවංකය, ඇතුබඳලෙන ආදිවූ මහා විහාර කරවා, එහි ද මහ දන් පවත්වා,

පොළොන්නරුවෙහි තුන්දහස් පන්සියක් පමණ මහ සඟනට නිති දන් පවත්වා, සොළීන් දවස බිඳි රුවන්වැලි මහසෑය, දෙනානකය, ශගිරි නකය, ථූපාරාම බඳවා, කොත් පලඳවා, අනුරාධපුර නුවර බොහෝ විහාර මුල්මිස කරවා, කටුකොහොල් පෙරළවා, සලපිළිම ගෙය ද කටුකොහොල් පෙරළවා ශ්‍රී මහා බෝධීන් වහන්සේට බෝධි ගෙය ද කරවා, ලෝවා මහපායට පටන් ගෙණ භාගයක් කරවා, මහා සමුද්‍රය, බෑන සමුද්‍රය බති සාගරය ඇතුමල වැව කදුරුවඩුන්නා වැව පඩැ වැව යන මහ වැව් සයක් බඳවා අවිරවති ඇල බිඳුවා, "ලක්දිවට නො එක් වාරයෙහි බැස ලෝක ශාසනය නසන හෙයින් ඒ ඒ දෙශවල මිථ්‍යාදෘෂ්ටි ගත් රජුන්ට උදෙසෙට දඹදිව ද ශාධා සම්‍යග්දෘෂ්ටි ගන්වම්"යි සිතා ලක්දිව මුළුල්ලෙහි සිංහල මහ සෙනඟ ගෙණ දඹදිව් තීක්මි, මහ සඞ්ඝයා යා නො දෙන හෙයින්, තුමූ රඤ්ඤ සියයෙන් දසදෙනා බැගින් තෝරා, සූ විසි ලක්ෂ පස්විසි දහසක් පමණ සිංහල යොධයන් දෙශාන්තර යමා, සොළී පාණ්ඩි රජයෙහි පටන් අරමණය දක්වා යුද්ධ කරවා, ගිය ගිය තන්හි ජය ගන්වා, ප්‍රදෙශවාසීන් සිංහලයට බන්නා තබා, තමන් තමන්ගේ දෙශයෙහි භය ගෙණ ගෙණ ම හිඳිනා සේ, මෙසේ දඹදිවට ද අණසක පතුරුවා, හවුරුදු පතා මලුතමින් දලඳා පූජාවක්, තුලාභාරයක්, වෙසක්කෙළියක්, දියකෙළියක් යනාදි වූ සුසැට මඟුල් කොට, දම්ස් පතා පෙත්තක්, පිළිමයක් සළු අට පිරිකරක්, බැගින් නො වරදවා දී නෙතිස් හවුරුද්දක් රාජ්‍යය කොට බුදුන් උදෙසා අප්‍රමාණ වූ පූජා කෙළේ ය.

පසුව ඔහු බෑන ෂණ්ඩිත විජයබාහු රජ හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. කාලින් කෙස් ද මිගිඳ, දිපහා නම් එබෙර දුම් තීසා ඔහු මරා, තෙමේ පස් දවසක් රාජ්‍යය කෙළේ ය. ඔහු මරා කාලිඞ්ගයෙන් ආ කීර්ති නිශ්ශංක නම් රජ පොළොන්නරුවෙහි

රුවන්මැලි දාගැබ බඳවා, කොත් පලඳවා, දළදා මළුවෙහි ශෛලමය දළදා ගෙය සැට පැණකින් කරවා නිමවා, එහි ම වටදා ගෙය කරවා, බලසෙන් සමගින් සමනොළ ගොස් බුදුන්ගේ ශ්‍රීපාදය වැඳ, ලක්දිව වටා තමා නමින් අරම් අම්බලම් කරවා, දඹුලු වෙහෙර රන් පත් ගස්වා, නෙ සැත්තෑවක් මිහ පිළිම රන් ගාවා නිමවා, රන්ගිරි දඹුල්ල ය යි නම් තබා, බොහෝ පින් රැස්කොට නව හවුරුද්දක් රජ කෙළේ ය. මොහු පින් වීරබාහු රජ රෑ රජ ම අලුයම් කාවුරු සෙනෙවිරත්හු විසින් මොහු නො ශමාක දරුවන ගී මරවනලදු වි ය. පසු ව වික්‍රම බාහු රජ් තුන් අවුරුද්දක් ම රජය කළේ ය. ඔහු මරා තිසසඛක රජහු බෑනා චෝඩගංග රජ නව සක් රාජ්‍යය කෙළේ ය.

පසු ව කිත් සෙනෙවිරද් එ රජහු ඇස් උදුරුවා පහකොට මහලු පරාක්‍රමබාහු රජහු අගබිසෝ ලීලාවතී නම් බිසෝවුන් ලවා තුන් හවුරුද්දක් රජය කැරවි ය. පසුව ඛකාවසින් ආ සාහසමල්ල රජ දූහැවුරුද්දක් රාජ්‍යය කොළේ ය. පසුම එළලු ආබෝ සෙනෙවිරද් එ රජහු පහකාම තිසසඛකා මහරජහු අගබිසෝ කල්‍යාණවති නම් බිසෝවුන් ලවා සහවුරුද්දක් රජය කැරවි ය. පසු ව ධර්මාශෝක නම තුන්මැසි රජ කුමරුවෙක් හවුරුද්දක් රජය කෙළේ ය. පසු ම ඇණිගඟ නම් රජ දඹදිවින් බලා පෙරලා අවුත් ලක්දිව බැස, පොළොන්නරු ගෙණ නම් පුතු ධර්මාශෝක නම් රජකුමරු නා ඒ එළලු අක්බෝ සෙනෙවි රදුන් මරා තොමේ සතළොස් දවසක් රජය කෙළේ ය. පසු ව මොහුගේ මැණික් නම් සෙනෙවිරද් ඔහු මරා පෙර රජ කළ ලීලාවතී නම් බිසොවුන් ලවා හවුරුද්දක් රජය කැරවි ය. පසු ම ලෝකේශ්වර නම් රජ පර දෙසින් දෙමළ පිරිස් ගෙණ කඳවුරු ගෙණ පස් මසක් රාජ්‍යය කෙළේ ය. පසු ව ලීලාවතී නම් බිසොවු සත් මසක් රජය කළා ය. ඔවුන් පහකොට පාඬිරටින් බලසෙනඟ ගෙණ පරාක්‍රම පාඬි රජ තුන් හවුරුද්දක් රජය කෙළේ ය.

පසු ම ලංකාවාසීන්ගේ කිසි යම් දරුණු වූ අකුශල කර්මයක් හේතුකොට ගෙණ, ලක්දිව මහේශාක්‍ය ආරක්ෂක දෙවියන්ගේ කිසි යම් උපෙක්ෂාවක් විද්‍යමාන කල්හි අබෞද්ධයන්ගේ උත්සන්න භාවයක් පහළවූ කල්හි, මාඝ රාජ නම් කාලිංග රජ සුවිසි දහසක් මලල සෙනඟ ගෙණ ලක්දිව් බැස, කඳවුරු නුවර ගෙණ පාඬි රජහු ඇස් උදුරුවා, ලෝකශාසනය නසා, රුවන්මැලි මහසෑය බිඳුවා, සෙසු දහස් ගණන් දාගැබ් බිඳුවා, නො එක් ශ්‍රද්ධාවන්ත රජුන්ගේ චෛත්‍යය නමැති කීර්ති ශරීරවල, කොත් නමැති

වොටුනු හා රුවන් නමැති හෘද්මාංස ගෙණ, ධාතු නමැති ජීවිත අන්තර්ධාන කරවා සඞ්ඝාරාම, ආයතන්, මහපා, දෙමළුන්ට වාසස්ථාන කරවා, ලක්දිව කුලස්ත්‍රීන්ගේ ජාති සම්භේද කොට, කුලදරුවන් සිමැසි කරවා, සිරිලක මිථ්‍යාදෘෂ්ටි ගන්වා, සුඛිත යන්ගේ ධන විචාරයෙන් හස්ත පාදාදි ඡේදනයෙන් විකාරයට පමුණුවා, ලඞ්කාද්වීපය ගිනි ගත් ගෙයක් සේ, කරවා, ගම් ගම් දෙමළුන් ලවා කොල්ලකවා බලාත්කාරයෙන් එකුන් විසි හවුරුද් දක් රාජ්‍යය කෙළේ ය.

මෙසේ ලක්දිව නට තල්සි යට කී මහබෝ වඩා ආ සිරිසඟබෝ වංශයෙන් ජාත නැගී ආ විජයබාහු නම් රජ මායා රජයෙහි හිඳ වැඩි, අන්ධකාරයෙහි තේජෝ කඳක් සේ පැන නැගී සිංහල බල පිරි යක් ගෙණ දෙමළ හසින් ඒ ඒ තැන්හි මහ වන්නිවල වසන, බලි සිංහලයන් තමනට වසඟයන් ගෙණ, අවසහයන් සාධා, ගම් ගම හුන් දෙමළුන් පොළොන්නරුවෑ දක්වා මරා ලුහුබැඳ මායා රජය නැන්කොට, එහි ජම්බුද්‍රෝණි නම් පුරයක් කරවා, එහි හිඳ රජය කරන්නාහු, දෙමළ අරාජිතයෙහි පොළොන්නරුවෙන් දළදා-පාත්‍ර ධාතු ගෙණ, මහ ගල් වල් නැගී, එයින් රැකලිය නො හැකි හෙයින් කොත්මලයෙහි භූමිගතව නිධාන කොට, කෝළ පෑඩි රජරට පලා ගිය මහාස්ථවිර ගණයා හා මහසඞ්ඝයා මායා රජයට ගෙන්වා, දළදා-පාත්‍ර ධාතු නො නට පවත් අසා, අතිසන්තොෂ ම එ කෙණෙහි ම ස්ථවිර ගණයා හා මහ සෙනග ගෙණ මහත් වූ පූජා උත්සවයෙන් කොත්මලයට ගොස්, දළදා-පාත්‍ර ධාතු ගෙණ සත්රුවන් මිණිරුවන් ලදුවා සේ උදාර වූ සන්තොෂයෙන්, ගම ගම් මහත් වූ පූජා කරමින්, වඩා ගෙණවුත්,

“මතු අරාජිතයෙක පරසතුරන්ගෙන් පීඩාවක් නො වන සේ දළදා ස්වාමීන්ට ක්ෂෙමස්ථානයක් කරමි” යි සිතා බෙලිගල සිසාරා පවුරුපදනම් වාසලින් සුරක්ෂිත කොට ආකාශයෙන් විනා මනුෂ්‍ය කෙණකුන් වැද්ද නොහැකි සේ ඉතා කෂම කොට, පර්වත මුදුනෙහි දෙව්ලොවින් බට විමානයක් සේ අසමාන වූ දළදාගෙයක් කරවා සිසාරා රත්පත්, සුළුපා, මහපා, චංක්‍රමණ, මණ්ඩප, පැන් පොකුණු ආදි වූ සංඝාරාමයන් කරවා, මහත් වූ මඞ්ගල්‍යයෙන් දළදා සවාමීන් එ ගෙට වඩා, දන්තධාතු ආරක්ෂාවෙහි නියුක්ත වූ ස්ථවිරගණයාට සංඝාරාමය පිළිගන්වා, දිනවාත්ති කරවා දවස් පතා පූජා පෙරහර කරණ සේ ව්‍යවස්ථා කොට රජගෙන්-බුදුන් ගෙන් සම සම්ගෙහි රකවල් ලවා අප්‍රමාණ වූ පූජා කළෙය.

දෙවනු ව ශාසනොපකාරයට පටන් ගෙණ, ලක්දිව පොත්පත් දෙමළුන් නැසූ හෙයින්, සංඝයාගේ අකුරු පමා පමා සේ දුක අසා බුදුන්ගේ සුවාසූදහසක් ධර්මස්කන්ධයට සුවාසූදහසක් මිසුරන් පුදා, ගම් ගම් කුලියට පොත් ලියන යෝ නියෝග කොට, ලක්දිව මහ සංඝයා රැස් කොට බොහෝ දවසක් අසමඟ වූ සංඝයා සමඟ කොට, මිලුකම් කරවා මහත් වූ පූජා කොට තුන් රජයෙහි සියලු සංඝයාට ම නො වරදවා අටපිරිකර දී, සද්දම්සක් මලුකම් පූජා කොට, තව ද, තමන්ගේ නමින් විජයසුන්දරාරාම නම් වූ ආරාමයක් කරවා, සාංඝික කොට පිළිගන්වා, මහත් වූ, පූජා කොට, 'අකුරු කරණ සංඝයා ප්‍රත්‍යයක් නිසා දුක් නො ගන්නේ ය මා ගෙදොරට ම සිඟා වඩනේ ය" යි ආරාධනා කරමින්, වැඩි වැඩි දහස් ගණන් සංඝයාට දවස් පතා දොර දන් දී, සළුපිරුදි මහා සළුපිරාදි සළුකාන් කරප්‍රාප්තකකට දම්ස් පතා දන් වසුන් නවා දී, බොහෝ සංඝයා අකුරු කරවා ශාසන සංග්‍රහයෙක් තුණුරුවන් පිදූහ.

තව ද: වත්තල තමන් නමින් විජය බාහු නම් රජ මහා විහාරයක් කරවා පිළිගන්වා, කැලණි වෙහෙර දෙමළුන් විසින් නට මහසෑය බඳවා, කොත් පලඳවා, එහි ම වූ පූජා මාසල මුල්පිස කරවා, සෙසු ජරාවාස කටුකොහොල් පෙරළවා, එසේ ම මායා රජයෙහි සියලු ජරා අවස් පෙර තිබූ පරිද්දෙන් ම නව කර්මාන්ත කරණ සේ නියෝග කොට; තව ද: තමන් ලෝකශාසන ප්‍රතිෂ්ඨාපනයෙහි මහත් වූ අභිලාෂා ඇති ද, ගිය සොවුන් කාලයෙහි රජය ලත් හෙයින් ද්‍රවිඩ යුද්ධ කොට, ලඞ්කාව නතා, නටබුන් වෙහෙර කරවා ලෝවැඩ කිරීමට කල් මිද සේ දැන, තමන්ගේ අභිජාත පුත්‍ර වූ පරාක්‍රම බාහු-භුවනෙක බාහු නම් ඈපාවරුන් දෙදෙනාගේ ලක්ෂණ බලවා, පරාක්‍රම බාහු නම් මහලු පින් කුමරහු මිතු මුළු ලක් දිව පරයතුරන් මැඩ ලෝකශාසන පිහිටුවා, දඹදිව ද කීර්ති පතුරුවා, නො එක් දෙශයෙන් බිසෝවරුන් ආදී අනැගි අනැගි පාක්කුඩම් ගෙන්වා, දීපචක්‍රවර්ති ව රජය කරණ පින් ලකුණු ඇති සේ අසා;

රජපා සතුටු ව, සතුටු කඳුළෙන් නුවන් තෙමා, කුමරහු ඇකයෙහි හිඳුවා, සිඹ සනහා දෙදෙනා ම මිතු ඔවුනොවුන්ට පෙම් සහිත ව වසන සේ, මල් රජහු බෑ රජ තම සුවව ව වසන සේ, ද්‍රවිඩයන්ගේ බල මහත් හෙයින් ද්‍රවිඩ සංග්‍රාමයට උත්සාහ නො කරණ සේ, සලගල කඳුරු පැන නොයන සේ, සම්ප : මදයෙන් මත් නො වන සේ, ක්‍රොධයෙන් ජය නො ගන්නා සේ, මෛත්‍රී බලයෙන් ම ජය ගන්නා සේ, අනර්ථයෙහි ප්‍රාණයක් නො නසන සේ, කාවක්

තිස්රජහු දුටුගැමුණු-සැදැතිස් දෙදෙනාහට කිසෙයින් පෙම් සහිත වූ නො එක් ඔවා නෙපුල් දී, ධර්මනීති, ලෝකනීති, රාජනීති, අක්ෂර ලිඛිතාදි නො එක් සිවුසැට කලා ශිල්පයෙහි දක්ෂ කරවා, පරාක්‍රම බාහු නම් ජ්‍යෙෂ්ඨ ඇපාතන් සංඝරක්ෂිත නම් මාහිමියන් ආදි වූ මහ සඞ්ඝයා කරා ගෙණ ගොස්, ඔවුන් මහසංඝයාට පාවා දී, මහ සංඝයා හා දළදා-පාත්‍ර ධාතුව හා රාජ්‍ය වාසීන් ඔවුන්ට මතු ලෝකශාසන රක්ෂාවෙහි අප්‍රමාද වන සේ කියා මෙසේ ලඞ්කා නමැති කොත්හි රජසිරි පිහිටුවා, ලෝක-ශාසනයට තමන් බලා-නුරූපයෙන් මැඩ කොට සතර හවුරුද්දක් රාජ්‍යය කොට කීර්ති කීර්ති පුණ්‍යාවසානය කළහ.

ඉක්බිත්තෙන් පියරජහු අභාවෙන් පරාක්‍රම බාහු රජ පැන නැඟී සියලු සිංහල සෙන් රැස්කොට නුවර දෙව්පුරයක් සේ සරහා පළමු වන අභිෂෙක මඞ්ගල්‍යය කොට, මල් රජහට යුවරජ-මහාපා තනතුරු දී පියරජහු තුබූ ලෙසම දානවෘත්තිය පවත්වන සේ නියොග කොට, ලක්දිව හුන් පර සතුරන් සාධා ලුහුබැඳ ලඞ්කා නමැති අඞ්ගනාව අනික්කහට නො හරිමි මැ යි, මට ම පතිනි කර වමි මැ යි සී මහත් වූ රාජාභිමාන කොට, “පළමුව දළදා සාමීන්ට සත්කාරයක් කොට, පසු ව ද්‍රවිඩ යුද්ධ කරමි”යි සිතා දළදා සාමීන් මහත් වූ උත්සවයෙන් ජම්බුද්‍රෝණි නම් පුරයට ගෙන්වා, එහි තමන්ගේ රජගෙට නුදුරු තැන සිතු සිතු විට ගොස් තුන් වේලෙහි වඳිනා සේ අතැඟි වූ දළදා ගෙයක් තනා, ඒ මධ්‍යයෙහි අතැඟි වූ ආසනරයෙන් ආසනයක් තනවා, දළදා සාමීන් වැඩහිඳිනා මිණි රුවන මෙසා සිටිනා සේ අතැඟි වූ රුවනින් අතුරු නැති විසිතුරු වූ රුවන් කරඬුවක් කරවා, ඒ වසා සිටිනා සේ පන්දහසක් සතරන් ගෙණ පස්දිසි ලක්ෂයක් අගනා සතරන් කරඬුවක් කරවා, ඒ වසා සිටිනා සේ පස්විසි දහසක් රිදියෙන් පස් ලක්ෂයක් ම අගනා රිදී කරඬුවක් කරවා, දළදා ගෙය පවත් මුළුනුවර අලඞ්කාර කොට සරහා දළදා සාමීන්ට මහත්වූ උත්සවයෙන් පූජාකොට මහසඟ මැද දළදා සාමීන් තමන් අත්ලට වඩා ගෙණ සත්‍යක්‍රියා කරන්නාහු:

අප බුදුහු තුන් වාරයක් ලක්දිව් වැඩ තුදුස් තැනක් පාරිභෝගික කොට අරක් දී වැඩියාහු ය, එසේ හෙයින් මේ ලක්දිව නම මිථ්‍යාදෘෂ්ටි ගත් රජුන්ට ම නො සිහෙනු එකාන්ත ධර්මයෙක සම්‍යක් දෘෂ්ටිකත් රජුන්ට ම සිහෙනු ද එකාන්ත ධර්මයෙක එසේ හෙයින් පෙර මහා වංශයෙහි පළමුවන වාරයෙහි බැස ලෝ සසුන් නසා දෙවිසි හවුරුද්දක් රාජ්‍යය කළා වූ අශ්‍රාචාරී

දෙමළුන් අසේල නම් සිංහලාධිපති රජෙක් ම සාධා ලෝක ශාසනයට වැඩ කෙළේ ය. දෙවන වාරයෙහි බැස සුසාළිස් හවුරුද්දක් රජය කළාවූ එළාල දෙමළුන්, දුෂ්ටගාමිණී නම් සිංහලාධිපති රජෙක් ම සාධා ලෝ වැඩ කෙළේ ය. තවද: තුන්වන වාරයෙහි බැස තුදුස් හවුරුදු සත් මසක් රාජ්‍යය කළාවූ පස්මු ද්‍රවිඩයන්, වලගම් අබා නම් ශ්‍රීලඞ්කාධිපතියෙක් ම සාධා ලක්දිවට වැඩ කෙළේ ය.

චූළ වංශයෙහි සතර වන වාරයෙහි බැස සත්විසි හවුරුද්දක් රජය කළා වූ සරජ ද්‍රවිඩයන්, දසෙන් කැලි නම් ශ්‍රී ලංකාධිපති රජෙක් ම සාධා ලෝ වැඩ කෙළේ ය. තව ද පස් වන වාරයෙහි බැස සතාසූ හවුරුද්දක් රාජ්‍යය කළාවූ සසානුදගයක් පමණ මහ සොළි දෙමළුන්, මහලු විජය බාහු නම් ලංකාධිපති රජෙක් ම සාධා ලෝ සසුන් රක්‍ෂා කෙළේ ය. දැන් මෙ සවන වාරයෙහි බැස වෙහෙර සසුන් නසා පිළිවි රජය මුළුල්ලෙහි බලාත්කාරයෙන් ගෙණ හිදිනා මාඝරජය, ජයබාහුය යන ද්‍රවිඩ රාජයන් දෙදෙනාගේ දෙමළුන් මම ද සාධා ලක්දිව ලෝක ශාසන දෙකට වැඩක් ම කරණු කැමැත්තෙමි, එයි දු සඛා මි ය.

තව ද කොසොල් රජ්ජුරුවන් බිම්සර රජ්ජුරුවන් තමන් ජීවමාන බුදුන් සමයෙහි උපන් හෙයින් බුදුන්ගේ නොයෙක් පෙළහර සා දෙශනාවන් අසා දැක තමන් තමන්ගේ ජීවිතවල ඵල ලදහ. ධර්මාශෝක දෙවන පැතිස් දුෂ්ට ගාමිණී ආදි වූ බුදුන් අජීවමානකාලයෙහි උපන් රජදරුවෝ ද, තමනු දු මහ පින්බල ඇති හෙයින් නිර්මිත බුද්ධරූප හා පෙළහර දැක නො එක් පින් රැස් කළහ. බුදුන්ගේ අජීවමාන පෙළහරෙක් නම් අධිෂ්ඨානයක් ඇතිව ම වන බවක් මිස, නිකම්මම පෙළහරෙක් නැත; අප බුදුන් පරිනිර්වාණ මඤ්චකයෙහි වැඩහෙව පස්මු මහා අධිෂ්ඨානයක් කළ සේක. මේ ලොකයෙහි මහා ශබ්දයෙක් නම් එබඳු වූ කුඩා වස්තුවක් නො හහවා මි ය මහා අධිෂ්ඨාන ශබ්දයෙන් උපන් සූක්ෂ්ම වූ අධිෂ්ඨානත් ඇතිමනු එකාන්ත ම ය. මේ ආදි කාරණයෙන් පන් දහසක් හවුරුදු පවත්නා තමන් වහන්සේගේ ශාසනයෙහි මතු වන ප්‍රඩාවනානයන් බලන්නා වූ බුදුහු මාත් නුදුටු සේක් ද හෝ සී නො සිතමි. බුදුහු මාන් දැක වදාළ සේක්වී නම් බුදුන් කළ සූක්ෂ්මවූ අධිෂ්ඨානත් ඇත්නම්, මමද පෙර ලක්දිව වැඩ කළ වීර රජුන් කෙරෙහි ඇතුළත් වීම් නම්, පරසතුරන් සාධා ලක්දිව හෙළි කෙරෙම් නම්, මා නිසා ලෝක-ශාසනයට වැඩෙක් වේ නම් දැන් මට ද කිසියම් පෙළහරක් පෑ වදාළසේක් වී නම් යෙහෙකැ" සී සිත සිතා බලබලා සිටියාය.

එ කෙණෙහි පියුම් ගබ ජල රාජහංස ලීලාවෙන් රජහුගේ කර තලාමල පද්මයෙහි ලීලොපෙත ව වැඩහුන් දළදා සාමි, රජු හෙළු ඇසිපිය ඔසවා නො ලන ඇසිල්ලෙහි ආකාශයට පැන නැගී ජීවමාන බුද්ධ රූපය මවා, සියලඟින් සවණක් රස් විහිදා, මුළු නුවර ඒකාලොක කොට, කිසියම් පෙලහරකින් රජහු සානන්ද කරවා ආකාශයෙන් බැස නැවත හස්තතලයෙහි පෙණී ගිය සේක.

ඒ පෙළහර දුටු මහ සඟ පිරිස දුන් සාධුකාරයෙන් හා මහ පිරිස දුන් සතුටු ඝොෂාවෙන් මුළු නුවර එක කොලාහල විය. එ වේලෙහි රජ්ජුරුවෝ "මම ද ජීවිතයෙහි ඵල ලදිම් ම ය. මහපින් රජුන් කෙරෙහි ඇතුළත් වීම් ම ය" යි පස්වණක් ප්‍රීතීන් පිණා එම මොහොත ම දළදා සාමින් තුන් කරඬුයෙන් දළදා ගෙට වඩා සත් රුවනක් ලද සක්විති රජකු සේ පිණ පිණා නො එක් රත්නාභරණ යෙනු දී පුදා, තවද: වඩ වඩා සද්දවසක් මහ පූජා කළාහ. එයින් කීහ.

ලඞ්කාධිනාථකරපඞ්කජරාජහංසී-
ඛීමමාය සා දසනධාතු මුනින්දරූපං
සොකෙහි රංසිවිසරෙහි සමුල්ලසන්තී
සබ්බා දිසා ච විදිසා සමලඞ්කරිත්‍වා

දිස්වා තම්මහත මතීව පසන්නචිත්තො
සම්පත්තයක්කරතනො විය චක්කවත්තී,
සෙට්ඨෙහි නෙක රතනාභරණාදිකෙහි
පූජෙසි ධාතුමතුලං මනුජාධිනාථො:- යි.

එ තැන් පටන් රජහුගේ මහත් වූ පින් බෙලෙන් හා ශ්‍රද්ධා බෙලෙන් හා තුනුරුවන් බෙලෙන් සියලු ලංකාවාසීහු රජහු කෙරෙහි භය ගෙණ ගෙණ වසන්නාහු ආඥාචක්‍රය මඩනට අසමර්ථ ය හ. නානා දෙශවාසි රජදරුවෝ ද ඒ රජහට නො එක් පඬුරු එවන්නාහ. එ කල තමන්ගේ ආඥා පින් බෙලෙන් හා මල් යුව රජහුගේ මන්ත්‍රී බෙලෙන් ලංකාවෙහි පරසතුරන් සාධන්නාහු දිවි නැසුම් මතා වරදෙහි දඟගෙයි ලවමින්, දඟගෙයි ලූ ව මතා වරදෙහි කිසියම් ම නිග්‍රහයක් කරවමින්, රටින් නෙරපුම් මතා වරදෙහි දඩ ගණිමින්, දහස් ගණන් දඩගත මතා වරදෙහි උදහස් පමණකින් හරිමින්, නොඑක් යුද්ධ කරන්නාහු පියරජහු දවස සාධා ගත නුහුනු සිංහල මහවන්නින් තමන් හුන් පොළ හිද ම සාධා, නො එක් රටවල් ගෙණ, ලක්දිව සිංහල බලසෙන් තමන් කරා ම රැස් කොට, දෙවනු ව ද්‍රවිඩ යුධයට පටන් ගෙණ, ඒ ඒ දිගින් සිංහල මහ සෙන් මෙහෙයා දෙමළුන්ට නො එක් ගැහැටුම් කරන්ට පටන් ගත්හ.

එ කල පොළොන්නරු, කොට්සර, ගඟතලා, කවුඩුල්ල, කුරුඳු පඳී, මාන මිතු, මාවටු, මන්නාරා, පුලච්චේරි, ගෝකණ්ණ, දෙබර, පවත්, හුරාතොට, මැලිගමු, ගොවුසු, මීපාතොට, ආදී තැන්හි කඳවුරු බැඳහුන් අතුරු නොදී සතුරු ව, සතළිස් හවුරුද්දක් බලාත්කාරයෙන් වාසය කළා වූ මාඝරාජ-ජයබාහු නම් දෙමළ රජුන් දෙදෙනාගේ සතළිස් දහසක් පමණ ඇති දෙමළ මලල මහ සෙනග ඒ ඒ තැන්හි රඳලිය නොහී පොළොන්නරු නුවර ම රැස්ව ඔවුනොවුන් හා මන්ත්‍රණය කරන්නාහු "පරාක්‍රම බාහු රජහුගේ ආඥා පින් බල මහත. පරදෙශයෙහි රජදරුවෝ ද ඔහට ම වසඟයහ. සිංහලයෝ හැම දෙන ම ඔහු කරා ම රැස් වූහ. අපගේ ද්‍රවිඩයෝ ද පවා සම භාගයෙක් ඔහට ම වසඟයහ. ඔහුගේ අභිෂෙකයෙහි පටන් හිරු දුටු කණාමැදිරියන් සේ නිෂ්ප්‍රභ වූම්හ. එක දවස සිංහලයෙහි රඳලීමක් බැරි ය. මෙහි නො රඳා රට යම්හ"යි කියා අත්, අස්, මුතු, මැණික්, රජ වොටුනු, බිසෝමරුන් ආදී වූ සිංහලයම හිමි අනැගි අනැගි වූ ළඟතන් රුවන්ගෙණ "රට යම්හ"යි නික්ම රජහුගේ මහ පින් බලයෙන් සිතූ අත හා නොහී "මාසෙන් ගමුයෙහි සුංගම් බැලූහ"යි යන ව්‍යවහාරය සේ කඳවුරෙහි පූජ් මාසල ය යි, පශ්චිම වාසලින් නික්ම ගොස් රටමැද වැද මහකැලෑවල දී රජහුගෙන් ගිය සිංහල මහ සෙනගට හසු ව, ඉතා මහත් වූ විපත්තියට පැමිණ සම්පත්තිය ද පාවාදී, ජීවිතය ද දී, මූලොච්ඡින්න ව හිස දී, රජහුගේ චිත්තාපිය ද සාධා දුන්හ. උම්ංදෙයෙහි එක් සියක් රජුන් හැර ගිය සම්පත් නිසා මිහුළු නුවර මාසින් සුඛිත වූවා සේ එ තැන්හි ලද සැපතෙහි පටන් සිංහලයෝ ධනෙශ්වර වූහ.

මෙසේ ලක්දිව පරසතුරන් සාධා රට සමෘද්ධ කරවමින් සිටි කල්හි නැවත තමන්ට එකොළොස් වන්නෙහි බෞද්ධාගම්හ යි මායම් කියා ලක්ෂ ගණන් නාවවම්බු නම් වූ විෂ කොකොල් ගෙණ සඳී සෙනාවක් සේ ඒ ඒ තොටින් බැස ලක්දිව ගලා ගෙණ, 'ගිනිසෙණ ගැසූ මග දියසෙණ ගැසුවා සේ,'' ලක්දිව නැවත කසන්ට පටන් ගත් චන්ද්‍රබානු නම් රජහු හා ජාවක මහ සෙනග ද. අසුර යුද්ධ කරන්නා සේ, නො එක් යුද්ධ කරවා මර මරා, ලුහුබැඳ, මෙසේ මලල යුඩ ය, ද්‍රවිඩ යුඩ ය, ජාවක යුඩ ය, යනාදි නො එක් යුඩයෙහි මෙසේ සිරිලක පරසතුරන් ජය ගෙණ, එකාතපත්‍ර කොට, දෙමළුන් විසින් නැසූ ලක්දිව පමුණු පරපුරා ව්‍යවස්ථාවම් තාපස-ගණතැන්, පුඟුල්තැන්, ආයතැන්, පිරිවෙන් තැන්, දන මේ තැන්, පෙර සේ ම ව්‍යවස්ථා කරවා පළමු කොට රට බතින් සමෘද්ධ කරවා, දිළිඳු ව ගිය ලඩකාවාසීන් තමන් තමන්ගේ ධන ධාන්‍ය

මෙතෙකැ කී හොඳන්නා සේ, ශ්‍රීවිතාන කරවා, දෙවනු ම ශාසනෝප කාරයට පමුණ් ගෙණ, අරාජිතයෙහි බොහෝ කලක් සවච්ඡන්ද චාරී ව විසූ අලජ්ජී පුද්ගලයන් තෝරා ශාසනය පරිශුද්ධ කරවා, නැවත සොළී රජයට නො එක් පඬුරු පාක්කුඩම් යවා, එහි වසන භික්ෂූන් සිංහලයට ගෙන්වා උභය ශාසනය ම සමඟ කළහ.

තව ද තම්බලිංගමුවෙහි වසන දොළොස් දහසක් භික්ෂූන් අතුරෙන් ධම්මකිර්ති නම් මහාස්ථවිරයන් සිහා යන පෙරමඟ පිළුම් පැනතැංගයය හි අසා දළදා මැඩු ගඳ කලල් ආදි දහම් පඬුරු, රජ පඬුරු තම්බලිංගමු යවා ඔවුන් සිංහලයට වඩා ගෙන්වා බුදුන් රහතුන් දුටුවා සේ, මහත් වූ සත්කාර කොට, ඔවුන් දිවී පමණින් මහත් වූ ප්‍රත්‍යය දානය දී මහ පින් රැස් කළ හ.

මෙසේ තමන් සමඟ කැරවූ ශාසනය රක්‍ෂා කරන්නාහු අට ආයතන් මහාස්ථවිර ග්‍රාමවාස ආරණ්‍යවාසාදි සියලු ස්ථවිරගණයාට පූර්ණ විහාර, රත්වත් සුළුපා මහපා චංක්‍රමණ රාත්‍රිස්ථාන දිවාස්ථාන මණ්ඩප පැන් පොකුණු පුෂ්පාරාම ඵලාරාම දී නො එක් සඞ්ඝාරාම කරවා නො එක් සත්කාර කළ හ.

තව ද ගම වෙසෙහි මහා සඞ්ඝයා රැස්කොට තෙරස ධුත ගුණාදී රූක්‍ෂ ප්‍රතිපත්ති පූරණයට ආත්මක්‍ෂම වූ ප්‍රතිපත්ති සාර වූ භික්ෂූන් ගිවිස්වා තෝරාගෙණ පලාබත්ගල් පායෙහි වල් වාසයක් කරවා, එහි වස්වා, සිරිලක තමන් සමයෙහි අරහතනයන් පහළ වූවා සේ සිවුපස දානයන් දී අප්‍රමාණ වූ ප්‍රතිපත්ති පූජා කළහ.

තව ද: ලක්දිව ආගම ධර ස්ථවිරයන් එ වකට මඳ ම ගිය හෙයිනුත්, පොත් පත්, නිමවා නැති හෙයිනුත්, දඹදිවින් පොත් ගෙන්වා සියගණන් ස්ථවිරයන් ආගම ධර කරවා, බුදුන්ට පර්‍යාප්ති පූජා කළහ. තව ද: තමන්ගේ භුවනෙක බාහු නම් මල් යුවරජහු විනය ධර කරවා, ඔහු ලවා අසන තැන් කියවා, නො එක් භික්ෂූන්ට සම්මුති දෙවා, ස්ථවිර පූජා කරවූහ.

තව ද: තමන් ජාත වූ ශ්‍රී වර්ධන නම් නුවර ප්‍රාසාද චංක්‍රමණ මණ්ඩප පැන් පොකුණු ප්‍රතිමා ගෘහ චෛත්‍යඝර බෝධ්‍යඝර පවුරු වාහල් ආදී නානාවිධ කර්මාන්තයෙන් අලඞ්කෘත වූ, රජමහ විහාරයක් කරවා, තමන් වසන ජම්බුද්‍රෝණි නම් පුරයෙහි පටන් ඒ පුරය දක්වා, දිගින් අඩ යොදනක් හා පුළුලින් ඉස්බක් පමණ තැන් හෙරිතලයක් සේ සම කරවා, පර්‍යන්තයට රජ තොරනක්

හා දස රියනකට පිළී තොරණක් හා සියක් රියනකට තුන් මහල් පිළී මාලිගා බැගින් තිමවා, මහ සුදු වැල්ලෙන් තවරා, දෙපස ධවජ පුන්කලස් තබා, වෙහෙර පවුර සිසාරා, බුද්ධපූජාවට ආ මෙඝ රාජයාගේ ඉන්ද්‍රචාප සහස්‍රයන් බඳු වූ, විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් සොබනා මහත් වූ තොරණ සහස්‍රයෙන් හා බුදුන් පුදම්හ යි නානා ලෝකයෙහි ඒ ඒ දිගින් දිවූ චන්ද්‍රවිමානයන් බඳු වූ, අසමාන වූ, ශ්වේතච්ඡත්‍ර සමූහයෙන් හා තරුපෙළ සේ දිලියෙන රන් කොත් රිදී කොත් සහස්‍රයෙන් හා බුද්ධ පූජාවට දිව අවුත් ආකාශයෙහි සිට නටන දිව්‍ය සමූහයන් සේ, ඒ ඒ දිගින් නගනා ලද පඤ්චවර්ණ ධවජ මාලා සහස්‍රයෙන් හා පූජා ලෝභයෙන් දෙවියන් විමන් හා සමග ආකාශයෙන් බැස, වෙහෙර සිසාරා අතුරු නොදී සිටගත්තා සේ නානාලඞ්කාරයෙන් සදා වෙහෙර සිසාරා පෙළ පෙළ දී තබන ලද රත්න මණ්ඩප පඞ්ක්තීන් හා බුදුන්ගේ මහා මඞ්ගල්‍යයෙහි අජීවමාන වස්තූන් ජීවමාන වූ නියාවට කාරණ දක්වන්නා සේ සේසත් අතින් ගෙණ, පෙළ පෙළ දී නවා නග බඹරු පෙළින් හා දෙහොත් මුදුන් දිදී ඇවිදිනා නානා වර්ණ දිව්‍ය රූප පංක්තීන් හා,

ඒ දවස් මෙඝරාජයන් හස්තිරූප ව්‍යාජයෙන් බුදු මඟුලට බැස මිහි මඬලෙහි ඇවිදිනා සේ, ඒ ඒ දිග්හි යන්ත්‍ර බලයෙන් ඇවිදිනා හස්තිරූප පඞ්ක්තීන් හා, පූජා ලෝලින් දිවූ සමුද්‍ර රාජයාගේ මහ රළ පෙළ සේ, ඒ ඒ දිග්හි යන්ත්‍ර බලයෙන් දිවන අශ්ව රූප පංක්තීන් හා, බුදුන්ගේ මහා මඞ්ගල්‍යයෙහි අලඞ්කෘත වූ පූජාවෙන් වෙහෙර සරහා සතස් සුවහස් ගණන් සඞ්ඛ්‍යා හා, මුළු ලක්දිව සියලු මනුෂ්‍ය සේනා රැස්කොට වෙහෙර සිසාරා, ගවු ගවු මානයෙහි පූජා පෙළහරින් සිටගත් මනුෂ්‍ය සේනාව ම අතුරු නො දී සිටිනා සේ, නියෝග කොට,

තුමූ සර්වාභරණයෙන් සැරහී සිවුරඟ සෙන් ගෙණ දළදා පාත්‍ර ධාතු රත්න කර්මාන්තයෙන් ම හෙබියා වූ අනැගි වූ රථාලඞ්කාරය කට වඩා මඟුලැතුන් දෙදෙනකු හට සොඳා, රන් ධවජ-රිදී ධවජ-රන් පැන- රිදී පැන - රන් කලස - රිදී කලස - රන් කරඬු - රිදී කරඬු-රන් විසිරි-රිදී විසිරි- රන් චාමර- රිදී චාමර- රන් පතැස්-රිදී පතැස් යනාදී වූ රජ පෙළහරින් ඒ මාර්ගය අතුරු නොදී පෙළ පෙළ දී නික්මවා, තුමූ පසු ව ඇත් අස් රථ පාබල පිරිසින් මහ මේ ගිගුමෙන් උද්දම වූ සමුද්‍රයක් සේ, පඤ්චාංගික තූර්‍ය්‍ය නාදයෙන් මහ පූජා කරවමින්, ක්‍රමයෙන් ඒ පුරයට වඩා ගෙණ ගොස් වෙහෙර මැද මහා මණ්ඩපයෙහි අනැඟි වූ බුද්ධාසනයකට වඩා,

පෙරවරු ඒ මණ්ඩපය පුරා පුදන ලද ශාලගණින් සුගන්ධශාලි භෝජනය හා නා නා ජාතියෙහි පූජා පූප වර්ගයෙන් හා, පින් සොඬ වූ ජනයන් විසින් වස්වන ලද නාග චම්පකාදී සුවඳ මල් වර්ෂාවෙන් හා සියලු සංඝයාට දෙනලද දානප්‍රවාහයෙන් හා තුන් යම් රාත්‍රියෙහි වෙහෙර සිසාරා තරු කැලෑයෙන් සුප්‍රසන්නවූ ආකාශ යක් සේ පුදනලද ප්‍රදීප සහස්‍රයෙන් හා ඒ ඒ තැන්හි රඟම්බුලු බැඳ නටන ලද නළු පිරිසින් හා, බුදුන්ගේ සතුති ගී කිය කියා ඒ ඒ දිග්හි සිට බුද්ධ පූජා ශාන්ති කරණ බලි භෝජන මණ්ඩල පංක්තීන් හා, ඒ ඒ තැන්හි ධර්මාසන තංවා කියමින් දෙවන ලද ධර්ම දානයෙන් හා තුඩ තුඩ "අහෝ! බුද්ධෝ, අහෝ! බුද්ධෝ," යි කියන ලද සාධුකාර ශබ්දයෙන් හා ඒ ඒ තැන්හි අතෝනා ලද පඤ්චාංගික තූර්යනාදයෙන් හා, ශක්‍රයාගේ නඳුන් උයන් වන් දිව්‍ය උත්සවය මෙවැනි යයි මනුෂ්‍ය ලෝකයට ගෙණහැර දක්වන්නා සේ, පෙර ශ්‍රී ලංකාධිපති වූ සියලු රජුන් කළා වූ බුද්ධ පූජා ම මේ වැනි යයි දක්වන්නා සේ, බුදුන්ගේ මහ පින්ලියය එ තැන්හි ම මල් ඵල දක්වන්නා සේ, සත් රුවන් සක් දවාලක් මුළුල්ලෙහි එක මුඛයකින් කියා නිමවාගත නොහැකි අප්‍රමාණවූ තුණුරුවන් පූජා කොට, එ වෙහෙර මහසඟනට සාංඝික කොට පිළිගන්වා, තමන්ගේ කීර්ති ශරීරය බුද්ධෝත්පාදයෙහි පවත්නා සේ, ස්ථාවර කළහ. තව ද: තමන් නමින් පරාක්‍රමබාහු නම් පිරිවෙණක් කරවා, නො එක් කප්පිය භාණ්ඩ හා දරුගම් වටනා පස එම වෙහෙර ලවා මහත් වූ පූජා කළහ.

තව ද භුවනෛකබාහු නම් මල් යුවරජු ලවා බෙලිගල් පායෙහි ඔහු නමින් ම පිරිවෙණක් හා රජමහා විහාරයක් කරවා, ශ්‍රී මහිකයෙහි කී පරිද්දෙන් ම සද්දවසක් මහත් වූ තුණුරුවන් පූජා කරවූහ. තව ද: ඔවුන් ලවා ම කුරුණෑගල් පායෙහි එසේ ම රජමහ විහාරයක් කරමින්, ඔහු නමින් ම මහෙන්ද්‍රබාහු පිරිවෙණ කරමින්, එසේ ම මහපූජා කරවූහ. තව ද: කැලණි වෙහෙර යටාලතිස් රජ කැරවූ පස්මහල් මහපාය කටුකොහොල් පෙරළවා, එහි ම ඔත් පිළිම ගෙය කටුකොහොල් පෙරළවා, තව ද: එම වෙහෙර ත්‍රිවංක ගෙය කටුකොහොල් පෙරළවා එහි ම මහවෙහෙර සිසාරා සලපතර අතුරුවා, එම වෙහෙර අභිමුඛයෙහි මහාමණ්ඩපයක් කරවා, වෙහෙර සිසාරා දහස් සුවහස් පහන් ඇගෑ බඳවා, නො එක් වාරයෙහි තුන් තුන් දවස් බැගින් බත් පූජා ය, මල් පූජා ය, සහන් පූජා ය යි අප්‍රමාණ කොට පූජා කරවූහ. තව ද: එම වෙහෙර බොහෝ කලක් නමින් නමින්

පහන් පූජා පවත්නා සේ, මෙහෙරම නුවරැ තෙක නාළිකේර සහස්‍රෝද්‍යානයක් කරවා බුදුන්ට පිදූහ. තව ද: අත්තනගලු වෙහෙර දහැම් සිරි සඟබෝ රජහු ඉස දන් දුන් තැන, ගෝඨාභය රජහු විසින් කරවූ දෙමහල් මඩද ගෙය තුන්මහල් කොට කරවා, එම වෙහෙර තමන් පියරජහුගේ දේහ නික්ෂෙප ස්ථානයෙහි මහ සෑය බඳවා, එහිම අෂ්ටාංග වූ ප්‍රතිමා ගෘහයක් කරවා එහි සල පිළිම වඩා නො එක් වාරයෙහි පූජා කළහ.

තව ද: අප බුදුන් අයාමෙහි බුදුරජය හිමි වූ සුගත් මහ පවුලෙන් දුන්නා ද ලද අනුබුද්ධ වූ මහා කාශ්‍යප ස්ථවිරයන්ගේ දළදා ද, අනුක්‍රමයෙන් ලඞකාවෙහි ම පවතිති යි බෙම්තොට දළදා ගෙයි වැඩ හිඳිති යි, අසා ඔබ කෙරෙහි උපන් මහත් වූ ශ්‍රද්ධාවෙන්, මහත් වූ මංගල්‍යයෙන්, සිවුරඟසෙන් හා සමඟ බෙම්තොටට ගොස් ඔබ දළදා දක උපන් මහත් වූ ප්‍රීතීන් පිණා, ඒ සා දනවුව සිඞාරා ඇවිපි බඳවා, තුන් දිවාරාත්‍රියක් මලින්, සුවඳින් පුද, මහත් වූ ප්‍රදීප පූජාවෙන් පින් රැස් කළහ. තව ද: දෙවිනුවර දෙවුරජානන්ගේ රජගෙය ජරාවාස ව තුබූහ යි කරවූ කල් පමණ නැතැ යි අසා, ඒ ගෙය බිම්ලිය කරවා, එ නුවර සියලු ජරාවාස කටුකොහොල් හරවා, ගවුරුඳු පතා, ඇසල පූජා කරවූහ. තව ද: පියරජහු කරවූ විජය සුන්දරාරාමය සිඞාරා මහපවුරු ලවා, එහි තුන් මහල් අලුත් දළදා ගෙය දිව්‍ය විමානයක් සේ කරවා, විචිත්‍ර වූ චිත්‍රකර්මාන්තයෙන් අසමාන කොට නිමවා, මහ පෙළහරින් දළදා වඩා, ශ්‍රීවර්ධන පුරයෙහි කළ පරිද්දෙන් ම මහා පූජා කළහ. තව ද: අප බුදුන්ගේ ජීවමාන බුද්ධ රූපය සිත් සේ දවස් පතා බලම් හි සිතා, එම ජීවමාන බුද්ධ රූපයෙන් රුවක් සක්මනෙහි වැඩසිටිනා භාවය, නො එක් චිත්‍රකාරයන් ලවා පෙති කණ්ඩ සිතියම් කරවා, ලක්දිව බොහෝ සංඝයා හා මහ ජනයා රැස්කොට, සත් දිවාරාත්‍රියක් මහත් වූ බුදුමඟුල් උත්සව පූජා කළහ.

තව ද: තමන් අෂ්ටාඞ්ග රෝගයෙන් ගොඩ නැගීමට හේතු වන සේ තමන්ට තුන් වන්නෙහි ය, සවන්නෙහි ය, එකොළොස් වන්නෙහි ය, දොළොස් වන්නෙහි ය, සතළොස් වන්නෙහි ය, එක්විසි වන්නෙහි ය, සත්විසි වන්නෙහි ය, තිස් වන්නෙහි ය යි අට වාරයක් ම අටමහ මලුකම පූජාවක් සරසා ලඞකාවීපයෙහි දහස් ගණන් සංඝයා රැස් කරවා, සැටපා ගෙවල් තනවා, සිඞාරා මහාමඬු ලවා නානාවර්ණ වූ වස්ත්‍රයෙන් අලඞකාර කොට එහි මහ සංඝ ගණයා පෙළ පෙළ හිඳුවා, මහත් වූ දානපූජාවෙන් වළඳවා, තමන්

නමින් මහණ මහලු පැවිදි කරවා, ස්ථවිර මහාස්ථවිර, ආයතන්, පරිවේණාදි ස්ථානාන්තර දෙවා, පසුව ද මඟුලැතුන් උසව ගරු භාණ්ඩ හා සඟ කප්පිය පරිෂ්කාර රැස්කරවා, මහාස්ථවිර, ආය තන් ආදි මහා ස්ථානාන්තර ලදුවානව සළුපිළිගම් හා සමග සළු පිරිකර දී, අවශෙෂ වූ ස්ථවිර නිශ්‍රයෙන් මුක්ත මහණ මහලු පැවිදිවූවානට අෂ්ට පරිෂ්කාර දී, මෙසේ ම සත් සත් දවස් බැගින් මහත් වූ රාජර්ධීන් මහ මලුකම් පූජාවක් අටවාරයෙක ම කරවා, නො එක් වාරයෙහි අවශෙෂ වූ මලුකම් පූජාවිනු ද කළහ.

තව ද: කඨින දානයෙහි විපාක බොහෝ ය යි අසා අසූ අනු ව්‍යඤ්ජන ලක්ෂණයෙන් යෙදී අශීති වර්ෂයක් ආයුඃ ශ්‍රී වළඳා සෙසු බුදුන් හා සම සමයේ ම ලෝවැඩ කළාවූ අප මහා ගෞතම බුදුන් ගේ අශීති මහා ශ්‍රාවකයන් උදෙසා, අශීති මහාකඨින දානයෙකින් පෙර රජුන් නො කළාවූ ලෙසට අද්භූත වූ කඨින දානයක් දෙමි සී සිතා ලක්දිව බොහෝ ස්ත්‍රී පුරුෂයන් රැස් කරවා කපුයෙහි පටන් ඉවුම, රිකුරුම, පෙද කිරීම, කැටීම, වියවීම, ඇපිළීම කඩකැපීම, ගෙත්තම් කිරීම, රඳනම් යනාදි වූ සියලු කර්මාන්ත ම සුවහස් ගණන් සත්ත්වයන් ලවා එකද ම නිමවා, කප්පිය වූ නො එක් ගරුභාණ්ඩ හා සමග ලක්දිව මහා ස්ථවිර ගණයාට අශීති මහා කඨින දානයක් දී, එ දවස් ම අශීති මහා පූජාවක් කොට, සෙසු සියදහස් ගණන් වාරයෙහි සියදහස් ගණන් කඨින දානයන් ද දී, භොග පමණින් පින් රැස් කළහ.

තව ද: පෙර තමන් සිවුරඟසෙන් ගෙණ ගොස් සමනොළ වැද ශ්‍රී පාදයට ඒ ඒ දිකින් දස දස ගව්වෙහි මහවනය සිසාරා සිටි ජන ප . මනුෂ්‍යයන් පුදා, නො එක් රත්නාභරණයෙනු ද පුදා, ආ සම යෙහි සිතන්නාහු "මා නො එක් රාජ්‍ය රක්ෂාවෙහි යෙදී වසන හෙයින් සිත් සේ ඒ ඒ තන්හි ඇවිද පින් රැස් කොට ලෝවැඩ කිරීම සිත්සේ භාරනය. මාගේ ඒ අදහස් දූත ලෝවැඩෙහි බැඳෙන ඇමතියෙක් කවරෙක් දෝ හෝ"යි සිතා එක නාලිකෙර ඵලයක් බුදු බැව් පතා රොපණය කොට, තුන් ඇස්සෙන් තුන් පැලයක් නංවා හත්, දිලිඳුන් දුක අඹුදරුවන් පමා දන් දුන්, බුදු වෙමව යි පතන තුණුරුවනෙහි පහන් දෙවප්‍රතිරාජ නම් අමාත්‍යයා කැඳවා "සම නොල යන මග ජලදුර්ග පඞ්කදුර්ග ගිරිදුර්ගයෙන් අතිදුර්ග ය, පින් ලෝභයන් හවුරුදු පතා යන අෂ්ටාදශ දෙශවාසි සත්ත්වයෝ බොහෝ පීඩා විඳිනාහ. මා සමයෙහි සියලු සතුන් සුවසෙන් යන එන සේ ඒ මග ද හෙලි කරව. තව ද අත්තන ගල්ලෙහි පෙර මහ තෙරතෙණකුන් පින් බෙලෙන් අහස් පොළෝ ගුගුරුවා රහත් වූ තැන එ කල උපතිස්ස නම් රජහු කැරවූ පස්මල් රන් ලළු

මහපාය නැසී බිම් පමණක් සිටියහ යි ඇසීම්, ජරාමාස හැරවීම නම් ඈසිරි වඩනා පිණෙක, ඒ පිණ ද මා නමින් කරවාලව. තවද, බෙම්තොට නිශ්ශංක මහ පා උයන සේ මා නමිනුදු එහි උයන කුදු කරවා ලව" යි යනාදීන් නො එක් විධන කොට ඔහට සුදුසු වූ නො යෙක් සනුමාන දුන්හ.

හෙතෙම පළමු ව ගම්පොළ නුවරැ ගොස්, සමන් දෙව්රජානන් ගේ රූපය කරවා, රන්රුවින් පලඳනාවෙන් ජීවමාන රූපයක් සේ සාධා, රුවක් මිඩුයෙකින් ගෙණ, පූජා පෙරහරින් සමනොළකුළු තික්ම, පළමු ව බෝතලයෙහි මූවදෙර වඩු පන්තිස් රියන් මහ හෙයක් ද, කනමැදිරි හොය තිස් රියන් හෙයක් ද, උලපනෙහි සතළිස් රියන් හෙයක් ද, අඹහොමු හොයෙ සූතිස් රියන් හෙයක්ද, ගේ මිතුයෙහි ගෙවල් හා සමග ඇත් අස් ගවමහිෂයකදූ හා යෑනැති සේ ස්ථාවර කොට කරවා සිය ගණන් මහසඟ පවරා, ඒ ඒ තැන්හි නො එක් දන පූජා කොට, ඒ ඒ තැන්හි අරම් අම්බලම් කරවා සෙසු තැන්හි දු සෙතු බන්ධන පියවරපාණ බැඳ, මහවනය මහවත් කොට ගොස්, සමනොළ් වැද, දෙව්රජානන් මලුයෙහි පිහිටුවා, සිසාරා පවුරු බැඳ, ශ්‍රීපාදය වසා මණ්ඩපයක් කරවා, යදම්කදෙක් බැඳ රඳවා, තුන් දවසක් මලුයෙහි ලැග, ශ්‍රී පාදය සිසාරා ඇවිද, තමා මස්තකයෙන් තමා රජහු නමට රාත්‍රි පහනක් පුද, සිසාරා සුවහස් ගණන් පහන් පූජා කොට, බොහෝ කලක් රජහුගේ කීර්ති ශ්‍රී ශරීරය පවත්නා සේ එහි ශිලාලෙඛන සිදුවා, එපවත් රජහට කියා යවා,

නැවත එයින් අත්තනගලු ගොස් ඒ පාස රජු හි පරිදි දෙන් ම නො එක් ධන පරිත්‍යාගයෙන් තුන් මහල් කොට කරවා අනෝමදස්සි නම් මාහිමියන්ට පිළිගන්වා, රජහුගේ නියෝග වූ පරිද්දෙන් ම දානවෘත්ති ව්‍යවස්ථා කරවා, එයි දු රජහට සැලකොට යවා, එයින් බෙන්තොට ගොස් කළු හෝ මූවදෙර සතාසූරියන් මහ හෙයක් ද, කොකෙල්සේනාවෙහි පන්සියක් රියන් මහහෙයක් ද, සල් හොමු හොය දෙසියක් රියන් මහ හෙයක් ද, සල්පා හොය යෙල සියක් රියන් හෙයක් දැ යි යනාදීන් දුගී දුගී ස්ථානයෙහි නො එක් ඒ දඹු, අරම්, අම්බලම් කරවා නිමවා, නො එක් දන පූජා කොට, කළුතොට පටන් බෙන්තොට දක්වා යොදනක් මානයෙහි කිවී ගැවසි සිටිනා සේ පරාක්‍රමබාහු නම් නාළිකෙරොද්‍යානයක් කරවා, එයි දු රජහට කියා යවා; තව ද: ඒ ඒ රට දී කපුයෙහි පටන් එක ද කරවා නිමි සවිස්සක් කෙළින් සිවුරෙන් හා සමග සූසෑ වත් කඨින පූජා කොට, එයින් ගොස් මහදෙල්නස් නම වූ මහ

වනය මූලික්පුරා මහත් වූ ග්‍රාමයක් බිම්පිස උපදවා, ඒ වනය කොස් වනයක් කොට, එහි තුන්මහල් පිළිම ගෙයක් ආදි වූ ආරාමයක් කොට, රජහු නමින් මහත් වූ දන පූජා කොට, නැවත රජහු කරා අවුත් තමන් රජහු නමින් කළ කළා වූ පූජා පින් දුන්වූහ.

එකල රජපා ඔහු කෙරෙහි උපන් මහත් වූ කරුණා ඇතිව, ඔහු කරවූ මහදෙල්ගස් නම් ග්‍රාමය ආදී වූ නො එක් ගම් පමුණු දී මහසඟ මැද ඔහු දළදා ස්වාමීන් කරා ගෙණ ගොස් "මෙ තෙම තුණුරුවන් කෙරෙහි දූ පහන, මා කෙරෙහි දූ පහන, එසේ හෙයින් බුදුන්ට ද රජුන්ට ද පක්ෂපාත ය, ඔහු මට ඉතා ප්‍රිය බැවින් ප්‍රිය වූ වස්තුව දළදා ස්වාමීන්ට පුදමි"යි ඔහු ගුණ මුඛ නො පොහොනායේ කිශා පුත්‍රදාරාවන් හා සමඟ ඔහු දළදා ස්වාමීන්ට ම පූජා කොට එ නැස් පමණ් ඔහු ලවා ද, තමින් තමින් ම තුණුරුවන්ට නො එක් සත්කාර කරවූහ. තව ද: නො එක් වාරයෙහි "බුදුන් සතු ලක් දිවින් ඔබට ම පූජා කෙරෙමි"යි සිතා තමන්ගේ රජගෙය දිව්‍ය විමානයක් සේ සරසා දළදා ස්වාමීන් එහි වඩා, නානා විධ භොජනයෙන් හා නානා ජාතියෙහි පුප වගීයෙන් හා නාග චම්පකාදී සකල ගණ්ධ සුගන්ධ මාලායෙන් හා නුවර පුදන ලද සුවහස් ප්‍රදීප මාලායෙන් හා වස්ත්‍රාභරණාදී අනගි අනැගි වූ පූජා වස්තුයෙන් හා නො එක් වාරයෙහි සත් සත් දවස් බැගින් තමන් භොග පමණින් බුදුන් පිදූහ. තව ද: නො එක් වාරයෙහි ලක් දිව වැසි නො වැස, ශස්‍යයන් මලානික වන කල්හි මුළු හෙලදිව් උත්සව මඟුල් කරවා චෛත්‍යාභිෂෙක-බොධ්‍යභිෂෙකවල නො එක් පූජා කරවා, දළදා ස්වාමීන්ට දහස් පිරිත් කරවා නුවර මහ පූජාවෙන් ප්‍රදක්ෂිණා කරවා නො එක් ආරාධනා කොට, එ කෙණෙහි ම සිරිලක වැසි වස්වා, බුදුබල පෑ ලොකවාසීන් ලවා නො එක් වාරයෙහි බුදුන්ට සතුනි පූජා කරවූහ.

මෙසේ තමන් ලද ජීවිතයෙහි සාරය ලදින් ලෝසසුන් රක්ෂා වෙහි අග්‍ර මාද වූ රාජවංශ නමැති මහ මිණිවැලයෙහි මිණි රුවනක් බඳු වූ, රජපා බොහෝ කලක් රජසිරි විඳිනාහු, තමන්ගේ සහජාත පුත්‍ර වූ විජය බාහු ය, භුවනෛකබාහු ය, ත්‍රිභුවන මල්ල ය, පරාක්‍රම බාහු ය, ජය බාහු ය යි යන පුත්‍රයන් පස්දෙනා හා වීරබාහු නම් බෑන රජු හා සඳහා ලඟට කැඳවා නො එක් අවවාද දෙන්නාහු "දරුවනි! ලෝකයෙහි අවජාත ය, අනුජාත ය අතිජාත ය යි පුත්‍රයෝ තුන් දෙනෙක් වන්නාහ. එයින් මවුන් පියන්ගේ කුල පරපුර සැපත් නසා, ඔවුන් ශ්‍රී වුන් ගම් අශ්‍රී විඳ ඇවිදිනාහු අවජාත නම් වෙති. මවු පියන්ගේ කුලපරපුර සැපත් පමණක් ම රක්ෂා

කොට ඔවුන් හා සම සම ව වසන්නාහු අනුජාත නම් වෙති. මවු පියන්ගේ කුල පරපුර සැපත් හා අවශෙෂ වූ වස්තු වඩ වඩා ශ්‍රී සම්පත් උපදවා ගෙණ එවුන්ට වඩා ශ්‍රී සම්පත් විඳිනාහු අභිජාත නම් වූ උත්තම පුත්‍ර නම් වෙති.

මම ද මපියානන් වහන්සේ ඔප ගෙණ දුන් එක මායා රජය ගෙණ දුන් තුන් රජය ම එක්සත් කොට තබා ගත්මි ඔබ සාධා ගත නුහුනු ද්‍රවිඩයන් මරා ලුහුබැඳ, කොඃ එක් මහවත්තීන් සඳ ගෙන්වා, ශ්‍රී පාමුල්හි රැස්කරවා පිමි. දඹදිවින් තිංසෝමරුන් ඈදී වූ තෘතා රුවන් හා පාක්කුඩම් ගෙන්වා පරදේශයෙහි රජ්ජුරු දූ තොපට නැකොට තබාලිමි. සොළී-පාඬි රජයෙහි රජ්ජුරුවන්ගෙන් රජ මොටුනු හා අඟැගි මිණිපළඳුරු මා කරා ගෙන්වා ගතිමි. තොප හැම තබා මාගේ යක්මුනුබුරු පරම්පරාවෙහාය් රජසිරි විඳිනා පමණ අපමණ වූ කවරුවත් රැස්කොට තබාලිමි. ලෝක ශාසනය ද සමග කොට තබාලිමි. මෙ ආදි කාරණයෙන් මම මපියානන් වහන්සේට අභිජාත පුත්‍ර විමි. තෙපි තෙපි ද මට මෙසේ ම අභිජාත පුත්‍ර වව,යි පෙර සාගර නම් රජහුගේ සැට දහසක් පුත්‍රයෝ දඹදිව සැට දහසක් රජ නුවර කරවා වෙන වෙන ම සමග ව ම රාජ්‍යය කළාහ. දසබෑ රජහු මුළු දඹදිව දස භාගයක් කොට බෙදාගෙණ සමග ව ම රාජ්‍යය කළාහ. තෙපි තෙපි ද මතු ඔවුනොවුන්ට සුවච ව, සිරිලක බෙදාගෙණ සමග ව, රජය කරව. පරසතුරන්ට අවසර නො දෙව. තෙපි තෙපි ද මට මෙසේ අභිජාත පුත්‍ර වව' යි යනාදීන් අවා එක් ඔවා කෙපුල් දී මහසංඝයා හා රාජ්‍ය වාසීන් රැස්කොට "මාගේ මේ පුත්‍රයන් පස්දෙනා හා වීරබාහු නම් භාගිනෙය්‍යයන් හා මේ රජ සදෙනා අතුරෙන් මතු රාජ්‍ය රක්ෂාවෙහි යෝග්‍යයෝ කවුරු දෝ හෝ"යි විචාළාහ.

එ තෙපුල් අසා මහ සංඝයා කියන්නාහු "මහරජ! මොහු සදෙන ම වෙන වෙන ම ධෛර්‍ය්‍යය, වීර්‍ය්‍යය, ඥානබලය, කායබලය ඇතියාහ. එසේ ද වුවත් තොපගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර වූ විජයබා රජ බාලසෙහි පටන් තුණුරුවන් කෙරෙහි අතිප්‍රසන්නයහ. අතිශ්‍රද්ධා ඇතියහ. ජරා දුර්වලයන් කෙරෙහි අතිදයා ඇතියාහ. දවස් පතා, ගිලන් භික්ෂූන් පිළිවිසියි. ගිලන්පස දෙන්නාහ. අරාජිතයෙහි ගැති දස් ව ගිය සංඝයාගේ බන්ධූන් හා දුඃඛිත ජනයන්ට සුවහස් ගණන් රන් රුවන් දී සිය ගණන් ගළවා අලහ. තොපගේ පුරුෂයෝ සත්ත්වයන් අතින් කරවූවර එලවන්නාහ් දුටු කල පවා, තමන්ගෙන් රන් දී ඔහු ද ගොඩ නංවා මුත් දෑස දක නො යන්නාහ. තොපගේ රජගෙයි රාජද්‍රෝහ කළාවූ සොරහු පවා ඔවුන් කරා ගය නැති ව

මැද ගැලවුනාහු පමණක් නැත. කෝප දක්නට භය ඇති ව තොපව හෝ හැඳින සිංහල මහවන්නීහු පළමුව අවුත් ඔවුන් දුක ඔවුන්ගේ ඕලගෙන් කෝප දක්නාහ.

ලක්දිව ඇමතියන් අඹුවෝත් "මතු අප ඇම රකු නම බෝසත් විජයබාහු රජහට දූන් පමන් සේවය කරව" යි තමන් තමන් පුරුෂයන් උගන්වත්ල. කිරිබොන දෙතුන් හැවිරිදි බාල දරුවෝ මවුන් පියන් පුරතල් විඳුම්හ යි "මතු පුත කාට සේවය කරවුද" යි විචාළ කල්හි "අප බෝසත් විජයබාහු රජහට සේවය කරම්හ" යි කියති. මවුන් පියන් අතින් සතා පහර ලද කිරිබොන කුමරහු "විජයබාහු රජ දුන නමින් ගෙඩි කැ පවත් කියා මවුන් පියන්ගේ දූෂිතම් රජහට පමුණත් ල. විජයබාහු රජ කුමරුවන්ගේ බස් අසා මවුන් පියන් ගෙන්වා ඔවුන්ට ප්‍රසාද දී කුමරුවන් නො මරණ ලෙස කියා කුමරුවන්ට මැටුප් තබා, දෙත්ල. ලක්දිව් වැසීන් ලවා බෝසත් විජයබා රජ ය යි තුඩ තුඩ කියවා මේ ආදී ගුණයෙන් ජනානුරඤ්ජනයෙන් යෙදී වෙසෙති. දෙවයෙනි! අහස් බලා සඳ කොයි දුයි විචාරන්නා සේ, ඔහුගේ ගුණ දැන දැන අප අතින් විචාරණු කිම් ද? ලඞ්කාවීපයට රාජ්‍යය තබා ජම්බුවීපයටත් රාජ්‍යය කරන් පින් බල ඇතියාහ. මතු තබා දූන්ම තොපට අභිජාත පුත්‍රභාවයක් යෙදිනැ"යි යනාදීන් තමන් තමන්ගේ මුව නො පොහොනා සේ ඔහු ගුණ වණ්නා කළාහ.

එ කල පරාක්‍රමබාහු රජ පුත් රජහුගේ අපරිමිත ගුණ අනා සතුටු කඳුලෙන් නුවන් තෙමා, ඔහු ලඟට නැඳවා, හිඹ සනහා, සමාන ආසනවල හිඳුවා, සෙසු රජ පස් දෙනා ද, දලදා-පාත්‍රධාතු ද, මහ සඞ්ඝයා ද, අමාත්‍ය මණ්ඩලය ද, මුළු හෙලදිව රාජ්‍යය රක්‍ෂාව ද ඔහට ම පාවා දී, තමන් මායා රජයෙහි ද රාජ්‍යය කළ හෙයින් අරාජිතභයක් නැසී ගිය ලක්දිව ජන පීඩා වන හෙයිනුත්, බොහෝ සංග්‍රාමයෙහි නියුක්ත හෙයිනුත් රුවන්මැලි මහසෑය බඳවා නොත් පලඳවා ගත නුහුනු නියාවත්, දෙමළුන් නැසූ මූල රාජධානිය පොළොන්නරුව සමෘද්ධි කරවා ගත නුහුනු නියාවත්, අරාජිතයෙහි මායා රජයට මැඩි වන දලදා සවාමීන් කඳවුරු ගෙණ ගොස් දලදා ගෙට නො වැඩූ නියාවත්, දැන් කොවදී රජයෙහි ජනයන් හා මහා සඞ්ඝයා රැස්කොට මලුතම් කරවා ගත නුහුනු නියාවත්, තමන් කඳවුරු ගොස් අභිෂෙක මඟුල් නොකළ නියාවත් යනාදි වූ ලෝවැඩ සපුන් මැඩ කියා "පෝසත් වූ නම්, මේ ආදී රාජ්‍ය ක්‍රියා වෙති යෙදී, මපියානන් වහන්සේට මා සේ ම තොපි දු මට අභිජාත පුත්‍ර වව" යි අනුශාසනා කොට රාජ්‍ය රක්‍ෂාව පාවා දුන්හ.

එ කල විජයබාහුරජ තො බා ම රාජ්‍ය රක්‍ෂා භාරය පිළිගෙණ පියරජහු කී බවා තෙපුල් නමැති මස්තක මාලාවෙන් නමින් මස්තකය සරසා 'මපියාතන් වහන්සේට, මා අභිජාත පුත්‍ර වන බැවි ඔබ සමයෙහි ම ඔබ හා ලෝකවාසීන්ට දක්වා මුත් නො හරිම් මය'' යි සිතක් වූ රාජාභිමාන බැ:ද:

ස්වාම්‍යාමාත්‍යං ච රාෂ්ට්‍රං ච-දුර්ගං කොශං බලං සුහෘත්,
එතත් ප්‍රකෘතයස්සප්ත-සප්තාඞ්ගං රාජ්‍යමුච්‍යතෙ-යි.

යන රාජ සප්තාංගය කල්පනා කොට ඒට මට ආක්ෂිම සමාන වූ අදහස් කොවරදවන්නා වූ කොකුසල මන්ත්‍රී වූ සිත ඇත්තක් නො සගවා කථා කොට පියන කරම් මිත්‍රාඞ්ගයට කවර කෙනෙක් සම්මතයෝ දෝ හෝ යි පරීක්‍ෂා කරන්නාහු, සහෝදරයන්වත් වඩා ප්‍රණීත වීරබාහු රජහු වැලි කොළිගෙහි පටන් සවජනයෙනුත්, තමන් හා විශ්වාසයක් මුත් අවිශ්වාසයක් නැති නියාවක් ඔවුනො වුන් නො දක නො මසක ප්‍රෙම ඇති නියාවක්, තමන් ගේ ම ලෝවැඩ සසුන් වැඩෙහි අති ලෝභ නියාමක් පෘලොව සමාන ඥාන බල මන්ත්‍රී බල ඇති නියාවත් පරීක්‍ෂා කොට සුහෘදඞ්ගාංව ඔහු ම මිට කරම්හුය යි සිතා ඔවුනොවුන් හා සමඟ මන්ත්‍රණය කොට එතැන් පටන් දෙසුහුරු රජහු එක්ව ගෙණ "පලමු කොට කෙබඳු වූ පිණක් කරමෝ දෝ හෝ" යි කල්පනා කොට "දළදා ස්වාමීන්ට පිය රජහු කැරවූ ජම්බුද්‍රොණී පුරයට මස්තකයෙහි දළදා ගෙය බොහෝ කාලයක් වැඩහුන් හෙයින් ජරාමාසය, මව පාවා දුන් ස්වාමීන් මා කැර වූ දළදා ගෙයක ම වැඩහුන මනා වේ ද' යි සිතා පරණ දළදා ගෙය බිඳ පිස කරවා පෙර කාර්‍ය කම්ංතන යට දිවුණ දිවුණ කම්ංතන කරවන්නාහු, සිය ගණින් මෙහෙකරුවන් රැස් කොට, කොබෝ දමනකින් දිව්‍යවිමානයක් මෙන් අසම්මත වූ දළදා ගෙයක් තිම්වා, නුවර මග පූජාවෙන් එහි ... වඩා, පෙර කලවත් වඩා දමසින් දවස පූජා ව්‍යවස්ථා කරවා තමන්ගෙන් රකවල් ලවා ඒ පිණ ද පිය රජහු තමින් ම දන්වා යවා,

එ තැන් පටන් ගංගොදකයට යමුනෝදකය වැද ගියා සේ පිය රජහු තමන් කෙරෙහි ඇති පෙම් වතුරු දිවුණු කරවා ගෙණ, පරාක්‍රමබාහු - ජයබාහු රජකුමරුවන් දෙදෙනා බාල හෙයින් පිය රජහට දරුශොකයක් වැද්ද නො දෙන සේ සමීපයෙහි වසවති රජහු ලඟ රඳවා ත්‍රිභුවනමල්ල නම් මල් රජහු ජම්බුද්‍රොණී නම් පුරයෙහි ඔවත් දකුණු පසෙහි සමුද්‍රාන්ත කොට පියරජහට අරක්ගන්නා සේ නියොග කොට සිටුවා, ඔහට ද දකුණු පස පිරිස් පාවාදී, භුවනෛකබාහු නම් සහෝදර මල් රජහු යෝධ බල හෙයිනුත්, යුධ කාමී හෙයිනුත්, ද්‍රවිඩයන් බොහෝ සේ

බස්නා කුඩමැලිගං ගෙන උත්තරාපථයෙහි පියරජහට අරක් ගන්නා සේ නියෝග කොට, යාපවුගල පිහිටුවා, ඒ දිග්හි බලපිරිස් ඔහට පාවා දී, වීරබාහු රජහු හා සමග තුමූ ලක්දිව ඒ ඒ තන්හි ඇවිද රාජ්‍යය තැන්පත් කොට පොළොන්නරු නුවර කරවමිහ යි කියා පියරජහු අතින් සමු ගෙණ නික්මුනාහ.

එ කල පරාක්‍රමබාහු මහ රජානෝ පුත් රජහු කෙරෙහි උපන් මහ පෙම් වතුරෙන් ඉපිල පැන නැංගා සේ, හුනස්නෙන් පැන නැඟී පුත් රජහට පසු ගමන් කොට "මි පුතුන් කෙරෙහි පෙම් ඇති සෙනඟෙක් ඔහු හා සමඟ යව" යි නියෝග කළහ. එතෙපුල් ඇසූ සියලු රාජ්‍යවාසීහු "අප බෝසත් විජයබාහු රජ රාජ්‍යය ලදහ. ඔවුන් හා සමඟ අපි යමිහ අපි යම්හ" යි ඔවුනොවුන් පරයා උගම්වෙගයෙන් උද්දම් වූ සමුද්‍රයක් සේ නික්මුනාහ.

එ කාටු සම්හර ඇමතියන් ඔහු කැමැතිම ද නො යන කල්හි සුවහස් ගණන් ඇමති දූ "තෙපි තෙපි නො යා නම් ඇපි ඇපගේ බෝසත් විජයබාහු රජු හා සමඟ ගොස් ඔවුන් වසන රට වැන්දඹුව වී මුත් වසම්හ" යි තමන්ගේ පුරුෂයන් නො බලා නික්මුනාහ. සම්හර කිරි බොන දරුවෝ මවුපියන් නො යන්නා දැක බෝසත් විජයබාහු රජහු යන්නා දැක මවුපියන් තබා රජු පසුපස්සෙහි නික්මුනාහ.

එ කල බෝසත් විජයබාහු රජ සිය ගණන් තබා නිකුත් මහසෙන් දැක, උපන් මහත් වූ ප්‍රීතීන්, සම්හරු අවවාදයෙන් රඳවා කැමැති පමණ පිරිස් ගෙණ, පෙර මහලු විජයබාහු රජු හා ද්‍රවිඩ සංග්‍රාමයෙහි ධන-ධාන්‍ය එහි පිහිටුවා, මායාදුනු පිරිස් ඒ පවීනයට ආරක්ෂාවෙහි පිහිටුවා, එ ගල් මුදුනෙහි මහනෙත් පාමුල මහා ස්ථවිරයන්ට සඞ්ඝාරාමයක් කරවා, පිළිගන්වා දන වෘත්ති ව්‍යවස්ථා කරවා එසී දූ පියරජහට දන්වා යවා එයින් සිවුරඟ සෙනඟ ගෙණ සමනොළ ගොස් බුදුන්ගේ ශ්‍රීපාද වැඳ අනැගි අනැගි රත්නාභරණයෙන් බුදුන් පුදා, එයින් ගොස් ගම්පොල නුවර වැදා, එහි නියම්ගම් පාය කටුකොහොල් පෙරළවා, එහි දූ දනවෘත්ති ව්‍යවස්ථා කරවා,

එයින් සිඟුරුවානයට ගොස් එහි වල්ගම්පායෙහි නව කර්මාන්ත කරවා, හිමවා පියරජහු නමින් අභය රාජ පිරිවෙණ කරවා, ඒ ග්‍රාමය පිරිවෙණට පුදා එහි ද දනවෘත්තීන් ව්‍යවස්ථා කරවා, එයින් භුවනෛකබාහු නම් සුළු පියරජහු විසූ කුරුණෑගල් ගොසින් ඒ රජහු කැර වූ රජමහ විහාරයෙහි ඔහුගේ ම දෙහ නිඃක්ෂෙපස්ථානය දැක දෙරජහු ම එ රජහු කෙරෙහි උපන්

මහා ශෝකයෙන් මැලප, අතිශ් ලක්ෂණ උපදවා, එ තැන්හි ම තුන් මහල් ගෙඩි ගෙය කරවා, එහි මහ බුදුන් කරවා, ඒ රජහුගේ රූපය කරවා, සර්වාභරණයෙන් ජීවමාන සේ සරහා, එම ගෙයි පිහිටුවා නො එක් පිරිවර හා දරුගම් මටකා පස ලවා, භුවනෛකබාහු පිරිවෙණ ය යි එ ගෙට නම් තබා, එ නුවර ජන ගහන කරවා පවුරු වාසල් ආදියෙන් සෙඹ සොම බඳුල සොබ නුවර බද මනුෂ්‍යයන් එ ගල් රක්‍ෂාවෙහි සිටුවා, එයි දූ පියරජහට දන්වා යවා, එයින් ගොස් දෙ සුහුරු රජහු මහසෙන් හා සමග යාපවු ගලට ගියහ.

එ කල පෙරවක් පිය රජහුගේ යුද්ධයෙහි පැරද පැලැ. චන්ද්‍රභානු රජු හා ජාවක මහ සෙනග සොළී පාඬින් ගෙණ මාවලු බැස කුරුඳු-පදී-මානාවතු-ගොනදෙබර පමත් ආදී තන්හි සිංහල බලසෙන් ගෙණ පෙරලා අවුත්, යාපවු ගල් සිසාරා, අතුරු නො දී කඳවුරු බැඳ "මෙ වන පෙරමක සේ අ පසුයෙහි නො සමිහ. මෙ තුන් රජය නොපට නො හරිමහ. දළද-පාත්‍ර ධාතු දෙව, රජ වොටුනු දෙව, රාජ්‍යය දෙව, සමන් නෝ කරම"යි සැහැසි මහසී කියා යවූහ.

එ කල විජය බාහු රජ නො බා මෑ වීරබාහු රජු කැඳවා සමග මිත්‍රභාශය කොට "මෙ තැන්හි අප දෙදෙන බල දක්වමහ"යි සෙසු සෙනගක් නො ගෙන්වා දෙදෙන හා සමග ගිය සෙනග ම ගෙණ මාරශුද්ධ කරන්නා සේ, නො එක් යුධ කොට චන්ද්‍රභානු රජු හා සෙනඟ මතු උත්සවයක් නො කරණ සේ මරා, ලුහුබැඳ, ඔහුගේ ඇත්-අස්-ජායබෙර-ජයකුඹ-බිසෝවරුන් ආදිවූ සියලු සැපත් හා සියලු ආයුධ ගෙණ, ඒ සියල්ල ම පියරජහු කරා ජම්බුද්‍රොණිපුරයට යවා, ඒ නුවර මහත් වූ මාලිගාවක් නංවා, නුවර සිසාරා සල පවුරු ලවා, යාපව්ව බද ජනයන් එ නුවර ආරක්‍ෂාවෙහි සිටුවා, භුවනෛකබාහු නම් මල් රජහු එ ගල රඳවා, එ නුවර ද බොහෝ සබඝයාව දන්වැට නංවා, එයි දූ පියරජහට දන්වා යවා,

එයින් අනුරාධපුර නුවර ගොස් මහාසෙනග ලවා දෙනා නක යෙහි තඹරූප්, ශ්‍රී මහා බොධි, ලෝවා මහ පා, රුවන්මැලිමළු ආදි තන්හි වල් සිඳුවා, මැලිමළු කනවා, ඒ ඒ තන්හි ගිය නුවර වාසීන් ගෙන්වා රුවන්මැලි මහසෑයෙහි පියරජහු කරවා නො නිමි කර්මාන්ත කරවන සේ නියොග කොට, සෙනෙවිරත් පිරිවෙන් ආදිවූ මහාවංසයාට දන වෘත්ති තබා දී, පරාක්‍රමබාහු රජහු පවා දක්නට හාස ඇති ම, එ වක් දක්වා නො දූත හුන්, පිහිටි රජයෙහි මහ වන් නින් තමන් ගියහ යි අසා හස නැණි ම අවුත් දූත්වූ කල්හි

ඔවුන්ම ප්‍රසාද දී, පෙර නො එක් වර යුද්ධයෙහි ඔවුන්ගෙන් අල්වා හසතිර කොට ගත් අඹුදරුවනු දු පාවා දී, ඔවුන් නුවර රකිනා සේ ආරක්ෂාවෙහි නියුක්ත කොට, එයි දූ පියරජහට දන්වා යවා,

එයින් පොළොන්නරු මුල රාජධානියට වැද, බොහෝ කලක් නැසී තුඹු සියගණන් වෙහෙර සසුන් හා, බිම පමණක් තිබිය දී නැසී ගිය රාජධානිය හා සිදී බිදී ගිය පවුරු පදනම් ආදි අපරිමිත නව කර්මාන්ත කොට, දෙ සුහුරු රජහු ම ඔවුනොවුන් පරයන අදහසින් පොළොන්නරු කරවා, මතු අපගේ යශස ම සිටුවමින යි වහසි කියා පියරජහට දූතයන් අත කැඩපත් ලියා "පොළොන්නරු රාජධානිය නවකර්මාන්ත බොහෝ තියාවත්, සම්හර කර්මාන්ත නිමිපිය කැරවුම මනා තියාවත්, සමහරක් නසිමින් සිටි තියාවත්, කිසියම දෙයක් නො නැසී සිටි තියාවත්, දූත් අප උපෙක්ෂා වුව හොත් මතු වන රජුන්ට උගහට වන තියාවත්, පෙර බොහෝ රජුන්ගෙන් නටුවාවූ කීර්ති ශරීරය දූත් අපි උපදවා ස්වාමීන්ගේ යශස් කර්මාන්ති ජීවිතෙන්ද්‍රිය පිහිටුවාලනු කැමැත්තෙමිහ. උදහස් නොව අදහස් දෙමා වදාළ මැනවැ" යි දන්වා යවා,

එ කල පිය මහ රජතෝ පුත් රජහුගේ සූර වීර තෙපුල් අසා, ලෝ වැඩ සසුන් වැඩ යෙදුනා වූ ප්‍රෙමණීය කථා අසා, තමනු දූ අනවකාශයෙන් සිත සිතා ම හිදිනා කාශීයක් මී හෙයින්, මහ මෙර සේ ඝන නැගී සන්තොෂයෙන් පිණා, එ කෙණෙහි ඇමැති මඩුළු මහ සංඝයා මැද මේ පවත් කියා, මායා රජයෙහි රැස් ව ඒ ඒ තන්හි හුන් ස්වර්ණකාර, කුම්භකාර, චර්මකාර, අයකාර, ලොහකාර, ධනුකාර, චිත්‍රකාර, උළුවඩු, සුණුවඩු, දඹුවඩු, ගල්වඩු ආදි සුවහස් ගණන් කම්කර පිරිස් හා, සුවහස් ගණන් බැලතියා වුත් හා කැති, පොරෝ, උදලු, කුත්තාති නො එක් උපකරණ භාණ්ඩයනු දූ යවා, ජම්බුද්‍රෝණි පුරයට පූර්විදිග් භාගයෙහි වසන සුවහස් ගණන් බල පිරිස් පුත් රජහට අරක් ගන්නා සේ යවා, නව යොදුන් රට බද මායාහෙහි සියලු බල පිරිස් බැන රජහට අරක් ගන්නා සේ නියෝග කොට යවා, අපිරිමිත වූ රන් රුවන් පඬුරු ද යවූහ

එ කල විජයබාහු වීරබාහු රජ දෙදෙන තමින් පොළොන්නරු වන් රජහට සත්විසි වන හවුරුදු පවින් පොළොන්නරුවෙහි නො එක් කර්මාන්ත කරවන්නාහු, පළමු කොට මහ සැගෑ ඇල ආදි නැසී නැසී ගිය වැවු කර්මාන්ත කොට, අමුණු කර්මාන්ත නිමවා, මහවෙල් හෙළි කරවා, කෙත් කුඹුරු ඇති කොට, ගොයම කරවා, රට බතින් සමෘධ කරවා, ජන සනහ කරවා, ඒ දෙවනු ම

නුවර මාකල්-පවුරු-වීථි-පහැය් උයන්-පොකුණු යනාදි කර්මාන්ත පෙර සේ ම කරවා තුන් වස්තු ව ලඞ්කාතිලකාදි වෙහෙර සපුන් කරවා, ලක්‍ෂ ගණන් මනුෂ්‍යයන්ගෙන් මහ ජන ගහන කරවා, එසි ද පියරජහට දන්වා යවා, පිය රජහු මහත්වූ රාජමඞ්ගල්‍යයෙන් ගෙන්වා, සඳවුරු බැ පුරෙහි දී අභිෂෙක මඟුල් කරවා, වීරබාහු රජහට ඒ සියලු රාජ්‍යය ම පාවා දී, ඔවුන් එහි රඳවා,

තුමූ පිය රජහු සමඟ ජම්බුද්‍රෝණී පුර ගොස්, සඳවුරු පුර දළදා සවාමින් වඩා ගෙණ යන සේ පිය රජහු අනුදන්වා ගෙණ, ජම්බුද්‍රෝණී පුරයෙහි පටන් පොළොන්නරු නුවර දක්වා විසි ගවු මඟ ඇත්-අස්-රථ-රුවන් මඩු නො ගැහැටි යන සේ මඟ සම කරවා, දෙ දෙ ගව්වෙහි ඉඩම්-මඩම් කරවා ඒ ඒ තන්හි ධවජ, පුන් කලස, කෙසෙල්, තොරණ ලවා, දළදා සවාමීන් අනැගි වූ රථයකින් වඩා මහත්වූ උත්සවයෙන් රන් ධවජ-රිදී ධවජ-රන් පැන-රිදී පැන-රන් කලස-රිදී කලස-රන් චාමර-රිදී චාමර-රන් විසිරි- රිදීවිසිරි-රන් පතැස්-රිදී පතැස් යනාදි වූ රජ පෙළහරයෙන් ඒ මාර්ගය අතුර නොදී වතුරු සේ නික්මුණ් මහ සෙනගින් හා, ඒ ඒ තන්හි අනේකනා ලද පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය නාදයෙන් හා, ඔවුනොවුන්ම වාද කරන්නා සේ, ඒ ඒ තන්හි සිට ගසන ලද සුවහස් ගණන් බලත් සබින් හා, අහෝ! සාධු! අහෝ! සාධු යි කියන ලද අපරිමිත සාධු නාද වචනයෙන් හා, මහ මේ ගිගුම් ගත් සමුද්‍රයෙන් නික්මුත් ඌර්මි වේගයක් සේ, ඔවුනොවුන් පරයා දිවන පින් සොඬ වූ මනුෂ්‍ය සේනාවෙකින් හා, බුදු මඟුලට දිවූ බඹසෙනඟක් සේ, ඔවුනොවුන් පරදා දළදා - පාත්‍ර පසු පස්සෙහි නික්මුත් සංඝ සමූහයකින් හා නික්ම, ඉඩමින් ඉඩමෙහි මහ පූජාවන් වඩා-මල් පූජා - බත් පූජා පහන් පූජා කරමින්, සුවහස් ගණන් මහ සඞ්ඝයාට මහ දන් දෙමින්, පොළොන්නරුවට වඩා ගෙණ ගොස්, මුළු නුවර දිව්‍ය පුරයක් මෙන් සරසා පරණ දළදා ගෙය දිව්‍ය විමානයක් සේ, සරහා, පුසැව සවුරුද්දක් අනාවාස ම තුබූ දළදා ගෙට ශුභ මොහොතකින් දළදා සවාමීන් වඩා, දවසින් දවස පෙරවරු පුදන ලද යහල ගණන් සුගන්ධ ශාලි භොජනයෙන් හා, බොහෝ කලක් දළදා නුදුටු පින් සොඬ වූ ජනයන් විසින් වස්වන ලද සුවඳමල් වර්‍ෂාවෙන් හා, රාත්‍රියෙහි පුදන ලද ප්‍රදීප සහස්‍රයෙන් හා අපරිමිත වූ පූජා කරන්නාහු, තුන් මසක් මුළුල්ලෙහි මඟුල් කොට නිමවා. එයි දූ පිය රජහට දන්වා යවා,

දහස් තොට දී මලුකමු දූ කරවම්හ යි පිය රජුහුගෙන් අනුදන්වා ගෙණ වීර බාහු රජහු දහස් තොට යවා, එහි සුවහස් ගණන් සංඝාරාම කරවා, සැවපා ගෙවල් කාංවා, පෙර සිරිත් වූ පරිද්දෙන් ම

මිලුතම පූජා ගරහා, එ පවත් ඇසු පිහිටි රජයෙහි හා රුහුණු රජයෙහි මහ වත්ති තමන් කෙරෙහි හයින්, නො එක් දනොප-කරණ ගෙණ දහස් ගණන් දහස් නොව ගලා ගත් කල්හි "තුන් රජයෙහි මහා සංඝයා මා කෙරෙහි පෙම් ඇතොත්තින් මාගේ මිලුතම පූජාවට වඩනේ ය" යි ආරාධනා කොට යවා, එ පවත් ඇසූ "අප බෝසත් විජය බා මහ රජහුගේ මිඛගල්‍ය පූජාවට අපි අපි යම්හ" යි යේ බලන භික්ෂු පමණකුත් නො රදවා, සුවහස් ගණන් සංඝයා පෙළ පෙළ දී, හිටි හිටි තෙනින් ගොස්, ඡද්දන්ත විල හිසාරා හිපි රත් පියුම් වනයක් සේ, දහස් නොව සිසාරා, ගලාගත් කල්හි දෙපෝයක් මූළුල්ලෙහි අනේක ප්‍රකාර ප්‍රණීත භොජනයෙන් මනදන් දී, බොහෝ දෙනා මහණ මහලු පැවිදි කරවා, ආගතන් - සථවිර - මහාසථවිර මාහිමි යනාදි ථානානතර දෙමා ලදුමාකට තෙලිසම් - සළු-පිඩහම් සමග සුවහස් අගනා සේ සළුපිරිකර දී, රැස් වූ මූළු ලක් දිව සුවහස් ගණන් මහ සංඝයා අතුරෙන් සහ සමතු ද නො වරදවා, අනැගි පිරිකර දී, ඉතිරි ව ගිය පිරිකර සොළී - පාඩි රජයෙහි භික්ෂූන්ට යවා, මහ සගමැද "මා කළා වූ සියලු පින්කම් ම ම පියානන් වහන්සේ නමිනැ"යි අස්වා දෙපෝයක් මූළුල්ලෙහි මිලුතම පූජාව නිමවා, එයි ද පිය රජහට දක්වා යවා;

එ කල පිය රජහු එ තෙපුල් අසා, උපන් මහා සනතොෂයෙන් "රහල් තෙරුන් කළ ප්‍රතිපත්ති පූජා ද, බුදුන් කළා ම මිත බැවින් පුත්හු කළ සත්කාරය ද, මා ම කෙළෙම යැ"යි සමාදන් ව අනැගි නො එක් පඬුරු දී යවූහ.

මෙසේ මේ පන්තිස්වන්නෙහි කරණ ලද විජයබාහු මලුතම් පූජාව හා සමග, නව මලුතම් පූජාවක් කරවා, තුමූ එම ජම්බුද්‍රොණී නම් පුරයෙහි, නව ද වඩ වඩා පුත්‍රයන් විඳිනා ශ්‍රී සම්පත් බල බලා නව ද මඩ වඩා පින් රැස් කොට රජසිරි විඳිනාහ.

එ කල උභය කුල පරිශුද්ධ ව පැවති ගණවැසි කුලෙහි අවිනෂ්ට වූ මහා පඬිවංශ ඇණි වාගිරි පම්තයෙහි එම රජුගේ ආරාධනාවෙන් සිවුපස දනය ලදින් වාසය කළා වූ මහනෙක් පා මුල සුමඩගල මහා සථවිරයන්ගේ සහෝදර වූ, ඔවුන්ගෙන් ම කිසියම් දහම් සායක් දූනගත්තා වූ මයුරපාද පරිවෙණාධිපති බුඩපුත්‍ර සථවිරයන් විසින් නව අරහාදි බුදුගුණයෙහි පළමු වන අරහත් ගුණය ගෙණ සූතිස් පරිච්ඡෙදයෙකින් හා සුවිසි දහසක් පමණ ග්‍රන්ථ සඩ්ඛ්‍යාවෙකින් හා සතාතු බණවරෙකින් හා, සත් ලක්ෂ අට හැටදහසක් පමණ අක්ෂර සඩ්ඛ්‍යාවෙකින් හා, අසඩ්ඛ්‍ය ගණන් පූජා

නයින් උපලක්ෂිත වූ මේ පූජාවලී නම් ධර්ම ව්‍යාඛ්‍යාන කථාව මේ රජහට තිස්වන්නෙහි උපදවා, "අප බුදුහු එක් අස්නේ වැඩහිඳ නානා ලෝකධාතුවෙහි සත්ත්වයන්ට බණ වදාරන්නාහ. ඔබගේ පුත්‍රවංශයෙහි ජාත වූ හෙයින් අපි ද අපගේ වෙහෙර ම හිඳ අප රජු හා ශ්‍රී ලංකාවිපවාසී සත්ත්වයන්ට අනුශාසනා කොට බුදුන්ට උතුම් වූ ප්‍රතිපත්ති පූජා කරම්හ"යි සිතා එම දෙවප්‍රතිරාජ නම් අමාත්‍යයානන් අතට දී යවනලද.

එ කල රජහු මේ පූජාවලිය දැක දෙවන රජයක් ලදුවා සේ උදාර වූ සන්තොෂයෙන් පිණා, දෙපෝයක් මුළුල්ලෙහි අතික් රාජ්‍ය ක්‍රියාවෙක නො යෙදී, සිත් එකඟ ව අසා, බුදුන්ගේ අපරිමිත වූ ගුණයෙහි පැහැද රාජ්‍යය පුදා පිළිගත් කරම උදාර වූ සන්තොෂයෙන් යෙදී, පොත ලක්දිව නො එක් ප්‍රඥාවන්ත ජනයන්ට පැ කිෙසාවූ ලවා මඟුලැතු පිට තබා පෙරසක් හා සමග නුවර නො එක් පූජායෙන් උත්සව කරවා, බොහෝ කලක් ඇසූ ඇසූ ශ්‍රාවකජනයන් මෙහි ආදර කරණ සේ බුදුන්ගේ ද, තමන්ගේ ද, මේ කීර්ති ශරීරය සථාවර කොට සො එක් සත්කාර කළහ.

මෙසේ මා විසින් එක ව්‍යාඛ්‍යාන කථාවෙහි කියකලද පළමු වන සංග්‍රහ පරිච්ඡෙදයෙහි සූතිස් මහා සංග්‍රහ පූජා ය, දෙවන අභිනීහාර මඟුල් නම් වූ පරිච්ඡෙදයෙහි කියනලද අට ලක්ෂ අසූ දහස් එක්සාළිසක් පමණ පූජා ය, තුන්වන සාමාන්‍ය ධර්මයෙන් ලද විවරණ පරිච්ඡෙදයෙහි පස් පණස් ලක්ෂ විසි දහසක් පමණ පූජා ය, සතර වන බොධිසම්භාර පරිච්ඡෙදයෙහි තෙළෙසක් පමණ පූජා ය, පස් වන ප්‍රථම ජාතිභෙද පරිච්ඡෙදයෙහි සූසාළිසක් පමණ මහා ජාතිභෙද පූජා ය, සවන විතීය ජාතිභෙද පරිච්ඡෙදයෙහි සූවිසි මහා ජාතිභෙද පූජා ය, සත්වන සාධුනාද පරිච්ඡෙදයෙහි දෙලක්ෂ සතළිස් දහසක් පමණ පූජා ය, අට වන ප්‍රතිසන්ධි පරිච්ඡෙදයෙහි දෙතිසක් මහා පූර්වනිමිති පූජා ය, නව වන ප්‍රසව මංගල්‍ය පරිච්ඡෙදයෙහි දෙලක්ෂ සතළිස් දහස් දෙතිසක් පමණ පූජා ය, දස වන මහාභිනිෂ්ක්‍රමණ පරිච්ඡෙදයෙහි පස් ලක්ෂ දෙලොස් දහසක් පමණ පූජා ය,

එකොළොස් වන බොධිමණ්ඩල පරිච්ඡෙදයෙහි සාරලක්ෂ විසි දහස් තෙසාළිසක් පමණ පූජා ය, දොළොස් වන බ්‍රහ්මාරාධනා පරිච්ඡෙදයෙහි දෙලක්ෂ සතළිස් දහසක් පමණ පූජා ය, තෙළෙස් වන ධර්මසක් පැවතුන් පරිච්ඡෙදයෙහි දෙලක්ෂ සතළිස් දහස් දෙතිසක් පමණ පූජා ය, තුදුස් වන වෙළුවනාරාම පරිච්ඡෙදයෙහි දෙලක්ෂ පන්දහස් තුන්සිය සූසාළිසක් පමණ පූජා ය,

පසළොස් වන නිග්‍රෝධාරාම පරිච්ඡේදයෙහි සාරලක්ෂ විසි දහස් එකුතුරුවූ මහපූජා ය, සොළොස් වන අද්භූත මහා පරිච්ඡේදයෙහි සංඛ්‍යා පථයට අවිෂය වූ මහ පූජා ය, සතළොස් වන ජේතවනාරාම පරිච්ඡේදයෙහි දෙසිය සැත්තෑවක් පමණ පූජා ය, අටළොස් වන පූර්වාරාම පරිච්ඡේදයෙහි එක්සිය විස්සක් පමණ පූජා ය, එකුන් විසි වන දහර භික්ෂු පරිච්ඡේදයෙහි අප්‍රමාණ වූ ප්‍රතිපත්ති පූජා ය, විසි වන අසදෘශ දාන පරිච්ඡේදයෙහි අප්‍රමාණ පූජා ය,

එක් විසි වන ගංගාරෝහණ පරිච්ඡේදයෙහි සත්දහස් පන්සිය තිසක් පමණ පූජා ය, දෙවිසි වන දිව්‍යරාජ පරිච්ඡේදයෙහි අසූ දහසක් පමණ දිව්‍යරාජ පූජා ය, තෙවිසි වන යමක ප්‍රාතිහාර්ය පරිච්ඡේදයෙහි දෙලක්ෂ සතළිස් දහස් එක්සිය තෙයාසූවක් පමණ පූජා ය, සූවිසි වන පාණ්ඩුකම්බලාසන පරිච්ඡේදයෙහි දෙකෙළ සොළොස් ලක්ෂයක් පමණ පූජා ය, පස්විසි වන දේවාරෝහණ පරිච්ඡේදයෙහි දෙලක්ෂ සැත්තෑ දහස් පන්තිස් මහ පූජා ය, සවිසි වන භික්ෂුණී ශාසන පරිච්ඡේදයෙහි අප්‍රමාණ වූ භික්ෂුණී ප්‍රතිපත්ති පූජා ය, සත්විසි වන මහා ප්‍රජාපතී පරිච්ඡේදයෙහි අද්භූත වූ අප්‍රමාණ පූජා ය, අටවිසි වන ජීවකාරාම පරිච්ඡේදයෙහි අප්‍රමාණ මහ පූජා ය, එකුන්තිස් වන දේවදත්තාවතාර පරිච්ඡේදයෙහි අප්‍රමාණ සම මෙත් පූජා ය, තිස් වන අජාසත්තු රාජ දමන පරිච්ඡේදයෙහි ජීවිතාදී අප්‍රමාණ පූජා ය,

එක්තිස් වන යශෝධරා පරිච්ඡේදයෙහි අප්‍රමාණ වූ ප්‍රාතිහාර්යාදි ප්‍රතිපත්ති පූජා ය, දෙතිස් වන ධර්මාශෝක පරිච්ඡේදයෙහි තුදුස් ලක්ෂ සත් පණස් දහස් නවසිය සයානූවක් පමණ පූජා ය, තෙතිස් වන මිහිඳු මාහිමියන්ගේ ප්‍රතිපත්ති පරිච්ඡේදයෙහි නොයෙක් සුවහස් ගණන් පූජා ය, සූතිස් වන ශ්‍රී ලංකාද්වීප පරිච්ඡේදයෙහි සිරිලක රජ කළ එක්සිය තෙපණස් රජුන් අතුරෙන් පැරකුම් රජුන් අවසන්හි පින්වත් රජුන් කළා වූ අසඞ්ඛ්‍ය ගණන් නොයෙක් පූජා ලත් හෙයිනුත්, ග්‍රන්ථ භීරුකයන් කුසීතමති යි සිතාත්, ග්‍රන්ථ විශාරද මත හෙයිනුත්, දූත දූත ද මා විසින් දක්මාගත නුහුනුවා වූ අප්‍රමාණ වූ පූජා ලත් හෙයිනුත්, එසේ වූ පූජා විදීමට සුදුසු හෙයිනුත්;

සංසාර සාගරයට දිව්‍ය නෞකාවක් බඳු වූ, සංසාර නැමැති මහා පඞ්ක දුර්ගයට දිව්‍ය සේතුකාවක් බඳු වූ, සංසාර නැමැති මහා කාන්තාරයට දිව්‍ය රථයක් බඳු වූ, සංසාර නමැති මහාන්ධකාරයට තේජෝ කඳක් බඳු වූ, සංසාර නැමැති මහ ගිම් හෙළියට ඡායා වෘක්ෂයක් බඳු වූ, සංසාර නමැති පිපාසාවට පියුම් විලක් බඳු

වූ, සංසාර නමැති මහාව්‍යාධියට ඖෂධ වෛද්‍යයෙක් බඳු වූ, සංසාර නමැති මහා විෂයට දිව්‍ය මන්ත්‍රයක් බඳු වූ, සංසාර නමැති මහ ගිනිකඳට ආකාශ ගංගාවක් බඳු වූ, මට ද සියලු සතුන්ට ද මවු වූ, පිය වූ, ගුරු වූ, දෙවි වූ, බඹ වූ, තමන් වහන්සේ වන් ගුණමහ නිවන් පුරයෙහි සියලු සතුන් ගෙණ හැර පුරා ගත්තා වූ, අප මහා ගෞතම තිලෝගුරු බුදුරජානන් වහන්සේ - ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේව මනුස්සානං බුද්ධෝ භගවා" යි යන මේ නව අරහාදී බුදුගුණයෙහි පළමු වන අරහත් ගුණයෙන් යෙදුනු සේක යි දතයුතු. එසේ හෙයින් කියන ලදී:

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො,
අත්ථානුරූපං "අරහං" ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං-ති.

මේ පූජාවලි දෙශනාවසානයෙහි
අප බුදුන් ශ්‍රී ලඞ්කාද්වීපයෙහි හැම රජුන්ගෙන් ලද
උද්දෙසික පූජා කථා නම් වූ
තිස් හතරවන පරිච්ඡේදය නිමි.

මයූරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍රයන් විසින්
පරානුග්‍රහයෙන් පහළ කරණ ලද පූජාවලි නිමාමි වි.

චිරං තිට්ඨතු සද්ධම්මො-දෙවො සම්මා පවස්සතු,
රට්ඨං රක්ඛන්තු රාජානො-පජා පප්පොන්තු නිබ්බුතිං.

කප්පරුක්ඛාසමානස්ස-සත්තානං වසතො භවෙ
පඤ්ඤා භගවතී මය්හං-වුද්ධිං ගච්ඡතු සබ්බදා.

අහං තු පරමිං බොධිං-පත්වා ධම්මමනුත්තරං,
දෙසෙත්වා පාණිනො සබ්බ-මොචෙය්‍යං භවබන්ධනා.

ඉමිනා පුඤ්ඤකම්මෙන-සා[illegible]බුද්ධා භවා භවං
මනොසද්ධාව ඤාණෙන-ජාති සෙට්ඨිව භොගිනා
වෙස්සන්තරොව දානෙන-හොතු මය්හං භවා භවෙ.